# බුදුදහමට කුඩා විශ්වකෝශයක්

පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි

# බුදුදහමට කුඩා විශ්වකෝෂයක්

**සම්පාදකඃ**

## ඕස්ට්‍රේලියාවේ පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි

පරිවර්තකඃ

මන්ජරී පීරිස්

2021

බුදුදහමට කුඩා විශ්වකෝෂයක්

ඕස්ට්‍රේලියාවේ පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි

පරිවර්තකඃ මන්ජරී පීරිස්

ISBN :

© පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි

ප්‍රස්තාවනාව

මෙම ග්‍රන්ථය වසර 40කට වඩා වැඩි කාලයක් පාලි ත්‍රිපිටකය කියවීමෙන් සහ එහි අඩංගු සහස්‍ර වර්ෂ දෙකහමාරකට පෙර බුදුපියාණන් වහන්සේ විසින් පැවසූ වචන පිළිබඳව සිතීමේ ප්‍රතිඵලයකි. එසේම මෙම වචන අප වෙත පැමිණෙන්නේ එතරම් දීර්ඝ කාලයකට පෙර වුවද, ඒවා තවමත් අර්ථවත්ව පවතී. ඒවායේ ඇති ප්‍රඥාව පුදුමයට පත් කරවයි. එසේම ඒවා නූතන ලෝකයේ ජීවත්විය යුතු ආකාරය පිළිබඳව ප්‍රායෝගික උපදෙස් ලබා දෙයි. බුදුදහම පිළිබඳව බොහෝ ග්‍රන්ථ ඇත. නමුත්, මෙම ග්‍රන්ථය ධර්මය වෙත ප්‍රවේශ වන්නේ තරමක් වෙනස් දෘෂ්ටිකෝණයකින්ය. මා බුදුදහම පිළිබඳව ග්‍රන්ථ කියවන විට එකම විෂයයන් ඉදිරිපත් කර ඇති බව අවධානයට ලක් වී ඇත. එකම උපුටා දැක්වීම් භාවිත කර ඇත. එකම අර්ථකථනය ලබා දී ඇත. මෙය අපේක්ෂා කළ යුතු අතර, ත්‍රිපිටකය පිළිබඳව මගේ කියවීමෙන් මට පෙනී ගියේ බුදුපියාණන් වහන්සේ කථා කර ඇත්තේ හුදෙක් චතුරාර්ය සත්‍යය, ආර්ය අෂ්ටාංගික මාර්ගය සහ පංච ශීලය ගැන පමණක් නොව, පුළුල් පරාසයක විෂයයන් ගැන කථා කළ බවයි. මා මෙම ග්‍රන්ථයෙන් ප්‍රමුඛත්වයක් දී ඇත්තේ බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල අඩුවෙන් ප්‍රසිද්ධ කරුණු පිළිබඳවයි. ත්‍රිපිටකයෙන් සහ තවත් සමහර බෞද්ධ සාහිත්‍යයෙන් විෂයයන් 450කට වඩා වැඩියෙන් සහ උපුටා දැකිවීම් 1000කට වඩා වැඩියෙන් මෙහි අන්තර්ගත වේ. ධර්මයේ නොසලකා හරින ලද සහ එතරම් ප්‍රසිද්ධ නැති කරුණුවලට ඉඩ ලබාදීමෙන් පාඨකයා බුදුපියාණන් වහන්සේගේ ප්‍රඥාවේ ඇති අනගි බව පිළිබඳ ගැඹුරු ඇගයීමකට එළඹෙනු ඇතැයි මම සිතමි.

වසර ගණනාවක් තිස්සේ ධර්මය පිළිබඳ ඔවුන්ගේ දැනුම මා සමග බෙදා ගනිමින් සහ ධර්මය අඛණ්ඩව අධ්‍යයනය කිරීමට මා දිරිමත් කළ සියලුම ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලාට මම ස්තුතිවන්ත වෙමි. මෙම ග්‍රන්ථය ඉංග්‍රීසි බසින් සිංහලට පරිවර්තනය කිරීම සඳහා වැය කරන ලද අති විශාල කාලය සහ උත්සාහය පිළිබඳව මම මන්ජරී පීරිස් මෙනවියට සහ එහි භාෂාව සහ විශේෂයෙන්ම පාලි වචන ප්‍රවේසමින් පරීක්ෂා කිරීම පිළිබඳව අරුන තලගල මහතාට ස්තුති කරමි. විවිධ සහාය ලබා දුන් සුජීව දිලංගන මහතාටත් ස්තුතිවන්ත වෙමි.

## පරිවර්තකගේ සටහන

බුදුදහම පිළිබඳ කුඩා විශ්වකෝෂයක් බඳු මෙම ග්‍රන්ථය, සිංහල බසින් ධර්ම ග්‍රන්ථ පරිහරණය කරන පින්වතුන්ට ප්‍රයෝජනවත් යේ යැයි මම විශ්වාස කරමි.

මා කෙරෙහි විශ්වාසය තබමින් මෙම ග්‍රන්ථය සිංහලට පරිවර්තනය කිරීමට මට අවසර සහ උපදෙස් දුන් ඕස්ට්‍රේලියාවේ වැඩ වසන පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමියන්ට මම මගේ ප්‍රණාමය පුද කරමි.

ග්‍රන්ථ පරිවර්තනයේදී විවිධ ධර්ම ග්‍රන්ථ සපයමින් සහ ධර්ම දැනුම ලබාදෙමින් විවිධ අයුරෙන් උපකාර කළ මහරගම සිරි වජිරඤාණ ධර්මායතනවාසී ශ්‍රාස්ත්‍රපති රාජකීය පණ්ඩිත පූජ්‍ය ගබ්බෙල වජිරඤාන ස්වාමීන්වහන්සේටත් මගේ ගෞරවනීය ප්‍රණාමය පුද කරමි.

මෙම ග්‍රන්ථය මුද්‍රණයට යන තුරු ඉතා කැපවීමෙන් සිංහල බස් වහර නිවැරදි කර දීම සම්බන්ධයෙන් අරුන තලගල මහතාට කෘතඥ වෙමි. විවිධ අයුරෙන් සහාය ලබා දුන්, සූජීව දිලංගන සහ ජීවක මෛත්‍රී යන මහත්වරුන් සහ සුමනා ධර්මවිමල මහත්මියටත් කෘතඥ වෙමි.

මගේ දෙමව්පියන් සහ පවුලේ සියලු දෙනාගේත්, ග්‍රන්ථය කියවීමෙන් පරිහරණය කරන පිංවතුන්ටත් සංසාර විමුක්තියටත් හේතු වේවා. මෙම ග්‍රන්ථය පරිවර්තනය කිරීමේ අභිලාෂයත් එයමයි.

මන්ජරී පීරිස්
86, දහම් මාවත
මහරගම

## අභිධර්මය

බුදුපියාණන් වහන්සේගේ කාලයේ වර්ධනය වීම ආරම්භවී, උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂ දෙකකට හෝ තුනකට පසු එහි අවසාන ස්වරූපයට පැමිණි, ධර්මයට එක් විශේෂිත ප්‍රවේශයකි. අභිධර්මය යන වචනයේ අදහස 'විශිෂ්ට ධර්මය' යන්නයි. මුල් බෞද්ධ චින්තකයින් අභිධම්ම යනුවෙන් හැඳින්වූ ඔවුන්ගේ මූලික ඒකකවල සංසිද්ධීන් විශ්ලේෂණය කිරීමට උත්සාහ කළ විට අභිධර්මය වර්ධනය විය. ඉන්පසු ඒවායේ ලක්ෂණ, ඒවායේ කාලසීමාව, එකිනෙකා සමග ඇති අන්තර් ක්‍රියාකාරීත්වය සහ ඒවායේ කර්මයට අදාළ ප්‍රතිඵල විස්තර කිරීමට උත්සාහ කරන ලදී. එහෙත් බුදුපියාණන් වහන්සේ සාමාන්‍යයෙන් නිරීක්ෂණය පාදක කොටගත් කටයුතුවලට පමණක් සීමාවූ අතර, අභිධර්මය වඩාත්, සම්ප්‍රේක්ෂණයට නැඹුරු විය.
*Abhidhamma Studies*, Nyanaponika, 1985.

## අභිධම්ම පිටක

අභිධම්ම පිටකය ත්‍රිපිටකයේ තුන්වන කාණ්ඩයයි, බුදුදහමේ පූජනීය ධර්ම ග්‍රන්ථයි (අනෙක් කොටස් සූත්‍ර පිටකය සහ විනය පිටකයයි). එයට ග්‍රන්ථ හතක් අඩංගු වේ - ධම්මසඞ්ගණිප්පකරණය, විභඞ්ගප්පකරණය, ධාතුකථාප්පකරණය, පුග්ගල

පඤ්ඤත්ති, කථාවත්ථුප්පකරණය, යමකප්පකරණය සහ පට්ඨානප්පකරණය යනුවෙනි. අභිධම්ම පිටකයේ ග්‍රන්ථ සාමාන්‍යයෙන් සූත්‍ර පිටකය සහ විනය පිටකයේ ග්‍රන්ථවලට වඩා පසුව ඇතිවූ ඒවා වන අතර, වර්තමාන ස්වරූපයෙන් ව්‍යාප්ත වී ඇත්තේ බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වර්ෂ සිය ගණනකට පසුව විය හැකිය. සම්ප්‍රදාය ඒ සියල්ල ආරෝපණය කර ඇත්තේ බුදුපියාණන් වහන්සේටය. නමුත් මේ පිළිබඳව අභිධර්ම පිටකයේවත් සඳහන් වී නැත. සූත්‍ර පිටකයේ හෝ විනයේ පිටකයේවත් සඳහනක් නැත. කෙසේ නමුත්, බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට පරස්පරව ද අභිධම්ම පිටකයේ කිසිවක් සඳහන්වී නැත; වෙනස ඇත්තේ ප්‍රවේශය තුළය, අන්තර්ගතයේ නොවේ. බලන්න **අභිධම්ම සහ සඞ්කස්ස.**

*Guide to the Abhidhamma Piṭaka*, Nyanatiloka, 1950.

## ගබ්සා කිරීම

ගබ්සා කිරීම යනු (ගබ්භපාතන) උත්පත්ති පාලනය කරන ආකාරයකි; කලලයක් සම්පූර්ණයෙන් වර්ධනය වීම සහ ඉපදීම වැළැක්වීම එය විනාශ කිරීමයි. ගබ්සා කිරීම පැරණි ඉන්දියාවේ හොඳින් දැන සිටි දෙයක් වූ අතර, එය සිදුකරනු ලැබුවේ උදරයට පීඩනයක් යොදවමින්, ශල්‍යකර්මයක් කරමින් හෝ විවිධ ඖෂධ වර්ග භාවිත කරමින් එය උණුසුම් කරමින්ය. (විනය.111.84) බුදුදහමට අනුව, ජීවිතයක් ආරම්භ වන්නේ 'විඤ්ඤාණය පළමුව ප්‍රකට වීමත් සමගම මනසේ පළමු නැඟී සිටීමේදීය'. නමුත් මෙය සිදු වන්නේ කුමන අවස්ථාවේ ද යන්න හරියටම ප්‍රකාශ කර නැත. (විනය. 111, 73) අනුමාන කරන ආකාරයට, පිළිසිඳ ගැනීමේදී හෝ එසේ සිදුවූ විගස හෝ ගබ්සා

කිරීම ප්‍රාණ ඝාතය ලෙස සැලකේ. ගබ්සා කරන්නන්ට නැවත ලැබෙන්නේ අයහපත් උත්පත්තියක් බව ජාතක පොතේ සඳහන් වේ. (ජාතක V, 269) වෙනත් අයට ගබ්සා කිරීම භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට තහනම් වේ. (D.1,11).

සමහර අවස්ථාවල මවගේ ජීවිතය බේරා ගැනීම පිණිස ගබ්සා කිරීම අවශ්‍ය වේ. නමුත්, අද කාලයේ බොහෝ ගබ්සා කිරීම් සිදු කරන්නේ ලජ්ජාවට පත්වීම් හෝ දරුවා සැලසුම් කිරීමෙන් තොරව පැමිණීමේ අපහසුතාවය මග හැරීමටයි. බෞද්ධයන්ට, ජීවිතයක් විනාශ කිරීම ඉතා පහත් ක්‍රියාවක් වේ. ගබ්සා කිරීම ශ්‍රී ලංකාවේ සහ බුරුමයේ තහනම් වේ. නමුත් තායිලන්තයේ එය එසේ නොවේ. බලන්න **නැවත ඉපදීම පිළිබඳව.**
*Buddhism and Abortion*, Damien Keown, 1999.

## යහපත් ක්‍රියාව (සම්මා කම්මන්ත)

බුදුපියාණන් වහන්සේගේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ හතරවන පියවර යහපත් ක්‍රියාවයි (සම්මා කම්මන්ත). ක්‍රියාවක් යනු කයෙන් සිදුකරන ක්‍රියාකාරකමක් හෝ වැඩකි. ප්‍රතිෂේධාත්මක ලෙස, සම්මා කම්මන්ත ලෙස බුදුපියාණන් වහන්සේ විග්‍රහ කළේ ප්‍රාණ ඝාතයෙන්, සොරකම් කිරීමෙන් සහ කාමමිච්ඡාචාරයෙන් වැළකීමයි.(M.111,251) ප්‍රායෝගිකව, සම්මා කම්මන්ත යනුවෙන් අදහස් වන්නේ, කරුණාව, පරිත්‍යාගශීලීත්වය, ඉවසීම, අනෙක් අයට උපකාර කිරීම හෝ ජීවිතය ආරක්ෂා කිරීම හෝ ඉහළ දැමීම පෙරදැරි කරගත්, ඕනෑම ක්‍රියාවක්ය.

## පරදාර සේවනය

පරදාර සේවනය (අතිචරියා) යනු විවාහවී සිටිද්දී හෝ විවාහ වී සිටින කෙනෙකු වෙනත් අයකු සමග ලිංගික සේවනයේ යෙදීමයි. පුරුෂ පරදාර සේවනයේ යෙදෙන්නෙකු පරදාරික සහ ගැහැණු පරදාර සේවනයේ යෙදෙන්නෙකු අතිචාරිණී (S.11.259) වශයෙන් හඳුන්වන බව ත්‍රිපිටකයේ සඳහන් වේ. පරදාර සේවනයේ යෙදෙන ගැහැණියක 'බස්සෙකු වැනි කෙනෙකු. (කොසියායණී) ලෙස ද නම් පටබැඳී ඇත. එයට හේතුව ඇය රාත්‍රී කාලයේ අතන මෙතන හොරෙන් අරගෙන යන නිසාය (Ja. 1, 496). පරදාර සේවනය බොහෝ විට තුන්වන ශික්ෂා පදය උල්ලංඝණය කිරීමකි. බොහෝ විවාහ උත්සවවලදී පාර්ශ්ව දෙකෙන්ම එකිනෙකා කෙරෙහි දැඩි විශ්වාසය රැකීමට ගාම්භීර පොරොන්දුවක් ඇතුළත් කරනු ලැබේ. පරදාර සේවනයේ යෙදීමෙන් මෙම පොරොන්දුව බිඳ දැමේ. සාමාන්‍යයෙන් බොරු කීම, වංචාව සහ රැවටීම වැනි වෙනත් ඍණාත්මක හැසිරීම් වැනි පටලැවිලි ඇතිවේ. අනෙක් අයට සිදු කෙරෙන කාමමිච්ඡාචාරයේ ඍණාත්මක ප්‍රතිඵලවලට විශ්වාසය විනාශ වීම, අවමන් කිරීම, දැඩි කම්පාව සහ පවුලේ බැඳීම දුර්වලවීම ආදිය ඇතුළත් වේ. මෙම හේතු නිසා බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ:''තමන්ගේ බිරිඳ කෙරෙහි නොසතුටට පත් වී, යම් කෙනෙකු ගණිකාවන් හෝ වෙනත් අයගේ බිරින්දෑවරුන් සමග එකතුවීම යම් කෙනෙකුගේ පිරිහීමට හේතුවක් වේ'' (Sn.108). බලන්න **විශ්වාසදායක වීම සහ ලිංගික හැසිරීම** Remarks on the Third Precept: Adultery and Prostitution in Pali Texts, Steven Collins, *Journal of the Pali Text Society*, Vol.XXIX, 2007.

## අධිෂ්ඨානය සහ යාච්ඤාව

යාච්ඤාව (අව්හායන හෝ පත්ථනා) යනු දෙවිකෙනෙකුට හෝ දෙවිවරුන්ට ආමන්ත්‍රණය කරන වචනවල එකතුවකි. සාමාන්‍යයෙන් යාච්ඤා දෙආකාරයකි - (1) උපකාර ඉල්ලමින් සහ (2) දෙවිවරුන් ඇගයීමට, මේ දෙකම ත්‍රිපිටකයේ එක් උද්ධෘතයකින් සඳහන් වී ඇත, 'ඇයදීමට, ඇගයීමට සහ දෙඅත් එක්කොට වැඳීමට' (ආයාචන්ති ථොමයන්ති පක්දජලිකා නමස්සමානා, D.1,240). එවැනි යාච්ඤා නිශ්ශබ්ද හෝ වචනයෙන් කියන, තනිව හෝ කණ්ඩායමක් වශයෙන් සිදු කෙරේ. බ්‍රාහ්මණ ආගමේ පූජනීය ධර්ම ග්‍රන්ථ වූ වේදයේ විවිධ දෙවිවරුන්ට කරන යාච්ඤා සිය ගණනක් ඇත. දෙවියන්ගෙන් නිදහස්වූ දර්ශන විද්‍යාවක් වූ බුදුදහමේ ආධ්‍යාත්මික ජීවිතයකට යාච්ඤාවේ කාර්යභාරයක් තිබේ යැයි නොසලකයි. එසේම යාච්ඤාවෙන් ඵලක් නොමැති බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. මිනිසුන් වඩාත් ආශා කරන දේවල් වන්නේ - සතුට, දීර්ඝායුෂ, දිව්‍ය ලෝකවල නැවත ඉපදීම, යනාදියයි. - 'භාරහාර සහ යාච්ඤාවලින් ලබාගැනීම' (න ආයාචනහෙතු වා න පත්ථනාහෙතු, A.111,47) නොහැකි බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. අහඹුව සහ සහසිද්ධිය යාච්ඤාවල සඵලතාවක් ලෙස විශ්වාස කිරීමට මිනිසුන් පොළඹවන බවට යෝජනා කරමින් අවධානය ගන්නාවූ ප්‍රකාශයක් මහාවස්තුවේ ඇත. එය මෙසේ කියයි: 'වරක් එක් මිනිසෙක් දිව්‍යාංගනාවකට සශ්‍රීකත්වය ලබා ගැනීම සඳහා

යාච්ඤා කළේය. පසුව ඔහු නිකම්ම පොහොසත් විය. නිශ්චිතවම වැරදි විශ්වාස ඇතිවන්නේ මෙසේය.'

නමුත් අධිෂ්ඨානය (අධිට්ඨාන හෝ දිට්ටි) සඳහා බුදුදහමේ වැදගත් කමක් ඇත. අධිෂ්ඨානය යනු ප්‍රබල අධිෂ්ඨානයකි, යම් දෙයක් අත්පත් කර ගැනීම සඳහා කරන පොරොන්දුවකි හෝ ස්ථීර අධිෂ්ඨානයකි. යම් කෙනෙකු අධිෂ්ඨානයක් කරන විට, අප පතන අරමුණ පැහැදිලි කර විඥානයේ ඉදිරියට ගෙන එයි: එය කරුණු සංවිධානය කර ඉදිරිපත් කර මනසේ බලය තියුණු කරයි. එය එම බලය අරමුණ කෙරෙහි එක්තැන් කරයි. අධිෂ්ඨාන කිරීමකට පුද්ගලයෙකු 'ස්ථීර-සිතකින්, නොසැලී සහ ශක්තිය සහ වීර්යය උරුම කරගනිමින්, ඉහළම අරමුණට අධිෂ්ඨාන' (Sn.68) කළ හැකිය. සමහර විට පෙනෙන්ට තිබෙන ආකාරයට යාච්ඤා ක්‍රියාත්මක වුණත්, බුදුදහමට අනුව, එසේ වන්නේ සැබැවින්ම මනසේ බලයේ නිසා මිසක්, දෙවිකෙනෙකුගේ මැදිහත්වීම නිසා නොවේ.

බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමේදී ඉටුකිරීමට කාර්යභාරයක් තිබුණි. උන්වහන්සේ මෙසේ අවධාරණය කළහ: ''මගේ මාංසය සහ රුධිරය වියළී ගිය පසු, මගේ සම, පටක සහ ඇටකටු පමණක් ඉතිරි කිරීම, සතුටට කරුණකි. නමුත් මිනිස් බලය, මිනිස් ශක්තිය, මිනිස් නොපසුබට උත්සාහය මා බුද්ධත්වයට පත්වන තුරු මගේ අධිෂ්ඨානයේ ධෛර්යය හීනනොවේ'' (A.1,50). මෙම වචන උන්වහන්සේට නිර්වාණය අවබෝධ කරගන්නා තුරු අවශ්‍ය ශක්තිය, විශ්වාසය සහ ධෛර්යය අවධි

කළේය, අවධානය කළේය. මානසික පවිත්‍රතාවය ඇති කිරීමෙහිලා ප්‍රබල අධිෂ්ඨානය කාර්යභාරයක් ඉටුකරන බව ද බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ. සෘණාත්මක මානසික තත්ත්වයක් ඉවත් කිරීමට ඇති සාර්ථක ක්‍රමය වන්නේ ධනාත්මක අධිෂ්ඨානයක් ඇතිකර ගැනීමෙන් සෘණාත්මක මානසික තත්ත්වයට යටත් නොවීම බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. 'මෙසේ සිතමින් මකා දැමිය හැකිය':''අනෙක් අය සාවඥ වනවිට අපි එසේ නොවෙමු. අනෙක් අය බලය පානවිට අපි එසේ නොකරමු. අනෙක් අය ඊර්ෂ්‍යා කරනවිට අපි එසේ නොවෙමු'' (M.1,42-3).

## ඇග්නොටිසම් = දෙවියන් වහන්සේ කෙනෙකු සිටී දැයි නොදැනීම

භෞතික සංසිද්ධිවලින් බැහැරව කිසිවක් නැතැයි ඇදහීම හෙවත් ඇග්නොටිසම් යනු දෙවියන් වහන්සේ කෙනෙකු සිටීදැයි නොදන්නා බවට ඇති දාර්ශනික ස්ථාවරයයි. බුදුපියාණන් වහන්සේ එම ස්ථාවරයේ සිටි බව සමහර විට කියනු ලැබේ. නමුත් මෙය නිවැරදි නොවේ. උන්වහන්සේ උත්තරීතර පුද්ගලයෙකුගේ පැවැත්ම හෝ ස්වභාවයක් සම්බන්ධ ප්‍රශ්න ආමන්ත්‍රණය කළේ කලාතුරකින් බව ඇත්තකි. නමුත් එයට එකම හේතුව එකල සිටි ප්‍රමුඛ ආගමික චින්තකයන් එවැනි ප්‍රශ්න සාකච්ඡා නොකිරීමය. බුදුපියාණන් වහන්සේවත්, ජෛන ආගමේ නිර්මාතෘ මහාවීර, පූරන කස්කප, මක්ඛලී ගෝසාල, අජිත කේසකම්බලී හෝ උන්වහන්සේලාගේ දර්ශන විද්‍යාවල උත්තරීතර පුද්ගලයෙකුගේ සංකල්පය දුන්නේ නැත. එසේම දෙවියන් වහන්සේ පිළිබඳ

අදහස සාකච්ඡා කරන විට, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ස්ථාවරය නිශ්චිතව සහ පැහැදිලිව සිදු කළහ - උන්වහන්සේ එය ප්‍රත්‍යක්ෂවම, සහේතුකව සහ සදාචාරවත් ලෙස ඔප්පු කළ නොහැකි බව පවසමින් ප්‍රතික්ෂේප කළහ.

අභිමතය සහ දෙවියන් වහන්සේ සතු යැයි කියනු ලබන සර්ව බලධාරිත්වය පිළිබඳ සංකල්පය, පරස්පරයේ ප්‍රශ්නය සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ අන්ගුත්තර නිකායේ සාකච්ඡා කළහ. යම් කෙනෙකුට ඇති වන යම් ප්‍රසන්න, වේදනාකාරී හෝ මධ්‍යස්ථ අත්දැකීමක් ඇති වන්නේ උත්තරීතර දෙවියන් වහන්සේ කෙනෙකු නිසා යැයි විශ්වාස කරන සමහර භික්ෂූන් සහ පූජකයන් ඇත. මම ඔවුන් වෙත සමීප වී එය ඔවුන් විශ්වාස කරන්නේද කියා ඇසුවෙමි. ඔවුන් එසේ යැයි කී විට මම මෙසේ ඇසුවෙමි: ''එසේ නම් ඔබ කියන ආකාරයට, යම් කෙනෙකු මිනීමරුවෙකු, හොරෙකු, සල්ලාලයෙකු, හෝ බොරුකාරයෙකු, අශිෂ්ට බස් දොඩවන්නෙකු, ලෝභී පුද්ගලයෙකු, වෛරය පිරුණු මිථ්‍යා ලබ්ධිකයෙකු නම්, ඒ සියල්ල සිදුවී ඇත්තේ උත්තරීතර දෙවියන් වහන්සේ කෙනෙකු නිසාය.'' පිළිතුර වශයෙන් යම් කෙනෙකු උත්තරීතර දෙවිකෙනෙකු මත අපහසුවකදී උරදීමට ආධාර කර ගන්නවා නම්, යමක් කිරීමට අධිෂ්ඨානයක්, කැමැත්තක්, අවශ්‍යතාවක් හෝ වැළකීමක් ඒ පුද්ගලයාට තිබිය (තර්කාන්විතව) යුතු නොවේ. එවැනි පුද්ගලයෙකු ව්‍යාකූලවූ, හානිවිය හැකි, සහ සැබෑ භික්ෂුවක් හෝ පූජකයෙකු යැයි අවංකවම හැඳින්විය නොහැකිය. එවැනි අදහස්, එවැනි මත

විශ්වාස කරන අයට මෙය මගේ නිවැරදි නිශ්ප්‍රභ කිරීමයි.' (A.1, 174) බ්‍රාහ්මණ ආගමේ උත්තරීතර දෙවියන් වහන්සේ වූ බ්‍රහ්ම, සර්ව බලධාරීවරයෙකු වූ බව, ආදරණීය දෙවියෙකු සහ ලෝකයේ තිබෙන ප්‍රතික්ෂේප කළ නොහැකි දුක්විඳීම් සහ දුෂ්ටකම් යන ප්‍රකාශ අතර ඇති පරස්පර බව ජාතක පොතේ මතුකර දක්වා ඇත (Ja. vi. 208). උත්තරීතර පුද්ගලයෙකු සම්බන්ධයෙන් මේවා හෝ බුදුපියාණන් වහන්සේගේ වෙනත් ඕනෑම ප්‍රකාශයන් සම්බන්ධයෙන් භෞතික සංසිද්ධිවලින් බැහැරව කිසිවක් නැතැයි අදහන කිසිවෙකු නැත. බලන්න **අධිෂ්ඨානය සහ දේව වාදය**

**මද්‍යසාර**

මද්‍යසාර, පැසවීම තුළින් නිපදවන රසායන ද්‍රව්‍යයකි. එය ප්‍රධාන ස්නායු පද්ධතිය මර්දනය කරමින් උකහා ගත්විට මත්වීම සිදු කරයි. මද්‍යසාර අඩංගු බීම සාමාන්‍යයෙන් වෙනස් වූ වර්ග තුනකට වර්ග කර ඇත; ධාන්‍ය වර්ග පැසවීමෙන් නිපදවන බියර්, පලතුරු පැසවා වයින් සහ බියර් හෝ වයින් පෙරා ස්ප්‍රිතු ද නිපදවනු ලබයි. මද්‍යසාර අඩංගු ප්‍රධාන බීම වර්ග හතරක් ත්‍රිපිටකයේ සඳහන්ව තිබේ. සුරා: හාල් හෝ පිටිවලින් පැසවා සාදනු ලැබේ (Sn.398; Vin.1.205). මෙරය: සීනි හෝ පලතුරු සහ සමහර විට සීනි, ගම්මිරිස් හෝ එක් විශේෂ ගසක පොතුවලින් රස කෙරේ (M.1,238). මජ්ජ: නිපදවන්නේ මීපැනි සහ ආසව, තල්ගසේ හෝ කැළෑ රටඉඳි ගසේ යුෂ වලිනි ( Vin. 11,294 ). ධර්ම ග්‍රන්ථවල සඳහන් වෙනත් මද්‍යසාර අඩංගු බීම වර්ගවලට ජලොගි, කපොතික, මධු, පසන්න සහ

වාරුනි ඇතුළත් වේ. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී මත්ද්‍රව්‍ය පෙරීම සිදුවූවාද යන්න නිශ්චිත නැත. නමුත් පානිනි ගේ අෂ්ටාධ්‍යායී *Aṣṭādhyāyī* නාමාවලියට අනුව, ස්ත්‍රීතු නිෂ්පාදනය පිළිබඳව එක්තරා ප්‍රමාණයකට අඟවයි. තැබෑරුම් (පානාගාර, සුරාගෙහ, Ja,1,304; 350; Vin. 11,267) පිළිබඳව බොහෝ සඳහන් ත්‍රිපිටකයේ ඇත. සමහර විට සම්පූර්ණ සතියක්ම මද්‍යසාර බොන්නා සිහින ලෝකයක මස් හෝ මාලු කමින් මද්‍යසාර භාවිත කරමින් සිටී (Ja. 11. 211; 111, 220, 287; Vin, 12; 466), සහ මද්‍යසාර ප්‍රාදේශීය ස්වරූපයෙන් භූතයන්ට සහ දෙවිවරුන්ට පිළිගන්වයි (Ja.1,425; 489).

මද්‍යසාරවල ආරම්භය පැහැදිලි කිරීමේදී බොහෝ සංස්කෘතීන්ට අයත් ජනප්‍රවාද ඇත. එය දෙවිවරුගෙන් ලැබුණු තෑගයක් යන මතය බොහෝ විට ඇතුළත් කෙරේ. මද්‍යසාර ලෝකයට පැමිණියේ කෙසේද යන්න පැහැදිලි කිරීමට බොරු ප්‍රශංසා අඩුවෙන් සහ වඩා සාධාරණ ලෙස ඒත්තු ගත හැකි සේ පෙනෙන කථාවක් ජාතක පොතේ සඳහන් වේ. බොහෝ කාලයකට ඉහතදී එක් නිශ්චිත වනයක එක් ගසක ප්‍රධාන කඳේ විශාල වළ ගැසීමක් සහිත දෙබලක් තිබුණි. වැහි වතුර මෙම වළේ එක්රැස් විය. ගහේ පලතුරු ඒ තුළට ඇද වැටී හිරු එළියෙන් එම පලතුරු පැසුණි. ග්‍රීෂ්ම ඍතුවේදී, පිපාසිත පක්ෂීහු එම වළෙන් වතුර බී මත්වී පොළොව මත පතිත වී, ටික වේලාවක් නිදාගෙන සිට පියඹා ගියහ. මෙය නිරීක්ෂණය කළ දඩයක්කාරයෙක් එයට හේතුව පිළිබඳව කුතුහලයට පත්ව, එම ද්‍රව්‍යයෙන් කොටසක් භාවිත කර මත්වූයේය. පසුව ඔහු එය ඔහුගේ

මිත්‍රයන්ටද හඳුන්වා දුන්නේය. මද්‍යසාර හඳුන්වා දීම සිදුවූයේ මෙසේය. ජාතක පොතට අනුව, මෙම සොයාගැනීම අප්‍රමාණ සමාජයීය වැරදිවලට හේතුවිය (Ja. V. 12 - 20).

සියලු බෞද්ධයන් පුහුණු කිරීමට බාර ගන්නා පංචශීලයේ පස්වන ශික්ෂාපදය වන්නේ මද්‍යසාර හෝ වෙනත් විනෝදාත්මක මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීමයි. මද්‍යසාර සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන්ම මද්‍යසාරවලින් මත්වීම මනස අපැහැදිලි කරයි. මේ අතර, බුදුදහමේ සම්පූර්ණ අභිමතය වන්නේ මනස පිරිසිදු කර ගැනීමයි. කෙසේ නමුත්, මද්‍යසාර භාවිතයෙන් වෙනත් බොහෝ පෞද්ගලික සහ සමාජයීය අවාසි ද ඇති කරයි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''මද්‍යසාර භාවිතයෙන් මෙම හය ආකාර උවදුරු ඇති වේ: වස්තුව නැතිවීම, දබරවීම් වැඩිවීම, අයහපත් සෞඛ්‍ය තත්ත්වයන් ඇතිවීම, අපකීර්තිය ඇතිවීම, තමන් මෝඩයෙකු වීම සහ බුද්ධිය දුබල වීම යන හයයි'' (D. 111.182). යම් කෙනෙකු පස්වන ශික්ෂාපදය කැඩුවහොත්, එය අනෙක් ශික්ෂාපද කැඩීමට හේතුවිය හැකි බව බෞද්ධ සම්ප්‍රදාය සඳහන් කරයි.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව, තායිලන්තයේ මද්‍යසාර භාවිතය ලෝකයේ මද්‍යසාර භාවිතවන රටවල් අතරින් 45වන ස්ථානයට පත්වී ඇත. එය බහුතරයක් බෞද්ධ රටවලට වඩා බොහෝ ඉහළය.

'Alcoholic Fermentation and its Products in Ancient India', K. T. Achaya, *Indian Journal of History of Science*, XXVI,1991.

## පිණ්ඩපාතයේ වැඩම කිරීම

බෞද්ධ භික්ෂූන් සහ භික්ෂුණීන් ආහාර ලබා ගන්නා ක්‍රමයවූ පිණ්ඩපාතයේ වැඩම කිරීම (පිණ්ඩපාත) යනුවෙන් අදහස් කරනු ලැබේ. මෙම පුරුද්ද සිඟා කෑමෙන් වෙනස් වේ. සිඟන්නෙකු පිනට යමක් ඉල්ලයි, නැතිනම් ආයාචනය කරයි. නමුත් භික්ෂූන් සහ භික්ෂුණීන් කරන්නේ දන්දෙන්නට හැකියාවක් ඇති පුද්ගලයෙකුගේ නිවස ඉදිරිපිටට ගොස්, නිශ්ශබ්දව සුළු වේලාවක් රැඳී සිට යම් දෙයක් ලැබීමෙන් පසු එතැනින් පිටවීමයි. මහාවස්තුවේ මෙසේ සඳහන් වේ: ''ප්‍රඥාවන්ත භික්ෂූහු කිසිම දෙයක් නොඉල්ලති, උතුම් පුද්ගලයෝ ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳව ඉඟි නොකරති. ඔවුහු හුදෙක් සිටගෙන උන්වහන්සේලාගේ පාත්‍රය පෙනෙන්නට ඉඩ හරිති. මේ උතුම් පුද්ගලයන් ආහාර ලබා ගන්නා ආකාරයයි.'' පිළිගැනීමේ සහ කෘතඥතාවය දැක්වීමේ ව්‍යායාමයක් වශයෙන් තමන්වහන්සේලාගේ පාත්‍රයට පිළිගන්වන ඔනෑම දෙයක් වැළඳීම භික්ෂූන් සහ භික්ෂුණීන් වහන්සේලාගෙන් බලාපොරොත්තු වේ. විශේෂයෙන්ම ගම්භීර හා දැඩි සේ භික්මුණු මහා කාශ්‍යප මහරහතන් වහන්සේ පිළිබඳ කථාවක් මෙම පුරුද්ද ශක්තිමත් කිරීම සඳහා පවසා ඇත. වරක් ලාදුරු රෝගියෙකු උන්වහන්සේට ආහාර ටිකක් පිළිගැන්වීමේදී එම අසරණ පුද්ගලයාගේ ඇඟිල්ලක් උන්වහන්සේගේ පාත්‍රයට වැටී ඇත. උන්වහන්සේ මෙම ඉතාමත් අහර රුචිය නැතිකරන කැබැල්ල අනෙක් ආහාර සමග කිසිම මැසිවිල්ලක් නොමැතිව වැළඳුවහ (Th.1054 - 6). පාත්‍රවලට ආහාර ලබා ගැනීම

සහ වැළඳීම භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට පණවා ඇති අට ආකාර අත්‍යවශ්‍ය කාරණාවලින් එකකි. ශ්‍රී ලංකාවේ පිණ්ඩපාත වැඩීමේ පුරුද්ද නැතිවී ගොස් ඇත. නමුත් බුරුමයේ, තායිලන්තයේ සහ කාම්බෝජියාවේ එය තවමත් නිතර සිදුවේ. බලන්න **පාත්‍රය අනෙක් පැත්ත හැරවීම**

## පරහිතකාමීත්වය

පරහිතකාමීත්වය යනු තමාට පෙර හෝ ඊට වඩා අන් අයගේ යහපත ගැන සිතීම හා ක්‍රියා කිරීමයි. දේවධර්මාචාර්යවරුන් සහ දාර්ශනිකයන් සැබැවින්ම අවංකවම පරහිතකාමීත්වය කළ හැකිද යන්න පිළිබඳව බොහෝ තර්ක කර ඇත. බුදුපියාණන් වහන්සේ 'ස්වයං හෝ වෙනත්' දුෂ්කර තත්ත්වයක් මඟහැර සිටියේ, අප, අප තුළ යම් යම් වෙනස්කම් සිදු කළ විට අපට අන්‍යයන්ට වඩා හොඳින් වාසි සැලසීමට හැකි බව උන්වහන්සේ අවබෝධ කරගත් නිසාය. සත්‍ය සඳහා බුදුපියාණන් වහන්සේ සිදුකළ වසර හයක පරිශ්‍රමය උන්වහන්සේට ඉතිරි වසර 45 අනෙක් අයට සත්‍යය උගන්වමින් කාලය ගතකිරීමට ඉඩ සලසා දී ඇත. එසේම අනෙක් අයට යහපත සිදුකිරීමෙන් කෙනෙකුට නිතර තමාගේ යහපත සඳහා ඔහු හෝ ඇය වෙනස් කරන බව ද උන්වහන්සේ අවබෝධ කරගත්හ. ආනන්ද හිමියන් විසින් බොහෝ කාලයක් 'කයෙන්, වචනයෙන් සහ මනසින් ආදරය ප්‍රකාශ කිරීම තුළින්' උන්වහන්සේට - බොහෝ විට භාවනා කිරීමට සුළු වේලාවක් පමණක් ඉතිරිවී තිබියදීත්, - රහත්ඵලය (D. 11.143) ලැබීමට ආසන්න වීම පිළිබඳව වරක් බුදුපියාණන්

වහන්සේ ප්‍රකාශයක් සිදුකළහ. ඒ අනුව, බෞද්ධයන්ට එය ආත්මාර්ථකාමීත්වය සහ පරාර්ථකාමීත්වය අතර තෝරාගැනීමක් නොව, නමුත්, තමන් සහ අනෙක් අය සමග එකමුතුවීම පිළිබඳවයි. බුදුපියාණන් වහන්සේ ඉතාමත් වැදගත් දේශනාවකින් මෙසේ පැවසූහ: ''ලෝකයේ මේ ආකාර මිනිසුන් වර්ග හතරක් ඇත. ඒ හතර මොනවාද? තමන් හෝ අනුන් පිළිබඳව සැලකිල්ලක් නැති පුද්ගලයා, අනුන් ගැන සිතන, නමුත් තමන් ගැන නොසිතන පුද්ගලයා, තමන් ගැන සිතන, නමුත් අනුන් ගැන නොසිතන පුද්ගලයා, සහ තමන් සහ අනුන් ගැන සිතන පුද්ගලයා යනුවෙනි. මේ අතරින් තමන් සහ අනුන් ගැන සිතන පුද්ගලයා ප්‍රධාන වේ, ඉතා උසස්, වඩාත් උසස්, ඉහළම උත්තරීතර වේ'' (A.11.95). බලන්න **ආදරය සහ අනුකම්පාව**

*Altruism: the Power of Compassion to Change Yourself and the World*, Matthieu Ricard, 2015.

## අම්බපාලී

අම්බපාලී වේසාලියේ ජීවත්වූ ධනවත් සහ නිපුණ ගණිකාවකි. එකල ඇය ඉතා රූමත් තැනැත්තියක ලෙස හඳුනාගෙන තිබුණි. ඇය 'දැකීමට සතුටුදායක, සිත්ගන්නාසුලු, කැළලක් නැති, සමේ ස්වාභාවික වර්ණයක් ඇති සහ ගායනයේ, නැටුමේ සහ බටනලා වාදනයේ නිපුණ' තැනැත්තියක ලෙස විස්තර සඳහන් වේ (Vin.1.268). එසේම ඇයට වේසාලියෙන් අවට විශාල අඹ උයනක් අයිතිව තිබුණි. බුදුපියාණන් වහන්සේ සහ සමහර භික්ෂූහු ඉඳහිට එහි වැඩ විසූහ (උදාහරණ A.IV,100; S.V,141; 301). බුදුපියාණන් වහන්සේ වේසාලියේ අවසාන වතාවට

වැඩ වසන විට, උන්වහන්සේට ආශ්‍රමයක් ලෙස භාවිත කිරීම සඳහා එම අඹ වනය පූජා කළාය. (D.II,95-7). මීට කාලයකට පසු, සමහර විට ඇයගේ මහලු වියේදී, අම්බපාලී භික්ෂුණියක් වූවාය. විශ්වාසයට අනුව අවසානයේ ඇය රහත්ඵලයට පත් වී ඇත.

ථේරීගාථාවේ ඇය විසින් රචිත පද 19කින් යුක්ත කවියක් ඇත. හද සසල කරවමින් ඇය ඇයට තිබූ රූපශ්‍රීය සහ ඇගේ මහලු වියේදී ඇගේ පෙනුමත් සසඳයි (Thi.252 - 70). මීට වසර දාහකට පසු චීන ජාතික වන්දනාකරු හියුං ඝාං වේසාලියේ සිටින විට, අම්බපාලිගේ අඹ වනයේ ඉදිකර තිබූ ආශ්‍රමය තවමත් ක්‍රියාත්මක වන බවත්, ඇය තවමත් සිහි කරන බවත් ඔහුට දැනගන්නට ලැබුණි. බලන්න **කෙස්, ගණිකා වෘත්තිය සහ ස්ත්‍රීන්**

## අභිලාෂය සහ ප්‍රාර්ථනාව

අභිලාෂය (ඡන්ද හෝ ඉච්ඡා) යනු පෞද්ගලික ප්‍රයෝජනයක් - වස්තුව, බලය, තත්ත්වය හෝ ප්‍රසිද්ධිය - ලබා ගැනීමට ඇති ප්‍රබල ආශාව වන අතර, ප්‍රාර්ථනාව (පත්ථනා) යනු යම් උදාර දෙයක් ලබා ගැනීමට ඇති සුමට, නමුත් දැඩි අධිෂ්ඨානයකි. අභිලාෂයට ඇති ඉංග්‍රීසි වචනය එන්නේ ඇම්බිටියොනම්, හෙවත් 'විශේෂ ආකාරයකට හැසිරීම' යන අරුත ඇති ලතින් වචනයකි. ප්‍රාර්ථනාවට ඇති ඉංග්‍රිසි යෙදුම 'ප්‍රශ්වාස කිරීම' යන අරුත ඇති ප්‍රංශ ඇස්පිරර් යන වචනයෙන් පැවත එයි. එසේම එය හුස්ම යන අරුත ඇති ස්පිරිටස් යන ලතින් වචනයට සම්බන්ධ වේ. අභිලාෂය

අනිවාර්යයෙන්ම ඍණාත්මක නොවේ. නමුත් එයට අවශ්‍ය දේ ලබා ගැනීම සඳහා අවංකත්වයේ පරිශ්‍රමය අභිබවා යාමේ ප්‍රවණතාවක් ඇත. එසේම එයට අවශ්‍ය දේ ලැබූ පසු, එය සමහර විට අනිසි ලෙස භාවිත කරයි. මෙයට උදාහරණ වශයෙන්, සාර්ථකවූ නළුවන් අවසානයේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම, තරු ක්‍රීඩකයන් තවත් පදක්කමක් දිනා ගැනීම සඳහා වංචා කිරීම, තවත් වස්තුව එක්ෂස් කිරීම සඳහා පොහොසත් ව්‍යාපාරිකයන් හෝ තමන්ගේ කොටස් හිමියන්ට බදු ගෙවීම පැහැර හැරීම ආදී වශයෙනි. බුදුපියාණන් වහන්සේ පැවසූ ආකාරයට: ''මෝඩයා වස්තුව කෙරෙහි ඇති කෑදරකම නිසා නොදැනුවත්වම තමන්ම පිරිහීමට පත්වෙයි.'' (Dhp.355) අභිලාෂය බොහෝ විට හුදෙක් අප 'වටේට කැරකෙන්නට සලස්වයි.' ඒ තවදුරටත් අප සංසාරයේ පැටලවීමයි. අභිලාෂය මත පදනම් වූ ජීවිතය පිළිබඳ දර්ශන විද්‍යාව, පැහැදිලි කිරීමට ඇමරිකාවේ ඊනියා ස්වයං අභිවෘද්ධි ව්‍යාපාරය හොඳ උදාහරණයකි. 'විශිෂ්ටත්වයට ඇති ආශාව', 'ඔබට විය හැකි හොඳම තැනැත්තා වීමට' සහ 'සමාජයට දායක වීමට', යන මේ සියලු කථා පිටුපස ඇත්තේ අමු ලෝභකම සහ ආත්මාර්ථකාමීත්වයයි.

ප්‍රාර්ථනාව යනු කල්පනාකාරී බව, සෘජුබව සහ අනෙක් අයගේ යහපතද කල්පනාවට ගත් ස්වයං කැමැත්ත සමගින් සකස්වූ ආශාවකි. අභිලාෂය සම්පූර්ණයෙන්ම අරමුණ මත අවධානය යොමු කරන අතර, ප්‍රාර්ථනාව අරමුණ හෝ එය අත්පත් කර ගැනීමට භාවිත කරන උපක්‍රමවල දැක්ම කිසිවිටක නැතිකර නොගනියි. අපගේ අරමුණ ඉටුවූ පසු

ප්‍රාර්ථනාව අපට 'නිදහසේ හුස්ම ගැනීමට' (අස්සාස, M. 1. 64) ඉඩ සලස්වයි. එයට හේතුව අපගේ වටිනාකම් අපකීර්තියකට පත් නොකරමින් හෝ අනෙක් අයට හානියක් නොකරමින් එය අප ඉටු කර ඇති බව දනිමු. ලෞකික ජීවිතයේ අරමුණු මෙම ජීවිතයට ප්‍රයෝජනවත් වන බවත්, ආධ්‍යාත්මික අරමුණු මේ ජීවිතයේදී සහ ඊළඟ භවයේදීත් යහපත ඇති කරන බවත්, ප්‍රාර්ථනා අවබෝධ කර ගනියි. එසේම අවසානයේදී සම්පූර්ණ සමාප්ති තත්ත්වයට යොමුවන අතර, අපට තව දුරටත් වෙනත් කිසිම අරමුණකට උත්සාහ කරන්නටද අවශ්‍ය නොවේ, ඒ නිර්වාණයයි. එවැනි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, ''තමන්ගේ සම්පූර්ණ කැමැත්ත යෙදිය යුතුයි, වෙහෙසිය යුතුයි, ප්‍රබල උත්සාහයක් දැරිය යුතුයි, තමන්ගේ මනස යොමු කළ යුතුයි, සහ අධිෂ්ඨාන කළ යුතුයි'' යනුවෙන් බුදුපියාණන් වහන්සේ වදාළ සේක (A.1V.364). පුද්ගලයෙකු ධර්මය පුහුණු කිරීමේදී 'තමන්ගේ ආශාවන් කෙරෙහි මධ්‍යස්ථ විය යුතු බව' බුදුපියාණන් වහන්සේ වදාළ සේක. ඒ අපේ ප්‍රාර්ථනාව අභිලාෂය යන තත්ත්වයට පත්වී පිරිහීමට ලක් නොවන සේ වැදගම්මක් ඇති අරමුණු කෙරෙහි අපේක්ෂා කිරීම යනුවෙන් අදහස් කිරීමයි. බලන්න **අතරමැදි කුසලතාවන්**

## ආනන්ද

ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුපියාණන් වහන්සේගේ ඥාති සහෝදරයෙක් වේ. බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ අවසාන අවුරුදු 35දී ආනන්ද හිමියන් උන්වහන්සේගේ පෞද්ගලික පරිවාරක සහ උපස්ථායක ලෙස කටයුතු කර ඇත. එසේම

උන්වහන්සේ වඩාත් බහුල ලෙස ආදරයට බඳුන් වූ ශ්‍රාවකයාය. සාරිපුත්ත මහරහතන් වහන්සේ ප්‍රඥා ගුණයෙන් ද, මුගලන් මහරහතන් වහන්සේ ඍද්ධිබල ගුණයෙන් ද, ආනන්ද මහරහතන් වහන්සේ නිසැකවම කරුණාව, මෘදුබව, සානුකම්පිත බව සහ ආදරය යන මේ ගුණයන්ගෙන් පරිපූර්ණ වූහ. උන්වහන්සේ විසින් 'කයෙන්, වචනයෙන් සහ මනසින්' සිදු කරන ලද සියලු ආදරණීය ක්‍රියා පිළිබඳව බුදුපියාණන් වහන්සේ ඇගයූ සේක (D. 11,144). මෙයින් අදහස් වූයේ ආනන්ද හිමියන් සැමවිට උපකාර කිරීමට සූදානම් වූ බව, සැමවිට මිනිසුන්ට කරුණාවෙන් කථා කළ බව, සහ අනෙක් අය ගේ සුභසිද්ධිය පිළිබඳව සිතූ බවයි.

තමන් වහන්සේට තිබූ ඇතැම් ගුණාංග හරියටම ආනන්ද හිමියන්ටත් තිබූ බව බුදුපියාණන් වහන්සේ පැවසූහ - ඒ තමන් වහන්සේ දැකීමෙන් මිනිසුන් සතුටට පත්වීම, තමන් වහන්සේ ධර්මය කියාදුන් විට මිනිසුන් සතුටට පත්වීම සහ එසේම තමන් වහන්සේ දේශනා අවසාන කළ විට මිනිසුන් කනස්සල්ලට පත්වීම යනාදියයි (D.11.145). පළමු ධර්ම සංගායනාවේදී ආනන්ද හිමියන්ට ඉතා වැදගත් කාර්යභාරයක් තිබුණි. බුදුපියාණන් වහන්සේ සමග බොහෝ වසර ගණනාවක් ඉතා සමීපව ගත කිරීමෙන් සහ උන්වහන්සේගේ බොහෝ ධර්ම දේශනා මතක තිබීමෙන්, ආනන්ද හිමියන් ධර්ම සංගායනාවේදී ඒවා සජ්ඣායනය කළ අතර, අනෙක් සහභාගීවූවන් ඒවා මතකයට නැඟීමේ යෙදුණි. ඊට පසු ඒවා ඊළඟ අයට පවරන්නට යෙදුණි. එය ආනන්ද හිමියන්ගේ වචනයෙන්, 'මෙසේ මම

ඇසුවෙමි .... (එවං මෙ සුතං ...), යනුවෙන් බොහෝ සූත්‍ර ආරම්භ වේ. *Great Disciples of the Buddha*, Nyanaponika Thera and Hellmuth Hecker, 1997.

## අනත්තා

අනත්තා යනුවෙන් අදහස් වන්නේ ආත්මයක් නැතැයි යන්නයි. බුදුපියාණන් වහන්සේගේ ඉතාමත් උත්තරීතර සහ මූලික ඉගැන්වීම අනත්තා යන ධර්මයයි. අපගේ වෙනස්වන ශරීරයෙන් ඔබ්බට, මනස සහ අත්දැකීම් වෙනස් නොවන සහ අද්විතීය මමත්වය හෝ ස්වයං වන බවත්, එය සමහර විට ආධ්‍යාත්මය, ආත්ම හෝ ජීවය වශයෙන් හඳුන්වන බවත් සාමාන්‍යයෙන් උපකල්පනය කෙරේ. මෙම ස්වයං යන්න 'මම' යනුවෙන් අඳුනා ගනිමින්, අනෙක් දේවල් 'මගේ': 'මගේ බිරිඳ', 'මගේ දේපළ', 'මගේ ආගම', 'මගේ රට', ආදී වශයෙන් හඳුනා ගැනේ. බුදුපියාණන් වහන්සේට අනුව මෙය ලෝභය, භය, මෝහය, වෛරය සහ ආත්ම වංචනය තුළින් මිනිසුන් තමන් සහ අනෙක් අය බොහෝ දැඩි ව්‍යසනයට සහ වේදනාවට පමුණුවන හේතුව වේ. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'ශරීරය ආත්මය නොවේ, හැඟීම් ආත්මය නොවේ, හැඳින ගැනීම ආත්මය නොවේ, මානසික නිර්මාණයන් ආත්මය නොවේ, සහ විඤ්ඤාණය ආත්මය නොවේ ... මෙය යම් කෙනෙකු දකින විට, එම පුද්ගලයා මේ දේවලින් ඈත් වේ. මෙසේ ඈත්වීමෙන්, තද ආශාවන් නැතිවෙයි. ආශාවන් නැතිවූ විට, එම පුද්ගලයා නිදහස් වෙයි. නිදහස් වූ විට, එම පුද්ගලයා තමන් නිදහස් වූ බව දැනගනී (S.111,66-7). බුදුදහම ආත්මය විනාශ කිරීමට උත්සාහ කරන බව සමහර විට කියනු ලැබේ. මෙය නිවැරදි නොවේ. හුදෙක් විනාශ කිරීමට

ආත්මයක් නැත. බුදුදහමේ පරමාර්ථය වන්නේ ආත්මය වශයෙන් ගන්නා දෙය සැබැවින්ම මායාවක් බව දැකීමයි. බලන්න **පටිච්චසමුප්පාදය සහ හිස්බව.**
*Selfless Persons*, Steven Collins, 1982.

## අනත්තා සහ නැවත ඉපදීම

බුදුදහම නැවත ඉපදීම ගැන සහ ආත්මයක් (අනත්තා) නැතැයි උගන්වන බව සමහර මිනිසුන් දැන ගන්නා විට, නැවත ඉපදීමක් සිදුවන්නේ කෙසේ දැයි තේරුම් ගැනීම ඔවුන්ට අපහසු වී ඇත. 'ආත්මයක් හෝ අධ්‍යාත්මයක් නොමැති නම්, එක් ජීවිතයකින් ඊළඟ භවයට ඉදිරියට යන්නේ කුමක් දැය' ඔව්හු අසති. මෙම ගැටළුව යථාර්ථයට වඩා වැඩියෙන් පැහැදිලිව පෙනේ. ආත්මයක් නැතැයි යන දෙයක් බුදුපියාණන් වහන්සේ උගන්වා නැත - උන්වහන්සේ ඉගැන්වූයේ ස්ථීර, වෙනස් නොවන, අතිශය ගුඪ ආත්මයක් නැති බවයි. බුදුදහමේ ද නූතන මනෝවිද්‍යාවේ මෙන් ආත්මය අවබෝධ කරගෙන ඇත්තේ තැනීමක්, නිරන්තරව ක්‍රමයෙන් ඇතිවන හැඟීම්, මතකයන්, ගතිලක්ෂණ සහ චිත්ත ස්වභාවයන් සමූහයක් ලෙසයි. ඊළඟ භවයට නොකඩවා පවත්වාගෙන යන්නේ මෙම 'ආත්මයයි'. එය පේළියක ඇති බිලියඩ් බෝල තුනකට සමාන කළ හැකි අතර, ඒවා එකිනෙකට ස්පර්ශ වන අතර, හතරවන බිලියඩ් පන්දුව තුන්වෙනි පන්දුවෙන් මඳක් ඈතින් ඒවාට පෙළ ගැසී ඇත. ක්‍රීඩකයෙක් සිය දිග බිලියඩ් යෂ්ටියෙන් හතරවන පන්දුවෙන් පහර දුන්නොත්, එය මේසය හරහා වේගයෙන් ගමන් කර, පේළියේ තිබෙන පළමු පන්දුවට පහර දෙයි. චලනය වන පන්දුව ක්ෂණිකව නතර වනු ඇත. පළමු සහ දෙවන පන්දු නිශ්චලව රැඳී පවතිනු ඇත. පේළියේ

අවසාන පන්දුව වන තුන්වන පන්දුව මේසය හරහා පොකැට්ටුවට වේගවත්ව ගමන් කරයි. සිදුවී ඇත්තේ කුමක් ද? සිව්වන පන්දුවේ ශක්තිය පේළියේ පළමු හා දෙවන පන්දුව හරහා තුන්වන පන්දුව තුළට ගමන් කර එය සක්‍රීය කළවිට එය මේසය හරහා ගමන් කරයි.

ඒ හා සමානවම අපට පහසුවෙන් 'ස්වයං' ලෙස හැඳින්විය හැකි දේ වන මානසික ශක්තිය එක් ශරීරයකින් තවත් ශරීරයකට ගමන් කරයි. ඇත්ත වශයෙන්ම මෙම ශක්තිය මාධ්‍යයක් හරහා ගමන් කර වෙනත් වස්තුවක් සජීවී කරණය කිරීමට හරියටම ඉඩ දෙන දෙය නම් එයට ඇති වෙනස්වීමේ හැකියාවයි. (අනිච්ච) එය මෙය නොවේ. නමුත් ආත්මයකට හෝ ජීවයකට වෙනස් නොවී එක් ස්ථානයකින් හෝ තත්ත්වයකට යා හැකිය යන අදහස පැහැදිලි කිරීම අපහසුය.

**කෝපය**

කෝපය (කොධ) යනු යම් කෙනෙකුගේ ආශාවන් ඉටු කර ගැනීමේ ප්‍රයත්නයන් අසාර්ථක වූවිට අත්දකින සෘණාත්මක හැඟීමයි. බුදුපියාණන් වහන්සේ පැවසුවේ කෝපයට මනස ප්‍රකෝප කිරීමට ඇති හැකියාව නිසා එය සියලු මිනිස් චිත්තවේගයන්ගෙන් වඩාත්ම විනාශකාරී එකක් බවයි. සෞන්ද්‍රානන්දකාව්‍යය මෙසේ සඳහන් කරයි: ''මේ ලෝකයේ තවත් පුද්ගලයෙකුට වෛරී චේතනා ඇති මනසකින් හානියක් නොවිය හැකි නමුත්, එවැනි මනසක් ඇති පුද්ගලයා වහාම පිළිස්සී යනු ඇත. එමනිසා, ඔබ වෛරය සහ කලහකාරී වීම වෙනුවට,

සියලු ජීවීන් කෙරෙහි ආදරය සහ කරුණාව තෝරාගත යුතුයි.''

බෞද්ධ මනෝවිද්‍යාව කෝපය පිළිබඳ විවිධ ප්‍රකාශනයන් සහ තීව්‍රතාවන් හඳුනා ගනී - ඒ මෘදු කෝපය, තරහ, නොරිස්සුම, අධික අසහනය, ප්‍රචණ්ඩ, අමනාපය, සිත් රිදැවුම ආදියයි. ඒවා සමග කටයුතු කිරීමට විවිධාකාර ප්‍රායෝගික ක්‍රම ඉදිරිපත් කර ඇත. ඇත්ත වශයෙන්ම කෝපය පාලනය කර ගැනීම අත්‍යවශ්‍යය. නමුත්, ඉන් ඔබ්බට, යම් කෙනෙකුට එහි හේතූන් සමඟ කටයුතු කළ යුතුයි. කෝපය සහ ආශාව අතර ප්‍රබල සම්බන්ධතාවක් ඇත - අපගේ ආශාව ශක්තිමත් වන තරමටම, එම ආශාව ඉෂ්ට කර ගැනීම අසාර්ථක වූ විට අපගේ කෝපයද වැඩි වේ. එම නිසා, කෝපයට අනුකූල වීමේ පළමු පියවර වන්නේ ආශාවන් වෙනස් කිරීමයි. කෙසේ නමුත් කෝපය මුළුමණින්ම තුරන් වන්නේ මමත්වය හෝ ආත්මය පිළිබඳ හැඟීම අවබෝධ කරගත් පසුයි. බලන්න **මානසික දූෂණය**
*Curbing Anger, Spreading Love*, Bhikkhu Visuddhacara,1992.

## අංගුත්තර නිකාය

අංගුත්තර නිකාය යනු බුදුදහමේ පූජනීය ග්‍රන්ථ වන ත්‍රිපිටකයෙහි සූත්‍ර පිටකයේ හතර වන ග්‍රන්ථයයි. අංගුත්තර යන්නෙහි අර්ථය 'අතිරේක කොටස්' යන්නයි. සියලු ධර්ම දේශනා හෝ සූත්‍ර 2344ම සංඛ්‍යාත්මක පද්ධතියකට අනුව එකේ සිට එකොළහ දක්වා මෙම ග්‍රන්ථයේ සකස් කොට ඇත. ත්‍රිපිටකයේ වෙනත් කිසිම ග්‍රන්ථයකට වඩා ඉතා විශාල වශයෙන් විවිධත්වයෙන් යුක්ත විෂයයන් සමග අංගුත්තර

නිකායේ සාකච්ඡා කරයි.
*Numerical Discourses of the Buddha*, trans. by Nyanaponika Thera and Bhikkhu Bodhi, 1999.

## සත්ත්වයන්

සත්ත්වයන් (සත්ත හෝ තිරච්ඡාන) මිනිසුන් නොවන, නිශ්චිත හැඩයක් ඇති සචේතනික ජීව ස්වභාවයකි. බුදුපියාණන් වහන්සේ සත්ත්වයන් වර්ගීකරණය කළේ බිත්තරවලින්, ගර්භාෂයෙන්, ජලයෙන් හෝ ඕපපාතිකව උපත ලැබුවාද යන්න මතය (S. 111.240). අනෙක් චේලාවට, සත්ත්වයන් බොහෝ පාද තිබෙන, පාද හතරක්, පාද දෙකක් හෝ පාද නොමැති (උරග) යනුවෙන් උන්වහන්සේ වර්ගීකරණය කළහ (Vin. 11.110). බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''සත්ත්ව ලෝකය ජීවීන් තරම් විවිධාකාරවූ වෙනත් කිසිම වර්ගයක් ගැන මම නොදනිමි'' (S.111, 152: Sn. 600 ff) මනුෂ්‍යයන්ට වඩා සත්ත්වයන් වශයෙන් බොහෝ ජීවීන් උපත ලබන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.1.35). සත්ත්ව රාජ්‍යය පාලනය වන්නේ 'එකිනෙකා ආහාරයට ගැනීම සහ දුර්වලයන් ගොදුරු කර ගැනීම' යන මූලධර්මයෙන් නිසා, මිනිසෙකු ලෙස නොව සතෙකු ලෙස නැවත ඉපදීම පැහැදිලි අවාසියකි (M.111.169).

සතුන් මිනිසුන්ට වඩා පහත් යැයි බුදුපියාණන් වහන්සේ සැලකුවේ ඔවුන්ට ධර්මය වටහා ගැනීමේ මානසික හැකියාවක් නොමැති වීම සහ තිබෙන්නේ අසම්පූර්ණ හරි වැරදි දැනීමක් නිසාය. ඒ තල්මසුන්, ඩොල්ෆින්, චිම්පන්සි ආදී සත්ත්වයන්ය. මේ සත්ත්වයන් සමහර විට කරුණාවන්ත බව, ත්‍යාගශීලී

බව, අනුකම්පාව, පක්ෂපාතිත්වය ආදිය පෙන්වයි. පැවිදි නීතිය යටතේ මිනීමැරීම භික්ෂුත්වයෙන් නෙරපා හැරීමට තරම් වන වරදක් වන අතර, සතෙකු මැරීම සම්බන්ධයෙන් දඬුවම ඊට වඩා අඩු වේ (Vin.1V. 124). නමුත් සතුන් පිළිබඳ සුභසාධනය වැදගත් නොවේ යැයි මෙයින් අදහස් නොවේ. ඊට ප්‍රතිවිරුද්ධව, සත්ත්වයන්ගේ පහත් තත්ත්වය ඒ ආකාරයෙන් අපගේ අනුකම්පාව සහ ආරක්ෂාව ලැබීමට වඩාත් යෝග්‍ය වේ. අප මෙන්ම ඔවුන්ද වේදනා විඳීම්වලට බැඳී ඇත. මෙම කරුණු දෙකම ජාතකමාලාවේ මතුකර ඇත: ''සතුන් ස්වභාවයෙන් හෙමින් වැටහෙන ජීවීන් නිසා, අපි ඔවුන්ට අනුකම්පාව දැක්විය යුතුයි. සතුටට ආශා කිරීම සහ වේදනාව මඟහැරීම සම්බන්ධයෙන් සියලු සත්ත්වයන් එක හා සමානය. එම නිසා ඔබ යම් දෙයක් අප්‍රසන්න ලෙස සලකන්නේ නම්, ඔබ එය අනෙක් අයට පැමිණවිය යුතු නැත.''

බුදුපියාණන් වහන්සේට අනුව, සියලු දෙනාට ගුණවත් බව සහ කරුණාව මූලික සදාචාරමය මූලධර්මයකි. එසේම පුද්ගලයෙකුගේ ආධ්‍යාත්මික දියුණුවට අත්‍යවශ්‍ය පියවරකි. බෞද්ධ සදාචාර විනය සංග්‍රහයේ පළමු අවශ්‍යතාව වන්නේ පංච ශික්ෂාපද, 'ප්‍රාණඝාතයෙන් වැළකීම, කෝටුව සහ කඩුව පසෙකට දමා, සියලු ජීවීන් කෙරෙහි සැලකිල්ලෙන්, කරුණාවෙන් සහ අනුකම්පාවෙන් ජීවත්වීමයි' (D.1.4). ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන්නෙකු වීමට අවශ්‍ය වන්නාවූ ඕනෑම කෙනෙකු 'ප්‍රාණ ඝාතනයෙන් වැළකීම, සහ අනෙක් අයට එසේ කිරීමට අනුබල නොදීම සහ අනුමත නොකිරීම'

අවශ්‍ය වේ (A.V.306). බුද්ධචරිතයේ මෙසේ සඳහන් වේ: 'සියලු සත්ත්වයන් කෙරෙහි සංවේදනාත්මකව සැලකීම සැබෑ ආගම වේ. (සර්වෙසු භූතෙසු දයා හි ධර්මා). බුදුපියාණන් වහන්සේට අනුව ආදරය සහ කරුණාව සියලු සචේතනික සත්ත්වයන්ට පතුරුවන්නේ නැත්නම්, එය අසම්පූර්ණ වේ. වරක් බුදුපියාණන් වහන්සේ යෝජනා කළේ යම් යම් තත්ත්වයන් යටතේ සතුන් කෙරෙහි කරුණාව දැක්වීම, මිනිස් නීතිවලට වඩා ප්‍රමුඛස්ථානයන් ගත හැකි බවයි. එක් භික්ෂුවක් උගුලකට හසුවී සිටින සතෙකු දැක එම සත්ත්වයා කෙරෙහි අනුකම්පාවක් ඇතිවී, ඌ නිදහස් කර ඇත. එකල චාරිත්‍රානුකූල නීතියට අනුව උගුලකට හසුවූ සතෙකු උගුල ඇටවූ දඩයක්කාරයාට අයිති දේවල් ලෙස සලකනු ලැබූ අතර, භික්ෂුව සොරකමක් කළ ලෙස සෙසු භික්ෂූන් විසින් විවේචනය කරන ලදී. කෙසේ නමුත්, එම භික්ෂුව ක්‍රියාකර ඇත්තේ අනුකම්පාවෙන් බවත්, ඔහු කිසිම වරදක් කර නොමැති බවත්, පවසමින් බුදුපියාණන් වහන්සේ එම භික්ෂුව වරදින් මිදවූ සේක (Vin.III,62).

මිනිසුන්ට වඩා සතුන් පහත් වූවත්, සමහර ආකාරයෙන් ඔවුන් ආදර්ශයක් ලෙස ගනිමින් මිනිසුන්ට හොඳින් කටයුතු කළ හැකි බව බුදුපියාණන් වහන්සේ පිළිගත්හ. වරක් සමහර භික්ෂූන් එකිනෙකා සමග දබර කරමින් සිටි විට, බුදුපියාණන් වහන්සේ ඔවුන්ට මෙසේ පැවසූහ: ''සතුන්ට එකිනෙකා කෙරෙහි කරුණාවන්ත වීමට, ගෞරව කිරීමට සහ ශිෂ්ට වීමට හැකි නම්, ඔබටත්

එසේ විය හැකිය'' (Vin.11,162). තවත් අවස්ථාවක, බුදුපියාණන් වහන්සේ පැවසුවේ උන්වහන්සේ දන්නා එක්තරා භික්ෂුවකට වඩා, හිරු උදාවට පෙර උඩුබුරුලන මහළු හිවලෙකුට කෘතඥතාව තිබූ බවය. (S.11,272).

අප අනෙක් මිනිසුන්ට ආදරය කළ යුතු බව බොහෝ ආගම් කියයි. බුදුදහම ආදරය පුළුල් කර විශ්වීය කරයි. එසේ කරමින්, ආදරය කෙතරම් නිහතමානී වුවත්, සියලු ජීවීන්ට දැනිය යුතු අතර, ප්‍රකාශ කළ යුතු බව කියයි. ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයේදී අශෝක අධිරාජයා විසින් සතුන් කුරිරුකම්වලින් ආරක්ෂා කිරීමට සහ වන සතුන් සඳහා සංචිත සැපයීමට මුල්ම නීති සම්පාදනය සකස් කරන ලදී. බලන්න **දඩ කෙළි, දඩයම් කිරීම සහ මිනිස්-සත්ත්ව අන්‍යෝන්‍ය ක්‍රියාව**
*The Great Compassion*: *Buddhism and Animal Rights*, Norm Phelps, 2004.

## සත්ත්වයන් නිදහස් කිරීම

'ෆැං ෂෙං' යනු චීන ජාතිකයන්, මරන්නට නියමිත සතුන් නිදහස් කිරීම සඳහා මිලදී ගැනීම හඳුන්වන පදයකි. මෙම පුරුද්දට මූලික හේතුව වූයේ සියලු සතුන්ට කරුණාව සහ අනුකම්පාව දක්වන ලෙස බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීමය. මෙම පුරුද්ද පිළිබඳ මුල්ම සාක්ෂ්‍යය සැබැවින්ම ඇතිවන්නේ පාලි ත්‍රිපිටකයෙන්ය. උගුලක හසුවී සිටි සත්ත්වයෙකු නිදහස් කළ එක් භික්ෂුවක බුදුපියාණන් වහන්සේ ඇගයූ සේක. එයට හේතුව එම භික්ෂුව එසේ කළේ 'කරුණාව පෙරදැරි කරගෙන නිසාය' (කරුන්නෙන Vin. 111.62).

සත්ත්වයන් නිදහස් කිරීමේ චීන බෞද්ධ සම්ප්‍රදායයේ ආරම්භය ස්වර්ණභාසොත්තම සූත්‍රයේ සඳහන් වේ. (චීන ජින් ගුඅැං මිං). එය 'පොදු යුගයේ' මුල් කාලීන ශතවර්ෂවල නිර්මාණය කර ඇත. මෙම කාර්යයට අනුව, එක් වෙළෙන්දෙකුගේ ජලවාහන නමැති පුත්‍රයා ග්‍රීෂ්ම ඍතුවේ ජනශූන්‍ය වනයක ගමන් කරන විට, වේගවත් ලෙස ජලය වාෂ්පවන පොකුණක මත්ස්‍යයන් නොමැරී ජීවත්වන්නට කරන අරගලය දැක ඇත. පොකුණ වටා කපුටන්, කොක්කුන් සහ හිවලුන් අවාසනාවන්ත මත්ස්‍යයන් ඉක්මනින් පිළිගැනීමට රැඳී සිට ඇත. අනුකම්පාවෙන් සසලවී මත්ස්‍යයන් බේරා ගැනීමට තීරණය කළ ජලවාහන ජලය හිරුඑළියෙන් ආවරණය කර එහි වාෂ්ප වීම වැළැක්වීමට අතුපතර කපා පොකුණ මත තැබුවේය. මෙය ප්‍රතිඵල රහිත බව තහවුරු වූ විට, පොකුණට ජලය සපයන ස්වභාවික ජල ධාරාව රඳවනය හිස් බව ඔහු සොයා ගත්තේය. එම ජල ධාරාව රඳවනයේ විශාල සිදුරක් තිබුණ අතර, ජලය එයින් වෙනතකට යොමු වී කිබුණි. එම සිදුර ඔහුට තනිවම අවහිර කළ නොහැකි නිසා, ඔහු රටේ රජු වෙත ගොස් තත්ත්වය පැහැදිලි කර ඇතුන් කිහිප දෙනෙක් ඉල්ලා සිටියේය. රජු එය ලබා දුන්නේය. ජලවාහනගේ උපාය කුශලතාව සහ උත්සාහයන් අවසානයේ ප්‍රතිඵල ලබා දුන්නේය. ඔහුට පොකුණ ජලයෙන් පුරවන්නට හැකිවූ අතර, මත්ස්‍යයන්ගේ ජීවිතද බේරා ගත හැකි විය.

ස්වර්ණභාසොත්ත සූත්‍රය චීන භාෂාවට පරිවර්තනය

කළ විට, විශේෂයෙන්ම ජලවාහන පිළිබඳ කථාව සතුන් කෙරෙහි මිනිසුන්ගේ ආකල්පවලට ප්‍රබල බලපෑමක් ඇති කරන්නට හැකිවිය. ඉතා ඉක්මණින් පුද්ගලික මට්ටමෙන් සතුන් නිදහස් කරනවා වෙනුවට, මහත් පරිශ්‍රමයෙන් සිදුකරන පොදු උත්සවවලදී විශාල සතුන් සංඛ්‍යාවක් නිදහස් කරන සිරිත ඇතිවිය. එවැනි උත්සව සංවිධානය කළ ප්‍රථම පුද්ගලයා චි - 1 භික්ෂුවයි. (538-97) කාලයත් සමග, මත්ස්‍යයන් සහ ඉබ්බන්, නිදහස් කිරීම සඳහා පොකුණු, පරෙවියන් සඳහා පරෙවි කූඩු, එළුවන්, හරකුන් සහ අශ්වයන් සඳහා තණබිම්ද විහාරස්ථාන මගින් සපයනු ලැබීය.

වර්තමානයේ 'සතුන් නිදහස් කිරීම' නිරන්තරයෙන් ජීවිත බේරාගැනීමට වඩා ජීවිතවලට විනාශකාරී හුදු චාරිත්‍රයක ස්වරූපය ගනී. සැලකිය යුතු ප්‍රමාණයක චීන ප්‍රජාවන් ජීවත් වන රටවල කැලෑ කුරුල්ලන් හුදෙක්ම මුදා ගැනීම පිණිස අල්ලා ගන්නා සමස්ත කර්මාන්තයක්ම බිහිවී තිබේ. මෙම කුරුල්ලන් ඔවුන් ජීවත්වන ස්වාභාවික පරිසරයෙන් රැගෙන, නගරවලට නැව්ගත කර, ''කොන්ක්‍රීට් වනයට'' නිදහස් කරයි. බොහෝ විට මෙම කුරුල්ලෝ ඉක්මණින්ම මිය යති. විහාරස්ථානවල පිහිටි පොකුණු සාමාන්‍යයෙන් ඉතා තදබදයක් ඇති නිසා මත්ස්‍යයන් සහ ඉබ්බන් ගිලන් වන අතර, දුක්ඛිත ජීවිත ගත කරන බව පෙනේ.

පරිසරවේදීන්ට අනුව, ආසියානු විහාරස්ථානවල සිටින කැස්බෑවන්ට (හෙඔස්මිස් අන්නන්දලී) (*Heosemys annandalii*), ඇතිවන ප්‍රධාන තර්ජන දෙක

නම්, එය ඊනියා චීන බෞද්ධයන් විසින් 'නිදහස් කර ගැනීම' සඳහා අනුග්‍රහය දක්වන අවන්හල් වෙළඳපොළ සහ විහාරස්ථාන වෙළඳාම නිසාය. වඩාත් පෙරට යන චීන විහාරස්ථාන බොහොමයක් සහ භික්ෂුහු දැන් සත්ත්වයන් නිදහස් කිරීමේ නිසියාකාර ක්‍රමය හෝ ඔවුන්ගේ පරිශ්‍රය තුළ එම පුරුද්ද තහනම් කිරීමට පවා මහජනතාව දැනුවත් කිරීමට උත්සාහ කරති. බලන්න **ප්‍රාණඝාත නොකරන දින**

*Ethical Treatment of Animals in Early Chinese Buddhism*, Pu Chengzhong, 2014.

## සත්ත්වයන් බිලිදීම

බුදුපියාණන් වහන්සේගේ කාලයේ බ්‍රාහ්මණ ආගමේ ප්‍රධාන පිළිවෙත්වලින් එකක් වූයේ සතුන් බිලිදීමයි (යාග). මෙයට සමහර විට සතුන් මැරීම ඇතුළත් විය. දෙවිවරුන් ඒවා පිළිගැනීමට සූදානම් නම්, එම බිලිදීම් සිදුකළ යුත්තේ කෙසේද කියා වේදයේ විස්තර කරයි. මෙම පිළිවෙත් සමහරක් ඉතා පරිශ්‍රමයෙන් කළ යුතුව ඇත. ඒවා ඉතා වියදම් සහිත ද වේ. උග්ගතසරීර නමැති බ්‍රාහ්මණයෙකු සිදු කළ බිලි පූජාවක් පිළිබඳව සටහනක් ත්‍රිපිටකයේ ඇත. එම බිලිපූජාවට 'ගවයන් පන්සියයක්, ගෝණන් පන්සියයක් සහ බොහෝ වැස්සියන්, එළුවන් සහ බැටළුවන් මැරීම සඳහා බිලිපූජා කණුවට ගෙන එන ලදී (A.IV,41).' මෙම කුරිරු පිළිවෙත් අනුකම්පා රහිත, නාස්තිකාර සහ ඵලරහිත දෙයක් ලෙස බුදුපියාණන් වහන්සේ එය විවේචනය කළහ (A.II,42). බිලි පූජා කරන අය සතුන් මැරීම සඳහා බිලිපූජා කණුව සකස් කරන්නට සහ ශුද්ධ ගින්දර දැල්වීමට පෙර සිටම තමන්ටම සෘණාත්මක කර්ම සිදුකර ගන්නා බව බුදුපියාණන් වහන්සේ තරයේ දරා සිටියහ (A.IV,42).

සත්ත්වයන් මැරීම, බිලි පූජා කණු ඉදිකිරීමට ගස් කැපීම සහ 'කඳුළු තැවරුණු මුහුණු සමග' වහලුන් සූදානම් වීම සඳහා අනතුරු අඟවමින් සහ පහර දෙමින් ගෙන යාම බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ (A.II,207-8). එවැනි බිලි පූජා වෙනුවට ගුණවත් තවුසන්ට සහ භික්ෂූන්ට පරිත්‍යාග කරන ලෙස උන්වහන්සේ ආයාචනය කළහ (D.I,144).

ක්‍රි. පූ. 257 දී අශෝක රජු නියෝගයක් නිකුත් කරමින් කියා සිටියේ 'වසර සිය ගණනක් තිස්සේ, ජීවීන් ඝාතනය කිරීම සහ හානි සිදු කිරීම කර ඇත.' නමුත් දැන් එය නැවැත් විය යුතු බවයි. පුරාණ සම්භවයක් තිබියදීත්, වෛදික බිලිපූජා තහනම් කිරීමට රජු ගත් අධිෂ්ඨානය සමහර විට මෙයින් අදහස් කෙරේ. කාලයාගේ ඇවෑමෙන් බිලි පූජා පිළිබඳව බෞද්ධ විවේචන බ්‍රාහ්මණවාදය තුළ ඒවා ක්‍රමානුකූලව ඉවත් කිරීමට හේතුවිය. ඝාතනය කරන ලද සතුන් වෙනුවට ආදේශකයක් වශයෙන් එළඟිතෙල්, ධාන්‍ය, කිරි හෝ මීපැණි පූජනීය ගින්නට විසි කරන ලදී. හින්දු ආගම පරිණාමය වන විට, එය එහි ඉතා වැදගත් සදාචාරවත් මූලධර්මයක් ලෙස අහිංසාවාදය (අහිංසා) පිළිගත් නමුත්, සමහර හින්දු නිකායිකයෝ අදටත් සතුන් බිලිපූජාවලට බඳුන් කිරීමේ පිළිවෙත තවමත් කරගෙන යති.

## වරදට සමාව ඉල්ලීම

වරදට සමාව ඉල්ලීම (ඛමති) යනු යම්කිසි වරදක් කළ විට යම් කෙනෙකු එය හඳුනාගැනීම සහ ශෝකය පළ කිරීමයි. සමහර විට අපි අනෙක් අයට රිදවන හෝ අමනාප වන අයුරෙන් ශික්ෂාපදවලින්

එකක් හෝ තව එකක් බිඳ දමමු. එය සංශෝධනය සඳහා අපට කළ හැකි එක් දෙයක් නම් අප රිදවූ අයට අපගේ පසුතැවිල්ල ප්‍රකාශ කිරීමයි. කල් නොතබමින් හෝ ස්වයං නිදොස්බවකින් තොරව, අවංකව සමාව ඉල්ලීමක් කිරීම ඉහළම ආකාරයේ ත්‍යාගශීලීභාවයකි. එසේ කිරීමෙන් අනෙක් පුද්ගලයාට හැඟෙන්නට ඉඩ තිබෙන ඕනෑම කෝපයක් හෝ නොරිස්සුමක් සුව කිරීමට අපට උදව් විය හැකිය. ඔවුන්ට සමාව දීම පුහුණු කිරීමට මාර්ගය අපි පහසු කරමු. එසේම බිඳී ගිය සම්බන්ධයක් නැවත ඇතිකර ගැනීමට අපි ඉඩ සලසමු. අපගේ පාර්ශ්වයෙන්, අපට දැනෙන්නට හැකි අවංක, සීමා නොකළ සහ කාලෝචිත සමාව ඇයදීමක් සිදු කිරීමෙන් ඕනෑම ආකාරයේ තමන්ටම දොස් පවරා ගැනීමක් කර ගැනීමෙන් සහනයක් සැලසේ. එය අපගේ චරිතයේ ඍණාත්මක පැත්ත පිළිබඳව වඩාත් විවෘත වීමට සහ අභිප්‍රායක් ඇති කර ගැනීමට උපකාරී වේ. එය චරිත ගොඩනැඟීමේ වැදගත් අංගයක් වේ.

සමාව ඉල්ලීම දුෂ්කර විය හැකි නම්, වරදකට සමාව දීමද දුෂ්කර විය හැකිය. වරදකට ලක්වූ පුද්ගලයෙකු වරද සිදු කළ පුද්ගලයාගේ සමාව පිළිගෙන ඊට පසු එයට සමාව දීමෙන් ප්‍රතිචාර දක්වන්නට බැඳී සිටින්නාසේම, වරද කළ පුද්ගලයා සමාව ඉල්ලීමට බැඳී සිටින බව බුදුපියාණන් වහන්සේ පැවසුවේ මේ නිසාය (Vin.I,54). වරද කළ පුද්ගලයාට පළමු පියවර ගෙන කණගාටුව ප්‍රකාශ කිරීමට යුතුකමක් ඇත. ඊට පසු, වරදට ලක්වූ පුද්ගලයා සමාව පිළිගෙන සමාව දීමට තරම් ආචාර සම්පන්න විය යුතුයි. බුදුපියාණන් වහන්සේගේ ප්‍රකාශ කිරීම් නිසා දැඩිසේ මිනිසුන්

කැලැඹීමට පත්වූ බොහෝ අවස්ථා ඇත. සත්‍ය ප්‍රකාශ කිරීමෙන් සමහර විට ඇල්මෙන් රඳවාගෙන සිටි අතිශය ඇල්ම දක්වන දෙයක් කඩතොලුවීමට ඉඩ තිබේ. එසේ කිරීමට බුදුපියාණන් වහන්සේ කිසිවිටක සමාව ඉල්ලා සිටියේ නැත. එයට හේතුව සැමවිටම උන්වහන්සේගේ ඕනෑකම වූයේ අදාළ පුද්ගලයාට යහපත්ම දේ සිදුකිරීමයි. අපගේ අසම්පූර්ණත්වයන්, මමත්වය සහ සිහිකල්පනාවේ ඇති අඩුපාඩු නොවන්නට, අප සිදු කර ඇති රිදවීම්වලට සමාව ඉල්ලීම යනු අපට ඔහු හෝ ඇය සුවපත් කළ හැකි එක් ආකාරයකි.

## ඇපොස්ටසි 'අදහන ධර්මය වෙනස් කිරීම'

ඇපොස්ටසි යන යන ඉංග්‍රීසි පදය පැවත එන්නේ අපොස්ටට යන ලතින් වචනයෙනි. එහි අදහස 'ඉවතට යෑමයි.' එසේම අරාබි වචනය 'රිද්ද' වන අතර එහි අර්ථය 'ආපසු හැරීම' යි. එම නිසා ඇපොස්ටසි යනු යම් කෙනෙකුගේ ආගම අත්හැර තවත් ආගමක් වැළඳගැනීම හෝ ආගමක් නොමැතිවීමයි. බුදුදහමේ ඇදහීමට නීතීමය පෙළඹවීමක් නැත. එම නිසා ආගම අතහැර තවත් ආගමක් වැළඳගැනීමේ සංකල්පයක් කිසිදිනක සකස් කර නැත. එසේම කිසිම බෞද්ධ සංස්කෘතියක එවැනි සංකල්පයක් ඇත්තේද නැත. බුදුදහමේ පුද්ගලයෙකුට එම පුද්ගලයාගේ මනාප සහ අවබෝධය අනුව ඔහුට හෝ ඇයට අදහන්නට හෝ නොඅදහන්නට නිදහස ඇත.

ආගම අතහැර තවත් ආගමක් වැළඳ ගැනීම පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ ආකල්පය සුනක්ඛත්ත

නමැති මිනිසා උන්වහන්සේට අහඹු ලෙසින් හමුවීමෙන් නිරූපණය වේ. ඔහු බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකි. නමුත් කාලයකට පසු ඔහු ධර්මය කෙරෙහි නොසතුටට පත් වී ගුරුවරයා සහ ඉගැන්වීම් අත්හරින්නට තීරණය කළේය. සුනක්ඛත්ත බුදුපියාණන් වහන්සේ වෙතට ගොස් මෙසේ පැවසුවේය: ''බුදුපියාණන් වහන්ස, මම ඔබ හැර යමි. මම තවදුරටත් ඔබගේ ධර්මයේ නොසිටිමි.'' මෙම ප්‍රකාශයට බුදුපියාණන් වහන්සේ ප්‍රතිචාර දැක්වූවේ සුනක්ඛත්තගෙන් යම් ප්‍රශ්න කිහිපයක් විමසමින්ය: ''මම කවදාවත් ඔබට කියා ඇද්ද එන්න, මගේ ඉගැන්වීම්වල සිටින්න කියා''? ''නැත ස්වාමීනී.'' ''එසේ නම් ඔබ කවදාවත් මගේ ඉගැන්වීම්වල සිටින්නට බලාපොරොත්තු වන බවක් කියා ඇද්ද?'' ''නැත ස්වාමීනී.'' ''එසේ නම් ඔබ අත්හරින්නේ කව්ද සහ අත්හරින්නේ කුමක්ද, මෝඩ පුරුෂය?'' (D.111.2-3). මෙම අවස්ථාවේදී හෝ අනෙක් අවස්ථාවක ආගමක් අත්හැර තවත් ආගමක් වැළඳගැනීම සම්බන්ධයෙන් හුදෙක් එසේ කිරීම නිසා දඬුවම් කළ යුතු බවක් හෝ නිරයට යන බවක් බුදුපියාණන් වහන්සේ පවසා නැත. එසේම ආගමක් අත්හැර තවත් ආගමක් වැළඳගැනීම අපරාධයක් ලෙස පාරම්පරික බෞද්ධ රටවල නීතිමය සංග්‍රහයන් කිසිවක් නම් කර නැත. බලන්න **වෙනස් කිරීම සහ ඉවසීමේ හැකියාව**

## අගැයීම

අගැයීම (මොදනා) යනු යම් දෙයක හෝ යම් කෙනෙකුගේ යහපත හඳුනා ගනිමින් ඇතිවන සතුට

සහ ප්‍රීති ප්‍රමෝදයයි. එය කෘතඥතාව සහ මුදිතාවට සමීප ලෙසින් සම්බන්ධ ධණාත්මක මානසික තත්ත්වයකි. අගැයීම නිෂේධය, නොසෑහීමට පත්වීම සහ ආත්මානුකම්පාව පහ කරයි. එය සතුට බෙදා දෙයි. එසේම අප ක්‍රියාත්මක වීමට පොළඹවයි. බුදුපියාණන් වහන්සේ අවම වශයෙන් අපට ප්‍රශංසා සහ අගය කළ හැකි කරුණු හතරක් ගැන සාකච්ඡා කළහ. ඒ (1) අප තුළ යහපත ඇති කිරීම, (2) අනෙක් අය තුළ යහපත ඇති කිරීම, (3) මිනිසෙකු ලෙස ඉපදීමේ ආශීර්වාදය සහ (4) අප භුක්තිවිඳින වාසි සහ වාසිදායක තත්ත්වයන් යන කරුණු කෙරෙහිය.

සමහර විට ධර්මය අපගේ ඍණාත්මකතාවන් කෙරෙහි සහ ඒවා සමග කටයුතු කරන්නේ කෙසේද පිළිබඳව අපගේ සියලු අවධානය යොමු වන අයුරින් පුහුණු විය හැකිය. මෙම සමතුලිත නොවූ බව මඟ හැරීම සඳහා බුදුපියාණන් වහන්සේ අපට ඉගැන්වූයේ අපගේ ශක්තීන් සහ ගුණධර්ම (සීලානුස්සති) මෙනෙහි කරමින් කාලය ගත කිරීම සහ ඊට පසු ඒවාට ගෞරව කිරීමයි. සමහර විට අපි අප සම්බන්ධයෙන් දේවල් නොසලකා හරිමු. 'මෙතැන සතුටු වීමෙන්, අතන සතුටු වීමෙන්, මෙතැන සහ අතන යන තැන් දෙකේම සතුටු වීමෙන් කෙනෙක් සතුටු වේ. තමාගේම යහපත් ක්‍රියාවන් කෙරෙහි කල්පනාකාරී වීම නිසා ඇගයීමට පත් වේ' (Dhp.16). අනෙක් අයගේ ශාන්ත භාවය, ගුණවත්භාවය සහ කරුණාව හෝ ඔවුන් සිදු කර ඇති යහපත දකිමින් හෝ අසමින් අප තුළ ඔවුන් ඇගයීමට සහ ආදර්ශයට ගැනීමට ආශාවක් ඇති කර

ගත හැකිය. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''ඇදහිල්ල ඇති කෙනෙකු පරිපූර්ණ ලෙස අපේක්ෂා කරන්නේ නම්, ඔහු විසින් මෙම ප්‍රාර්ථනාව කළ යුතුයි: ''සාරිපුත්ත සහ මොග්ගල්ලාන මහරහතුන් වහන්සේලා මෙන් වේවා... ඛේමා තෙරණිය මෙන් ... උපාසක හත්ථක හෝ උපාසිකා බුජ්ජුත්තරා මෙන් වේවා!,'' (A.I,88).

වෙනත් සියලු සත්ත්වයන් හා සමග සසඳන විට මිනිසුන් සිටින්නේ ස්වල්පයක් පමණක් බව බුදුපියාණන් වහන්සේ පෙන්වා දුන්හ. මිනිසෙකු වශයෙන් ඉපදීම සැබැවින්ම දුර්ලභ සිදුවීමකි (A.I,37). එය එසේ නම්, ''මිනිස් උපතක් ලැබීමේ දුර්ලභ අවස්ථාව, තථාගතයන් වහන්සේ ලෝකයේ පහළවීමෙන්, ධර්මය සහ පුහුණුව අනාවරණය කිරීමෙන්, එසේම චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමට උත්සායක් දැරීම'' ට හැකිවීම අප අගය කළ යුතුයි (S.V,457). අප දැන් තරුණයි, යහපත් සෞඛයෙන් සිටී, අපට බහුල ලෙස සම්පත් තිබේ, අප සිටින්නේ සාමය තිබෙන රටකයි, නමුත් මෙම තත්ත්වය සැමවිට එසේ නොවේ යැයි අප ඉඳහිට මේ පිළිබඳව සිතිය යුතු බව ද බුදුපියාණන් වහන්සේ වදාළහ (A.III,103). නාගාර්ජුන ඔහුගේ සුහර්ල්ලේඛ ග්‍රන්ථයේ මෙසේ ලිව්වේය: ''මිනිස් ජීවිතයක් ලැබූ කෙනෙකු අයහපත සිදු කරමින් තමන්ගේ ජීවිතය නාස්ති කරන්නා, මැණික් ගලකින් සැරසූ රත්රන් කෝප්පයකට වමනය පිරවීමට වඩා වැඩියෙන් මෝඩ ක්‍රියාවකි.'' ශරීර කොටස් දුබල වූ ගණන් කළ නොහැකි තරම් මිනිස්සු මේ පොළොව මත හුදෙක් ජීවත්වීම දෛනික අරගලයක් කරමින්

හෝ ආගම් ඇදහීමට නිදහසක් නැතිව සිටිති. අප බොහෝ දෙනෙකුට එවැනි අනර්ථයන් විඳවීමට සිදුවී නැත. අපගේ වර්තමාන තත්ත්වය පිළිබඳව වඩාත් දැනුවත් බවට පත්වීමෙන් අප භුක්ති විඳින බොහෝ ලාභයන් සහ අපට ඇති විශ්මය ජනක වාසිදායක තත්ත්වයන් පිළිබඳව තියුණු ඇගයීමක් සහ කෘතඥතාවක් අපට ලබාදිය හැකිය. ධර්මය පුහුණු කිරීම සඳහා මෙම ලාභයන් සහ වාසිදායක තත්ත්වයන්ගෙන් උපරිම ප්‍රයෝජනය ගැනීමට මෙය ධනාත්මක උත්තේජකයක් විය හැකිය. **බලන්න සමගිය**

## අර්හත් ඵලය

අර්හත් ඵලය යන වචනයේ ප්‍රභවය අරහති යන පාලි ක්‍රියා පදයෙන් එයි. එහි අදහස යෝග්‍ය හෝ උතුම් යන්නයි. එය බුදුවරයෙකුගේ ඉගැන්වීම්වලට සවන්දීමෙන් සහ පුහුණු කිරීමෙන් අවබෝධය ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස ලැබූ පදවි නාමයකි. බුදුවරයෙකු මෙන්ම අර්හත් ලාභියෙකුද ප්‍රඥාව සහ කරුණාව සම්පූර්ණ කර ඇති අතර, උන්වහන්සේ තව දුරටත් නැවත ඉපදීමට යටත් නොවේ. 'ඉපදීම සහ මරණය වටා... කෙලෙස් විනාශ කර ඇත, පූජනීය ජීවිතයක් ගත කර ඇත, කළ යුතු දේ කර ඇත, බරක් අත්හැර ඇත, නිවණට ප්‍රවේශ වී ඇත, බන්ධන විනාශ කර ඇත. අවසාන අවබෝධය තුළින් සම්පූර්ණයෙන්ම නිදහස් වී ඇත, විමුක්තිය ලබා ඇත. අර්හත් පුද්ගලයෙකු මේ සියල්ල අභිබවා ගොස් ඇතැයි' බුදුපියාණන් වහන්සේ වදාළහ (M.I,141).

අර්හත් ලාභීන් පිළිබඳව බොහෝ විට ත්‍රිපිටකයේ

සඳහන් වේ. ඔවුන් පිළිබඳව ලබා දී ඇති හැඟීම නම්, ඔවුන් මානසිකව හෝ කායිකව නිශ්ශබ්ද, කරුණාවන්ත, සම්පූර්ණයෙන්ම කනස්සල්ලෙන් සහ බාධවන්ගෙන් තොරව සිටින බවයි. ඔවහු 'කායිකව නිශ්ශබ්දව සහ මනසින් නිදහස්ව' සිටිති (S.I,126). 'චංචල පුද්ගලයන් අතර ඔවුහු නොසෙල්වී සිටිති' (Th.192). 'සැමවිටම සතුටින් සිටිති' (S.I,212). 'ඔවුන් යන්නේ කොහේද පිළිබඳව ඔවුහු කරදර නොවෙති' (A.II,27). 'ඔවුහු කිසිදෙයකට නොබැඳෙති', 'නොඇලීමටවත් නොබැඳෙති' (Sn.795). 'කෝපයට පත් වූවන් අතර ඔවුහු ආදරයෙන් පිරී ජීවත් වෙති' (Dhp.197). 'සැම තැනකදීම නිවසේ සිටින ආකාරයක්' ඔවුන්ට හැඟේ (Sn.42). එයට හේතුව ඔවුන් 'සියලු සීමාවන් අභිබවා ගොස් ඇත' (Sn.795). 'යමක් උදෙසා' සහ 'එරෙහිව' යන සියල්ල පැත්තකට දමා ඇත' (Sn.362). අර්හතුන් 'සුළඟින් නොකැළඹුණු පොකුණක් මෙන් සන්සුන්ය' (It.92). 'ගැඹුරු, නිශ්චල විලක ජලය මෙන් පිරිසිදුය' (Dhp.82). 'වලාකුළුවලින් නිදහස්වූ සඳ මෙන් දීප්තිමත්ය' (Dhp.172). 'වලාකුළු නොමැති අහස මෙන් පැහැදිලිය' (Sn.1065). ලෞකික පුද්ගලයෙකුට, ඒවා 'මෝඩ' ලෙස පෙනෙන්නට පුළුවනි. නමුත් සැබැවින්ම ඒවා එසේ නොවේ'' (Sn.713). සැබැවින්ම, ඒවා 'දැළි පිහියක මුවාත මෙන් තියුණුය' (Sn.716).
*The Early Buddhist Theory of Man Perfected*, I. B. Horner, 1979.

## කලාව

කලාව (කලා) යනු දේවල් අලංකාර කිරීමට භාවිත කරන පරිකල්පනයනයන් කලාවයි. නැතහොත්, සිතුවම් කිරීමෙන්, රූප ඇඳීමෙන් සහ කැටයම් කිරීමෙන් අදහස් සහ හැඟීම් ඉදිරිපත් කිරීමයි. කලාව

යන විෂය පිළිබඳව බුදුපියාණන් වහන්සේට පැවසීමට තිබුණේ ස්වල්පයකි. නමුත් පැහැදිලිවම උන්වහන්සේ එහි වටිනාකම දුටුවහ. භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට තමන්ගේ ආශ්‍රමයන් විවිධ වර්ණවලින් ඒවා පින්තාරු කරමින් සහ විවිධ ජ්‍යාමිතික සහ මලින් කළ මෝස්තරවලින් අලංකාර කරගත හැකි බව උන්වහන්සේ පැවසූහ (Vin.II,117).

ක්‍රි. පූ පළමුවන ශතවර්ෂයේදී ආශ්‍රමයන් අතිශය දියුණු ලෙස පින්තාරු කළ හැකි බව සර්වාස්තිවාදීන් විනයේ උද්ධෘතයක පෙන්වා දී තිබුණි. 'ප්‍රධාන ප්‍රවේශ මාර්ගයේ මුගුරක් අතැති යක්ෂයෙකුගේ (යක්ඛ) චිත්‍රයක්, ආලින්දයේ උතුම් ප්‍රාතිහාර්යය පැවැත්මේ උරුම පෙදෙස්, පටිච්චසමුප්පාදය සහ ජාතකකථාවල නිරූපණද, ප්‍රධාන බුදු මැදුරේ දොරටුව සමීපයේ මල්මාලාවක් රැගත් යක්ෂයෙකු, සාලාවේ ධර්මය උගන්වන භික්ෂූන් වහන්සේලා, භික්ෂුණීන් වහන්සේලා සහ වැඩිහිටියන්, කෑම ගන්නා ශාලාවේ ජීවියෙකු ආහාර අල්ලාගෙන සිටීම, සහ ගබඩා කාමරය සමීපයේ යක්ෂයෙකු යකඩ කොක්කක් අල්ලා ගෙන සිටීම ආදී වශයෙනි.

ළිඳ ළඟ මකරාගේ (නාග) චිත්‍ර ජලය සහිත කළ සමගින් තිබිය යුතුයි. නාන කාමරයේ ප්‍රේත ලෝකවල දර්ශන ද, බෙහෙත් තිබෙන තැන්වල, තථාගතයන් වහන්සේ රෝගීන්ට සාත්තු සේවා සැපයීම, වැසිකිළියේ මළමිනී හෝ මිනී ඇට ගොඩගසා ඇති පොළොවේ බිය උපදවන නිරූපණ ද, නිදාගන්නා නවාතැනේ ඇටසැකිල්ලක්, ඇට සහ හිස් කබලක ද චිත්‍ර තිබිය යුතුය.

බලය, කලාව, බුද්ධිය, කායික සුන්දරත්වය හෝ යහ ගුණය නිරූපණය කරමින් කථාවක් අනුසාරයෙන් විශිෂ්ටතම සාකච්ඡාවක් මහාවස්තුවේ ඇත. කථාවේ අවසානයේ එම පහෙන් උතුම්ම කරුණ යහ ගුණය බව තීරණය කර ඇත. බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂ ගණනාවක් බුදුදහම පැතිරුණු නිසා, උන්වහන්සේගේ ඉගැන්වීම් සියලු කලාවන්ට ශක්තියක් ලබා දී ඇත. - පින්තාරු කිරීම, කැටයම් කලාව, කවි කලාව, නාට්‍ය සහ අඩු මට්ටමින් සංගීතය සහ වැදගත් සහ කල් පවතින අයුරෙන් වටිනාකමක් දෙමින් කලාත්මක නිර්මාණවලට පිබිදීමක් ඇති කළේය. අවසාන ශතවර්ෂ සුළුතරයේදී බෞද්ධ කලාකරුවන්ගේ නිර්මාණශීලීත්වයේ ඇණ හිටීමක් දක්නට ඇත. ඔවුන්ගේ හොඳම කෘති බොහොමයක් පෙර ආකෘතිවල හොඳ පිටපතකට වඩා ටිකක් වැඩිය. *Buddhist Art and Architecture*, R.E. Fisher, 1993.

## අසිත

අසිත, කන්හසිරි යන නමින් හැඳින්වූ ඔහු, ශාක්‍ය රාජ්‍යයේ වනයක ජීවත්වූ තවුසෙකි. අසිත යන නමේ පදගත අර්ථය 'ඇලෙන්නේ නැත' යන්නයි. කන්හසිරි යනු 'අඳුරු ශ්‍රේෂ්ඨත්වය'යි. අසිත තවුසා අවුල්වූ කෙස් ඇත්තෙකු ලෙස සඳහන් වේ (Sn.689). එක් දිනක් දෙවිවරුන් පුළුල් ලෙස උත්සව පැවැත්වීමක යෙදෙමින් සිටිනවා අසිත තවුසා දුටුවේය. ඔවුන් මෙතරම් සතුටින් සිටින්නේ ඇයි දැයි ඔහු ඔවුන්ගෙන් විමසුවේය. ඔවුහු මෙසේ පිළිතුරු දුන්හ: ''එක් බෝධිසත්ත්වයෙකු, එක් විශිෂ්ට සහ අසමසම වැදගත් පුද්ගලයෙකු, මනුෂ්‍ය ලෝකයේ සුභසිද්ධිය

සහ සතුට වෙනුවෙන් ශාක්‍ය නගරයේ ලුම්බිනියේ උපත ලබා ඇත. අප මෙතරම් සතුටට පත්වී ඇත්තේ ඒ නිසාය'(Sn.683). දරුවා දැක බලා ගැනීමට තද ආශාවක් ඇතිව, අසිත තවුසා කපිලවත්ථුවට ගියේය. සුද්ධෝදන රජතුමා ඔහු පිළිගෙන දරුවා වඩා ගැනීම සඳහා දුන්නේය. 'සංඥා සහ මන්ත්‍ර පිළිබඳ කලාවේ (ලක්ඛණ මන්ත්‍ර Sn.690) විශාරදයෙකු වූ ඔහු දරුවා පිරික්සා බලා සම්පූර්ණ බුද්ධත්වයට (සම්බෝධි) පත්වී 'අත්‍යන්ත සුපිරිසිදු' දර්ශනයට (පරමවිසුද්ධිදස්සී) එළඹෙමින් බොහෝ දෙනා කෙරෙහි මහා කරුණාවෙන් (බහුජනහිතානුකම්පී Sn.693) සත්‍යය අනාවරණය කරන බව ප්‍රකාශ කර සිටියේය. ඊළඟට ඔහුගේ ඇස්වලට ක්‍රමයෙන් කඳුළු ගලන්නට විය. මෙය දකිමින් සහ එයින් කනස්සල්ලට පත් වී ඔහු යම් විපතක් දරුවාගේ අනාගතය සම්බන්ධයෙන් කලින් දකින්නේද කියා ශාක්‍යයෝ ඇසූහ. තමන් දුක්වූයේ මේ සියල්ල සිදුවන්නට පෙර තමන් මිය යන නිසා බව පැවසුවේය (Sn.694).

ත්‍රිපිටකයේ අසිත තවුසා පිළිබඳව ඇති එකම සඳහන මෙයයි. සමහර විද්වතුන්ට අනුව, ඔහු පිළිබඳ මෙම කථාව තනිකරම පුරාවෘත්තයකි. එසේ විය හැකිය. කෙසේ වුවත්, එහි ඇත්තේ සහජයෙන්ම මනඃකල්පිත හෝ විශ්වාස කළ නොහැකි තරම් සුළු ප්‍රමාණයකි. පුරාණ ඉන්දියාවේ ඉහළ පැළැන්තියේ පුද්ගලයෙකු දේශීය පූජනීය පුද්ගලයෙකුට තමන්ගේ අළුත උපන් පුත්‍රයාට ආශීර්වාද කර සමහර විට නම් තැබීම සිදු කිරීමට ආරාධනා කිරීම සාමාන්‍ය දෙයක් විය. ඒ ආකාරයෙන් පූජනීය පුද්ගලයා, පුත්‍රයා උතුම්

මිනිසෙකු බවට වැඩෙනු ඇතැයි 'අනාවැකි පළ කිරීම' සාමාන්‍ය දෙයකි.

පසුව අසිත තවුසාගේ කථාව නැවත කීම සිදුවූ අතර, ඒ හා සමාන බොහෝ කථා ඇත. පෙර කථාවට වඩා ඒ සැම එකක්ම විස්තරාත්මක විය. නිතරම පවසන්නේ කුමාරයා විශ්වීය අධිරාජයෙකු (චක්කවත්ති) හෝ සම්පූර්ණයෙන්ම ප්‍රබුද්ධ වූ තවුසෙකු (බුද්ධ) වන බව අසිත තවුසා අනාවැකි පළ කළ බවයි. මෙය හෝ අනාවැකියක් පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වී නැත. බලන්න **මන්ත්‍ර**

**අසෝක**

අසෝක මයුර රාජ වංශයේ තුන්වන අධිරාජයා වූ අතර, ක්‍රි. පූ. 268 සිට 239 තෙක් ඉන්දියාව පාලනය කළේය. කාලිංග රජතුමා සමග ඔහු අතර ඇතිවූ යුද්ධයෙන් සිදුවූ විනාශයෙන් කම්පනයෙන්, අසෝක රජතුමා බුදුදහම වැළඳ ගත්තේය. ඊට පසු ඔහුගේ අති විශාල රාජධානිය ආධ්‍යාත්මික ප්‍රතිපත්ති තුළින් රාජ්‍ය කාලයේ ඉතිරිය පාලනය කරන්නට උත්සාහ කළේය. ඔහු කලහකාරී විදේශ ප්‍රතිපත්ති අත් හැර, ආගමික එකඟතාව ප්‍රවර්ධනය කළේය. ආරෝග්‍යශාලා පිහිට වූයේය. අධිකරණ පද්ධතිය සංශෝධනය කළේය. බෞද්ධ ධර්මදූතයන් ඉන්දියාව පුරා සහ වෙනත් රටවලට යැව්වේය. මූලික වශයෙන් එය කළ විගසම, බුදුදහම ඉන්දියාව පුරා පැතිරුණු ආගමක් බවට පත්වූයේ අශෝක රජුගේ අනුග්‍රහය නිසාය. ඔහුගේ විවිධ ප්‍රතිසංස්කරණ පිළිබඳව දැන ගැනීම සඳහා අශෝක රජු නියෝග මාලාවක් නිකුත් කළේය. ඒවා ගල් සහ විශාල ගල් කුළුණු මත

කොටන ලද අතර, ඉන්දියාව පුරාම ඒවා සංවිධානය කරන ලදී. ක්‍රි. පූ. 256දී නිකුත් කළ ග්‍රීක භාෂාවෙන් ලියන ලද මෙම නියෝග දෙකක් ඇෆ්ගනිස්තානයේ කනදාර්වලදී 1963දී හමුවී ඇත. පැරණි ඉන්දියාවේ වඩාත් මුල් කාලීනව රහස් සංකේතවලින් ලියන ලද සටහන් අසෝක රජුගේ නියෝග වේ. බලන්න **රජවරු සහ සංඝමිත්තා**

*The Edicts of King Asoka*, S. Dhammika, 1993.

## ජ්‍යෝතිෂය

ජ්‍යෝතිෂය (ජොතිසත්ථ හෝ නක්ඛත්තවිජ්ජා) යනු එකිනෙකාට සාපේක්ෂව ග්‍රහලෝක සහ තාරකාවන්ගේ පිහිටීම්, මිනිස් ස්වභාවය සහ ඉරණම කෙරෙහි වැදගත් බලපෑමක් ඇති කරයි යන විශ්වාසයයි. අපගේ චරිතය සහ ඉරණම අපගේ චේතාන්විත සිතුවිලි, කථාව සහ ක්‍රියා, එනම් අපගේ කර්මයේ, එකතුවෙහි ප්‍රතිඵලය යන මෙම විශ්වාසය ඉතා මූලික බෞද්ධ ධර්මයට පටහැනි වේ. භික්ෂූන් සහ භික්ෂුණීන් ජ්‍යෝතිෂය හෝ වෙනත් අනාවැකි පළ කිරීම් පුහුණු නොකළ යුතු බව බුදුපියාණන් වහන්සේ වදාළහ. මේ සියල්ල 'පහත් කලාවන්' (තිරච්ඡානවිජ්ජා D.I,8) ලෙස උන්වහන්සේ හැඳින්වූහ. ජ්‍යෝතිෂවේදී අනාවැකි මත යැපීමේ මෝඩකම ඉස්මතු කරන කථාවක් ජාතක පොතේ කියන අතර, මෙම පදය එකතු කරයි: ''වාසනාවන්ත තරුවක් එනතුරු බලා සිටිමින්, මෝඩයන් අවස්ථාවක් නැති කර ගනී. එය 'වාසනාව' වන විශිෂ්ටත්වයයි. හුදෙක් තරුවලට කුමක් කළ හැකිද?''(Ja.I,258). උපහාසාත්මකව, බෞද්ධ රටවල සිටින බොහෝ මිනිස්සු ජ්‍යෝතිෂය කෙරෙහි විශ්වාසයක් තබති. භික්ෂූහු සාමාන්‍යයෙන්

ජ්‍යෝතිෂමය අනාවැකි පළ කරති. බලන්න **අද්භූත බලයෙන් අනාවැකි කීම, විජ්ජා, වාසනාව සහ ඉරණම**

**සම්ප්‍රජානනය** - බලන්න **සිහි කල්පනාව**

**සමබරතාව**

සමබරතාව (සමත්ත හෝ සමතා) යනු සමතුලිතතාව සහතික කිරීම සඳහා නිවැරදි සමානුපාතිකයන්හි විවිධ දේ පවතින තත්ත්වයකි. සෞඛ්‍ය සම්පන්න සහ වර්ධනය වන ආධ්‍යාත්මික පුහුණුවක් වැඩිදියුණු කිරීම සඳහා එක් දැහැමි ගුණයක් තවත් එකක් සමතුලිත කිරීමට අත්‍යවශ්‍ය වේ. ආගමික විශ්වාසය සහ ප්‍රඥාව, සහ උත්සාහය සහ ඒකාග්‍රතාව අතර විශේෂයෙන්ම සමබරතාවක් පවත්වා ගැනීම බුදුපියාණන් වහන්සේ නිර්දේශ කළහ. ක්ෂණිකව අත්විඳිය නොහැකි හෝ තේරුම් ගත නොහැකි දේවලට ආගමික ඇදහිල්ලෙන් මනස විවෘත කිරීමේ හැකියාව විවෘත කරයි. නමුත් ආගමික ඇදහිල්ල ප්‍රවේසමෙන් අත්වැල් බැඳගෙන සහ තීරණාත්මක ලෙස සිතමින් නොයන්නේ නම්, එයින් නොමඟට යොමුවිය හැකිය. විසුද්ධිමග්ග මෙසේ සඳහන් කරයි: 'ආගමික ඇදහිල්ල ප්‍රබලව තිබෙන පුද්ගලයෙකුගේ ප්‍රඥාව දුර්වල නම්, ඔහු අවිචාරවත්ව පිළිගන්නා සහ පදනම් රහිත දැඩි විශ්වාසයක් ඇත්තෙකු වේ. ප්‍රබල ප්‍රඥාවක් ඇති, නමුත් දැඩි විශ්වාසය දුර්වල වූවෙකු කුසලතා අංශයෙන් වරද්දා ගනී. එය ඖෂධයකින් රෝගාතුරවූවෙකු සුව කිරීමට අපහසු වන්නාක් මෙන්ය. මේ දෙකම සමබර වූ විට කෙනෙකුට දැඩි විශ්වාසයක් ඇතිවන්නේ ඒ සඳහා පදනමක් ඇති විට පමණි (Vism.129). කෙසේ නමුත් බෞද්ධ ජීවිතයකට

අදාළ අනෙක් කරුණුවලදී ද සමබරතාවට තැනක් ඇත. පොදු සහභාගීත්වය සහ හුදෙකලාව සහ අධ්‍යයනය සහ භාවනාව, ගැඹුරුබව සහ සැහැල්ලුබව, ආත්මාර්ථකාමී බව සහ අනෙක් අයට උපකාර කිරීම යනාදිය අතර සමබරතාවක් තිබිය යුතුයි.

වරක් සෝණ නමැති එක් භික්ෂුවක් කෙතරම් අධිෂ්ඨානයෙන් සක්මන් භාවනාව පුහුණු වූවාද කිවහොත්, ඔහුගේ දෙපාවලින් ලේ ගලන්නට විය. බුදුපියාණන් වහන්සේ මේ පිළිබඳව දැනගෙන සෝණගෙන් මෙසේ ඇසූහ: 'ඔබ භික්ෂුවක වීමට පෙර ගිටාරය වැනි සංගීත භාණ්ඩ වාදනය කරන්නට දැනගෙන සිටියේද?. 'එසේය ස්වාමිනි'. 'එහි තත් වඩා තද වූවිට හෝ වඩා බුරුල් වූ විට සංගීතය ප්‍රසන්න වූයේද හෝ සංගීතමය නොවූවේද?' 'නැත ස්වාමීනි'. 'එසේම තත් තද හෝ බුරුල් නොවූ විට, සංගීතය ප්‍රසන්න වූයේද?' 'එසේය ස්වාමීනි'. 'ඒ ආකාරයටම උත්සාහයක් ඕනෑවට වඩා ප්‍රබල වූවිට, කලබලයක් ඇතිවේ. එසේම එය ඕනෑවට වඩා දුර්වල වූ විට, එය මන්දෝත්සාහී බවට පත් වේ. එමනිසා, සෝණ ඔබගේ ශක්තිය සමබර කරගන්න. ශරීර කොටස් අතර ඇති සමබරතාවට සංවේදී වන්න. එවිට ඔබගේ අරමුණට යා හැකිය' (A.III,374-5). බලන්න **මැද මාවත**

## ප්‍රජාවේ පදනම්, හතර

ප්‍රජාවේ පදනම් හතර (සඞ්ගහවත්ථූනි) යනු

කණ්ඩායමක් තුළ එකමුතුව (සාමාජික), සහෝදරත්වය (හායතා) සහ ආදරය (මෙත්තා) යන හැඟීමක් ඇති කිරීමට උපකාරී වන හැසිරීම් සහ ආකල්පයි. මෙය විශාල වශයෙන් පවුලකට, සංවිධානයකට හෝ සමාජයකට විය හැකිය. මිනිසුන් කණ්ඩායම් වශයෙන් එක්වන විට, ආතතීන් ඇති විය හැකිය. එක් පුද්ගලයෙකුගේ චරිතය තවත් කෙනෙකු හා ඇතිල්ලෙන විට, දියුණුවීමේ අභිලාෂයන් තදින් එකට ගැටේ. අදහස්වල වෙනස්කම් පැන නඟියි. මතයන් වරදවා වටහා ගනියි. බුදුපියාණන් වහන්සේගේ ප්‍රජා පදනම් හතර නම් වූ ත්‍යාගශීලී බව (දාන), කරුණාවන්ත වචන (පියවාචා), අනෙක් අය වෙනුවෙන් හොඳ දේ කිරීම (අත්ථචරියා) සහ අපක්ෂපාතීත්වය (සමානත්තතා) යන්න මනසේ තබාගෙන එවැනි ගැටලු අවම කරගත හැකිය. ඒවා පැන නඟින විට සංසිඳුවා ගත හැකිය. හෝ සම්පූර්ණයෙන්ම මඟහරවා ගත හැකිය. ප්‍රජා පදනම් හතර ලෝකයටයි, බුදුපියාණන් වහන්සේ පැවසූහ. කඩ ඇණය රථයක රෝදයකටයි. ඒ අශ්ව රථයක් බාධා රහිතව ඉදිරියට යෑමට සහ හැරවීමටයි (A.II,32; II,248; D.III,192).

ත්‍යාගශීලීත්වය සාමාන්‍යයෙන් භෞතික දේ සමග නොමසුරු යැයි සිතේ. නමුත්, අපට ප්‍රශංසාව, අපගේ කාලය සහ අපගේ කුසලතා සමග ත්‍යාගශීලී විය හැකි අතර, එවැනිතෑගි, අප අවට සිටින අය විසින් බෙහෙවින් අගය කරනු ලැබේ. අනෙක් අයට ඔවුන්ට උවමනා ආකාරයට සිටින්නට ඉඩ දීමෙන්, ඔවුන්ගේ බලාපොරොත්තු අනුමත කරමින් හෝ ඔවුන්ට පාලනය කරන්නට ඉඩ සලසමින් ද සමහර

විට අපට ඔවුන්ට ත්‍යාගශීලී විය හැකිය.

කාරුණික කථාව යනු මිනිසුන් වෙන් කිරීම සහ ඔවුන් අතර බෙදීම් ඇති වීම සම්පූර්ණයෙන්ම අසීමිත කිරීමට ඇති කථාවේ බලයයි. ඕපාදූප, පුරසාරම්, කන්කෙඳිරි ගෑම, අවනම්බු කිරීම්, ජනවාර්ගික කැලල් සිදු කිරීම, සරදම් කිරීම්, උපහාසය සහ තවත් කෙනෙකුට ඉහළින් ඇති උච්චතා මානය ආදිය මෙසේ කිරීමට යොදා ගන්නා බොහෝ ඍණාත්මක කථා වර්ගවලින් සමහර ඒවාය. මේ ආකාරයෙන් කරුණාවෙන් සහ ගෞරවයෙන් පොළඹවනු ලැබූ වචන සම්බන්ධතා ගොඩ නැඟීමට සහ මිනිසුන් තුළින් හොඳම දේ එළි දැක්වීමට උපකාරී වේ. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'කථාවට පස් ආකාරයක ගුණාංග තිබේ නම්, එය හොඳින් කථාකර ඇත්නම්, අගුණ කථා නොකරන්නේ නම්, ප්‍රශංසා කටයුතු නම්, ප්‍රඥාවන්තයන් විසින් චෝදනා කර නැත්නම් ආදී වශයෙනි.' ඒ පහ මොනවාද? ඒවා නම් කාලෝචිත, සත්‍යවන්ත, මෘදු, අදාළ සහ ආදරණීය මනසකින් කථා කළ ආදී වශයෙන්ය (A.III,243-4).

අනෙක් අය වෙනුවෙන් යහපත් දේ සිදු කිරීම යනුවෙන් අදහස් කරන්නේ ඒ අයට උපකාර අවශ්‍ය වන අවස්ථා දැකීමට තරම් සංවේදී වීම සහ අවශ්‍ය උපකාරය පිරිනැමීමට තරම් පරාර්ථකාමී වීමයි. සමහර විට, ඔවුන්ට උපකාරයක් අවශ්‍ය වුවොත් ඒ අවස්ථාවේ ඔබ ඉන්නා බව හුදෙක් ඔවුන්ට දැනගන්නට සැලැස්වීම, ඔවුන් සමග සම්බන්ධතාවක් ඇති කිරීමට හෝ ශක්තිමත් කිරීමට ප්‍රමාණවත් වේ.

සැබැවින්ම එම පිරිනැමීම අවංක විය යුතුයි. බුදුපියාණන් වහන්සේ විසින් කියන ලද කථාවක ගෝවින්දට රේනගේ වචනවල මේ ආකාරයේ ආකල්පයක් හොඳින් පැහැදිලි කර ඇත. ''ඔබට යම් දෙයක් අවශ්‍ය නම්, මම ඒ දෙය ලබා දෙමි. යම් කෙනෙකු ඔබට හානියක් කරන්නට උත්සාහ කරන්නේ නම්, මගේ හමුදාව ඔබ ආරක්ෂා කරනු ඇත'' (D.II,243). අපක්ෂපාතීත්වය යනු කණ්ඩායමක අනිසි අනුග්‍රහයන් නොමැති වූ විට, සියලු දෙනාටම උසස් වන්නට හෝ දායක වන්නට එකම ආකාරයේ අවස්ථාවන් ඇති විට සහ වගකීම් සහ ප්‍රදානයන් සමානව බෙදා ගැනීමය. එවිට හණමිටි අදහස් ඇතිවීමට, ජාතිය, සංස්කෘතිය, ගැහැණු - පිරිමි බව සහ ආගම සමාන කණ්ඩායම් හෝ සමානතාවක් නැති ස්වභාවයේ කණ්ඩායම් නැතිවේ. ඒ නිසා ප්‍රජාව ප්‍රබලව සහ සමීප ලෙස පවතියි.

බුදුපියාණන් වහන්සේගේ කාලයේ උන්වහන්සේගේ ධර්මය ඉතා පුළුල් ලෙස සහ වේගයෙන් ප්‍රචලිත වීමට හේතුව වූයේ පැවිදි සංඝයා සහ ගිහි පිරිස අතර තිබූ ප්‍රබල හැඟීමයි. බුදුපියාණන් වහන්සේ ආළවී ගමට ගිය විට උන්වහන්සේට හත්ථක නමැති සමෘද්ධිමත්, 500ක ප්‍රබල බෞද්ධ ප්‍රජාවගේ නායකයා හමුවිය. හත්ථකට මෙතරම් විශාල සහ කැපවූ කණ්ඩායමක් ඇතිකර ගන්නට හැකිවූයේ කෙසේ දැයි බුදුපියාණන් විමසූහ. තමන්ට එසේ කරන්නට හැකිවූයේ ප්‍රජා පදනම් යොදා ගනිමින් සහ එයට නිර්ලෝභී මූල්‍යමය ආධාර දීමෙන් බව ඔහු පිළිතුරු දුන්නේය. බුදුපියාණන් වහන්සේ ප්‍රතිචාර දැක්වූහ: 'විශිෂ්ටයි, හත්ථක, විශිෂ්ටයි! විශාල

කණ්ඩායමක් ඇති කළ යුතු නිශ්චිත ක්‍රමය මෙයයි' (A.IV,219). බලන්න **පරිත්‍යාග, පස් ආකාර**

## සුන්දරත්වය

සුන්දරත්වය (කල්‍යාණ හෝ සුභ) යනු ඉඳුරන්ට සහ මනසට ප්‍රසන්න වීමේ ගුණාංගයයි. යම් අරමුණක්, හඬක් හෝ හැසිරීමක් හෝ අදහසක් වුවද සුන්දර යනුවෙන් විස්තර කළ හැකිය. පෞද්ගලික කායික සුන්දර වීම ආශීර්වාදයක් වන අතර, එය ඇලීමකට හෝ ආත්මාර්ථවාදයට යොමුවිය හැකි බව ද සත්‍යයක් බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. නමුත් කායිකත්වයට ඔබ්බෙන් සුන්දරත්වයක් ඇත. එය පුද්ගල විශේෂතාවක් සහ ආකල්පයම සුන්දරත්වය යනුවෙන් හැඳින්විය හැකිය. බෞද්ධ දර්ශනවාදයේ කරුණාව, ත්‍යාගශීලී බව සහ අවංකත්වය වැනි ඇතැම් සිතුවිලි සුන්දර (සොභන) යනුවෙන් විස්තර වේ. බුදුපියාණන් වහන්සේ වඩා සැලකිල්ලක් යොමු කළේ මෙම වර්ගයේ සුන්දරත්වයටයි. ධම්මපදයේ උන්වහන්සේ මෙසේ පැවසූහ: ''යම් කෙනෙකු ඊර්ෂ්‍යා සහගත නම්, ආත්මාර්ථකාමී හෝ වංක නම්, වාග් චාතුර්යය හෝ යහපත් ස්වරූප තිබියදීත්, ඒවා අශෝභන වේ. නමුත් එවැනි දේවල් පහ කර වෛරයෙන් නිදහස් වූ පුද්ගලයා සැබෑ ලෙස සුන්දර කෙනෙකි'' (Dhp.262-3). බලන්න - **කලාව සහ භාවනාව සහ ස්වභාවික සුන්දරත්වය**

## උත්පත්ති පාලනය

උත්පත්ති පාලනය යනු උත්පත්තියක් ඇතිවීම වැළැක්වීමයි. මෙය කළ හැකි ආකාර දෙකකි- ඒ පිළිසිඳ ගැනීමක් සිදුවීම වැළැක්වීමෙන් හෝ

කලලයක් ඉපදීමට පෙර යම් අවධියකදී විනාශ කිරීමෙනි. බුදුදහම උගන්වන්නේ ජීවිතය ආරම්භ වන්නේ පිළිසිඳ ගැනීමේදී හෝ ඊට ස්වල්ප වේලාවකට පසු නිසා, ගබ්සා කිරීම මැරීමේ ක්‍රමයක් බවත්ය (M.I,265-6). පිළිසිඳ ගැනීමක් සිදුවීම වැළැක්වීම පිණිස කොන්ඩම, උපත් පාලන උපක්‍රම පෙති, ගැබ්ගෙළ පිළිබඳ උපක්‍රම හෝ ශුක්‍රාණු නාශක භාවිතයෙන් මැරීමක් සිදුවන්නේ නැත. ඒ නිසා සදාචාරාත්මකව මධ්‍යස්ථ වේ. පැරණි ඉන්දියානුවෝ පිළිසිඳ ගැනීම වැළැක්වීම පිණිස ආලේපන ගල්වනයක් භාවිත කළහ. එසේම සතුන්ගේ බඩවැල් භාවිත කරමින් කොන්ඩම නිපදවූහ.
*Buddhism and Bioethics*, Damien Keown, 1995.

## ආගමික හා පූජනීය දේ අවමනට ලක් කිරීම

ආගමික හා පූජනීය දේ අවමනට ලක් කිරීම (පරිභාස) යනු දෙවිවරයෙකු, ආගමික ධර්මයක් හෝ සාන්තුවරයෙකු, ශාස්තෘවරයෙකු හෝ ආගමික නායකයෙකු වැනි පූජනීය උත්තමයෙකු පිළිබඳව අපහාසාත්මක භාෂිතයෙන් කථා කිරීමයි. සමහර සම්ප්‍රදායන් තුළ, සැකයෙන් යුතු අදහස් පළ කිරීම ද ආගමික හා පූජනීය දේ අවමනට ලක් කිරීමක් වශයෙන් සලකනු ලැබේ. පැරණි ඉන්දියාවේ ආගමික ලෝකයේ රළු කඩා වැටීම්වලදී ආගමික හා පූජනීය දේ අවමනට ලක් කිරීම සහ එක් ආගමක් තවත් ආගමක් සමග බොහෝ සේ උග්‍ර තක්සේරුවලට ලක් කිරීම සාමාන්‍යයෙන් පොදු දෙයක් විය. අපහාසාත්මක සහ ගරහනසුළු ප්‍රකාශනයන්ට සහ අසාධාරණ විවේචනවලට සමහර විට ඉලක්කයක්

වූයේ බුදුපියාණන් වහන්සේය. සන්සුන් හෝ උපේක්ෂාවෙන් උන්වහන්සේ අපහාස සහ හෙළාදැකීම්වලට ප්‍රතිචාර දැක්වූවා පමණක් නොව, උන්වහන්සේ තමන්ගේ ශ්‍රාවකයන්ටද එසේ කරන ලෙස අවවාද කළහ. සුප්පිය නමැති මිනිසෙකු 'බුදුපියාණන් වහන්සේ, ධර්මය සහ සංඝයා කෙරෙහි සියලු ආකාරයෙන් වැරදි සොයන බව උන්වහන්සේගේ ශ්‍රාවකයන් දන්වා සිටි විට, බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''යම් කෙනෙකු මා, මගේ ධර්මය හෝ සංඝයා කෙරෙහි හෙළා දකින ආකාරයේ කථා කරයිද, ඒ පිළිබඳව ඔබලා කෝප විය යුතු නැත, අමනාප විය යුතු නැත හෝ කැලැඹිය යුතු නැත. ඔබ එසේ කළහොත්, ඔවුන් කිවු දේ ඇත්තක් ද නැද්ද කියා ඔබට හඳුනා ගැනීමට නොහැකි වේ. එම නිසා අනෙක් අය මා, මගේ ධර්මය හෝ සංඝයා හෙළා දකිමින් කථා කළහොත්, ඔබලා නිවැරදි නොවන දේ පැහැදිලි කළ යුතුයි'': ''මෙය නිවැරදි නොවේ, එය නිවැරදියි, අපි මේවා නොකරන්නෙමු, එය අපේ ක්‍රමය නොවේ'' (D.I,1-3).

මෙසේ පවසමින්, බුදුපියාණන් වහන්සේ වැදගත් කරුණක් එකතු කළහ: ''යම් කෙනෙකු මා, ධර්මය හෝ සංඝයා අගය කරමින් කථා කරයිද, ඒ පිළිබඳව ඔබලා ආඩම්බර විය යුතු නැත. ඒ පිළිබඳව සතුටින් පිපිය යුතු නැත. හෝ ප්‍රීතියෙන් ඉපිලෙන්නට අවශ්‍ය නැත. ඔබ එසේ කළහොත්, එය ඔබට බාධාවක් වේ. එමනිසා අනෙක් අය මා, ධර්මය හෝ සංඝයා පිළිබඳව අගයයි ද ඔබලා ඒ කිව් දේ සත්‍යවූ දෙයක් ලෙස හුදෙක් පිළිගන්න: ''මෙය නිවැරදියි. එය

සත්‍යයි. ඒ අපේ ක්‍රමයයි...'' ජෛන ගුරුවරයෙකු වූ සච්චක ආගමික ගුරුවරුන් විවාදයට භාජනය කරන විට, ඔවුන් යටත් කර ගැනීම සඳහා ආක්‍රමණශීලී අයුරෙන් ප්‍රශ්න කිරීම ගැන ආඩම්බර විය. ඔහු ඔවුන්ගේ අදහස් පරිහාසයට ලක් කළ විට, හෝ දුෂ්කර ප්‍රශ්න ඇසූ විට, ඔවුන් බොහෝ විට 'පැකිළෙයි, විෂය වෙනස් කරයි සහ පීඩාවට, කෝපයට හෝ නොරිස්සුමට පත් වෙයි.' යැයි ඔහු පැවසුවේය. බුදුපියාණන් වහන්සේ සමග සාකච්ඡාවට පසුව, සච්චක මෙසේ පැවසුවේය: 'පුදුමයි, සැබැවින්ම විශ්මය දනවයි, යහපත් ගෞතමයන් වහන්සේට දිගින් දිගටම රළු හෝ වාචිකව පහර දෙන විට උන්වහන්සේගේ සමේ පැහැය පැහැදිලි වන්නේ කෙසේ ද, මුහුණ දීප්තිමත් වන්නේ කෙසේ ද? සම්පූර්ණව ප්‍රබුද්ධ වූ උන්වහන්සේගෙන් බලාපොරොත්තු විය හැකි ආකාරයයි' (M.I,250).

එයට හේතුව අනෙක් අය පරිභව කළ විට හෝ අපහාස කළ විට, බුදුපියාණන් වහන්සේ කෝපයට පත් වූයේ නැත. උන්වහන්සේ වෙනුවෙන් තමන් කෝපයට පත්විය යුතු යැයි බෞද්ධයන්ට හැඟිය යුතු නැත. බෞද්ධ වැඳුම් පිදුම් කරන ස්ථාන හෝ සංකේත කෙලසීම සම්බන්ධයෙන් බෝධිචර්යාවතාර මෙම කරුණ පෙන්වා දෙයි: 'පූජනීය පිළිරූ හෝ ස්තූප සම්බන්ධයෙන් අපහාස කරමින් කථා කිරීම හෝ ඒවාට හානි සිදු කිරීම පිළිබඳව වෛරයක් ඇති කර ගැනීම නුසුදුසුය. එවැනි දේවලට බුදුවරුන් කෝප වන්නේ නැත.' ආගමික හෝ පූජනීය දේ අවමනට ලක් කිරීම සාපරාධී වරදක් ලෙස

පාරම්පරික බෞද්ධ සංස්කෘතීන්වල නීතිමය ව්‍යවස්ථාවන් කිසිවක ඇතුළත් කර නැත. බලන්න **ඉවසීමේ හැකියාව**

## ආශීර්වාදය

ආශීර්වාදයක් (මඞ්ගල) යනු එක් පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකුට සාමාන්‍යයෙන් යම් වචන නැවත නැවත කියමින්, විශේෂ පැන් ඉසිමින්, පවිත්‍ර පූජනීය වස්තූන් ස්පර්ශ කරමින් හෝ අතින් යම් අංග චලනය කරමින් ලබා දෙන ආරක්ෂිත බලයකි. මෙවැනි ආකාරයේ ආශීර්වාදවල ඵලදීම පිළිබඳව බුදුපියාණන් වහන්සේ විවේචනාත්මක වූහ. වෙනත් කරුණුවලදී මෙන්ම 'ආශීර්වාද', ලබා ගැනීමට හොඳම ක්‍රමය වශයෙන් උන්වහන්සේ ඉගැන්වූයේ 'ආරක්ෂාව' හෝ 'වාසනාව' වන්නේ ගුණවත්, අවංක සහ කරුණාවන්ත වීම බවය. ආශීර්වාද පිළිබඳව ජනප්‍රිය ධර්ම දේශනාව වන්නේ සුත්ත නිපාතයේ මඞ්ගල සූත්‍රයයි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'ත්‍යාගී බව' හුදෙක් තමන්ගේ පවුලට උපකාර කිරීමෙන් සහ චෝදනාවන්වලට ලක් නොවෙමින් ක්‍රියා කිරීමයි. මෙය ඉහළම ආශීර්වාදයයි. දුෂ්ට බව අනුමත නොකරමින් සහ ප්‍රතික්ෂේප කරමින්, මත්ද්‍රව්‍යවලින් ඈත්වීමෙන්, තමාගේම මනස නිරීක්ෂණය කරමින් සිටීම ඉහළම ආශීර්වාදයයි. ගෞරව කිරීම, නිහතමාන කම, සන්තුෂ්ටිය, කෘතඥවීම සහ කාලයෙන් කාලයට ධර්මයට සවන් දීම, මේ ඉහළම ආශීර්වාදයයි' (Sn.263-5).
*Life's Highest Blessings*, R.LSoni, 1987.

## අන්ධ මිනිසුන් සහ අලියා පිළිබඳ උපමා කථාව

අන්ධ මිනිසුන් සහ අලියා පිළිබඳ උපමා කථාව සමහර විට ලෝකයේ තිබෙන සියලු උපමා කථා අතරෙන් ඉතාමත් පුළුල් ලෙස දන්නා සහ ආදරය කළ කථාවයි. බොහෝ දුරට මෙම උපමා කථාවේ පැරණිතම ප්‍රබන්ධය උදානයේ තිබෙන අතර, එය බුදුපියාණන් වහන්සේට ආරෝපණය කර ඇත (Ud.67-9). කථාවේ ආකර්ෂණය ඇත්තේ මිනිසාගේ සහ මෘගයාගේ කැපී පෙනෙන සමීපත්වය එය කෙතරම් හොඳින් සලකා බලා ඇත්ද යන්නයි. එසේම එහි ඇති සියුම් ලෙස හාස්‍ය ප්‍රකාශ කිරීමේ හැකියාවයි. මෙම උපමා කථාව බුදුපියාණන් වහන්සේ එසේ කීමට හේතුවූ පසුතලයයි: බෞද්ධ නොවන භික්ෂූන් කණ්ඩායමක් යම් දාර්ශනික හෝ දේවධර්මයට සම්බන්ධ කාරණයක් සම්බන්ධයෙන් එකිනෙකා අතර දබර කර ගන්නා ආකාරයක් සාවත්ථියේ යම් භික්ෂූන් පිරිසක් දැක ඇත. පසුව ඔවුන් තමන් දුටු දේ බුදුපියාණන්ට පවසා ඇත. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'වෙනත් නිකායන්වල ඔබ මොබ යන භික්ෂූන් අන්ධයි, දකින්නේ නැත. ඔවුහු හොඳ නරක නොදනිති. ඔවුන් සත්‍ය සහ අසත්‍ය දන්නේ ද නැත. එහි ප්‍රතිවිපාකයක් වශයෙන් ඔවුහු සැම විටම දබර වෙති, වාද කරති සහ පොර බදති, දිව නමැති ආයුධයෙන් එකිනෙකාට තුවාල කරති.' ඊට පසු බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ජනප්‍රිය උපමා කථාව වදාළහ. 'වරක් මෙහි සාවත්ථියේදී එහි රජු එක් මිනිසෙකුට කථා කොට මෙසේ පැවසුවේය: 'සාවත්ථියේ ඉන්නා සියලුම අන්ධ මිනිසුන් එක් ස්ථානයකට රැස් කරන්න', එසේ කිරීමෙන් පසු, රජ

එම මිනිසාට මෙසේ නියෝග කළේය: 'දැන් මේ අන්ධ මිනිසුන්ට ඇතෙකු පෙන්වන්න.' නැවතත් එම මිනිසා රජු පැවසූ ආකාරයට කටයුතු කළේය: 'අහෝ අන්ධ මිනිසුනි, මේ ඇතෙකි, මේ උගේ හිසයි. මේ උගේ කනයි, මේ උගේ දළයි, මේ උගේ හොඬවැලයි. මේ උගේ කඳයි. මේ උගේ ඇකිලයි. මේ උගේ පිටුපසයි. මේ උගේ වලිගයයි. මේ උගේ වලිගයේ අගයි', මෙසේ සිදු කිරීමෙන් පසු, රජු අන්ධ මිනිසුන් ඇමතුවේය, 'ඔබ ඇතෙකු දැක ඇද්ද?', ඔවුන් පිළිතුරු දුන්නේ, 'අපට පැටියෙකු බෝ කිරීමට සම්බන්ධ පිරිමි සතෙකු ඇත' 'ඇතෙකු කුමන ආකාරයේද?' ඔහු ඇසුවේය. හිස අතගා ඇති මිනිසෙකු මෙසේ පැවසුවේය, 'ඇතෙකු මුට්ටියක් වැනිය'. කනක් අල්ලා ඇති තවත් මිනිසෙකු මෙසේ කීවේය, 'ඇතෙකු කුල්ලක් වැනිය,' දළ අල්ලා ඇති තවත් මිනිසෙකු මෙසේ කීවේය, 'ඇතෙකු නඟුලක රිට වගේය,' හොඬ වැල අල්ලා ඇති මිනිසා මෙසේ කීවේය, 'ඇතෙකු නඟුලක් වැනිය,' ශරීරය අල්ලා ඇති මිනිසා මෙසේ පැවසුවේය, 'ඇතෙකු ධාන්‍යාගාරයක් වැනිය' කකුල අල්ලා ඇති මිනිසා මෙසේ කීවේය, 'ඇතෙකු කණුවක් වැනිය', පිටුපස අල්ලා ඇති මිනිසා මෙසේ කීවේය, 'ඇතෙකු වංගෙඩියක් වගේය,' වලිගය ඇල්ලූ මිනිසා මෙසේ පැවසුවේය, 'ඇතෙකු මෝල්ගහ වගේය'. වලිගයේ කොන ඇල්ලූ මිනිසා මෙසේ පැවසුවේය, 'ඇතෙකු කොස්සක් වැනිය,'. ඊට පසු ඔවහු 'ඔව් එය එසේය!,' 'නැත එය එසේ නොවේ!,' 'ඇතෙකු මේ වගේය!,' 'ඇතෙකු අර වගේය!' කියමින් දබර කරන්නට වූහ. අවසානය වන තුරුම එකිනෙකා සමග දබර කළහ.

මෙම කථාව කියූ විට, බුදුපියාණන් වහන්සේ එහි අර්ථය ඉතා කෙටියෙන් දක්වා ඇත - සමහර භික්ෂූන් සහ පූජකයන් ඔවුන්ගේ අදහස්වලට බැඳී ඒවා අල්ලාගෙන යමක එක් පැත්තක් පමණක් දකිමින් බහින් බස් වෙති.' මෙම අවසාන වැකිකඩය වන - යමක එක් පැත්තක් පමණක් දකිමින් (එකමංගදස්සිනො) - උපමා කථාවේ ප්‍රධාන කාරණයයි. යථාර්ථය පිළිබඳව වඩා සම්පූර්ණ, නිවැරදි අදහස සකස් කර ගන්නේ කෙසේද යන්නට බුදුපියාණන් වහන්සේ දුන් අවවාදවලින් මෙය එකක් පමණි. මෙහිදී බුදුපියාණන් වහන්සේ යෝජනා කරන්නේ කොටස සම්පූර්ණ එක ලෙස වරදවා වටහා ගත යුතු නොවන බවයි. අනෙක් ස්ථානවල, අදහස් තක්සේරු කිරීමේදී, අදහස් සැකසීමට කාලය ගත කරන විටද, එසේ කළ විටද, වෙනත් දෘෂ්ටි කෝණයන් සලකා බැලීම සඳහා විවෘත මනසක් තබා ගනිමින් පුද්ගලික පක්ෂග්‍රාහිවීම් පසෙකට දමන ලෙස බුදුපියාණන් වහන්සේ අවවාද කරති.

උදානට පසුව මෙම උපමා කථාව පිළිබඳ ඊළඟ සඳහන සත්‍යයේ සාපේක්ෂතාව (අනෙකන්තවාද) පිළිබඳ ජෛන ධර්මය පැහැදිලි කිරීමට කථාව භාවිත කරන ජෛන කෘතියක් වන *Syadvadamanjari* ස්‍යාද්වදමන්ජරි හි දැකගත හැකිය. 'සෑම අදහසක්ම යම් දෘෂ්ටි කෝණයකින් (නය) සත්‍ය වේ. හෝ වෙනත්, සහ පොදුවේ ගත් කල කිසිදු මතයක් නිශ්චිතවම අසත්‍ය විය නොහැක.' ඊට පසු, උපමා කථාව ඉන්දියාව පුරා සහ ඉන් ඔබ්බට පැතිරුණි. එය බ්‍රාහ්මණ සහ හින්දු ලේඛනවලද, පර්සියානු කථා එකතුවකද, තුර්කි සුෆී ගූඪවාදී රුමීගේ එක් නීතියක

ද ඇත. අද මෙම උපමා කථාව හෝ එය ඇතුළත්වූ බොහෝ ළමා පොත් ඇත.

## දඩ කෙළිය

දඩ කෙළිය යනු සතුන්ට හිංසා කරමින් හෝ මරණයට පත් කරමින් ඔවුන්ගේ රුධිරය අදිමින් කරන ක්‍රීඩා හෝ විනෝදස්වාදයකි. එකිනෙකාට එරෙහිව සටන් කිරීම හෝ මිනිසෙකු සමග සටන් කිරීම හෝ දඩයම් කිරීම වැනි එකම හෝ විවිධ සත්ත්ව වර්ගයන් සම්බන්ධ කර ගත හැකිය. කුකුළ්පොරය, වලසුන්-පොලඹවීම, හිවලුන් දඩයම් කිරීම සහ උකුස්සන් පුහුණු කිරීම මේවා අතරින් පළමු වැන්න සඳහා උදාහරණ වන අතර, ගවපොරය දෙවැන්න සඳහා උදාහරණයකි. රුධිර ක්‍රීඩාවලින් ලැබෙන වින්දනය අර්ධ වශයෙන් සටන්වදින්නන්ගේ සූදුවෙන් වන අතර, අර්ධ වශයෙන් සත්ත්වයාට එරෙහි වන තැනැත්තාගේ දක්ෂතාවය හෝ ධෛර්යය පරීක්ෂා කිරීමෙන්ය. සමහර අයට අවම වශයෙන්, හිරිහැර කිරීමෙන් හෝ එසේ කිරීමෙන් ඇතිවෙන වේදනාව නැරඹීමෙන් අස්වාභාවික සතුටක් ලැබීමද ආකර්ෂණයේ කොටසක් විය හැකිය. බුදුපියාණන් වහන්සේගේ කාලයේ ජනප්‍රිය වූ එවැනි සමහර ක්‍රීඩා ත්‍රිපිටකයේ සඳහන් වී තිබේ. ඒවා ඇතුන්, මීහරක්, හරකුන්, බැටළුවන්, කුකුළන් සහ වටුවන් අතර සූදානම් කළ දඩකෙළි වේ. වටුවන්ගේ සටන් තරමක් විකාර බවක් දැනෙන්නට තිබුණත්, පිරිමි වටුවන් කලහකාරීවන අතර, ඔවුන්ට තවත් කෙනෙකු හමුවූ විට, කෝපයෙන් සටන් කරයි. අවම වශයෙන් මෙම සටන්වලින් සමහර සතුන් මරණයට ලක්නොවූ බව පෙනේ. සාමාන්‍ය මිනිසුන්ට වඩාත්

පොදුවූ දඩකෙළිය වූයේ කුකුළ් පොරයයි (කුක්කු යුද්ධ). එය පොළවල් සහ ගමේ පිරිස් එකතුවන ස්ථානවල අංගයක්ව තිබේ. ස්වභාවිකව කුකුළන් සටන් කරන නමුත්, එකිනෙකා මරන්නේ නැත. ඔවුන්ගේ පයට තියුණු ලෝහ කුරු අමුණා තිබුණහොත් පමණක් මෙසේ සිදුවේ. මෙය පැරණි ඉන්දියාවේ සිදුවූ බවක් පෙනෙන්ට නැත.

භික්ෂූන් සහ භික්ෂුණීන් සත්ත්වයන්ගේ සටන් නොබැලිය යුතු බව බුදුපියාණන් වහන්සේ වදාළහ. එයට හේතුව ඒවා නොසැබි විනෝද ක්‍රීඩාවක් ලෙස සලකන නිසාත් සහ ඒවාට කෲරත්වය සම්බන්ධ වන නිසාත්ය (D.I,6). පැවිදි සහ ගිහි පුද්ගලයන්ට දඩයම් ක්‍රීඩාවලට සහභාගී වීම පංච ශීලයට විරුද්ධ දෙයකි. පංච ශීලය රැකීමට 'සියලු සත්ත්වයන්ට සැලකිල්ල දැක්වීම, කරුණාව සහ අනුකම්පාව' අවශ්‍ය වේ (D.I,4). ශ්‍රී ලංකාවේ දඩකෙළි සම්ප්‍රදායක් නැත. ටිබෙටය සහ කොරියාව හෝ චීන බෞද්ධයන් අතර ද නැත. සමහර විට බුදුදහමේ බලපෑම නිසා විය හැකිය. මරණයෙන් අවසාන වන කුකුළ් පොරය බුරුමය, කාම්බෝජියාව සහ තායිලන්තයේ ජනප්‍රිය වේ.

## බුද්ධ ගයා - බලන්න උරුවෙල

## බෝධිසත්ත්ව

බෝධිසත්ත්ව යන්න 'සර්වඥ බවට පැමිණීම' යන අර්ථය ඇති සංස්කෘත වචනය වූ බෝධි, සහ 'සම්බන්ධ වූ' යන අර්ථය ඇති සක්ත යන වචනවලින් සෑදුණු සංයෝගයකි. ඒ අනුව

බෝධිසත්ත්ව යනු සර්වඥ බවට පත්වීම සඳහා කැපවූ පුද්ගලයෙකි. බෝධිසත්ත්ව යන නාමය බුදුන් වහන්සේට පමණක් උන්වහන්සේගේ සර්වඥ බවට පත්වීමට පෙර ත්‍රිපිටකයේ භාවිත කර ඇත. සම්ප්‍රදායට අනුව, ජාතක කථා යනු බුදුපියාණන් වහන්සේගේ ජීවිතය සහ බෝධිසත්ත්වයෙකු වශයෙන් කළ ක්‍රියාවල විස්තරය. මහායාන බුදුදහම බොහෝ බෝධිසත්ත්ව‍වරුන් හඳුනා ගෙන ඇත. ඒ අතර වඩා වැදගත් වන්නේ මෛත්‍රිය, මංජුශ්‍රී, සමන්තභද්‍ර සහ අවලෝකිතේස්වර යන අයයි. මහායානයට අනුව, මේ සහ අනෙක් බෝධිසත්ත්ව වරුන් අනෙක් සියලු දෙනා සර්වඥ බවට පත් වීමෙන් පසු එම තත්ත්වයට පත්වීමට පොරොන්දුවී ඇත. මෙම අරමුණ එළඹෙන තුරු ඔවුන් දිව්‍යමය විෂය පථවල නැවත ඉපිද ඇති අතර, උපකාර සඳහා මිනිසුන්ගේ ඉල්ලීම් සඳහා ඔව්හු ප්‍රතිචාර දක්වනු ඇත.

*The Bodhisattva Idea in Buddhist Sanskrit Literature*, H. Dayal, 1932.

## බෝධි වෘක්ෂය

බෝධි, යනු 'පුබුදුවීම' යන අර්ථය ඇති පාලි වචනයයි. බුද්ධ ගයාවේ වැඩෙන එක් ගස් විශේෂයක නමයි. බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත් වන විට, වැඩ සිටියේ මෙම වෘක්ෂය පාමුලයි. මෙම වෘක්ෂය ෆිකස් රෙලිජිඔසා නමින් උද්භිද විද්‍යාඥයන් දන්නා අත්තික්කා වර්ගයට අයත් එකකි. මෙම වෘක්ෂයට විශාල ලෙස පැතිරෙන අතු සහ රවුම් වූ පත්‍ර අග්ගිස්ස තුඩක් ද සහිත ලක්ෂණ ඇත. බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වයට පැමිණීම පිළිබඳ ත්‍රිපිටකයේ බොහෝ විස්තරවල බෝධි

වෘක්ෂය ගැන සඳහන්ව ඇත්තේ දෙවතාවක් පමණි (D,II,4 and Ud.1 සහ (Vin.I,1-7). උන්වහන්සේගේ බුද්ධත්වයෙන් පසු, බුදුපියාණන් වහන්සේ දින හතක්, ලබා දුන් නිවහන් සැපයීම වෙනුවෙන් කළගුණ සැලකීමට වෘක්ෂය දෙස බලා සිටි බව සම්ප්‍රදාය පවසයි (Ja.I,77). නූතන බෞද්ධයෝ තවමත් එම හේතුවටම මෙම වෘක්ෂ වර්ගයට ගෞරව කරති. බුද්ධ ගයාවේ පිහිටි වර්තමාන බෝධි වෘක්ෂය පැළ කරනු ලැබුවේ 1880දීය. එය මුල් වෘක්ෂයට දුරස්තරව සම්බන්ධ වේ. සමහර විට බොධි වෘක්ෂ නුග ගස් වශයෙන් වරදවා හඳුන්වනු ලබයි. නමුත් නුග ගස් සම්පූර්ණයෙන්ම වෙනස් වූ ගස් වර්ගයකි.

බලන්න - **වෘක්ෂ වන්දනා**

## ශරීරය

ශරීරය යනු (කාය හෝ සරීර) පුද්ගලයෙකුගේ කායික ව්‍යූහයයි. බුදුපියාණන් වහන්සේගේ විශ්ලේෂණයට අනුව, ශරීරය යනු පුද්ගලයෙකුගේ හැඟීම්, සංජානනය, මානසික නිර්මාණය සහ විඥානය යන පස් ආකාර අවයව වලින් එකකි. ශරීරය ඝනත්වය, දියාරු බව, තාප ජනක බව සහ අවකාශය යන ධාතුවලින් සමන්විත වේ (D.II,294). බුදුපියාණන් වහන්සේ ශරීරය විස්තර කළේ 'මව සහ පියාගෙන් උත්පත්තිය ලැබ, බත් සහ කැඳවලින් පවත්වා ගෙන යමින්, අනිත්‍ය වූ, තුවාල සහ සීරීම්වලට, කැඩී බිඳී ගොස් විනාශ වීමට යටත් වූ, විඥානයෙන් බැඳී සිටින සහ ඒ මත යැපෙන' (එත්ථ සිතම් එත්ථ පටිබද්ධම්, D.I,76) දෙයක් ලෙසයි.

එකල වෛද්‍ය න්‍යායන් අනුගමනය කරමින් බුදුපියාණන් වහන්සේ වැදගත් ශරීර කොටස් 31ක් හඳුනා ගත්හ - හිසේ කෙස්, ශරීරයේ කෙස්, නියපොතු, දත්, සම, මාංශ පේෂී පටක, ඇට, ඇට මිදුළු, වකුගඩු, හදවත, අක්මාව, උදර සිවිය, බඩදිව, පෙනහළු, අන්ත්‍රය, බඩවැල්, ආමාශය, අසූචි, පිත, සෙම, සැරව, ලේ, දහඩිය, මේද, කඳුළු, ශරීර තෙල්, කෙළ, නාසික ක්ලේෂමල, වසා ගැටිති සහ මූත්‍ර යනාදියයි (M.I,57).

පසුව විචාරකයන් 32වන කොටසක් ලෙස මොළය මෙයට එකතු කර ඇත. පැරණි බෞද්ධයන් ශරීරයට විවරයන් (නව සොතා) නමයක් තිබෙන බව අවධානයට ලක් කර ඇත. එසේම ඇස් දෙකක්, කන් සහ නාස් පුඩු, මුඛය, ගුදය සහ මූත්‍ර මාර්ගය (Sn.197) සහ සමේ තට්ටු දෙකක් සහ පිට සිවිය (ඡවි) සහ සම (චම්ම, A.IV,129) වශයෙනි. එසේම ඔව්හු කණ්ඩරාවන් 60ක් සහ අස්ථි බන්ධනියන් (නහාරු, Vism.253) හඳුනා ගත්හ. ශරීරයේ ඇති අප්‍රසන්න අංගයන් කෙරෙහි සමහර විට සිත යොමු කිරීමට බුදුපියාණන් වහන්සේ නිර්දේශ කළහ. මෙය ශරීරය පිළිකුල් සහගත යැයි බුදුපියාණන් වහන්සේ විශ්වාස කළ නිසා නොව, එහි ප්‍රසන්න හා ප්‍රියජනක අංශ ගැන පමණක් සැලකිලිමත් වීමේ සාමාන්‍ය ප්‍රවනතාව සමතුලිත කිරීමටයි. ශරීරයට වඩා යථාර්ථවාදී හා සමබර අවබෝධයක් ලබා ගැනීමෙන්, පෞද්ගලික පුහු ආටෝපය සහ බිය සැක නැති ලිංගික ආශාව අඩුකර ගැනීමට උපකාරයක් වේ. කෙසේ නමුත්, ශරීරයේ පියකරු බව ආශීර්වාදයක්ය යන ජනප්‍රිය

මතය සමග බුදුපියාණන් වහන්සේද එකඟ වූහ. අවම වශයෙන් එය පුහු ආත්මෝපය අවුස්සන්නේ නැති මට්ටමටවත් තිබිය යුතුය (A.III,47). ශරීරය සහ මනස අතර ඇති සමීප සම්බන්ධය නිසා භාවනාව පුහුණු කරන ඕනෑම පුද්ගලයෙකු ශරීරයේ තත්ත්වය පිළිබඳව සැලකිල්ලට ගත යුතුයි. 'ශරීරයේ අපහසුතාවන් මනස බාහිර දේවලට විසිර යවන' බව බුදුපියාණන් වහන්සේ වදාළහ (S.V,156). එසේම 'ශරීරය විඩාපත් වූ විට, මනස විකෘති වූ විට, එය සමාධි ගත කිරීමෙන් දූරස්ථ වන' බව බුදුපියාණන් වහන්සේ පෙන්වා දුන්හ (M.I,116). එහි ප්‍රතිඵලයක් වශයෙන් සාර්ථක භාවනාවකට සංසිඳුණු, සහනශීලී ශරීරයක් වැදගත් පෙරඇවැසියකි. බලන්න **ස්වස්ථතාව සහ ඉරියව්ව**

## ශරීරය සිදුරු කිරීම සහ විරූප කිරීම

විශේෂිත සංස්කෘතීන් තුළ විවිධ සංස්කෘතීන් හෝ කණ්ඩායම් සමහර විට මිනිස් සිරුර ස්ථීර ආකාරයෙන් විකෘති කරයි. මේවාට සමහර උදාහරණ නම්, දෙපා බැඳීම, පුරුෂ හා ස්ත්‍රී සුන්නත් කිරීම, හමේ පච්ච කෙටීම, බිලිපූජා කිරීම, හිස බැඳීම, බෙල්ල දිගු කිරීම සහ දත් පිරී ගෑම යනාදියයි. මෙම කාරණාව පිළිබඳව බුදුදහමේ විශේෂ ඉගැන්වීමක් නැත. නමුත්, පච්ච කෙටීම හැර, බෞද්ධ රටවල මේ ක්‍රියාවන් කිසිවක් කිසිදා ව්‍යවහාරයේ නැත. සමහර විට මෙයට හේතුව බුදුදහමෙන් සාමාන්‍යයෙන් ශරීරය කෙරෙහි දක්වන ගෞරවනීය ආකල්පය සහ මාංශ විකෘති කිරීමට අවශ්‍ය වන අද්භූත විශ්වාසයන් හෙළා දැකීම නිසාත් විය හැකිය.

සමහර ආගමික හා ලෞකික ආගමකට සම්බන්ධ නැති නීති පද්ධති සමහර අපරාධ සිදු කිරීම සම්බන්ධයෙන් ශාරීරික විකෘති කරන දඬුවම් දීමට උපදෙස් දෙයි. ඒ සඳහා උදාහරණ වන්නේ හංවඩු ගැසීම, අවයව කපා දැමීම සහ කප්පාදු කිරීම යනාදියයි. එවැනි උග්‍ර දඬුවම් සඳහා බුදුදහම හේතු තුනකට විරුද්ධ වෙයි. 1. දුෂ්ටකමක් වන එය අතිශය කෲරත්වයකට හසුවෙයි. එසේම එවැනි දඬුවමක් ලබා දෙන පුද්ගලයන් සහ පොදුවේ සමාජයට දැඩි ප්‍රතිඵල ලබා දෙයි. 2. බොහෝ අපරාධවල ප්‍රතිවිපාක පවතින්නේ සීමිත කාල සීමාවකටය. නමුත්, ශාරීරික විරූපණය කිරීම ජීවිත කාලය පුරාම පවතී. ඒ නිසා බොහෝ අපරාධ සඳහා ලබා දෙන දඬුවම් සමගින් සමානුපාතික නොවේ. 3. සියලු නීති පද්ධතීන් මානව ආයතන වන නිසා වරදිනසුලු වේ. යම් පුද්ගලයෙකු අපරාධයක් සම්බන්ධයෙන් අංග ඡේදනය කර පසුව සැබැවින්ම එම පුද්ගලයා අහිංසක යැයි අනාවරණය වුවහොත්, ඔහුට සාධාරණ ලෙස වන්දි ගෙවීම කළ නොහැකිය. බලන්න **මරණ දඬුවම**

## ග්‍රන්ථ

ග්‍රන්ථයක් යනු (ගන්ථ හෝ පොත්ථක) බොහෝ තුනී පත්‍රිකා මත ලියන ලද හෝ මුද්‍රිත දෙයකි. ඊට පසු ඒ සියල්ල එකට අමුණා කියවීමට හැකි වන අයුරෙන් සකස් කොට ඇත. පත්‍රයක ලියා ඇති පණිවුඩයක් ගැන ජාතක පොතේ සඳහන් වේ (Ja.II,174). පළමු ඉන්දියානු ග්‍රන්ථ මුද්‍රණය කරනු ලැබුවේ සමහර විට ක්‍රි. පූ. 3වන ශතවර්ෂයේදීය. ඒ තල් ගසේ කොරිෆා උම්බ්‍රකුලිෆෙරා කොළ භාවිත කරමින්ය.

ක්‍රි. පූ. 100දී පමණ ශ්‍රී ලංකාවේ ත්‍රිපිටකය ලියන්නට කැපවූ බව එරට වාර්තා පවසා ඇති නමුත්, එහි කොටස් කලින් ඉන්දියාවේ ඒ වන විටත් ලියා තිබෙන්නට ඇත. බුද්ධාගම ඉන්දියාවේ උතුරේ ඈතට ව්‍යාප්ත වූ විට, ග්‍රන්ථ නිපදවූයේ බර්ච් පොත්තෙනි (සංස්කෘතවලින් භාර්ජ), චීනයේ එය සිල්ක් සහ පසුව කඩදාසිවලින් නිපදවන ලදී. කඩදාසි මත මුද්‍රණය කර, ශක්තිමත් කවරයෙන් බැඳ, පළමු නූතන බෞද්ධ ග්‍රන්ථ, නිපදවූයේ 1862 ශ්‍රී ලංකාවේය. බෙද්ධයන් සැමවිටම ත්‍රිපිටකයේ ග්‍රන්ථවලට ගෞරව කර ඇත. ඒ සඳහා ඔවුහු රන්වන් පාට පිට කවර දමා, සිල්ක් වලින් ඔතමින් සමහර විට ස්තූපවල නිදන් කරති.

*Palm-leaf and Paper: Illustrated Manuscripts of India and Southeast Asia*, John Guy, 1982.

## පාත්‍ර

පාත්‍ර (පත්ත) යනු ආහාර හෝ දියර වර්ග රඳවා තැබීම සඳහා භාවිත කරන රවුම් හැඩයෙන් සහ ගැඹුරු බඳුනකි. බෞද්ධ භික්ෂු භික්ෂුණීහු පිණ්ඩපාතයෙන් ආහාර එකතු කර වැළඳීම සඳහා පාත්‍රය භාවිත කරති.

බුදුපියාණන් වහන්සේගේ කාලයේ සිටි විවිධ නිකායන්ට අයිති තවුසන් පිණ්ඩපාතය සඳහා භාවිත කළේ වියළි ලබු කැට වලින්, බෙලෙක්ක සහ තඹ, පළිඟු වැනි ලෝහවලින් සාදන ලද පාත්‍රයි. සමහර විට මිනිස් හිස් කබල් ද භාවිත කරන ලදී. යකඩ හෝ මැටි පාත්‍ර පමණක් භාවිත කරන ලෙස බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේ ගේ ශ්‍රාවකයන්ට පැවසූහ (Vin.II,112).

එසේම පාත්‍රය තැබීම සඳහා කුඩා රවුම් රඳා පවතිනයක් සහ එය රැගෙන යාමට එල්ලුම් පටියක් තබා ගැනීමට උන්වහන්සේ ඔවුන්ට අවසර දුන්හ. පැරණි කාලයේ සිට, බෞද්ධ පාත්‍ර සාමාන්‍යයෙන් යාන්තමට සමතලා වූ අර්ධ ගෝලයක හැඩයෙන් යුක්ත වේ. වටප්‍රමාණය මැදින් අඟල් 18ක් පමණ වේ. ඒවා පින්තාරු කර හෝ කලු පැහැයෙන් වාර්නිෂ් කර ඇත.

## බ්‍රහ්ම

බොහෝ වෛදික දෙවිවරුන් පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන්ව ඇත. උදාහරණ ලෙස ඉන්ද්‍ර සක්ක, අග්ගි, සුරිය, චන්ද, වරුණ, පජාපති, ශ්‍රී, වෙණ්හු (සංස්කෘතයෙන් විෂ්ණු) සොම සහ යම ලෙස ද හැඳින් වේ. ක්‍රි. පූ. 5වන ශතවර්ෂය වන විට බ්‍රාහ්මණවාදයේ ප්‍රමුඛයා බවට පත්වී සිටියේ බ්‍රහ්මයාය. ඔහු 'සියල්ල දකින' 'සියලු බල ඇති', 'අධිපතියා', 'හදන්නා', 'මැවුම්කරු', සහ 'පාලකයා', 'පත් කරන්නා' සහ 'පාලනය කරන්නා', 'සියලු දෙනාගේ පියා' සහ 'එන්නට සිටින සියලු දෙනාගේ පියා' යනාදි වශයෙන් හැඳින් වේ (M.I,327). ඔහු 'අනෙක් සියලුම දෙවිවරුන්ට වඩා වැඩියෙන් දීප්තියෙන් ඉස්මතු වේ'. ඔහුගේ ස්වභාවික පෙනුම ඇසට නොපෙනෙන නිසා, ඔහු පෙනී සිටින විට, දළ ස්වරූපයක් ආරෝපණය කරයි' (D.II,210). එසේම ඔහු ආදරණීය සහ කෝපය හෝ වෛරය නොමැති කාරුණික දෙවිකෙනෙකු ලෙස ද විශ්වාස කරනු ලැබේ (D.I,247). බැතිමත්හු බ්‍රහ්ම ඇගයූ අතර, උපකාර

ඉල්ලීම ද කළහ. පූජා සහ පරිත්‍යාග සමගින් වැඳුම් පිදුම් ද කරති. ඔවුන්ගේ බලාපොරොත්තුව වූයේ බ්‍රහ්මගේ මඟපෙන්වීම සහ ආරක්ෂාව මේ ජීවිතයේදී ලැබීම සහ මරණයෙන් පසු බ්‍රහ්ම සමඟ සහෝදරත්වයෙන් (බ්‍රහ්මසහව්‍යතා D.I,235) සිටීමයි. මේ අනුව බොහෝ ආකාරවලින් බ්‍රහ්මයා ප්‍රධාන දේවවාදී ආගම්වල උත්තරීතර දේවතාවියට සමාන වේ.

බුදුපියාණන් වහන්සේ බ්‍රහ්මයාගේ යථාර්ථය පිළිගත් අතර, ඔහු පිළිබඳව කරන සෑම ප්‍රකාශයක් ගැනම සැක පහළ කළහ. එනිසා ඔහුට වන්දනාමාන කිරීම සහ තබන භක්තිය අර්ථ විරහිතය යන්න වක්‍රාකාරයෙන් ඉදිරිපත් විය. වෙනස් නොවනවාට වඩා, බ්‍රහ්මයා අන් සියල්ලටම අමතරව, වෙනස්වීම් හා ආපසු හැරවීම්වලට (අඤ්ඤථත්තං අත්ථි විපරිණාමෝ, A.V,60) යටත් වේ. තමන් සියලු දේ නිර්මාණය කළා යැයි බ්‍රහ්ම සිතන නමුත්, ඔහු කරුණු වැරදි ලෙස අර්ථකථනය කර ඇත (D.I,18 ff). බ්‍රහ්මගේ නිර්මාණය විශ්වාස කරන අයගෙන් හරියටම එය සිදුවූ ආකාරය පැහැදිලි කරන ලෙස බුදුපියාණන් වහන්සේ ඉල්ලා සිටි විට, 'ඔවුන්ට ඒත්තු ගැන්වෙන පිළිතුරක් දීමට නොහැකි විය.' (තෙ මයා පුට්ඨා න සම්පායන්ති, D.III,28). බ්‍රහ්ම සර්වඥයෙකු යැයි විශ්වාස කළ නමුත්, ඔහුගේ වඩා හොඳ අවස්ථාවන්හි දී ඔහු බොහෝ දේ ගැන නොදැන සිටි බව පිළිගත්තේය (D.I,222). බුදුපියාණන් වහන්සේට ප්‍රශංසා කිරීමට හෝ තමන් නොදන්නා කරුණු පිළිබඳව, විශේෂයෙන් ආධ්‍යාත්මික කරුණු සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේගෙන්

දැනගැනීමට බ්‍රහ්ම බොහෝ විට පැමිණෙන බව බුදුපියාණන් වහන්සේ කියා සිටීම බ්‍රහ්මයා පිළිබඳව කියනු ලබන දිව්‍යමය සර්වඥතා ඥානයට තවදුරටත් බලපෑමක් ඇතිවිය (M.I,168; 326; S.I,139; 153). බ්‍රහ්මයා සර්ව බලධාරී සහ සර්ව ආදරණීය නම්, ඔහු ලෝකයේ ඇති සියලුම දුක් වේදනා සහ නපුර ගැන කිසිවක් නොකළේ මන්ද යන්න ජාතක කථාවෙන් ඇසුවේය. 'බ්‍රහ්මයා ලෝකය කෙළින් නොකරන්නේ ඇයි? ඔහු සැබැවින්ම පාලකයා, ඉහළම, සියලු සත්ත්වයන්ගේ අධිපතියා නම්, මුළු ලෝකයම මෙතරම් අවුල් ජාලයක සිටින්නේ ඇයි? ඔහු ලෝකය ප්‍රීතිමත් එකක් නොකළේ ඇයි? ඔහු සැබැවින්ම පාලකයා, ඉහළම, සියලු සත්ත්වයන්ගේ අධිපතියා නම්, මෙතරම් වංචා, බොරු, උඩඟුකම සහ අධර්මිෂ්ඨකම් පවතින්නේ ඇයි? සැබැවින්ම ඔහු පාලකයා, ඉහළම, සියලු සත්ත්වයන්ගේ අධිපතියා නම්, සියල්ලම නිර්මාණය කළ ඔහු අධර්මිෂ්ඨ සහ කaaර පුද්ගලයෙකු විය යුතුයි' (Ja.VI,208). ඉහළම, බලවත්, වඩාත් විශිෂ්ට යන අර්ථය ඇති බ්‍රහ්ම යන ධාතුවෙන් බ්‍රහ්ම යන වචනය සෑදී ඇත. එම වචනය බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය පිළිබඳ සමහර ප්‍රභේදයන් නම් කිරීම සඳහා භාවිත කළහ. ඒ අනුව බ්‍රහ්මචාරී පුද්ගලයෙකුගේ ජීවිතය බ්‍රහ්මචාරිය නම් වේ: ඉහළම චිත්තවේග හතර බ්‍රහ්ම විහාරයි, ආර්ය අෂ්ටාංගික මාර්ගය ද බ්‍රහ්මයාන වශයෙන් හැඳින් වේ, එසේම ධර්මය බ්‍රහ්මචක්ක වේ (M.I,69; 147; S.I,5). බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේ 'බ්‍රහ්ම බවට පත්වූ බව' (බ්‍රහ්මභූතො, D.III,84) කියූ විට වෛදික අවබෝධයෙන් දෙවියන් වහන්සේ සමග එක්වීමකට පත් වූවා යැයි යන

අදහසක් එයින් ඇති නොවේ. ඊට වඩා, උන්වහන්සේ ඉහළම තත්ත්වය වූ නිර්වාණය අවබෝධ කළ බව යන්න එහි අදහසයි. පසු කාලීන දෘශ්‍ය රූප සංඥා තුළින් බ්‍රහ්ම නිරූපණය වූයේ මුහුණු හතරක්, අත් හතරක්, සහ පාත්තයෙකු මත නැග සිටින ආකාරයෙනි. බ්‍රහ්ම වැඳුම් පිදුම් ඉන්දියාවෙන් සම්පූර්ණයෙන්ම තුරන් වී ඇත. නමුත් උපහාහාසාත්මක ලෙස තායිලන්තයේ බෞද්ධයෝ බ්‍රහ්ම පුළුල් ලෙස වැඳ පුදති. එහි ඔහු හඳුන්වන්නේ ෆා ප්‍රොම් වශයෙනි. බලන්න **දේවවාදය**

*Buddhism and the God Idea*, Nyanaponika, 1981.

## බ්‍රාහ්මණයන්

බ්‍රාහ්මණයන් (බ්‍රාහ්මණ) හින්දු ආගමේ පාරම්පරික පූජකවරුන්ය. ඔවුහු කුල පද්ධතියේ ඉහළම තනතුරු දරා සිටිති. හින්දු නීතියේ ආදි සම්භාව්‍ය ග්‍රන්ථය වූ මනුස්මෘති මෙසේ සඳහන් කරයි: ''බ්‍රාහ්මණයෙකු තමන්ගේ උපතේදීම, දෙවිවරුන්ගෙත් දෙවියා වේ. එසේම ඔහුගේ ඉගැන්වීම් මිනිසුන්ට විශ්වාසය තැබිය හැකිය. එයට හේතුව, ඒවා එන්නේ වේදයෙන් නිසාය.'' බුදුපියාණන් වහන්සේගේ කාලයේදී බ්‍රාහ්මණයන්ට කෑදරකම, උද්ධච්චකම සහ ලෞකික දේවලට හිත යාම පිළිබඳව ප්‍රසිද්ධියක් තිබුණි. මෙය ඔවුන් අගය කළ ඉහළ සාරධර්මවලට ප්‍රතිවිරුද්ධ විය. ගෞරවය සහ ප්‍රමුඛතාවය ලබා ගැනීම සඳහා ඔවුන්ගේ ඉල්ලීම බුදුපියාණන් වහන්සේ විවේචනය කළහ. ඒ හුදෙක් ඔවුන් බ්‍රාහ්මණයන් ලෙස ඉපදීම සහ - ඕනෑම කෙනෙකු ඉහළ කුලයේ හෝ නැති වුණත්, ගුණයහපත් නම් ඒ අය ගෞරවය ලැබීමට සුදුසු යැයි පවසමින්ය. ගුණයහපත් බව යම්

කෙනෙකු සැබෑ බ්‍රාහ්මණයෙකු කරන බවට බුදුපියාණන් වහන්සේ ස්ථිරවම කියා සිටියහ. 'සතුරුකම් මධ්‍යයේ මිත්‍රශීලී, ප්‍රචණ්ඩකාරී වාතාවරණයක් මධ්‍යයේ සාමකාමී, ඇලී සිටීම ඇති තැන සෑහීමට පත්වන්නා සැබෑ බ්‍රාහ්මණයෙකු ලෙස මම හඳුන්වමි. යම් කෙනෙකුගේ රාගය, වෛරය, උඩඟුබව සහ කුහකකම හුදෙක් ඉඳිකටු තුඩක් මතට වැටී ඇති අබ ඇටයක් මෙන් නම් මම ඔහු සැබෑ බ්‍රාහ්මණයෙකු යැයි කියමි. කවුරුන් හෝ මෘදු, ප්‍රයෝජනවත්, ප්‍රසන්න හා කිසිවෙකුටවත් අහිතකර නොවන වචන කථා කරන්නේ නම්, ඔහු සැබෑ බ්‍රාහ්මණයෙකු ලෙස මම හඳුන්වමි' (Dhp.406-8).

සමහර බ්‍රාහ්මණයෝ බුදුපියාණන් වහන්සේ තමන්ගේ ස්ථාවරයට තර්ජනයක් ලෙස දුටුවහ. උන්වහන්සේ කෙරෙහි විවේචනාත්මක වූහ. සතුරු වූහ. තමන්ගේ ගෝත්‍රයේ සාමාජිකයෙකු භික්ෂුවක වූ බව අසා අක්කොසක භාරද්වාජ බුදුපියාණන් වහන්සේට විරෝධය පා, අශෝභන සහ රළු වචනවලින් අපහාස කළේය'(S.I,162). බ්‍රාහ්මණයන්ගේ ඇස් හමුවේ අපිරිසිදු වූ කුල නීති බුදුපියාණන් වහන්සේ වැනි තවුසෝ නොසලකා හැරියහ. ඒ අනුව ඔවුන් ස්පර්ශ කිරීම, ඒ අය සමීපව සිටීම හෝ ඔවුන් දැකීම පවා අපවිත්‍ර වීමක් ලෙස සලකන ලදී. වරක් බුදුපියාණන් වහන්සේ පිඬු සිඟා වඩින විට ගිණි පූජාව කරමින් සිටි බ්‍රාහ්මණයෙකු සමු විය. බ්‍රාහ්මණයා කෝපයෙන් කෑ ගැසුවේය: ''නවතින්න පැවිද්දා! වහාම එතැන නවතින්න සමාජයෙන් පිටමං කළ කාලකන්නි පැවිද්ද!'' (Sn. p.21). තවත් අවස්ථාවක, බුදුපියාණන් වහන්සේ බ්‍රාහ්මණ ගමක පිඬුසිඟා වඩින විට එහි

පදිංචිකරුවෝ කිසිවක් දීම ප්‍රතික්ෂේප කළහ (S.I,114). එවැනි තවත් ගමක වාසීන් ඔවුන්ගේ ළිංවලට තණකොළ සහ වී පොතු පොතු දමමින් උන්වහන්සේට ජලය පානය කිරීමට නොහැකි වන සේ අපිරිසිදු කර ඇත (Ud.78).

තවත් අය භාවනා පුහුණු කිරීමේ බෞද්ධ පිළිවෙත සරදමට ලක් කර ඇත. 'දොර කණුවක් සමීපයේ සිටින බළලෙකු මෙන්, කැළි සසළ ගොඩක්, හෝ කාණුවක්, භාවනා කරයි ද, කල්පනා කරමින් සිටී ද, වමාරා කයි ද, අනුමාන කරයිද, එසේම මේ තවුසන් ... 'අප භාවනා කරනවා, අප භාවනා කරන්නෝ!'යි ඔවුන්ගේ පහතට එල්ලා වැටෙන උරහිස් සහ හිස් පහතට එල්ලෙමින්, ඔවුන් භාවනා කරන්නාවූ සැම තැනම ... කොරගසමින් යමින් කියා සිටී' (M.I,334). දුර අතීතයේදී එක් බ්‍රාහ්මණයෙකු භික්ෂූන් වහන්සේලා පිරිසකට ආහාර වෙනුවට ඝණ අපද්‍රව්‍ය ලබා දුන්නේ යැයි කියනු ලබන සිද්ධියක් බුදුපියාණන් වහන්සේ අනාවරණය කළහ. අවසාන වශයෙන් අපහාස කිරීමට ඔහු මෙසේ පවසා ඇත: ''ඔබට කැමැති තරම් අනුභව කර, ඉතිරි ඒවා රැගෙන යන්න.'' මෙම කථාව සත්‍ය විය නොහැකිය (S.II,259). නමුත් එයින් පිළිබිඹු වන්නේ බෞද්ධයන් ඔවුන් කෙරෙහි බ්‍රාහ්මණ සතුරුබව පිළිබඳ දැනුවත් භාවයයි.

පළමු බෞද්ධයන් සැමවිටම එවැනි පරිභවයන් නිහඬව පිළිගත්තේ නැත. ලොහිච්ච බ්‍රාහ්මණයන්ගේ තරුණ ශිෂ්‍යයන් පිරිසකට වරක් වනයේදී ජ්‍යෙෂ්ඨ භික්ෂුවක වූ කච්චන රහතන් වහන්සේ මුණගැසුණි.

එහිදී ඔවුහු වචනයෙන් කෙටි ප්‍රහාරයක් එල්ල කරමින් එම භික්ෂුවට සහ අනෙක් අයට ගෞරව කළේ භාරතකා නම් නූගත් කම්කරුවන් පමණක් බව පැවසූහ. මෙම අපහාසයට නිශ්ශබ්ද විය යුතු යැයි තීරණය කළ කච්චන හිමියෝ මෙසේ පිළිතුරු දුන්හ: 'හිරු උදාවත් සමග ස්නානය කරන, වේද තුනම ගායනා කරන, මන්ත, රීති, භාර සහ ඉතා අපිස් බව... කුහකකම, විකෘති වූ යෂ්ටි සහ චාරිත්‍රානුකූල සෝදා පිරිසිඳුවීම්, මේවා බ්‍රාහ්මණයන්ගේ සළකුණුයි. නමුත් බ්‍රහ්මයා වෙතට ගමන් මාර්ගය ඇත්තේ අවධානය යොමුව, පැහැදිලි සහ කැළැල්වලින් තොරවූ මනසක් තිබෙමින් සහ සියලු සත්ත්වයන් කෙරෙහි කරුණාවන්ත වීමෙන්ය' (S.IV,117-18).

නමුත්, බෞද්ධයන් කෙරෙහි බ්‍රාහ්මණයන්ගේ ආකල්ප සැමවිටම විරුද්ධ වූයේ නැත. ඔවුන් අතරින් වඩාත් නිදහස් මතධාරී හා ආධ්‍යාත්මික මනසින් යුක්ත පුද්ගලයන් බොහෝ විට බුදුපියාණන් වහන්සේට කියන්නට තිබූ දේ පිළිබඳව උනන්දු වූ අතර, සමහරු උන්වහන්සේ කෙරෙහි ගැඹුරු ගෞරවයක් ද ඇති කර ගත්හ. බ්‍රාහ්මණ කාන්තාවක් වූ ධනංජානි තිසරණය කෙරෙහි 'සම්පූර්ණ විශ්වාසය, (අභිප්පසන්න) තිබූ බව සඳහන් වේ (S.I,160). නගරයට වැඩිය බුදුපියාණන් වහන්සේ හමුවීමට යන බව සොණදණ්ඩ සෙසු බ්‍රාහ්මණවරුන්ට පැවසූ විට, එය නුසුදුසුයි පවසමින් ඔවුහු එය වැළැක්වීමට උත්සාහ කළහ. 'ගෞතම භික්ෂුව හමුවීමට ඔබ යනවා වෙනුවට, ඔහු ඔබ වෙත ආ යුතුය!' මෙය සමග එකඟ නොවූ සොණදණ්ඩ බුදුපියාණන් වහන්සේගේ බොහෝ

ගුණධර්ම ගණනය කිරීමට තමන්ම යායුතු බව සිතමින් නික්ම ගියේය. එය අනෙක් බ්‍රාහ්මණයන්ගේ සිත් වෙනස් කළේය. ඒ සියලු දෙනාම සොණදණ්ඩ සමග බුදුපියාණන් වහන්සේ වෙතට යාමට සහ උන්වහන්සේ නගරයට වැඩම කරවන්නට ආරාධනය කරන්නට තීරණය කළහ (D.I,113).

බුදුපියාණන් වහන්සේගෙන් ප්‍රශ්න ඇසීමට බ්‍රාහ්මණයන් පැමිණීම පිළිබඳව බොහෝ උදාහරණ ඇත: උන්වහන්සේගේ ඉගැන්වීම් සහ සමහර විට ඔවුන්ගේම ඇදහිල්ලේ අර්ථය පිළිබඳවද විමසන ලදී. වේඨදීප බ්‍රාහ්මණයන් වත් අඩු තරමෙන් බුදුපියාණන් වහන්සේට ගෞරව කරන්නට ඇත (e.g. A.I,155 ff; II,22; III,230; D.I,235; S.I,160 ff). එයට හේතුව උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු භෂ්මාවශේෂවලින් අටෙන් එකක් ඔවුන් ඉල්ලා සිටි අතර පසුව එය ස්තූපයක නිදන් කරන ලදී (D.II,167). සමහර බ්‍රාහ්මණයෝ බුදුපියාණන් වහන්සේට දන්දීම ප්‍රතික්ෂේප කළහ. අනෙක් අය දන් දීමට බොහෝ සතුටු වූහ. බ්‍රාහ්මණ ඉච්ඡානඞ්ගල එවැන්නෙකි. බුදුපියාණන් වහන්සේ සහ අනෙක් භික්ෂූන් ගමට නුදුරු වනයක වනගත වී සිටින බව දැන, ඔහු කණ්ඩායමක් සමග දානය රැගෙන විත්, දානය පිළිගැන්විය (A.IV,341).

එකල සිටි බ්‍රාහ්මණයෝ උගතුන් සහ බුද්ධිමතුන් වූ නිසා ඔවුන් ධර්මය තේරුම් ගැනීමට යහපත් ස්ථාවරයක සිටියහ. බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පැවිදි සහ ගිහි වශයෙන් බ්‍රාහ්මණ කුලයට අයත් වූවන්ය. පසු කාලීන ශතවර්ෂවලදී ඉන්දියානු බුද්ධ ධර්මයේ සමහර ඉහළම බුද්ධිමතුන් බ්‍රාහ්මණයන් වූහ,

උදාහරණ වශයෙන්, නාගාර්ජුන, අශ්වඝෝෂ, අසඞ්ග, ආර්යශූර, සාන්තිදෙව ආදිය. බලන්න **දොණ**

'The Brahmanas in Early Buddhist Literature,' B. G. Gokhale, *Journal of Indian History,* 48, 1970.

## බ්‍රාහ්මණවාදය

බුදුපියාණන් වහන්සේගේ කාලයේදී බ්‍රාහ්මණවාදය උතුරු ඉන්දියාවේ ප්‍රමුඛ ආගමක් විය. එය වේදය මත පදනම් විය. එහි උත්තරීතර දෙවියන් වූයේ බ්‍රහ්මයි. බුදුපියාණන් වහන්සේගෙන් ශතවර්ෂ ගණනාවකට පසු බ්‍රාහ්මණවාදය ක්‍රමයෙන් දැන් හඳුන්වනු ලබන තත්ත්වයට පරිණාමයට පත් වී හින්දු ආගම ලෙස පිළිගෙන ඇත. මෙම ක්‍රියාවලියේදී, බොහෝ බ්‍රාහ්මණ ධර්මයන් සහ 'භාවිතයන් තාවකාලික නැවැත්වීමට පත් විය. නැතිනම් විපල්වකාරී ලෙස වෙනස් විය. එමනිසා බ්‍රාහ්මණවාදය සහ හින්දු ආගම අතර බොහෝ පොදු දේ තිබුණත්, ඒ අතර පැහැදිලිව පෙනෙන වෙනස්කම්ද ඇත. විද්වතුන් සමහර විට, ඒවා වෛදික හින්දු ධර්මය සහ පුරාණික් හින්දු ධර්මය යැයි වෙන්කොට හඳුන්වයි. තත්ත්වය යුදෙව් ආගම සහ ක්‍රිස්තියානි ධර්මය අතර තිබෙන සම්බන්ධතාවට සමාන වේ. දෙවැන්න ප්‍රථම දෙයින් වර්ධනය වෙමින්, එහි බොහෝ අංග රඳවා ගනිමින් සහ බොහෝ අලුත් අදහස් වර්ධනය කර ගත්තේය. එමගින් ඒවා එකිනෙකට වෙනස් වූ ආගම් දෙකක් බවට පත්විය.' බලන්න **හින්දර සහ මන්ත්‍ර**

*Brahmanism, Buddhism and Hinduism*, L.M. Joshi, 1970.

## බ්‍රහ්ම විහාර

බුදුදහමේ බ්‍රහ්ම විහාර හතර ඉහළම චිත්තවේග හතර ලෙස සැලකිල්ලට ගනු ලැබේ. බ්‍රහ්ම යන වචනයේ පදගත අර්ථය වන්නේ 'ඉහළම' හෝ 'උත්කෘෂ්ට' යන්නයි. එසේම එය බුදුපියාණන් වහන්සේගේ කාලයේදී බ්‍රාහ්මණවාදයේ උත්තරීතර දෙවියන්ට ලබා දී තිබූ නමයි. විහාර යන්නෙහි අදහස 'නිවහන', 'ජීවත්වීම' හෝ 'වාසය කිරීමයි'. ඒ අනුව බ්‍රහ්ම විහාර යම් කෙනෙකුට ඉඳහිට දැනෙන චිත්තවේග නොවේ. නමුත් යම් කෙනෙකු සමග සැම විට 'ජීවත්වන' සහ 'ජීවත්වන අයයි'. සතර බ්‍රහ්ම විහාර ආදරය, කරුණාව, මුදිතාව සහ උපේක්ෂාවයි. ඒවා බොහෝ අදහස්වලින් අවබෝධ කරගත හැකිය.

ඒවා එකිනෙකට සම්බන්ධ, නමුත් වෙන්වූ ගතිස්වභාවයන් හතරක් ලෙස විසුද්ධිමග්ගය දකින අතර, මවක් තම පුතුන් සිව්දෙනා කෙරෙහි දක්වන හැඟීම් සහ ආකල්ප හා සමග සැසඳේ: '... ළදරුවෙකු, රෝගාතුරවූවෙකු, තාරුණ්‍යයේ උච්චතම අවස්ථාවේ සහ හතරවැන්නා සාර්ථකව ලෝකයේ තමන්ගේ ගමන යමින් සිටින්නෙකු වශයෙනි. ළදරුවා වැඩෙනු දැකීමට, රෝගාතුරවූ දරුවා සුවය ලැබීමට, තාරුණ්‍යයේ සිටින දරුවා තරුණ බව බොහෝ කාලයක් විඳීම දැකීමට ඇයට අවශ්‍ය වේ. සාර්ථකව ජීවිතය ගත කරන දරුවා පිළිබඳව ඇයට ප්‍රශ්නයක් නැත' (Vism.321). විකල්පයක් ලෙස, එකිනෙකාගේ තත්ත්වයන් අනුව අනෙක් අය සමග සම්බන්ධවීමට දක්ෂ සහ කාරුණික ක්‍රම ලෙස දැකිය හැකිය: ඒ මිත්‍රශීලී මිනිසුන් සම්බන්ධයෙන් ආදරයෙන්, දැඩි වේදනාවෙන් සිටින අයට

කරුණාවෙන්, සාර්ථක ජීවිත ගත කරන්නන්ට මුදිතාවෙන් සහ අප්‍රසන්න පුද්ගලයන්ට උපේක්ෂාවෙන්, ආදී වශයෙනි. මෛත්‍රී භාවනාව පුහුණු කිරීමේ අරමුණ වන්නේ බ්‍රහ්ම විහාර දිරි ගැන්වීම සහ පෝෂණය කිරීමයි. බලන්න **කරුණාව සහ අනුකම්පාව**

*Like Milk and Water Mixed, Buddhist Reflections on Love*,S. Dhammika 2016.

## ආශ්වාස සහ ප්‍රශ්වාසය

ආශ්වාස - ප්‍රශ්වාසය (ආපාන) වාතය ඩයෆ්‍රමය හරහා ශරීරය ඇතුළට ගැනීම සහ පිටකිරීමයි. බොහෝ මිනිසුන් මෙන්ම, පැරණි ඉන්දියානුවන් ජීවිතය ස්වසනය සමග සම්බන්ධ කළහ. සැබැවින්ම සත්ත්ව ජීවිතවලට භාවිත කරන එක් වචනයක් නම් පාණ යන්නයි. එහි පදගත අර්ථය වන්නේ 'හුස්ම ගන්නා දේවල්' යන්නයි.' පළමු ශික්ෂා පදයට නිශ්චිත පදගත පරිවර්තනය වන්නේ: 'හුස්ම ගන්නා ජීවීන්ට හානි කිරීමෙන් වැළකීමට ශික්ෂාපදය මම සමාදම් වෙමි. ඒ අනුව ප්‍රායෝගිකව, බැක්ටීරියා, මූදුහත්ත, ගස් වැනි හුස්ම නොගන්නා දේවල්, ජීවත්වන සත්ත්වයන් මැරීම (පාණාති පාතා) යන ශික්ෂා පදය කැඩීමකට අයත් නොවේ. ජීවිතය සහ ශ්වසනය අතර තිබෙන සම්බන්ධය නිසා ආශ්වාස ප්‍රශ්වාසයට ගූඪවාදී වැදගත්කමක් ඇතැයි ඉන්දියානුවෝ සිතූහ. හුස්ම රඳවා ගැනීම හෝ දීර්ඝ වේලාවක් වේගයෙන් හුස්ම ගැනීමෙන් විඥානයේ වෙනසක් සිදු වන්නේ යැයි තවුසෝ දුටුවහ. ඒවා පූජනීය තත්ත්වයන් ලෙස අර්ථ නිරූපණය කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් බුදුපියාණන් වහන්සේගේ

කාලයේ තිබූ බොහෝ භාවනා වර්ග හුස්ම කෙරෙහි අවධානය යොමු කරන ලදී. බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය ලැබීමට පෙර උන්වහන්සේ අත්හදා බැලූ එක් භාවනාවක් නම්, 'හුස්ම රඳවා ගැනීමේ භාවනාවයි.' (අප්පාණකං ඣානං), පසුව උන්වහන්සේගේ ශරීරයට වෙහෙසීම සහ කැළඹීම සහ වේදනාව ඇති කිරීම නිසා අවසානයේ එය අත් හළහ (M.I,243-4).

හුස්මේ චලනය පිළිබඳව භාවනාවක් (ආනාපානසති) බුදුපියාණන් වහන්සේ ඉගැන්වූවත්, එම භාවනාව බුදුපියාණන් වහන්සේ පුරුදු කළේ නැත. එයට හේතුව එම භාවනාවේ යම් ගූඪ බලයක් හෝ වැදගත් කමක් නැතැයි උන්වහන්සේ විශ්වාස කළ නිසාය. එසේ නම් හුස්ම පිළිබඳව ඇයි? මෙයට බොහෝ විට හේතු තුනක් තිබේ. පළමුවැන්න සම්පූර්ණයෙන්ම ප්‍රායෝගිකයි. 1. හුස්ම භාවනා කිරීමට අවධානය යොමු කිරීමේ පහසු අරමුණක් නිසා එය බුදුපියාණන් වහන්සේ භාවිත කළහ. එය සැම දෙනාටම නිදහස්ව ඇති දෙයකි. 2. මනස සන්සුන් කිරීම සඳහා හුස්මේ ඇති මෘදු ඇතුළත - පිටත රටාවකට නිතිපතා වන සිදුවීම් පෙළට ඇති ස්වාභාවික හැකියාව, 3. හුස්ම කෙරෙහි අවධානය යොමු කිරීම බාහිර අවධානයෙන් මනස වෙත අවධානය යොමු කිරීමේ පළමු පියවර විය හැකිය.

බොහෝ මානසික තත්ත්වයන් ස්වසනයේ වෙනස් කම් ඇති කරයි. අප සන්සුන් වනවිට, අපගේ හුස්ම දීර්ඝ, සෙමෙන් සහ මෘදු වෙයි. අප ප්‍රකෝප වූ විට, එය කෙටි සහ වේගවත් වේ. අපි අපේ හුස්ම

බලාපොරොත්තුවලින් අල්ලා ගනිමු, තරහෙන් ආශ්වාස ප්‍රශ්වාස කරමු, දුකෙන් හෝ පසුතැවිල්ලෙන් සුසුම් හෙළමු, කුපිත වෙමු, සහ සහනයකින් තොරව හුස්ම ගනිමු. අපගේ හුස්මේ චලනය පිළිබඳව සෝදිසියෙන් සිටීම ස්වභාවයෙන්ම අපගේ මනසේ චලනය පිළිබඳව දැනුවත් වීමට හේතු වේ. බලන්න **ස්වසනය පිළිබඳ සිහිකල්පනාව**

*Breath by Breath*, Larry Rosenburg,1999.

## අල්ලස් ගැනීම හෝ දීම

අල්ලසක් (ලඤ්ච) යනුවෙන් අදහස් කරන්නේ තම රාජකාරියට පටහැනිව කටයුතු කිරීම සඳහා වගකිවයුතු තත්ත්වයක සිටින පුද්ගලයෙකුට බලපෑම් කිරීම සඳහා ලබා දෙන, ලබා දී ඇති හෝ ඉල්ලා සිටින වටිනාකමකි. දූෂිත නිලධාරියෙකු 'අල්ලස් කන්නෙකු' (ලඤ්චඛාදක, ජා.11,196) පැරණි ඉන්දියාවේ හඳුන්වනු ලැබුණි. පොලිස් බලකායක් වශයෙන් සේවය කළ මිනිස් සමූහයක් කෝලියවරුන්ට තිබුණු බව ත්‍රිපිටකයේ සඳහන් වේ. ඔවුන් පැහැදිලිව පෙනෙන හිස් පළඳනාවක් පැළඳූ අතර, ඔවුන් ප්‍රචණ්ඩත්වයට සහ දූෂණයට ප්‍රසිද්ධියක් තිබුණි. එසේම අල්ලස් ගැනීමට ද බොහෝ විට නැඹුරු විය (S.IV,341). බලවත් මිනිසුන් මත විශ්වාසය රඳවමින් ඇතැම් සොරුන් නැවතත් බොහෝ විට බලවතුන්ට අල්ලස් දෙමින් නීතිය මඟ හැරිය බවත්, බුදුපියාණන් වහන්සේ නිරීක්ෂණය කළහ. අල්ලස් ගැනීම සහ දීම බොහෝ විට අදහස් කරන්නේ දෙවන සහ හතරවන ශික්ෂාපදය කඩ කිරීමයි (A.I,154). එයට සැමවිටම වංචාව, කෑදරකම, අසාධාරණය සහ නීතිය කඩකිරීම අදාළ වේ.

සියලු පාරම්පරික බෞද්ධ රටවල් 2008 ජාත්‍යන්තර විවෘත භාවය පිළිබඳ දූෂණ හැඳින ගැනීමේ දර්ශකයේදී අල්ප ලකුණු රැස් කළහ. රටවල් 180කින්, භූතානය අඩුම දූෂණය ඇති බෞද්ධ රට ලෙස 45 වන ස්ථානයට පත් විය. තායිලන්තය 80වන ස්ථානයටත්, ශ්‍රී ලංකාව 92වන ස්ථානයටත් පත් විය. ජාත්‍යන්තර විවෘතභාවය පිළිබඳ ආයතනයට අනුව, ලෝකයේ වඩාත් දූෂිත දෙවන රට වූයේ බුරුමයයි. කාම්බෝජියාව යට පැත්තෙන් 11වන ස්ථානයටත්, ලාඕස් 26වන ස්ථානයටත් පත් විය.

## පාලම්

පාලම් (**චඞ්කම** හෝ සෙතු) යනුවෙන් අදහස් කරන්නේ ගංගා, මිටියාවත් හෝ දුර්ග වැනි බාධක හරහා මිනිසුන්ට හෝ වාහනවලට ගමන් කිරීමට ගොඩනඟන නිර්මාණයි. ජනතාවගේ යහපත සඳහා පාලම් ගොඩනැඟීම පුණ්‍ය කර්මයකට උදාහරණයක් බව බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ (S.I,33). කුලාවක ජාතකයේ බෝධිසත්ත්වයන් වහන්සේ ප්‍රජාවේ ශුභසිද්ධිය පිළිබඳ තැකීමක් ඇති ගම්වාසියෙකු විස්තර කර ඇත. ඔහු අවට පාරවල්වල තිබෙන විශාල ගල් ඉවත් කරයි. ගැල් හෝ අශ්ව කරත්තවල ඇක්සල් කැඩෙන්නට හේතුවන ගස් කපා දමයි. පාලම්, මුහුදු වෙරළාසන්න නිකේතන සහ ගිමන් හල් මගීන්ගේ පහසුව සඳහා සාදයි (Ja.I,199). විශ්වාස කටයුතු පාලමක්. ලෙස හඳුන්වන උණ බටවලින් සෑදූ පාලමක් පිළිබඳව ත්‍රිපිටකය සඳහන් කරයි. එය තවලමක්, ඇතෙකු හෝ අශ්වයන්ට හරහා යන්නට තරම් ශක්තිමත් බව අටුවාවේ සඳහන් වේ (Th.7; Vin.I,106).

ගඟක් තරණය කිරීම ආධ්‍යාත්මික ප්‍රයත්නයේදී රූපකයක් ලෙස ත්‍රිපිටකයේ නිතර භාවිත වන හෙයින්, පාලම් තැනීම, ඒවා ඉදි කිරීම සඳහා මුදල් ගෙවීම හෝ අලුත්වැඩියා කිරීම මුල් කාලීන බෞද්ධයන්ට විශේෂ ආකර්ෂණයක් තිබූ බව පෙනේ. මහායාන සූත්‍රයේ දුසිමක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් පාලම් තැනීමේ ගුණාංග සඳහන් වේ. උදාහරණ වශයෙන් සර්වගුණපුන්‍යක්ෂේත්‍ර සූත්‍රයේ 'කුසලතාවේ අංශ' හතක් සඳහන් වේ. ඒවායෙන් හතරවැන්න 'මිනිසුන්ට ගංගා තරණය කිරීමට උපකාර පිණිස පාරු නඩත්තු කිරීම' වන අතර, පස්වැන්න 'රෝගීන් සහ දුර්වල පුද්ගලයන්ට ගංගා තරණය කිරීමට පාලම් ඉදිකිරීම' ලෙස සඳහන් වේ.

බුදුදහම ව්‍යාප්ත වෙත්ම, ඒ සමග ප්‍රායෝගික ලෙස කරුණාව ප්‍රකාශ කිරීම සිදුවිය. ශ්‍රී ලංකාවේ බෞද්ධ වංශකතාවක් වූ චූලවංසය, භික්ෂූන් පාලම් ඉදිකිරීම පිළිබඳව සඳහන් නොකරයි. නමුත් ආගමික චේතනාවෙන් එසේ කළ බොහෝ රජවරු පිළිබඳව සඳහන් කරයි. උදාහරණ වශයෙන් විජයරාජසීහ 'ජලය නිසා මාර්ග හරහා යාමට නොහැකි තත්ත්වයන් ඇති ස්ථානවල යාම් ඊම් පහසුව සඳහා ගල්වලින් පාලම් ඉදි කළේය.'දේවපතිරාජ රජු බොහෝ විශාල ප්‍රමාණයේ සහ ශක්තිමත් පාලම් සෑදීම පිළිබඳව වංශකතාවේ සඳහන් වේ. බහුශ්‍රැත බුද්ධිමතෙකු වූ තන්ග්ටොං ගාල්පො (1385-1464)දී ටිබෙටයේ සහ භූතානය පුරා සංගිලි පාලම් 50කට වඩා වැඩි ප්‍රමාණයක් ඉදි කළේය. 20වන ශතවර්ෂයේ මැද වන තුරුම ඔහු විසින් ඉදි කළ බොහෝ පාලම් භාවිත විය.

ආගමික පුරුද්දක් වශයෙන් පාලම් ඉදිකිරීම චීනයේ සහ ජපානයේ ඉතා ජනප්‍රිය විය. සංගීතයේ ඉතිහාසය නමැති ග්‍රන්ථයේ 'තාක්ෂණික පුහුණු' අංශයේ හුඅයි බිං නමැති භික්ෂුවක් පිළිබඳව සඳහන් වේ. ඔහු ආධාරකයන් අටක් රැහැනෙන් බැඳ තබන, පතුළ පැතැලි බෝට්ටුවක් සහිත පාලමක් ඉදි කළේය. තවත් වැඩක් පිළිබඳව භික්ෂුවක් පැවසූ බවට සිවුආන් ටොන්ග්සි යන පැරණි චීන ග්‍රන්ථයක වාර්තා කර ඇත: 'පළමුව මා සිතුවේ ඉහළම පුණ්‍ය කර්මයට ප්‍රභවය එන්නේ පිළිම ලී වලින් කැටයම් කිරීම සහ බුදුපියාණන් වහන්සේගේ පිළිරූ මැටියෙන් සෑදීම වශයෙනි. නමුත් එක් දිනයක මට වැටහුණේ අනෙක් මිනිසුන්ට සහ අනෙක් සත්ත්වයන්ට උපකාර කිරීම 'පුණ්‍ය කර්මයට ඉණිමග සහ බෝට්ටුව යන්නයි.' මීට පසු එම භික්ෂුව පාලම් සෑදීමේ වැඩසටහනක් ඇරඹුවේය. පාලම් සෑදූ භික්ෂූන් සහ ගිහි පින්වතුන් සැමවිටම පැවසුවේ 'මිනිසුන් විඳින දුෂ්කරතා පිළිබඳව අනුකම්පාවෙන්' හෝ 'ගඟ බෝට්ටුවලින් තරණය කිරීමට උත්සාහ කිරීමේදී මිනිසුන් ගඟේ ගීලිම පිළිබඳව ඇතිවූ අනුකම්පාව' නිසා තමන් එසේ කළ බව යයි චීන මූලාශ්‍ර සඳහන් කරයි. ජපන් භික්ෂුවක් වූ ඩොෂො (629-700) පාරවල්, වේලි සහ පාලම් පිළිබඳ ප්‍රසිද්ධ ඉංජිනේරුවරයෙකි. ජපානයේ වඩාත් ප්‍රසිද්ධ නූතනයට පෙර පාලම් අතුරෙන් නගසකිවල පිහිටි ශෝභන ආකර්ෂණීය පාලම නම් කළ හැකිය. එය 1634දී සැලසුම් කර ඉදි කරන ලද්දේ මොකුසුන්යොයුජෝ නමැති භික්ෂුවයි. මෙම නව්‍ය ව්‍යූහය ජපානයේ ඉදි කළ පළමු ගල්-රැළි පාලමයි.

එය අදටත් භාවිත වේ. එයට එම නම තබන ලද්දේ ජලයේ රැළි දෙකක් පිළිබිඹු වන නිසාය. එය උපැස් යුවලක් ලෙස පෙනේ.
*The Impact of Buddhism on Chinese Material Culture*, John Kieschnick, 2003.

## බුදුපියාණන් වහන්සේ

බුද්ධ යනුවෙන් අදහස් වන්නේ 'ප්‍රබුද්ධව' යන පදවි නාමයයි. සිද්ධාර්ථ ගෞතම බුද්ධත්වයට පත් වූ පසු තමන් වහන්සේ හැඳින්වූයේත්, අනෙක් අය හැඳින්වූයේත් ඒ නමින්ය. පුද්ගලයෙකුට වඩා වැඩියෙන්, බුදුවරයෙක් යනු ප්‍රඥාවේ සහ කරුණාවේ අගතැන්පත් වූවෙක්ය. එසේම තව දුරටත් නැවත ඉපදීමට යටත් නොවේ. බුදුවරයන් බුද්ධත්වයට පත් වන්නේ සම්පූර්ණයෙන්ම උන්වහන්සේලාගේ සුවිශේෂත්වයෙන්ය. නමුත් අර්හතුන් අර්හත්වයට පත්වන්නේ බුදුවරයන්ගේ ධර්මය ඇසීමෙන් සහ පුහුණු කිරීමේ ප්‍රතිඵලයක් ලෙසය. අපගේ වර්තමාන යුගයේ බුදුන්වහන්සේ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේය. නමුත් පෙර යුගවලදීද බුදුවරයන් පහළ වූ අතර ඈත අනාගතයේදීද බුදුවරයන් පහළ වන බව සාම්ප්‍රදායිකව දැනගන්නට ඇත. ඊළඟ බුදුන්වහන්සේ මෛත්‍රේය යනුවෙන් නම් වේ. ධර්මයේ සත්‍යය ඉක්මනින් හෝ පමාවී අපැහැදිලි වූ විට, යම් කෙනෙකු එය නැවත අනාවරණය කරයි. එවැනි පුද්ගලයෙකු හඳුන්වන්නේ බුද්ධ යනුවෙනි. 'ලෝකයෙන් අවිද්‍යාව නමැති ව්‍යාජය ඉවත් කරන්නා' (ලොකෙ විවත්තච්ඡද්දො, D.II,19) යනුවෙන් හැඳින් වේ. බලන්න **නිශ්ශබ්ද බුද්ධ**
*The Historical Buddha*, H.W. Schumann, 1989.

## බුද්ධ චරිත

බුද්ධ චරිත හෝ 'බුදුපියාණන් වහන්සේගේ ක්‍රියා' උන්වහන්සේගේ පළමු යථාර්ථවාදී සහ සම්පූර්ණ ජීවන චරිතාපදානය වේ. එය රචනා කරනු ලැබුවේ ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයේදී ශ්‍රේෂ්ඨ ඉන්දියානු කවියෙකු වන අශ්වඝෝෂ විසිනි. විනය පිටකයේ ඇතුළත්, චරිතාපදානයක් සඳහා මීට පෙර දැරූ උත්සාහයන් අසම්පූර්ණය, නැතහොත් ලලිතවිස්තරය මෙන් අතිශෝක්තියෙන් පිරී ඇත. එය සත්‍යකට වඩා, යථාර්ථයක් නොවූ කථාවකි, නව කථාවකි.

සමහර කොටස් විස්තර වශයෙන් පැහැදිලි කළත්, ප්‍රබෝධමත් කරන සහ උපදේශාත්මක ඵලයක් ඇතිවන ලෙස වැඩිකර දක්වමින් ත්‍රිපිටකයේ සඳහන් ආකාරයට සම්පූර්ණයෙන්ම සමීප ලෙස අනුගමනය කරමින් බුදුපියාණන් වහන්සේගේ ජීවිතය බුද්ධචරිතයේ සටහන් කර ඇත.

බුද්ධචරිතයේ සඳහන් 2132ක් වූ ශෝභන සහ කිවි බසට යෝග්‍ය සංස්කෘත පැදි ඉන්දියානු සාහිත්‍යයේ ඉහළම නිපුණ බවින් පරිපූර්ණ කෘතිය ලෙස සැලකීමට යොමු වී ඇත. පැරණි කාලයේදී පවා එය බොහෝ භාෂාවලට පරිවර්තනය කර ඇත.
*Aśvaghosa's Buddhacarita*, trans. by E. H. Johnston, 1998.

## බුදුපියාණන් වහන්සේ, කාලය

බුදුපියාණන් වහන්සේ වසර 80ක් ජීවත්වූ බවට සියලු මූලාශ්‍ර එකඟ වේ. නමුත් උන්වහන්සේ නිශ්චිතවම උත්පත්තිය ලැබුවේ කවදාද යන්න පිළිබඳව විශාල

ලෙස පැතිරුණු නොගැළපීම් ඇත. අඩුම තරමින් ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයේ මුල් කාලයේ සිටම, උන්වහන්සේ උත්පත්තිය ලබා ඇත්තේ ක්‍රි.පූ. 624 යැයි ශ්‍රී ලාංකිකයන් විශ්වාස කර ඇත. තුන්වන හෝ හතරවන ශතවර්ෂයේදී පමණ ශ්‍රී ලංකාවේදී මෙම දිනය මහාවංසයේ සහ දීපවංසයේ සටහන් කර ඇත. එම නිසා සමහර විට එය එකල ශ්‍රී ලංකාවේ විශ්වාස කළ දෙය විය හැකිය.

මෑතක් වනතුරුම ඉන්දියානු සාහිත්‍ය, ඉතිහාසය සහ දර්ශන විද්‍යාව පිළිබඳ ශිෂ්‍යයන් සහ ඉතිහාසඥයන් ක්‍රි. පූ. 563 බුදුපියාණන් වහන්සේගේ උපන් දිනය ලෙස බොහෝ දුරට සැලකිය හැකි දිනය ලෙස විශ්වාස කළහ. කෙසේ නමුත්, තුන්වන හෝ හතරවන ශතවර්ෂයේදී පමණ ශ්‍රී ලංකාවේදී මෙම දිනය මහාවංසයේ සහ දීපවංසයේ සටහන් කර ඇත. එම නිසා සමහර විට එය එකල ශ්‍රී ලංකාවේ විශ්වාස කළ දෙය විය හැකිය. නමුත් 1988දී බුදුපියාණන් වහන්සේගේ දිනයන් සම්බන්ධයෙන් සියලු සාක්ෂි සමාලෝචනය කිරීම සඳහා ජර්මනියේ ගොටින්ජන් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර විද්වතුන්ගේ සමූළුවක් පැවති අතර, උන්වහන්සේ උපත ලැබුවේ 563ට පසුව බව සමහර විට වසර 100කට පසුව බවට පුළුල් පොදු එකඟතාවක් තිබුණි. මෙම කරුණ සම්බන්ධයෙන් නිශ්චිතභාවයක් ඇති කර ගැනීමට තවත් පර්යේෂණ සිදු කිරීම අවශ්‍ය වේ. සැබැවින්ම බුදුපියාණන් වහන්සේගේ දිනයන් පිළිබඳව අවිනිශ්චිතතාව උන්වහන්සේගේ ඉගැන්වීම්වල සත්‍යතාවයට බලපාන්නේ නැත.

*When Did the Buddha Live?*edited by Heinz Bechert, 1995.

## බුද්ධඝොස

බුද්ධඝොස යනුවෙන් අදහස් කරන්නේ 'බුදුපියාණන් වහන්සේගේ හඬ' යන්නයි. බුද්ධඝොස ක්‍රි. පූ. 5වන ශතවර්ෂයේ දකුණු ඉන්දියානු උගත් භික්ෂුවකි. උන්වහන්සේ ත්‍රිපිටකයට අයත් පැරණි අටුවා අධ්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට පිටත් වූහ. පසුව ශ්‍රී ලංකාවේ ථේරවාද පාණ්ඩිත්‍යය මධ්‍යස්ථානයේ මහාවිහාර භික්ෂූහු අටුවාවන් පාලියට පරිවර්තනයට කිරීමට උන්වහන්සේට ආරාධනය කළහ. එසේ කිරීමේදී උන්වහන්සේ බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල ථේරවාද අර්ථනිරූපණ ක්‍රමවත් කර, ප්‍රතිෂ්ඨාපනය කළහ. එසේම උන්වහන්සේ විසුද්ධිමග්ග නමින් ථේරවාද ධර්මයට සහ පුහුණුවට මාර්ගෝපදේශයක් ලියූහ. උන්වහන්සේගේ සාහිත්‍යමය ක්‍රියාවලිය අවසන්වූ පසු බුද්ධඝෝස හිමියෝ නැවතත් ඉන්දියාවට වැඩියහ. ඉන් අනතුරුව උන්වහන්සේගේ ජීවිතයේ ඉතිරි කාලය පිළිබඳව තොරතුරක් නැත. උන්වහන්සේගේ අටුවා කෙරෙහි විශ්වාසය තැබිය හැකි බව නොකඩවා අවධානයට ගැනුණි. තවමත්, අදටත් පුළුල් ලෙස කියවීම සහ අධ්‍යයනය කෙරේ.

*Buddhaghosa*, B. C. Law, 1946.

## බුදුදහම සහ බෞද්ධයන්

'බුඩිසම්' යනු බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් මත පදනම් වූ දර්ශනය සඳහා ඉංග්‍රීසි නාමයයි. මෙම නම මුලින්ම ලියා ඇත්තේ 1801 දී ඉංග්‍රීසි ජාතිකයෙකු ශ්‍රී ලංකාව ගැන ලියන විටදීය. ඊට පසු

දශක කිහිපයකට පසු එය බෞද්ධිසම් හෝ බුද්ධිසම් යනුවෙන් ලියැවී, අවසානයේ බුඩිසම් බවට පත්වී ඇත. බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ ජීවිතය පිළිබඳ දර්ශනය උතුම් පුද්ගලයන්ගේ ඉගැන්වීම් (අරිය ධම්ම) හෝ සත්‍යය සහ පුහුණුව (ධම්ම විනය), වශයෙන් හැඳින්වූහ. ශාක්‍ය පරම්පරාවෙන් පැවත එන්නන් ලෙස තමන්වහන්සේලා හඳුන්වන ලෙස බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රාවකයන්ට පැවසූහ. ඒ බුදුපියාණන් වහන්සේගේ (සාක්‍ය පුත්ත, S.I,192) වරක් යම් කෙනෙකු ආනන්ද ස්වාමීන් වහන්සේ කුමන වර්ගයේ භික්ෂුවක් ද කියා විමසුවේය. 'මම සාක්‍යපුත්ත භික්ෂුවක්මි' යැයි (A.V,196) උන්වහන්සේ පිළිතුරු දුන්හ. සමහර විට මුල් කාලීන බෞද්ධයන් අනෙක් අය හඳුන්වනු ලැබුවේ හුදෙක් ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයන් වශයෙනි (ගෝතම සාවක, Dhp.296). ක්‍රිස්තියානි, ඉස්ලාම් සහ හින්දු ආගමට පසු ලෝකයේ හතරවෙනි විශාල ධර්මය බුදුදහමයි. වර්තමානයේ ලෝකයේ මිලියන 500ක් පමණ බෞද්ධයෝ ජීවත් වෙති.

## බුදුපියාණන් වහන්සේ සහ ජේසුස්වහන්සේ

බුදුපියාණන් වහන්සේ සහ ජේසුස්වහන්සේ සමහර විට, ඉතිහාසයේ වැඩ සිටි ඉතාමත් වැදගත් බලසම්පන්න පුද්ගලයන් දෙදෙනා වූහ. උන්වහන්සේලාගේ ඉගැන්වීම් ඔවුන් අනුගමනය කළ සංස්කෘතීන් කෙරෙහි ගැඹුරු හා ධනාත්මක බලපෑමක් ඇතිකර තිබේ. උන්වහන්සේලා දෙදෙනා අතර සිත්ගන්නාසුලු සමානකම් ද ඇත. දෙදෙනා

වහන්සේලාම නිවෙස්වලින් බැහැරව, ඔබ මොබ යන ගුරුවරුන් වූ අතර, උන්වහන්සේලාගේ අදහස් තේරුම් කිරීමේදී උපමා කථා සහ කතන්දර භාවිත කිරීමේ නිපුණ වූහ. දෙදෙනා වහන්සේලාම ශ්‍රාවකයන් කණ්ඩායමක් ආකර්ෂණය කර, ඔවුන්ගේ ඉගැන්වීම් පතුරුවා හැරීමට කටයුතු කළහ. බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේ බුද්ධත්වයට පත් පෙළගැස්මේ නවතම බුදුවරයා ලෙස වටහා ගත්හ (S.II,106). ජේසුස්වහන්සේ උන්වහන්සේ පුරාණ උතුම් යුදෙව් ශාස්තෘවරයාගේ අනුප්‍රාප්තිකයා ලෙස විශ්වාස කළහ. නමුත්, වඩාත්ම වැදගත් සමානකම් ලෙස අපට පෙනෙන්නේ දෙදෙනා වහන්සේලාගේ සදාචාරාත්මක දැක්ම තුළය. උන්වහන්සේලා තුළ තිබූ සමාන මනසක් පෙන්නුම් කරන උන්වහන්සේලා ඉගැන්වූ බොහෝ දේවල්වලින් කිහිපයක් මෙසේය:

අන් අයගේ වැරදි, ඔවුන් කර ඇති හෝ කිරීමට අසමත් වූ දේ දෙස කිසිවිට නොසිතන්න. ඒ වෙනුවට, ඔබ කළ හෝ කිරීමට අසමත් වූ දෙස බලන්න. (Dhp.50)

විනිශ්චය නොකරන්න. එවිට ඔබ විනිශ්චයට ලක් නොවේ. මක්නිසාද යත්, ඔබ අන් අය විනිශ්චය කරන ආකාරයටම ඔබ විනිශ්චයට ලක්වන අතර, ඔබ භාවිත කරන මිනුමෙන්ම ඔබ මිනුමට ලක්වන නිසාය. (Matthew 7,1-

මෝඩයා, ඔබේ අවුල්වූ කෙස් සහ ඔබේ එළු සමෙන් යුතු ඇඳුමෙන් ඇති ඵලය කුමක් ද? ඇතුළත ගැටගැසීමක් තිබෙන විට ඔබ පිටත පිරිසිදු කරයි. (Dhp.394)

2) දැන් ෆරීසස්වරුණි, කෝප්පයේ සහ පිඟානේ පිටත පිරිසිදු කරන්න. නමුත් ඇතුළතින් නුඹ ලෝභයෙන් සහ නපුරුකමින් පිරී ඇත. ඔබලා මෝඩ මිනිසුන්! (Luke 11,39-40)

රිදවීමෙන්, මරාදැමීමෙන්, කපා දැමීමෙන්, හා බැඳීමෙන්, සොරකම් කිරීමෙන්, බොරු කීමෙන්, වංචා කිරීමෙන් සහ රැවටීමෙන්, ශුද්ධ ලියවිලි විකෘති කිරීමෙන් සහ කාමමිථ්‍යාචාරයේ යෙදීමෙන්, පුද්ගලයෙකු අපිරිසිදු කරයි. මස් අනුභව කිරීමෙන් නොවේ.

මක්නිසාද, නපුර, මිනීමැරුම, කාමමිථ්‍යාචාරය, ලිංගික දුරුචාරය, සොරකම, බොරු සාක්ෂි සහ අපහාස සිදු කරන්නේ හදවතින්මය. ලිංගික දුරාචාරය, සොරකම, බොරු සාක්ෂි සහ අපහාස සිදු කරන්නේ හදවතින්මය. පුද්ගලයෙකු අපිරිසිදු කරන්නේ මේවායි. අත

(Sn.242)

රෝගීන්ට සාත්තු කරන්නා මට සාත්තු කරයි. (Vin.IV,301)

නොසෝදා ආහාර ගැනීමෙන් නොවේ. (Matthew 15, 19-20)

මම ඔබට සත්‍යය කියමි. මගේ සහෝදරයන්ට ඔබ කරන්නාවූ ඕනෑම අඩුම දෙයක් වුවත්, ඒ මට කළා හා සමානය. (Matthew 25,40)

ඔවුන් අතීතය පිළිබඳව කරදර නොවේ. අනාගතය පිළිබඳව ඔවුන් ආශා කරන්නේ නැත. වර්තමානය තුළ ඔවුන් පවත්වා ගෙන යයි. ඒ නිසා ඔවුන්ගේ පෙනුම සහ

එමනිසා හෙට දින ගැන කරදර නොවන්න. එයට හේතුව හෙට, දිනය ගැන කරදර වනු ඇත. සෑම දිනකම තමන්ට ප්‍රමාණවත් කරදර ඇති වේ. (Matthew 6,34)

ගුණය ශාන්තය.
(S.I,5)

බුදුපියාණන් වහන්සේ සහ ජේසුස්වහන්සේ සමාන ඉරණමකට මරණයෙන් පසුවත් මුහුණ දුන්හ. ජේසුස්වහන්සේ සහ බුදුපියාණන් වහන්සේත් අවසානයේ දේවත්වයට පැමිණුන බව මහායානයේ සමහර ගුරුකුලවලට අනුව සඳහන් වේ. එක්තරා භික්ෂුවක් තමන්වහන්සේගේ ශාරීරික පෙනුමෙන් ආකර්ෂණය වූ විට, බුදුපියාණන් වහන්සේ ඔහුට වරද පෙන්වා දුන්හ: ''ඔබට මගේ මේ කිළිටි ශරීරය දකින්නට අවශ්‍ය ඇයි? ධර්මය දකින්න, එවිට ඔබට මා දැකිය හැකිය'' (S.III,120). කෙසේ නමුත්, තුන්වන ධර්ම සංඝායනාව අතරතුර, සමහර සහභාගීවූවන් කියා සිටියේ බුදුපියාණන් වහන්සේ කෙතරම් පරිපූර්ණද යත්, උන්වහන්සේගේ මළ මූත්‍ර පවා සුවඳ බවයි (Kv.XVIII,4). සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ (ක්‍රි. පූ. 1වන ශතවර්ෂයේදී පමණ) සඳහන් වන්නේ බුදුපියාණන් වහන්සේ ආරම්භයේ සිටම වැඩ සිටි බවයි.! ජේසුස්වහන්සේ 'යහපත් ගුරුතුමා', වශයෙන් යම් කෙනෙකු ආමන්ත්‍රණය කළ විට, උන්වහන්සේ වහාම ඔහුට කථා කොට එය නිවැරදි කළේය: ' ඔබ මා යහපත් යැයි කියන්නේ ඇයි? දෙවියන් වහන්සේ හැර වෙන කිසිවෙක් යහපත් නොවේ' (Luke 18,19). ජේසුස්වහන්සේගේ මරණයෙන් වසර 20ක් ඇතුළත, එවැනි ප්‍රකාශ නොසලකා හරිමින් ශාන්ත පාවුළු ඒ වනවිටත් කියා සිටියේ ජේසුස්වහන්සේ දෙවියන් වහන්සේගේ මිනිස් ආරෝපිතයක් බවයි.

නමුත්, මේ සියලු සමානකම් තිබියදීත්, ජීවිත, සහ

විශේෂයෙන්ම දෙදෙනා වහන්සේලාගේ ගැඹුරු ඉගැන්වීම්, බොහෝ ආකාරයෙන් වෙනස් වූ බව පෙනේ. බුදුපියාණන් වහන්සේ පාලක තන්ත්‍රයේ පවුලකින් පැවත ආ අතර, ජේසුස්වහන්සේ උත්පත්තිය ලැබුවේ පහත් තත්ත්වකය. ජේසුස්වහන්සේ කිසිදිනක විවාහ වූයේ නැත. බුදුපියාණන් වහන්සේ ස්වාමිපුරුෂයෙක් සහ පියෙක් විය. බුදුපියාණන් වහන්සේ සැම දෙනාටම ඉගැන්වූ නමුත්, උන්වහන්සේගේ පණිවුඩය බොහෝ විට උගතුන් සහ බුද්ධිමතුන් සමග ප්‍රතිනාද විය. ජේසුස්වහන්සේ ඔහුගේ පණිවුඩය ප්‍රධාන වශයෙන්ම යොමු කළේ සාමාන්‍ය පොදු ජනතාවටයි. ඔහුගේ ශ්‍රාවකයන් දිරි ගැන්වූයේ කුඩා දරුවන් මෙන් වන්නටය (Matthew 18,3). බුදුපියාණන් වහන්සේ ජීවත්වූයේ සාපේක්ෂ වශයෙන් සාමකාමී කාලයක වන අතර, දේශපාලනමය වශයෙන් ද නිදහස් වූ කාලයකය. ජේසුස්වහන්සේ මෙහෙවර එවකට පැවති ප්‍රචණ්ඩත්වයට නැඹුරු දේශපාලනය සමග විසඳාගත නොහැකි ලෙස මිශ්‍ර වී තිබුණි. බුදුපියාණන් වහන්සේ වසර 45ක් ඉගැන්වූ සේක. ජේසුස්වහන්සේ වසර දෙකක් හෝ තුනක් පමණි. පුළුල් වූ යථාර්ථය පිළිබඳව දෙදෙනා වහන්සේලාගේ අවබෝධයේ සම්පූර්ණයෙන්ම පොදු වූ කිසිවක් නැත. බුදුපියාණන් වහන්සේ දිව්‍යමය මැවුම්කරුවෙකු පිළිබඳව විශ්වාස නොකළහ. ජේසුස්වහන්සේ විශ්වාස කළහ. බුදුපියාණන් වහන්සේට පරමාත්මය වූයේ, 'නොඉපදුණ, සිදුනොවූ, නොසෑදූ, නොතැනූ' මනුෂ්‍ය නොවන ස්වභාවයකි (Ud.80). දෙවියන් වහන්සේ පැහැදිලිවම පෙනෙන ආකාරයට පෞද්ගලික සහ මනුෂ්‍ය-ස්වභාවයක් ඇත්තෙකු ලෙස ජේසුස්වහන්සේ දුටුවහ. සමහර වේලාවට ඔහු දෙවියන් වහන්සේ

'අබා' යනුවෙන් ඇමතුවේය. එය ආදරණීය කුළුපගතාවයට භාවිත කරන යෙදුමකි. ජේසුස්වහන්සේ ඔහුගේ කිතුනු දහම දුටුවේ දිව්‍යමය විනිශ්චයෙන් සහ නිරයෙන් ගැලවීම ලෙසයි. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය දුටුවේ සංසාරයෙන් නිදහස් වීම ලෙසයි. මෙය අනුගමනය කරමින් බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ අවධානය මනස තුළට යොමු කරමින් භාවනා කළහ. ජේසුස්වහන්සේ ඔහුගේ ඉල්ලීම් දෙවියන් වහන්සේ වෙත පිටතට යොමුකරමින් යාච්ඤා කළේය. ජේසුස්වහන්සේට අනුව, මිනිස් සංහතියේ ඉලක්කය වන්නේ දෙවියන් වහන්සේ ඉදිරියේ නැවත ඉපදීමයි. බුදුපියාණන් වහන්සේට අනුව, දිව්‍යලෝකය නිසැකයෙන්ම නිර්වාණයට පහත් අරමුණකි. බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේගේම වර්ගයට විශේෂ අවධානයක් නොදුන් අතර, සියලු ගෝත්‍ර, කුල සහ පංතිවලටම ඉගැන්වූ සේක. 'ඊශ්‍රායලයේ බැටළුවන්ට පමණක්', දෙවියන් වහන්සේ තෝරා ගත් මිනිසුන්ට ඉගැන්වීමට ඔහු යවා ඇතැයි ජේසුස්වහන්සේ විශ්වාස කළේය (Matthew 10,5-6; 15, 24). දෙවියන් වහන්සේ ඉතා ඉක්මණින් ගෙන්දගම් සහ ගින්දර සමගින් විනාශකාරී සිද්ධියකින් ලෝකය විනාශ කරනු ඇතැයි ජේසුස්වහන්සේ විශ්වාස කළහ (Matthew 10,23; 16,28). අනාගතය පිළිබඳව අනාවැකි කීමට බුදුපියාණන් වහන්සේට තිබූයේ ඉතා අල්ප උනන්දුවකි. එසේම ජේසුස්වහන්සේගේ අප්‍රසන්න අනාවැකි ඒත්තු නොගන්නා බවට පෙනෙන්ට ඇත. සමහර විට තමාගේ කෝපයට පත්වීම් සාධාරණ යැයි ජේසුස්වහන්සේට හැඟුණි. ඒ විශේෂයෙන්ම ඔහුගේ පණිවුඩය සැක කළ හෝ හෙළා දැක්ක විටයි

(Matthew 23,33-35; John 2,15). සරදමට ලක් කළ, අපහාස කළ විට හෝ සැක කළ විට, බුදුපියාණන් වහන්සේ සිනහමුසු නොකැළඹුණ බවින් දරා සිටියහ (M.I,171; S.I,161-3).

ඒ අනුව, මෙම උතුම් ගුරුවරුන් දෙදෙනා වහන්සේලා ගැන සම්පූර්ණයෙන් පිරික්සා බැලුවොත්, කුතුහලය දනවන සමානකම් සහ පැහැදිලිව කැපී පෙනෙන වෙනස්කම්, පොදුවේ ගත් ලක්ෂණයන් සහ ප්‍රභේදයන් හෙළි වේ. යම් කෙනෙකුට උන්වහන්සේලා සහ උන්වහන්සේලා විසින් පදනම් කරගත් ධර්මය අවංකවම අවබෝධ කර ගැනීමට අවශ්‍ය නම් මෙම සමාන කම් සහ අසමානකම් යන දෙකම පිළිගත යුතුව ඇත. කෙසේ නමුත්, බෞද්ධයන් සහ ක්‍රිස්තියානීන්, මිතුරන් ලෙස හමුවන විට, බුදුපියාණන් වහන්සේගේ මෙම වචන ඔවුන්ට මතක තිබේ නම්, ඔවුන්ගේ එම හමුවීම් බොහෝ සුමිහිරි හා ඵලදායී වනු ඇත.: 'එකඟතාවක් නොමැති දේ පසෙකට දමන්න. එකඟතාවක් ඇති දේ, ප්‍රඥාවන්තයන් අවධානයට ගෙන, සාකච්ඡා කර, විමසා බලනු ඇත' (D.I,164). බලන්න **මහඟු නියමය**

## බුද්ධ, ජීවිතය

සිද්ධාර්ථ ගෞතම, පසුව බුදුපියාණන් වහන්සේ ලෙසින් හඳුන්වනු ලැබූහ. උතුරු ඉන්දියාවේ සාක්‍ය ප්‍රාන්ත රාජ්‍යයේ කුඩා ගමක ප්‍රබල පවුලක උත්පත්තිය ලැබුවේය. සුඛෝපභෝගී ලෙස හැදී වැඩී, විවාහ වී පුතෙකු ලැබුවේය. වරප්‍රසාද සහ සැපපහසුකම් වලින් යුක්ත ජීවිතයක් තිබියදීත්, සිද්ධාර්ථ සතුටෙන් නොසිටියේය. ඔහු වටා සැම

තැනම තිබී දකින්නට ලැබුණු දුක්වේදනා පිළිබඳව ගැඹුරෙන් සැලකිලිමත් විය. අවසානයේ ඒ කාලයේ පැවති චාරිත්‍රය අනුගමනය කරමින්, උන්වහන්සේ අභිනිෂ්ක්‍රමණය කර ඔබ මොබ යන තවුසෙකුගේ ජීවිතය ඇරඹූ සේක. උන්වහන්සේ විවිධ ගුරුවරුන් යටතේ අධ්‍යයනය කළහ. දැඩි ස්වයං අත්තකිලමථය පුහුණු වූහ. නමුත් වසර හයකට පසු, අවසානයේ එවැනි දෙයකින් ඵලයක් නොමැති බවට තීරණය කළහ. විවේකයක් ගනිමින් සහ සෑහෙන ආහාරයකින් ශක්තිමත් වෙමින්, උන්වහන්සේ තමන් සත්‍ය දැනගන්නා තුරු එතැනින් නොනැඟීමට අධිෂ්ඨාන කරමින්, එක් විශේෂ ගසක් යට ඉඳගත්හ. එම හවස් යාමයේ උන්වහන්සේට පැවැත්මේ සත්‍ය ස්වභාවය පැහැදිලි විය. උන්වහන්සේ බුද්ධත්වයට පැමිණි සේක.

වසර 45ක් පුරා උන්වහන්සේ දකුණු ඉන්දියාව කොණින් කොණට චාරිකාවේ වඩිමින්, තමන් වහන්සේ අවබෝධ කරගත් සත්‍යය අනෙක් අයට ඉගැන්වූහ. අවසානයේ 80 වන වයසේදී කුසිනාරාවේදී පරිනිර්වාණයට පත්වූහ. එක් විශේෂ කණ්ඩායමකට හෝ ගෝත්‍රයකට වඩා, සියලු මිනිස් සංහතියටම ධර්මයක් ඉගැන්වූ පළමු පුද්ගලයා වන්නේ බුදුපියාණන් වහන්සේය. ජේසුස්වහන්සේ, කොන්ෆියුෂිස් සහ ලාඕ ට්සු සමගින් බුදුපියාණන් වහන්සේ සියලු කල උතුම්ම ආගමික චින්තකයා වශයෙන් සැලකිල්ලට ලක් වේ. බලන්න **බුදුපියාණන් වහන්සේගේ කාලවකවානුව, සීසඡේදනය, සමේ වර්ණය සහ මුහුණ, ආහාර, බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන්, බුදුපියාණන් වහන්සේගේ පළමු කන් පෙති, පුරුදු සහ චර්යා ක්‍රමය,**

බුදුපියාණන් වහන්සේගේ අවසාන භෝජනය, ශාරීරික පෙනුම, රාහුල, සතර පෙර නිමිති, ශාක්‍යයන්, සුභද්ද, ගුරුවරුන්, චාරිකා, බුදුපියාණන් වහන්සේගේ කටහඬ, බුදුපියාණන් වහන්සේගේ අවසාන වචන

*The Historical Buddha*, H.W. Schumann, 1989.

## සීසර් සැත්කම් අංශය

සීසර් සැත්කම යනු දරු උපත් නාළිකාව වෙනුවට උදරයේ ශල්‍යකර්මයකින් දරු උපතක් සිදු කිරීමයි. මවගේ පටු උකුල් පෙදෙස, දරුවාගේ පිහිටීම හෝ අසාමාන්‍ය ලෙස විශාල දරුවෙකු යන හේතු නිසා මෙම ක්‍රියාපටිපාටියේ අවශ්‍ය විය හැකිය. 19වන ශතවර්ෂයේදී ජීවානුහරණ ශල්‍යකර්මය හඳුන්වා දෙන තුරු, සීසර් සැත්කම්වලට ලක්වූ කාන්තාවන්ගෙන් සියයට 75ක්ම මිය ගියේය. සිද්ධාර්ථයන්ගේ පිළිසිඳ ගැනීම සහ උත්පත්තිය පිළිබඳව බොහෝ මනඃකල්පිත විස්මය දනවන දෙයින් ජනප්‍රවාද වටකර ගෙන ඇත (M.III,119-123). එයින් එකක් නම් උන්වහන්සේ උපන්නේ මවගේ දකුණු පසින් බවයි. නමුත් මෙය ත්‍රිපිටකයේ සඳහන්ව නැත. සිත් ගන්නා කරුණ නම්, මෙය සැබැවින්ම එහි ප්‍රභවය ඇති එක් පුරාවෘත්තයක් වීමයි. ධනවත් හා බලවත් අයට පමණක් ලබාගත හැකි දෙයක් වුවද, සීසර් සැත්කම පැරණි ඉන්දියාවේ ප්‍රසිද්ධ විය. සිද්ධාර්ථයන්ගේ උපත සැබැවින්ම සීසර් සැත්කමක් නම්, උන්වහන්සේගේ මව වූ මහා මායා දරු උපතෙන් දින හතකට පසු මිය ගියේ ඇයි ද යන්න පැහැදිලි කළ යුතුව තිබේ (M.III,122).

## දින දර්ශනය

පැරණි ඉන්දියානු පිළිවෙත් අනුගමනය කරමින්, බුදුදහම චන්ද්‍ර දින දර්ශනය (දිනදස්සන) තෝරා

ගත්තේය. මෙම දින දර්ශනයට අනුව, මාර්තු- අප්‍රේල් පුර පොහොය දින අලුත් අවුරුද්ද ආරම්භ වේ. එම මාසවල නම් වන්නේ චිත්ත, ජෙට්ඨ, ආසාළහ, සාවණ, පොට්ඨපාද, අස්සයුජ, කත්තික, මගසිර, ඵුස්ස, මඝ සහ ඵග්ගුන වශයෙනි. ඉරුදිනයෙන් අරඹමින්, සතියේ දින වන්නේ රවිවාර, චන්දවාර, කුජවාර, බුධවාර, ගුරුවාර, සුක්කවාර, සහ සනිවාර යනුවෙනි. මාස හතර බැගින් ඍතු තුනකි. ග්‍රීෂ්ම ඍතුව (ගිම්හාන), වැසි කාලය හෝ මෝසම් (වස්සාන) සහ ශීත ඍතුව (හේමන්ත) වශයෙනි. සෑම මාසයක්ම තව දුරටත්, දෙසතියකට (අඩඨමාස) බෙදා ඇත. එකක් චන්ද්‍රයාගෙන් ( සුක්කපක්ඛ) දීප්තිය ලබන අතර, අඳුරු භාගය (කාලපක්ඛ) මාසයේ සඳ දැකිය නොහැකි කාලය වේ.

පුර පොහොය දින සහ අඩ සඳ දිනවලදී භික්ෂූහු සහ භික්ෂුණීහු එක්ව පාතිමොක්ඛකය සජ්ඣායනය කරති. මාසයේ පළමුවන, අටවන, පහළොස්වන සහ විසිතුන්වන දින උපෝසථය වශයෙන් හැඳින් වේ. මේ දිනවල බැතිමත් බෞද්ධයෝ ධර්මය කෙරෙහි ඔවුන්ගේ ඇති බැඳීම සාමාන්‍යයෙන් පුරුදු කරනවාට වඩා වැඩියෙන් ශක්තිමත් උත්සාහයක් දරමින් අලුත් කරති. සමහර විට අටසිල් සමාදන් වෙති. මෙම පුහුණුව අදටත් අනුගමනය කරති. සියලු බෞද්ධ රටවල් චන්ද්‍ර දින දර්ශනය 19වන ශතවර්ෂය වනතුරුම භාවිත කර ඇත. ඊට පසු අටවන ග්‍රෙගරි පාප්තුමා 1582දී හඳුන්වා දුන් වර්තමානයේ භාවිත වන බටහිර ග්‍රෙගෝරියානු දර්ශනය ආදේශ කරන ලදී. 1960 ගණන්වලදී ශ්‍රී ලංකාව චන්ද්‍ර දින දර්ශනයට නැවත පැමිණි නමුත්, එයින් සැලකිය යුතු

ප්‍රමාණයක පටලැවිලි ඇති විය. පසුව නැවතත් වහා බටහිර ක්‍රමයට අවතීර්ණ විය. සියලු ආගමික දින දර්ශනවල තිබෙන වැදගත් අංගයක් නම්, එහි ඇති නිවාඩු වේ. (නික්කම්මදිසාව), ඒ ශුද්ධ දින, ආගමේ ඉතිහාසයේ වැදගත් දින සැමරීමයි. එවැනි දිනවල මිනිස්සු තමන්ගේ ආගම පුහුණු කිරීමේදී වඩාත් සැදැහැවත් සහ සැලැකිලිමත් බවක් දක්වති. මෙය ප්‍රශංසා කළ යුතු දෙයකි. නමුත් අවංක බෞද්ධයෙක් සියලු විට ගුණවත්, කරුණාවන්ත, ත්‍යාගශීලී සහ කල්පනාකාරී වීමට උත්සාහ දරයි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: '' පිරිසිදු පුද්ගලයෙකු සෑම දිනයක්ම විශේෂ ලෙස සලකයි. ඔවුන්ට සෑම දිනයක්ම ශුද්ධ දිනයක් වේ'' (M.I,39). බලන්න **කාලය.**

**චම්පා**

මධ්‍ය දේශයේ නැගෙනහිරෙහි ඉහළම අද්දර පිහිටි රාජධානියක් අඞ්ග නම් වේ. බුදුපියාණන් වහන්සේගේ කාලය වනවිට, එය මගධයට ඒකාබද්ධ කර තිබුණි. (විවාහමය සබඳතාවක් හෝ දිනාගත් ප්‍රදේශයක් නිසාද යන්න නොදනී) ත්‍රිපිටකයේ සාමාන්‍යයෙන් සඳහන් කර ඇත්තේ අඞ්ග-මගධ යනුවෙනි (M.I,27).

රාජධානියේ අගනුවර චම්පා, ගංගානම් ගඟේ දකුණු ඉවුරේය. එය විශාල වෙළඳ නැව්තොටකි. නගරයේ ඉතාමත් ප්‍රසිද්ධියේ ප්‍රශංසා කරන කැපී පෙනෙන දෙය වන්නේ නෙළුම්මලින් පිරුණු විශාල වැවයි. රාජධානියේ පෙර සිටි රැජිනක් වූ ගග්ගරා විසින් එය ඉදිකර ඇත. බුදුපියාණන් වහන්සේ චම්පා වෙත වැඩිය බොහෝ අවස්ථාවල, විල ඉවුරේ වන වදුලේ

නතර වූහ (A.IV,59; D.I,111; Vin.I,312). නූතන ඉන්දියානු බිහාර් ප්‍රාන්ත රාජ්‍යයේ පිහිටි භාගල්පූර් නගරය ඉදිකර ඇත්තේ චම්පා නගරයේ නටබුන් මතුපිටය.

**කංසා ශාකය**

කංසා ශාකය (හඬිග) පැතිරුණු, හෙල්ලක හැඩය ගත්, දැති සහිත දාර ඇති පත්‍ර තිබෙන උස පැළෑටියකි. එයින් ප්‍රබල ගන්ධයක් නිකුත් වෙයි. මෙම පැළෑටිය උද්භිද විද්‍යාඥයන් හඳුන්වන්නේ කැනබිස් සතිව වශයෙනි. පැරණි ඉන්දියාවේ කංසා තන්තු කඹ, පැදුරු සහ රෙදි සෑදීමට භාවිත කර ඇත (D.II,350; Vin.III,256). කංසාවලින් නිපදවූ සිවුරු ඇඳීමට භික්ෂූන්ට අවසර නොතිබුණි. වියළි කංසා කොළවලින් දුම් ඉරීම හෝ එයින් මල් හටගන්නා මුදුනේ රුක්ලාටු උකහා ගැනීම තුළින් හෘද-වාහිනික සහ ප්‍රධාන ස්නායු පද්ධතියට අනපේක්ෂිත ප්‍රබෝධ කරන බලපෑමක් ඇති කරයි. සුළු වශයෙන් ගත් විට, එය යහ පැවැත්මක සහ සැහැල්ලු හැඟීමක් දනවයි. නමුත්, වැඩි ප්‍රමාණයක් ගත්විට, ඉන්ද්‍රිය සංවේදක විකෘති කිරීම, කාලය පිළිබඳ වෙනස්වූ හැඟීමක් ඇති කිරීම, මතක ශක්තිය කෙටි කාලයකට නැතිවීම, මායාවන් සහ සමහර විට විෂ සහිත මනෝභාවයන් ඇති කිරීම ඇති වේ. ශතවර්ෂ ගණනාවක් සමහර නිකායන්වල හින්දු තාපසයන් කංසා දුම් උරා ඇත. ඒ ඔවුන්ට කංසා භාවිතයේ බලපෑමෙන් සිව දෙවියන් සමග සන්නිවේදනයේ යෙදීමට හැකි වේය යන විශ්වාසයෙනි. කෙසේ නමුත්, කංසා එහි ඇති සිතින් මවා ගැනීමේ බලපෑම සඳහා භාවිතය පිළිබඳව ත්‍රිපිටකයේ කිසි තැනක සඳහන් නොවේ. බෞද්ධ යථා දර්ශයට අනුව, කංසා භාවිතය පස්වෙනි ශික්ෂා පදය කඩ කිරීමකි. පෙර සිටි සහ ඊට පසුව

සිටින්නාවූ මිනිසුන් මෙන්ම, බුදුපියාණන් වහන්සේ ද කංසාවල අඩංගු ඖෂධීය වටිනාකම හඳුනා ගත්හ. උන්වහන්සේ එය හන්දි ඉදිමුමට ප්‍රතිකාරයක් වශයෙන් නිර්දේශ කළහ. උණු ජලය රැඳී භාජනයකට කංසා කොළ (භඬ්ගොඩක) දමා එහි දුම පිරුණු කුඩා කාමරයක රෝගියා තැබිය යුතුයි. එම දුම ආඝ්‍රාණය කර ගාත්‍රවල ඇතිල්ලිය යුතුයි (Vin.I,205). බලන්න **සිරුර සැතැපීම සඳහා උණුසුම් කළ කාමරය**

## මරණ දඬුවම

මරණ දඬුවම (බ්‍රහ්මදණ්ඩ හෝ වධ) යනු අධිකරණමය දඬුවමක් ලෙස මරණ දඬුවම පැමිණවීමයි. පැරණි ඉන්දියානු නීතියේ දෙආකාරයක මරණ දඬුවම් තිබුණි. ඒ සීඝ්‍ර (සුද්ධාවධ), සාමාන්‍යයෙන් මෙහි අදහස හිසගසා දැමීමයි. අනෙක වේදනාකාරී (ක්ලේසදණ්ඩ), මරණයට පෙර දඬුවම් වශයෙන් දැඩි මානසික හෝ කායික වේදනා ඇතුළත් වේ. අපරාධකාරයන් එල්ලා මරණ බිහිසුණු ආකාර ගණනාවක් ත්‍රිපිටකයේ සඳහන් වේ (M.I,87). එසේම සොරෙකු මරණයට පත් කිරීම හෙළා දකින විනිශ්චයකාරවරයෙකුගේ වචන ද එහි සඳහන් වේ: 'ඔහුගේ අත් පිටුපසින් ශක්තිමත් කඹයකින් ගැට ගසන්න. ඔහුගේ හිස මුඩු කරන්න. රළු බෙර ශබ්දයකට අනුව ඔහු මාර්ගයේ පෙරහැරේ ගෙන යන්න. දකුණු ගේට්ටුවෙන් ඔහු පිටතට ගෙන ඔහුගේ හිස ගසා දමන්න!' (D.II,321). එල්ලා මරණ ස්ථානවල බිය ජනක සහ හදවතට රිදුම් දෙන දසුන් සාමාන්‍ය දෙයක් විය. අපරාධකරුවෙකු 'ඔහු ඔහුගේ කනසල්ලෙන් නිවා දැමීම සඳහා' (Vin.III,86)

ඉක්මණින් මරා දමන ලෙස එක් භික්ෂුවක් කළ ඇයදීමක් පිළිබඳව අපි අසා ඇත්තෙමු. බුදුපියාණන් වහන්සේ මරණීය දඬුවමට විරුද්ධ වූයේ ප්‍රධාන වශයෙන්ම එයට කෲරත්වය සහ මැරීම සම්බන්ධ වීමත්, එනිසා පළමු ශික්ෂාපදය උල්ලංඝනය වන නිසාත්ය. කෲර දඬුවම් පවරන විනිශ්චයකාරවරුන් සහ වධවේදනා පමුණුවන්නන් සහ වධකයන් යන මේ සියල්ලන් පදගත අර්ථයෙන් 'කෲරතර' ජීවානෝපායක් (කුරුර කම්මන්ත) පාපය පුහුණු කරන බවත්, එයින් තමන් වෙනුවෙන් බොහෝ ඍණාත්මක කර්ම නිර්මාණය කරන බවත් බුදුපියාණන් වහන්සේ පැවසූහ (S.II,257-60).

අපරාධකරුවන් පුනරුත්ථාපනය කිරීමට උත්සාහ දරමින් ඔවුන් සමාජයේ ප්‍රයෝජනවත් සාමාජිකයන් බවට හැරවීම, ඔවුන් එල්ලා මරා දැමීමට වඩා යහපත් බව ද බුදුදහම සඳහන් කරයි. 'සිර ගෙවල් විවෘත කිරීම සහ වධකයාගේ ඒකකය බිඳීම' ඇතුළු බොහෝ ප්‍රතිසංස්කරණවලට මුල පිරූ බුද්ධිමත් රජෙකු පිළිබඳව ජාතක පොතේ සඳහන් වේ (Ja.IV,176). තවත් රජෙකු වැරදි කරන්නෙකු පිළිබඳව මෙසේ කියයි: 'මම මිනිසුන්ට දඬුවම් කරන්නේ යුක්ති සහගතවය. නමුත් අනුකම්පාවෙන්ය' (Ja.III,442). මෙම කාරණයම ශ්‍රේෂ්ඨ බෞද්ධ දාර්ශනිකයෙකුවූ නාගාර්ජුන ක්‍රි. පූ. 1වන ශතවර්ෂයේදී පැවසුවේය. 'තමන්ගේ පුත්‍රයා වටිනා පුද්ගලයෙකු කිරීමේ කැමැත්තෙන් ඔහුට දඬුවම් කරන්නාක් මෙන්ම, දඬුවමක් පැණවිය යුත්තේ අනුකම්පාවෙනි, වෛරයෙන් හෝ ලෝභයෙන් නොවේ. කෝපයෙන් යුක්ත මිනීමරුවන් විනිශ්චය කළ විට, ඔබ නොමරා, පලවා හැරිය යුතුය'.

මරණීය දන්ඩනය අවසන් කරන බෞද්ධ බලපෑම පිළිබඳ පැරණිතම සාක්ෂිය වන්නේ අශෝක රජු විසින් එම ප්‍රතිපත්තිය අවලංගු කරමින් ක්‍රි. පූ. 243දී නිකුත් කරන ලද හතරවන කුළුණේ නියෝගයයි. අඩුම තරමින්, බෞද්ධ වකවානුවක් ඉන්දියාවේ පැවති යම් කාලයකදී මරණ දඬුවම සම්මතය නොවන බවට පෙනෙන්ට තිබුණි. 7වන ශතවර්ෂයේදී උප මහාද්වීපය හරහා ගමන් කළ චීන ජාතික වන්දනාකරු සුඇංසුං මෙසේ ලිව්වේය: 'ඉන්දියාවේ රජවරු බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් ගැඹුරු ලෙස විශ්වාස කළහ. ඒ නිසා මිනිසුන් පාලනය කිරීමේදී මරණ දඬුවම භාවිත කළේ නැත. බැරෑරුම් වැරදිවලට වරදකරුවන් වූ අය පවා එල්ලා මැරුවේ නැත.' භක්තිමත් බෞද්ධයෙකුවූ ජපාන අධිරාජයා, ෂොමූ ඔහුගේ රාජ්‍ය කාලයේදී මරණ දඬුවම අහෝසි කළේය. (724-49) නැවතත් එය 810දී තහනම් කළේය. එසේම ඊළඟ වසර 350 තුළ දී වැඩි වශයෙන්ම භාවිත නොවීය. 1913දී ටිබෙටය මරණ දඬුවම අහෝසි කළේය. වර්තමානයේ සියලු බෞද්ධ රටවල්වල මරණ දඬුවම ඇත. කෙසේ නමුත්, ශ්‍රී ලංකාවේ 1997 සිට මරණ දඬුවම පිළිබඳ තාවකාලික තහනමක් ඇත.

'Of Compassion and Capital Punishment: A Buddhist Perspective on the Death Penalty.' Damien Horigan, *The American Journal of Jurisprudence*, 41,1996.

## කුලය

කුලය (වණ්ණ) යනු මිනිසුන් නිර්මාණය කර ඇත්තේ බ්‍රහ්ම විසින්ය යන හින්දු විශ්වාසයයි. එනම්, පූජකයන් (බ්‍රාහ්මණ), රණ ශූරයන් (ඛත්තිය), වෙළඳුන් (වෙස්ස) සහ කම්කරුවන් (සුද්ද) යන එකිනෙකට වෙස්වූ වර්ග හතරයි. මෙම විශ්වාසයට

අනුව, විවිධ කුලවල අය තමන්ගේ ජීවිකාව සිදු කළ යුත්තේ විවිධ ආකාරයටයි. කුලයන් හතරට ඔබ්බෙන් ඇත්තේ සමාජයෙන් පිටමං කළ අයෙකු සේ 'වසල' කුලයටයි. (නීචකුලා හෝ වසල) පිටරැටියන් (මිලක්ඛ), කුලයක් නැති අය සාමාන්‍ය හින්දු සමාජයේ සම්මත සීමාවන්ගෙන් පිට අය ලෙස සලකනු ලබයි. 'බ්‍රාහ්මණයන් ඉහළම කුලය, වෙනත් කුල පහත්, බ්‍රාහ්මණයන් සිත්කලු, අනෙක් අඳුරු පැහැ, බ්‍රාහ්මණයන් පමණක් පිරිසිදු, බ්‍රාහ්මණයන් නොවන අය අපිරිසිදු යැයි යන අදහස බ්‍රාහ්මණයෝ විශ්වාස කළහ. එම අදහස ඉගැන්වූහ' (M.II,148).

කුලය පිළිබඳව බුදුපියාණන් වහන්සේ කෙළින් කතා කරන විවේචයෙක් වූහ. උන්වහන්සේගේ දේශනාවලින් අඩුම තරමින් දුසිමක්වත් කුලය පිළිබඳ පරස්පරයන් සහ කෘර බව මතුකර දැක්වීමට කැප වී ඇත. උන්වහන්සේගේම වංශය වූ ශාක්‍යයන් රණ ශූර කුලයට අයත් විය. ඔවුහු එම ඉහළ තත්ත්වය පිළිබඳව අධික ලෙස ආඩම්බරයට පත්වූහ. ඔවුන්ගෙන් කණ්ඩායමක් භික්ෂුත්වය ලැබීමට අවසර ඉල්ලූ විට, බුදුපියාණන් වහන්සේ පළමුව පහත් කුලයේ කරණවෑමියකු වූ උපාලිට ප්‍රමුඛත්වය දෙමින් ඔහු පැවිදි කළහ. එසේ කළේ අනෙක් අය එවිට ඔහුට හිස නැමිය යුතු නිසාය (Vin.II,183). බුදුපියාණන් වහන්සේ පිළිගත් එකම සමාජ බෙදීම වූයේ ගෘහමූලිකයා (ගහපති) සහ නිවෙස හැරයන්නා (පබ්බජිත) යි. ඒ භික්ෂූන් සහ භික්ෂුණීන්ය. ඒ එක තත්ත්වයක්වත්, කිසිම සහජ ගුණාංගයකින් තීරණය වන්නේ නැත. නමුත්, යම් කෙනෙකුගේ ජීවන රටාව සහ ජීවිතයේ අරමුණෙන්මය. කුලය මෙන් ස්ථාවර

වීමට වඩා, කෙනෙකුට එකකින් තවත් එකකට මාරු වීමට තෝරා ගත හැකිය.

බුදුපියාණන් වහන්සේ කුල ක්‍රමය විවේචනය කළේ බොහෝ හේතු මතයි. කුල ක්‍රමය නියම කර ගත්තේ උත්තරීතර පුද්ගලයෙකු විසින් යැයි යන කියමන සාවද්‍ය මතයකට වඩා වැඩි දෙයක් නොමැත (M.II,148). කුල ක්‍රමය සෑම තැනම ක්‍රියාත්මක වන්නේ නැත. එම නිසා විශ්වීය සත්‍යයකට වඩා ප්‍රාදේශීය චාරිත්‍රයකි (M.II,149). විවිධ කුලවලට විවිධ හැකියාවන් සහ පුද්ගල විශේෂතාවන් ඇතැයි කියන ප්‍රකාශ අත්දැකීමෙන් ඇතිවූ දෙයක් නොවේ. ඒ නිසා අවලංගු වේ (M.II,150; Sn.116). පහත් කුල සහ සමාජයෙන් පිටත කුලවල අය අපිරිසිදු විය හැකිය. එයට හේතුව ඔවුන්ට පහත් රැකියා කරන්නට සිදු වීමයි. නමුත්, ඒ අය සෝදා පිරිසිදු වන්නේ නම්, ඒ අය අනික් අය මෙන්ම පිරිසිදු වේ (M.II,151). කුල ක්‍රමය අසාධාරණයි. එය කෘරත්වය සහ දුක්විඳවීම මතු කරයි. ඒ නිසා එය දුෂ්ටයි. දිව්‍යමය සම්භවයක් ඇති යැයි කියනු ලබන කුලවලින් ඇතිවන වෙනස්කම් ආර්ථිකමය යථාර්ථයන්වලින් ද පරස්පරය. පහත් කුලයක කෙනෙකුට පොහොසත් වන්නට හැකි වුවහොත්, ඔහුට බලාපොරොත්තු සුන් වූ දුප්පත් බ්‍රාහ්මණයෙකු රැකියාවට බඳවා ගත හැකිය. තමන් එනතුරු රැඳී සිටීමට බල කළ හැකිය. කාර්යයක් පවරා අණ කළ හැකිය (M.II,85). බෞද්ධ අදහසට අනුව, මිනිසුන්ට සලකන ආකාරය, ඔවුන්ට ලැබෙන ගෞරවය, ඔවුන්ට තිබෙන අවස්ථා, ඒ අය නැවත ඉපදෙන ස්ථානය පවා, ඔවුන්ගේ හැසිරීම මත රැඳේ. ඔවුන් ඉපදී ඇති කුලයට අනුව නොවේ.

බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'නම හෝ කුලය වශයෙන් ලෝකය නියම කර ඇත්තේ හුදෙක් නමකි. එය සිදුව ඇත්තේ පොදු භාවිතයටයි. මෙය පැරණි විශ්වාසයක් සහ වැරදි දෙයක් වුවත්, බ්‍රාහ්මණයෙකු වීම උත්පත්තියේ වැදගත් බවක් යැයි අඥානයෝ පමණක් කියති. කෙනෙකු බ්‍රාහ්මණයෙකු වන්නේ උත්පත්තිනේ නොවේ. උත්පත්තියට වඩා වෙනත් දෙයක් නිසා කෙනෙකු බ්‍රාහ්මණයෙකු වේ. කෙනෙකු බ්‍රාහ්මණයෙකු හැර වෙනත් කෙනෙකු කරන්නේ ක්‍රියාය. කෙනෙකු ගොවියෙකු, අත්කම් ශිල්පියෙකු, වෙළෙන්දෙකු හෝ වැඩකාරයෙකු, හොරෙකු, සොල්දාදුවෙකු, ජීවිත පරිත්‍යාග කරන්නෙකු හෝ රජෙකු... වන්නේ ක්‍රියාවෙන්ය. යමෙකු බ්‍රාහ්මණයෙකු වන්නේ සරලතාව, පවිත්‍ර ජීවිතය, ස්වයං සංවරය සහ ස්වයං විනය ඇතිකර ගැනීමෙනි' (Sn.648-55). ජාතක පොතේ මෙසේ සඳහන් කරයි: 'ධාර්මිකතාවය නැතිය. සියලු කුල නිරයට යයි. ඔවුන් ධාර්මිකව ක්‍රියා කරන්නේ නම්, සියලු කුල පිරිසිදු වේ'(Ja.VI,100).

කුලය පිළිබඳ බෞද්ධ විශ්ලේෂණ ශතවර්ෂ ගණනාවක් විවිධ ආකාරයෙන් සිදුවිය. සාවත්ථියේ ඉහළ කුලයේ පුරවැසියන්ගේ නොරිස්සුමට සහ කෝපයට ලක්වෙමින් සමාජයෙන් පිටමං කළ පහත් කුලයක පුද්ගලයෙකු පිළිබඳව දිව්‍යාවදානයේ කථාවක් ඇත. බුදුපියාණන් වහන්සේ භික්ෂුණියක් ලෙස පැවිදි කළ ඊට පසු කුලය අවලංගු වන්නේ ඇයිද යන්න විස්තර කරමින් බුදුපියාණන් වහන්සේ ඔවුන්ට හේතු මාලාවක් ඉදිරිපත් කළහ. මේ හේතු අතර, ඉතා වැදගත් හේතුවක් වූයේ යම් කෙනෙකු පෙර ජීවිතයේදී ඉහළ කුලයේ. පහළ කුලයේ හෝ

සමාජයෙන් නෙරපූ කුලයක විය හැකි වන අතර, මේ ජීවිතයේදී ඒ එකකින් විය හැකිය. එසේම අනාගත ජීවිතයකදී තත්ත්වයට හේතු පාදකය වන්නේ මේ ජීවිතයේ හැසිරීමයි. (ඒ කර්මය) යි. කෙනෙකු මේ ජීවිතයේදී අයිති කුලයට අනුව නොවේ.

කුලය පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ ප්‍රතික්ෂේපය තිබියදීත්, වර්ගීකරණයේ වඩා මැදහත්, සහ වඩා සුනම්‍ය වෙනස්වීම් බොහෝ බෞද්ධ රටවල පවතී. බුරුමයේ පාය ක්‍යුන් ආශ්‍රම වහලුන්ගෙන් පැවත එන්නන්ය. ජපානයේ බුරකු සහ ටිබෙටයේ රාගයාපා පෙරදී අවමානයට ලක් වූයේ ඔවුන් මසුන් මරන්නන්, කැළි කසල එකතුකරන්නන් හෝ වෙළඳාම පිණිස සතුන් මරන්නන් ලෙස වැඩ කර තිබූ නිසාය. මෙම කණ්ඩායම් ඔවුන්ට අදාළ සමාජවල කොන්වීමට මුහුණ දුන්හ. ශ්‍රී ලංකාවේ ආශ්‍රමස්ථ නිකායන් කුල පරම්පරාවන් හරහා වෙන් කර ඇත. 1950 ගණන් වල සිට, ඉන්දියාවේ අඩු කුලයේ සහ සමාජයෙන් කොන් කළ කුලවල මිලියන ගණන් මිනිසුන් ඔවුන්ගේ නායකයා වූ වෛද්‍ය අම්බෙඩ්කර් ගේ ආදර්ශය අනුගමනය කරමින් කුල පද්ධතියේ අවමානයෙන් ගැලවීමට බුදුදහම වැළඳ ගෙන ඇත.

*Buddhism and the Race Question*, J.N. Jayatilleke, 1958.

**ගුහා**

ගුහාවක් හෝ විසිතුරු කුඩා ලෙනක් (කන්දර, ගුහා හෝ ලෙණ) තද බෑවුමක පැත්තක හෝ පොළොවයට තිබෙන විශාල කුහරයකි. සියලු ආගමික සම්ප්‍රදායයන්වල ශ්‍රමණයෝ සහ තාපසයෝ බොහෝ

කාලයක සිට ගුහාවලට ආකර්ෂණය වෙමින් සිටිති. මෙයට හේතුව ඔවුන් සාමාන්‍යයෙන් දුරබැහැර ප්‍රදේශවල සිටින නිසා සහ ඔවුන් ශබ්දය අවුරන නිසාත්, මෙහිදී ඔවුන්ට හුදෙකලාව සහ නිශ්ශබ්දතාව යන දෙකම ලැබෙන නිසාය. බුදුපියාණන් වහන්සේ භික්ෂූන්ට සුදුසු යැයි සඳහන් කළ වාසස්ථාන වර්ග පහෙන් එකක් වන්නේ ගුහාවන් ය (Vin.V,146). රජගහ අවට තිබූ ගුහාවන් සමහරක් භික්ෂූන් සහ භික්ෂුණීන් අතර ජනප්‍රිය යැයි සඳහන් වූ ගුහාවන් වන්නේ ඉන්දසාල (D.II,263), කපොට (Ud.39), පිප්ඵලී (Ud.4), සූකරඛත (M.I,497), සහ සත්තපණ්ණි (Vin.II,76) යන ගුහාවල්ය. මෙම අවසානයට සඳහන් කළ ගුහාව පළමුවෙනි ධර්ම සංඝායනාව පැවැත් වූ ස්ථානයයි. සුදුසු ගුහාවල් නොතිබූ විට, භික්ෂූන් වහන්සේලා සමහර විට කුඩා ගුහා විශාල කර ගැනීමට හෝ කෘතිම ගුහාවල් ගල් සහිත කඳුවැටිවල කණින්නට සූදානම් කළහ (Vin.III,248). පසුකාලීන ශතවර්ෂවලදී ඉන්දියානු බෞද්ධයෝ ගුහා කැණීමට විචක්ෂණශීලී තාක්ෂණයන් සංවර්ධනය කළහ. ඒ අනුව ඒවා ආශ්‍රම ලෙස භාවිත කළ හැකි විය. මුල්ම කාලයේ ඇති කළ ගුහා අතර පුනේ අසල පිහිටි බෙඩ්සා සහ කරලා නම් කළ හැකිය. මේ සියල්ලකම සම්පූර්ණයෙන්ම ජීවමාන ගලින් නිම කළ රැස්වීම් ශාලා, ගබඩා කාමර, මුළුතැන්ගෙවල්, වතුර රැස් කරන ටැංකි සහ භික්ෂූන් සඳහා කාමරද තිබුණි. ඉන්දියාවේ විශාලතම සහ ඉතාමත් අතිශයින් දියුණු ලෙස නිමා කළ ගුහා ආශ්‍රම පිහිටා තිබෙන්නේ අජන්තා සහ එල්ලෝර යෙහිය. අජන්තාවල පිහිටි ගුහා 30 කණින ලද්දේ ක්‍රි. පූ. 1වන ශතවර්ශයේ සිට 5වන ශතවර්ෂය දක්වාය. ඒවා කැටයම් සහ සිතුවම්වලින් ඉතා දියුණු ලෙස අලංකාර කර ඇත.

*Early Buddhist Rock Temples* Vidya Dehejia,1972.

## බ්‍රහ්මචාරී බව

බ්‍රහ්මචාරී බව (බ්‍රහ්මචරිය) යනු ලිංගික හැසිරීමෙන්, විශේෂයෙන්ම ලිංගික සංසර්ගයෙන් වැළකීමයි. භික්ෂූන් සහ භික්ෂුණීන් බ්‍රහ්මචාරී විය යුතුමයි. ගිහියන් ද අටසිල් සහ දසසිල් සමාදන් වූ විට එසේ විය යුතුයි. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී වඩා අවංක සමහර ගිහියෝ තමන්ගේ කලත්‍රයා සමග ජීවත්ව ඉඳීද්දීම බ්‍රහ්මචාරීව ජීවත්වීම තෝරා ගත්හ (M.I,490). කෙසේ නමුත්, ආධ්‍යාත්මික ගුණවගාවක් සඳහා ලිංගිකත්වයෙන් වැළකීම පූර්වාවශ්‍යතාවක් නොවේ. තමන්වහන්සේගේ ශ්‍රාවකයන් දෙදෙනෙකු වූ පුරාණ සහ ඉසිදත්ත යන දෙදෙනාම සෝවාන් ඵලයට පත් වූ බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. මෙයින් පළමුවැන්නා බ්‍රහ්මචාරී වූ අතර දෙවැන්නා 'තෘප්තිමත් විවාහ ජීවිතයක් ගත කළේය.' (සදාරසන්තුට්ඨ *sadārasantuṭṭho*, A.III,348). කෙසේ නමුත්, ලිංගිකත්වයට වැදගත් ප්‍රීතියක් සහ චිත්තවේගී තෘප්තියක් දිය හැකි අතර, එයට උවමනාවට වඩා මනඃකල්පිතයන්, දැඩි ආශාවන්, ඉච්ඡා භංගයන් සහ කායික සහ මානසික කැළඹීම් උත්තේජනය කළ හැකිය. භාවනාව තුළින් මානසික සන්සුන් බව සහ පිරිසිදු බව දියුණු කර ගැනීමට උත්සාහ දරන්නෙකුට මෙය එම පුහුණුවට බාධාවක් ලෙස දැනෙන්නට පුළුවනි. එම නිසා ඔහු අඩුම ගණනේ එම තත්ත්වය අවම කිරීමට එක් නිශ්චිත කාලයකට හෝ බ්‍රහ්මචාරී වීමට තෝරා ගනු ඇත.

විවාහය තුළ පවා ලිංගිකත්වය ආධ්‍යාත්මික කටයුතුවලට බාධාවක් විය හැකි බවට බයිබලයේ සඳහන් කරුණ සමග බුදුපියාණන් වහන්සේ එකඟ විය හැකි වන්නට ඉඩ ඇත. 'ඔබ දැඩි අවධානයෙන් නිදහස් වනවා දකින්නට මම කැමැත්තෙමි. අවිවාහක තැනැත්තා දෙවියන් වහන්සේගේ කටයුතුවලට සැලකිල්ලක් දක්වයි, ඒ ඔහු දෙවියන් වහන්සේ සතුටු කරන්නේ කෙසේද යන්න පිළිබඳවයි. නමුත් විවාහක තැනැත්තා සැලකිලිමත් වන්නේ ලෝකයේ තිබෙන දේවල් පිළිබඳවයි. ඒ ඔහු තම බිරිඳ සතුටු කරන්නේ කෙසේ ද කියායි.' (1 කොරින්තන්ස් 7,1-35) එසේම, බ්‍රහ්මචාරී බවට පක්ෂපාතීව බුදුදහමෙන් කියන්නේ හුදෙක් ප්‍රායෝගික හේතූන් වෙනුවෙනුයි. ලිංගිකත්වය පහත්, කාමුක හෝ පව්කාර දෙයක් ලෙස හැඟීමක් ඇති කර ගෙන නොවේ.

බ්‍රහ්මචර්යාවට සහ ලිංගික ආශාවන් පාලනය කරන්නට කැපවූ අයට සංයුත්ත නිකායෙන් උපක්‍රම තුනක් යෝජනා කර ඇත. එයින් එකක් වන්නේ ශරීරයේ ඇති අප්‍රසන්න කරුණු පිළිබඳව සිතන්නට උත්සාහ කිරීමයි. තවත් එකක් වන්නේ 'ඉඳුරන්ගේ දොරටු මුරකිරීමය' (ඉන්ද්‍රිය සංවර). ඒ කාමුක ආශාවන් ඇති කිරීමට ඉඩ ඇති සංවේදනයන් සිහි කල්පනාවෙන් යුතුව මඟ හැරීම සහ ඉන්ද්‍රිය සංවේදී ගැටීම පිළිබඳව දැනුවත්වීමයි. තෙවන සහ වඩාත්ම සිත් ගන්නා ක්‍රමය වන්නේ 'මව් මන', 'සහෝදරී මනස' හෝ 'දියණිය මනස' (මාතුචිත්ත, භගිනිචිත්ත, ධීතුචිත්ත) යනුවෙන් හඳුන්වන දේ වර්ධනය කර ගැනීමයි. මෙයින් අදහස් කරන්නේ ඕනෑම ගැහැණු කෙනෙකු, ඇයගේ වයසට අනුව, තමන්ගේ මව,

සහෝදරිය හෝ දියණිය වශයෙන් සිතීම හා සම්බන්ධ වීමයි (S.IV,110-12). ගැහැණු සැබැවින්ම 'පියාගේ මනස', 'සහෝදර මනස' හෝ 'පුත්‍ර මනස' වර්ධනය කරති.

බ්‍රහ්මචර්යාවේ රැඳී ජීවත්වීමට තීරණය කරන මිනිසුන්ට සමහර විට කාමුක ආවේගයන්ට එරෙහිව නිරන්තරයෙන් අරගල කරන්නට සිදු වේ. නැගෙනහිර සහ බටහිර යන දෙඅංශයෙන්ම භික්ෂූන්ට සහ පූජකයන්ට තමන් පාලනය කර ගත නොහැකි වීමෙන් කළකිරීමට පත්ව සැබැවින්ම තම ලිංගික අවයවයන් ඡේදනය කළ බවට වාර්තා ඇත. එවැනි භික්ෂුවක් ඔහුට ඇතිවූ ලිංගික පෙළඹවීම් නිසා කළකිරීමට පත් වී අවසානයේ තමන්ගේ ශිෂ්නය කපා දැමූ බවට කථාවක් විනය පිටකයේ සඳහන් වේ. මෙය බුදුපියාණන් වහන්සේට දැන්වූ විට: 'මෙම මෝඩ මිනිසා එක් දෙයක් කපා දමා ඇත. ඔහු කළ යුතුව තිබුණේ වෙනත් දෙයක් කපා දැමීමයි' ඒ ආශාවන් සහ සිතින් මවා ගත් දේවල්ය. ඒවාට ප්‍රතිචාර දැක්වූ අවයවය නොවේ (Vin.II,110). ඊට පසු බුදුපියාණන් වහන්සේ කිසිම හේතුවක් නිසා අංගඡේදනය කිරීම වරදක් බව ප්‍රකාශ කළහ. බ්‍රහ්මචර්යාව පුහුණු කිරීමට සමහර අය දිරිමත් කරන වෙනත් ආගම් මෙන්ම බුදුදහම ද ලිංගිකත්වයේ ඇති ඍණාත්මක පැත්ත සහ බ්‍රහ්මචර්යාවේ ඇති වාසි අවධාරණය කරයි. නමුත් බ්‍රහ්මචර්යාවේ ප්‍රශ්න යැයි කීමට ඇත්තේ ස්වල්පයකි. බලන්න **ලිංගිකත්වය සහ ආධ්‍යාත්මිකත්වය**

## සජ්ඣායනය

සජ්ඣායනය (ජප හෝ සඞ්ගීති) යනු වචන හෝ

වැකිකඩ සංගීතය රහිතව තාලයට ගායනා කිරීමයි. ධර්මය විකාශනය කිරීමේදී සජ්ඣායනයට වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට ඇත. අඩුම තරමින් වසර 200ක් හෝ 300ක් භික්ෂූහු සහ භික්ෂුණීහු අඛණ්ඩව හමුවී මතක තබා ගැනීම පිණිස සූත්‍ර සජ්ඣායනය කළහ. වර්තමානයේ සජ්ඣායනයට සමාජීය, භාවනාශීලී සහ චිකිත්සක වටිනාකමක් ඇත. සජ්ඣායනය කරන කාලයක් තුළ සිතුවිලි නිහඬ කර අවධානය ඒ සඳහා යොමු කළ හැකිය. එම නිසා එය භාවනාවට හොඳ සූදානමකි. බුදුපියාණන් වහන්සේගේ වචන සජ්ඣායනය කිරීම, විශේෂයෙන්ම මෙත්ත සූත්‍රය වැනි දේශනාවලින් සුව කිරීමේ ඵලයක් ඇති බවට පුළුල් විශ්වාසයක් ඇත. එසේම මෙම විශ්වාසය තහවුරු කිරීමට යම් සාක්ෂි ද ඇත. සජ්ඣායනයේ ඇති මෘදු සහ සතුට ගෙන දෙන ශබ්දයට කය සහ මනස සංසිඳවිය හැකිය. එසේම සජ්ඣායනය කිරීමට එක්වන කණ්ඩායමට රෝගියාට තමන් පිළිබඳව හැඟීමක් සහ සැලකිල්ලක් තිබෙන බවට සිතුවිලි ඇතිකරවයි. මෙම සාධකය සුව කිරීමේ ක්‍රියාවලියට උපකාර වේ. සජ්ඣායනය කිරීමෙන් ඇතිවන යහපත 7වන ශතවර්ෂයේ වැඩ සිටි චීන භික්ෂුවක් වූ යිජිං මෙසේ සඳහන් කරයි: ‘එය බුදුපියාණන් වහන්සේගේ ගුණ අපට දැන ගැනීමට සලස්වයි. කවි ඇගයීමට අපි ඉගෙන ගන්නෙමු. එය දිව පිරිසිදු කරයි. පපුව ප්‍රසාරණය වෙයි. එක්රැස්වීමේ දැඩි විශ්වාසය අපි ඉගෙන ගන්නෙමු. ගැඹුරු ආශ්වාස ප්‍රශ්වාස ධෛර්යමත් කිරීමෙන් එය යහපත් සෞඛ්‍ය කියා දෙයි.’ බලන්න **සංගීතය**

## චරිතය සහ චරිත ගොඩනැඟීම

චරිතය (සභාව) යනු පුද්ගලයෙකු තවත් කෙනෙකුගෙන් වෙනස්ව නිර්මාණය කරන මානසික ගුණාංග සහ ගති ලක්ෂණයි. මෙයට ඇති ඉංග්‍රීසි වචනය හටගෙන ඇත්තේ කොටන ලද හෝ මුද්‍රා තබන ලද ග්‍රීක සලකුණකින්ය. යම් කෙනෙකු ප්‍රසන්න හෝ අප්‍රසන්න යැයි අප කියන විට, අප අදහස් කරන්නේ ඔහු තුළ වඩාත් පහසුවෙන් පෙනෙන හෝ වඩාත් නිතර ප්‍රකට වන ධනාත්මක හෝ ඍණාත්මක ගති ලක්ෂණ බහුලව ඇති බවයි. අපි නැවත ඉපදෙන විට පෙර ජීවිතයේ ගති ලක්ෂණ අප සමග ගෙන එන්නෙමු. සමහර විට ජීවිත බොහෝ ගණනකින් සහ සහජයෙන් මතුපිටට යටින් පවතිනා ගති ගෙන එන්නට පුළුවනි. (අනුසය) මාස ස්වල්පයක් තුළදී මෙම ගති ලක්ෂණ පැහැදිලිව පෙනේ. අවස්ථාවට අනුකූලව ඒවා බලවත් වේ, හෝ ක්‍රමයෙන් පිරිහී යයි. අපගේ ළමා වයසේ මුල් කාලයේ අත්දැකීම් ද අලුත් ගති ලක්ෂණ ඇති වීමට හේතු විය හැකිය.

එසේම, මතු පිටට යටින් පවතිනා ගති අවදි කිරීමට අවස්ථාවන් ඇතිවිය හැකිය. අප අපගේ නව යොවුන් වියේ මුල් කාලයේ සිටිනා විට, අපගේ චරිතය සකස් වී ඇති නමුත්, තවමත් අනුහුරු කළ හැකිය. අප සකස් කරන මානසික පුරුදුවලට අනුකූලව, සමහර ගති ශක්තිමත් කළ හැකිය. සමහර විට අගතියට (නත) වර්ධනය විය හැකිය. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ‘යම් කෙනෙකු බොහෝ විට සිතන සහ සලකා බලන කුමන දෙයක් හෝ අනුව, එම

පුද්ගලයාගේ මනස ඒ ආකාරයට නැඹුරු වේ' (M.I,115). ග්‍රීක රූපයකට සමාන රූපයක් භාවිත කරමින් උන්වහන්සේ කියා සිටියේ සමහර ගති ලක්ෂණ ගලක් මත කෙටූ ඒවා වගේ බවත්, අනෙක් ඒවා පොළොව මත සීරීමට සමාන වන බවත්, තවත් සමහරක් ජලය මත ලිවීම හා සමාන බවත්ය (A.I,283-4). මෙයින් අදහස් වන්නේ සමහර ඒවා වෙනස් කිරීම අපහසු බවත්, අනෙක් ඒවා ඊට අඩු බවත්ය. ඒවා හිතා මතාම උත්සාහයෙන් හෝ විශේෂයෙන්ම සැලකිය යුතු තරම් අත්දැකීම්වලින් වෙනස් නොකළහොත්, කෙනෙකුගේ චරිතය සාපේක්ෂව ස්ථාවරව තිබේ. කාලයත් සමග වඩාත් ස්ථාවරව සහ ගැඹුරට මුල් බැස ගනී.

චරිතය වැදගත් වේ. එයට හේතුව එය අපගේ ජීවිත ගමනේ වැදගත් සාධකයක් වන නිසාය. අප අපම දකින ආකාරය, අප අනෙක් අයට සම්බන්ධ වන ආකාරය කෙරෙහි එය අපට බලපායි. එම නිසා ඒ ආකාරයෙන්, ඔවුන් අප හා සම්බන්ධ වන ආකාරය, ජීවිතයේ වෙනස්වීම් සමග අප කටයුතු කරන ආකාරය සහ අප ලෝකය දකින ආකාරය කෙරෙහිද එය බලපායි. බෞද්ධයෙකු වීමේ වැදගත් අංගයක් වන්නේ චරිත ගොඩනැඟීම හෝ 'ප්‍රසන්න ස්වභාවයක්' (කල්‍යාණ ධම්ම A.I,248) යනුවෙන් බුදුපියාණන් වහන්සේ හැඳින් වූ දේ දියුණු කර ගැනීමයි. පූර්ණ ලෙසින් කථා කරනවා නම්, මෙම ක්‍රියාවලියේ පියවර තුනක් ඇත; (1) චරිත වෙනස් වීමේ යෝග්‍ය බව දැකීම, (2) වැඩ කිරීමට ආදර්ශයක් හෝ පරමාදර්ශී චරිතයක් තිබීම (3) චරිතයක් වෙනස් කිරීමට උපක්‍රම තිබීම සහ යෙදීමයි.

පෙර ජීවිතයේ සහ වර්තමාන ජීවිතයේ අනපේක්ෂිත තත්ත්වයන් හේතු කර ගෙන සමහර පුද්ගලයෝ දැනටමත් ප්‍රසන්න චරිත ගෙවති. බොහෝ අය එසේ නැත. බොහෝ අය තමන් වෙනස් කර ගැනීමේ හෝ තමන් වෙනස් වීමෙන් ලැබිය හැකි වාසි ද කවදාවත් දැක නැත. චරිත පරිවර්තනයක් සිදු වීමට ආශාව ඇති කළ හැකි සමහර දේ අතර ඔවුන් විසින්ම අත්විඳින ලද පෞද්ගලික අර්බුදයක් ඇතුළත් වේ. ඒ අතරට, අනතුරකින් මැරෙන්නට ගිය අත්දැකීමක්, හෝ විශේෂයෙන් ප්‍රසංසනීය පුද්ගලයෙකුගෙන් ලැබූ පිබිදීමක් වශයෙනි. පුද්ගලයෙකු සෑම දිනක් පිළිබඳවම මේ ආකාරයට කල්පනාකාරී විය යුතු බව වාග්භට ලියා ඇත: 'මගේ දවල් සහ රාත්‍රී ඉක්මණින්ම ගෙවී යයි. මා කුමන ආකාරයේ මිනිසෙකු බවට පත් වී ඇත්තෙම්ද?' එවැනි පුහුණුවක් තුළින් වෙනසක් නිශ්චිතව අවශ්‍ය වන්නේ කොතැනද යන්න දැකීමට කෙනෙකුට උපකාර වේ. වෙනසකට ඇති සම්භාව්‍යතාව සහ අවශ්‍යතාව දැක, පුද්ගලයෙකු ඒ සඳහා කටයුතු කිරීමට පරමාදර්ශයක් ද තිබිය යුතුයි. සැබැවින්ම පරිපූර්ණ පරමාදර්ශී පුද්ගලයා වන්නේ අනන්ත ලෙස ඉවසිලිවන්ත, අඩුනොවන ලෙස කරුණාවන්ත, සම්පූර්ණයෙන්ම අවංක සහ ගම්භීර ලෙස ප්‍රඥාවන්ත වූ බුදුපියාණන් වහන්සේය. බුදුපියාණන් වහන්සේ 'සරණ යෑම' කෙනෙකු උන්වහන්සේ මඟ පෙන්වන පරමාදර්ශියා ලෙස පිළිගැනීමයි. යමෙකු වීමට කැමැති ආකාරය තීරණය කළ පසු, ඔහුට වෙනස්වීමට ප්‍රායෝගික මඟ පෙන්වීමක් අවශ්‍ය වේ. බුද්ධිමය, සදාචාරමය සහ මනෝවිද්‍යාත්මක යන ජීවිතයේ සෑම කරුණක් පිළිබඳවම ගමන් මාර්ගය ඉදිරිපත් කරන ආර්ය

අෂ්ටාංගික මාර්ගය එවැනි වැඩසටහනකි.

## ධර්මය පැතිරවීම

බුදුපියාණන් වහන්සේ සියලු දෙනාටම නොමිලයේ ධර්මය දුන්හ. ධර්මය ඉගැන්වීම සඳහා බුදුපියාණන් වහන්සේ බොහෝ විට දුෂ්කරතා සහ අපහසුතාවලට පත්වූහ. ඉඳහිට උන්වහන්සේ ජීවිතයේ අවදානම්වලටද මුහුණ පා ඇත (Ud.78). පුණ්ණ භික්ෂුව ධර්මය බෙදා හදා ගැනීමට සූදානම් වූයේ ප්‍රචණ්ඩත්වයට ප්‍රසිද්ධියක් උසුලන මිනිසුන් සිටිනා දිස්ත්‍රික්කයක් තුළය. එහිදී ඔහුට අතවරයකට ලක්වීමට හෝ ඊටත් වඩා දුෂ්කරතාවන්ට පත්වීමේ සහ ඉවසිලිවන්ත වීමේ අවදානම් තත්ත්වයන් තිබුණි (M.III,269). වර්තමානයේ බටහිර වැසියෝ පාරම්පරික බෞද්ධ රටවලට ධර්මය හෝ භාවනාව ඉගෙන ගැනීමට ගොස් නැවත තමන්ගේ මව්රටට පැමිණෙති. ඊට පසු, තමන් නොමිලේ ඉගෙන ගත් දේ ඉගැන්වීම පිණිස මුදල් අය කරති. මේ ආකාරයෙන් සමහර ආසියානු භික්ෂූහු ද ධර්මය සඳහා මිලක් අය කරති. මෙසේ කරමින්, එවැනි පුද්ගලයෝ වටිනා ධර්මය වෙළඳ භාණ්ඩයක් බවට පත් කරති. නමුත් බුදුපියාණන් වහන්සේ පැහැදිලිව පැවසුවේ: ‘කෙනෙකු ධර්මයෙන් ව්‍යාපාරයක් නොකළ යුතුයි’ (Ud.66). ‘ධර්ම දානය අනෙක් සියලු දානයන්ට වඩා විශිෂ්ටයි’ (Dhp.354) යැයි පවසමින් බුදුපියාණන් වහන්සේ අදහස් කළේ ධර්මය දිය යුතු දෙයක් මිස අලෙවි කළ යුතු දෙයක් නොවන බවයි.

බුදුපියාණන් වහන්සේගේ කාලයේ දී වෙනත්

ආගම්වල ගුරුවරුන් මිලක් (ආචරියධන) අය කළ බව මිනිස්සු දැනගෙන සිටියහ. නමුත් ධර්මය ඉගැන්වූ ගුරුවරු ගෞරවය සහ අවධානය යොමු කිරීම හැර වෙන කිසිවක් බලාපොරොත්තු නොවූහ (A.V,347). භාවනා වැඩසටහනකදී ආහාරවලට, වාසස්ථානය ආදියට අය කිරීමේ වරදක් නැත. ගුරුවරයෙකුට පරිත්‍යාගයක් පිළිගැනීම ද අයෝග්‍ය නොවේ. නමුත් 'අනුග්‍රාහකත්වයක්' යනුවෙන් එය හඳුන්වමින් මිලක් අය කිරීම වුවත්, හෝ බලාපොරොත්තු නැති නිශ්චිත මුදලක 'පරිත්‍යාගයක්' නිවේදනය කිරීමත්, බුදුදහමේ ඉතා මූලික සදාචාර ප්‍රතිපත්ති සහ පරමාදර්ශවලට විරුද්ධ වේ. ධර්මය උගන්වන්නන් තමන් කරන දේ විරල සහ විශ්මය ජනක විශේෂ ප්‍රතිලාභයක් ලෙස දැකිය යුතුයි. එසේම එය කරුණාවන්ත ක්‍රියාවක් මිස යැපුම් මාර්ගයක් නොවේ. බලන්න **ගුරුවරු සහ ශිෂ්‍යයන්**

## සුචරිතයට සහ සිරිත්වලට ඇලීම

සුචරිතයට සහ සිරිත්වලට ඇලීම (සීලබ්බපරාමාස) යනු බුදුපියාණන් වහන්සේ නිතර භාවිත කළ පදයකි (A.III,377; D.II,58; M.I,433). සීල යන්නේ අදහස නියමයන් සහ ශික්ෂාපදවලින් ප්‍රකාශකර ඇති සදාචාරමය හැසිරීමයි. (උදාහරණ - ශික්ෂාපද පහ), වත යන්නෙන් අදහස් කරන්නේ පොරොන්දු, නියමයන් හෝ පිළිවෙත් ක්‍රම සහ පරාමාස යනුවෙන් අදහස් වන්නේ ඇලීම හෝ ග්‍රහණය කිරීමයි. මෙම යෙදුමෙන් අදහස් කරන්නේ සදාචාරාත්මක නීති රීති වලට අධික අවධානය දීම හෝ ඇතැම් චාරිත්‍ර වාරිත්‍ර නිවැරදිව ඉටු කිරීම ප්‍රබුද්ධවීමට හේතු වනු ඇතැයි

යන වැරදි මතයයි.

කෙසේ නමුත්, එයට වෙනත් බොහෝ විදහා පෑම් ඇත, වඩා වැදගත් ඒවා නොසලකා හරිමින්, සුළු නීති රීති ගැන ඕනෑකමින් අනුගමනය කිරීම, සදාචාරවත් නීති රීති සඳහා සමාජ සිරිත් පිළිබඳ නීති රීති ව්‍යාකූල කිරීම, නීතියක් හරියටම අනුගමනය කළ යුතු යැයි අවධාරණය කරමින්, කෙනෙකු චාටුවෙන් පොළඹවා ගැනීමේ අදහසින් කටයුතු කිරීම, ශික්ෂා පදයක බාහිර ස්වරූපය තදින් පිළිපදිමින් එහි තේරුම හෝ අරමුණ සැලකිල්ලට නොගැනීම යනාදියයි. ශික්ෂාපද හුදෙක් යාන්ත්‍රිකව සජ්ඣායනය කරමින් එය ප්‍රමාණවත් යැයි සිතීම සීලබ්බපරාමාසයට ඒ හා සමාන උදාහරණයකි. තමා ගැනම ආඩම්බරවීම සහ තමාගේ දැහැමි බව ඕනෑවට වඩා පෑම හෝ තමන්ගේ සදාචාරවත් දැහැමි බව පිළිබඳව පුරසාරම් දෙඩවීම යනාදිය ද මෙයට ඇතුළත් විය හැකිය (Sn.782). සීලබ්බපරාමාසයෙන් පීඩාවට පත් වූ අයෙකු සුනම්‍යතාව, සමබරතාව සහ වචන හෝ පිටස්තර ස්වරූපයෙන් ඔබ්බට යෑමට හැකියාවක් නැත. ඒ නිසා, සමහර විට අවංක සහ උද්‍යෝගිමත් වන නමුත්, එවැනි පුද්ගලයෙකුට සැබැවින්ම කිසි දිනක ධර්මය ගැඹුරු මට්ටමකට සිතට කාවදින්නේ නැත. සුචරිතය සහ සිරිත්වලට ඇලීම, පුද්ගලයෙකුගේ ආධ්‍යාත්මික දියුණුවට බාධාවක් (අප්පහාය අභබ්බො A.V,144) ඇති කරන බන්ධන දහයෙන් එකක් බව (දසසංයෝජන A.V,17) බුදුපියාණන් වහන්සේ හඳුනාගත්හ.

## ඇඳුම්

ඇඳුම් (සෙල හෝ වත්ථ) යනු ශරීරයට ගැලපෙන පරිදි සකස් කර ඇති රෙදි කැබලි වේ. ඇඳුමෙන් සැරසෙන්නේ ශරීරය කාලගුණ කාරකවලින් ආරක්ෂා කර ගැනීමට සහ විළිබිය සැලකිල්ලට ගෙනය. පැරණි ඉන්දියාවේ රෙදි නිපදවනු ලැබුවේ නූල්, පට නූල්, කපු හෝ වෙනත් ගස්වලින් ලබාගත් තන්තු භාවිත කරමින්ය. ඉතාමත් මිල අධික රෙදි කාසි බ්‍රොකේඩ රෙදි සහ කඩුම්බර ලිනන් රෙදිය (A.I,248; Ja.VI,500). තමන් වහන්සේ ගිහියෙකුව සිටියදී උන්වහන්සේගේ තලප්පාව (වෙඨන), කබාය (කඤ්චුක), යට ඇඳුම් (නිවාසන) සහ ලෝගුව (උත්තරාසඞ්ග) කාසි බ්‍රොකේඩවලින් පමණක් නිමවා තිබූ බව බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ (A.I,145). පුරුෂයෝ සහ ගැහැණු ඔවුන්ගේ ඉඟ වටා ඉණ රෙදි කඩ (සංවෙල්ලිය) සහ ඔවුන්ගේ උඩුකය වටා දිගු රෙදි වැස්මක් (සාටක) විවිධ ආකාරයට ඔතා ගත්හ. සාරි නමැති හින්දි වචනය සමහර විට පාලියෙන් හඳුන්වන සාටකයට සම්බන්ධ කමක් තිබිය හැකිය. ගැහැණු සහ පිරිමි යන දෙපිරිසම නූතන වරපට හා සමාන යට ඇඳුම් (කටිසුත්තක හෝ කොපීන) භාවිත කරයි. පිරිමි තලප්පා සහ ගැහැණු වේල් ඔවුන්ගේ හිස් ආවරණය සඳහා යොදා ගනී. බොත්තම් නැත. රෙදි කැබලි එකට ගැට ගැසීමට යොදා ගනී. සාක්කු ද නැත. ඇඳුම අද්දරට කුඩා ද්‍රව්‍යයක් ගැට ගසයි.

බුදුපියාණන් වහන්සේ කහ පැහැති හෝ තැඹිලි පැහැති සිවුරක් ඇන්දහ. උන්වහන්සේගේ භික්ෂූන් සහ භික්ෂුණීන්ට ද එසේ කිරීමට නියම කළහ. උන්වහන්සේගේ ගිහි පිරිසට යම් විශේෂ ආකාරයේ ඇඳුම් අඳින්නට නියම කළ බවට සඳහනක් නැත. නමුත් ඔවුන් 'සුදු පැහැති ඇඳුම් ඇඳගත් ශ්‍රාවකයන්' (ඔදාතවසන D.I,211; M.I,340) ලෙස බොහෝ විට හැඳින ගන්නට යෙදුණි. බුදුපියාණන් වහන්සේගේ කාලයේ සිටම බෞද්ධයන් සරල, සායම් පොවා නැති රෙදිවලින් නිමවූ ඇඳුම්වලට කැමැත්තක් දක්වා ඇති බව පෙනේ. මෙය පමණක් සුදුසු වන්නට ඇත. එවැනි ඇඳුම් පිරිසිදු බව සහ සරල බව සංකේතවත් කරයි. එසේම ධනවතුන් සහ දුප්පතුන් අතර වෙනස අඩු කරමින් සමානාත්මතාව අවධාරණය කරයි. ශ්‍රී ලංකාවේ ඉතා භක්තිමත් මිනිස්සු තවමත් සුදු ඇඳුම් ඇඳීමට වැඩි කැමැත්තක් දක්වති. තායිලන්තයේ පවා අටසිල් හෝ දසසිල් සමාදන්වන පිරිස උපෝසථ කාලයේදී සුදු අඳිති.

කෙසේ නමුත් වඩා වැදගත් වන්නේ යම් කෙනෙකුගේ හදවතේ ගුණයයි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'අලංකාර ඇඳුම් පැලඳුම්වලින් සැරසී සිටියත්, යම් කෙනෙකු සන්සුන් නම්, හික්මීමෙන් යුක්ත නම්, පූජනීය ජීවිතයකට කැපවී ඇත්නම්, සියලු සත්ත්වයන් කෙරෙහි අවිහිංසාව පතුරුවයි නම්, ඔහු සැබෑ තවුසෙකි, සැබෑ බ්‍රාහ්මණයෙකි, සැබෑ භික්ෂුවකි' (Dhp.142).

බලන්න **නග්නත්වය**

*Indian Costume,* G. S.Ghurye,1995.

## සාමූහික කර්ම

බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල සාමුහික කර්ම පිළිබඳව ඉඟියක් දක්නට නැති අතර, පාරම්පරික ශබ්ද කෝෂවල සාමූහික කර්ම සඳහා පාලි හෝ සංස්කෘත යෙදුමක් නැත. මෙම අදහස පසුකාලීන බෞද්ධ ග්‍රන්ථවලද නොමැති බව පෙනේ. මෙම අදහස පිළිබඳ පළමු සඳහන 19වන සියවසේ අග භාගයේ සිට පරම විඥානාර්ථ ලේඛනවලින් සොයාගත හැකිය.

සාමූහික කර්ම වැනි දෙයක් අඟවන බෞද්ධ සම්ප්‍රදායේ එක් සිදුවීමක් නම් බුදුපියාණන් වහන්සේගේ ඥාතීන් වන ශාක්‍යයන් පිළිබඳ කතාවකි. කෝසලයේ රජු විඩූඩ 'කිරිඵරා බොන ළදරුවන්, ද ඇතුළත්ව, 'සියලු සාක්‍යයන්' සමූල ඝාතනය කළේය. හිතන පරිදි, ඔහු එසේ කළේ 'සාක්‍යයන්' පෙරදී එක් ගංගාවක ජලය සම්බන්ධයෙන් ඇතිවූ වාදයකදී එම ගඟට වස මිශ්‍රණය කර තිබීම නිසාය (Ja.IV,152). ඇත්ත වශයෙන්ම සාක්‍යයන් ටික දෙනෙකු පමණක් මෙම ක්‍රියාව කරන්නට ඉඩ ඇත. සාක්‍යයන්ගේ ප්‍රධානියා සමහර විට එයට අනුමැතිය දෙන්නට ඇති අතර, තවත් බොහෝ දෙනෙකු එය අනුමත කර තිබිය හැකි වුව ද, බහුතරය වූ, විශේෂයෙන්, ළදරුවන්ට සහ දරුවන්ට ඒ පිළිබඳව කිසිදු සම්බන්ධයක් ඇත්තේම නැත. ඒ අනුව මෙම කථාවේ සමූහ කර්මය ගම්‍ය වේ.

කෙසේ නමුත්, මෙම කථාව ත්‍රිපිටකයේ නැත. නමුත්, එය ජාතක පොතේ අටුවාවල සහ ධම්මපදයෙහි

එයි. මේ දෙකම පසුකාලීන ධර්ම ග්‍රන්ථ වන අතර, දින නිශ්චිත නැත. කතෘ හෝ කතෘන් කවුරු වුවත්, සාමූහික කර්ම පිළිබඳ අදහස නිශ්චිත ධර්මයක් ලෙස ඉදිරිපත් කරනවාට වඩා, ඒවා හුදෙක් කතාන්දර කීමක් ලෙස පෙනී යයි. සැබැවින්ම පසුකාලීන විචාරකයන් කිසිවෙකු මෙම සංකල්පය වර්ධනය කිරීම සඳහා ඉඟියක් ලෙස කථාව නොගැනීමෙන් මෙම උපකල්පනය ශක්තිමත් වේ. එසේම මහාවංස ටීකාවේ තවත් කථාවක සංස්කරණයකින් සඳහන් කරන්නේ සමූලඝාතනයෙන් දිවි ගලවා ගත් අය සිටින බවයි. ඒ අනුව 'සියලු සාක්‍යයන්' වෙනත් අය විසින් ඇති කළ කර්මයේ ඍණාත්මක විපාක අත්වින්ද බව කියන කියමනට බලපෑමක් ඇති කරන බව සහ පරස්පර විරෝධී බවක් තිබෙන බව පෙනේ.

සාමූහික කර්මය යන අදහසට විවිධ මත ඇත. තමන් විසින් එක්ව සිදුකරන ලද ඍණාත්මක කර්ම හේතුකොටගෙන මිනිසුන් විශාල සංඛ්‍යාවක් විශේෂ කණ්ඩායමකට නැවත ඉපිද ඊට පසු එකට දුක්විඳිය හැකිය යන අදහස පුද්ගලයෙකු තරයේ දරා සිටිය හැකිය. තවත් මතයකට අනුව, අහිංසක පුද්ගලයන් අයත් කණ්ඩායමක සුළුතරයක් එම සාමාජිකයන් බහුතරයක් විසින් කරන ලද ඍණාත්මක කර්ම හේතුකරගෙන දුක්විඳින්නට සිදුවිය හැකිය යන්නයි. මෙම මතයන්ට අනුව, සිතන පරිදි විපාක එන්නේ යුධ, දුර්භික්ෂ, වසංගත, භූමිකම්පා හෝ ස්වභාවික විපත්ති යන ආකාරයෙනි. එහෙම උනත්, මෙම දෙවන මතයේ තවත් වටහා ගැනීමක් නම්, තමන් හා සම්බන්ධ කෙනෙකුට ඍණාත්මක යමක් සිදුවීමෙන් පුද්ගලයෙකුට තමන් කළ නපුරුකමට දුක් විඳින්නට

සිදුවිය හැකි බවයි. එහි ඕනෑම මතයකට අනුව, කුසල් අනුමෝදන් කිරීමේ අදහස මෙන්ම, සාමූහික කර්මය, පෞද්ගලික වගකීම අවධාරණය කරන බුදුපියාණන් වහන්සේගේ කර්මය පිළිබඳ අදහස සමග පරස්පර වේ. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'නපුරක් කරනු ලබන්නේ තමා විසින්මයි, නපුරෙන් වැළකී සිටින්නේත් තමා විසින්මයි, පවිත්‍ර වන්නේත් තමා විසින්මයි. පිරිසිදු බව සහ අපිරිසිදු බව රඳා පවතින්නේ තමා මතයි. කිසිවෙකුට තවත් කෙනෙකු පවිත්‍ර කළ නොහැකිය' (Dhp.165).
*Good Kamma! Bad Kamma! What exactly is Kamma?* Bhante S. Dhammika, 2015.

## කරුණාව

කරුණාව (කරුණා) යනු අනෙක් අයගේ දැඩි වේදනාව හෝ වේදනාව තමන්ගේම දෙයක් ලෙස දැනිය හැකිවීමයි. සතර බ්‍රහ්ම විහරණවලින් දෙවැන්න එයයි. අන් සියලු ගුණයන්ට වඩා වැඩියෙන් ඉහළින්ම බුදුපියාණන් වහන්සේ ඇගයීමට ලක් කළේ එයයි. එයට හේතුව එය වෙනත් බොහෝ ගුණයන්ට මූලයයි. කරුණාවට ඉංග්‍රීසි භාෂාවේ ඇති වචනයේ අර්ථය පාලි භාෂාවේ ඇති වචනයේ අර්ථයත් හරියටම එකයි. එය ලතින් භාෂාවේ (කොම්) හෙවත් 'සමග' යන අර්ථය සහ පස්සියො හෙවත් 'වේදනා විඳීම' යන අර්ථයයි. බෞද්ධ මනෝවිද්‍යාවේ, කරුණාව සංවේදනයට (අනුද්දයතා), අනුකම්පාව (දයා), සුහද හැඟුම (අනුග්ගහ) සහ අනුකම්පාව (අනුකම්පා) හා සම්බන්ධ වේ.

බුදුපියාණන් වහන්සේගේ පෞරුෂත්වයේ වඩාත්ම කැපී පෙනෙන ලක්ෂණය වූයේ උන්වහන්සේගේ

කරුණාවයි. නමුත් මෙය හුදෙක් උන්වහන්සේට දැනුණු හෝ උන්වහන්සේ ඉදිරියේ අනෙක් අයට දැනුණු යම් දෙයක් නොවේ. එය උන්වහන්සේ කියූ සහ කළ බොහෝ දේවල චේතනාවයි. උන්වහන්සේ මෙසේ පැවසූහ: 'තමන්ගේ ශ්‍රාවකයන්ගේ සුභසිද්ධිය බලා ගන්නා සහ ඔවුන් කෙරෙහි කරුණාව ඇති ගුරුවරුයෙකු විසින් ඔවුන් කෙරෙහි කරුණාවෙන් කළ යුතු සියල්ල මම ඔබලා වෙනුවෙන් කර ඇත්තෙමි' (M.I,46). බුදුපියාණන් වහන්සේ 'මහා කරුණාවෙන්' යුක්තව රෝගීන් වෙත ගොස් ඔවුන් සැනසූහ (A.III,379) එසේම උන්වහන්සේ 'මහා කරුණාවෙන්' ඔවුන්ට ධර්මය ඉගැන්වූහ' (A.III,168). වරක් උන්වහන්සේ විකෘති මානසික පරිතුෂ්ටියක් ඉටු කිරීම සඳහා මිනීමරන්නෙකු සොයමින් වනයට වැඩියහ. ඒ උන්වහන්සේට ඔහු සහ ඔහුගෙන් විපතට පත්වන්නට තිබූ අය කෙරෙහි ඇතිවූ මහා කරුණාව නිසාය (M.II,98 ff).

බුදුපියාණන් වහන්සේගේ කරුණාව කාල සීමාවන් පවා ඉක්මවා ගොස් තිබූ බව පෙනේ. 'ඉදිරි පරම්පරාවන් කෙරෙහි තිබූ කරුණාව' නිසා උන්වහන්සේට සමහර විට යම් දේවල් කිරීමට සහ කිරීමෙන් වැළකීමටද සිදු වූ බව සඳහන් වී ඇත' (M.I,23). උන්වහන්සේගේ වැඩ සිටීමට මුල්ම හේතුව 'බොහෝ දෙනාගේ යහපත පිණිස, බොහෝ දෙනාගේ සතුට පිණිස, ලෝකය කෙරෙහි ඇති මහාකරුණාව නිසා, දෙවිවරුන්ගේ සහ මිනිසුන්ගේ සුභසිද්ධිය සඳහා, යහපත සහ සතුට සඳහා' බව වරක් බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.II,147). බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රාවකයන්ට සමහර වේලාවට කරුණා සිතුවිලි සහ

හැඟීම් පිබිදීම සඳහා නිශ්ශබ්දව හිඳගෙන ඉන්නට සහ ඊට පසු ඒවා ලෝකයට පතුරුවන්නට ධෛර්යමත් කළහ. මෙසේ කළ අය 'කරුණාව-පුබුදු කළ' (කරුණාධිමුත්ත) ලෙස හැඳින්විය හැකි බව පැවසූහ.' මෙයින් අදහස් වන්නේ කරුණාව පිරුණු මනසකින් යුක්ත පුද්ගලයෙකු ලෝකයේ හතරෙන් පංගුවකට පතුරවමින් වාසය කරන බවයි. ඊට පසු දෙකෙන්, තුනෙන් සහ හතරම ආදී වශයෙන් වේ. ඒ අනුව, පුද්ගලයෙකු කෝපයෙන් සහ ද්වේෂයෙන් නිදහස් අධික සහ උසස් බවට පත් කරුණාවෙන් පිරුණු මනසකින් මුළු ලෝකයටම, උඩ, යට, හරහා, සියලු තැන සහ සියලු හාත්පස කරුණාව පතුරුවමින් වාසය කරයි' (D.II,243). ජාතකමාලාවේ මෙසේ සඳහන් වේ: 'හුදෙක් සීතල වැස්ස අස්වැන්න වැඩෙන්නට සලස්වන්නාක් මෙන් කරුණාව අනෙක් සියලු ගුණධර්මවලට උපත ලබා දෙයි. යම් කෙනෙකු කරුණාවන්ත නම්, ඔහුට තමන්ගේ අසල්වැසියාට හිංසා කිරීමට කැමැත්තක් නැත. ඔහුගේ ශරීරය, කථාව සහ මනස පිරිසිදු වේ. ඔහුගේ අසල්වැසියාගේ සුභසිද්ධිය පිළිබඳ සැලකිල්ල වැඩි වේ. කරුණාව, ඉවසීම, සතුට සහ යහපත් කීර්තිය වැනි ගතිස්වභාවයන් වැඩේ. සන්සුන් වීම නිසා, කරුණාවන්ත පුද්ගලයා අනෙක් අයගේ මනසේ බිය ඇති නොකරයි. ඔහු ඥාතියෙකු මෙන් විශ්වාස කටයුතු වේ. ඔහු තද ආශාවලින් නොකැළඹෙයි. කරුණාව නමැති ජලයෙන් පිපාසය නිවේ. වෛරය නමැති ගින්න ඔහුගේ හදවතේ දැල්වෙන්නේ නැත. මෙය මතක තබා ගනිමින්, අනෙක් අය ඔබ යැයි හෝ ඔබේ දරුවන් යැයි සිතමින් ඔවුන් කෙරෙහි කරුණාව දියුණු කරන්නට උත්සාහ කරන්න.'

*Compassion and Emptiness in Early Buddhist Meditation*, Bhikkhu Analayo, 2015.

## සමේ ස්වාභාවික වර්ණය සහ මුහුණ

සමේ ස්වාභාවික වර්ණය (ඡවි වණ්ණ) යනු මුහුණේ සමේ වර්ණය සහ තත්ත්වයයි. මුහුණ (මුඛ) යනු මුහුණෙන් හැඟීම් පළ කිරීමයි. සමේ ස්වාභාවික වර්ණය මිනිස් අලංකාර පහෙන් එකකි. අනෙක් ඒවා ලස්සන කෙස්, පේශි ව්‍යූහය, දත් හා තාරුණ්‍යයයි (Ja.I,394). පැරණි ඉන්දියාවේ 'වඩා කළු නොවූ සහ වඩා පැහැපත් නොවූ' සමේ ස්වාභාවික වර්ණය වඩාත් ආකර්ෂණීය ලෙස විශ්වාස කෙරේ (M.I,88). අපගේ සමේ ස්වාභාවික වර්ණයට බලපාන්නේ ජානමය හේතු, සෞඛ්‍ය, ආහාර සහ දේශගුණයයි.

කෙසේ නමුත්, අපගේ මානසික තත්ත්වය ද, අපගේ සමේ ස්වාභාවික වර්ණය කෙරෙහි යම් බලපෑමක් ඇති කරයි. එය අපගේ මුහුණ හැඩ ගැන්වීමේ ප්‍රධාන සාධකයයි. මුහුණේ තිබෙන බොහෝ මාංශ පේශීන් අද්විතීය වන්නේ ඒවා මුහුණ අවට සමට සම්බන්ධ වී ඇති නිසා, ඇස්, මුඛය, නාසය සහ කන්වලින් විහිදුවන නිසාය. විවිධ චිත්තවේග මෙම පේශීන් ප්‍රසාරණය හෝ සංකෝචනය කරයි. එය සම තුළට ලේ ගමනාගමනය කිරීමට බලපෑමෙන් සමේ පැහැයට ද බලපායි. පරිචිතවූ චිත්තවේගයන් සමහර පේශීන් ස්ථිරවම නැති කිරීම හෝ තද වීමට හේතු වේ. එයින් මුහුණේ ස්වාභාවික ලක්ෂණ වෙනස් කරන අතර, සමේ මටසිලුටු බවක් හෝ රැළි වැටීමක් ඇති කරයි.

ජනප්‍රිය ප්‍රඥාවට අනුව පුද්ගලයෙකුගේ හදවත ලියැවී ඇත්තේ ඔහුගේ මුහුණේය. මෙම කියමනේ සත්‍යයේ

මූලයක් ඇත. බිය හෝ කනස්සල්ල ඇස්වල කෙවෙනිවලට කිඳු බසින්නට හැකිය. කම්මුල් පහතට එල්ලා වැටීම සහ සම සුදුමැලි වීම ද සිදුවේ. පිපිරෙනසුලු මනෝවේගයකින් පමානොවී මුහුණ රත්පැහැ ගැන්විය හැකිය. කේශ නාළිකා දෘෂ්‍යමාන වෙන අතර, සමේ දුර්වර්ණ වූ ලප පෙනෙන්නට පටන් ගනී. දිගටම පවතින කෝපය, අවදානම් හෝ උඩඟු ආකල්පයකින් සමක අඳුරු පැහැයක් ඇති කළ හැකි අතර, මුඛයේ කොන් විරිත්තන ආකාරයකයට යටි අතට තබයි.

ධර්ම ග්‍රන්ථ පුරා බොහෝ තැන්වල බුදුපියාණන් වහන්සේට රන්වන් පැහැ සමක් (කඤ්චනසන්නිභත්තච), කැපී පෙනෙන සියුම් සමක් (සුඛුමච්ඡවි) සහ පැහැදිලි සහ බැබලෙන ඉන්ද්‍රියයන් (විප්පසන්නානි ඉන්ද්‍රියානි A.I,181; D.III,143; Sn.551) තිබූ බව සඳහන් වේ. මෙම බාහිර සුන්දරත්වය බුදුපියාණන් වහන්සේගේ අභ්‍යන්තර වෙනස්වීමේ ඍජු ප්‍රතිඵලයකි. බුද්ධත්වය ලැබීමේ අත්දැකීම ආදරය, කරුණාව, අත්හැරීම සහ ගුණයන් සීමාවෙන් තොරව පළ කිරීම සඳහා අවකාශය සලසමින් ලෝභය, වෛරය සහ චිත්ත වික්ෂේපය, අහෝසි කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බුදුපියාණන් වහන්සේගේ සමෙහි වර්ණය සහ මුහුණ මහළු වියේදීත් සුන්දරව තිබීමට හේතුවිය.

භාවනාවේ දියුණුව සනිටුහන් කරන නිශ්චිත සලකුණක් වන්නේ මුහුණේ පහසුවෙන් පෙනෙන වඩා සන්සුන් සහ බොහෝ ප්‍රසන්න හැසිරීමයි (භද්‍රමුඛ). බොහෝ කාල වේලාවක් භාවනාවේ

යෙදෙන්නට හැකි සහ පුහුණුව ඵලදායී වූ අයට සමහර විට බැබලෙන සමේ වර්ණයක් තිබෙන බව වාර්තා වේ. විශේෂයෙන්ම මෛත්‍රී භාවනාව වඩන හෝ ධ්‍යාන හතරෙන් එකකට පත්වූ අය සම්බන්ධයෙන් සත්‍ය වේ (S.III,236; V,301). වර්තමානය වෙත බොහෝ සෙයින් රැඳී ජීවත්වන අයට 'බැබලෙන වර්ණයක්' ඇති බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (වණ්ණෝ පසීදති S.I,5).

## නිවැරදි ඒකාග්‍රතාව

නිවැරදි ඒකාග්‍රතාව (සම්මා සමාධි) බුදුපියාණන් වහන්සේ පෙන්වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අටවන පියවරයි. එය සාර්ථක භාවනාවකට අත්‍යවශ්‍ය කොටසකි. 'මනස එක්සත් කිරීම' (චිත්තස්සඒකග්ගතා M.I,301) වශයෙන් බෞද්ධ ග්‍රන්ථවල විග්‍රහකර ඇත. එය සමහර විට මනස එක් දෙයකට තියුණු වීම' (එකොදිභාව) යනුවෙන් ද හැඳින් වේ.

ඒකාග්‍රතාවයේ ඇති වාසි බොහෝය. යම් අරමුණකට දැරිය හැකි කාලයකට යොමු කරගෙන සිටි විට, එය අපට වඩා හොඳින් දැනගැනීමට සලස්වයි. ඒ නිසා ඒකාග්‍රතාවට ප්‍රඥාව තුළ ඉෂ්ට කරන්නට කාර්යභාරයක් ඇත. අප ඒකාග්‍රතාව දියුණු කළ විට, අපට අපගේ අවධානය සාමාන්‍යයෙන් සිද්ධ වන නිරන්තරව එක් දෙයකින් තවත් දෙයකට තැනින් තැන රහසින් යනවා වෙනුවට අප කැමති ඕනෑම දෙයකට හරවා ගත හැකිය. එසේ කිරීමට ඇති හැකියාව, ඵලක් නැති දවල් හීන දැකීම, කනස්සල්ල

සහ අනවශ්‍ය ලෙස අනවසරයෙන් ඇතුළුවන සිතුවිලි අවම කරගත හැකිය. ඒ අනුව, යම් දුරකට සැනසිල්ල සහ සන්සුන් බව ලබා දෙයි. බෞද්ධ භාවනාවේ ඒකාග්‍රතාව සාමාන්‍යයෙන් දියුණු වන්නේ ආනපානසතිය පුරුදු කිරීමෙනි (M.III,82).

බුදුපියාණන් වහන්සේට අනුව, ඒකාග්‍රතාව දියුණු කර ගැනීම සඳහා උපකාර වීමට අපට කළ හැකි බොහෝ දේ ඇත. පළමුවැන්න ශික්ෂාපද අනුගමනය කිරීමයි. මෙය කිරීමෙන්, අපගේ ජීවිතය සරල කරයි, මනස ප්‍රකෝප කරන පසුතැවිල්ල, වික්ෂිප්ත වීම සහ අනෙක් අය සමග ගැටුම්වලට ඇති අවස්ථා අවම වෙයි. තවත් ක්‍රමයක් නම්, බුදුපියාණන් වහන්සේ හැඳින් වූ ඉඳුරන්ගේ දොරටු රැකීමයි (ඉන්ද්‍රිය සංවර). මෙයින් අදහස් කරන්නේ මනස වැඩියෙන් ප්‍රබෝධ කරන අවස්ථාවන් සොයා නොයෑමයි (D.I,70). එසේම, කායික පහසුව, මානසික සුභසිද්ධිය සහ ඒකාග්‍රතාව අතර ඍජු සබඳතාවක් ඇත. භාවනා කරන විට, සැහැල්ලු, පහසු ඉරියව්වක් පවත්වා ගෙන යාමෙන්, ශරීරයට බලකිරීමකින් තොරව, නිහඬ වීමට ඉඩ ලබා දෙයි. ඒ ආකාරයට, සැහැල්ලු, ප්‍රීතිමත් ආකල්පයක් තිබීම ඒකාග්‍රතාව ඇති කර ගැනීම පහසු කරයි. 'සතුටෙන් ප්‍රීති ප්‍රමෝදය ඇතිවේ. ප්‍රීති ප්‍රමෝදයට පත් වීමෙන් ශරීරය නොකැළඹීමට පත් වේ. නොකැළඹුන ශරීරයකින්, යම් කෙනෙකු සංතෘප්තිමත් වේ. සංතෘප්තිමත් වූ මනස ඒකාග්‍රතාවට පත් වේ' (D.I,73).
*Tranquillity and Insight*, A.Sole-Leris, 1992.

## අනුකූලතාව

අනුකූලතාව යනු සැමවිටම එකම ලෙස සිටීමේ

ගුණාංගයයි. එය බෞද්ධ දර්ශනයේ සහ ආචාර ධර්මයේ වැදගත් ප්‍රතිපත්තියකි. අව්‍යාජ වීමට නම්, සත්‍යයක් යථාර්ථයට පටහැනි නොවන පරිදි අනුකූල විය යුතුයි. උදාහරණ වශයෙන්, 'සියලු කොන්දේසි සහිත දේ දුක්විඳිනවා' (Dhp.278) යන බුදුපියාණන් වහන්සේගේ ප්‍රකාශය උතුම් සත්‍යයක්ය යන්න නිවැරදිව හඳුන්වා ඇත. එයට හේතුව සම්පූර්ණයෙන්ම සහ සදාකාලික තෘප්තියක් ලබා දෙන කොන්දේසි සහිත දෙයක් සොයා ගැනීම නුපුළුවන් නිසාය. එසේම පරස්පර මත, ප්‍රකාශ හෝ විශ්වාස දෙකක්, එකවිට සත්‍යය නොවේ, නමුත්, දෙකම වැරදි විය හැකිය. 'සත්‍යය එකකි'. (ඒකං හි සච්චං, Sn.884) යනුවෙන් කියමින් බුදුපියාණන් වහන්සේ අදහස් කළේ මෙයයි. සදාචාරමය සත්‍යයන් ද අනුකූලවිය යුතුයි. සමහර හැසිරීම් එක් අවස්ථාවක වැරදි විය නොහැකි අතර, තවත් අවස්ථාවක නිවැරදි විය නොහැකිය. එම නිසා, කුමන අවස්ථාවකදී වුවත්, සත්ත්ව ඝාතනය වැරදිය. කෙසේ නමුත්, ප්‍රකෝපය නිසා හෝ ඊර්ෂ්‍යාව නිසා ඝාතනය කිරීම සහ ආත්ම ආරක්ෂාව වෙනුවෙන් ඝාතනය කිරීම අතර වෙනසක් තිබෙන බව බුදුදහම හඳුනාගෙන ඇත. පළමුවැන්න සම්පූර්ණයෙන්ම වැරදිය. දෙවැන්න බුදුපියාණන් වහන්සේ 'මිශ්‍රව' (වීතිමිස්ස), යන්නෙන් හැඳින්වූ දෙය විය හැකිය. ඒ වැරදි සහ නිවැරදි යන දෙකම විවිධ මට්ටමෙන් මිශ්‍රවූ එකකි (M.I,318).

ආධ්‍යාත්මික ජීවිතයේ බොහෝ අංශවලට ද අනුකූලතාව වැදගත් වේ. වටිනා ගුරුවරයෙකුගේ සලකුණු වන්නේ ඔහු හෝ ඇය ප්‍රසිද්ධියේ සහ පෞද්ගලිකව ක්‍රියා කරන ආකාරය අතර

අනුකූලතාවක් ඇති බව සහ වෙනස්වන තත්ත්වයන් තුළදී ඔහුගේ හෝ ඇයගේ යහපත් ගුණාංග ඒවා විඳ දරා ගැනීමත්ය (M.I,318). රහත් ඵලයට පත්වූ පුද්ගලයෙකු සතු ගතිලක්ෂණයක් වන්නේ ඔවුන්ගේ අවබෝධය සහ ක්‍රියා (විජ්ජාචරණසම්පන්නො) අතර ඇති එකඟතාවයි. උදාහරණ වශයෙන්, සමාව දීම අත්හැරීම සඳහා ඇති ඉහළම ආකාරය බව එවැනි පුද්ගලයෝ සැබැවින්ම අවබෝධ කර ගනිති. එම නිසා, එවැනි අයට ඕනෑම පුද්ගලයෙකුට, තමන්ට කෘර වූ අයෙකුට පවා, සමාව දිය හැකිය. 'තමන්වහන්සේ දේශනා කරන්නේ පුහුණු කරන දේ බවත්, පුහුණු කරන්නේ දේශනා කරන දේ බවත්' (It.122) බුදුපියාණන් වහන්සේ වදාළහ. මෙයට හේතුව බුදුපියාණන් වහන්සේ සත්‍යය ගැඹුරුම මට්ටමින් අවබෝධ කරගෙන තිබීමයි. එබැවින් එය බුදුපියාණන්ගේ පැවැත්මේ සෑම අංශයක් සමගම සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ විය. උන්වහන්සේට අනුකූලතාව පහසු සහ ස්වාභාවික දෙයක් විය.

## සන්තුෂ්ටිය

සන්තුෂ්ටිය (සන්තුට්ඨි) යනු යම් කෙනෙකුගේ වර්තමාන තත්ත්වයේදී සතුටු වීම සහ තෘප්ත විය හැකි වීමයි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'සන්තුෂ්ටිය ඉහළම වස්තුවයි' (Dhp.204), මෙහි අදහස අප තෘප්තිමත් වූ විට, අපට වෙනත් කිසිම දෙයක් ලබා ගැනීම අවශ්‍ය නැත. සතුටු වීමට කොහේවත් යාම හෝ කිසිම කෙනෙකු වීමට අවශ්‍ය නැත. ඒ අප දැනටමත් ඒ තත්ත්වයට පත් වී ඇත. ඒ නිසා සන්තුෂ්ටිය වෙනත් කිසිම දේපළක් හෝ කෞශල්‍යයකට වඩා අනර්ඝ වේ. භික්ෂුවකගේ

සන්තුෂ්ටිය බුදුපියාණන් වහන්සේ මෙසේ විස්තර කළහ: 'ඔහු තමන්ගේ ශරීරය වසා ගැනීමට සිවුරකින්, ඔහුගේ කුසට අවශ්‍ය ප්‍රමාණයට නොවැඩිව පිළිගත් දානයෙන් ලැබූ ආහාරවලින් තෘප්තිමත් වේ. ඔහුගේ ගමන් මාර්ගය කුරුල්ලෙකු එහා මෙහා පියඹන ආකාරයට තටු පමණක් රැගෙන යයි'(D.I,71).

## මත වෙනස් කිරීම

'ආගමික මත වෙනස් කිරීම' යන පදයෙන් හඳුන්වන්නේ අලුත් ආගමික අනන්‍යතාවක් තෝරා ගැනීමක් හෝ එක් ආගමික අනන්‍යතාවකින් තවත් එකකට වෙනස් කිරීමයි. බුදුදහමේ මත වෙනස් කිරීම පිළිබඳ විශේෂ වචනයක් නැත. කෙසේ නමුත්, අලුතින් බුදුදහම වැළඳ ගත් පුද්ගලයෙකු තමන් බුදුපියාණන් වහන්සේගේ 'ශ්‍රාවක තත්ත්වයට ගිය පුද්ගලයෙක්' (සාවකත්තං උපගතො) වශයෙන් විස්තර කර ඇති බව මජ්ඣිම නිකායේ සඳහන් වේ (M.I,380) .

මුල්ම ආරම්භයේ සිටම, පවතින ආගමික විශ්වාසයන්ට තමන් වහන්සේගේ ධර්මය විකල්පයක් බව බුදුපියාණන් වහන්සේ දුටුවහ. තමන්වහන්සේගේ මුල්ම ශ්‍රාවකයන්ට ධර්මය බොහෝ ඈතට සහ පුළුල් ලෙස උගන්වන ලෙස බුදුපියාණන් වහන්සේ උපදෙස් දුන්හ (Vin.I,120). මෙසේ කිරීමට, මුල්කාලීන බෞද්ධයන්ගේ උනන්දුව ආලවකගේ පිළිගැනීමෙන් හොඳින් පැහැදිලි වේ: 'බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේ අතිවිශිෂ්ට අයුරෙන් ඉගැන්වූ ධර්මය අගයමින් මම ගමෙන් ගමට, නගරයෙන් නගරයට යන්නෙමි' (Sn.192). බුදුපියාණන් වහන්සේගේ කාලයේ සිට අද දක්වාම තුන් සරණ යමින් (තිසරණ) මිනිස්සු

බෞද්ධයන් වීමට තමන්ගේ අදහස ප්‍රකාශ කරමින්, ‘මම බුදුන් සරණ යමි. මම ධර්මය සරණ යමි. මම සංඝයා සරණ යමි’ යනුවෙන් බෞද්ධ ප්‍රජාව තුළට ඔවුන්ගේ ප්‍රවේශය සනිටුහන් කරති. මෙම කියමන දෙවන වරටත්, තුන්වන වරටත් ඒ පුද්ගලයාගේ අවංක බව සහ කැපවීම නැවත සහතික කරමින් නැවත නැවත කියයි.

බුදුදහම වැළඳ ගැනීම සඳහා යම් කෙනෙකුට මඟ පෙන්වන්නේ මොනවාද හෝ කාරණා වන්නේ මොනවාද? බුදුපියාණන් වහන්සේ බුදුදහමට හැරවූවා යැයි ධර්ම ග්‍රන්ථවල විස්තර කරන සම්පූර්ණ දේ එසේ සිදුවූයේ උන්වහන්සේ පැවසූ දේශනාවලට සවන්දීමේ ප්‍රතිඵලයක් ලෙසය. සමහර අවස්ථාවල, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගෙන් ප්‍රශ්න විමසූ අයගෙන් ඔවුන්ගේ ඇදහිලි පිළිබඳව විමසීමක් කරමින් ඊට පසු ඔවුන්ට ධර්මය ඉදිරිපත් කිරීම ආරම්භ කළහ. තවත් අවස්ථාවල පුද්ගලයෙක් බුදුපියාණන් වහන්සේ උගන්වන දේ පැහැදිලි කරන ලෙස ඉල්ලා, පැහැදිලි කර දෙන ලෙස ප්‍රශ්න කිහිපයක් අසයි. උන්වහන්සේ පැවසූ දේ පිළිගෙන ඊට පසු උන්වහන්සේගේ ශ්‍රාවකයෙකු වීමට කැමැත්ත පළ කරයි. මේ සියලු අවස්ථාවල, බුදුදහමට හැරවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ ධර්මය කෙරෙහි ඇති බුද්ධිමය තෘප්තිය සහ බුදුපියාණන් වහන්සේගේ පෞරුෂත්වය සහ හැසිරීම කෙරෙහි ඇතිවූ පැහැදීම යන දෙකේම එකතුවක් බව පෙනී යයි. පසේනදී රජතුමා බුදුදහම පිළිගැනීමට ඔහු උනන්දු වූ විශේෂ හේතු සඳහන් කළේය: බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ භික්ෂූන් සහ භික්ෂුණීන්ගේ හැසිරීම, උන්වහන්සේලාගේ

විනය තහවුරු කරන ජීවන රටාව, උන්වහන්සේලාගේ සදාචාරවත් සෘජුබව සහ ධර්මය උන්වහන්සේලා සතුටට පත් කරන සාධකයක් වූ බව යනාදියයි (M.II,120-4). බුදුදහමේ හාස්කමක් තහවුරු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් කෙනෙකු බුදුදහම වැළඳ ගත් බවට උදාහරණ බෞද්ධ ධර්ම ග්‍රන්ථවල නැත. සැබැවින්ම බුදුපියාණන් වහන්සේ හාස්කම්වලින් උපද්දන බුදුදහමට හැරවීම් අනුමත නොකළහ. 'බොහෝ මිනිසුන් ඔබවහන්සේ කෙරෙහි විශ්වාසය තබනු ඇතැයි' (D.I,211) පවසමින් වරක් පුද්ගලයෙකු බුදුපියාණන් වහන්සේට හාස්කමක් හෝ ඉර්ධි ප්‍රාතිහාර්යයක් ප්‍රදර්ශනය කරන ලෙස ඉල්ලුවේය. බුද්ධිමතුන් පවා එවැනි 'හාස්කම්' රැවටිල්ලක් හෝ විජ්ජාවක් ලෙස සම්පූර්ණයෙන්ම සැක කරනු ඇතැයි පවසමින් උන්වහන්සේ මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ.

ලෝකය අවසන් වීමට ආසන්නව ඇති බවට ඇති බිය, නිරයට යාමට ඇති භව්‍යතාව පිළිබඳ සිතෙහි අවුල් සහගත බව හෝ වැරදි කළ බව සහ පසුතැවිල්ල නිසා, යන හේතු නිසා සාමාන්‍යයෙන් ප්‍රධාන දේවවාදී ආගම්වලින් සිදු කරන වෙනත් ආගම්වල අය තම ආගමට හැරවීම පිළිබඳ උදාහරණ බුදුදහමේ නැත. දිගුකාලීන අභ්‍යන්තර අරගල හෝ හෝ චිත්තවේගී කැලඹීම් ද සිදු නොවේ.

සමහර අවස්ථාවල මිනිසුන් බුදුදහම වැළඳ ගත්තේ ඒ පිළිබඳව කෙටි සෙවීමකින් පසුව හෝ මූලික දැනුමක් ලබා ගත් පසුව පමණක් බව ත්‍රිපිටකයේ සඳහන් වේ. බුදුපියාණන් වහන්සේ ශ්‍රාවකයන් වශයෙන් එවැනි පුද්ගලයන් පිළිගත් අතර, ඔවුන්

බුදුදහම වැළඳ ගැනීමට පෙර, ධර්මය හොඳින් දැනගෙන, සහ හොඳින් ගවේෂණය කිරීම වඩා හොඳ යැයි උන්වහන්සේ සිතූ බව පෙනී යයි. නාලන්දාවේ ප්‍රධාන සහ වැදගත් පුරවැසියෙකුවූ උපාලි ගෘහපති ජෛන ආගමෙන් බුදුදහමට හැරවීම පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ ආකල්පය විස්තර කරයි.

ජෛන ආගමේ තිබෙන දුර්වලකම් පිළිබඳව බුදුපියාණන් වහන්සේ මතුකර දැක්වූ දීර්ඝ සාකච්ඡාවකට පසු, උපාලි තමන් ශ්‍රාවකයෙකු ලෙස පිළිගන්නා ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටියේය. එම ඉල්ලීමට පිළිතුරු දෙමින් බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: ‘සැලකිලිමත් ලෙස සෝදිසි කරන්න, උපාලි. හොඳින් දන්නා ඔබ වැනි පුද්ගලයන් පළමුව සැලකිලිමත් ලෙස සෝදිසි කිරීම සුදුසු වේ’ (M.I,379). තමන් කරන දේ හොඳින් දන්නා බව කියමින් උපාලි තමන්ගේ ඉල්ලීම නැවත නැවත කියමින් බල කරන්නට විය.

එවිට බුදුපියාණන් වහන්සේ උපාලිගෙන් ඉල්ලීමක් කළහ. ‘බොහෝ කාලයක් ඔබේ පවුලේ උදවිය ජෛනයන්ට දන් දී ඇත. ඔවුන් පැමිණි විට ඔවුන්ට දන් දීම අඛණ්ඩව කරගෙන යන්න.’ බුදුපියාණන් වහන්සේගේ මහාත්ම ගුණය පිළිබඳව උපාලි ප්‍රසාදයට පත්විය. ‘මා දැනගෙන සිටියේ ඔබවහන්සේට පමණක් දන්දිය යුතු සහ අනෙක් අයට ඔබවහන්සේගේ ශ්‍රාවකයන් නොදිය යුතු යැයි ඔබ සඳහන් කළ බවයි. එසේම අනෙක් අයට දෙන පරිත්‍යාගයන් නොව, ඔබවහන්සේට දුන් විට පමණක් ශ්‍රාවකයන්ට කුසල් ලැබෙන බවත් ඔබවහන්සේ කියා

ඇතැයි දැනගන්නට ලැබුණි. නමුත් ඔබවහන්සේ ජෛනයන්ට දන් දෙනමෙන් මා උනන්දු කරයි.' තමන්ගේ පෙර ආගමට උපකාර කරන්නට පොරොන්දු වෙමින්, උපාලි නැවතත් තමන් ශ්‍රාවකයෙකු ලෙස පිළිගන්නා ලෙස ඉල්ලීමක් කළේය. අවසානයේ බුදුපියාණන් වහන්සේ ඔහු පිළිගත්හ. බුදුපියාණන් වහන්සේ ජෛන ආගම වෙනුවෙන් උපාලි කළ යුතු යැයි කරන ලද ඉල්ලීම, බුදුදහම වැළඳ ගන්නා අය ඔවුන්ගේ පෙර විශ්වාසය කෙරෙහි තිබිය යුතු ආකල්පය සම්බන්ධයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුර විය යුතුයි. සමහර ආගම් වෙනස් කිරීමේදී එම පුද්ගලයාගේ පෙර ඇදහිල්ල සමග සම්පූර්ණ බිඳීමක් හෝ ප්‍රබල අහෝසි කිරීමක් අවශ්‍ය වේ. අනෙක් ආගම්වලත් යථාරූපී මූල ද්‍රව්‍යයන් තිබෙන බවත්, නිවැරදි, සදාචාරමය වටිනාකම් උගන්වන බවත් පිළිගැනීමට තරම් බුදුපියාණන් වහන්සේ විවෘත වූහ. තත්ත්වය එසේ පවතින විට, උන්වහන්සේ වෙනත් සියලු ආගම් පිළිබඳව සම්පූර්ණයෙන්ම විවේචනාත්මක නොවූහ. එසේම උන්වහන්සේගේ අනුගාමිකයන්ගෙන් ආගමික සුවිශේෂත්වයක් අවශ්‍ය නොවීය.

වෙනත් ඇදහිලි බැහැර කිරීමේ ආකල්පයකට වඩා, මෙසේ ඉඩ සැලසීමෙන් අදහස් කරන්නේ බෞද්ධයන් සමහර විට ඔවුන්ගේ ආගම තුළට මිථ්‍යා විශ්වාසයන්ට හා ව්‍යාජ මතයන්ට රිංගන්නට ඉඩ දී ඇති බවයි. ධනාත්මක පැත්තෙන් බලන විට, විවිධ ආගමික ප්‍රජාවන් අතර නොඉවසීම, තියුණු බෙදීම, ජයග්‍රහණය සඳහා අසැබි ලෙස ආගම්වලට මාරු කිරීමට පොර බදන්නන් සහ එවැනි කටයුතු සඳහා එක්වෙන නොමනාපය සහ ඊර්ෂ්‍යාව සාමාන්‍යයෙන්

බෞද්ධ සමාජවල අංග නොවන බව අදහස් වේ. බලන්න **ඇදහූ ආගම හෝ මතය අත් හැරීම, දූත මෙහෙය සහ ඉවසීමේ හැකියාව**

## සිරුර අලංකාරයට යොදන ආලේපන

සිරුර අලංකාරයට යොදන ආලේපන (ගන්ධවිලේපන) යනු කැළැල් සහ ගන්ධයන් ආවරණය කරමින් ශරීරය අලංකාර කිරීම සඳහා ශරීරයට ආලේප කරන ද්‍රව්‍යයකි. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී කාන්තාවන් සහ සමහර විට පුරුෂයන් ද පියරු (කක්කු) සහ රූජ් (මනොසිලා) ඔවුන්ගේ මුහුණේ තවරමින්, තොල් පාට කළහ. එසේම අත්ල සහ ඇඟිලි තුඩු ලාක්ෂා (ලාඛා), සුදු හඳුන් කුඩු හෝ තෙල් ඔවුන්ගේ ශරීරයේ (චන්දන) ඇතුල්ලූහ. ඔවුන්ගේ ඇස් බෙහෙත් ආලේප වලින් (අඤ්ජන, D.I,7; Ja.V,302; Thi.145; Vin.II,107) පින්තාරු කළහ. බුදුපියාණන් වහන්සේගේ ඥාති සොහොයුරු නන්ද තමන්ගේ ඇස්, බෙහෙත් ආලේපවලින් පින්තාරු කළේය. එම චාරිත්‍රය ගැහැණියක් බඳු පෙනුමකට වඩා, පිරිමින් තුළ විචක්ෂණශීලී භාවයක් පෙන්නුම් කරන සලකුණකි. කැපීපෙනෙන තරුණ පිරිමි සමහර විට, ඔවුන්ගේ ඇඳුම්වල පාටට ගැලපෙන ආකාරයට ඔවුන්ගේ සැරසුම යොදා ගනී (D.II,96).

අඩ සහ පුර පෝය උපෝසථ දිනයේදී කැපවූ බෞද්ධයන් පුහුණු කරන අෂ්ටාංග ශීලයන්ගෙන් එකක් වන්නේ සැරසුම් හෝ පෞද්ගලික අලංකාර කිරීම් යොදා නොගැනීමයි (A.IV,250). ඔවුන්ම තුළ හානියක් නැති වුවත්, හැඩ ගැන්වීමෙන් සහ

අලංකාර කිරීමෙන් ඇඟවෙන්නේ ඔවුන්ගේ සැබෑ පවතින තත්ත්වයට වඩා වෙනස් යමක් පෙන්වන්නට ඇති ආශාවයි. අවංක ගිහි බෞද්ධයෝ අඩුම තරමින් මාසයකට දෙවතාවක් අලංකාර කිරීම්වලින් වැළකී යථාර්ථය හඳුනාගනිමින්, පිළිගනිමින් සහ එයින් සතුටු වෙමින් සිටිති. භික්ෂූන් සහ භික්ෂුණීන්ට 'මල්මාලා, සුවඳවිලවුන්, අලංකාර කිරීමට ආලේපන, ආභරණ සහ පළඳනා භාවිතය' ඉහත සඳහන් හේතු මත භාවිතා නොකිරීමට උපදෙස් ලැබී ඇත. එසේම ඒවා ලබා ගැනීමට සහ භාවිතයට බොහෝ කාලයක් සහ වියදමක් දරන්නට අවශ්‍ය වේ (D.I,5). බලන්න **සමේ වර්ණය සහ සුවඳ විලවුන්**

'Perfumery in Ancient India.'R. Krishnamurthi, *Indian Journal of the History of Science*, January 1987.

## කවුන්සලය

කවුන්සලය (සඞ්ගීති) යනු යම් විශේෂ කරුණක් සඳහා පුද්ගලයන් කණ්ඩායමක හමුවීමකි. මේ සඳහා ඇති පාලි වචනයේ තේරුම 'ගායනා කිරීම' (ගීති) 'එකට' (සම්) යන්නයි. බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුව උන්වහන්සේගේ ඉගැන්වීම්වලට එකඟවීමට කවුන්සිලයක් පවත්වා ඒවා අනාගත පරපුරට ආරක්ෂා කරගත හැකිවන පරිදි මතකයේ තබා ගැනීම පිණිස ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා තීරණය කළහ. පළමු ධර්ම සංගායනාව ලෙස හැඳින්වූ මෙම රැස්වීම රජගහ නුවර සත්තපණ්ණි ගුහාවේ පැවැත් වූ අතර, එයට 500ක් අර්හතුන් වහන්සේලා සහභාගී වූහ (Vin.II,283-88). ශතවර්ෂයකට පමණ පසු, දෙවන ධර්ම සංගායනාව පැවිදි විනය පිළිබඳ මතභේදයක් විසඳීම සඳහා වෙසාලියෙහි දී පැවැත්වුණි. ඊට පසු සියලු ඉගැන්වීම්

නැවත සජ්ඣායනය කර එකඟත්වයට එළඹුණි (Vin.II,293-306).

ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයේ දී අශෝක රජු තුන්වන සංගායනාවක් පැට්නා නගරයේ පැවැත්වූ බව සාම්ප්‍රදායිකව දැනගන්නට ඇත. නමුත් මේ පිළිබඳව ඓතිහාසික තොරතුරු අඩුය. සංඝයා අතර තිබූ මතභේද විසඳා ඇත. වැරදි සහගත භික්ෂූන් සහ භික්ෂුණීන් නෙරපා හැර ඇත. ධර්මදූතයන් වහන්සේලා ඉන්දියාවේ විවිධ ප්‍රාන්තයන් වෙත ධර්ම ප්‍රචාර කටයුතු සඳහා යවා ඇති බව කියනු ලැබේ. ඊට පසු, බුදුදහම විවිධ ගුරුකුලයන්ට ක්‍රමයෙන් කැඩී බිඳී ඇත. සියලු බෞද්ධයන් නියෝජනය වන ධර්ම සංගායනා පැවැත්වීම තවදුරටත් පහසු නොවීය. නමුත් විවිධ රටවල් සමහර විට ඔවුන්ගේම ධර්ම සංගායනා පැවැත් වූහ. 1956දී බුරුම රජය රැන්ගූනයේ හයවන ධර්ම සංගායනාව පැවැත්විය. එය ප්‍රධාන වශයෙන්ම ථේරවාද ප්‍රයත්නයකි. මෙම ධර්ම සංගායනාවට පසු, ත්‍රිපිටකයේ නව සහ නිවැරදි කරන ලද සංස්කරණයක් ප්‍රකාශයට පත් කරන ලදී. බලන්න **කථාවත්ථු**

'A Review of the Scholarship on the Buddhist Councils.'Charles S. Prebish,*The Journal of Asian Studies*, Febuary 1974.

## ආචාරශීලී බව

ආචාරශීලී බව (පටිසන්ථාර) යනු අනෙක් අය කෙරෙහි ශිෂ්ට, කාරුණික සහ ගෞරව සහිත බවයි. බුදුපියාණන් වහන්සේ මිනිසුන් හමුවූ විට, 'විනීත සහ ඉතා ප්‍රිය උපදවන අයුරෙන් කථා කරමින්' ඔවුන්ට ආචාර කළ බව සඳහන් වේ (M.I,198). එසේම ඔවුන්ට ඉඳ ගැනීමට අසුනක් ද පිරි නැමූ බව

සඳහන් වේ (M.I,359). සොණදණ්ඩ බ්‍රාහ්මණයා බුදුපියාණන් වහන්සේ සමග බොහෝ අවස්ථාවල කථාබහ කර ඇත. ඔහු බුදුපියාණන් වහන්සේ 'ප්‍රසන්න ලෙස කථා කරන, විනීත, ආචාරසම්පන්න, ශිෂ්ට සහ අදාළ කරුණුවම කථා කරන' බව හඳුනා ගත්තේය (D.I,115). ආචාරශීලී බව හුදෙක් සම්මා වාචා සහ සම්මා කම්මන්ත නොවේ. එය අනෙක් අය කෙරෙහි ගෞරවය සහ ආදරය ප්‍රකාශ කිරීමක් ද වේ. බලන්න **සුබ පැතීම**

## දැඩි ආශාව

දැඩි ආශාව (තණ්හා) යනු යමක් අත්විඳින්නට හෝ ලබා ගැනීමට ප්‍රබල ලෙස සහ නොකඩවා පවතින දැඩි ආශාවකි. බුදුපියාණන් වහන්සේට අනුව, දුක්විඳීමට හේතු වන කාරණා දෙකෙන් දැඩි ආශාව එකකි. අනෙක මෝහයයි. අප දුක්විඳින්නේ ඇයි හෝ අප දුක්විඳින බව වත් දන්නේ නැති විට, අපට අප එයින් නිදහස් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමටවත් නොහැකිය. අනෙක් අතට, කොන්දේසි සහිත පැවැත්මක ඇති අසම්පූර්ණත්වය සහ අතෘප්තිමත් තත්ත්වය පිළිබඳව අප තියුණු ලෙස දන්නවා ඇත. නමුත් ජීවිතයේ සියලු දුෂ්කරතාවන්ට වන්දිය අපට අවශ්‍ය දේ ලබා ගැනීම යැයි සිතමින්, ප්‍රශ්නයට විසඳුම ලෙස ඊටත් වඩා දැඩිව අල්ලා ගැනීමෙන් අපගේ ආශාවන් පසුපස ලුහුබැඳ යාම යැයි අපි වරදවා විශ්වාස කරමු. නැවත වරක් මෙය ප්‍රශ්නය දික්ගස්සයි. නිදහස ලබා ගැනීමේ හැකියාව ඇති වන්නේ දැඩි ආශාවේ සැබෑ ස්වභාවය සහ එයට හේතු අප ප්‍රඥාවෙන් බලන්නට ආරම්භ කළ විට පමණි.

# ඇදහිල්ල

ඇදහිල්ලක් යනු යම් ආගමක සාමාජිකයෙකු ලෙස නිගමනය කරන්නට පුද්ගලයෙකු තමන්ගේ ආගමික විශ්වාසය පිළිබඳ කැමැත්ත පළ කිරීමේ ප්‍රකාශයකි. ඇදහිල්ල යන වචනය ලතින් භාෂාවේ ක්‍රෙඩෝ යන්නය. එහි අර්ථය 'මම විශ්වාස කරමි' යන්නයි. ඇදහිල්ලක් ඇතැයි යන අදහස බුදුදහමට වෙනස් වේ. එයට හේතුව, එය බොහෝ විට නිශ්චිත ඇදහිල්ලක් හෝ ලබ්ධියක් පිළිගැනීමට වඩා හැසිරීම මතුකර පෙන්වයි. ක්‍රිස්තියානි ධර්මයේ සියලු පැරණි ඇදහිලි වූ, අපෝස්තල්වරුන්ගේ ඇදහිලි, නයිසීන් ඇදහිලි, ඇතන්ස් හා සම්බන්ධ ඇදහිලි ආදිය, ක්‍රිස්තියානුවෙකු වීමට සහ ගැලවීම සඳහා පිළිගැනීමට අවශ්‍ය දේවධර්මමය අදහස් අත්හරී. නමුත්, හැසිරිය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව කිසිවක් නොකියයි.

බුදුදහමේ ඇදහිල්ලට සමාන දෙයක් හෝ අඩුම තරමින් එහි ලුහුඬු සාරාංශයක් තිබුණේ නම්, ඒ බුදුපියාණන් වහන්සේගේ ප්‍රකාශයයි : 'එකම දෙයයි, මා උගන්වන්නේ එකම දෙයයි - දුක් විඳීමයි සහ දුක්විඳීම අභිබවා යෑමයි' (M.I,140). ධම්මපදයේ උන්වහන්සේගේ සුප්‍රසිද්ධ වචන තවමත් වඩා හොඳ දෙයයි: 'නපුරු සැමදේම මඟ හරින්න, යහපත දියුණු කර මනස පිරිසිදු කරන්න, මේ බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් වේ' (Dhp.183). බුදුදහමට අනුව, දැඩි උනන්දුවකින් අදහස් සමූහයක් විශ්වාස කළත්, එය විමුක්තිය ලබා ගැනීමට මඟ පෙන්වන්නේ නැත. අවබෝධයෙන් සහ හදවතේ ඇති කරන ගැඹුරු වෙනසකින් පමණක් එය

මුදුන්පත් කරගත හැකිය. බලන්න **විශේෂණයක් සහ දැඩි විශ්වාසය**

## ආදාහනය

ආදාහනය (ආළාහනකිච්ච) යනු මරණයෙන් පසු භූමදානය කිරීම, එම්බාම් කර මිනිය කල් තබා ගැනීමට සකස් කිරීම, සතර මහා ධාතුවලට සම්බන්ධ වීමට අනාවරණය කිරීම හෝ එය ජලයට දැමීම වෙනුවට සිරුර දැවීමයි. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ දේහය ආදාහනය කරන ලෙස ඉල්ලීමක් කළහ (D.II,142). ඒ නිසා එදා සිට බෞද්ධ රටවල මියගිය අයගේ සිරුරු ඉවත දමන වඩා සාමාන්‍ය ක්‍රමය වන්නේ ආදාහනය කිරීමයි. 19වන ශතවර්ෂයේ අවසානය වනතුරු බොහෝ බටහිර රටවල ආදාහනය නීති විරෝධී විය. එයට හේතුව විනිශ්චය දිනයේදී ශාරීරිකව මළවුන්ගෙන් නැවත නැගිටීම කළ නොහැකි යැයි යන විශ්වාසයයි. කතෝලික දේවස්ථානයෙන් ආදාහනය කිරීමට අවසර ලැබුණේ මෑතකදීය. නමුත් තවමත් පොදුවේ පිළිගත් දේවස්ථාන සහ පොදුවේ පිළිගත් යුදෙව් ආගම එය තහනම් කර ඇත. බලන්න **අවමඟුල්**

## අපරාධය

අපරාධය (අපරාධ) යනු එය තහනම් කරන නීතිය උල්ලංඝණය කරන ක්‍රියාවක් වන අතර, ඒ සඳහා උසාවියකට දඬුවම් නියම කළ හැකිය. අපරාධ සාමාන්‍යයෙන් වර්ග දෙකකට බෙදා ඇත -

මිනීමැරුම් හෝ ස්ත්‍රී දූෂණ වැනි වැරදි (මාලා ඉන් සෙ) සහ සූදුව හෝ මත්ද්‍රව්‍ය භාවිතය වැනි වෙනත් වැරදිය. එයට හේතුව සමාජයේ සුභසිද්ධිය සඳහා නියාමනය කිරීම (මාලා ප්‍රොහිබිටා) අත්‍යවශ්‍ය වේ. පළමු වර්ගයේ අපරාධය සාමාන්‍යයෙන් ශික්ෂාපද කඩ කරයි. දෙවන වර්ගය එසේ වන්නට හෝ නොවන්නට හැකිය. අපරාධ, එයට හේතු සහ වැළැක්වීම, ඒවා සිදුකරන අයට සලකන විදිය, දාර්ශනිකයන්ගේ, නීති වේදීන්ගේ, සහ සමාජ විද්‍යාඥයන්ගේ මනසේ දීර්ඝ කාලයක් තිස්සේ පැවතී ඇත. නමුත් අපරාධයේ මූලාරම්භය පිළිබඳ න්‍යායක් ලබා දීමට උත්සාහ කළ මුල්ම පුද්ගලයෙකු ලෙස බුදුපියාණන් වහන්සේ පෙනී යයි. ප්‍රසිද්ධ අග්ගඤ්ඤ සූත්‍රයේ බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කර ඇත්තේ අපරාධ මතුවූයේ පෞද්ගලික දේපළ පිළිබඳ සංකල්පය ගොඩනැඟීමෙන් පසුව බවයි (D.III,92). මහාදුක්ඛක්ඛන්ධ සූත්‍රයෙන් මෙම නිරීක්ෂණය කරමින් උන්වහන්සේ එම කාරණය සම්බන්ධයෙන් වඩාත් හරියටම සාකච්ඡා කළහ: 'හේතුව, ප්‍රභවය සහ පදනම ලෙස ඉඳුරන් පිනවීමෙන් මිනිස්සු එකිනෙකා සමග දබර කරති, යුද්ධයට යති, ගෙවල්වලට කඩා වදිති, කොල්ලකති, සොරකම් කරති, අධිවේගී මංකොල්ලකෑම් කරති, කාන්තාවන් දූෂණය කරති, එයට දඬුවම් ලබති' (M. I, 86-7, සංක්ෂිප්ත කර ඇත). වෙනත් වචනවලින් කියනවා නම්, එහි බොහෝ මූලික මූල ද්‍රව්‍යයන් දක්වා අඩු වී ඇත. විනාශකාරී සමාජ විරෝධී හැසිරීම්වලට මිනිසුන් තල්ලු කරනු ලබන්නේ මූලික වශයෙන් පුද්ගලික පිනවීම සඳහා වූ ආශාවෙනි. පිළිවෙලට එය ඔවුන්ගේ ආත්ම සංවේදිතාව හා බැඳී පවතී. ආශ්වාදය

බලාපොරොත්තු වන්නේ ආත්මය වැඩි දියුණු කර ගන්නට සහ ශක්තිමත් කර ගන්නට දැනීමක් ඇතිවන බැවිනි. එම නිසා බෞද්ධ ආකල්පයට අනුව, දරිද්‍රතාවය නැති කිරීම හොඳ දෙයක් වන නමුත්, එය අපරාධය පිළිබඳ ප්‍රශ්නය අවශ්‍යයෙන්ම විසඳන්නේ නැත. අපරාධ අවම කිරීම සඳහා බුදුදහම උපක්‍රම දෙකක් යෝජනා කරයි - තෘප්තිය කල් දැමීම දිරිගන්වන අධ්‍යාපනය (ඒ සංයමය සහ තෘප්තිය) සහ වඩාත් ගැඹුරු ස්වයං අවබෝධයයි. බලන්න **දැඩි ආශාව**

*Dhamma, Man and Law*, K.N. Jayatilleke,1989.

## විවේචනය

විවේචනය යනු පුද්ගලයෙකුගේ හෝ දෙයක් පිළිබඳව දකින අදක්ෂකම් හෝ වැරදි අවධානයට ලක් කිරීමේ ක්‍රියාවයි. විවේචන බොහෝ විට ඍණාත්මක යැයි සිතනු ලැබේ. නමුත්, සත්‍යය අසත්‍යයෙන් සහ හරිදේ වැරදි දෙයින් වෙන්කර හඳුනා ගැනීමට, විශේෂයෙන්ම ආගම්වල විවිධ කියා පෑම් තක්සේරු කිරීමේදී, සැබැවින්ම එයට ඉතා වැදගත් කාර්යභාරයක් ඇත. පෙර කී මෙම ද්විත්ව ගුණාංග අනුව විවේචනය වලංගු වන අතර, එය සිදු කළ යුත්තේ සුපරීක්ෂාකාරීවයි.

වරක් මිනිසෙකු බුදුපියාණන් වහන්සේට පැවසුවේ සමහර මිනිසුන් වැරදි විවේචනය කළත්, වැදගත් දෙය අගය නොකරන බවයි. තවත් අය වැරැද්ද විවේචනය නොකර, වැදගත් දේ අගය කරයි. තවත් සමහර අය වැරැද්ද විවේචනය කරන අතර, වැදගත් දේ අගය කරයි. තවත් අය මේ දෙකම ගැන අදහස් ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියි. ඊට පසු ඔහු

පැවසුවේ ඔහුගේ අදහස වන්නේ විවේචනයෙන් සහ ඇගයීමෙන් වළකින පුද්ගලයා මේ හතර දෙනාගෙන් හොඳම පුද්ගලයා බවයි. බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: 'විවේචනයට සුදුසු දේ විවේචනය කරන, ප්‍රශංසාවට සුදුසු දේ ප්‍රශංසා කරන, හරි වේලාවට යථාව හා සත්‍යය පවසන්නා හොඳම තැනැත්තා යැයි මම තරයේ දරා සිටිමි. ඒ ඇයි? එයට හේතුව ඔවුන්ගේ සාපේක්ෂ කාල ගණනය ප්‍රශංසනීය නිසායි' (A.II,100-2).

කරුණු දෙකක් මෙහි යෝජනා කර ඇත. අප යම් දෙයක හෝ යම් කෙනෙකුගේ අඩුපාඩු පෙන්වා දෙන්නට පෙර, අපට එම කරුණු සමග දැනීමක් තිබේද සහ අපගේ විවේචනය අදාළද යන්න පිළිබඳ නිසැක විය යුතුයි. දෙවනුව, අපගේ විවේචනය කළ යුත්තේ හරි වේලාවටය - උදාහරණ වශයෙන් ධනාත්මක වෙනසක් උත්තේජනය කිරීමට වැඩි ඉඩක් ඇතිවිට. තව දුරටත්, අනෙක් අය විවේචනය කිරීම ප්‍රසිද්ධියේ කරනවාට වඩා පෞද්ගලිකව, ඔවුන්ගේ පිටුපසට වඩා, ඔවුන්ගේ මුහුණට, අප වැරදිවලින් නිදහස්ව සිටිමින් විවේචනය කිරීම සහ අපගේ අභිප්‍රාය එම පුද්ගලයාට උපකාර කිරීම යැයි අපට අවංකවම කිව හැකි නම්, විවේචනය කිරීම යහපත්ය. ඉඳහිට බුදුපියාණන් වහන්සේ අනෙක් අයව විවේචනයට ලක් කිරීම පිළිබඳව මිලින්දපඤ්හයේ මෙසේ සඳහන් වේ: 'නැමෙනසුලු ඕනෑම දෙයක් උණු ජලයේ මෘදු වන්නා සේම, බුදුපියාණන් වහන්සේගේ වචන ද එසේමයි. අප්‍රසන්න ලෙස රළු වුවත්, ප්‍රවේශමින් සැලකිල්ලට ගෙන මහාකරුණාවෙන් පුබුදු කරවයි' (Mil.172) .

ප්‍රයෝජනවත් විවේචන පිළිබඳව සඳහන් කරමින්, බෞද්ධ දර්ශනවාදියෙකු වන නාගාර්ජුන ඔහුගේ රත්නවාලියේ මෙසේ ලිව්වේය: 'ප්‍රයෝජනවත් කථාකරන්නන් හිඟය, යහපත් සවන්දෙන්නන් තවමත් වඩා හිඟය, නමුත් මේ සියලු දේ අතර ඊටත් වඩා හිඟ වන්නේ අප්‍රසන්න නමුත්, ප්‍රයෝජනවත් වචනයි.' බලන්න **මෙරූ**

## නැටීම

නැටීම (නච්ච) යනු ශරීරයේ චලනයයි, විශේෂයෙන්ම පාද. බොහෝ විට සතුට පළ කිරීමකි. සාමාන්‍යයෙන් සංගීතය හෝ ගායනාව හා එක්ව ගෙන යන දෙයකි. බුදුපියාණන් වහන්සේගේ කාලයේ නැටීම කලාවක් ලෙස ඒ වන විටත් දියුණු වී තිබුණේ නැත. බොහෝ විට සම්බන්ධ වී තිබුණේ විවාහ, අස්වැන්න නෙළා ගන්නා මංගල්‍යයකදී, බීමත්ව සිටින විට, ලිංගික දුරාචාරාත්මක කටයුතුවලදී සහ යුද්ධවලදී ය. මැදපෙරදිග දකුණු දිස්ත්‍රික්කවල ගායනය, නැටුම්, සංගීතය සහ භෝජන සංග්‍රහ මංගල්‍යයන් බොහෝ සෙයින් ඇතුළත් වූ ආගමික උත්සව පැවතුණි (A.V,216). පැවිදි විනයට අදාළ මතයට අනුව එවැනි නැටුම් එක්තරා මෝඝත්වයක් බව කියමින් බුදුපියාණන් වහන්සේ ඒවා ප්‍රතික්ෂේප කළහ (A.I,261). බැතිමත් බෞද්ධයන් අඩුම තරමින් මාසයකට හතර වරක් අටසිල් සමාදන් වීම තුළින් උත්සාහ ගන්නේ නැටුම්වලින් වැළකීමයි (A.IV,250). සියලු බෞද්ධ සංස්කෘතීන් තමන්ගේම සම්භාව්‍ය හා ජනනැටුම් සම්ප්‍රදායන් වර්ධනය කරගත් නමුත්, ඒවා සාමාන්‍යයෙන් ආගම හා සම්බන්ධ නොවීය. මෙයින් බැහැර වන්නේ ජපානය සහ ටිබෙටයයි. ඔවුන්ට දිගුකාලීන ආගමික නැටුම් සම්ප්‍රදායන් ඇති අතර, රංගන ශිල්පීන් වෙස්මුහුණු සහ අලංකාර බ්‍රොකේඩ්වලින් සැරසී සිටී. ටිබෙටයේ

සාමාන්‍යයෙන් රංගන ශිල්පීන් භික්ෂූන්ය.

## මරණය

හෘද ස්පන්දනය සහ ස්වසනය යන දෙකම නතර වූ විට මරණය (මරණ) සිදුවන බව සාම්ප්‍රදායිකව සිතූ නමුත්, නව වෛද්‍ය පටිපාටියට අනුව, මෙම අර්ථ දැක්වීම සංශෝධනය කිරීම අවශ්‍ය වේ. දැන් වෛද්‍ය වෘත්තිය අර්ථ දක්වන්නේ මරණය යනු ජීවිතය තරදුරටත් ස්ථාපිත කළ නොහැකි ඔබ්බෙන් වූ ස්ථානය බවයි. ශාරීරික, වාචික සහ මානසික ක්‍රියාකාරකම් නතරවූ විට, ඕජෝගුණය (ආයු) සහ තාපය (උස්මා) නතරවූ විට, විඥානය (විඤ්ඤාණ) ශරීරයෙන් වෙන් වෙන බවත්, ජීව ක්‍රියාකාරීත්වය නතර වී (අචේතනා, M.I,296) මරණය සිදුවන බව, බුදුපියාණන් වහන්සේ වදාළහ. මනුෂ්‍ය අත්දැකීම්වලින් මරණය ඉතාම වැදගත් සිද්ධියකි. අපට සමීප කෙනෙකුගේ මරණය ශෝකය, සහ දැඩි ශෝකයක් ඇති කරයි. එසේම තමන්ගේම මරණය අපට බියක් සහ සිත අවුල්වීමක් ඇති කළ හැකිය. මරණයට ඇති බිය බොහෝ දුරට සදාකාලික ජීවිතයකට උරුම පෙදෙසක් පිළිබඳ විශ්වාසයක් ඇති කිරීමට හේතු වන්නට ඇත. අපගේ මරණය නොවැළැක්විය හැකි බව අප ඉඳහිට සිහිපත් කරන්නේ නම්, එය පැමිණෙන විට අපට සූදානම්ව සිටින්නට හැකිය. අපගේ වර්තමාන ජීවිතය වඩාත් අගය කිරීමට ද එය හේතු වේ. මෙම හේතුව නිසා, මරණය පිළිබඳව මෙනෙහි කිරීම (මරණානුස්සති) බුදුපියාණන් වහන්සේ විසින් ඉගැන්වූ එක් මෙනෙහි කිරීමකි (A.III,71). බලන්න **අවමංගල්‍ය උත්සවය, දැඩි**

## ශෝකය සහ මහළු විය

*Buddhism and Death*, M. Walshe, 1978.

## වාදවිවාද

වාදවිවාදයක් (කථොජ්ජ හෝ විවාද) යනු විරුද්ධ අදහස් ඇති මිනිසුන් දෙදෙනෙකු හෝ ඊට වඩා පිරිසක් අතර ඇතිවන විධිමත් සාකච්ඡාවකි. සාමාන්‍යයෙන් පොදු වේදිකාවක පැවැත් වේ. ඉන්දියානු සමාජය සැම විටම ආගමික කරුණු සම්බන්ධයෙන් ඉතා ඉවසනසුලු වේ. විවිධ ආගම්වල පක්ෂ ප්‍රතිපක්ෂ හේතු පොදු වාදවිවාද සහ සාකච්ඡාවලදී ප්‍රකට කරන ලදී. පුද්ගලයන්ට ඒවා විශ්වාස කරනවාද නැද්ද යන්න පිළිබඳව තමන්ම තීරණය කරන්නට ඉඩ අවස්ථාව ලබා දී ඇත.

මෙම වාදවිවාද පැවැත්වූයේ කෙසේද යන්න පිළිබඳව හොඳ අදහසක් අපට ත්‍රිපිටකයෙන් සහ වෙනත් මූලාශ්‍රවලින් ලබා දී ඇත. තුන්වෙනි වරටත් නීත්‍යානුකූල ප්‍රශ්නයක් ඇසූ විට පිළිතුරු දිය නොහැකි වුවහොත්, එම පුද්ගලයා පරාජයට පත්වූ බවට සැලකේ (M.I,231). සහභාගීවන්නන් විසින් පිළිගත් තර්ක භාවිත කිරීම සහ පිළිගත් ක්‍රියා පටිපාටීන් අනුගමනය කිරීම අපේක්ෂා කරන ලදී. එසේම විනිශ්චයකරුවෙකු (පඤ්හවීමංසකා) ඔවුන් එසේ කළ බවට සහතික කළ යුතු ද වේ (Sn.827). වෙනත් ප්‍රශ්නයක් අසමින් ප්‍රශ්නයක් මඟ හැරීම, විෂය වෙනස් කිරීම හෝ ප්‍රශ්න කරන්නාට සමච්චල් කිරීම නුසුදුසු ලෙස සලකන ලදී. ඒ හා සමානවම, විරුද්ධවාදියෙකුට කෑ ගැසීම, ඔහු පසුබටවූ විට හෝ අතිරේක කාර්යයන්ගෙන් ඔහුට බාධා ඇතිවූ විට, ඔහු

අල්ලා ගැනීමටද අවසර නොතිබුණි (A.I,197; M.II,168). විවාදයේදී තමාගේම අදහස් දැරූ ගුරුවරයෙකුට කීර්තිය සහ ගෞරවය හිමිවන අතර, පරාජිතයන්ට ලජ්ජාවෙන් හොරෙන්ම යන්නට සිදු වේ. 'ප්‍රේක්ෂකයන් ප්‍රචණ්ඩ අපවාද වාග් ධාරාවකින් තදින් දොස් නඟමින් උසුළු විසුළු කරන විට', 'නිශ්ශබ්දතාවට යටහත්ව, ඔහුගේ හිස පහත්විය, පහත හෙළු ඇස් ඇති, පරාජය වූ, පිළිතුරක් දීමට නොහැකිවූ බවට'(A.I,187) විවාදයකට සහභාගීවූවෙකුගේ විස්තරයක් ඇත. විවාදයකදී 'කෙනෙකුගේ පිහාටු අමුණා තිබේ යැයි' (ඔපක්බිං කරොති A.I,189), කීමෙන් අදහස් වන්නේ එම ගුරුවරයාට ඔහුගේ ගෞරවය, විනය සහ ශ්‍රාවකයන් අහිමි වීමයි. අනුමාන දේවධර්ම සහ ප්‍රායෝගික නොවූ ධර්ම නොබෝ කලකින් තර්කානුකූල සියුම් පිරික්සීමට සහ සාක්ෂි සඳහා ඉල්ලීම්වලට සූදානම් රහිත හේතුවක් විය. බුදුපියාණන් වහන්සේගේ ධර්මය මෙන් පරීක්ෂාවට ලක් වූ අය සමාධිමත් වූහ. එසේ නොකළ අය මැකී ගියහ.

ඉතා ඉහළ ඔට්ටු සමග, මෙම වාදවිවාද උද්වේගකර වීම පුදුමයක් නොවේ. සමහර විට දැඩි ප්‍රහාරවලින් ද අවසන් විය. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ප්‍රගමනයේ මුල් කොටසේදී එවැනි කොටස් ඒකරාශි කීරීම් මඟහැරියේ සමහර විට මෙම හේතුව නිසාම විය හැකියි. උන්වහන්සේ මෙසේ පැවසූහ:'සමහර වාදවිවාද වෛරය භාවාර්ථය කරගෙන පැවැත් වේ. සමහර ඒවා සත්‍යය භාවාර්ථය කරගෙන පැවැත් වේ. මේ ක්‍රම දෙකෙන්ම ඉසිවරයෙක් සම්බන්ධ නොවේ' (Sn.780). මෙහි

ප්‍රතිවිපාකයක් වශයෙන් බුදුපියාණන් වහන්සේට අවධානයෙන් යුතු සියුම් පිරික්සුමක් ඉදිරියේ තමන්වහන්සේගේ අදහස් රැක ගැනීමට හැකියාවක් නැති බවට චෝදනා පැන නැඟුණි. එක් විවේචකයෙක් මෙසේ පැවසුවේය: 'බුදුන්වහන්සේ කථා කරන්නේ කාටද? උන්වහන්සේට ප්‍රඥාවේ පැහැදිලි බව ලැබෙන්නේ කාගෙන් ද? හුදෙකලාවේ ජීවත්වීමෙන් උන්වහන්සේගේ ප්‍රඥාව විනාශ වී ඇත. උන්වහන්සේට සාකච්ඡා කිරීම නුහුරුය. උන්වහන්සේ කථාවේ හොඳ නැත. සම්පූර්ණයෙන්ම අවබෝධයක් නැත. කුරංගයෙකු වටේට කැරකෙමින් ඉතා කුලෑටි ලෙස සිටින ආකාරයෙන් බුදුන්වහන්සේ ද එසේමයි' (D.III,38). බොහෝ කාලයක් බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය තමන් වහන්සේටම තබා ගනිමින් සෑහීමට පත්වූ බව පෙනී යයි. නමුත්, මිනිසුන් ඒ පිළිබඳව ගැඹුරෙන් පැහැදිලි කිරීම් සොයන්නට පටන් ගත් පසු, ධර්මය විවේචනයට සහ වැරදියට දක්වන්නට පවා ආරම්භ වූ විට, පොදු වාදවිවාද සහ සාකච්ඡාවලට සහභාගී වීමට උන්වහන්සේගේ අවධානය යොමු විය. ඉතා ඉක්මණින් බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ දර්ශනය පැහැදිලිව තේරුම් කර දීමට සහ විවේචනවලට සාර්ථකව පිළිතුරු දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් කීර්තියක් ලබා ගත්හ. අන් අයගේ ඉගැන්වීම් ද දැඩි සාකච්ඡාවට භාජන කිරීමට ද උන්වහන්සේ ආරම්භ කළහ. විවේචකයන් ව්‍යාකූල කිරීමේ සහ වෙනත් ආගම් අනුගමනය කරන්නන් බුදුදහම වැළඳගන්නට යොමු කිරීමේත් උන්වහන්සේ ඉතා සාර්ථක වූහ. මේ නිසාම උන්වහන්සේ මෙසේ කිරීමට ගුප්ත ක්‍රම භාවිත කරන්නේ යැයි දෝෂාරෝපණයට ද ලක්වූහ. පුද්ගලයෙක් මෙසේ

පැවසුවේය:'අනෙක් අයගේ ශ්‍රාවකයන් බුදුදහමට හැරවීමට මැජික් භාවිත කරන බුදුන්වහන්සේ විජ්ජා කාරයෙකි' (M.I,381). සැබැවින්ම මෙම කියමනේ සත්‍යයක් නැත. බුදුපියාණන් වහන්සේ භාවිත කළ එකම 'විජ්ජාව' සාමාන්‍ය දැනුම, හේතු සහ අත්දැකීමට අවධානය කැඳවීමක් පමණි. බුදුපියාණන් වහන්සේගේ පරමාර්ථය වූයේ කිසිවිටකත්, විරුද්ධවාදියෙකු පරාජය කිරීම, විවේචකයෙකු නිශ්ශබ්ද කිරීම හෝ ශ්‍රාවකයන් 'දිනා ගැනීම' නොවේ. නමුත්, මිනිසුන් අවිද්‍යාවෙන් පැහැදිලි තත්ත්වයකට හෝ අවබෝධයකට ගෙන ඒමට මඟ පෙන්වීමයි. උන්වහන්සේ සිදුකර ඇති, බොහෝ හෘදයංගම අවධානය කැඳවූ දේවල්වලින් මෙය එකකි. ''මම මෙය ඔබට කියමි. බුද්ධිමත්, අවංක, සාධාරණ සහ සෘජු පුද්ගලයෙකු මා වෙතට පැමිණියහොත්, මම ඔහුට ධර්මය කියා දෙමි. ඔහු කියා දුන් ආකාරයට පුහුණු වුවොත්, ඔහුගේම දැනුම සහ ප්‍රායෝගික බුද්ධියෙන් ඔහු පූජනීය ජීවිතයකට එළඹ තමන්ගේ ඉලක්කය ඉෂ්ට කරගන්නවා ඇත. මා මෙසේ කියන්නේ ශ්‍රාවකයන් දිනා ගැනීමට හෝ ඔබ ඔබගේ පවත්නා තත්ත්වයන් අත්හැර වීමටය යැයි දැන් ඔබ සිතන්නට පුළුවනි. නමුත් එය එසේ නොවේ. ඔබගේ ගුරුවරයා තබාගෙන ඔබට ඔබගේ පවත්නා තත්ත්වයන් අනුගමනය කළ හැකිය. මා මෙසේ කියන්නේ එවිට ඔබ ඔබගේ ජීවන රටාව අත්හැර ඔබ නරක යැයි සලකන දේ අනුගමනය කරමින් ඔබ හොඳ යැයි සලකන දේ ප්‍රතික්ෂේප කරනු ඇතැයි ඔබ සිතන්නට පුළුවනි. නමුත් එය එසේ නොවේ. ඔබ යෝග්‍ය යැයි දකින ආකාරයට ජීවත් වන්න. ඔබ නරක යැයි සලකන දේ ප්‍රතික්ෂප කිරීම දිගටම කරගෙන යන්න. ඔබ හොඳයැයි

සලකන දේ අනුගමනය කරන්න. නමුත්, අදක්ෂ, අපිරිසිදු, නැවත ඉපදීමට කැඳවා යන, බිහිසුණු, දැඩි වේදනා ඇති කරන, උත්පත්තියක් සමග බැඳුණු, ජරාපත් වීම සහ මරණය, යන තත්ත්වයන් ඇත. මා ධර්මය උගන්වන්නේ මේ දේවල් මැඩපැවැත්වීම සඳහා පමණි' (සංක්ෂිප්ත කර ඇත, D.III,55-6).

ඉතිහාසය පුරාම, බුදුදහම ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය සඳහා වාදවිවාද වැදගත් කොටසක් ඉටුකර ඇත. කාමලසීල සහ මහායානය අතර ටිබෙටයේ 742දී පැවැත් වූ සමය වාදයෙන් අදහස් වුණේ චීන ධර්මය අර්ථනිරූපනයට වඩා ඉන්දියානුවන් එම රට තුළ බලවත් වීම බවයි. මෑත කාලයේ ඉතාම වැදගත් වාදය තිබුණේ ශ්‍රී ලංකාවේ පානදුරේ 1873දී පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් සහ වෙස්ලියන් මිෂනාරී ඩේවිඩ් ද සිල්වා අතරය. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ තීරණාත්මක ජයග්‍රහණය බෞද්ධයන්ට ගෞරවණීය විශ්වාසයක් ඔවුන් තුළ ඇතිකර ගන්නට සමත් විය. එය ශ්‍රී ලංකාවේ බුදුදහමේ පුනරුදයක ආරම්භය සනිටුහන් කළේය. බලන්න **කාලාම සූත්‍රය**
'Debate. A. Kariyawasam, *Encyclopedia of Buddhism*, Vol. IV, 1984.

## හේතුඵල ධර්මය

හේතුඵල ධර්මය හෝ යම් ස්වභාවයක පවත්නා තත්ත්වයන් හටගැනීම (පටිච්චසමුප්පාද) යනු 1. කිසිවක් 'තමා තුළම ඇති දෙයක්' නොව, නමුත්, නමුත් එහි පැවැත්ම සඳහා වෙනත් දේ මත රඳා පැවතීම' සහ 2. දේවල් පැවැත්මට එන්නේ ස්වභාවික හේතු කාරකයක් නිසා බවත්, අහඹු ලෙස

හෝ උත්තරීතර පුද්ගලයෙකුගේ කැමැත්ත නිසා සිදු නොවන බව යන බෞද්ධ සංකල්පනාවයි.

මෙම සංකල්පවලින් පළමුවැන්නට උදාහරණයක් වශයෙන් - 'අපි මලක්' පිළිබඳව කථා කරමු, නමුත්, එකින් එක අපි නටුව, පෙති, මල් පැණි, පුරුෂ කේශරය, ස්ත්‍රී කේසරය ආදිය ඉවත් කළ විට, මේ එකක් වත් මල නොවේ. 'මල' ඉවත්ව ගොස් ඇති බව අපට පෙනේ. මලේ කොටස්වල සම්පූර්ණ එකතුවට එය පහසු පදයක් වේ. සෑම කොටසක්ම නැවතත් එහි කොටස් වලට ද සම්පූර්ණ එකතුවකි. මෙය නගර, පොත්, පරිගණක, ගල් සහ මිනිසුන් සම්බන්ධයෙන් ද සැබෑය. කෙසේ නමුත්, පටිච්චසමුප්පාද ධර්මය මූලිකවම භාවිත වන්නේ දුක්ඛ සත්‍යය (දුක්ඛ) පැහැදිලි කිරීමටයි - කායික සහ මානසික, පුද්ගල සහ සමාජීය, දුක්විඳීම මැඩපැවැත්වීම බුදුදහමේ ඇති ප්‍රධාන අරමුණයි.

එම නිසා බුදුපියාණන් වහන්සේට අනුව, ස්ථීර නාය්‍යාත්මක ආත්මයක්, පුද්ගලයෙකු හෝ ස්වභාවයක් නැත. මෙය අවබෝධ කරගැනීමෙන් පුද්ගලයෙකු ජීවිතය සඳහා දැඩි සේ ආසා කිරීමෙන් සහ මරණයට ඇති භීතියෙන් නිදහස් වෙයි. එසේම ඒවා සමග බැඳී පවතින සියලු ඍණාත්මක චිත්තවේගයන්ගෙන් සහ ක්‍රියාවන්ගෙන් ද නිදහස් වේ. බුදුපියාණන් වහන්සේ අඩුම තරමින් පටිච්ච සමුප්පාදය පිළිබඳව උදාහරණ තුනක් දී ඇත.

කායික සහ මානසික දුක් විඳීම සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ; 'අවිද්‍යාව මානසික ස්වභාවය නිර්මාණය කරයි, මානසික

ස්වභාවය විඤ්ඤානය නිර්මාණය කරයි, විඤ්ඤානයේ ස්වභාවය නාමරූප සහ රූපය සකස් කරයි. නාමරූප සහ රූප ස්වභාවය සංවේදිතාව නිර්මාණය කරයි, සංවේදිතා ස්වභාවය ස්පර්ශය නිර්මාණය කරයි, ස්පර්ශ ස්වභාවය වේදනාව නිර්මාණය කරයි, වේදනා ස්වභාවය තණ්හාව ඇති කරයි, තණ්හා ස්වභාවය ඇලීම ඇති කරයි, ඇලීමේ ස්වභාවය හටගැනීම ඇති කරයි, හටගැනීමේ ස්වභාවය නැවත ඉපදීම, ලෙඩරෝග, මහළු විය සහ මරණය ඇති කරයි' (D.II,55ff).

සමාජීය සන්දර්භය තුළ වේදනා විඳීම මෙලෙස පැහැදිලි කර ඇත ; ගැටුම් ඇති වන්නේ මනාපයෙන්ය, මනාප ඇති වන්නේ ආශාවන්ගෙන්ය, ආශාවන් ඇති වන්නේ ප්‍රසන්න සහ අප්‍රසන්නතාවලින්ය, ප්‍රසන්න සහ අප්‍රසන්නතා ඇති වන්නේ ස්පර්ශයෙන්ය, ස්පර්ශ ඇති වන්නේ නාමරූප සහ රූපවලිනි (Sn.862-871).

දුක්විඳීම්වලට අවිධිමත් ආරම්භයක් තිබෙන්නාක් මෙන්ම දුක්විඳීම්වලින් නිදහස් වීමටත් එසේමයි. එය බුදුපියාණන් වහන්සේ මෙසේ පැහැදිලි කළහ; 'දුක්විඳීම් පාලනය කරන්නේ ඇදහිල්ලයි, ඇදහිල්ල පාලනය කරන්නේ සතුටයි, සතුට පාලනය කරන්නේ ප්‍රීති ප්‍රමෝදයයි. ප්‍රීති ප්‍රමෝදය පාලනය කරන්නේ සන්සුන් බවයි. සන්සුන් බව පාලනය කරන්නේ මුළාවෙන් මිදීමටයි, මුළාවෙන් මිදීමෙන් නොඇලීම ඇති කරයි, නොඇලීමෙන් නිදහස ඇති වේ, නිදහස ලැබීමෙන් කෙලෙස් විනාශ කිරීමට දැණුම ඇති කරයි' (S.II,30).

බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ‘හේතුඵල දහම හරියටම ගැඹුරු දෙයක් නොවේ. නමුත් එය ගැඹුරු ලෙසම පෙනේ. එය තේරුම් නොගැනීම සහ සොයා දැන නොගැනීම තුළින් මනුෂ්‍යත්වය ගැටගැසුණු නූල් බෝලයක් මෙන්, කුරුල්ලෙකුගේ අවුල් වූ කූඩුවක් මෙන් හෝ තණකොළ වදුලක් මෙන් දුක්විඳීමෙන්, නොසතුටෙන් පිරී, ඉරණමකින් හෝ සංසාරයෙන් ඔබ්බට යා නොහැකිය’(D.II,55). බලන්න **හිස් බව**
*Causality*: *The Central Philosophy of Buddhism*, David Kalupahana, 1975.

## නියතිවාදය

නියතිවාදය (නියතිවාද) යනු පුද්ගලයෙකුගේ ඉරණම ස්ථිර සහ ඔහු හෝ ඇය ඒ අනුව ක්‍රියා කළ යුතු යැයි යන විශ්වාසයයි. නියතිවාද වර්ග දෙකක් තිබෙන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ, 1. දේවවාදී නියතිවාදය (ඉස්සරනිම්මාණහේතු). එයින් කියන්නේ උත්තරීතර දෙවි කෙනෙකු සැම දෙයක්ම දන්නා සහ පාලනය කරන බවත්, සියලු දේ සිදුවීමට ප්‍රථමව ඒවා තීරණය කරන බවත්ය. 2. කර්මයට අනුව තීරණය කිරීම (පුබ්බෙකතහේතු) මෙයින් කියන්නේ පුද්ගලයෙකු අත්විඳින සියලු දේ, ප්‍රසන්න, වේදනාකාරී හෝ මධ්‍යස්ථ, කර්මය හේතුකරගෙන සිදුවන බවයි. ඒ ඔවුන් අතීතයේදී ක්‍රියා කළ ආකාරයටයි.

බුදුපියාණන් වහන්සේට අනුව, මෙම අදහස් දෙකම වැරදි නොවේ. නමුත්, අනර්ථකාරී ද වේ (A.I,173). නියතිවාදයෙන් අදහස් කරන්නේ පුද්ගලයෙකුට එක් ක්‍රියාමාර්ගයකට ඉහළින් තවත් ක්‍රියාමාර්ගයක් තෝරා ගත නොහැකි බවයි. කිසිම දෙයක් වෙනස් කිරීමට

උත්සාහ කළ නොහැකිය. එසේම ඔහු හෝ ඇය කරන කිසිවකට වගකිව යුතු නොවේ යැයි කියයි. එවැනි විශ්වාසයක් වගකීමෙන් තොර බවකට මඟපෙන්වීමක් පමණි. (මට චෝදනා නොකරන්න. එය දෙවියන් වහන්සේගේ කැමැත්තයි.) හෝ අලස කමයි. (මම කුමක් කරම් ද? ඒ මගේ අතීත කර්මයයි.)

දේව වාද නියතිවාදය සම්බන්ධයෙන් බුද්ධචරිතයේ මෙසේ සඳහන් වේ: 'සිදුවන හැම දෙයටම හේතුව දෙවියන් වහන්සේ නම්, එවිට, මිනිසුන්ගේ උත්සාහයන්ගේ ඵලය කුමක් ද?' බලන්න **නිදහස් කැමැත්ත**

## දේවදත්ත

දේවදත්ත බුදුපියාණන් වහන්සේගේ ඥාති සහෝදරයාය (බුදුපියාණන් වහන්සේගේ පියා වූ සුද්ධෝදනගේ සහෝදරයාවූ සුප්පබුද්ධගේ පුත්‍රයාය.) ඔහුගේ නමේ අදහස වන්නේ 'දෙවියන් විසින්-දෙන ලද' යන්නයි. බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය ලැබූ පසු පළමුවරට කපිලවත්ථුවට වැඩි විට, දේවදත්ත ඇතුළු බොහෝ තරුණ සාකාය්‍යන් භික්ෂූන් වීමට තීරණය කර ඇත. (Vin.II,182) යම් වසර කාලයක්, දේවදත්ත උදේශ්‍ගීමත් භික්ෂුවක බවට ඔප්පු වී ඇත. ත්‍රිපිටකයේ බොහෝ ස්ථානවල ඔහු ඇගයීමට ලක් කර ඇත. (A.IV,402 ff; Vin.II,189).

බුදුපියාණන් වහන්සේ තවත් බොහෝ භික්ෂූන් සමග දේවදත්ත ද ආදර්ශවත් භික්ෂූන් ලෙස නම් කළහ. (Ud.3-4) නමුත්, එම අදහස වෙනස් විය. බුදුපියාණන්

වහන්සේ දේවදත්ත පිළිබඳව මෙසේ පැවසූහ: 'කලින් දේවදත්තගේ ස්වභාවය එක් ආකාරයකි. දැන් එය සහමුලින්ම වෙනත් එකකි.'(Vin.II,189) දේවදත්ත උදෙයි්ගීමත් ලෙස භාවනා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඔහු ඍද්ධි බල පෙන්වන්ට ආරම්භ කළ පසු, ඔහු ක්‍රමයෙන් අහංකාර විය. පසුව, බුදුපියාණන් වහන්සේ පාරම්පරික ශ්‍රමණ පිළිවෙත්වලින් බොහෝ දුරට ඉබාගාතේ යන්නා සේ ඔහුට දැනෙන්ට විය. ඔහුට තවත් භික්ෂූන් පිරිසක් ඔහු සමග එකඟ කරගන්නට හැකි විය. මේ පිළිබඳව බුදුපියාණන් වහන්සේට විරෝධය පාමින්, ඔහු සියලු භික්ෂූන්ට බොහෝ පුහුණුවීම් අනිවාර්ය කරන ලෙස බුදුපියාණන් වහන්සේට බල කළේය, 1. වනයේ පමණක් ජීවත් වන්නට, 2. කිසිම විටක දානයකට ආරාධනයක් නොපිළිගැනීම, පිණ්ඩපාතයෙන් පමණක් යැපීම, 3. වැරහැලි සිවුරුවලින් පමණක් සැරසීම, 4. විහාරවල නොව, එළිමහණේ ජීවත්වීම සහ 5. නිර්මාංශ වීම, යනාදියයි.

දේවදත්තගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප විය. ඔහු සහ ඔහුගේ සහායකයෝ බුදුපියාණන් වහන්සේගෙන් සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් වෙන්වූහ. බුදුපියාණන් වහන්සේගේ වසර 45ක පැවිදි ජීවිත කාලය තුළදී උන්වහන්සේ මුහුණ දුන් විශාලතම උග්‍ර අවස්ථාව මෙයයි. අවස්ථා දෙකකදී දේවදත්ත බුදුපියාණන් වහන්සේ ඝාතනය කිරීමට උත්සාහ කළ බව ද විනය පිටකයේ සඳහන් වේ. නමුත් මෙය සත්‍යද යන්න නිශ්චිත නොවේ. එය හුදෙක් ඔහු හැකිතාක් දුරට නරක පුද්ගලයෙකු ලෙස පෙන්වන්නට පසුව සිදු කළ උත්සාහයක් ද යන්න නිශ්චිත නැත.(Vin.II,190-94) ත්‍රිපිටකයේ ඊට වඩා වැඩි

විස්තරයක් දේවදත්ත පිළිබඳව සඳහන් වී නැත. නමුත්, අවසානයේදී ඔහුගේ හවුල්කරුවන් ඔහු අතහැර නැවතත් බුදුපියාණන් වහන්සේ වෙත පැමිණි බව පරම්පරාවෙන් එන මතවලින් කියැවේ. පසුව දේවදත්ත අපකීර්තියට ලක් වී සහ හුදෙකලාව මිය ගිය බව සඳහන් වේ.

## භූතයා

දේවවාදී ආගම්වල යක්ෂයා, සමහර විට බීල්ස්බුබ්, ඉබ්ලිස්, සාතන් හෝ ලුසිෆර් ලෙසද හැඳින් වේ. එය දෙවියන් වහන්සේට සහ සත්පුරුෂ බවට සම්පූර්ණයෙන්ම විරුද්ධ පුද්ගල ස්වභාවයකි. මාර නමැති යම් පුද්ගල ස්වභාවයක් බොහෝ අවස්ථාවල බුදුපියාණන් වහන්සේ වෙත ප්‍රවේශ වූ බව ත්‍රිපිටකයේ සඳහන්ය. බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වය ලබාගැනීමට සිදු කළ උත්සාහයන් අධෛර්යමත් කිරීමට, උන්වහන්සේට අපවත්වීමට දිරිගැන්වීමට පොළඹවන්නටත් මාර උත්සාහ දරා ඇත (Sn.426; D.II,104). මාර සැබැවින්ම පුද්ගලයෙකු යැයි බොහෝ බෞද්ධයෝ විශ්වාස කරති. තවත් සමහරු මාර සැබැවින්ම උපහැරණයක් හෝ ඍණාත්මක මානසික තත්ත්වයන්වල පුද්ගලාරෝපණයක් යැයි වාද කරති. පළමු වැන්නට වඩා දෙවැනි අදහසට බොහෝ සාක්ෂි තිබෙන බව පෙනී යයි. මාර නමැති පාලි වචනයෙහි අදහස් වූ 'මරණය' හෝ 'මරණය ගෙන ඒම' සහ මාරගේ පැවත එන්නන් තණ්හා (තණ්හා), නොසතුට (අරතී) සහ ආශාව (රගා, S.I,124) යනුවෙන් නම් කිරීමෙන් මෙය ප්‍රත්‍යක්ෂ වේ. තවදුරටත්, බුදුපියාණන් වහන්සේ තමාට පහර දීමට

මාර භාවිත කළ හමුදාව විස්තර කරන්නේ ඉන්ද්‍රියමය ආශාවන්, අකැමැත්ත, කුසගින්න සහ පිපාසය, තණ්හාව, නිදිමත සහ අලසකම, බිය, නොසන්සුන්කම, වාසි, ගෞරවය සහ කීර්තිය, නුසුදුසු කීර්තිය සහ තමන් උසස් කොට සහ අන් අය පහත් කොට සැලකීම යනාදි වශයෙනි (Sn.436-8).

මෙම දෙවන අර්ථනිරූපණයට තවදුරටත් ආධාර කරන්නේ මිනිස් මනසට පිටස්තර බලවේගයක උපායන්වලට වඩා, අවිද්‍යාවෙන් පෙළුණු සිතුවිලි, කථාව සහ ක්‍රියාව පාපිෂ්ට ලෙස බුදුදහම දැකීම යන කරුණයි. ඇතැම් විට මාර, මිනිසුන්ගේ ප්‍රඥාව, ගුණධර්ම, නිර්වාණය ලබා ගැනීමට ඇති කැමැත්ත යනාදී දේ නැවැත්වීමට උත්සාහ දරයි. එම නිසා, මාර අවසානය-සාදන්නා (අන්තක) S.I,72, දුෂ්ට කෙනෙක් (කණ්හ) M.I,377 හෝ බැඳුම් පටිය (නමුචි) D.II,259 ලෙසින්ද හඳුන්වනු ලබයි.
*Buddhism and the Mythology of Evil*, Trevor Ling, 1965.

## ධම්ම

ධම්ම, (සංස්කෘත ධර්ම) යන වචනයට විවිධ අර්ථ ඇත. සාමාන්‍යයෙන් එය භාවිත කරන්නේ බුදුපියාණන් වහන්සේගේ සම්පූර්ණ ඉගැන්වීම්වල ලියවිලි එකතුව හැඳින්වීමටයි. මේ අදහසින් ධර්මය තුන් සරණෙන් දෙවැන්නයි. එම වචනය ද භාවිත කරන්නේ 'සත්‍යය', 'සැබැවින්ම' හෝ 'දේවල් සිදුවන ආකාරය' යන අදහසිනි. අභිධම්ම, සහ ධම්මානුපස්සනා යන වචනවලින් අදහස් වන්නේ 'දේවල්' හෝ 'ද්‍රව්‍ය', විශේෂයෙන්ම මානසික අරමුණු, ඒ සිතුවිලි, මනෝමය ප්‍රවණතා, ගතිලක්ෂණ සහ

චිත්තවේගයි. ධර්මයට තවත් පොදු අදහසක් නම් 'ධර්මිෂ්ඨකම' හෝ 'ධාර්මිකතාව' යි. ඒ අනුව, බෞද්ධ සම්ප්‍රදායේ, යහපත් හෝ ධාර්මික රජ කෙනෙකු ධම්මරාජා වශයෙන් හැඳින් විණ.

බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව ධර්මය යන අදහස විස්තර කරන්නේ 'මෙතැන සහ දැන් පෙනෙන, සදාකාලික, විමසා බැලීමට ආරාධනය කරන, ඉදිරියටම මඟ පෙන්වන, එකින් එක තමාටම' ප්‍රඥාවන්තයන් විසින් අවබෝධ කළ යුතුය, යන්නයි (M.I,37). බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේගේ ධර්මය විස්තර කළේ 'ආරම්භය අතිශය අලංකාර, මැද අතිශය අලංකාර සහ අවසානය අතිශය අලංකාර' ලෙසයි (Vin.I,20). උන්වහන්සේ 'ධර්ම දානය අනෙක් සියලු දානවලට වඩා උත්කෘෂ්ට වේ' (Dhp.354) යැයි ද පැවසූහ. ජාතක කතාවට අනුව, ධර්මය 'එය පුහුණු කරන්නා විශාල කුඩයක් වැස්සෙන් ආරක්ෂා කරන්නාක් මෙන් ආරක්ෂා කරයි.'(Ja.IV,55) බුදුපියාණන් වහන්සේගෙන් යම් ශතවර්ෂ ගණනාවකට පසු, අශෝක රජු ධර්මයේ සදාචාරමය පරිමාණය ඉතා අලංකාර ලෙස විග්‍රහ කළේ 'නපුර ස්වල්පයක්, බොහෝ යහපත, කරුණාව, පරිත්‍යාගශීලීබව, යථාරූපීබව සහ පවිත්‍රතාව' වශයෙනි.

## ධම්මපදය

ධම්මපදය බුද්දක නිකායේ කුඩාම ග්‍රන්ථවලින් එකකි, බුදුදහමේ පූජනීය ධර්ම ග්‍රන්ථවන ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයේ පස්වන කොටසයි. ධම්මපදය යන නමේ අර්ථය 'ධර්මයේ වචනයි'. මෙහි පැදි 423ක් පරිච්ඡේද

26ක සකස් කර ඇත. චාම්බව, දුෂ්ටබව, අවංක බව, මරණය, සතුට, භික්ෂුවකගේ ජීවිතය, ගුණ යහපත්කම සහ විමුක්තිය වැනි විෂයයන් පරාසයක් සමග කවි පිළිබඳව සාකච්ඡා කරයි. පහසුවෙන් සමීප විය හැකි ප්‍රමාණය සහ බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳව එය සාකච්ඡා කරන ප්‍රබෝධමත් ආකාරය නිසා, සියලු බෞද්ධ ග්‍රන්ථ අතරින් වඩාත් පුළුල් ලෙස කියැවූ සහ ආදරය කළ ග්‍රන්ථය ධම්මපදයයි. එසේම එය ලෝකයේ ප්‍රධාන භාෂා වැඩි ප්‍රමාණයකට පරිවර්තනය කර ඇත.
*The Dhammapada*, trans. by Narada Thera, 1963.

## ධර්ම

ධර්ම යනු ධම්ම නැමැති පාලි වචනයේ සංස්කෘත ආකෘතියයි.

## බුදුපියාණන් වහන්සේගේ ආහාර

පොදුවේ පිළිගත්, එහෙත් ජනප්‍රවාදය සහ සාවද්‍ය මත රාශියක් පිටුපස සමහර විට බුදුපියාණන් වහන්සේගේ මහකරුණාව අප්‍රකට වේ. ඇත්ත වශයෙන්ම අතීතයේ සිටි ඕනෑම ශ්‍රේෂ්ඨ ආගමික ගුරුවරයෙකු ගැන දන්නා දෙයකට වඩා බොහෝ තාත්වික තොරතුරු පෙර කී ලෙස උන්වහන්සේ පිළිබඳව ත්‍රිපිටකයේ තිබියදී මෙසේ සිදුවීම පුදුමයට කරුණකි. උන්වහන්සේගේ ශාරීරික පෙනුම, ඉගැන්වීමේ ආකාරය, අන් අය කෙරෙහි උන්වහන්සේට තිබූ බලපෑම සහ උන්වහන්සේගේ පුරුදු සහ චර්යා ක්‍රමය පිළිබඳ සවිස්තරාත්මක සහ සාධාරණ ලෙස ඒත්තු ගත හැකි සේ පෙනෙන චිත්‍රයක් ඇත. එය උන්වහන්සේ වැළඳූ ආහාර ගැන

පවා යම් දෙයක් අපට කියයි. කෙසේ නමුත්, බුදුපියාණන් වහන්සේ ඔබ මොබ යන භික්ෂුවක වීමට අභිනිෂ්ක්‍රමණය කරන තුරු උන්වහන්සේගේ ජීවිතයේ ඕනෑම කරුණක් පිළිබඳව විශ්වාස කටයුතු තොරතුරු ලබා ගත හැක්කේ ඉතා ස්වල්පයක්ය. නමුත්, විශේෂ වරප්‍රසාද සහිත පසුබිමකින් පැවත ආ තරුණයෙකු ලෙස, ඒ කාලය වනතුරු ඉතා හොඳ ආහාර ලබන්නට ඇත. තමන්වහන්සේගේ තරුණ කාලයේදී තමන්වහන්සේගේ නිවසේ සේවකයන් පවා හොඳම වර්ගයේ බත් සහ මස් (සාලිමංස, A.I,148) ආහාරයට ගත් බව වරක් උන්වහන්සේ මතයක් වශයෙන් කියා සිටියහ. එම නිසා සාධාරණ ලෙස අනුමාන කරන පරිදි, උන්වහන්සේ ද එසේම විය යුතුයි. විවිධ ගුරුවරුන්ගේ අනුගාමිකයෙකු වශයෙන් අධ්‍යයනය කිරීමෙන් පසු, උන්වහන්සේ සීමාන්තික ස්වයං-අත්තකිලමථය පුහුණු කිරීමේ පටිපාටියක් ඇරඹූහ. මෙම පුහුණුවේ අංගයක් ලෙස උන්වහන්සේ ආහාරවල ඉවත ලන සහ අපතේ යන දේ ආහාරයට ගත්හ. මේවා අතරට, තම්බන ලද බත්වල පෙණ, තල ඇටවලින් තෙල් මිරිකා ගැනීමෙන් පසු ඉතිරි වන ඝන ද්‍රව්‍ය, තණ කොළ සහ ගොම පවා ඇතුළත් වේ. එක් අතකින්, අන්තයේ බාහිර කෙළවරට යමින්, උන්වහන්සේ තමන් වහන්සේගේම අසූචි හා මූත්‍ර වැළඳූහ. කෙසේ නමුත්, සමහර අවස්ථාවල උන්වහන්සේ දද්දුල නමැති සහල් වර්ග වැනි වඩා ගුණදායක ආහාර සහ උද්භිද විද්‍යාඥයන් ද නොදන්නා කැලෑ හාල් *Oryza rufipogon* (M.I,78-9) ද වැළඳූහ.

එවැනි ස්වයං-අත්තකිලමථයේ ඇති නිෂ්ඵලත්වය

දකිමින් වෙනත් ප්‍රවේශයක් ලබා ගැනීමට උත්සාහ කිරීමට බුදුපියාණන් වහන්සේ තීරණය කළ බව උන්වහන්සේ මහාසීහනාද සූත්‍රයේ සඳහන් කළහ. නමුත් පළමුව තමන්වහන්සේගේ ශක්තිය ආපසු ලබා ගැනීම උන්වහන්සේ සිදුකළ යුතුව තිබුණි. ඒ නිසා උන්වහන්සේ තම්බන ලද හාල් සහ කුම්මාස (M.I,247) වළඳමින් එය ආරම්භ කළහ. අද කාලයේ මෙන්, එකල ද හාල් ලුණු ස්වල්පයක් එකතු කරමින් තම්බා ගන්නා ලදී. කුම්මාස පිළියෙළ කරන ලද්දේ විවිධ ධාන්‍ය වර්ග සහ ඇටවර්ග තම්බා ගැනීමෙනි. නමුත්, විශේෂයෙන්ම, ලියන් බෝංචි (මියුකියුන නිවෙ) කළු කඩල (විග්න මුන්ගො) මිශ්‍රණය ඝන වන තුරු තම්බා ඊට පසු එය කැටියක් බවට පත් කර ගනී. කුම්මාස බාල ආහාරයක් වශයෙන් සැලකුව ද, එය සැබැවින්ම කුස පුරවන සහ පෝෂ්‍යදායක ආහාරයක් ද වන්නට ඇත. බුද්ධත්වයට පැමිණීමෙන් පසු, එතැනින් ගමන් කළ වෙළෙඳුන් දෙදෙනෙක් බුදුපියාණන් වහන්සේ දැක ඇත. ඔවුන් උන්වහන්සේට බාර්ලි ධාන්‍ය පිටිවලින් පිළියෙළ කරන ලද කැඳ සහ මී පැණි බෝල (මන්ථං ච මධුපිණ්ඩික Vin.I,4), පූජා කර ඇත. මෙයත්, පෝෂ්‍යදායක සහ තෘප්ත කරන ආහාරයක් වන්නට ඇත. එතැන් සිට, උන්වහන්සේ ජීවිතයේ අවසානය වන තුරුම ප්‍රණීත සහ සුඛෝපභෝගී හෝ සරල සහ නොවැදගත් යන ඕනෑම උන්වහන්සේට පිළිගන්වන ලද ආහාරයක් වැළඳූහ. බත් කැඳ (යාගු) උන්වහන්සේ සාමාන්‍යයෙන් නිතර වැළඳූ ආහාරයකි. සමහර විට එය පිළියෙළ කරන්නට ඇත්තේ හාල් සහ ජලය ඝන පදමකට තම්බා ගෙන, එයට ලුණු, සුදු ලූනු බිකක් සහ ගම්මිරිස් ස්වල්පයක් එකතු කර

ගැනීමෙනි. මෙම කැඳවලින් ප්‍රයෝජන පහක් තිබෙන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ ; ''එය කුසගින්න නැති කරයි, පිපාසය සංසිඳුවයි, වාතය පාලනය කරයි, බඩවැල් පිරිසිදු කරයි, ආහාරවල ඉතිරිවූ ශේෂ දිරවීමට උපකාර වේ'' (A.III,250).

අනෙක් වේලාවට උන්වහන්සේ කලු ඇට ඉවත් කළ හාල් වැනි වඩා ප්‍රණීත අවුළුපත් (විචිතකාළකහත්ත) තෝරා ගත් රසමුසු සහ වැංජන සමග වැළඳූහ. (M.II,7-8) තවත් අවස්ථාවක උන්වහන්සේට ඌරු මස් (සූකරමංස) සමග ජුජුබෙ පළතුරු (සිස්ෆුස් ජුජුබෙ) A.III,49) පිළිගැන්වූ වූ බව අපට දැනගන්නට ඇත. වරක් උන්වහන්සේට ජුජුබෙ සහ තල තෙල්, සහ ගම්මිරිස්, සුදු ලූනු සහ ලාමජ්ජක මිශ්‍ර කර පිසින ලද බත් කැඳ පිළිගන්වා ඇත (Vv.43,6). ජම්බු, අඹ, අරළු, නෙල්ලි වැනි පලතුරු උන්වහන්සේ සමහර විට වැළඳූ බව විනය පිටකයේ සඳහන් වේ (Vin.I,30). අවසානයට සඳහන් කළ මෙම පලතුරු වර්ග දෙකේ රසය සැර වන නමුත්, විටමින් ඒ, සී සහ යකඩ බහුල වේ. බුදුපියාණන් වහන්සේගේ අවසාන ආහාරය සූකරමද්දව නමැති කෑම වර්ගයකි. නමුත්, අවාසනාවට, මෙහි අඩංගු වන්නේ කුමක් ද කිය අප දන්නේ නැත (D.II,127).

'ශරීරයේ පැවැත්ම තිබෙන්නේ ආහාර නිසා බව සහ ආහාර මත යැපෙන බව' වරක් බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.II,145). මෙය බුද්ධත්වයට පත් උන්වහන්සේ සහ අනෙක් සැම දෙනාටමත් සත්‍යය වූ දෙයකි. බලන්න **නිර්මාංශ වීම**

## ආහාර පාලනය

ආහාර පාලනය යනු වෛද්‍යමය හේතු හෝ ශරීරයේ බර පාලනය සඳහා ආහාර ප්‍රමාණය සහ වර්ග පරිභෝජනය සීමා කිරීමයි. පොහොසත් සමාජවල, ස්ථූලතාව විශාල සෞඛ්‍යමය ප්‍රශ්නයක් වී තිබේ. බර අඩු කිරීමේ කර්මාන්තය බහු-බිලියන එකක් බවට පත් වී ඇත. ස්ථූලතාව සඳහා ප්‍රතිකාර අතරට ආහාර රුචිය මර්දක, මනෝචිකිත්සාව, ආහාර පාලන උපදේශන සහ ශල්‍යකර්ම ක්‍රියා මාර්ග ද ඇතුළත් වේ. නමුත් ඉතාමත් සාර්ථක ප්‍රතිකාර රැඳී පවතින්නේ සරල සහ ලාභ ඒවා වශයෙනි - ව්‍යායාම සහ ආහාර පාලන පුරුදු වෙනස් කිරීමෙනි. ඒ අනුව කැලරි ඇතුළත් කර ගැනීම විශේෂයෙන්ම අඩු වේ. කෙසේ වෙතත්, බොහෝ අයට මෙම ප්‍රතිකාර යොදා ගැනීමේ දුෂ්කරතා ඇත.

වරක් පසේනදී රජතුමා බුදුපියාණන් වහන්සේ හමුවීමට ගියේ තවත් විශාල ආහාර වේලක් ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් පිම්බෙමින් සහ පීඩාවෙන් හුස්ම ගනිමින්ය. මෙය දුටු බුදුපියාණන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළහ: 'පුද්ගලයෙකු සිහිකල්පනාවෙන් සිටිමින්, ඒ නිසාම ආහාර ගැනීමේ මැදහත් බව දන්නේ ද, ඔහුගේ අසනීප අඩු වෙයි, ඔහු වියපත් වන්නේ ක්‍රමිකවය. ඔහු ඔහුගේ ජීවිතය ආරක්ෂා කර ගනියි.' රජුට ඉඟිය දැනුණි. තමන් වැඩිපුර ආහාර ගන්නා හැම විටම මෙම වචන නැවත නැවත කියන ලෙස තම ඥාති පුත්‍රයාගෙන් ඉල්ලා සිටියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, රජු ක්‍රමයෙන් ආහාර ගැනීම අඩු කළේය, බර අඩුවිය, ඔහුගේ සිහින් හැඩය නැවත ලබා ගත්තේය (S.I,81-2).

පොහොසත් සමාජවල, කුසගින්න සැහැල්ලු කිරීමට ආහාර ගන්නේ ස්වල්ප දෙනෙකි. ඔව්හු බොහෝ ආහාර ප්‍රමාණයක් සහ සැබැවින්ම කුසගින්නක් ඉතා හොඳින් නැති විට පවා නිතර ආහාර ගනිති. ආහාර බහුල ලෙස සහ පහසුවෙන් ලබා ගත හැකිය. ඒ නිසා අපි හදිසි ආසාවෙන්, විඩාවෙන්, ප්‍රචාරණවලට ප්‍රතිචාර දක්වමින්, විනෝදයට, අලුත් හෝ අසාමාන්‍ය රසයන් යැයි සිතූ පරිදි හෝ හුදෙක් සමහර ප්‍රචාරක දැන්වීම් ඉදිරිපත් කරන ආකාරයට 'රස අංකුර පෙළඹවීමට' ආහාර ගන්නෙමු. ආහාර සැබැවින්ම පරිභෝජනය කරන විට, අපි බොහෝ විට ව්‍යාකූලව සිටින්නෙමු, ආහාර ගන්නේ යාන්ත්‍රිකවය, අප කරන්නේ කුමක් ද යන්න අවධානය යොමු කරන්නේ කලාතුරකින්ය. එහි ප්‍රතිඵලයක් ලෙස, අප ආහාර නොගන්නා විට අපගේ බර ගැන බොහෝ දෙනෙක් කනස්සල්ලට පත් වන අතර, සැබැවින්ම ආහාර ගන්නා විට එසේ අවධානය යොමු වන්නේ කලාතුරකිනි. මෙම කාරණය බර වැඩිවීමට හෝ තරබාරු වීමට හේතු වේ.

සිහිකල්පනාවෙන් ආහාර ගැනීමට (සති) පසේනදී රජතුමාට බුදුපියාණන් වහන්සේ දුන් අවවාදයේ වටිනාකම පෝෂණවේදීන් සහ බර-අඩු කිරීමේ විශේෂඥයන් හඳුනාගැනීම ආරම්භ කරගත්තා පමණි. සිහිකල්පනාවෙන් ආහාර ගැනීම ඇබ්බැහි වීමේ චර්යාව සිහිකල්පනාවෙන් යුක්ත එකකට හරවා ගැනීමට උපකාර වේ. මෙහිදී ඉතා හොඳ දේ තෝරා ගැනීමේ හැකියාව වැඩි කරයි. එය අපට මොහොතකට නතර වන්නට, සිතන්නට, අප

කරන්නට යන්නේ කුමක් ද කියා ආසන්නව දැන ගැනීමට, සහ එයට හේතුව යනාදියට ඉඩ හරියි. බොහෝ විට හැසිරීමේ වෙනසක් ගෙන එන්නට මෙය ප්‍රමාණවත් වේ. සිහිකල්පනාවෙන් ආහාර ගැනීමෙන් කෑමට ආශාව ඇතිවන විට එය දැනගැනීමට අපට ඉඩ සලස්වයි. ඊට පසු එම ආශාවට යටත් වීමට වඩා, ඒ දෙස නොඇලීමෙන් බලා සිටින්න. හුස්ම පිළිබඳව සිහියෙන් බලා සිටින්නට නිතිපතා පුහුණු වීමෙන් ආහාර ගැනීමට පෙර සහ ආහාර ගන්නා විට සිහියෙන් සිටීමට අපට මතක්වීමට බොහෝ ඉඩ කඩ ඇත. 'ආහාර ගැනීමේ භාවනාව' යනුවෙන් හැඳින්විය හැකි දේ ඉඳහිට පුහුණු කිරීම උපකාර විය හැකි තවත් දෙයකි. ඒ තනිවම හා කඩිමුඩියක් නැතිව ආහාර ගැනීම, අප කරන දේ පිළිබඳව සම්පූර්ණ අවධානය යොමු කිරීම, එක් එක් කටක් පිළිබඳවම සිහියෙන්, එය සම්පූර්ණයෙන්ම සපමින්, සහ ඊළඟ කට ගැනීමට පෙර සම්පූර්ණයෙන්ම ගිලිමින් යනාදියයි. නිතිපතා ව්‍යායාම සහ සමතුලිත ආහාර වේලකින් සප්පායම් වූ විට, සෞඛ්‍යමත් ශාරීරික බරක් පවත්වා ගැනීමට සිහිකල්පනාවෙන් ආහාර ගැනීම ස්වභාවික, ක්‍රමික සහ සාර්ථක ක්‍රමයකි.

බුදුපියාණන් වහන්සේ ඍණාත්මක පණිවුඩයක් දෙනවා වෙනුවට, ධනාත්මක ලෙස පසේනදී රජතුමා පෙළඹවීමට තෝරා ගැනීම වැදගත් දෙයකි. තරබාරුකමෙන් ඇතිවන ප්‍රශ්නවල විස්තරයක් සපයමින් ඔහු පිනවීම වෙනුවට, බුදුපියාණන් වහන්සේ බර අඩුවීමෙන් ඇතිවන වාසිවන, ශාරීරික රෝග අඩුවීම (තනු තස්ස භාවන්ති චේදනා), වියපත්

වීමේ ක්‍රියාවලිය ක්‍රමික වීම (සණිකං ජීරාති) සහ ජීවිතයේ සාමාන්‍ය දියුණු වීමක් (ආයු පාලයං) යනාදි නූතන වෛද්‍ය විද්‍යාවෙන් තහවුරු කරන ලද සෞඛ්‍යමත් බරක් සහ ආහාර පද්ධතියකින් ඇතිවන සියලු වාසි බුදුපියාණන් වහන්සේ ඇතුළත් කළහ. මිනිසුන් පෙළඹවීමේදී ධනාත්මක වෙරගැන්වුම බොහෝ විට වඩාත් සාර්ථක බව බුදුපියාණන් වහන්සේ දැන සිටියහ. බලන්න **නිරාහාරවීම**

## දීඝනිකාය

දීඝනිකාය යනු බුදුදහමේ පූජනීය ග්‍රන්ථවන ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයේ පළමු ග්‍රන්ථයයි. දීඝ යනුවෙන් අදහස් වන්නේ 'දීර්ඝ' සහ නිකාය යන්නෙන් අදහස් කරන්නේ 'පොත' හෝ 'එකතුව' යන්නයි. මෙම නම භාවිත කරන්නේ මෙම ග්‍රන්ථයේ ඇතුළත් දේශනා හෝ සූත්‍ර 34 දීර්ඝ නිසාය. වඩාත් දීර්ඝම එක ඉංග්‍රීසි පරිවර්තනයේ පිටු 46ක් ඇත. දීඝ නිකායේ අඩංගු දේශනාවලින් භාගයකට කිට්ටුව බුදුපියාණන් වහන්සේ සහ වෙනත් අයගේ වාද-විවාද හෝ සාකච්ඡා ආකාරයෙන් ඉදිරිපත් වේ. මෙම වාද-විවාදවලින් සමහරක් ඉතා උද්‍යෝගීමත් ඒවා වන අතර, ඒවා බුදුපියාණන් වහන්සේගේ මතයට මිනිසුන් පෙළඹවීමට උන්වහන්සේ තර්ක, තර්ක න්‍යාය, හේතු සහ මෘදු ඒත්තු ගැන්වීම භාවිත කළ ආකාරය පිළිබඳව මනබඳින දැකීම් මාත්‍රයක් ලබා දෙයි. ත්‍රිපිටකයේ වෙනත් බොහෝ කාණ්ඩවලට මෙන්ම දීඝ නිකායේ සඳහන් දේශනා ද යම් විශේෂ ආකාරයකට වර්ගකර නැති බවක් පෙනේ.

*The Long Discourses of the Buddha*, trans. by M.Walshe, 1987.

## දිශාවන්

දිශාවක් යනු (දිසා) පුද්ගලයෙකු හෝ දෙයක් චලනය වන හෝ යොමු කරවන හෝ සේන්දු වන සාමාන්‍ය ස්ථානයයි. පැරණි ඉන්දියානුවෝ ප්‍රධාන දිශා (D.III,180) හයක් හඳුනා ගත්හ. ඉර නැඟෙන දිසාව වූ නැගෙනහිරෙන් (පුරත්ථිමාදිසා) ආරම්භ කරමින්, ඒවා දක්ෂිණාවර්තව අනුපිළිවෙලට ගණන් කළ අතර, දකුණ (දක්ඛිණාදිසා), බටහිර (පච්ඡිමාදිසා), උතුර (උත්තරදිසා), නිරීක්ෂකයාගේ හිසට විරුද්ධ දිශාවෙහි අග (හෙට්ඨිමාදිසා) සහ මුදුන (උපරිමාදිසා) ආදි වශයෙනි. එසේම ඔවුහු අන්තර් මාධ්‍ය දිශාවන් (අනුදිසා), ඒ දකුණු බටහිර, උතුරු බටහිර ආදි වශයෙන් හඳුනා ගත්හ. එක් එක් මාලිමා තුඩු හතරම සත්වයකුගෙන් සම්බන්ධ විය. නැගෙනහිරට ඇතෙකු දක්ෂිණාවර්තව වෙන වෙනම පිළිවෙළින් ගවයෙකු, අශ්වයෙකු සහ සිංහයෙකු ආදී වශයෙනි. එකින් එක එක් විශේෂ දෙවි කෙනෙකු, ධතරට්ඨ, විරූළ්හ, විරූපක්ඛ සහ කුවේර විසින් පාලනය කරන බවට විශ්වාස කරනු ලබයි (D.III,259).

දකුණ අඩුවෙන්ම වාසනාවන්ත දිශාව ලෙස සලකනු ලැබුණි. එසේම සුසානභූමිය, මළමිනී ගොඩගසා ඇති භූමිය සහ මරණ දඬුවම ක්‍රියාත්මක කරන ස්ථානය සැමවිටම පිහිටා ඇත්තේ ඕනෑම නගරයක දකුණු ගේට්ටුවේ පිටතය (D.II,160; 321). හැකි සෑම තැනකදීම බුදුපියාණන් වහන්සේ නැගෙනහිර දෙසට මුහුණ ලා හෝ නැගෙනහිර දෙසට හිස තබාගෙන

වැතිර සිටියද, උන්වහන්සේ එසේ කිරීමට හේතුව කොතැනකවත් දක්වා නැත (D.II,85). මෙයට අමතරව, දිශාවල වැදගත් කමක් උන්වහන්සේට නොතිබුණි.

නමුත්, බුදුදහම ප්‍රහුණු කිරීමේ දී දිශාවල සබඳතාවක් තිබූ එක් කරුණක් ඇත. අප හුදෙක් ආදරය අපගේ හදවතේ පෝෂණය නොකළ යුතු බවත්, ඒ වෙනුවට එය සෑම තැනකටම පැතිරවිය යුතු සහ ව්‍යාප්ත කළ යුතු බවත් උන්වහන්සේ පැවසූහ. 'එක් දිශාවකට, ඊට පසු දෙවන සහ තුන්වන සහ හතරවන, උඩට, පහළට, හැම අතින්ම, සෑම තැනකටම, තමාට මෙන් අනෙක් අයටත් පැතිර විය යුතු' බව සඳහන් කළහ. 'කෝපයෙන් සහ වෛරයෙන් නිදහස් වූ බහුල සහ උසස් බවට පත් වූ ආදරයකින් පිරවූ මනසකින් විශාල පුළුල් ලෝකයට පතුරුවමින් කෙනෙකු ජීවත්විය යුතුයි' (M.I,38).

මේ ලස්සන සහ සසල කරවන වචන ප්‍රායෝගික සහ අධ්‍යාත්ම විද්‍යාමය ආකාරයෙන් යන දෙආකාරයෙන්ම අවබෝධකර ගත හැකිය. උතුර, දකුණ, නැගෙනහිර සහ බටහිර යනු අපගේ සමීපතම පේනතෙක්මානයයි, සහ ඒ තුළ වාසය කරන අයයි. නමුත්, එය ආර්ථිකමය 'උතුර' සහ 'දකුණ', වශයෙන් ද සඳහන් කළ හැකිය. ඒ පොහොසත් දියුණු රටවල සහ දුප්පත් නොදියුණු රටවල, එසේම මැද පෙරදිග, ඈත නැගෙනහිර ආදී වශයෙන් ජීවත් වන අයයි. උඩ දිශාවන්ට පැතිරවීමෙන් අදහස් කරන්නේ අපට වඩා ඉහළ ස්ථානවල සිටින අය, උදාහරණ වශයෙන් අපගේ සේව්‍යයා, අපට වඩා බලයෙන් සහ පොහොසත් බවින් ඉහළ අය අදහස් කරමින්ය.

ආදරය පහළ දිසාවට පැතිරවීමෙන් අදහස් කරන්නේ අප බොහෝ විට මඟහරින හෝ නොදකින නිහතමානී පුද්ගලයන් පවා, අපට වඩා බුද්ධිමය මට්ටමින් පහත් අය ලෙස සලකන අයට සහ සතුන්ටය.

## කායික සහ මානසික දුබලතා

දුබලතාවකින් පෙළීම යනු කායික හෝ මානසික වර්ධනයෙන් අඩු හෝ අසම්පූර්ණ ස්වභාවයකින් සිටීමයි. සමහර වැරදි තොරතුරු සපයන බෞද්ධයන් විශ්වාස කරන්නේ කායික සහ මානසික දුබලතා ඇති අයට එසේ සිදුවී ඇත්තේ පෙර ජීවිතයේ දී ඍණාත්මක යම් දෙයක් සිදු කිරීමෙන් ඇති වූ ප්‍රතිඵලයක් නිසා බවයි. අඩු පාඩු වසා ගැනීම සඳහා ඉතා සරල ආකාරයට කර්මය පිළිබඳව මෝඩ, ළාමක ලෙස විශ්වාස ඇති කර ගන්නා අයුරු හැඳින්වීමට මෙය හොඳම උදාහරණයක් වේ. ධනාත්මක හෝ ඍණාත්මක කර්ම ධනාත්මක හෝ ඍණාත්මක හැඟීම් ලෙසම ප්‍රකට වේ. ඇත්ත වශයෙන්ම කායික දුබලතාවක් ඇති පුද්ගලයෙකුට පූර්ණ සංවර්ධිත පුද්ගලයෙකු හා සමානවම ප්‍රීතිමත් පුද්ගලයෙකු විය හැකිය, සමහර විට ඊටත් වඩා එසේ විය හැකිය. ඒ ආකාරයටම කායික සහ මානසික ඌන සංවර්ධයෙන් පෙළෙන පුද්ගලයන් බොහෝ විට, මෘදු, ආදරණීය සහ අහිංසක, සමහර 'සාමාන්‍ය' මිනිසුන්ට වඩා මුළුමනින්ම වෙනස් වේ. අපි දුබලතාවයන් ඇති පුද්ගලයෙකු දැක මෙසේ සිතිය හැකිය 'මම එවැන්නෙකු වීමට කැමැති නොවෙමි.' නමුත් අපේම හැඟීම් ඔවුන්ගේ මිම්මක් නොවේ. ආබාධිත පුද්ගලයෙකුට ඔවුන්ගේ තත්ත්වය පිළිගෙන

සතුටින්, සෑහීමට පත්වෙමින් සහ තෘප්තියෙන් සිටීමට හැම අතින්ම හැකියාවක් තිබේ. තත්ත්වය මෙසේ තිබියදී, ශාරීරිකව හෝ මානසිකව ආබාධිත වන්නේ අතීතයේ සිදු කර ඇති සෘණාත්මක ක්‍රියාවක ප්‍රතිඵලයක් නිසා යැයි කීම සුපරික්ෂාකාරී නොවන සාධාරණීකරණයකි. බොහෝ ආබාධිත තත්ත්වයන් සිදුවන්නේ ජානමය වැරදි නිසා බව විද්‍යාව ඔප්පු කර ඇත. මේ අනුව බෞද්ධ ධර්මයේ දෘෂ්ටි කෝණයෙන් බලන විට, බොහෝ සේ ඔවුන්ගේ කර්මයට වඩා හේතුව තිබිය හැක්කේ ජීව විද්‍යාත්මක සහ භෞතික නියාමයේ (බීජනියාමයේ සහ උතුනියාමයේ) විය හැකිය.

බුදුපියාණන් වහන්සේගේ සමහර ශ්‍රාවකයන් ශාරීරික දුබලතා තිබූ අයයි - කුජ්ජුත්තරා කුදු පුද්ගලයෙකු වූ අතර, භද්දිය ද කුරු පුද්ගලයෙක් විය. කුජ්ජුත්තරා ඇයගේ ඉහළ මට්ටමේ ඉගෙනීම පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ ඇගයීමට ලක් වූවාය. භද්දිය ඔහුගේ මනරම් කටහඬ සම්බන්ධයෙන් ඇගයීමට ලක්විය (A.I,23;26). කුජ්ජුත්තරා සෝවාන් ඵලයට පත් වූ අතර, භද්දිය රහත් ඵලයට පත්විය (S.II,279). පැහැදිලිවම, කායික දුබලතා තිබීම ආධ්‍යාත්මික දියුණුවට එළඹීමට බාධකයක් නොවේ. භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට කායික දුබලතා (යථාවජ්ජේන කීළන්ති, Vin.III,179) සරදමට අනුකරණය කිරීම වරදක් බවට අනුදැන වදාළහ.

## ධර්මය අතුරුදහන් වීම

ධර්මය නොබෝ කලකින් අතුරුදහන් වේ යැයි

කුතුහලයක්, නමුත් දිගටම පවතින විශ්වාසයක් සමහර බෞද්ධයන් අතර පවතී. මෙම විශ්වාසය සාමාන්‍යයෙන් පවතින්නේ අපැහැදිලි තත්ත්වයක වන නමුත්, සමහර අවස්ථාවල බෞද්ධ ආයතනවල තිබෙන නොවැළැක්විය හැකි අඩුපාඩුකම් පිළිබඳව ඉහළ අවබෝධයක් ඇතිවන අවස්ථාවලදී එය ඉදිරියට එයි. නමුත්, මෙම විශ්වාසයේ යම් සත්‍යයක් තිබේ ද? පළමුව 'ධර්මය' යන්නෙන් අප අදහස් කරන්නේ කුමක් ද කියා පැහැදිලි කර ගත යුතුයි. ධර්මය යනු, 1. යථාර්ථයේ ස්වභාවය පිළිබඳ සත්‍යය, 2. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ බොහෝ ධර්ම දේශනා සහ සාකච්ඡාවලදී අවබෝධකර ගත් සත්‍යය විස්තර කළ ආකාරය, සහ (3) තමන් බෞද්ධයන් යැයි හඳුන්වන්නා වූ අය එම සත්‍යය යොදා ගන්නා සහ පුහුණු කරන්නා වූ ආකාරයයි.

මෙම පළමු අර්ථයෙන්, අවකාශය, බලය හෝ කාලයට වඩා වැඩියෙන් ධර්මය අතුරුදහන් විය නොහැකිය. ඕනෑම දෙයක් පවතින තාක් කල්, ධර්මය පවතින්නේ ධර්මය යථාර්ථයේ ස්වභාවය නිසාය. දෙවන සහ තුන්වන අර්ථයෙන්, ධර්මය අවසානයේ අතුරුදහන් වේ. එයට හේතුව බුදුපියාණන් වහන්සේගේ වචන සහ ඒවා පිළිබඳව මිනිසුන්ගේ අවබෝධයත් ඇතුළුව සියලු සාමූහික දේවල් (සංඛාර) වෙනස් වීමට යටත් (අනිච්ච) නිසාය. ධර්මය අතුරුදහන් වීමෙන් පසු, ඉක්මනින් හෝ පමාවී අලුත් බුදුකෙනෙකු විසින් එය නැවතත් අනාවරණය කර, ලෝකයට ප්‍රකාශයට පත් කරනු ඇත. ඊළඟ යුගයේ බුදුපියාණන් වහන්සේ මෛත්‍රේය යනුවෙන් නම් කරනු ඇත.

මේ අවසාන අර්ථයන් දෙකේ ධර්මය නැති වන්නේ කවදාද? 'අකුරු වැරදි ලෙස උච්චාරණය කර ඒවායේ අර්ථය වැරදි ලෙස අර්ථකථනය කරන විට' කාරණා දෙකක් ඇති බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.I,59). මෙහිදී බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ වචන පිළිබඳව සඳහන් කළේ ඒවා තමන් වහන්සේගේ සමීපතම ශ්‍රාවකයන් මතකයේ තබා ගනිමින් ද, පසුව අද කාලයේ අප ත්‍රිපිටකයෙන් පරිහරණය කරන ආකාරයට ඒවා ලිවීමට බැඳුණු බවත්ය. මේ අර්ථයෙන් ධර්මය අතුරුදහන් වීමේ අනතුරක් නැත. සැබැවින්ම, මුද්‍රණයෙන්, පොත් පත් සහ විද්‍යුත් මාධ්‍යයේ තිබෙන වර්තමානයේ තරම් මීට පෙර කවදාවත් ධර්මය සුරක්ෂිත, සුලබ සහ පුළුල් ලෙස කියවන කාලයක් තිබී නැත.

තවත් අවස්ථාවක යම් පුද්ගලයෙකු බුදුපියාණන් වහන්සේ වෙත එවැනිම ප්‍රශ්නයක් යොමු කර ඇත. 'තථාගතයන් වහන්සේ පරිනිර්වාණයට පත් වූ පසු, යහපත් ධර්මය බොහෝ කාලයක් නොපවතින්නට කාරණය සහ හේතුව කුමක් ද?' බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: 'යහපත් ධර්මය බොහෝ කාලයක් නොපැවතීමට හේතුව සිහිකල්පනාවේ අත්තිවාරම් හතර වර්ධනය නොකිරීම සහ දියුණු නොකිරීමයි'(S.V,174). මෙහිදී බුදුපියාණන් වහන්සේ කියා සිටියේ මිනිසුන් භාවනාව තුළින් ඔවුන්ගේ මනස පිරිසිදු සහ පැහැදිලි කරන තාක් කල් ධර්මය කල් පවතින බවයි. මෙම කරණය පිළිබඳවම බුදුපියාණන් වහන්සේ තව දුරටත් පැවසූහ 'පොළොව, ජලය, ගින්දර හෝ සුළඟට යහපත් ධර්මය අතුරුදහන් කළ නොහැකිය. නමුත්,

මෙතැන සිටින මෝඩ මිනිසුන් එය අතුරුදහන් කරනු ඇත' (S.II,224). ඒ අනුව ධර්මය කොපමණ කාලයක් පවතී ද යන ප්‍රශ්නයට පිළිතුර මෙයයි. ධර්මයට නිශ්චිත ආයු කාලයක් නොමැති අතර, කිසියම් නිශ්චිත වේලාවක අතුරුදහන් වීමට කලින් නියම කළ වේලාවක් ද නැත. බෞද්ධයන් යැයි කියා ගන්නා අය කැපවීමෙන්, අවංකව, අවබෝධයෙන් සහ ආදරයෙන් පුහුණු කරයිද, ඒ තාක් කල් ධර්මය පවතියි, දියුණුව පවතිනු ඇත. 'මෝඩ මිනිසුන්' (මොඝ පුරිසා) ඇත්තේ සුළුතරයකි.

## බුදුපියාණන් වහන්සේගේ පළමු ශ්‍රාවකයන්

බුදුපියාණන් වහන්සේට සිය දහස් ගණනක් වූ බොහෝ ශ්‍රාවකයන් සිටිය බවත්, ඔවුන්ගෙන් හොඳ සංඛ්‍යාවක් රහත් ඵලයට මඟ පෙන්වන එක් හෝ තවත් ඵලයකට පත් වූ බවත් මහාවච්ඡගොත්ත සූත්‍රයේ සඳහන් වේ (M.I,490-1). කෙසේ නමුත්, බුදුපියාණන් වහන්සේගේ පළමු ශ්‍රාවකයන් වූයේ තපස්සු සහ භල්ලික යන වෙළඳුන්ය. බුදුපියාණන් වහන්සේගේ හතරවෙනි සතිය ගෙවුණේ උරුවෙලාවේ වන අතර, එහිදී තපස්සු සහ භල්ලික ගමේ අවට පසු කරමින් යන විට, නිසලව භාවනා කරමින් සිටි බුදුපියාණන් වහන්සේ දැක ඇත. උන්වහන්සේගේ ශාන්ත පෙණුම සහ නිසල ප්‍රභාව දැක ආකර්ෂණය වූ ඔවුහු බාර්ලි කැඳ සහ මීපැණි බෝල රැගෙන උන්වහන්සේ වෙත ප්‍රවේශ වූහ. බුදුපියාණන් වහන්සේ වළඳා අවසාන විට, තමන්ට උන්වහන්සේ සහ ධර්මය වෙතින් සරණ යෑමට හැකි දැයි ඇසූහ. ඔවුහු තුන්වන සරණ නොලැබූහ. එයට හේතුව ඒ වන විට සංඝයා බිහිවී නොතිබුණි (Vin.

I.4). මේ පුද්ගලයන් දෙදෙනා පිළිබඳව තවත් තොරතුරු ත්‍රිපිටකයේ ඇත්තේ ඉතා ස්වල්පයකි. ඔවුන් දෙදෙනා පළමු ශ්‍රාවකයන් වශයෙන් සරණ ගිය බව බුදුපියාණන් වහන්සේ විස්තර කළ බව අංගුත්තර නිකායේ සඳහන් වේ (A.I,26). ථේරගාථාවේ භල්ලිකගේ පැදියක් ඇත. නමුත්, බුදුපියාණන් වහන්සේට උරුවෙලාවේදී හමු වූ එම පුද්ගලයාම ද යන්න නිශ්චිත නැත (Th.7).

සමහර විට ඔවුන් පිළිබඳ තොරතුරු හිඟවීම, පළමු ශ්‍රාවකයන් දෙදෙනා ගැන බොහෝ ජනප්‍රවාද වැඩෙන්නට හේතුවිය. චීන ජාතික වන්දනාකරු සුඇංසෑං උතුරු ඇෆ්ගනිස්ථානයේ සිටින විට, 7වන ශතවර්ෂයේදී ඔහු මෙම වෙළඳුන් දෙදෙනාගේ නම්වලින් හැඳින්වෙන, ඔවුන්ගේ උපන් නගර දෙකකට ගියේය. එම නගර දෙකේ හරියටම පිටත ස්තූප ගොඩනඟා තිබුණි. සිතන පරිදි තපස්සු සහ භල්ලිකට බුදුපියාණන් වහන්සේ විසින් දෙන ලද ධාතු තැන්පත් කළ ස්තූපයි. පැරණි ශ්‍රී ලංකිකයන් කියා සිටියේ තපස්සු සහ භල්ලික ඔවුන්ගේ ම ලෙසයි. ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර වෙරළේ තෙරියේ අලංකාර පැරණි ස්තූපයක් ඇත. සිතන පරිදි මෙම වෙළඳුන් දෙදෙනා ඔවුන්ට බුදුපියාණන් වහන්සේ ලබා දුන් කේශධාතු තැන්පත් කළ ස්තූපය මෙයයි. තපස්සු භල්ලික ඔවුගේ රටේ ජාතිකයන් බව බුරුම ජාතිකයෝ පවසති. රැන්ගූන්වල පිහිටි ශ්‍රේෂ්ඨ ස්වර්ණමය ෂ්වේදගොන් චෛත්‍යයේ වෙළෙඳුන් දෙදෙනා බුදුපියාණන් වහන්සේ දුන් කේශධාතු 8නමක් තැන්පත් කර ඇති බව ජනප්‍රවාදවලින් කියැවේ. ෂ්වේදගොන් චෛත්‍යය පිළිබඳ සටහන් දිව

යන්නේ දසවන ශතවර්ෂයට පමණි. එම නිසා මෙම ජනප්‍රවාදය පසුකාලීන එකකි.

මෙම වෙළෙඳුන් දෙදෙනා පැමිණියේ උක්කාවලින් බව විනය පිටකයේ සඳහන් වේ. නමුත් බොහෝ ඉතිහාසඥයන් හඳුනා ගන්නේ ඉන්දියාවේ ඔරිස්සා යන ප්‍රදේශයෙන් බවයි. පුරාවිද්‍යාව මෙය සනාථ කරන බව පෙනේ. ඔරිස්සාවේ සෙල්ලිපි දෙකක්, දෙකම බ්‍රාහ්මී අක්ෂරයෙන් සහ ක්‍රි. පූ. 1වන සියවසේ සිට පැවත එන තපස්සු සහ භල්ලික විසින් කරන ලද පරිත්‍යාගයන් ලෙස සඳහන් වී ඇත. මේවායින් පළමු වැන්න ස්තූපයක තිබී හමුවූ අතර, දෙවැන්න විශාල ස්තූපයක් අසල ගුහාවක පිහිටා ඇත. බලන්න **සුභද්ද සහ සුජාතා**

Tapassa and Bhallika of Orissa: Their History and Nativity, by G. Mohanty et al. *Orissa Review* 2007.

## අනාවැකි කීමේ හැකියාව, විජ්ජා, වාසනාව සහ ඉරණම

සිතන පරිදි, අනාවැකි කීමේ හැකියාව යනු අනාගතයේ සිදුවන දේ කීමේ හැකියාවයි. විජ්ජා යනු සිතන පරිදි, ස්වභාවික සිදුවීම්වල ගමන් මඟ සම්මතයෙන් ඔබ්බට ගොස් වෙනස් කිරීමට ඇති බලයයි. වාසනාව යනු පුද්ගලයෙකුට එය තිබේ නම්, ඔහුට හෝ ඇයට සාර්ථකත්වය හෝ සතුට ලබා දිය හැකි ගුණාංගයකි. දෛවය යනු සිතන පරිදි කලින් තීරණය කරන ලද සියලු සිදුවීම් මාලාවකි.

බුදුපියාණන් වහන්සේ මේ සියලු දේ 'පහත් කලාවන්' (තිරච්ඡාන විජ්ජා) ලෙස නම් කළහ. උන්වහන්සේගේ

භික්ෂූන් සහ භික්ෂුණීන්ට ඒවා පුහුණුව පැහැදිලිවම තහනම් කළහ. යහපත් භික්ෂුවක් 'විජ්ජාකාරී මැතුරුම් සජ්ඣායනය නොකරයි, සිහින හෝ සලකුණු අර්ථ නොදක්වයි, ජ්‍යෝතිෂයය පුහුණු නොකරයි' (ආථබ්බණං සුපිනං ලබණං නො විදහෙ අතො පි නක්ඛත්තං, Sn.927) නැතහොත් ශ්‍රී, වාසනාවට අධිපති දේවතාවිය (D.I,11) වැඳීම නොකරන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. බුදුපියාණන් වහන්සේ මෙතෙක් සිදු කළ දරුණුතම තරවටු කිරීම්වලින් උන්වහන්සේ කියා සිටියේ මෙම මිථ්‍යා විශ්වාසයන් විශ්වාස කළ හෝ පිළිපදින ඕනෑම ගිහි ශ්‍රාවකයන් 'ගිහි ප්‍රජාවෙන් නෙරපා හැරීම, ගිහි ප්‍රජාවට කැළලක්, සහ අපකීර්තියක්' වන බව ද බුදුපියාණන් වහන්සේ පැවසූහ. නිරයේ නැවත උපදින සමහර මිනිසුන් පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වේ (A.III,206). ඒ අය අතර ඇත්තේ අළුගෝසුවන්, මස් වෙළෙඳුන්, ද්වේෂ සහගත ලෙස නින්දා අපහාස කරන්නන්, දූෂිත විනිශ්චයකරුවන් සහ අනාවැකි කියන්නන්ය (A.III,206).

බුදුපියාණන් වහන්සේ සමහර විට මේ සියලු මිථ්‍යාවන්ට විරුද්ධ වූයේ බොහෝ හේතු නිසාය. පළමුව, වාසනාව සහ ඉරණම පිළිබඳ විශ්වාසය කර්මය පිළිබඳ ඉගැන්වීම්වලට පරස්පරයි. අණාවැකි පළ කිරීම සහ විජ්ජා පුහුණුව අනිවාර්යයෙන් සම්බන්ධ වන්නේ වස්තුවට අදාළ දෙයකටය. ඒ නිසා අවිද්‍යාව සහ තණ්හාව ශක්තිමත් කරයි. ශාස්ත්‍ර කීම සහ විජ්ජා මැතුරුම් සහ ආරක්ෂාවට බඳින යන්ත්‍ර ගසාකෑමට සාමාන්‍යයෙන් වංචාව, වංකකම සහ රැවටීම සම්බන්ධ වේ. පරස්පර විරෝධී ලෙස, මේ

සියලු මිථ්‍යා විශ්වාසයන් වර්තමානයේ බොහෝ බෞද්ධ රටවල සත්‍ය යැයි පුළුල් ලෙස පිළිගෙන තිබෙන අතර, බොහෝ විට භික්ෂූන් විසින් ක්‍රියාවේ යොදවයි. බලන්න **ජ්‍යෝතිෂය, ආශිංසන සහ මුදුන**

## දික්කසාද කිරීම

දික්කසාද කිරීම යනු විවාහය අවසාන කිරීමයි. සමහර ආගම්වල විවාහය ආගමික ක්‍රියාවකි. ඒ නිසා දික්කසාද කිරීමේදී විවිධ සීමා කිරීම් ඇත. බයිබලය නියම කර ඇත්තේ පුරුෂයෙකුට තමන්ගේ බිරිය දික්කසාද කළ හැක්කේ ඇය පරපුරුෂ සේවනයේ යෙදුණහොත් පමණක් බවයි (මැතිව් 5,31-2, 1 කොරින්තියන්ස් 6, 10-11). බුදුපියාණන් වහන්සේගේ කාලයේදී පැරණි ඉන්දියාවේ විධිමත් දික්කසාද ක්‍රියාමාර්ග තිබූ බවක් පෙනෙන්ට නැත. මනුස්මෘතියට අනුව, පුරුෂයෙකුට තමන්ගේ බිරිඳ පළවා හැරිය හැක්කේ, ඇය වඳ, ද්‍රෝහී වූවොත්, කලහකාරී, ඇයට දීර්ඝකාලීන රෝගයක් තිබුණහොත්, හෝ නිශ්චිත කාලයක් තුළදී ඇයට පුතෙකු බිහි කරන්නට නොහැකි වුවහොත් යන කරුණු හේතු කර ගෙනය. විනය පිටකයට අනුව, 'විවාහයක් අවලංගු කරන සාමාන්‍ය ක්‍රමය වන්නේ පුරුෂයා ''ඒ ඇති''!' (අලංවචනීයා) යැයි කීමෙනි (Vin.III,144). දික්කසාදය සඳහා ත්‍රිපිටකයේ සමහර විට 'කැඩීම' හෝ 'වෙන්වීම' යන අදහස ඇති, සමහර විට විවාහය හැඳින්වීමට භාවිත කරන 'විකිරණ' යන වචනය හැර වෙනත් වචනයක් නැති බව පෙනේ (උදාහරණ D.I,11).

යම් කෙනෙකු තමන්ගේ කලත්‍රයා සමගින් අමනාප වූ

විට, එක් කෙනෙකු නිවසින් බැහැර වීම, හෝ පන්නා දැමීම සිදු වේ. සාමාන්‍යයෙන් මෙසේ කරන්නේ සහ මෙසේ සිදුවන්නේ බිරිඳටයි. උග්ග බ්‍රහ්මචාරී වීමට තීරණය කළ විට, ඔහු තමන්ගේ බිරින්දෑවරු හතර දෙනාට එය දන්වා ඔවුන්ට කැමැති නම් තවදුරටත් එහි රැඳෙන්නට, දෙමාපියන් වෙත යන්නට හෝ තවත් ස්වාමිපුරුෂයෙකු හා විවාහ වන්නට ඉඩ තිබෙන බව පැවසුවේය. වැඩිමහල් බිරිඳ පෙනෙන ආකාරයට, තවත් පුරුෂයෙකුට කැමැත්තෙන් සිටි නිසා, උග්ග සතුටින් ඇය ඔහුට භාර කළේය (A.IV,210).

සංගාමජී නමැති තවත් මිනිසෙක් භික්ෂුවක වීමට තීරණය කළේය. ඔහු හුදෙක් තම නිවස සහ ගැබ්බර බිරිඳ අත් හළේය. ඔහුගේ බිරිඳ දරුවා ලැබුණ පසු සංගාමජී වෙත ගෙන ගියාය. නමුත් ඔහු ඇය හෝ දරුවා පිළිගැනීම ප්‍රතික්ෂේප කළේය (Ud.5-6).

ඉසිදාසී නමැති කාන්තාව සහ ඇයගේ පුරුෂයා ඔහුගේ දෙමාපියන්ගේ නිවසේ ජීවත් වූහ. ඔහු ඇය සමග නොසතුටට පත් වී නිවස අත්හැර ගොස් වෙනත් තැනක ජීවත් වූයේය. ඉසිදාසි ඇයගේ දෙමව්පියන් වෙතට ගිය අතර, පසුව ඇය වෙනත් කෙනෙකුට විවාහ කර දෙන ලදි (Thi.413-20). දික්කසාදය පිළිබඳව බුදුපියාණන් වහන්සේ කිසිවක් නොපැවසූහ. බලන්න **විවාහ උත්සවය**

## වෛද්‍යවරු

වෛද්‍යවරයෙකු (භිසක්ක, තිකිච්ඡක හෝ වෙජ්ජා) යනු පුහුණව ලැබ වෛද්‍ය වෘත්තියේ යෙදෙන්නෙකි.

මුල් බ්‍රාහ්මණ ග්‍රන්ථවල සමාජයෙන් පැන්නූවන්, අපරාධකරුවන්, ගණිකාවන්, පොලීකාරයන් යනාදී අය වැනි වෙනත් පහත් කොට සලකන කණ්ඩායම් සමග වෛද්‍යවරුන් ද වෙන් කර තිබුණි. බ්‍රාහ්මණයෙකු කිසි විටක වෛද්‍යවරයෙකු විසින් පිරිනමන ලද ආහාර අනුභව නොකළ යුතු බව මනුස්මෘතියේ සඳහන් වේ. ඒ එය සැරව සහ ලේ ආහාරයට ගැනීම හා සමාන යැයි අදහස් කරන නිසාය. එසේම වෛද්‍යවරුන්ට ආගමික උත්සවවලටද ආරාධනය නොකෙරේ. මෙම අවමානයට හේතුව වෛද්‍යවරු විවිධ කුල සහ ශාරීරික දියර ඇති මිනිසුන් සමග ස්පර්ශ වන නිසාය. චාරිත්‍රානුකූල පාරිශුද්ධත්වය සහ අපිරිසිදුකම යන සංකල්පය බෞද්ධ හා ජෛන ජාතිකයන් විසින් ප්‍රතික්ෂේප කිරීම ඉන්දියානු සංස්කෘතියේ වෛද්‍යවරුන් පිළිගැනීමේ ආරම්භයයි. වේදනාව අඩු කිරීමට වෛද්‍යවරුන්ගේ කාර්යභාරයට ද මුල්කාලීන බෞද්ධයෝ ගරු කළහ.

මානව සතුට කෙරෙහි උන්වහන්සේ තුළ තිබූ සැලකිල්ල නිසාම, බුදුපියාණන් වහන්සේ නිතරම වෛද්‍ය වෘත්තියට අදාළ කරුණු පිළිබඳව කථා කළහ. ලෙඩ රෝග සෑදීමට හේතුවන කරුණු අටක් බුදුපියාණන් වහන්සේ දක්වා සිටියහ (S.IV,230). පුද්ගලයෙකු දරණ මත සහ ආකල්ප ලෙඩ රෝග සුවකිරීමේදී ඉෂ්ට කිරීමට භූමිකාවක් ඇතැයි උන්වහන්සේ පෙන්වා දුන්හ (A.III,144). එසේම කෙනෙකුට කායික රෝග තිබියදීත්, මානසික සුවය පවත්වා ගෙන යා හැකි බව ද උන්වහන්සේ පෙන්වා දුන්හ (S.III,2).

හිපොක්‍රටික් දිවුරුමකට සමාන බෞද්ධයෙකුගේ පදනම විය හැක්කේ කුමක් ද, යන්න වරක් බුදුපියාණන් වහන්සේ පැවසූහ: 'රෝගියෙකුට සත්කාර කිරීම සඳහා සුදුසු බව ලැබීමට කෙනෙකුට ගුණාංග පහක් තිබිය යුතුය. ඒ පහ මොනවාද? ඔහුට ඖෂධ පිළියෙළ කිරීමට හැකි විය යුතුයි. ඔහු සුව කිරීම දැනගෙන එය සකස් කොට දෙයි. නමුත් කිසිම විටක හානිකර දේ සකස් කොට නොදෙයි. ඔහු රෝගියා ආදරයෙන් රැක බලා ගනියි, නමුත්, වාසිවලට ආශාවෙන් එසේ නොකරයි. ඔහු අසුචි, මූත්‍ර, වමනය හෝ කෙළවලින් නොසැලේ. කාලයෙන් කාලයට ඔහු රෝගියාට උපදෙස් දීම, ආධ්‍යාත්මික උත්තේජනය ඇති කිරීම, සතුටට පත් කිරීම සහ ධර්මය පිළිබඳව කථා කරමින් රෝගියා ධෛර්යමත් කිරීම කරයි' (A.III,144).

නූතන වෛද්‍ය ප්‍රතිපත්තියට බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ කාලයේ ඉගැන්වීම්වලින් යම් සදාචාර ප්‍රතිපත්තිමය මූල ද්‍රව්‍යයන් එකතු කළහ. ඉන්දියානු වෛද්‍ය විද්‍යාවේ පියා වූ සුශ්‍රැත වෛද්‍යවරුන්ට උපදෙස් දුන්නේ රෝගියෙකුගේ මරණයට දොස් ඇසීමෙන් වැළකීම සඳහා, මාරාන්තික රෝගියෙකුට ප්‍රතිකාර නොකරන ලෙසයි. මීට ප්‍රතිවිරුද්ධව, බුදුපියාණන් වහන්සේ පැවසුවේ, වෛද්‍යවරයා කරුණාවෙන් මාරාන්තික රෝගියාටත් ප්‍රතිකාර කළ යුතු බවත්, රැකබලා ගත යුතු බවත්ය. සුශ්‍රැත වෛද්‍යවරයාගේ ගෞරවය පිළිබඳව උනන්දු වූ නමුත්, බුදුපියාණන් වහන්සේ සැලකිල්ල යොමු කළේ රෝගියාගේ සුභසිද්ධියයි (A.I,121).

බොහෝ විට බුදුපියාණන් වහන්සේ

වෛද්‍යවරයෙකුට සමාන කරන ලදී : 'බුදුපියාණන් වහන්සේ නිපුණ වෛද්‍යවරයෙකු වැනිය. ඒ උන්වහන්සේට කෙලෙස් නමැති රෝග සුව කළ හැකිය' (Pj.I,21). වරක් උන්වහන්සේම තමන් වහන්සේ 'උත්තරීතර වෛද්‍යවරයා' (අනුත්තරො භිසක්කො It.101) විනයට විරුද්ධ වුවත්, බෞද්ධ භික්ෂූහු බොහෝ කාලයක් වෛද්‍යවරුන් ලෙස සේවය කර ඇත. බලන්න **ජීවක සහ වාග්භට**
*Development of Public Health in Buddhism*, J. R, Haidar,1992.

## දෝණ

දෝණ, උගත් සහ ගෞරවයට පාත්‍රවූ බුදුපියාණන් වහන්සේගේ කාලයේ දී ජීවත් වූ බ්‍රාහ්මණයෙකි. සමහර විට මෙය ඔහුගේ සැබෑ නම නොවිය හැකිය, නමුත් පසුකාලීනව ඔහු හඳුන්වා දීමට යොදා ගත් නමයි. දෝණ යන පාලි වචනයේ අර්ථය වන්නේ මැනීමට භාවිත කරන කෝප්පයක් හෝ භාජනයක් යන්නයි. බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත් වන විට, දෝණ සිටියේ කුසිනාරාවේය.

මෙම ඉතා වැදගත් සිදුවීම පිළිබඳව වචනය පැතිරෙත්ම, බොහෝ රාජධානිවල සහ වංශවල නියෝජිතයෝ බුදුපියාණන් වහන්සේගේ ශ්‍රී දේහයේ අයිතිය ලබා ගැනීමට පැමිණියහ. ශාක්‍ය වංශිකයෝ මෙසේ කියමින් ඉල්ලා සිටියහ: 'අපගේ වංශයේ ඉහළම පුද්ගලයා තථාගතයන් වහන්සේ වූහ.' මගධයේ රජුගේ පණිවුඩකරු කියා සිටියේ ඔහුගේ ස්වාමියා බුදුපියාණන් වහන්සේ මෙන්ම රණවිරු කුලයේ නිසා ඔහුට භෂ්මාවශේෂවලට අයිතියක් තිබෙන බවයි. කුසිනාරාවේ මල්ලයන් නීතියේ

දහයෙන් නමයක් යන අයිතිය පිළිබඳ ආකල්පයෙන් තර්ක කරමින් මෙසේ කියා සිටියහ : 'තථාගතයන් වහන්සේ පරිනිර්වාණයට පත් වූයේ අපගේ නගරයේ වටාපිටාවේය. ඒ නිසා අපි උන්වහන්සේගේ ඇට අත් හරින්නේ නැත.' මෙම අසැබි අරෝවේදී සම්පූර්ණයෙන්ම ඉල්ලුම් කරන්නන් අටකි.

ත්‍රිපිටකයේ, දෝණ නිපුණ තීරකයෙක් ලෙස විස්තර කර ඇත. ඔහු එම විශාල පිරිස ඇමතුවේය: 'බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් ඉවසීම පිළිබඳවයි. මෙම උතුම්ම පුද්ගලයාගේ භෂ්මාවශේෂ බෙදා ගැනීම සම්බන්ධයෙන් අරගල ඇති කර ගැනීම සාධාරණ නොවේ. අපි සියලු දෙනාම එකඟතාවෙන් සහ සන්හිඳියාවෙන් එකතු වෙමු. මිත්‍රත්වයේ භාවාර්ථයෙන් භෂ්මාවශේෂ අටකට බෙදමු.' මෙම වචනවලින් හැම දෙනාම හරි අවබෝධයට පත්වූහ. දෝණ සාධාරණ යැයි සිතූ ආකාරයට බුදුපියාණන් වහන්සේගේ භෂ්මාවශේෂ බෙදිය යුතු යැයි එකඟ විය.

ඔහුගේ සේවයට ප්‍රදානයක් ලෙස භෂ්මාවශේෂ තැන්පත් කර තිබූ සහ ඔහු විසින් මිනුම් දණ්ඩ ලෙසින් භාවිත කළ භාජනය ලබා දී ඇත. ඔහු එය කෘතඥපූර්වකව ලබා ගෙන ස්තූපයක තැන්පත් කරන බව පවසා ඇත. සෑම දෙනාගේම තෘප්තියට හේතුවන ආකාරයෙන් බෙදීම සිදුකිරීමෙන් පසු, මොරිය වංශයේ නියෝජිතයෙකු පැමිණ කොටසක් ඉල්ලා සිටියේය. නමුත්, අනෙක් අය ඔවුන්ට ලැබුණු කොටසෙන් කොටසක් දීම ද ප්‍රතික්ෂේප කළහ. දෝණ නැවතත් මුදවා ගැනීමට ඉදිරිපත් වී, පසුව

පැමිණෙන අයට අවමඟුල් චිතකයෙන් ලැබෙන අඟුරු දෙන්නට යෝජනා කළේය (D.II,164-6). එසේ කරන ලදී. ඒ අනුව පළමු බෞද්ධ ස්තූප දහය ඉදිකරණ ලදී. සාමය, සමගි සම්මුතිය, සහ නිරවුල් ප්‍රායෝගික බුද්ධිය සඳහා බොහෝ ආශා කරන සහ සසල වන ප්‍රශංසාවක් දෝණට පිරිනැමීමට බුද්ධචරිතයේ රචක අශ්වඝෝෂ මෙම සිද්ධිය ඔහුගේ කෘතිය තුළින් අවස්ථාවක් කරගෙන ඇත. බුදුපියාණන් වහන්සේගේ ගුණ අගයමින් මාත්‍රා 16,000ක් සහිත කවියක් දෝණ රචනා කළ බව පාරම්පරිකව දැනගන්නට ඇත. දෝණගජ්ජිත නමින් හඳුන්වන මෙම කවිය වර්තමානයේ නැතිවී ඇත. බලන්න **අවමඟුල් සහ මැනීම්**

**සැකය**

සැකය (කංඛා හෝ විචිකිච්ඡා) යනු යම් දෙයක් පිළිබඳව ඇති අවිනිශ්චිත තත්ත්වයකි. බොහෝ විට අසහනය සහ අපහසුව සමග පවතින හැඟීම් වේ. අනෙක් සැකය හා බැඳී ප්‍රකාශන වන්නේ සැක කරන, අවිශ්වාස කරන, අවිනිශ්චිත බව සහ ව්‍යාකූලභාවයයි. බෞද්ධ මනෝවිද්‍යාවේ, සැකයට ඍණාත්මක සහ ධනාත්මක යන භූමිකා දෙකම තිබෙන බව පෙනී යයි. ධර්මය පිළිබඳ සැකයක් ඇති වූ විට, එය ක්‍රියාවට නැංවීම පිළිබඳ අවිනිශ්චිත වීමක් සහ දෙගිඩියාවක් ඇති වේ (A.I,4-5). එවිට එය බාධාවක් ලෙස පෙනේ. යම් කරුණක් පැහැදිලි කර ගැනීමට සහ වඩා ගැඹුරෙන් විමර්ශණය කර ගැනීමට පුද්ගලයෙකුට පෙළඹවීමක් ඇති වූ විට, එය අවබෝධයටම හේතු වේ.

දිගින් දිගටම තමන්ගෙන් ප්‍රශ්න කරන ලද විවිධ ඇදහිලි පිළිබඳ තමන්ට සැක ඇතිවූ බව කාලාම බුදුපියාණන් වහන්සේට පැවසූ විට බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ 'අවිනිශ්චිත වීම හොඳයි, සැක කිරීමත් හොඳයි. අවිනිශ්චිත බව ඇතිවන්නේ සැක සහිත කරුණුවලයි' : (A.I,189). බලන්න **කාලාම සූත්‍රය**

## සිහින

සිහින (සුපින) නින්ද තුළදී මතකයට එන මානසික චිත්ත රූපයි. සිහිනවලට යම් වැදගත් කමක් තිබේ යැයි පුළුල්ව ව්‍යාප්තවූ විශ්වාස ඇත. තමන්ට අනාගතයේ සිදුවන දේ පිළිබඳ අනාවැකි පළ කළ හැකි යයි සමහර මිනිස්සු විශ්වාස කරති. අනෙක් අය තමන් හරහා මිය ගිය හෝ දෙවියන් සමගද ජීවත්වන අයට සන්නිවේදනය කළ හැකි බව විශ්වාස කරති. නිවැරදිව අර්ථ නිරූපණය කළ විට, සිහින මගින් යටපත් කළ ආශාවන් සහ උත්සාහයන්ට සැඟවුණු ඇත්ත දැකීමේ හැකියාවක් ලබා දිය හැකි බව නූතන මනෝ විශ්ලේෂකයෝ පවසති. ඒ අනුව වඩාත් ගැඹුරු ස්වයං අවබෝධයකට මඟ පෙන්වයි. බෞද්ධ මනෝවිද්‍යාව බොහෝ වර්ගයේ සිහින හඳුනා ගනියි. මිලින්දපඤ්හයට අනුව, මෙම සිහින හට ගන්නේ 1. කායික ආතතීන්, 2. මානසික නොරිස්සුම, 3. භූතයන්, 4. මානසික ගුණයන්, හෝ 5. ස්වභාවික අනාගතය හෙළි කිරීමේ හැකියාවන් නිසාය. සිහින හටගන්නේ ප්‍රධාන වශයෙන් නින්දට පත් වන විට සහ අවදි වන විට (ඔක්කන්තෙ මිද්ධෙ) සහ ගැඹුරු නින්දේ (අසම්පත්තෙ භවඞ්ගෙ Mil.II,298-9) යන මේ කාල

පරාසයේ දී බව නූතන පර්යේෂණවලින් තහවුරු කළ කරුණකි.

බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පැමිණීමට පෙර, සංකේතවලින් අදහස් නිරූපණය කරන අපූර්ව සිහින හතක් දැක ඇත. ඒවායින් උන්වහන්සේගේ බුද්ධත්වයට පැමිණීම පිළිබඳව අනාවැකි පළ කර ඇත (A.III,240 ff). කෙසේ නමුත්, අනෙක් අයගේ සිහින අර්ථ නිරූපණය කළ හැකි යැයි කියා සිටි අය ගැන උන්වහන්සේට සැක සහිත විය. උන්වහන්සේ භික්ෂූන් සහ භික්ෂුනීන්ට එසේ කිරීම තහනම් කළහ (D.I,8). මෛත්‍රී භාවනාව වඩන පුද්ගලයෙකු බියකරු සිහිනවලින් කලබල නොවන බව උන්වහන්සේ පැවසූහ (A.V,342). එසේම සිහිකල්පනාවෙන් නින්දට යන භික්ෂුවකට රාත්‍රී විමෝචනය පිට කිරීමක්, සාමාන්‍යයෙන් ශෘංගාර සිහින එක්වූ මානසික සිදුවීම් ඇති නොවේ (A.III,251). යමක් සිදු කිරීමට සිහින දැකීම - උදාහරණ වශයෙන් කෙනෙකු මැරීම, යමක් සොරකම් කිරීම වැනි දේ සදාචාරමය වශයෙන් වැදගත් නොවන බවත්, එම නිසා කර්මානුකූල ඵලයක් ඇති නොවන බවත් බුදුපියාණන් වහන්සේ පැවසූහ (Vin.III,111). ඒ අනුව, සිහින අධිෂ්ඨානයේ බලය අභිබවා ගිය එකක් බව උන්වහන්සේ අවබෝධ කර ගත්හ.

**ඖෂධ**

ඖෂධ (ඔසධ) වෛද්‍යමය හෝ විනෝදාත්මක අරමුණෙන් කන, බොන, උරන හෝ එන්නත් කරන රසායනික ද්‍රව්‍යයකි. වෛද්‍යමය හේතුවලට ඖෂධ ගැනීම, කුඩා ප්‍රමාණයෙන් මත්වතුර රස මාත්‍ර ගැනීම

පවා පස්වන සිල්පදය කැඩීමක් වන්නේ නැත. එයට හේතුව එහි අභිප්‍රාය වන්නේ සෞඛ්‍ය පිළිසකර කිරීමයි. මෙහිදී භාවිත කරන මත්වතුර ප්‍රමාණය ස්වල්ප නිසා මත්වන්නේ නැත. කෙසේ නමුත්, කංසා, අබිං, හෙරොයින්, ප්‍රබල මත්ද්‍රව්‍ය ආදියට ඖෂධීය වටිනාකමක් නැති නිසා සහ ඒවා සිහි බුද්ධිය විකෘති කරන නිසාත්, කායික හෝ මානසික ඇබ්බැහි වීමකට යොමු කළ හැකි නිසාත්, ඒවා ශික්ෂා පදයට විරුද්ධ වේ.

බොහෝ සමාජවල ඉතා පුළුල් ලෙස භාවිත වන මත්ද්‍රව්‍ය මත්වතුරයි. සමහර මැද පෙරදිග රටවල බහුලව භාවිත වන මත් ද්‍රව්‍ය 'කැට්'ය. භික්ෂූන් අතර පවා බුලත් සහ පුවක් සැපීම බෞද්ධ රටවල සාමාන්‍ය පුරුද්දකි. නමුත් එහි පස්වන ශික්ෂාපදය බිඳ දැමීමේ බලපෑම අල්ප නිසා බොහෝ බලධාරීහු එය ශික්ෂා පදයට හානියක් වේ යැයි එකඟ නොවෙති.

**දුක්ඛ** - බලන්න **දුක් විඳීම**

## බුදුපියාණන් වහන්සේගේ කන් පෙත්ත

කන් පෙත්ත (කණ්ණපත්ත) යනු කනේ පිටතින් ශ්‍රවණ නළයට පහළින් එල්ලා වැටෙන මෘදු ගැටිත්තයි. සියලු සංස්කෘතීන්වල පැරණි සහ නූතන බුදුපිළිමවල කන් පෙත්ත නිරූපණය කර ඇත්තේ දික්ව සහ සාමාන්‍යයෙන් සිදුරු කරය. බුදුපියාණන් වහන්සේගේ බුදුපිළිමවලින් බොහොමයක්ම සර්වඥ ස්වභාවයේ සංකේත ලෙස නිර්මාණය කර තිබෙන බව පෙනෙන්ට තිබේ. කෙසේ නමුත්, දික්වූ කන් පෙති ඇති පිළිම ඈත මතකයේ නොනැසී පැවැත තිබෙන ඒවා සැබැවින්ම බුදුපියාණන් වහන්සේගේ පෙනෙන්ට තිබූ ආකාරයයි. පැරණි ඉන්දියාවේ පුරුෂයන් සහ ස්ත්‍රීන් සාමාන්‍යයෙන් කන් මත ඇබ භාවිත කර ඇත. දරුවන්ගේ කන් පෙති සිදුරු කර කුඩා මැටි රවුම් සිදුරුවලට දමනු ලැබුණි. දරුවන් වැඩෙන විට, සෙන්ටිමීටර් 6ක් දක්වා විෂ්කම්භයක් සහිත ප්ලග්වලට ඉඩ ප්‍රමාණයක් සැලසෙන පරිදි දිගු කරන තෙක් විශාල රවුම් කන් පෙති තුළට දමා ඇත. මෙවැනි ද්‍රව්‍ය සිය ගණනක් පුරාවිද්‍යාඥයන් සොයා ගෙන ඇති අතර, ඉන්දියාවේ සමහර කෞතුකාගාරවල දැක ගන්නට ඇත. ගිහියෙකු වශයෙන් සිටියදී සිද්ධාර්ථ ද එවැනි කන් ඇබ අඳින්නට ඉඩ ඇත. උන්වහන්සේ ලෝකය අභිනිෂ්ක්‍රමණය කළ විට ඒවා උන්වහන්සේගේ දික් කළ කන් පෙති ඉතිරි කරමින් ඒවා අත් හරින්නට ඇත. බලන්න **බුදුපියාණන් වහන්සේගේ කායික**

## පෙනුම

*Ear Ornaments of Ancient India*, Michel Postel, 1989.

## පෘථිවිය

**පෘථිවිය** (පඨවි) යනු එහි අක්ෂය මත භ්‍රමණය වන, සූර්යයා වටා ගමන් කරන සහ එහි පිටත පෘෂ්ඨයේ ජීවයට සහාය වන ග්‍රහලෝකයෙකි. පෘථිවිය විශාල ගැඹුරක් ඇති, විශාල ප්‍රමාණයකින්, ගෝලාකාර හෝ තැටි හැඩයකින් යුක්ත (මණ්ඩල D.I,134) යැයි බුදුපියාණන් වහන්සේ විස්තර කළහ. ඉන්දියාවේ පූර්ව-බෞද්ධ ආගම පෘථිවිය ග්‍රීක ගයිය හෝ රෝමානු ටෙරාට සමාන පඨවි දේවතාවිය ලෙස පුද්ගලාරෝපණය කරන ලදි.

ජනප්‍රවාදයට අනුව, බුද්ධත්වයය පත්වීමෙන් පසු, බුදුපියාණන් වහන්සේ පෘථිවිය ස්පර්ශ කර පෘථිවි කැඳවා තමන්වහන්සේ අවිද්‍යාව නමැති අඳුර නිවමින් ලැබූ මහා ජයග්‍රහණයට සාක්ෂි දරන්නට ඉඩ සැලැස්වූ සේක. බුදුපියාණන් වහන්සේගේ බොහෝ පිළිම උන්වහන්සේගේ වම් අත උකුළේ සුවසේ තබාගෙන දකුණු අත දණහිස මත තබාගෙන, ඇඟිලි තුඩු පෘථිවිය ස්පර්ශ කරමින් මෙම දසුන නිරූපණය කරයි. බුදුපියාණන් වහන්සේ පඨවි පිළිබඳව කිසි දිනක සඳහන් නොකළත්, අපගේ ගෞරවය ලැබීමට සුදුසු යම් ගුණයන් පෘථිවියට තිබෙන බව උන්වහන්සේ දුටුවහ. උන්වහන්සේට අනුව, සියලු ජීවීන්ගේ වැඩීමට ආධාර කරන පැළැටිවලට හැකිවී තිබෙන්නේ ඒවා පෘථිවියෙන් පෝෂ්‍යදායක 'සාරයක්' (පඨවීඔජා හෝ පඨවීරස) උරා ගන්නා නිසාය (A.V,213; S.I,134).

නමුත්, බුදුපියාණන් වහන්සේට පෘථිවිය හුදෙක් ජීවීන් පෝෂණය කිරීමක් පමණක් නොවේ. එයට අනුකරණය කිරීමට යෝග්‍ය යම් ආධ්‍යාත්මික ගුණාංග ද තිබුණි. අපට 'මඩ නොමැති පොකුණක් මෙන් පැහැදිලි වන්නට', 'පොළොවේ සවි කළ කණුවක් මෙන් ස්ථීර වන්නට' සහ 'බලවත් පෘථිවිය (පථවි සමෝ නොවිරුජ්ඣති Dhp.95), මෙන් වෛරයෙන් නිදහස් වන්නට' ද උන්වහන්සේ අවවාද කළහ. බුදුපියාණන් වහන්සේ වඩාත්, අගය කරන ලද්දේ පෘථිවියේ ඇති යැයි පෙනෙන්නට තිබෙන ඉවසිලිවන්ත දරා සිටීමයි. තවත් අවස්ථාවක උන්වහන්සේ තමන්වහන්සේගේ පුත් රාහුලට මෙසේ පැවසූහ 'මිනිසුන් පිරිසිඳු හෝ කිළිටි දේවල් පොළොවට විසිකර දමන්නා සේ, ඒ ආකාරයට මෙතෙක් පොළොව කිසි දිනක කෝප වන්නේ නැත, අවමන් කරන්නේ නැත හෝ පිළිකුලට පත් වන්නේ නැත. පොළොව මෙන් භාවනාව දියුණු කරන්න, ඊට පසු ප්‍රසන්න සහ අප්‍රසන්න හැඟීම් ඔබේ මනසට ඇතුල් වී එහි නොරැඳෙනු ඇත' (M.I,423).

බලන්න **ලෝකය**

*Buddhist Perspectives on the Ecocrisis*, Klaus Sandell,1987.

## සම්මා වායාම

සම්මා වායාම (සම්මා වායාම) බුදුපියාණන් වහන්සේගේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ හයවන පියවරයි. වායාම යනු අනෙක් ගුණාංග මාර්ගයට ගෙන ඒම ඉක්මන් කර, ඊට පසු ඒවා ප්‍රාණවත් කරයි. එම නිසා, උදාහරණ වශයෙන් අප සියලු දෙනාටම සිහිකල්පනාවෙන් සිටීම වැඩි දියුණු කර ගැනීමේ හැකියාව ඇත. එහෙත් අප ඒ පිළිබඳව සවන්දීම සහ

එහි වටිනාකම සහ ප්‍රයෝජනය අගයන තුරු අපට කිසි විටක කළ නොහැකිය. ඊට පසු සිහිකල්පනාව ඇති කර ගැනීමට උත්සාහ කර එසේ වන්නට හැකිය. අඩුම තරමින් කෙටි වේලාවකට හෝ සිහිකල්පනාව ඇතිකර ගැනීමෙන් පසු, අපට මෙම හැකියාව සහ අපගේ සිහිකල්පනාවේ ගැඹුර ශක්තිමත් කිරීමට උත්සාහ කළ හැකිය. මෙම ක්‍රියාවලියේ සෑම පියවරකදීම වායාම, ස්ථීර අධිෂ්ඨානය සහ සක්‍රීය කායික ශක්තිය අත්‍යවශ්‍ය වේ. බුදුපියාණන් වහන්සේ සම්මා වායාම මෙසේ විස්තර කළහ : 'සම්මා වායාම කුමක් ද? පුද්ගලයෙකු මෙතෙක් ඇති නොවූ නුසුදුසු තත්ත්වයන් ඇතිවීම වැළැක්වීමට, දැනටමත් ඇතිවී තිබෙන නුසුදුසු තත්ත්වයන් අත් හැරීමට කැමැත්තක්, මෙතෙක් ඇති වී නැති සුදුසු තත්ත්වයන් ඇති කර ගැනීමට කැමැත්තක් සහ දැනටමත් ඇති වී ඇති සුදුසු තත්ත්වයන් පෝෂණය කිරීමට සහ තවදුරටත් වර්ධනය කිරීමට කැමැත්තක් උපදවයි. කෙනෙකු උත්සාහයක් දරයි, ශක්තිය යොදයි, මෙම අවසන් අරමුණ කෙරෙහි මනස එක්තැන් කරයි, මෙහෙයවයි' (D.II,312). කෙසේ නමුත්, හුදෙක් කෙනෙකුගේ සිතේ සවිය ඇති කර ගැනීම සඳහා දැඩි ප්‍රයත්නයක් දැරීම සමහර විට ඵලදායී බව වළක්වන බව බුදුපියාණන් වහන්සේ සැමවිටම පෙන්වා දුන්හ. උත්සාහය වීර්යය යෙදවීමයි. නමුත්, සම්මා වායාම වඩා සියුම් වේ. උත්සාහයට වඩා සියුම් වෙනස් කම් ඇත. එය බෝට්ටුවක් පැදවීම වැනි දෙයක් ලෙස සැසඳිය හැකිය. යම් කෙනෙකුට යා යුතු තැනට බෝට්ටුව ගෙන යාම හුදෙක් හබලෙන් ඇදීම හා සමාන කාරණයක් නොවේ. පළමුව, හබල එකඟතාවෙන් ඇදිය යුතුයි. අප දියවැලට විරුද්ධව යන විට, අපට

ඉතා තදින් අදින්නට සිදුවිය හැකිය. දියවැල සමග යන විට, අපට කිසිසේත් අදින්නට අවශ්‍ය විය නොහැකිය. හරි දිශාවට යන්නට, අපට අදින්න අවශ්‍ය වන්නේ වම්පස දියවැල පමණයි. අනෙක් වේලාවට දකුණු දියවැල පමණයි. ඒ අනුව, 'නිවැරදි' වන්නට, අනෙක් සාධකවලට විරුද්ධව උත්සාහය සමතුලිත විය යුතුයි. එහි තීව්‍රතාවය අවස්ථාවේ හැටියට ගැළපිය යුතුයි. සැහැල්ලු විය යුත්තේ කුමන අවස්ථාවේවදී ද සහ ක්‍රියාවලි ස්වභාවිකව දිග හැරිය යුත්තේ කුමන අවස්ථාවේ ද යන්න පිළිබඳව අප දැනගත යුතුයි. උවමනාවට වඩා උත්සාහ කිරීම කලබලකාරී ප්‍රතිපල ඇති කරන අතර, ප්‍රමාණවත් තරමට උත්සාහ නොකිරීම ඇණ හිටීමට යොමු කරවන බව බුදුපියාණන් වහන්සේ පහදා දුන්හ (S.I,1). බලන්න **උද්‍යෝගය**

## ඇතුන්

ආසියානු ඇතුන් (ගජ, හත්ථී හෝ නාග) ගොඩබිම වාසය කරන විශාල සතෙකි. ඇතුන්ට සණ අළු පැහැති සමක්, විශාල සහ දික් වූ කන්, හොඬවැල යනුවෙන් හඳුන්වන ග්‍රහණය කළ හැකි නාසයක් ඇත. බෞද්ධ අදහසට අනුව ඇතෙකු 'පූජනීය' යැයි කීම වැරදිය. එයට හේතුව ඇතුන්ට යම් විශේෂ ආධ්‍යාත්මික හෝ පූජනීය වැදගත් කමක් නැති නිසාය. කෙසේ නමුත්, ඇතුන්ට වඩා බොහෝ සෙයින් කුඩා මිනිසුන්ට ඔවුන්ගේ කල්පනාකාරී, පරීක්ෂාකාරී හැසිරීම්, ඉවසීම සහ බුද්ධිය සමගින් ඇතුන් පුහුණු කරන්නට හැකිවීම පිළිබඳව පැරණි බෞද්ධයෝ සැලකිල්ලට ගනිමින් ප්‍රසාදයට පත්වූහ.

ඒ නිසාවෙන් ත්‍රිපිටකය පුරා බුදුපියාණන් වහන්සේ සහ වෙනත් අර්හත්ඵලලාභීන් බොහෝ විට ඇතුන් හා සමාන කර තිබේ.

බුදුපියාණන් වහන්සේ ගසක් පාමුල වැඩ සිටින විට, දෝණට හමුවූ විට, උන්වහන්සේ 'අලංකාර, භක්තිය පුබුදුවමින්, සන්සුන් ඉඳුරන්ගෙන් සහ ශාන්ත මනසින් යුක්තව, මෙල්ල කරන ලද, සුපරික්ෂාකාරී, හැම අතින්ම පුහුණු කළ ඇතෙකු මෙන් සම්පූර්ණ සමාහිත සහ හික්මවීමකින්' පෙනී සිටියහ (A.II,38). බුදුපියාණන් වහන්සේ කිසි විටක උරහිසෙන් හැරී පිටුපස නොබැලූහ. සැම විටම ඇතෙකු මෙන් සම්පූර්ණයෙන්ම හැරී බැලූහ. මෙය උන්වහන්සේගේ 'ඇතෙකුගේ බැල්ම' (D.II,122) ලෙස හැඳින් වේ. බෞද්ධ ග්‍රන්ථවල සඳහන් එක් අපූර්ව කවියක බුදුපියාණන් වහන්සේගේ ගුණ උතුම්, මහේශාක්‍ය ඇතෙකුගේ විවිධ වූ අංගයන් හා සමග සසඳා ඇත. 'මෘදුබව සහ හානියෙන් තොර බව ඇතාගේ ඉදිරිපස කකුල්, සරලබව සහ බ්‍රහ්මචාරීබව පිටුපස කකුල්, දැඩි විශ්වාසය හොඬවැල, උපේක්ෂාව සුදු වර්ණ දළ, සිහිකල්පනාව බෙල්ල, හිස අවධානයෙන් යුතු සැලකිල්ල, ධර්මය ඔහුගේ උදරයයි, සහ හුදෙකලාව වලිගය' ආදී වශයෙනි. හුස්ම පිළිබඳව අවධානය යොමු කරමින් භාවනාව සහ සම්පූර්ණයෙන්ම සංසුන්ව, මෙම බලවත් ඇතා සමාධියෙන් ඇවිදියි, සිට ගනියි, සහ ඉඳ ගනියි. ඔහු සෑම ආකාරයෙන්ම සම්පූර්ණයෙන් පුහුණු වී ඇත, නිපුණය' (A.III,346).

බුදුපියාණන් වහන්සේට ඇතුන් පිළිබඳව විශේෂ ළබැඳියාවක් තිබුණ අතර, උන්වහන්සේ වෙනත් කිසිම සතෙකු පිළිබඳවට වඩා විස්තර කර ඇත.

ඇතුන්ගේ බුද්ධිය, සිහිය, පරීක්ෂාකාරී හැසිරීම සහ විශේෂයෙන්ම පිරිමි ඇතුන් වනයේ හුදෙකලාව සිටින්නට ඇති රුචිය සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේට හැඟීමක් තිබූ බව පෙනේ. උන්වහන්සේ නිරීක්ෂණය කළහ. 'මේ කාරණය පිළිබඳව, රහත්ඵලයට පැමිණි ඉසිවරයන් සහ දළ සහිත ඇතුන් අමාරුවෙන් ඉදිරියට යමින් ප්‍රතිවිරුද්ධ මත එකඟ වන තුරු, මේ දෙදෙනාම වනයේ හුදෙකලාවට ආදරය කරති' (Ud.42). සමහර අතින්, මිනිසුන්ට වඩා ඇතුන් හොඳ යැයි ද බුදුපියාණන් වහන්සේ සැලකූ සේක. වරක් ඇතුන් පුහුණු කරන්නෙකු වූ පෙස්ස බුදුපියාණන් වහන්සේට මෙසේ පැවසූවේය: 'මිනිසුන් සංකූල වන අතර සතුන් අවංක වේ. මට ඇතුන් පුහුණු කිරීම් මෙහෙය විය හැකිය. චම්පාවලට ගොස් ආපසු එන්නට යන කාලය තුළදී, එම ඇතා සියලු ආකාරයේ මුරණ්ඩුකම්, කලහ සහ රැවටිලි මේ කාලය තුළදී පෙන්වයි. නමුත්, අපගේ වැඩකරන්නන්, පණිවුඩකරුවන් සහ සේවය කරන්නන්, කියන්නේ එකකි, කරන්නේ තවත් එකකි. සිතන්නේ තවත් එකකි.' බුදුපියාණන් වහන්සේ පෙස්ස සමඟ එකඟ වූහ (M.I,340). සමහර විට බුදුපියාණන් වහන්සේගේ අතිශය ප්‍රසන්න සහ හොඳින් දන්නා උපමා කථාව වන්නේ අන්ධ මිනිසුන් සහ ඇතා පිළිබඳවය. (Ud.68-9).

## හිස්බව

හිස් හෝ ශූන්‍ය (සුඤ්ඤ) ඇතුළත කිසිවක් නැති බව හෝ හරයක් නැති ස්වභාවයයි. ඒ අනුව ගෙයක් හිස් යැයි කියන්නට පුළුවනි. එසේම අවංක නොවන පොරොන්දුවක් හිස් යැයි කියන්න පුළුවනි. ශෝභන, නිශ්ශබ්ද සහ විවේකී අවකාශයක් හැඳින්වීමට සමහර

විට ත්‍රිපිටකය 'හිස්' හෝ 'හිස්බව' යන වචන භාවිත කරයි. ඒ අනුව, සමහර විට රහත්ඵලයට පත්වූ පුද්ගලයන්, විශේෂයෙන්ම බුදුපියාණන් වහන්සේ පිළිබඳව කථා කරන විට: 'තථාගතයන් වහන්සේලා හිස් ස්ථානවලදී : සුඤ්ඤාගාරෙසු ... තථාගතා අභිරමන්ති, Vin.II,158) අතිශයින් සතුටට පත්වෙති.' නමුත්, සියලු සම්මුතියකට එළඹී දේවල් හිස් යැයි වදාරමින් බුදුපියාණන් වහන්සේ අදහස් කළේ ඒවාට ආත්ම ස්වභාවයක් නැති නිසාත්, ඒවා නන්දෙසින් එක් තැනකට රැස්වෙන දේවල්වල ප්‍රතිඵලයක් ලෙස පවත්නා දෙයක් වීම නිසාත්ය. ඒ අනුව, බුදුපියාණන් වහන්සේගේ දේශනා තුළින් වදාරණ හිස් වීම යනු අනත්තා යන වචනයට ආදේශයකි. වරක් ආනන්ද හිමියන් 'ලෝකය හිස්' යන ප්‍රකාශයේ අර්ථය කුමක් ද කියා බුදුපියාණන් වහන්සේගෙන් ඇසූ විට උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ 'ඒ ලෝකය ආත්මයෙන් හිස් හෝ ආත්මයට අයත් දෙයින් හිස් නිසාය'(S.IV,54). බුදුපියාණන් වහන්සේ ශූන්‍යවාදියෙක් හෝ උන්වහන්සේ ඉගැන්වූ සියලු දේ හුදෙක් මිථ්‍යාවක් යන්න වැරදිය. සමහර පසුකාලීන මහායාන බුදුදහමේ ගුරුකුල හිස්බව මනස පිළිබඳ දර්ශනයක් පාදක කරගත් මූල ධර්මයක් හෝ යම් ආකාරයේ විශ්වයට අයත් දෙයක් ලෙස ද දකින්නට නැඹුරු විය. එවැනි මත හිස්බව පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ අදහසින් වෙනස් වේ. බලන්න **පටිච්ච සමුප්පාදය සහ ආත්මය**

## අවබෝධයට පත් වීම

අවබෝධයට පත් වීම යනුවෙන් අදහස් කරන්නේ පහදා ගැනීමයි. බෝධි යන පාලි වචනය සාමාන්‍යයෙන් අවබෝධයට පත්වීම යනුවෙන් පරිවර්තනය වේ. එහි අදහස 'ප්‍රබුද්ධ වීමයි' හෝ 'පහදා ගැනීමය', ඇස් ඇරීමයි. බුදුදහම පුහුණුවේ ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයෙකු, නොසෑහෙන (දුක්ඛ), අනිත්‍යවූ (අනිච්ච) සහ ආත්මයක් නැති (අනත්ත) කොන්දේසි සහිත ප්‍රපඤ්චමය ස්වභාවය පිළිබඳව ගැඹුරෙන්, සම්පූර්ණයෙන් සහ ඍජුව අවබෝධ කරගත් විට, ඔහු අර්හත්ඵලයට පත්වූ බව සඳහන් වේ. සම්පූර්ණයෙන්ම ඉබේම මෙම අවබෝධය පුද්ගලයෙකුගේ අත්දැකීම් සහ හැසිරීම්වලට මූලික වෙනසක් ඇති කරයි. ඉච්ඡා භංගය, කාංසාව සහ බිය වෙනුවට සැනසිල්ල සහ ප්‍රීති ප්‍රමෝදය ආදේශ වෙයි. අවබෝධයට පත් වූ පුද්ගලයෙකු බුදුන් වහන්සේ හෝ අර්හත්ඵල ලාභියෙකු (ඔවුන් අතර සුළු වෙනසක් සහිතව) වශයෙන් හැඳින් වේ. එම තත්ත්වයම බොහෝ විට නිර්වාණය වශයෙන් ද හැඳින් වේ.

බුදුපියාණන් වහන්සේට අනුව අවබෝධය ඇතිවන්නේ පියවර හතරකිනි. හැම එකක්ම ක්‍රියාත්මක වන්නේ විශේෂ ආධ්‍යාත්මික ගුණාංග පෙනී සිටීමෙන් සහ නිශ්චිත සත්‍යයන් අවබෝධ වීමෙනි. මෙම පියවරයන්ගෙන් පළමුවැන්න සෝවාන් ඵලයට (සොතාපත්ති) පත් වීමයි. සම්පූර්ණ අවබෝධයට අපේක්ෂිත ආකාරයට, විනාඩි ගණනාවකදී හෝ සමහර විට උත්පත්ති කිහිපයකින්

නියත වශයෙන් යොමු කරන ක්‍රියාපද්ධතියක් ක්‍රියාත්මක කරයි. සෝවාන්ඵලය විස්තර වන්නේ තුන් සරණ (අවෙච්චපසාද), පහසු සහ ස්ථීර සුචරිතයක් (සීල), කය ආත්මය නොවේ යැයි (සක්කායදිට්ටි) අවබෝධකර ගැනීම සහ පවත්නා තත්ත්වයක හෝ සදාචාරයට ඇලීම (සීලබ්බතපරමාස) නැසීමෙන් අචල හැඟීමෙන් යුක්ත විශ්වාසය නිරූපණය වීමකින්ය D.III,227). අනෙක් පියවරයන්, එක් වරක් පැමිණෙන හෙවත් සකෘදාගාමී (සකදාගාමිතා), නැවත නොඑන හෙවත් අනාගාමී (අනාගාමිතා) සහ අවසාන පියවර වන සම්පූර්ණ අවබෝධය (අරහත්ත) වශයෙනි. බලන්න **ගුඪවාදී**

## අවබෝධයේ සුවිශේෂ කොටස්

සමහර අවස්ථාවල බුදුපියාණන් වහන්සේ වෙනත් තැන්වල විස්තරාත්මකව පැහැදිලි කළ දේ කෙටියෙන් පසුව සංක්ෂිප්ත්ව දැක්වූහ. යථාර්ථය වටහා ගැනීමට උපකාරවන විවිධ මානසික තත්ත්වයන් සංක්ෂිප්ත කිරීමේදී බුදුපියාණන් වහන්සේ ප්‍රධාන කරුණු හතක් හඳුනාගෙන ඇත (M.III,223). ඒවා අවබෝධයට විශේෂ කොටස් හත හෙවත් සප්ත බොජ්ඣංග වශයෙන් හැඳින් වේ. (සත්ත බොජ්ඣංග). ඒවා සිහිකල්පනාව (සති), මානසික ප්‍රපඤ්ච විමසීම (ධම්මවිචය), වීර්යය (විරිය), ප්‍රීතිය (පීති), නොකැළඹුණබව (පස්සද්ධි), ඒකාග්‍රතාව (උපෙක්ඛා).

සිහිකල්පනාව අපට යථාර්ථයේ අරමුණු දැකීමට ඉඩ සලස්වයි. ඒවායේ ස්වරූප සියුම්ව පිරික්සීමට සහ

ගවේෂණය කිරීමට අප උත්සාහයක් දරන විට, ඒවායේ වෙනස්වනසුළු, ප්‍රමාණවත් නොවන, සහ පුද්ගලිකත්වයක් නොහඟවන ස්වභාවය අපට පෙනෙන්ට පටන් ගනී. අපගේ ආධ්‍යාත්මික ප්‍රාර්ථනාවලට සතුට ලබා දෙයි. එවිට එය හුදෙක් නිරන්තර වෙහෙසක් බවට පත් නොවේ. අප යන ගමනේදී අපට නියත වශයෙන් මුහුණ දීමට සිදුවන උඩු යටිකුරු හමුවේ ඒකාග්‍රතාව අපගේ සමබරතාව රැකගැනීමට අපට උපකාරී වේ. සමාධිය අවධානය සහ වීර්යය එක්තැන් කරයි. එවිට අපගේ උනන්දුව පිරිහී නොයයි. එසේම අප වෙනතකට යොමු වන්නේද නැත. අවසානයේ, උපේක්ෂාව සිත අවුල් කරන සිතුවිලි සහ හැඟීම් නිහඬ කරයි. එවිට මනස පැහැදිලි කර භාවනාව පහසු කරයි (D.II,79).

## **ව්‍යවසායක කුසලතා**

ව්‍යවසායක කුසලතා (ව්‍යාපාරකුසල) යනු ව්‍යාපාරයක් ආරම්භ කිරීමට, පවත්වා ගෙන යාමට සහ පුළුල් කිරීමට භාවිත කරන කුසලතා වේ. දරිද්‍රතාවෙන් සිට ධනවත් මිනිසෙකු දක්වා එක් තරුණයෙකු ගිය ආකාරය, එසේ සිද්ධ වීමට ඔහු ගත් ව්‍යාපාරමය තීරණ හත සහ ඔහු භාවිත කළ විවිධ උපක්‍රම පිළිබඳව ජාතක කතාවක සඳහන් වේ.

එක් දිනක් රජුගේ භාණ්ඩාගාරික මාළිගාවට යමින් සිටියදී ඔහු පාරේ මියගිය මීයෙකු දැක තමන්ගේ මිතුරෙකුට පැවසුවේ යම් කෙනෙකුට තමන්ගේ බුද්ධිය පාවිච්චි කරමින් මියගිය මීයෙකුගෙන් වුවත් මුදල් ඉපයිය හැකි බවයි. මෙය ඇසුණු එක් තරුණයෙකු භාණ්ඩාගාරික යනු තමා කතා කරන දේ

දන්නා කෙනෙකු බව අවබෝධ කරගෙන, මීයා ඔසවා විමසීම් කිහිපයක් කර, අවන්හල් හිමියෙකුට ඔහුගේ බළලාට කෑම පිණිස විකිණුවේය. එය විකිණීමෙන් ඔහුට ලැබුණු එකම කාසිය යොදමින් ඔහු උක් සීනි සිරප් යම් ප්‍රමාණයක් සහ භාජනයක් මිලදී ගෙන, එයට ජලය මිශ්‍ර කළේය. මල් එකතු කරන්නන් කණ්ඩයමක් වනයේ සිට වෙහෙසට පත් වී ආපසු එන විට ඔහු ඔවුන්ට එම බීම පිරිනැමුවේය. ඔවුහු ඔහුට මල් මිටක් දුන්හ. ඒවා ඔහු අලෙවි කළේය. සෑම දිනකම ඔහු එසේ කර, තමන්ගේ සුළු මුදල අට ගුණයකින් වැඩි කර ගත්තේය.

එක් දිනක් හදිසියෙන් හමා ආ කුණාටුවක් නිසා රාජකීය උයනේ ගස්වල සියලු අතු සහ කොළ කඩා වැටුණි. මේ පිළිබඳව ඇසූ මේ මිනිසා එහි ගොස් සියලු අතු සහ කොළ තමන්ට ලබා ගැනීමට හැකි නම්, ඒවා පිරිසිදු කරන්නට කැමැත්ත පළ කළේය. උයනේ ඇති අවුල් ස්වභාවය පිරිසිදු කරන්නේ කෙසේ ද යැයි සිතමින් සිටි උයන්පල්ලා මෙය අසා බොහෝ සෙයින් මෙම අදහසට කැමැති විය. තරුණයා ප්‍රදේශයේ සෙල්ලම් පිට්ටනියට ගොස් එහි සිටි දරුවන්ට කථා කර ඔවුන් තමන්ට උපකාරයක් කරන්නේ නම් තමන්ද ඔවුන්ට පැණි බීම ලබා දෙන්නට පොරොන්දු විය. එම කාර්යය සෙල්ලමකට පරිවර්තනය කරමින් දරුවෝ උයන පිරිසිදු කර ගස්වල අතු ගේට්ටුව ළඟ ගොඩ ගැසූහ. ඒ මාර්ගයේ ගිය මැටි බඳුන් තනන්නෙක් ලී ගොඩ දැක ඒවා සියල්ල පෝරණුවේ දර සඳහා මිලදී ගත්තේය. තරුණයාට ඔහුගේ මුළු මුදල දෙගුණයක් කර ගැනීමට හැකි විය. ඔහු මෙම මුදලෙන් කොටසක් යොදවා එක් විශාල කළයක් සහ කුඩා ඒවා බොහෝ

ප්‍රමාණයක් මිලදී ගෙන ඒවා නගරයේ ප්‍රධාන ගේට්ටුව ළඟ තබා, ඒ අසලින් යන තණකොළ කපන්නන්ට ජලය ගෙවීම් රහිතව සැපයුවේය. ඔහුගේ කරුණාවට ඔවුන් ප්‍රතිඋපකාර කරන්නේ කෙසේද කියා ඔවුන් ඇසූ විට ඔහුගේ පිළිතුර වූයේ තමන්ට උපකාරයක් අවශ්‍ය වූ විට ඔවුන්ට දැනුම් දෙන බවයි. තරුණයා ඊට පසු සංචාරය කරන වෙළෙන්දෙකු සහ නැවියෙකු සමග මිතුරුකමක් ඇති කර ගත්තේය. එක් දිනක් වෙළෙන්දා අශ්ව වෙළෙන්දෙකු පසු දින අශ්වයන් 500ක් සමග නගරයට පැමිණෙන බව ඔහුට කීවේය. තරුණයා තණකොළ කපන්නන්ට කියා සිටියේ පසුදින තමන්ට තණකොළ මිටිය බැගින් ලබා දෙන්නටත්, තමන් ඒවා විකුණා අවසාන වනතුරු ඔවුන්ගේ ඒවා නොවිකුණන ලෙසත් එකඟ කර ගත්තේය. අශ්ව වෙළෙන්දා පැමිණි විට ඔහුට කොහේවත් තණකොළ මිලදී ගන්නට බැරිවූ විට, ඔහු තරුණයාගෙන් ඉහළ මිලකට ඔහු සතු සියලු තණකොළ මිලදී ගත්තේය. මේ වනවිට තරුණයා කාසි දාහක් එකතු කරගෙන සිටියේය. දින කිහිපයකට පසුව, තරුණ ව්‍යවසායකයාට තමන්ගේ මිතුරු නැවියාගෙන් දැනගන්නට හැකිවූයේ විශාල නැවක් නොබෝ දිනකින් පැමිණෙන බවයි. ඔහු මිල අධික වාහනයක් කුලියට ගෙන වරායට එය පදවාගෙන ගියේ උදාර විලාසයකිනි. මුළු බඩුතොගයම ණයට ගැනීමට ඔහුගේ රත්රන් මුදුව ඇපයක් වශයෙන් තබමින් සාකච්ඡා කර ගත්තේය. පසු දින ඔහු වරායට නොදුරින් කුඩාරමක් ඉදිකර, මිනිසුන් කිහිප දෙනෙකු කුලියට ගෙන, යම් කෙනෙකුට ඔහු හමු වීමට අවශ්‍ය නම්, එසේ කිරීමට පෙර, ඔවුන් දොරටු පාලයන් තිදෙනෙකු පසු කර යායුතු බවයි. නැව පැමිණි පසු,

නගරයේ වෙළෙඳුන් වරායට ගිය විට දැනගන්නට හැකිවූයේ උසස් වෙළෙන්දෙකු මුළු බඩුතොගයම ණයට ගත් බවයි. එකිනෙක බැගින් ඔවුහු තරුණයා හමු වීමට දොරටු පාලයන් හරහා ගිය විට ඒ සැම දෙනාට බඩු තොගයෙන් කොටසක් මිලදී ගන්නට හැකිවිය. පසුව තරුණයා පොහොසත් වෙළෙන්දෙකුගේ දියණියක් විවාහ කරගෙන ඊට පසු සතුටින් ජීවත් විය (Ja.I,120-22).

මෙම කථාවේ නිරූපණය කර ඇති උපක්‍රම බොහොමයක් වර්තමානයේ ව්‍යාපාර අධ්‍යයන පාසැල්වල උගන්වන දේවලට සමානය. කථාව පුරාම, තරුණයා නිරූපණය කර ඇත්තේ විශ්වසනීය, ප්‍රත්‍යක්ෂ කරගත හැකි සහ අවස්ථානුකූලව කටයුතු කරන, ඕනෑම ආයතනයක සාර්ථකත්වයට අවශ්‍ය ගුණාංග ඇත්තෙකු ලෙසයි. සාර්ථකත්වය සඳහා ඇති මාර්ගයකට ඔහුගේ පියවර වූයේ, ප්‍රවීනයන්ගේ අදහස් අවධානයට ගැනීමට තිබූ හැකියාව, සහ පෙනෙන ආකාරයට කෙතරම් ඵල සහිත වේදැයි සැක සහිත වුවත් එය අවධානයට නොගෙන එම කටයුත්ත ආරම්භ කිරීමට තිබූ සූදානමයි. ඔහුට පැහැදිලිව ඔහු තුළ අදහසක් සහ විශ්වාසයක් තිබුණි. ඊළඟට ඔහු අවශ්‍යතා පිරික්සීමක් සිදු කළේය. මිල නියම කිරීමේ උපක්‍රමයක් සහ භාණ්ඩයක අගය වැඩි කිරීම් ප්‍රමාණයක් ඉදිරිපත් කළේය. අනෙක් අය ප්‍රශ්නයක් ලෙස පමණක් දුටුදේ අවස්ථාවක් ලෙස දැකීමට සහ මිනිසුන් පෙළඹවීමට ඔහුට හැකියාවක් තිබුණි. ඊළඟට ඔහු ස්ථාපිත ජාලයක්, හිතවතුන්ගේ සැලැස්මක් සහ කෙළින්ම මුල්තැනින්ම ලබාගත් වෙළඳපොළ තොරතුරු භාවිත කළේය. තණකොළ කපන්නන් සමග ඔහු ඇතිකර ගත් එකඟතාව දැන්

ආචාර සම්පන්න නොවන බවට සලකන වෙළෙඳපොළ හැසිරවීමකට සමාන වේ. ඔහු පැහැදිලිවම ආත්ම විශ්වාසය සහිත වූ අතර, එම විශ්වාසය අනෙක් අය අතරත් බෙදා හැරිය යුතු බවත් ඔහු තේරුම් ගත්තේය. ඔහු එය කළේ ප්‍රායෝගික දැනීම සහ සාර්ථකත්වය පිළිබඳව ඔහු කෙරෙහි ප්‍රතිරූපයක් නිර්මාණය කරමින්ය. තමන් පිළිබඳව සහ වෙළඳපොළ පිළිබඳ වාණිජමය ප්‍රඥාව සම්බන්ධයෙන් නිශ්චිත වෙමින්, සැලසුම් කළ සහ සම්පූර්ණයෙන්ම සාර්ථක අවදානමක් ඔහු ගත්තේය. ඔහුගේ විශ්වාසය ගොඩනැඟීමේ උපක්‍රමය ශක්තිමත් කරමින්, තමන්ට උපරිම ලාභ ලබා ගැනීමේ ගනුදෙනුවට සමීප වීම සඳහා ඔහු වෙළඳපොළ බණ්ඩයක පළමු වැදගත් අයිතිකරු ලෙස ලාභ ලබා ගැනීමට කටයුතු කළේය.

මෙම කථාව අවසාන වන්නේ මෙසේ කියමින්ය: 'ස්වල්ප ආයෝජනයකින් ආරම්භ කරමින්, සූර සහ සහජ හැකියා ඇති පුද්ගලයෙකුට පිඹීමෙන් කුඩා දැල්ලක් වර්ධනය කළ හැකි ආකාරයෙන්ම තමන් ඔසවා තැබිය හැකි බවයි' (Ja.I,123). මෙතැන සහ වෙනත් බොහෝ දේශනා තුළින් බුදුපියාණන් පැහැදිලි කළේ ගිහි පුද්ගලයන්ට ධනය සැලසුමක් අනුව යෙදවීම වැදගත් ඉලක්කයක් බවයි. නමුත් එය 'නීත්‍යානුකූලව සහ සාධාරණව' (ධම්මිකා ධම්මලද්ධා A.II,67), ඉපැයූ, අනෙක් අය සමග බෙදා ගත්, සහ සීමාව තේරුම් ගත් දෙයක් විය යුතුයි. මෙසේ කළහොත්, එම ධනය සැලකිය යුතු තරම් සතුටකට (භෝගසුඛ, A.II,69) උල්පතක් වේ. එය බුදුපියාණන් වහන්සේ හැඳින්වූයේ 'හරියාකාරව භාවිත කළ

යහපත සහ බුද්ධිමත්ව භාවිත කළ ධනය ලෙසයි' (ඨානගතා, පත්තගතා, ආයතනසෝ, A.II,68) බලන්න **දියුණුවීමේ අභිලාෂය සහ ප්‍රාර්ථනාව**

## විශේෂණයක්

විශේෂණයක් යනු (පරියාය හෝ වෙවචන) යම් දෙයක ගතිලක්ෂණ හොඳින් සම්පිණ්ඩනය කරන වචනයක් හෝ වාක්‍ය ඛණ්ඩයකි. බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල සම්පිණ්ඩනයක් ලෙස කිව හැකි පද හතරක් ඇත: (1) 'නරක සැම දේ මඟ හරින්න, හොඳ දේ දියුණු කරමින් මනස පිරිසිදු කරන්න, මේ බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීමයි.' (2)' අපහාස නොකරමින්, හිංසා නොකිරීම, පැවිදි නීතිවලට අනුකූලව ජීවත්වීම, මධ්‍යස්ථව ආහාර ගැනීම, හුදෙකලාව ජීවත්වීම සහ මනස පුහුණු කිරීම, මේ බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීමයි.' (3) ගැටුම් උවදුරක් හැටියට සහ එකඟතාව සාමය හැටියටත් දකිමින්, සමගියෙන් සහ කරුණාවන්ත හදවතකින් වාසය කිරීම, මෙය බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීමයි' (4) 'ආදරය තමන් කෙරෙහි සහ අනෙක් අය කෙරෙහි වර්ධනය කළ යුතුයි, සියලු දෙනා කෙරෙහි ආදරය පැතිරවිය යුතුයි, මෙයයි බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම' (Dhp.183; 185; Cp.3,15,13; Mil.394). මෙම විශේෂණවල කරුණු දෙකක් වහාම ප්‍රත්‍යක්ෂ වේ. පළමු වැන්න නම් බුදුදහම මූලික වශයෙන් සැලකිලිමත් වන්නේ කෙනෙකුගේ විශ්වාසයන්ගේ ස්වභාවය ගැන නොව, කෙනෙකුගේ හදවතේ ගුණාත්මක භාවය ගැනය. දෙවන කාරණය වන්නේ මනස පිරිසිදු කිරීමට සහ ආදරයේ විවිධ ප්‍රකාශයන් පහළ කිරීම පිළිබඳව බුදුදහම දෙන්නාවූ

වැදගත් කමයි.

බෞද්ධයෙකු යනු බුදුපියාණන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබන්නෙකු නොවේ. ඒ පුද්ගලයා, කථාවේ කරුණාවන්ත (සබ්බ), සාමය සඳහා කටයුතු කරන්නට උත්සාහ දරන්නෙකු (සමග්ග) සහ තමන්ගේ ප්‍රජාව තුළ එකඟතාවයෙන් සිටීම (අවිවාද) තමන්ගේ හදවතේ මෛත්‍රිය ගොඩනඟන (මෙත්ත භාවනාව) සහ තමන් ඇතුළු සෑම දෙනා කෙරෙහිම එම මෛත්‍රිය පතුරුවන (මෙත්තචිත්තේන ඵරිතබ්බ) පුද්ගලයා බෞද්ධයෙකු වේ. බලන්න **කුලය**

## උපේක්ෂාව

උපේක්ෂාව (උපෙක්ඛා) යනු විශේෂයෙන්ම දුෂ්කර අවස්ථාවලට මුහුණ දෙන්නට සිදුවෙන අවස්ථාවලදී පවා චිත්ත වේගය සන්සුන්ව, මැදහත්ව තබාගෙන සිටීමේ ගුණාංගයයි. සමහර විට එය සමතුලිතතාව (සුසමාහිත) හෝ මධ්‍යස්ථවීම (මජ්ඣත්ත) වශයෙන් ද හැඳින් වේ. උපේක්ෂාව සතර බ්‍රහ්මවිහාරවල අවසාන අංගයයි. එය ආදරය ප්‍රකාශ කළ හැකි එක් ක්‍රමයකි. අපට පීඩා කර ඇති හෝ වරදට සමාව නොඉල්ලූ පුද්ගලයෙකුට මිත්‍රශීලී ලෙස සැලකීම පවා දුෂ්කර විය හැකිය. නොහැකි විය හැකිය. අපට එවැනි අයට මෛත්‍රිය පළ කළ හැක්කේ සන්සුන්ව සිටීමෙන්, නොසැලී සහ අවෛරයෙන් සිටීමෙනි. මෙම ආකල්පයෙන්, අප අපගේ මෛත්‍රිය වඩා ශක්තිමත්ව දියුණු කරගෙන සිටි විට, එම පුද්ගලයා සමග විවෘතව කථා කරන්නට වඩා පහසු වේ. උපේක්ෂාව බොහෝ වරදට පෙළඹවීම්වලට,

ප්‍රකෝපනයන්ට සහ දෛනිකව අපට පහර දෙන ඓන්ද්‍රීය හැඟීම්වලට ප්‍රතිචාර දැක්වීමට සූක්ෂම මාර්ගයකි. එය අපගේ හැඟීම් සමතුලිතව තබා ගැනීමට ඉඩ ලබා දෙන බව, බුදුපියාණන් වහන්සේ 'සමාන නොවන දෙයක් මත සමානව ඇවිදින්න' පැවසූ සේක (S.I,4).

සමහර විට, උදාසීනත්වයට උපේක්ෂාව යැයි පටලවා ගැනීම් සිදුවිය හැකිය. නමුත්, මේ දෙකේ වෙනස හඳුනා ගැනීම සැබැවින්ම පහසුය. ඇවිස්සීම හෝ කැළඹීම, නුසුදුසු, අසාධාරණ හෝ ප්‍රයෝජනයක් නොවන බව අප තේරුම් ගෙන සන්සුන්ව සහ නොසැලී සිටී නම්, එය උපේක්ෂාව ලෙස හැඳින් වේ. අපට වද වීමට නොහැකි නිසා හෝ අප හුදෙක් සැලකිල්ලක් නොදක්වන නිසා අප නොසැලී සහ නොපටලැවී සිටිනවා නම්, එය උදාසීනත්වය ලෙස හැඳින්වේ. උපේක්ෂාව වැඩෙන්නේ දැණුමෙන් වන අතර, උදාසීනත්වය වැඩෙන්නේ අවිද්‍යාව හෝ ආත්මාර්ථකාමිත්වය නිසාය.

## වරම් ලැබූවන්ට පමණක් තේරෙන ගුප්තවිද්‍යාව

සමහර ආධ්‍යාත්මික ඉගැන්වීම් බහුතරයකගෙන් රහසක්ව තබාගෙන තෝරාගත් සුළු පිරිසකට පමණක් හෙළි කළ යුතුය යන අදහස වරම් ලැබූවන්ට පමණක් තේරෙන ගුප්තවිද්‍යාවෙන් අදහස් වේ. බුදුපියාණන් වහන්සේගේ කාලයේ හෝ ඊට මඳක් කලින් මුල් කාලයේ රචිත උපනිෂද්, ගුරුවරයාට සම්පූර්ණ පක්ෂපාතීත්වය පොරොන්දු වූ ඉහළ කුලයේ මිනිසුන්ට පමණක් ලබා දුන් රහසිගත ඉගැන්වීම් වේ. ටිබෙට් බුදුදහමේ හෝ වජ්‍රයාන

බුදුදහමේ පවා සමහර ඉගැන්වීම් ඒවා ආරම්භ කළ අයට පමණක් වෙන්කර ඇත.

ධර්මය 'විශේෂ කණ්ඩායමකට' සීමා කිරීම හෝ තනි අයිතියක් පවත්වා ගැනීමේ අදහස බුදුපියාණන් වහන්සේට අතිශය අප්‍රසන්න දෙයක් විය. තමන්වහන්සේ ඉගැන්වූ සත්‍යය සියලු දෙනාට අවබෝධ කරගත හැකි, සියලු දෙනාට අදාළ සහ සුදුසු දෙයක් ලෙස බුදුපියාණන් වහන්සේ ප්‍රත්‍යක්ෂ කරගත්හ. එක් අවස්ථාවකදී උන්වහන්සේ මෙසේ පැවසූහ: 'දේවල් තුනක් විවෘතව බැබලේ, රහසේ නොවේ. ඒ තුන මොනවාද? සඳේ ගෝලය, සූර්යයාගේ ගෝලය, සහ ධර්මය සහ තථාගතයන් වහන්සේලාගේ පුහුණුවයි' (A.I,283). මෙම කරුණ බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ පරිනිර්වාණයට මොහොතකට පෙරත් නැවත වදාළහ: 'සැඟවුණු හෝ විවෘත ඉගැන්වීමක් පිළිබඳ කිසිදු අදහසක් නොමැතිව මම ධර්මය අනාවරණය කර ඇත්තෙමි. කිසිවක් රඳවා නොගන්නා ගුරුවරයාගේ සංවෘත මුෂ්ටිය මා සතුව නැත' (D.II,100). අවංක ගුරුවරයෙකුගේ එක් සලකුණක් වන්නේ ඔහු 'කිසිවක් රහසේ තබා නොගැනීම සහ කිසිම දෙයක් රඳවා නොගැනීම' බව මිලින්දපඤ්හයේ සඳහන්ය (Mil.94). බලන්න **ගුරුවරු සහ ශ්‍රාවකයන්**

## දුෂ්ටකම

දුෂ්ටකම (පාප) යනු අතිශය ඍණාත්මක භාවයේ බලපෑමක් හෝ පෙනී සිටීමක් ඇති වීමයි. බොහෝ ආගම්වලට අනුව, දුෂ්ටකම ඇතිවීමේ ආරම්භය

විපත්ති ඇති කිරීමට හේතුවන සහ මිනිසුන් වැරදි කිරීමට පොළඹවන යක්ෂයා හෝ සාතන් නමින් හඳුන්වන විශේෂ ජීවියෙකුගෙන් ඇති වේයැයි විශ්වාස කෙරේ. බුදුදහමට අනුව, දුෂ්ටකම නිශ්චිතවම කෲරකම, සාතන, කැදරකම සහ සොරකම යන ස්වරූපයෙන් පවතියි. නමුත්, එය මිනිස් හදවතේ ජීවත්වන ලෝභයෙන්, වෛරයෙන් සහ අවිද්‍යාවෙන් ඇති වේ. එය ඇතිවන්නේ බාහිර බලවේගයකින් නොවේ. ඒ අනුව, බෞද්ධයන්ට දුෂ්ටකම වළක්වා ගත හැක්කේ සදාචාරමත් අධ්‍යාපනය - පෞද්ගලික සහ සමාජීය වශයෙනි. භූතයන් පළවා හැරීම්, මන්ත්‍ර හෝ හිතන පරිදි පූජා පවත්වා යක්ෂයන් එළවා දැමීම හෝ ගැලවීමට බැරි සේ කොටු කිරීමෙන් එය කළ නොහැකිය. බලන්න **අයිතිය**

*Buddhism and the Mythology of Evil*, T. Ling, 1965.

## පරිණාමය

පරිණාමය යනු විපර්යාසාත්මක ක්‍රියාවලියක්, ස්වභාවික තෝරාගැනීමක් සහ නොනැසී පැවැත්මට දරන අරගලයක් හරහා පරිසරයේ තිබෙන වෙනස්වීම්වලට සුදුසු සේ ජීවිතය ක්‍රමයෙන් සකස්වීම පිළිබඳ විද්‍යාත්මක සංකල්පයයි. මෙම අදහස පළමුව විස්තර කරනු ලැබුවේ 1859දී චාල්ස් ඩාවින් විසිනි. එය දැන් සියලු විද්‍යාවන් අතර වඩාත් පිළිගත් මූලික මූල ධර්මයයි. ත්‍රිපිටකයේ නිශ්චිතව සඳහන් කර නොතිබුණද, ජීවත්වීමට ඇති තෘෂ්ණාව (භවතණ්හා), සැමදෙයක්ම වෙනස්වන බව (අනිච්ච), සහ දෙවියන්ගේ මැවීම්වලට වඩා සියලු දේ හටගන්නේ ස්වාභාවික හේතූන් නිසා බව යන

බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් සමග පරිණාමය පිළිබඳ අදහස අනුකූල වේ. පෘථිවිය බිහිවූ පසු, එය සම්පූර්ණයෙන්ම ජලයෙන් වැසුණු බවත්, පළමු ජීව ස්වරූපය පෘථිවිය මත පෝෂණය වෙමින් පැවී ඇති බවත්, ඒවා ක්‍රමයෙන් අතිවිශාල කාල පරාසයක් තුළ සරල තත්ත්වයේ සිට සංකීර්ණ තත්ත්වයකට පරිණාමය වූ බවත්, බුදුපියාණන් වහන්සේ අග්ගඤ්ඤ සූත්‍රයෙහි වදාරා ඇත (D.III,84-88). මිනිසුන් දෙවියන් වහන්සේ විසින් සිදු කරන ලද විශේෂ නිර්මාණයක් ලෙස උගන්වන දේවවාදී ආගම්වල අදහසක් වූ මිනිසුන් පහත් සත්ත්වයන්ගෙන් පරිණාමය වන්නට ඇතැයි යන්න බලවත් අපහාසයකි. බෞද්ධයන් සැමවිටම විශ්වාස කර ඇත්තේ සතුන් ආදරය හා ගෞරවය ලැබීමට යෝග්‍ය බවත්, සමහර විට මිනිසුන් සතුන් ලෙසත්, සතුන් මිනිසුන් ලෙසත් නැවත ඉපදිය හැකි බවත් යන්නයි. එමනිසා, ඔවුහු පරිණාමය යන සංකල්පය හා අස්වැසීමක් ලබති.

## අමතර පෘථිවියෙහි ජීවිතය

පෘථිවියෙන් ඔබ්බට පිහිටි ස්ථානවල විවිධ වර්ගයේ ජීවීන් - දෙවිවරු, දේවතාවන්, ආත්මයන් ආදිය සාමාන්‍යයෙන් දිව්‍යලෝකය යන ස්ථානයේ ජීවත්ව සිටිය බවට විවිධ සංස්කෘතීන්වල මිනිසුන් බොහෝ කාලයක සිට විශ්වාස කර ඇත. නූතන තාරකා විද්‍යාවේ දියුණුව හා විශ්වය පිළිබඳ වඩාත් යථාර්ථවාදී අවබෝධයක් පුළුල්ව ව්‍යාප්ත වූ පසු, වෙනත් ග්‍රහලෝකවල ජීවයක්, බුද්ධිමත් ජීවයක් පවා තිබිය හැකි ද යන්න ගැන මිනිසුන් අනුමාන කර ඇත. 'චන්ද්‍රයාගේ සහ සූර්යයාගේ ආලෝකය බලවත්

සහ මහේශාක්‍ය වුවත්, ළඟා විය නොහැකි' හෝ අප අන්තර් ගැලැක්සියේ අවකාශය ලෙස හඳුන්වන ලෝක පද්ධති අතර, 'කළු, අඳුරු ආලෝකය නැති අවකාශයන්' ගැන බුදුපියාණන් වහන්සේ අච්ඡරියාබ්භූත සූත්‍රයෙන් කථා කළහ. ඒවායේ ජීවීන් සිටින බව ද උන්වහන්සේ පැවසූහ (M.III,123-4). මෙම විස්තරය දෙවිවරුන් ආදින් ගැන සඳහන් කරන බව පෙනේ. ග්‍රහලෝකවල වාසය කරන මූර්තිමත් ජීවීන් ගැන සඳහන් නොවේ. නමුත් ග්‍රහලෝකවල සැබැවින්ම පදිංචිව සිටින පැහැදිලි ස්වරූපයකින් යුක්ත ජීවීන්ට අදාළ නොවේ. බුදුපියාණන් වහන්සේ පැවසූ කිසිවක් වෙනත් ග්‍රහලෝකවල ජීවීන් සිටිය හැකි යැයි යෝජනා නොකරන නමුත්, උන්වහන්සේගේ ධර්මයේ මෙම හැකියාව බැහැර කරන කිසිවක් නැත.

## ශ්‍රද්ධාව

ශ්‍රද්ධාව (සද්ධා) යනු වර්තමානයේ දැනගත නොහැකි හෝ සාමාන්‍ය ආකාරයකින් දැනගත නොහැකි අදහසක සත්‍යතාව පිළිගැනීමයි. බොහෝ දේවවාදී ආගම්වලට අනුව, විශ්වාසයට මනස පිළිබඳ දර්ශනයේ බලපෑමක් ඇත. දෙවියන් වහන්සේට විශ්වාසය අවශ්‍ය වන අතර, එසේ ඇති අයට ඔහු ඔවුන් බේරා ගනිමින් ඔවුන්ට ප්‍රතිචාර දක්වයි. බුදුදහමේ ශ්‍රද්ධාව අවබෝධ කරගන්නේ වෙනස් ආකාරයකටය. ශ්‍රද්ධාව කැමැත්තක් උපදවන්නේ නම්, එය අගය කරනු ලබයි. එය පළමුව ධර්මයට විවෘත විය යුතුයි, ඊළඟට එය පුහුණු කිරීම ආරම්භ කිරීමට, සහ ඊට පසු, ප්‍රතිඵල ලැබෙන තුරු නොපසුබටව කරගෙන යාම වශයෙනි. යම් පුද්ගලයෙකුට අඩුම තරමින් යම් තරමකට හෝ ශ්‍රද්ධාවක් ඇත්තේ නැත්නම් ඔහු කිසිදිනක ධර්මය සලකා බලන්නේවත් නැත. රත්නාවලියේ, එහි රචක බෞද්ධ දර්ශනවාදී නාගාර්ජුන මෙසේ කියමින් මේ පිළිබඳව හොඳින් සඳහන් කරයි : 'ශ්‍රද්ධාවෙන් යුතු පුද්ගලයා ධර්මය ඇසුරු කරයි, නමුත් සැබැවින්ම ධර්මය දන්නේ අවබෝධයෙන් යුක්ත වීමෙනුයි. මේ දෙකෙන් අවබෝධයෙන් යුක්ත වීම ප්‍රධාන දෙයයි. නමුත් පළමුව ඇතිවන්නේ ශ්‍රද්ධාවයි.' එක් නිශ්චිත ස්ථානයකදී, කෙසේ නමුත්, ශ්‍රද්ධාව පෞද්ගලික අත්දැකීම් පදනම් වූ දැනුමෙන් ආදේශ වෙයි. පදනම් රහිත ශ්‍රද්ධාව (අමූලිකා සද්ධා) සහ විචක්ෂණයෙන් නිගමනය කළ ශ්‍රද්ධාව (ආකාරවතී

සද්ධා) යන දෙක අතර වෙනස බුදුදහම වෙන්කොට හඳුනා ගනියි. චිත්තවේගයන් කෙරෙහි ප්‍රබල අවධානයක් මගින් ක්‍රියාවට නංවන ලද ශ්‍රද්ධාව, ප්‍රාතිහාර්ය යැයි කියනු ලබන හෝ විකල්පයන් විමසා බැලීමෙන් තොරව කෙනෙකුට හමුවන පළමු දෙයින් ආකර්ෂණය වී එය පිළිගැනීමට මඟ පෙන්වන ශ්‍රද්ධාව කලින් සඳහන් කළ උදාහරණ වේ. සම්භාවිතාවන්, නිගමනයන් සහ සාධක ප්‍රවේසමින් තක්සේරු කිරීම තුළින් විචක්ෂණයෙන් නිගමනය කළ ශ්‍රද්ධාව වැඩේ. බුදුපියාණන් වහන්සේ සහ ගෞරවයට පාත්‍රවූ ප්‍රජා නායකයෙකු සහ ජෙන ආගම ඇදහූවෙකු වන උපාලි නමැති පුද්ගලයෙකු අතර ඇති වූ හමුවීමකින් මෙම ආකල්පය හොඳින් විස්තර වේ. බුදුපියාණන් වහන්සේ සමග ඇතිවූ දීර්ඝ සාකච්ඡාවකට පසු උපාලි 'මෙම දිනයේ සිට ජීවිතය අවසාන වන තුරු' උන්වහන්සේගේ ශ්‍රාවකයෙකු වීමට තීරණය කළේය. නමුත්, උපාලිගේ ශ්‍රද්ධාව පිළිගැනීම වෙනුවට, එය තීරණය කිරීමට ප්‍රථමව, සැලකිල්ලෙන් එය තීරණය කිරීමට කාලය ගන්නා ලෙස බුදුපියාණන් වහන්සේ ඔහුට දැනුම් දුන්හ. :'උපාලි සුපරික්ෂාකාරී සෝදිසියක් කරන්න. ඔබ වැනි හොඳින් දන්නා මිනිසුන් පළමුව සුපරික්ෂාකාරී සෝදිසියක් කිරීම කිරීම සුදුසු වේ.'

මේ කාලයේ ඉන්දියාවේ විවිධ නිකායන් අතර ශ්‍රාවකයන් බඳවා ගැනීම සඳහා සැලකිය යුතු තරම් තරඟයක් තිබුණි. ඒ නිසා උපාලි මෙම බලාපොරොත්තු නොවූ අවවාදයෙන් පුදුමයට පත්විය. :'මම ඔබවහන්සේ පැවසූ දෙයින් ඊටත් වඩා සතුටට පත් වූයෙමි. වෙනත් නිකායක් මා

ශ්‍රාවකයෙකු ලෙස බඳවා ගත්තේ නම්, ඔවුන් නගරය පුරාම අනෙක් සියලු අයට දැන ගැනීම පිණිස බැනරයක් ප්‍රදර්ශණය කරනු ඇත. නමුත් ඔබවහන්සේ ප්‍රකාශ කරන්නේ සුදුසු විමර්ශණයක් පළමුව කරන ලෙසයි.' උපාලි ජෛනයෙකු නිසා, ඔහුගේ පළමු ආගමට උපකාර කිරීම තවදුරටත් කරගෙන යන ලෙස බුදුපියාණන් වහන්සේ ඉල්ලා සිටියහ.: 'බොහෝ කාලයක් ඔබගේ පවුලේ උදවිය ජෛනයන්ට දාන දීම කර ඇත. ඔවුන් පැමිණි විට දාන පිරිනැමීම පෙර පරිදි කරගෙන යන්න' (M.I,379).

බුදුපියාණන් වහන්සේට අනුව, විචාරශීලී ශ්‍රද්ධාව 'අවබෝධය, ශක්තිමත් කිසිම ගුරුවරයෙකු හෝ දේශකයෙකු, යක්ෂයන්, දෙවියන්, දෙවියන් වහන්සේ හෝ ලෝකයේ කිසිම කෙනකු විසින් සෙලවිය නොහැකි අන්දමින් මුල් බැස ගත් දෙයකි' (M.I,320). ඒ නිසා සමීප මනසකින් පිටුවහලක් ලැබීම හෝ වෙනත් ආගම් කෙරෙහි පක්ෂපාතී ආකල්පයක් ඇති කරගැනීම අවශ්‍ය නොවේ. බලන්න **හදිසි සහ ක්‍රමානුකූල සහ විශ්වාසය**

'Miracles of in the Canonical Scriptures of Buddhism.'R. E. Hume, *Journal of the American Oriental Society*, 44, 1927.

## විශ්වාසදායකත්වය

විශ්වාසවන්ත වීම (අනුබ්බත හෝ අස්සව) යනු යම් දෙයකට හෝ පුද්ගලයෙකුට අචල සහ කල්පවතින හිතවත් බවක් සහ කැපවීමක් තිබීමයි. සමාජීය වශයෙන් දැඩි විශ්වාසයක්, විශ්වසනීයතාවක් සහ කල්පවතින මිත්‍රත්වයක් ගොඩනැඟීමේ වැදගත් කාර්යභාරයක් ඇත. විශ්වාසදායකත්වයේ

ආධ්‍යාත්මික වටිනාකම වන්නේ ආවේගීතාව පදනම් කරගත් ආශාවන්, විඩාව හෝ චපල සිත් ඇති බව මඟ හැරීමට යොමුවන ප්‍රවණතාව වැළැක්වීමයි. ඒ අතර, අධිෂ්ඨානය සහ ස්වයං සංවරය වැඩි කරයි. අප සිදුකරන සෑම කැපකිරීමකටම ඒ ආකාරයෙන්ම සහ ඒ ප්‍රමාණයටම විශ්වාසවන්ත වීම අවශ්‍ය නොවේ. අපගේ විශ්වාසවන්ත බව ප්‍රධාන වශයෙන් වැදගත් අරමුණු සඳහා සහ ඒවායේ වැදගත් බවට සමානුපාතීව වෙන් කළ යුතුයි. අපගේ විශ්වාසවන්ත බවට වැදගත් කරුණු තුනක් ඇති බව බුදුපියාණන් වහන්සේ වදාළහ - ධර්මය, මිතුරන් සහ විවාහය සම්බන්ධ ඥාතීන් වශයෙනි.

අප තුන් සරණ යා යුත්තේ, අප කරන්නේ කුමක් ද සහ එයට අපගෙන් ලැබිය යුත්තේ කුමක් ද යන්න අපට සැබැවින්ම අවබෝධ වී තිබේ නම් පමණි. අප මෙය කරන විට සහ අපගේ කැපවීමට විශ්වාසවන්තව සිටින විට, එම මාර්ගයේ අපගේ ගමන ඉක්මන් කරන ඉමහත් ශක්තියක් සහ විශ්වාසයක් එය අපට ලබාදෙයි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ : 'කෙනෙකු ධර්මය පුරුදු කළ යුත්තේ අවංකව සහ දෙගිඩියාවෙන් තොරවය. මෙසේ ධර්මය පුහුණු කරන්නා මේ ජීවිතයේ සහ ඊළඟ භවයේ හොඳින් නිදයි' (Dhp.169). අව්‍යාජ මිතුරන්ගේ සමහර ගතිලක්ෂණ නම් ඔවුන් ඔවුන්ගේ වචනවලට අවංක වීම, ඔබගේ කරදරකාරී අවස්ථාවලදී ඔබ සමග බැඳී සිටීම සහ ඔවුන්ගේ ජීවිතය ඔබ වෙනුවෙන් කැප කිරීමය (D.III,187). තවත් වචනයකින් කියනවා නම්, ඉහළම මට්ටමේ මිත්‍රත්වය, වෙනස්වන අවස්ථාවලදී ද වෙනස් නොවේ. එවැනි විශ්වාසවන්ත බව එය යොමු කරන අය අතර සමීප

සබඳතාවක් ඇති කරයි.

සාර්ථක විවාහයක් සඳහා විශ්වාසවන්ත බව ඉතාම වැදගත් අංගයයි. ස්වාමිපුරුෂයා භාර්යාවට ද්‍රෝහී නොවිය යුතුවන අතර, භාර්යාවද එසේම විය යුතු බව බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ (D.III,190). ජාතක කතාවේ ඇතුළත්, එක් චරිතයක් මෙසේ පවසයි: 'අපි වෙනත් අයගේ බිරින්දෑවරුන් සමග සීමාව ඉක්මවා නොයමු. එසේම අපගේ බිරිඳ අපට විරුද්ධව සීමාව ඉක්මවා නොයයි. අපි අනෙක් අයගේ සහකාරියන් සමග බ්‍රහ්මචාරීන් ලෙස හැසිරෙමු' (Ja.IV,53). හොඳ බිරිඳක් 'ස්වාමියාට අවංකවූ' (එකහත්කිනී, Ja.III,63) ලෙස ත්‍රිපිටකයේ ඇගයීමට ලක් කර ඇත. බෞද්ධ සම්ප්‍රදායේ සඳහන් ආදිවර්ගමය (මුල් සැලැස්ම), කැපවූ සහ විශ්වාසවන්ත කලත්‍රයා වන්නේ සොත්ථිසේන රජුගේ බිරිඳ වන සම්බූලා ය. විකෘතියට පත්වන රෝගයකින් ඔහු පීඩා විඳී අතර, සිංහාසනය අතහැර වනාන්තරයට යාමට සිදුවූ විට, නවතින්න යැයි ඔහු කළ සියලු ඉල්ලීම් නොසලකා ඔහුගේ පිටුවහල් වීමත් සමග ඇය සතුටින් ඔහු හා පිටත්ව ගියාය. ඉවසීමෙන් සහ ආදරයෙන් ඇය ඔහුට සාත්තු සප්පායම් කර අවසානයේදී ඔහුගේ රෝගය සුව කර ගත්තාය. ඔහු ඇගේ විශ්වාසවන්ත බව සැක කර ඇය මඟහැරියත්, ඇය තවමත් ඔහු අත්හැරියේ නැත. අවසානයේදී ඔහු ඇයගේ විශ්වාසවන්ත බව හඳුනාගෙන ඇය සැක කිරීම පිළිබඳව සමාව ඉල්ලුවේය. දෙදෙනා සමගි විය (Ja.V,88-98).

විවාහමය විශ්වාසවන්ත බව සහ ආදරය තවත් බොහෝ ජාතක කථාවල වැදගත් තේමාවන් වේ. එයින් එකක, භාර්යාව තම ස්වාමියා කෙරෙහි දක්වන භක්තිය නපුරු රජ කෙනෙකුගේ කුටෝපායන්ගෙන් ඔහු ගලවා ගැනීමට හේතු වේ (Ja.II,122-5). තවත් කථාවක, තමන්ගේ කැපවූ සහ බොහෝ කාලයක් දුක් විඳින බිරිඳට ලැබිය යුතු ගෞරවය දෙන මෙන් බෝධිසත්ත්වයන් වහන්සේ ස්වාමිපුරුෂයාට උපදෙස් දුන්හ (Ja.II,203-5). විශේෂයෙන්ම සිත් සසල වන එක් කථාවක එක් බියකරු රාක්ෂයෙකුට මුහුණ දෙන්නට සිදු වූ විට, පුරුෂයෙකුගේ සියලු මිතුරන් ඔහු අතහැර ගිය අතර, ඔහුගේ බිරිඳගේ ධෛර්යය පවා මොහොතකට අඩපණ විය. සැමියා බිරිඳගෙන් උපකාර ඉල්ලූ විට ඇයගේ පැකිළීම අත්හැර ඇය වහා ඔහුගේ පිහිටට මෙසේ කියමින් ඉදිරිපත් වූවාය 'වසර හැටක් උතුම් පුරුෂයෙකු වූ ඔබ අතහැර නොයමි. පොළොවේ හතර කොණම පවා ඔබ මට ඉතා ආදරණීය බව දනී' (Ja.II,341-4). තවත් කථාවකින් හෙළි කරන්නේ, තම ස්වාමිපුරුෂයා වෙනුවෙන් තම ජීවිතය පවා දෙන්නට කැමැති වූ බිරිඳ සිදුවන්නට තිබූ මරණයකින් දෙදෙනාම ගලවා ගත් බවයි (Ja.III,184-7).

## ප්‍රසිද්ධිය

ප්‍රසිද්ධිය (කිත්ති) යනු විශාල පිරිසක් විසින් දැනගැනීමේ තත්ත්වයි. සාමාන්‍යයෙන් එය අගය කිරීම, වර්ණනාව සහ ගෞරවය සමග බැඳී පවතී. බුද්ධත්වයට පත් වී වසර කිහිපයකින්ම බුදුපියාණන්

වහන්සේ ප්‍රසිද්ධියට පත් වී තිබුණි. බුදුපියාණන් වහන්සේ පිළිබඳව මෙසේ සඳහන්ව තිබුණි: 'දුර ප්‍රදේශවල සිට සහ වෙනත් රටවලින් උන්වහන්සේගේ උපදෙස් ලැබීමට මිනිසුන් පැමිණ ඇත. උන්වහන්සේ අනුසරණය කළ අය බොහෝය. උන්වහන්සේ බොහෝ දෙනාගේ ගුරුවරයා විය. නායකයෝ සහ බොහෝ නිකායන්වල ගුරුවරු උන්වහන්සේගේ උපදෙස් ලැබීමට සහ සාකච්ඡා කිරීමට පැමිණියහ. සමහර පැවිදි අය සහ බ්‍රාහ්මණයන් වැදගත්කමින් අඩු දේවලට ප්‍රසිද්ධිය ලැබූ අතර, ගෞතම බුදුපියාණන් වහන්සේ ලැබූ කීර්තිය පදනම් වූයේ උන්වහන්සේගේ ඉහළම දැනුම සහ හැසිරීම මතයි '(D.I,116) .

ප්‍රසිද්ධියට පත්වන අය පහසුවෙන් අහංකාර, නොසැලකිලිමත් සහ ප්‍රශංසාවට ඇලුණු ස්වභාවයක් ඇති බව බුදුපියාණන් වහන්සේ දුටුවහ. එම නිසා හැකි හැම අවස්ථාවකම ප්‍රසිද්ධිය මඟ හරින ලෙස උන්වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රාවකයන්ට අවවාද කළහ. උන්වහන්සේ පිළිබඳව මෙසේ පවසා තිබුණි :'උන්වහන්සේගෙන් උපදෙස් ලබා ගැනීම පිණිස දුර බැහැර ප්‍රදේශවලින් සහ රටවලින් මිනිසුන් පැමිණියහ. උන්වහන්සේට බොහෝ අනුගාමිකයෝ සිටියහ. උන්වහන්සේ බොහෝ දෙනෙකුගේ ගුරුවරුයා වූහ. නායකයෝ උන්වහන්සේගේ උපදෙස් පැතූහ. විවිධ නිකායයන්වලට අයත් ගුරුවරු උන්වහන්සේ සමග සාකච්ඡා කිරීමට පැමිණියහ. සමහර පැවිදි අය සහ බ්‍රාහ්මණයන් වැදගත්කමින් අඩු දේ සම්බන්ධයෙන් ප්‍රසිද්ධිය ලබා ඇති අතර, ගෞතම බුදුපියාණන් වහන්සේගේ කීර්තිය පදනම් වී ඇත්තේ උන්වහන්සේගේ ඉහළම

දැනුම සහ හැසිරීම මතය' (D.I,116). ප්‍රසිද්ධියට පත්වන අය පහසුවෙන් අහංකාර, නොසැලකිලිමත් සහ ප්‍රශංසාවට ඇලීමක් ඇති කර ගැනීම සිදුවිය හැකි බව බුදුපියාණන් වහන්සේ දුටුවහ. හැකි සෑම අවස්ථාවේදීම ප්‍රසිද්ධිය අත් හරින ලෙස උන්වහන්සේ තම ශ්‍රාවකයන්ට අවවාද කළහ. සමහර ගුරුවරුන් තමන්ගේ අවංකත්වය දරා සිටින්නේ ප්‍රසිද්ධ වනතුරු පමණක් බවත් ඊට පසු ඔවුන් පිරිහීමට පත්වන බවත්, යන නිපුණ නිරීක්ෂණය බුදුපියාණන් වහන්සේ සිදු කළහ (M.I,318). වරක් බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'රිදීවලින් පිරුණු රත්රන් භාජනයක් ලබාගැනීමට හෝ බොරුවක් නොකියන එක් පුද්ගලයෙකුගේ මනස කියවමින්, මම ඔහු හඳුනා ගත්තෙමි. නමුත්, එම පුද්ගලයාම, හිතා මතාම බොරුවක් පවසන බව මම දැක ඇත්තෙමි. ඒ ඔහුගේ මනසේ දැඩි ලෙස සිතේ රඳවා ගත් ලාභ ප්‍රයෝජන, ගෞරවය සහ ප්‍රසිද්ධිය සඳහා පෙළුණු නිසාය' (S.II,233).

## උපවාස කිරීම

උපවාස කිරීම (උපවාස හෝ අනසන) යනු දිගු කාලයකට නිරිහාරව සිටීමයි. උපවාස සිදු කරන්නේ ආගමික, සෞඛයමය හෝ වෛද්‍යමය හේතූන් පදනම් කර ගෙනය. සමහර විට එය දේශපාලනමය අරමුණු පදනම් කර ගෙන ද සිදු වේ. මහත්මා ගාන්ධී, අයර්ලන්ත ජනරජයේ හමුදා සිරකරුවන් සහ කියුබාවේ විරෝධකරුවන් ද එසේ කර ඇත. යම් වෛද්‍යමය ක්‍රියාමාර්ගවලට සූදානම් වන්නන්ට බොහෝ විට ආහාරවලින් වැළකෙන්නට උපදෙස් ලැබේ. බොහෝ ආගම්වල එක්තරා ආකාරයක හෝ

තවත් ආකාරයක උපවාසයක් සහ එක් කාල පරිච්ඡේදයක දී හෝ වෙනත් කාලයක දී නිරාහාරව සිටීම පුහුණු කෙරේ. සන්තාන ලෙසින් හඳුන්වන මරණය දක්වා නිරාහාරව සිටීම ඇතුළුව බොහෝ වර්ගයේ වර්ගයේ නිරාහාරව සිටීම් ජෛන ජාතිකයෝ පුහුණු කරති. රාමසාන් මාසය තුළ හිරු උදාව සහ හිරු බැසීම අතර ඇති කාලය තුළ සියලුම දියර සහ ආහාර ගැනීමෙන් මුස්ලිම්වරුන් වැළකී සිටිය යුතුයි. නිරාහාරව සිටීම පිළිබඳව බොහෝ විට බයිබලයේ සඳහන් කර ඇත. (උදාහරණ ක්‍රියා 14,23, ලූක් 2,37, මැතිව් 6,16, ආදිය) ජේසුස්වහන්සේ වරක් දින 40ක් නිරාහාරව සිටියේය (මැතිව් 4,2). කෙටි කාලයකට අඛණ්ඩව නිරාහාරව සිටීම සෞඛ්‍යයට යහපත් බව විද්‍යාත්මක පර්යේෂණවලින් පෙන්වා දෙයි. නමුත්, දිගුකාලීන නිරාහාරව සිටීම්, දින තුනකට වඩා වැඩි කාලයක් එසේ කිරීම නිර්දේශ නොකෙරේ.

අන්ත ලෙස නිරාහාරව සිටීමේ ස්වරූපයෙන් පුහුණු කරන ස්වයං අත්තථකිලමථය (අත්තකිලමථාන යෝග) බුදුපියාණන් වහන්සේගේ කාලයේ සිටි නිකායන් පුහුණු කර ඇත. සමහර ශ්‍රමණ ඇත්තන් දිගුකාලීන නිරාහාරව සිටීමෙන් බොහෝ සේ වැහැරී ගොස් ඇත. ඊට පසු ඔවුහූ 'ඔවුන්ගේ ශක්තිය නැවත ලබාගෙන, සවිමත් වීමට, මහත් වීමට,' ඊට පසු නැවත නිරාහාර වීමට, ආහාර විශාල ප්‍රමාණයක් ගත්හ (M.I,238). අනෙක් ගුරුවරුන්ගෙන් ඉගෙන ගත් වසර හය තුළ දී බුදුපියාණන් වහන්සේ විවිධ පැවිදි පුරුදු සමඟින් අත්හදා බැලූහ. උන්වහන්සේ ද දිගු කාලීන නිරාහාරවල යෙදුනහ. මේවායින් සමහරක්

දින හතකට වරක් පමණක් ආහාර ගැනීම හෝ දිනකට එක් කෝලා පලතුරක් පමණක් අනුභව කිරීම ඇතුළත් වූ බව උන්වහන්සේ මහාසිහනාද සූත්‍රයෙන් සඳහන් කර ඇත (M.I,80). කෝලා යනු සිස්යෆුස් ජුජුබේ නමැති සීමිත පෝෂණයක් ඇති කුඩා පලතුරකි. මේ හේතූන් සහ වෙනත් උපවාස නිසා බුදුපියාණන් වහන්සේගේ ශරීරය ඉතාමත් වැහැරී ගියේය. උන්වහන්සේ මෙසේ පැවසූහ: 'ඉතාමත් ස්වල්පයක් වූ ආහාර ගැනීම නිසා පැරණි ගෙපැලක පරාල මෙන් මගේ ඉළ ඇට සිහින් පතුරක් මෙන් විය. මගේ ඇස් එහි කෙවෙනිවලට ගිලා බැස්සේය. ඒවායේ දීප්තිය ගැඹුරු ලිඳක ජලය මත ඇති දීප්තිය මෙන් පෙනුණි. මගේ උදරය මගේ කොඳු ඇට පෙළට ස්පර්ශ වූ නිසා මගේ උදරය ස්පර්ශ නිරීමට උත්සාහ කරන විට, මට හසු වූයේ මගේ කොඳු ඇට පෙළයි. ඒ සියල්ලම සිදුවූයේ මා ආහාරයට ගත්තේ ඉතා ස්වල්පයක් නිසාය'(M.I,80) .

බුද්ධත්වයට පත්වීමෙන් පසු, බුදුපියාණන් වහන්සේ නිරාහාරව සිටීමක් හෝ එසේ කිරීමට උන්වහන්සේ නිර්දේශ කිරීමක් පිළිබඳව සටහන් නැත. භික්ෂූන් සහ භික්ෂුණීන්ට දවල් වරුවේ සිට පසු දින හිරු උදාව තෙක් ආහාරවලින් වැළකී සිටින්නට සිදු වේ. නිරාහාරව සිටීම සැලකිල්ලට ගතහොත්, එය සුළු කාලයකි. එසේම එම කාලය තුළ ඔවුන්ට පලතුරු යුෂ සහ දියර ආහාර ගැනීමට අවසර ඇත. රාත්‍රී ආහාර තහනමට අදාළව කිරි ද ඇතුළත් වන නමුත්, තායිලන්තයේ භික්ෂූහු (චීස් සාදන්නේ කිරිවලින් වුවත්), එම කාරණය නොතකමින් හවස්වරුවේ චීස් ආහාරයට ගනිති. රෝගවලින් පෙළෙන භික්ෂූන් සහ භික්ෂුණීන්ට හවස් වරුවේ මීපැණි, සීනි, තෙල් සහ

එළඟිතෙල් ආහාරයට ගැනීමට අවසර විනය පිටකයේ නියම කර ඇත (Vin.III,51). ශ්‍රී ලංකාවේ භික්ෂූහු සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනයට සහභාගී වන විට චතුමධුර නමැති මෙම ද්‍රව්‍ය හතරේ මිශ්‍රණය පරිභෝජනය කරති.

උපෝසථය රකින ගිහි පුද්ගලයෝ ද දහවල් සිට පසු දින හිරු උදාව තෙක් ආහාර ගැනීමෙන් වළකිති. රාත්‍රී ආහාර ගැනීමෙන් වැළකීමට භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට බුදුපියාණන් නිර්දේශ කර ඇත්තේ ප්‍රධාන වශයෙන් සෞඛ්‍යමය හේතූන් නිසා බව පෙනී යයි. උන්වහන්සේ මෙසේ පැවසූහ : 'මම හවස් වරුවේ ආහාර නොගනිමි. ඒ නිසා මම රෝග පීඩාවලින් නිදහස්ව සිටිමි. යහපත් සෞඛ්‍යය, ශක්තිය සහ පහසුව ඒ නිසාම විඳිමි' (M.I,473). 'සමහර සෞඛ්‍ය' වෘත්තිකයන් දීර්ඝ කාලයකට රෙකමදාරු කරන නිරාහාරව සිටීම් සෞඛ්‍යයට යහපත් නැත. ඒවා බුදුපියාණන් වහන්සේගේ සංකල්පය වූ මධ්‍යම ප්‍රතිපදාව පුහුණු කිරීම සහ අන්තය මඟහැරීමට ද පටහැනි වේ. බලන්න **ආහාර සීමා කිරීම**

## ගින්දර

බ්‍රාහ්මණ ආගමේ බොහෝ චාරිත්‍රවලට කේන්ද්‍රගත වූයේ ගින්දරයි. ඍග් වේදයේ වෙනත් කිසිම දෙවිකෙනෙකුට වඩා යාච්ඤා කරන්නේ අග්නි හෙවත් සමහර විට ජාතදේව (Ja.I,286; IV,51) යනුවෙන් හඳුන්වන ගින්දරට අධිපති දෙවියාටය. වෛදික පූජාවල ආහවනීය, ගෘහපති සහ දක්ෂිණාග්නි නමැති ගින්දර වර්ග තුනක් අන්තර්ගත වේ. නිවසේ ගිනි තුනක් ඇත. මූලික ගින්න උපත්

ගින්නයි (ජාතග්ගි, Ja.II,43) ඒ පුද්ගලයෙකු ඉපදුණු විට, දැල්වූ ගින්න සහ එම පුද්ගලයාගේ අවමංගල්‍යයේදී ආදාහනයේදී චිතකය දැල්වූ ගින්නයි. මෙම ගිනි පුද්ගලයෙකුගේ ජීවිතය පුරාම දැල්වී තිබීම අවශ්‍ය වේ. උත්පත්ති ගින්නෙන් විවාහ ගින්න වටා හත් වරක් ඇවිදීමෙන් විවාහය තහවුරු වේ. මෙම පූජනීය ගිනිවලට අමතරව, පැවිද්දන් වීමට ලෝකය අභිනිෂ්ක්‍රමණය කරන බ්‍රාහ්මණයෝ වනයේ පූජනීය ගින්නක් අවුළුවා අග්නිට නමස්කාර කළහ. එසේම මේ ගින්න ද උපත් ගින්නෙන් දැල්වුණි (Ja.I,494).

ප්‍රධාන මනෝමය කෙලෙස් වර්ග තුන වූ ලෝභය, ද්වේෂය සහ මෝහය (ලෝභ, දෝස සහ මෝහ) ගින්දර වශයෙන් සඳහන් කරමින් ඒවායේ බ්‍රාහ්මණ ආගමේ පූජනීය ගින්දර හා ඇති සමගාමී සහ අසමානතා බුදුපියාණන් වහන්සේ සඳහන් කළ බව පෙනී යයි (Vin.I,35). තුන් ආකාර ගිනි වෙත යොමු වෙමින් ඒවා දල්වමින් තිබිය යුතු බව බ්‍රාහ්මණ ආගමේ නියමයයි. බුදුපියාණන් වහන්සේ පැවසුවේ ගිනි තුන නිවා දැමීමෙන් පමණක් රහත්ඵලයට පත්විය හැකි බවයි. සම්පූර්ණ විමුක්තිය ලැබීමේ ස්වභාවයට බුදුපියාණන් වහන්සේ ලබාදුන් බොහෝ නම් අතරින්, වඩාත්ම සාමාන්‍ය නම නිර්වාණයයි. එහි අදහස වන්නේ 'නිවා දැමීමයි', හෙවත්, දැල්වෙන මනෝමය කෙලෙස් නිවා දැමීමයි. භික්ෂුවක පූජනීය ගින්නට පූජා නොතැබිය යුතු බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (D.I,9). එය 'බිඳවැටීම ප්‍රකාශ කිරීමේ මාර්ගයක්' (අපායමුඛානි D.I,101) ලෙස උන්වහන්සේ හැඳින්වූහ. ධම්මපදයේ උන්වහන්සේ මෙසේ සඳහන් කළහ : 'යම් කෙනෙකු වසර සියයක් පූජනීය ගින්දරට පූජා පවත්වන්නේ ද, ඒ වෙනුවට

මනස දියුණු කළ පුද්ගලයෙකුට ගෞරව කිරීම වඩා යහපති' (Dhp.107).

මුල් කාලීන බෞද්ධයන් ගින්දරට වැඳුම් පිදුම් කිරීම ආධ්‍යාත්මික වටිනාකමක් නැති බවට සැලකූ අතර, ජාතක කථාවල ඒවා නොවැදගත් ලෙස සලකන ලදී (e.g. Ja.II,43-40; VI,206-7). මේවායින් එකක, එක් තවුසෙක් ඔහු විසින් ගින්දරට පූජා කළ ගවයෙකු පිළිගන්වන්නට තීරණය කළේය. මස්වලට ලුනු නොමැති නිසා, ඒවා ගෙන එන්නට ඔහු පිටතට ගියේය. පිටව යන්නට පෙර, ඔහු පූජනීය ගින්දර අසල සත්ත්වයා ගැට ගසා ඔහු පිටත්ව ගියේය. ඔහු පිටත සිටි කාලයේදී ඔහුගේ අසපුවට පැමිණි හොරු කණ්ඩායමක් ගවයා මරා, මස් උයා කුස පුරවා ගත්හ. ඔවුන් ඉතිරි කර ගියේ හම, වලිගය සහ ඇටකටු පමණය. තවුසා ආපසු පැමිණි විට සිදුවී ඇති දේ දැක, මෙසේ කීවේය : 'ජාතදේවට (අග්නි) ඔහුගේම දේ ආරක්ෂා කරගත නොහැකි නම්, ඔහු මගේ දේ ආරක්ෂා කරන්නේ කෙසේද?' ඔහු ඊට පසු ගවයාගෙන් ඉතිරි වී ඇති දේ ගින්දරට විසිකර ඊට උඩින් ජලය පිරි බාල්දියක් වත් කළේය (Ja.I,494).

ක්‍රි. පූ. 7වන ශතවර්ෂයට පසු, වජ්‍රයාන බුදුදහමට සංයෝජනය කළ බොහෝ බ්‍රහ්මණවාදී පිළිවෙත් අතර, ගිනි පිළිවෙත් ක්‍රමය ද එකකි. ටිබෙට් ජාතික බුදුදහමේ එය හඳුන්වන්නේ ස්බියින්-ස්රෙග් නමින් වන අතර, ජපාන ෂින්ගන් බුදුදහමේ, එය ගොම යනුවෙන් හැඳින් වේ. බලන්න **අපතේ යන ඉඩම් සහ වේදය**

## පළමු ඵලතුරු

පැරණි ඉන්දියාවේ, ග්‍රීසියේ මෙන්ම එම කාලයේම හෙබ්‍රෑවරුන් අතර ද, සෑම වසරකම අස්වැන්නේ පළමු ඵල දැරීම ඒවා ධාන්‍ය, එළවළු හෝ පලතුරු වේවා, දෙවිවරුන්ට (සංස්කෘත: ආග්‍රයණෙෂ්ති) පූජා කිරීම චාරිත්‍රයක්ව පැවතුණි. අර්ථශාස්ත්‍රයේ තවුසන් සහ බ්‍රාහ්මණයන්ට ඵලදාව පිළිගන්වන වාර්ෂික පළමු ඵලතුරු උත්සවය පිළිබඳව විස්තරයක් සඳහන් වේ. ගෞතම ධර්මසූත්‍රයට අනුව, පළමු පලතුරු දවන පූජා වර්ග හතෙන් එකකි. මෙයින් අදහස් කරන්නේ ඵලදාව සමහර විට පූජනීය ගින්දරට විසි කරන බවයි. කාලෝචිත තෑගි පහෙන් එකක් පළමු ධාන්‍යය සහ පළමු පලතුරු (නවසස්සානි ඵලානි) අස්වැන්න නෙළා ගනිමින් හෝ කඩා ඉවත් කරගනිමින් සිල්වත් භික්ෂූන්ට හෝ භික්ෂුණීන්ට පිළිගැන්වීම බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.III,41). ශ්‍රී ලංකාවේ බොහෝ විහාරස්ථානවල බුදුපියාණන් වහන්සේගේ පාත්‍රය නිරූපණය කරමින් විශාල මැටි හෝ ලෝකඩ භාජන තිබුණි. ගොවීහු අස්වැන්න කැපීමෙන් ලැබෙන පළමු සහල්, පාත්‍රයේ තැන්පත් කරති. මෙම චාරිත්‍රය ඇණ හිට ඇති බව පෙනෙන්නට තිබේ.

## නැමෙනසුලු බව

මනෝ විද්‍යාත්මක අර්ථයෙන් නැමෙනසුලු බව (මුදුතා) යනු යම් තත්ත්වයක් හෝ මූලධර්මයක් තුළ වෙනස්කම් හෝ සියුම් වෙනස්කම් දැක බලා ඒ අනුව ඒවාට හැඩගැසීමේ ගුණාංගයයි. මෙත්ත සූත්‍රයේ බුදුපියාණන් වහන්සේ, නැමෙනසුලු බව හා එක්ව වෙනත් කලාතුරකින් සාකච්ඡා කළ, නමුත්

වැදගත් ගුණාංග බොහොමයක් පිළිබඳව කථා කර ඇත : 'කෙනෙකු දක්ෂ, ඍජු, ඉතා ඍජු, කථා කරන්නට පහසු, නම්‍යශීලී සහ තැන්පත් විය යුතුය' (Sn.143) .

පාලනය සම්බන්ධයෙන් උන්වහන්සේ තුළ තිබූ ආකල්පවලින් බුදුපියාණන් වහන්සේගේ නම්‍යශීලී බව ඉතා හොඳින් ප්‍රත්‍යක්ෂ වේ. භික්ෂූන් සහ භික්ෂුණීන්හට විශේෂිත ප්‍රශ්න කෙරෙහි යොමු වීමට සහ යම් යම් ආකල්ප ඔවුන් තුළ ඇති කර ගැනීමට ඔවුන් ධෛර්යමත් කිරීමටත් බුදුපියාණන් වහන්සේ නීති පැණවූහ. සැම කෙනෙක්ම ඒවා ගැඹුරු ලෙස පිළිගෙන ඒ සමග ජීවත්වීම උන්වහන්සේ බලාපොරොත්තු වූහ. කෙසේ නමුත්, සෑම විය හැකි අවස්ථාවක්ම ආවරණය කිරීම කිසිම නීතියකට නොහැකි බවත්, අවස්ථා වෙනස් වන බවත්, ඒ නිසා එම නීති අවශ්‍ය වූ විට වෙනස් කළ යුතු බවත්, අවබෝධ කිරීමට තරම් නුවණක් උන්වහන්සේට තිබුණි. හරියටම බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයට ප්‍රථමව නීති ගැළපීම් සහ වෙනස් කිරීම් කළ ආකාරය අපට විනය පිටකයෙන් දකින්නට හැකිය. සුළු නීති අවශ්‍යතාවක් මතු වූවොත් වෙනස් කළ හැකි බව බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේගේ ශ්‍රාවකයන්ට පැවසූහ (D.II,154). බුද්ධිමය නම්‍යශීලීභාවය (චිත්තමුදුතා) අදහස් සහ මත ඇති කර ගැනීම සඳහා වැදගත් වේ (Dhs.45). නමුත්, ඒවා පිළිබඳව පණ්ඩිත හෝ උද්ධච්ච හෝ දරදඬු නොවී සිටීම නොඇලීමේ වැදගත් කරුණකි. බලන්න **දක්ෂ උපක්‍රමයකි.**

# මල්

මල් (පුප්ඵ හෝ කුසුම) යනු මල් හටගන්නා ගස්වල ප්‍රජනක නිර්මාණයන්ය. සාමාන්‍යයෙන් දීප්තිමත් වර්ණයෙන් යුක්ත පෙති සහ ප්‍රසන්න සුවඳක් එයින් නිකුත් වේ. ත්‍රිපිටකයේ සඳහන් ආකාරයට මල්වල සමහර කොටස්වලට කඳ (දණ්ඩ හෝ වණ්ට), පොහොට්ටුව (කොරක), පෙති (පත්ත හෝ දල), මණිය (ගබ්භ), කේසරය (කිඤ්ජක්ඛ) මදය (කණ්ණිකා) සහ රේණු (රෙණු) ඇතුළත් වේ. මල් දෙආකාරයකට වැඩේ. ඒ පොළොව මත වැඩෙන සහ ජලයේ වැඩෙන වශයෙනි. සමහර විට වැල් මත වැඩෙන තවත් වර්ගයක් ද ඇත (Ja.I,51; Vv.35). පැරණි ඉන්දියානු විවාහ ගිවිසීමේ උත්සවවලදී මනාලිය මල්මාලාවලින් සැරසීම ද එක් අංගයක් විය (M.I,286). මල්මාලා සෑදීම ශිල්පයක් ලෙස හඳුනාගෙන තිබේ (Ja.V,292). විවිධ වර්ගයේ මල්මාලා, මල්වඩම් සහ මල්පොකුරු පිළිබඳව විනය පිටකයේ සඳහන්ව තිබේ. නමුත් මේවා පිළිබඳ වෙනස පැහැදිලි නැත (Vin.III,179).

බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ ඉගැන්වීම්වලදී මල් පිළිබඳව උපමා කථාවල භාවිත කළ ආකාරය විමසා බැලූවිට, උන්වහන්සේ මල්වලට විශාල ඇල්මක් දැක්වූ බව පෙනේ. උදාහරණ වශයෙන් උන්වහන්සේ මෙසේ පැවසූහ: 'යහපත් උපදෙස් බෙදාදෙන නමුත්, ඒ උපදෙස් අනුව ක්‍රියා නොකරන පුද්ගලයා වර්ණවලින් පිරුණු, නමුත් සුවඳ රහිත ලස්සන මලක් හා සමානය' (Dhp.51). එසේම 'මල් ගොඩකින් බොහෝ මල්මාලා සාදන්නට

පුළුවන් ආකාරයටම, මිනිසෙකු වී උත්පත්තිය ලැබීමෙන් බොහෝ යහපත් දේ කළ හැකිය' (Dhp.53). සමහර අවස්ථාවලදී උන්වහන්සේ අප බැඳී ඇති දේ මල්වලට සැසඳූහ. නමුත් ඒවා අනෙක් අතට අනිත්‍ය වූ දේවල්ය. දැනුවත් බෞද්ධයා බුද්ධ ප්‍රතිමාව ඉදිරිපිට නිහඬව අනිත්‍ය පිළිබඳ සත්‍යය ආවර්ජණය කරමින්, තමන්ගේ ලෞකික වස්තූන් පිළිබඳව නිවැරදි දෘෂ්ටිකෝණයෙන් බැලීමට අධිෂ්ඨාන කරයි. බලන්න **නෙලුම්, ගස් සහ පූජා**

## ආහාර

ආහාර යනු (ආහාර හෝ අන්න) කුසගිනි වේදනාව සංසිඳුවා ශරීරය පෝෂණය කරන්නට ජීවීන් විසින් ආහාරයට ගන්නා ද්‍රව්‍යමය පෝෂ්‍ය පදාර්ථයි. පැරණි ඉන්දියාවේ ආහාර තද හෝ මෘදු (S.I,162) වශයෙන් වර්ග කරන ලදී. ඒවා කමින්, බොමින්, සපමින් හෝ උරමින් පරිභෝජනය කරන ලදි (Pj.I,207). පිරිසිදු හෝ අපිරිසිදු ආහාර යන සංකල්පය බුදුපියාණන් වහන්සේ බැහැර කළහ. බ්‍රාහ්මණ ආගමේ ආහාරමය නීති බොහෝ ජාතක කථාවලින් සමච්චලයට ලක් කර ඇත. මහාජනක ජාතකයේ මෙසේ සඳහන් කරයි: 'සාධාරණව ඉපැයූ මුදලින් මිලදී ගන්නා ආහාර පිරිසිදුය' (Ja.VI,62-4). කෙසේ නමුත්, භික්ෂූන් සහ භික්ෂුණීන්ට ආහාරයට ගත හැක්කේ කුමක්ද යන්න පිළිබඳව යම් සීමා ඇත. නමුත් ඒවා පණවා ඇත්තේ ප්‍රායෝගික හේතූන් සඳහාය. ආහාර ගැනීමේ දී මධ්‍යස්ථ බවක් තිබීම බුදුපියාණන් වහන්සේ ඇගයීමට ලක් කළ අතර (Sn.707) ඒ සඳහා උන්වහන්සේගේ භික්ෂු සහ භික්ෂුණීන් ධෛර්යමත් කළහ. මෙම අරමුණ සහ සෞඛ්‍යමය හේතූන් සම්බන්ධයෙන් ඔවුන් මධ්‍යාහ්නයෙන් පසු ආහාර

නොගත යුතු බවට නීතියක් ඇති කළහ: 'මම හවස ආහාර නොගනිමි. ඒ නිසා මම රෝග පීඩාවෙන් නිදහස් වෙමි. මම සෞඛ්‍ය, ශක්තිය සහ පහසුව විඳිමි' (M.I,473).

බුදුපියාණන් වහන්සේ සාමාන්‍යයෙන් ඉතා සරල හෝ ඉවතලන දේ පවා ආහාරයට ගත්හ. නමුත්, ධනවත් අනුගාමිකයෙකු දානය සඳහා නිවසට ආරාධනය කළහොත්, උන්වහන්සේ ඒ ඇරයුම ද පිළිගෙන, 'කලු ඇට ඉවත් කළ අගනා බත්, සෝස් වර්ග සහ වැංජන සමග ආහාර වැළඳූහ'(M.II,7). සෞන්ද්‍රානන්දකාව්‍යයේ ආහාර සම්බන්ධයෙන් උන්වහන්සේ දුන් අවවාදය සඳහන් වේ : 'ඔබගේ භාවනාව සහ යහපත් සෞඛ්‍යය වෙනුවෙන් ඔබගේ ආහාර ගැනීම මැනීමක් ඇතිව කළ යුතුයි. වැඩිපුර ආහාර ගැනීම ස්වසනය සීමා කරයි. අලසකම සහ නිදිමත ඇති කරයි. ශක්තිය විනාශ කරයි. පමණට වඩා අඩුවෙන් ආහාර ගැනීම ශරීරයේ ඝනත්වය, සෞඛ්‍යමත් වර්ණය, වීර්යය, ප්‍රයෝජනවත් බව සහ ශක්තිය හිස් කරයි.' බුදුදහම ආදරය දකින්නේ ඕනෑම දෙයකට, ආහාර සම්බන්ධයෙන් පවා, එය සකස් කිරීමේදී, අන් අය සමග බෙදා හදා ගැනීමේදී හෝ හුදෙක් ආහාර ගැනීමේදී පවා, වැදගත් මානයක් එක් කිරීමට හැකි දෙයක් ලෙසයි. ජාතක කථා අටුවාවල මෙසේ සඳහන් කරයි : 'ආදරයට සමාන කිසිම රසයක් නැත. උනන්දුවකින් තොරව ලබා දෙන මිහිරි දේවල් හතර, ආදරය සමග දෙන රළු මෙනේරි තරම් රසවත් නොවේ' (Ja.III,142). බුදුපියාණන් වහන්සේ එම කාරණයම සඳහන් කරමින් මෙසේ පැවසූහ: 'ඉස්තරම් හෝ ගොරෝසු, බොහෝ හෝ ස්වල්ප වශයෙන්, කෙනෙකුට

ආදරයෙන් සාදන ලද ඕනෑම දෙයක් අනුභව කළ හැකිය. සැබැවින්ම ආදරය ඉහළම රසයයි' (Ja.III,145). ආහාර ගැනීමට පෙර පහත සඳහන් වචන ප්‍රත්‍යවේක්ෂණයක් ලෙස කියන ලෙස බුදුපියාණන් වහන්සේ තමන්ගේ ශ්‍රාවකයන්ට යෝජනා කළහ: 'අපි මධ්‍යස්ථව ආහාර ගනිමු. බුද්ධිමත්ව ප්‍රත්‍යවේක්ෂණය කරමින්, අපි විනෝදයට, ප්‍රීතිවන්නට හෝ කායික ආකර්ෂණය සඳහා ආහාර නොගනිමු. නමුත්, මෙම ශරීරය නඩත්තුවට සහ පවත්වා ගැනීමට, කුසගින්නෙන් ඇතිවන අපහසුව සංසිඳුවන්නට, පූජනීය ජීවිතයක් ගතකිරීමට උපකාර වන්නට පමණක් යැයි සිතමින් සහ 'මම පැරණි ආශාවන් අවසාන කරමි. අලුත් ආශාවන් උපදින්නට ඉඩ නොදෙමි. ඒ අනුව සෞඛ්‍යමත් වෙමි, නිදොස් වෙමි, සැනසිල්ලෙන් සිටිමි' (M.I,273). පුද්ගලයෙකු බොහෝ කල් සිට පැවත එන බෞද්ධ සම්ප්‍රදායට අනුව, තවත් ආහාර පිඬු හතරක් හෝ පහක් හෝ වතුර වීදුරු දෙකක් හෝ තුනක් කුස පිරවීමට ඉඩ තිබියදී ආහාර ගැනීම නතර කළ යුතු බව සඳහන් වේ (Th.983; Vism.33).

කුසගින්නෙන් පෙළෙන පුද්ගලයෙකුට ඔබ ආහාර දුන් විට, ඔබ දෙන්නේ ද්‍රව්‍යමය වස්තුවක් පමණක් නොවේ, ආහාරවලින් ලබා දෙන සියලුම දේ ඔබ දී ඇති බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. ඒ ජීවිතය, රූපශ්‍රීය, තෘප්තිය, ශක්තිය සහ බුද්ධියයි (A.III,42). බෞද්ධ වීර කාව්‍යයක් වූ මණිමේකලයේ මෙසේ සඳහන් වේ :'කුසගින්න යහපත් උත්පත්තිය විනාශ කරයි. සියලු උදාර බව විනාශ කරයි. පෙර දී ඉගෙන ගැනීම ජීවිතයේ වඩාත් වටිනා දෙය යැයි සිතුවිල්ලක් තිබුණත්, උගතුන්ගේ ඉගෙන ගැනීමට

තිබූ ඒ කැමැත්ත විනාශ කරයි. කුසගින්න සියලු ලැජ්ජාව ඉවත් කර, ගතිලක්ෂණවල සුන්දරත්වය පහත දමයි. පුරුෂයන් තම භාර්යාවන් සමග අනෙක් අයගේ දොර ළඟ සිටගෙන සිටින්නට සලස්වයි. අප්‍රසන්න තණ්හාවේ උල්පත වූ, කුසගින්නේ ස්වභාවය මෙයයි. එසේම එයට සහාය දෙන්නන් ද ඉතා ඉහළින් වර්ණනා කළ නොහැකිය. ආහාර දැනටත් ප්‍රමාණවත් අයුරෙන් තිබෙන අයට ලබා දීම ත්‍යාගශීලීබව අපතේ යැවීමකි. නමුත්, කුසගින්න සංසිඳුවීමට ආහාර දීම සැබෑ පරිත්‍යාගශීලීත්වයකි. එසේ කරන අය මේ ලෝකයේදී සශ්‍රීක වෙති. ඒ ආහාර දීම යනු ඔවුන්ට ජීවිතය දීමකි'. බලන්න **ආහාර සීමා කිරීම, නිරාහාරව සිටීම, සුදුලූනු සහ නිර්මාංශවීම**

*Food and Drink in Ancient India*, Om Prakash,1961.

## සමාව දීම

සමාව දීම (ඛමති) යනු අපට හානි කළ හෝ අප ආදරය කරන අය කෙරෙහි අප තුළ ඇති කෝපය, නොරිස්සුම හෝ පළිගැනීම ගැලවී යන්නට ඉඩ හැරීමයි. බුදුදහමට අනුව, සමාව දීම ද්‍රව්‍යම දේ දෙනවාට වඩා ඉහළ සහ උතුම් වර්ගයේ දීමකි. තමන් වහන්සේගේ ශ්‍රාවකයෙකු වරදක් කිරීමෙන් පසු එසේ කළ බවට පිළිගන්නා විට සාමාන්‍යයෙන් බුදුපියාණන් වහන්සේ පවසන්නේ:'සැබැවින්ම වරදක් ඔබ යටපත් කර ඇත. නමුත් ඔබ වරද පිළිගෙන එය සුදුසු යැයි පාපෝච්චාරණය කර ඇති නිසා, මම ඔබට සමාව දෙමි. වරදක් පිළිගෙන එය පාපෝච්චාරණය කරන ඕනෑම කෙනෙකුට අනාගතයේදී සංයමයක් ඇතිවී, උතුම් ශ්‍රාවකයෙකු

බවට එම පුද්ගලයා දියුණු වේ' (D.I,85). බුදුපියාණන් වහන්සේ මෙසේ ද පැවසූහ: 'බුද්ධිමතෙකු කරුණු තුනකින් දැනගත හැකිය. ඔහු වරදක් වරදක් හැටියට දකී. එය එසේ දකිමින්, ඔහු එම වරද නිවැරදි කරන්නට උත්සාහ ගනී. තවත් කෙනෙකු වරද පිළිගන්නා විට, ඔහු එය කළ යුතු නිසා සමාව දෙයි' (A.I,103). මාසයකට දෙවතාවක් භික්ෂූන් සහ භික්ෂුණීන් එකට එකතු වී තමන්ගේ සමානයන් ඉදිරියේ විනය නීති කඩකර ඇත්නම් පාපෝච්චාරණය කර සමාව ඉල්ලා සිටිය යුතුයි.

සමාව දීම සහ සමාදාන වීමේ වටිනාකම පිළිබඳ හොඳ උපදෙස් ජාතක කථාවලින් ලබා දෙයි. 'යහපත් මිනිසුන් දබර කළවිට, ඔවුන් වහාම සමාදාන වී බොහෝ කල් පවතින බැඳීමක් ඇති කර ගත යුතුයි. ප්‍රයෝජන රහිත, බිඳුණු හෝ කැඩුණු වළං මෙන්, මෝඩයෝ පමණක් සමාදාන වීමට උත්සාහ නොගනිති. මෙය තේරුම් ගෙන මෙම ඉගැන්වීම් සැලකිල්ලට ගන්නා පුද්ගලයා කිරීමට අපහසු දෙයක් කරයි. ඔහු වටිනා සහෝදරයෙකි. අපවාදය දරා සිටින පුද්ගලයා සමාදානය වීමට සුදුස්සෙකි' (Ja.III,38). ක්‍රිස්තියානි දහම මෙන්ම බුදුදහම ද සමාව දීම ආදරයේ වැදගත් කරුණක් බව හඳුනා ගනී. එක් ඊර්ෂ්‍යා සහගත නිලධාරියෙකු මිත්‍රයන් කණ්ඩායමකට විරුද්ධව බරපතල අසත්‍ය චෝදනා ඉදිරිපත් කිරීම නිසා ඇතෙකු ලවා පොඩි කර මරා දමන්නට තීන්දු කර තිබූ බව ජාතක කථාවක සඳහන් විය. ඇතා අවාසනාවන්ත කණ්ඩායම වෙත ප්‍රවේශ වන විට, ඔවුන්ගේ නායකයා ඔවුන්ට මෙසේ පැවසුවේය. 'ශීලය සිතේ තබාගෙන ඔබ - ඔබ කෙරෙහි මෙත් වඩන ආකාරයටම බොරුකාරයා, රජු සහ ඇතා

කෙරෙහි ද මෛත්‍රිය පවත්වා ගෙන සිටින්න' (Ja.I,199-200). අවසානයේ මිත්‍රයන් සියලු දෙනා ආරක්ෂා විය.
*The Art of Forgivness, Lovingkindness, and Peace*, Jack Kornfield, 2008.

## නිදහස් කැමැත්ත

නිදහස් කැමැත්ත යනු, බාහිර බලපෑමක් නොමැතිව යම් පුද්ගලයකු කුමන ක්‍රියා මාර්ගයක් ගන්නේ ද, එය නිදහසේ තෝරා ගැනීමට ඇති හැකියාවයි. නිදහස් කැමැත්ත යන්නෙහි සාමාන්‍ය අදහස නියතිවාදය සමග පරස්පර වේ. අපට සම්පූර්ණ නිදහසක් තිබෙන බවක් හෝ අප අධිෂ්ඨාන කරගෙන සිටින බවක් බුදුදහම අපට උගන්වන්නේ නැත. නමුත්, අපගේ කැමැත්ත කොන්දේසි සහිත හෝ වැඩි හෝ අඩු මට්ටමකට සීමා වී ඇති බව අදහස් වේ. අපගේ තෝරා ගැනීමට සහ ක්‍රියා කිරීමට ඇති හැකියාව බොහෝ විට බලපෑමට ලක් වී ඇති අතර, ඒ නිසාම අපගේ ආශාවන්, කුසලතා, තත්ත්වයන්, සෞඛ්‍යය, පුරුදු සහ දැඩි විශ්වාසවල ශක්තිය, සහ වෙනත් විවිධ සාධකවලින් සීමා වී තිබෙන බව ස්වයං විග්‍රහයෙන් හෙළි වේ. අපගේ විසංඥය සියුම් ලෙස අපගේ අනුදැනුමකින් තොරව බලපෑම් කළ හැකි බව මනෝවිද්‍යාව අපට පවසයි. බොහෝ බෞද්ධ පුහුණුවල පරමාර්ථය වන්නේ අපට බලපාන සාධක දැක ඒවා තේරුම් ගැනීම සහ ඊට පසු ක්‍රමයෙන් ඒවා ජය ගැනීමයි. මේ ආකාරයට අප බොහෝ සෙයින් නිදහස් වන අතර, වඩා හොඳ තේරීම් ද කරනු ඇත.

## මිත්‍රත්වය

මිත්‍රත්වය (මිත්තතා, හෝ සක්ඛි) යනු පුද්ගලයන් දෙදෙනෙකු හෝ බොහෝ පුද්ගලයන් අතර ඇතිවන සමීප සහ ලිංගික නොවන සම්බන්ධයකි. මෙම මානව සම්බන්ධය බුදුපියාණන් වහන්සේ විසින් අනෙක් සියල්ලට වඩා වැඩියෙන් අගය කළ දෙයයි. බුදුපියාණන් වහන්සේ බොහෝ අවස්ථාවල සාමාන්‍ය මිතුරන්, එනම් සාමාන්‍යයෙන් යාළුවන්, සගයන්, හෝ අඳුනන අය වශයෙන් හඳුන්වන (මිත්ත, සඛ සහ සම්භත්ත), අප හොඳින් ඇසුරු කරන්නට සහ සමාජශීලීව හැසිරෙන්නට කැමැති නමුත් අපගේ ඔවුන් හා සම්බන්ධය ගැඹුරු නැති මිනිසුන් පිළිබඳව බුදුපියාණන් වහන්සේ බොහෝ විට කථා කළහ.

ආදරණීය මිතුරන්, හෘදයංගම මිතුරන්, අඹ යාළුවා, (මිත්ත, සුහද) හෝ සැබෑ මිතුරන් (සහාය හෝ සම්දිට්ඨ), යනුවෙන් බුදුපියාණන් වහන්සේ හැඳින්වූයේ අපට සමීප, අප සැබැවින්ම ආදරය කරන මිතුරන්ය. විශේෂයෙන්ම, අපට ඇත්තේ එවැනි මිතුරන් එක් කෙනෙකු හෝ දෙදෙනෙකි. සාමාන්‍යයෙන් එවැන්නන් එකම ලිංගයකට අයත් වේ. ඔවුන්ගේ මිතුදම් සාමාන්‍යයෙන් ජීවිත කාලයක් පවතී. එවැනි මිතුරන් වසර ගණනාවක් එකිනෙකා දකින්නේ නැති විය හැකිය. ඊට පසු හමුවූ විට, එකිනෙකා හමුවී ඇත්තේ පසුගිය සතියේ පමණක් මෙන් දැනේ. අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ඔහු සහ ඔහුගේ මිතුරන් සමග ඇති මිතුදම 'ශරීරයෙන් වෙනස් වූ, නමුත් එක මනසකින්' (කායා ඒකඤ්ඤ ච පන මඤ්ඤ චිත්තං, M.III,156) යැයි අදහස් වන බව බුදුපියාණන් වහන්සේට පවසා ඇත.

ආදරණීය මිත්‍රයෙකු සතු ගුණාංග ලෙස බුදුපියාණන් වහන්සේ සැලකූ දේ පිළිබඳව බුදුපියාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රයෙන් ගණනය කළහ. මේවාට ඇතුළත් වූයේ, ඔබ ඉල්ලා සිටින දේට වඩා ඔබට දීම, ඔබ බියට පත් වූ අවස්ථාවේදී ඔබේ බිය සැක දුරු කිරීම, ඕනෑම තත්ත්වයක් යටතේ මොන විදියේ අමාරුකම් තිබුණත්, අවංකව සිටීම, ඔබ සාර්ථකව සිටින අවස්ථාවේදී ඒ පිළිබඳව ප්‍රමුදිත වීම, ඔබට රැකවරණයක් නැති විට, ඔබ ආරක්ෂා කිරීම, වැරදි කිරීමට ඔබ අධෛර්යමත් කිරීම සහ යහපත කිරීම සඳහා ඔබ ධෛර්යමත් කිරීම, ඔබ විශ්වාස කිරීම සහ ඔබේ විශ්වාසය රැකීම යනාදියයි. යම් දිනක අවස්ථාවක් එළඹුණොත්, ආදරණීය මිතුරෙකු ඔබ වෙනුවෙන් තමන්ගේ ජීවිතය දෙන්නට ද හැකිය (D.III,187). ආදරණීය මිතුරෙකු පිළිබඳව ජාතක කතාවේ මෙසේ සඳහන් වේ :'ඔබ වෙනුවෙන් සාමාන්‍ය මිතුරෙකු පියවර හතක් යන විට, ආදරණීය මිතුරෙකු පියවර දොළසක් යනු ඇත. ඔහු සති දෙකක් හෝ මාසයක් එසේ කරයි නම්, ඔහු පවුලයි, ඊටත් වඩා කරන්නේ නම්, ඔහු ඔබගේ දෙවන ආත්මයයි' (Ja.I,365). මෙවැනි ගුණාංගවලින් අඟවන්නේ කරුණාව, ලෝභකමින් තොර පරිත්‍යාගශීලීත්වය, හිතවත් බව, මුදිතා සහ සම්පූර්ණ විවෘතබව සහ විශ්වාසයයි. පුද්ගලයෙකු, 'මවක් තමන්ගේම දරුවා ඇකයෙහි හොවා ගෙන රැකබලා ගන්නා අයුරින්ම සහ පෝෂණය කරන අයුරෙන්ම එවැනි මිත්‍රයෙකු රැක ගන්නා බව' බුදුපියාණන් වහන්සේ පැවසූහ (D.III,188).

පුද්ගලයන් දෙදෙනෙකුගේ මිත්‍රත්වයක වැදගත් ආධ්‍යාත්මික මූල ද්‍රව්‍යය ඇතුළත්ව තිබේ නම්, ඒ අය

බුදුපියාණන් වහන්සේ හඳුන්වන ආකාරයට කල්‍යාණ මිත්‍ර බවට පත් වේ. ඔවුන්ගේ සම්බන්ධය කල්‍යාණ මිත්තතා නම් වේ. කල්‍යාණ මිත්‍රයා පරමාදර්ශී මිත්‍රයා වන අතර, කල්‍යාණ මිත්තතා උත්තරීතර මිනිස් සබඳතාවකි. කල්‍යාණ යන්නේ පදගත අර්ථය 'සුන්දර' හෝ 'අතිශය ලක්ෂණ වූ' යන්නයි. නමුත්, බුදුපියාණන් වහන්සේ කායික ආකර්ෂණය මෙයින් අදහස් නොකළහ. උන්වහන්සේ අදහස් කළේ අභ්‍යන්තර ලස්සනයි, අවංකත්වය, කරුණාවන්තබව, ආවේණික සත්ගුණය සහ ධර්මයට ඇති ඇල්ම යනාදියේ ඇති සුන්දරත්වයයි.

බුදුපියාණන් වහන්සේ ලස්සන මිතුරෙකු ලෙස විස්තර කළේ 'ආදරණීය, ප්‍රසන්න, හොඳ උපදේශකයෙකු, පළපුරුදු, කැප වූ, කරුණු හොඳින් පැහැදිලි කිරීමට හැකි, ගැඹුරු අවබෝධයක් ඇති, සහ ඔබගේ සුභසාධනය පිළිබඳව සැලකිලිමත් වීම' යනුවෙනි (A.IV,32). උන්වහන්සේ ලස්සන මිත්‍රත්ව පිළිබඳව මෙසේ කථා කළහ. 'ආධ්‍යාත්මික මිත්‍රත්වය යනු කුමක් ද? මේ සම්බන්ධයෙන් ගමක හෝ නගරයක ජීවත් වුවද, තරුණ හෝ වයසක හෝ ඇදහීමෙන්, ගුණධර්ම වලින්, ත්‍යාගශීලී බවින් හෝ ප්‍රඥාවෙන් පිරිපුන් පුද්ගලයන් සමග ආශ්‍රය කරයිද, එකතු වෙයි ද, සම්බන්ධ වෙයි ද, සාකච්ඡා කරයි ද, එය ආධ්‍යාත්මික මිත්‍රත්වය යනුවෙන් හැඳින් වේ (A.IV,282).

'ඥානවන්තයින් විසින් තම තමාට ධර්මය මුදුන්පමුණුවා ගත යුතු' බව බුදුපියාණන් වහන්සේ අවධාරණය කළහ (M.I,37). මෙය අනෙක් අයගෙන් වෙන් වී හුදෙකලාව කළ නොහැකි බව උන්වහන්සේ

අවධාරණය කළහ. ආත්ම විශ්වාසයෙන් ස්වාධීන වීම වැදගත් වේ. නමුත්, එය මිත්‍රත්වය සපයන චිත්තවේගී පෝෂණය සමග සමබර විය යුතුයි. ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුපියාණන් වහන්සේට ආමන්ත්‍රණය කරමින්, 'පූජනීය ජීවිතයේ හරි අඩක්ම ආධ්‍යාත්මික මිත්‍රත්වය, කුළුපගතාව සහ හවුල්වීම' යැයි පැවසූහ. බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ, 'එසේ නොවේ ආනන්ද, එසේ නොවේ, ආධ්‍යාත්මික මිත්‍රත්වය, කුළුපගතාව සහ හවුල්වීම සම්පූර්ණ පූජනීය ජීවිතයයි. යම් කෙනෙකුට ආධ්‍යාත්මික මිත්‍රයෙකු සිටින විට, ආධ්‍යාත්මික කුළුපග මිත්‍රයෙකු, ආධ්‍යාත්මික හවුල්කරුවෙකු, විසින් ආර්ය අෂ්ටාංගික මාර්ගය වර්ධනය සහ වැඩි දියුණු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකිය' (S.V,2). බලන්න **විශ්වාසදායී බව**

*Buddhism and Friendship*, Subhuti, 2004.

## මූලධර්මවාදය

මූලධර්මවාදය (ඉදංසච්චාභිනිවෙස) යනු පූජනීය ධර්ම ග්‍රන්ථ වචනාර්ථයෙන් හා පටු ලෙස අර්ථ දැක්විය යුතුය යන විශ්වාසයයි. මූලධර්මවාදීහු තම ආගම පිළිපැදීමේදී යම් මතයක තදින් එල්බ සිටිති. ඔවුහු වෙනත් ආගම් කෙරෙහි නුරුස්සති. ඔවුන් බොහෝ විට ධර්ම ග්‍රන්ථ ඔවුන්ගෙන් වෙනස් ලෙසට අර්ථකථනය කරන සෙසු ආගම්වාදීන් කෙරෙහි ඊටත් වඩා නුරුස්සති. 'සත්‍යය මෙය පමණයි, අනෙක් සියල්ලම අසත්‍යයි' යනුවෙන් කෝපයෙන් ප්‍රකාශ කරමින් සිටිනා පුද්ගලයා මූලධර්මවාදියෙක් ලෙස බුදුපියාණන් වහන්සේ විස්තර කළහ (M.II,171).

බුදුදහමේ සාමාන්‍යයෙන් ඇති විවෘත සහ විමසිය හැකි ස්වභාවය නිසා, මූලධර්මවාදීන් හෝ මූලධර්මවාදී ව්‍යාපාර බුදුදහමින් හටගැනීම දුර්ලභය. පුද්ගලයෙකු බුදුදහම පිරික්සා බලද්දී, වචනය (ව්‍යඤ්ජන) පමණක් නොව, හරය ද (අත්ථ) ද ගත යුතු බව බුදුපියාණන් වහන්සේ වදාළහ. මෙසේ පැවසීමෙන් උන්වහන්සේ අදහස් කළේ, ධර්මයෙන් ඔබ්බට නිකම්ම වචනවලට වඩා පරිමාණයන් සහ සියුම් වෙනස්කම් තිබෙන නිසාය. ඒ නිසා නිකම්ම වචන දැන ගැනීම ප්‍රමාණවත් නොවේ (D.III,127; Vin.I,20) වෙනත් තැනක, උන්වහන්සේ මෙසේ පැවසූහ: 'මම ධර්මය විවිධ ආකාරයෙන් උගන්වා ඇත්තෙමි. නමුත්, එය අන් අය විසින් උගන්වනු ලබන (වෙනස්, නමුත් තවමත්) හොඳින් කථා කරන වචනවලට එකඟවන සහ අනුමත කරන අය, ඔවුන් සමග සමගියෙන්, අන්‍යෝන්‍ය ගෞරවයෙන්, වාද-විවාද නොකරමින්, මිශ්‍රවූ කිරි සහ ජලය මෙන් එකිනෙකා කෙරෙහි ආදර දැසින් බලා සිටිනු ඇතැයි අපේක්ෂා කළ හැකිය'(S.IV,225). ආගමික ප්‍රකාශයන් තක්සේරු කිරීමට අප ගන්නා උත්සාහයන් වලදී, ආගමික ග්‍රන්ථවලට වඩා අපගේ අත්දැකීම් මත අප රඳා පැවතිය යුතු බව ජනප්‍රිය කාලාම සූත්‍රයෙන් බුදුපියාණන් වහන්සේ වදාළහ (A.I,189).

## අවමඟුල්

අවමඟුලක් (මතකිච්ච) යනු මිය ගිය කෙනෙකුගේ ශරීරය ඉවත් කිරීම හා සම්බන්ධ පිළිවෙතයි. බුදුපියාණන් වහන්සේගේ කාලයේ සාමාන්‍ය මිනිසුන්ගේ අවමඟුල් උත්සව සැහෙන්න සරලයි.

මිනිසුන් සිව්දෙනෙකු දේහය මළමිනී ගොඩගසා ඇති ගෙයට ගෙන යන අතර, ඒ පිටුපස පන්දම් රැගෙන, හඬමින් මඟ වැලපෙන ඥාතීහු සහ මිතුරෝ පෙරහරකින් යති (Ja.VI,464; Sn.580; Th.779). ශරීරයෙන් මිදීමේ සාමාන්‍ය ක්‍රමය වන්නේ ආදාහනය කිරීම හෝ විද්‍යුත් උපකරණයක ප්‍රතිරෝධක කම්බියකට නිරාවරණය කිරීමය. මෙයින් පළමුවැන්න සිදුකරන්නේ නම් දේහය සෑය මත තබා, ඒ මත මල්, සුවඳ දුම් සහ මල්මාලා තබනු ලැබේ. ඊට පසු, ගිනි තැබීමට පෙර, සහභාගිවන්නෝ වට තුනක් සෑය වටා යති. මරණයෙන් 12වන හෝ 13වන දිනට පසු, සද්ධා උත්සවය පවත් වනු ලබයි. එහිදී ආහාර, ඇඳුම් සහ වෙනත් තෑගි මිය ගිය තැනැත්තාගේ නාමයෙන් බ්‍රාහ්මණයන්ට දෙනු ලබයි (A.I,166; D.I,97).

බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණ උත්සවය සූදානම් කරන ලද්දේ කුසිනාරාවේ වැසියන් වූ මල්ල රජදරුවන් විසිනි. රාමායනයේ සහ වෙනත් පසුකාලීන සාහිත්‍යයේ විස්තර කර ඇති රාජකීය අවමංගල උත්සවවලට සමානවූ ආකාරයකට මෙහෙයවන ලදී. ඔවුහු කුඩාරම් සහ වියන් ඉදිකර, සංගීතය සහ නැටුම් කැටුව, බුදුපියාණන් වහන්සේගේ ශ්‍රී දේහයට සුවඳදුම් සහ මල්මාලාවලින් ගෞරව කරමින්, දවස් ගණනාවක් ගත කළහ. ඊට දින හතකට පසු, ඔවුහු ඔවුන්ගේ හිස් සෝදා, අළුත් ඇඳුම් ඇඳ, ශ්‍රී දේහය යකඩ පෙට්ටියක තැන්පත් කර, තෙල් ආලේප කර, එය තුනී රෙදිපට කිහිපයකින් එතුහ (D.II,159-60). ශ්‍රී දේහය නගරය හරහා වැඩම කරමින්, දකුණු දොරටුවට වඩා නැගෙනහිර දොරටුවෙන් පිටතට වැඩම කර ආදාහනය කරන ලදී. උසස් පුද්ගලයන්ගේ භෂ්මාවශේෂ සාමාන්‍යයෙන් මැටි

ගොඩැල්ලක් (ථූප) යට තබන අතර, හරස් පාරක පිහිටා ඇත. බුදුපියාණන් වහන්සේ සම්බන්ධයෙන්, උන්වහන්සේගේ භෂ්මාවශේෂ කොටස් අටකට බෙදා සෑම කොටසක්ම එවැනි ස්තූපයක් තුළ තැන්පත් කරන ලදී.

වර්තමානයේ විවිධ බෞද්ධ සංස්කෘතීන් ඔවුන්ගේ අවමංගල්‍ය කටයුතු ශ්‍රී ලංකාවේ මෙන් සරල සහ ගෞරවනීය ලෙසත්, තායිලන්තයේ මෙන් විචිත්‍රවත් හා වර්ණවත් ලෙසත් පවත්වති. චීනයේ සහ වියට්නාමයේ ගෞරවනීය භික්ෂූන් වහන්සේලාගේ දේහයන් සමහර විට මිනිය කල් තබා ගැනීමට සකස් කරති. ටිබෙටයේ සාමාන්‍ය මිනිසුන්ගේ සිරුරු සමහර විට බෙදා වෙන්කර උකුස්සන්ට සහ බල්ලන්ට කන්නට දෙයි. බලන්න **දෝණ, ශෝකය සහ ස්තූප**

## සූදු ක්‍රීඩාවේ යෙදීම

සූදු ක්‍රීඩාවේ යෙදීම (ජූතකීළා) යනු මුදල් අවදානමක් ගන්නා ක්‍රීඩාවකි. බුදුපියාණන් වහන්සේගේ කාලය වනවිටත්, සූදුව පුරාණ ක්‍රියාවක් විය. වඩා පැරණි හින්දු ධර්මග්‍රන්ථ වූ වේදයේ ප්‍රසිද්ධ 'සූදුවේ නියැලෙන්නාගේ විලාපය' අඩංගු වේ. එහි ඔට්ටු අල්ලා පැරදී තම බිරිඳ සහ දරුවන් අහිමි වූ හඬා වැලපෙන මිනිසෙකු පිළිබඳව සඳහන් වේ. එවැනි අන්ත ලෙස ඔට්ටු ඇල්ලීම පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වේ (M.III,170). මඳ වශයෙන් පුදුමයට කරුණක් නම් බුදුපියාණන් වහන්සේ සූදුව දුටුවේ නුසුදුසු ක්‍රියාවක් ලෙසය. උන්වහන්සේ මෙසේ පැවසූහ: 'සූදුවට ඇබ්බැහිවීමෙන් මෙම අවදානම් හය ඇති වේ. ජයග්‍රහණය කිරීමේදී පුද්ගලයෙකුට වෛරය උපදී, පරාජය වනවිට, තමන්ගේ වස්තුව නැතිවීම පිළිබඳව වැලපෙයි. එම පුද්ගලයාගේ වචන උසාවියේදී පිළිනොගනී. මිතුරෝ සහ නිලධාරීහු මඟහරිති. විවාහය පිණිස කෙනෙකු සොයන විට, සූදුවේ යෙදෙන්නෙකුට කලත්‍රයෙකු පෝෂණය කළ නොහැකි බව පවසයි' (D.III,183). තවත් අවස්ථාවක 'සූදුව මත ධනය නාස්ති කිරීම' පුද්ගලයෙකුගේ පිරිහීම සිදුවන බව උන්වහන්සේ වදාළහ (Sn.106).

කෙසේ නමුත්, සූදුව වර්ග තුනකට බෙදෙන බව අපට කිව හැකිය - විනෝදාත්මක, පුරුදු සහ ඇබ්බැහිවීම වශයෙනි. පළමු වර්ගය වන්නේ යම් කෙනෙක් ඉඳහිට කුඩා ඔට්ටු සඳහා කාඩ් සෙල්ලම්

කරයි. එසේ නැත්නම් පුණ්‍ය කටයුත්තක් සඳහා ලොතරැයි ටිකට් එකක් මිලදී ගනී. පුරුද්දට සූදුවේ යෙදීම යනු කෙනෙකුගේ ආදායමෙන් සැලකිය යුතු, නමුත් කළමනාකරණය කළ හැකි ප්‍රතිශතයක් නිතිපතා සූදුව සඳහා යෙදවීමයි. සූදුවට ඇබ්බැහි වීම යනු සූදුවට එළඹෙන අවස්ථාව ප්‍රතික්ෂේප කිරීමට ඇති නොහැකියාවයි. ඒ නිසා සැමවිටම ණයතුරුස්වලින් පෙළේ. බෞද්ධ දෘෂ්ටි කෝණයකින් බලන කළ, විනෝදයට කරන සූදුව හානිකර නොවන බවට සලකන අතර, එය ශික්ෂා පදවලට පටහැනි ද නොවේ. කෙසේ වෙතත්, සියලු සූදු ක්‍රීඩා අවම වශයෙන් ලෝභයේ මූලයක් මත ක්‍රියා කරන හෙයින් ලොතරැයි සහ වාසනාව උරගා බලන ක්‍රීඩාවලින් අරමුදල් රැස්කිරීම බෞද්ධ සංවිධානවලට නිශ්චිතවම නොගැළපේ. පුරුදු සහ ඇබ්බැහිවීම් නිසා සිදු කරන සූදු ක්‍රීඩා මනෝවිද්‍යාත්මකව, සමාජීය සහ ආධ්‍යාත්මික වශයෙන් හානිකර වන්නේ ඒවාට පෙලඹී ඇත්තේ සහ ඒවායින් ශක්තිමත් වන්නේ මෝහය, කෑදරකම සහ වාසනාව සහ 'අවාසනාව' පිළිබඳ වැරදි විශ්වාසයක් නිසාය.

බුදුපියාණන් වහන්සේට අනුව පුද්ගලයෙකු 'වාසනාවන්ත' වන්නේ දැහැමි ජීවිතයක් ගත කිරීමෙනි. සූරන ලොතරැයි කාඩ් පතක් තිබීමෙන් නොවේ. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'සූදු ක්‍රීඩාවේ යෙදෙන්නෙකු තමන්ගේ පළමු ප්‍රයත්නයේදීම දිනුමක් ලබන්නට නම්, ඔහුගේ වාසනාව එසේ වුව ද නොවැදගත් වේ. කයෙන්, වචනයෙන් සහ මනසින් බුද්ධිමත්ව හැසිරීම, මරණයෙන් මතු දිව්‍ය ලෝකයේ නැවත ඉපදීමට

බොහෝ වාරයකින් 'වාසනාවන්ත' වේ' (M.III,178).

බලන්න **අනාගතය කීමේ හැකියාව**

'Compulsive Gambling in Ancient Indian Texts.'A.V. Bhide, *Indian Journal of Psychiatry* 2007.

## ගංගානම් ගඟ

ගංගානම් ගඟ (ගඞ්ගා) යනු ඉන්දියාවේ දිගම ගඟයි. එය බුදුපියාණන් වහන්සේ වැඩ සිටි මධ්‍යම දේශය හරහා ගලා යයි. ගඟේ විශාලත්වය සහ අලංකාරය, සහ ගංවතුරක් ඇති වූ විට බෝග පෝෂණය කිරීමට සහ ගම්මාන පිසදැමීමට ඇති හැකියාවෙන් අදහස් වන්නේ ගඟ වෙත ප්‍රණාමය සහ ගෞරව සම්ප්‍රයුක්ත බියක් මුසු අයුරෙන් බැලූ බවක්ය. ජාතක කතාවේ සඳහන් එක් චරිතයක් මෙසේ පවසයි: 'තම ජලය ගලා බසිමින් සහ පතුරුවමින් සිටින ගංගානම් ගඟට මම ගෞරව කරමි' (J.V,93). පැරණි විවරණ තුළින් ගංගාවේ මූලාශ්‍රය පිළිබඳ මුළුමනින්ම අපූරු විස්තරයක් ලබා දෙමින් පළමුව එළඹෙන්නේ ගංගාව හිමාල කඳුකරයේ අනොතත්ත විලෙන් ආරම්භ වෙමින් නිදහස් අවකාශය තෙක් නැඟී ඊට පසු ඉන්දියාවට ගලා යෑමට පෙර බොහෝ පර්වත උමං මාර්ග පසු කර යන බවයි. ගංගානම් ගඟේ උල්පත පිළිබඳව කිසිවක් සඳහන් වී නැත. නමුත් එය ආරම්භ වන්නේ හිමාලයේ කොතැනක හෝ සිට බව සඳහන්ය. බෝධිසත්වයන් වහන්සේ එක් භවයකදී තාපසයෙකුව සිටිද්දී උන්වහන්සේ හිමාලයට ගොස් 'ගංගානම් ගඟ අසබඩ වංගුවක අසපුවක් සෑදූ බව' ජාතක කතාවේ බොහෝ විට සඳහන් වේ (e.g. Ja.II,145; II,258).

ගංගානම් ගඟේ උඩ දිසාවට ප්‍රවේශය උද්ධගඞ්ගා

වශයෙන් හැඳින් වේ (Ja.II,283); යමුනා ගඟ එයට පයාගවලදී සම්බන්ධ වන බව සඳහන් වේ (නූතන අල්ලහබාද් Ja.II,151). අවසානයේ මෙම ගඟ මුහුදට ගලා බසී (A.IV,198-9). ඉන්දියානුවන් දිගු කාලයක් තිස්සේ විශ්වාස කර ඇත්තේ ගංගානම් ගඟේ ජලයෙන් ඔවුන් සිදු කර ඇති ඕනෑම නපුරක ප්‍රතිඵල සෝදා ඉවත් කරන බවයි. මෙම විශ්වාසය බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ (M.I,39).

බුදුපියාණන් වහන්සේ බොහෝ විට ගංගානම් ගඟ උන්වහන්සේගේ ඉගැන්වීම්වලදී උපමාවක් හෝ රූපකයක් වශයෙන් යොදා ගත්හ (උදාහරණ M.I,225; S.II,184; IV,298). යම් දෙයක ගණනය කළ නොහැකි තරම් විශාල ගණනක් පිළිබඳ අදහසක් දෙන්නට අවශ්‍ය වූ විට, උන්වහන්සේ පැවසුවේ එය ගංගානම් ගඟේ වැලිකැට තරම් බහුල බවයි (S.IV,376). නිර්වාණය සාක්ෂාත් කර ගැනීම සඳහා උන්වහන්සේගේ ඉගැන්වීම්වල ඇති සාර්ථකත්වය අවධාරණය කරන විට, මෙම අදහස පැහැදිලි කිරීම සඳහා උන්වහන්සේ ගංගාවේ නියත වශයෙන්, නැවැත්විය නොහැකි, ලෙස ගංගානම් ගඟේ නැගෙනහිර දිසාවට ගලායෑම භාවිත කළහ: 'ගංගානම් ගඟ නැගෙනහිර දිසාවට ගලා යන, ලිස්සා යන, යොමුවන ආකාරයටම, ආර්ය අෂ්ටාංගික මාර්ගයට යන්නට අවශ්‍ය ගුණ වගා කරන විට සහ ඒ සඳහා බොහෝ දේ කරන විට, නිර්වාණය වෙත ගලා යයි, ලිස්සා යයි, යොමු වෙයි' (S.V,40).

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ අවසාන සංචාරයේදී පාඨලිපුත්ත (දැන් පැටිනා) නගරයෙන් පිටවන විට, වේසාලියට ප්‍රවේශ වීම සඳහා, ගංගානම්

ගඟ තරණය කරන්නට සිදුවිය. මේ මොහොත වන විට ගඟ කිලෝමීටරයකට ආසන්න පළලකින් යුක්ත වන අතර, එම පළල පැරණි කාලයේ තරමටම ආසන්නව දැනටද සමහර විට තිබිය හැකිය. බුදුපියාණන් වහන්සේගෙන් සමු ගැනීමට පැමිණි නගර වැසියන් උන්වහන්සේට ගඟ තරණය කිරීම සඳහා පාරුවක් හෝ බෝට්ටුවක් සොයමින් ගං ඉවුරේ ඉහළට සහ පහළට ඇවිද ගියහ. සමහරු පාරු සෑදීමේ උත්සාහයක් ලෙස බට එකට බැඳීමට පටන් ගත්හ. මහාපරිනිබ්බාන සූත්‍රයට අනුව, 'එකල ශක්තිමත් මිනිසෙකු තම අත දිගුකර නැවත එය ඇද ගන්නා වේගයේ තරමටම ඉක්මණින්, බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ භික්ෂූන් වහන්සේලා මෙම ඉවුරෙන් අතුරුදහන් වී ගඟේ අනෙක් ඉවුරේ නැවත පෙනී සිටියහ' (D.II,89).

බුදුදහමට ක්‍රිස්තියානි දහමේ යම් බලපෑමක් ඇතැයි විශ්වාස කළ අය සමහර විට මෙම සිද්ධිය උපුටා දක්වන්නේ ජේසුස්වහන්සේ ජලය මත ඇවිදීම පිළිබඳ කථාවට සමාන ලෙසය (Mark 6, 45-52). මෙම සැසඳීම කෙසේ නමුත්, විරල එකකි. ජේසුස්වහන්සේ ජලය මත ඇවිදීම ගැන කථාන්තරය ලිවූ කවුරු වුණත්, එය අතිශයෝක්තියක් නොවූ සත්‍යය ලෙස විශ්වාස කර, එය ජේසුස්වහන්සේගේ දේවත්වයට සාක්ෂියක් ලෙස ඉදිරිපත් කර ඇත. බොහෝ ක්‍රිස්තියානීහූ එය එසේ යැයි විශ්වාස කරති. බුදුපියාණන් වහන්සේ ගංගානම් ගඟ තරණය කිරීම පිළිබඳ කථාවේ උන්වහන්සේ වතුර මත ඇවිදින්නේ නැත. නමුත් උන්වහන්සේ එක් ස්ථානයකින් අතුරුදහන් වී තවත් ස්ථානයකින් නැවත දර්ශනය වේ. ක්‍රිස්තියානි කථාවේ ජේසුස්වහන්සේගේ

ශ්‍රාවකයෝ ඔහුගේ දේවත්වය සහ ඔවුන්ගේ සීමිත මනුෂ්‍යත්වයත් අවධාරණය කරමින් මවිතයෙන් බලාසිටියහ. බෞද්ධ කථාවේදී, බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන් යන දෙඅංශයම අතුරුදහන් වී නැවත පෙනී සිටිති. එය ඔවුන්ගේ චෛතසික බලයන් සම්බන්ධයෙන් ඔවුන්ගේ ආධ්‍යාත්මික සමානාත්මතාවය හඟවයි.

නමුත්, වඩාත් වැදගත් ලෙස, සමහර මිනිසුන් එසේ කරන්නට ඇති නමුත්, බෞද්ධ කථාව අතිශයෝක්තියක් ලෙස ගත යුතු නොවේ. එය උපදේශාත්මක සැරසිල්ලක උදාහරණයකි. වැදගත් කරුණක් ඉදිරිපත් කිරීමට පෙර අවධානය රඳවා ගැනීමට අදහස් කරන කථාවකි. පාලි ත්‍රිපිටකයේ සහ වෙනත් ඉන්දියානු සාහිත්‍යයේ බොහෝ විට භාවිත කර ඇති සාහිත්‍යමය යෙදුමකි. මෙම කථාවේ වැදගත් කරුණ වන්නේ බුදුකෙනෙකු හෝ අර්හත්ඵලය ලැබූ පුද්ගලයන්ගේ හෝ වේවා, මාර්ගඵල ලාභියෙකුගේ ඇති මහේශාක්‍ය බව අවධාරණය කිරීමයි. සිද්ධිය අවසානයේදී බුදුපියාණන් වහන්සේ ආපසු හැරී බලන විට, විරුද්ධ දිශාවේ ඉවුර දිගේ මිනිසුන් තවමත් ඉහළට සහ පහළට දුවමින් සිටිනු දුටුවහ. උන්වහන්සේ මෙසේ පැවසූහ:'මිනිසුන්ට සාගරය, විලක් හෝ ජලය පැතිරුණු විශාල ප්‍රදේශයක් තරණය කිරීමට අවශ්‍ය වූ විට, ඔවුහු පාලමක් හෝ පාරුවක් සාදා ගනිති. නමුත්, ප්‍රඥාවන්තයා දැනටමත් තරණය කර ඇත' (D.II,89). බලන්න **බුදුපියාණන් වහන්සේ සහ ජේසුස්වහන්සේ සහ ප්‍රාතිහාර්යයන්**

## ගෙවතු

ගෙවතු (ආරාම හෝ උය්‌යාන) යනු පැළ වගාකර ඇති බිමකි. පැරණි ඉන්දියාවේ ගෙවතු වැවීම් කලාව ඉහළින්ම දියුණුව පැවතුණි. වෘක්ෂායුර්වේද වැනි ලෞකික ආගමකට නැති සාහිත්‍යමය කටයුතුවලදී ගෙවත්තක් සකස් කරන්නේ කෙසේ ද, මල්හට ගන්නා කුමන පැළ තෝරාගත යුතු ද, ඒවා පැළ කළ යුතු පිළිවෙල සහ ඒවා පෝෂණය කළ යුතු ආකාරය පිළිබඳව විස්තරාත්මක උපදෙස් ලබා දෙයි. අවධානය දෙන්නාවූ බිරිඳක පිළිබඳව කාම සූත්‍රයේ මෙසේ සඳහන් වේ: 'ඇය පොළොව ප්‍රවේසමින් සැකසිය යුතුයි. සුවඳවත් පැළෑටි, එළවළු, උක් පඳුරු ආදිය සිටවිය යුතුයි. ඇය අරළු, සමන් පිච්ච සහ වෙනත් මල්හට ගන්නා ගස් සහ පේළියට පඳුරු ද සිටවිය යුතුයි. වත්තේ මැද, ලිඳක්, පොකුණක් හෝ ජල තටාකයක් කැණිය යුතුයි. යාචකයන් සහ බෞද්ධ හා ජෛන භික්ෂූන් වහන්සේලා පිටත තබා ගත යුතුයි.'

ත්‍රිපිටකයේ බොහෝ විට සඳහන් ගෙවතු වර්ග දෙක වන්නේ පලතුරු උයන් (ඵලාරාම), සහ විනෝද උයන් (පුෂ්පාරාම)ය. ඵලාරාම යනු සාමාන්‍යයෙන් ගමක අද්දර පිහිටි අඹ ගස්ය. විනෝද උයන් (පුප්ඵාරාම) රජවරුන්ට හෝ ධනවතුන්ට අයිති, නගරවලින් පිටත පිහිටි, නිවාඩු කාලවලදී සහ සති අන්තවලදී භාවනා කිරීමට, විනෝද සංචාරවලට සහ උත්සවවලට භාවිත කෙරේ (Vin.III,49). මල් හටගන්නා පඳුරු, ගස් සහ වැල්වලට අමතරව, මෙම සතුටු උයන්වල ඉතා වැදගත් අංග වූයේ තාවකාලික

ශාලාව, නෙළුම් පොකුණ, ගල්වලින් නිමැවූ බංකුව සහ විශාල ගසක අත්තකට එල්ලන ලද ඔංචිල්ලාවයි. මොනරුන් සහ ලේනුන්ට ආහාර ලබා දෙන සහ පොකුණුවල මාළුන් බෙර වාදනයක ශබ්දයට ආහාර ගැනීමට පැමිණෙන්නට පුහුණු කිරීමට ද ස්ථානයක් තිබිය හැකිය (Ja.II,227). මෙම උයන් බොහොමයක් තාප්පයකින් ආවරණය වී තිබුණු අතර, උයන්පල්ලෙකු විසින් නඩත්තු කරන ලදී. පැරණිතම බෞද්ධ ආශ්‍රම ක්‍රමයෙන් ඇතිවී තිබෙන්නේ බුදුපියාණන් වහන්සේට පරිත්‍යාග කරන ලද පළතුරු වතු සහ විනෝද උද්‍යානවලිනි. මේවායින් වඩාත් ප්‍රසිද්ධ ඒවා වන්නේ වේළුවනාරාමය සහ ජීවකගේ අඹ වනයයි. මේ දෙකම පිහිටියේ රජගහ නුවරයි. එසේම ජේත කුමාරයා විසින් පරිත්‍යාග කරන ලද වනය පිහිටියේ සාවත්ථියේ දීය. 'නගරයට වඩා සමීප නොවූ සහ වඩා දුර නොවූ, ඒමට සහ යාමට සුදුසු, මිනිසුන්ට අවශ්‍ය විටක ප්‍රවේශ විය හැකි, දිවා කාලයේ ජනාකීර්ණ නොවූ, රාත්‍රියේ සෝෂාකාරී නොවූ, නිහඬ, මිනිසුන්ගෙන් හුදෙකලා වූ, බාධා නොමැතිව ඉඳගෙන සිටීමට සුදුසු සහ ආධ්‍යාත්මික පුහුණුවට යෝග්‍යවන බව' මෙම පළමු ස්ථානය පිළිබඳව විස්තර කර ඇත (Vin.I,39). මෙම උයන් යම් තරමකට හුදෙකලාව සහ නිශ්ශබ්දතාව සපයන අතර, ඊට අමතරව ඒවා විශේෂයෙන්ම 'ආධ්‍යාත්මික පුහුණුවට ද (පටිසල්ලානසාරුප්ප) යෝග්‍ය' වන්නේ කුමක් නිසා ද?

පැරණි බෞද්ධයන් අවබෝධ කර ගත්තේ පුද්ගලයෙකුගේ ආසන්නම වටාපිටාව ඔහුගේ මනස කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි බවයි. උදාහරණ වශයෙන්, 'උද්‍යාන, උයන්වතු සහ පොකුණු, ප්‍රසන්න

අපේක්ෂා, ගම්බද දර්ශන, නගරබද සහ ගම්බද කඳුකර නිල් පටල සහිත දර්ශනයකින් යුක්ත නවාතැනකට කලබලය සහ කනස්සල්ල සමනය කළ හැකිය (Vism.110). වනාන්තර මෙන්ම, උද්‍යානවලට ද මනස සන්සුන් කිරීමට ස්වභාවික හැකියාවක් ඇති බව පෙනේ. පර්යේෂණවලින් පෙන්වා දී ඇත්තේ වර්ණ ද කෙනෙකුගේ මානසික තත්ත්වය කෙරෙහි බලපාන බවයි. නිල් සහ කොළ, විශේෂයෙන්ම සන්සුන් බලපෑමක් ඇති කරන අතර, ඇත්ත වශයෙන්ම කොළ වර්ණය උද්‍යානයක ප්‍රධාන වර්ණයයි. ප්‍රභා සංශ්ලේෂණ ක්‍රියාවලියේ දී ශාක ඔක්සිජන් සඳහා කාබන් ඩයොක්සයිඩ් හුවමාරු කරයි. පැළ නොමැති නගරබද ප්‍රදේශ හෝ නිවෙස් වැනි ආවරණය වූ ගෘහස්ථ ප්‍රදේශවලට වඩා වැඩියෙන් පඳුරු සහ ගස් ඇති උද්‍යාන ඔක්සිජන් බහුල පරිසරයක් බවට පත් කරයි. වැඩියෙන් ඔක්සිජන් ආශ්වාස කිරීමෙන් මනස අවදි කිරීමට සහ තියුණු කිරීමට හේතු වෙයි. පළපුරුදු වෘත්තිකයෙකුට ඕනෑම තැනක භාවනා කළ හැකි වුවද, සමහර පරිසරයන් අනෙක් තැන්වලට වඩා භාවනා කිරීමට වඩාත් යෝග්‍ය බවට සැකයක් නැත. උද්‍යාන මේ සඳහා නිදසුනක් වන අතර, මුල් කාලීන බෞද්ධයන් ඔවුන්ගේ ආශ්‍රම සඳහා එවැනි ස්ථානවලට වැඩි කැමැත්තක් දැක්වූයේ මන්ද යන්න එයින් පැහැදිලි වේ.

ජපානයේ කැපී පෙනෙන උද්‍යානවලින් සමහරක් ආරාමවල පිහිටා තිබේ. මේ අතරින් කයටෝවල රියෝන්-ජි ඉතාමත් ජනප්‍රිය එකයි. ටිබෙටයේ ලසා හි නොර්බලිංග, ශ්‍රී ලංකාවේ අනුරාධපුරයේ දැන් නටබුන් වී ඇති රන්මසු උයන තවත් සුන්දර උද්‍යාන

දෙකත් භාවනා වැඩි දියුණු කිරීමට හොඳ ස්ථාන දෙකකි. ප්‍රතිසංස්කරණය කරන්නෙකු වන තායිලන්තයේ භික්ෂුවක වූ බුද්ධදාස විසින් ගැමි පරිසරයක පිහිටුවන ලද සුඅන් මොක්ඛ නමැති ආරාමය විමුක්තියේ උද්‍යානය ලෙස නම්කර ඇත.
'The Buddhist Monastery and the Indian Garden' G. Schopen, *Journal of the American Oriental Society*, 2006.

## සුදු ලූනු

සුදු ලූනු (ලසුණ) යනු ඇල්ලියම් සතිවුම් පැළෑටියේ ලූනු වැනි බිකයි. ඒවා අනුභව කරන්නේ එහි ඇති කට දන රසය නිසාය. හේතු නොදන්නා, බොහෝ ඉන්දියානුවෝ සුදු ලූනු, ලූනු (පලණ්ඩුක) සහ ඒ හා සමාන එළවළු ආහාරයට ගැනීමෙන් නොහික්මුණු රාගය අවුස්සන්නේ යැයි යන විශ්වාසය නිසා බොහෝ කාලයක සිට ඒවා භාවිතයෙන් වළකිති. බ්‍රාහ්මණයෙකු සුදු ලූනු අනුභව කළහොත්, ඔහුට තම කුලය අහිමි වන බව මනුස්මෘතියේ සඳහන් වේ. බෞද්ධ භික්ෂූන් මෙම මිථ්‍යා විශ්වාසය තෝරා ගෙන, එය චීනයට ගෙන ගොස් ඇත. අදටත් බැතිමත් චීන බෞද්ධයෝ කිසිදිනක සුදු ලූනු ආහාරයට නොගනිති. භික්ෂූ - භික්ෂුණීන්ට සුදු ලූනු ආහාරයට නොගන්නා ලෙස බුදුපියාණන් වහන්සේ පවසා ඇත. නමුත් මෙම තහනම සඳහා විචාරශීලී හේතූන් ඒ සඳහා ඉදිරිපත් කළහ. ඒ හුස්ම සමග එයින් පිටවන දැඩි ආඝ්‍රාණය අනෙක් අයට අප්‍රසන්න විය හැකි නිසාය (Vin.II,139). කෙසේ නමුත්, ඖෂධයක් වශයෙන් සුදු ලූනු ගැනීමට උන්වහන්සේ අවසර දුන්හ.
ආයුර්වේදයේ බොහෝ කාලයක සිට සුදු ලූනුවල විවිධ වෛද්‍යමය ගුණාංග ඇති බවට අඟවා ඇත.

ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයෙකු වන වාග්හට අඟවා ඇත්තේ බ්‍රාහ්මණයන් සුදු ලූනු භාවිත කිරීමට අකමැත්තේ ඔවුන්ගේ ආගමික සදාචාරාත්මක බවක් නිසාත්, ඒ දින කිහිපයක් එළදෙනෙකුට සුදු ලූනු ආහාරයට දී ඊට පසු එම සතාගෙන් ගන්නා කිරි භාවිත කළ විට සෘජුවම සුදු ලූනු නොගෙන එම සුව කිරීමේ ශක්තිය ලබාගත හැකි බවයි. බලන්න **පැළැටි**

## ලිංගභේදය

ලිංගභේදය (ලිඞ්ග) පුරුෂයෙකු හෝ ස්ත්‍රියක වීමේ සාධකයයි (S.V,204). පුරුෂ (පුරිසින්ද්‍රිය) හෝ ස්ත්‍රී (ඉත්ථින්ද්‍රිය) භාවය වශයෙන් ලිංගභේදය වෙන්කොට බුදුපියාණන් වහන්සේ හඳුනාගෙන ඇත්තේ සිතුවිලි, රැකියාව, ඇඳුම, රුචිකත්වයන්, ආවේගයන්, කටහඬ, පෙනුම, සුවඳ යනාදියෙන්ය (A.I,1; IV,57). මෙයින් පැහැදිලි වන්නේ ලිංගභේදය කායික සහ මානසික, සහජ සහ උපයාගත් සාධකවල එකතුවක් ලෙස උන්වහන්සේ දුටු බවයි. මෙයින් අදහස් කරන්නේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයම ඔවුන්ගේ ශරීරවලින් ඉහළ මට්ටමකට යම් යම් හැසිරීම්වලට හුරු වී තිබෙන බවයි. නමුත්, ලිංගභේදයේ මානසික සහ සමාජීය කරුණුවල සීමාව ඉක්මවා යෑමේ හැකියාවක් ඔවුන්ට ඇති බව පෙනේ. මේ අනුව, රහත්ඵලයට පත්වීමේ විභවය සම්බන්ධයෙන් ගත් කල, ස්ත්‍රීන් සහ පුරුෂයන් එක සමාන වේ. පුරුෂයන් මෙන්ම කාන්තාවන්ට ද රහත්ඵල ලැබීමේ හැකියාවන් තිබෙන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (Vin.V,254). 'කාන්තාවක හෝ පුරුෂයෙකු හෝ වේවා, ධර්මය නමැති අශ්ව කරත්තයේ ගමන් කරන ඕනෑම

කෙනෙකුට නිර්වාණයට ළං විය හැකිය' (S.I,33). එසේ තිබියදීත්, සාම්ප්‍රදායික බෞද්ධ සංස්කෘතීන්හි කාන්තාවන්, වෙනත් බොහෝ සංස්කෘතීන්වල මෙන්ම, බොහෝ කලක සිට පිරිමින්ට වඩා පහත් ලෙස සලකනු ලැබුණි. මෙම වෙනස්කම් පොදුවේ ආගමික ජීවිතයට සහ විශේෂයෙන් පැවිදි වෘත්තියට ද ව්‍යාප්ත වී තිබේ. මෙසේ කිරීමේ දී පාරම්පරික බෞද්ධ සංස්කෘතීන් බුදුපියාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ පරමාදර්ශය වූ තත්ත්වය, වංශය හෝ ලිංගභේදය නොතකා, ආධ්‍යාත්මික සොයා යෑම සියල්ලන්ටම විවෘතය යන්න නොසලකා හැර ඇත. අනෙක් අතට, බෞද්ධ සංස්කෘතීන් කිසි විටකත්, කාන්තාවන් පර්ඩා (සැඟවීමට යොදා ගන්නා රෙදි කඩක්) ලිංගික අංගඡේදනය කිරීම, බලහත්කාරයෙන් වැන්දඹු කිරීම්, වැන්දඹුවන් පුළුස්සා දැමීම හෝ වෙනත් කුරිරුකම්වලට ඉඩක් නොමැත.

ඉදහිට බෞද්ධ ධර්ම ග්‍රන්ථවල ද්විලිංගිකයන් හෙවත්, පුරුෂ සහ ස්ත්‍රී ප්‍රජනක සමගින් උපත ලැබූවන් පිළිබඳව සඳහන් වේ (A.III,128). ද්විලිංගිකතාව වෙනම ලිංගභේදයක් ස්ථාපනය නොකරයි. එයට හේතුව දුර්ලභ ග්‍රන්ථී පිළිබඳ විකෘතියක් මිස, ස්වභාවිකව ඇතිවන තත්ත්වයක් නොවන බැවිනි. ජීව විද්‍යාත්මක නොව, ආකල්පයම ස්වභාවයෙන් යුක්ත ද්විලිංගිකතාව, සමලිංගිකත්වය සමග පටලවා නොගත යුතුයි. බලන්න **තමන්ගේ සැබෑ ලිංගිකත්වයට විරුද්ධ ලිංගිකත්වය ලබා ගැනීමට ඇති කැමැත්ත**

'Origins of Gender Differentiation and Sexuality as Represented in the Buddhist and Christian Genesis Myths.' P. D. Premasiri, *Buddhist Studies*, 2001.

## ත්‍යාගී බව

ත්‍යාගී බව (දාන හෝ චාග) යනු තමන් සතු දේ අන් අය සමඟ බෙදා ගැනීමට ඇති සතුට ගෙන දෙන කැමැත්තයි. එය දෙවන ශික්ෂාපදයේ ධනාත්මක (චරිත) අංගය වන අතර, අන් සතු දේ ගැනීමෙන් වැළකී සිටීම මෙයින් අදහස් කරයි. බුදුදහමට අනුව, ත්‍යාගී බව ලෝභය දුර්වල කිරීමට ගන්නාවූ උපක්‍රමයකි. එය අනෙක් අයට උපකාර කිරීමට මාර්ගයක් වන අතර, සමාජයේ ඇති ආර්ථික විෂමතා අඩු කිරීමට ක්‍රමයකි. එය මූලික බෞද්ධ ගුණාංගවලින් එකක් නිසා, පරිත්‍යාග කිරීම් සහ බෙදාහදා ගැනීම් පිළිබඳව බුදුපියාණන් වහන්සේට කියන්නට බොහෝ දේ තිබුණි. අපට අමුත්තන්ට, ගමනක් යන්නට සූදානම් වන්නන්ට, රෝගීන්ට, කුසගින්නෙන් සිටින්නන්ට සහ දුප්පතුන්ට පරිත්‍යාග කිරීම් කළ හැකි බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. එසේම පළමුවෙන් ලැබෙන පලතුරු භික්ෂූන්ට, භික්ෂුණීන්ට හෝ ආගමික දේ සම්බන්ධ ගුරුවරුන්ට ද, අපට දෙන්නට හැකි බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.III,41). විනය පිටකයේ මූලසර්වාස්තිවාදයේ මේ පිළිබඳව විස්තර සපයයි: 'දන්දීම සඳහා මෙම සුදුසු වේලාවල් පහ ඇත. දැන් පැමිණි කෙනෙකුට සහ පිටත්ව යන කෙනෙකුට ලබාදීම, මෙය පළමුවැන්නයි. රෝගීන්ට හෝ රෝගියෙකුට සාත්තු සප්පායම් කරන්නෙකුට දීම මෙය දෙවැන්නයි. අස්වැන්න නැතිවූ සහ අසරණ සහ කුසගින්නෙන් පෙළෙන කෙනෙකුට දීම, මෙය තුන්වැන්නයි. සදාචාරවත් පුද්ගලයෙකුට තම පළමු පලතුරු පූජාව සිදුකර, ඊට පසුව පමණක් ආහාර ලබාගත් අයට දීම, සිව්වැන්නයි. සුළඟින් ගසාගෙන ගොස්, තෙත් වී,

තෙත බරි වී, ගල් ගැසී සිටින පුද්ගලයෙකු පැමිණ කැඳ හෝ බීමට යමක් ඉල්ලමින්, ඔහුගේ තෙත වියැළෙන තුරු රැඳීමට, ගිමන් හැරීමට සහ තවදුරටත් කුසගින්නෙන් පෙළෙන තුරු රැඳී සිටින ලෙස ඉල්ලා සිටීමට බලාපොරොත්තු වන විට, ලබා දීම පස්වන නිවැරදි කාලයයි.' ජාතක කතාවේ මෙසේ සඳහන් වේ: 'ස්වල්පයක් තිබෙන විට ස්වල්පයක් දෙන්න. මධ්‍යම තරමක් තිබෙන විට, මධ්‍යම තරමෙන් දෙන්න. බොහෝ සේ තිබේනම්, බොහෝ දෙන්න. කිසිම දෙයක් නොදීමට සමාවක් නැත' (Ja.V,387). අප යමක් දෙන විට හෝ බෙදා ගන්නා විට, එය ගෞරවයෙන්, කල්පනාවෙන්, හැකි නම් අපගේම අත් දෙකින්, ලබන්නාට ප්‍රයෝජනයක් වන දෙයක්, අපගේ ත්‍යාගය එම පුද්ගලයාට ප්‍රයෝජනවත් වන්නේ කෙසේ ද යන්න සැලකිල්ලට ගෙන දෙන ලෙස බුදුපියාණන් වහන්සේ අවවාද කළහ. පරිත්‍යාග කරන දෙයින් ඔබ්බට ගොස් එයින් අනෙක් අයට සැබැවින්ම ලැබිය හැකි ප්‍රයෝජනය පිළිබඳව සිතන ලෙස ද උන්වහන්සේ අපට අවවාද කළේ උන්වහන්සේට තිබූ අසමාන කුසලතාව සහ ප්‍රඥාව නිසාය. එමනිසා උන්වහන්සේ මෙසේ පැවසූහ: 'ආහාර දීමෙන් කෙනෙකු ජීවිතය, රූපය, සතුට, ශක්තිය සහ බුද්ධිය ද දෙයි. එසේම මෙම කරුණු පහ ලබා දීමෙන්, කෙනෙකු දැන් සහ පසුවද ඒවායේ කොටස් කරුවෙකු වෙයි (A.III,42)'. අන්‍යයන්ගේ ද්‍රව්‍යමය අවශ්‍යතා සපයා දීමේ වටිනාකම දකිමින්, අපට දිය හැකි ඉහළම, වඩාත් ප්‍රයෝජනවත් සහ වටිනා දෙය ධර්මය බව බුදුපියාණන් වහන්සේ අපට සිහිපත් කළහ (Dhp.354). කෙසේ නමුත්, කෙනෙකු දේවල් ලබාගත යුත්තේ එහි සාපේක්ෂ වැදගත්කම

පිළිබඳ අදහසිනි. ඖෂධ හෝ වෛද්‍යවරයෙකු පිළිබඳ දැඩි අවශ්‍යතාවක් ඇති රෝගාතුරවූ පුද්ගලයෙකුට බුදුදහම ගැන කෙටි පත්‍රිකාවක් නුසුදුසු දෙයක් මෙන්ම, එය ප්‍රඥාව සහ කරුණාව නැති හිස් ක්‍රියාවකි. මෙම කරුණ ඉස්මතු කර දක්වන්නේ එක් සිද්ධියක් සම්බන්ධයෙනි. එක් මිනිසෙකු දවස පුරා වැඩ කිරීමෙන් අනතුරුව කෙළින්ම බුදුපියාණන් වහන්සේ කථා කරමින් සිටිය ස්ථානයකට ධර්මය ඇසීමට දැඩිසේ අධිෂ්ඨාන කරගෙන ගියේය. ඔහුට විවේකයක් ගැනීමට, ස්නානය කිරීමට හෝ ආහාර ගැනීමට වේලාවක් නොතිබුණි. මෙය දැනගත් බුදුපියාණන් වහන්සේ ධර්ම සාකච්ඡාව ආරම්භ කිරීමට ප්‍රථමව ඒ මිනිසාට ආහාරයට යමක් දෙන ලෙස භික්ෂූන්ට දැනුම් දුන්හ (Dhp- a. 262).
*Dāna, The Development of its Concept and Practice*, T. Endo, 1987.

## සන්සුන් බව

සන්සුන් බව ඇති කර ගැනීම (සොරච්ච) යනු මෘදුව සහ කරුණාව ඇතිවන ආකාරයෙන් අනෙක් අයට හානියක් ඇති නොවන අයුරෙන් කථා කිරීම හෝ ප්‍රවේසමින් ක්‍රියා කිරීමයි. 'සමාන වංශයේ' යන අර්ථය ඇති සහ තමන්ගේම පවුලේ අයට මෙන් අනෙක් අයටත් සැලකීම යන්න අදහස් කරමින්, ජෙන්ටිල් යන පැරණි ප්‍රංශ වචනයෙන් 'ජෙන්ටිල්' යන ඉංග්‍රීසි වචනය පැවත එයි. සොරච්ච යන පාලි වචනය සොරත යන්නෙන් පැවත එන අතර, එහි අදහස සන්සුන් හෝ මෘදු යන්නයි. ධර්ම ග්‍රන්ථ බොහෝ විට මෘදුබවේ ඇති වටිනාකම විස්තර කරයි. 'වචනයෙන්, චින්තයෙන් හා ක්‍රියාවෙන් පිරිසිදු උතුම් ධර්මයට ආදරය කරන අය සැමවිටම සාමකාමීව,

මෘදුව, අවධානයෙන් යුක්තව සහ සංසුන්ව සිටිමිනි. ඔවුහු නිසි ලෙස ලෝකයේ ගමන් කරති' (Ja.III,442). බුදුපියාණන් වහන්සේ සාමාන්‍යයෙන් මෘදුබව සෞම්‍යබව (මද්දව) සහ ඉවසීම (ඛන්ති) සමග සම්බන්ධ කළහ. ඉතා පැහැදිලිව, මේ තුන අන්‍යෝන්‍යව එකිනෙකාට සහයෝගය දක්වයි. මෘදුබව සම්මා වාචා සහ සම්මා කම්මන්ත පුරුදු කිරීමට අපට විශේෂ පරිමාණයක් එකතු කරයි. සමහර විට, යම් කෙනෙකු විවේචනය කිරීමට හෝ නිවැරදි කිරීමට එය අවශ්‍ය වේ. අප එසේ කරන්නේ හොඳම අභිප්‍රායෙන් වූවත්, එය පුද්ගලයෙකු රිදවන්නට හේතු විය හැකිය. එවැනි වචන මෘදු ස්වරයෙන් ඔතා සෙමින් සහ නිහඬව ඉදිරිපත් කිරීමෙන් එම වේදනාව අඩු විය හැකිය. එයින් අපගේ වචන පිළිගැනීමට වඩාත් හේතුවිය හැකිය. කරුණාවෙන් ක්‍රියා කළ හැකිය. එනමුත්, රළු, නොසැලකිලිමත් හෝ අශෝභන ආකාරයෙන් එය කළ හැකිය. නැවතත්, යමෙකු මෘදු ලෙස කටයුතු කරන්නේ නම්, එවැනි ක්‍රියාවන් වඩාත් ප්‍රයෝජනවත් සහ ඇගයීමට ද හේතුවනු ඇත. මෘදුබව දෙආකාරයකින් අපගේ හැසිරීමේ කොටසක් බවට පත්විය හැකිය. 1. බුදුපියාණන් වහන්සේගේ මෘදුබව සැලකිල්ලට ගනිමින් එය අපට මතක් කරමින් සහ පෙළඹවීමක් ලෙස වඩාත් මෘදුවීමට එය ක්‍රියා කරයි. 2. හොඳ චේතනාවෙන් කථා කරමින් සහ ක්‍රියා කරමින්, නමුත් සිහි කල්පනාවෙන් එසේ කිරීමෙන් ද අප කරන දේවල් මෘදුබවින් වැඩි දියුණු කළ හැක්කේ කෙසේ දැයි බැලීමට අපට හැකි වේ.

අවාසනාවට, සමහර විට මෘදුබව පහත් කොට

සැලකේ. එයට හේතුව එම ගුණය දුර්වලකමක්, බියගුලුබවක් සහ ධෛර්යය නොමැති බව හා සම්බන්ධ වී තිබීමයි. නමුත්, යම් කෙනෙකු මෘදු බවේ ඇති සුන්දරත්වය සහ වටිනාකම දැකීමෙන් එය තෝරා ගත් ආකාරයටම, මෘදු නම්, එය එසේ විය යුතු නොවේ. මෙම මෘදු පුද්ගලයා පෙනුමෙන් පමණක් දුර්වලයෙකු වුවද සැබැවින්ම ශක්තිමත් විය හැකිය (Th.501). මෘදු, සෞම්‍ය සහ ඉවසිලිවන්ත පුද්ගලයෙකු එහෙත්, තවමත් අචල (අජ්ජව) සහ ඉක්මණින් දේවල් කරන්නට හැකි (ජව) නම්, ඉහළම ගෞරවය ලැබීමට සුදුසු බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.III,248).

## හොල්මන්

ප්‍රසිද්ධ බටහිර අදහස්වලට අනුව, හොල්මන් වශයෙන් විශ්වාස කරන්නේ මිය ගිය මිනිසුන්ගේ ආත්ම ජීවත්වන අය අතර පහළ වීම වශයෙනි. හොල්මන් සම්බන්ධයෙන් යථාර්ථය බයිබලය පිළිගන්නා අතර, ඔවුන් හා සම්බන්ධවීමට උත්සාහ දැරීම තහනම් කර ඇත. (ඩෙයුටරොනොමි 18,11) ජේසුතුමා මිය යෑමෙන් පසු, නැවත පෙනී සිටිය විට, ඔහුගේ ශ්‍රාවකයන් මුලදී සිතුවේ ඔහු හොල්මනක් ලෙසයි. (ලූක් 24,37-39) පේත නමැති පාලි වචනය බොහෝ විට පරිවර්තනය වී ඇත්තේ 'හොල්මන' ලෙසයි. නමුත්, හොල්මන සහ පේත එකිනෙකාගෙන් වැදගත් අයුරෙන් වෙනස් නිසා, එසේ කිරීම මුළාවක් ලෙස පෙනී යයි. පේතට වඩා හොඳ පරිවර්තනය වන්නේ 'කුසගින්නෙන් පෙළෙන භූතයා' යන්නයි.

බුදුපියාණන් වහන්සේට අනුව, ජීවීන්, මිනිසුන්, සතුන්, දෙවිවරුන්, කෝපයෙන් පෙළෙන භූතයන්, කුසගින්නෙන් පෙළෙන භූතයන් හෝ නිරයේ සිටින සත්ත්වයන් වශයෙන් පවතී. මෙම පවත්නා තත්ත්වයන්ගෙන් එකක් හෝ වෙනත් එකක නැවත ඉපදීම සිදුවන්නේ පුද්ගලයෙකු තමන් විසින් හිතා මතා කළ සිතුවිලි, කථාව සහ ක්‍රියාවලින් ඉපැදවූ කර්මයෙන් නිර්ණය වීමෙනි. ඕනෑවට වඩා ලෝභ වී, නිරන්තරයෙන් අතෘප්තිමත්ව සහ ලොල් වූ පුද්ගලයෙකු කුසගින්නෙන් පෙළෙන ප්‍රේත ආත්මයක නැවත ඉපදීමට බොහෝ සෙයින් ඉඩ තිබේ. වෙනත් විෂය පථවල පැවැත්ම පිළිබඳව බුදුපියාණන් වහන්සේ බොහෝ විස්තර දී ඇතත්, කුසගින්නෙන් පෙළෙන ප්‍රේත ආත්ම පිළිබඳව මුළුමණින්ම කිසිවක් පවසා නැත. සැබැවින්ම විවිධ විෂය පථ පිළිබඳ සමහර ලැයිස්තුවල, ප්‍රේතයන් හැර දමා ඇත. උදාහරණ වශයෙන්, බාලපණ්ඩිත සූත්‍රය (M.III,165 ff). කෙසේ නමුත්, ජාතක කතාවේ ප්‍රේතයන් ඇත්තටම අවාසනාවන්ත ජීවීන් ලෙස පෙන්වමින් ලාදුරු රෝගියෙකු 'ප්‍රේත-වැනි මිනිසෙකු' (මනුස්සපෙත, Ja.V,68), ලෙස විස්තර කර ඇත. කුසගින්නෙන් පෙළෙන ප්‍රේතයන්ට මිනිසුන් අතර රැඳෙන්න පුළුවන් හෝ 'භූතාත්ම කැඳවන්න' හෝ සම්බන්ධ කර ගන්න පුළුවන් යැයි සඳහනක් බෞද්ධ ග්‍රන්ථවල නැත. කෙසේ වෙතත්, පෙනෙන ආකාරයට ඔවුන්ට ඔවුන්ගේ ජීවත්වන ඥාතීන් සිතන දේ හෝ ඔවුන් පිළිබඳව හැඟෙන දේ ගැන සංවේදිතාවක් තිබෙන්නට හැකිය. කුසගින්නෙන් පෙළෙන ප්‍රේතයන්ගේ ඇති වැදගත්කම සම්බන්ධයෙන් ඔවුන් ගැන කථාකිරීම ප්‍රයෝජනයක් නැති නුසුදුසු ආකාරයේ කාර්යයක් බව බුදුපියාණන් වහන්සේ

සැලකිල්ලට ගත් හේතුවෙන්, උන්වහන්සේගේ චින්තනය විනිශ්චය කළ හැකිය (D.I,8). බලන්න **කුසල් මාරු කිරීම සහ යක්ෂයන්**

## දෙවියන්, දෙවිවරු

දෙවියන් (ඉස්සර) අද්භූත ජීවියෙකි. සමහර අය ඊශ්වර ලෝකය මැවූ බවත්, ඒ නිසා ඔහුට බිය විය යුතු බව සහ නමස්කාර කළ යුතු බවත් විශ්වාස කරති. ඊශ්වර සාමාන්‍යයෙන් හඳුන්වන්නේ සියල්ලන්ටම ආදරය කරන, සියල්ල දන්නා සහ සියලු බල ඇත්තෙකු ලෙසයි. යුදෙව් සහ ක්‍රිස්තියානි දෙවියා යාහවේ, සිඛිසම් ගේ සත් නාම් සහ සොරොස්ත්‍රිනිසම් ගේ අහුර මස්ඩා නම් වේ. හින්දු මිනිසුන් දෙවිවරු බොහොමයකට වන්දනා කරන අතර, බොහෝ හින්දූන් උත්තරීතර දෙවියන් වශයෙන් සලකන්නේ සිව හෝ විෂ්ණුය.

උත්තරීතර දෙවියෙකුගේ පැවැත්මක් පිළිබඳව හේතු තුනක් නිසා බුදුදහම ප්‍රතික්ෂේප කරයි. 1. දෙවියන්ගේ යැයි කියනු ලබන දායකවීම් එකිනෙකට විරුද්ධ වීම පළමු වැන්නයි. දෙවියන් සියල්ලන්ටම ආදරය කරනවා නම්, සියලු බලය ඇත්තෙක් නම්, බෞද්ධයන් අසන්නේ මිනිසුන් සෑම විට රෝගවලින් පෙළෙන්නේ, විපත්තිවලට සහ කුරිරුකම්වලට මුහුණ දෙන්නේ ඇයි ද යන්නයි. 2. දෙවි කෙනෙකු කෙරෙහි විශ්වාසය තබා ගැනීම අවශ්‍ය නැත. බුදුදහම උගන්වන්නේ සදාචාරය යහපත් විය හැකි බවත්, ජීවිතය අර්ථවත් විය හැකි බවත්, දෙවියන්ගේ සංකල්පය හඳුන්වා නොදී විශ්වයේ මූලාරම්භය සතුටුදායක ලෙස පැහැදිලි කළ හැකි බවත්ය. 3.

දෙවියන්ගේ පැවැත්ම ඔප්පු කිරීම සඳහා භාවිත කරන සියලුම සාක්ෂි වෙනත් ආකාරවලින් පහසුවෙන් අර්ථ නිරූපණය කළ හැකිය. උදාහරණ වශයෙන්, ප්‍රාතිහාර්යයන් සිදුවිය හැක්කේ චෛතසික බලයෙන්, යාච්ඤා කිරීමෙන් සහ ඊළඟට, ඉදිරියේදී සිදු වන්නට තිබූ අනතුරකින් ගැලවීම අහම්බෙන් සිදුවූවක් විය හැකිය. මළවුන්ගෙන් නැගිටීම, හැමටම කලින්, එම පුද්ගලයා සැබෑවටම මියගොස් නොසිටි නිසා සිදුවූ දෙයක් ලෙස අදහස් කළ හැකිය.

කෙසේ නමුත්, යථාර්ථය පිළිබඳව අවබෝධ කිරීමේදී, බුදුදහම තුළ එක් උත්තරීතර දෙවිකෙනෙකුට ඉඩක් නැත. බුදුදහම වෙනත් දිව්‍යමය ජීවීන්ගේ පැවැත්ම පිළිගනී. ඒ අය පහසුවෙන්ම දෙවියන් (දේව) ලෙස හැඳින් වේ. මෙම ජීවීන් මිනිසුන්ට වඩා බලවත් සහ ප්‍රභාමත් විය හැකි නමුත්, ඔවුන් අනිවාර්යයෙන්ම අධ්‍යාත්මික වශයෙන් දියුණු වූ අය නොවේ. ඒ නිසා, අපගේ ආධ්‍යාත්මික ජීවිතයේ වැදගත් කාර්යභාරයක් ඔවුන්ට නැත. පෙනෙන්නට තිබෙන ආකාරයට, බුදුපියාණන් වහන්සේගේ ඉතා දියුණු ගිහි ශ්‍රාවකයෙකු වූ උග්ග වෙත දර්ශනය වී ඔහු සමග කතාබහ කර ඇත. දෙවිවරුන්ගේ එවැනි පැමිණීම විශේෂ අනුග්‍රහයක් හෝ මහත් ආශීර්වාදයක් ලෙස සමහරු සලකන්නට ඇති නමුත්, උග්ග ඒවායෙන් සම්පූර්ණයෙන්ම හැඟීම්වලට වහල් වීමට හෝ පෙළඹීමට පත් නොවීය. වැදගත් යමක් දෙවිවරුන් ඔහුට කිව්වේ ද, ඒ සියල්ල ඔහු දැන සිටියේය. (A.IV,211) බලන්න **භෞතික සංසිද්ධිවලින් බැහැරව කිසිවක් නැතැයි ඇදහීම, බ්‍රහ්ම, නියතිවාදය, දිව්‍යලෝකය, ශක්‍ර සහ දේවවාදය**

*Gods in Buddhism*,M. M. J. Marasinghe,1974.

## ස්වර්ණමය පාලනය

ස්වර්ණමය පාලනය ලෙස හැඳින්වෙන මූලධර්මය, 'අනුන් ඔබට කරනවාට කැමැති දේ ඔබ ඔවුන්ට කරන්න' (මැතිව් 7, 12). මෙය බොහෝ විට ජේසුස්වහන්සේගේ සදාචාරාත්මක ඉගැන්වීම්වල මුදුන ලෙසත්, ක්‍රිස්තියානි ධර්මයට අනන්‍යවූ දෙයක් ලෙසත් බොහෝ විට සිතනු ලැබේ. කෙසේ නමුත් ජේසුස්වහන්සේට වඩා ශතවර්ෂ පහකට පෙර වැඩ සිටි බුදුපියාණන් වහන්සේ මෙම මූලධර්මයම උන්වහන්සේගේ ඉගැන්වීම්වල ද පාදකය ලෙස සලකා ඇත. කෙසේ නමුත්, එය ත්‍රිපිටකයේ බොහෝ ස්ථානවල විවිධ ස්වරූපයෙන් ඇතුළත් ව තිබේ. උදාහරණ වශයෙන් බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'දඬුවම ඉදිරියේ සියලු දෙනා වෙව්ලයි. ජීවිතය සැමටම ආදරණීයයි. අනෙක් අයගේ ස්ථානයේ ඔබ තබා, කිසිවෙකුට හානි නොකරන්න. ඔවුන්ට හානි කර නැත' (Dhp.130). 'ඔබ මෙම නිගමනය කළ යුතුයි. ''කෝපයට පත් වූ සහ කෝපයෙන් කථා කරන පුද්ගලයෙකු අප්‍රසන්නය, මට එකඟ විය නොහැකිය. එම නිසා මම කෝපයට පත් වී කෝපයෙන් කථා කරන්නේ නම්, අනෙක් අයට මා අප්‍රසන්න වේ, එකඟ විය නොහැකිය.'' මෙය අවබෝධකර ගනිමින්, යම් කෙනෙකු මෙසේ සිතිය යුතුයි ''මා කෝපයට පත් වන්නේ ද කෝපයෙන් කථා කරන්නේ ද නැත'' (M.I,99). මෙසේ සිතිය යුතුය, ''මා මෙන්ම අන් අය ද, අනෙක් අය මෙන් මම ද එසේය, ''කිසිවෙකුට හානි නොකරමි, ඔවුන්ට හානි කර නැත'' (Sn.705).

කෙනෙකුගේ සිතුවිලිවලට සහ හැසිරීම්වලට ප්‍රධාන වන බව කියනු ලබන ස්වර්ණමය පාලනය සඳහා පූර්වාවශ්‍යතා කිහිපයක් වේ. කෙනෙකුට තමන්ගේ සැබෑ සුභසාධනය පිළිබඳව පැහැදිලි විය යුතුයි. කෙනෙකු අනෙක් අයගේ ප්‍රතිචාර පිළිබඳව දැනුවත් විය යුතුයි. කෙනෙකු තමන්ගේ හැඟීම්වලින් මිදෙමින් අනෙක් අයගේ හැඟීම්වලට ඇතුළුවීම සඳහා තමන්ගේ හැඟීම්වලින් ප්‍රමාණවත් අයුරෙන් වෙන්විය යුතුයි. ඉතාමත් සිත්ගන්නාසුලු කරුණක් නම්, සිහිකල්පනාව සහ අත්හැරීම සෑහෙන පමණට සැබෑ සංවේදනය සහ කරුණාවට පෙර ඇතිවීමයි. බලන්න **පරහිතකාමීත්වය සහ ජේසුස්වහන්සේ**

**හොඳ සහ නරක**

හොඳ හෝ නිවැරදි (කුසල) යනු සදාචාරාත්මකව උපකාරී වන, නිපුණ සහ නිර්වාණය අවබෝධ කර ගැනීමට උපකාර වන ගුණාංගයයි. නරක හෝ වැරදි (අකුසල) මෙහි ප්‍රතිවිරුද්ධයයි. ඕනෑම හැසිරීමක සදාචාරාත්මක වටිනාකම තීරණය කිරීම සඳහා බුදුදහම මූලධර්ම තුනක් භාවිත කරයි.

1.උපකාරක මූලධර්ම යනු යම් විශේෂ ඉලක්කයක් සපුරා ගැනීමට උපකාර කරන්නේ නම් යමක් යහපත් වන අතර, [එය එසේ නොවන්නේ නම්, නරකය යන අදහසයි. බුදුදහමේ අරමුණ වන්නේ බුද්ධත්වය හෝ නිර්වාණය වන අතර, ඒ සඳහා උපකාර වන ඕනෑම දෙයක් යහපත් යැයි කිව හැකිය.]
2. ප්‍රතිවිපාකමය මූලධර්මය නම් ක්‍රියාවක ප්‍රතිවිපාක

අනුව, එහි වටිනාකම අපට තීරණය කළ හැකිය යන අදහසයි. [ උදාහරණයක් වශයෙන්, සොරකම් කිරීමෙන් එසේ කළ පුද්ගලයා අපහසුතාවට, කෝපයට සහ වඩාත් සැකයට යොමු වේ. එය සොරෙකු තුළ සංයමය නැති කම බලවත් කරයි. (අසු නොවුණා නම්), (අසු වූවොත්) දඬුවම් විඳින්නට සිදු වේ. මේ සියල්ල ඍණාත්මක දේවල්ය. සොරකම් කිරීම වරදකි.]

3. පොදුවේ යොදා ගැනීමේ මූලධර්මය යන්නෙහි අදහස යම් දෙයක වටිනාකම අපට දැනෙන්නේ කෙසේ ද යන්න [දැන ගැනීමෙන් පසුව එය අන් අයට අදාළ කර ගැනීමෙන් අපට එහි වටිනාකම තීරණය කළ හැකි වීමයි. මා කරදරයකට පත් වී සිටින විට, යම් කෙනෙකු මට උපකාර කරන්නේ නම් මා කැමතිය. අන් අයටත් ඒ හා සමාන හැඟීමක් ඇති බව මට අනුමාන කළ හැකිය. එම නිසා, කරදරයක සිටින අයෙකු දුටුවිට, ඒ අයට උපකාර කිරීමට මම උත්සාහ කරමි. ක්‍රිස්තියානි දහමේ මෙම සංකල්පය ස්වර්ණමය පාලනය ලෙස හැඳින් වේ. මෙම මූලධර්ම කිසිවක් හොඳ හෝ නරක තීරණය කිරීමට තරම් ප්‍රමාණවත් නොවේ. නමුත් එකට ගත්විට, සදාචාරාත්මක හැසිරීම් සඳහා විශ්වාසදායක මඟ පෙන්වීමක් ස්ථාපනය කරයි.] බලන්න

**මනෝමය කෙලෙස්**

*The Nature of Buddhist Ethics*, Damien Keown,1992.

## පාත්තයා

පාත්තයා (හංස) යනු අර්ධ-ජලජ, දැලකින් වැසුණු පාද සහ දිගු බෙල්ලක් ඇති කුරුල්ලෙකු වැනි විශාල තාරාවෙකි. උතුරු ඉන්දියාවේ හීලෑ නැති බොහෝ

පාත්තයන් වර්ග ඇත. හංස යන සංස්කෘත සහ පාලි නම බොහෝ විට 'හංසයා' යන නමින් වැරදියට පරිවර්තනය වේ. නමුත්, සිග්නස් ගණයේ කුරුල්ලන් වන හංසයන් ඉන්දියාවට ආවේණික නොවේ. ඔවුන් පැරණි ඉන්දියාවට ආගන්තුකය. පාත්තයන් පිළිබඳව බොහෝ විට ත්‍රිපිටකයේ සඳහන්ව ඇත. පසුකාලීන බෞද්ධ සාහිත්‍යයේ සඳහන්ව ඇත්තේ අන්සර් ඉන්ඩිකස් හෙවත් දණ්ඩක් සේ දිස්වන හිසක් ඇති පාත්තයන් මධ්‍යම ආසියාවේ ජනපදවල ඇතිදැඩි වන බවයි. මෙම ගෘහස්ථ පාත්තයන්ගේ ප්‍රමාණය සම්බන්ධයෙන් කියතොත්, මේ ලස්සන කුරුල්ලන්ට අළු, සුදු සහ දුඹුරු කුරුලු පිහාටු රැසක් ඇත. සුදුවන් හිස කැපී පෙනෙන කලු පැහැති පටිවලින් සළකුණු වී ඇත. මේ සතුන්ගේ මෘදු, සංගීතමය 'ආං ආං ආං' ඇමතුම ස්වභාවික ලෝකයේ වඩාත්ම සිත් ඇදගන්නා සුළු එකක් ලෙස පුළුල් ලෙස පිළිගෙන ඇත. බුදුපියාණන් වහන්සේ සමහර විට පාත්තයෙකුට සංසන්දනය කර තිබේ. මෙම කුරුල්ලාගේ ගති ලක්ෂණ සහ පුරුදු බොහෝ විට උන්වහන්සේ විසින්ම ඇතැම් ආධ්‍යාත්මික ගුණාංග සඳහා රූපක වශයෙන් බොහෝ විට භාවිත කළහ.

ගෘහස්ථව ජීවත්වන්නන්, ලස්සන පාට තිබුණත්, අශෝභන ලෙස වේගයෙන් පියාසර කරන මොනරෙකු හා සමාන වන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. නමුත්, භික්ෂූන් සහ භික්ෂුණීන් අඳුරු පැහැති, නමුත් අහසේ ඉහළට නගින්නට හැකි පාත්තයෙකු මෙන් යැයි උන්වහන්සේ පැවසූහ (Sn.221). වඞ්ගීස නමැති භික්ෂුව බුදුපියාණන් වහන්සේට මෙසේ පැවසූවේය : 'පාත්තයන් ඔවුන්ගේ

ගෙල දිගු කරන්නාක් මෙන්, මෘදු ලෙස ඔබේ මොළොක් කන්කලු හඬ, මිහිරි හඬ ඉක්මණින්ම අවදි කර ඉදිරියට යවනු මැන සුන්දර බුදුපියාණන් වහන්ස, (Sn.350) 'දිගු බෙල්ලක් ඇති පාත්තයන් බොහෝ විට ශීත සෘතුවේදී ජලයෙන් යට ආහාර ගනිමින් සිටිනු දකින්නට ඇත. මාර්තු මස මැද දී ඔවුහු කුඩු තනන්නට ටිබෙටය වෙත පියාසර කරනු ඇත. බුදුපියාණන් වහන්සේට අනුව, මෙම සංක්‍රමණික හැසිරීම නොඇලීම අඟවයි. උන්වහන්සේ මෙසේ පැවසූහ: 'සිහිකල්පනාවෙන් යුක්ත මිනිස්සු මහන්සි වෙති. ඔවුන් කිසිම නිවසකට නොඇලේ. තමන්ගේ විලෙන් පියඹා යන පාත්තයන් මෙන් ඔවුහු තවත් එකක් පිටුපසින් තිබියදී එක් වාසස්ථානයකින් පිටත් වේ' (Dhp.91). 'පාත්තයන් සූර්යයා වෙත ඇති මාර්ගයේ පියඹන අතර, මුණිවරයෝ තමන්ගේ චෛතසික බලයෙන් පියඹති. මාර සහ ඔහුගේ හමුදාව පරාජය කරමින් ප්‍රඥාවන්තයන් ලෝකයෙන් බැහැරට යොමු කෙරේ (Dhp.175)'. ඔක්තෝබර් මාසයේදී උතුරු ඉන්දියාවට පාත්තයන්ගේ නැවත පැමිණීම, යම් චමත්කාර ජනක දෙයක් ලෙස පිණ්ගිය භික්ෂුව රූපකයක් ලෙස භාවිත කළේය. 'පලතුරුවලින් පිරිණු වනයේ ජීවත් වීම සඳහා කුරුල්ලෙකු කුඩා පඳුරක් අතහැර යන්නාක් මෙන්, මම පටු අදහස් ඇති ගුරුවරුන් අත්හළ මම විශාල විලකට එන්නාවූ පාත්තයෙකු මෙන් පුළුල් දෘෂ්ටි පරිකල්පනයකින් යුක්ත බුදුපියාණන් වහන්සේ වෙත පැමිණ ඇත්තෙමි' (Sn.1134).

අලුතින් එක් කළ අභිනිෂ්ක්‍රමණ සූත්‍රයේ 12වන පරිච්ඡේදයේ සඳහන් පාත්තයෙකු පිළිබඳ

සැලකිලිමත් කථාව සමස්ත බෞද්ධ සම්ප්‍රදායේම සුන්දරතම පුරාවෘත්තයන්ගෙන් එකක් වේ. වරක් තරුණ සිද්ධාර්ථ උයනක් හරහා ඇවිදිමින් සිටින විට එක් පාත්තයෙකු උගේ පිහාටුවක ඊතලයක් ඇණී අහසින් වැටෙනු දුටුවේය. ඔහු මෘදු ලෙස තමාගේ උකුලේ හොවාගෙන එම ඊතලය ඉවත් කර තුවාලයට බෙහෙත් තෙල් සහ මීපැණි ගැල්වූයේය. ඊට පසු වහා ඔහුගේ ඥාති සහෝදර දේවදත්ත තමන් කුරුල්ලාට විද්ද නිසා උෆ තමන් වෙත වහාම එවිය යුතු බවට ඉල්ලමින් පණිවුඩයක් එව්වේය. සිද්ධාර්ථ මෙසේ පිළිතුරු යැව්වේය: 'පාත්තයා මිය ගියා නම්, නොපමාව ආපසු එවමි. නමුත්, උෆ තවමත් ජීවත්ව සිටී. ඒ නිසා ඔබට ඒ පිළිබඳ අයිතියක් නැත.' දේවදත්ත නැවතත් පණිවුඩයක් එව්වේ තමන්ගේ හැකියාව නිසා පාත්තයා බිමට හෙළන්නට හැකි වූ බවත්, ඒ නිසා උෆ තමන්හට අයිති බවත් කියමින්ය. නැවතත්, සිද්ධාර්ථ එය ප්‍රතික්ෂේප කරමින්, මෙම මතභේදය නිරාකරණය සඳහා බුද්ධිමතුන් කැඳවිය යුතු බව කියා සිටියේය. එසේ කරමින්, එම කාරණය පිළිබඳව යම් වේලාවක් සාකච්ඡා කිරීමෙන් පසු, වඩාත් ජ්‍යෙෂ්ඨ බුද්ධිමතා තමන්ගේ මතය ප්‍රකාශ කළේය: 'පාත්තයා රැකබලාගෙන ජීවිතය ආරක්ෂා කරන්නාට හිමිවිය යුතු බවත්, සත්ත්වයා විනාශ කරන්නට උත්සාහ කරන්නාට හිමි නොවිය යුතු' යැයි ප්‍රකාශ කළේය. රැස්වූ පිරිස එම තීරණයට එකඟ වූ අතර, සිද්ධාර්ථට පාත්තයා තබා ගැනීමට අවසර ලැබුණි. ත්‍රිපිටකයේ සඳහන් වී නොමැති වුවත්, තරුණ සිද්ධාර්ථගේ සහ පාත්තයාගේ කථාව, පදනම් වී ඇත්තේ සත්‍ය කරුණු මත විය හැකිය. කරුණු කෙසේ වුවත්, සියලු ජීවිතවලට කරුණාව සහ ගෞරවය පෝෂණය කිරීම

සඳහා බුදුදහමෙන් දක්වන සැලකිල්ල එයින් පිළිබිඹු වේ. *The Goose in Indian Literature and Art*, J. P. Vogel, 1962.

## දේශපාලනය කිරීම

දේශපාලනය කිරීම (ඛත්තවිජ්ජා හෝ පාලනවිජ්ජා) යනු රටක් පාලනය කිරීමට යොදා ගන්නා දේශපාලනමය න්‍යායයි. දේශපාලනය හෝ දේශපාලන විද්‍යාව පිළිබඳව බුදුපියාණන් වහන්සේට කියන්නට තිබුණේ ස්වල්පයකි. නමුත්, බුදුපියාණන් වහන්සේ සමග කථා කළ රජවරුන්ගෙන් සමහර විට ඉල්ලා සිටියේ තමන්ගේ රටවැසියන්ගේ සුභසාධනය ගැන සාධාරණ, මෘදු සහ සැලකිලිමත් වන ලෙසයි. රජවරුන් සඳහා බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් පසුව පාලන නීති දහයට (දසරාජධම්ම) විධිමත්ව සකස් කරන ලදී. ඒවා නම් ත්‍යාගශීලීබව (දාන), සදාචාරය (සීල), විවෘත මත දැරීම (පරිච්චාග), විවෘතබව (අජ්ජව), මෘදුබව (මද්දව), ස්වයං සංයමය (තපො), කෝප නොවන (අක්කොධ), අවිහිංසාව (අවිහිංසා), ඉවසීම (ඛන්ති), සහ තරඟකාරී නොවන (අවිරොධන Ja.I,260; III,274).

දේශපාලනය පිළිබඳ දීර්ඝතම සහ සවිස්තරාත්මක පැරණි බෞද්ධ ඉගැන්වීම මහාවස්තුවේ සඳහන් වේ. එය තෙසකුණ ජාතක කතාවේ විස්තරණයකි (Ja.V.109). පහත දැක්වෙන්නේ මෙම කෘතියෙන් උපුටා ගත් කරුණු කිහිපයකි. 'රජෙකු කිසි විටකත් කෝපයේ බලපෑම්වලට යටත් විය යුතු නැත. ඒ වෙනුවට ඔහුට ඔහුගේ කෝපය පාලනය කිරීමට ඉඩ දෙන්න. මන්ද, කෙනෙකු කෝපයට පත් වී සිටින

විට ... පුද්ගලයෙකුගේ අභිලාෂයන් හෝ යුතුකම් ශක්තිමත් නොවීමයි. ආරවුලක් ඇති වූ විට, ඔහු දෙපාර්ශ්වයටම සමාන අවධානයක් යොමු කළ යුතු අතර, එක් එක් අයගේ තර්කවලට සවන් දී හරි දේ අනුව තීරණය කළ යුතුය. ඔහු අයථා පක්ෂපාතකම්, වෛරය, බිය හෝ මෝඩකම පාදක කරගෙන ක්‍රියා කළ යුතු නොවේ ... රාජ්‍ය කටයුතු පිළිබඳව විමසිල්ලෙන් සිටිමින්, රජෙකු සැමට සතුට බෙදා දිය යුතුයි. ඔහු සියලු දෙනා ප්‍රචණ්ඩ ක්‍රියා කිරීමෙන් වළක්වා තෘප්තිය ලැබෙන්නේ ධර්මිෂ්ටකමෙන් බව පෙන්විය යුතුයි. පෙර රජවරුන්ගේ කාලයේදී මෙන්, සංක්‍රමණිකයන් විශාල සංඛ්‍යාවක් එකට එකතු වී රාජධානියට ඇතුළු වීමට පැමිණියහ. ඔබ ඒ සියල්ලම ඇතුළත් කර ගන්නේ නම්, සැමවිටම දුප්පතුන්ට අනුග්‍රහ දක්වන්න. නමුත්, ඔබේ යටත්වැසියන් වන ධනවතුන් ද ආරක්ෂා කරන්න ... අසල්වැසි රජවරුන් කෙරෙහි සතුරුකම් ඇති නොකරන්න. වෛර කරන තැනැත්තාට ඔහුගේ සතුරන් විසින් වෛරයෙන් පෙරළා ගෙවනු ඇත. ඔබේ අසල්වැසියන් සමග මිත්‍රත්වයේ සබඳතා වර්ධනය කරගන්න. එයට හේතුව, මිත්‍රත්වයේ ස්ථිරව සිටිනා අයට අන් අය ගෞරව කරන බැවිනි. සියලුම වර්ගයේ විෂයයන් ගැන දීර්ඝ ලෙස කථා නොකරන්න. නමුත්, ඔබගේ විනිශ්චය සුදුසු වේලාවේ, අදාළ ලෙස දෙන්න ... සැම විටම සාධාරණව ජීවත් වන අය ආරක්ෂා කරන්න. එයට හේතුව යහපත් දේශපාලනමය බලයක් ඇතිවන්නේ සාධාරණත්වය මත නිසාය ... ගම්වල හෝ පළාත්වල ප්‍රධානීන් ලෙස ඔබගේ පුතුන් හෝ සහෝදරයන් වුවද ඔවුන් ප්‍රතිපත්ති රහිත අය නම්, ප්‍රචණ්ඩ නම් හෝ අධම නම් පත් නොකරන්න ... මෝඩ හෝ

කෑදර ඇමතිවරයෙකුගෙන් පාලකයෙකුට හෝ රාජ්‍යයයකට වටිනාකමක් නැත. එම නිසා ඔබේ අමාත්‍යවරුන් ලෙස කෑදර නැති, නමුත් සිහි කල්පනාවෙන් කටයුතු කරන සහ උපදෙස් ලබා දීමේ කැප වූ සහ රාජ්‍යයකට මඟ පෙන්විය හැකි මිනිසුන් පත් කරන්න. ඔබගේ ඇස් උපදෙස් දෙන්නෙකුගේ ඇස් තරම් හොඳ නැත. ඔබගේ ප්‍රතිපත්ති ද එසේ නොවේ. එමනිසා, ඔබේ සියලු කටයුතුවලදී ඔබ උපදෙස් දෙන්නෙකු සේවයේ යෙදවිය යුතුයි.' මෙහි සහ පසුකාලීන බොහෝ බෞද්ධ දේශපාලන න්‍යායයන්වල සාරය වන්නේ 'යහපත් දේශපාලනමය බලය රඳා පවත්නේ සාධාරණත්වය මත යන සංකල්පය යන්නය.' (බලචක්‍රම් හි නිශ්‍රාය ධර්මචක්‍රම් ප්‍රවර්තත්) යන සංකල්පයයි. ඒ බලය එහි නීත්‍යානුකූල බව ලබාගන්නේ සාධාරණත්වය, සමානාත්මතාව සහ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීමෙන් සහ ප්‍රවර්ධනය කිරීමෙනි.
*Dhamma, Man and Law*, K.N. Jayatilleke, 1989.

## කෘතඥතාවය

කෘතඥතාවය (කතවේදිතා හෝ කතඤ්ඤුත) යනු අන් අය අපට උපකාරයක් කළ විට අපට ඇතිවෙන ස්තුතිපූර්වක හැඟීම සහ එයට පෙරලා අපගේ ස්තුතිය ප්‍රකාශ කිරීමට අපට ඇතිවෙන කැමැත්තයි. කෘතඥතාව යහපත් මිනිසෙකු පිළිබඳ සළකුණක් බව බුදුපියාණන් වහන්සේ වදාළහ: 'සැබැවින්ම, යහපත් මිනිස්සු ස්තුතිපූර්වක සහ කෘතඥතාවෙන් හෙබි අය වෙති' (Vin.I,61). නමුත්, කෘතඥතාවෙන් යුක්ත අය බහුල නොවන බව ද බුදුපියාණන් වහන්සේ හඳුනා ගත්හ: 'මෙම දෙආකාර මිනිසුන් ලෝකයේ සොයා

ගැනීම අපහසුය. ඒ දෙආකාරය කුමක් ද? පළමුව උපකාරයක් කිරීමට ඉදිරිපත් වන්නා සහ උපකාරයක් කිරීම පිළිබඳව කෘතඥපූර්වක වන්නා යන මේ දෙදෙනාය' (A.I,87) .

## ආචාර කිරීම

ආචාර කිරීම යනු පුද්ගලයෙකු හමුවූ විට කියන ලද හෝ කරන ලද දෙයකි. පැරණි ඉන්දියාවේ ගෞරවනීය හා ආචාරශීලී අයුරෙන් සුබ පතන බොහෝ ආකාර තිබුණි. ඉතාම සුලබ ආකාරය වූයේ හිස නැමීම (පණාම) සහ යාච්ඤා කරන ආකාරයෙන් දෑත් තැබීමයි (අඤ්ජලී, D.I,118; M.I,168). සමහර විට මෙය කරන අතරතුර, කෙනෙකු සුබ පතනු ලබන පුද්ගලයා සමග සුහද වචන හුවමාරු කරගනී. නැතහොත්, ඔහුගේ සෞඛ්‍යය පිළිබඳව විමසයි (D.I,52; A.I,66). බෞද්ධ රටවල මෙය භික්ෂූන් අතර, ගිහියන් විසින් භික්ෂූන්ට සහ ගිහියන් අතර, සුබ පතන ඉතාමත් සුලබ ආකාරය ලෙස පවතී.

මෙම සුබ පැතුමට තුන් ආකාරයක් තිබෙන බව නාට්‍යශාස්ත්‍ර යේ සඳහන් වේ: දෙඅත් හිස මත, මුහුණ ඉදිරිපිට, පපුව ඉදිරිපිට, දෙඅත් තබාගෙන, සුබ පැතුම් ගෞරවයෙන් දෙවිවරුන්ට, ගුරුවරුන්ට සහ මිතුරන්ට ලබා දෙනු ඇත. වැඩි ගෞරවයක් දැක්වීම සඳහා, කෙනෙකු හිස නමා, යාච්ඤා කරන ඉරියව්වෙන් දෙඅත් තබාගෙන, එක් දණහිසකට හෝ දණහිස් දෙකටම දෙඅත් තබා නැමී සිටිය යුතුයි (Thi.109). වඩා ගෞරවනීය වීමට අවශ්‍ය නොවන නමුත්, සැබැවින්ම වඩාත් විස්තරාත්මක නොවන, එකක් වන්නේ දණහිස් දෙකෙන්ම නැමී

අනෙක් පුද්ගලයාගේ දෙපා ඉදිරියේ හිස තැබීමයි. අතිශය දියුණු සුබ පැතුම වන්නේ අනෙක් පුද්ගලයාගේ දෙපා පිරිමදිමින් සහ සිප ගනිමින් නමස්කාර කිරීමයි (M.II,120; S.I,178). මෙය 'පපුව පහතට තබා කෝටුවක් මෙන් වැතිරීම දණ්ඩනමස්කාරය' (දණ්ඩපණාම) යනුවෙන් හැඳින් වේ.

මිනිසුන් බුදුපියාණන් වහන්සේ හමුවීමට ගිය විට, උන්වහන්සේ 'සතුටින් පිළිගැනීම, මිත්‍රශීලී බව, විනීත බව, ප්‍රසන්න බව, සිත්ගන්නාසුලු බව, සහ පළමුව කථා කරන පුද්ගලයා' බව ඔවුහු හඳුනා ගත්හ (D.I,116). උන්වහන්සේ අනෙක් අයගේ සුබ පැතුම් සහ ගෞරවය ප්‍රකාශ කිරීමේ ප්‍රතිචාරයන් පිළිගත් අතර, එම ප්‍රතිචාර දැක්වූවත්, නැතත් හෝ එසේ කළ ආකාරය ආදිය පිළිබඳව වැඩිපුර සැලකිල්ලක් නොදැක්වූහ. සොණදණ්ඩ නැමැත්තෙකු තුන්සරණ යෑමෙන් පසු, තමන්ට එක් විශේෂ ප්‍රශ්නයක් තිබෙන බව ඔහු බුදුපියාණන් වහන්සේට රහසින් කීවේය. ඔහු බ්‍රාහ්මණයෙකු වූ අතර, ඔහුගේ ආදායම රඳා පවතින්නේ අනෙක් බ්‍රාහ්මණවරුන් ඔහුට දැක් වූ ගෞරවය මතය. ඔහු බුදුපියාණන් වහන්සේට වැඳ වැටී සිටිනු දුටුවහොත්, ඔහුට සම තත්ත්වයේ මිතුරන්ගේ ගෞරවය නැතිවී ඔහුගේ ආදායම අහිමි වනු ඇත. 'රැස්වීම් ශාලාවට ඇතුළු වන විට, මම සුබ පැතීමට දෙඅත් එක් කළහොත්, එය ඔබවහන්සේ වෙනුවෙන් නැඟී සිටින්නාක් මෙන් සලකනු ඇත. රැස්වීම් ශාලාවට මා ඇතුළු වන විට, මම මගේ හිස් වැස්ම ඉවත් කළහොත්, එය ඔබවහන්සේ පාමුල වැඳ වැටුණා හා සමානව සැලකිල්ලට ගත හැකිය. මගේ රථයේ ගමන් කරන විට, මම ඔබවහන්සේට ආචාර

කිරීමට රථයෙන් බැස්සේ නම්, අනෙක් අය මා විවේචනය කරනු ඇත. ඉතින් මා ඔබවහන්සේ මගේ අශ්ව රථයෙන් පසු කර යන විට, නිකම්ම මගේ හිස නැමුවේ නම්, මා රථයෙන් බැස ඔබවහන්සේගේ පාමුල වැන්දා හා සමානව සලකන්න' (D.I,125-6). බුදුපියාණන් වහන්සේට මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති වූයේ නැත. අනුමාන කරන පරිදි, සොනඩණ්ඩ ගේ අසීරු තත්ත්වය පිළිබඳව උන්වහන්සේ ඔහුට අනුකම්පා කළහ. ඒ සමාජීය සිරිත් උන්වහන්සේට අල්ප වශයෙන් වැදගත් වූ නිසාය. බලන්න **ආගන්තුක සත්කාරය**

## දැඩි ශෝකය

දැඩි ශෝකය (සොක) යනු යම් දෙයක් හෝ ආදරණීය පුද්ගලයෙකු අහිමි වූ විට, ඇති වන ගැඹුරු දුකකි. පුද්ගලයෙකුට දුකක් දැනෙන කාල පරිච්ඡේදය ශෝක කිරීම (සොචන) යනුවෙන් හැඳින් වේ. යමෙකු දිගු අසනීපයෙකින් පසු මිය ගියහොත්, පවුලේ අයට සහ ඥාතීන්ට ඇති වන ශෝකය සාමාන්‍යයෙන් ඉතා අඩුය. එයට හේතුව, ඔවුන්ට මරණයට සූදානම් වීමට කාලය තිබූ නිසාය. නමුත් සමහර මරණ හදිසි සහ අනපේක්ෂිතය. හදිසියේ හෝ බේදජනක මරණයක් සඳහා වූ විවිධ ප්‍රතික්‍රියා බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු සිදු වූ දෙයින් මනාව පැහැදිලි වේ. 'ඒ වන විටත් තෘෂ්ණාවෙන් මිදී නොසිටි භික්ෂූහු හඬා වැළපුණහ, කෙස් තදින් සහ වේගයෙන් ඇද දැමූහ, දෑත් විසිකරමින් බිම පෙරළෙන්නට පටන් ගත්හ. නමුත්, තණ්හාවෙන් නිදහස් වූ භික්ෂූහු සිහිකල්පනාවෙන් දරා ගත්හ. පැහැදිලිව දැන සිටි ඔව්හු මෙසේ

පැවසූහ:'සම්මුතියකට එළඹී සියලු දේවල් අනිත්‍යයි, එබැවින්, මේ සියල්ලෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද?' (D.II,158). 'මෙම පළමු වර්ගයේ ප්‍රතික්‍රියාව හැඟීම් ප්‍රකට කරන ශෝකවීම සහ දෙවන වර්ගය නිහඬව ශෝකවීම යනුවෙන් හැඳින් වේ.

සමහර විට, මෙම පළමු ආකාරයේ ශෝකයට හේතුව සමාජ අපේක්ෂාවන් හෝ අනුකම්පාව හෝ අවධානය ආකර්ෂණය කර ගැනීමට ඇති ආශාවේ අංගයක් ද විය හැකිය. අව්‍යාජ වූ විට, එයින් සමථයකට පත් වීමක් ඇති වේ. හැඟීම් විනාශකාරී නොවන මාර්ගවලට යොමු කිරීමේ මාර්ගයක් ලෙස මෙහෙයවයි. කෙසේ නමුත්, එය අතිශයින් වේදනාකාරී අත්දැකීමක් විය හැකිය. බොහෝ මිනිසුන්ට, එවැනි දැඩි ශෝකයක් සාමාන්‍යයෙන් ටික කලකට පසු මැකී යයි. ඊට පසු ඔවුහු සාමාන්‍ය තත්ත්වයට පත් වෙති. නමුත්, සමහරුන්ට එය දිගටම පවතී. සාමාන්‍ය ක්‍රියාකාරකම් කෙරෙහි උනන්දුවක් නැතිවීම, දිගු කාලීන දුක සහ නොසන්සුන් බව හෝ අසහනය පවා තිබිය හැකිය. නිහඬ ශෝකයට හේතුව විය හැක්කේ කෙනෙකුගේ හැඟීම් යටපත් කිරීම, සමාජ අපේක්ෂාවන්ට අනුකූල වීමට හෝ මෘදු හෝ විවේචනයට ලක්වන ආකාරයෙන් පෙනී සිටීමට ඇති බිය නිසා විය හැකිය. හොඳම වේලාවේදී, කෙසේ වෙතත්, නිහඬව ශෝක වීම චිත්තවේගී බවේ ශක්තිය හඟවන්නට ඉඩ ඇත. ජීවිතයේ යථාර්ථයන් පරිණත ලෙස පිළිගැනීම පෙන්නුම් කරයි.

ඇත්ත වශයෙන්ම, ශෝකය ඇති වූ පසු එය සමග කටයුතු කිරීමේ උපාය මාර්ගවලට වඩා එසේ වීමට පෙර ඒ සඳහා සූදානම් වීම වඩා හොඳය. ජීවිතයේ

කිසිම දෙයක් මුළුමණින්ම අපේක්ෂා කළ නොහැකිය. මරණය තරම් සම්පූර්ණයෙන්ම නිශ්චිත නැත. එහෙත් එය අප කලාතුරකින් සූදානම් වන එක් අභියෝගයකි. අපගේම සහ අපගේ ආදරණීයයන්ගේ අභාවය පිළිබඳව ඉදහිට මෙනෙහි කිරීමේ පුරුද්ද බුදුපියාණන් වහන්සේ නිර්දේශ කළහ. අප ශෝකය අත්විඳින විට එහි තීව්‍රතාව සහ කාල සීමාව අඩු කිරීමට මෙයින් හැකි වේ. එසේම නැවත ඉපදීමේ සත්‍යය පිළිගැනීම ද ප්‍රයෝජනවත් වේ. අපගේ මියගිය ආදරණීයයන් අප සමග සම්බන්ධ වීමට පෙර, ජීවිතයක් සහ පවුලක් තිබූ බවත්, ඔවුන්ට බොහෝ විට අලුත් පවුලක් සමග ජීවිතයක් නැවත ඉපදීමෙන් ලැබිය හැකි බවත්, යනාදිය තේරුම් ගැනීමෙන් ශෝකයේ වේදනාව අඩු කරන්නට හැකි වේ. කෙසේ වෙතත්, ආදරය කරන කෙනෙකු අහිමි වීම පිළිබඳව අඩුම ගණනේ යම් දුකක් දැනීම නොවැළැක්විය හැකිය. තමන් වහන්සේගේ හොඳම මිත්‍රයන් දෙදෙනා සහ ප්‍රධාන ශ්‍රාවකයන් වහන්සේලා වූ මොග්ගල්ලාන සහ සාරිපුත්ත පරිනිර්වාණයට පත් වූ අවස්ථාවේ බුදුපියාණන් වහන්සේ පවා නැතිවීම පිළිබඳ හැඟීමක් අත්විඳ ඇත. උන්වහන්සේ මෙසේ පැවසූහ: 'මහණෙනි, මෙම ශාලාව දැන් මට හිස් බවක් දැනේ. මුගලන් සහ සාරිපුත්ත මහරහතුන් වහන්සේලා පරිනිර්වාණයට එළඹ ඇත' (S.V,164).
*The Art of Dying,* Virginia Hamilton, 2014.

## වරදකාරීත්වය

වරදකාරීත්වය (අපරාධ හෝ විප්පටිසාර) යනු යමෙකු යම් වැරැද්දක් කර ඇති බව දැන ගැනීම

හෝ විශ්වාස කිරීම නිසා ඇති වන අප්‍රසන්න හෝ නොසන්සුන් හැඟීමයි. එය පැමිණෙන්නේ ඇංග්ලෝ සැක්සන් වචනයක් වූ 'වරදක් කර ඇති' යන අදහස ඇති 'ගිල්ට්' යන්නෙනි. සමහර ආගම්වල, මිනිසුන්ගේ හැසිරීම පාලනය කිරීමේ මාධ්‍යයක් ලෙස, සහ වැරදි ලෙස හැසිරීම සඳහා සුදුසු දඬුවමක් ලෙස වරදකාරිත්වය දිරිමත් කරනු ලැබේ. බෞද්ධ මනෝවිද්‍යාවට අනුව, වරදකාරීත්වය මූලික වශයෙන් අසුබවාදී ලෙස පෙනෙන්නේ එයට වර්තමානයේ සිටීම හෝ තේරුම් ගැනීම වෙනුවට අතීතයේ වාසය කිරීම සම්බන්ධ වන බැවිනි. කෙසේ නමුත්, බුදුපියාණන් වහන්සේ පැවසුවේ ලජ්ජාව (හිරි) සහ ආත්ම ගෞරවය (ඔත්තප්ප) පිළිබඳ ප්‍රාණවත් හැඟීමකින් සමහර විට, ස්වයං පාලිත සාධක ලෙස ප්‍රයෝජනවත් විය හැකි බවයි (A.I,51). තවමත් වඩා පරිණත ආධ්‍යාත්මික ගුණාංග වැඩී නැති පුද්ගලයෙකුට ලජ්ජාව (අන් අයගේ මතය කෙරෙහි සැලකිලිමත් වීම) සහ ආත්ම ගෞරවය (තමන් ගැන තමන්ට ඇති මතය පිළිබඳව සැලකිලිමත් වීම), වැරදි වළක්වා ගැනීමට සහ යහපත් දේ කිරීමට එක් අමතර පෙළඹවීමක් ලබා දිය හැකිය.

**ගුරු** - බලන්න **ගුරුවරු සහ ශ්‍රාවකයන්**

## බුදුපියාණන් වහන්සේගේ පුරුදු සහ චර්යා රටාව

සමහර පසුකාලීන බෞද්ධ සම්ප්‍රදායයන්වලට අනුව බුදුපියාණන් වහන්සේ මනුෂත්වය ඉක්මවූ පුද්ගලයෙකු සහ දෙවිකෙනෙකු ලෙස පවා පෙනෙන්නට පටන් ගත්තේය. නමුත් උන්වහන්සේ කිසිම විටක ලෞකික කිසිම දෙයක් සිදු නොකළ අතර සැබැවින්ම එසේ කිරීමට ද අවශ්‍ය නොවීය. කෙසේ නමුත් බුදුපියාණන් වහන්සේ පිළිබඳව ත්‍රිපිටකයේ ඇති මුල්ම සටහන්වලින් උන්වහන්සේ නිරූපණය කර ඇත්තේ සාමාන්‍ය පුද්ගලයෙකු ලෙසය.

සැබැවින්ම උන්වහන්සේ බොහෝ ආකාරයෙන් නිරූපණය වී ඇත. බුදුපියාණන් වහන්සේගේ දෛනික චර්යාවන් බොහෝ දුරට උන්වහන්සේගේ තත්ත්වයේ සිටිනා කෙනෙකුගෙන් අපේක්ෂා කළ දේවල්ය. උන්වහන්සේ බැහැ දැකීමට පැමිණි අය සමග ධර්මය සාකච්ඡා කිරීමට හෝ උන්වහන්සේගේ භික්ෂු භික්ෂුණීන් මාර්ගයට යොමු කිරීමට බොහෝ වේලාවක් වැය විය. අමුත්තන් පැමිණි විට ඔවුන් සමග කථා කිරීම සඳහා පිටත සෙවනේ පැදුරක් දමන ලෙස උන්වහන්සේ සහායකයෙකුගෙන් ඉල්ලා සිටියහ (D.I,152). එවැනි අවස්ථාවල ආනන්ද ස්වාමීන් වහන්සේ හෝ වෙනත් සහායකයෙක් සමහර විට උන්වහන්සේ පිටුපස සිටගෙන සිසිලක් ලැබීම සඳහා

උන්වහන්සේට පවන් සැලූහ (D.II,73; M.I,83). එක් අවස්ථාවක උන්වහන්සේ දිවා විවේකයක් සඳහා වනයට යෑමට පැදුරක් ගෙනෙන ලෙස ආනන්ද ස්වාමීන් වහන්සේට පැවසූහ (D.II,102). බුදුපියාණන් වහන්සේ ආහාර ගත්තේ දිනකට එක් වරකි (M.I,437). ඒ සැමවිටම පෙරවරුවේය. සාමාන්‍යයෙන් උන්වහන්සේ ආහාර සඳහා පිණ්ඩපාතයේ වැඩියහ. නමුත් උන්වහන්සේ යම් කෙනෙකුගේ නිවසට දානය සඳහා ආරාධනය කළහොත් ඒවා ද පිළිගත්හ. උන්වහන්සේ ආහාර වැළඳුවේ සිහිකල්පනාවෙනි. ඊට පසු ආහාර වැළඳීමෙන් පසු පාත්‍රයේම අත් සෝදා ගත්හ (M.II,138-9). දහවලට පෙර ආහාර ගෙන අවසාන කළ පසු උන්වහන්සේ බොහෝ විට භාවනා කළහ. ඒ සඳහා සූදානම් වීම පිළිබඳව උන්වහන්සේ මෙසේ පැවසූහ: 'මම වනයට ඇතුල් වෙමි. හමුවන තණකොළ සහ කොළ එකතු කරමි. ඒවා ගොඩ ගසා ඒ මත හිඳ ගනිමි' (A.I,182). එළිමහනේ භාවනා කරන විට උන්වහන්සේ සිවුරෙන් කොටසක් උන්වහන්සේගේ හිස මතට ඇද ගත්හ. බොහෝ දුරට එසේ කරන්නට ඇත්තේ උන්වහන්සේගේ ඇස් ආවරණය කරන්නට විය හැකිය (S.I,167).

නැවතත් අනෙක් අය මෙන්ම බුදුපියාණන් වහන්සේගේ සිරුර ද කිලිටි වූ නිසා සෝදන්නට සිදු විය. බුදුපියාණන් වහන්සේ ස්නානය කිරීමෙන් පසු නානකඩය පිටින්ම සිටිමින් ගං ඉවුරේ ශරීරය වේලාගැනීම පිළිබඳ තොරතුරු ඇත (M.I,161). අදටත් ඉන්දියාවේ පවතින චාරිත්‍රවලට අනුව එදා උන්වහන්සේ ස්නානය කළේ ආහාර ගැනීමට

පෙරය. සමහර විට උන්වහන්සේ සවස නිදන්නට ඇත (M.I,249-50). මෙසේ සිදුවන්නට ඇත්තේ බොහෝ විට උන්වහන්සේගේ පසු කාලීන ජීවිතයේ ග්‍රීෂ්ම ඍතුවේ වන්නට ඇත. උන්වහන්සේ මහළු වියට පත්වූ කාලයේ සැන්දෑ යාමයේ හිරු රශ්මිය විඳිමින් හිඳ ගෙන සිටියහ (S.V,216). උන්වහන්යේ විඩාපත් වූ විට හෝ රෝගී වූ විට හැර උන්වහන්සේගෙන් ප්‍රශ්න ඇසීමට හෝ උපදෙස් පැතීමට පැමිණි අය වෙනුවෙන් කාලය වැය කළහ. කෙසේ නමුත් උන්වහන්සේට ස්වල්ප වේලාවක් හුදෙකලාව සිටීමට අවශ්‍ය වූ අවස්ථා ද තිබුණි. උන්වහන්සේ එසේ කරන්නට තීරණය කළ විට තමන් වහන්සේට බාධා නොකරන ලෙස සහායකට දැනුම් දුන්හ (D.I,151). එසේ නොමැති නම් සමහර විට උන්වහන්සේ තමන්වහන්සේගේ කාමරය පිරිසිදු කළහ. නැතහොත් කිසිවෙකුට නොදන්වා එළියට වැඩියහ (S.III,95).

හැන්දෑ ජාමයේ බුදුපියාණන් වහන්සේ සමහර විට රෝගීන්ගේ සුවදුක් බලා ඔවුන්ව සැනසීමට හෝ සියල්ල හොඳින් සිදුවේය යන්න නිශ්චිත කිරීමට ආරෝග්‍යශාලාවලට (ගිලානසාලා) වැඩියහ (A.III,142; S.IV,210; Vin.I,301). සවස් කාලයේ සිසිල් වායුවේ උන්වහන්සේ ඉහළට සහ පහළට ගමන් කළහ (D.III,80; S.I,107). සමහර විට භාවනා කරමින් හෝ හුදෙක් දෙපා දිග හරිමින් ය. 'මහ රාත්‍රිය වන තුරුම' භික්ෂු කණ්ඩායම්වලට හෝ ගිහි පිරිසට ධර්ම සාකච්ඡා කළ බවට බොහෝ විස්තර ඇත (D.II,86). අදාළ අවස්ථාවල දී උන්වහන්සේ තමන්වහන්සේගේ ඉතාමත් නිපුණ ශ්‍රාවකයන්ට සාකච්ඡාවක් කරන ලෙස පවසා ඉඳගෙන ඒවාට සවන් දුන්හ. එවැනි

එක් අවස්ථාවක උන්වහන්සේගේ පිටුපස වේදනාවක් තිබූ නිසා ධර්ම දේශනයට සවන් දෙමින් වැතිර සිටියහ (A.V,122-3). බුදුපියාණන් වහන්සේ සැතපුණේ කොපමණ වේලාවක් ද යන්න පිළිබඳව අපට තොරතුරු නැත. නමුත් උන්වහන්සේ බොහෝ විට රාත්‍රිය පුරා භාවනා කළ බව ත්‍රිපිටකයේ සඳහන් වේ (A.III,299).

වැඩසිටි කාලය පුරා වෙනත් අය කරන සුළු දේවල් බොහොමයක්ම බුදුපියාණන් වහන්සේ ද කළහ. උදාහරණ වශයෙන් අමුත්තෙකුට පැමිණීම පිණිස තමන්වහන්සේගේ කුටියේ දොර විවෘත කළහ (D.I,89), ගොඩනැගිල්ලකට ඇතුළ් වීමට ප්‍රථමව තමන් වහන්සේ විසින්ම දෙපා සෝදා ගත්හ (D.II,85), සහ කාමරයකට ඇතුල් වීමට ප්‍රථමව අනෙක් අයට දැන ගැනීම පිණිස කහිමින් ඒ බව දැනගන්නට ඉඩ සැලසුවහ (M.I,161). බුදුපියාණන් වහන්සේගේ මහකරුණාව සහ නිරවුල් ප්‍රායෝගික බුද්ධිය යන දෙකම අවධාරණය කරන හාස්‍යජනක සිද්ධියක් විනය පිටකයේ සඳහන්ව ඇත. වරක් උන්වහන්සේ ධර්ම සාකච්ඡාවක් සිදුකරමින් සිටින විට උන්වහන්සේට කිඹිහුමක් පිටවූ විට රැස්ව සිටි සියලුදෙනාම 'චිරං ජයතු!' (චිරං ජීව! ) යැයි කිවූහ. මෙයින් බොහෝ ඝෝෂාවක් ඇති වූ නිසා කථාවට බාධාවක් ඇතිවුණි. එවිට බුදුපියාණන් වහන්සේ සභාවෙන් මෙසේ ඇසූහ : ''යම් කෙනෙකුට කිඹිහුමක් පිටවූ විට බොහෝ කාලයක් ජීවත් වේවා !'' යැයි කීමෙන් ඒ අය බොහෝ කාලයක් ජීවත් වේ ද නැතිනම් ජීවත් නොවේ ද?' එසේ නොවන බව භික්ෂූහු පිළිගත්හ. බුදුපියාණන් වහන්සේ එයට එකඟ

වෙමින් කෙනෙකු කිඹිහුම් පිටකරන හැම වාරයකම 'චිරං ජයතු!' යැයි කීම එසේ නම් අවශ්‍ය නොවන බව පැවසූහ (Vin.II,140).

බුද්ධත්වය ලැබීම කායික වශයෙන් අපූර්වත්වයක් සහ අධිප්‍රමාණ ශක්තීන් හිමි වීමක් යනාදිය සමග සම්බන්ධ කිරීමට බොහෝ විට මිනිසුන් පුරුදු වී ඇත. පාරම්පරික බෞද්ධ රටවල බුදුපියාණන් වහන්සේ මීටර් 5ක් උසින් යුක්ත බව, එක් තැනකින් තවත් තැනකට පියාසර කළ බව, දෙවිවරු සහ දේවදූතයන් උන්වහන්සේ වෙනුවෙන් සියලු දේ කළ නිසා කරන්නට කිසිවක් නොතිබූ බව සහ උන්වහන්සේගේ සම ඉතා සියුම් හෙයින් ශරීරයේ කුණු තැවරුණේ නැති නිසා ස්නානය කිරීම අවශ්‍ය නොවූ බවත් පුළුල් අයුරෙන් විශ්වාස කෙරුණි. බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත්වන විට උන්වහන්සේගේ වයස 80ක් වුව ද, ඒ අවස්ථාව පිළිබිඹු කරන පිළිමවලින් නියත වශයෙන්ම දර්ශණය වන්නේ තරුණයෙකුගේ ලක්ෂණයි. බුදුපියාණන් වහන්සේ අසාමාන්‍යයි. නමුත් ඒ සමහර විට මිනිසුන් සිතන ආකාරයට නොවේ. උන්වහන්සේට පුදුමාකාර ශක්තීන් තිබුණි. නමුත් ඉතා වැදගත් ඒවා නම් සාමාන්‍ය ආකර්ෂණය වන ආකාර පිළිබඳවයි. බුදුපියාණන් වහන්සේ අසාමාන්‍ය වන්නේ උන්වහන්සේගේ නිත්‍ය වූ මහාකරුණාව, අනුකම්පාව, ඉවසීම, ධෛර්යය සහ සන්සුන් බව නිසාය. උන්වහන්සේගේ ශක්තිය වූයේ ඉපදීම සහ මරණය යන චක්‍රයෙන් උන්වහන්සේ නිදහස් කළ යථාර්ථයේ ස්වභාවය පිළිබඳ උන්වහන්සේට ගැඹුරු අවබෝධයක් තිබීමයි. බලන්න **කායික පෙනුම**

## හිසකෙස්

හිසකෙස් යනු ශරීරයෙන් පිටත වැඩෙන, දිගු සිහින් නූල් වැනි කෙස් රොදයි. කාලය පිළිබඳ අවබෝධයට අනුකූලව බුදුපියාණන් වහන්සේ හිස කෙස් (කෙස) සහ ශරීරයේ කෙස් (ලොම M.I,57) අතර ඇති වෙනස හඳුන්වා දුන්හ. ශරීරයේ කෙස් ඇහිබැම, ඇස් පිහාටු, නාසයේ කෙස්, මුහුණේ කෙස්, ශ්‍රෝණියේ කෙස් සහ කිහිල්ලේ කෙස් ආදිය ඇතුළත් වේ (Vin.IV,260). කෙස්වලට දීර්ඝකාලීන සමාජීය, ආගමික, ශෘංගාර සහ මනෝවිද්‍යාත්මක වැදගත් කමක් ඇත. සික් ආගමේ ගුරුවරුන් උගන්වන්නේ පිරිමින් ඔවුන්ගේ කෙස් නොකැපිය යුතු බවයි. ස්වභාව ධර්මයට විරුද්ධ බව කියමින් බයිබලය පිරිමින්ට දිගු කෙස් තිබීම නුසුදුසු යැයි සඳහන් කරයි (1 කොරින්තියන්ස් 11,14). ඉස්ලාම් සහ පොදුවේ පිළිගත් යුදෙව් දහම පිරිමින් ඔවුන්ගේ රැවුල නොකැපිය යුතු බව කියයි. බොහෝ ආගම්වලට අනුව කාන්තාවන් ඔවුන්ගේ කෙස් වේල්පටකින් හෝ හවරියකින් වසා ගත යුතුයි. පැරණි ඉන්දියානු චාරිත්‍ර මිනිසාගේ පස් ආකාර රූපශ්‍රීයෙන් එකක් ලෙස සැලකුහ. දිස්නය ඇති කළු හිස කෙස් සහ ශ්‍රෝණිය සහ නාභිය අතර ඇති මෘදු රේඛාවෙන් (තනුරොමරජි) ප්‍රබල ශෘංගාරාත්මක ආකර්ෂණයක් ඇති වේ. බුදුපියාණන් වහන්සේගේ කාලය වනවිටත් කොයිෆර් කලාව අති සංවර්ධනය වූ එකක් විය. පුරුෂයන් සහ ස්ත්‍රීන් යන දෙපාර්ශ්වයම ඔවුන්ගේ හිසකෙස් කෙරෙහි විශාල අවධානයක් යොමු කර තිබුණි. ස්ත්‍රීන් තමන්ගේ හිස කෙස් මැදින්

බෙදා කොණ්ඩ කරල ගොතා තිබුණි. (වෙණි, Ja.II,185) එසේම කෙස් සුවඳවත් කිරීමට සහ දිලිසීමට සඳුන් තෙල් තවරයි (Ja.V,156). අම්බපාලි ගණිකාව ඇගේ දිලිසෙන කළු පැහැති හිසකෙස් කෙළවරේ කැරලි කර එහි මල් ගසා තිබුණි. කෙස් පනාවෙන් හොඳින් වෙන්කර රන් ආභරණවලින් සරසා කොණ්ඩ කරල් දෙකකින් අලංකාර කර තිබුණි (Thi.252-5). නන්ද භික්ෂුවක වීමට පිටත්වයමින් ආපසු හැරී බලන විට ඔහුගේ හිතවතිය ඇගේ කොණ්ඩය අඩක් පීරමින් සිටිනු දුටුවේය. මෙම චිත්ත රූපය පසුව තම හිතෙන් ඉවත් කරගන්නට බැරිවිය (Ud.22). පුරුෂයන් සඳහා සිඛාබන්ධයේ වටේ ඔතන ලද දික්වූ කෙස් සමග දිග රෙදි පටියක් ඇතුළත් වේ. ඊට පසු එය හිස වටා තලප්පාවක් ලෙස ඔතා ඇත (D.I,7). තරුණයන් හිස මත ගැට පහක් හෝ බනිසක් මෙන් චූල්ක නමින් හඳුන්වන කෙස් සැකසුමක් භාවිත කළහ (Ja.V,250). කාන්තාවෝ ඔවුන්ගේ කෙස්වලට මැණික් එබ්බූ හිස වටා පලඳනාවක් සමහර විට භාවිත කළහ (Ja.I,65). හිසේ පිටුපස, මුදුනේ හෝ පැත්තකට බනිසක් මෙන් සැකසූ කොණ්ඩය ද ජනප්‍රිය විය. කෙස් පහළට ලිස්සන ආකාරයට සකස් කිරීම සඳහා මී ඉටි සහ සමහර විට නුග ගස්වල ශාක යුෂ ගල්වනු ලැබුණි (Vin.II,207). පුරුෂයෝ ඔවුන්ගේ රැවුල කප්පාදු කළහ. දික් කළහ. කුඩා යටි රැවුල් (ගොළොමිකම් කාරාපෙන්ටි) වැවූහ. හැඩ තල හතරකට සකස් කළහ. එසේම ඔවුහු තමන් වයසට පත් වී ඇති බව වසන් කිරීමට සුදු කෙස් ගලවති (Vin.II,134). සමහර තවුසෝ ගෙතූ කෙස් (ජාටා) පැළඳ ගෙන සිටියහ. ඒ ඉතා දිගු ගෙතූ වරලසක් පහතට වැටෙන්නට සැලැස්වීමෙන් හෝ විවිධ විලාසිතාවලට එකට ගැට

ගැසීමෙනි. ගෙතූ වරලසක් බනිසක් මෙන් හිස මත ගැට ගැසූ විට, එය ජාටණ්ඩුව (S.I,117) යන නමින් හඳුන්වනු ලැබුණි. සමහර තවුසන් හිස මත ගැටයක් ගැසූ අතර, තවත් සමහරු ඔවුන්ගේ හිස මුඩු කළහ. නැතහොත් ඔවුන්ගේ කෙස් ගැලවූහ (D.I,167). බ්‍රාහ්මණයෝ සමහර විට කෙස් වැඩීම සඳහා පිටුපස ස්වල්ප වශයෙන් ඉතිරි කර ඔවුන්ගේ හිස් මුඩු කළහ. මෙය අදටත් එසේ සිදුවෙමින් පවතී.

බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ භික්ෂූන්ට හිස සහ මුහුණත් භික්ෂුණීන්ට හිසත් මුඩු කරන ලෙස ඉල්ලා සිට ඇත. සමහර විට සනීපාරක්ෂක හේතූන් සහ පුහු ආටෝපය අධෛර්යමත් කිරීම සඳහා ද මෙසේ කියන්නට ඇත (Vin.II,207). භික්ෂුණීන්ගේ කිහිලි, ලිංග ප්‍රදේශ මුඩු කිරීම අපේක්ෂා කරන ලදී. මෙසේ කිරීමට හේතුව එකල කාන්තාවන් කෙරෙහි ගෞරවය රැකීමේ සලකුණක් වශයෙන් විය හැකිය (Vin.IV,260). භික්ෂූන්ට නාසය තුළ ඇති කෙස් ද දික් වී ඇත් නම් කැපීමට නිර්දේශ වී තිබුණි. ඒ කුතුහලය සහ අප්‍රසන්න බව මඟ හැරීම පිණිසය (Vin.II,134). බලන්න **රැවුල බෑම**

'Hair.' Patrick Olivelle. *Encyclopedia of Buddhism*, ed. Robert E. Buswell, 2004.

## ප්‍රභා මණ්ඩලය

ප්‍රභා මණ්ඩලය යනු (ප්‍රභා හෝ ප්‍රභාමණ්ඩල) විශේෂයෙන්ම ශාන්තුවර තත්ත්වයට පත් මිනිසුන්ගේ හිස වටා ආලෝක චක්‍රයක් දිස්වෙන බවට විශ්වාස කරන දෙයකි. පැරණි කාලයේ සහ වර්තමානයේ ද බුදුපියාණන් වහන්සේ බොහෝ විට නිරූපණය කරනු ලබන්නේ ප්‍රභා මණ්ඩලයක් සමගිනි. නමුත්

කිසි විටක එසේ තිබූ බවට ත්‍රිපිටකයේ සඳහන් නොවේ. කෙසේ නමුත්, බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය ලැබූ අවස්ථාවේ නිල්, කහ, රතු, සුදු, තැඹිලි යන වර්ණවලින් කිරණ (රංසි) උන්වහන්සේගේ ශරීරයෙන් නිකුත් වූ බව ත්‍රිපිටකයේ සඳහන් වේ (Vin.I,25). එසේම, උන්වහන්සේගේ පරිනිර්වාණය සිදුවන අවස්ථාවේ දී බුදුපියාණන් වහන්සේගේ සම අසාමාන්‍ය ලෙස පැහැදිලි සහ දීප්තිමත් වී ඇත (D.II,134). නිශ්චිතවම මේ ආකාරයේ පෙනුම වෙනස්වීමක් සිදුවන්නේ කෙසේ ද යන්න පුදුම දෙයකි. නමුත්, එකිනෙකාගෙන් පුළුල් ලෙස වෙන් වූ සංස්කෘතීන්වල සඳහන් වූ සංසිද්ධීන් වේ.

## ප්‍රීතිය

ප්‍රීතිය (සුඛ) යනු සැනසිල්ල, ශුභසාධනය සහ තෘප්තිය සමග වූ හැඟීමකි. එම හැඟීම මෘදු බව සිට තියුණු බව තෙක් විහිදී යන්නට පුළුවනි. එසේම එය ක්ෂණික හෝ කල් පවතින එකක් විය හැකිය. ඉන්ද්‍රිය සංවේදී උත්තේජකයන් මත යැපෙන ලෞකික ප්‍රීතිය සහ දැහැමි වීමෙන් සහ ක්‍රමයෙන් මනස නිදහස් කර ගැනීමෙන් ලබා ගන්නාවූ ආධ්‍යාත්මික ප්‍රීතිය අතර ඇති වෙනස බුදුපියාණන් වහන්සේ හඳුනා ගත්හ. බුදුපියාණන් වහන්සේ සාධාරණ සහ වැදගත් ලෙස සැලකූ ලෞකික ප්‍රීතිය සම්බන්ධ සමහර උදාහරණ වන්නේ අයිතිය පිළිබඳ ප්‍රීතිය (අත්ථිසුඛ), වස්තුව පිළිබඳ ප්‍රීතිය (භෝගසුඛ) සහ ණයතුරුස්වලින් නිදහස් වීමේ ප්‍රීතිය (අනණසුඛ,A.II,67-8) යනාදියයි. තෝරාගත් වෘත්තියේ විශිෂ්ටත්වය ලැබීමෙන් සහ එයින් යහපත් ජීවිතයක් ගත කිරීම

තුළින් කෙනෙකුට ඇතිවන හැඟීම එම පුද්ගලයාට බොහෝ සතුටක් ගෙන දිය හැකිය. (D.I,51) උසස් මට්ටමෙන්, ආධ්‍යාත්මික සතුටට හිතකර දේවල් අතරට, ශික්ෂාපද පිළිපැදීම (D.I,69-70), යෝග්‍ය පරිදි (A.I,294), ඉඳුරන් සන්සුන් කිරීම (D.I,70), තමන්ගේම යහපත් ක්‍රියා ගැන සිතීම සහ ප්‍රීති වීම (Dhp.16), මනස හීලෑ කිරීම (Dhp.35), වෛර කරන අයගෙන් වටවී සිටිය ද ආදරය කිරීමට හැකිවීම (Dhp.197), සාමයෙන් සිටීම (Dhp.202) යනාදිය ඇතුළත් වේ. නමුත්, ඉහළම සහ වඩාත් පිරිසිදු සතුට ලැබිය හැක්කේ රහත්ඵලයට පැමිණීමෙනි (Dhp.203). ප්‍රීතියේ මට්ටම් දෙක සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ මෙසේ අවවාද කළහ: 'ලෞකික සැපත අත්හැරීමෙන් ඉහළම ප්‍රීතියට පත් වන්නට හැකි නම්, ප්‍රඥාවන්තයා එය වඩා හරවත් ප්‍රීතිය ලෙස දකිමින්, එසේ කළ යුතුය' (Dhp.290). ප්‍රීතියට භාවනාවේ වැදගත් කාර්යභාරයක් ඇත. එය ස්ථිර, පහසු ඒකාග්‍රතාවක් දියුණු කිරීමට උපකාරී වේ. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'සතුටෙන් තිබෙන මනසක් ඒකාග්‍රතාවට පැමිණේ.' (සුඛිනෝ චිත්තං සමාධියති, D.I,73) බලන්න **භාවනාවේ දියුණුව**

*The Art of Happiness*, The Dalai Lama,1998.

## එකඟතාව

එකඟතාව (අවිරොධ හෝ සහිත) යනු සුමුදු, ප්‍රසන්න සහ දෙකක් හෝ ඊට වැඩියෙන් දේවල් එකට මතභේදයට තුඩු නොදෙන අයුරෙන් ක්‍රියා කිරීමයි. මිනිස් කණ්ඩායම් ඇතුළත සහ අතර, එකඟතාව තිබීමේ අවශ්‍යතාව සහ සුදුසු බව පිළිබඳව බුදුපියාණන් වහන්සේ බොහෝ විට පැවසූ සේක. 'සමාජයක ප්‍රගතිය' (අපරිහානිය ධම්ම) ලෙස හැඳින්

වූ දෙයට දායක වන කරුණු නම් 'එකඟතාවෙන් එකට හමුවීම, නැවත හමුවන සේ විසිර යෑම හා ව්‍යාපාර කරගෙන යාමට' ඇති හැකියාව බව බුදුපියාණන් වහන්සේ හැඳින් වූ සේක (D.I,74). පෙර මිනීමරුවෙකු වූ අංගුලිමාල බුදුපියාණන් වහන්සේගේ මත ප්‍රතිනාද කරමින් මෙසේ පැවසුවේය: 'ඉවසීම සහ සමගිය වර්ණනා කරන අයගේ ධර්මය වරින් වර මගේ සතුරන්ට සවන් දෙන්නට ඉඩ සලසන්න. ඒ අනුව ජීවත් වන්නට ඉඩ සලසන්න' (M.II,105) .

කෙසේ නමුත්, මෙය ක්‍රියාත්මක කිරීමේදීට වඩා කීම පහසුය. මිනිසුන් එකිනෙකා සමග හොඳින් වාසය කරන්නට නොහැකි වීම සම්බන්ධයෙන් අපකීර්තිමත්ය. එසේම මේ සම්බන්ධයෙන් ආගමික කණ්ඩායම් බොහෝ විට අනෙක් අයට වඩා ටිකක් හොඳය. 'වෛරය, ප්‍රචණ්ඩත්වය, සතුරුබව, සහ ද්වේෂ සහගත බව යන දේවලින් තොරව සාමයෙන් ජීවත් වීමට කැමැති මිනිස් සංහතිය නිරන්තරව වෛරයෙන්, ප්‍රචණ්ඩත්වයෙන්, සතුරුබවෙන්, නොමනාපයෙන් සහ ද්වේෂ සහගත බවෙන් පීඩා ගෙන දෙන ගැටුම්වල සිටින්නේ සහ කිසිම ආදරයක් නොමැත්තේ ඇය' ද කියා වරක් පුද්ගලයෙක් බුදුපියාණන් වහන්සේගෙන් ඇසුවේය? (D.II,276).

බොහෝ අසමගිතාවන් ඇති වීමට මූලික හේතුව තමන්ගේම අදහස්වලට ඇලීම සහ දැඩි ආශාවයි; තමන්ගේම අදහස්වලට, බලය සහ ප්‍රසාදය ලැබීමට ඇති ඇලීම වශයෙනි. ගැඹුරු මට්ටමින් දැඩි ආශාව ඇති වන්නේ ආත්ම හෝ මමත්වය යන සංකල්ප විශාල වශයෙන් ජනනය වීමෙනි. සම්පූර්ණ

එකඟතාව සහ කල්පවත්නා සැනසිල්ල ලැබිය හැකි වන්නේ කෙනෙකු රහත්ඵලයට පත් වූ පසුය. නමුත්, මේ අතර, අපගේ සම්බන්ධතා වඩාත් භේද රහිත කර ගැනීම සඳහා පුද්ගලයන් වශයෙන් අපට කළ හැකි දේ බොහෝ ඇත.

බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ:'මහණෙනි, ආදරය සහ ගෞරවය, උපකාර කරන බව සහ එකඟතාව, ප්‍රගමනය සහ සමගිය පෝෂණය කරන කරුණු හයක් තිබේ. ඒ හය මොනවා ද? ආධ්‍යාත්මික ජීවිතයේ දී පුද්ගලයෙකු ප්‍රසිද්ධියේ සහ පුද්ගලිකව තමන්ගේ මිතුරන් කෙරෙහි ආදරයෙන් ක්‍රියා කරයි ද, කථා කරයි ද; පුද්ගලයෙකු ප්‍රසිද්ධියේ සහ පුද්ගලිකව ඔවුන් කෙරෙහි ආදරයෙන් සිතයි ද, සීමාවෙන් තොරව, තමන් සාධාරණව ලබා ගත් දේ එය තමන්ගේ පාත්‍රයේ ප්‍රමාණයට වඩා වැඩි නොවූව ද බෙදා හදා ගනියි ද; යමෙකුට ඔවුන් සමග සම්පූර්ණ, නොබිඳුණු සහ නිදහස ලබාදෙන, ප්‍රඥාවන්තයින් අගය කළ සමාධියට හිතකර ගුණාංග ඇති විට; සහ යමෙකු සතුව පූජනීය ජීවිතයේ දී ප්‍රසිද්ධියේ සහ පෞද්ගලිකව තම මිත්‍රයන් සමග සිටින විට, විමුක්තියට මඟ පෙන්වන, දුක් වේදනා සම්පූර්ණයෙන්ම විනාශ කරන උතුම් අවබෝධයට උපකාර වේ ද ; එවිට ආදරය සහ ගෞරවය, උපකාර කරන බව සහ එකඟතාව, ප්‍රගමනය සහ සමගිය ඇති වේ' (M.I,322).

බුදුපියාණන් වහන්සේ වරක් තම ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා කිහිප දෙනෙකුගෙන් 'කිරි සහ ජලය මිශ්‍ර වූවාක් මෙන්, එකිනෙකා සමග ආදරණීය ඇස්වලින් එකමුතුව, අන්‍යෝන්‍ය වූ ඇගයීමෙන් සහ

එකඟතාවෙන් එකට ජීවත්වන්නට හැකි වූයේ කෙසේ දැයි' ඇසූහ (M.III,156). ඔවුන්ගෙන් එක් අයෙකු වන අනුරුද්ධ හිමියන් පිළිතුරු දෙමින්, 'මම සැමවිටම සලකා බලන්නේ එය මොන තරම් ආශීර්වාදයක් ද, සැබෑ ආශීර්වාදයක් ද, මම ආධ්‍යාත්මික ජීවිතයේ එවැනි මිතුරන් සමග ජීවත්වීම යන්නයි. මම ප්‍රසිද්ධියේ සහ පුද්ගලිකව ඔවුන් කෙරෙහි ආදරයෙන් සිතමි, කථා කරමි, සහ ක්‍රියා කරමි. මම සැමවිටම සලකන්නේ මගේ අභිමතයන් පසෙකට දමා ඔවුන්ට අවශ්‍ය දේ පිළිගත යුතු බවත්, පසුව මම එය කරන බවත්ය. එවිට අප ශරීරයෙන් බොහෝ දෙනෙක් වන නමුත්, මනසින් එක් පුද්ගලයෙක්ය' (M.III,156).

බුදුපියාණන් වහන්සේ සහ අනුරුද්ධ හිමියන් බොහෝ දේවල් මෙහි සඳහන් කර ඇත - ආදරය, පරිත්‍යාගශීලී බව, එක සමාන සාරධර්ම ඇති බව, අනෙක් අය ඇගයීම, ඔවුන්ගේ අවශ්‍යතාවන්ට සංවේදී වීම සහ සැමවිටම තමන්ටම උවමනා ආකාරයට කටයුතු නොකිරීම යනාදියයි. සමගිය පෝෂණය කරන ගුණාංග නම් සමාව දීම, කරුණාව, ගෞරවය, අනුකම්පාව සහ ඉවසීමයි.

## රෝග සුව කිරීම

රෝග සුව කිරීම යනු සෞඛ්‍ය සම්පන්න වීමට හෝ සෞඛ්‍යය යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලියයි. සාම්ප්‍රදායික රෝග සුව කිරීම වෛද්‍යවරුන් විසින් ඖෂධ සහ ශල්‍යකර්ම භාවිත කරමින් සිදු කරනු ලැබේ. ආගම පිළිබඳ සන්දර්භය තුළ, රෝග සුව කිරීම බොහෝ විට දෙවියන්ගේ ආශීර්වාද හෝ

හාස්කම් මත සම්බන්ධ වේ. වෙනත් ආගම් දෙවියන්ගේ මැදිහත්වීමකට ආරෝපණය කරන බොහෝ කාරණා මෙන්ම, බුදුදහම මනසේ බලය මැඩ පැවත්වීමට වැඩි නැඹුරුවක් දක්වයි. මනස සහ ශරීරය එකිනෙකට සමීපව බැඳී ඇති බවත්, එකිනෙකට එයින් බලපෑමක් ඇති කළ හැකි බවත් දිගු කාලයක් තිස්සේ පෙන්වා දී ඇත. මේවා බුදුපියාණන් වහන්සේට සැඟවුණු ඇත්ත දැකීමේ තිබූ හැකියාවයි. දැඩි විශ්වාසයෙන් යුක්ත හැඟීමක්, ධනාත්මක දෘෂ්ටියක් සහ යමෙකු රැකබලා ගන්නා සහ ආදරය කරන හැඟීමක් මනසට බලපානු ඇත. එවිට එය ශරීරය සුවපත් වීමට උපකාරී වේ. බුදුපියාණන් වහන්සේ මෙය ද අවබෝධ කර ගත්හ. ඒ නිසාවෙන් සාර්ථක රෝග සුවකරන්නෙකු බවට පත් වූහ. බුදුපියාණන් වහන්සේ හෝ උන්වහන්සේගේ ශ්‍රාවකයෙකු රෝගීන් වෙත පැමිණ අනුකම්පාවෙන් සහ සැලකිලිමත් අයුරෙන් අනුශාසනා කිරීමෙන් පසු රෝගීන් සුවය ලැබූ බවට ත්‍රිපිටකයේ සඳහන් වේ (A.III,295 ff;S.V,79-80; 381). හොඳ හෙදියකගේ වැදගත්ම ලක්ෂණය වනුයේ ඇය රෝගියාට සේවාව සපයන්නේ 'ආදරයෙන් යුක්ත මනසකින් මිස, වාසි ලබා ගැනීමේ ආශාවෙන් නොවන බව' (මෙත්තචිත්තො ගිලානානං උපට්ඨහති නො අමිසන්තරො, A.III,144). බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ.

නමුත්, ශරීරය සුවපත් කරන්නෙකුට වඩා, බුදුපියාණන් වහන්සේ මනස සුවපත් කරන්නෙකු වන සේක. වරක් කිසාගෝතමී, ඇයගේ පුත්‍රයා අහිමි වූ විට, ශෝකයෙන් වියරු වූවාය. ඈ නගරය පුරා

තම දරුවාට ඖෂධ දෙනමෙන් මිනිසුන්ගෙන් බැඟෑපත් වූවාය. අවසානයේ බුදුපියාණන් වහන්සේ වෙත පැමිණියාය. උන්වහන්සේ කරුණාවෙන් ඇයට පැවසුවේ කිසිම දිනක කිසිම කෙනෙකු නොමළ ගෙයකින් සුදු අබ ගෙන එනමෙන්ය. මෙම ඇට ඇයගේ දරුවා හාස්කමින් යළි ප්‍රාණවත් කරනු ඇතැයි සිතමින් ඈ ගෙයින් ගෙට එසේ ඉල්ලමින් ගියාය. මෙම ඇට ඇයට ලබා දීමට සැම කෙනෙක්ම කැමැත්ත දැක්විය. නමුත්, කිසිවෙක් ඒ නිවසින් මියගොස් ඇත් දැයි ඇසූ විට පිළිතුර වූයේ මිය ගොස් ඇති බවයි. සෙමෙන් මරණය ජීවිතයේ නොවැළැක්විය හැකි කොටසක් බව කිසාගෝතමියට වැටහීමට පටන් ගත්තේය. ඇයගේ ශෝකය අවබෝධයට සහ පිළිගැනීමට ඉඩ දුන්නේය (Dhp-a,273).

බුදුපියාණන් වහන්සේගේ කාලයේ සහ අදටත්, සමහර දැනුමක් නැති පුද්ගලයන් සිතා ඇත්තේ බුදුපියාණන් වහන්සේ අනාගතය හෙළි කරන්නෙකු, හාස්කම් කරන්නෙකු හෝ දාර්ශනිකයෙකු වශයෙනි. නමුත්, උන්වහන්සේ තමන්ගේ කාර්යභාරය වශයෙන් දුටුවේ මනුෂ්‍ය දුක් කන්දරාව සුවපත් කරන වෛද්‍යවරයෙකු වශයෙනි. වරක් එක් මිනිසෙක් ස්වභාව ධර්මය සහ විශ්වයේ පරිමාණය පිළිබඳ ප්‍රශ්න මාලාවක් බුදුපියාණන් වහන්සේගෙන් ඇසුවේය. බුදුපියාණන් වහන්සේ ඔහුට පැවසුවේ ඔහු විෂ සහිත ඊතලයක් වැදී ඇති පුද්ගලයෙකු හා සමාන බවය. එය ඉවත් කළ හැකි වෛද්‍යවරයෙකු පැමිණි විට මිනිසා මුලින්ම ඉල්ලා සිටින්නේ යම් ප්‍රශ්නවලට පිළිතුරු දිය යුතු බවයි. උදාහරණ වශයෙන් ඊතලය විද්ද පුද්ගලයාගේ නම, ඔහුගේ

දෙමාපියන්ගේ නම්, ඊතලය විදීමට භාවිත කළ දුන්නේ වර්ගය, ඊතලයට තිබුණේ කුමන ආකාරයේ තුඩක් ද යනාදියයි. මේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු දීමට බොහෝ කාලයකට පෙර, වස-විස මරා දමන්නට ඉඩ ඇත. ඊට පසු බුදුපියාණන් වහන්සේ පැවසුවේ උන්වහන්සේගේ කාර්යභාරය වන්නේ මිනිසුන් අසන්නට ඉඩ තිබෙන සියලු න්‍යායාත්මක හෝ දේවධර්මීය ප්‍රශ්නවලට පිළිතුරු දීම නොව, දුක්විඳීම යන ඊතලය ඉවත් කරන්නේ කෙසේ ද යන්න ඔවුන්ට පෙන්වීම බවයි (M.I,429-31). බලන්න **බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව**

## හදවත

හදවත (හදය) යනු ශරීරය හරහා රුධිරය පොම්ප කරන විශේෂිත කාමර හතරකින් යුක්ත මාංශ පේශී වේ. මුල් බෞද්ධ විශ්ලේෂණයට අනුව, එය ශරීරයේ කොටස් 31න් එක් කොටසකි. ත්‍රිපිටකය පුරා ප්‍රාඥ නොවන දේශනාවල 'හදවත' යන වචනය වෙනුවට භාවිත කර ඇත්තේ අප දැකීමට බලාපොරොත්තු වන 'මනස' යන වචනයයි. හදවත බොහෝ විට විවිධ හැඟීම් සමග සම්බන්ධ වේ. යම් කෙනෙකුගේ 'අධික ශෝකයෙන් පෙළීම' (Ja.V,180) 'බියෙන් පෙළීම' (Ja.IV,415) සහ 'තවත් කෙනෙකු හොඳින් අවබෝධ කරගෙන සිටීම' (M.I,32) පිළිබඳව අපි කියවා ඇත්තෙමු. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ වචනවලින් මෙසේ පැවසූහ: 'වැදගත්ම දෙය අවබෝධ කරගන්න' (හදයංගමා, D.I,4).

මුල් අභිධම්ම චින්තකයන් විඥානයේ කායික පාදකය කුමක් වේ ද යන ප්‍රශ්නය සැලකිල්ලට ගත් නමුත්,

ඔවුහු කිසි විටක කිසිම විශේෂිත ඉන්ද්‍රියයක් තීරණය නොකළහ. පසුව, අභිධම්ම සම්ප්‍රේක්ෂණය තීරණය කළේ එය හදවත (හදය වත්ථු) බවයි. ආයුර්වේද වෛද්‍ය හේළ (ක්‍රි. පූ. 1වන ශතවර්ෂය) හදවතට වඩා එය මොළයේ විය හැකි බව පළමු වරට පැවසූ ඉන්දියානු ජාතිකයා බව පෙනේ. නමුත්, නූතන කාලය වන තුරු ඔහුගේ ඇතුළු නුවණෙන් එතරම් බලපෑමක් ඇති නොවුණි.

## දෙව්ලොව

දෙව්ලොව (දේවලෝක හෝ සග්ග) යනු මිනිසුන් නැවත ඉපදීමට හැකි තල හයෙන් එකකි. අනෙක් ඒවා වන්නේ මිනිස් විෂය පථය, සත්වයන්ගේ විෂය පථය, ඊර්ෂ්‍යාසහගත ජීවීන්ගේ විෂය පථය, කුසගින්නෙන් පෙළෙන ජීවීන්ගේ විෂය පථය සහ නිරයයි. දෙව්ලොව මූලික වශයෙන් ප්‍රසන්න විෂය පථයක් හෝ තලයක් වන අතර එහි ආයුකාලය ඉතා දීර්ඝ වේ. බුදුදහමට අනුව දිව්‍යලෝක හතක් හඳුනාගෙන ඇත. 1. චාතුමහාරාජික දෙව්ලොව 2. තාවතිංස දෙව්ලොව 3. යාම දෙව්ලොව 4. තුසිත දෙව්ලොව 5. නිම්මානරතී දෙව්ලොව 6. පරනිම්මිත දෙව්ලොව සහ 7. බ්‍රහ්ම දෙව්ලොව යනාදි වශයෙනි. සියලු දිව්‍යලෝකයන් තුළ විවිධ ගෝල ඇති බව විශ්වාස තිබේ. මෙම දිව්‍යලෝක සහ ඒවායේ විවිධ උපකොට්ඨාස සමහර විට කිතුනු දේවධර්මයේ දිව්‍යමය විෂය පථ නමයට සමාන විය හැකිය. ඒවායේ වාසය කරන දිව්‍යමය ජීවීන් ක්‍රිස්තියානි ඉහළම පැලැන්තියේ දේව දූතයන්, දෙවන පෙළේ දේව දූතයන්, බිෂොප්වරුන්, උසස් පොළේ දේවදූතයන් සහ දේවදූතයන්ට සමාන වේ.

අවශ්‍යයෙන්ම ප්‍රඥාවන්තයන් නොවූ ඉහළ මට්ටමකට ධනාත්මක චිත්තවේගයන් වර්ධනය කරගත් මිනිසුන් එක් හෝ තවත් දිව්‍යලෝකයක නැවත ඉපදිය හැකිය. කෙසේ වෙතත්, බුදුපියාණන් වහන්සේ කියා සිටියේ දිව්‍යලෝකයේ නැවත ඉපදීම සඳහාම ධර්මය පිළිපැදීමේ අදහස පුද්ගලයෙකු නතර කළ යුතු, වැළකිය යුතු සහ පිළිකුල් කළ යුතු බවය. (අට්ටියෙය්‍යාථ, හරායෙය්‍යාථ, ජිගුච්ඡෙය්‍යාථ) (A.I,115). දිව්‍යලෝකය නිරය හෝ කිරිසන් තල, ඊර්ෂ්‍යා සහගත ජීවීන් හෝ කුසගින්නෙන් පෙළෙන ජීවීන්ගේ විෂය පථවලට වඩා ඉතා ඉහළ දෙවයක් වන නමුත්, බුදුපියාණන් වහන්සේ සැලකුවේ එය මිනිස් විෂය පථයට වඩා පහත් ලෙසයි. එයට හේතුව ඔවුන්ගේ අත්දැකීම් ඉතා සතුටෙන් පිරි එකක් නිසා, දිව්‍යලෝකයේ ජීවීන් ගුණ යහපත්කම් හෝ අවබෝධය දියුණු කර ගැනීමට අවස්ථාව හෝ දිරිගැන්වීම ලබන්නේ නැත. සැබැවින්ම ඔවුන්ගේ ආයුකාලය අවසානයට පැමිණි විට (අනෙක් සියලු තල මෙන්ම දිව්‍යලෝකය ද අස්ථිරය) ඔවුහු ඒ අතරම නැවත උත්පත්තියක් ලබති. බලන්න **අවතාර**

*The Gods in Early Buddhism*, M. M. Marasinghe, 1976.

**අපාය**

බලන්න **නිරය**

**මිථ්‍යා ලබ්ධිය**

මිථ්‍යා ලබ්ධිය ලතින් භාෂාවේ හැරසිස් යන වචනයෙන් පැවත එයි. එහි තේරුම 'ගැනීම' හෝ

'තෝරා ගැනීම' යි. එය නිල හෝ වඩාත් පුළුල් ලෙස පවතින ආගමට වඩා වෙනස් ආගමක් පිළිබඳ ඕනෑම අර්ථකථනයකට දෙන නමකි. මිථ්‍යා ලබ්ධික විශ්වාසයක ස්වභාවය නිර්වචනය කිරීම ඉතා අපහසුය. 16වන ශතවර්ශයේ මානවවාදී සෙබස්තියන් කැස්ටලියෝ එය ඉතා හොඳින් ලිව්වේය: 'මිථ්‍යා ලබ්ධික යන පදයේ අදහස ප්‍රවේසමින් පරීක්ෂා කිරීමෙන් පසු, මෙයට වඩා වැඩියෙන් යමක් මට අනාවරණය කළ නොහැකිය: ඒ අප මිථ්‍යා ලබ්ධීන් ලෙස සලකන්නේ අප එකඟ නොවන අයයි'.

ශතවර්ෂ ගණනාවකට පෙර වනතුරු බටහිර සහ තවමත් මැද පෙරදිග බොහෝ ස්ථානවලත් මිථ්‍යා ලබ්ධික චෝදනාවලට ලක්වූවන්ට වඩාත් දරුණු දඬුවම් පමුණුවා හෝ පමුණුවමින් පවතී. බුදුදහමට සත්‍යය පිළිබඳව පැහැදිලි සහ නිරවද්‍ය සංකල්පයක් ඇත. එය වැරදි අදහස් (මිච්ඡා දිට්ඨි) වශයෙන් හඳුනා ගනී. කෙසේ නමුත්, සත්‍යය පිළිබඳ ඉතා නම්‍යශීලී අර්ථකථනයක් සඳහා එය සැමවිට ඉඩ ලබා දී ඇත. එනිසා මිථ්‍යා ලබ්ධිය කෙරෙහි අති සංවේදිතාව සහ මිථ්‍යා ලබ්ධිකයන් දඩයම් කිරීම සහ නිහඬ කිරීම දුර්ලභ වේ.

මෙම නම්‍යශීලී බව ධර්ම ග්‍රන්ථවල සටහන් වී ඇති බව මෙම සිද්ධියෙන් මනාව පැහැදිලි වේ. වරක් භික්ෂුවක් තම මිතුරන් බොහෝ දෙනෙකුගෙන් සැඟවුණු ඇත්ත දැකීමේ හැකියාව ලබා ගන්නේ කෙසේ දැයි විමසූ අතර, එක් එක් කෙනා ඔහුට වෙනස් පිළිතුරක් ලබා දුන්නේය. ව්‍යාකූලත්වයට පත්

ඔහු බුදුපියාණන් වහන්සේ වෙත ගොස් අනෙක් භික්ෂූන් වහන්සේලා පැවසූ දේ පැවසූ අතර, බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: 'කිම්සුක (එරබදු) ගසක් දැක නැති මිනිසෙකු වෙත ගොස් වෙනත් මිනිසෙකුගෙන් එවැනි ගසක් කෙබඳු දැයි විමසුවා යැයි සිතමු. අනෙක් අය මෙසේ පිළිතුරු දිය හැකිය:'කිම්සුක ගසක් කලු වර්ණයෙන් යුක්ත අඟුරු කඳක් මෙන්ය' යැයි කියනු ඇත. ඉතින් පළමු මිනිසාට අනෙක් මිනිසා එය දැක ඇතැයි පෙනෙන්නට හැකිය. ඊට පසු ඔහු තවත් මිනිසෙකු ළඟට ගොස් කිම්සුක ගසක් කුමක් දැයි ඇසූ විට අනෙකා මෙසේ පිළිතුරු දිය හැකිය:'එය මස් කැබැල්ලක් මෙන් රතුපැහැතිය'. ඉතින් ඔහුට අනෙක් මිනිසා එය දුටුවා යැයි පෙනෙන්නට හැකිය. එවිට ඔහු තවත් මිනිසෙකු වෙත ගොස් කිම්සුක ගසක් කෙබඳු දැයි ඇසූ විට අනෙක් අය මෙසේ පිළිතුරු දෙන්නට හැකිය: 'එහි කඳ පතුරු වශයෙන් පහතට එල්ලෙයි. එහි කරල් සිරීස ගසක් මෙන් පුපුරයි.' ඉතින් ඔහුට අනෙක් මිනිසා දකින ආකාරයට එය පෙනෙන්නට හැකිය. අවසානයේ ඔහු තවත් මිනිසෙකු වෙත ගොස් නැවතත් ඔහුගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නට හැකිය. අනෙක් මිනිසා මෙසේ පිළිතුරු දෙන්නට හැකිය: 'කිම්සුක ගසකට ඝනකමින් යුක්ත පත්‍ර තිබේ. නුග ගසක් මෙන් සමීප සෙවනක් ලබා දෙයි.' ඉතින් ඔහුට අනෙක් මිනිසා දකින ආකාරයට පෙනෙන්නට හැකිය. ඒ අකාරයටම, එම දියුණු වූ මිනිසුන් තමන්ගේ පෞද්ගලිකව ඇති කරගත් පිරිසිදු දෘෂ්ටියට අනුව ඔවුන්ගේ පිළිතුරු ලබා දී ඇත' (S.IV,193).

## හිමාලය

හිමාලය (හිමාවල හෝ හිමවන්ත) යනු ඉන්දියානු උපමහාද්වීපයේ උතුරු මායිමේ කිලෝ මීටර් 2500ක් දිග කඳු දාමයකි. මෙම නම පැවත එන්නේ 'හිම මාලය' යන අරුත ඇති හිම සහ මාල යන වචනවලිනි. නැතහොත් සමහර අයගේ අදහස අනුව, 'හිම වාසස්ථානය' යන අරුත ඇති හිම සහ ආලය යන වචනවලිනි. ජාතක කතාවේ හිමාලය පැහැදිලි කරන්නේ 'විශාල කලාපයක්, යොදුන් පන්සියයක් උස සහ පළල තුන්දහසක්' බවයි (Ja.V,415). ඒවා 'කඳුවැටිවල අධිපතියා' (පබ්බතරාජ) ලෙස බුදුපියාණන් වහන්සේ හැඳින්වූහ (S.II,137). උන්වහන්සේගේ බුද්ධත්වය ලැබීමෙන් නොබෝ කලකින්, උන්වහන්සේ අනෙතත්ත විල වෙත අධි ප්‍රමාණ බල භාවිත කරමින් වැඩිය බව සඳහන් වේ. වර්තමානයේ එය කයිලාෂ් කඳු වැටිය පාමුළ මනසරොවර් විල සමග හඳුනාගෙන තිබේ (Vin.I,27). පසුකාලීනව, උන්වහන්සේ ඉඳ හිට 'හිමාලයානු කලාපයේ වනාන්තරයක කුටියක වාසය කළහ.' සමහර විට පහළ කුමඹින් සන කැලෑ කඳුවැටියේ හෝ නේපාලයේ මහාභාරත කඳුවැටියේ විය හැකිය (S.I,116).

හිමාලය බොහෝ ජාතක කථා සඳහා පසුබිම සකසයි. බෝධිසත්ත්ව වශයෙන් බුදුපියාණන් වහන්සේගේ පෙර ජීවිතවල බොහෝ අවස්ථාවල දී බුදුපියාණන් වහන්සේ අභිනිෂ්ක්‍රමණය කර කඳුවැටිවල තවුසෙකු ලෙස ජීවත් වී ඇත. නැතහොත් උන්වහන්සේගේ ජීවිතයේ අවසානය වන තුරු එහි හුදෙකලාවේ වැඩ සිටියහ (e.g. Ja.I,140; 362;

371; 406; 440). උන්වහන්සේ සහ අනෙක් තවුසෝ කැලෑ පළතුරු සහ ධාන්‍ය ආහාරයට ගනිමින් ජීවත් වූහ. බොහෝ විට වන සතුන් සමග මිතුරු වූහ. ශීත ඍතුව සමීප වන විට, ශීතෙන් වැළකීමට, ලුනු, විනාකිරි සහ වෙනත් අවශ්‍ය දෑ එකතු කිරීමට සමතලා බිමක් වෙත ගොස්, මාස හතරකට පසුව නැවත පැමිණියහ. බුදුපියාණන් වහන්සේට හිමාලය කඳුවැටියේ මහේශාක්‍ය හිරු ආලෝකයේ හිම මුදුන්, සත්පුරුෂ බවේ සහ පවිත්‍රතාවේ සංකේතයක් විය. ධම්මපදයෙන් උන්වහන්සේ මෙසේ පැවසූහ:'යහපත් දේ හිමාලය මෙන් ඈත සිට බබලයි. නරක දේ රාත්‍රියට විදින ඊතලයක් මෙන් අපහැදිලිය' (Dhp.304) බලන්න **මෙරු**

## හීනයාන

'හීන යානය' යන අර්ථය ඇති හීනයානය වශයෙන් මහායාන බෞද්ධයන් බුදුදහමේ පූර්ව මහායාන ගුරුකුල සඳහා භාවිත කරන නින්දා සහගත යෙදුමකි. පැරණිතම මහායාන සූත්‍රවල (ක්‍රි. පූ. පළමුවන සියවසදී පමණ), දක්නට ලැබුණ ද, වඩාත් පොදු යෙදුම් වූයේ ශ්‍රාවකයන්ගේ මාධ්‍යය (අර්හත්යාන හෝ හර්වකහාන) වන සහ පහත් ක්‍රමවලින් නිදහස් වීමය. (හීනාධිමුක්ත) අවසානයේ හීනයානය යෙදුම බවට පත් වූ අතර, එය තවමත් ථේරවාදී බුදුදහම විස්තර කිරීම සඳහා මහායාන බෞද්ධයෝ භාවිත කරති. පරමාදර්ශී වෘත්තියෙහි නියැලෙන්නාවූ බෝධිසත්වයන් වහන්සේ උත්සාහ කරන්නේ සියලු ජීවීන් නිදහස් කර ගැනීමට වන අතර, හීනයාන පරමාදර්ශය වන්නේ අර්හත් බව ලබා ගැනීමෙන් තමන්ට පමණක් විමුක්තිය ලබා

ගැනීමයි. මහායාන බුදුදහම පිළිබඳව කිසිම අපහාසාත්මක යෙදුමක් පාලි ත්‍රිපිටකයේ නැත. එයට හේතුව එය බුදුදහම තුළ නිකායන් ඇති වූ කාලයට පෙර පැවති නිසාය.

'A Historical Study of the Terms Hinayana and Mahayana.' R. Kimura, *Journal of the Dept. of Letters*, Calcutta University, Vol. XII, 1925.

## භාවනාවට ඇති බාධා

අප ආනාපාන සතිය හෝ වෙනත් භාවනාවක් වඩන්නට ආරම්භ කළ විගස, අනවසරයෙන් ඇතුළුවන සිතුවිලි අපට දැනේ. මෙම සිතුවිලි සමග එන චිත්තවේගයන් වර්ග පහක් ලෙස බුදුපියාණන් වහන්සේ හඳුනාගෙන ඇත. 1. ඉඳුරන්ගෙන් ඇතිවන ආශාවන් (කාමච්ඡන්ද), 2. වෛරය (ව්‍යාපාද), 3. නිදිමත සහ අලසකම (ථීන - මිද්ධ), 4. නොසන්සුන් බව සහ කනස්සල්ල (උද්ධච්චකුක්කුච්ච), සහ සැකය (විචිකිච්ඡා) යනාදියයි.

මෙම බාධා පහ භාවනාවට හුදෙක් කඩාකප්පල්කාරී වනවා පමණක් නොවේ. ඒවා බොහෝ මානසික ප්‍රශ්නවලට මුල් හේතුව ද වේ. ඒ නිසා ඒවා සමග අනුගත වීම අපගේ ලෞකික සහ ආධ්‍යාත්මික හිතකර බවට හේතුවිය හැකිය (A.III,63). මෙම බාධා 'අවබෝධයක් නැති බව, විචාර බුද්ධිය නැති කම සහ දැඩි වේදනාවට හේතු වන බව' බුදුපියාණන් වහන්සේ පැවසූහ (S.V.111). ඒවා අඩු වූ විට, මනස 'නම්‍ය, කීකරු, ප්‍රායෝගික සහ තීව්‍ර වන බවත්' බුදුපියාණන් වහන්සේ වැඩි දුරටත් විස්තර කළහ (S.V.92); ඒවායෙන් නිදහස් වීම, තාවකාලිකව පවා 'සතුට ඇතිවීමට, සතුටෙන් ප්‍රීති ප්‍රමෝදයට පැමිණීමටත්, ශරීරය සන්සුන් වීමටත්, සන්සුන් වූ

ශරීරය ප්‍රීතිය ඇතිකිරීමටත් සහ ප්‍රීතියෙන් යුක්ත මනස ඒකාග්‍රතාවයට පැමිණීමත් සිදු වෙන්නට' සලස්වන බවත් බුදුපියාණන් වහන්සේ වදාළහ (D.I,73). භාවනා කරන විට දී බාධා ඇති කරන සිතුවිලි අනවශ්‍ය ලෙස ඇතුළු වීම භාවනාව දුර්වල කරයි. මෙය මැඩ පවත්වන ආකාර බොහොමයක් බුදුපියාණන් වහන්සේ විතක්කසණ්ඨාන සූත්‍රයේ නිර්දේශ කර ඇත. ඒ සිත කලඹන සිතුවිලි ඒවායේ ඇති දුර්විපාක සැලකිල්ලට ගනිමින්, ප්‍රතික්ෂේප කරමින් සහ බලයෙන් ඒවා කපා හරිමින්, මධ්‍යස්ථ සිතුවිලි ආදේශ කරමින් කළ යුතුය (M.I,119ff).

කෙසේ නමුත්, අප භාවනා නොකරන විට බාධා අපගේ හැසිරීම් වලින් වර්ධනය වේ. එම නිසා ඒවා සමග කටයුතු කළ යුතු හොඳම ක්‍රමය වන්නේ අපගේ ජීවන රටාවට වෙනස් කම් ගෙන ඒමයි. ශික්ෂාපද අනුගමනය කරමින්, හිතාමතාම අධික ලෙස ඉඳුරන් ප්‍රබෝධ නොකිරීමෙන්, තමන් තුළ නිශ්ශබ්දව ඉවසීම වඩමින් යන මේ සියල්ල භාවනාවට උපකාර විය හැකිය. බාධා පහ අඩු කළ විට ධ්‍යාන වැඩීමට මාර්ගය විවෘත වේ. බලන්න **මානසික කෙලෙස්, භාවනාවේ දියුණුව සහ නින්ද**

## හින්දු ධර්මය

හින්දු ධර්මය වචනයේ සුපුරුදු අර්ථයෙන් ආගමක් නොව, ඊට වඩා, ඉන්දියාවේ බ්‍රාහ්මණවාදයෙන් විකාශනය වූ ඇතැම් විට පුළුල් ලෙස වෙනස් වූ ආගමික සංකල්ප සහ පුරුදුවල එකතුවකි. බුදුදහම හින්දු ධර්මයේ ශාඛාවක් හෝ එය හින්දු ධර්මය තුළ ප්‍රතිසංස්කරණය වූ ව්‍යාපාරයක් ලෙස ආරම්භ වූ බව

ඇතැම් විට කියනු ලැබේ. මෙම කියමන් කිසිවක් නිවැරදි නොවේ. බුදුපියාණන් වහන්සේගේ කාලයේ හින්දු ධර්මය පැවතුණේ නැත. එය වර්තමාන ස්වරූපයට ක්‍රමයෙන් පත්වූයේ, 2වන හෝ තුන්වන ශතවර්ෂයෙන් පමණ පසුවයි. නමුත්, හින්දු ධර්මය බ්‍රාහ්මණවාදය සමග ව්‍යාකූල වූව ද, බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ ධර්මය දුටුවේ උන්වහන්සේගේ කාලයේ ආගමට වඩා වෙනස් හා විකල්පයක් ලෙස මිස, ප්‍රතිසංස්කරණයක් හෝ නැවත අර්ථකථනයක් නොවන බව බෞද්ධ ධර්ම ග්‍රන්ථවලින් තවමත් පැහැදිලිය.

ඔවුන් එකට ජීවත් වූ ශතවර්ෂ ගණනාව තුළ දී, සමහර අවස්ථාවල බෞද්ධ සහ හින්දු උගත්තු සහ දාර්ශනිකයෝ එකිනෙකාගේ අදහස් සහ පුරුදු පිළිබඳව බොහෝ සෙයින් විවේචනාත්මක වූහ. මේ දෙකම එකම හෝ සමාන නම් එසේ සිදුවන්නට ඉඩ නොතිබුණි. මෛත්‍රී උපනිෂද්වල මෙසේ සඳහන් වේ: 'සාවද්‍ය තර්ක, සැසඳීම් සහ අනුවර්තීවාදයෙන් ... ඇදහිලිවන්තයින්ගේ අවධානය රැවටිල්ලෙන් වෙනතකට යොමු කිරීමට කැමති අය සිටිති.' ව්‍යාජ සංසන්දයන් සහ ඔප්පු කිරීම් මගින් ආත්මය ප්‍රතික්ෂේප කරන ධර්මයක් (නෛරාත්ම්‍යවාද) මගින් ලෝකය වික්ෂිප්ත වී ඇත. එය වේදයන්ගේ ප්‍රඥාව සහ වෙනත් දැනුම... අතර වෙනස පැහැදිලිව දකින්නේ නැත. වේදය... වෙනුවට ධර්මයට අවධානය යොමු කළ යුතු බව සමහරු කියති. නමුත්, වේදයේ කියා ඇති දේ නිවැරදිය. බුද්ධිමතුන් ඔවුන්ගේ ජීවිත වේදය මත පාදක කළ යුතුයි.' මෙය බුදුදහමින් වේදය ප්‍රතික්ෂේප කිරීම සහ බෞද්ධයන්

තමන්ගේ අදහස් වලට සහාය පළ කිරීමට යොදා ගත් තර්කවලට පැහැදිලිවම කරන ලද බුදු දහමේ අනත්ත විවේචනය කිරීමකි. ප්‍රමේයමාලාවේ මෙසේ සඳහන් වේ: 'වේද තුනේ අඩංගු සත්‍යය කණාද ගේ අනුගාමිකයන්, බෞද්ධයන් සහ වෙනත් මිථ්‍යා ලබ්ධීන් විසින් විනාශ කරනු ලැබේ. මීට පෙර, එය විෂ්ණු ඔහුගේ ත්‍රිශූලයෙන් ආරක්ෂා කරන ලදී.' මේවා සහ පැරණි හින්දු සාහිත්‍යයෙහි බුදුදහම පිළිබඳ කර ඇති බොහෝ විවේචන එකක් හුදෙක් අනෙක් එකේ ප්‍රතිසංස්කරණයක් නම් හෝ දෙකම එක සමාන නම්, ඒවා අනවශ්‍ය හා අර්ථ විරහිත වන්නට ඇත. කෙසේ වෙතත්, දාර්ශනික මට්ටමින් මතභේද තිබියදීත්, පැරණි ඉන්දියාවේ බෞද්ධයන් සහ හින්දු භක්තිකයන් අතර තිබූ සබඳතා සාමාන්‍යයෙන් එකඟතාවයකින් යුක්ත වූ අතර, ඒ දෙකම ඉවසා දරා සිටින ආගම් බවට පත්විය. වර්තමානයේ හින්දු දහම ප්‍රධාන වශයෙන් ඉන්දියාවේ සහ නේපාලයේ සහ ෆිජී සිට එක්සත් රාජධානිය දක්වා ඉන්දියානු විදේශික ප්‍රජාවන් අතර ක්‍රියාත්මක වේ.

*The Origins and Development of Classical Hinduism*,A. L. Basham and K. G. Zysk, 1971.

## සමලිංගිකතාව

සමලිංගිකතාව යනු ප්‍රතිවිරුද්ධ ලිංගයට අයත් අයට වඩා එකම ලිංගයට අයත් අය කෙරෙහි ආකර්ෂණය වීමේ ප්‍රවණතාවයි. බෞද්ධ ධර්ම ග්‍රන්ථවල සමලිංගික පුරුෂයන් අසිත්තපණ්ඩක ලෙස ද අවිනිශ්චිත ස්ත්‍රීත්වයේ කාන්තාවන්ට (සම්භින්න) හෝ පිරිමි ගති ඇති ස්ත්‍රීන් (වෙපුරිසික්, Vin.II,271)

ලෙස ද හැඳින් වේ. අද පිරිමි සමලිංගිකයන් සමලිංගිකයන් ලෙස හඳුන්වන අතර, ගැහැණු සමලිංගිකයන් නාරි මෛථුනයේ යෙදෙන්නන් ලෙස හැඳින් වේ. පැරණි ඉන්දියානු අවබෝධයට අනුව, සමලිංගිකයන් හුදෙක් අස්වාභාවික, සම්මතයෙන් වෙනස් හෝ රෝගී අයට වඩා 'තුන්වන ස්වභාවය' සංස්කෘත බසින් ට්‍රතීය ප්‍රකෘති), *tṛtīya prakṛti* ලෙස සලකනු ලැබේ. මනෝ විද්‍යාව සහ හේතුඵලවාදය කෙරෙහි අවධාරණය කරමින්, බුදුදහම ලිංගික ක්‍රියා ඇතුළුව හැසිරීම් විනිශ්චය කරන්නේ ඔවුන් පිටුපස ඇති අභිප්‍රාය සහ ඒවායින් ඇති වන බලපෑම් අනුවය. ආදරය, අන්‍යෝන්‍යතාව සහ බෙදා හදා ගැනීමට ඇති ආශාව මගින් ඇති ලිංගික ක්‍රියාවකට සම්බන්ධ පුද්ගලයන් දෙදෙනාගේ ස්ත්‍රී පුරුෂ භාවය කුමක් වුවත්, ධනාත්මකව විනිශ්චය කරනු ලැබේ.

එමනිසා, සමලිංගිකතාව බුදුදහමේ අනාචාරයක් හෝ තුන්වන ශික්ෂාපදයට විරුද්ධ යැයි නොසැලකේ. සමලිංගිකයෙකු ඊනියා 'සමලිංගික සිදුවීමක' දුරාචාරාත්මක බව මඟහැර වෙනත් පුද්ගලයෙකු සමග ආදර සම්බන්ධයකට පිවිසෙන්නේ නම්, ඔහුට හෝ ඇයට අවංක බෞද්ධයෙකු වීමට සහ බොදු ජීවිතයක සියලු ආශීර්වාද භුක්ති විඳීමට නොහැකි වීමට කිසිම හේතුවක් නැත. සාම්ප්‍රදායික බෞද්ධ රටවල කිසිදු නීති සංග්‍රහයක් සමලිංගික සේවනය එයින්ම සාපරාධී ක්‍රියාවක් ලෙස නම් කර නැත. නමුත් සැබැවින්ම, සමලිංගික දූෂණය සහ බාලවයස්කරුවන් සමග සමලිංගික සේවනයට එරෙහිව විෂම ලිංගිකයන් විසින් කරන ලද සමාන වැරදි සඳහා දඬුවම් ලබා දී ඇත. වර්තමානයේ

බොහෝ බෞද්ධ රටවල සමලිංගික සේවනය සාමාන්‍යයෙන් අමුතු දෙයක් ලෙස සලකන නමුත්, එය දුෂ්ට හෝ පාපිෂ්ට දෙයක් නොවේ. තායිලන්තය, ලාඕසය, කාම්බෝජය, චීනය, වියට්නාමය, මොන්ගෝලියාව, ජපානය සහ දකුණු කොරියාවේ කැමැත්තක් ඇති වැඩිහිටියන් අතර සමලිංගික සේවනයට එරෙහි නීතී නැත. සමලිංගික සේවනය බුරුමයේ සහ ශ්‍රී ලංකාවේ නීති විරෝධීය. එයට හේතුව ඔවුන්ගේ නීතිවලින් කොටසක් සකස් කර ඇත්තේ යටත් විජිත යුගයේ නිසාය. මෑතදී ශ්‍රී ලංකාවේ සමලිංගික සේවය සඳහා වන දඬුවම රට තුළ වර්ධනය වන ලිංගික සංචාරක ගැටලුවට නොමනාපයෙන් සලකන ප්‍රතිචාරයක් ලෙස වැඩි කරන ලදී. බලන්න **එකම ලිංගික විවාහ සහ ලිංගික හැසිරීම**

'Homosexuality and Theravada Buddhism.'*The Buddhist's Encyclopedia of Buddhism*, 2001.

## මී පැණි

මී පැණි (මධු) යනු මී මැස්සන් විසින් නිපදවනු ලබන පැණි රසැති, ඇලෙනසුලු දියරයකි. එය සීනි, පලතුරුවල ඇති සීනි, ග්ලූකෝස්, කාබනික අම්ල, විටමින්, ඛනිජ සහ ජලය යන සංකීර්ණ මිශ්‍රණයකින් සමන්විතය. මී පැණි අත්‍යවශ්‍ය ඖෂධ වර්ග පහෙන් එකක් ලෙස බුදුපියාණන් වහන්සේ සැලකූ සේක. (Vin.III,251) එයට ජලය උරා ගන්නට ඇති හැකියාව නිසා, අදටත් එය ලෙඩ සුවකිරීමේ සහ ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමේ කාරකයක් වශයෙන් භාවිත කෙරේ. පැරණි ඉන්දියාවේ මී පැණි වර්ග බොහොමයක් හඳුනාගෙන ඇත. 'බුදුපියාණන් වහන්සේ 'පැහැදිලි සහ පැණි රස' (A.III,369) යැයි

විස්තර කළ බුද්ද නිපදවනු ලැබුවේ ලිට්ල් බී (අපිස් ෆොලොරියා) භාවිත කරමිනි. වඩා ඝනවත් සහ තද පැහැ මී පැණි (අපිස් ඩොර්සත) නිපදවනු ලැබුවේ රොක් බී භාවිත කරමින් වන අතර, එය පාළියෙන් හමර ලෙස හැඳින් වේ (D.III,188; Dhp.49). පුරා වෘත්තයට අනුව, බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වයට මොහොතකට පෙර, සුජාතා නම් තරුණියක් උන්වහන්සේට කිරිබත් සහ මී පැණි බඳුනක් පිරිනැමූ අතර, එය උන්වහන්සේගේ අවසාන පරිශ්‍රමයට ශක්තියක් ලබා දුන්නේය. බුදුපියාණන් වහන්සේට බුද්ධත්වය ලැබීමෙන් පසු පළමු ආහාරය වූයේ තපස්සු සහ භල්ලික යන වෙළෙඳුන් උන්වහන්සේට පිළිගන්වන ලද බාර්ලි කැඳ සහ මී පැණි බෝල බව ත්‍රිපිටකයේ සඳහන් වේ (Vin.I,4).

මෙම හේතූන් නිසා බොහෝ කාලයක් තිස්සේ බෞද්ධයෝ මී පැණි විශේෂයෙන් 'මංගල ආහාරයක්' ලෙස සලකති. කෙනෙකුගේ වචනය 'නිර්දෝෂී, ප්‍රසන්න, කනට ප්‍රිය, එකඟ විය හැකි, හදවතට යන, විනීත, ප්‍රියමනාප සහ සෑම කෙනෙකු විසින් කැමැති' නම් එම තැනැත්තා 'මී පැණි සහිත දිවක් ඇත්තෙකු' ලෙස නිවැරදිව හැඳින්විය හැකි බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.I,128). ගිහි ශ්‍රාවකයෙකු තම ජීවානෝපාය මී මැස්සෙකු මී පැණි එකතු කරන ආකාරයට (D.II,188), එනම් වෙහෙස මහන්සිවී වැඩ කිරීමෙන් සහ තමන්ගේ ආදායම් මාර්ගයට හානි නොකරමින් උපයා ගත යුතු බව ද උන්වහන්සේ පැවසූහ (Dhp.49). මී මැස්සන් උන්ගේ වදයෙන් දුම් පිට කරන විට මී මැස්සන් මරන මිනිසුන් තමන්ටම ඍණාත්මක කර්ම නිර්මාණය කරන බව

මහාවස්තුවේ සඳහන් වේ. එය බුදුදහමේ සියලු ජීවීන් කෙරෙහි දක්වන සාමාන්‍ය සැලකිල්ලට අනුකූල මතයකි. බලන්න **බුදුපියාණන් වහන්සේගේ පළමු ශ්‍රාවකයන්**

## ආගන්තුක සත්කාරය

ආගන්තුක සත්කාරය (සක්කාර) යනු අමුත්තන්, ආගන්තුකයන් සහ සංචාරකයන් පිළිගැනීම සහ උපකාර කිරීමය. පැරණි ලෝකය පුරාම, අවම වශයෙන් තමන්ගේම ගෝත්‍රයක හෝ ආගමක සාමාජිකයන් කෙරෙහි ආගන්තුක සත්කාරය ඉතා ගෞරවයෙන් යුතුව පැවත්වුණි. ඉන්දියාවේ පැවති කුල ක්‍රමයේ චෝදනාත්මක විවේචන මගින් ආගන්තුක සත්කාරය යම් ප්‍රමාණයකට සීමා විය. උදාහරණයක් වශයෙන්, වඩාත් වැදගත් හින්දු නීති ග්‍රන්ථය වන මනුස්මෘතියේ සඳහන් වන්නේ බ්‍රාහ්මණයෙකු ආගන්තුක සත්කාරය පිරිනැමිය යුත්තේ වෙනත් බ්‍රාහ්මණවරුන්ට පමණක් බවත්, පොදුවේ පිළි නොගත් නිකායවල භික්ෂූන් වහන්සේලාට හෝ ශ්‍රමණයන්ට ආචාර කිරීම හෝ ආචාර කිරීම්වලට ප්‍රතිචාර නොදැක්විය යුතු බවත්ය. නමුත් වඩා විවෘත මනසින් යුක්ත බ්‍රාහ්මණයෝ සැමවිටම මේ අදහස සමඟ එකඟ නොවූහ (D.I,117).

බුදුපියාණන් වහන්සේ පඤ්චසාලා නම් බ්‍රාහ්මණ ගම්මානයේ පිණ්ඩපාතයේ වැඩි විට, එහි වැසියන් උන්වහන්සේට කිසිවක් දීමට අකමැති වූ අතර, උන්වහන්සේ පැමිණෙන විට 'හිස්ව තිබූ පාත්‍රය' එලෙසින්ම පිටව යන විට ද එසේ තිබුණි. ඒ, එවැනි අදහස් නිසාම විය හැකිය (S.I,114). බුදුපියාණන්

වහන්සේට අනුව, පුද්ගලයන්ගේ කුලය, ආගමික බැඳීම හෝ තත්ත්වය කුමක් වුවත්, ආගන්තුක සත්කාරය සැමට පෙන්විය යුතුයි. වේසාලියේ ප්‍රමුඛ පුරවැසියෙකු සහ ජෛන ආගමේ ත්‍යාගශීලී ආධාරකරුවෙකු වූ සීහ බෞද්ධයෙකු බවට පත් වූ විට, දානය සඳහා තම නිවසට පැමිණිය හැකි ජෛන භික්ෂූන් වහන්සේලාට නොකඩවා ආගන්තුක සත්කාර කරන මෙන් බුදුපියාණන් වහන්සේ ඉල්ලා සිටියහ (A.IV,185).

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේ බැහැ දැකීමට පැමිණෙන සෑම දෙනාම 'පිළිගනිමින්, මිත්‍රශීලීව, ආචාරශීලීව, ප්‍රසන්න ලෙස සහ සිත්ගන්නාසුලු ආකාරයෙන්' සිටි බව ත්‍රිපිටකයේ බොහෝ ස්ථානවල සඳහන්ව ඇත (D.I,116).

ගිහියෙකුගේ එක් කාර්යභාරයක් වන්නේ පස් ආකාර පූජා සිදු කිරීමයි. ඒ අමුත්තන්ට ආහාර ලබා දීම, නවාතැන් සැපයීම සහ අමුත්තන්ට උපකාර කිරීමයි. භික්ෂුවක් (A.II,68) ආශ්‍රමයකට පැමිණි විට, නේවාසික භික්ෂූන් ඔහු වෙත ගොස් පිළිගෙන, ආසනයක් සූදානම් කිරීම. පා ධෝවනය කිරීම, නවාතැන් සූදානම් කිරීම සහ පිළිගැනීමේ හැඟීම ලබා දීමට අවශ්‍ය වෙනත් දේ සූදානම් කිරීමයි (Vin.II,207-11). සියලු ආහාර අනුභව කිරීමෙන් පසු අමුත්තෙකු පුද්ගලයෙකුගේ නිවසට පැමිණියහොත්, ඔහුගේ කුසගින්න නිවීම සඳහා තවත් බත් පිසිය යුතු බව මිලින්දපඤ්හයේ සඳහන් වේ (Mil.107). ආගන්තුක සත්කාරයට පෙරළා ප්‍රතිචාර නොදැක්වීම ඉතා නරක ස්වභාවයක් බව බුදුපියාණන් වහන්සේ සැලකුහ. උන්වහන්සේ මෙසේ පැවසූහ 'යම්කෙනෙකු වෙනත්

කෙනෙකුගේ නිවසට ගොස් ආහාර වේලක් ලැබුවේ නම්, ඔවුන් ද තමන්ගේ නිවසට පැමිණි විට එසේ නොකළොත්, ඔහු නෙරපූ කෙනෙකු ලෙස සලකන්න' (Sn.128). ජාතක කතාවේ මෙසේ සඳහන් වේ: 'එක් රැයකට හෝ වෙනත් කෙනෙකුගේ නිවසේ පහන් කර, ආහාර පාන ලබා ඇත්නම්, ඔහු කෙරෙහි නපුරු සිත් ඇති කර නොගන්න. එසේ කළහොත්, එය දිගුකළ අතක් පුළුස්සා දැමීමක් වේ. හොඳ මිතුරෙකු පාවා දීමක් වේ' (Ja.VI,310).

වර්තමානයේ හෝටල් සහ වේගවත් ප්‍රවාහනය නිසා, අතීතයේ දී සිදු වූ ආකාරයට සංචාරකයන්ට ආගන්තුක සේවාව සැපයීම එතරම් අදාළ හෝ අවශ්‍ය නොවේ. කෙසේ නමුත්, ආගන්තුක සත්කාර දැක්වීමට තවත් බොහෝ අවස්ථා ඇත. බෞද්ධ කණ්ඩායමකට, වැඩබිමකට හෝ වටාපිටාවකට අලුතෙන් පැමිණෙන අයට බොහෝ විට නුහුරු හෝ අවිනිශ්චිත බවක් ඇති වේ. එවැනි අය ආදරයෙන් පිළිගැනීම, නිවසේ සිටින්නා සේ පරිසරයක් ඔවුන්ට ඇති කිරීම සහ අනෙක් අයට ඔවුන් හඳුන්වා දීම යනාදිය කරුණාව ප්‍රකාශ කිරීමකි.

මෑතක් වන තුරුම බෞද්ධ ලෝකයේ බහුලව දක්නට ලැබෙන වක්‍රාකාර ආගන්තුක සත්කාරය සංචාරකයන් සහ වන්දනාකරුවන්ට කෑම බීම සපයා ඇත. ගම් හෝ නගර හෝ මාර්ග ඔස්සේ ගම් අතර දීර්ඝ දුරක් ඇති ප්‍රදේශවල මිනිසුන් විවේක නිවාස ඉදිකරනු ඇත. අනෙකුත් බැතිමත් පිරිස් කෑම පිසීම සඳහා දර සැපයීම, පානය කිරීම සඳහා ජලය සැපයීම, සහ නවාතැන් පිරිසිදු කිරීම සඳහා කටයුතු කරනු ඇත. ගස් සිටුවීම (බොහෝ විට මාර්ග දිගේ), පාලම්

තැනීම, ළිං හැරීම, තානායම් ඉදිකිරීම සහ මගීන්ට ජලය සැපයීම යන මේ සියල්ලම පුණ්‍ය ක්‍රියා බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (S.I,33).

බෞද්ධ දාර්ශනිකයෙකු වූ නාගාර්ජුන ඔහුගේ රත්නාවලීයේ ඔහුගේ රාජකීය වාර්තාකරුට 'වන්දනා ස්ථාන, නගර සහ පුරවරවල ගිමන් හල් පිහිටුවා, පාළු මාර්ගවල ජලය පිරවූ කළ තබන ලෙස' ආයාචනය කළේය. මෙම අවසාන පුරුද්ද බුරුමයේ තවමත් ජනප්‍රිය වේ. ජලය පරිත්‍යාග කරන්නන්ගේ සමිති (වයිනයි ය ථුබ) යනුවෙන් හඳුන්වන මිතුරු කණ්ඩායම් විසින් සාදන අතර ඔවුහු මගීන්ගේ පහසුව සඳහා මාර්ග ඔස්සේ ජල භාජන තැබීමට කටයුතු කරති. එවැනි ජල ශාලා පිළිබඳව (පානීයසාලා) බෞද්ධ ධර්ම ග්‍රන්ථවල සඳහන් වී ඇත (Vin.II,153). බලන්න **මන්ත්‍ර**

## ගෘහස්ථ ජීවිතය

ගෘහස්ථ ජීවිතය (ඝරාවාස) යනුවෙන් හඳුන්වන්නේ කලත්‍රයා සහ දරුවන් සමග නිවසක ජීවත්වීම සහ තමන් සහ ඔවුන්ගේ ජීවත්වීම සඳහා කටයුතු කිරීමයි. ත්‍රිපිටකය පුරාම ගෘහස්ථ ජීවිතය සහ භික්ෂු භික්ෂුණීන්ගේ ජීවිත අතර තියුණු වෙනසක් දක්නට ලැබේ. පළමුවැන්න 'දූවිලි සහිත සහ සීමා සහිත' (රජාපථ) ලෙස විස්තර කරන අතර, දෙවැන්න 'සුළඟ මෙන් නිදහස්' (අබ්භොකාස D.I,63) යැයි කියනු ලැබේ. කෙසේ වෙතත්, මෙය ඉතා සරල සාමාන්‍යකරණයක් විය හැකිය. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී භික්ෂූන් සහ භික්ෂුණීන්ට විශාල නිදහසක් තිබුණි. නමුත් ඔවුන්ගේ ජීවිත

දුෂ්කර සහ අනාරක්ෂිත විය. බොහෝ අයට ස්ථීර වාසස්ථාන නොතිබුණ අතර, 'සීතල සහ උණුසුම, කුසගින්න සහ පිපාසය, හෝ හපුටන් සහ මදුරුවන් දෂ්ට කිරීම, සුළඟ, හිරු රශ්මිය සහ බඩගෑම සහ දණගෑම' යනාදියද ඉවසා දරා සිටින්නට සිදු විය (M.I,10). විනයෙහි සඳහන් වී ඇති බොහෝ සිදුවීම්වලින් පෙනී යන්නේ විහාරස්ථාන පවා පෞද්ගලික ආතතීන්, ඊර්ෂ්‍යාවන් සහ එකඟ නොවීම්වලින් නිදහස් නොවූ බවයි. සමහර විට මුළුමනින්ම බරපතල ඒවා ද විය (M.I,321). ඊට හාත්පසින්ම වෙනස්ව, ගෘහස්ථ පුද්ගලයෙකුට 'කුරිංචි-වහලක් සහිත නිවසක්, ඇතුළත සහ පිටත හොඳින් කපරාරු කරන ලද, ආරක්ෂිත දොරවල්, ජනේල සහිත, වූල් වැස්මක් අතුරන ලද කවිච්චියකින් යුක්ත බඩුමුට්ටු, සුදු කවරයක්, එම්බ්‍රෝයිඩර් කරන ලද බිලැන්කට්ටු, මිල අධික මුව හමක්, ඉහළින් උඩුවියනක් සහ හතර කොණේම තද රතු පැහැ කොට්ට, ඊට එහා දැල්වෙන පහනක් සහ සිත් වශී කරන භාර්යාවන් දෙදෙනෙකු ඔහුට උපස්ථාන කිරීමට සිටිනු ඇත'(A.I,137). එවැනි ගෘහස්ථ සුවපහසුව සහ උණුසුම් බව තිබියදීත්, සාමාන්‍ය පුද්ගලයාගේ ජීවිතයට ද එහි අඩුපාඩු තිබේ. පැරණි ඉන්දියානු සමාජ ව්‍යූහයෙන් අදහස් කළේ නිවස තුළ සෑමවිටම තම දෙමාපියන්ට සහ සමාජයේ කුල ක්‍රමයේ හිරකරන ඉල්ලීම්වලට යටත් වන බවයි. කාන්තාවන්ගේ තත්ත්වය වඩාත් නරක විය. ඇය නැන්දම්මාට සහ ස්වාමිපුරුෂයාට සම්පූර්ණයෙන්ම ණය ගැතිවිය. උපත් පාලනය නොපැවති නිසා හෝ විශ්වාස කළ නොහැකි නිසා ගැබ් ගැනීම් රාශියක් විඳ දරා ගැනීමට සිදුවිය. පෘථුල පවුලක ඉහළ චිත්තවේගී සැනසිල්ලක් සහ සහායක් ලැබුණි. නමුත්,

පුද්ගලාන්තර ගැටුම් ඇති කළ හැකි අතර, පුද්ගලභාවය සහ පෞද්ගලික භාවය අපකීර්තියට පත්විය හැකිය. මෙම හා වෙනත් දුෂ්කරතා එතකුදු වුවත්, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ගිහි ශ්‍රාවකයන්ට උපදෙස් දුන්නේ 'ඔබ ඔබේ ව්‍යාපාරය කරගෙන යන විට, දරුවන් පිරිවරාගෙන නිවසේ වාසය කරන විට, භාවනාව පුරුදු කරන ලෙසයි' (A.V,333). සමහර ගිහියන් රහත්ඵලයට පැමිණි අතර, දහස් ගණන් අනෙක් අය රහත්ඵලය තෙක් ඇති අවස්ථාවන්ට පත් වූහ (M.I,491-92).

එබැවින් ක්‍රි. පූ. 5වන සියවසේ ගෘහස්ථ ජීවිතය පැවිදි ජීවිතයට වඩා සමහර විට ආධ්‍යාත්මික සොයා යෑමට හිතකර විය. නමුත් එතැන් සිට සමාජය සහ පවුල් ජීවිතය සැසඳීමෙන් ඔබ්බට වෙනස් වී ඇත. අද අවම වශයෙන් බටහිර රටවල, ගෘහස්ථ ජීවිතය (විවාහක හෝ අවිවාහක හෝ වේවා) සමහර විට ඉතිහාසයේ වෙන කවරදාටත් වඩා වැඩි නිදහසක්, පෞද්ගලිකත්වයක්, අමතර කාලයක් සහ ඉගෙනීමට සහ පුහුණු වීමට අවස්ථාව ලබාදෙයි. තත්ත්වය එසේ වුවද, ධර්මය නිවැසියන්ට සම්පූර්ණයෙන්ම පිළිපැදිය නොහැක යන අදහස තවදුරටත් වලංගු නොවේ. එසේම බුදුපියාණන් වහන්සේගේ කාලයේ සිට ගෘහස්ථ ජීවිතය වෙනස් වී ඇත්නම්, පැවිදි ජීවිතය ඊටත් වඩා වෙනස් වී ඇත. අද සාමාන්‍ය භික්ෂුවකගේ බොහෝ කාලයක් භික්ෂුත්වයේ වගකීමට අදාළ යුතුකම් වටා කේන්ද්‍රීය වේ. ආශීර්වාද උත්සව, ධර්ම දේශනා පිළියෙල කිරීම සහ දේශනා කිරීම, අවමංගල්‍ය කටයුතු පැවැත්වීම, අවිධිමත් උපදේශනය, භික්ෂූන්ගේ විභාග සඳහා පාඩම් කිරීම,

විවිධ උත්සවවලට සහභාගී වීම යනාදියයි. සාමාන්‍ය ආශ්‍රමාධිපති ආශ්‍රමය පවත්වා ගෙන යාමට සහ අලුත්වැඩියා කිරීමට සහ ඊළඟ මාසයේ විදුලි බිල්පත ගෙවීමට මුදල් සොයා ගැනීමට ඔහුගේ කාලයෙන් බොහෝ වේලාවක් වැය කරයි. සමහර අයට ආධ්‍යාත්මික වැඩි දියුණුව සඳහා ඇති ලොකුම බාධාව නම් ඔවුන් භික්ෂුවක් හෝ භික්ෂුණියක් නොවුවහොත් ඔවුන්ට ආධ්‍යාත්මික වශයෙන් දියුණු විය නොහැකිය යන මතයක් දැඩිව දැරීමයි; එය ධර්මය වඩා සම්පූර්ණයෙන් පුහුණුව සඳහා උත්සාහ කිරීම පවා වළක්වන ආකල්පයකි. යථාර්ථවාදීව, පැවිදි ජීවිතය මෙන්ම ගෘහස්ථ ජීවිතය ද ආධ්‍යාත්මික අවස්ථාවන්ගෙන් පොහොසත්ය. 'නමුත්, ලිංගිකත්වය ගැන කුමක් කිව හැකි ද?', දරුවන් ඇති දැඩි කිරීමේ දුෂ්කරතා ගැන කුමක් කිව හැකි ද?', සමහරු අසනු ඇත. ලිංගික ආශාව ආධ්‍යාත්මික ජීවිතයට බාධාවකි. නමුත් යම් කෙනෙකු කහ සිවුරක් පොරවා ගත් පමණින් මෙම ආශාව අනිවාර්යයෙන්ම පහව යන්නේ නැත. බ්‍රහ්මචාරීව සිටීමෙන් සහ භාවනාවට කැපවී සිටියද, සමහර භික්ෂූහු ඔවුන්ගේ සියලු ජීවිත කාලයේදීම, ලිංගික ආශාවන් සමග පොරබදති. ඒ හා සමානවම, බොහෝ නිවැසියන්ට ඔවුන්ගේ විවාහයේ මුල් අවධියේදී ලිංගිකත්වය වැදගත් වන නමුත්, සමහර අයට කාලයත් සමග එය අඩු වේ. තවද, සමහර අවිවාහක අය සමහර විවාහක අය පවා, සහතික වීමකින් තොරව බ්‍රහ්මචාරී වේ. දරුවන් හදා වඩා ගැනීම දුෂ්කර සහ කාලය වැය වන වැඩක් යන්න සත්‍යයකි. නමුත් දරුවන් සමග ජීවත්වීම සහකරුවෙකු සමග ජීවත්වීම, සමහර ඉතා වැදගත් ආධ්‍යාත්මික ගුණවගාවන්ට අවස්ථාවන් ලබාදෙන බවත් ඒ හා සමානවම සත්‍යයකි. මවක හෝ පියෙකු

සහ සහකරුවෙකු වීම සඳහා බොහෝ විට කෙනෙකුට අනෙක් අය වෙනුවෙන් ඇති පැතුම් පසෙකට දැමීමට හෝ කල් තැබීමට සිදු වේ. මෙම කාරණය පිළිගැනීම සහ අත්හැරීම වැඩිදියුණු කිරීමට උපකාර විය හැකිය. ඒ සඳහා ඉවසීම, පරිත්‍යාගශීලීත්වය, සමාවදීම සහ ආත්ම පරිත්‍යාගය අවශ්‍ය වේ. දරුවන් සහ සහකරුවන්ට කෙනෙකු සමහර විට ආශ්‍රමවල නැති මානසික සුභසිද්ධියට ඉතා අවශ්‍ය ආදරය, මිත්‍රත්වය, මෘදුබව සහ චිත්තවේගී ආධාරය ලබා දෙමින් පෝෂණය කළ හැකිය.

අවසානයේ, මිනිසුන් අතර වෙන්කොට හඳුනා ගැනීමක් සිදු කළ යුතු නම්, එය ඔවුන්ගේ ඇඳුම්වල වර්ණය මත නොව, මනසේ ගුණාංග මත පදනම් විය යුතුයි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'පිරිසිදුව සැරසිය යුතු නමුත්, යම් කෙනෙකු සන්සුන්, හික්මීමෙන් යුතු, පූජනීය ජීවිතයකට කැපවී තිබෙනම්, සහ සියලු සතුන් කෙරෙහි හානි කිරීමෙන් වැළකී ඇත්නම්, ඔහු සැබෑ තවුසෙකි, සැබෑ බ්‍රාහ්මණයෙකි, සැබෑ භික්ෂුවකි' (Dhp.142). පෙරදී තවුසෙකු වූ රොහිතස්ස තමා 'ලෝකයේ අවසානය' ඒ නිර්වාණයට යමින් සොයන්නට උත්සාහ කළ බවත්, නමුත් කිසිසේත් සාර්ථක නොවූ බවත්, වරක් බුදුපියාණන් වහන්සේට පැවසුවේය. එයට හේතුව පැහැදිලි කරමින්, 'ලෝකයේ අවසානය' යම් තැනකට යමින් සොයා ගත නොහැකි බවත්, නමුත් අභ්‍යන්තරය කෙරෙහි බලමින් එය කළ යුතු බවත් බුදුපියාණන් වහන්සේ පැවසූහ (S.I,62). ඔබ නිවසක හෝ ආශ්‍රමයක ජීවත් වුවත්, ඔබ නිල් වර්ණ

කලිසමක් හෝ කහ වර්ණ සිවුරක් ඇන්දත්, ඔබට ඔබගේ අභ්‍යන්තරය කෙරෙහි බැලිය හැකිය. බලන්න **උපාසක උපාසිකා**

## මිනිස් - සත්ත්ව අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය

බොහෝ ආගම්වල ජනප්‍රවාද, ජන කතා සහ සාන්තුවරුන්ගේ ජනප්‍රවාදවල ශාන්තුවරයන් හෝ මුණිවරයන් සතුන් සමග අන්‍යෝන්‍යව ක්‍රියා කළ කතන්දර, සමහර විට එකිනෙකා සමග කථාකරන තරමට දේ ඇතුළත් වේ. ශාන්ත ජෙරම් සහ සිංහයා, ශාන්ත අන්තෝනි සහ කපුටා, සහ ශාන්ත ෆ්‍රැන්සිස් සහ ඔහුගේ කුරුළු ශ්‍රාවකයන් බටහිර පරම්පරාවෙන් එන මත හොඳින් දන්නා කතන්දර වේ. එවැනි බොහෝ කතන්දරවල සමහර විට ඒවායේ ප්‍රභවයන් සතුන් පිළිබඳව ඇත්තේ බොළඳ අවබෝධයකි; නමුත්, අනෙක් ඒවා පදනම් වී ඇත්තේ අඩුම තරමින් යම් අත්දැකීමක් මත විය හැකිය. සමහර ඉහළ සත්ත්වයන් කෘතඥපූර්වක බව, ආදරය, පක්ෂපාතීත්වය, සහ අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය වැනි ගතිලක්ෂණවල මූලයන් පෙන්වන බවට දැනගන්නට ඇත. එසේම සමහර සත්ත්වයන්ට මිනිසුන්ගේ යම් චිත්තවේගයන් හඳුනා ගත හැකිය. විශේෂයෙන්ම ආදරය සහ බිය, වැනි ප්‍රබල ඒවා හඳුනා ගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීම කළ හැකිය. ශාන්තුවරයන් සහ තවුසන් බොහෝ විට ජීවත් වූයේ වනජීවීන් ක්‍රමයෙන් ඔවුන්ගේ පැවැත්මට පුරුදු වී ඔවුන් කෙරෙහි ඇති බිය නැති කර ගන්නා ජනශූන්‍ය ප්‍රදේශවලය. ආගන්තුකයන් මෙය දැක තාපසයන් සහ සතුන් එකිනෙකා කෙරෙහි යම් ආකාරයක සම්බන්ධයන් ගොඩනඟාගෙන ඇති බව

උපකල්පනය කරන්නට ඇත.

මිනිසුන් සතුන් සමග විවිධ ආකාරයෙන්, ඔවුන් සමග කතාකරමින් ද අන්‍යෝන්‍යව ක්‍රියා කිරීම පිළිබඳ විවිධ කතන්දර ජාතක කතාවේ ඇත. ත්‍රිපිටකයේ ද එවැනි බොහෝ කතන්දර ඇතුළත්ව ඇත. වරක් සැරියුත් මහරහතන් වහන්සේ රෝගී වූ විට, උන්වහන්සේට ඖෂධ ලබා දීමට මුගලන් රහතන් වහන්සේ භාර ගත්හ. ඒ නෙළුම් දඬුයි. උන්වහන්සේ විශාල නෙළුම් පොකුණක් වෙත ගියහ. එක් ඇතෙකු උන්වහන්සේ දැක තමන්ට උපකාරයක් කළ හැකි දැයි විමසුවේය. අවශ්‍ය දේ පැවසූ විට එම ඇතා තවත් ඇතෙකුට එය ලබා දෙන ලෙස උපදෙස් දුන්නේය. දෙවන ඇතා නෙළුම් දඬු හොඬවැල පුරා උදුරා, මඩ සෝදා, එකට මිටියක් බැඳ මුගලන් හිමියන්ට දුන්නේය (Vin.I,214). මිනිසුන්ට කරන ලද සත්ත්ව උපකාර පිළිබඳ තවත් කථාවක් උදානයේ සඳහන්ව ඇත. කලහකාරී භික්ෂූන් කෙරෙහි පිළිකුල් උපදවාගත් බුදුපියාණන් වහන්සේ කොසඹෑව අත්හැර ලඟපාත වනයකට වැඩියහ. උන්වහන්සේ සල් ගසක් යට දින ස්වල්පයක් ගත කළහ. වනයේ සිටි ඇතෙක් බුදුපියාණන් වහන්සේ වටා තණකොළ කපා ඉවත් කර, හොඬවැලෙන් ජලය ගෙන ආවේය (Ud.41-2). එක් වඳුරෙකු උන්වහන්සේට වැළඳීමට පලතුරු ගෙන ආ බවත් පැරණි අටුවාවල සඳහන් වේ (Dhp-a.59). කලින් සඳහන් කළ කථාව මෙන්ම මෙම කථාවද සත්ත්වයන්ගේ කරුණාවන්ත වීම සහ උපකාරවීම පිළිබඳවය. නමුත් එය උත්තරීතර සත්ත්වයන් - උතුම් ඇතුන් සහ රහත්ඵලයට පත් මුණිවරයන්ගේ - නිශ්ශබ්දතාව සහ හුදෙකලාව පිළිබඳ අදහස ගැන පොදු ඇගයීමක් ද එකතු කරයි.

වරක් එක් භික්ෂුවක් ඔහුට අහල පහල කුරුල්ලන් විශාල රංචුවකගේ ලැගීමෙන් බාධා ඇතිවන බව බුදුපියාණන් වහන්සේට පැවසුවේය. එම කුරුල්ලන් වෙත රාත්‍රියක තුන් හතර වතාවක් ගොස් පිහාටුවක් ඉල්ලන ලෙස බුදුපියාණන් වහන්සේ ඔහුට උපදෙස් දුන්හ. නොබෝ දිනකින් මෙම නිරන්තර ඉල්ලීම නිසා එපාවී වෙනත් තැනකට කුරුල්ලන් යනු ඇති බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. භික්ෂුව අවවාදයට අනුව කටයුතු කළ අතර, නිසැකවම කුරුල්ලෝ වෙන තැනකට පිටවූහ (Vin.III,147). බුදුපියාණන් වහන්සේ සැමවිටම ගිහියන්ගෙන් දේවල් නොඉල්ලන ලෙස භික්ෂූන්ට අනතුරු ඇඟවීම සඳහා මෙම සිද්ධිය භාවිත කළහ.

මිනිස් කරුණාවට සහ ආදරයට සතුන් ප්‍රතිචාර දක්වනු ඇතැයි යන උපකල්පනය මත පදනම් වූ කථා බෞද්ධ සම්ප්‍රදායේ බහුලව දක්නට ලැබේ. මේවායින් වඩාත් ප්‍රසිද්ධ වන්නේ බුදුපියාණන් වහන්සේ සහ නාලාගිරි සිද්ධියයි. වරක් උන්වහන්සේගේ දුෂ්ට ඥාති සහෝදර දේවදත්ත බුදුපියාණන් වහන්සේ ඝාතනය කිරීමට කරන ලද උත්සාහයකදී, භයානක ඇතෙකු වූ නාලාගිරි මහ මඟට මුදා හැරීමට කටයුතු කළේය. වලිගය කෙළින් කර හොරණෑ හඬ දෙමින්, ඇතා බුදුපියාණන් වහන්සේ වෙත පහර දීමට සැරසෙන විට, බුදුපියාණන් වහන්සේ කෝපාවිෂ්ට සත්ත්වයා දකිමින් ඇතාට මෛත්‍රිය පැතිර වූහ. ඇතා හදිසියේම කෝපයෙන් නිහතමානී බවට පරිවර්තනය විය. ඇතා බුදුපියාණන් වහන්සේ වෙතට ළඟා වී උන්වහන්සේගේ සිරස පිරිමැද්දේය (Vin.II,195). බලන්න

## සුරතල් සතුන්

## මිනිස් ස්වභාවය

ස්වභාවය (ධම්මතා හෝ පකති) යන වචනයට බොහෝ අර්ථ ඇත. නමුත් යම් දෙයක මූලික ස්වභාවය යන අර්ථයෙන් භාවිත කළ හැකිය. ඉංග්‍රීසි වචනය පැමිණෙන්නේ 'ඉපදුණු' යන අර්ථයෙන් යුක්ත ලතින් භාෂාවේ නේටස් යන වචනයෙනි. 'මිනිස් ස්වභාවය' යන පදයෙන්, මිනිසුන්ගේ උපන් හෝ සහජ චරිතය යන්න සඳහන් කෙරේ. ආගමික චින්තකයන් සහ දාර්ශනිකයන් මිනිස් ස්වභාවය යහපත් ද අයහපත් ද යන ප්‍රශ්නය පිළිබඳව දිගු කාලයක් තිස්සේ සිතා බලා ඇත. කොන්ෆියුෂියානු ධර්මය අඟවා ඇත්තේ මිනිසුන් සත්තකින්ම යහපත් බවයි. මෙන්සියස් නමැති චීන දාර්ශනිකයා මෙම අදහස ඔහුගේ ඉගැන්වීම්වලින් විස්තර කර ඇත. එය කොන්ෆියුෂියානු ධර්මයේ කාලයෙන් කාලයට ඉදිරියටම පිළිගන්නා ලදී. ක්‍රිස්තියානි ධර්මයේ ජම්ම පාපය යනුවෙන් ස්ථිරව අවධාරණය කරන්නේ ආදම් සහ ඒවගෙන් උරුමයෙන් ලැබීම හේතු කරගෙන මිනිසුන් ඉපදෙන්නේ පවට සහ නපුරට නැඹුරුව බවයි. ක්‍රිස්තියානි ධර්මයේ මෙය හඳුන්වන්නේ සම්පූර්ණ කුරිරුකම ලෙසයි. ඔගස්ටින්, ඇක්වයිනාස්, ලූතර්, කල්වින් සහ ජෝන් වෙස්ලි වැනි දේවධර්මාචාර්යයන් නිගමනය කළේ මිනිසුන්ට යහපත් දේ කිරීමට හැකියාවක් නැති බවත්, ගැලවීම ලබන්නේ දිව්‍ය අනුග්‍රහයෙන් හා දයාවෙන් බවත්ය. මිනිසා අත්‍යවශ්‍යයෙන්ම හොඳ ද නරක ද යන ප්‍රශ්නයට බුදුපියාණන් වහන්සේ කිසි දිනක සෘජුව

ආමන්ත්‍රණය කළේ නැත. කෙසේ නමුත්, ඔවුන්ට යහපත කිරීමට හැකියාව ඇති බවත්, පෙර කී ලෙස නිවැරදි අවස්ථාවේදී ඔවුන්ට සත්පුරුෂ බව කෙරෙහි ප්‍රවණතාව ඇති වන බවත් බුදුපියාණන් වහන්සේ ඇඟවූහ.

'යහපත දියුණු කරන්න. එය කළ හැකිය. එය නොහැකි නම්, මම ඔබට එය කිරීමට නොපොළඹවමි. නමුත්, එය කළ හැකි නිසා, මම ඔබට කියමි "යහපත දියුණු කරන්න! '' යහපත දියුණු කිරීමෙන් ඔබට පාඩුවක් සහ දුකක් ඇති වේ නම් මම ඔබට එය කිරීමට නොපොළඹවමි. නමුත් එය ඔබගේ සුභසිද්ධිය සහ සතුටට උපකාර වන නිසා, මම ඔබට "යහපත දියුණු කරන්න!'' යැයි කියමි' (A.I,58). තමන් සතුටට පත් කරන්නට හේතුවන දේ කිරීමට මිනිසා තුළ ඇති ස්වාභාවික නැඹුරුතාව ඔවුන්ට යහපත්කම කෙරෙහි ආකර්ෂණය වන්නට හේතුවන බව මිලින්දපඤ්හයේ සඳහන් වේ. රජු මෙසේ ඇසුවේය: "ගෞරවනීය නාගසේන හිමියන් වහන්ස, වඩා උතුම් වන්නේ යහපත ද අයහපත ද? '' "යහපත ප්‍රමුඛ වේ, අයහපත ප්‍රමුඛ නැත'' " ඒ ඇයි? '' "රජතුමනි, කෙනෙකු අයහපත කරන විට, එය පසුතැවිලි සහගතයි, ඒ නිසා ඔහු අයහපත කිරීමෙන් වැළකේ. නමුත්, කෙනෙකු යහපත කිරීමෙන් පසුතැවිලි වීමක් සිදු නොවේ. පසුතැවිල්ලෙන් නිදහස් වීමෙන් ඔහු සතුටට පත් වේ, සතුටෙන් ප්‍රීති ප්‍රමුදිත වේ. ප්‍රීති ප්‍රමුදිතවීමෙන් ශරීරය නොකැළඹේ. නොකැළඹුන ශරීරය නිසා කෙනෙකු ප්‍රීතිමත් වේ. ප්‍රීතිමත් ශරීරය ඒකාග්‍රතාවට පත් වේ. ඒකාග්‍රතාවට පැමිනුණ පුද්ගලයාට දේවල් ඒවායේ සැබෑ ස්වරූපයෙන් දැකිය හැකිය. ඒ නිසා යහපත ප්‍රමුඛ වේ' (Mil.84).

පසුකාලීනව මෙම අදහස් උපුටා දක්වමින් මහායාන චින්තකයින් බුදුපියාණන් වහන්සේගේ ගතිස්වභාවය වර්ධනය කළහ. සියලු මිනිසුන්ට, සැබැවින්ම සියලු ජීවීන්ට බුදුපියාණන් වහන්සේට සමාන ස්වභාවයක් ඇති අතර, එමඟින් සහජයෙන්ම යහපත් යන අදහස ඔවුහු වර්ධනය කළහ. බුදුන්ගේ ගතිස්වභාවය සෑම කෙනෙකු තුළම ආවේණික බවත්, එකම දේ එය අවබෝධ කරගත යුතු බවත් යන අදහස විදහා දැක්වීමට රත්නගොත්‍රවිභාගයේ කැපී පෙනෙන උපමාවක් භාවිත කර ඇත. සොරෙකු නිවසක් බිඳ ඇතුල් වී වටිනා මැණිකක් සොරකම් කළේය. ඔහු පිටත්ව යද්දී නිවසේ අයිතිකරුවෝ අවදි වී ඔහු දැක පසු පස හඹා යන්නට වූහ. හොරා වීදි දිගේ දුවන විට, පාර අයිනේ නිදමින් සිටි හිඟන්නෙකු දුටුවේය. හොරා මැණික හිඟන්නාගේ සාක්කුවට දැම්මේය. සොරාගේ සිතුවිල්ල වූයේ ඔහු අල්ලා ගතහොත් නිර්දෝෂී බව කියා පසුව හිඟන්නාගෙන් මැණික ලබා ගැනීමය. යාචකයා පසුදින අවදි වී ඔහුගේ කුසගින්න, අවශ්‍යතා සපුරාගැනීම් සහ අසතුටින් පිරි ජීවිතය නොනැවත කරගෙන ගියේය. දිනක් ඔහු තමන්ගේ සාක්කුවට අත දැමූ විට එම මැණික හමුවිය. තමන් අදහාගත නොහැකි ලෙස දිගටම පොහොසත් වී ඇති බවත්, නමුත් කිසි දිනක එය නොදැන සිටි බවත් ඔහුට හදිසියේම වැටහුණි. මිනිස් ස්වභාවයේ මූලික යහපත්කම පිළිබඳ අදහස බෞද්ධ රටවල නීති විද්‍යාවේ න්‍යායයන් කෙරෙහි තියුණු බලපෑමක් ඇති කළේය. 7වන ශතවර්ෂයේ ජපානයේ ෂොටොකු කුමරුන්ගේ කාරණා 17කින් යුක්ත ව්‍යවස්ථාවේ ජනප්‍රිය දෙවන ලිපියේ මෙසේ සඳහන්

වේ: 'අවංකවම මාණික්‍ය තුනට (ඒ බුදුන්වහන්සේ, ධර්මය සහ සංඝයා) ගෞරව කරමි.' මේ තුන සියලු මිනිසුන්ට ඉහළම පරමාදර්ශය සාදන අතර, සියලු ජාතීන්ගේ අත්‍යන්ත පදනම වේ. ඇත්ත වශයෙන්ම දුෂ්ට මිනිසුන් ඇත්තේ ස්වල්පයකි. අප ඔවුන්ට හරි වැරැද්ද උගන්වන්නේ නම්, ඉතා බහුතරය එය පිළිපදිනු ඇත.'

## මානව හිමිකම්

මානව හිමිකම් යනු පුද්ගලයෙකුට යම් ආකාරයකින් සැලකීමට සහ ඔහු හෝ ඇය හුදෙක්ම මනුෂ්‍යයෙකු වන නිසා යම් යම් දේ ලබාගැනීමට හිමිකම් තිබෙන බවට ඇති සංකල්පයයි. වඩාත්ම මූලික අයිතිවාසිකම වන්නේ ජීවත්වීමේ අයිතිය, නමස්කාර කිරීමේ නිදහස, කථාකිරීමේ නිදහස, සිතීමේ නිදහස සහ නීතිය ඉදිරියේ සමාන සැලකීම ලැබීමේ අයිතියයි. 18වන සියවසේ අග භාගයේ දී යුරෝපයේ මානව හිමිකම් පිළිබඳ සංකල්පය වර්ධනය වූ අතර, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය එක්සත් ජාතීන් විසින් 1948දී පිළිගන්නා ලදී. මානව හිමිකම් පිළිබඳ සංකල්පය අදහස් තුනකින් වර්ධනය විය. 1. මානව නීති සහ ආයතන, මිනිසා විසින් සාදන ලද ඒවා වන අතර, දෙවියන් විසින් නියම කරන ලද ඒවා නොවන නිසා වෙනස් කළ හැකිය. සියලු මිනිසුන් එක හා සමාන, සහ 3. සියලු මිනිසුන් සතුව අභිමානය යනුවෙන් හැඳින්වෙන ගුණාංගය තිබෙන බවයි.

මෙම අදහස්වලින් පළමුවැන්න අග්ගඤ්ඤ සූත්‍රයේ පැහැදිලිව සඳහන් කර ඇති අතර, පවතින සමාජ ක්‍රමය දිව්‍යමය වශයෙන් නියම කරගත්තක්ය යන

අදහසට එරෙහිව බුදුපියාණන් වහන්සේ තර්ක කර ඇත (D.III,92-3). අසාධාරණ හෝ කෲර රජවරුන් බලෙන් නෙරපා දැමීම සඳහා මිනිසුන් සාධාරණීකරණයට හේතු දක්වන බව ජාතක කතාවේ ද සඳහන්ව ඇත. මෙම අදහස්වලින් දෙවැන්න වාසෙට්ඨ සූත්‍රයේ පැහැදිලිව සඳහන් කර ඇත. මෙහිදී 'මිනිසුන් අතර වෙනසකම් සාම්ප්‍රදායික පමණක්' බව කියමින් බුදුපියාණන් වහන්සේ කුල පද්ධතියට විරුද්ධව තර්ක කර ඇත (Sn.594-611). තුන්වන අදහස බුදුපියාණන් වහන්සේ පැහැදිලිව ප්‍රකාශ කර නැත. නමුත්, ජීවිතයේ අනගි බව, සියලු ජීවීන් ආදරය කිරීමට යෝග්‍ය බව සහ සියලු දෙනා තුළම රහත්ඵලය සාක්ෂාත් කර ගැනීමට හැකියාව තිබෙන බවත්, උන්වහන්සේගේ ඉගැන්වීම්වලින් ගම්‍ය වේ.

එසේ තිබියදීත්, බෞද්ධ ශිෂ්ටාචාරය කිසිවිටක මානව හිමිකම් පිළිබඳ සංකල්පය වර්ධනය කළේ නැත. එයට හේතුව සමහර විට, හින්දු දේශපාලන න්‍යාය හේතුකර ගෙන මුල් කාලයේ සිටම ඔවුන් පිළිගත්තේ රජු දෙවියන් ලෙස සැලකීම විය හැකිය. වර්තමානයේ බොහෝ සාම්ප්‍රදායික බෞද්ධ රටවල පවතින්නේ අසමාන හෝ දුර්වල මානව හිමිකම් වාර්තාවකි. බලන්න **මිථ්‍යා ලබ්ධිය සහ ඉවසීමේ හැකියාව**

*Buddhism and Human Rights*, D. Keown, S. Prebish and R. Huster, 1998.

## හාස්‍යය

හාස්‍යය (පරිහාස) යනු සිනහව උපද්දවන ගතිලක්ෂණයකි. හාස්‍යජනක හැඟීමක් තිබීම

දේවල්වල විනෝදය දනවන පැත්ත දැකීමට ඇති හැකියාව හෝ අන් අයට සිනහ වීමට ඇති සුහුරු බවයි. බුදුපියාණන් වහන්සේට උන්වහන්සේගේ කාලයේ තිබූ හාස්‍යය පිළිබඳව තිබුණේ පහත් මතයකි. එයට හේතුව සමහර විට, ඒවා බොහෝ විට වඩා නිවැරදිව කියනවා නම්, රළු - ප්‍රහසනයක්, අසැබි බස හෝ ලිංගික ඇනුම්පද මත පදනම් වූ ඒවා නිසාය. එසේම, එතැන් පටන් බොහෝ සෙයින් හාස්‍යය මතුකර ගෙන ඇත්තේ අන් අයට විහිළු කිරීමෙන් සහ සමච්චල් කිරීමෙන් බව බුදුපියාණන් වහන්සේ දැක ඇත. ඒ නිසා කුරිරුබවේ මූලය එහි ගැබ්වී ඇත. පැරණි ඉන්දියානු නළු නිළියන් සහ හාස්‍යය ජනනය කරන්නන් විශ්වාස කළේ ඔවුන් 'සත්‍යය සහ අසත්‍යය යන දෙකම ජන සමූහයා විනෝදයට සහ ප්‍රීතියට පත් කිරීමට භාවිත කරන නිසා', ඔවුන් දිව්‍ය ලෝකයේ සිනහසෙන දෙවිවරුන් අතර නැවත උපදින බවයි. බුදුපියාණන් වහන්සේට තිබුණේ වෙනස් වූ අදහසකි. එවැනි පුද්ගලයන් නිරයේ සිනාහඬට ලක් වන්නට නැවත ඉපදීමට බොහෝ ඉඩකඩ තිබෙන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (S.IV,306). සත්‍යය කථා කිරීමේ ඇති වැදගත්කම පිළිබඳව උන්වහන්සේගේ විශ්වාසය එයයි. උන්වහන්සේ රාහුල ස්වාමීන් වහන්සේට මෙසේ පැවසූහ: 'විහිළුවටවත් බොරු නොකියන්න' (M.I,415). මෙම අදහසම ජාතක කතාවේ බොහෝ වාරයක් සඳහන්ව ඇත. (උදාහරණ Ja.I,439; V,481)

කෙසේ නමුත්, සිනහවක් ඇති කරන හෝ සිතේ ස්වභාවය සැහැල්ලු කරන හාස්‍යය බුදුපියාණන් වහන්සේ අනුමත කර ඇති බව පෙනේ. එයට

හේතුව උන්වහන්සේගේ විනීත, සියුම් හාස්‍ය පිළිබඳ බොහෝ උදාහරණ ත්‍රිපිටකයේ අඩංග වීමයි.

උන්වහන්සේගේ දේශනා ශ්ලේෂ හෙවත් දෙපිට කැපෙන වැකිවලින් (සිලෙස) පිරී ඇත. ශ්ලේෂ යනු වෙනස් අර්ථ දෙකක් ඇති වචනයක් හෝ එකම ශබ්දයක් ඇති වචන දෙකක් හාස්‍යජනක ඵලයක් ඇති කරන ලෙස භාවිත කිරීමයි. උදාහරණ වශයෙන් බ්‍රාහ්මණයන් වේදය සජ්ඣායනය කළ නිසා ඔවහු 'සජ්ඣායනය' කරන්නන් (අජ්ඣායක) වශයෙන් හඳුන්වනු ලැබූහ. සැබැවින්ම ඔවුන් මෙසේ හැඳින්වූ නිසා බුදුපියාණන් වහන්සේ හාස්‍ය පළ කළහ. ඒ ඔවුන්ට භාවනා කරන්නට නොහැකි වූ නිසාය (අජ්ඣායක D.III,94). බුදුපියාණන් වහන්සේ විහිළු කළහ. හාස්‍යය මතු කරන තවත් ක්‍රමයක් නම්, සම්බන්ධවූ නමුත්, නොගැළපෙන කාරණා දෙකක් සමීප කිරීමෙනි. මෙය බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ උපමාවලින් ඉඳහිට කළ දෙයකි. යහපත් අභිප්‍රායයන් තිබෙන නමුත්, වැරදි පුරුදු තිබීමෙන්, පුද්ගලයෙකුට නිර්වාණයට යොමු විය නොහැකිය. එය ගවයෙකුගේ අංවලින් ඇදීමෙන් කිරි ගන්නට උත්සාහ කිරීමක් හා සමාන වේ (M.III,141). හැන්දක් සුප් එකක රස බැලීමට වඩා වැඩි යමක් මෝඩයෙකුට බුද්ධිමතෙකු ආශ්‍රය කිරීමෙන් ලබන යහපතක් නැති බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (Dhp.64). එක්තරා පුද්ගලයන් හෝ අදහස්, විශේෂයෙන්ම බ්‍රාහ්මණයන්ගේ අයිතීන් කියාපෑම් විවේචනාත්මකව සාකච්ඡා කරන්නට ඉඳහිට බුදුපියාණන් වහන්සේ හාස්‍යයමය අනුකරණ (පරිහාපජ්ජ) භාවිත කළහ. වරක් එක් අහංකාර

බ්‍රාහ්මණයෙක් 'ඔවුන් බ්‍රහ්මගේ මුඛයෙන් ඉපදී ඇති නිසා' අනෙක් කුලවල අයට වඩා බ්‍රාහ්මණයන් ඉහළ යැයි තරයේ කියා සිටියේය. ඒ වේදයේ සඳහන් විශ්වාසයකි. බුදුපියාණන් වහන්සේ උපහාසාත්මක කියමනකින් මෙසේ පැවසූහ: 'නමුත් අනෙක් සෑම දෙනෙකු මෙන්ම බ්‍රාහ්මණයන් ද ඉපිද ඇත්තේ ඔවුන්ගේ මව්වරුන්ගේ ගර්භාශයෙනි' (M.II,148). නූතන පාඨකයා තුළ අදටත් නිහඬ හිනාවක් ඇති කළ හැකි අයුරින් උත්තරීතර දෙවියෙකු පිළිබඳ අදහස දීඝ නිකායේ බුදුපියාණන් වහන්සේ මෘදු ලෙස හාස්‍යයට ලක් කළහ (D.I,17-18; 220-222).

සිනහව සමහර විට 'හොඳම ඖෂධය' ලෙස හැඳින් වේ. හාස්‍යයට සමහර විට චිකිත්සක වටිනාකමක් තිබිය හැකි බවට බුදුපියාණන් වහන්සේ ද එකඟ වන්නට ඇත. යම් නිශ්චිත චින්තන ක්‍රමයක් ගැටලුවක් විසඳිය නොහැකි යැයි පෙනෙන හෝ දරාගත නොහැකි බරක් ඇති අවස්ථාවලදී එම තත්ත්වය විහිළුවක් කර ගනිමින් සමහර විට වෙනස් අදහසක් විවෘත කරගත්විට විසඳුමක් ලබාගත හැකි විය හැකිය. හාස්‍යය මගින් විරේචකයක්, සාංකාවෙන්, ආතතියෙන් හෝ භීතියෙන්, චිකිත්සක මුදා හැරීමක් ඇති වේ. නැතහොත්, අසහනයෙන් ද මිදීමට පුළුවනි. බුදුපියාණන් වහන්සේ ඉඳහිට හාස්‍යය මේ සඳහා යොදා ගත්හ. වරක් අජාසත්ත රජු පැවිදි ජීවිතයේ වර්තමානයේ දකින්නට තිබෙන එක් වාසියක් උන්වහන්සේට පැවසිය හැකි ද කියා විමසුවේය. මෑතකදී තම පියා ඝාතනය කිරීමෙන් රජුට වැඩි වැඩියෙන් ඒ පිළිබඳව කණගාටුවක් සහ නොසන්සුන්තාවක් දැනෙන්ට පටන් ගෙන තිබුණි.

තමන්ගේ දාසයෙකු පලා ගොස් භික්ෂුවක බවට පත් වුවහොත් සහ පසුව දාසයා සිටින තැන දැනගත්තේ නම් කුමක් කරන්නේද යන්න බුදුපියාණන් වහන්සේ රජුගෙන් විමසූහ. එම භික්ෂුව සිරගත කර නැවත වහල්කමට ගන්නේ ද කියා බුදුපියාණන් වහන්සේ ඔහුගෙන් විමසූහ? 'නැත' රජු පිළිතුරු දුන්නේය.'ඊට ප්‍රතිවිරුද්ධව මම ඔහු වෙනුවෙන් නැගිට, ඔහුට ආචාර කර දානය පිරිනමමි.' 'හොඳයි, දැක්කද? වර්තමානයේම භික්ෂුවක වීමේ එක් ලාභයක්' (භාවාර්ථය ප්‍රකාශ කිරීම D.I,51-61). බැරෑරුම් ප්‍රශ්නයකට මෙම අනපේක්ෂිත හාස්‍ය ජනක පිළිතුර පළමුව රජු පුදුමයට පත් කරන්නට ඇත. ඊට පසු ඔහු මඳ සිනහවක් පළ කරන්නට හෝ සිනහසෙන්නට ඉඩ ඇත. රජුගේ කණස්සල්ල සැහැල්ලු කරමින් සහ සහනයක් ලබා දීමෙන් පසු, බුදුපියාණන් වහන්සේ ඊට පසු රජුගේ ප්‍රශ්නයට වඩා ගැඹුරු ලෙස පිළිතුරු දුන්හ. බලන්න **මඳ සිනහ සහ සිනහ**

*Humor in Pali Literature and Other Essays*, W. Rahula,1997.

## දඩයම් කිරීම

දඩයම් කිරීම (මිගව) යනු වල් සතුන් ලුහු බැඳීම, එළවාගෙන යාම, සහ මැරීමයි. පූර්වඉතිහාසය තුළ සහ අදත්, සමහර අති පුරාණ ගෝත්‍රිකයන්, මිනිසුන් ඔවුන්ට ආහාර ලබා ගැනීමට හෝ ඔවුන්ගේ අතිරේක භෝජනය සඳහා දඩයම් කර ඇත. පසු කාලයේදී, යුද්ධ සඳහා පුහුණු කිරීමට මාර්ගයක් වශයෙන් දඩයම් කිරීම සමහර විට දකින්නට තිබුණි. වර්තමානයේ, සම්පූර්ණයෙන්ම වාගේ සියලු දඩයම් කිරීම් සිදුවන්නේ ක්‍රීඩා සංග්‍රහ හෝ නිර්භීතකම තහවුරු කිරීමටයි. බුදුදහම සැමවිටම දඩයම් කිරීම

අනුමත නොකරයි. එයට හේතුව ඒ සඳහා කෲරත්වය සහ මැරීම සම්බන්ධ වන නිසා සහ බොහෝ අවස්ථාවල එය අනවශ්‍ය දෙයක් වන නිසාත්ය. දඩයම් කිරීමේදී ඝාතනය නොවන සතුන් තුවාල විය හැකි වන අතර, 'පඳුරුවලට සහ කැලෑවල ඝන ලැහැබ්වලට, තණකොළ, පන්ගස් සහ කටු ඇඹිල්ල පඳුරුවලට පලා ගොස් මිය යයි, සිලිටි නිල්වන් කළු පිල් කළඹැති කපුටන් සහ ගිජු ලිහිණියන් විසින් කා දමනු ලබන බව මහාවස්තුවේ පෙන්වා දෙයි.' කුකුළන්, මුවන් ලුහු බඳින්නන් සහ ධීවරයන් යන මේ සියලු දෙනාගේ නැවත උත්පත්තිය අයහපත් විය හැකි බව බුදුපියාණන් වහන්සේ වදාළහ (A.II,207; S.II,256). මුල්කාලීන බෞද්ධයන් ද වෙනත් සතුන් දඩයම් කිරීම සඳහා උදාහරණ වශයෙන් සුනඛයන්, උකුස්සන්, දිවියන් වැනි සතුන් ප්‍රයෝජනයට ගැනීම (Ja.V,270) සහ එක් සතෙකු අල්ලා ගැනීමට තවත් සතෙකු පොලඹවා ගැනීම පිළිබඳව විවේචනය කර ඇත (Ja.V,375). බෞද්ධ රජවරු දඩයම් කිරීමෙන් සතුටුවූයේ කලාතුරකිනි. වෙනත් බොහෝ සංස්කෘතීන් මෙන් නොව, බෞද්ධ රටවල දඩයම් කිරීමේ දර්ශනවලින් සරසා ඇත්තේ ස්වල්ප වූ ස්ථාන කිහිපයක හෝ රජ මැදුරුවල පමණි. ක්‍රීඩාව සඳහා දඩයම් කිරීම බොහෝ ජාතක කතාවල විවේචනයට ලක් කර ඇති අතර, අයුතු බල යොදා සතුන්ට පීඩා කිරීම පිළිබඳව අනුකම්පා සහිත හැඟීම් උපදවන්නට උත්සාහ කරයි (Ja.I,145-54). රජවරුන් සඳහා සිදු කරණ ලද සරභා අනුශාසනාවේ දඩයම් කිරීම පිළිබඳ බෞද්ධ ආකල්පය සම්බන්ධයෙන් ජාතකමාලාවේ ඉතා හොඳින් සම්පිණ්ඩනය කර ඇත: 'ඔබට මා කෙරෙහි ආදරණීය වන්නට අවශ්‍ය නම්, දඩයම් කිරීම අත්හරින්න. එයට

හේතුව සතුන් ස්වභාවයෙන්ම අඳුරු ජීවිත ගත කරන්නන්ය. අප සතුන්ට අනුකම්පා කළ යුතුයි. සතුටු වීම සහ දුක්විඳීම් මඟහැරීම් සම්බන්ධයෙන් සියලු සත්ත්වයන් එක හා සමානය. එමනිසා ඔබට යම් දෙයක් අප්‍රසන්න නම්, එය ඔබ අනෙක් අයට පැමිණවිය යුතු නොවේ.'

බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් නිසාම දඩයම් කිරීම් අත්හළ යම් කෙනෙක් වේ නම් ඒ පිළිබඳ මුල්ම විස්තරය අශෝක රජු ගැනයි. ක්‍රි. පූ. 256දී ඔහු තමන් විනෝද ගමන් සහ දඩයම් කිරීමේ චාරිකා කණ්ඩායම් සූදානම් කිරීම නවත්වන බවට නියෝගයක් ප්‍රකාශ කළේය. එකල එය රජවරුන්ගේ සාම්ප්‍රදායික විනෝදයවූ අතර, ඒ වෙනුවට ඔහු වන්දනා ගමන් සහ පරීක්ෂණ චාරිකා ආරම්භ කර තිබුණි. බලන්න **ලේ වලින් සිදුකරන ක්‍රීඩා**

## සනීපාරක්ෂක විද්‍යාව

සනීපාරක්ෂක විද්‍යාව (ආරොග්‍යවිජ්ජා) රෝගවලින් වැළකීම සඳහා තමන් සහ තමන්ගේ ආසන්න පරිසරය පිරිසිදුව තබා ගැනීමේ පුරුද්දයි. අපිරිසිදු ආහාර අනුභව කිරීමෙන්, හිසකෙස් සෝදා නොගැනීමෙන් සහ නොකැපීමෙන්, ශරීරය කෙරෙහි සැලකිල්ලක් නොදැක්වීම යම් ආකාරයකින් පූජනීය බවට පත් වේයැයි විශ්වාස කරන තවුසන් බුදුපියාණන් වහන්සේ විවේචනයට ලක් කළහ. මෙම විශ්වාසය පැරණි ඉන්දියාවේ මෙන්ම මුල් සහ මධ්‍යතන සමස්ත ක්‍රිස්තියානි ලෝකයේ පුළුල් ලෙස පැතිරී තිබුණි. බුදුපියාණන් වහන්සේ මෙසේ

පැවසූහ: 'නිරුවතබව හෝ අවුල් වූ කොණ්ඩය නොව, මඩ හෝ නිරාහාරව සිටීම නොව, බිම වැතිර සිටීම නොව, නොසෝදා සිටීම නොව, විලුඹ මත ඇණ තියාගෙන සිටීම නොව, සැකයෙන් ඔබ්බට නොගිය කෙනෙකු පවිත්‍ර වේ Dhp.141). තමන්වහන්සේගේ භික්ෂූන් සහ භික්ෂුණීන්ට නිතිපතා සේදීමට සහ රැවුල බෑමට සහ ඇඳුම් පිරිසිදුව තබා ගැනීමට බුදුපියාණන් වහන්සේ නියම කළහ. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'අපිරිසිදු ශරීරයක් නිසි ආකාරයෙන් සෝදා ගන්නේ කෙසේ ද? එකට එක ඇතිල්ලීමෙන්, සබන් කුඩු, ජලය සමග හොඳට ඇතිල්ලීමෙන්ය' (A.I,207). බුදුපියාණන් වහන්සේ දන්ත සනීපාරක්ෂාව පිළිබඳව උපදෙස් පවා ලබා දුන්හ:'දත් බුරුසුවක් භාවිත කිරීමෙන් වාසි පහක් ඇත. ඒ පහ මොනවා ද? ඇස් දීප්තිමත් වේ. හුස්ම ප්‍රසන්න වේ. නාස් කුහර පිරිසිදු වේ. සෙම සහ සොටු ආහාරවලට ඇතුල් නොවේ. ඒ නිසා කෙනෙක් ආහාර හොඳින් භුක්ති විඳිති' (A.III,250). බලන්න **සිරුර සැතැපීම සඳහා උණුසුම් කළ කාමරය**

*A Pure Mind in a Clean Body: Bodily Care in the Buddhist Monasteries of Ancient India and China*, A. Heirman and M. Torck, 2012.

## රූප වන්දනාව

රූප වන්දනාව (පටිමාපූජා) යනු පිළිමවලට දෙවියන් හෝ ගෞරවයට පාත්‍ර වූ පුද්ගලයෙකු ලෙස සලකමින් එම පිළිමවලට නමස්කාර කිරීම සහ යාච්ඤා කිරීමයි. සමහර බෞද්ධ පූජාවල පිළිම භාවිත කරන අතර, කිසිම දැනුම්වත් බෞද්ධයෙකු ඒවා බුදුපියාණන් වහන්සේ යැයි විශ්වාස නොකරනු ඇත. ඔවුන් මෙම පිළිමවලට 'යාච්ඤා' නොකරනු ඇත. හත්වන සියවසේ දී මෙම අවබෝධයට අනුකූලව, යීජිං නමැති චීන ජාතික භික්ෂුව මෙසේ ලිව්වේය: 'ඒ උතුම් ගුරුවරයා නිර්වාණයට එළඹ ඇති නමුත්, උන්වහන්සේගේ රූප තවමත් පවතී. උන්වහන්සේ තවමත් ලෝකයේ වැඩ සිටින්නාක් මෙන් මෙම රූපවලට ගෞරව කළ හැකිය.'වාණබට්ට ඔහුගේ කාදම්බරියේ මෙසේ ලිව්වේය: ලාභ ප්‍රයෝජන ලබා ගැනීම පිණිස සමහරු ලීයෙන් සහ ගලෙන් නිම වූ පිළිමවලට වඳිති. නමුත් ඒවා අරූපී වන දෙවිවරුන්ගේ නිරූපණ වේ.' බුදුදහම හෝ බෞද්ධ චාරිත්‍ර තේරුම් ගැනීමට සුළු උත්සාහයක්වත් දැරූ අයෙකුට බෞද්ධයන් පිළිම නමස්කාර කරන්නේයැයි විශ්වාස කළ නොහැකිය. ඇත්ත වශයෙන්ම, උත්සාහයක් ගත් අය ද සිටිති.

11 වන ශතවර්ෂයේ මුල් භාගයේ දී ඉන්දියාව පුරා සංචාරය කළ මුස්ලිම් ජාතික ගණිතඥ අල් බීරූනී, පැවසුවේ නිවට, නූගත් මිනිසුන් පමණක් දෙවිවරුන්ගේ පිළිම සැබෑ දෙවිවරුන් ලෙස පිළිගත් බවත්, එය දාර්ශනිකයන් සහ දේවධර්මවාදීන් සිදු

නොකළ වැරැද්දක් බවත්ය (*Taḥqīq ma li-l-hind* XI). 15වන ශතවර්ෂයේ අගභාගයේ ඉන්දියාවේ රචනා කරන ලද දබිස්තන් අල්-මධාහිබ් නම් *Dabistan al-Madhhāhib* මුස්ලිම් කෘතියක මෙසේ සඳහන් වේ:'ඔවුන්ගේ ඇදහිල්ලට අනුව ආගන්තුකයන් (එනම් බුදුදහම සහ හින්දු ආගම) දෙවියන් ලෙස පිළිමය පිළිබඳව සිතන්නට හැකි නමුත්, සැබැවින්ම කාරණය මෙය නොවේ. මේ ඔවුන් සිතන දෙයයි, ඒ පිළිමය හුදෙක් දෙවියන්ගේ නිරූපණයක් පමණක් බවයි. දෙවියන්ට හැඩයක් හෝ රූපයක් නැත.' 17වන ශතවර්ෂයේ දී වර්ෂ ගණනාවක් ශ්‍රී ලංකාවේ ජීවත් වූ ඉංග්‍රීසි ජාතික ක්‍රිස්ටියන් රොබට් නොක්ස් බුදුපිළිම පිළිබඳව සිංහලයන්ගේ ආකල්පය ගැන මෙසේ ලිව්වේය: 'මෙම පිළිම පිළිබඳව ගත් කල ඔවුන් පවසන්නේ තමන්ට දෙවිවරුන් වීමට අයිති නැති නමුත්, ඔවුන්ගේ මතකය සඳහා පමණක් රූප දෙවිවරුන් නියෝජනය කරන බවත්ය. ඒ නිසා ඔවුන් දෙවිවරුන්ට ගෞරව සහ වැඳුම් පිදුම් කරන බවත්ය. වර්තමානයේ බුදුදහමේ පිළිම වැඳීම ස්ථිරවම පුරුදු කරගෙන යන අය නොදැනුවත්කම හෝ හිතාමතාම වංකකම සම්බන්ධයෙන් වැරදිකරුවෝ වෙති.

**බලන්න ප්‍රීති ප්‍රමෝදය**

## අවිද්‍යාව

අවිද්‍යාව (අවිජ්ජා හෝ මෝහ) යනු යම් දෙයක් පිළිබඳව තොරතුරු හෝ දැනුමක් නොමැතිකම, එය වැරදි ලෙස වටහා ගැනීම හෝ ඒ පිළිබඳව දැනුවත්භාවය නොමැතිකම ය. බුදුපියාණන් වහන්සේට අනුව, නොදැනුවත්කම දුක් විඳීමට හේතු

දෙකෙන් එකක් වන අතර, අනෙක තණ්හාවයි. අප දුක් විඳින්නේ ඇයි ද යන්න හෝ අප දුක් විඳිනා බව වත් දන්නේ නැති විට, එයින් අප නිදහස් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාවලිය ආරම්භ කිරීමටවත් අපට නොහැකිය. අනෙක් අතට, කොන්දේසි සහිත පැවැත්මේ අසම්පූර්ණකම සහ අසතුටුදායක බව අප තියුණු ලෙස දැන සිටියත්, එයට විසඳුම දෙවියන්ට යාච්ඤා කිරීම හෝ දිව්‍යලෝකයේ නැවත ඉපදීමට උත්සාහ කිරීම යැයි වරදවා විශ්වාස කරන්නට ඉඩ තිබේ. නැවතත්, මෙය ප්‍රශ්නය දිග්ගැස්සීමක් පමණි. විමුක්තිය ලබා ගැනීමට හැකි වන්නේ දුක් විඳීමේ සැබෑ ස්වභාවය සහ එයට හේතු වූ කරුණු ප්‍රඥාවෙන් දැකීමට පටන් ගත් විට පමණකි. **බලන්න මානසික කෙලෙස්**

## මායාව

මායාවක් (මායා) යනු ව්‍යාජ හෝ සැබෑ පැවැත්මක් නැති දෙයකි. සමහර වැරදි ලෙස අවබෝධ කර ගත් අය විශ්වාස කරන්නේ බුදුපියාණන් වහන්සේ ඉගැන්වූයේ සියල්ල මනස විසින් නිර්මාණය කරන ලද මායාවක් බවත්, කිසිවක් ඇත්ත වශයෙන්ම නොපවතින බවත්ය. වෛදික හින්දු ආගමේ මූලධර්මයන් වැරදි ලෙස බුදුපියාණන් වහන්සේට ආරෝපණය කර ඇති බවට ඇති බොහෝ උදාහරණවලින් මෙය එකකි. එසේ නම් 'සැම දෙයක්ම යථාර්ථවාදී නොවේ' (සබ්බං විතථ, Sn.9) යැයි පැවසීමෙන් බුදුපියාණන් වහන්සේ අදහස් කළේ කුමක් ද?

වෛදික විඥාන වාදයට අනුව, සෑම දෙයක්ම

දෙවියන්ගේ 'නැටුමක්' හෝ 'නාට්‍යයක්' (ලීලා) හුදෙක්ම මනසේ නිර්මාණයක් පමණි. මෙහි අතිශය ප්‍රතිවිරුද්ධය බොළඳ යථාර්ථවාදයයි. සෑම දෙයක්ම හරියටම පෙනෙන ආකාරයටම යන සංකල්පයයි. මෙම අදහස් දෙකම අසත්‍යයි. පළමු වැන්න දෙවැන්නට වඩා වැඩිය. බුදුපියාණන් වහන්සේ ඒ දෙකටම කැමැත්ත පළ කර සිටියේ නැත. ඉතා පැහැදිලිවම, බාහිර ලෝකය පවතින්නේ වචනයේ සැබෑ අර්ථයෙන්මය. ලෝකය පැවැත්මේ මූලද්‍රව්‍යයන් - පෘථිවිය හෝ ඝනත්වය (පඨවි), ජලය හෝ දියාරු බව (ආපො), ගින්න හෝ තාප ජනක බව (තෙජො) සහ සුළඟ හෝ චලනය වීම (වායො) -අපගේ මනසින් ස්වාධීනව පවතින අතර, ප්‍රතිඵල ගෙන දෙයි. කෙසේ නමුත්, අපගේ සංවේදිතාවන් මත බාහිර ලෝකය ගැටෙන විට, අපි අදහස්, සාරධර්ම, උපකල්පන සහ බලාපොරොත්තු ඒ මත ප්‍රක්ෂේපණය කරමින් ප්‍රතිචාර දක්වමු. එහි ප්‍රතිඵලයක් වශයෙන් අප දකින දේ බොහෝ විට වස්තුවක ගුණාංගවලට වඩා අපගේ මනසේ ප්‍රතිඵලයකි. 'හඳුනා ගැනීම විකෘති කිරීම' (සඤ්ඤා විපල්ලාස, A.II,52) යනුවෙන් බුදුපියාණන් වහන්සේ හැඳින්වූයේ මෙයයි. භාවනාවේ වටිනාකම නම්, මනස දෙස බැලීමේදී, එහි ප්‍රක්ෂේපණය සහ විකෘතිවීමේ ප්‍රවණතාව අප දකින අතර, එයින් නොමඟ යෑමේ ඇති ඉඩකඩ අඩුය. කාලයාගේ ඇවෑමෙන්, මනස සම්පූර්ණයෙන්ම නිසල සහ පැහැදිලි වන විට, එය ප්‍රක්ෂේපණය වීම නවත්වන අතර, සංවේදක වස්තූන් ඒ ආකාරයෙන්ම අනාවරණය වේ. සාමාන්‍ය පුද්ගලයා සෑම දෙයක්ම දකින්නේ ඔහුගේ හෝ ඇයගේ ආශාවන්, මතකයන්,

පූර්ව විනිශ්චයන් සහ ඕනෑකම්වල පෙරහන තුළිනි. රහත්ඵලලාභියා 'දේවල් ඒවායේ සැබෑ ස්වභාවයෙන්ම දකියි' (යථාභූතඤාණදස්සන).

## අන්තරාභවය

සමහර බෞද්ධ ගුරුකුල කියා සිටින්නේ මරණයෙන් පසු නැවත ඉපදීමට පෙර විඤ්ඤාණය නැවත ඉපදීමට පෙර තාවකාලිකව යම්කිසි කාලයක් ජීවක්‍රියාකාරිත්වය නතරවන බවයි. මෙම අන්තරාභවය (අන්තර්භව) ලෙස හැඳින් වේ. මෙම කාල පරතරය කොපමණ කාලයක් පවතින්නේ ද යන්න පිළිබඳව විවිධ න්‍යායයන් ඇත. සමහරු දින හතක් යැයි පවසන අතර, තවත් සමහරු දින 14ක් ද, තවත් සමහරු දින 49ක් ද යනුවෙන් පවසති. ථේරවාදී බුදුදහම අන්තරාභවය යථාර්ථය ප්‍රතික්ෂේප කරන අතර, පාලි ධර්ම ග්‍රන්ථවලින් අඟවන්නේ මරණය සහ නැවත ඉපදීම අතර පරතරයක් ඇති බවයි. 'කෙනෙකු ශරීරය අත්හළ විට, (මිය ගිය) නමුත් නැවත ඉපදී නැත' තත්ත්වය පිළිබඳව බුදුපියාණන් වහන්සේ කථා කළහ (S.IV,400). වෙනත් බොහෝ අවස්ථාවල බුදුපියාණන් වහන්සේ පැවසුවේ නිර්වාණය අවබෝධ කරගත් පුද්ගලයෙකුට, මේ ජීවිතයට, ඊළඟ භවය සහ සාධාරණ ලෙස අනුමාන කරන පරිදි, අතර කාල පරාසයක් ද යන්න සඳහන් කරමින්, 'මෙතැන සහ අතන නැති බවත්, අන්තරාභවය ද නොමැති බවය'(S.IV,73). උන්වහන්සේ කියා සිටියේ යම් යම් තත්ත්වයන් යටතේ කෙනෙකුට මෙම අන්තරාභවය තුළ දී ද නිර්වාණයට පත්විය හැකි බවයි. එවැනි

අවස්ථාවක නිර්වාණය සාක්ෂාත් කර ගත් පුද්ගලයා උන්වහන්සේ හැඳින්වූයේ 'අන්තරාභවය තුළ නිර්වාණය අවබෝධ කරගත් වර්ගය' (අන්තරාපරිනිබ්බායී, S.V,69) වශයෙනි.

ටිබෙටයේ වජ්‍රයාන බුදුදහමේ අන්තරාභවය හඳුන්වන්නේ බර්ඩෝ යනුවෙනි. සමහර ටිබෙට් ජාතිකයන් විශ්වාස කරන්නේ මෑතක දී මියගිය පුද්ගලයෙකුට මෙම තත්ත්වයේ සිටින බවට කියනු ලබන *Liberation Through Hearing in the In-between State* (*Bardo Thodol*) නම් ග්‍රන්ථයෙන් උපදෙස් කියවීමෙන් නැවත ඉපදීම වළක්වා නිර්වාණයට පත්විය හැකි බවයි. මෙම ග්‍රන්ථය බටහිර රටවල හඳුන්වන්නේ *The Tibetan Book of the Dead* යනුවෙනි.

## සුවඳ දුම් කුඩු

සුවඳ දුම් කුඩු (සුගන්ධධූප) යනු ඇවිළෙන විට සුවඳැති දුමාරයක් ඇති කරන ද්‍රව්‍යයකි. පැරණි ඉන්දියාවේ සුවඳ දුම් සාමාන්‍යයෙන් නිපදවූයේ විවිධ මල්වල සාරයෙන් හෝ ඇතැම් ගස්වලින් නිපදවන සුවඳවත් මැලියම්වලින්ය. බුදුපියාණන් වහන්සේ බොහෝ විට රූපාන්තරණයෙන් ගුණවත්කම මිහිරි සුවඳකට සමාන කළහ. උදාහරණ වශයෙන් උන්වහන්සේ මෙසේ පැවසූහ: 'සියලු සුගන්ධයන් අතර - සඳුන්, තගර නමැති ශාකය, නෙළුම් හෝ සමන් පිච්ච - ගුණවත් බවේ සුවඳ වඩාත් මිහිරිය' (Dhp.55). එසේම, මල්වල සුවඳ සුළඟින් එහාට නොයයි... නමුත් යහපත් පුද්ගලයාගේ සුවඳ සියලු දිශාවලට පැතිරෙයි' (Dhp.54). දැනුවත් බෞද්ධයන් සුවඳ කුඩු දල්වා එය බුද්ධ ප්‍රතිමාව ඉදිරිපිට තබන

විට, ඔවුහු නිශ්ශබ්දව ගුණවත් බවේ ඇති වැදගත්කම පිළිබඳව ප්‍රත්‍යවේක්ෂා කර ශික්ෂාපද වඩාත් අවංකව පුහුණු කිරීමට අධිෂ්ඨාන කරති. ඉංග්‍රීසි බසින් සුවඳකුරු සමහර විට 'හඳුන්කුරු' යනුවෙන් හැඳින් වේ. ජොස් යන වචනය පැවත එන්නේ පෘතුගීසි භාෂාවේ ඩෙස් හෙවත් 'දෙවියන්' යන අදහසින්ය. එමනිසා සුවඳකුරු 'දෙවියන්ගේ කුරු' යනුවෙන් හැඳින්වීම බෞද්ධ සන්දර්භය තුළ නුසුදුසු වේ.

## ව්‍යභිචාරය

ව්‍යභිචාරය (අගම්මගමණ, වචනාර්ථයෙන් 'නොයා යුතු දේට යාම') හෝ 'වැරදි ආශාව' (අධම්ම රාග) යනු සමීප ඥාතීන් අතර ලිංගික සම්බන්ධතාවයයි. ව්‍යභිචාරය සමහර විට දෙමව්පියන් සහ දරුවන් හෝ සහෝදර සහෝදරියන් අතර ලිංගික සම්බන්ධතා ලෙස සිතනු ලැබේ. නමුත්, බොහෝ සංස්කෘතීන් සලකන්නේ දෙවන හෝ තුන්වන ඥාති සහෝදරයන් හෝ සහෝදරියන් අතර ලිංගික සම්බන්ධතා පවා ව්‍යභිචාරයක් ලෙසයි. දෙමව්පියන් සහ දරුවන් සහ සහෝදර සහෝදරියන් අතර ව්‍යභිචාරය පැරණි ඉන්දියාවේ සිදු විය.

දෙවිවරුන් ව්‍යභිචාරය කළ බවට මිථ්‍යාවන් කිහිපයක් වේදයේ ඇතුළත් කර තිබුණි. උදාහරණ වශයෙන් අග්නි, බ්‍රහ්ම සහ ප්‍රජාපති වශයෙනි. ව්‍යභිචාරය පිළිබඳව බෞද්ධ සාහිත්‍යයේ ද ඉඳහිට සඳහන්ව ඇත. උදය ජාතකයේ බෝධිසත්වයන් ඔහුගේ අර්ධ සහෝදරිය සමග බලයෙන්ම විවාහ කරවූ කුමාරයෙකි. ඔවුන් දෙදෙනා එකම කාමරයේ වසර ගණනාවක් නිදා ගත්ත ද, ඔවුහු බ්‍රහ්මචාරී

ජීවිත ගත කළහ (Ja.IV,105). දසරථ ජාතකයේ රාම සහ ලක්ඛණ කුමාරවරු ඔවුන්ගේ සහෝදරිය සමග විවාහ වේ (Ja.IV,130). බොහෝ පැරණි ජනයා මෙන්, බුදුපියාණන් වහන්සේගේ ඥාතීන් වන ශාක්‍ය ජනයාට ඔවුන්ගේ මූලාරම්භය පිළිබඳව මිථ්‍යාවක් තිබූ අතර, එයට සහෝදර- සහෝදරියන්ගේ ව්‍යභිචාරය ද ඇතුළත් විය. කෝලියානුවන් ශාක්‍යයන් සමග මතභේදයක් ඇති වූ විට, ඔවුන් ශාක්‍යයන්ට නින්දා කළේ 'බල්ලන්, හිවලුන් සහ වෙනත් සතුන් මෙන් සහෝදරියන් සමග එකට ජීවත් විය' යනුවෙන් ඇනුම් පද කියමිනි (Ja.V,413).

බුදුපියාණන් වහන්සේගේ ජීවිත කාලය තුළ, භික්ෂුණියක් භික්ෂුවක වූ තම පුත්‍රයා සමග ස්නේහයෙන් සිටි අතර, ඔහු සමග ලිංගිකව හැසිරුණාය. මෙය භික්ෂුත්වයෙන් නෙරපා හැරීමට අයත් වන වරදකි (Vin.III,35). මේ පිළිබඳව බුදුපියාණන් වහන්සේ ගේ අවධානයට යොමු කළ විට, උන්වහන්සේ මෙසේ පැවසූහ: 'මවක් තම පුතාට හෝ පුතා මවකට කාම රාගය ඇති කර ගත නොහැකි බව මේ මෝඩ මිනිසා දන්නේ නැද්ද?' (A.III,67-8).

සමහර විට මෙම සිද්ධිය වෙත සිත යොමුකරමින් බුදුපියාණන් වහන්සේ මෙසේ ද පැවසූහ: 'චෝදනාවලට ලක්වීමට ඇති ලැජ්ජාව සහ බිය ලෝකය ආරක්ෂා කරන පවත්නා තත්ත්ව දෙක වේ. ඒ දෙක ලෝකය ආරක්ෂා නොකළේ නම්, කෙනෙකුගේ මව හෝ මවගේ සහෝදරිය, කෙනෙකුගේ මාමාගේ බිරිඳ, කව්ද යන්න පැහැදිලි නොවිය හැකිව තිබුණි. එසේම ලෝකය

ව්‍යාකූලතාවයට පත් වේ. එළුවන් සහ බැටළුවන්, කුකුළන් සහ ඌරන්, සුනඛයන් සහ හිවලුන් අතර දකින අසංවරය පවතිනු ඇත.' (A.I,51).

## ඉන්දියාව

සංස්කෘතික ඒකකයක් ලෙස ඉන්දියාව දැන් පාකිස්තානය, ඉන්දියාව සහ බංග්ලාදේශය යන නූතන රාජ්‍යයන්ගෙන් සමන්විතය. හින්දු භක්තිකයන් දිගු කාලයක් තිස්සේ ඉන්දියාව ලෙස හැඳින්වූයේ ආර්යදේශය හෝ වඩාත් සාමාන්‍යයෙන් භාරත යනුවෙනි. එය තවමත් එහි නිල නාමයයි. ඉන්දියානු බෞද්ධයන් සැම විටම තම භූමිය හැඳින්වූයේ ජම්බුදීප යනුවෙනි (A.I,227). 'උතුරේ පළල් සහ දකුණේ පටු' (D.II,235) යනුවෙන් සහ උතුරු මායිම මත, උස් කඳු, (ඒ හිමාලයයි) (Vin.IV,197) ඇති බව බුදුපියාණන් වහන්සේ අපක්ෂපාතී ලෙසින් නිවැරදිව ඉන්දියාව විස්තර කළහ. උන්වහන්සේ ඉන්දියාවේ සාමාන්‍ය පරිසරය මෙසේ විස්තර කළහ: 'ප්‍රසන්න උද්‍යාන, ප්‍රසන්න කුඩා වන වදුලු, ප්‍රසන්න භූමි සහ විල් ප්‍රදේශ ගණනින් ස්වල්පයක් තිබෙන අතර, දැඩි ලෙස ප්‍රපාතාකාර සමතලා ස්ථාන, දිය බැස එගොඩ විය නොහැකි ගංගා, ඝන කැලෑ අකුල්වලින් පිරුණු ලඳු කැලෑ සහ කටු සහිත ගස් සහ ලංවිය නොහැකි කඳුවැටි වඩාත් බහුල වේ' (A.I,35).

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ මුළු ජීවිතය පුරාම ජීවත් වූයේ උතුරු ඉන්දියාවේ එම ප්‍රදේශයේය. ගංගා සහ යමුනා ගංගාවල පුළුල් සමතලා රළගැසීමෙන් රැස් වූ පසින් යුක්ත නිම්නය ඒ කාලයේ හැඳින්වූයේ මධ්‍ය දේශය වශයෙනි.

බුදුදහම ඉන්දියාවේ වසර 1000ක් පමණ විහිදුණි. ඊට පසු බොහෝ කාලයක් පුරා පිරිහීමකට ලක් විය. අවසානයේ එය 13වන ශතවර්ෂයේ දී විනාශයට පත්වෙමින් තිබුණි. 1950 දශකයේ දී බුදුදහම යළි ප්‍රාණවත් කිරීම සඳහා භිම්රාඕ අම්බෙඩ්කර් ගේ මෙහෙයවීමෙන් ප්‍රධාන වශයෙන් විද්වතුන් සහ වසලයන් අතර ව්‍යාපාරයක් ආරම්භ විය. එතැන් සිට, ඉන්දියාවේ බෞද්ධ ජනගහනය සම්පූර්ණයෙන්ම නිකම්ම මිලියන 8කට වඩා වැඩි වී තිබේ.
*Indian Buddhism*, A.K. Warder, 1980.

## උමතුකම

උමතුකම (උම්මත්ත) යනු සමාජයේ තවදුරටත් නිසි ලෙස ක්‍රියාකිරීමට නොහැකි තත්ත්වයට මානසිකව රෝගී වීමයි. චිත්ත ප්‍රභවයන් වික්ෂිප්තවීම නිසා තවදුරටත් පුද්ගලයාගේ පාලනය යටතේ නොපැවතීම උමතුකම ලෙස බුදුපියාණන් වහන්සේ විස්තර කළහ (M.II,106). දැඩි සහ දික්ගැස්සුණු ශෝකය, බිය, ආතතිය, හෝ කලකිරීම හෝ මොළය තුළ රසායනික අක්‍රමිකතාවක් යන මේ සියල්ල උමතුවකට හේතුවිය හැකිය. සිතුවිල්ලකින් දැනගත නොහැකි දේවල් පිළිබඳව ඕනෑවට වඩා දැඩිව සිතීමෙන් කෙනෙකුට උමතුබව ඇති නොවූවත්, අඩුම තරමෙන් සිතෙන් දැඩිව ග්‍රහණය කර ගැනීමක් ඇතිවිය හැකි බව බුදුපියාණන් වහන්සේ වදාළහ (S.V,446). මිනිස් මනස පිළිබඳව තිබූ ගැඹුරු දැනුම සහ මහාකරුණාව නිසා, උමතු පුද්ගලයෙකුට ඔහුගේ හෝ ඇයගේ ක්‍රියාවන්ට වගකිව නොහැකි බවත්, ඒ නිසා එවැන්නන්ට දඬුවම් නොකළ යතු බවත් බුදුපියාණන් වහන්සේ අවබෝධ කර ගත්හ. තාවකාලිකව උමතුව සිටියදී, පුද්ගලයෙකු

අපරාධයක් කළ හැකි බව උන්වහන්සේ අවබෝධ කර ගත්හ. බෞද්ධ පැවිදි නීති විද්‍යාවේ දී 'තාවකාලික උමතුව' පිළිබඳව සිදු කරන ආයාචනය නීත්‍යානුකූල එකක් සේ සැලකේ (M.II,248). මෙම අදහස යම් ශතවර්ෂ ගණනාවක් තිබෙන්නට ඇත. මිලින්දපඤ්හයේ මෙසේ සඳහන් වේ. : 'සිහිවිකල් වූ පුද්ගලයෙකු විසින් කරන ලද වරදක් අද ලෝකයේ දොස් ලැබිය යුතු එකක් ලෙස නොසැලකේ. ඒවාට ප්‍රතිඵල අනාගතයේ ද නොලැබේ.' (Mil.222) උමතුබව හේතුකොට ගෙන නිර්දෝෂී බව ලැබීමට ආයාචනය 19වන සියවසේ මුල් භාගය වනතුරු ඉංග්‍රීසි අපරාධ නීතියෙන් පිළිගෙන නොතිබුණි.
බෞද්ධ වෛද්‍යවරයෙකු වූ වාග්භඨ උමතුබව සඳහා ප්‍රතිකාර කිහිපයක් නිර්දේශ කළේය. ඒ රෝගියාට සැනසීමක් සහ අස්වැසුමක් ලබාදීමට සහ සමහර විට රෝගියා බිය ගැන්වීමට හෝ පහර දීමට පවා විය හැකිය. සමහර විට එය නූතන කම්පන ප්‍රතිකාර ක්‍රමයට සමාන ප්‍රවේශයක් විය හැකිය. **බලන්න අයිතිය**

## පොලිය

පොලිය (වඩ්ඩී) යනු ආයෝජිත මුල් මුදල භාවිතය වෙනුවෙන් අයකරන යම් මුදලකි. පොලී අය කිරීම බයිබලයෙන් තහනම් කර ඇත. 16වන ශතවර්ෂය තෙක් ක්‍රිස්තියානි ලෝකයේ එය ලෞකික ආගමකට සම්බන්ධ නැති සහ ආගමික නීතිය යටතේ නීති විරෝධී විය. ඉස්ලාමික නීතිය යටතේ එය තවමත් තහනම්ය. බ්‍රාහ්මණවාදය එය නපුරක් ලෙස සැලකීය. පොලියට ණය දීම සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේට කීමට කිසිවක් නොතිබුණි. නමුත්, අතීතයේ සිටම බෞද්ධ සම්ප්‍රදාය කිසි

විටකත්, එය වැරදි දෙයක් ලෙස සැලකුවේ නැත. බෞද්ධ චින්තනයට අනුව, යම් කෙනෙකුගේ ගවයෙකු, කෙනෙකුගේ කුසලතා හෝ නිවස කුලියට ගැනීම නීත්‍යානුකූල නම්, ඒ හා සමානවම කෙනෙකුගේ මුදල් නීත්‍යානුකූලව කුලියට ගැනීම නීත්‍යානුකූල විය යුතු බවයි. මුදල් ණයට දීමෙන් ප්‍රාග්ධනය වෙනත් ආකාරයකින් ලබා ගත නොහැකි අයට එය ලබාගත හැකිවන අතර, එමඟින් මිනිසුන්ට ඔවුන්ගේ ඉතිරිකිරීම් ද වැඩිකර ගත හැකිය. මුදල් ණයට දීමෙන් සදාචාරවත් නොවන ගැටලු ඇති වන්නේ අය කරන පොලිය අධික වූ විටයි. ඒ ගෙවන්නට නියම කරන පොලිය ණය දෙන්නාගේ බලාපොරොත්තු සුන්වූ අවස්ථාවක වැඩි වූ විට හෝ ණයගැතියාගේ දිළිඳුකම නිසා ණය අයකර ගැනීමට නොහැකි වීමයි. බුදුපියාණන් වහන්සේගේ කාලයේ දී ඔහු හෝ ඇය විසින් ගෙවිය යුතු පොලිය වෙනුවට ඔවුන්ගේ දරුවන් බලෙන් අල්ලා ගත හැකිවිය (Thi.444). වර්තමානයේ එවැනි අපයෝජනයන්ගෙන් ණයහිමියා නීතියෙන් ආරක්ෂා වී ඇත.

කෙසේ නමුත්, පොලියට ණය මුදල් දීම පිළිබඳව බුදුපියාණන් වහන්සේගෙන් විරුද්ධත්වයක් නොතිබුණි. ණයෙන් පෙළීම (ඉණ) ඊර්ෂ්‍යා නොඋපදවන තත්ත්වයක් බව උන්වහන්සේ හොඳින් දැන සිටියහ. නිවසක් නොමැති භික්ෂුවක වීමේ ඇති වාසියක් නම්, 'අරුණෝදයේ මුදල් ඉල්ලමින් ණයහිමියන්ගේ පැමිණීම් සහ "ගෙවන්න. ගෙවන්න.'' යැයි කීම අදාළ නොවීම' බව බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ (S.I,171). ණයගැතියෙකුට භික්ෂුවක් හෝ භික්ෂුණියක් විය නොහැකි බව බුදුපියාණන්

වහන්සේ නියම කළහ. එයට ප්‍රධාන හේතුව, එවිට මිනිසුන් ඔවුන්ගේ මූල්‍යමය වගකීම්වලින් රැකවරණය ලබන්නෙකු ලෙස පැවිදි සංඝයා භාවිත නොකරන නිසාය (Vin.I,76).

ණය වී සිටීම සාංකාවකට සහ කනස්සල්ලකට ප්‍රභවයක් නම්, යම් කෙනෙකුට මුදල් අවශ්‍ය අවස්ථාවේ එසේ නොමැති වීම ද එසේම වේ. මෙම ප්‍රශ්න දෙකම වළක්වා ගැනීමට ක්‍රමය නම්, යම් කෙනෙකුගේ මූල්‍ය විචක්ෂණයෙන් සකසුරුවම් කිරීම සහ සමතුලිත ජීවන රටාවක් (සමං ජීවකං) පවත්වා ගෙන යාමත්ය. වර්තමානයේ බොහෝ මිනිසුන් ණයබර වන්නේ ඔවුන්ගේ මූලික අවශ්‍යතා නිසා නොව, කාලීන මෝස්තරවලට අනුකූලවීමට අවශ්‍ය නොවන දේවල් සඳහාය. එසේ නැත්නම්, ඔවුන්ට අවශ්‍ය දේ ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් බලා සිටීම වෙනුවට අවශ්‍ය දේ වහාම ලබා ගැනීමට උවමනාවක් තිබීමයි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ:'සමතුලිත ජීවන රටාවක් යනු කුමක් ද? යම් කෙනෙකු තමන්ගේ ආදායම සහ වියදම් යන දෙකම දනී, එසේම පමණ ඉක්මවා වියදම් නොකරයි, කාලකණ්ණිකමට ද ජීවත් නොවෙයි, වියදම් කිරීමෙන් පසු ආදායම් මට්ටම එතරම් ඉහළ මට්ටමක පවතින බවත්, වියදම් ආදායම් නොඉක්මවන බවත් දැන ගැනීමයි' (A.IV,282).

මෙයින් ඔබ්බට, සමහර පුද්ගලයන් ඔවුන්ගේ වර්තමාන තත්ත්වය, දැනටමත් ප්‍රමාණවත් හා සුරක්ෂිත වුවත්, එය වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙන්, ව්‍යවසායක ප්‍රයත්නයක් සඳහා මුදල් ණයට ගැනීමට පෙළඹෙනු ඇත. මෙය කලින් සිතා

බැලීමෙන් සහ වෙහෙස මහන්සිවී කළහොත්, සහ ආයතනය සදාචාරාත්මකව යහපත් නම්, බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් බලන්නේ නම්, නීත්‍යානුකූල වන්නේ නම්, එය වැඩි තෘප්තියක් සහ සතුටක් ලබා ගැනීමට මාර්ගයක් විය හැකිය. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ 'තමන්ගේ ව්‍යාපාරය දියුණු කිරීම සඳහා ණය මුදලක් ලබාගෙන එය දියුණු වූවානම්, ඔහුගේ ණය පියවා විවාහ වීම සඳහා තවත් මුදල් ඉතිරිව තිබෙන්නට පුළුවනි. එවිට ඔහු මෙසේ සිතන්නට පුළුවනි. ''කලින් මම ණයබරව සිටියෙමි. නමුත්, දැන් මම ණයෙන් නිදහස්ව ඇත්තෙමි. තවත් මුදල් ඉතිරිව ද තිබේ.'' එවිට ඔහු ප්‍රීති ප්‍රමෝදයට පත් වේ, සතුටට පත් වේ' (D.I,71). කුඩා ව්‍යාපාරිකයෙකුට එක් අතකින් විශ්වාසයක් ඇති කර ගත හැකි අතර, පොලී කලට වේලාවට ගෙවන්නේ නම් ණයක් පහසුවෙන් ගත හැකි බවද බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.I,117). බලන්න **දියුණුවීමේ අභිලාෂය සහ ප්‍රාර්ථනාව, ව්‍යවසායික හැකියාවන් සහ දිවිපෙවෙත**

ඉසිපතන - බලන්න **සාරනාත්**

## ඉතිවුත්තක

ඉතිවුත්තක යනු බුද්දක නිකායේ කුඩා පොතක් වේ. එය සූත්‍ර පිටකයේ පස්වන කොටසයි. (බුදුදහමේ පූජනීය ග්‍රන්ථවන ත්‍රිපිටකයේ දෙවන කාණ්ඩයයි) ඉතිවුත්තක යන නමේ අර්ථය 'කියූ පරිදි' යන්නයි. එම කෘතියේ කෙටි දේශනා හෝ සූත්‍ර 112ක් සෑම එකකම අග පැදියක් සහිතව ඇත. වෙනත් බොහෝ දේශනා මෙන් නොව, මේවා ආරම්භ වූයේ ඒවා දේශනා කළ ස්ථානය සඳහන් කිරීමෙන් නොවේ.

සම්ප්‍රදායට අනුව, ඒ සියල්ලම දේශනා කර ඇත්තේ බුදුපියාණන් වහන්සේ කොසඹෑ නුවර සිටය. රජමැදුරේ සිටි බුජ්ජුත්තරා නමැති දාසියක් ඒවාට සවන් දෙමින්, මතකයට නඟමින් අනෙක් අයට බෙදා දෙන ලදී.

*The Itivuttaka*: *The Sayings of the Buddha*, trans. by J.D. Ireland, 1991.

## ජෛන ආගම

ජෛන ආගම යනු ක්‍රි. පූ. 7වන ශතවර්ෂයේ දී පමණ පාර්ශ්ව ඉසිවරයා විසින් ආරම්භ කරන ලද ආගමයි. බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය ලැබීමට වසර 20කර පමණ පෙර, තවත් මුණිවරයෙකු තමන් ප්‍රබුද්ධ වූයේ යැයි ද, ඊට පසු පාර්ශ්වගේ ඉගැන්වීම්වලට නව ජීවයක් දෙන්නට සහ ජෛන පැවිදි විනය ප්‍රතිසංස්කරණය කරන්නට කටයුතු කළ බව ද කියා ඇත. මෙම පුද්ගලයා නායපුත්ත, හෝ නාතපුත්ත යන නමින් බෞද්ධ ග්‍රන්ථවල සඳහන් වේ. එසේම ඉතිහාසයේ සඳහන් වන්නේ මහාවීර (මහා වීරයා) වශයෙනි. පාර්ශ්වගේ විනය පිළිපැදීම නොකඩවා පවත්වාගෙන ගිය තවුසන් තනි වස්ත්‍රයක් ඇඳ සිටි අතර, මහාවීරගේ ශ්‍රාවකයන් නිරුවතින් සිටි බව පෙනෙන්නට තිබුණි. පළමු බෞද්ධයන් ජෛන ජාතිකයන් සමග කුළුපග වූ අතර, ඔවුන් නිසන්ඨයන් හෙවත්, බැඳීමක් නැති අය ලෙස හඳුන්වන ලදී (D.I,57). ජෛන භික්ෂූන්ගේ ප්‍රධාන පුරුදු අතරින් එකක් හතරරැල්ලක සංවරය වශයෙන් හැඳින්වුණි (S.I,66). මහාවීර තමන් සියල්ල දත් අයෙකු (M.II,31) වශයෙන් හඳුන්වා ගත් බව, ජෛන ධර්ම ග්‍රන්ථවල සඳහන්ව තිබෙන බව ත්‍රිපිටකයේ සඳහන් වේ. හිතා මතා කළ හෝ නොකළ සෑම ක්‍රියාවකින්ම කර්මයක් ඇති වේ යැයි මහාවීර ඉගැන්වූයේය. නමුත් බුදුපියාණන් වහන්සේ ස්ථිරව ප්‍රකාශ කර සිටියේ හිතා මතා කළ ක්‍රියාවන්ට පමණක් කර්මානුකූල

ප්‍රතිඵල ඇතිවන බවයි. මෙම වෙනසෙන් ආගම් දෙක අතර තවත් බොහෝ වෙනස්කම් පසුව ඇති වේ. බුදුපියාණන් වහන්සේ බොහෝ විට මහාවීරගේ ශ්‍රාවකයන් සමග සාකච්ඡා කළහ, නැතහොත් තර්ක කළහ. උන්වහන්සේ සහ මහාවීර අතර මුහුණට මුහුණලා කිසිදිනක හමුවීමක් නොවීය. ජෛන ආගම සහ බුදුදහම ප්‍රතිවාදී වුවත්, සහ 'විවාදශීලී' (Sn.381) වශයෙන් ජෛනයන් ත්‍රිපිටකයේ බැහැර කළත්, ආගම් දෙක අතර බොහෝ සමාන දේ ද තිබුණි. මෙම මෘදු පැවිදි ඇදහිල්ල කෙරෙහි යම් මට්ටමකින් බුදුපියාණන් වහන්සේට නැඹුරුතාවක් තිබූ බව පැහැදිලිය. එසේ තිබියදීත්, ඇතැම් ජෛන ධර්ම, විශේෂයෙන්ම ජෛන පැවිද්දන් පුහුණු කළ ස්වයං-අත්ථකිලමථය පිළිබඳව ද බුදුපියාණන් වහන්සේ විවේචනාත්මක වූහ.

මේවා සහ වෙනත් දර්ශනවාදී ප්‍රශ්න සම්බන්ධයෙන් ඇති නොගැළපීම් තිබියදීත්, බුදුදහම මෙන්ම ජෛන ආගමත් සැමවිටම ඉවසනසුලු ආගමකි. ප්‍රසිද්ධ ජෛන නිර්මාණයක් වූ නාලඩියාවේ මෙසේ සඳහන් වේ: 'ගවයන් විවිධ හැඩවලින් සහ වර්ණවලින් යුක්ත නමුත් ඔවුන් ලබාදෙන්නාවූ කිරි සැමවිටම සුදුපැහැයෙන් යුක්තය. ආගමික නිකායන් බොහෝය, සහ විවිධය. නමුත් ඒ සියල්ලෙන්ම උගන්වන්නේ ගුණයහපත් කමෙන් යුක්තව ජීවත්වීමයි.' ශතවර්ෂ ගණනාවක් ආගම් දෙක ආධිපත්‍යය සඳහා එකිනෙකා සමග තරඟ කළහ. නමුත් බුදුදහම අවසානයේ ප්‍රමුඛ බවට පත්විය. සදාකල්හිම ජෛන ආගම සුළු ආගමක් ලෙස පැවතුණි. වර්තමානයේ ඉන්දියාවේ මිලියන 3ක් පමණ ජෛන භක්තිකයෝ ප්‍රධාන වශයෙන් බටහිර ගුජරාට් දේශයේ සිටිති. සුළු

ප්‍රමාණයක්, නමුත්, උදේ‍යාගිමත් ජෛන ප්‍රජාවෝ බ්‍රිතාන්‍යයේ ද සිටිති. බලන්න **නිරුවත්බව සහ නිකායන්**

*The Jains*, Paul Dundas, 2002.

## ජාතක

ජාතක යනුවෙන් අදහස් කරන්නේ 'උත්පත්තිය පිළිබඳවයි'. බුද්දක නිකාය සූත්‍ර පිටකයේ පස්වන කොටසයි. එහි ජාතක කථා 547ක් අඩංගු වේ. සමහරක් මුළුමනින්ම කෙටි වන අතර, අනෙක් ඒවා ඉතා දීර්ඝ, කරුණාව, වික්ෂණශීලී බව, අවංකත්වය, ස්වයං කැපකිරීම, ධෛර්යය සහ අධිෂ්ඨානශීලී බව වැනි බෞද්ධ ගුණාංග රූපවලින් පැහැදිලි කර ඇත. මෙම කථා බොහොමයක චරිත සත්ත්වයන්ය. මුල් කාලීන බෞද්ධයන් මෙම කථා බොහොමයක් ඉන්දියානු ජනප්‍රවාද සහ ප්‍රබන්ධ කථාවලින් ලබා ගත් අතර, ඒවා බෞද්ධ බවට පත් කළේ එක් එක් කථාවේ වීරයා සැබැවින්ම බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ පෙර භවයන්හි බෝධිසත්ව ලෙස බව පවසමින්ය. අනෙක් ජාතක කථා සම්පූර්ණයෙන්ම බෞද්ධ නිර්මාණ වේ. ජාතක කථාවන්හි දින සඳහන් කිරීම ඉතා දුෂ්කර වේ. බොහෝ කථා නිශ්චිතවම බෞද්ධ කාලයට පෙරවන අතර, ඒවායේ වර්තමාන ස්වරූපයෙන්, බොහොමයක් සමහර විට ක්‍රි. පූ. 3වන සහ 1වන ශතවර්ෂ අතරදී රචිත ඒවා විය යුතුය.

සෑම ජාතකයකම කොටස් හතරක් අඩංගු වේ. සෑම කථාවකටම පෙර, දීර්ඝ හැඳින්වීමක් (නිදානකථාවක්) ඇති අතර, එයින් කියන්නේ බුදුකෙනෙකු වීම සඳහා බුදුපියාණන් වහන්සේට තිබූ අභිලාෂයේ සිට පළමු

ආරාමය ආරම්භ කිරීම දක්වාම උන්වහන්සේගේ සාම්ප්‍රදායික ජීවිතය ගැනයි. කතන්දර සම්බන්ධයෙන් ගත් කල, සෑම කෙනෙකුම 'වර්තමාන කථාවකින් (පච්චුප්පන්න වණ්ණ) හැඳින්වීමකින් අරඹයි. බුදුපියාණන් වහන්සේ එම කථාව පැවසීමට හේතු දක්වමින්, සහ 'සම්බන්ධතාවයක්' (සමොධාන) සමගින් අවසාන වේ. එහි චරිත හඳුනාගෙන ඇත. කතන්දර (අතීත වත්ථු) ගද්‍යයෙන් යුක්ත වන අතර, ඒවා තුළ කාවද්දා ඇති පද (ගාථා) වේ. එහි මුළුමණින්ම පද 2500ක් පමණ ඇත. බුදුපියාණන් වහන්සේගේ සත්‍ය වචන ලෙස සලකනු ලබන්නේ මෙම පද පමණි.

ඔවුන්ගේ සජීවී කථා වස්තුවේ සිදුවීම් අතර ඇති සබඳතාව, මනාව නිර්වචන කරන ලද චරිත සහ හාස්‍ය විහිදෙන ජාතක දීර්ඝ කාලයක් තිස්සේ ඉතා ජනප්‍රිය වූ බෞද්ධ සාහිත්‍යවලින් එකකි. ඊසොප්ගේ සමහර ප්‍රබන්ධ කථා සහ තවත් බොහෝ ජනකථා එකතුවෙහි මූලාරම්භය ජාතක පොත විය හැකි බව විද්වත් ජනතාව විශ්වාස කරති.
*The Jātaka*, trans. by R. Chalmers, H.T. Francis, E.B. Cowell and W.H.D. Rouse, 1990

## ජේතවනය

ජේතවනය යනු සාවත්ථියේ ප්‍රධාන දොරටුවට ඔබ්බෙන් වූ ජේත කුමාරයාට හිමිව තිබූ උද්‍යානයකි. පසුකාලීන මූලාශ්‍රයවලින් කියැවෙන්නේ ජේත කුමරු කෝසලයේ රජු පසේනදිගේ පුත්‍රයා බවයි. ධනවත් වෙළෙන්දෙකු වූ අනාථපිණ්ඩික රජගහ දී බුදුපියාණන් වහන්සේ හමුවී උන්වහන්සේට සාවත්ථියට වඩින ලෙස ආරාධනය කළේය. බුදුපියාණන් වහන්සේ එම ආරාධනාව පිළිගෙන

තමන්වහන්සේට නගරයේ වැඩවසන විට නැවතීමට සුදුසු ස්ථානයක් සූදානම් කරන ලෙස අනාථපිණ්ඩකගෙන් ඉල්ලා සිටියහ. අනාථපිණ්ඩික සාවත්ථියට නැවත පැමිණි විට, බුදුපියාණන් වහන්සේට සහ භික්ෂූන්ට නවාතැන් ගැනීමට වඩාත් සුදුසු ස්ථානය ජේත කුමරුගේ සතුටු උයන බව තීරණය කළේය. පසුව ඔහු එය අදහාගත් නොහැකි මිලකට මිලදී ගත් බව විනය පිටකයේ සඳහන් වේ. අනාථපිණ්ඩික ඊට පසු එහි 'කාමර, ද්වාර මණ්ඩප, සභා ශාලා, ගිනි තැපීමට ශාලා, වැසිකිළි, සක්මන් භාවනා කිරීමට සක්මන් මළු, ළිං, නාන කාමර, නෙළුම් පොකුණු සහ ගබඩා' ඉදි කළේය (Vin.II,154-9). බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ අවසාන වසර 23න් බොහෝ කාලයක් සාවත්ථියේ සහ ඒ අවට නිරන්තරව ගත කළහ. 1863දී ජේතවන භූමිය හඳුනාගෙන ඇත. එතැන් සිට පැතිරුණු ආශ්‍රම සංකීර්ණයක් නිරාවරණය කරමින් එහි විශාල කැණීම් සිදුකර ඇත.

'Sravasti in Ancient India,' *Memoirs of the Archaeological Survey of India*, 1935.

## ධ්‍යාන

පාළි ඣාන හෝ සංස්කෘතයේ ධ්‍යාන යන වචනයේ මුල් අරුත වන්නේ 'මෙනෙහි කිරීම' හෝ 'භාවනාවේ යෙදීමයි'. නමුත්, බුදුපියාණන් වහන්සේගේ කාලය වන විට, ඕනෑම ගැඹුරු භාවනාමය මුදුන්පමුණුවා ගැනීමක්' ලෙස අදහස් කරන ලදී. මනස අපිරිසිදු තත්ත්වයේ චර්යාක්‍රමයේ සිට නොකිලිටි පැහැදිලි තත්ත්වයට වර්ධනය වන අවස්ථාවට බුදුපියාණන් වහන්සේ ධ්‍යාන ලෙස භාවිත කළහ. උන්වහන්සේ එවැනි අවස්ථා හතරක් හඳුනා ගත්තද, මේවා එකිනෙකට වෙනස් හා වෙන්වූ

ඒවා යැයි නොසිතිය යුතුයි. ඊට වඩා, එක් අවස්ථාවක් තවත් අවස්ථාවක් දෙසට ගලා යන අතර, දියුණු වීමට හෝ අඩුවී යාමට විවිධ මානසික සංඝටක තවත් අවස්ථාවකට පරිවර්තනය වේ.

ධ්‍යාන ලබා ගැනීමේ පළමු පියවර වන්නේ බාධා පහ දුර්වල කරමින් හෝ තාවකාලිකව නතර කරමින් භාවනාව වර්ධනය සහ පුහුණු කිරීමයි. මෙය ඉඳුරන් පිනවීම සහ මනසේ නුපුහුණු ස්වභාවයන්ගෙන් දූරස්ථ බවක්' (විවිචෙව්ව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි) ඇතිකර වීමේ තත්ත්වයක් සිදුකරයි. ඒ අවස්ථාවේදී සිතුවිලි අඛණ්ඩව ඇති කරන නමුත් (සවිතක්කං සවිචාරං), ඒවා බොහෝ දුරට අඩු කරයි. ප්‍රධාන වශයෙන් ප්‍රමාණයෙන් මධ්‍යස්ථ වේ. එසේම එහි සියුම්, නමුත්, සැලකිය යුතු ප්‍රීති ප්‍රමෝදයක් සහ සතුටක් (පීති සුඛ) ඇත. එවිට භාවනා කරන්නා එම ප්‍රීති ප්‍රමෝදය සහ සතුට තමන්ගේ සිරුර කෙරෙහි 'පතුරවයි, සම්පූර්ණයෙන්ම පතුරුවයි, පුරවයි සහ ව්‍යාප්ත කරයි.' (අභිසන්දෙති, පරිසන්දෙති, පරිපූරෙති, පරිප්ඵරති). මෙය පළමු ධ්‍යානය වශයෙන් බුදුපියාණෝ හැඳින්වූහ.

මෙම තත්ත්වය අඛණ්ඩව වගා කරන්නේ නම්, සිතුවිලි අවසානයේදී සම්පූර්ණයෙන්ම නතර වේ (අවිතක්කං අවිචරං), උත්සාහයෙන් තොරව මනසේ අවධානය යොමු වේ (චෙතසොකොධිභාවං), කෙනෙකුට ප්‍රීති ප්‍රමෝදය සහ සතුට පැතිරවීම අඛණ්ඩව කරන විට, ගැඹුරු ලෙස අභ්‍යන්තරයේ සන්සුන් බවක් (අජ්ඣත්තං සම්පසාදනං) ඇති වේ. මෙය දෙවන ධ්‍යානය ලෙස හැඳින් වේ.

කාලයාගේ ඇවෑමෙන්, ප්‍රීති ප්‍රමෝදය (පීති ච විරාග) පහව යයි. උපේක්ෂාව (උපේක්ඛා), පැහැදිලිව පෙනෙන සිහිකල්පනාව සහ මනා අවබෝධය (සතිසම්පජඤ්ඤ) පැහැදිලි බවට පත් වේ. පුද්ගලයා සතුට (සුඛ) අත්විඳියි. මෙය සාමාන්‍යයෙන් ප්‍රබුද්ධ අයට පමණක් ලැබෙන විශේෂ වූ ප්‍රතිලාභයකි. මෙය තුන්වන ධ්‍යානය වශයෙන් හැඳින් වේ.

සිව්වන සහ ඉහළම ධ්‍යානයේ දී, පුද්ගලයෙකු සියලුම කායික සහ මානසික සතුටින් සහ වේදනාවන්ගෙන් (සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බේව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා) ඉවත් වේ. සම්පූර්ණයෙන්ම පිරිසිදු වූ උපේක්ෂාව සහ සිහිකල්පනාව හැර (උපෙක්ඛාසති පාරිසුද්ධං, D.I,73-75) මනස සෑම දෙයකින්ම හිස් වේ.

ධ්‍යානවල ප්‍රධාන කොටස් තුන වන්නේ ධනාත්මක හැඟීම්, සිහිකල්පනාව සහ උපේක්ෂාව බව සැලකිල්ලට ගත යුතුයි. භාවනායෝගියා ධ්‍යාන ඉරියව්වෙන් එළියට පැමිණි පසුත්, අඛණ්ඩව පවතින ප්‍රීති ප්‍රමෝදය සහ සතුට, චිත්තවේගී අපහසුතා සහ අතීත මානසික රිදීම් අහෝසි කරන්නට උපකාරී වේ. ඒ අනුව, මනස ලිහිල් කරගැනීමෙන් සහ සන්නිවේදනය තුළින් ගැඹුරු තෘප්තියක් ලැබේ. සිහිකල්පනාවෙන් සිටීමෙන් දේවල් පිළිබඳ පැහැදිලි විනිවිදයන දැක්මක් ඇතිකර ගැනීමට ඉඩකඩ සැලැස් වේ. ඒ අතර, උපේක්ෂාව ඕනෑම දෙයකට පැටලීමෙන් වළක්වයි. භාවනා කරන්නා නිශ්චල සෝදිසියෙන් සිටින කේන්ද්‍රයක් බවට පත් වන අතර,

ක්‍රමයෙන් එය ප්‍රඥාවෙන් පිරී තිබෙනු ඇත.
*The Path of Serenity and Insight*, H. Gunaratna,1985.

**ජීවක කොමාරභච්ච**

ජීවක කොමාරභච්ච යනු බුදුපියාණන් වහන්සේගේ වෛද්‍යවරයා වූ අතර, බෞද්ධ වෛද්‍ය විද්‍යාවේ පියා ද වේ. සම්ප්‍රදායයනට අනුව, ඔහු රජගහ ජීවත්වූ ගණිකාවකගේ පුත්‍රයාය. ඔහුගේ උත්පත්තිය සිද්ධවීමෙන් පසු, කූඩයකට දමා, කුණු ගොඩකට දමා තිබුණි. අභය කුමරු ඔහු එයින් බේරාගෙන දරුකමට හදාගෙන ඇත. අතරමං කළ දරුවකු සාමාන්‍යයෙන් සැකයෙන් තොරව, සුනඛයන් සහ කපුටන් කා දමනු ඇත. නමුත්, ඔහු හමුවන විට, ජීවත්ව (ජීවති) සිටියේය. ඒ නිසා ජීවක යනුවෙන් හඳුන්වනු ලැබුණි. ඔහුගේ නමේ දෙවන කොටස සමහර විට පැමිණ ඇත්තේ ප්‍රස්වවේදය සහ ළමාරෝග පිළිබඳව සංස්කෘත නාමය වූ කෝමාරභ්‍රත්‍ය යන වචනයෙනි. ඔහු වැඩුණු පසු තක්කසිලාවට (උතුරු පකිස්තානයේ නූතන තක්සිලාව) යවන ලදී. එහිදී ඔහු වසර හතක් ආත්‍රෙය මුණිවරයන්ගෙන් වෛද්‍ය විද්‍යාව ඉගෙන ගත්තේය. ඔහු රජගහට නැවත පැමිණි විට, දක්ෂ වෛද්‍යවරයෙකු වශයෙන් ඉතා ඉක්මණින්ම ගෞරවයට පත්විය. අවසානයේ ඔහු බිම්බිසාර රජුගේ රාජ සභාවේ වෛද්‍යවරයා වශයෙන් පත්කරනු ලැබුණි.

ජීවක බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකු බවට පත් වී උන්වහන්සේට සහ ඕනෑම භික්ෂුවකට හෝ භික්ෂුණියකට උන්වහන්සේලා රෝගී වූ විට, ප්‍රතිකාර කළේය. ඔහුට ලස්සන අඹ උයනක් රජගහ නුවර

හරියටම නැගෙනහිරට පිටතින් තිබුණි. ඔහු එය බුදුපියාණන් වහන්සේට පූජා කළ අතර, පසුකාලීනව එය විශාල ආරාමයක් බවට පත්කරන ලදී (D.I,47). මෙම ආරාමයේ නටබුන් 1954දී සොයාගත් අතර, පුරාවිද්‍යාඥයන් විසින් කැණීම් සිදුකරන ලදී.

බුදුපියාණන් වහන්සේ ජීවකට ධර්ම දේශනා දෙකක් සිදුකළහ. පළමු වැන්නෙන්, භික්ෂූන් සහ භික්ෂුණීන්ට මස් ආහාරයට ගත හැකි අවස්ථාවන් උන්වහන්සේ පහදා දුන්හ. දෙවැන්නෙන් තෙරුවන් සරණ ගිය සහ පංච ශීලය පිළිපදින ගිහි ශ්‍රාවකයෙකු එසේ කළ හැකි අවස්ථාවන් පැහැදිලි කළහ (M.I,369; A.IV,222). ඔහු කැපවීමෙන් සහ අවධානය දෙමින් තමන්ගේ රෝගීන්ට සලකමින් උපස්ථාන කළ ආකාරය සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ ප්‍රධාන ශ්‍රාවකයෙකු වූ සහ 'මිනිසුන්ගේ විශ්වාසය දිනා ගත්' (A.I,26) ජීවක ඇගයූහ. බලන්න **වෛද්‍යවරු සහ වාග්භට.**

## ප්‍රීති ප්‍රමෝදය

ප්‍රීති ප්‍රමෝදය (පීති) යනු සියුම් සහ වඩා යහපත් වූ සතුට දනවන හැඟීමකි. එයට සමාන දෙයකි. බෞද්ධ මනෝවිද්‍යාවේ ප්‍රීති ප්‍රමෝදය ඇතිවන්නේ සුචරිතවත් ජීවිතයක් ගතකිරීමේ ප්‍රතිඵලයක් ලෙසත්, සාර්ථක භාවනාවේ සළකුණක් ලෙසත්, වර්ධනය වන ආධ්‍යාත්මික පරිණතභාවයේ ඇඟවුමක් ලෙසත්ය. බුදුදහමේ බොහෝ විවිධ ප්‍රීති ප්‍රමෝද වර්ග හඳුනාගෙන ඇත. මුදිතාව, උදාහරණයක් වශයෙන් අනෙක් අයගේ සාර්ථකත්වයේ සහ සතුටේදී සතුටු

වීමට ඇති හැකියාවයි. බාවරී ඉසිවරයාට හුදෙක් 'බුද්ධ' යන වචනය ඇසූ සැනින් ඔහු සතුට (උදග්ග), ප්‍රීතිය (වෙදජාත) සහ ප්‍රමෝදය (අත්තමන, Sn.995) අත්විඳියි. බුදු පිළිමයක් අරමුණු කරගෙන භාවනා කරමින් කෙනෙකුට සන්සුන් ප්‍රීතියක් දැනෙන්නේ නම් එය බුද්ධාලම්බනපීතියයි. විසුද්ධිමග්ගයේ ප්‍රීති ප්‍රමෝදය එහි තීව්‍රතාව සහ එයින් ශරීරයට ඇති කරන බලපෑමට අනුව වර්ගීකරණය කර ඇත. ඒ අනුව කෙනෙකුට සුළු ප්‍රීතියක් (ඛුද්දිකා පීති), ක්ෂණික ප්‍රීතියක් (ඛණිකා පීතී), හදිසි උද්වේගයෙන් ඇතිවන ප්‍රීතිය (ඔක්කන්තිකා පීතී), ආධ්‍යාත්මික උත්තේජනය ඇති කරන ප්‍රීතිය (උබ්බෙගා පීතී) සහ හාත්පස පැතිරී යන ප්‍රීතියයි. (එරණ්ා පීතී, 143)

සමහර මිනිස්සු ප්‍රීති ප්‍රමෝදය පිළිබඳව අනතුරු අඟවති. ඒ එය ඇලීමට හේතු විය හැකියැයි සිතීම නිසාය. නමුත් බුද්ධඝෝස විද්වත් හිමියෝ මේ කරුණ පිළිබඳව වැදගත් අදහසක් ඉදිරිපත් කළහ: 'එයට ප්‍රීති ප්‍රමෝදය කියා හඳුන්වන්නේ එය සතුටු විය යුතු දෙයක් නිසාය' (Vis.143). ප්‍රීති ප්‍රමෝදය ධ්‍යානවල වැදගත් අංගයකි. එසේම අර්හත්ඵලය ලැබීමට දියුණු කළ යුතු බොජ්ඣංග ධර්ම හතෙන් එකකි. (D.II,79) බලන්න **අර්හත්ඵලය, බොජ්ඣංග ධර්ම**

## විනිශ්චය

විනිශ්චයක් (විනිච්ඡය) කිරීම යනු නිගමනයකට එළඹීම හෝ යමක් පිළිබඳව තීරණයක් ගැනීමයි.

බුදුපියාණන් වහන්සේට අනුව, මිනිස්සු ආකාර හතරකින් එකකින් විනිශ්චය කරති. 1. බාහිර පෙනුම (රූපප්පමාණ), 2. අනෙක් අයගේ මතය (ඝොසප්පමාණ), 3. ආර්ථික තත්ත්වය (ලූඛප්පමාණ), හෝ යථාර්ථය (ධම්මප්පමාණ), A.II,71) වශයෙනි.

අපි සාමාන්‍යයෙන් සන්දර්භ දෙකක් තුළ තීන්දු තීරණ ගන්නෙමු. ඒ පාර්ශ්ව දෙකක් හෝ වැඩි ගණනක් අතර විනිශ්චයක් ගැනීමට කැඳවූ විට, හෝ පළමුව පුද්ගලයෙකු හමුවූ විට හෝ ඔවුන් යම් නිශ්චිත ආකාරයකින් හැසිරෙනු දුටු විටයි. පළමු සන්දර්භය තුළදී, අපි අපගේ තීන්දුව සම්බන්ධ පාර්ශ්වයන්ට දැනුම් දෙන්නෙමු. එසේම, බලාපොරොත්තු වන ආකාරයට, එමගින් ඔවුන් අතර යම් මතභේදයක් තිබේ නම්, එය සමනය වේ. දෙවැන්න නම්, අප සම්බන්ධ වන පුද්ගලයන් පිළිබඳව විනිශ්චයන් කිරීම සාමාන්‍යයෙන් සිදු කරනු ලබන්නේ අපගේ මනසෙහි පෞද්ගලික භාවය තුළයි. කෙසේ වෙතත්, එය ඔවුන් පිළිබඳව අප සිතන ආකාරය කෙරෙහි බලපානු ඇත - ඒ ගෞරවයෙන් හෝ අවඥාවෙන්, විශ්වාසයෙන් හෝ සැකයෙන්, අකැමැති හෝ උදාසීනත්වයෙන් වශයෙනි. සැබැවින්ම, අප ඔවුන් පිළිබඳව ඇති කරන්නාවූ මතය, අනෙක් අතට, අප ඔවුන්ට සලකන ආකාරය කෙරෙහි බලපානු ඇත. කාරණය එසේ තිබියදී, විශේෂයෙන්ම විවේචනාත්මක වීමේදී, අන් අය විනිශ්චය කිරීමේදී, අප ප්‍රවේශම් විය යුතුයි. සමහර විට ප්‍රධාන වශයෙන් බෞද්ධයන් ගැන සැලකිලිමත් වන ආකාරයේ විනිශ්චයක් ගැන සඳහන් කිරීම ද සුදුසු විය හැකිය. පුද්ගලයෙකුගේ වර්තමාන

තත්ත්වයන් තුළ නැවත ඉපදීම සඳහා කුමන ආකාරයේ කර්මයක් කළ යුතු ද යන්න පිළිබඳව හෝ ඔවුන් දැන් කරන ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස නැවත ඉපදෙන්නේ කොතැන ද යන්න පිළිබඳව දැඩි ආප්තවාදී ස්වරූපයකින් සැලකිය යුතු තරම් උනන්දුවක් දක්වන එක්තරා ආකාරයක බෞද්ධයෙකු සිටී. එවැනි අනුමාන කිරීම් සඳහටම ඉතාම සුභවාදීව දුර්වල අනුමානයක් පමණක්ම වේ. කර්මයේ සියුම් හා අන්තර් සම්බන්ධිත ක්‍රියාකාරකම් සකස් කිරීමට උත්සාහ දැරීම සාමාන්‍ය පුද්ගලයෙකු උමතු කරන්නට ප්‍රමාණවත් යැයි බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.II,80). මෙයට හේතුව කර්මයේ ක්‍රියාකාරීත්වය නොපැහැදිලි නිසා නොවේ, නමුත්, අනෙක් අයගේ මනසේ සිදුවන්නේ කුමක් ද යන්න, ඔවුන්ගේ චේතනා හෝ ඔවුන්ගේ ක්‍රියාවල සම්පූර්ණ පරාසය පවා සැබැවින්ම අපට කිසි විටක දැනගැනීමට නොහැකි නිසාය. ගිහි ශ්‍රාවකයෙකු වූ මිගසාල මෑතකදී මියගිය කිහිප දෙනෙකු යම් යම් තත්ත්වයන් යටතේ නැවත ඉපදී ඇති බව විශ්වාසයෙන් යුතුව කියන බව අසන්නට ලැබුණු බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ:'මනුෂ්‍ය චරිතවල සංකීර්ණත්වය දැන ගැනීමට තරම්, මේ මිගසාල කවිද? ... උන්වහන්සේ මෙසේ ද පැවසූහ: 'අනෙක් අයගේ විනිශ්චයකරුවෙකු නොවන්න, අනෙක් අය විනිශ්චය නොකරන්න. අනෙක් අය විනිශ්චය කරන අය තමන්ටම හානියක් කර ගනිති' (A.III,351). මිනිසුන් සම්බන්ධයෙන් අප ගන්නාවූ විනිශ්චයන් වැරදි වීමට ඉඩ ඇති බව පැහැදිලිව පෙනෙන සම්භාව්‍යතාවට අමතරව, අන් අය විනිශ්චය කිරීම තමා ගැනම ආඩම්බර වීම සහ ස්වයං ධාර්මිකතාව පිළිබඳ ලක්ෂණයක් හෝ

මතුවීමක් ද විය හැකිය. එය අපගේ සදාචාරාත්මක දුර්වලතා සහ අඩුපාඩු පිළිබඳ අවධානය වෙනත් අතකට හැරවීමේ ක්‍රමයක් ද විය හැකිය. එසේ වුව ද, මිනිසුන් පිළිබඳව විනිශ්චයන් කිරීමට අපට අවශ්‍ය වන අවස්ථා බොහොමයක් තිබේ - අපගේ දරුවා රැකබලා ගැනීමට ළදරුවන් රැකබලා ගන්නා පුද්ගලයා එයට සුදුස්සෙකු ද, අපගෙන් මුදල් ණයට ගන්නා අය එය ආපසු දීමට තරම් අවංක පුද්ගලයෙකු ද, අපගේ වාහනය අළුත්වැඩියා කළ හැකියැයි කියන කාර්මිකයාට එසේ කළ හැකි ද වශයෙනි. අපට වඩාත් බුද්ධිමත් තේරීම් කිරීම සඳහා අපගේ විනිශ්චයන් යථාර්ථය පිළිබිඹු කිරීම සහතික කරනු පිණිස අපට කුමක් කළ හැකි ද? බුදුපියාණන් වහන්සේ මෙම නිවැරදි උපදෙස දුන්හ:'ඉක්මන් විනිශ්චයක් කිරීමකින් යමෙකු නිවැරදි නොවේ. ප්‍රඥාවන්තයා කාරණයක දෙපැත්තම සාධාරණත්වය, අපක්ෂපාතීත්වය, සත්‍යය පිළිබඳව විමසිලිමත්ව, ප්‍රඥාවන්තව සහ අනවශ්‍ය කඩිමුඩිය නොමැතිව බලයි. එවැනි පුද්ගලයෙකු ධාර්මික පුද්ගලයෙකු යැයි කියනු ලැබේ' (Dhp.256-7). බුදුපියාණන් වහන්සේ මෙහි නිර්දේශ කළ පළමු දෙය නම් කඩිමුඩියේ හෝ ආවේගශීලීව (අසාහන) විනිශ්චයන් නොකළ යුතු බවයි. මිනිසුන් ඇතුළත් කළ බොහෝ දේවල් බහු-ආංශික වන අතර, ඒවා සම්පූර්ණයෙන්ම හෙළි කිරීමට කාලය ගත වේ. ඒ හා සමානවම, යමක් පිළිබඳව දැනුම සාමාන්‍යයෙන් දත්ත රැස්කිරීමේ ක්‍රියාවලියක අවසානයේදී පෙනීමට පටන් ගැනේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කඩිමුඩියේ කරන ලද ඕනෑම විනිශ්චයක් වැරදි විය හැකි යයි කීම සුරක්ෂිත වේ, නැතහොත්, අඩුම තරමින් අර්ධ වශයෙන් එසේ

වේ. දේවල් බහු-ආංශික වූ විට, එය අනුගමනය කිරීමේදී ඒවා නිරීක්ෂණය කරන ලද දෘෂ්ටිකෝණයට අනුව ඒවා වෙනස් ලෙස පෙනෙන්නට ඇත. ඒ නිසා බුදුපියාණන් වහන්සේ අපට උපදෙස් දුන්නේ 'කාරණයක දෙපැත්ත දෙසම බලන්න' (අත්ථං අනත්ථඤ්ච උභො නිච්ඡෙය්‍ය). ආරවුලකදී විවිධ පාර්ශවයන්ගේ මත ලබා ගැනීම, පුද්ගලයෙකු පිළිබඳ හුදෙක් වැරදි පමණක් නොව හොඳ කරුණු ද සැලකිල්ලට ගැනීම, අපට නොහික්මුණු ලෙස හැසිරුණු පුද්ගලයා සාමාන්‍යයෙන් එසේ නොවන, නමුත්, එදින නරක දවසක් වූයේ යැයි සැලකීම වැනි දේ මෙයට උදාහරණයක් විය හැකිය. සාධාරණත්වය (ධම්මෙන) සහ අපක්ෂපාතීත්වය (සාම) යන ගුණාංග නිර්වචනය කිරීම සැමවිටම පහසු නොවේ. නමුත්, මේ දෙකේම වැදගත් අංගයක් වන්නේ සලකන ආකාරයේ ඇති සමානත්මතාවයි. සමහර කරුණු අනෙකට වඩා වැඩියෙන් ඉස්මතු නොකිරීම, සියලු සාක්ෂි සැලකිල්ලට ගැනීම සහ ඒ සියල්ල කල්පනාකාරීව යෝග්‍යතාව සලකා බැලීම සැමවිටම විචක්ෂණශීලී වේ.

බුදුපියාණන් වහන්සේගේ කාලයේ දී, වෙනත් බොහෝ සංස්කෘතීන්හි මෙන්ම, ඉන්දියාවේ සාධාරණ සහ අපක්ෂපාතී ලෙස සාකච්ඡා කිරීමේ සංකේතයක් ලෙස තරාදියක් (තුලා) භාවිත කරන ලදී (Dhp.268). ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේ දී, අපගේ ආශාවන්ගෙන් එක් ආකාරයකින් හෝ වෙනත් ආකාරයකින් හෝ අප ප්‍රාර්ථනා කළ දෙය සත්‍ය වීමෙන්, බලපෑම් ඇති වීම පහසුය. විශ්වාසය ඇති කරවන්නට මානබලන

වංචාකාරයන්ට බොහෝ විට අනෙක් අය රවටන්නට හැකි වන්නේ ඔවුන්, එය විනිශ්චය අපැහැදිලි කරන බව දනිමින් තමන්ගේ කෑදරකම උත්තේජනය කරන නිසාය. ප්‍රඥාවන්තයා විනිශ්චය කිරීමේ දී පෞද්ගලික හැඟීම් ලුහුබැඳ ඒම වැළැක්වීමට උත්සාහ කරමින් 'සත්‍ය ගැන විමසිල්ලෙන්' (ධම්මස්ස ගුත්තො), කරුණු පිළිබඳව දනිමින් රැඳී සිටියි.

සමහර විට අපට බුදුපියාණන් වහන්සේගේ ප්‍රඥාවන්ත අවවාදයට තවත් එක් දෙයක් අවසානයට එකතු කළ හැකිය. ඒ පායාසි සූත්‍රයේ අවධාරණය කර ඇති කරුණකි (D.II,347-8). අපගේ උපරිමයෙන් කරනලද්ද හොඳම විනිශ්චය වන අතර, සැම විටම විවෘත මනසකින් සිටීම හොඳය. මේ ආකාරයෙන්, පසුකාලීන අත්දැකීම් හෝ අතිරේක කරුණු අපගේ ආරම්භක විනිශ්චය වැරදි යැයි කියා පෙන්වන්නේ නම්, අපට එය යෝග්‍ය සේ සකස් කිරීමට හැකි වනු ඇත. අසාධාරණයක් යනු වෙනස් කිරීමට එකඟ නොවන මතයක් වන අතර, අසාධාරණකම් බොහෝ පුද්ගලාන්තර සහ සමාජීය ගැටලු රාශියකට හේතුවකි. බලන්න **විවේචන**

## කාලාම සූත්‍රය

කේසපුත්තිය සූත්‍රය ලෙස වඩාත් නිවැරදිව හැඳින්වෙන කාලාම සූත්‍රය බුදුපියාණන් වහන්සේගේ වඩාත් ප්‍රසිද්ධ සහ සිත්ඇදගන්නා දේශනාවලින් එකකි (A.I,188 ff). ඔබමොබ යන ගුරුවරු බොහොමයක් කේසපුත්ත ඇතුළු විවිධ නගරවල ඔවුන්ගේ ආගම ප්‍රවර්ධනය කරමින් සහ අන් අයගේ ආගම්වලට අගෞරව කළහ. නගරවැසියෝ මෙම ගුරුවරුන්ට උනන්දුවෙන් සවන් දුන් නමුත්, ගැටුම්කාරී මත සහ ප්‍රකාශයන්ගෙන් සම්පූර්ණයෙන්ම ව්‍යාකූල වූහ. බුදුපියාණන් වහන්සේ කේසපුත්ත වෙත වැඩිය විට, එහි මිනිස්සු උන්වහන්සේට මේ බව පැවසූහ: 'මේ ගුරුවරුන්ගෙන් කවරෙකු සත්‍ය කථා කරන්නේ ද, කවරෙකු අසත්‍ය කථා කරන්නේ ද පිළිබඳව අපට සැකයක් ඇත, අප ව්‍යාකූල වී ඇත.' සියලු ගැටුම්කාරී මත පෙර කී ලෙස, මිනිසුන්ට ඒ ආකාරයෙන් හැඟීම ස්වභාවික බව බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ. ඊට පසු උන්වහන්සේ අවවාද කළහ:'කාලාමයෙනි, ආරංචියෙන් හෝ පරම්පරාවෙන් ආ නිසා හෝ 'මෙහෙමලු' යන කටලු කථා නිසා හෝ 'මේ අපගේ පිටක (ආගමික ග්‍රන්ථ) සම්ප්‍රදාය'යි සිතීමෙන් හෝ තර්ක හේතුවෙන් හෝ නය හේතුවෙන් හෝ 'මේ කරණය යහපත් වගේ පෙනේ යයි කල්පනා කිරීමෙන් හෝ 'මෙය අප සිතා බලා සතුටින් පිළිගත් දෘෂ්ටියට ගැළපේ' යයි

සිතීමෙන් හෝ 'මොහු සුදුස්සෙකැ'යි සැලකීමෙන් හෝ 'මොහු අපගේ ගුරුය' යන හැඟීමෙන් හෝ නො පිළිගනු. යම් විටක මේ දේ අයහපත්ය, අකුසලය, වරදය' යි ඔබටම වැටහෙන්නේ ද එවිට ඒ අත්හැර දමනු. එසේම යම් විටෙක මේ දේ යහපත්ය, කුසලය, නිවරදියයි ඔබටම වැටහෙන්නේ ද, එවිට ඒ පිළිගෙන පිළිපදිනු.' ඒ නිසා හුදෙක් තමන්ගේම ධර්මය ප්‍රවර්ධනය කරනවා වෙනුවට, සප්‍රමාණ දැනුම සඳහා මාර්ගය වූයේ සහ නොවූයේ මොනවාද යන්න දැකගැනීමට උපකාර වන ආකාරයෙන් සිතන්නට බුදුපියාණන් වහන්සේ කේසපුත්තගේ මිනිසුන් ධෛර්යමත් කළහ. බුදුපියාණන් වහන්සේට අනුව, පෞද්ගලික අත්දැකීම් වෙනත් මාර්ගවලට වඩා සත්‍යයට නිවැරදි මඟ පෙන්වීමකි. බුදුපියාණන් වහන්සේ කාලාම සූත්‍රය දේශනා කළ කෙසපුත්ත ගම දැන් කෙසරිය නමැති ගම්මානය වශයෙන් හඳුනාගෙන ඇති අතර, එය ඉන්දියාවේ බිහාරියේ වේසාලියේ උතුරු බටහිර කිලෝමීටර් 50කට පමණ නුදුරින් පිහිටා ඇත. විශාල පැරණි ස්තූපයකින් මෙම ස්ථානය සලකුණු වේ. බලන්න **වාද විවාද සහ හේතුධර්මවාදය**

*Kalama Sutta, The Buddha's Charter of Free Inquiry*, trans. by Soma Thera, 1981.

**අනුස්සව** - නැවත නැවත ඇසීමෙන් ලබාගත් දෙයට, නොයන්න.

පරම්පරා - වට අනුව,

**ඉතිකිරා** කටකතා මත

**පිටක සම්පදාන** - පූජනීය ලියවිල්ලක ඇති දේ මත

**තක්ක හේතු** - අනුමාන කිරීම් මත

**නය හේතු** - පිළිගත් න්‍යායන් මත

**ආකාර පරිවිතක්ක** - මතුපිටින් සත්‍ය ලෙස පෙනෙන එහෙත් ව්‍යාජ තර්කන

**දිට්ඨි නිජඣාන් අක්ඛ අන්තියා** -හිතාමතාම මතයකට පක්ෂව

**භබ්බ රූපතාය** - කෙනෙකුගේ පෙනෙන්නට තිබෙන හැකියාව මත

**සමනො නො ගරු** - භික්ෂුව අපගේ ගුරුවරයා වේ යැයි සලකා බැලීමෙන්

## කර්මය

කම්ම නමැති පාලි වචනයෙන් අදහස් කරන්නේ 'ක්‍රියාව' යන්නයි. බෞද්ධ ධර්මයෙන් අදහස් කරන්නේ ඕනෑම හිතා මතා කළ මානසික, වාචික හෝ කායික ක්‍රියාවකි. කර්මයේ ඵලය හෝ ප්‍රතිඵලය විපාක වශයෙන් හැඳින් වේ. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'අභිප්‍රාය කර්මය යැයි මම කියමි. එයට හේතුව පළමුව සිතා, පුද්ගලයෙකු කයෙන් ක්‍රියා කරයි, කථා කරයි හෝ සිතයි.' සෑම සිතා මතා කළ ක්‍රියාවක්ම විඥානය වෙනස් කරයි (A.III,415). එයින් චරිතයක් ගොඩනැගෙයි. එයින් අප වටා ඇති ලෝකයට හැසිරීම, අත්දැකීම සහ අපගේ සබඳතාවලින් බලපෑමක් ඇති වේ. ධනාත්මකව සිතාමතා කළ ක්‍රියා (ත්‍යාගශීලීත්වය, කරුණාව, ආදරය සහ ප්‍රඥාවෙන් පෙළඹුණු) ධනාත්මක ලෙස අත්විඳින ප්‍රතිවිපාක දෙසට නැඹුරු වේ. ඍණාත්මකව හිතාමතා කරන ක්‍රියා (ලෝභය, වෛරය සහ මෝහයෙන් පෙළඹුණු) ඍණාත්මක ලෙස අත්විඳින ප්‍රතිවිපාක දෙසට නැඹුරු වේ. සමහර විට බුදුපියාණන් වහන්සේගේ සියලු ඉගැන්වීම්වලින්

වඩාත් වැරදියට වටහා ගත් දේ කර්මය පිළිබඳ ධර්මයයි. වඩාත් නිතර සිදුවන වැටහීම්වලින් සමහරක් පහත දැක් වේ :

1. කර්මය යනු විශ්වයේ පුද්ගලයන්ගෙන් ස්වාධීන වූ නමුත්, ඔවුන් මත ක්‍රියා කරන බලවේගයක් හෝ ශක්තියකි. බුදුපියාණන් වහන්සේ පැහැදිලි කළේ කර්මය යනු චේතනාව (චේතනා) ලෙස අර්ථ දැක්වීමේ දී එය විඥානයේ ක්‍රියාකාරීත්වයක් හෝ ගතිලක්ෂණයක් බවයි. උන්වහන්සේ මෙසේ කියමින් මෙම කාරණය යළිත් ඉස්මතු කළේය: 'මනෝවිද්‍යාත්මක සංසිද්ධීන් මනස විසින් කලින් සිදුකරයි. මනස නායකයා ලෙස තබා ගනී, ඒවා මනසින් සිදු කරන ලද ඒවාය. කෙනෙකු නපුරු මනසකින් කථා කරයිද, හෝ ක්‍රියා කරයිද, ගවයා පසුපස රෝදය යන්නා සේ ... දුක් වේදනා පසු පස යයි. කෙනෙකු පිරිසිදු මනසකින් කථා කරයිද හෝ ක්‍රියා කරයි ද, සෙවනැල්ලක් සේ සතුට ද එම පුද්ගලයා පසු පස යයි.' (Dhp.1,2)

2. අපට සිදුවන සෑම දෙයක්ම අපගේ අතීත කර්මවල ප්‍රතිඵලයි. මෙය දෛවවාදයට මඟ පෙන්වන වැරදි සහ අනර්ථකාරී අදහසකි (A.I,173). සැබැවින්ම, දේවල් සිදුවීමට, අවම වශයෙන් පුළුල් හේතු පහක්වත් බුදුදහම විසින් හඳුනාගෙන ඇත. කර්මය එයින් එකක් පමණි. අනෙක් ඒවා නම් ස්වභාව ධර්මයෙන් සිදුවන (ධම්මනියාම), ජීව විද්‍යාත්මක නියාම (බීජ නියාම), භෞතික නියාම (උතුනියාම) සහ මනෝවිද්‍යාත්මක නියාම (චිත්තනියාම, As.854).

3. කර්මය අතිශය සරල කළ සහ එක් දිසාවකට සීමා වූ භාෂිතයෙන් දකින්නට හැකිය, ඒ හොඳ හෝ නරක, සහ එහි ප්‍රතිඵල ධනාත්මක හෝ ඍණාත්මක ආදී වශයෙනි. මිනිස් විඥානය සහ චේතනා බොහෝ විට බොහෝ සෙයින් වඩා සංකීර්ණ සහ සියුම් වෙනස්කම් ඇති බව දැන ගැනීමට තරම් බුදුපියාණන් වහන්සේ හොඳ මනෝවිද්‍යාඥයෙක් වූහ. ඒ නිසා තවත් බොහෝ සියුම් ප්‍රතිඵල ලැබෙනු ඇත. සදාචාරාත්මක මධ්‍යස්ථ ක්‍රියාවන්හි ප්‍රතිඵලවල කර්මානුකූල ප්‍රතිවිපාක පිළිබඳව උන්වහන්සේ කථා කළහ. අනෙක් වේලාවල උන්වහන්සේ 'සදාචාරාත්මකව මිශ්‍ර වූ' (වීතිමිස්සා ධම්ම, M.I,318) ක්‍රියා ගැන සඳහන් කළහ.

4. අපගේ අතීත කර්මවල විපාකවලින් අපට කිසිවිටක ගැලවිය නොහැක. මෙය සත්‍ය නම්, අපගේ ජීවිත සම්පූර්ණයෙන්ම තීරණය කරනු ලබන්නේ අපගේ අතීතය අනුවයි. ඒ නිසා අපට වෙනස් වී නිර්වාණය අවබෝධ කරගත නොහැකිය (A.I,249). බුදුදහම උගන්වන්නේ විවිධ ප්‍රබල හිතා මතා කළ යහපත් ක්‍රියාවන් අයහපත් ක්‍රියාවක් සහ ප්‍රතිලෝම වශයෙන් ඉතා හොඳින් වෙනස් කළ හැකි හෝ අහෝසි කළ හැකි බවයි (Dhp.173). ඒ අනුව, අප අපගේ කර්මය විසින් තීරණය කරනවාට වඩා, පාලනය වන්නේ යැයි කීම නිවැරදිය.

5. වර්තමාන ජීවිතයේ අපගේ අත්දැකීම් අපගේ මීට පෙර ජීවිතයේ අප කළ දේ මත සිදු වේ යැයි සහ අප දැන් කරන දේ අනාගත ජීවිතයේ ප්‍රතිඵල ගෙන දෙයි යන මෙම අදහසට විරුද්ධව,

බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'කර්මයේ ප්‍රතිඵල, තුන් ආකාරයැයි මම කියමි, ඒ මේ ජීවිතයේ අත්විඳීමට, හෝ ඊළඟ උත්පත්තියේදී, හෝ පසු අවස්ථාවක වශයෙනි' (A.III,415). අපගේ ක්‍රියා බොහොමයක ප්‍රතිඵල ඒවා කළ වහාම හෝ ඉක්මණින් ඇති විය හැකිය. ඒ වර්තමාන ජීවිතයේදීම සිදුවීමයි.

6. කර්මානුකූල බොළඳකම, යනු ඔබ මෙම ජීවිතයේදී භික්ෂුවකට පයින් ගැසුවොත්, ඊළඟ ජීවිතයේ දී එක කකුලක් පමණක් ඇතිව ඉපදේ, නැතහොත්, ඔබ මේ ජීවිතයේදී පරුෂ වශයෙන් බැණ වදින්නේ නම්, ඊළඟ භවයේදී කට ගඳ ගහන්නේ යැයි, හෝ මේ ජීවිතයේ දී ඔබ ත්‍යාගශීලී නම්, ඊළඟ ජීවිතයේ දී පොහොසත් වන්නේ යැයි සිතීම වැනි දේය. සැබවින්ම මේවා වඩා නිවැරදිව කියනවා නම්, මෝඩ සිතුවිලිය.

7. එයට හේතුව කර්මය මූලිකවම මනෝවිද්‍යාතමකයි (අදහස), එහි විද්‍යමානවීම මූලිකවම මානසික වේ. එය අපගේ කායික ස්වරූපයට හා තත්ත්වයන්ට බලපාන්නේ මනසට කය කෙරෙහි බලපෑම් කළ හැකි මට්ටමට පමණි. උදාහරණ වශයෙන්, දික්ගැස්සුණු අසහනයක් කායික රෝගයක් ඇති කිරීම හෝ උග්‍ර කළ හැකිය. කර්මය අප කෙරෙහි ඇති කරන ප්‍රධානතම බලපෑම නම් අපට හැඟෙන ආකාරය (ප්‍රීතිමත්, මධ්‍යස්ථ හෝ අසතුටුදායක) සහ අප නැවත ඉපදෙන්නේ කුමන විෂය පථයේද යන්නයි. බලන්න **සාමූහික කර්මය, නියතිවාදය සහ තුන්ආකාර අවබෝධය**

## කපිලවත්ථු

ශාක්‍ය වංශිකයන්ගේ ප්‍රධාන නගරය කපිලවත්ථු වූ අතර, එය සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ ඔබමොබ යන තවුසෙකු වීමට පෙර ජීවිතයෙන් බොහෝ කාලයක් ගත කළ ස්ථානයයි. තමන්වහන්සේ තරුණ කාලයේදී ග්‍රීෂ්ම ඍතුවට, වර්ෂා කාලයට සහ ශීත ඍතුවට වශයෙන්, සෑම එකකටම විවිධ වර්ණයෙන් ලිලීමල් සහ නෙළුම් මල් සහිත පොකුණු සහිත නිවාස තුනක් තිබූ බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.I,145). නගරය 'ධනවත්, සශ්‍රීක, ජනගහනයෙන් පිරුණු සහ වඩා සංකීර්ණ ලෙස ජනයා පදිංචි' විය (S.V,369). එනමුත්, එය ගමක් (ගාම Sn. 683) ලෙස පමණක් සඳහටම හැඳින්විණ. එයට සභා ශාලාවක් (සන්ථාගර සාලා) තිබූ අතර, වැඩිහිටි ශාක්‍යයෝ ව්‍යාපාර පිළිබඳව සාකච්ඡා කිරීමට පැමිණියහ (D.I,91). කපිලවත්ථුවට බුදුපියාණන් වහන්සේ වැඩිය එක් අවස්ථාවක එහි නව සභා ශාලාව ආරම්භ කිරීමේ උත්සවයට ආරාධනය කරනු ලැබුණි. මෙයට සූදානම් වෙමින් ශාලාවේ කලාල එලා, පිටත ජලය සහිත කලයක් තබා, ලාම්පු එල්ලා තැබූ බව දැනගන්නට ලැබුණි. බුදුපියාණන් වහන්සේ අසුන් ගෙන ඇත්තේ ප්‍රධාන කණුවක් අසලය (M.I,353-4).

පසුව, ජනප්‍රවාදවලට අනුව, කපිලවත්ථුව උත්කෘෂ්ට නගරයක් බවට පත්වූ බව කියැ වේ. නමුත්, එය බොහෝ දුරට පාලකයාගේ වළව්ව වටා ඉදිකරන ලද කුඩා ජනාවාසයක් විය හැකිය. බුදුදහම ඉන්දියාවෙන්

අතුරුදහන් වීමෙන් පසු, මෙම ස්ථානය වනාන්තරයෙන් වැසී ගියේය. එය 1973දී නිශ්චිතවම හඳුනාගෙන ඇත. පුරාවිද්‍යා කැණීම්වලින් හෙළිවූයේ, බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ටික කලකට පසු, ඉදි කරන ලද පළමු ස්ථූපය සහ පසුකාලයේ වෙනත් නිර්මාණයන් බවයි. සිද්ධාර්ථ කුමරු 'හිමාලය කඳු පාමුල ඉපදී හැදී වැඩුණු බව නිතර කියැවෙන නමුත්, මෙය නිවැරදි නොවේ. ශාක්‍ය රට 'හිමාලයෙන් ආරක්ෂා කරනු ලැබුවේ' කඳු පාමුල නොවන බව ධර්ම ග්‍රන්ථවල සඳහන් වේ (Sn.422). සිද්ධාර්ථ කුමරු උපත ලැබූ කපිලවත්ථු සහ ඒ අවට ලුම්බිනී භූමි භාගය සම්පූර්ණයෙන්ම පැතලිය. හිමාලය කඳු පාමුල ආරම්භ වන්නේ තවත් කිලෝමීටර් 20ක් පමණ උතුරට ඔබ්බෙහිය.
*Discovery of Kapilavatthu*, K.M.Srivastava,1986.

## කර්ම

කර්ම යනු කම්ම නමැති පාළි වචනයේ සංස්කෘත ස්වරූපයයි.

## කථාවත්ථු

කථාවත්ථු යනු නොගැළපීම් පිළිබඳ ග්‍රන්ථයයි. අභිධම්ම පිටකයේ පස්වන ග්‍රන්ථයයි. සම්ප්‍රදාය එය ආරෝපණය කරන්නේ අශෝක රජු විසින් කැඳවන ලද තුන්වන බෞද්ධ සභාවේ සභාපති වූ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ වෙතය. එසේ නම්, එය ත්‍රිපිටකයේ ඇතුළත් කළ යුතු නවතම ග්‍රන්ථවලින් එකක් විය යුතුය. බුදුපියාණන් වහන්සේගෙන් පසු පළමු ශතවර්ෂ කිහිපය තුළදී

නූතන බවට පත්ව ඇති, බුදුදහම පිළිබඳ වැරදි වැටහීම් 200ක් පමණ කථාවත්ථුවේ ප්‍රතික්ෂේප කරයි. එය සාමාන්‍යයෙන් මෙසේ කරන්නේ තර්කානුකූලවයි. සාමාන්‍යයෙන් යථාව හෝ සාමාන්‍ය බුද්ධිය මත එකඟවයි. නමුත් වඩාත් සාමාන්‍යයෙන් සූත්‍රවලින් උද්ධෘතයන් උපුටා දැක්වීමෙනි. වැදගත් දෙය නම්, එය විනය පිටකය හෝ අභිධම්ම පිටකයෙන් කිසිම උද්ධෘතයක් උපුටා නොදැක්වීමයි.
*Points of Contraversy* trans. by S.Z. Aung and Mrs C.A.F. Rhys Davids, 1915

## ඛුද්දක නිකාය

ඛුද්දක නිකාය, සූත්‍ර පිටකයේ පස්වන කොටසයි. ඛුද්දක යන වචනයේ අර්ථය වන්නේ කෙටි හෝ අඩු යන්නයි. මෙම කොටසේ ඇතුළත් වී ඇත්තේ අනෙක් නිකාය හතරට පහසුවෙන් ගැළපීමට නොහැකි සියලු ග්‍රන්ථයි. ඛුද්දක නිකායේ ග්‍රන්ථ 15ක් ඇති අතර, ඉතාම වැදගත් ඒවා වන්නේ ධම්මපදය, උදාන, ඉතිවුත්තක, සුත්ත නිපාත, ථේරගාථා, ථේරිගාථා සහ ජාතකයි. අනෙක් ග්‍රන්ථ අට ලියා ඇත්තේ පසුවයි. ඒවායෙන් බුදුපියාණන් වහන්සේගේ මුල් ඉගැන්වීම් ගැඹුරෙන් අවබෝධ කර ගැනීමට ඇත්තේ ස්වල්ප වැදගත් කමකි.
*A Textual and Historical Analysis of the Khuddaka Nikaya*, O. Abhayanayake, 1984.

## කරුණාවන්ත බව

කරුණාවන්ත බව (අවෙර හෝ සඞ්ගහ) යනු රැකවරණය, මිත්‍රශීලීත්වය, මෘදුබව සහ ආදරය ඇති ආකල්පයක් අන් අය කෙරෙහි දැක්වීම පිළිබඳ පොදු භාෂිතයකි. බුදුපියාණන් වහන්සේ බොහෝ විට අපට අවවාද කර ඇත්තේ හුදෙක් කරුණාවන්ත වීම හෝ

කාරුණිකව සිතීමට නොව, නමුත්, 'කරුණාවන්ත වන්න' (දයාපන්න), වීම හෙවත්, එය අපගේ ක්‍රියාවන් තුළින් ප්‍රකාශ කළ යුතු බවත්ය (M.I,288; A.IV,249). අව්‍යාජ කරුණාව යනු ආත්මාර්ථකාමීත්වය හෝ වෙනත් කෙනෙකු කෙරෙහි ආධිපත්‍යය දැරීමට හෝ රිදවීමට ඇති ආශාවෙන් තොර වීමයි. එය ත්‍යාගශීලීත්වය, උපකාරවන, අන් අය මන්දගාමී හෝ අදක්ෂ වූ විට ඉවසීම, ප්‍රසන්න ආකාරයෙන් කථා කිරීම, ආගන්තුකයන්ට නිවසේ සිටින හැඟීමක් ඇති කිරීම සහ යම් කෙනෙකු වෙනුවෙන් අමතර සැතපුමක් යාම වැනි දේ සඳහන් කළ හැකිය. කෙටියෙන් කිවහොත්, කරුණාව යනු, කථාවෙන් සහ ක්‍රියාවෙන් ප්‍රකාශ වන ආදරයයි.
*The Dalai Lama: A Policy of Kindness*, Sydney D. Piburn.

## රජවරු සහ රජකම

රජෙකු (මනුජින්ද, නරින්ද හෝ රාජ) යනු රාජකීය පෙළපතක් ඇති පරම්පරාගත පිරිමි පාලකයෙකි. රජෙකු 'පුරුෂයන් අතර ප්‍රධාන' (රාජ මුඛං මනුස්සානං, Sn.568) බව බුදුපියාණන් වහන්සේ විස්තර කළහ. රජකමක ආරම්භය සහ ස්වභාවය සම්බන්ධයෙන් විවිධ ආගම්වල විවිධ මත ඇත. බයිබලයෙන් කියන්නේ සියලු පාලකයන් ඔවුන්ගේ බලය ලබා ගන්නේ දෙවියන් වහන්සේගෙන් බවයි. ඒ අනුව, රජුට කීකරු වීම දෙවියන් වහන්සේට කීකරු වීම බවයි. (රෝමන්වරු 13, 1-2). යුරෝපයේ මෙම ධර්මය 'රජවරුන්ගේ දිව්‍යමය අයිතිය' වශයෙන් දැනගන්නට ඇත. කොන්ෆියුෂියානු ධර්මය 'දෙව්ලොව වරම' (තින්මිං) නමින් එවැනිම අදහසක්

ඉගැන්විය. ෂින්ටො, බ්‍රාහ්මණ ආගම සහ පසුව හින්දු ආගමට අනුව, සැබැවින්ම රජවරු දෙවියන් වූහ. රජෙකුගේ නීත්‍යානුකූල භාවය පාලනය කිරීමට ඇති ඔහුගේ යෝග්‍යතාවෙන් නොව, දිව්‍ය කැමැත්ත හෝ අනුමැතියෙන් බව මෙම සියලු අදහස්වලින් ස්වභාවිකවම අනුගමනය කෙරේ.

බුදුපියාණන් වහන්සේට රජවරු සහ රජකම පිළිබඳව තිබුණේ සම්පූර්ණයෙන්ම වෙනස් සහ වඩා යථාර්ථවාදී සංකල්පයකි. අග්ගඤ්ඤ සූත්‍රයේ උන්වහන්සේ සත්‍ය ලෙස පිළිගත්තේ රාජාණ්ඩුව පිළිබඳ සමාජීය පොරොන්දු න්‍යායයක්ය. පැරණි කාලයේ යම් ආකාරයක ආණ්ඩුවක අවශ්‍යතාව ජනතාව දුටු බවත්, එබැවින් වඩාත් හොඳින් පාලනය කළ හැකි යැයි සිතූ පුද්ගලයෙකු ඔවුන් තමන් අතරින් තෝරා ගත් බවත් උන්වහන්සේ පැවසූහ. හින්දු සම්ප්‍රදායට අනුව, ඉන්දියාවේ පළමු රජවූයේ මහාසම්මතය. ඔහුගේ අදහසට සහාය දැක්වීම සඳහා බුදුපියාණන් වහන්සේ නැවත අර්ථකථනය ලද්දේ 'බොහෝ දෙනා විසින් තෝරාපත් කර ගත්' යන අදහස ඇතිවයි (D.III,93; Ja.II,352). ඒ අනුව, බෞද්ධ න්‍යායට අනුව, රජවරු ඔවුන්ගේ නීත්‍යානුකූල බව ලබාගත්තේ පොදු කැමැත්තෙනි, ඒ ඔවුන් පාලනය කරන මහජනයාගෙනි. රජෙකු පාලනය කිරීමට තමන්ගේ අයිතිය රඳවාගෙන සිටියේ තමන්ගේ වැසියන්ට එයින් ප්‍රයෝජනයක් ලැබෙන තුරු පමණි. කුරිරු, අයුක්ති සහගත හෝ අදක්ෂ රජෙකු බලයෙන් නෙරපා දැමීමට මිනිසුන්ට අයිතියක් ඇති බව බොහෝ ජාතක කථාවලින් අඟවා ඇත (Ja.I,326; III,513-14; VI,156). එවැනි අදහස් ඔවුන්ගේ කාලයට වඩා

බොහෝ ඉදිරියෙන් සිටි අතර, ඒවා මෙතෙක් ක්‍රියාත්මක වූ බවට සාක්කි ඇත්තේ ස්වල්පයකි.

කෙසේ නමුත්, යහපාලනය පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් රජවරුන් වඩා කරුණාවන්ත කරවීමට යම් බලපෑමක් කර ඇත. මේ සඳහා හොඳම උදාහරණය, 'සියලු වැසියන් මගේ දරුවන්ය. මගේ දරුවන් කෙරෙහි මා ප්‍රාර්ථනය කරන දේ මම ඔවුන් වෙනුවෙන් ද ප්‍රාර්ථනය කරමි - ඔවුන්ගේ සුභසිද්ධිය සහ සතුට, මේ ලෝකයේ දී සහ ඊළඟ භවයේදී' යැයි අව්‍යාජ ලෙස අශෝක රජුගේ පැවසීමයි.

ත්‍රිපිටකය සහ පසුකාලීන සාහිත්‍ය බෞද්ධ සාරධර්මවලට අනුකූල වන ලෙස රජවරුන්ට අවවාද කරන අතර, සාමාන්‍ය හැඟීම නම්, රජවරුන් අත්තනෝමතික, හිතුවක්කාර, සැපයෙහි ගැලුණ සහ කුරිරු අය ලෙසයි. 'රජවරු චපල මනසින් යුක්තයි', 'රජවරු කෘරයි', 'අතිශය දැඩි ගින්නක් මෙන්, රජවරු ළංවීමට අන්තරාදායකයි' (Ja.IV,432; V,345; VI,419). සමහර අය පිළිබඳව විස්තර කර ඇත්තේ 'ඇසේ ඇති දූවිලි මෙන්ය, සුප් එකක ඇති වැලි කැට මෙන්ය, විලුඹේ ඇති කටුවක් මෙන්ය' (Ja.II,240). මිලින්ද රජු නාගසේන හිමියන්ගෙන් ධර්මය පිළිබඳව සාකච්ඡාවක් පැවැත්විය හැකි දැයි ඇසූ විට, ''ඔබට රජෙකු මෙන් නොව, උගත් පුද්ගලයෙකු ලෙස එසේ කළ හැකි නම්, මම ඔබ සමග සාකච්ඡා කරමි.'' පැවසූහ. මේ දෙදෙනා අතර ඇති වෙනස කුමක් දැයි රජු ඇසූ විට, නාගසේන හිමියෝ පිළිතුරු දුන්හ : 'උගත් අය සාකච්ඡා කරන විට, විශ්වාසයන් පෙරළා දමයි, න්‍යායයන් අවුල් කරයි, ප්‍රකාශයන් ප්‍රතික්ෂේප

කරයි. අදහස් පිළිගනියි, කරුණු ඉදිරිපත් කරයි, වෙනත් කරුණු ඒවාට විරුද්ධව ඉදිරිපත් කරයි. රජවරුන් සාකච්ඡා කරන විට, ඔවුන් යමක් කියා, ඒවා සමග එකඟ නොවන අයට දඬුවම් කරයි' (Mil.28-9).

රජවරුන් හොඳ වුණත්, නරක වුණත්, ඔවුන්ට බොහෝ බලයක් තිබුණි. ඔවුන් සමග ආරවුල් ඇති කර ගැනීම වැළැක්වීම සඳහා බුදුපියාණන් වහන්සේ සමහර පැවිදි නියමයන් වෙනස් කළහ. අධිරාජයා ආරක්ෂා කිරීම සඳහා, බුදුපියාණන් වහන්සේ කියා සිටියේ තමන් රජුට ඉටුකළ යුතු වගකීම් සම්පූර්ණ කරන තුරු අපේක්ෂකයන්ට සංඝ සාසනයට ඇතුළත් විය නොහැකි බවය (Vin.I,39). රජුට අවශ්‍ය වුවහොත් විනය නීති වෙනස් කළ හැකි විය (Vin.I,137). භික්ෂූන් සහ භික්ෂුණීන්ට කුමන්ත්‍රණ, ඊර්ෂ්‍යා සහ පෙළඹවීම්වලට නොපැටලවීම සඳහා රාජසභාවලින් වැළකී සිටීමට උත්සුක වන ලෙස ද උන්වහන්සේ දැන්වූහ (A.V,81) .

ත්‍රිපිටකයේ බහුල ලෙස සඳහන් රජවරු තිදෙනා වන්නේ කෝසලයේ පසේනදී, මගධයේ බිම්බිසාර සහ ඔහුගේ පුත් සහ උරුමකරු අජාසත්තු යන රජවරුන්ය. බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයෙන් වසර දෙකකට පමණ පසු කෝසලයේ අගනුවර වූ සාවත්ථියේ දී පළමු වරට පසේනදී රජ හමුවී ඇත (S.I,68). උන්වහන්සේගේ ඉගැන්වීම්වලින් හැඟීමක් ඇති වී රජු සහ ඔහුගේ අග බිසව වූ මල්ලිකා දේවිය නොබෝ කලකින් උන්වහන්සේගේ වඩාත් කැපවූ ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූහ. බුදුපියාණන් වහන්සේ සහ රජු අතර සාකච්ඡා ඇතුළත් බොහෝ දේශනා

ත්‍රිපිටකයේ සටහන්ව ඇත. සංයුත්ත නිකායේ එක් පරිච්ඡේදයක තිබෙන දේශනා සියල්ලක්ම වාගේ එවැනි සාකච්ඡා වේ (S.I,68-102). පසේනදි විසින් ධර්මය තමන්ගේ ජීවිතයට අවශ්‍යාජ ලෙස එකතු කර ගැනීම පිළිබඳව ඔහු බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට එතරම් කැපවීමක් තිබියදීත්, අනෙක් ආගම් කෙරෙහි ගෞරව දැක්වීමෙන් සහ ත්‍යාගශීලීවීමෙන් නොවැළැකීම යන කරුණෙන් තරම් තවත් හොඳින් කොහේවත් පැහැදිලි කර නැත (S.I,78; Ud.14). සම්ප්‍රදායට අනුව, පසේනදීට පුත්‍රයන් දෙදෙනෙකු සිටි අතර, ඔවුන්ගෙන් එක්කෙනෙකු වන බ්‍රහ්මදත්ත භික්ෂුවක වූයේය (Th.441-6).

බිම්බිසාර රජකමට පත් වූයේ වයස 15දී වන අතර, වසර 52ක් රජකම දැරුවේය. ඔහුට තරුණ සිද්ධාර්ථ කුමාරයා ඔබමොබ යන තවුසෙකුව සිටිය දී, උන්වහන්සේගේ බුද්ධත්වයෙන් පසු සහ වෙන්වූ පසු අවස්ථාවලදීද කෙටි වේලාවකට හමු වී ඇත. බිම්බිසාර රජු ඔහුගේ එක් සතුටු උයනක් වූ වේළුවනාරාමය ආශ්‍රමයක් වශයෙන් භාවිත කිරීම සඳහා පූජා කළේය (Vin.I,35). බෞද්ධ සම්ප්‍රදාය බිම්බිසාර රජු භක්තිමත් බෞද්ධයෙකු යැයි කියා සිටියත්, ඔහු යොමු කළ දේශනාවක් ත්‍රිපිටකයේ නැත. වෙනත් බොහෝ ඉන්දියානු රජවරු මෙන්ම ඔහුත් සියලු ආගම්වලට ආධාර කළේය. ඒ සෑම දෙනෙක්ම තමන් බුදුපියාණන් වහන්සේ තමන්ගේ එක් අනුගාමිකයකු ලෙස සඳහන් කළහ.

බිම්බිසාර රජු 'සාධාරණ සහ ධාර්මික රජ කෙනෙකු' වශයෙන් බුදුපියාණන් වහන්සේ හැඳින්වූ අතර (D.I,86), ඔහුගේ පුත් අජාසත්තු පිළිබඳව

ත්‍රිපිටකයේ සඳහන්ව ඇත්තේ කෲර, වංචනික සහ භාවි කථනීය කළ නොහැකි පුද්ගලයෙකු ලෙසය. ඔහු රජකම ලබා ගැනීම සඳහා තම පියා ඝාතනය කළේය. බුදුපියාණන් වහන්සේට විරුද්ධව කුමන්ත්‍රණය කළේය. දේවදත්තට උපකාර කළේය (Vin.II,185). ඔහුට භෞමික බලයට ආශාවන් ද තිබුණි. ඔහු කෝසලය සමග යුද්ධයකට පෙළඹවීමක් ඇති කළේය. එය ඔහුට ව්‍යසනයක් ඇති කිරීමට හේතුවිය (S.I,82-5). ඔහු වජ්ජි නගරය ආක්‍රමණය කිරීමට සූදානම් වීම සඳහා පාටලිගාම නගරයේ මායිම ශක්තිමත් කළ බව අපි කියවා ඇත්තෙමු (D.II,86). කාලයත් සමග අජාසත්තගේ මනස ඔහුගේ ඝාතනය කළ පියා පිළිබඳ සිතුවිලිවලින් හොල්මන් කරන්නට විය. ඔහු බුදුපියාණන් වහන්සේගෙන් සැනසිල්ලක් අයැද සිටියේය (D.I,47-9). සම්ප්‍රදායෙන් සඳහන් කරන්නේ අජාසත්ත වසර 35ක් පාලනය කළ බවත්, අවසානයේ ඔහුගේ පුත්‍රයා වූ උදායිභද්ද විසින් ඝාතනය කළ බවත්ය. බලන්න **සුද්ධෝදන**

‘Early Buddhist Kingship.’ B. G. Gokhale, *The Journal of Asian Studies*, Vol.26, 1966.

## දැනුම් තුන

දැනුම් තුන (තෙවිජ්ජ) යනු නිර්වාණය අවබෝධයට මොහොතකට පෙර මතුවන ඇතුළු නුවණයි. එය අවසාන අවස්ථාවේදී නිර්වාණය අවබෝධ කිරීමේදී අත්විඳින ගතිලක්ෂණවලින් එකකි. පළමුවැන්න පෙර ජීවිත පිළිබඳව දැනුමයි. (පුබ්බෙ නිවාසානුස්සති ඤාණය) එහිදී යමෙකු ඉතා පැහැදිලිව සහ විස්තරාත්මකව තමන්ගේ පෙර ජීවිතවල දීර්ඝ ප්‍රදර්ශනයක් දකී. මෙම ප්‍රබෝධමත් අත්දැකීම කෙනෙකුට ඍජු අත්දැකීම්වලින් නැවත ඉපදීම

පිළිබඳ සත්‍යතාව විමසා බැලීමට ඉඩ සලසයි. දෙවැන්න නම්, සත්ත්වයන් ඔවුන්ගේ කර්මය (සත්තානං චුතූපපාත ඤාණය) අනුව ඉපදීම සහ මිය යෑම පිළිබඳ දැනුමයි. මෙම දැනුමෙන් යමෙක් කර්මයේ සංකීර්ණ සහ සියුම් ක්‍රියාකාරකම් අවබෝධකර ගනී. සාමාන්‍ය පුද්ගලයෙකුට කර්මයේ යථාර්ථය විශ්වාස කර පිළිගන්නට හැකියාවක් තිබිය හැකි වුවත්, නිර්වාණය අවබෝධ කර ගත් පුද්ගලයෙකුට පමණක් එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව පෞද්ගලික සහ ඍජු දැනුමක් ඇති බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.III,348 ff). තුන්වන සහ දැනුම් තුනෙන් ඉතා වැදගත් වන්නේ මානසික කෙලෙස් විනාශ කිරීම පිළිබඳ අවබෝධයයි (ආසවක්ඛය ඤාණය) D.I,81-3), ඉඳුරන් පිනවීමට ඇති ආශාව, අඛණ්ඩව පැවතීමට ඇති ආශාව, අවිද්‍යාව සහ දෘෂ්ටි වශයෙනි. දැනුම් තුන මතුකර ගැනීමට ප්‍රවේශ වීමට හැකි වන්නේ මනස 'එක්තැන් කරමින්, පවිත්‍රකර, පිරිසිදු කර, නිකැලැල් කර, නම්‍යශීලී කර සහ කෙලෙස්වලින් නිදහස් කර, මෘදු කර, ස්ථීර කර, ශක්තිමත් කර සහ නොකැළඹෙන' තත්ත්වයට ගතහොත් පමණි. මෙම දැනුම්වලට ප්‍රවේශ වීමට කෙනෙකුට ඒවා කෙරෙහි 'මනස හරවා, මෙහෙය වීම' (චිත්තං අභිනීහරති අභිනින්නාමෙති) අවශ්‍ය බව ද බුදුපියාණන් වහන්සේ පැවසූහ. වෙනත් වචනවලින් කිවහොත්, සවිඥානිකව යමක් කිරීමයි (D.I,76).

වේද තුන (A.I,166; D.I,88) පිළිබඳව නිපුණත්වය ලැබූ පූජකයෙකුට බ්‍රාහ්මණ ආගමේ තුන් ආකාර දැනුම (සංස්කෘත ත්‍රෛවිද්‍යා) ඇත්තෙකු ලෙස හැඳින් වේ. බුදුපියාණන් වහන්සේ තම දැනුම සඳහා එකම

යෙදුම භාවිත කළහ. එමඟින් ඒවා බ්‍රාහ්මණ ආගමේ ඒවාට වඩා උසස් සහ වඩා වැදගත් සහ ඉහළම කුලයට පමණක් නොව සැමට ප්‍රවේශ විය හැකි විකල්ප ක්‍රියාකාරකම් ලෙස උන්වහන්සේ ඉදිරිපත් කළහ.

## කොසම්බි

කොසම්බි උතුරු ඉන්දියාවේ විශාල නගරයක් වූ අතර, වංස රාජධානියේ අගනුවර ද විය. බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ වැදගත් සිදුවීම් කිහිපයක තොරතුරු ද එහි දර්ශනය වේ. කිලෝමීටර් 6කට ආසන්න දිගින් යුක්ත තාප්පවලින් නගරය වට වූ අතර, දකුණු පැත්තෙන් යමුනා ගඟට මුහුණ ලා තිබුණි. බුදුපියාණන් වහන්සේගේ කාලයේ දී කොසම්බිහි ඉදිකරන ලද එක් ආරාමයක් වන ඝෝසිතාරාමය (M.I,320) 1951දී පුරාවිද්‍යාඥයන් විසින් හඳුනාගෙන, පසුව, කැණීම් කරන ලදී. අශෝක රජතුමා නගරයේ විශාල කුළුණක් ඉදිකර ඇති අතර, තවමත් නටබුන් අතර මෙය දැකිය හැකිය.
'Excavations at Kausambi-1949-1950,'*Annual Bibliography of Indian Archaeology*, 1969.

## කුසිනාරා

කුසිනාරා, මල්ල යන වංශයට අයත් මිනිසුන්ගේ ප්‍රධාන නගරය වන අතර, බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණය සහ ආදාහනය සිදුවූ ස්ථානයයි. 'කැලෑවේ මඩ සහ දැවවලින් ඉදි කළ නගරයක්' වශයෙන් ආනන්ද හිමියන් කර ඇති විස්තරයට අනුව එය කුඩා ප්‍රදේශයක් බව පැහැදිලිය (D.II,145).

බුදුපියාණන් වහන්සේගේ අවසාන ගමන කිලෝමීටර්

190ක් පමණ දුර වේසාලියේ සිට කුසිනාරාවලට වැඩියහ. උන්වහන්සේ වේසාලියෙන් පිටත් වූයේ වැසි කාලයෙන් (ඔක්තෝබර් මැද) පසුවය (D.II,114). කුසිනාරාවට වැඩම කළේ මාස තුනකට පසුවය. එයින් අදහස් වන්නේ උන්වහන්සේ සෑම දිනකම සාමාන්‍යයෙන් කිලෝමීටර් 2ක් වඩින්න ඇත කියාය. උන්වහන්සේ මාර්ගයේ අතරමග විවිධ ස්ථානවල නතර වූ නිසා, ඒ කොපමණ වේලාවක් ද යන්න නොදන්නා නමුත්, උන්වහන්සේ සමහර විට සැබැවින්ම ඊට වඩා සෑම දිනකම පා ගමනින් වඩින්නට ඇත. බුදුපියාණන් වහන්සේගේ වයස, සෞඛ්‍ය තත්ත්වය සහ කාලගුණය අනුව, කුමන ආකාරයට වුණත්, එවැනි ගමනක් උන්වහන්සේට වෙහෙස කර වන්නට ඇත.

බුදුපියාණන් වහන්සේ කුසිනාරාවට යාබද පෙදෙසට පැමිණි විට, උන්වහන්සේ සල් ගස් දෙකක් අතර, සැතපී, ශ්‍රාවකයන්ට අවසාන උපදෙස් දුන්හ.

උන්වහන්සේ පරිනිර්වාණයට පත් වූයේ රාත්‍රී තුන්වන යාමයේ (රත්තියා පච්ඡිමෙ යාමෙ, D.II,147) දී බව අපි අසා ඇත්තෙමු. පැරණි ඉන්දියාවේ රාත්‍රියාම කොටස් තුනකට (පඨම, මජ්ඣිම සහ පච්ඡිම), වශයෙන් ඉරුදාවේ ආරම්භ කරමින්, ඉරබසින විට අවසාන කරමින්, හැම එකක්ම සමාන දිග ප්‍රමාණයකින් බෙදා තිබුණි. එයින් අදහස් වන්නේ බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත්වූයේ මධ්‍යම රාත්‍රිය සහ ඉරුදාව අතර කාලයක දී බවයි.

ශතවර්ෂ ගණනාවක් පුරා කුසිනාරා වන්දනා

මධ්‍යස්ථානයක් වී තිබුණි. බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත් වූ සහ ආදාහනය පැවැත් වූ ස්ථාන යන දෙකේම ස්තූප දෙකක් තිබුණි. එසේම විවිධ සිද්ධස්ථාන සහ ආශ්‍රම ද තිබුණි. ඉන්දියාවේ බුදුදහම නැති වූ විට, කුසිනාරාව අත්හැර දැමුණි, කැලෑවන් වල් බිහි විය. නැවත සොයා ගත්තේ 1861 පමණය. 20වන ශතවර්ෂයේ සිදුකළ කැණීම්වලින් ස්තූප දෙකක් ඇතුළුව බොහෝ නටබුන් ප්‍රකට විය. බලන්න **දොණ, ආහාර, සංචාර, බුදුපියාණන් වහන්සේගේ සහ වෙසාඛ**

*Kusinagara*, D.R. Patil,1981.

## භාෂාව

භාෂාව (භාසා) යනු එක් විශේෂිත රටක හෝ ප්‍රදේශයක මිනිසුන් විසින් වැඩක යොදවන ලද ශබ්ද සහ සංකේත භාවිත කරමින් සන්නිවේදනය කරන ක්‍රමයකි. බුදුපියාණන් වහන්සේගේ ආවේණික භාෂාව කුමක් ද කියා නොදන්නා නමුත්, ඉන්දියාවේ උන්වහන්සේ උපන් ප්‍රදේශයේ ස්වභාෂාව විය යුතුයි. සමහර විට නූතන හින්දි භාෂාවේ දුරස්ථව බලපවත්වන්නක් විය හැකිය. අදාළ කරුණුවලින් පෙනී යන්නේ බුදුපියාණන් වහන්සේට භාෂා කිහිපයක නිපුණත්වය තිබූ බව සහ උන්වහන්සේ පුළුල් ප්‍රදේශයක් පුරා සංචාරය කරමින් ඉගැන්වීම නිසාම එසේ අපේක්ෂා කළ හැකිය (M.III,235). බුදුපියාණන් වහන්සේ 'මුල්', 'පිරිසිදු' හෝ 'ශුද්ධ' භාෂාවක් යන සංකල්පය විශ්වාස නොකළහ. උන්වහන්සේගේ අනුශාසනයෙන් පැහැදිලි වන්නේ අපට අපගේ භාෂාවෙන් ධර්මයේ සැම දෙයක්ම ඉගෙන ගත හැකි බවත්, සහ ඉගෙන ගත යුතු බවත්ය (Vin.II,139). ධර්මය ඉගැන්වීමේ දී තම ශ්‍රාවකයන් සමග වඩාත් හොඳින් සන්නිවේදනය කිරීම සඳහා උන්වහන්සේ සැම විටම තමන්වහන්සේගේ ශ්‍රාවකයන්ගේ භාෂාව තෝරා ගත්හ (D.II,109). බලන්න **පාලි**

'The Dialects in which the Buddha Preached.' K. R. Norman, *Collected Papers*, Vol.II, 2003.

## අවසාන සිතුවිල්ල ඇතිවන මොහොත

මනස, මානසික සිදුවීම්වල (විඤ්ඤාණසොත), 'ප්‍රවාහයක්' හෝ 'ධාරාවක්' බව බුදුපියාණන් වහන්සේ වටහා ගත්හ. පසුව අභිධම්ම චින්තකයන් අනුමාන කළේ එය සැබැවින්ම මහත් වේගයෙන් මතුවෙමින් සහ නැති වෙමින් යන හුදු චින්තන අවස්ථා වැලක් (චිත්තවීථි) බවයි. පසුකාලීනව, තවමත් එම න්‍යාය වර්ධනය වූයේ පුද්ගලයෙකු මිය යන විට අවසාන සිතුවිලි ඇතිවන මොහොතට (චුතිචිත්ත) අනුව, ඔහුගේ ඊළඟ ජීවිතය සකස් වන බවයි. වර්තමානයේ ථේරවාදයේ පවතින මෙම අදහස, බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට සාධාරණීය කළ නොහැකි අලුතෙන්ම මතුවූ තත්ත්වයක් බව පෙනේ. එසේම බුදුපියාණන් වහන්සේගේ කර්මය සහ සාදාචාරය පිළිබඳ ගුණයට අදාළ අදහසට පටහැණි වේ.

අවසාන සිතුවිල්ල ඇතිවන මෙහොතේ ඇති වැදගත්කම පිළිබඳ න්‍යාය බුදුපියාණන් වහන්සේගේ දේශනා කිසිවක හෝ පසුකාලීන අභිධම්ම පිටකයේවත් සඳහන් වී නැත. මිය යන විට හෝ බරපතල ලෙස රෝගාතුරව සිටින මිනිසුන්ට බුදුපියාණන් වහන්සේ උපදෙස් දුන් බොහෝ අවස්ථා ත්‍රිපිටකයේ සඳහන් වී ඇත. අවසාන සිතුවිල්ල කෙනෙකුගේ ඉරණමට සැබැවින්ම තීරණාත්මක නම්, එවැනි අවස්ථාවන් උන්වහන්සේ එසේ සඳහන් කිරීමට වඩාත් සුදුසු කාලය එය වනු ඇතැයි කෙනෙකුට බලාපොරොත්තු විය හැකිය. නමුත්, උන්වහන්සේ කිසිවිටකත් එසේ නොකළහ. වෙන

කිසි තැනකත් උන්වහන්සේ එසේ සඳහන් කළේ නැත. මහානාම වරක් තම සිත පීඩාවට හා ව්‍යාකූලත්වයට පත් වූ මොහොතක මිය යන්නට සිදුවුවොත් එයින් සෘණාත්මක උත්පත්තියකට හේතු වේය යන්න පිළිබඳව සිය සාංකාව බුදුපියාණන් වහන්සේ සමග රහසින් කිව්වේය. ඔහු දැඩි ආගමික විශ්වාසය, ගුණවත්බව, ඉගෙනීම, අත්හැරීම සහ ප්‍රඥාව බොහෝ කාලයක් දියුණු කර ඇති නිසා, එවැනි දෙයක් සිදුවීම පිළිබඳව බියවීමට කිසිවක් නොමැති බවට බුදුපියාණන් වහන්සේ ඔහුට සහතික වූහ (S.V,369).

අවසාන සිතුවිල්ල ඇතිවෙන මෙහොතේ කියනු ලබන වැදගත්කම පිළිබඳ න්‍යාය නොදියුණු ස්වරූපයෙන් පළමුව පහළ වූයේ (ක්‍රි. පූ. 1වන ශතවර්ෂයේදී) පමණ මිලින්දපඤ්හිය : 'යම් කෙනෙකු වසර සියයක් පුරා කුසලතාවෙන් තොරව කටයුතු කර, මරණය සිදුවෙන අවස්ථාවේදී එක් මෙහොතක් බුදුපියාණන් වහන්සේ පිළිබඳව සිහිකල්පනාවෙන් යුක්ත වීම නිසා ඔහු දෙවියන් අතර නැවත ඉපදේ' (Mil.80). විසුද්ධිමග්ගය රචනා කරන විට මෙම අලුතින් එක් කළ සැක සහිත අදහස විස්තරාත්මකව සකස් කර ඇති අතර, පොදුවේ පිළිගැනීමට ලක් වී ඇත (Vism.458-60). බුදුපියාණන් වහන්සේ උගන්වා නොතිබීම යන කරුණ හැරුණු විට, මෙම න්‍යාය සමග විවිධ දාර්ශනික, සදාචාරාත්මක සහ තාර්කික ප්‍රශ්න ඇත. ඒ අවසාන සිතුවිල්ල ඇතිවන මොහොත කෙනෙකුගේ ඊළඟ භවය තීරණය කරන සාධකය වීම පිළිබඳවයි.

මෙම සිද්ධාන්තයට අනුව, පුද්ගලයෙකු සාපේක්ෂව යහපත් ජීවිතයක් ගත කළත්, ඔහුගේ මරණයට හරියටම පෙර ඇති වූ කාංසාව සහ ව්‍යාකූලත්වය නිසා ප්‍රතිෂේධ සිතුවිලි ඇති වීමෙන් ඔහුට අයහපත් නැවත ඉපදීමක් ඇති වේ. ඒ හා සමානවම, යම් කෙනෙකු දුරාචාරමය සහ සල්ලාල ජීවිතයක් ගත කළ හැකි නමුත්, පහසුවෙන් සහ සැනසිල්ලෙන් මිය යාම නිසා ඔහුට වාසිදායක නැවත ඉපදීමක් ලැබිය හැකිය. සමහර විට වසර බොහෝ ගණනාවක් යහපත් හෝ අයහපත් සිතුවිලි, වචන සහ ක්‍රියා හුදෙක් තත්පර මිලියන දහසක් දිග යැයි කියනු ලබන එක් එක් මොහොතක හෝ දෙකක සිතුවිලිවලින් අවලංගු කරන්නේ කෙසේ දැයි අවබෝධ කර ගැනීම ඉතා දුෂ්කර වේ. මෙම න්‍යායට හේතු කාරකය සැලකිල්ලට ගැනීමට ද අපොහොසත් වී ඇත. සෑම දෙයක්ම කොන්දේසි සහිත නම්, බුදුපියාණන් වහන්සේ ඒ බව උගන්වා ඇත්තේ නම්, අවසාන සිතුවිලි මොහොත දෙවන අන්තිම සිතුවිලි මොහොත මගින් නිර්ණය විය යුතු අතර, එය පිළිවෙළට තුන්වන අවසාන සිතුවිලි මොහොත මගින් ආදී වශයෙන් නියම කළ යුතුය. මෙයින් අදහස් කරන්නේ අප මේ දැන් සිතන, කියන සහ කරන දේ අප මිය යන විට අපගේ මනසේ ඇති දේ කෙරෙහි බලපෑමක් ඇති කරන බවයි. එමනිසා, අවසාන සිතුවිලි මොහොත අවධාරණය කිරීම යනුවෙන් අදහස් කරන්නේ බලපෑමට අතිශෝක්තියෙන් වැදගත්කමක් ලබා දීම සහ හේතුව නොසලකා හැරීමයි. එනම්, කෙනෙකු මෙහි සහ දැන් ජීවත්වන ආකාරයයි.

අවසාන සිතුවිලි මොහොත පිළිබඳ න්‍යාය බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ වෙනත් දේ සමග හොඳින් නොගැලපේ. උදාහරණ වශයෙන් (Vism.458-60) කර්මය (කම්මවිපාක) පිළිබඳ සියුම් සහ එකිනෙකට සම්බන්ධ කටයුතු කිරීමට උත්සාහ කිරීමේදී කෙනෙකු උන්මත්තයෙකු (උන්මාද) වීමට හේතුවනු ඇතැයි බුදුපියාණන් වහන්සේ පැවසූහ. නමුත්, විසුද්ධිමග්ගයේ, මරණයට මොහොතකට පෙර, කුමක් සිදුවේද යයි සිතනු ලබන දෙය සිදු කෙරෙන අතීත කර්ම සහ ඊළඟ භවයට එයින් ඇතිවන කර්මවල ප්‍රතිවිපාක ගැන අසාමාන්‍ය සවිස්තර විස්තරයක් හඳුන්වා දෙයි. කර්මයේ සංකීර්ණතා පිළිබඳව සිතීමෙන් උමතුබව ඇති වීමට හැකිය යන බුදුපියාණන් වහන්සේගේ ප්‍රකාශය විසුද්ධිමග්ගයේ න්‍යායාත්මකව සලකා බැලීම පිළිබඳව ද අපට අනතුරු අඟවයි. මනස පිළිබඳව අභිධම්ම පිටකයේ සහ එහි අටුවාවල අඩංගු විස්තර ඒවා ලියා ඇති කාලය සැලකිල්ලට ගත් විට, සමහර විට උපකාරී වේ, සැබැවින්ම ඉතා විචක්ෂණශීලී වේ. කෙසේ වෙතත්, ඒවා කල්පිත, සමහර විට වැඩිපුර යාන්ත්‍රික සහ සරල සහ ඉදහිට සම්පූර්ණයෙන් වැරදිද වේ. එසේ තිබියදී, බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ දේ සහ ඊළඟ ශතවර්ෂවලදී උන්වහන්සේගේ ඉගැන්වීම්වලින් වර්ධනය වූ අදහස් අතර වෙනස හඳුනා ගැනීම වැදගත් වේ. බලන්න **සිතාගත නොහැකි දේ**

**ගිහි බෞද්ධයන්** - බලන්න **උපාසක සහ උපාසිකා**

## රීතිය සහ රීතියේ පොදු අභිප්‍රාය

අක්ෂරය (ව්‍යඤ්ජන) යනු යම් ප්‍රකාශයක නිශ්චිත වචනාර්ථයයි. භාවාර්ථය (අත්ථ) යනු ප්‍රකාශයක් පසුපස ඇති අභිප්‍රාය, සහ රීතියෙන් අඟවන පුළුල් සියුම් වෙනස සහ ව්‍යංගයි. බුද්ධිමත් පුද්ගලයෙකු 'වචන සහ ඒවායේ අර්ථ නිරූපනයේ දක්ෂ' (නිරුත්තිපදකොවිදො, Dhp.352) බව සහ අප 'රීතිය සහ රීතියේ පොදු අභිප්‍රාය පිළිබඳව' (D.III,127; Vin.I,20) අවබෝධ කරගෙන ධර්මය පුහුණු කළ යුතු බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. මෙයට හේතුව අපගේ ආධ්‍යාත්මික ගමන ඵලදායී වන්නේ මේ දෙක සමබරව පවත්වා ගැනීමෙන් පමණක් නිසාය. අපි රීතිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්නේ නම්, අප පොතේ දැනුම හා තාක්ෂණික දැනුම හිසින් ගත් අය, දරදඬු සහ සාම්ප්‍රදායික විශ්වාසවල අද්දරට පවා නැඹුරු වී ඇත්තෙමු. අප රීතියට ලැබීමට සුදුසු අවධානය යොමු නොකරන්නේ නම්, අප කරන්නේ ධර්ම රීතියේ පොදු අභිප්‍රාය පුහුණු කරන්නේ යැයි සම්පූර්ණයෙන්ම සිතිය හැකිය. අප සියලු දෙනා කරමින් සිටින්නේ අපට ගැලපෙන ලෙස එය අර්ථ දැක්වීමයි. රීතිය කරුණු ඉදිරිපත් කරයි. රීතියේ පොදු අභිප්‍රාය ආලෝකමත් කරයි.

රීතියෙන් පොදු අභිප්‍රාය බැහැර වූ විට, ඇති වන ගැටළු පිළිබඳ බොහෝ උදාහරණ ඇත. උදාහරණ වශයෙන් බුදුපියාණන් වහන්සේ ඉහළම වටිනාකම දුන්නේ අවංකබවටයි. අප සැම විටම සත්‍යය කිව

යුතු බව උන්වහන්සේ පැවසූහ. කෙසේ නමුත්, යම් කෙනෙකුට රිදවීමේ විශේෂ අභිප්‍රායයෙන් සත්‍යය කියන්නට පුළුවන. පදගත අර්ථය එක් දෙයක් වන අතර, හඬේ විලාසය හෝ මුහුණෙන් පළකරන දේ නිශ්චිතවම ප්‍රතිවිරුද්ධ වන යම් දෙයක්, හඟවමින් කෙනෙකුට කිව හැකිය. එසේ නැත්නම් අත්‍යවශ්‍ය කරුණු එකක් හෝ දෙකක් යෝග්‍ය ලෙස අත්හැර දමමින් හෝ අනෙක් ඒවා ඉස්මතු කරමින්, යමෙක් පවසන සෑම දෙයක්ම සත්‍ය බව කියමින්, නමුත් මුළුමනින්ම සත්‍යවාදීව තරයේ දරා සිටිමින්, සිද්ධිය පිළිබඳව සම්පූර්ණයෙන්ම වෙනස් චිත්‍රයක් ලබාදිය හැකිය. යම් කෙනෙකුගේ වචනවල නිශ්චිත අදහස අපැහැදිලි වන සේ හුදෙක් අවශ්‍ය තරමට ඇත්ත සඟවා කථා කිරීමට ද පුළුවන. ඊට පසු පහසු ආකාරයට යම් කෙනෙකු කියූ දේ ප්‍රතික්ෂේප කිරීම හෝ තහවුරු කිරීම කළ හැකිය. මෙම උදාහරණවලින් පෙන්වා දෙන්නේ කෙනෙකුට කෲර, යටි කුට්ටු, තමන්ගේ වාසියට හරවමින් හෝ වංකවෙමින් ශික්ෂාපදවල, විනයේ හෝ ධර්මයේ වෙනත් කරුණුවල රීතියට නිශ්චිතවම පිළිපැදිය හැකි බවයි.

ධර්මය කෙරෙහි ඇති මේ ආකාර වරදවා නිරූපණය කරන පෙළඹවීම් අප වළක්වා ගන්නේ කෙසේ ද? අපට උපකාර විය හැකි පළමු දෙය නම්, රීතිය එහි පොදු අභිප්‍රායට එකතු කිරීම සඳහා සැමවිටම සමස්ත ධර්මයේ සන්දර්භය තුළ බුදුපියාණන් වහන්සේගේ ඕනෑම වචනයක් තැබීමයි. උදාහරණ වශයෙන්, චෛතසික ශක්තීන් දියුණු කරන භික්ෂූන් සහ භික්ෂුණීන්ට ඒවා ප්‍රදර්ශණය නොකරන ලෙස

බුදුපියාණන් වහන්සේ නීතියක් පැණවූහ. ඊට පසු කාලයක දරුවන් දෙදෙනෙකු මං පහරන්නන් විසින් පැහැර ගෙන ගිය විට, එක් භික්ෂුවක් ඔහු බේරාගැනීම සඳහා තමන්ගේ චෛතසික ශක්තීන් භාවිත කළේය. 'නීතිය කඩ කිරීම' පිළිබඳව අනෙක් භික්ෂූහු හැම අයුරින්ම තද අප්‍රසාදය පළ කළහ. නමුත්, බුදුපියාණන් වහන්සේ එම හිමියන් සියලු වරදින් නිදහස් කළහ. ඒ එම භික්ෂුව එම විශේෂ නීතිය කඩ කර ඇති නමුත්, කරුණාවෙන් යුක්තව ක්‍රියා කරමින් ඔහු ධර්මයේ පොදු අභිප්‍රාය පිළිපැද ඇති හෙයිනි. එසේම කරුණාවන්ත වීම සැමවිටම සුළු රීති පිළිපැදීමට වඩා වැදගත් වේ. රීතිය සහ රීතියේ පොදු අභිප්‍රායට ඵලදායී එකතු වීමක් සහතික වන අනෙක් දෙය ලෙස බුදුපියාණන් වහන්සේ හැඳින්වූයේ 'මාර්ගය ඇතුළු කර ගැනීමයි' (පටිපදංයෙව අන්තරං කරිත්වා, M.III,38). අවංකව, මුළු හදවතින්ම සහ අව්‍යාජව පුහුණු වීමට අප කැපවී සිටින්නේ නම්, එය අපට වචන දැන ගැනීම සඳහා සහ ඒවායේ ගැඹුරු සහ පූර්ණ සහ පැහැදිලි අදහස දකින්නට ආත්ම විශ්වාසය සහ ප්‍රඥාව ලබා දෙනු ඇත.

## ජීවිතය

ජීවිතය (ජීවිත) යනු ජීවීන්ට උත්තේජකවලට ප්‍රතිචාර දැක්වීමට, වර්ධනය වීමට, ප්‍රජනනය කිරීමට, පෝෂණය අවශෝෂණය කර ගැනීමට, කාලයත් සමග මලපහ කිරීමට සහ දිගටම පැවතීමට ඇති හැකියාවයි. අප හා සෘජු අත්දැකීම් ඇති ජීවීන් වර්ග දෙක නම් පැලෑටි සහ සතුන්ය. බොහෝ සතුන් සම්බන්ධයෙන් ගත් කල, අළුතින් සජීවී වන ජීවයක්

පිළිසිඳ ගැනීමකින් ඇති වේ, නැතහොත්, ඉක්මණින්ම ආරම්භ වේ. පිළිසිඳ ගැනීමක් සිදුවීමට නම්, කරුණු තුනක් එකවෙලාවට සිදුවිය යුතුය - දෙමව්පියන්ගේ ලිංගික එක්වීම (සන්නිපතිත), මවගේ ඩිම්බ නිපදවීම (උතුනී) සහ ගන්ධබ්බගේ පැමිණීමයි. එනම් ඉපදීමට නියමිත සත්ත්වයාගේ විඤ්ඤාණයයි. (M.I,266). මෙම විඤ්ඤාණය සාරවත් ඩිම්බයට අවශෝෂණය වී, එය සප්‍රාණික වීමට පටන් ගෙන, සම්පූර්ණයෙන් සෑදුණු සත්ත්වයෙකු බවට වැඩේ. නූතන වෛද්‍ය විද්‍යාවේ දී මෙන්, කලල රූපය අදියර හතරක් හරහා ගමන් කරන බව බුදුපියාණන් වහන්සේ හඳුනා ගත්හ: සති 17දී පමණ හඳුනා ගත හැකි මිනිස් ලක්ෂණ වර්ධනය වීමට පෙර, ගැබ් ගැනීම (කලක), සෛල භේදනය (අබ්බුද), කලලයේ ඇතුළතට සෛල ගමන් කිරීම (පෙසි) සහ කලලයේ ජීවියාගේ ජීවාණු පටක ස්තර අභ්‍යන්තර ඉන්ද්‍රියයන් තුළට වර්ධනය වන ක්‍රියාවලියයි. (ඝන) ඊට පසු එය කලලය යනුවෙන් නම් කෙරේ(S.I,206).

සියලු ජීවීන් අන් සියල්ලටම වඩා තම ජීවිතය ආදරයෙන් රැකබලා ගන්නා නිසා, සහ මරණය වළක්වා ගැනීමට මොනව වුනත්, (Dhp.130) ඕනෑම අරගලයක් කරන නිසාත්, තවත් කෙනෙකුගේ ජීවිතය නැති කිරීම කෙනෙකුට කළ හැකි නරකම දෙය බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. මේ අනුව, ජීවිතයට ගරු කිරීම (අවිහිංසා, සංස්කෘතයෙන් අහිම්සා), ජීවිතය ප්‍රවර්ධනය කිරීම, සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම ඉහළම බෞද්ධ සදාචාරාත්මක පරමාදර්ශයන් වේ. බලන්න **ගබ්සා කිරීම**

‘Conception and Intrauterine Life in the Pali Canon.’M. Baisvert, *Studies in Religion*, 29 (3), 2000.

## ජීවිතයේ අර්ථය

ජෛව විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් බලන කල, ජීවිතයේ අර්ථය වන්නේ, අඛණ්ඩ පැවැත්ම සඳහා අවශ්‍යතා අත්පත් කර ගැනීම, ප්‍රජනනය සහ පැවැත්මයි. නමුත්, ආගමික දෘෂ්ටිකෝණයෙන් ජීවිතයේ අරමුණ කුමක් ද? සමහර ආගම් සහ දර්ශනවාදීන් තරයේ දරා සිටින ආකාරයට, ජීවිතයට තනි සහ නිශ්චිත අරමුණක් තිබේ නම්, එවිට, සෑම කෙනෙකුම ඉක්මණින් හෝ පසුව, මෙම අරමුණ ස්වාභාවිකවම සොයාගෙන එය සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරනු ඇතැයි කෙනෙකු අපේක්ෂා කරනු ඇත. සැබැවින්ම, විවිධ ආගම් මුළුමණින්ම ජීවිතයේ වෙනස් සහ සමහර විට පරස්පර විරෝධී අරමුණු සත්‍ය ලෙස පිළිගන්නා බව අපට පෙනේ. ජීවිතයට අර්ථයක් තිබේද හෝ නැද්ද යන්න කිසිම දිනයක නොඅසමින් හෝ නොසිතමින් බොහෝ මිනිසුන් ජීවිතය යහපත් කර ගැනීමට සමත් වන බව අපි දනිමු. මෙයින් ඉතා ප්‍රබල ලෙස ඇඟවෙන්නේ ජීව විද්‍යාත්මක ජීවිතයකවට එහා ජීවිතයට එක් නිශ්චිත අරමුණක් හෝ අර්ථයක් නොමැති බවයි.

බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් බලන කල, මෙය හොඳ දෙයකි - එයින් අදහස් වන්නේ අපගේ ජීවිතයට අපට අවශ්‍ය අර්ථය ලබා දීමට, නිදහස සහ හැකියාව තිබෙන බවයි. ධනය හෝ බලය එක්රැස් කිරීම අපගේ ජීවිතයේ අරමුණ බවට පත් කිරීමට අප තීරණය කළහොත්, එවිට එය සිදු වනු ඇත. විනෝදය ලුහුබැඳ යාම, අපගේ පවුල වෙනුවෙන් කැපවීම හෝ දෙවියන් මෙනෙහි කිරීම අපගේ

ජීවිතයේ අරමුණ බවට පත් කිරීමට අප තීරණය කළහොත්, එය එසේ වනු ඇත. තමන්වහන්සේගේ ශ්‍රාවකයෙකු නිර්වාණය සාක්ෂාත් කරගෙන රහතුන් වහන්සේ නමක් බවට පත් වූ විට, බුදුපියාණන් වහන්සේ සැමවිටම පැවසුවේ, ඔහු හෝ ඇය 'කළ යුතු දේ කර ඇත' යනුවෙනි. (S.III,68) මෙයින් අපට නිගමනය කළ හැක්කේ බුදුපියාණන් වහන්සේට අනුව, ජීවිතයේ අර්ථය, අරමුණ සහ තෘප්තිය වන්නේ නිර්වාණයේ ප්‍රීතිය සහ නිදහස ලබා ගැනීමයි.

## ජීවිතයේ අදියර

ශතවර්ෂ ගණනාවක් තිස්සේ දාර්ශනිකයන් සහ ස්වාභාවික ආචාරධර්ම අනුගමනය කරන්නන් මනුෂ්‍යයෙකු උපතේ සිට මරණය දක්වා යන ගමනේදී ගත කරන හෝ ගත කළ යුතු අදියර හඳුනා ගැනීමට උත්සාහ කර ඇත. බටහිර චින්තනයේ දී, මේවායින් වඩාත් ප්‍රසිද්ධ වන්නේ සමහර විට, ෂේක්ස්පියර්ගේ, මිනිසාගේ අදියර හත යි. පැරණි ඉන්දියාවේ සාම්ප්‍රදායික චින්තනයේ දී, ජීවිතයට අදියර තුනක් ඇති බවට කියනු ලැබේ: එනම් යෞවනය (පඨමවය), මැදිවිය (මජ්ඣිමවය) සහ මහලුවිය (පච්ඡිමවය, Ja.I,79). පුද්ගලයෙකුගේ ජීවිතයේ (ආශ්‍රම) සුදුසු ප්‍රගමනය විය යුත්තේ, ශිෂ්‍යයෙකු, නිවැසියෙකු, විශ්‍රාමිකයෙකු සහ අවසානයේ ආගමික තවුසෙකු විය යුතු යන අදහස හින්දු ධර්මය ක්‍රමයෙන් වර්ධනය කර ඇත.

බෞද්ධ චින්තකයන් ද මෙම විෂය ගැන සිතා බලා ඇත. පුද්ගලයෙකුගේ ජීවිතය සනිටුහන් කරන වසර

දහය බැගින් වූ අදියර දහයක් විසුද්ධිමග්ගයේ දී හඳුනාගෙන ඇත. 'මෙම දශක ගණන සම්බන්ධයෙන් ගත් කල, වසර සියයක් ජීවත් වන පුද්ගලයෙකුට පළමුවැන්න මෘදු දශකය ලෙස හැඳින් වේ. එයට හේතුව, එවිට කෙනෙකු මුදු මෙළෙක්ය, අස්ථීර ළදරුවෙකි. දෙවැන්න ක්‍රීඩා දශකය නම් වේ. එයට හේතුව එම දශකයේදී කෙනෙකු ක්‍රීඩාවට ආශා කරන නිසාය. තෙවැන්න වර්ණ දශකය වේ. මෙම දශකය තුළ කෙනෙකුගේ රූපශ්‍රීය සම්පූර්ණයෙන්ම පිබිදෙයි. හතරවන දශකය බල දශකය ලෙස හැඳින් වේ. කෙනෙකුගේ ශක්තිය මෙම දශකය තුළ ඉහළටම නගියි. ඊළඟ වසර දහය පඤ්ඤා දශකය ලෙස හැඳින් වේ. මෙම කාලය තුළ අවබෝධය ස්ථාපිත වේ. උද්‍යෝගීමත් නොවන පුද්ගලයෙකු පවා ඒ කාලය වන විට, අවම වශයෙන් යම් අවබෝධයක් ලබා තිබේ. ඊළඟ අවුරුදු දහය හානි දශකය ලෙස නම් කෙරේ. කෙනෙකු ක්‍රීඩා සඳහා, රූපය ගැන කැමැත්ත, ශක්තිය සහ අවබෝධයත් ක්‍රමයෙන් පිරිහීම ආරම්භ වේ. ඊළඟ වසර දහය පබ්භාරි දශකය ලෙස හැඳින් වේ. එයට හේතුව ඉරියව්ව පහතට නැමීමයි. ඊළඟ වසර දහය වංක දශකය ලෙස හැඳීන් වේ. කෙනෙකුගේ ඉරියව්ව මේ කාලය තුළ නගුලක් සේ නැමෙයි. අවසානයට පෙර වසර දහය මොමූහ දශකය ලෙස හැඳින් වේ. කෙනෙකු මේ කාලයේ තමන්ගේ දෙවන ලමාවියේ සිටියි. අමතකවීම ඇති වේ. අවසාන දශකය සයන දශකය වේ. එයට හේතුව වසර සියයක් ජීවත්වන්නට හැකිවන අය ඔවුන්ගේ කාලයෙන් වැඩි කාලයක් වැතිර සිටී' (Vism.619).

බුදුපියාණන් වහන්සේ ජීවිතයේ අදියරයන් පිළිබඳව තමන්වහන්සේගේම විස්තරයක් ලබා දුන්හ. වෙනත් බොහෝ දේ තිබුණනද, උන්වහන්සේ වෙනත් බොහෝ චින්තකයන්ට වඩා වෙනස් අදහසක් දුන්හ. උන්වහන්සේ පුද්ගලයෙකුගේ ජීවිතයේ අදියර හතරක් පිළිබඳව කථා කළහ. පළමුවැන්න, 'මොළොක් ළදරුවෙකු, පහසුවෙන් අවනත වන, පිටුපසට වැතිර සිටින සහ තමන්ගේම මල මූත්‍ර සමග සෙල්ලම් කරන.' මෙය පුද්ගලයෙකුගේ ආරම්භක ප්‍රසන්න අත්දැකීමක් ලෙස බුදුපියාණන් වහන්සේ හඳුනා ගත්හ. නමුත්, නොමේරූ එකකි. ඊළඟ අදියරේදී, 'දරුවා වයසින් වැඩෙන අතර, ඔහුගේ ඉන්ද්‍රියයන්ගේ පිබිදීමත් සමග, සෙල්ලම් නගුල්, ටිප් කැට්, පැනීම, කොළවලින් සෑදූ සුළං මෝල්, ටීක් බෝල, සෙල්ලම් අශ්ව රථ, සෙල්ලම් දුනු සමග සෙල්ලම් කරයි.' එවැනි ප්‍රියමනාප ක්‍රීඩා ඉහළ මට්ටමක පවතින නමුත්, අවසානයේ දී එය ද අත්හැර දමනු ඇතැයි බුදුපියාණන් වහන්සේ පැවසූහ. තුන්වන අදියරයේ දී, 'වයස් ගත වූ පසු, ඉඳුරන්ගේ සම්පූර්ණ වර්ධනයත්, සහ ඉන්ද්‍රියයන් පහේ පිනවීමෙන් ලැබෙන අත්දැකීමත් සමග, පුද්ගලයා ඇසට පෙනෙන වස්තූන්, කනෙන් අහන ශබ්ද, නාසයෙන් ගඳ සුවඳ දැනීමෙන්, දිවෙන් දැනෙන රසයෙන් සහ ශරීරයෙන් දැනෙන පහසෙන් පෙළඹවී, ග්‍රහණය වී, වශී වී සහ වස්තූන්වලට ඇබ්බැහි වේ.' අවසාන අදියරයේ දී, පුද්ගලයා ඉඳුරන් කෙරෙහි ලුහුබැඳ යාම අත් හරී, ආධ්‍යාත්මික පිපාසය අරඹයි. භාවනාව තුළින් සැනසීම සහ ප්‍රීති ප්‍රමෝදය අත්පත් කර ගනී (A.V,204-9). බුදුපියාණන් වහන්සේ එය මෙසේ විස්තර කළහ,

'පෙර පැවති ජීවන රටාවට වඩා උසස් සහ වඩා පිරිසිදුය' (අභික්කතත්රො පණීතතරො, A.V,209).

ජීවිතයේ අවධීන් පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ දැක්ම අනෙක් චින්තකයන්ගේ ඒවාට වඩා සැලකිය යුතු තරම් වෙනස් වේ. බොහෝ දෙනා අවධාරණය තරන්නේ භෞතික සාධක පිළිබඳවයි. (එනම්, ශරීරය මේරීම සහ දිරාපත් වීම). නමුත්, බුදුපියාණන් වහන්සේ අවධානය යොමු කළේ මනෝ විද්‍යාව කෙරෙහිය. තවත් බොහෝ අය විවිධ අවස්ථා ස්වභාවික, නොවැළැක්විය හැකි හෝ අනිවාර්ය ලෙස දකිති. බුදුපියාණන් වහන්සේගේ සැලැස්ම තුළ, ස්වභාවික යැයි කිව හැක්කේ පළමු අදියර තුන පමණි. ඉන්ද්‍රිය සංවේදී උත්තේජනයට ඇද ගැනීමෙන් නිදහස් වන්නට තීරණය කරමින්, මනස එහි ඉහළම හැකියාව යොදමින් සහ දියුණු කිරීමෙන් වඩාත් සම්පූර්ණ ඉරණමක් අප සඳහා උපද්දවා ගන්නට අපට හැකි බව බුදුපියාණන් වහන්සේ අපට ඉගැන්වූහ. වෙනත් බොහෝ විස්තරවලට අනුව ජීවිතයේ අදියර අවසාන වන්නේ මරණයෙනි. නමුත්, බුදුපියාණන් වහන්සේට අනුව, අවසානය වන්නේ පැහැදිලි තත්ත්වයක්, සැනසිල්ල සහ ප්‍රීතිප්‍රමෝදය වෙත ළඟා වීමෙනි. එහි දී මරණය නොවැදගත් ලෙස දකී.

## ආලෝකය

ආලෝකය (ආලෝක) යනු එක් නිශ්චිත තරංග දිග ප්‍රමාණයකින් යුක්ත විද්‍යුත් චුම්බක විකිරණයකි. ලාම්පු හෝ ඉටිපන්දම් ස්වරූපයෙන්, ආලෝකය

බෞද්ධ පූජා හෝ භාවනා උත්සවවලදී භාවිත වන ද්‍රව්‍ය තුනෙන් එකකි. අනෙක් ඒවා මල් සහ සුවඳ දුම් වේ. බොහෝ සම්ප්‍රදායයන්හි මෙන්ම, බුදුදහමේදීද, ආලෝකය රූපකයක් ලෙස භාවිත වේ. නැතහොත්, ප්‍රඥාව හෝ අවබෝධය සමග සංසන්දනය කරන්නේ එයින් ද්‍රව්‍ය දෘශ්‍යමාන වන බැවිනි. බුදුපියාණන් වහන්සේගේ පුත්‍ර රාහුල ඔහුගේ පියා හැඳින්වූයේ 'මනුෂ්‍යත්වයේ පුරෝගාමියා ලෙසිනි' Sn.336). ඇතැම් විට බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රාවකයන්ට අභියෝග කළේ මෙසේ පවසමිනි : 'ඔබලා ආලෝකය සොයන්නේ නැද්ද?' (Dhp.146). උන්වහන්සේ තමන්වහන්සේගේ රහත්ඵලලාභී ශ්‍රාවකයන් හැඳින්වූයේ 'ආලෝකය ගෙන එන්නන්' (It.80) වශයෙනි. වරක් උන්වහන්සේ තමන්වහන්සේගේ භික්ෂූන්ට මෙසේ පැවසූහ 'ඔබලා ඉදිරියෙහි බබලවන්න'(සොහෙථ). එහි අදහස ඔවුන්ගේ හැසිරීම අනෙක් අයට ආදර්ශයක් සහ ප්‍රබෝධක ආවේගයක් විය යුතුය යන්නයි. (Vin.I,187).

සැලකිය යුතු තරම් සුන්දරත්වයකින් යුක්ත උද්ධෘතයක, අච්ඡරියබ්භූත සූත්‍රයේ සිද්ධත්ථ කුමරුන්ගේ පිළිසිඳ ගැනීම නිරූපණය කර ඇත්තේ සත්ත්වයන් එකිනෙකා ගැන දැනුවත් වනසේ ලෝකයට ආලෝකයක් ගෙන එන සිදුවීමක් ලෙසය. 'බෝධිසත්ත්වයන් වහන්සේ තම මවගේ කුස තුළට බැසගත් විට, දෙවිවරුන්ගේ ආලෝකයෙන් ලෝකය බැබළුණාට වඩා වැඩි මිණිය නොහැකි ආලෝකයකින් වඩා දීප්තිමත් විය. අපගේ සඳ සහ හිරුගේ ආලෝකය බලවත් සහ තේජවන්ත වුවත්, ලඟාවිය නොහැකි ලෝකයන් අතර අඳුරේ පවා, අඳුරු අවකාශයන්හි පවා, එම ආලෝකය බබලයි.

එම අන්ධකාරයේ වෙසෙන ජීවීන් එකිනෙකා දැන හඳුනා ගෙන කල්පනා කළහ. සැබැවින්ම මෙහි වෙනත් ජීවීන් ද සිටිති' (සංක්ෂිප්ත කර ඇත, M.III,120). දැනුම්වත් බෞද්ධයන් බුද්ධ ප්‍රතිමාවක් ඉදිරියේ පහන් දැල්වූ විට හෝ පහන් තැබූ විට, ඔවුහු ප්‍රඥාවේ ඇති මහේශාක්‍ය බව සහ විමුක්තියේ බලය පිළිබඳව මෙනෙහි කරති, එය වඩාත් ඔවුන්ගේ දෛනික ජීවිතයේ කොටසක් බවට පත්කර ගන්නට අධිෂ්ඨාන කර ගනිති.

**සම්මා ආජීව**

සම්මා ආජීව (සම්මා ආජීව) යනු බුදුපියාණන් වහන්සේගේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ පස්වන පියවරයි. ආජීව හෝ දිවිපෙවත යනු ජීවත්වීම සඳහා අප කරන රක්ෂාවයි. වචනයේ පූර්ණ අර්ථයෙන් 'නිවැරදි'වීමට නම්, ජීවානෝපායක් සඳහා, 1. අවම වශයෙන් කෙනෙකුගේ මූලික අවශ්‍යතා සපුරාලිය යුතුය, 2. සදාචාරාත්මක මූලධර්මවලට අනුකූල විය යුතුයි. 3. සමාජයට ප්‍රයෝජනවත් සහ හිතකර දායකත්වයක් ලබා දිය යුතුයි. ආයුධ සහ මිනිසුන් (වහල් භාවය, මිනිසුන් ගෙන ඒම සහ පිට කිරීම, ඇතැම් ගණිකා වෘත්තීන් සහ එයින් උපයන ආදායමෙන් ජීවත්වීම), මස් වෙළඳාම සහ මත්පැන් සහ විෂ නිෂ්පාදන, නිෂ්පාදනය සහ අලෙවියේ යෙදීම වැරදි දිවි පෙවත සඳහා උදාහරණ වශයෙන් බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ. වර්තමානයේ මෙම ලැයිස්තුව සෑහෙන තරමට වැඩි කළ හැකිය. (A.III,208).

ගොවිතැන් කිරීමේදී නගුලෙන් හාරන විට බොහෝ කුඩා සතුන් මරණයට පත්වන නිසා එයින් වරදක් සිදුවේ යැයි ජෛන ආගම සැලකීය. බුදුපියාණන් වහන්සේ එය උතුම් (උක්කට්ටතා) ජීවානෝපායක් ලෙස හැඳින්වූයේ එයින් මිනිසුන්ට ආහාර සැපයෙන නිසාය (Vin.IV,6). උන්වහන්සේ පැවසුවේ 'කෙනෙකුගේ ශිල්පය ඉගෙන ගෙන නිපුණ වීම' (බාහුසච්චඤ්ඤ ච සිප්පඤ්ච) මහත් ආශීර්වාදයක් බවයි. (Sn.261)'වෙහෙස මහන්සි වී, හස්තයේ ශක්තියෙන් සහ නළලේ දහඩියෙන්, අවංකව සහ සාධාරණ ලෙස උපයාගත්' යහපත් සහ අවංක ආදායමක් ලෙස බුදුපියාණන් වහන්සේ විස්තර කළහ (A.II,67). උදාහරණ වශයෙන් ආයෝජනවලින් ලබන පොලියෙන් ජීවත්වීම නිවැරදි හෝ වැරදි ජීවානෝපායක් වන්නේ ද යන්න රඳා පවත්නේ කෙනෙකුගේ මුදල් ආයෝජනය කර ඇති දේ මතය. අපි සාමාන්‍යයෙන් වෛද්‍යවරයෙකු, හෙදියක හෝ ගුරුවරයෙකු වීම යහපත් ජීවානෝපායක් ලෙස සිතමු. නමුත්, නැවතත්, එය රඳා පවතින්නේ මෙම වෘත්තීන් ක්‍රියාවෙහි යොදවන ආකාරය අනුවයි. එබැවින් යහපත් ජීවානෝපාය යනු හුදෙක් අප කරන්නේ කවර ආකාරයේ වැඩක් ද යන්න පමණක් නොවේ, නමුත්, අප වැඩ කරන්නේ කෙසේ ද යන ආකාරයයි.

*Work as a Spiritual Practice*, Lewis Richmond, 1999.

## නෙලුම්

නෙලුම් (අරවින්ද, භිසපුප්ඵ, කමල, පදුම, පොක්ඛර, පුණ්ඩරීක හෝ මුළාලපුප්ඵ) යනු නෙලුම්බියම් ස්පෙසිඔසම් යන උද්භිද විද්‍යාත්මක නාමය සහිත

ලස්සන මලකි. එය ආසියාවේ බොහෝ ප්‍රදේශවලට ආවේණිකය. මිලින්දපඤ්හ ග්‍රන්ථයේ නෙලුම් මල විස්තර කර ඇත්තේ 'දිලිසෙන, මෘදු, ආකර්ෂණීය, සුවඳවත්, කැමැති, සොයන, අගය කරන ලද, ජලයෙන් හෝ මඩෙන් කිලිටි නොවූ, පෙතිවලින්, කේසර, සහ ඵලාවරණයකින් අලංකාර වූ, මීමැස්සන් බහුලව සිටින සහ සිසිල් සහ පැහැදිලි ජලයේ වැඩෙන' වශයෙනි (Mil.361). නෙලුම් මල් වඩා හොඳට වැවෙන්නේ මඩ සහිත පොකුණුවලය. මේරූ විට, අතිශය සුන්දර මල් ගොන්නක් පෙනෙන්ට තබන්න - සුදු, කහ, රෝස හෝ ලා රතු - ඒවා මතුපිටින් නෙලුම් මල ඉහළට මතු වෙයි. මෙම ලක්ෂණය බොහෝ විට, බෞද්ධ ධර්ම ග්‍රන්ථවල විස්තර කර ඇත්තේ අවිද්‍යාව සහ තෘෂ්ණාව ඇති ලෝකයක ජීවත්වන ප්‍රඥාවන්තයෙකු පිරිසිදු සහ සුන්දර බවට පත්වීම සඳහා එම තත්ත්වයෙන් නැගී සිටිම හා සමාන කරමින්ය (Th.700). බුදුපියාණන් වහන්සේ බොහෝ විට නෙලුම් කොළයෙන් ජල බිංදු ලිස්සා යන ආකාරය නිර්වාණයට පත් වූ පුද්ගලයෙකු ලෝකයේ පවතින පෙළඹවීම් සහ විපර්යාසවලින් වෙනස් නොවී රැඳී සිටීම ද හා සංසන්දනය කළහ (Dhp.401). මෙම හේතූන් නිසා සහ හුදෙක් එහි ඇති නිරපේක්ෂ සුන්දරත්වය නිසා බෞද්ධයන් සෑම විටම නෙලුම් මල කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වයි. බොහෝ විට නෙලුම් මල ලිලී මල සමග පටලැවේ. ලිලී මල හැඳින්වෙන්නේ ඉන්දීවර, සොගන්ධික හෝ පාළියෙන් උප්පල යනුවෙනි.

'The Lotus Symbol: It Meaning in Buddhist Art and Philosophy.' William E. Ward, *The Journal of Aesthetics and Art Criticism*, Vol.11, 1952.

## පද්මාසන (නෙලුම් මලේ) ඉරියව්ව

පද්මාසන (නෙලුම් මලේ ඉරියව්ව) (පද්මාසන) යනු සාම්ප්‍රදායිකව බොහෝ ඉන්දියානු අධ්‍යාත්මික පිළිවෙත්වල, විශේෂයෙන් භාවනා සහ යෝග පුහුණු කිරීමේදී ඉඳගන්නා ආකාරයට කියන නමයි. පුහුණු කරන්නා එක් එක් පාද කලවා මත එකිනෙකට ප්‍රතිවිරුද්ධව තබා ගනී. මේ අනුව, පාද එකිනෙකට පූට්ටුව සහ සමමිතිකව හරි කෙළින් තිබේ. දෙඅත් උකුලේ හෝ දණහිස් මත තැබිය හැකිය. මෙම ඉරියව්ව, යම් තරමක ඉරියව්ව හා බැඳුණු ස්ථාවරත්වයක් උගන්වන නමුත්, බොහෝ පුද්ගලයන්ට එයට හුරුවීමට කාලයක් ගත වේ. බොහෝ විට දීර්ඝ කාලයක් පවත්වා ගෙන යන විට අපහසුතාවක් ඇතිවන බව පැවසේ. පද්මාසන ඉරියව්වෙන් බොහෝ ප්‍රතිලාභ ලැබෙන බව ඉන්දියානු සම්ප්‍රදාය පවසයි: 'ශක්තිය', එකඟතාවකට ගෙන එයි. ස්නායු සම්බාහනය කිරීමෙන් සැහැල්ලුබව වැඩිකිරීම ආදිය සඳහා සහ භාවනාමය දියුණුව සඳහා ඒවාත් අත්‍යවශ්‍ය වේ.

සාම්ප්‍රදායික බෞද්ධ කලාවේ දී, බුදුපියාණන් වහන්සේ බොහෝ විට පද්මාසන ඉරියව්වෙන් ඉඳගෙන සිටින ආකාරයට පෙන්නුම් කර ඇත. නමුත්, පද්මාසන යන වචනය ත්‍රිපිටකයේ කොතැනකවත් නැත. වාඩි වී භාවනා කිරීමේදී සිටිය යුතු ඉරියව්ව ගැන බුදුපියාණන් වහන්සේ කිසිවක් නොකියන අතර, කෙනෙකු 'ශරීරය ඍජුව තබාගෙන' සහ පාද පල්ලන්කඹාභුජිත්වා තබා ගත යුතු බව පවසා ඇත. (M.I,56) මෙම යෙදුමෙන් අදහස් කරන්නේ දෙපා හරහට (එනම් පද්මාසන ඉරියව්වෙන්) හෝ

හුදෙක්ම නවාගෙන විය හැකිය. මෙම දෙවන ඉරියව්වෙහි, දෙපා නවා, එකිනෙකට පූට්ටුව වෙනුවට, එකිනෙකට විරුද්ධව තැබිය යුතුය. මෙම ඉරියව්ව වඩාත් සුවපහසු වන බවත්, කෙණ්ඩ පෙරළීම සහ වේදනාකාරී තද බවක් ඇතිවීමට ඇති ඉඩකඩ අඩු බවත් බොහෝ අය පවසති. ශරීරය තැන්පත් කිරීම මනස කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි වුවද සමහර විට එය සුළු වශයෙන් විය හැකිය. අවසානයේ දී කායික වශයෙන් වඩාත් සුවපහසු එක කෙනෙකුගේ භාවනාවට වඩාත් පහසු එක වේ. භාවනාව සරල සහ ස්වභාවික ක්‍රියාවලියකි, එසේ විය යුතුය. බොහෝ තාක්ෂණික අවශ්‍යතා සහ විස්තර ඉල්ලා සිටීමෙන්, මෙම ගුණාංග අහිමි වීමට හේතු විය හැකිය. බලන්න **ශරීරය**

## ආදරය

ආදරය යනු අන් අය කෙරෙහි උණුසුම් සෙනෙහසක්, උනන්දුවක් සහ සැලකිල්ලක් දක්වන හැඟීමකි. බුදුපියාණන් වහන්සේ බොහෝ විවිධාකාරයේ සහ ආදරයේ තීව්‍රතාවන් ගැන කථා කළ අතර, සමහර ඒවාට ඉංග්‍රීසි බසින් සමාන වචන නොමැත; උණුසුම් සැලකිල්ල (ආදර), සමීපත්වය (භජති), ආදරණීය කැපවීම (දළ්හභත්ත), ප්‍රසන්න ආදරය (හිත), ශෘංගාර ආදරය (කාම), ලෞකික ආදරය (ලොකස්සාදරති), මුදු මොළොක් ආදරය (මමායති), ඇල්ම (මනාප), මාතෘ ප්‍රේමය (මත්තෙය්‍ය), පීතෘ ආදරය (පෙත්තෙය්‍ය) සහ කැපවූ ආදරය (සම්භජෙය්‍ය) යනාදී වශයෙනි. නමුත් බුදුපියාණන් වහන්සේ බ්‍රහ්ම විහාර හතරෙන් පළමුවැන්න වූ මෛත්‍රිය ඉහළම ආදරය වශයෙන් හැඳින් වූහ. මෙම ආදරය

විසුද්ධිමග්ගයේ මෙසේ අර්ථදක්වා ඇත : 'ආදරයෙන් නිරූපණය කරන්නේ අනෙක් අයගේ සුභසාධනය ප්‍රවර්ධනයයි. එහි කාර්යය වන්නේ ඔවුන්ගේ සුභසාධනය පැතීමයි. එය හිරිහැර ඉවත් කිරීම ප්‍රකට කරයි. එහි ආසන්නතම හේතුව වන්නේ සත්ත්වයන්ගේ ආදරණීය ස්වභාවය දැකීමයි.' ආදරයේ වඩාත්ම වැදගත් කොටස් වන්නේ සුභද හැඟුම (අනුද්දාය), සංවේදනය (අනුද්දායනා), සහ අනුන් ගැන සැලකිලිමත් වීම (අනුද්දායිත්ත, Dhs.1056) බව ධම්මසඞ්ගනියේ සඳහන් වේ.

මානසිකව සෞඛ්‍ය සම්පන්නව සහ සතුටින් සිටීමට අප ආරම්භ කළ යුත්තේ අපටත්, අපගේ සෘජු පවුලටත් ආදරය කිරීමෙනි. අප වැඩෙන සහ පරිණත වන විට, අපගේ ආදරයට තවත් පුද්ගලයන් ඇතුළත් කිරීමට අපි ක්‍රමයෙන් ඉගෙන ගන්නෙමු - මිත්‍රයන්, බිරිඳ හෝ ස්වාමියා, නෑනා, මස්සිනා, නැන්දම්මා, මාමණ්ඩි, දරුවන් යනාදි වශයෙනි. සැබෑ ආධ්‍යාත්මික පුද්ගලයෙකු බවට පත්වීමට නම්, අපගේ ආදරය අවසාන වශයෙන් අප සම්බන්ධ වන සියලු ජීවීන් වෙත පැතිර විය යුතුයි. සීමිත බවින් වඩාත් පැතිරෙන සුලු ආකාරයෙන් ආදරය වෙනස් වන මෙම ක්‍රියාවලියේදී ආත්මාර්ථකාමීත්වය, ඊර්ෂ්‍යාවන්ත බව, බැඳීම සහ පරස්පරතා සඳහා ඉල්ලුම ක්‍රමයෙන් බැස යන අතර, ආදරය ශක්තිමත්, විචක්ෂණය රහිත සහ නිරුත්සාහක බවට පත් වේ. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට මෙසේ පැවසූහ: 'ඔබලා මේ ආකාරයට පුහුණු විය යුතුයි. : ''අපගේ මනස නොමඟ නොයයි. අපි නපුරු දේ කථා නොකරන්නෙමු. නමුත්, කරුණාවෙන් හා

අනුකම්පාවෙන් කථා කරන්නෙමු. අපි වෛරයෙන් නිදහස්ව ආදරයෙන් යුක්තව කථා කරන්නෙමු. පළමුව අපි එක් පුද්ගලයෙකුට ආදරය පතුරුවමින් පටන් ගෙන පසුව මුළු ලෝකයටම පුළුල්වූ, පැතිරෙන සුලු, අපරිමේය සහ වෛරය හෝ අමනාපය සම්පූර්ණයෙන්ම තොරවූ ආදරය පතුරුවම''. ඔබලා පුහුණු විය යුත්තේ මෙසේය' (M.I,127).

12වන ශතවර්ෂයේදී රචිත ධර්මප්‍රදීපිකා නමැති පැරණි ශ්‍රී ලංකික ග්‍රන්ථය ආදරය පිළිබඳව මෙසේ සඳහන් කරයි: ''කෙනෙකු ආදරය දියුණු කර ඇත්නම්, එය සැබැවින්ම උතුම්ය. අල්ලා ගැනීමට හෝ අයිති කර ගැනීමට ඇති ආශාවෙන් නිදහස් වේ, ඒ ශක්තිමත්, පිරිසිදු ආදරය රාගයෙන් නොකිලිටිය, ඒ ආදරය ලාභ හෝ වාසි බලාපොරොත්තු නොවේ, ඒ ආදරය වෙනස් නොවේ, ග්‍රහණය කර නොගනී, අනම්‍යයි, නැමිය නොහැකිය, මෘදුය, තැන්පත්ය, දැඩිය, නමුත්, නොරිදවයි, උපකාර කරනසුලුයි, නමුත් බාධා නොකරයි, ලැබීමට වඩා වැඩියෙන් දෙයි, ගෞරවයට පාත්‍රවෙයි, නමුත් අහංකාර නොවේ, මොළොක් නමුත් බුද්ධියට වඩා හැඟීමට බර නොවේ, එය ආදරයේ ඉහළම මුදුන්පත් කරගැනීමට මඟ සලස්වයි. එවිට එම පුද්ගලයා සියලු නොමනාප වලින් නිදහස් වේ.' බලන්න **පරහිතකාරීත්වය, එකඟතාව, කරුණාව, මෙහෙයැවීම, මැනීම් සහ කුසලතාව**

*Like Milk and Water Mixed, Buddhist Reflections on Love*,S. Dhammika, 2013.

## මෛත්‍රී භාවනාව

මෛත්‍රී භාවනාව (මෙත්තා භාවනා) යනු වඩා

කරුණාවන්ත වීමට, කුළුණු බර වීමට, මෘදු සහ ආදරණීය වීමට ඇති හැකියාව ධෛර්යමත් සහ ශක්තිමත් කිරීමට බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ පුහුණුවකි. මෙම පුහුණුව කිරීමට, කෙනෙකු සුවපහසු ඉරියව්වක ඉඳගෙන, යාච්ඤාකරන ආකාරයේ ආකල්පයක හැඟීමක් මතුකරගෙන ඊට පසු තමා පිළිබඳව සිතමින් තමාට යහපත ප්‍රාර්ථනා කළ යුතුයි. ඊට පසු ආදරය කරන පුද්ගලයෙකු, මධ්‍යස්ථ පුද්ගලයෙකු අකැමැති පුද්ගලයෙකු සහ අවසානයේ සියලු දෙනා ගැනම සිතන්න. ඊට පසු පිළිවෙළින් ඒ සියලු දෙනාටම යහපත ප්‍රාර්ථනා කරන්න. සංවේදීතාවයෙන් මෙසේ යම් කාලයක් තුළ භාවනා කළ විට, මෛත්‍රී භාවනාව ක්‍රමයෙන් දියුණු වේ. ගැඹුරු ස්වයං පිළිගැනීමක්, තමන් දැනටමත් ආදරය කරන අයගෙන් ශක්තිමත් ඇගයීමක්, අහම්බෙන් හඳුනාගන්නා අය තුළ උණුසුම් සහ වැඩෙන උනන්දුවක් ඇති වේ. පෙර නොකැමැති අය කෙරෙහි නොමනාපය අඩු වේ.

සැබැවින්ම, ආදරය ශක්තිමත් කළ හැකි තවත් ක්‍රමයක් නම්, ආදරයෙන් ක්‍රියා කිරීමයි. ජාතක කථා අටුවාවේ මෙසේ සඳහන් වේ :'භික්ෂුවක තමන්ට සහ අනෙක් සියල්ලන්ට තනිව, සහ පොදුවේ මෛත්‍රිය පැතිරවිය යුතුයි. මිතුරු අයට මිත්‍රශීලීබව පැතිරවිය යුතුයි. සතුරු අයට මිත්‍රශීලිබව පැතිර විය යුතුයි. ඒ අතර සිටින සියලු දෙනාටත් එසේ විය යුතුයි. සෑම කෙනෙකුටම, තනි තනිව සහ පොදුවේ, මෛත්‍රිය සහ කරුණාව, මුදිතාව සහ උපේක්ෂාව පැතිරවිය යුතුයි. ඔවුන් කෙරෙහි තමාගේ හැසිරීම බ්‍රහ්ම විහරණවලින් පෙළඹවිය යුතුයි' (Ja.II,61)

මෛත්‍රී භාවනාව පුහුණුවීමෙන් ලැබෙන ප්‍රයෝජන සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ පැවසූහ: 'මෛත්‍රියෙන් මනසේ ඇති කර ගත් නිදහස වැඩි දියුණු කිරීමෙන් සහ උසස් කිරීමෙන්, සැමවිටම පුහුණු කළේ නම්, කෙනෙකුගේ සිතුවිලි සහ අත්තිවාරම ගොඩ නගා ගත්තේ නම්, ශක්තිමත් කළේ නම්, තහවුරු කළේ නම්, නිසියාකාරව කරන්නට බැඳේනම්, එම පුද්ගලයා එකළොස් ආකාරයකට ආශීර්වාද ලබයි. එම පුද්ගලයා සතුටින් නිදයි, සතුටින් අවදි වෙයි, නපුරු සිහින නොදකී, මිනිසුන්ට ආදරණීය පුද්ගලයෙක් වේ, අමනුෂ්‍යයන්ට ප්‍රිය වේ, දෙවියන් විසින් රැකබලා ගනී, ගින්දරින්, වස විසවලින් සහ අවිආයුධවලින් ආරක්ෂා වේ. පහසුවෙන් සමාධිගත වේ, දීපත්මත් සමේ වර්ණයක් ඇත. සන්සුන්ව මිය යයි, මරණයෙන් පසු, අවම වශයෙන් දෙව්ලොව නැවත උපදී' (A.V,342). බලන්න **බ්‍රහ්ම විහරණ**

*Like Milk and Water Mixed: Buddhist Reflections on Love*,S. Dhammika, 2013.

## ලුම්බිනී

සිද්ධාර්ථ ගෞතම කුමාරයා ලුම්බිනී (Sn.683) නමැති ස්වභාවික රක්ෂිතයක උපත ලැබූ බව මුල් සම්ප්‍රදායට අනුව කියැවේ. උන්වහන්සේගේ මව වන මහාමායා, දරු ප්‍රසූතිය සඳහා ඇයගේ දෙමාපිය නිවස වීබූ දෙව්දහ නුවර වෙත යමින් සිටියදී, විළිරුජාව ආරම්භ වීම නිසා, දරු උපත ලුම්බිනියේ දී සිදුවුණි. පසුකාලීන ශතවර්ෂවලදී, ලුම්බිනිය වැදගත් වන්දනා මධ්‍යස්ථානයක් වූ අතර, අවම වශයෙන් 14වන ශතවර්ෂය ආරම්භ වන තෙක්ම එසේම පැවතුණි.

ඉන්දියාවේ බුදුදහම අතුරුදහන් වූ පසු, ලුම්බිනිය ක්‍රමයෙන් වනාන්තරයෙන් වැසී ගිය අතර, එය නැවත සොයා ගනු ලැබුවේ 1896දීය. වර්තමානයේ මෙම ස්ථානය පිහිටා ඇත්තේ හරියටම නේපාලයේ මායිම තුළය. ලුම්බිනියේ ඇති වැදගත්ම ස්මාරකය වන්නේ අශෝක රජුගේ ශිලාලේඛනයක් සහිත විශාල ගල් කණුවකි. ඔහු ක්‍රි. පූ. 249 වන වසරේදී එම ස්ථානයට ගිය බව එහි සඳහන් වේ. එම ශිලාලේඛනයේ මෙසේ සඳහන් වේ: 'ඔහුගේ රාජාභිෂේකයෙන් වසර විස්සකට පසු, අශෝක රජකුමා මෙම ස්ථානයට ගොස් නමස්කාර කළේ මෙහි ශාක්‍යයන්ගේ මහාප්‍රාඥ බුදුපියාණන් වහන්සේ එහි උත්පත්තිය ලැබූ බැවිනි. බුදුපියාණන් වහන්සේ එහි උත්පත්තිය ලැබූ නිසා, රජතුමා ගල් රූපයක් සහ කණුවක් ඉදි කළේය. එම ග්‍රාමයේ නිෂ්පාදනවලින් ගෙවිය යුතු බදු වලින් අටෙන් එකක් පමණක් ගෙවීමට බදු මුක්තයක් පැණවුණි.'

*The Places where Siddhartha Trod:Lumbini and Kapliavastu*, Max Deeg, 2003.

## මධුර

මධුර යන වචනය දැන් ලියන්නේ මථුර ලෙස වන අතර, එය මධ්‍ය දේශයේ බටහිර මායිමේ පිහිටි කුඩා නගරයකි. බුදුපියාණන් වහන්සේ වරක් මෙම ස්ථානයට වැඩම කළ නමුත්, එය දූවිලි සහිත, අයාලේ යන සුනඛයන්ගෙන් පිරුණු සහ උන්වහන්සේ පිඬුසිඟා වඩින විට එහි මිනිසුන් දානය පූජා කිරීමට අකැමැති වූ බව කියමින් එම ස්ථානය පිළිබඳව තිබූයේ සිත් නොගත් බවක්ය (A.III,256). සමහර විට බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු, මහා කච්චාන භික්ෂුව කුල ක්‍රමය පිළිබඳව මධුර රටේ රජු සමග සාකච්ඡාවක් තිබුණි (M.II,83). ක්‍රි. පූ. 1වන ශතවර්ෂය වන විට, මධුර රට බුදුදහම පිළිබඳ ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට පත් විය. බුදුදහම ඉන්දියාවේ පිරිහීමට පටන් ගන්නා තුරු, ක්‍රි. පූ. 8වන ශතවර්ෂය වන තෙක් බුදුදහම මධුර රටේ පැවතුණි. පසුගිය වසර 150 තුළ, නගරයේ සහ ඒ අවට කැණීම් සිදු කළ පුරාවිද්‍යාඥයන්හට විහාර සහ ආශ්‍රම රාශියක නටබුන් හමුවී ඇත. පැරණිතම බෞද්ධ කලාවන් පිළිබඳ උදාහරණ කැණීමෙන් අනාවරණය කරගෙන ඇත. මධුර දිල්ලියේ සිට කිලෝ මීටර් 100ක් දකුණේ පිහිටා ඇති අතර, එයින් බටහිරට ඉතා දුරින් බුදුපියාණන් වහන්සේ වැඩම කර ඇත. මෙය තවමත් හඳුනා ගත හැකිය.

*History of Mathura, 200 BC-AD 300*, A. Sharma, 2006.

## මහාබෝධි විහාරය

බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූ උරුවෙල, බුද්ධගයාවේ ඉදි කරන ලද විශාල ගොඩනැගිල්ල මහාබෝධි විහාරයයි. පුරාවෘත්තයට අනුව, අශෝක

රජු පළමු බෞද්ධ විහාරස්ථානය උරුවෙලාහි ඉදිකර ඇත. එය බොහෝ විට සත්‍යය මත පදනම් වූ පුරාවෘත්තයකි. වර්තමාන විහාරය ඉදි කළේ කවුරුන්ද සහ කවදාද කියා නොදනී. නමුත්, ඒ පිළිබඳ පළමු සටහන ක්‍රි. පූ. 5වන ශතවර්ෂය සිට පැවත එයි. එම විහාරය ඉදි කර ඇත්තේ ආදී සම්භව්‍ය වූ පස්ගුණයකින් යුක්ත සැලැස්මකින්ය (පඤ්චායතන). එහි ආරුක්කු කුටියක් (ගර්භ) සහිත සෘජුකෝණාශ්‍ර පාදකයක්, විශාල ඇතුළට යොමුවුණ එහි මැදින් නැගී සිටින ඇල වූ කොතක් (සිඛර) සහ එහි හතර කොණේ කුඩා කොත් ද ඇතුළත් වේ. මැද තිබෙන කොත උසින් මීටර් 52ක් වන අතර, ඉන්දියානු පන්සල්වල සාමාන්‍යයෙන් දකින්නට තිබෙන සමතලා කරන ලද, රවුම් සහ දාර ස්වරූපයෙන් යුක්ත ආමලකයකින් නිමා කර ඇත. පෝටිකෝව, පොළොව සහ දොර රාමු මත ඇති ගල් කණු හැර, මුළු පන්සලම ඉදිකර ඇත්තේ ගඩොල්වලිනි. පන්සල් කුටියේ ඇතුළත ඇති අල්තාරය (ආසන) දැන් ඇත්තේ ඒ මත බුදු පිළිමයක් සමගය. එහි 'දියමන්ති සිංහාසනය' (වජ්‍රාසන), 'පෘථුවියේ කේන්ද්‍රීය ස්ථානය' (පථවීනාභි), යනුවෙන් එහි සලකුණු කර ඇත. මේ බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය ලැබූ අවස්ථාවේ හරියටම වැඩ සිටි ස්ථානයයි. පන්සල පිටුපස දැන් වැඩෙන බෝධි වෘක්ෂය මුල් වෘක්ෂයට ඈතින් සම්බන්ධ වේ. ශතවර්ෂ ගණනාවක් තුළ මහාබෝධි පන්සල නැවත හැඩගස්වා සහ අලුත්වැඩියා කර ඇත. 19වන ශතවර්ෂයේ මැද භාගයේදී එය දරුණු ලෙස දිරාපත් වූ අතර, 1880දී බ්‍රිතාන්‍ය ඉන්දියානු රජය විසින් සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කරන ලදී.

*Navel of the Earth: The History and Significance of Bodh Gaya,* S. Dhammika, 1996.

**මහා මායා**

සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේගේ මව මහාමායා නම් වේ. ඇය දෙවදහ අඤ්ජන ගේ දියණිය වන අතර, පසුව ශාක්‍ය වංශිකයන් තෝරා පත්කර ගත් පාලකයා වූ සුද්ධෝදනගේ පළමු බිරිඳ බවට පත් වූවාය. බෞද්ධ ධර්ම ග්‍රන්ථවල මහා මායා පිළිබඳව ඇත්තේ ඉතා ස්වල්ප වූ තොරතුරු ප්‍රමාණයකි. සමහර විට, සිද්ධාර්ථ කුමරුන්ගේ උපතෙන් දින හතකට පසු ඇය මිය ගිය නිසා විය හැකිය. ඇය පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වී ඇත්තේ එකම අවස්ථාවක පමණි (D.II52). ඇයට දරුවෙකු පිළිසිඳගත් රාත්‍රියේ ඇය සිහිනෙන් සුදු ඇතෙකු දුටු බවට සම්ප්‍රදායෙන් කියැවේ. එකල ඇය 50විය ඉක්මවා තිබූ බව ද එහි කියැවේ.

**මහා පජාපතී ගොතමී**

මහා පජාපතී ගොතමී සුද්ධෝදනගේ දෙවන බිරිඳයි. සිද්ධාර්ථගේ මව මිය ගිය විට, මහා පජාපතී ගොතමී දරුවා තමාගේ දරුවා මෙන් ඇති දැඩි කළාය. සිද්ධාර්ථ බුදුබවට පත් වූ පසු, මහා පජාපතී ගොතමී උන්වහන්සේ වෙත පැමිණ තමන්ට සහ අනෙක් කාන්තාවන්ට භික්ෂුණීන් බවට පත් වී ලෝකය අභිනිෂ්ක්‍රමණය සඳහා අවසර පැතුවාය. බුදුපියාණන් වහන්සේ එසේ කිරීමට අකැමැති වූහ. නමුත්, ආනන්ද ස්වාමීන් වහන්සේ ගොතමී වෙනුවෙන් මැදිහත් වූහ. කාන්තාවන්ටත් පුරුෂයන් හා සමාන ආධ්‍යාත්මික හැකියාව තිබේ දැයි ආනන්ද හිමියෝ බුදුපියාණන් වහන්සේගෙන් විමසූහ. උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: 'ධර්මය සහ එය පුහුණුව

සඳහා නිවසේ සිට නිවසින් බැහැර වන්නට යාමෙන් නිර්වාණ මාර්ගයේ ඇති සියලු තත්ත්වයන් අවබෝධ කර ගැනීමට සහ නිර්වාණය ලබා ගැනීම කාන්තාවන්ට කළ හැකිය.' එවිට බුදුපියාණන් වහන්සේට තමන්වහන්සේ හදාවඩා ගත් මව කෙතරම් උපකාරී වී ඇත්දැයි සලකා බලන ලෙස ආනන්ද හිමියෝ උන්වහන්සේගෙන් විමසූහ: 'බුදුපියාණන් වහන්ස, මහා පජාපතී ගොතමී ඔබවහන්සේට ඉතා උපකාරී වී ඇත - ඇය ඔබවහන්සේගේ සුළු මවයි. ඔබවහන්සේගේ මව මිය ගිය විට ඇය ඔබවහන්සේට කිරි පෙව්වාය' (Vin.II,254). මෙම වචනවලින් පෙලඹීමට පත් වූ බුදුපියාණන් වහන්සේ කාන්තාවන්ට භික්ෂුත්වය ලබා ගැනීමට අවසර දීමට තීරණය කළහ.

මෙම පියවර ගැනීමට බුදුපියාණන් වහන්සේ මෙතරම් අකැමැති වූයේ ඇයි? මේ වන විට එවැනි ආරාම තිබුණේ නැත. භික්ෂූන් ජීවත් වූයේ නගරවලින් සහ පුරවරවලින් බැහැර වනාන්තර සහ උද්‍යානවලය. ඉන්දියානු සමාජයේ කාන්තාවන්ගේ තත්ත්වය පසුකාලීන තත්ත්වයට වඩා බොහෝ ඉහළ මට්ටමක පැවතුණද, හුදෙකලාවූ කාන්තාවක් නිදැල්ලේ යැයි සිතීමට තරම් හොඳ අවස්ථාවක් වන අතර, එයින් හිරිහැරයට හෝ ඊට වඩා නරක තත්ත්වයකට පත්වීමට ඉඩ තිබේ. කාන්තාවන් වනාන්තරවල ජීවත්වීමෙන් බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙන්නට සිදුවෙනු ඇතැයි බුදුපියාණන් වහන්සේ සමහර විට සිතන්නට ඇත. කාන්තාවන් භික්ෂුත්වය ලැබීමෙන් පසු, ඔවුහු සාමාන්‍යයෙන් ගෞරවය දිනාගත් අතර, ප්‍රායෝගික ප්‍රජාවන්

ස්ථාපිත කිරීමට හැකි වූ අතර, ධර්මයට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට ද සමත් වූහ. ථේරවාදී රටවල 12වන ශතවර්ෂයේදී පමණ භික්ෂුනී ශාසනය නැති වූ නමුත්, චීනය, කොරියාව සහ ජපානයේ නොකඩවා පැවතුණි. බලන්න **ලිංගභේදය**

## මහාවස්තු

මහාවස්තු, 'උතුම් කතන්දරය' විනය බව කියනු ලැබේ. එහි අර්ථය 'පුහුණුව' වන අතර, සාමාන්‍යයෙන් භික්ෂූන් සහ භික්ෂුණීන්ට පණවා ඇති නීතිවල එකතුවකට භාවිත වන වචනයකි. සැබැවින්ම මහාවස්තු ක්‍රි. පූ. 2වන ශතවර්ෂය සහ 3වන ශතවර්ෂය අතර වාචික සහ ලිඛිත මූලාශ්‍රවලින් සකස් කරන ලද බුදුපියාණන් වහන්සේ පිළිබඳ දීර්ඝ සහ වඩාත් අවුල් සහගත ජීවන චරිතාපදානයකි. එහි සිත්බඳනා කථාන්දර එකතුවක්, පුරාවෘත්ත, විශ්වසනීය ඓතිහාසික තොරතුරු, භක්තිමත් කවි සහ ධර්මය පිළිබඳ ඉගැන්වීම් සහ බොහෝ ජාතක කථා, එහි ඇතුළත් වේ. සමහර ඒවා ත්‍රිපිටකයෙන් වන අතර, අනෙක් ඒවා එයට අනන්‍යසාධාරණ වූ ඒවාය.

*The Mahavastu*, trans. by J. J. Jones, Vol.I, 1949, Vol.II, 1952, Vol.III, 1956.

## මෛත්‍රිය

මෛත්‍රිය, (පාලියෙන් මෙත්තා) යනුවෙන් අදහස් කරන්නේ 'ආදරණීය පුද්ගලයා' හෝ 'මිත්‍රශීලී පුද්ගලයා' වන අතර, ඒවා ඊළඟ යුගයේ බුදුපියාණන් වහන්සේ හඳුන්වනු ලබන නාමයයි (D.III,76). වර්තමානයේ මෛත්‍රේය බෝධිසත්ත්වයන් වහන්සේ ලෝකයේ යම් තැනක හෝ ඇත අනාගතයේ

උන්වහන්සේ නිර්වාණයට මඟ පෙන්වන ආධ්‍යාත්මික ගුණාංග පුහුණු කරන සමහර විට දිව්‍යමය විෂය පථයක වාසය කරනු ඇත. බොහෝ බෞද්ධ ප්‍රතිමාවල මෛත්‍රේය බෝධිසත්ත්වයන් වහන්සේ උන්වහන්සේගේ සිරස මත ස්තූපයක් සහිතව ප්‍රසන්න කුමාරයෙකු ලෙස නිරූපණය කර ඇත. පසුකාලීන චීන කලාවේ උන්වහන්සේ බොහෝ විට නිරූපණය කර ඇත්තේ තරබාරු සිනහවක් සහිත පෙනුමක් සහිතවය. ඒ උන්වහන්සේගේ ළං විය හැකි බව සහ මිත්‍රශීලී ස්වභාවය අවධාරණය කිරීමටයි. සමහර විට බටහිර පුද්ගලයන් වැරදි ආකාරයෙන් 'සිනහවෙන බුදුන්වහන්සේ' ලෙස නමක් පටබැඳ ඇත.

*Maitreya, the Future Buddha*, Alan Sponberg and Helen Hardacre, 2011.

## මජ්ඣිම නිකාය

මජ්ඣිම නිකාය, ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයේ දෙවන ග්‍රන්ථයයි. මෙම ග්‍රන්ථයේ 152ක්වූ ධර්ම දේශනා හෝ සූත්‍ර මධ්‍යම ප්‍රමාණයෙන් යුක්ත නිසා එය මජ්ඣිම නිකාය වශයෙන් හැඳින් වේ. එහි අදහස මැද හෝ මධ්‍යම යන්නයි. මෙම දේශනා විවිධ ස්වභාවයෙන් යුක්ත වන අතර, පුළුල් පරාසයක විෂයයන් ආවරණය කරයි.

සමහර ඒවා සංවාද සහ සාකච්ඡා වන අතර, අනෙක් ඒවා බුදුපියාණන් වහන්සේ කෙටියෙන් පැවසූ ඒවාවල විස්තර වශයෙන් පැහැදිලි කළ ඒවාය. ඒවායෙන් කිහිපයක් බුදුපියාණන් වහන්සේගේ මතකයන් වන අතර, සමහරක් උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු ශ්‍රාවකයන් දේශනා කළ ඒවා

වේ. මජ්ඣිම නිකායේ සඳහන් දේශනා සාර සංග්‍රහයෙන් වර්ග කර ඇත - ඒ දේශනාවලින් ආමන්ත්‍රණය කරණු ලැබුවේ කවුරුන් ද (ගිහි පිරිස, බ්‍රාහ්මණයන්, ඔබ මොබ යන අය), ඔවුන්ගේ නම් (උදාහරණ වශයෙන්, සිංහ ගර්ජනාව), ඔවුන්ගේ ශෛලි (උදාහරණ, විභඬග) හෝ දළ වශයෙන් ඔවුන්ගේ විෂයයන් (උදාහරණ, සුඤ්ඤතා).
*The Middle Length Discourse of the Buddha*, trans. by Bhikkhu Nanamoli and Bhikkhu Bodhi, 1995.

## මන්ත්‍ර

මන්ත්‍රයක් (පාලියෙන් මන්ත) යනු ශබ්දයක් හෝ ශබ්දවල එකතුවක් මන්ත්‍රයක් වශයෙන් භාවිත කිරීමයි. බුදුපියාණන් වහන්සේගේ කාලයේ බ්‍රාහ්මණ ආගම ඉගැන්වූයේ යම් මන්ත්‍ර නැවත නැවත ශබ්ද කිරීමෙන් ආධ්‍යාත්මික බලයක් සහ ආශීර්වාදයක් ලබාදෙන බවත්, දෙවිවරුන්ගේ උපකාරය උපද්දන බවත්ය. 'මන්ත්‍රයක් මතුරමින් (මන්තයාබොධබ්බං, A.IV,136)

නිර්වාණය පිළිබඳ ධර්මය ඉගැන්වූ අරක නමැති භික්ෂුවක් ගැන ත්‍රිපිටකයේ සඳහන් වේ. සමහර මන්ත්‍රවල වේදයෙන් පේළි හෝ කවි ඇතුළත් වේ. නමුත්, 'හම්' වැනි හුදු මාත්‍රා ද භාවිත විය. නිර්වාණයට පත් අය 'හම්' මැතිරීම නොකරන බව බුදුපියාණන් වහන්සේ විනය පිටකයේ පැවසූ සේක (Vin.I,3). වෛදික මන්ත්‍රවල නිපුණත්වය පිළිබඳ සැලකිල්ලක් හෝ ගුණාත්මක බවක් සහතික නොකරන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. 'බ්‍රාහ්මණයෝ උගත් පවුල්වල උපදිති. මන්ත්‍ර

ඔවුන්ගේ නෑයන් සේ සලකති. නමුත් ඔවුන් නැවත නැවතත් නරක ක්‍රියා කරනු දක්නට ලැබේ. මේ හේතුව නිසා මේ භවයේ චෝදනාවලට ලක් වෙති. එසේම මේ භවයෙන් පසු ද අයහපත් දෛවයන් හිමි කර ගනිති' (Sn.140-1). බ්‍රාහ්මණ ආගමට ප්‍රධාන වූ පුරුදු වූ මන්ත්‍ර මැතිරීමෙන්, පූජා තැබීමෙන් සහ යාග පැවැත්වීමෙන් (මන්තහුතියඤ්ඤ), සැකයෙන් පීඩා විඳිනකෙනෙකුට උපකාර කළ නොහැකි බව සුත්ත නිපාතයේ සඳහන් වේ (Sn.249).

සියලු ආකාරයේ විජ්ජා බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ. උතුම්ම ශක්තිය සහ ආරක්ෂාව, සදාචාරාත්මක ලෙස ක්‍රියා කිරීම සහ පිරිසිදු මනසක් තිබීමය, යන අදහස උන්වහන්සේ ආදේශ කළහ. මේ හේතුව සම්බන්ධයෙන්, ඉහළම මන්ත්‍රය (උත්තරං මන්තං, Mil.11) බුදුපියාණන් වහන්සේගේ ධර්මය බව මිලින්දපඤ්හයේ නම් කර ඇත. වැරදි කළ බවට අසත්‍ය ලෙස චෝදනා ලැබූ ගුණවත් මිනිසුන් පිරිසක් ඇතුන් ලවා පෑගවීමෙන් දඬුවම් ලැබීම පිළිබඳ කථාවක් ජාතක කතාවේ ඇතුළත් වී ඇත. නමුත් හැකි තරම් උත්සාහ කළ ද වධකයාට ඇතුන් ලවා මිනිසුන් මැරීමට නොහැකි විය. ඔවුන් යම් ආරක්ෂක මන්ත්‍රයක් හෝ ජප කිරීමක් මැතුරුවේ යැයි උපකල්පනය කරමින්, වධකයා ඒ මිනිසුන්ගෙන් මෙසේ ඇසුවේය: 'ඔබගේ මන්ත්‍රය කුමක් ද?' එහි නායකයා පිළිතුරු දුන්නේය: 'අපට මෙය හැර වෙනත් මන්ත්‍රයක් නැත : අප කිසිවෙකු සතුන් මරන්නේ නැත. හොරකම් කරන්නේ නැත. කාමයේ වරදවා හැසිරෙන්නේ නැත. බොරු කියන්නේ නැත. මත්පැන් ගන්නේ නැත. අපි මෛත්‍රිය වඩමු. පරිත්‍යාගශීලීත්වය පුහුණු කරමු. සංචාරකයන් සඳහා

පාරවල් අලුත්වැඩියා කරමු. ළිං ඉදි කරමු. තානායම් ඉදි කරමු. අපේ මන්ත්‍ර සහ අපේ ආරක්ෂාව මේවායි. අප දියුණු වන්නේ ඒ නිසායි' (Ja.I,200). මන්ත්‍ර භාවිතය බ්‍රාහ්මණ ආගමේ දෘෂ්ටියක් වූ අතර, එය වජ්‍රයානයට ඉතා වැදගත් විය. බුදුදහමේ මෙම ගුරුකුලය සමහර විට මන්ත්‍රයාන වශයෙන් ද හැඳින් වේ. ජපානයේ වජ්‍රයාන බුදුදහම ෂිංගොන් යනුවෙන් හැඳින් වේ. එය මන්ත්‍ර සඳහා ජපන් වචනයයි. බලන්න **බ්‍රාහ්මණයන් සහ ආගන්තුක සත්කාරය**

**මාර**
බලන්න **යක්ෂයා**

**විවාහය**

විවාහය යනු දෙදෙනෙකු, විශේෂයෙන්ම පිරිමියෙකු සහ ගැහැණියක, විධිමත්ව සහ නීත්‍යානුකූලව එක් වීමකි. එය බොහෝ විට සිදුවන්නේ විවාහ මඟුල යනුවෙන් හැඳින්වෙන උත්සවයක් හරහාය.

බෞද්ධ දෘෂ්ටියට අනුව, විවාහය ලෞකික ආගමකට සම්බන්ධ නැති, දෙදෙනෙකු හෝ පවුල් දෙකක් අතර ඇතිවෙන එකඟවීමකි. ඒක විවාහ, එකවිට එක භාර්යාවකට හෝ ස්වාමියකුට වැඩිය ඇති, බහු පුරුෂ සේවනය හෝ වෙනත් කිසිම ආකාරයේ විවාහ පිළිබඳව බුදුපියාණන් වහන්සේ ස්ථිරවම යමක් කියා සිටියේ නැත. බ්‍රාහ්මණ ආගම අට ආකාරයක විවාහ හඳුනා ගෙන ඇත. ඉතාමත් සාමාන්‍ය විවාහ වූයේ දෙමාපියන් හෝ භාරකරුවන් සූදානම් කළ ඒවාය. මේ සඳහා සාමාන්‍යයෙන් ගෙවීමක් කළ යුතු විය. නිතර සිදු නොවූ, නමුත් තවමත් පිළිගත් ක්‍රමය වූයේ,

දෙමව්පියන්ගේ අනුමැතිය (ආසුර), ඇතිව, යුවල එකිනෙකා තෝරා ගැනීම හෝ යුවල දෙමව්පියන්ගේ අනුමැතිය නොමැතිව (ගාන්ධර්ව) විවාහ වීමයි. පසුව සඳහන් කළ ක්‍රමයට සාමාන්‍යයෙන් රහසින් පැන යාම සම්බන්ධ විය. පැහැරගෙන යාමට (රාක්ශ්‍රස) රණවිරු කුලයට අවසර තිබුණි. සමහර විට ප්‍රචණ්ඩත්වය බලපෑවේය. වජ්ජින් 'අනුන්ගේ බිරින්දෑවරුන් සහ දියණියන් පැහැරගෙන යාමට' සහ තමන් සමග ජීවත්වන්නට ඔවුන්ට බල කළහ. මෙම චාරිත්‍රය සමාජීය වශයෙන් හිංසාකාරී බව බුදුපියාණන් වහන්සේ සැලකූහ (D.II,74). ස්වයංවර යනුවෙන් ජාතක කතාවේ සඳහන් එක් විවාහ ක්‍රමයකට අනුව, විවාහ අපේක්ෂකයන් ගණනාවකින් සාමාන්‍යයෙන් තරුණිය, සමහර විට තරුණයා, සහකරු හෝ සහකාරිය තෝරා ගත්තේය. එවැනි උත්සව සාමාන්‍යයෙන් පැවැත්වෙන්නේ ප්‍රසිද්ධ රැස්වීමකදීය. බුදුපියාණන් වහන්සේගේ ගිහිගෙයි බිරිඳ සහ රාහුල පුත්‍රයා පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වේ. ඒ නිසා උන්වහන්සේ ගිහිගෙයි දී විවාහ වී සිටි බව අපි දන්නෙමු. නමුත්. ඒ විවාහය හෝ විවාහ උත්සවය කුමන ආකාරයක ද යන්න එහි සඳහන් වී නැත. කෙසේ නමුත්, පසුව, බුදුපියාණන් වහන්සේ පිළිබඳ ප්‍රබන්ධමය ජීවන චරිතවල සාමාන්‍යයෙන් නිරූපණය වී ඇත්තේ ස්වයංවර විවාහයක් ලෙසය. එයින් අඟවන්නේ පරමාදර්ශී විවාහ ක්‍රමය ලෙස මුල්කාලීන බෞද්ධයන් සිතුවේ මෙය බවයි.

බ්‍රාහ්මණ ආගමේ නීතියට අනුව, තරුණියක් විවාහ විය යුත්තේ ඇයගේ පළමු ඔසප් දිනයේ සිට මසක් ඇතුළතදීය. ඊට පසු වුවොත්, විවාහය ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් ඇයගේ පියා වඩාත් චෝදනා ලබයි.

මුල්කාලීන බෞද්ධයන් විවාහය සඳහා සුදුසු වයස (පත්ත සොළස වස්ස කාල, පත්තවය, Ja.I,421) ලෙස සැලකුවේ 16 බවයි. යුවල එකම වයසේ (තුල්‍යවය) වීම යහපත් යැයි සිතන ලදී. නමුත්, (ක්‍රි. පූ. 4වන ශතවර්ෂය) කාම සූත්‍රයේ නිර්දේශ කර ඇත්තේ මනාලිය මනාලයාට වඩා අවුරුදු තුනක් බාල විය යුතු බවයි. වියපත් පුරුෂයන් ඔවුන්ට වඩා බොහෝ වයසින් අඩු කාන්තාවන් විවාහ කර ගැනීම නුසුදුසු සහ මෝඩ ක්‍රියාවක් බව බුදුපියාණන් වහන්සේ සිතූහ (Sn.110).

විවාහය සඳහා කිසිම විශේෂ ආකාරයක් වෙනුවෙන් බුදුපියාණන් වහන්සේ කථා නොකළහ. නමුත්, උන්වහන්සේ ඒක භාර්යා චාරිත්‍රය සඳහා අනුමැතිය පළ කළ බවට උපකල්පනය කළ හැකිය. උන්වහන්සේගේ පියා සුද්ධෝදනට භාර්යාවන් දෙදෙනෙකු සිටි නිසා, සිද්ධාර්ථට ද බොහෝ භාර්යාවන් සිටිය හැකි වුව ද, තෝරාගත්තේ එක් කෙනෙකු පමණය. විවාහය පිළිබඳව කරන ලද දේශනයකින් සාකච්ඡා කළේ ඒක භාර්යා චාරිත්‍රය ගැන පමණි. නැවතත්, එය හොඳම විවාහ ක්‍රමය වශයෙන් උන්වහන්සේ පිළිගත් බවට හැඟවූහ (A.IV,91-3). කාන්තාවකට පින නොමැති නම් පොදු-බිරිඳක් වශයෙන් ඇයට තරඟ වදින්නට සිදුවන බව උන්වහන්සේ පැවසූහ (සපත්නී, S.IV,249). කාන්තාවකට බහුභාර්යා චාරිත්‍රයෙන් ඇතිවන අවාසි ත්‍රිපිටකයේ සාකච්ඡා කරයි. 'බහු-භාර්යාවකු වීම වේදනාකාරී වේ' (Thi.216). 'ගැහැණියකුට ඇතිවන නරකම කනස්සල්ල බහු-භාර්යාවන් සමග කලහ කිරීමයි' (Ja.IV,316). එවැනි ප්‍රශ්න කාම සූත්‍රයේ තහවුරු කර ඇත. එකම නිවසේ විවිධ භාර්යාවන් අතර ඇතිවන

ආතතිය සහ උපක්‍රමශීලී මෙහෙයවුම් පිළිබඳව එම සූත්‍රයේ විස්තර කර ඇත.

ස්වාමිපුරුෂයෙකු සහ පියෙකුව සිටීමෙන්, බුදුපියාණන් වහන්සේට පෞද්ගලික අත්දැකීමෙන්ම විවාහය සහ දෙමාපිය බව සම්බන්ධයෙන් කථා කළ හැකිවිය. ස්වාමිපුරුෂයෙකු තම බිරිඳට ගෞරව සහ සැලකීම කළ යුතු බව සහ ඇය කිසි විටක හෙළා නොදැකිය යුතු බව, විශ්වාසය රැකිය යුතු බව, ඇයට බලය පැවරිය යුතු බව සහ මුදල් සැපයුම කළ යුතු බව ද බුදුපියාණන් වහන්සේ පැවසූහ. බිරිඳක ඇයගේ වැඩකටයුතු මනාව කළයුතු බව, සේවකයන් පාලනය කළ යුතු බව, ස්වාමියාට අවංක විය යුතුය, පවුලේ ආදායම ආරක්ෂා කළ යුතුය සහ නිපුණ සහ උත්සාහවන්ත විය යුතුය (D.III,190). ධර්මය අනුගමනය කරන යුවලක්, 'එකිනෙකාට ආදරණීය වචනයෙන් අමතන' (අඤ්ඤමඤ්ඤ පියංවදා, A.II,59) බව සහ 'තමන්ගේ දරුවන් සහ කලත්‍රයා රැකබලා ගැනීම ඉහළම ආශීර්වාදය' (පුත්තදාරස්සඞ්ගහොඑතම්මඞ්ගලමුත්තමං, Sn.262) බව ද උන්වහන්සේ පැවසූහ. 'යහපත් බිරිඳක හොඳම මිතුරිය' (භාරියා ව පරමා සඛා, S.I,37) බව උන්වහන්සේ පැවසූහ. ස්වාමිපුරුෂයෙකු සහ බිරිඳක 'එක් හදවතක් එකඟතාවෙන් හා සතුටු සිතින්' (පමොදමානා එකචිත්තා සමග්ගවාසං, Ja.II,122) ජීවත් විය යුතු බව ජාතක කතාවේ සඳහන් වේ. 'එකමුතුකමින් එකට එක්වී සහ අන්‍යෝන්‍ය වූ ආදරයෙන්' (සම්පියෙන පි සංවාසං සමග්ගත්ථාය සම්පවත්තෙන්ති, A.III,222), සිටිනවා වෙනුවට අනුන්ගේ බිරින්දෑවරුන් මිලදී ගන්නා බ්‍රාහ්මණයන් බුදුපියාණන් වහන්සේ විවේචනයට ලක් කළහ.

මෙසේ අඟවමින්, මෙය විවාහය සඳහා වඩා හොඳ අභිප්‍රායක් ලෙස උන්වහන්සේ සිතූහ. 'මේ ලෝකයේ ආදරය නොමැතිව එක්වීම දුක්විඳීමකි' යැයි ජාතක කතාවේ සඳහන් වේ. (ලොකස්මිං හි අප්පියසම්පයොගො ව දුක්ඛො, Ja.II,205)

බුදුපියාණන් වහන්සේගේ අවබෝධයට අනුව, පුරුෂයෙකු සහ බිරිඳක එකිනෙකා කෙරෙහි ගැඹුරෙන් ආදරය කරන්නේ නම්, සහ සමාන කර්ම තිබේ නම්, ඔවුන්ට ඊළඟ භවයේදී ඔවුන්ගේ සම්බන්ධතාව නැවතත් අළුත් කළ හැකිය (A.II,61-2). එකිනෙකා කෙරෙහි ප්‍රබල සම්බන්ධකමක් දෙදෙනාට දැනේ නම්, පෙර ජීවිතයකදී ද දැඩි ආදරයක් දෙදෙනා තුළ තිබුණු බවට එයින් පැහැදිලි වන බව ද උන්වහන්සේ පැවසූහ. 'පෙර දී එකට ජීවත්වී, සහ වර්තමානයේ ආදරයෙන්, ස්ථිරවම ජලයේ නෙලුම් මලක් පිපෙන්නා සේ ආදරය ඉපදී ඇත' (Ja.II,235). මෙම අදහස මහාවස්තුවේ විස්තර වශයෙන් පැහැදිලි කර ඇත :'ආදරය මනසට ඇතුල්වන විට, හදවතට සතුට දැනේ. 'මෙම කාන්තාව මීට පෙර මා සමග ජීවත් වී ඇත.' යි බුද්ධිමත් මිනිසෙකුට නිශ්චිතව කිව හැකිය (Mvu.III,185).

බුදුපියාණන් වහන්සේගේ භක්තිමත් ශ්‍රාවකයන් වූ සහ බොහෝ වසර ගණනාවක් සතුටෙන් විවාහ ජීවිතයක් ගත කළ පරමාදර්ශී බෞද්ධ යුවල වූයේ නකුලපිතා සහ නකුලමාතාය. තමන්ගේ බිරිඳ ඉදිරිපිටදීම වරක් නකුලපිතා බුදුපියාණන් වහන්සේට මෙසේ පැවසූහ: 'මා තරුණයෙකු සහ ඇය තරුණියකව සිටියදී මගේ නිවසට ඇය රැගෙන ආ දවසේ සිටම, මා කිසිදිනක ඇයට, සිතිවිල්ලකින් හෝ

කායිකව ද්‍රෝහි වී නැත' (A.II,61). තවත් අවස්ථාවක, නකුලමාතා ඇයගේ ස්වාමිපුරුෂයා දිගු කාලයක් රෝගීව සිටියදී භක්තියෙන් ඔහු දිරිමත් කරමින් සැම විටම බිය සැක දුරු කරමින් ඔහුට උවටැන් කළාය. මේ පිළිබඳව දැනගත් බුදුපියාණන් වහන්සේ නකුලපිතාට මෙසේ පැවසූහ, 'ඔබට ලාභයක්ම සිදු වී ඇත. ඔබට මහත් සේ කරුණාවන්ත වූ, ආදරය කරන, ඔබගේ උපදේශිකව සහ ගුරුවරිය ලෙස නකුලමාතාව ඔබට ලැබීම මහත් ලාභයකි.' (අනුකම්පිකා, අත්ථකාමා, ඔවාදිකා, අනුසාසිකා, A.III,295-8) බෞද්ධ දෘෂ්ටි කෝණයෙන් බලන කල, පහත දැක්වෙන ගුණාංගයන් කල්පවත්නා සහ හරවත් සම්බන්ධතාවකට උපක්‍රමය සාදනු ඇත - විශ්වාසවන්තකම, අන්‍යෝන්‍ය ආදරය සහ කරුණාව, සහ එකිනෙකාගේ ආධ්‍යාත්මික උපදේශකයා සහ ගුරුවරයා වීමට.

ඉතිහාසය පුරාම, බොහෝ සාමාන්‍ය බෞද්ධයන් එක් විවාහයකට සීමා වී ඇත. නමුත් රජවරුන්ට සමහර විට, එක් භාර්යාවකට වැඩියෙන් සිටි අතර, ටිබෙටයේ මෑතක් වන තුරුම සහෝදරයන් අතර එකම භාර්යාවක් ඇසුරු කිරීම සාමාන්‍ය දෙයක් විය. මධ්‍යම කාලීන යුගයේ ශ්‍රී ලංකාවේ කඳුකර ප්‍රදේශවල බහුභාර්යා සේවනය පැවතුණි. අදටත්, එම තත්ත්වය ලඩඛ් සහ ස්පිටි යන ප්‍රදේශවල සමහර කොටස්වල පවතී. වර්තමානයේ සියලු බෞද්ධ රටවල නීත්‍යානුකූලව පිළිගන්නා විවාහ ආකාරය ඒක විවාහ පමණි. නිශ්චිත බෞද්ධ විවාහ උත්සව නැත. විවිධ රටවල්වල ඔවුන්ට ආවේණික චාරිත්‍ර තිබෙන අතර, සාමාන්‍යයෙන් භික්ෂූන් ඒවා සිදුකරන්නේ හෝ ඒවාට සහභාගීවීම සිදුවන්නේ නැත. කෙසේ නමුත්,

විවාහයට පෙර හෝ පසුව, මනාලයා සහ මනාලිය බොහෝ විට, පන්සලකට ගොස් භික්ෂුවකගෙන් ආශීර්වාද ලබති. බලන්න **බ්‍රහ්මචාරීබව, දික්කසාදය සහ යසෝධරා**

'Marriage in the Buddhist Tradition.' B. C. Law, *Indian Historical Quarterly*, 2, 1926.

## සම්බාහන කිරීම

සම්බාහන කිරීම (පරිමද්දන හෝ උච්ඡාදන) සහ අවයව පිරිමැදීම (සම්බහන) බුදුපියාණන් වහන්සේගේ කාලය වන විටත්, හොඳින් දන්නා දෙයකි. දෙමාපියන්ට ගරුසරු ඇති දරුවෝ ඔවුන්ගේ වියපත් දෙමාපියන්ගේ අවයව සම්බාහන කරති (A.I,62). එසේම ලිංගික සම්බාහනය කෙටි කලකින් නතර වූ ඉන්ද්‍රියමය සම්බාහනය ද දන්නා කරුණකි (A.IV,54). භික්ෂුණීන් එළදෙනකගේ පාදයේ අස්ථියකින් සම්බාහනය කිරීම පිළිබඳව අප අසා ඇත්තෙමු. සමහර විට අස්ථිවල කෙළවර ඇති රවුම් තැටි ශරීරයේ උඩ සිට පහළට පිරිමදියි. කෙනෙකුට තමන්ගේ විඳුරුමස් පවා සම්බාහනය කළ හැකිය (Vin.II,266). ශීත ඍතුවේ ඇති වන අසනීප මඟහැරීමේ ක්‍රමයක් වශයෙන් අඛණ්ඩ ලෙස වේගයෙන් සහ නැවත නැවත ශරීරය පිරිමැදීමේ (පාදඝාට), ශිල්පයක් වශයෙන් සක්මන් කරන ලෙස වාඝ්භට උපදෙස් දුන්හ.

භික්ෂූන්ට විනෝදය සඳහා සම්බාහනය කිරීම බුදුපියාණන් වහන්සේ තහනම් කළහ (D.I,7). නමුත් උන්වහන්සේ චිකිත්සක සම්බාහන අනුමත කළහ. එක් අවස්ථාවක බුදුපියාණන් වහන්සේට යම් අසනීපයකින් පෙළෙන විට දවස් ගණනාවක් 'තෙල් සාත්තුවක්' (සිනෙහන) කළ බවට වාර්තා වී ඇත

(Vin.I,279). ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ මෙයින් අදහස් කරන්නේ කන්වලට හෝ නාසයට විවිධ තෙල් ඇතුළත් කිරීම, තෙල් වස්ති කිරීම හෝ තෙල් සම්බාහනය කිරීමයි. ආනන්ද හිමියන් බුදුපියාණන් වහන්සේ වියපත් වී සිටින කාලයේ උන්වහන්සේගේ අවයව සම්බාහනය කළ බවට තොරතුරු ද ඇත (S.V,217).

## ස්වයං සම්භෝගය

ස්වයං සම්භෝගය (සුක්කවිස්සට්ඨි) යනු කෙනෙකු තමන්ගේම ලිංගික අවයව (සම්බාධ), සාමාන්‍යයෙන් සුරතාන්ත (අධිකවේග) මට්ටමට උත්තේජනය කිරීමේ ක්‍රියාවලියයි. කාලාම සූත්‍රයේ ස්වයං සම්භෝගය 'සිංහයා ග්‍රහණය කර ගැනීම' (සිම්හාකරන්ත) යනුවෙන් හැඳින් වේ. බුදුපියාණන් වහන්සේගේ කාලයේ සමහර මිනිසුන් ස්වයං සම්භෝගය මනසට සහ ශරීරයට චිකිත්සක බලපෑමක් ඇති වේ යැයි විශ්වාස කළහ (Vin.III,109). නමුත්, එය සමග බුදුපියාණන් වහන්සේ එකඟ වූයේ නැත. විනයට අනුව, භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට ස්වයං සම්භෝගය බරපතල වරදකි (Vin.III,111). නමුත්, මේ කාරණය පිළිබඳව ගිහියන්ට බුදුපියාණන් වහන්සේ මඟ පෙන්වීමක් කර නැත. කෙසේ වෙතත්, ස්වයං සම්භෝගය යනු ලිංගික ධාවකයේ සාමාන්‍ය හැඟීමක් වන අතර, එය සාමාන්‍ය ලිංගික සම්බන්ධතාවන් සඳහා සිතෙහි පැලපදියම් වූ දෙයක් හෝ ආදේශකයක් බවට පත් නොවන තාක් කල්, ස්වයං සම්භෝගය කායිකව සහ මානසිකව හානිකර නොවන බව සමකාලීන වෛද්‍ය මතය සමග බුදුදහමට එකඟ විය හැකිය. සම්භෝගය පිළිබඳව

වරද සහ ස්වයං පිළිකුල සැබැවින්ම සම්භෝගයේ යෙදීමට වඩා හිංසාකාරී වේ. බලන්න **ලිංගික හැසිරීම**

**මායා** බලන්න **මායාව**

## බුදුපියාණන් වහන්සේගේ අවසාන භෝජනය

බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයට පෙර, චුන්ද නමැති කම්මල්කරුවෙකු විසින් පූජා කරන ලද භෝජනය උන්වහන්සේ වැළඳූ බව දීඝ නිකායේ සඳහන් වේ. මෙම භෝජනයට සූකරමද්දව නමින් පිළියෙල කළ දෙයක් සමන්විත විය. එය 'ඌරාගේ සතුට දනවන දෙය' ලෙස පරිවර්තනය කළ හැකිය (D.II,127). මෙම භෝජනයට අඩංගු වූයේ කුමක් ද යන්න පිළිබඳව බොහෝ කල්පිත තිබී ඇත. සමහර අය කියන්නේ එය ඌරු මස්වලින් පිළියෙළ කරන ලද භෝජනයක් බවයි. එය හැම අතින්ම විය හැකිය. එයට හේතුව බුදුපියාණන් වහන්සේ නිර්මාංශ පුද්ගලයෙකු නොවූ අතර, නිර්මාංශවීමට පක්ෂව කථා කළේ ද නැත. වඩාත් අරුම පුදුම න්‍යායයන්ගෙන් එකක් සහ පුළුල් පිළිගැනීමක් ලබා ඇති එකක් නම්, එය එක්තරා ආකාරයක පොළොව යට වැඩෙන ආහාරයට ගන්නා හතු වර්ගයක් බවයි. බුදුදහම පිළිබඳ මුල් යුරෝපීය විද්වතුන් න්‍යායාත්මකව සලකා බැලුවේ ප්‍රංශ ජාතිකයන් එම හතු ලබා ගැනීමට පුහුණු කළ ඌරන් භාවිත කළ නිසා, බෞද්ධ ධර්ම ග්‍රන්ථවල සඳහන් 'ඌරන්ගේ සතුට දනවන දේ' හතුවල විවිධාංගයක් විය හැකි බවයි. මෙම න්‍යාය පදනම් වී ඇත්තේ ප්‍රංශ ගම්බද ප්‍රදේශවල ඇති දේ පැරණි ඉන්දියාවේද එසේ විය යුතුය යන ව්‍යාජ තර්කාංගය මතය. සැබැවින්ම,

ඉන්දියාවේ හතු වැඩෙන්නේ නැති අතර, ප්‍රංශයේ පවා ඒවා සොයා ගැනීමට පුහුණු කළ ඌරන් භාවිතය මෑත කාලීන පුරුද්දකි. මේ අනුව බුදුපියාණන් වහන්සේගේ අවසාන භෝජනය හතු යැයි කියන න්‍යායේ කිසිදු පදනමක් නැත. ඒ හා සමානවම, සාධාරණ ලෙස අනුමාන කරන පරිදි, මෙම පළමු කරුණෙන් මතු වී ඇති පදනම් විරහිත න්‍යායයන් නම්, බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත් වූයේ විෂ හතු වැළඳීමෙන්, ආහාර විෂවීමෙන් හෝ උන්වහන්සේට වස පොවා ඇත යනාදියයි. නැවතත්, කරුණු එවැනි මනංකල්පිත කල්පිතවලට පටහැනි වේ. අපට කිව හැක්කේ සූකරමද්දව යනු යම් ආකාරයක පිළියෙළ කළ දෙයක් බවයි. එයට අවශ්‍ය ද්‍රව්‍ය බොහෝ කලකට පෙර අමතක වී ඇත.

බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත්වීමට පෙර, මාස කිහිපය තුළදී, උන්වහන්සේ 'පරිනිර්වාණයට පත් වෙන්නට මෙන් තියුණු වේදනාවක් ඇති කරන දරුණු රෝගයකින් පීඩා වින්දහ.' එම වේදනාව උන්වහන්සේ 'සිහිනුවණින්, සම්පූර්ණයෙන්ම දැනුවත්ව සහ පැමිණිලි නොකරමින් විඳ දරා ගත්හ' (D.II,99). උන්වහන්සේට අවුරුදු 80ක් වූ අතර, ඒ කාලයේ හැටියට අසාමාන්‍ය ලෙස ජීවත් වූහ. ආනන්ද හිමියන් බුදුපියාණන් වහන්සේ ඒ අවස්ථාවේදී විස්තර කළේ, 'බුරුල් සහ රැළි වැටුණු අත් පා ඇති සහ නැමුණු ඉරියව්වෙන් යුක්ත' අයුරෙනි (S.V,216). බුදුපියාණන් වහන්සේම තමන්වහන්සේගේ ශරීරය පවත්වා ගෙන යා හැක්කේ 'අණ්ඩ දැමීමෙන්' බව පැවසූහ (D.II,100). උන්වහන්සේගේ අවසාන භෝජනයෙන් පසු,

'රුධිරය සමග පාචනය' (ලොහිතපක්ඛන්දිකා) දරුණු ලෙස වැළඳී හදිසියේ රෝගාතුරවූ අතර, රෝගය අඛණ්ඩව යම් කාලයක් පැවතීමෙන් පීඩාවට පත්වූහ. පසුවදා උන්වහන්සේ පරිනිර්වාණයට පත්වූහ.

පෙර කී ලෙස බලන විට, පෙනී යන්නේ බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත් වූයේ වෙහෙස, අසනීප සහ මහලු විය වැනි දේවලින් ඇති වූ සාමාන්‍ය සංකූලතා නිසා බව සහ උන්වහන්සේ පෙර දින වැළඳූ දේ නිසා නොවන බවයි. මෙම මිලින්දපඤ්හ ලියන විට මෙම සාධාරණ නිගමනය තවමත් පැවත තිබුණි. එහි මෙසේ සඳහන් විය 'බුදුපියාණන් වහන්සේ රෝගාතුර වූයේ ආහාර නිසා නොවේ. ඒ උන්වහන්සේගේ ශරීරයේ තිබූ ස්වභාවික දුර්වලතා සහ ආයු කාලය සම්පූර්ණ වීම නිසා රෝගී තත්ත්වය උග්‍ර වීම නිසාය' (Mil.175).

බෞද්ධ දෘෂ්ටි කෝණයෙන් බලන කල, බුදුපියාණන් වහන්සේගේ අවසාන ආහාර වේලෙහි ඇති එකම වැදගත්කම වන්නේ එය උන්වහන්සේ තුළ මහාකරුණාව සඳහා තිබූ අසීමිත හැකියාව පෙන්නුම් කිරීමයි. අවසානය ළං වී ඇති බව අවබෝධ කරගත් වහාම උන්වහන්සේ වහාම සිතුවේ උන්වහන්සේගේ පරිනිර්වාණය සිදු කළ බවට චුන්දට දොස් පැවරෙන්න ඉඩ ඇති බවයි. මෙය වැළකීම සඳහා, උන්වහන්සේ ආනන්ද හිමියන්ට උපදෙස් දුන්නේ චුන්දගේ ගමට ගොස් බුදුවරයෙකුට අවසාන භෝජනය පූජා කිරීම කෙතරම් මංගල කරුණක් ද සහ ආශීර්වාද ලත් ක්‍රියාවක් ද කියා ඔහුට කියා දෙන මෙන්ය. මේ අනුව, අසනීප වුවද, වෙහෙසට පත් වුවද, සහ පරිනිර්වාණය ආසන්න වුව ද, බුදුපියාණන්

වහන්සේගේ එකම සිතුවිල්ල වූයේ අනෙක් අයගේ සුභසිද්ධියයි. බලන්න **භෝජනය සහ කුසිනාරා**
*The Last Days of the Buddha*, trans. by Sister Vajira and Francis Story, 1988.

## මිනුම් සහ මැනීම

මැනීම (මාණ හෝ තුලනා) යනු ප්‍රමාණය, බර, දිග ප්‍රමාණය හෝ යම් දෙයක ගණන තීරණය කිරීමේ ක්‍රියාවලියයි. මිනුමක ඇති බොහෝ ඒකක ත්‍රිපිටකයේ සඳහන් වේ. බර සහ දිග ප්‍රමාණය යන දෙක සඳහාම මේවායෙන් කුඩාම එක වූයේ රථරෙනු වන අතර, එය සමාන වන්නේ අශ්ව කරත්තයකින් විසි වෙන දුහිවිලි වල කුඩාම අංශු මාත්‍රයයි.

දිග ප්‍රමාණයක ඉතාම පොදු එකක පහත දැක් වේ:

| | | |
|---|---|---|
| 36 රථරේණු | = | 1 ලික්ඛා (උකුණු බිත්තරයක්) |
| 7 ලික්ඛා | = | 1 යව (බාර්ලි ධාන්‍ය) |
| 7 යව | = | 1 අංගුලි (අතේ මිම්ම) |
| 24 අංගුලි | = | 1 රතන (රියන, වැලමිටේ සිට මැද ඇඟිලි කෙළවර අතර දිග) |
| 4 රතන | = | 1 ධනු (අධිනහර ගැටය) |
| 500 ධනු | = | 1 ක්‍රොස |
| 8 ක්‍රොස | = | 1 යෝජන - බරකරත්තයකින් දිනකට අදින්නට හැකි දුර, හෝ කිලෝමීටර් 14ක්) |

දිග ප්‍රමාණය මැනීම සඳහා තවත් ක්‍රමයක් :
1 රතන = 7 යට්ඨි
20 යට්ඨි = 1 උසභ

80 උසභ = 1 ගාවුත
4 ගාවුත = 1 යෝජන

ප්‍රමාණය මැනීම සඳහා පොදු ඒකකය වූයේ නාළි යනුවෙන් හඳුන්වන උණබම්බු කොටසක තබා ගත හැකි ප්‍රමාණයයි Ja.IV,67; Vin.I,249). තවත් එකක් දොණ යි. ආරම්භයේදී, දොණ යනුවෙන් හැඳින්වූයේ සහල් මැනීම සඳහා භාවිත කරන ලද සම්මත ප්‍රමාණයේ ලී බඳුනකි. පසුව එය ද පරිමාවේ ඒකකයක් බවට පත්විය. දොණයක අළ්හක 4ක් හෝ පල 200ක් තිබුණි (A.II,55). බත් සහ ව්‍යංජන සමග සම්පූර්ණ ආහාර වේලක් දොණ එකකට සමාන විය (S.I,81). බුදුපියාණන් වහන්සේගේ ආදාහනයෙන් පසු උන්වහන්සේගේ භෂ්මාවශේෂ රඳවා ගත් පසු, දොණයකින් බෙදා වෙන් කරන ලදී. සාමාන්‍ය පිරිමියෙකු ආදාහනය කළ පසු ඔහුගේ අස්ථිවල බර කිලෝග්‍රෑම් 1සිට 1.8 පමණ වේ. බුදුපියාණන් වහන්සේගේ නෂ්ටාවශේෂ පහසුවෙන්ම දොණයකට ගැළපිය හැකිව තිබුණි. වෙනත් මැනීමේ ඒකක වන්නේ අච්ඡරා, චතුභාග, අම්මණ, කුක්කු, පත්ථ සහ විදත්ථි යි (Ja.III,318; VI,339; V,297; 385).

අප හුදෙක්ම අනෙක් අය වෙත ආදරය නොපෙන්විය යුතු බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. අපගේ ආදරය අතිවිශාල විය යුතුය. (අප්පමාණ) සමහර ආදරයන් ඊර්ෂ්‍යාවෙන්, රාගයෙන් හෝ පාලනය කර ගැනීමට ඇති ආශාවෙන් දෝෂ සහිත වේ. තවත් සමහර ඒවා පෙරළා ප්‍රතිචාර නොදැක්වුවොත් හෝ

ආදරය දෙන්නා ඔහු හෝ ඇයගේ ක්‍රමයට නොලැබුණොත්, ආදරය රඳවා තබා ගනී. සමහර අය ආදරය සමහර අයට කැමැත්තෙන් සහ සතුටින් දෙන නමුත්, අනෙක් අයට නොදී රඳවා තබා ගනී. මේ සියලු ආදර වර්ග යම් මට්ටමකට සීමිත නිසා ඒවා මැන බැලිය හැකිය. මෛත්‍රිය මිනිය නොහැකි ආදරයකි.

**ඖෂධ**

ඖෂධ (භෙසජ්ජ) රෝගයක් සුව කිරීම සඳහා ආලේප කරන හෝ උකහා ගන්නා ද්‍රව්‍යයකි. **සා**ගරමතිපරිපුච්ඡාවට අනුව, සුප්‍රසිද්ධ ජීවක නමැති බෞද්ධ වෛද්‍යවරයා මෙසේ පැවසුවේය: 'ඖෂධයක් නොවන කිසිවක් මේ ලෝකයේ නැත.' ඖෂධ ඒවායේ රසය (රස), පසු-ජීර්ණ ප්‍රතිඵලය (විපාක), ශක්තිය (විරිය) සහ ඒවායේ විශේෂිත ක්‍රියා (ප්‍රභාව) යන කාරණාවලට අනුව වර්ග කළ හැකිය යන අදහසට අනුව පැරණි ඉන්දියානු ඖෂධ වේදය පාදක වී ඇත.

බුදුපියාණන් වහන්සේ ඖෂධ සහ පිළියම් පිළිබඳව දැනුවත්ව සිටි අතර, ඖෂධ නියම කිරීමේ නිපුණත්වයක් උන්වහන්සේට තිබුණි. විනය පිටකයෙන් උන්වහන්සේ බොහෝ ආකාරයේ ඖෂධ නිර්දේශ කළ අතර, ඒවා සත්ව මේදය, ගසක මුල, කහට කසාය, කොළ, ඵලතුරු, දුම්මල, ලුනු හෝ ආලේප වශයෙන් වර්ග කළහ (Vin.I,198-250). උන්වහන්සේ නිර්දේශ කළ සමහර ඖෂධ නූතන පර්යේෂණවලින් චිකිත්සක වටිනාකමක් තිබෙන බවට පෙන්වා දී ඇත. වරක් බුදුපියාණන් වහන්සේ ශාරීරික තුන්දෝසයේ අසංතුලනයකින් පෙළෙන

විටදී උන්වහන්සේගේ වෛද්‍යවරයාවූ ජීවක තෙල් සම්බාහනයක් සහ ලිලීමල්වල සුවඳ ආඝ්‍රාණය කිරීම සඳහා නිර්දේශ කරන ලදී (Vin.I,279). තවත් අවස්ථාවක උන්වහන්සේට උදරයේ වාතය ඇතිවූ විට, උණු ජලයේ උක් සීනි සිරප් (ඵාණිත) වැළඳූහ (S.I,174).

එක් වෛද්‍යවරයෙකු ඖෂධීය පැළෑටි එකතු කරමින් හිමාලයේ යෑම පිළිබඳව සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ සඳහන් වේ. මෙම පැළෑටි කොටා, වියළවා, අනෙක් ද්‍රව්‍ය සමග තම්බා, හෝ අනෙක් ද්‍රව්‍ය සමග තම්බා නොගනිමින්, සහ ඒවා සපන්නට හෝ ආහාර සමග ගැනීම හෝ කපා ශරීරය තුළට ඇතුළු කළ හැකි බව සූත්‍රයේ සඳහන් වේ.

පැරණි කාලයේ රෝගීන්ට වෛද්‍යමය සැලකිල්ල දැක්වීම මහඟු පුණ්‍ය කර්මයක් බව සැලකිල්ලට ගනු ලැබුණි. 5වන ශතවර්ෂයේදී චීන ජාතික වන්දනාකරු ෆාහියන් ඉන්දියාවේ සිටින විට, ඔහු මේ සම්බන්ධයෙන් පැටිනාවල බෞද්ධයන් පිළිබඳව ලිව්වේය 'මෙරට ශ්‍රේෂ්ඨ මිනිසුන් සහ ගෘහපතියන් නගරය තුළ රෝහල් පිහිටුවා ඇති අතර, ඒවාට දුප්පත්, අසරණ, අබ්බගාතයන් සහ සියලු දිස්ත්‍රික්කවල සිටින රෝගීන් පැමිණේ. ඔවුන්ට නොමිලේ උපකාර කෙරේ. වෛද්‍යවරු ඔවුන්ගේ රෝග තත්ත්ව පරීක්ෂා කර බලා ඔවුන්ට නිවැරදි ආහාර, බීම, සහ ඔවුන්ගේ සෞඛ්‍යය ප්‍රකෘති තත්ත්වයට පත් කිරීම සඳහා ඖෂධ සහ ප්‍රතිකාර නිර්දේශ කරති. ඔවුන්ට සුවය ලැබුණු පසු, ඔවහු කැමැති අවස්ථාවේ රෝහලෙන් පිටව යති.' ධර්මයේ සුවයට කුමන ඖෂධය ද, ධර්මය යනු සතුට සහ නිදහසයි. එබැවින්, බොහෝ විට ධර්මය ශක්තිමත්

සුව සලසන ඖෂධයක් වශයෙන් සමාන කිරීම පුදුමයක් නොවේ. 'බුදුපියාණන් වහන්සේ ඒ සම්බන්ධයෙන් නිපුණ වෛද්‍යවරයෙකු හා සමානය. කෙලෙස් නමැති රෝගය සුව කිරීමට උන්වහන්සේට හැකි විය. ධර්මය නිවැරදිව ආලේපනය කරන ලද ඖෂධයක් වැනිය. තමන්වහන්සේලාගේ කෙලෙස් සුව කරගත් සංඝයා එම ඖෂධයෙන් සෞඛ්‍යය ප්‍රකෘති තත්ත්වයට පත් කර ගත් අය වැනිය' (Pj.I,21). බලන්න **සුව කිරීම**

*Asceticism and Healing in Ancient India: Medicine in the Buddhist Monastery*, Kenneth Zysk, 1989.

**භාවනා**

භාවනාවට යොදන ඉංග්‍රීසි වචනය පැමිණ ඇත්තේ 'සිතා බලන්න' හෝ 'කල්පනා කරන්න' හෝ 'පතුරන්න' යන අර්ථය ඇති 'මෙඩිටේෂන්' යන ලතින් වචනයෙනි. භාවනාව යනුවෙන් සාමාන්‍යයෙන් පරිවර්තනය කර ඇති වචනයේ පාළි වචනය ''භාවනා'' වේ. ඒ අනුව, භාවනාව යන වචනය සැබැවින්ම බුදුපියාණන් වහන්සේ විසින් උගන්වන ලද මනෝවිද්‍යාත්මක පරිවර්තනයේ විවිධ ශිල්පීය ක්‍රම සඳහා සෑහීමකට පත්විය නොහැකි එකකි. සිතුවිලි සම්බන්ධයෙන් ගත් කළ, බෞද්ධ භාවනාවේ ප්‍රවේශයන් තුනක් තිබෙන බව පැවසිය හැකිය: 1. සිතුවිලි භාවිත කිරීම, 2. සිතුවිලි නිශ්චල කිරීම සහ සිතුවිලි නිරීක්ෂණය කිරීමයි.

මේවායෙන් පළමු වැන්න මෛත්‍රී භාවනාවයි. භාවනා කරන්නා, යම් චිත්තවේගයන් සහ හැසිරීම් මතු කිරීමේ අරමුණෙන් විශේෂ ආකාරයේ සිතුවිලි පිළිබඳව ඕනෑකමින් සිතා බලයි. දෙවන ආකාරයේ

භාවනාවකට උදාහරණයක් වන්නේ හුස්ම පිළිබඳ භාවනාවයි. මෙහිදී භාවනාකරන්නා ඔහුගේ හෝ ඇයගේ අවධානය හුස්ම පිළිබඳව අරමුණු කරයි. ඒ අනුව, සිතුවිලි ධාරාව පහළට බසිමින් පැවතෙමින්, අවසානයේ නතර වේ. ආනාපානසති භාවනාවේ භාවනා යෝගියා හුදෙක්ම මානසික ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමේ හැකියාව දියුණු කර ගනී (සිතුවිලි, චිත්තවේග, අවබෝධය, ආදිය.), ඒ අනුව, ක්‍රමයෙන් ඒවායෙන් බලපෑම් ඇතිවීම අඩු වේ. බලන්න **ධ්‍යාන සහ මැණික් ගල් සහ ලෝහ**

*Tranquillity and Insight*, A. Sole-Leris, 1992.

## භාවනාව සහ ස්වාභාවික ලස්සන

බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ පැවිදි ශ්‍රාවකයෝ සැලකිය යුතු තරම් ඔවුන්ගේ කාලය ස්වාභාවික වටාපිටාවේ ගත කළහ. මෙසේ කිරීමට ප්‍රධාන හේතුව වූයේ වනාන්තරවල පැවති නිශ්ශබ්දතාව සහ සන්සුන් බව නිසා පහසුවෙන් භාවනා කළ හැකි වීමය. නමුත් මෙම ප්‍රයෝජනයට අමතරව, ස්වාභාවික ලෝකයේ, කුඩා වනවදුලු සහ කඳුවැටි, මල් සහ වනයේ පොකුණු, පත්‍රවල සරසර හඬ නැගීම සහ කුරුල්ලන්ගේ ගීතනාදවල ලස්සනින් භාවනාව දියුණු කිරීමට හැකියාවක් ඇත. බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය ලැබීමට හරියටම කලින්, තමන්වහන්සේගේ අවසාන භාවනාව සඳහා උරුවෙලාහි තැන්පත් වන්නට තීරණය කළේ යම් තරමකට එහි තිබූ ගැමි වටාපිටාව නිසා බව උන්වහන්සේ පැවසූහ. උන්වහන්සේ මෙසේ ද පැවසූහ 'එවිට යහපත සොයන්නෙකු, අසමසම, සම කළ නොහැකි මාර්ගය සොයමින්, මගධ දේශය

හරහා සංචාරය කරමින්, මම හමුදා ගම්මානයක් වන උරුවෙලාවට පැමිණියෙමි. එහිදී ලස්සන බිම් කැබැල්ලක්, සුන්දර වන පෙතක කුඩා වන වදුලක්, මනරම් ඉවුරක් සහිත පැහැදිලිව ගලාබසින ගංගාවක් සහ අවශ්‍යතාව සඳහා අසල ගමක් තිබෙනු මම දුටුවෙමි. මම සිතුවෙමි, 'සැබැවින්ම මෙය තරුණයෙකුට උත්සාහ කිරීම සඳහා හොඳ ස්ථානයක්.' ඒ නිසා මම එහි ඉඳ ගතිමි. මම සිතුවෙමි, සැබැවින්ම උත්සාහ කිරීම සඳහා මෙය හොඳ ස්ථානයකි ' (M.I,166-7).

ඇතැම් මනෝවිද්‍යාත්මක ආකාරවලට අනුව, සමහර ස්ථානවල අනෙක් ස්ථානවලදීට වඩා හොඳින් භාවනා කළ හැකි බව විසුද්ධිමග්ගයේ සඳහන් වේ. 'සෙවන සහ ජලය සපයන, හොඳ සමබරතාවක් ඇති බිත්ති, කණු සහ පියගැට සහිත, ආකර්ෂණීය බිතුසිතුවම් සහ ලැටිස් සහ විවිධ ආකාරයේ සිතුවම්වලින් බැබළෙන වාසස්ථානයක්' සෘණාත්මක ආශාවන්ට නැඹුරු වූ පුද්ගලයන්ට එම පරිසරය වඩා හොඳ බව එය අඟවයි. මන්දගාමී මනසක් ඇති පුද්ගලයෙකු, එය එසේම පැවතුණහොත්, ඔහුගේ හෝ ඇයගේ භාවනාව ආවරණය නොවූ ස්ථානයක, උදාහරණ වශයෙන් 'වතු, කුඩා වනවදුලු සහ පොකුණු, ප්‍රසන්න දර්ශන, ගම්මානවල, නගරවල සහ සොබාදසුන්වල අඛණ්ඩ දර්ශන සහ කඳුවැටිවල නිල්වන් පටලය දැකගත හැකි ස්ථානවල' සිදු කළ යුතුය (Vism.110).

ස්වභාවික ලෝකයේ සුන්දරත්වයට භාවනාවට සහාය විය හැකි නම්, භාවනායෝගියාගේ මනසට ස්වාභාවික සුන්දරත්වය ඇතුළු අලංකාරය පිළිබඳ

ඉහළම අවබෝධයක් හා ඇගයීමක් වර්ධනය කළ හැකි බව ද සත්‍යයකි. වන්න්තර බිය උපදවන අයුරු තමන් දුටුවේ කෙසේ ද කියා කෙනෙකු බුදුපියාණන් වහන්සේට පැවසූ අවස්ථාවේදී බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ:'දහවල් කාලයේදී කුරුල්ලන් නිහඬව සිටින විට, විශාල වනාන්තරයේ සරසර හඬ මට ප්‍රියජනකයි' (S.I,7).

සාර්ථක භාවනාව සහ සොබාදහමට ඇති සංවේදිතාව අතර සම්බන්ධතාව පිළිබඳව ථේරගාථා සහ ථේරිගාථාවේ සඳහන් බොහෝ කාව්‍යයන් ප්‍රබල සාක්ෂියක් දරයි. ගැමි වටාපිටාවන් සමග භාවනා කිරීමෙන් තමාට ඉහළම ප්‍රීති ප්‍රමෝදය ලැබුණු බව 'භූත' නමැති භික්ෂුව පැවසීය. 'කුණාටු වළාකුළු ගුගුරමින් වේගයෙන් කඩා හැලෙන වැස්ස පහළට ගලා යන විට, කුරුල්ලෝ අහසට පියඹා යති. මෙම විසිතුරු කුඩා ලෙනට භාවනා කරන්නට ගිය භික්ෂුවට මෙයට වඩා තවත් සතුටක් නැත.

බොහෝ සහ විවිධ ශාකවලින් වටවූ මල් සහිත ගං ඉවුර මත හිඳිමින් සතුටෙන් භාවනා කරන විට, ඊට වඩා තවත් සතුටක් ඔහුට නැත. මඳ වැස්සක් සහ තියුණු දත් සහිත මෘගයන්ගේ ගර්ජනා සමගින් හුදෙකලා කුඩා වන වදුලට රාත්‍රිය එළැඹී එන විට, භාවනා කිරීමට තමන්ගේ විසිතුරු කුඩා ලෙනට ගොස් සිටින භික්ෂුවට මීට වඩා වැඩි වෙනත් සතුටක් නැත' (Th.522-4). තළපුත නමැති තවත් භික්ෂූවක් මෙම පැදි රචනා කළේය: 'කන්දක් මුදුනේ පිහිටි ගල් සහිත විසිතුරු කුඩා ලෙනක, වල් ඌරන් සහ මුවන් සැරිසරන, එක් සතුට දනවන ස්ථානයක, වැහි බිඳු වැටෙන පොද වැස්සේ, මම මගේ ගුහාවට

ගොස් ප්‍රීති ප්‍රමෝදයට පත්වෙමි. මොනරුන් ඔවුන්ගේ ඝන නීලාකාශ පැහැ බෙල්ල, ලස්සන කරමල, වර්ණවත් වලිග සහ විවිධ පාටින් සලකුණු වූ තටු සමගින් ඔවුන්ගේ අවදිකිරීමෙන් උස්පහත්වන හඬින් සතුටින් පිළිගනිති. ඔබ වනාන්තරයේ භාවනා කරන විට කිනම් සතුටක්ද! වැස්ස වැටී ඇති විට, තණකොළ ඇඟිලි හතරක් උසට වැඩී තිබෙන විට, වනාන්තරය සම්පූර්ණයෙන්ම මලින් පිරී ඇති විට, මට කඳුවැටියක වලාකුළක් මෙන්, වනාන්තරයේ ගසක් මෙන්, කලු පුළුන් කැටියක් මෙන් සැහැල්ලුවට සෙමෙන් චලනය විය හැකිය' (Th.1135-7). ස්වාභාවික දසුන්වල ඇති සුන්දරත්වය මාර්ගඵලලාභී භික්ෂූන් එහි වාසය කිරීමට තෝරා ගැනීම නිසා වැඩිදියුණු වී ඇතැයි පවා ත්‍රිපිටකයේ උද්ධෘත කිහිපයක සඳහන් වේ. ගමක හෝ වනාන්තරයක, කඳුකරයේ හෝ තැනිතලාවේ, කොහේ වුවත්, සුපේශල පුද්ගලයන් ජීවත්වන වාසස්ථාන ප්‍රීතිමත් ස්ථාන වේ (Dhp.98). බලන්න **ගෙවතු**

**ඔසප්වීම**

ඔසප්වීම (උතුනී) යනු කාන්තාවකගේ යෝනි මාර්ගය හරහා ගර්භාෂ ඇතුළු පැත්තෙන් රුධිරය සහ වෙනත් ද්‍රව්‍ය අඛණ්ඩව පිටකිරීමේ ක්‍රියාවලියකි. සරුබව සහ නොසරුබව පිළිබඳ ඔසප් චක්‍රය ප්‍රජනනය සඳහා අත්‍යවශ්‍ය ස්වාභාවික ක්‍රියාවලියකි. බොහෝ ආගම් සහ සංස්කෘතීන් ඔසප්වීම අපිරිසිදුබව, අවාසනාව හෝ අශුභබව සමග සම්බන්ධ කරයි. බයිබලයට අනුව, කාන්තාවක් ඔසප්වන කාලයේදී චාරිත්‍රානුකූලව අපිරිසිදුවන අතර, එම කාලය තුළ ඇය විසින් ස්පර්ශ කළ කිසිවෙකු හෝ කිසිදෙයක්, ඒ ආකාරයටම අපිරිසිදු වේ. (ලෙවිටිකුස් 15,19-23). බොහෝ

ක්‍රිස්තියානීහු වර්තමානයේ මෙම ඉගැන්වීම් නොසලකා හරිති. නමුත්, භක්තිමත් යුදෙව් ජාතිකයෝ තවමත් ඒවා පිළිපදිති. ඉස්ලාම් ආගමේ, ඔසප්වන කාන්තාවන්ට නිශ්චිත, වෙනත් ලෙසකින් අනිවාර්ය ආගමික වත්පිළිවෙත් පැවැත්වීම තහනම් වේ. ලිංගික හැසිරීම සපුරා තහනම් වේ. හින්දු ආගමේ වඩාත් විශ්වාසය තැබිය හැකි නීති පොත වූ මනුස්මෘතියේ සඳහන් වන්නේ ඔසප් කාලය තුළදී මිනිසෙකු තම බිරිඳ සමග ලිංගිකව එක් නොවිය යුතු බවත්, ඇයගෙන් ආහාර පිළිනොගත යුතු බවත්, හෝ ඇය සමග කථාවත් නොකළ යුතු බවත්ය. හින්දු නීතිය යටතේ තරුණියකට ඇයගේ පළමු ඔසප් වීමට නොබෝ කලකින්ම විවාහ වීම සුදුසු බව කියැවේ.

බුදුපියාණන් වහන්සේ පිරිසිදු සහ අපිරිසිදු බව පිළිබඳ චාරිත්‍රය ගැන අදහස ප්‍රතික්ෂේප කළහ. කාන්තාවන්ගේ ඔසප්වීම සම්බන්ධ කිසිදු සීමාකිරීමක් අනුමත කළේ නැත. උන්වහන්සේගේ ප්‍රධාන අවධානය යොමු වූයේ 'අභ්‍යන්තර සේදීම' (M.I,39) පිළිබඳවයි. ඒ ආදරය, කරුණාව සහ අවංකත්වය ඇති මනසක් දියුණු කිරීමයි. එසේම මානසික කෙලෙස්වලින් නිදහස් මිනිසෙකු ගොඩ නැගීමයි.

සමහර බෞද්ධ සංස්කෘතීන් අභ්‍යන්තර පිරිසිදුබව පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් අමතක කර ඇත. ඒ වෙනුවට, චාරිත්‍රානුකූල පිරිසිදුබව අනුගමනය කරමින්, ඔසප් පිළිබඳ විවිධ මිථ්‍යා විශ්වාසයන් ඔස්සේ දිගටම අනුගත වේ. තායිලන්තයේ සමහර ප්‍රදේශවල මෙම තත්ත්වයේ සිටින කාන්තාවන්ට පන්සල්වලට ඇතුළු වීමට හෝ ස්තූප පැදකුණු කරන්නට අවසර නැත. බුරුමයේ දී

ඔවුහු මේ කාලයේදී පන්සල් නැරඹීමට නොයති. ඇතැම් ශුද්ධ බුදු පිළිම වෙත ප්‍රවේශ වීමට ඉඩ නැත. එසේම පැවිදි කිරීමේ සීමා මාලක වෙත යෑමට අවසර නැත.

## මානසික කෙලෙස්

බුදුපියාණන් වහන්සේට අනුව, මනස ස්වභාවයෙන්ම දීප්තිමත් ය (පභස්සරම්). නමුත්, කෙලෙස්වලින් කැලැල් ඇති වේ. (ආගනතුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං). හොඳින් ඉගැන්වූ ශ්‍රාවකයන් මේ පිළිබඳව දන්නා නිසා, ඔවුන්ට මෙහෙයවීමක් ඇත. ඒ නිසා ඔවුන්ගේ මනස දියුණු කිරීමට හැකියාවක් ඇත. (චිත්තභාවනා, A.I,10) මානසික කෙලෙස්වලට බුදුපියාණන් වහන්සේ විවිධ නම් දුන්හ. එසේම ඒවායේ පරාසයක් හඳුනා ගත්හ. විවිධ අවස්ථාවන්හි සහ විවිධ ශ්‍රාවකයන් පිරිසකට උන්වහන්සේ තුන් ආකාර ගින්දර (අග්ගි), තුන් ආකාර ඍණාත්මක දේ, (කිඤ්චන), තුන් ආකාර පැල්ලම් (කිලෙස), සමහර විට (උපක්කිලෙස) හෝ (සඞ්කිලෙස), හතර ආකාර මත්ද්‍රව්‍ය (ආසව), හතර ආකාර ජලගැල්ම (ඔඝා), හතර ආකාර බැඳීම් (ගන්ථ), හතර ආකාර බන්ධන (යොග), හතර ආකාර අල්ලා ගැනීම් (උපාදාන), පස් ආකාර බැඳුම් (සඞ්ගා), පස් හෝ සමහර විට හත් ආකාර මතුපිටට යටින් පවතිනා ප්‍රවණතා (අනුසය) සහ සංයෝජන දහය (දසසංයොජන) යන මේ ප්‍රධාන කරුණු පිළිබඳව උන්වහන්සේ ආමන්ත්‍රණය කළහ. නිර්වාණයට පත් වූ යෝගියෙකු තුළ මතුපිටට යටින් පවතිනා ප්‍රවණතා නැති බව කියැවේ (ඛීණාව, A,I,77). ජලගැල්ම තරණය කළ පුද්ගලයා (ඔඝතිණ්ණ), බැඳීම් (යොගාතිග) අභිබවා ඇත. බැමි (විණ්ණගන්ථ)

හරහා කපා දමා ඇත.

මේ සියලු වර්ග කිරීමේ දී පෙනෙන ආකාරයට ඇතුළත් කර ඇති විවිධාකාර ගති ස්වභාවයන් සැබැවින්ම මුල් බැස ගත් හෝ මූලික ලෝභයේ කෙලෙස් (ලොභ හෝ රාග), වෛරය (දොස), මෝහය (මොහ), මානය (මාන) සහ තමාගේ මතයෙහි අනමය ලෙස එල්ලුන (දිට්ඨි), හටගත් දේවල්ය. උදාහරණ වශයෙන්, පළිගන්නාසුළු වීම හෝ සාවඥවීම වෛරයේ විවිධ විද්‍යමානවීම් වේ (M.I,42-3). සත්‍යය පිළිබඳව පවා තමන්ගේ දෘෂ්ටියේ එල්බ සිටීම (ඉදං සච්චාභිනිවෙස) හරියටම තව ආකාරයේ ලෝභ කමකි. සමහර විට අහංකාරකමේ මූලද්‍රව්‍යයක් සමග මිශ්‍ර වී තිබෙන්නට පුළුවනි (D.III,230). සදාචාරය සහ නීතිවලට ඇලී සිටීම (සීලබ්බතපරාමාස) ඇති වන්නේ මෝහය ලෝභයේ ඇලෙන අංගය සමග සංයෝජනය වීමෙනි (D.III,230). බලන්න **මැණික් ගල් සහ ලෝභ**

## පුණ්‍යය

පුණ්‍යය (පුඤ්ඤ) යනු කෙනෙකු යම් යහපත් දෙයක් කිරීමෙන් දැනෙන ප්‍රීති ප්‍රමෝදයයි. සාම්ප්‍රදායික ථේරවාදී රටවල, පුණ්‍යය යන වචනයේ අර්ථය බරපතල ලෙස වරදවා වටහා ගෙන ඇත. වර්තමානයේ කුසලතා යම් ආකාරයක හැසිරීමකින් ලබාගත් මනෝවිද්‍යාත්මක ගුණාංගයක් ලෙස සිතනවාට වඩා, පසුව භාවිත කිරීම සඳහා ගබඩා කර ඇති, හෝ පසුව අනෙක් අයට 'පැවරිය හැකි' පවා 'සෑදිය හැකි', 'රැස් කළ හැකි', වස්තුවක් හෝ වෙළඳ භාණ්ඩයක් ලෙස සිතන්නට පටන් ගෙන ඇත. මෙම

වරදවා වටහා ගැනීම විශේෂයෙන්ම තායිලන්තයේ ධර්මය පිළිපැදීමට කෙලෙසුණු බලපෑමක් ඇති කර තිබේ. සියලු මිනිසුන් බොහෝ විට බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් කෙරෙහි සැලකිලිමත්ව හුදෙක් ප්‍රීති ප්‍රමෝදය සඳහා හෝ එය කළ යුතු හරි දේ නිසා හෝ යහපත් දේ නොකරන නිසාය. නමුත්, 'පින් ලබා ගැනීමටයි'. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පරිත්‍යාගශීලීත්වය තත්ත්වයෙන් පහත වැටී ඇත. ඒ දන් දීමේ ක්‍රියාවලිය ආපසු ලබා ගැනීමේ උපක්‍රමයෙන් සිදුවන නිසාය. යම් චාරිත්‍ර ඉටු කරමින් - පිළිම මත රත්රන් කොළ තබමින්, භික්ෂූන්ට මුදල් දෙමින්, ස්තූප ආදිය පැදකුණු කරමින් - එදිනෙදා ජීවිතයේ දී අවංකව සහ ගුණවත්ව සිටීමෙන්ට වඩා 'තමන්ට පිං කිරීමට' හැකි යයි මිනිසුන් විශ්වාස කිරීමට පටන් ගෙන ඇත.

මේ සියල්ල බුදුපියාණන් වහන්සේගේ අනුශාසනාව නොතකා: 'බාහිර ක්‍රියාවක් පවිත්‍රතාව ගෙන එන බව නොසිතති. කුසලතාවෙන් යුක්ත අය පවසන්නේ බාහිර දේවල් සොයන්නන්ට පවිත්‍රතාව ලබාගත නොහැකි බවයි' (S.I,169). පධාන සූත්‍රයට අනුව, යක්ෂයා වන මාර, 'කුසලතා ගොඩ ගසා ගන්න' (චීයතෙ පුඤ්ඤං) යැයි යෝජනා කරමින්, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ආධ්‍යාත්මික පුහුණුවීම්වලින් වැළැක්වීමට උත්සාහ ගත්තේය. එය හරියටම වර්තමානයේ සමහර භික්ෂූන් ගිහියන්ට කරන යෝජනාවක් වැනිය. බුදුපියාණන් වහන්සේ දැඩි සේ මෙම කියමන ප්‍රතික්ෂේප කළහ:'මට කුසලතාවලින් කිසිම ප්‍රයෝජනයක් නැත' (Sn.428-31). ඒ හා සමානවම අවංක බෞද්ධයෙකු දිනපතා

ඔහුගේ හෝ ඇයගේ ධර්මය පුහුණු කිරීමෙන් ඔහුට හෝ ඇයට අවශ්‍ය සියලු කුසලතා නිර්මාණය කරනු ඇත.

බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ'මේ ලෝකයේ යම් කෙනෙකු කුසලය ප්‍රාර්ථනා කරමින් කුමන හෝ ත්‍යාගයක් හෝ පූජාවක් කරයි ද, ඒ කිසිවක් ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කරන්නෙකුට ගෞරවය පූජා කිරීමෙන් ලැබෙන දෙයින් හතරෙන් එකක්වත් වටින්නේ නැත' (Dhp.108). ආදරණීය හදවතක් ඇති කර ගැනීම, ඊළඟ භවයේදී ලාභ ප්‍රයෝජන ලැබේ යැයි කියනු ලබන වංචනිකව යෙදූ උපක්‍රමවලට වඩා බොහෝ වාරයක් ඵලදායී බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. 'ඊළඟ ජීවිතය සඳහා කුසලතා වැඩීමට ඇති සියලු පදනම්වලින් ඒ කිසිවක් මනස නිදහස් කරන මෛත්‍රියේ දහසයවන පංගුවෙන් කොටසක් වටින්නේ නැත. මනස නිදහස් කරන මෛත්‍රිය ඒවා ඉක්මවා ගොස් ආලෝකමත් කරයි, දීප්තිමත් කරයි සහ බබලවයි' (It.19).

වැරදි අවබෝධ සහ දූෂණය සියලු මිනිස් ව්‍යවහාර තුළට වරින් වර රිංගයි. මේ සම්බන්ධයෙන් බුදුදහම වෙනත් ආගම්වලට වඩා වෙනස් නැත. බලන්න **කුසලතා පැවරීම**

## මේරු කන්ද

මහාමේරු, සිනෙරු, නෙරු සහ කෙලාස යනුවෙන් ද හැඳින්වෙන මේරු කන්ද ත්‍රිපිටකයේ බොහෝ විට සඳහන් කන්දකි. වර්තමානයේ එය මීටර් 6638ක් උස

බටහිර හිමාලයේ (A.I,227; Ja.I,321; III,210) පිහිටි කයිලාෂ් කන්ද වශයෙන් හැඳින් වේ. පැරණි ඉන්දියානු භූගෝලයේ කලාප හතර එක්වන ස්ථානය, ප්‍රථිවියේ උසම කන්ද සහ පසු කාලීන විශ්ව විද්‍යාව, සහ දෙවියන්ගේ වාසස්ථානය මේරු කන්ද ලෙස විශ්වාස කෙරේ.

මේරු කන්ද බෞද්ධයන්ට, හින්දුවරුන්ට සහ ජෛනයන්ට 'පූජනීය' යැයි සමහර විට කියනු ලැබේ. නමුත් මුල් කාලීන බුදුදහමට අදාළව මෙම කියමන යෝග්‍ය විය යුතුව ඇත. මුල් කාලීන බෞද්ධයන් මේරු කන්දේ ප්‍රමාණය, මහේශාක්‍ය බව සහ සුන්දරත්වය සම්බන්ධයෙන් උද්දාම වූ නමුත්, ඔවුන් එයට යම් ආධ්‍යාත්මික බලයක් ඇතැයි විශ්වාස නොකළහ. බුදුපියාණන් වහන්සේට අනුව, 'පූජනීය' කඳු, ගස් හෝ සිද්ධස්ථානවලට යෑමෙන් කිසිම අව්‍යාජ ආධ්‍යාත්මික ලාභයක් ලැබිය නොහැකිය (Dhp.188-92). කෙසේ නමුත්, මේරු කන්දෙන් දකින ගතිලක්ෂණ සමහර විට ඉහළම ආධ්‍යාත්මික වටිනාකම් සමග සමාන වේ. නිර්වාණය අවබෝධ කර ගැනීම 'මහා නේරු ශිඛරය ස්පර්ශ කිරීම' හා සංකේතමය ලෙස විස්තර කර ඇත (M.I,338). කන්දේ ස්ථීරබව සහ උපේක්ෂාව ආදර්ශයට ගැනීමට තරම් වටිනා සුවිශේෂී ගති ලක්ෂණ ලෙසද පෙනෙන්ට තිබේ. කෙසේ නමුත්, කන්දේ අනෙක් ගතිලක්ෂණ වටිනාකමින් අඩු ලෙස සැලකිල්ලට ගෙන තිබේ. පුරාවෘත්තයට අනුව, මේරු කන්ද රන්වන් කන්දක් ලබා දුන් අතර, එයින් එහි සිටි උතුම් සහ අධම සතුන් සියල්ලන්ම එක හා සමාන විය. වෙනත් වචනවලින් කිවහොත්, එයින් දක්ෂ සහ අදක්ෂ, යහපත් සහ අයහපත්, මෝඩයන් සහ

ප්‍රඥාවන්තයන් අතර වෙනස්කම් කිරීම (අවිසෙස්කර) සහ වෙන්කොට හඳුනාගැනීමට ඇති හැකියාව නැතිවිය (Ja,III,247; V,425).

සමකාලීන බටහිර සමාජය තුළ, කිසියම් විශ්වාසයක් කෙතරම් යථාර්ථවාදී නොවන බවක් හෝ ඕනෑම හැසිරීමක් කෙතරම් දුරාචාරවත් වුවත්, 'අප විනිශ්චය කළ යුත්තේ කවුරුන් ද?' යන ප්‍රකාශය ප්‍රතික්ෂේප කිරීමට සැලකිය යුතු අකැමැත්තක් ඇත. එවැනි දේ පිළිබඳව අදහස් කඩිමුඩියේ හෝ පක්ෂග්‍රාහීව ඉදිරිපත් කරන විට, තමන් දෙස බැලීම මග හැරීමේ උපක්‍රමය භාවිත කරන විට, හෝ ස්වයං ධාර්මිකවීම සහ තමා ගැනම ආඩම්බරවීමට යොමුවන විට, එවැනි අකැමැත්ත ඕනෑවටත් වඩා සාධාරණීය කෙරේ. නමුත්, දාර්ශනික පරමාදර්ශ සහ සදාචාරාත්මක සාරධර්ම තිබීම - ඊට පසු ඒවා සමග ජීවත්වීමට - වෙනස්කම් කිරීම, බුද්ධිමත් විනිශ්චයන් කිරීම සහ එක් අදහසක් හෝ ක්‍රියාමාර්ගයක් තෝරා ගැනීම සහ අනෙක්වා ප්‍රතික්ෂේප කිරීම අවශ්‍ය වේ. මෙය ප්‍රඥාව වර්ධනය වන එක් ක්‍රමයකි.
*Sacred Mountain*, John Snelling, 1990.

## මෛත්‍රිය

මෙත්තා යනු මෛත්‍රියේ ඉහළම හැඟීම් පළ කිරීම සඳහා වඩාත් සුලභව යොදන පාලි වචනයයි. එය පැමිණ ඇත්තේ 'මිත්‍රයෙකු' යන අර්ථය ඇති මිත්ත යන වචනයෙනි. 'මෛත්‍රිය යනුවෙන් අදහස් වන්නේ මිත්‍රශීලී ස්වභාවය සහ මිත්‍රශීලීත්වයෙන් හැසිරීමයි.' (මිත්තෙ වා භවා මිත්තස්ස වා එසා පවත්තී ති පි මෙත්තා, චුල්ල නිද්දෙස 117) විසුද්ධිමග්ගයේ

මෛත්‍රිය මෙසේ විස්තර කර ඇත ' මෛත්‍රිය විස්තර කර ඇත්තේ අනෙක් අයගේ සුභසාධනය වර්ධනය කරන බව සහ එහි ක්‍රියාව වන්නේ ඔවුන්ගේ සුභසාධනය කෙරෙහි අරමුණු කිරීමයි. එය පීඩා හිරිහැර ඉවත් කිරීම ප්‍රකට කරයි. එහි ආසන්නතම හේතුව වන්නේ සත්ත්වයන්ගේ මෛත්‍රීසහගත ස්වභාවය දැකීමයි. වෛරය අඩු කළ විට, එය සාර්ථක වන අතර, ඇල්මට වෙලීසිටීම වැඩි වූ විට, එය අසාර්ථක වේ' (Vism.318). කෙනෙකු 'තමන්ගේ මඟ පෙන්වන්නා ලෙස මෛත්‍රිය තබා ගෙන' (මෙත්තං පුරෙචාරිකං කත්වා, Ja.I,176; III,273) ඊට පසු කටයුතු කළ යුතු බව ජාතක කතාවල බොහෝ විට සඳහන් වේ. මෛත්‍රිය පරිත්‍යාගශීලීත්වය, සත්‍යවාදීබව සහ යහපත් ක්‍රියා සිදු කිරීම සමග ආරක්ෂාකාරී මන්ත්‍රයක් බව කියනු ලැබේ (Ja.I,200). ජෛන ආගමේ සහ හින්දු ආගමේ මෛත්‍රී, ග්‍රීක සමාජ විද්‍යාවේ 'අගපේ' සහ ක්‍රිස්තියානි ධර්මයේ සහ චීන ජාතික මුණිවරයෙකුවූ මොට්සු ගේ ඉගැන්වීම්වල සඳහන් ජෙනායි සමග මෙත්තා සමාන වේ. බලන්න **මෙත්ත සූත්‍රය**

## මෙත්ත සූත්‍රය

මෙත්ත සූත්‍රය යනු සුත්ත නිපාතයේ පද දහයක දේශනාවකි. එය බුදුපියාණන් වහන්සේගේ සියලු දේශනාවලින් වඩාත් ජනප්‍රිය සහ ප්‍රසිද්ධ එකකි. එහිදී බුදුපියාණන් වහන්සේ මෛත්‍රියේ ඇති සමහර ගතිලක්ෂණ විස්තර කරයි. ඒවාට නිහතමානී බව, තෘප්තිමත් බව, කථා කිරීමට පහසු සහ යහපත් දේ කිරීමට ඇති නිපුණත්වය ඇතුළත් වේ. බැහැර කිරීමක් නොමැතිව, 'දුටු සහ නොදුටු, ළඟ සහ දුර

සිටිනා' (Sn.147) සියලු සචේතනික සත්ත්වයන්ට මෛත්‍රිය පළකළ යුතු බව ද බුදුපියාණන් වහන්සේ පැවසූහ. බුදුපියාණන් වහන්සේගේ ඉතාමත් ජනප්‍රිය කියමනක් මෙත්ත සූත්‍රයේ ඇත (Sn.149), 'මවක් තමන්ගේ එකම දරුවා තමන්ගේ ජීවිතයට අනතුරක් තිබියදීත්, ආරක්ෂා කරන්නාක් මෙන්, සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය වැඩිය යුතුයි.' ශ්‍රී ලංකාව වැනි රටවල බොහෝ මිනිස්සු මෙත්ත සූත්‍රය කටපාඩමින් දනිති. ඔවුන් එය සජ්ඣායනය කරන්නේ එහි ඇති සන්සුන් සහ විශ්වාසය ලබාදෙන බලපෑමෙන් ඔවුන්ට ආරක්ෂාව ලැබේ යැයි යන විශ්වාසයෙනි.

*Living with Kindness: The Buddha's Teaching on Kindness*, Sangharakshita, 2004.

## මධ්‍යම දේශය

මධ්‍යම දේශය (මජ්ඣිම දේස) ඉන්දියාවේ උතුරු මැද ප්‍රදේශයේ ගංගානම් සහ යමුනා ගංගාවේ තැනිතලාවේ පැරණි නමයි. බුදුපියාණන් වහන්සේ උත්පත්තිය ලැබුවේ සහ බුදුදහම ආරම්භ වූයේ මේ ස්ථානයේ දීය. මධ්‍යම දේශය නැගෙනහිරෙන් කජංගල නගරයටත්, ගිනිකොන සලළවතී ගඟටත්, නිරිත දෙසින් සෙතක්ණ්ණික නගරයටත්, බටහිරෙන් ගම්මානය දක්වාත් විහිදී ඇති බවත්, සහ උතුරු දේශසීමා උසීරද්ධජ කඳුවැටියේ සලකුණු කර ඇති බව ධර්ම ග්‍රන්ථවල සඳහන් වේ (Vin.I,196). මෙම බිම් සලකුණුවලින් කිහිපයක් අද හඳුනාගත හැකි නමුත්, මධ්‍යම දේශය, නූතන ඉන්දියානු උත්තර් ප්‍රදේශය සහ බිහාර් සහ නේපාලයේ පහත් බිම් සමග අන්‍යෝන්‍ය සම්බන්ධකම් ඇත. බුදුපියාණන් වහන්සේ විශ්වාස කළේ මධ්‍යම දේශයේ ඉපදීම

පැහැදිලිවම වාසියක් බවයි. එයට හේතුව, සැබැවින්ම සමහර විට එකල මධ්‍යම දේශය උපමහාද්වීපයේ අළුතින් නැඟී එන ශිෂ්ටාචාරයේ ප්‍රධාන මධ්‍යස්ථානය වීමයි (A.IV,226).

බුදුපියාණන් වහන්සේගේ අවුරුදු 45ක සංචාර සහ ඔබමොබ යෑම උන්වහන්සේ වර්ග කිලෝමීටර් 235,000 පමණ ප්‍රදේශයක් හරහා ගෙන ගොස් ඇත. එයින් උන්වහන්සේ සියලු උතුම් ආගමික ගුරුවරුන් අතර වඩාත් පුළුල් ලෙස සංචාරය කළ පුද්ගලයා බවට පත් කර ඇත. ජේසුස් වහන්සේ ඉගැන්වූ ප්‍රදේශය ඊට වෙනස්ව, වර්ග කිලෝමීටර් 900ක් පමණ වේ. බුදුපියාණන් වහන්සේ නැගෙනහිරට වැඩිය දුරතම ප්‍රදේශය ලෙස තවමත් හඳුනා ගත හැක්කේ කන්ක්ජොල් (කජංගල, A.V,54) කිලෝමීටර් 18ක් දකුණට රජ්මහල්, සහ බටහිර දෙසින් වැඩිම ප්‍රමාණය මධුර වේ. එය දිල්ලියට කිලෝමීටර් 135ක් දකුණෙන් තිබේ. මෙම ස්ථාන දෙක කිලෝ මීටර් 1000කට කිට්ටුව වෙන්ව ඇත.

ශ්‍රී ලංකාවේ සහ තායිලන්තයේ ජනප්‍රිය ජනප්‍රවාදවල සඳහන් වන්නේ බුදුපියාණන් වහන්සේ එම රටවලට වැඩිය බවත්, නේපාල බෞද්ධයන් විශ්වාස කරන්නේ උන්වහන්සේ කත්මණ්ඩු නිම්නයට වැඩිය බවත්ය. එවැනි සංචාරයන් ගැන ත්‍රිපිටකයේ සඳහන් වී නැත. එසේම උන්වහන්සේ කිසිම දිනක මධ්‍යම දේශයෙන් ඔබ්බට වැඩිය බවට කිසිම සාධකයක් නැත. බලන්න **බුදුපියාණන් වහන්සේගේ සංචාර**

*The Geography of Early Buddhism*, B.C. Law,1979.

## මධ්‍යම ප්‍රතිපදාව

මධ්‍යම ප්‍රතිපදාව (මජ්ජිමා පටිපදා) යනු බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ආර්ය අෂ්ටාංගික මාර්ගයට (S.IV,330-1) දුන් විකල්ප නාමයකි. උන්වහන්සේ එය එසේ හැඳින්වූයේ බෞද්ධ ආධ්‍යාත්මික ජීවිතය ගත කළ යුත්තේ ස්වයං අත්තකිලමථය සම ස්වයං සැපයෙහි ගැලීම යන දෙකේ අන්තය, සැබැවින්ම සියලු අන්තයන් මඟහරිමින්ය. සමබරතාවය සහ මධ්‍යස්ථභාවය පිළිබඳ මෙම අවධාරණයෙන් අදහස් වන්නේ බුදුදහම එහි දීර්ඝ ඉතිහාසය තුළ අන්තගාමීන් හෝ අන්තවාදී කණ්ඩායම් කිහිපයක් බිහිකර ඇති බවයි.


N
NEPAL
Kathmandu
Savatthi
Lumbini
Kapilavatthu
UTTAR
PRADESH
Mathura
Agra
Ganges River
Ghaghara River
Gorakhpur
Lucknow
Sankassa
Kusinara
Kanpur
Yamuna River
Bettiah
Keasriya
BIHAR
Vesali
Ganges River
Allahabad
Kosambi
Sarnath
Varanasi
Patna
Nalanda
Rajgir (Rajagaha)
Gaya
Bodh Gaya
(Uruvela)
THE MIDDLE LAND
Modern Names
Ancient Names

## මිලින්දපඤ්හ

ඉන්දියානු භික්ෂුවක වූ නාගසේන සහ ඉන්දු ග්‍රීක රජකෙනෙකු වූ මිලින්ද අතර ඇති වූ සාකච්ඡාවක ස්වරූපයෙන් රචිත ග්‍රන්ථය මිලින්දපඤ්හ නම් වේ.

මේ දෙදෙනා අතර එවැනි සාකච්ඡාවක් සැබැවින්ම පැවතෙන්නට හැකි නමුත්, මිලින්දපඤ්හ සාහිත්‍යමය නිර්මාණයකි. බෞද්ධ ධර්මයේ විද්‍යමාන වන පරස්පර විරෝධයන් සහ අපැහැදිලි කරුණු පැහැදිලි කිරීමට නව පරිවර්තකයන් භාවිත කිරීමට එය සමහර විට මුලින් රචනා වී ඇත. මිලින්දපඤ්හයේ දුෂ්කර ප්‍රශ්න මාලාවක් රජු නාගසේන භික්ෂුවගෙන් අසන අතර, ඒවාට උත්වහන්සේ උදේාගීමත් සහ බොහෝ විට අවංක පිළිතුරු සපයා ඇත. මිලින්දපඤ්හයේ මුල්ම කොටස ලියා ඇත්තේ ක්‍රි. පූ. 1වන ශතවර්ෂයේදී පමණය. සමහර විට පකිස්ථානයේ ලියා, පසුව පාළි භාෂාවට පරිවර්තනය කර අවසානයේ ශ්‍රී ලංකාවට ගෙන ගොස් ඇත. එහිදී පසුකාලීනව තවත් කොටස් එකතු කර ඇත. මිලින්දපඤ්හ විශ්වාසය තැබිය හැකි නිර්මාණයක් ලෙස බෞද්ධයන් සලකන නමුත්, එය ත්‍රිපිටකයේ කොටසක් නොවේ.

*Milinda's Questions*, trans. by I.B.Horner, Vol. I, 1964; Vol.II, 1965.


N
NEPAL
Kathmandu
Savatthi
Lumbini
Kapilavatthu
UTTAR
Mathura
Agra
Ganges River
Gorakhpur
Ghaghara River
Lucknow
Kusinara
Sankassa
Kanpur
Yamuna River
PRADESH
Bettiah
Keasriya
BIHAR
Vesali
Ganges River
Allahabad
Kosambi
Sarnath
Varanasi
Patna
Nalanda
Rajgir (Rajagaha)
Gaya
Bodh Gaya
(Uruvela)
THE MIDDLE LAND
Modern Names
Ancient Names

## මනස

මනස (චිත්ත, මනො හෝ විඤ්ඤාන) සිහි කල්පනාවෙන් සිටීමට, හැඟීම් දැනීමට, සිතන්නට, විනිශ්චයන් කිරීමට සහ විමසීමට පුද්ගලයෙකුට ඉඩ සලසන අවයවයකි. දෙආකාරයකින් සමහර ආගම්වලට දෙවියන් වහන්සේ වන දේ බුදුදහමට මනස වේ. : 1. දේවවාදියා ඔහුගේ හෝ ඇයගේ සියලු අවධානය දෙවියන් වහන්සේ වෙතට යොමු කරන අතර, බෞද්ධයෙකුගේ ප්‍රධාන අවධානය වන්නේ මනසයි. 2. දේවවාදියා සියලු බලයන්, හැකියාවන් සහ පෙනෙන විදියට ප්‍රාතිහාර්යමය සිදුවීම් දෙවියන් වහන්සේට පවරන අතර, බෞද්ධයා ඒවා සිදුවන්නේ මනස නිසා බව දනී.

ත්‍රිපිටකයේ සඳහන් කර ඇති පරිදි බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වලින් විශාල ප්‍රතිශතයක් මනසෙහි ස්වභාවය විස්තර කිරීමට, එහි ගතිලක්ෂණ සහ හැකියාවන් විමසීමට සහ එය හික්මීමට, වෙනස් කිරීමට සහ නිදහස් කිරීමට කැප කර ඇත. පුද්ගලයෙකු නිර්මාණය කරන කොටස් හතරකි. අනෙක් ඒවා භෞතික රූප (රූප), හැඟීම් (වේදනා), හැඳින ගැනීම් (සඤ්ඤා), සහ මානසික ව්‍යූහයන් (සංඛාර) වේ. 'මනස සහ කය එකිනෙකා මත රඳා පවතින්නේ කප්පි රෝද දෙකක් එකිනෙකට විරුද්ධව හේත්තුවී නැගිට සිටින අයුරෙන්' බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (S.II,114).

'සියලු දේ මනසට ඉස්සර වෙයි, මනස ඒවායේ මඟ පෙන්වන්නා වේ, මනසෙන් ක්‍රියාත්මක වේ' (Dhp.1).

'සත්ත්වයන් කිළිටි වන්නේ කිළිටි මනසක් තිබීමෙනි, ඔවුන් පිරිසිදු වන්නේ මනස පිරිසිදු කිරීමෙනි'(S.III,151). දියුණු කළ මනසක් තරම් විශාල ප්‍රතිලාභයක් ලබා ගත හැකි කිසිම දෙයක් මම නොදනිමි. සැබැවින්ම දියුණු කළ මනසක් විශාල ප්‍රතිලාභයක් සඳහා හිතකර වේ' (A.I,8). 'ආධ්‍යාත්මික වශයෙන් ගත කරන ජීවිතය ජීවත් වන්නේ ලාභ, ගෞරව හෝ කීර්තියෙන් ලැබෙන වාසි හෝ සදාචාරය, භාවනාව හෝ දැන ගැනීම හෝ දැක ගැනීමෙන් ලැබෙන ප්‍රතිලාභ සඳහා නොවේ. නමුත් මනසේ සම්පූර්ණ නිදහස වූ, ආධ්‍යාත්මික ජීවිතයේ අරමුණ, ඉලක්කය සහ කූටප්‍රාප්තිය සඳහාය' (M.I,197).

බලන්න **සිත එකඟ කිරීම, මානසික කෙලෙස්, වඳුරු මනස, ව්‍යාජ විද්‍යාව සහ අවිඥානක**

'Citta, Mano and Viññana.' Rune Johnsson, *University of Ceylon Review*, Vol.23, 1965.

## හුස්ම පිළිබඳව සිහිකල්පනාව

බෞද්ධ භාවනාවේ මූලිකම සහ ජනප්‍රියම ස්වරූපය වන්නේ ආශ්වාසය සහ ප්‍රශ්වාසයයි (ආනාපානසති). බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ 'ආනාපානසතිය දියුණු කිරීමෙන් සහ වැඩි කිරීමෙන්, එය ප්‍රතිඵලදායක සහ ප්‍රයෝජනවත් වේ.' මෙම භාවනාව වඩන්නා පහසු ඉරියව්වක, සාමාන්‍යයෙන් දෙපා හරහට සහ කොන්ද ඍජුව තබාගනිමින්, හුස්ම ඇතුළතට සහ පිටතට යන එන ආකාරය දෙස අරමුණ සෙමෙන් තබා ගන්නට උත්සාහ ගනී (M.III,82). ක්‍රමයෙන් ඉදිරියට යන විට තමන්ගේ අවධානය වෙනතකට යන විට වහා දැනගෙන නැවත එය හුස්මේ අවධානයට ගන්නට හැකි වේ. ඒ අනුව, ඔහුට ඉහළ මට්ටමේ අවධානයක්, මානසික

සංවරයක් සහ කායික සහ මානසික සැහැල්ලුවක් වර්ධනය වේ. මෙම පුහුණුව පරිණත වූ විට, සිත එක්තැන් කිරීමට සිහිය පවත්වා ගැනීමට ඉඩ සැලසිය යුතුය. එනම් අවධානය පාලනය කිරීමට උත්සාහ දරනවා වෙනුවට, පුද්ගලයා මොහොතෙන් මොහොතට සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳව හුදෙක්ම දැන ගනී. මෙම කායික සුවපහසුව සහ මානසික අවදියෙන් සිටීම මනස පාලනය කිරීමේ පළමු පියවර බැවින්, එය තේරුම් ගෙන අවසානයේ නිදහස් කර ගත හැකිය.

බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ 'උණුසුම් ඍතුවේ පසුගිය මාසයේ දූවිලි සහ වැලි කැට සුළඟට ගසාගෙන ආවිට, අනපේක්ෂිත වර්ෂාව වහාම එය සමථයකට පත් කළාසේම, හුස්ම පිළිබඳව සිහියෙන් සිටීම දියුණු කරමින් වර්ධනය කළ විට, මනස සන්සුන් සහ උත්කෘෂ්ට වේ, ජීවත් වීමට ප්‍රසන්න මාර්ගයක් ඇති වේ, සහ නරක, සූක්ෂම සිතුවිලි වහා දුරු වේ, කිඳා බසී' (S.V,321). සුප්‍රසිද්ධ මනෝවිද්‍යාඥ විලියම් ජේම්ස් එවැනිම කරුණක් නූතන භාෂාවෙන් පමණක් ප්‍රකාශ කළේය. 'ස්වේච්ඡාවෙන් ඔබ මොබ යන අවධානය නැවත නැවත ගෙන ඒමට ඇති විශේෂ හැකියාව විනිශ්චයේ, චරිතයේ සහ අධිෂ්ඨානයේ හරියටම මුලයි. පුද්ගලයෙකුට තමන් සතුව විශේෂ හැකියාවක් තිබුණත් හෝ නැතිවුවත්, කිසිම පුද්ගලයෙකු තමාගේම ස්වාමියා නොවේ. මෙම අභියෝග්‍යතාව දියුණු කරන අධ්‍යාපනයක් විශිෂ්ට අධ්‍යාපනයක් වේ.' බලන්න **පද්මාසන ඉරියව්ව**

*Breath by Breath*, Larry Rosenburg,1999.

1.

## සම්මා සතිය

සිහිකල්පනාව හෝ සම්ප්‍රජානනය (සති) බුදුපියාණන් වහන්සේගේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ හත්වන පියවරයි. සිහිකල්පනාව යනු අත්දැකීම් පැහැදිලිවම තේරුම් ගෙන එය බාධා නොකරන සහ විවේචනාත්මක නොවන අයුරෙන් නිරීක්ෂණය කරන, මනසේ ගුණාංගයකි. සාමාන්‍යයෙන් අප සතු එක් එක් අත්දැකීම්, ආශාවන්, සිතුවිලි සහ මතකයන් මුදා හරී. මෙයින් අප සැබෑවූ අත්දැකීම් දැකීමෙන් වැළකේ. සිහිකල්පනාව පිළිබඳ භාවනාවේ අරමුණ වන්නේ සිහියෙන් සිටීමට ඇති හැකියාව ශක්තිමත් කර ඊට පසු එය ශරීරය, හැඟීම්, මනස සහ මනසේ අන්තර්ගතය නිරීක්ෂණය කිරීමට භාවිත කිරීමයි. කාලයත් සමග, මේවා නොවැදගත්, නොපෙනී යන, අපුද්ගල සංසිද්ධි ලෙස පෙනෙන්නට පටන් ගනී. ඒවා කෙරෙහි නොඇලීමක් උපදියි. ලෞකික දෘෂ්ටිකෝණයකින් වුවද, මෙයින් බොහෝ ප්‍රයෝජන ඇති වේ. මෙම සිහිකල්පනාව එදිනෙදා ජීවිතයේදී වුව ද පවත්වා ගත හැකි නම්, ප්‍රකෝප කිරීම හමුවේ සන්සුන්ව සිටීමටත්, පෙළඹවීම ඉදිරියේදී නොසැලී සිටීමටත්, මනසේ වඩා සතුට සහ සැනසිල්ල දියුණු කර ගැනීමටත් හැකි වේ. ඒ නිසා බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ 'සිහිකල්පනාව සැම තැනේදීම උපකාරී වේ'(S.V,115). විශේෂයෙන්ම ප්‍රඥාව වැඩීමට සිහිකල්පනාව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. බලන්න **මායාව සහ බුදුපියාණන් වහන්සේගේ අවසාන වචන**

*Insight Meditation*: *The Practice of Freedom*, Joseph Goldstein, 1993.

## ප්‍රාතිහාර්යයන්

ප්‍රාතිහාර්යයක් (පාටිහාරිය) යනු ස්වභාව ධර්මයේ දන්නා නීතිවලට පටහැනි ක්‍රියාවක් හෝ සිදුවීමකි. එසේම එයට දිව්‍යමය හේතුවක් ඇතැයි විශ්වාස ද කෙරේ. වඩාත් බහුලව සාමාන්‍ය ලෙස වාර්තා වන ඒවාට හදිසි වෛද්‍යමය නොවන සුව කිරීම්, දෙවියන්ගේ දිස්වීම, දෙවියන්ගෙන් පණිවුඩ ආදිය ඇතුළත් වේ. බුදුපියාණන් වහන්සේ ප්‍රාතිහාර්යයන් සිදුවිය හැකි බව පිළිගත් අතර, උන්වහන්සේට වාර්තා වූ යැයි කියනු ලැබූ බොහෝ ප්‍රාතිහාර්යයන් පිළිබඳව උන්වහන්සේට තිබූයේ සැක සහිත ආකල්පයයි. වරක්, කෙනෙකු 'ඔබවහන්සේ කෙරෙහි වඩාත් මිනිසුන් තුළ විශ්වාසය ඇති වේ' යැයි පවසමින් උන්වහන්සේට ප්‍රාතිහාර්යයක් පාන ලෙස ඉල්ලා සිටියේය. බුදුපියාණන් වහන්සේ පිළිතුරු දෙමින් පැවසුවේ, කල්පනාකාරී සහ සුපරික්ෂාකාරී පුද්ගලයන් තුළ ප්‍රාතිහාර්යයන් පිළිබඳව සැක ඇති බවයි. කෙසේ වෙතත්, සියල්ලන්ටම විශ්වාස කළ හැකි ප්‍රාතිහාර්යය උන්වහන්සේ හඳුන්වන්නේ 'උපදේශයේ ප්‍රාතිහාර්යය' (අනුසාසනී පාටිහාරිය) බවයි. මෙම ප්‍රාතිහාර්යය සමන්විත වන්නේ සදාචාරය, පිළිගැනීම, මනසේ සැනසිල්ල සහ භාවනාව බව උන්වහන්සේ පැවසූහ (D.I,214). බුදුපියාණන් වහන්සේ මෙසේ කියමින් ප්‍රාතිහාර්යය පිළිබඳ උන්වහන්සේගේ ආකල්පය සාරාංශ ගත කළහ: 'ප්‍රාතිහාර්යයන් පෑවත්, නොපෑවත්, ධර්මය ඉගැන්වීමේ මගේ අරමුණ වන්නේ එය පුහුණු කරන ඕනෑම කෙනෙකු සම්පූර්ණයෙන්ම දුකෙන් මිදීමේ නිදහස කරා මෙහෙය වීමයි. එසේ නම් හාස්කම් කිරීමේ තේරුම කුමක් ද?' (D.III,4).

සමහර ආගම්වලින් කියන්නේ ඔවුන්ගේ ශාස්ත්‍රවරයාට ප්‍රාතිහාර්යයන් පාන්නට හැකි බවත් එය ඔහුගේ අද්විතීය දේවත්වයට සාක්ෂියක් බවත්ය. නමුත් මෙම කියාපෑම සම්බන්ධයෙන් ප්‍රශ්න ඇත. වෙනත් ආගම් විසින් ප්‍රාතිහාර්යයන්ගේ යථාර්ථය සම්බන්ධයෙන් කියන දේ ප්‍රතික්ෂේප කිරීම අවශ්‍ය වේ. එක් ආගමික නිර්මාතෘවරයෙකු හෝ සාන්තුවරයෙකු කරන ලද ප්‍රාතිහාර්යයක ස්වභාවය බොහෝ විට සහතික කර ඇති හෝ සමහර විට තවත් අයෙකු විසින් කරන ලද ඒවාට සමාන වෙන බවට කියන හෙයින්, එක් නිර්මාතෘවරයෙක් දිව්‍යමය බවත්, අනෙක් අය එසේ නොවන බවත් ප්‍රකාශ කිරීම ඒත්තුගැන්විය නොහැකිය.

තවද, ප්‍රාතිහාර්යමය බලයන් ඇති පුද්ගලයන් පසුකාලීනව ඕනෑවට වඩා මනුෂ්‍ය බවට පමණක් පත් වූ බවට ඉතිහාසය බොහෝ උදාහරණ සපයා ඇත. එසේ තිබියදී, ප්‍රාතිහාර්යමය හැකියාවන් සහ දේවත්වය හෝ දිව්‍යමය අනුග්‍රහය අතර සම්බන්ධය දුර්වල එකකි. බුදුදහම සැමවිටම පෙන්වා දී ඇත්තේ බුදුපියාණන් වහන්සේගේ ක්‍රෘර සහ කපටි ඥාති සහෝදර දේවදත්ත ධ්‍යාන බල ඉතා ඉහළ මට්ටමකට දියුණු කරගත් බවයි. එම නිසා බෞද්ධ දෘෂ්ටි කෝණයෙන් බලන විට, ප්‍රාතිහාර්යයක් පෑමට ඇති හැකියාව සදාචාරාත්මක හෝ ආධ්‍යාත්මික පරිපූර්ණත්වයට සාක්ෂියක් නොවේ. අවසාන වශයෙන්, අසාමාන්‍ය සිදුවීම් අව්‍යාජ නම්, එසේ සිදුවන්නේ දිව්‍යමය බලයට වඩා, බොහෝ විට පුද්ගලයෙකුගේ චෛතසික හැකියාවන් නිසා විය හැකිය. මෙය අවම වශයෙන් බෞද්ධ ස්ථාවරයයි.

බුදුපියාණන් වහන්සේට සහ සමහර ශ්‍රාවකයන්ට ප්‍රාතිහාර්ය පෑමේ බලය තිබූ බව සමහර විට පැවසේ (e.g. D.II,89; III,38). බුදුපියාණන් වහන්සේගේ ප්‍රාතිහාර්යයන් පිළිබඳ කථාවන් හරියටම නිවැරදි බවට සමහර මිනිස්සු විශ්වාස කරති. ඒ අතර අනෙක් අය ඒ දෙස බලන්නේ උපහැරණයක අර්ථයෙන් හෝ ධර්ම ග්‍රන්ථවලට පසු කාලීනව එකතු කළ දෙයක් ලෙසයි. කොයි ලෙස සිතුවත්, නිර්වාණයට පත්වීම ප්‍රාතිහාර්යයන් පිළිබඳව විශ්වාස කිරීම මත රඳා නොපවතී. එසේම බුදුදහමේ ප්‍රධාන මූලධර්ම කිසිවක් අද්භූත හෝ ප්‍රාතිහාර්යමය ස්වභාවයකින් යුක්ත නොවේ.

බලන්න **මාරු කිරීම, ගංගානම් ගඟ, අනාවැකි, ව්‍යාජ බව සහ සංකස්ස**

‘Miracles in Early Buddhism.’David. J. Kaluphana in *Buddhist Studies*, 2002.

## ධර්මදූතයන් සහ දූතමෙහෙවර

දූතමෙහෙවර යනු යම් කෙනෙකුට පැවරෙන හෝ තමාටම පවරා ගන්නා වැදගත් කාර්යයකි. ධර්මදූතයන් යනු තමන්ගේම රට හැර වෙනත් රටවලත් තමන්ගේ ආගම ව්‍යාප්ත කරන අයයි. මේ දෙකෙන් එකකටවත් බුදුදහමේ වචනයක් නොමැති වූවත්, හැකිතාක් පුළුල් ලෙස ධර්මය ප්‍රවර්ධනය කිරීමේ අදහස ආරම්භ වූයේ බුදුපියාණන් වහන්සේගෙන්ය. එසේම එය ශතවර්ෂ ගණනාවක් පුරා බුදුදහමට වැදගත් විය. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ පළමු ශ්‍රාවකයන් පස්දෙනා පිළිගත් පසු, ඔවුන් මෙසේ ඇමතූහ: ‘බොහෝ දෙනෙකුගේ යහපත පිණිස, බොහෝ දෙනෙකුගේ සතුට පිණිස,

ලෝකය කෙරෙහි කරුණාවෙන්, දෙවිවරුන්ගේ සහ මිනිසුන්ගේ සුභසාධනයට, යහපතට සහ සතුට පිණිස, ඉදිරියට යන්න. දෙදෙනෙකු එකම දිසාවට නොයන්න. ආරම්භය ලස්සන, මැද ලස්සන සහ අවසානය ලස්සනවූ ධර්මය උගන්වන්න. සම්පූර්ණයෙන්ම තෘප්තිමත් සහ හැම අතින්ම පිරිසිදු වූ පූජනීය ජීවිතයේ රීතිය සහ රීතියේ අරමුණ යන දෙකම පැහැදිලි කරන්න'(Vin.I,20). තවත් අවස්ථාවක, උන්වහන්සේ කියා සිටියේ, තමන්ගේ ශ්‍රාවකයන් ධර්මය පිළිබඳව 'කථා කළ යුතු' 'ඉගැන්විය යුතු' සහ 'ආලෝක කළ යුතු' බවයි (A.II,51).

බෞද්ධ ධර්මදූතයන් කිසිවිටකත් ධර්මය ව්‍යාප්ත කිරීම සඳහා ආක්‍රමණශීලී හමුදාවන් හෝ යටත් විජිත බලහත්කාරයන් සමග එක්ව කටයුතු කළේ නැත. බුදුදහම ප්‍රවර්ධනය සඳහා බලපෑම් හෝ නීතිමය සම්බාධක පැනවීම් පිළිබඳ උදාහරණ ද ස්වල්පයක් ඇත. සමහර විට මෙයට හේතුව ධර්මදූතයන්ට තිබිය යුතු ඉගැන්වීමේ ආචාර ධර්ම පිළිබඳව උන්වහන්සේ ස්ථීරවම සිටි නිසා විය හැකිය. මේවාට ඇතුළත් වූයේ 'ධර්මය ඉගැන්විය යුත්තේ කරුණාවෙන්', 'වාසි ලබා ගැනීමට නොවේ', සහ තමන්ගේ හෝ අනුන්ගේ හානි පිණිස නොවේ' (A.III,184)) යනාදියයි. පුළුල් සහ සාර්ථකත්වයට පත් අවසාන මහා බෞද්ධ ධර්මදූත ප්‍රයත්නය වූයේ 16 සහ 17වන ශතවර්ෂය තුළ දී දකුණු හිමාලයේ (කින්නෞර් සහ සික්කිම්) ජනතාව ටිබෙට් ජාතික භික්ෂූන් විසින් වෙනස් කිරීමයි. අද ආසියාවේ බොහෝ ධර්මදූතයන් වහන්සේලා යුරෝපයේ සහ ඇමරිකාවේ ධර්මය ව්‍යාප්ත කිරීමට කටයුතු කරති. පරස්පර විරෝධීව හෝ නොදැනුවත්ව ක්‍රිස්තියානි මිෂනාරිවරුන්

බුදුදහම ප්‍රවර්ධනය සඳහා යම්කිසි කාර්යභාරයක් ඉටුකර ඇත. 19වන ශතවර්ෂයේ අගභාගයේදී ශ්‍රී ලංකාවේ සහ 20වන ශතවර්ෂයේදී බුරුමයේ බෞද්ධ පුනර්ජීවනය ආරම්භ වූයේ සමහර මිෂනාරිවරුන්ගෙන් ප්‍රත්‍යක්ෂ වූ උඩඟුකමට සහ අසංවේදීතාවට එරෙහි ප්‍රතික්‍රියාවක කොටසක් වශයෙනි. බලන්න **ආගම්වලට හැරවීම සහ සුනාපරන්තයේ පුණ්ණ**

## නිහතමානීකම

නිහතමානීකම (අප්පිච්ඡතා) යනු තමන්ගේ ගුණවත්කම හෝ ජයග්‍රහණ පිළිබඳව පුහු ප්‍රදර්ශනයෙහි නොයෙදෙන ගුණාංගයයි. සමහර ආගම්වල, නිහතමානීකම හෝ ස්වයං අපයෝජනය පවා යහපත් යැයි සැලකේ. එයට හේතුව එය මනුෂ්‍ය වර්ගයාගේ පව්කාරකම පිළිගැනීම සහ දෙවියන් වහන්සේ කෙරෙහි අව්‍යාජ බියක් දැක්වීම නිසාය. බුදුදහමට අනුව ඔබගේ සැබෑ වටිනාකමට වඩා ඔබ කෙරෙහි තක්සේරු කිරීම අහංකාර කමයි (මාන). ඒ අතර, ඕනෑකමින්ම ඔබ අවතක්සේරු කිරීම එක්තරා ආකාරයක ප්‍රතිලෝම ආඩම්බරයකි. යටහත් පහත් බව යනු ඔබේ සැබෑ වටිනාකම අවතක්සේරු කිරීමයි. නිහතමානීකම යනු ඔබේ සැබෑ වටිනාකම දනිමින් ඒ පිළිබඳව අහංකාර හෝ අධික හා අනිසි ලෙස සතුටු නොවීමයි. අව්‍යාජලෙස නිහතමානී පුද්ගලයන්ට තමන්ගේ සැබෑ ස්වරූපයෙන් දැකීමට හැකියාවක් ඇති අතර, ඔවුන්ගේ යහපත් ගතිගුණ පිළිබඳව නිෂ්ඵල හෝ ස්වයං ප්‍රවර්ධයකින් තොරව, ප්‍රීති ප්‍රමෝදයට පත්විය හැකිය. එසේම තමන්ගේ

වැරදි ලැජ්ජාවෙන් හෝ ස්වයං පිළිකුලකින් තොරව පිළිගැනීමටත් හැකි වේ.

වරක් බුදුපියාණන් වහන්සේ තමන්ගේ ගිහි ශ්‍රාවකයෙකු වූ හත්ථකට විශ්මය ජනක සහ විශිෂ්ට ගුණාංග හතක් තිබෙන බව සමහර භික්ෂූන් සමග පැවසූහ; ඒවා නම් විශ්වාසය, ගුණවත්කම, විනීතකම, ආත්ම ගෞරවය, ඉගෙනීම, ත්‍යාගශීලීත්වය සහ ප්‍රඥාවයි. පසුව බුදුපියාණන් වහන්සේ තමන් පිළිබඳව ඇගයීම සම්බන්ධයෙන් හත්ථකට දැනගන්නට ලැබී මෙසේ අදහස් දැක්වූයේය: 'මම හිතනවා ඒ වේලාවේ එතැන ගිහියන් නොසිටින්නට ඇත කියා.' මෙම අදහස් දැක්වීම පිළිබඳව බුදුපියාණන් වහන්සේට දැනගන්නට ලැබුණු විට, උන්වහන්සේ මෙසේ මතයක් පළ කළහ: 'හොඳයි! ඉතා හොඳයි!. ඔහු අව්‍යාජවම නිහතමානී වේ. ඒ නිසා ඔහු අව්‍යාජවම නිහතමානී නිසා ඔහුට අනෙක් අය ඔහුගේ යහපත් ගතිගුණ දැන ගැනීම අවශ්‍ය නොවේ. එබැවින් හත්ථක ඔහුගේ අටවන විශ්මය ජනක සහ විශිෂ්ට ගුණය වූ නිහතමානීකමෙන් සැබැවින්ම අලංකාර වී ඇති බව කිව හැකිය' (A.IV,218). බලන්න **ප්‍රසිද්ධ ස්ථානවල දී කාන්තාවන්ගේ හිස සහ මුහුණු වැස්ම**

**මොග්ගල්ලාන**

මොග්ගල්ලාන යනු බුදුපියාණන් වහන්සේගේ ප්‍රධාන ශ්‍රාවකයන් දෙදෙනාගෙන් එක් කෙනෙකි. උන්වහන්සේ සහ ළමා කාලයේ මිතුරා වූ සාරිපුත්ත මහරහතන් වහන්සේ සඤ්ජය ගුරුවරයා යටතේ භික්ෂුත්වය ලැබූහ. නමුත්, අවසානයේදී එම ගුරුවරයා සහ ඔහුගේ දර්ශනය කෙරෙහි කලකිරීමට

පත්ව, ඊට පසු කැඩී බිඳී වඩා හොඳ ගුරුවරයෙකු සොයමින් ඔවුන්ගේ වෙනස් වූ මාර්ගයක ගියහ. එක් දිනක සාරිපුත්තට බුදුපියාණන් වහන්සේගේ ධර්මය පිළිබඳව දැනගන්නට ලැබී, එම ධර්මය වැළඳගෙන තමන් සොයා ගත් ඒ ආශ්චර්යමත් ඉගැන්වීම පිළිබඳව මිතුරාට පැවසීම සඳහා ඔහු සොයා ඉදිරියටම ගියේය. ඔවුන් හමු වූ පසු, මොග්ගල්ලාන ධර්මය අසා බුදුදහම වැළඳ ගත්තේය. දෙදෙනා භික්ෂුත්වය ලබාගැනීම සඳහා බුදුපියාණන් වහන්සේ සොයා ගියහ. කාලයත් සමග මොග්ගල්ලාන සහ සාරිපුත්ත බුදුපියාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවක සහ උරුමක්කාර තත්ත්වවලට පත්වූහ. මොග්ගල්ලානට චෛතසික බල පිළිබඳ ස්වාභාවික හැකියාවක් තිබූ අතර, භාවනාව තුළින් ඉතා ඉහළ මට්ටමකට දියුණු කළහ. නමුත් ඔහු කිසි විටක ඒ පිළිබඳව අහංකාර වූයේ හෝ නොමඟ යැවුණේ නැත. උන්වහන්සේට අඳුරු පැහැයක් තිබූ බව සම්ප්‍රදායෙන් පැවසේ. උන්වහන්සේ විසින් විසින් දේශනා කරන ලද ධර්ම දේශනා දුසිම් කිහිපයක් ත්‍රිපිටකයේ සඳහන් වේ. උන්වහන්සේ බුදුපියාණන් වහන්සේට පෙර පරිනිර්වාණයට පත් වූහ. ඒ බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට එරෙහි අන්තගාමී ප්‍රතිවාදීන් විසින් ඝාතනය කිරීමෙනි. ශ්‍රී ලංකාවේ සහ තායිලන්තයේ පන්සල්වල බුදුපියාණන් වහන්සේගේ ප්‍රධාන ප්‍රතිමාව බොහෝ විට කුඩා ප්‍රතිමා දෙකකින් දෙපැත්ත ආරක්ෂා කර ඇත. එයින් එකක් මොග්ගල්ලාන සහ අනෙක සාරිපුත්ත වශයෙනි.
*Great Disciples of the Buddha*, Nyanaponika, 1997.

## පැවිදි ආශ්‍රමයක්

පැවිදි ආශ්‍රමයක් (ආරාම, ආවාස හෝ විහාර) යනු

භික්ෂූන් වැඩ වසන ස්ථානයකි. භික්ෂුණීන් වැඩ වසන ස්ථානයක් භික්ෂුණී ආරාමයක් ලෙසත්, නිවසක් පාළි භාෂාවෙන් (උපස්සය) ලෙසත් හැඳින් වේ. පළමු බෞද්ධ පැවිදි ආශ්‍රම සහ භික්ෂුණී ආරාම බුදුපියාණන් වහන්සේට පරිත්‍යාග කරන ලද ආරණ්‍ය සහ උද්‍යානවල ඉදිකර තිබූ තණකොළ පැල්පත් හෝ කුඩාරම්වලට වඩා ටිකක් ලොකුය. ඒවා වර්ග පහකින් යුක්ත වන්නට ඇත - නිවසක්, පැල්පතක්, වටකුරු පැල්පතක්, දිගටි පැල්පතක්, ගැමි ගෙදරක් හෝ ගුහාවක් වශයෙනි (Vin.V,146). පළමු බෞද්ධ ආශ්‍රමය වූ රජගහ නුවර පිහිටි වේළුවනාරාමය බිම්බිසාර රජු විසින් පූජා කරන ලද්දකි. කාලයාගේ ඇවෑමෙන් සරල ගොඩනැඟිලි ස්ථීර ව්‍යූහයන් සහ අවසානයේ සමහර විට ඉතා විශාල සංකීර්ණ බවටත් වර්ධනය විය. පැරණි ඉන්දියාවේ විශාලතම ආශ්‍රමය වූයේ 7වන ශතවර්ෂයේදී භික්ෂූන් 10,000කට ඉඩකඩ සැලසූ නාළන්දාවයි. වර්තමානයේ ලෝකයේ විශාලතම ආශ්‍රමවලින් එකක් වන්නේ බුරුමයේ මණ්ඩලෙහි ආසන්නයේ පිහිටි මහගන්දොයන් වන අතර, එහි ස්ථීර ලෙස වැඩ වසන භික්ෂූන් සංඛ්‍යාව 3000ක් පමණ වේ. කෙසේ වෙතත්, බොහෝ ආශ්‍රම කුඩාය, සැමවිටම සෑහෙන්න කුඩා ඒවා වේ. ශතවර්ෂ ගණනාවක් ආශ්‍රම සහ භික්ෂුණී ආරාම අවට ප්‍රජාවේ ආගමික, සංස්කෘතික, ආධ්‍යාපනික සහ ආර්ථික මධ්‍යස්ථාන ලෙස ක්‍රියා කර ඇත.

ශ්‍රී ලංකාවේ ආශ්‍රමයක් හඳුන්වන්නේ පන්සල ලෙසයි. පාලියෙන් මෙහි අර්ථය 'කොළවලින් සෑදූ පැල්පතයි'. තායි සහ කාම්බෝදි වචනය වන 'වට්' පැවත එන්නේ ආවරණයවූ ස්ථානය යන අර්ථය ඇති 'වාට' යන පාලි වචනයෙනි. ආශ්‍රමයට බුරුමයේ සාමාන්‍ය නම 'ක්යොං' වන අතර, ටිබෙට්

භාෂාවෙන් එය 'ගොම්ප' වේ. බලන්න **කලාව**
*The Buddhist Monastery, A Cross-cultural Study*, ed. by Pierre Pichard and Francois Lagirarde, 2003.

# මුදල්

මුදල් (මූල) යනු ලෝහ, කඩදාසි හෝ ප්ලාස්ටික් වලින් සෑදූ, නියෝජනය වන වටිනාකමක් ඇති වස්තු වන අතර, ඒවා භාණ්ඩ සහ සේවා සඳහා හුවමාරු කර ගත හැකිය. බුදුපියාණන් වහන්සේගේ කාලය තුළ ක්‍රියාත්මක වූයේ බඩු හුවමාරු ආර්ථිකයක් වන අතර, මුදල් භාවිතය හරියටම ආරම්භ වෙන්නට පටන් ගත්තා පමණි. වඩාත් සුලභ කාසි වූයේ කහාපණ, නික්ඛ, අද්ධපාද සහ මාසක (A.I,250; M.II,163; S.I,82) යනාදියයි. මෙම නම් වලින් කියැවෙන්නේ කාසියේ බර, එහි වටිනාකම, හෙවත්, ඒවා රත්රන්, රිදී, තඹ හෝ මිශ්‍ර ලෝහයකින් සාදා තිබේද යන්න මත රඳා පවතී. මාසක තඹ වලින් සාදා ඇති අතර, යම් වැදගත් වටිනාකමක් නියෝජනය වීමට මාසක 15ක් වත් අවශ්‍ය විය. එහි වටිනාකම එතරම් අඩුය. සිප්පි, ඇට වර්ග, ලී සහ ලාකඩවලින් සාදන ලද ටෝකන් ද හුවමාරු මාධ්‍ය ලෙස භාවිත කරන ලදී (Vin.IV,238). පැරණි ඉන්දියානු කාසි බොහොමයක් හතරැස් ඒවා විය. එයට හේතුව ඒවා රවුම් අච්චුවක් භාවිත කරමින් මුද්‍රා තබනවාට වඩා ලෝහ තහඩුවලින් කපා ගැනීම පහසු වීමයි.

භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට රත්රන් සහ රිදී ස්පර්ශ කිරීම පවා බුදුපියාණන් වහන්සේ තහනම් කළ අතර, ඔවුන්ට භාණ්ඩ හුවමාරුවෙහි යෙදීමට ද අවසර නොලැබුණි (A.II,53). ප්‍රායෝගික දුෂ්කරතා හේතුකර ගෙන අද මෙම නීතිය තව දුරටත් අනුගමනය

කරන්නේ සුළු භික්ෂු භික්ෂුණීන් ප්‍රමාණයකි. ඇතැම් දිනවල ශික්ෂාපද දහයක් පිළිපදින ගිහි පිරිස ද ඒ දිනවල මුදල් භාවිත නොකරති.

කෙසේ වෙතත්, මුදල් මගින් තර්කානුකූලව පිළිගත හැකි ඕනෑකම් සපුරාලීමට ප්‍රයෝජනවත් වීම සහ ආරක්ෂාව පිළිබඳ හැඟීමක් ලබා දීමටත් සහ අනෙක් අයගේ ගෞරවය දිනා ගැනීමට පවා හැකි බව බුදුපියාණන් වහන්සේ දැන සිටියහ. එම නිසා එය සතුටේ විධියක් විය හැකිය. එම නිසා, ධනය ලුහුබැඳ යාම ගිහියන් සඳහා වැදගත් සහ තර්කානුකූලව පිළිගත හැකි අරමුණක් යැයි උන්වහන්සේ සැලකූ සේක. සැබැවින්ම එහි කොන්දේසිය වන්නේ මුදල් 'උපයා ඇත්තේ වෙහෙස මහන්සි වී, හස්තයේ ශක්තිය සහ නළලෙහි දහඩිය, අවංකව සහ නීත්‍යානුකූලව වීමයි' (A.II,67). මිනිසුන් තමන්ගේ වියදම් ආදායම සමග විචක්ෂණයෙන් යුතුව තුලනය කළ යුතු බව බුදුපියාණන් වහන්සේ උපදෙස් දුන්හ (A.IV,281-4). තමන්ගේ මුදල් කොටස් හතරකට - 1. මූලික අවශ්‍යතා, 2. විවිධ වියදම්, 3. පුණ්‍ය කටයුතු සහ 4. අනාගතයේ සිදුවිය හැකි දේ වෙනුවෙන් ඉතිරි කිරීම වශයෙන් බෙදා වෙන් කළ යුතු බව ද උන්වහන්සේ පෙන්වා දුන්හ. (A.III,45) බලන්න **පොලිය**

'The Beginnings of Coinage in India.' M.K. Dhavalikar in *World Archaeology*,1975.

## වඳුරු මනස

වඳුරු මනස (කපිචිත්ත) යනු සාමාන්‍ය මිනිස් විඥානයේ කලබලකාරී, පහසුවෙන් අවධානය වෙනතකට යන සහ නිරන්තරව චලනය වන හැසිරීම විස්තර කිරීමට සමහර විට බුදුපියාණන්

වහන්සේ භාවිත කළ යෙදුමකි (Ja.III,148; V,445). වරක් උන්වහන්සේ නිරීක්ෂණය කළහ: 'වඳුරෙකු ගස් අතරින් පැද්දෙමින් එක් අත්තක් අල්ලාගෙන, තවත් එකක් අල්ලා ගැනීමට පමණක් එය යන්නට ඉඩ හරින්නා සේ, සිතුවිලි, මනස හෝ විඥානය නිරන්තරව දවල් සහ රාත්‍රී යන දෙකේම ඇතිවෙමින් නැතිවෙමින් පවතී' (S.II,95). යම් කෙනෙකු ස්වල්ප වේලාවක් හෝ තමන්ගේම මනස නිරීක්ෂණය කිරීමට කාලය යොමු කර ඇත් නම්, සහ ඊට පසු වඳුරන් සමූහයක් නරඹා ඇත් නම්, මෙම සැසඳීම නිවැරදි එකක් බව පිළිගත යුතුව ඇත, එසේම එය බොහෝ දුරට චාටු බස් කීමක් නොවේ. තවත් අවස්ථාවක බුදුපියාණන් වහන්සේ කියා සිටියේ පාලනයකින් තොර තණ්හාවෙන් පෙළෙන පුද්ගලයෙකු වනාන්තරයේ පලතුරු සොයා එහාට මෙහාට පනින වඳුරෙකු' වැනි බවයි (Dhp.334). මෙයට හාත්පසින්ම වෙනස්ව, බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රාවකයන්ට පවසා ඇත්තේ 'වනාන්තරයේ ජීවත් වෙන මුවෙකුගේ මනසක්' (මිග භූතෙන චෙතසා, M.I,450) මෙන් මනස දියුණු කර ගන්නා ලෙසයි. මුවන් විශේෂයෙන්ම, මෘදු සත්ත්වයන් වන අතර, සැමවිටම සෝදිසියෙන් සිටිති, එසේම තමන් කුමක් කළත්, ඒ පිළිබඳව දැනුවත්ව සිටිති.

*Taming the Monkey Mind*, Thubden Chodron, 1995.

## භික්ෂූන්

භික්ෂුවක් (භික්ඛු) යනු බ්‍රහ්මචාරී, පැවිදි ජීවිතයක් ගත කිරීම සඳහා සාමාන්‍ය සමාජය අතහැර දැමූ පුරුෂයෙකි. ධර්මය පුහුණු කිරීමට ඉතා වාසිදායක

පරිසරයක් ලබා දීමට සහ එම ධර්මය පතුරුවා හැරීමට කණ්ඩායමක් ඇති කිරීම සඳහාත් බුදුපියාණන් වහන්සේ **සඞ්ඝ** නමින් හැඳින්වෙන භික්ෂූන් සහ භික්ෂුණීන්ගෙන් සැදුම්ලත් ශාසනයක් පිහිටු වූහ. භික්ෂූන් වහන්සේලා සරල අවශ්‍යතා අටක් සහ විනයෙහි නීති 227කට අනුව ජීවත් වීම අපේක්ෂා කෙරේ. පිරිමි ළමයෙකුව සිටියදී කෙනෙකුට සාමණේර (සාමණේර) බවට පත් විය හැකිය. නමුත්, සම්පූර්ණයෙන්ම පැවිදි භික්ෂුවක් වීමට (උපසම්පදා) වයස අවුරුදු 20ක් හෝ ඊට වැඩි විය යුතුයි. පැවිදි ජීවිතය කෙරෙහි භික්ෂුවක තුළ ඇති උනන්දුව නැති වුවහොත්, ඔහුට ඕනෑම වෙලාවක තම අභිප්‍රාය වෙනත් භික්ෂුවක් ඉදිරියෙහි ප්‍රකාශ කරමින් සහ සිවුරු හැර යමින් එසේ කළ හැකිය. බෞද්ධ භික්ෂූන්ගේ වඩාත් ස්වභාවික ලක්ෂණ වන්නේ ඔවුන්ගේ කහ සිවුරු, මුඩු කරන ලද හිස් සහ සන්සුන්, සිනහවෙන් යුක්ත හැසිරීමය.

බුදුපියාණන් වහන්සේගේ කාලයේදී, භික්ෂූන් එකිනෙකා ඇමතුවේ, 'ඇවැත්නි' (ආවුසො), 'භවත්න' (භන්තෙ) හෝ 'ගෞරවණීය' (භො) යනාදී වශයෙනි. ශ්‍රී ලංකාවේ තවමත්, සහ බටහිර පවා වැඩි වශයෙන් භික්ෂූන් අමතන්නේ භන්තෙ යනුවෙනි. අවම වශයෙන් වසර දහයක් හෝ උපසම්පදාව ලැබූ භික්ෂුවක හෝ කනිෂ්ඨ වූවත්, ඉගෙනගැනීමේ හෝ ආධ්‍යාත්මික පුහුණුවේ නිපුණ වූවෙකු 'ගෞරවනීය' හෝ 'ජ්‍යෙෂ්ඨ ථේර' යනුවෙන් ඇමතිය හැකිය (ථෙර, A.II,22; Dhp.260-61). භික්ෂු සාමාජිකත්වය වසර 20ක් සම්පූර්ණ වූ අයෙකු 'මහාථේර' (මහාථෙර) ලෙස ආමන්ත්‍රණය කළ යුතුයි. බලන්න **පැවිදි කිරීම සහ**

## සංගීතය

සංගීතය (වාදිත) යනු ප්‍රසන්න බලපෑමක් ඇති කිරීම සඳහා ව්‍යුහාත්මක ආකාරයකින් ශබ්ද සෑදීමයි. ඉන්දියානු සංගීතයේ මූලික ගතිලක්ෂණ දෙක වූයේ සහ රැඳී පවතින්නේ මනෝභාවය (රාග) සහ රිද්මය (තාලාවච්චන, D.II,159) සහ ඒවා තුළ ඇති මූලද්‍රව්‍යයන් වූයේ ස්වර (සර), සංගීත ග්‍රාම (ගාම), හඬ (මුච්ඡනා) සහ විරමයි (ඨානා). බුදුපියාණන් වහන්සේගේ කාලයේ දී, සුලලිත සංගීතය වාදනය කළේ සංගීත භාණ්ඩ පහක වාද්‍ය වෘන්දයකිනි. (Th.398) වඩාත් ජනප්‍රිය වාද්‍ය වෘන්දය හෝ වාදනය කරන ලද ඒකල වැයුම වූයේ (වීණා) වීණාවයි. එය සමන්විත වූයේ ධ්වනි පුවරුවක් ලිවීමට සකස් කර ගත් හමක් මත දිග හැර (චම්මපොක්ඛර), බණ්ඩිය (දොණ), හස්තය (දණ්ඩ), හිස (උපවීණා), තත් හත (සත්තතන්තු) නියපොතුවලින් තත් හඬවමින් ගන්නා ලද (අග්ගනඛ), සහ කුන්තානිය දත්කුරක් වැනි සාමාන්‍යයෙන් ඇත් දළින් සාදන ලද්දකි (කොණ), (Ja.II,252; IV,470; S.IV,197).

එවැනි වීණා අතැති නිපුණ සංගීතඥයන්ට 'සිත් වසඟ කරන, කණට මිහිරි සහ සතුටු කරන' සංගීතය නිපදවිය හැකි බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (S.IV,197). උන්වහන්සේට සංගීතය පිළිබඳව හොඳ දැනුමක් සහ ඇගයීමක් තිබුණි. සමහර විට ඒ උන්වහන්සේ ඇති දැඩි වූ ඉහළ පැළැන්තියේ ප්‍රතිඵලයක් විය හැකිය (Ja.II,253). වීණාවක් ඉහළ ස්වරයකට (උත්තමමුච්ඡනාය මුච්ඡෙත්වා වාදෙසි), මධ්‍යම ස්වරයකට (මජ්ඣිමමුච්ඡනාය) සහ

අවසානයේ බුරුල් තත් සමග (සිථිල) සුසර කළ යුතු බව උන්වහන්සේ සඳහන් කළහ. පඤ්චසිඛ ඔහුගේ වීණාවේ ඒකල වාදනයට අනුව ගායනා කරනවා ඇසුණු බුදුපියාණන් වහන්සේ 'ඔබේ තත්වල හඬ ඔබගේ කටහඬ සමග හොඳින් මුසු වේ, එසේම ඔබගේ කටහඬ ඔබගේ තත්වල හඬ සමග හොඳින් මුසු වේ' යැයි පැවසූහ (D.II,267). කෙසේ වෙතත්, වෙනස් කරන ලද මනසකට ඕනෑම ගීතයක් හෝ සන්ධ්වනියකට වඩා වැඩි ප්‍රීති ප්‍රමෝදයක් ලබා දිය හැකි බව ද බුදුපියාණන් වහන්සේ දැන සිටියහ. ථේරගාථාවේ මෙසේ සඳහන් වේ 'කොටස් පහකින් යුක්ත වාද්‍ය වෘන්දයක සංගීතයට, දේවල් සම්බන්ධයෙන් පරිපූර්ණවූ ඇතුළු නුවණින් යුක්තව එක් දෙයකට යොමුවූ මනසක් තිබීමෙන් තරම් සතුටක් උපද්දවා ගත නොහැක' (Th.398). අටසිල්වලින් එක් ශික්ෂාපදයක් වන්නේ සංගීතය වාදනය කිරීම සහ සවන්දීමෙන් වැළකීමයි. එයට හේතුව, එයින් මනසේ නිශ්චල බව සහ සැනසිල්ල වෙනතකට හරවන නිසාය (A.I,212). ථේරවාද බෞද්ධ සම්ප්‍රදායේ පූජාවලදී සංගීතය හෝ ගායනා කිරීම කිසි විටක භාවිත වී නැත. නමුත්, ශ්‍රී ලංකාවේ, සමහර විට හේවිසි පූජා පැවැත් වේ. මෙහිදී බෙර ගැසීම ඇතුළු ශබ්ද පූජා පැවැතත් වේ. හොරණෑව, බෙර සහ සිම්බල යොදා ගත් සංගීතය බොහෝ ටිබෙට් ජාතික පූජාවල අත්‍යවශ්‍ය අංගයක් වේ. චීන බුදුදහමට අනුව ගොං සංගීතය සහ සීනු යොදා ගනු ලැබේ. බලන්න **සජ්ඣායන**

'Buddhism and Music,' Sean Williams, in *Sacred Sound: Experiencing Music in World Religions*,2006.

## ගුප්ත වාදය

ගුප්ත වාදය යනු විවිධවූ තීව්‍ර අත්දැකීම් හෝ එවැනි අත්දැකීම් වර්ධනය කිරීමේ උපක්‍රමයන් සඳහා දෙන යෙදුමකි. ගුප්ත වාදය විස්තර කිරීම කුප්‍රකට ලෙස දුෂ්කරය. සුප්‍රසිද්ධ මනෝවිද්‍යාඥ විලියම් ජේම්ස් පැවසුවේ ගුප්ත වාදයට අදාළ අත්දැකීම්වල ප්‍රධාන ලක්ෂණ වන්නේ වචනයෙන් විස්තර කළ නොහැකි බව, බුද්ධිමය ගුණය, කෙටිකාලීන බව සහ අක්‍රියතාව බවයි.

ගුප්ත වාදයේ ඇත්තේ න්‍යායාත්මක නොව, ප්‍රායෝගික යැයි විස්තර කළ හැකි බව එව්ලින් අන්ඩර්හිල් ලිව්වේය. එහි අරමුණ සහ ක්‍රමවේදය වශයෙන් ආදරයත්, සහ කිසි විටක ආත්මාර්ථකාමී නොවීමෙන්, එය සම්පූර්ණයෙන්ම ආධ්‍යාත්මික කටයුත්තකි. මේවා සහ සැබැවින්ම ගුප්ත වාදය පිළිබඳ බොහෝ විස්තර කිරීම්වල ඇති ගැටළුව නම්, ඒවා ප්‍රධාන වශයෙන් වැදගත් ඒකදේව වාද ආගම්වලට යොමු වීම සහ බුදුදහම, ජෛන ආගම, ටාඕ වාදය සහ ආගම් නැති ගුප්ත වාද අත්දැකීම් සැලකිල්ලට නොගැනීමයි.

නූතන මනෝවිද්‍යාවේ දෘෂ්ටි කෝණයෙන් බැලූ විට, සියල්ල නොවූවත්, බොහෝ විට අත්දැකීම් සාමාන්‍යයෙන් ලේබල් කරන ලද ගුප්ත වාදවල මෙම ගතිලක්ෂණ හතර ඇත - ඒ 1. ඒවාට දැඩි චිත්තවේගී සංඝටක ඇත. 2. ඒවා කායික සහ මානසික ආතතියෙන් - බලාපොරොත්තු සුන්වීම, ආශාවන්, නිරාහාරව සිටීම්, යටපත් කළ ලිංගිකත්වය, දීර්ඝ නිදි

වැරීම යනාදියෙන් උත්තේජනය වී ඇත. 3. ඔවුන් කිසිවිටක ගුප්ත වාදී ධර්ම මය විශ්වාසවලට විරුද්ධව යන්නේ නැත. - ක්‍රිස්තියානීන්ට විෂ්ණු දර්ශන නැත, මුස්ලිම්වරුන්ට ත්‍රිත්වය දෙස යාම්තමට හෝ මොහොතකට කිසිවිටක බලන්නේ නැත, යනාදිය. 4. ඒවා අර්ථ දක්වන්නේ බාහිර නියෝජිතයෙකු විසින් - දෙවියන් වහන්සේ, දේවදූතයන්, පරමාත්මය, යනාදී අය විසින් හටගන්වා ඇති බවයි.

බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වය ලැබීම පිළිබඳව උන්වහන්සේගේ විස්තරය ජේම්ස්ගේ හෝ අන්ඩර්හිල්ගේ ගූප්ත වාද තත්ත්වය පිළිබඳ විස්තර සමග හොඳින් ගැලපෙන්නේ නැත. මේ දැන් විස්තර කළ ගූඨ වාදයේ ඇති ගතිලක්ෂණ හතරෙන් කිසිවක් ද නැත. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ බුද්ධත්වය අවබෝධකර ගන්නට පෙර පැය කිහිපය තුළ භාවනා වඩන්න ආරම්භ කරන විට පවා අසාමාන්‍ය ලෙස සන්සුන් සහ තැන්පත්, චිත්තවේගයෙන් තොරවූ බව පෙනෙන්නට තිබී ඇත (M.I,167). උන්වහන්සේට තීව්‍ර වූ ප්‍රීති ප්‍රමෝදය (විමුත්තිසුඛ) ඇති වී ඇත්තේ පසුවය. උන්වහන්සේ තමන් වහන්සේගේ දැඩි අපිස්බවින් සම්පූර්ණයෙන්ම යළි ප්‍රකෘති තත්ත්වයට පත් වී ඇත්තේ බුද්ධත්වයට පත් වූ අවස්ථාවේදී ය (Ud.1-3).

තමන්වහන්සේ සුදුසු ආහාරයක් නොවැළඳූ බව, විවේක ගත් බව සහ ශක්තිය නැවතත් ලබා ගත් බව (බලං ගහෙත්වා, M.I,247), බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. බුද්ධත්වය ලැබීමට පෙර ආර්ය අෂ්ටාංගික මාර්ගය හෝ පටිච්ච සමුප්පාදය පිළිබඳව

උන්වහන්සේට යම් අවබෝධයක් තිබුණේද යන්නට සාක්ෂියක් නැත. සැබැවින්ම උන්වහන්සේ තමන් වහන්සේ අවබෝධ කරගත් සත්‍යය 'මීට පෙර අසා නැති බවට' (පුබ්බේ අනුස්සුතෙසු, S.V,422) නිශ්චිතවම පැවසූහ. තමන්වහන්සේ ලැබූ බුද්ධත්වය දෙවියන් වහන්සේගෙන් ලැබූ ත්‍යාගයක් හෝ දිව්‍යමය අනුග්‍රහයකින් ලැබූ දෙයක් ලෙස කිසිවිටක විස්තර නොකළහ. උන්වහන්සේ සැම විටම ඉගැන්වූයේ කෙනෙකුට නිර්වාණයට පත් විය හැක්කේ 'තමන්ගේම දැනුමෙන් සහ ප්‍රායෝගික බුද්ධියෙන්' (සයම් අභිඤ්ඤා D.III,55) බවයි. ධර්මය පිළිබඳ සමහර ලේඛකයෝ ඉඳහිට 'බෞද්ධ ගූප්ත වාදය' යනුවෙන් විස්තර කරති. අවධානයට ගත යුතු කරුණක් වන්නේ ගූප්ත වාදය යන වචනය පැවතෙන්නේ ලතින් භාෂාවෙන් මිස්ටරිම් යන වචනයෙනි. එහි අර්ථය 'ඇස් වසා ගැනීමයි' පාළි භාෂාවෙන් නිර්වාණය යන්නට වචනය (බෝධි) යන්නයි. එහි අර්ථය 'පිබිදීම' හෝ 'ඇස් ඇරීමයි'.

## නාලන්දා

නාලන්දා උතුරු ඉන්දියාවේ (නූතන බිහාර් රාජ්‍ය) රජගහ නුවරින් උතුරට කිලෝමීටර් 11ක් දුරින් පිහිටි කුඩා ගම්මානයකි. බුදුපියාණන් වහන්සේ නාලන්දාව පසු කර වැඩම කළ හෝ සමහර විට එහි වැඩම කර විවිධ වැදගත් ධර්ම දේශනා එහිදී සිදු කළහ. උන්වහන්සේගේ එක් ශ්‍රාවකයෙකු වූ කෙවට්ට එම ප්‍රදේශය 'සාරවත්, සමෘද්ධිමත්, බුදුපියාණන් වහන්සේට භක්තිමත් වූ මිනිසුන්ගෙන් පිරුණු' එකක් ලෙසට විස්තර කළහ (D.I,211). ගුප්ත රජුගේ මුල් කාලයේදී (ක්‍රි. පූ. 4වන ශතවර්ෂයේදී) නාලන්දාවේ ආශ්‍රමයක් ඉදිකරන ලද අතර, එය ආශ්‍රම විශ්වවිද්‍යාලයක් බවට ක්‍රමයෙන් ඇති වී ඉන්දියාවේ බුදුදහම ඉගෙනීමේ ප්‍රධාන පීඨය බවට පත් විය.

මෙම විශ්වවිද්‍යාලය පිළිබඳව අප දන්නා බොහෝ දේ ලැබී ඇත්තේ එහි අධ්‍යාපනය ලැබීමට ගිය චීන ජාතික භික්ෂූන්ගේ විස්තරවලිනි. විශේෂයෙන්ම, වන්දනාකළ චීන භික්ෂූව, සුඇංසෑං ගෙන්ය. එහි තියුණුම අවස්ථාව වූ 7වන ශතවර්ෂයේදී එහි ශිෂ්‍යයෝ 8,500ක් සහ ගුරුවරයෝ 1,510ක් සිටියහ. ශිෂ්‍යයෝ ඉන්දියාවේ සෑම ප්‍රදේශයකින්ම සහ චීනය, කොරියාව, ටිබෙට්, ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාවෙන් පැමිණ සිටියහ. විෂය ධාරාවට මුල් කාලීන බුදුදහම, මහායාන, හින්දු දර්ශන විද්‍යාව සහ ව්‍යාකරණ විධිය, ජන්දස් ශාස්ත්‍රය, තර්ක ශාස්ත්‍රය සහ බස හැසිරවීම වැනි ලෞකික ආගමකට සම්බන්ධ නැති විෂයයන් ද ඇතුළත් විය. විවිධ රටවලට අයත් සහ විවිධ භාෂාවලින් යුක්ත ග්‍රන්ථ ඇතුළත් විශාල පුස්තකාල තුනක් තිබුණි. මුස්ලිම් ආක්‍රමණිකයන් විසින් 1193දී නාලන්දාව වනසා ගිණි තැබූ අවස්ථාව වනවිටත්,

එය ශතවර්ෂ ගණනාවක් පුරා පිරිහෙමින් තිබුණි. වර්තමානයේ, නාලන්දාවේ නටබුන්, විශාල ප්‍රදේශයක් ආවරණය කර ඇත. එය වන්දනාකරුවන්ට සහ සංචාරකයන්ට ජනප්‍රිය ගමනාන්තයකි. විශ්වවිද්‍යාලයේ ශාලා වරක් ප්‍රසාදයට ලක් කළ කැටයම් ශිල්ප බොහොමයක් ඒ ආසන්නයේ ඇති කෞතුකාගාරයක ප්‍රදර්ශනය වේ.
*Nalanda*, A. Gosh, 1965.

## නම්

නමක් (නාම හෝ සාමඤ්ඤ) යනු යම් කෙනෙකු, දෙයක් හෝ ස්ථානයක් හඳුනාගන්නා ආකාරයයි. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී තිබූ නම්වල ස්වභාවය වර්තමානයේ ඒවාට වඩා ඉතා වෙනස්ය. පුද්ගලයෙකුගේ උපතින් පසු, ඔහු හෝ ඇය විසින් අත්විඳින පළමු චාරිත්‍රමය කටයුත්ත නම්, නම් තැබීමේ උත්සවයයි (නාමකරණ හෝ නමධෙය්‍ය) Ja.I,262; III,305), සුබදායක යැයි සැලකෙන ඇතැම් ගුණධර්ම හෝ වස්තූන්ගේ නාම ගුණවචන බොහෝ විට පුද්ගලික නම් (මූලනාම) ලෙස භාවිත කරන ලදී. අනෙක් නම් පියාගේ නමින් හෝ මවගේ නමින් ලැබේ. එනම් 'සාරීගේ පුත්‍රයා, නාතපුත්ත සහ මාලුඞ්කය්‍යපුත්ත ආදී වශයෙනි. පුද්ගලයෙකුගේ පෙනුම හෝ පුරුදු මත පදනම් වූ අන්වර්ථ නාමයන් ද පොදු වේ - උදාහරණ වශයෙන් දණ්ඩපාණී (දණ්ඩක් අතින් ගත් තැනැත්තා), දීඝනඛ (දීර්ඝ නියපොතු) සහ ඔට්ඨ (පැලී විවරවූ උඩුතොල), ඉඳහිට මිනිසුන් කරන රැකියාවට අදාළ නමකින් හැඳින් වේ, උදාහරණ වශයෙන් වඩුවා පඤ්චකඞ්ග (ආයුධ පහ). අද කාලයේ පරම්පරා නාමය ලෙස

කියන ආකාරයට ඉහළ කුලවල අය පමණක් ඔවුන්ගේ ගෝත්‍ර නාමවලින් (ගොත්තනාම) හඳුන්වනු ලැබූහ, උදාහරණ භාරද්වාජ, කච්ඡායන සහ වාසෙට්ඨ.

සම්ප්‍රදායට අනුව, බුදුපියාණන් වහන්සේගේ පෞද්ගලික නම සිද්ධාර්ථයි. එහි අර්ථය 'තමන්ගේ අරමුණ ඉෂ්ට කර ගත් අය' යන්නයි. උන්වහන්සේගේ ගෝත්‍ර නාමය ගෞතමයි. එහි පදගත අර්ථය 'යහපත් එළදෙන'යි. මෙම ගෝත්‍ර නාමයෙන් පිළිබිඹු වන්නේ පෙර දවසක විශාල ගව රැළක් සිටීම ධනය සහ ආඩම්බරයට හේතුවක් බවයි. බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් නොවූ මිනිසුන් සාමාන්‍යයෙන් උන්වහන්සේ ඇමතුවේ පූජ්‍ය ගෞතම (හෝ ගොතම) හෝ ගෞතම භික්ෂුව (සමණ ගොතම) ලෙසිනි.

පුද්ගලයෙකුගේ නමකට ඔහුගේ හෝ ඇයගේ තත්ත්වයට හෝ ඉරණමට බලපෑමට බලයක් ඇතැයි මිථ්‍යා මතයක් පැරණි ඉන්දියානුවන්ට තිබුණි. උදාහරණයක් වශයෙන් මනුස්මෘතියේ මෙසේ සඳහන් වේ 'තාරකා මණ්ඩලයක්, ගසක්. ගඟක්, කන්දක්, කුරුල්ලෙකු හෝ නයෙකු, හෝ අඩු කුලයක, පහත් හෝ බියකරු නමක් ඇත්තියක විවාහ නොකරගත යුතු' යැයි සඳහන් වේ. මුල් කාලීන බෞද්ධයෝ නාමසිද්ධි ජාතක කතාවල සඳහන් නම්වලින් ඇතිවෙන විශ්මය දනවන බලය පිළිබඳ විශ්වාසයන් සම්බන්ධයෙන් උසුළු විසුළු කළහ. මෙම කථාවේ පාපක (අකීකරු) නමැති තරුණයෙක් එය අශුභ යැයි විශ්වාස කරමින් තමන්ගේ නමට වෛර කළේය. ඔහු තමන්ගේ ගුරුවරයාට තමන්ට අළුත්

සහ වඩා හොඳ නමක් දෙන ලෙස ඉල්ලා සිටියේය. ගුරුවරයා කියා සිටියේ වඩා කැමති නමක් ලැබෙන තුරු සංචාරය කර නැවත පැමිණෙන ලෙසත්, එවිට අළුත් නමක් ලබා දෙන බවත්ය. ඔහුගේ සංචාරය තුළදී ජීවක (ජීවිතය) නමැති මිනිසෙකුගේ ආදාහනයක් දැක ගන්නට ලැබුණි. එවැනි නමක් ඇත්තෙකු මිය යන්නට හැකි ද කියා ඔහු තමන්ගේ පුදුමය පළ කළ විට, මිනිස්සු ඔහුට සිනහ පළ කළහ 'නමක් ජීවිතය හෝ මරණය ලබා නොදෙයි. නමෙන් සිදුවන්නේ පුද්ගලයෙකුගෙන් පුද්ගලයෙකු වෙන්කොට හඳුනා ගැනීමක් පමණි.' පසුව, 'පාපක'ට ප්‍රමාණවත් මුදල් නොඉපදීම සම්බන්ධයෙන් තම පාලකයාගෙන් ගුටිබැට ලැබූ වහල් සේවයේ යෙදෙන 'ධනපාලි' (වස්තුව) නමැති තරුණියක් සහ අතරමං වූ 'පන්ථකාපි' (මඟ පෙන්වන්නා) නමැති මිනිසෙකු හමු විය. කෙනෙකුගේ දෛවයට බලපාන්නේ තමන්ගේ නම නොවන බව අවබෝධ කරගත් ඔහු නැවත තම ගුරුවරයා වෙත පැමිණ පැවසුවේ තමන්ගේ පැරණි නමම තබා ගැනීමට තීරණය කළ බවයි (Ja.I,402).

නම් හුදෙක් පහසුව පිණිස හැඳින්වීමට, දෙනු ලබන සංඥා නාමයක්, සහ අනෙක් අය විසින් වෙනස් කළ හැකි සහ අලුත් කළ හැකි දෙයක් බව බුදුදහම හැම විටම හඳුනා ගෙන ඇත. එසේම නම් තැබීමේ ක්‍රියාවලිය සාමාන්‍යයෙන් ස්වාභාවික සහ අවිධිමත් එකක් බව ද හඳුනාගෙන ඇත. අත්ථසාලිනීයේ මෙසේ සඳහන් වේ 'නමක් නැති කිසිම ජීවියෙක් හෝ දෙයක් නැත. වනාන්තරයේ ගස් සහ කඳුකරය රටක ජනතාවගේ ව්‍යාපාරයයි. එයට හේතුව, 'මේ ගස කුමක් ද?' කියා ඔවුන්ගෙන් ඇසූ විට බදිර හෝ

පලාස, යනුවෙන් ඔවුන් දන්නා යම් නමක් කියති. ඔවුන් ගසේ නම නොදන්නා විට ද 'එය නමක් නැති ගසක්' යනුවෙන් හෝ කියනු ඇත. එසේම මුහුදේ ජීවත් වන මාලු හෝ ඉබ්බන් සම්බන්ධයෙන් සහ තවත් දේ පිළිබඳව ද එය එසේමයි' (As.392). වර්තමාන භාෂා සම්බන්ධ දාර්ශනිකයන් මෙන්ම බුදුපියාණන් වහන්සේද නම් භාවිත කරන සහ අවබෝධ කරන්නාවූ ආකාරය මත යථාර්ථය පැහැදිලි කිරීම හෝ විකෘති කිරීම කළ හැකි බව දැනගෙන සිටියහ. උන්වහන්සේ අදහස් කළේ කුමක් ද යන්න මෙයින් පැහැදිලි වේ 'නම් සැම දෙයක්ම පාලනය කරයි, අනුගමනය කරයි, සියල්ල එහි බලපෑම යටතට ගෙන එයි' (S.I,39). ආත්මයක් නැතැයි උන්වහන්සේ ඉගැන්වූහ. නමුත්, බොහෝ විට 'ඔබ', 'මම' සහ 'තමාම' යන වචන භාවිත කළහ. මෙම පෙනෙන්ට තිබෙන පරස්පර බව පෙන්වා දුන් විට, බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: 'මේවා හුදෙක් ලෝකයේ සාමාන්‍යයෙන් භාවිත වන නම්, භාෂාමය සම්මුති, ප්‍රකාශ සහ විස්තර වේ. තථාගතයන් වහන්සේ ඒවා භාවිත කරන්නේ ඒවායෙන් මුළානොවෙමින්ය' (D.I,202).

කෙසේ නමුත්, දේවධර්මමය සහ දාර්ශනික දේශනාවලින් බැහැරව, නම් පිළිබඳව පොතේ දැනුම හා තාක්ෂණික දැනුම හිසින් ගැනීම අනවශ්‍ය එකඟවීම් නොවීම්වලට හේතු විය හැකිය. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'කෙනෙකු ආශ්‍රිත ප්‍රදේශයේ භාෂාව භාවිතය සඳහා බල නොකළ යුතුයි. සාමාන්‍ය භාවිතය නොසලකා නොහැරිය යුතුය. කෙනෙකු මෙසේ කරන්නේ

කෙසේද? විවිධ රටවල මිනිසුන් එකම දෙයට 'බඳුන', 'බෙසම', 'දීසිය', 'කෝප්පය', 'සුප් බඳුන', 'බොකුටු භාජනය', හෝ 'රවුම් බඳුන' යනුවෙන් හැඳින්විය හැකිය. කුමන නමින් ඔවුන් හැඳින්වූවත්, කෙනෙකු එය පමණක් නිවැරදි යැයි ස්ථිරවම කියා සිටිමින් තමන්ගේ රටේ භාවිත වන නමට ඇලී සිටියත්, (වෙනත් රටක සිටිද්දී', එම රට තුළත් ඒ නම භාවිතය බලකරමින් සාමාන්‍ය භාවිතය නොසලකා හරින්නේ මෙසේය' (M.III,235).

මෙම නිරවුල් ප්‍රායෝගික බුද්ධිමය ආකල්පය තිබියදීත්, සමහර පාරම්පරික බෞද්ධයන් අතර නම්වලට ඇලීම ඉතා සාමාන්‍ය දෙයකි. උදාහරණ වශයෙන් බටහිර සිටින තායි භික්ෂූහු 'අජාන්' ලෙස ආමන්ත්‍රණය කිරීම අපේක්ෂා කරති. එය පාළියෙන් 'ආචරිය' යන වචනය උච්චාරණය කරන ආකාරයයි. එයට ඇති හැම අතින්ම සමාන නිවැරදි ඉංග්‍රීසි වචනයේ පරිවර්තනය 'ගුරුවරයා'ය.

## නන්ද

නන්ද සුද්ධෝදන සහ මහා පජාපතී ගෝතමීගේ පුත්‍රයාය. ඒ නිසා බුදුපියාණන් වහන්සේගේ සුළු සහෝදරයාය. ත්‍රිපිටකයේ ඔහු පිළිබඳව විස්තර කර ඇත්තේ බෞද්ධ කඩවසම් තරුණයා වශයෙනි. ඔහු 'මනා පෙනුමැති ස්වරූපයෙන් සුන්දර සහ කඩවසම්' (A.IV,165-6) සහ ඔහු භික්ෂුවක වූ පසුත්, ඔහුගේ සිවුර දෙපැත්තම මැද, ඇස් පාට කර ගමන් කළේ අලංකාර දිස්නයෙන් යුතු පාත්‍රයක් රැගෙනය (Vin.IV,173). 'එසේම ඔහු බුදුපියාණන් වහන්සේට වඩා අඟල් හතරක (චතුරඞ්ගුලොමක) උසින් අඩුය.

බොහෝ විට දුරින් එන විට බුදුපියාණන් වහන්සේ යැයි වරදවා හඳුනා ගෙන ඇත (Vin.IV,173).

නන්ද භික්ෂුවක වීමට ගිහි ගෙය හැර යන විට ඔහුට තමන්ගේ මිතුරිය පිළිබඳව සිතීම නවතා ගත නොහැකි විය. ඇය ඔහුට යන විට මෙසේ කීවාය: 'ඉක්මණින් නැවත පැමිණෙන්න.' ඔහුගේ ප්‍රශ්නය දැනගන්නට ලැබී බුදුපියාණන් වහන්සේ ඔහු 'පරෙවියන් වැනි පාද තිබෙන අප්සරාවියන් සිටින' දෙව්ලොව විෂය පථයකට යන්නට සැලැස්වූහ. මෙම අප්සරාවියන් පෙන්වමින්, බුදුපියාණන් වහන්සේ නන්දගෙන් මෙසේ ඇසූහ: 'වඩා සුන්දර කවුද, මෙම අප්සරාවියන්ද නැතහොත් ඔබගේ පෙම්වතිය ද?' 'මෙම අප්සරාවියන් සමග සංසන්දනය කරන විට ඇය අවලක්ෂණ කරන ලද වැඳිරියක් හා සමානය,' නන්ද පිළිතුරු දුන්නේය. මෙම අළුත් සහ වඩාත් සුන්දර චිත්‍රය මනසින් දකිමින්, නන්ද මෙම අප්සරාවියන් අතර නැවත ඉපදීමේ බලාපොරොත්තු වෙමින් උදෝග්ගිමත් ලෙස භාවනා කිරීම ඇරඹුවේය. අනෙක් භික්ෂූහු මේ පිළිබඳව අසන්නට ලැබී නන්දගේ අභිප්‍රාය ගැන ව්‍යාජ ලෙස සිනහ වූහ. ඔහු 'දෛනික කුලීකරුවෙකු' එනම් සුළු වැටුපකට වැඩ කරන්නෙකු වශයෙන් හැඳින්වූහ.

බුදුදහමේ දෙව්ලොව නැවත උපතක් ලැබීමට උත්සාහ කිරීම නිරයේ නැවත ඉපදීමට වඩා ඉහළ ලෙස සැලකේ. නමුත්, නිර්වාණයට පත් වීමට වඩා නිසැකයෙන්ම හීන වේ. මෙම කවටකම නන්දට තමන් පිළිබඳව තරමක් ලැජ්ජාවක් ලෙස දැනුණි. ඒ නිසා ඔහුට නිවැරදි හේතූන් මත පුහුණු වීම සඳහා පෙලඹුණි. උදෝග්ගිමත්ව සහ හුදෙකලාව

ජීවත්වීමෙන් අවසානයේ ඔහු රහත්ඵලයට පත්වුණි. බුදුපියාණන් වහන්සේ නන්ද දෙව්ලොව දක්වා ගෙනයාම උන්වහන්සේගේ නිපුණ උපායශීලීත්වයට උදාහරණයක් ලෙස දැක්විය හැකිය (Th.158). ප්‍රසිද්ධ සංස්කෘත කාව්‍යයක් වූ සෞන්දරානන්දකාවය, නන්දගේ ජීවිතය පිළිබඳව පදනම් වී ඇත.
*The Saundarānandaor Nanda the Fair*, trans. by E. H. Johnston,1932.

## නෙරඤ්ජර ගඟ

නෙරඤ්ජර යනු බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූ බුද්ධ ගයාව පසු කර ගලන ගඟයි (A.II,20; S.I,103; Vin.I,1). බුදුපියාණන් වහන්සේ බුද්ධ ගයාවේ වැඩ සිටින අවස්ථාවේ උන්වහන්සේ ස්නානය කළේ මෙම ගඟෙන්ය (Vin.I,13). පරමත්ථදීපනියට අනුව, මෙම ගඟට එම නම ලැබී ඇත්තේ එහි 'ජලය ප්‍රසන්න' (නෙල්ම් ජලං) නිසාය. එසේ නැතහොත් 'එහි ජලය නිල්පාට' නිසාය (නීල ජලාය). මෙම ගඟ කිලෝමීටර් එකකට කිට්ටුව පළල්ය. බොහෝ වැලි සහිතය. වැසි කාලයේ හැර අනෙක් කාලවල ජලය ඇත්තේ ස්වල්පයකි. බොහෝ විට නෙරඤ්ජර පලගු ගඟට පටලවා ගනී. සැබැවින්ම, පලගු සෑදී ඇත්තේ බුද්ධ ගයාවේ සිට කිලෝමීටර් දෙකක් පමණ නෙරඤ්ජර සහ මොහිනි ගඟෙන් පහළට එක් වීමෙනි.

## නිර්වාණ

නිර්වාණය, පාලියෙන් නිබ්බානයි, සංස්කෘතයෙන් නිර්වාණයි. නිර්වාණය බුදුදහමේ ඉහළම ආධ්‍යාත්මික තත්ත්වය සහ අත්‍යන්ත අරමුණයි. මෙම වචනය සෑදී ඇත්තේ 'නවත්වන' යන අදහස ඇති 'නිර්' යන

වචනය සහ 'නිවන' යන අදහස ඇති 'වා' යන වචනයෙනි. ඒ අනුව, නිර්වාණය යනු ලෝභය, ද්වේෂය සහ මෝහය යන ගිනි නිවාරණය හෝ නිවා දැමීමයි. නැතහොත්, එය 'නිර්', සහ 'ආශාව' යන අදහස ඇති 'වාන' යන දෙකෙන්ය. ඒ අනුව, 'ආශාව නැවැත්වීමයි'. ආර්ය අෂ්ටාංගික මාර්ගය පුහුණු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, අවිද්‍යාව සහ ආශාව, අවබෝධය සහ සාධනයට ඉඩ දෙයි. එවිට පුද්ගලයෙකු අවබෝධ කර ගනියි. මරණයෙන් පසු නැවත ඉපදීමක් සිදු නොවේ. එයට අයත් සියලු දුක් විඳීම් ද තව දුරටත් නොපවතී.

දෙවියන් වහන්සේ බැහැර කරන සටහනකින් නිර්වාණය සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ ඉතා විස්තරාත්මකව මෙසේ පැවසූහ. 'පොළොවක් හෝ ජලය, ගින්දර හෝ වාතය, නැති ගෝලයක් ඇත. අවකාශයේ අනන්තයේ ගෝලයක් නැත, විඤ්ඤාණයේ අනන්තයේ ගෝලයක් නැත, හිස්බවේ ගෝලයක් නැත, හැඳින ගැනීමේ හෝ හැඳින නොගැනීමේ ගෝලයක් නැත, මෙම ලෝකය හෝ ඊළඟ ලෝකය නැත, ඉරක් හෝ සඳක් නැත. එහිදී මම කියමි'. 'ඒමක් නැත, යාමක් නැත, නොනැවතීමක් නැත, අඩුවීමක් නැත, මතුවීමක් නැත, එය ස්ථිර නොවේ, එය චලනය නොවේ, එයට ආධරකයක් නැත. දුක්විඳීමේ අවසානය මෙයයි' (Ud.80).

නිර්වාණයට පත් වන්නේ සාමාන්‍යයෙන් පියවර දෙකකින්ය. නිර්වාණය ශේෂයක් රැඳී පවතිමින් (සොපදිසෙස නිබ්බාන ධාතු) සහ නිර්වාණය ශේෂයක් රැඳී නොපවතිමින් (අනුපාදිසෙන නිබ්බාන

ධාතු, It.38-9) වශයෙනි. උදාහරණ වශයෙන් බුදුපියාණන් වහන්සේ වයස 35දී බුද්ධත්වයට පත් වී තවත් වසර 45ක් වැඩ විසූහ. ඒ අනුව, උන්වහන්සේ මේ වර්ෂ ගණනාවේදී සම්පූර්ණ විමුත්ති ස්වභාවයෙන් වැඩ විසුවත්, ඒ විටත්, උන්වහන්සේට කයක් තිබූ නිසා, තව දුරටත්, කායික වෙහෙස, වේදනාව, කුසගින්න ආදියට ග්‍රහණය වූහ. නමුත්, උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු, අවසානයේ උන්වහන්සේගේ මනස මෙයින් ද සබඳතාව නතර විය. ඒ ශේෂයක් රැඳී නොපවතින නිර්වාණයකින් ය. සමහර අයට, නිර්වාණය හැඟීම් රහිත වැදගැම්මක් නැති දෙයක් ලෙස දැනේ. එක් විශේෂ බ්‍රාහ්මණයෙකු උච්ඡේදවාදියෙකු වීම ගැන චෝදනා කළේය. බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ It.38-9). 'කෙනෙකුට මා උච්ඡේදවාදියෙකු යැයි නිවැරදිව හැඳින්විය හැක්කේ එක් ආකාරයෙකින්ම පමණයි. මා උගන්වන්නේ ලෝභය, ද්වේෂය සහ මෝහය උච්ඡේදනය කිරීමටයි' (A.IV,174).

ශේෂයක් නොරැඳෙන නිර්වාණය හිස් වැදගැම්මකට නැති දෙයක් නොවන බව බුදුපියාණන් වහන්සේ ස්ථිරව පළකර සිටියහ. නමුත්, එය යම් දිව්‍ය ලෝකයක හෝ වෙනත් ලෝකයක බොළඳ 'සදාකාලික ජීවිතයක්' ද නොවේ. කෙනෙකු වරක් උන්වහන්සේගෙන් මෙසේ ඇසූහ: 'පිටතට ගිය කෙනෙකු දිවි ගෙවීම නතර වේද, නැතිනම්, සදාකාලිකව දුබල නොවී රැඳේ ද?' බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: පිටතට ගිය පුද්ගලයා පිළිබඳව මිම්මක් නැත. යමෙකුට ඔහු ගැන කථා කළ හැකි දේ තවදුරටත් නොපවතින අතර, සියලු ගතිලක්ෂණ ඉවත් කර ඇති විට, විස්තර කළ

හැකි සියලු ක්‍රම ද ඉවත් කර ඇත' (Sn.1075-6).

මෙම පූජනීය තත්ත්වයට බුදුපියාණන් වහන්සේ භාවිත කළ ඉතාම හොඳින් දන්නා නම නිර්වාණයයි. නමුත් උන්වහන්සේ එය කූටප්‍රාප්තිය, වඩා දුර වෙරළ, සත්‍යය, පිරිසිදු, ප්‍රීතිමත් අවස්ථාව, සම්පූර්ණ සැනසිල්ල, චමත්කාර ජනක, නිර්මල, සුරක්ෂිත රැකවරණය, යනාදී වශයෙන් ද හැඳින්වූහ (S.IV,369-72). බලන්න **ගුප්ත වාදය**

*The Psychology of Nirvana*, R. Johansson, 1969.

## නිර්වාණය සහ තණ්හාව

නිර්වාණයේ ඇති ගතිලක්ෂණවලින් එකක් වන්නේ බුදුදහමේ අත්‍යන්ත අරමුණයි. එනම් තණ්හාව සහ දැඩි ආශාව එතැන නොමැති වීමයි. එය සම්පූර්ණ සහ ස්ථිර සාධනය සහිත තත්ත්වයකි. එම තත්ත්වයට පත් වීමට ඇති තණ්හාව සමගින් තණ්හාව නැති තත්ත්වයකට පත් වීමට ඇති හැකියාව පිළිබඳව සමහර මිනිස්සු අසති. මෙම විද්‍යමාන කුකුස බුදුපියාණන් වහන්සේගේ කාලයේ පවා අවධානයට ලක් වූ අතර, යම්තම් වෙනස් දෘෂ්ටි කෝණ දෙකකින් කථාබහට ලක්විය.

යම් දෙයකට ඇති වන තණ්හාව එම ආශා කළ දෙය වෙතට අවධානය යොමු කරවයි. ඊට පසු එය අත්කර ගැනීම සඳහා ශක්තිය මෙහෙයවයි. අරමුණ අත්පත් කරගතහොත්, තෘප්තිය ඇතිවන කාලපරිච්ඡේදයක් පසුව ඇති වේ. නමුත්, මෙය සාමාන්‍යයෙන් කලකිරීමට පත්වීමට, කම්මැලිකමට පත්වීමට හෝ උනන්දුව නැතිවන තත්ත්වයට ක්‍රමයෙන් පත් වී යයි. ඊට පසු අවධානය ක්‍රමයෙන් වෙනත් අලුත්

දෙයකට ගසාගෙන යයි. ඊට පසු මෙම ක්‍රියාවලිය නැවත සිදු වේ. බෞද්ධ ආධ්‍යාත්මික සෝදිසියේ මුල් පියවර සමාන රටාවකට පසුපස යයි. නමුත්, පසු පියවර අනපේක්ෂිත ලෙස වෙනස් වේ. ධර්මය පුහුණු කිරීමේ ක්‍රියාවලියේදී පැහැදිලි බව සහ අවබෝධය වැඩිවීම පුද්ගලයෙකුට නිර්වාණය අත්පත් කර ගැනීම සඳහා 'දෙයක්' නොවන බවත්, ආශාව නොපවතින සහ ආශාව මැකී යාමට පටන් ගන්නා තැනක පවතින බව කෙනෙකුට දකින්නට උපකාරී වේ. ඒ අනුව, පරස්පර විරෝධී ලෙස, 'අඩු ආශාව ඇති තැනැත්තා' (සො අපරෙන සමයෙන තණ්හං නිස්සාය තණ්හං පජහති, A.II,146) නිර්වාණයට ළං වේ. නමුත් නිර්වාණය සඳහා ඇති ආශාව අඩු වී යන විට, පුද්ගලයා වැඩි දියුණු කරන ආධ්‍යාත්මික ගතිලක්ෂණවලින් ඇතිවෙන ශක්තිය එම පුද්ගලයා නිර්වාණය වෙත යොමු කරමින් පවතී. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'යමෙකුට දේවල් පිළිබඳව ඒවායේ සැබෑ ස්වරූපයෙන් දැනුමක් සහ දැක්මක් ඇති විට, 'මම සැලැකිල්ලක් නැති සහ උනන්දුවක් නැති (ලෞකික දේවල්වල) යැයි සිතන්නට අවශ්‍ය නොවේ. එයට හේතුව, කෙනෙකු යමක් එහි සැබෑ ස්වරූපයෙන් දකින විට ඒ පිළිබඳව සැලැකිල්ලක් නැතිවීම සහ උනන්දුවක් නැතිවීම ස්වාභාවිකය. යම් කෙනෙකු නොසැලකිලිමත් සහ උනන්දුවක් නොදක්වන විට, 'මම දැනුමෙන් සහ දැක්මෙන් නිදහස ලබා ඇත්තෙමි' යැයි සිතීමට අවශ්‍ය නැත. එයට හේතුව නොසැලකිලිමත් සහ උනන්දුවක් නොදක්වන අයෙකු ස්වභාවයෙන්ම නිදහස ලබාගන්නේ දැනුමෙන් සහ දැක්මෙන්ය. ඒ අනුව, එක් පවත්නා තත්ත්වයක් තවත් එකක් ක්‍රියාත්මක කරයි. එක් පවත්නා තත්ත්වයක් තවත් එකක්

සම්පූර්ණත්වයට පත් කරයි' (A.V,3-4).

ආනන්ද හිමියෝ තණ්හාව සහ නිර්වාණය අතර ඇති විද්‍යමාන කුකුස යම්තම් වෙනස් ආකාරයකින් පැහැදිලි කළහ. වරක් එක් මිනිසෙක් ආනන්ද හිමියන් වැඩ සිටි උද්‍යානයට ගොස් බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල තිබෙන අරමුණ ඇසුවේය. ආනන්ද හිමියන් පැහැදිලි කළ අතර, ඔහු ප්‍රතිචාර දැක්වූයේය :'එය සත්‍ය නම්, එවිට තත්ත්වය අවසානයක් දැකිය නොහැකි, කවදාවත් අවසාන නොවන ක්‍රියාවලියක් වනු ඇත. එයට හේතුව තණ්හාව, තණ්හාවෙන් අත්හැරීම නොහැකි නිසාය.' ආනන්ද හිමියෝ ඔහුගෙන් මෙසේ ඇසූහ: 'කලින් ඔබට මෙම උද්‍යානයට එන්නට ආසාවක් තිබුණේ නැද්ද? ඊට පසු ඔබ මෙහි පැමිණි පසු, එම ආසාව අඩුවූයේ නැද්ද?' මිනිසා එය එසේ වූ බව පිළිගත්තේය. එවිට ආනන්ද හිමියෝ මෙසේ පැවසූහ: 'රහත්ඵලයට පත් වූ පුද්ගලයාත් හරියටම එසේය. කලින් ඔහුට රහත්ඵලයට පත් වන්නට ආශාවක් තිබුණි. ඔහු එම තත්ත්වයට පත් වූ පසු, එම ආශාව බැස ගියේය' (සංක්ෂිප්ත කර ඇත, S.V,272-3)

## නිර්වාණමය නියතය

සෑම දෙනාම ස්වභාවික ක්‍රියාවලිය තුළදී අවසානයේ අත්‍යන්ත ආධ්‍යාත්මික අරමුණ වෙත එළඹීම නිර්වාණමය නියතය ලෙස හැඳින් වේ. දළ වශයෙන් ගතහොත්, මෙම අදහසේ මත දෙකක් තිබේ.

1. අප මිය යන හැම වාරයකදීම, අප අවසානයේ

අපගේ අරමුණ සාක්ෂාත් කරගන්නා තුරු, එය රහත්ඵලයක්, විමුක්තියක් හෝ දිව්‍යමය සම්මුතියක් වුවත්, ක්‍රමයෙන් ඉහළ ස්වරූපයක නැවත උපදී.
2. 'අප මෙහි සිටින්නේ ඉගෙන ගැනීමටයි'. අප ඉපදෙන හැම වාරයකදීම, අපට හොඳ සහ නරක, ජීවිතය සහ සත්‍යය පිළිබඳව ඉගෙන ගැනීමට, අවස්ථාව ලැබේ. අපගේ 'ආත්මය' පිරිසිදු කරගත් විට, අප අපගේ අරමුණ සාක්ෂාත් කරගන්නා තුරු, අපි වඩ වඩාත් වැඩියෙන් වැඩදායක භවයන්හි උත්පත්තිය ලබන්නෙමු. මෙම අදහස්වල පළමුවැන්නෙන් අඟවන්නේ විමුක්තිය හෝ අවබෝධය අත්හැර දැමූ නිගමනයක් බවයි. දෙවැන්න පදනම් වී ඇත්තේ උත්පත්තිය සහ මරණය යන ක්‍රියාවලිය පිටුපස යම් ස්වාභාවික 'අරමුණක්' තිබේය යන සංකල්පය මතයි.

බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල මෙම අදහස් එකක් හෝ පිළිබඳවත් ඉඟියක් හෝ නැත. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී තිබූ එක් නිකායක් වූ ආජීවකයනගේ නිර්වාණමය නියතයේ මතය ඉගැන්විය. ඔවුන් මෙම ධර්මය පැහැදිලි කළේ නූල් බෝලයේ තර්කනය භාවිත කරමින්ය. නූල් බෝලය බිමට විසි කළ විට, එය සම්පූර්ණයෙන්ම ලිහෙන තුරු පෙරළීම නොනවත්වා සිදුවෙයි. 'මෝඩයෝ සහ බුද්ධිමත්තු සමානවම අනිවාර්යයෙන්ම මෙම දුක්විඳීමට කෙළවරක් කරන තුරු වටේට - වටේට යති.' බුදුපියාණන් වහන්සේ මෙම ධර්මය ව්‍යාජ එකක් ලෙස දුරු කළහ (D.I,54). මුල් කාලීන මධ්‍යතන හින්දු ආගමේ, එම ධර්මය ක්‍රමයෙන් ඇති වූයේ කෙනෙකු තම කුලය වෙනුවෙන් කළ යුතු යුතුකම් පිළිපදීනම්, එම

පුද්ගලයා ක්‍රමයෙන් අවසානයේ බ්‍රාහ්මණයෙකු ලෙස උපදින තුරු ඉහළ කුලයක හෝ වඩා යහපත් ජීවිතයක නැවත උපදින බවත්, ඊට පසු එම තත්ත්වයේ සිට අත්‍යන්ත අරමුණට පත්වෙන බවත්ය.

මේ සියලු අදහස්වලින් බුදුපියාණන් වහන්සේගේ අවබෝධය වෙනස් විය. සංසාරය පිටුපස 'අරමුණක්' හෝ 'අර්ථයක්' නොමැති බව බුදුපියාණන් වහන්සේ ඇඟවූහ. එය දුක්විඳීමේ සම්භාව්‍යතාව ඇතිකරවන අපුද්ගල සැකසීමකි. එය අභිබවා යා හැක්කේ ගුණය සහ ප්‍රඥාව දියුණු කිරීමට තමා පිළිබඳව සහ වටපිටාව පිළිබඳවත් මනා අවබෝධයක් ඇති කර ගැනීමට උත්සාහයක් දැරීමෙන් පමණි.

## ආර්ය අෂ්ටාංගික මාර්ගය

ආර්ය අෂ්ටාංගික මාර්ගය (අරිය අත්ඨඞ්ගික මග්ග) බුදුදහමේ ප්‍රධාන ඉගැන්වීම වූ චතුරාර්ය සත්‍යයේ අවසානයයි. එය හඳුන්වන්නේ ආර්ය (අරිය) යනුවෙනි. එයට හේතුව එය පුහුණු කරන්නා උතුම් බවට පත් කරයි. එසේම එය මාර්ගයක් (මග්ග) ලෙස හැඳින් වේ. එයට හේතුව සංසාරයේ ඇති දැඩි වේදනාවෙන් නිර්වාණයේ නිදහස ලබා ගැනීමට එක් ස්ථානයක සිට තවත් තැනකට මඟ පෙන්වයි. සමහර විට බුදුපියාණන් වහන්සේ එය වටිනා මාර්ගය (අරහමග්ග, A.II,42) යනුවෙන් ද හැඳින්වූහ. සමහර විට ආර්ය අෂ්ටාංගික මාර්ගය 'මැදුම් මග' වශයෙන් ද හැඳින් වේ. එයට හේතුව ස්වයං අත්තකිලමථය සහ සුඛපරම වාදය යන දෙකම

මඟහරින ජීවනරටාවක් එය ප්‍රවර්ධනය කරන නිසාය. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ පියවර වන්නේ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති සහ සම්මා සමාධි ය.

පාරම්පරිකව, ආර්ය අෂ්ටාංගික මාර්ගය කොටස් තුනකට බෙදා ඇත - සීල, සමාධි, ප්‍රඥා යනුවෙනි. එය බෙදීමට තවත් ප්‍රයෝජනවත් ආකාරයක් නම්, බුද්ධිමය පුහුණුව, සදාචාරමය පුහුණුව සහ මානසික පුහුණුව වශයෙනි.
*The Noble Eightfold Path*, Bhikkhu Bodhi, 1984.

## චතුරාර්ය සත්‍යය

බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල ඉතා වැදගත් දෙය චතුරාර්ය සත්‍යයි. (චත්තාරි අරියසච්චානි). මෙම සත්‍යයන්ගෙන් පළමුවැන්න දුක්විඳීමයි (දුක්ඛ) දෙවැන්න දුක්විඳීම ඇති වන්නේ අවිද්‍යාව (අවිජ්ජා) සහ තණ්හාව (තණ්හා) නිසාය. තුන්වැන්න දුක්විඳීම අභිබවා යාහැකි බවයි. හතරවන ආර්ය සත්‍යය මාර්ගය සහ දුක්විඳීම අභිබවා යාමේ උපක්‍රමය වන ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. බුදුපියාණන් වහන්සේ මෙම මනෝරටාවට පදනම් කරගත්තේ පැරණි ඉන්දියානු වෛද්‍යවරයන් භාවිත කළ ක්‍රියාමාර්ගය බව පෙනෙන්ට තිබේ. වෛද්‍යවරුන් රෝගීන්ගේ රෝගය අවබෝධ කරගන්නේ ඔහුගේ හෝ ඇයගේ රෝග ලක්ෂණ නිරීක්ෂණය කරමින්ය. වෛද්‍යවරයා ඔහුගේ දැනුම, අත්දැකීම් භාවිත කරමින් සහ රෝගියාගෙන් ප්‍රශ්න අසමින්, ඔහු කර ඇත්තේ කුමක්ද හෝ කෑවේ මොනවාද හෝ ඔහු රෝගී වීමට

ඔහුට සිදුව ඇත්තේ කුමක්ද යනාදිය දැන ගැනීමට උත්සාහ කරයි. ඊට පසු වෛද්‍යවරයා ඔහුගේ සෙඛ්‍යය යථා තත්ත්වයට ගෙන ඒමට හැකි යැයි පවසමින් රෝගියා ධෛර්යමත් කරයි. අවසානයේ, සුදුසු ඖෂධ සූදානම් කර රෝගියාට දෙමින් ඒවා ගත යුතු ආකාරය පිළිබඳව උපදෙස් දෙයි.

බුදුපියාණන් වහන්සේ බොහෝ විට කියා සිටියේ දුක්විඳීම්වලින් මිදීමට මාර්ගය පෙන්වීම උන්වහන්සේගේ කාර්යභාරය බවයි.: 'තිබෙන්නේ එක දෙයයි, මම උගන්වන්නේ එකම දෙයක් පමණි. ඒ දුක්විඳීම් සහ දුක්විඳීම් නවත්වන්නේ කෙසේද කියාය'(M.I,140). වරක් එක් භික්ෂුවක් උන්වහන්සේ වෙත ප්‍රවේශ වී විශ්වයේ ආරම්භය සහ විශ්වයේ ප්‍රමාණය සහ වෙනත් අනුමාන කරන කරුණු පිළිබඳ ප්‍රශ්නවලට පිළිතුරු දෙන ලෙස බල කළේය. බුදුපියාණන් වහන්සේ එය ප්‍රතික්ෂේප කරමින්, මනුෂ්‍යත්වය විෂ ඊතලයකින් සිදුරු කරනු ලැබූ මිනිසෙකු හා සමාන බවත්, හොඳ වෛද්‍යවරයෙකුගේ කාර්යභාරය වන්නේ එම ඊතලය ඉවත් කිරීම මිස, ඊතලය සෑදුවේ කුමන ආකාරයේ ලීයෙන්ද, කුමන ආකාරයේ පිහාටු පියසැරිය සඳහා භාවිත කළේද හෝ විද්ද මිනිසාගේ ජීවන චරිතාපදානය ආදිය පීඩාවට පත් වූ මිනිසාට කීමට නොවන බවත් පැවසූහ. ඊට පසු බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'මම ඔබගේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු නොදෙන්නේ ඇයි? එයට හේතුව ඒවා ප්‍රයෝජනවත් නොවන නිසාය. ඒවා පූජනීය ජීවිතයක් ගත කිරීමට උපකාර නොවේ. ඒවා ඉවතට හැරෙන්නට, සන්සුන්වන්නට, නිශ්චල වන්නට, සැනසිල්ලට, ඉහළ දැනුම වර්ධනයට හෝ

නිර්වාණයට මෙහෙය වන්නේ නැත. මා උගන්වන්නේ මොනවාද? දුක්විඳීම්, එයට හේතුව, එය අභිබවා යෑම සහ එය අභිබවා යෑමේ මාර්ගයයි. මා එය උගන්වන්නේ ඇයි? එය ප්‍රයෝජනවත් නිසා, පූජනීය ජීවිතයක් ගත කිරීමට එය උදව් කරන නිසා, එය ඉවතට හැරෙන්නට, සන්සුන් වන්නට, නිශ්චල වන්නට, සැනසිල්ලට, ඉහළ දැනුම වර්ධනයට සහ නිවණ පිණිස මෙහෙය වන නිසාය' (M.I,431). බලන්න **සත්‍යය**

*What the Buddha Taught,* W. Rahula, 1974.

## රාත්‍රී විමෝචනය

රාත්‍රී විමෝචනය හෝ සරාගී සිහිනය, නින්දේදී සිතේ පාලනයක් රහිතව ස්‍රාවය පිට කිරීම ශුක්‍ර (සුක්ක) පිට වීමයි. මෙම අත්දැකීම්වලට හේතුව නිශ්චිත නැත. නමුත්, පොදු ප්‍රජාව සාමාන්‍යයෙන් පිළිගත් සත්‍යය නම්, එය ශෘඟාරාත්මක සිහින හෝ ශුක්‍රානු පුරංස්ථ ග්‍රන්ථයේ ශක්තියෙන් වැඩි වීම නිසා යැයි සමච්චල් කෙරේ. බොහෝ ආගම් දරා සිටින්නේ රාත්‍රී විමෝචනය පුරුෂයෙකුට ඔහුගේ පුරුෂ ශක්තියට බාධා කරන බව හෝ කෙලසන බවයි. මනුස්මෘතියේ මෙසේ සඳහන් වේ. 'රාත්‍රී විමෝචනය ඇති වූ බ්‍රාහ්මණ ශිෂ්‍යයෙකු ස්නානය කළ යුතු බව, හිරුට වන්දනා කළ යුතු බව සහ 'මගේ පුරුෂ ශක්තිය නැවත මා වෙත පැමිණේවා' යන වෛදික වගන්තිය දිනකට තුන් වතාවක් සජ්ඣායනය කළ යුතුයි.' බයිබලයට අනුව, රාත්‍රී විමෝචනය මිනිසෙකු අපවිත්‍ර කරයි. මෙය නිවැරදි කළ හැක්කේ චාරිත්‍රානුකූල පිරිසිදු කිරීමෙනි. (ලෙවිටිකුස් 15, 16-17) බෞද්ධ පැවිදි නීති වන විනය පිටකය සඳහන්

කරන්නේ ස්වයං සම්භෝගය වරදක් බවයි. නමුත්, රාත්‍රී විමෝචනය එසේ නොවේ. එයට හේතුව එයට අරමුණක් අයත් නොවන නිසාය. රාත්‍රී විමෝචනය ඇති වන්නේ 'හීනයක ප්‍රතිඵලයක් නිසා බව' (සුපිනෙන Vin.I,294) බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ. භික්ෂූන් පරිස්සමින් සහ සිහිකල්පනාවෙන් යුක්තව නින්දට යන්නේ නම් එසේ වීමට ඇති ප්‍රවණතා අඩු බව ද උන්වහන්සේ පැවසූහ.

තුන්වන ධර්ම සංගායනාවට සහභාගී වූ සමහර අය රහත් ඵලයට පත් වූ පුරුෂයෙකුට ද රාත්‍රී විමෝචනය ඇති විය හැකි බව සහ මෙම අත්දැකීම් ඇති වන්නේ අනර්ථකාමී දෙවියන් විසින් සිදු කරන බවට ද දරා සිටියහ. මෙම අදහස් දෙකටම පොදුවේ පිළිගත් භික්ෂූහු පරස්පර විරෝධය පෑහ (Kv.163). බලන්න **ලිංගික හැසිරීම**

## ප්‍රාණඝාත නොකරන දින

ඉන්දියාවේ මුල් කාලීන බෞද්ධයන් කිසිම හේතුවකට ප්‍රාණඝාත කිරීම වැරදි බව සැලකූහ. එසේම බොහෝ මිනිසුන් ඔවුන් සමග එකඟ නොවන බව ද, සමහර මිනිසුන් දහවල් ආහාරයට කුකුළෙකු මරන්නට උවමනා විය හැකි බව සහ තවත් පිරිසක් දඩයම් කිරීමෙන් විනෝදයක් ලබන බව ද හඳුනා ගත්හ. තමන්ගේ වටිනාකම් අනෙක් අයට අනුගමනය කිරීමට බල කිරීමට අවශ්‍ය නොවෙන අතරම වඩාත් මනුෂ්‍යත්වයෙන් යුක්ත සමාජයක් නිර්මාණය කිරීමේ අදහසින් ප්‍රාණඝාත නොකරන දින (මාඝාත දිස්වා, Vin.I,217) යනුවෙන් හඳුන්වමින් චාරිත්‍රයක් වර්ධනය කරන ලදී. එමගින්

අපරාධකරුවන් එල්ලා නොමරන ලදී, සතුන් ඝාතනය නොවීය, දඩයම් කිරීමට අවසර නොදෙන ලදී. එවැනි දින සාමාන්‍යයෙන් අණබෙර හඬෙන් නගර සහ ගම්වල ප්‍රචාරය කරන ලදී (Ja.IV,115). ක්‍රි. පූ. 243වන ශතවර්ෂයේදී අශෝක රජ ප්‍රාණඝාත කිරීම, සතුන් කප්පාදු කිරීම හෝ හංවඩු ගැසීම යනාදිය මාසයේ එක් නිශ්චිත දිනයක තහනම් කරමින් නියෝගයක් නිකුත් කළේය.

ප්‍රාණඝාත නොකරන දින පිළිපදින චාරිත්‍රය මුස්ලිම් පාලන කාලය වන තුරුම ඉන්දියාවේ පැවතුණි. ජාහන්ගිර් නමැති මුගල් රජු (1605 - 27 පාලන කාලයේ) ඔහුගේ ටුසුක් - ඉ - ජාහන්ගිරි ග්‍රන්ථයේ මෙසේ ලිව්වේය 'සෑම වර්ෂයකම රබීයූ - එල් - අවල් 18 සිට, (18th of Rabiu-l-awal) මගේ උපන්දිනයේ, මගේ ජීවිතයේ අවුරුදු ගණනට සමරූපීව, මිනිසුන් ආහාර සඳහා සත්ත්වයන් නොමැරිය යුතු බවට මම අණ දුන්නෙමි.) බලන්න **සත්ත්වයන් නිදහස් කිරීම**

## නග්නත්වය

නග්නත්වය හෝ නිරුවත් බව (නග්ගිය) වස්ත්‍ර නොමැතිව සිටිනා තත්ත්වයයි. ඉතිහාසය පුරාම මිනිසුන් නිරුවත්ව හෝ නිරුවත් බවට ටිකක් අඩුවෙන් සිට ඇත. නිවර්තන කලාපයන්වල දඩයමින් හා රැස් කිරීමෙන් ජීවත්වන ප්‍රජාවකගේ සාමාජිකයන් බොහෝ විට ප්‍රායෝගික හේතූන් නිසා නිරුවත්ව සිට ඇත. නිරුවත්ව සිටීම විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට, දඬුවමක් වශයෙන් සහ යහපත් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා පවා පුරුදු කර ඇත. පැරණි ඉන්දියාවේ නග්නත්වය පුහුණු කළේ ප්‍රධාන

වශයෙන් ආගමික හේතූන් සඳහාය.

බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත් වන්නට පෙර, උන්වහන්සේ ද නිරුවත්ව සිටි බව පෙනේ. මේ නිසා සමහර අය අනුමාන කළේ උන්වහන්සේ අඩු තරමින් යම් කාලයකට පෙන ආගම අනුගමනය කළ කෙනෙකු බවයි (M.I,77). බුදුපියාණන් වහන්සේගේ කාලයේ සිටි ආජීවකයන් සහ වෙනත් විවිධ නිකායවලට අයත් සාමාජිකයන් නිරුවත්ව සිටියහ. එකසාටක ශ්‍රමණයන් ඔවුන්ගේ ප්‍රජනන ඉන්ද්‍රිය වසා ගැනීමට පමණක් කුඩා රෙදි කැබැල්ලක් ඇඳ ඇත. නිරුවත්ව සිටීමට අමතරව, කෙස්වලින් ඇදීම, කිසි දිනක කෙස් සහ නියපොතු නොකැපීම, කෙස් අවුල් වීමට ඉඩ හැරීම සහ නොසේදීම යන මේ සියල්ල ලෝකයෙන් ප්‍රශංසනීය ඇත්වීමක් පෙන්වන්නට බව විශ්වාස කෙරේ. නග්නත්වය පිළිබඳව කියනු ලබන ආධ්‍යාත්මික වටිනාකම එක් භික්ෂුවක් විසින් සම්පිණ්ඩනය කරන ලදී : 'නග්නත්වය තණ්හාව අඩු කර ගැනීමට, සන්තුෂ්ටියට, නපුරුකම ඉවත් කර ගැනීමට, වැරදි කිරීමෙන් වැළකීමට ප්‍රවේසම්වීමට, අවධානයෙන් සිටීමට, බාධා අඩුකර ගැනීමට සහ වීර්යය ඇති කර ගැනීමට ප්‍රයෝජනවත් වේ' (Vin.I,305). මාසයකට දෙවතාවක් ආජීවක නිකායේ ශ්‍රාවකයෝ තමන්ගේ පූජකවරුන් අනුගමනය කරමින් නිරුවත් වී පොළොව මත නිදා ගනිති. මෙහි අදහස වන්නේ 'මා සතුව කොහෙවත් කිසි දෙයක් නැත. එම නිසා මට කිසි දෙයකට බැඳීම් නැත' (A.I,206). මෙම ගිහි ශ්‍රාවකයන් සැබැවින්ම කිසිම දෙයක් අත් හළේ නැති නිසාත්, පසු දිනම ඔවුන්ගේ සාමාන්‍ය ජීවිතය නැවත පටන් ගත් නිසාත්, ඔවුන්ගේ අභිනිෂ්ක්‍රමණය

බුදුපියාණන් වහන්සේ එය බොරු මවා පෑමකට වඩා මුකුත් නැති ලෙස සැලකූ සේක.

භික්ෂූන් කිසි විටක, තමන්ගේ පෞද්ගලික නිවහනේදීවත් නිරුවත් නොවිය යුතු බවට බුදුපියාණන් වහන්සේ නීතියක් පැණවූහ (Vin.II,121). උන්වහන්සේ මෙසේ පැවසූහ: 'නිරුවත්වීම නොගැළපේ, නුසුදුසුයි, අසැබියි, භික්ෂුවකට නොවටී, අවසර දිය නොහැකියි සහ නොකළ යුතුයි' (Vin.I,305). උන්වහන්සේ හේතු දෙකක් මත එයට විරුද්ධ වූහ. පළමුව, දැඩි සේ භික්මුණු බව හෝ මතුපිට වෙනස්කම් මෙන්, නිරුවත් වීමෙන් වැදගත් අභ්‍යන්තර වෙනස්කම්වලට මෙහෙය නොවේ. උන්වහන්සේ මෙසේ පැවසූහ 'නිරුවත්බව හෝ අවුල් වූ කෙස්, මඩ හෝ නිරාහාරව සිටීමෙන්, පොළොව මත දිගාවීමෙන්, නොසෝදා සිටීමෙන්, ඇණ තියා ඉඳගැනීමෙන්, එම පුද්ගලයා සැකයෙන් ඔබ්බට ගොස් නොමැති නම්, ඔහු පිරිසිදු නොවේ' (Dhp.141). එසේම උන්වහන්සේ නිරුවත් බවට විරුද්ධවූ තවත් හේතුවක් නම්, එය යහපත් හේතුවක් නොමැතිව ආචාරශීලී සමාජයේ සම්මතයන්ට පටහැනි බැවිනි. විශාඛා ආර්යාව වරක් සමහර භික්ෂුණීන් නිරුවතින් ස්නානය කරනු දැක මෙසේ කීවාය: 'කාන්තාවන් නිරුවතින් සිටීම අශෝභනයි, දැඩි පිළිකුල් සහිතයි, සහ අප්‍රසන්නයි' (Vin.I,293). එකල සාමාන්‍ය මතය මෙය වන්නට ඇත.

බුදුපියාණන් වහන්සේට අවශ්‍ය වූයේ උන්වහන්සේගේ භික්ෂු භික්ෂුණීන් සදාචාරයේ සහ යහපත් විධිවල සාමාන්‍ය ප්‍රමිති පිළිපැදීම සහ අනෙක් අයට ධර්මය සන්නිවේදනය කිරීමට

හැකිවීමයි. උන්වහන්සේ තමන්වහන්සේගේ භික්ෂූන් සහ භික්ෂුණීන් අභ්‍යන්තරයෙන් පමණක් නොව, බාහිරව ද වෙනත් නිකායයන්ට වඩා වෙනස් විය යුතු බවට සැලකිලිමත් වූහ. මෙම වෙනත් තවුසන්ගෙන් බොහෝ දෙනෙක් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් නිරුවත් වූහ, නැතහොත්, ඔවුන්ට කැමැති ඕනෑම දෙයක් ඇඳ සිටියහ. බුදුපියාණන් වහන්සේ නියම කළේ උන්වහන්සේගේ පැවිදි ශ්‍රාවකයන් පැහැදිලි සහ පහසුවෙන් හඳුනාගත හැකි සිවුරක් පෙරවිය යුතු බවයි. වර්තමානයේ ජෛන භික්ෂූන් සහ භික්ෂුණීන් සහ විවිධ නිකායන්වලට අයත් හින්දු තවුසන් තවමත් නිරුවත් බව පුහුණු කරති. ඉතාමත් හොඳින් දන්නා අය නම් නාග බබා සහ අවිදුත් ය.

## භික්ෂුණීන්

භික්ෂුණීන් (භික්ඛුනී) යනු බ්‍රහ්මචාරී පැවිදි ජීවිතයක් ගත කිරීම සඳහා සාමාන්‍ය සමාජය අභිනිෂ්ක්‍රමණය කළ අයයි. 'භික්ෂුණිය' හෝ 'කාන්තා පූජක' යන නූතන භාෂිතය වැරදි ව්‍යවහාර වේ. බෞද්ධ ප්‍රජාවට (පරිසා) අයත් සාමාජිකයන් හතර දෙනාගෙන් භික්ෂුණීන් දෙවැන්නෝ වෙති. අනෙක් අය භික්ෂූන්, උපාසක සහ උපාසිකාවන්ය. නිසියාකාරව පැවිදි වීම සඳහා, කාන්තාවක් පළමුව භික්ෂුණී ගණ පූරණයකින් පැවිදි විය යුතුයි. ධර්ම ග්‍රන්ථවල විස්තර කර ඇති පරිදි, සමහර භික්ෂුණීන් ගැඹුරු ලෙස උගත් (බහුස්සුත), කතාවේ ව්‍යක්ත (භාණික), ආත්ම විශ්වාසය සහිත (විසාරද) සහ ධර්මය ඉගැන්වීමේ ප්‍රකට (පට්ඨ ධම්මං කත්තං කතුං, Vin.IV,290) වේ. බෞද්ධ ධර්ම ග්‍රන්ථවලින් එකක් වූ ථේරීගාථාවේ හුදු

භික්ෂුනීන් 73ක් විසින් රචනය කරන ලද කවි අන්තර්ගත වේ. සංයුක්ත නිකායේ භික්ඛුණී සංයුත්තයේ භික්ෂුණීන් පිළිබඳව සූත්‍ර 10ක් ඇතුළත් වේ (S.I,128-135).

බුදුපියාණන් වහන්සේගේ කාලයේදී, භික්ෂුණීන් සාමාන්‍යයෙන් භික්ෂුණීන් සහ ගිහි පිරිස විසින් අමතනු ලැබුවේ 'උතුම් කාන්තාව' (අයෙ) වශයෙනි. භික්ෂූන් ඔවුන් අමතනු ලැබුවේ 'සහෝදරිය' (භගිනී) යනුවෙනි. ථේරවාදී රටවල ක්‍රි. පූ. 1000 දී පමණ භික්ෂුණී පරම්පරාව බිඳ වැටුණි. සාම්ප්‍රදායකයෝ එය යළි ප්‍රාණවත් කිරීමට හැකි හෝ කළ යුතු යැයි විශ්වාස නොකරති. එයට හේතුව අළුතෙන් භික්ෂුණීන් පැවිදි කිරීමට වර්තමානයේ භික්ෂුණීන් නොමැති නිසාය. කෙසේ නමුත්, භික්ෂුණීන්ගේ පරම්පරාව බොහෝ මහායාන රටවල දිගටම පවතී. තායිවානය වැනි රටවල භික්ෂුණීන් ක්‍රියාශීලී වන අතර, බෞද්ධ ප්‍රජාව අතර ගෞරවයෙන් නියෝජනය වේ. බලන්න **ගෘහස්ථ ජීවිතය, මහා පජාපතී ගෝතමී, පැවිදි වීම, අටපිරිකර, සංඝමිත්තා සහ ථේරගාථා සහ ථේරීගාථා**

*Women and Monastic Buddhism in Early South Asia*, Garima Kaushik, 2016.

## පස් වැදෑරුම් පරිත්‍යාග

බලි යන වචනයෙන් 'බදු', 'ගාස්තු' 'ගෙවීමක්' හෝ 'දඩයක්' පවා යන අර්ථය විය හැකිය. එයින් අදහස් කරන්නේ යම් කෙනෙකු කිරීමට බැඳී සිටින දෙයක් ලෙසය. බුදුදහමේ පස් වැදෑරුම් පරිත්‍යාග (පඤ්චබලි) වන්නේ ප්‍රතිලාභීන් පස් දෙනෙකුට - ඥාතීන්ට, ආගන්තුකයන්ට, වෙන්වූ ආදරණීයයන්ට, රජවරුන්ට සහ දෙවියන්ට ආදී වශයෙන්, ලබා දෙන ත්‍යාග හෝ සේවාවන් වේ (A.II,68). බුදුපියාණන් වහන්සේට උන්වහන්සේගේ ශ්‍රාවකයන් මෙම පරිත්‍යාග ලබා දීම අවශ්‍ය නොවූවත්, එසේ කිරීම යහපත් සහ කුසලතා ඇති කරන සුළු බවට යෝජනා කළහ. එසේම කෙනෙකුට සාධාරණව ඉපැයූ වස්තුව භාවිත කළ හැකි එක් ක්‍රමයක් වන්නේ පරිත්‍යාග කිරීම බව උන්වහන්සේ පැවසූහ (A.II,68). පරිත්‍යාග කිරීමෙන් තමන්ට අධික කාලයක්, කරදරයක් සහ මිලක් වැය කරන්නට සිදු වන බව එක් බ්‍රාහ්මණයෙකු සාරිපුත්ත හිමියන්ට පැවසූ විට, උන්වහන්සේ කෙසේ වුවත්, එසේ කරන ලෙස ඔහු ධෛර්යමත් කළහ (M.II,186).

පැරණි කාලයේදීට වඩා වර්තමානයේ අඩුවෙන් අදාළ වුවත්, පස් වැදෑරුම් පරිත්‍යාගවලින් සමහරක්, අදටත්, එනම්, පුද්ගලයන් අතර බැඳීම් ශක්තිමත් කිරීමේදී, පුද්ගලයන් සහ ආයතන සහ පරම්පරා හරහා, වැදගත් සමාජීය කාර්යභාරයක් ඇත. පැරණි කාලයේදී, කෙනෙකුගේ ඥාතීන් (ඤාතිබලි) පිළිගනිමින් සහ ඇගයීම් විඳහැර පෑම විස්තෘත

පවුලක් ශක්තිමත්ව තබා ගැනීමට අවශ්‍ය විය. නූතන සමාජයේ එහි ඇති වැදගත්බව හීන වී ඇති නමුත්, කෙනෙකුගේ නැන්දම්මා, මාමණ්ඩි, නෑනා, මස්සිනා ආදීන් සමග හොඳීන් සිටීම කොහොමටත් යහපත් දෙයකි. ආගන්තුකයන්ට (අතිථිබල) කරුණාවන්ත බව සහ ගෞරවණීය උපස්ථානය දැක්වීම බෞද්ධ සම්ප්‍රදායේ ආගන්තුක සත්කාරයේ අවශ්‍ය කොටසකි. වෙන්වූ දෙමාපියන් (පුබ්බපෙතබලි) වෙනුවෙන් සහ ඔවුන් සිහිකරමින් පරිත්‍යාග කිරීම බුදුපියාණන් වහන්සේගේ කාලයේද පැවති පැරණි පුරුද්දකි. බුදුපියාණන් වහන්සේ එය ආදරය සහ කළගුණ සැලකීම ප්‍රකාශ කිරීමක් ලෙස ඇගයූ සේක. දෙමාපියන් මිය ගිය පසු දරුවන් විසින් ඉටු කළ යුතු එක් යුතුකමක් වශයෙන් බුදුපියාණන් වහන්සේ මෙය සඳහන් කළහ (A.III,43; D.III,189). රජුට කරන පරිත්‍යාගය (රාජබලි) ලෙස නූතනයේ සමාන වන්නේ නීතියෙන් ගෙවීමට බැඳි බදු මුදල්ය. කිසි විටකත් ජනප්‍රිය නොවූවත්, වගකිව යුතු පුරවැසියා බදු ගෙවන අතර, එසේ කිරීමෙන් වැළකී සිටින අය අසාධාරණ ලෙස තමන් ජීවත්වන සමාජ ක්‍රමයේ ප්‍රතිලාභ ලබා ගන්නේ ඒ සඳහා සාධාරණ දායකත්වයක් ලබා නොදීය.

අද දෙවිවරුන්ට සහ ප්‍රාදේශීය ආත්මයන්ට පරිත්‍යාග කිරීම බොහෝ මිනිසුන්ට සමහර විට අර්ථශූන්‍ය දෙයක් විය හැකිය. සමහර විට එය දැන් අර්ථවත් ආගමික පුණ්‍යායතනවලට පරිත්‍යාග කිරීමක් ලෙස අර්ථ දැක්විය හැකිය. බුදුපියාණන් වහන්සේගේ පස් වැදෑරුම් පරිත්‍යාග බොහෝ විට බ්‍රාහ්මණ ආගමේ මහා පූජා පහට (පඤ්චමහායඤ්ඤ) විකල්පයක් විය හැකිය.

## මහලු විය

මහලු විය (ජරා) යනු ජීවියෙකුගේ ස්වභාවික ආයු කාලය අවසන් වන කාලයයි. මහලු විය ත්‍රිපිටකයේ අර්ථ දක්වන්නේ වයෝවෘද්ධ (වුද්ධ), ගෙවී ගිය (මහල්ලක), වයසින් දුරක් ගිය (අද්ධගත), අවසානයට ළඟා වන (වයො අනුප්පත්ත A.I,68), යනුවෙනි. එම තත්ත්වය 'දත්වල කැඩුණු බව, හිසකෙස් වල සුදු පැහැය, සම රැළි වැටීම, ශක්තිය අඩු වීම සහ සෞඛ්‍ය පහසුව පිරිහීම' බව බුදුපියාණන් වහන්සේ විස්තර කළහ (S.II,2). බුදුපියාණන් වහන්සේගේ කාලයේ ජීවිත අපේක්ෂාව අදට වඩා බෙහෙවින් අඩු වූ අතර, 'අසූවක්, අනූවක් හෝ සියයක්' ජීවත් වූයේ ඉතා ස්වල්ප පිරිසකි' (A.I,68).

කෙසේ නමුත්, බොහෝ විට මහලු විය හා සම්බන්ධ ප්‍රශ්න වූයේ ජරාපත්වීම සහ රෝග, තනිකම සහ මරණයට ඇති බියයි. මේවා අද මෙන්ම එදත් පොදු දේවල් විය. වෙනස වන්නේ වෙන කවරදාකටවත් වඩා වැඩියෙන් ජීවත්වන මිනිසුන් සමග, අවම වශයෙන් සංවර්ධිත රටවල වුවද, එවැනි ගැටලු ජනගහනයෙන් විශාල කොටසකට බලපෑමය.

දුක්විඳීම (දුක්ඛ) අභිබවා යාම සඳහා බුදුපියාණන් වහන්සේ ධර්මය ඉගැන්වූහ. මහලු විය දුක් විඳීම පිළිබඳ එක් සාධකයක් නිසා, උන්වහන්සේට මේ විෂය පිළිබඳව කීමට බොහෝ දේ තිබුණි (S.V,421). මහලු වියේ ඇති වන වඩාත් ප්‍රකට ලක්ෂණ වන්නේ කායික - දුබලකම, අයෝග්‍ය බව සහ රෝගී බව යනාදියයි. මෙම තත්ත්වයන් මහලු වියේදී ආවේණික

නිසා, ඒවා සම්පූර්ණයෙන්ම මඟහැරිය නොහැකිය. නමුත්, පසුවට කල් තැබීම හෝ අවම කළ හැකිය. මහලු විය ආරම්භයට පෙර මත්පැන් භාවිතයෙන් සහ දුම්ඉරීමෙන් වැළකීමෙන්, සෞඛ්‍යමත් ආහාර ගැනීමෙන් සහ අඛණ්ඩ ව්‍යායාම්වල යෙදීමෙන්, සහ රෝගයේ ආරම්භයෙන් පසු අප්‍රමාදව වෛද්‍යමය මැදිහත්වීම්වලට යොමුවීම යන මේ සියලු දේ මෙසේ කිරීමට උපකාරී වේ.

කෙසේ නමුත්, මහලු විය හා බොහෝ විට සම්බන්ධ මානසික ප්‍රශ්න, හරි ආකල්පයෙන්, යුතුව කටයුතු කිරීමෙන් බොහෝ යහපත් මට්ටිමකට අවම කර ගත හැකිය, නැතහොත් සම්පූර්ණයෙන්ම පවා වළක්වා ගත හැකිය. වරක් එක් මිනිසෙකු බුදුපියාණන් වහන්සේ වෙත ගියේය. 'බුදුපියාණන් වහන්ස, මම දැන් මහලු වියේ සිටිමි. වැරහී ඇත්තෙමි, වයසින් බොහෝ දුර ගොස් ඇත්තෙමි. අවසානය කරා යමින් සිටිමි, සෑම විට කායිකව රෝගී වෙමි, සහ අසනීපයෙන් සිටිමි... බොහෝ කාලයකට ප්‍රයෝජනවත් වන සතුටින් සිටීමට සහ සැනසිල්ලක් ලැබීමට මට යමක් කියන්න...' බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: 'මෙසේ පුහුණු වන්න, 'මගේ ශරීරය ලෙඩ වුවත්, මගේ මනස රෝගී නොවේ' (ආතුරකායස්ස මෙ සතො චිත්තං අනාතුරං භවිස්සති, S.III,1). මෙම බුද්ධිමත් වචන කායික පිරිහීමක් තිබියදීත්, අපට චිත්තවේගීව ස්ථිරව, සතුටින් සහ තෘප්තිමත්ව සිටිය හැකි බවට ධනාත්මක සහ බලකර සිටින සිහිකැඳවීමකි.

මහලු විය හා සිදුවීමට ආසන්න දුර්වල වීම හමුවේ මනස නිරෝගීව තබා ගැනීමට බුදුපියාණන්

වහන්සේ උපක්‍රම පරාසයක් නිර්දේශ කළහ. අපි එයින් තුනක් කෙටියෙන් සලකා බලමු. පළමුවැන්න මහලු විය පිළිගැනීමට ඉගෙන ගැනීමයි. නූතන සමාජය මහලු විය දකින්නේ බිය විය යුතු හා ප්‍රතික්ෂේප කළ යුතු තත්ත්වයක් ලෙසය. විද්‍යාව, ඖෂධ සහ ශල්‍යකර්ම හැකිතාක් දුරට එකට එක්වී සංවිධානය වන්නේ එය හැකිතාක් දුරට වැළැක්වීමට නොඉවසිලිවන්ත ලෙස උත්සාහ දරමින්ය. ප්‍රතිඵල හාස්‍යජනක සහ ඛේදජනකය. මහලු පාලිකාව ඇයගේ සිරුර අලංකාරය සඳහා ශල්‍යකර්මයකට යන අතර, වයස 70ක් වන මහලු මිනිසෙකු කෘතිම කොණ්ඩයක්, යොවුන් වියේ තරුණයෙකුගේ ඇඳුමක් ඇඳ ගනී. අද කාලයේ මෙන්ම, බුදුපියාණන් වහන්සේගේ කාලයේද, තමන්ට වඩා දශක ගණනාවක් වයසින් අඩු කාන්තාවන් විවාහ කරගත් මහලු මිනිස්සු සිටියහ (Sn.110). මහලු විය සම්බන්ධයෙන් යථාර්ථවාදී වන්නට සහ එය ස්වභාවික සහ නොවැළැක්විය හැකි ක්‍රියාවලියක් ලෙස දකින්නට බුදුපියාණන් වහන්සේ අපට උපදෙස් දුන්හ. මෙසේ කිරීමෙන් අපට 'තාරුණ්‍යයේ දේවල් ප්‍රසන්න ලෙස අත්හැර දමන්නට' උපකාර වන අතර, එවිට ශක්තිය ප්‍රතික්ෂේප කිරීම් සඳහා වැය නොකර, අර්ථවත් උත්සාහයන් තුළින් අපගේ කාලය පුරවමින් අවසානය සඳහා සූදානම් වීමට අපට හැකි වේ.

බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'උගත් අයට, උතුම් ශ්‍රාවකයන්ට මහලු විය පැමිණේ. නමුත් ඔහු මහලු වියේ සිටින විට මෙසේ සිතයි: 'මා පමණක් නොවේ, ඉපැදුණ සැම කෙනෙකුම මහලු වේ. මා මහලු වූ විට, මා වැලපෙන්නේ නම් හෝ හඬන්නේ නම් එය මට වැදගත් වන්නේ නැත, මගේ ශරීරය

කැත වෙයි. මා මගේ කටයුතු අතපසු කර ගනු ඇත. මගේ සතුරන් ප්‍රීති ප්‍රමෝදයට පත් වනු ඇත. මගේ මිතුරන් ශෝකයට පත් වනු ඇත.' එම නිසා මහලු විය පැමිණි විට කෙනෙකු වැළපෙන්නේ නැත. හඬන්නේ නැත. ඔහු නිවැරදි ලෙස උගතෙකු, උතුම් ශ්‍රාවකයෙකු ලෙස හැඳින් වේ. ඔහු දුක නමැති විෂ සහිත හීය ඉවතට ඇද ඇත. නමුත් සාමාන්‍ය මිනිසා ඒ පිළිබඳව සිතින් වේදනා විඳියි'(A.III,55).

අප ජීවත්ව සිටින කාලය තුළ අප කරන දේ තරම්, දීර්ඝායුෂ සමහර විට වැදගත් නොවන බව සැලකිල්ලට ගන්නා ලෙස බුදුපියාණන් අපගෙන් ඉල්ලා සිටියහ. උන්වහන්සේ මෙසේ පැවසූහ: 'අවුරුදු සියයක් මෝඩයෙකු සේ සහ දැනුම නොමැතිව ජීවත්වනවාට වඩා එක් දිනක් බුද්ධිමත්ව සහ භාවනායෝගීව සිටීම යහපත් වේ. කම්මැලිව සහ වැදගැම්මකට නැතිව වසර සියයක් ජීවත් වනවාට වඩා එක් දිනක් ශක්තියෙන් පිරුණු ජීවිතයක් ගත කිරීම යහපත් වේ' (Dhp.111-12). මෙම ප්‍රකාශන සැබැවින්ම අතිශයෝක්තියෙන් දක්වන නමුත්, ඒවායේ කරුණු පැහැදිලිය. අපගේ ජීවිතවල ගුණාත්මක භාවය ජීවත්වන කාලයට වඩා වැදගත් වේ. අප අපගේ ජීවිතය සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනට ගන්නේ නම් සහ වටහා ගන්නේ නම්, හැකි තාක් කල් තරුණ බව රැකගනිමින් සිටීමට දක්වන සැලකිල්ල අඩු වේ.

බොහෝ මහලු මිනිසුන් මුහුණ දෙන පොදු මානසික ප්‍රශ්න දෙකක් නම් - යම් දේවල් කිරීම පිළිබඳව හෝ කරන්නට බැරි වීම පිළිබඳව පසුතැවීමයි. අනෙක තමන්ගේ ජීවිතය නාස්ති වීම පිළිබඳ හැඟීමයි.

එවැනි හඟීම් මහලු මිනිසෙකුගේ වර්තමාන කාලය දුක සහ මහත් දොම්නසින් පිරවිය හැකිය. වර්තමානය අවංකව ජීවත්වෙමින් සහ දැන් මනස දියුණු කිරීමෙන් මෙම ප්‍රශ්න කලින්ම වළක්වා ගත හැකිය.

බුදුපියාණන් වහන්සේ ආමන්ත්‍රණය කළ මහලු වියේ තවත් අංගයක් වන්නේ මහලු පිරිස රැකබලා ගැනීමේ ප්‍රශ්නයයි. අතීතයේදී, මහලු පිරිසට දැක්වූ ගරු සැලකිල්ල සහ ගෞරවය නිසා මහලු වීමට යම් ප්‍රමාණයක හිලව්වක් සිදු විය. බොහෝ විට ආච්චිලා සහ සීයලාට තමන්ගේ දරුවන්ගේ දරුවන් රැකබලා ගැනීමේ කාර්යය පැවරී තිබූ නිසා එහි නිරත වූහ. ඒ නිසා ඔවුන් අවශ්‍යය යන හැඟීම ඇතිවුණි. නමුත් නූතන පාරිභෝගික සමාජවල තරුණයන්ට, අනාගතයෙහි තමන්ට ද වෙන අප්‍රිය ජනක මතක් කරවනයක්, සහ ආර්ථිකමය බරක් ලෙස මහලු මිනිසුන් සලකමින් බොහෝ විට නොසලකා හරිමින් සහ ප්‍රතික්ෂේප වෙමින් ද පවතී. ආදරණීය සහ කළගුණ දන්නා මිනිසුන් තමන්ගේ දෙමාපියන් සම්බන්ධයෙන් මෙසේ සිතන බව බුදුපියාණන් වහන්සේ වදාළහ 'මා නඩත්තු කළ ඔවුන් මම ද පෙරළා නඩත්තු කරමි' (භතෝ නෙසං භරිස්සාමි, D.III,189).

## සර්වඥතා ඥානය

සර්වඥතා ඥානය (සබ්බඤ්ඤුතා) යනු සියලු දේ දැන ගැනීමට ඇති හැකියාවයි. සාමාන්‍යයෙන් විශ්වාස කරන්නේ දෙවියන් වහන්සේගේ ගුණාංගයක් ලෙසයි. නමුත් සියල්ල දත් යැයි කියන ආගමික

නායකයන් ද ඇත. මනුෂ්‍ය හෝ දිව්‍ය කිසිම සත්ත්වයෙකු සියල්ල දන්නේ නොමැති බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. දෙවියන් වහන්සේ සියල්ල දන්නේ යැයි යන්න උන්වහන්සේ ප්‍රතික්ෂේප කළහ (D.I,17). දෙවියන් වහන්සේ එසේ වූයේ නම්, ආගම අර්ථ ශූන්‍ය බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. දෙවියන් වහන්සේ සියල්ල දන්නේ නම්, අප ක්‍රියා කරන්නේ කෙසේ ද කියා අප එසේ කිරීමට බොහෝ කාලයකට පෙර ඔහු දැනගත යුතුව තිබේ. මෙයින් අදහස් කරන්නේ එසේ නොමැතිව අපට ක්‍රියා කිරීමට නිදහසක් නැති බවයි. අප ක්‍රියා කරන්නේ කෙසේ ද යන්න තෝරා ගැනීමට අපට නිදහසක් නොමැති නම්, යහපත් වීමට හෝ නපුරෙන් වැළකී සිටීමට මිනිසුන්ට ඉගැන්වීමේ තේරුමක් නැත. ජෛන ආගමේ නිර්මාතෘ සහ බුදුපියාණන් වහන්සේගේ සමකාලීනයෙකුවූ මහාවීර සර්වඥයෙකු යැයි කියා තිබේ (M.II,31). මෙම කියමන පදනම් විරහිත එකක් බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (M.II,127).

සිත්ගන්නාසුලු කරුණක් නම්, බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂ ගණනාවක් තුළ, නූගත් සහ ඕනෑවට වඩා උද්‍යෝගිමත් බෞද්ධයන් කියා සිටියේ බුදුපියාණන් වහන්සේ 'මුළු ලෝකයේම වාසය කරන දෙවිවරුන් සහ මිනිසුන්ගේ මනසින් දකින, ඇසෙන, දැනෙන, සිතන, අත්කර ගන්නා, සොයන සහ විමසන සැම දෙයම දන්නා' බවයි. නමුත් බුදුපියාණන් වහන්සේ උන්වහන්සේ වෙනුවෙන් මෙම ප්‍රකාශය කිසි විටක සිදු නොකළහ (M.I,482). උන්වහන්සේ තමන් වහන්සේ පිළිබඳව ප්‍රකාශ කළේ 'ලෝකයන් පිළිබඳව දන්නා අය'

(ලොකවිදූ) වශයෙනි.

## වාචික සම්ප්‍රේෂණය

බෞද්ධ ධර්ම ග්‍රන්ථ ශතවර්ෂ ගණනාවක් වාචික සම්ප්‍රේෂණය තුළින් ඇති වූ බවට මිනිසුන් දැන ගත් විට, ඔවුන් උපකල්පනය කරන්නේ ධර්ම ග්‍රන්ථ ඉතාමත් විශ්වසනීය නොවන බවයි. ත්‍රිපිටකය පළමුව ලියන්නට යෙදුණේ ක්‍රි. පූ. 1වන ශතවර්ෂයේදී පමණ ශ්‍රී ලංකාවේ දී බව බොහෝ විට කියැවේ. මෙම තොරතුරේ මූලාශ්‍රය වන්නේ පැරණි ශ්‍රී ලංකාවේ පුරාවෘත්තය වූ දීපවංශයයි. නමුත්, මෙම පුරාවෘත්තය වාර්තා කරන්නේ ශ්‍රී ලංකාවේ පළමු වරට ධර්ම ග්‍රන්ථ ලිවීම පිළිබඳව පමණි. එය ඊට පෙර ඉන්දියාවේ ද ලියා තිබිය හැකිය. සැබැවින්ම එසේ වූ බවට විශ්වාස කිරීමට හොඳ හේතු තිබේ. මෙය අශෝක රජුගේ පාලන කාලයේදී සිදුවන්නට ඉඩ තිබේ. මෙම රජු භක්තිමත් බෞද්ධයෙකි. ධර්මය ආරක්ෂා කර ව්‍යාප්ත කළ යුතු බවට ඔහු ඉතාමත් සැලකිලිමත් විය. ඔහු රාජ්‍ය ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ලිවීම පුළුල් ලෙස භාවිත කළේය.

අප අශෝක රජතුමා පිළිබඳව දන්නා සැම දෙයකින්ම හඟවන්නේ ඔහු විසින් කරන ලද වැඩිම දේ ත්‍රිපිටකය ලිවීම සඳහා කරන ලද කැපවීමයි. මෙය සත්‍ය නම්, ත්‍රිපිටකය ලිවීම සහ බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණය අතර කාලපරිච්ඡේදය අවුරුදු 200ක් පමණ වන බව අදහස් වේ. කෙසේ වෙතත්, මඤ්ජුශ්‍රීමූලකල්පයට අනුව, ත්‍රිපිටකය ලියා ඇත්තේ අජාසත්තු රජුගේ (තදෙතත් ප්‍රවචනං ශස්තු

ලිඛාපයිෂ්‍යති විස්තරම්) පුත්‍ර උදායිභද්ද රජුගේ රාජ්‍ය පාලන කාලයේදීය. මෙය නිවැරදි නම්, එයින් කියැවෙන්නේ ත්‍රිපිටකය මුලින්ම ලියනු ලැබුවේ බුදුපියාණන් වහන්සේගේ කාලයෙන් වසර 30කට පමණ පසුව බවයි. උන්වහන්සේ සැබැවින්ම හමුවූ මිනිස්සු ඒ වනවිටත් ජීවත්ව සිටියහ.

බුදුපියාණන් වහන්සේට වඩා ශතවර්ෂ ගණනාවකට පෙර, බ්‍රාහ්මණ ආගමේ පාරම්පරික පූජකවරුන් වූ බ්‍රාහ්මණයන් වේදය මතකයෙන් දරා ගැනීමේ තාක්ෂණය පරිපූර්ණ කර තිබුණි. ඒ නිසා ඒවා ඊළඟ පරම්පරාවට (ඉතිහාස) පැවරිය හැකිව තිබුණි. පැරණිතම වේදය වන, ඍග් වේදය, ක්‍රි. පූ. 2,000 සහ 1,500 අතර සිට පැවත එන අතර, ක්‍රි. පූ. 11 හෝ 12 ශතවර්ෂය වන තුරුවත් ලියන්නට ආරම්භ කර නොතිබුණි. මෙයින් අදහස් වන්නේ වාචිකව සම්ප්‍රේෂණය අඩුම තරමින් වසර 3,000ක් වත් සිදු වූ බවයි. එසේ තිබියදීත්, වේදය දෛනික ජීවිතයට, විශ්වාසවලට සහ එකල ඒවා රචනය කළ භාෂාවට, ප්‍රත්‍යවේක්ෂණය වූ බව, භාෂාවේදීන් සහ ඉන්දියානු ඉතිහාසය සහ සංස්කෘතීන්, භාෂාවන් සහ සාහිත්‍ය පිළිබඳ විද්‍යාඥයෝ එකඟ වූහ. එනම්, ඒවා විශ්වාසවන්ත ලෙස භාර දී ඇති බවයි. මෙය සිදුකළේ කෙසේ ද?

බ්‍රාහ්මණයෙකුගේ මුළු ජීවිතයම කැපවූයේ වේදයට ජීවමාන උසුලන්නෙකු වීමයි. වේද හතර එකින් එක මතකයෙන් ඉගෙන ගැනීමට වසර 12ක් ගත වූ අතර හතරටම අවුරුදු 48ක් ගත විය (Sn.289). උච්චාරණය, ස්වරණය සහ වචනවල අනුපිළිවෙල නිවැරදිව ලබා ගැනීමට මහත් අවධානයක් යොදන ලදී.

සාමාන්‍යයෙන් ජූජනීය ගීතිකා 'පෙරට යවන්නා' පියා වන අතර, ඔහුගේ පුත්‍රයා ඒවා 'ලබන්නා' වෙයි (D.I,89). බුදුපියාණන් වහන්සේගේ බොහෝ ශ්‍රාවකයෝ බ්‍රාහ්මණයෝ වූහ. ඔවුන් අධ්‍යාපනය ලැබූ ස්මරණ කුසලතා ඔවුන්ගේ නව විශ්වාසයට ගෙන ආහ. බුදුපියාණන් වහන්සේගේ දේශනා, කථා සහ ප්‍රකාශ ආරක්ෂා කිරීමට මෙම කුසලතාවන්ම භාවිත කරන ලදී. වේදයන් මෙන්ම සූත්‍ර ද සජ්ඣායනය පිණිස පැහැදිලිව ව්‍යූහගත කර තිබුණි. ඒවා ස්මරණ උපක්‍රමවලින් පිරී තිබුණි - රිද්මයානුකූල පැදි, පිටපත්, අංක යෙදූ ලැයිස්තු, විධිමත් කරන ලද වාක්‍ය ආදිය, යනාදී වශයෙනි.

බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයට පෙරත්, භික්ෂූහු සහ භික්ෂුණීහු වැඳුම් පිදුම් කරමින් අඛණ්ඩව සූත්‍ර සජ්ඣායනය කළහ (D.III,211). මෙය කළ යුත්තේ කෙසේ ද කියා බුදුපියාණන් වහන්සේ උපදෙස් දුන්හ. 'සෙසු භික්ෂුවක් සභාවේදී ධර්මය උපුටා ගන්නා විට, ඔහු අදහස නිවැරදිව සහ වචන පිළිවෙල වැරදියට ගෙන ඇත් නම්, හෝ පළමුවැන්න නිවැරදිව සහ දෙවැන්න වැරදියට හෝ අග සිට මුලට කියන්නේ නම්, ඔබ එය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම නොකළ යුතුයි. ඒ වෙනුවට, ඔබ ඔහුට නිවැරදි තේරුම සහ නිවැරදි වචන අනුපිළිවෙල පැහැදිලි කළ යුතුයි. නමුත්, සෙසු භික්ෂුවක්, රැස්වීමකදී ධර්මය උපුටා දැක්වීමේදී, අර්ථය සහ වචන අනුපිළිවෙල යන දෙකම නිවැරදිව ගෙන ඇත්නම්, ඔබ ඔහුට ප්‍රශංසා සහ ප්‍රීතිය පළ කරමින් මෙසේ කිව යුතුයි. 'විශිෂ්ටයි! උච්චාරණය සහ වචන අනුපිළිවෙල පිළිබඳ මනා දැනුමක් ඇති ආධ්‍යාත්මික ජීවිතයේ

මිතුරෙකු හා සහකරුවෙකු ලෙස ඔබ ලැබීම අපට කෙතරම් භාග්‍යයක් සහ වාසනාවක් ද?' (සංක්ෂිප්ත කර ඇත, D.III,128-9). මේ නිසා, සූත්‍රයක් එකඟත්වයට පැමිනීමෙන් සහ මතකයට ගැනීමෙන් පසු, කිසිම දෙයක් එකතු කිරීමට, මකා දැමීමට හෝ වෙනස් කිරීමට අපහසු විය.

ගිහි බෞද්ධයන්ට ද සූත්‍ර පවා වාචිකව සම්ප්‍රේෂණය කිරීමේදී කාර්යභාරයක් තිබෙන බව අවබෝධ කර ගැනීම වැදගත් වේ. හුදෙක් පැවිදි ශ්‍රාවකයන් පමණක් නොව, තමන්වහන්සේගේ ගිහි ශ්‍රාවකයන් ද 'ධර්මය දන්නා අයවීම' බුදුපියාණන් වහන්සේට අවශ්‍ය වූ බව පැවසූහ. එවිට ඔවුන්ටත් තමන් උගත් දේ අනෙක් අයට 'අතින් අතට යැවිය හැකි' බව බුදුපියාණන් වහන්සේ වදාළහ (D.II,105). තමන් නොදන්නා සූත්‍රයක් දන්නා ගිහි පුද්ගලයෙකු මරණාසන්නව සිටින බව භික්ෂුවකට දැනගන්නට ලැබුණහොත්, එම භික්ෂුව එම ගිහියා මිය යන්නට ප්‍රථමව ගොස් ඔහුගෙන් එය ඉගෙන ගත යුතු බව විනය පිටකයේ සඳහන් වේ (Vin.I,140-1). ගිහි ශ්‍රාවකයෙකු වන උග්ගට (A,IV,208 ff) චිත්ත නමැති (S.IV,284-5) උපාසක කළ අයුරෙන්ම, විශේෂ අවස්ථාවල භික්ෂූන්ට ධර්මය ඉගැන්වීමට පවා ධර්ම දැනුම සහ ආත්ම විශ්වාසය තිබුණි. උගත් භික්ෂුවක් නොමැති විට, හත්ථක උපාසකට ඔහුගේ නගරයේ විශාල පිරිසකට උපදෙස් දීමට තරම් ප්‍රමාණවත් ලෙස ධර්මය පිළිබඳ දැනුමක් තිබුණි (A.IV,219).

ක්‍රි. පූ. 1වන සහ 2වන ශතවර්ෂවල සිට සාංචි හි සෙල්ලිපිවල සූත්‍ර කටපාඩමින් දත් උපාසක

උපාසිකාවන් පිළිබඳව සඳහන් කරයි. සමහර විට සූත්‍රවල සම්පූර්ණ එකතුව ඔවුහු දැනගෙන සිටියහ. සංචාරයේ යෙදුණ ඇතැම් වෙළෙන්දෝ හිරු උදාවට පෙර නැගිට, උදාන, ථේරගාථා සහ සුත්ත නිපාතයේ සුවිශේෂ කොටස් 'සම්පූර්ණ වශයෙන්ම' සජ්ඣායනය කළහ. ඔවුන් මෙම පාඨ ග්‍රන්ථයකින් හෝ මතකයෙන් සජ්ඣායනය කළාද යන්න අපි නොදනිමු. බෞද්ධ ග්‍රන්ථ මතකයට ගෙන ඒමේ සම්ප්‍රදාය සම්පූර්ණයෙන්ම මුළුමණින්ම නැති වී ගොස් නැත. ත්‍රිපිටකය සම්පූර්ණයෙන්ම මතකයෙන් සජ්ඣායනය කළ හැකි භික්ෂූහු ස්වල්පයක් තවමත් ටිබෙටයේ සිටිති. බලන්න **කවි කලාව**

*The Authenticity of the Early Buddhist Texts*, Bhikkhu Sujato and Bhikkhu Brahmali, 2014.

## පැවිදි කිරීම

පැවිදි කිරීම යනු පුද්ගලයෙකු පැවිද්දට පත්වීමේ ක්‍රියාවලිය හඳුනා ගැනීමේ ලකුණයි. බුදුදහමේ පැවිදි කිරීම පියවර දෙකකින් සිදු වේ. පළමු වැන්න පබ්බජ්ජා, හෙවත් 'ඉදිරියට යාම', ගෘහස්ථ ජීවිතයෙන් ඔබමොබ යන තවුසෙකුගේ පියවරට චර්යාවක් සනිටුහන් කරයි. දෙවැන්න උපසම්පදා, 'සම්පූර්ණයෙන් පැවිදි වූ භික්ෂුවක හෝ භික්ෂුණියක ලෙස සියලු යුතුකම් සහ වගකීම් වලට බැඳෙයි.' බෞද්ධ භික්ෂූන්ට පූජනීය කාර්යභාරයක් හෝ බලයක් නැත. ඒ නිසා ඔවුන්ගේ පැවිදිවීම හුදෙක් ලෝකය අභිනිෂ්ක්‍රමණය කිරීම සඳහා, විනයට අනුව ජීවත්වීමෙන් සහ නිර්වාණය අත්පත් කර ගැනීම සඳහා කැපවීමෙන් උත්සාහ කිරීමට සචේතනික සහ ප්‍රසිද්ධියේ ප්‍රකාශ වූ තීරණයකි.

පැවිදි වීමට, අයදුම්කරුවා යහපත් ස්ථාවරයකින් යුක්ත, ජ්‍යෙෂ්ඨ භික්ෂූන් දස දෙනෙකුන්ගෙන් යුක්ත

රැස්වීමක් ඉදිරියේ පෙනී සිටිය යුතුයි. තමන්ගේ නම, තමන් පුහුණු කිරීමට ඉදිරිපත් වූ භික්ෂුව හෝ භික්ෂුණිය ගේ නම් ඉදිරිපත් කර ඊට පසු සතුටුදායක ලෙස ප්‍රශ්න 12කට පිළිතුරු දිය යුතුයි. 1. ඔබට ලාදුරු තිබේද? 2. ඔබට විසප්පු තිබේද? 3. ඔබට හමේ දිලීර ආසාදනයක් තිබේද? 4. ඔබට ක්ෂයරෝගය තිබේද? 5. ඔබට අපස්මාරය තිබේද? 6. ඔබ මිනිසෙක්ද? 7. ඔබ පුරුෂයෙක්ද? හෝ භික්ෂුණියක් නම් ඔබ කාන්තාවක්ද? 8. ඔබ ණයෙන් නිදහස්ද? 9. ඔබ රජුට වගකීම්වලින් නිදහස්ද? 10. ඔබගේ දෙමව්පියන් සිටීද සහ කාන්තාවන් සම්බන්ධයෙන් ස්වාමිපුරුෂයා සිටීද? 11. ඔබ වයස 20 සම්පූර්ණ කර තිබේද? 12. ඔබට සිවුර සහ පාත්‍රය තිබේද යනු ඒ ප්‍රශ්නයි (Vin.I,93; II,271). රැස්වීමේ සාමාජිකයන් සෑහීමට පත් වූයේ නම් අයදුම්කරු සුදුසු වේ. ඔහු භික්ෂුවක වශයෙන් පිළිගැනේ. භික්ෂුණියක් වීමට අදහස් කරන කාන්තාව පළමුව මෙම ක්‍රියාවලිය භික්ෂූන් රැසක් සහිත මණ්ඩලයක් යටතේ සිදුවන අතර, ඊටපසු නැවතත් භික්ෂුණීන්ගේ රැස්වීමක් යටතේ සිදු වේ. නව භික්ෂූන් හෝ භික්ෂුණීන් අඩුම තරමින් ඊළඟ අවුරුදු පහ තම ගුරුවරයා 'යටතේ' (නිස්සය) ගත කළ යුතුයි. එම ගුරුවරයා නවක භික්ෂුව පුහුණු කර පැවිදි ජීවිතයේ සම්මතයන් හඳුන්වා දෙනු ඇත.

බුරුමයේ සහ තායිලන්තයේ තාවකාලික පැවිදි කිරීමේ සම්ප්‍රදායක් ඇත. බොහෝ පිරිමි සති හෝ මාස කිහිපයක් භික්ෂුවක ලෙස, සාමාන්‍යයෙන් ඔවුන්ගේ යොවුන් වියේදී ගත කරනු ඇත. මෙම තාවකාලික පැවිදි කිරීම කෙටි කාලයක් තුළ, නැවත ගෘහස්ථ ජීවිතයට පැමිණීමේ සම්පූර්ණ අදහසින් සිදු

කරන නිසා, සහ සැබෑ අභිනිෂ්ක්‍රමණයක් සිදු නොවන නිසාත්, එය සැබැවින්ම අව්‍යාජ පැවිදි කිරීමකට වඩා සමාජ චාරිත්‍රයකි.

විනය පිටකයට අනුව, භික්ෂුවක් හෝ භික්ෂුණියක් ගෘහස්ථ ජීවිතයට නැවත පැමිණීමට අදහස් කරන්නේ නම්, ඔවුන් තම තීරණය අනෙක් භික්ෂුවකට හෝ භික්ෂුණියකට දන්වා, ඔවුන් ඉදිරියේ විධිමත් අයුරෙන් සිවුරු හැර ආශ්‍රමය හැර යා යුතුයි. එවැන්නක් ප්‍රායෝගිකව, සියලුම බෞද්ධ රටවල, (තාවකාලික පැවිදි වූවන් හැර), සැලකිය යුතු තරම් අප්‍රසාදයෙන් යුතුව නොසලකා හරිනු ලැබේ.
*Buddhist Monastic Life*, Mohan Wijayaratna, 1990.

## ශරීරයේ ඉන්ද්‍රියයන් දන්දීම

වෛද්‍ය විද්‍යාවේ දියුණුවත් සමග, ශරීරයේ සමහර ඉන්ද්‍රියයන් එක් පුද්ගලයෙකුගෙන් ඉවත් කර, වෙනත් පුද්ගලයෙකුගේ ශරීරයේ ක්‍රියාකාරිත්වය නැවතුණු විට එම ඉන්ද්‍රියම ආදේශ කිරීමට දැන් හැකියාව ඇත. වඩාත් සාමාන්‍ය ලෙස සිදු වූයේ පරිත්‍යාග කිරීමට නියමිත අවයවය පරිත්‍යාගශීලියා මිය ගිය පසු ඉවත් කිරීමයි. නමුත් සමහර විට ජීවත්ව සිටින පුද්ගලයන් ඔවුන්ගේ එක් ඉන්ද්‍රියයක් පවුලේ සාමාජිකයෙකුට අවශ්‍ය වූ විට එය පරිත්‍යාග කරයි. මීට වසර කිහිපයකට පෙර, ශ්‍රී ලංකාවේ තරුණ භික්ෂුවක් ඔහුගේ එක් වකුගඩුවක් තමන්ට ඥාති නොවන සහ කිසිම දිනක හමු නොවූ දැරියකට පරිත්‍යාග කළේය. පෙනෙන ආකාරයට මෙම දැරියගේ අවශ්‍යතාව කියවා, ඇය පිළිබඳව අනුකම්පාවෙන් මෙම පරිත්‍යාගය කර ඇත.

සිත්ගන්නාසුලු කරුණ නම්, පුද්ගලයෙකුගේ ඉන්ද්‍රියයන් අන් අයගේ ප්‍රයෝජනය සඳහා පරිත්‍යාග කිරීමේ හැකියාව සහ ගුණාංගය බුදුදහමේ දී සලකා බැලීමට හැකිවූයේ, සැබැවින්ම එම හැකියාව සිදුවීමට වසර 2000කට පෙරය. බුදුපියාණන් වහන්සේ බෝධිසත්ත්වයෙකු ලෙස ගත කළ අතීත භවයකදී අන්ධ මිනිසෙකුට දෑස් පරිත්‍යාග කළ සිත්ගන්නාසුලු කථාවක් ජාතක කතාවක ඇත. ඔහුගේ ඇස් කෙවෙනියෙන් ඉවත් කළ ආකාරය, දෘෂ්ටි ස්නායුව කපා වෙන්කොට, ඇස් බෝල ඊට පසු සැත්කම් මගින් අන්ධ මිනිසාගේ කෙවෙනිවලට රෝපණය කිරීමේ ආකාරය විස්තරාත්මකව දක්වා ඇත (Ja.IV,407). බුදුදහමට අනුව, තමන්ගේ ජීවිතය මිත්‍රයෙකුට දීම ඉතාමත් ඉහළම සහ වඩාත් උතුම් ත්‍යාගයක් බවට සැලකේ (D.III,187). නමුත්, කැමැත්තෙන්ම කෙනෙකුගේ ශරීරයේ ඉන්ද්‍රියයක් තවත් කෙනෙකුට පරිත්‍යාග කිරීමෙන් එම පුද්ගලයා ජීවත් කරවන්නට ලැබීම එතරම් පුදුම සහගත නොවේ.

## පාළි

පාළි යන වචනයේ සරල සිංහල අර්ථය 'පෙළ' යන්නයි. නමුත් ථේරවාදී බෞද්ධයන් විසින් භාවිත කරන ලද ත්‍රිපිටක භාෂාවේ නම ලෙස භාවිත කර ඇත. පාරම්පරික ථේරවාදී බෞද්ධයන් විශ්වාස කරන්නේ බුදුපියාණන් වහන්සේ කථා කළේ පාළි භාෂාව බවයි. නමුත්, සමහර විට මෙය නිවැරදි නොවේ. සමහර නූතන භාෂාවේදීන් සිතන්නේ සැබැවින්ම පාළි බටහිර හෝ මධ්‍යම ඉන්දියානු භාෂාවක් බවයි. මේ අතර, අනෙක් අය සිතන්නේ මාගධී ස්වරූපයකට පදනම් වූ සාහිත්‍ය භාෂාවක් බවයි. පසුකාලීන ශතවර්ෂවල, ථේරවාද සම්ප්‍රදාය පාළි පූජනීය භාෂාවක් ලෙස සැලකූ අතර, ධර්මය තේරුම් ගත හැක්කේ එය පාළි භාෂාවෙන් ඉගෙනීමෙන් පමණක් බව විශ්වාස කළහ. එය මුල් භාෂාව ලෙස ද විශ්වාස කළහ (මූලභාසා, Vism.441) සහ සම්මොහවිනදිනී. දරුවෙකු භාෂාවක් කිසි දිනක නොඅසමින් වැඩුණේ නම්, ඔහු ස්වභාවයෙන්ම පාළි භාෂාව කථා කරනු ඇතැයි කියන්නට තරම් පෙළඹී ඇත.

මේ කිසිවක් බුදුපියාණන් වහන්සේගේ භාෂා පිළිබඳ අවබෝධය සමග නොගැළපේ. සත්‍යය පතුරුවා හැරීමේදී වෙනත් කිසිම භාෂාවක් අනෙක් භාෂාවට වඩා හොඳ නොවන බව බුදුපියාණන් වහන්සේ දැන සිටි අතර, උන්වහන්සේගේ අනුශාසනාව වූයේ: 'මම

ඔබට බුදුපියාණන් වහන්සේගේ වචන ඔබේම භාෂාවෙන් ඉගෙන ගැනීමට ඉඩ දෙමි' (Vin.II,139).

මෑතක් වන තුරු, ථේරවාද පිළිබඳ බොහෝ ග්‍රන්ථ - ඉතිහාසයන්, කවි, අටුවාකථා, කථාන්දර, ආදිය ලියා ඇත්තේ පාළියෙනි. අදත්, ශ්‍රී ලංකාවේ, බුරුමයේ, කාම්බෝජියාවේ හෝ තායිලන්තයේ හොඳින් උගත් ඕනෑම භික්ෂුවක් පාළි භාෂාවේ නිපුණ වේ.
*A Handbook of Pali Literature*, Oskar von Hinuber, 1996.

## උපමාකථා සහ උපමා

උපමාකථාවක් (උපමාකථා) යනු සදාචාරවත් කරුණක් ඉදිරිපත් කිරීම සඳහා කියැවෙන කෙටි කතාවකි. උපමා (උපමා) යනු උපදේශාත්මක අදහසින් එක් දෙයක් තවත් දෙයක් සමග සසඳන කථාවක හැඩයකි. විශිෂ්ට නිර්මාණශීලීත්වය සහ දක්ෂතාවයෙන් යුක්ත ගුරුවරයෙකු වූ බුදුපියාණන් වහන්සේ උපමාකථා සහ උපමා භාවිතයේ තීක්ෂණ බුද්ධියක් තිබූ කෙනෙකි.

ප්‍රශ්නයක් ඇසූ විට, උන්වහන්සේ බොහෝ විට පිළිතුරු දීමට ප්‍රථමයෙන් මෙසේ පැවසූහ 'මම ඔබට උපමාවක් දෙන්නෙමි, එයට හේතුව සමහර උදේාගිමත් පුද්ගලයෝ උපමාවක ආධාරයෙන් වඩා හොඳින් අවබෝධ කර ගැනීමය' (S.II,114). ජාතක බුදුපියාණන් වහන්සේ විසින් දේශනා කරන ලද උපමාකථාවල එකතුවකි. සූත්‍ර පිටකය පුරාම දළ වශයෙන් උපමා 550ක් පමණ ඇත. ඒවායෙන් බොහොමයක්, උපාය කුසලයෙන් හෙබි, උචිත සහ අමතක නොවන ඒවා වෙයි. බලන්න **අන්ධ මිනිසා සහ ඇතා**

## දෙමව්පියන් සහ දරුවන් ඇති දැඩි කිරීම

දෙමව්පියන් යනු පුද්ගලයෙකුගේ මව (මාතා) සහ පියා (පිතා) වන අතර, දරුවන් ඇති දැඩි කිරීම යනු දරුවන් ලොකු මහත් කිරීමේ කාර්යයි. අප අපගේ පළමු අවුරුදු කිහිපය සම්පූර්ණයෙන්ම දෙමව්පියන් මත යැපෙන නිසා, අප සමග පළමුවෙන්ම සම්බන්ධයක් ඇති කරන පුද්ගලයෝ ඔවුහු වෙති. අපගේ කායික, බුද්ධිමය සහ සදාචාරමය දියුණුව සම්බන්ධයෙන් දෙමව්පියන්ට ඉතා වැදගත් කාර්යභාරයක් ඇත. තමන්වහන්සේත් පියෙකු වීම නිසා බුදුපියාණන් වහන්සේටත්, දරුවන් ඇති දැඩි කිරීමේ කලාව සම්බන්ධයෙන් බොහෝ දේ කියන්නට තිබුණි. තමන්ගේ දරුවන්ට ආදරය කිරීම සහ රැකබලා ගැනීම යන දෙමාපියන්ගේ කාර්යභාරය හැර, ඔවුන් තම දරුවන් වැරදි කිරීමෙන් වැළැක්වීම, යහපත කිරීමට ධෛර්යමත් කිරීම, අධ්‍යාපනයක් ලබාදීම, සුදුසු විවාහයක් කරදීම සහ ඔවුන්ට උරුමයක් ඉතිරි කිරීම ද කළ යුතුව ඇත' (D.III,189).

මවක් තම දරුවා මාස නමයක් කුසේ දරාගෙන පෝෂණය කිරීම, ඇයට මව කියා ඇමතීමට නිසිලෙස සුදුසුකම් ඇති බව ජාතක කතවෙන් අදහස් කරයි. තමන්ගේ කිරි, දරුවාට දීමෙන් ඇය සාධාරණ ලෙස පෝෂණය කරන්නිය ලෙස හැඳින්විය හැකිය. තමන්ගේ දරුවාට කිසියම් අපහසුතාවක් ඇතිවුවහොත්, ඇය රැකවරණ දෙන්නිය ලෙස හැඳින්විය යුතුයි (Ja.V,330). දරුවන් තමන්ගේ දෙමාපියන්ට ආදරය, ගෞරවය සහ බුහුමන් දැක්විය යුත්තේ, 'මව්වරු සහ පියවරු

තමන්ගේ දරුවන්ට බොහෝ දේ කරන නිසාය.' - ඇති දැඩි කරති, පෝෂණය කරති, ලෝකයට හඳුන්වා දෙති' (A.II,70). 'කෙනෙකුගේ මවගෙන් සහ පියාගෙන් ලැබෙන ආදරය ලෝකයේ ඇති සතුටයි' (Dhp.332). කෘතඥපූර්වක වීමේ ආශීර්වාදය ආවධාරණය කිරීමට මෙන්, බුදුපියාණන් වහන්සේ පැවසුවේ, දෙමාපියන් අපට කර ඇති දේවලට කළගුණ සැලකීම කළ නොහැකි බවය. ඊට පසු උන්වහන්සේ මෙම වැදගත් නියමය එකතු කළහ: 'නමුත්, ධර්මය කෙරෙහි ශ්‍රද්ධාවක් නැති දෙමව්පියන්ට ශ්‍රද්ධාව ඇති කිරීමට, දුසිරිතේ යෙදෙන ඔවුන් සුචරිතයට යොමු කිරීමට හෝ අඥානවත් දෙමව්පියන් බුද්ධිසම්පන්න කිරීමට ධෛර්යමත් කරන කවර හෝ කෙනෙකු සිටී ද එවැනි පුද්ගලයෙකු එසේ කිරීමෙන් කළගුණ සළකයි, තමන්ගේ දෙමව්පියන් වෙනුවෙන් කළගුණ සැළකීමටත් වඩා කරයි' (A.I,61). බලන්න **ගෘහස්ථ ජීවිතය**

## ඉවසීම

ඉවසීම (ඛන්ති) මන්ද චලනය, අකාර්යක්ෂමතාව හෝ ප්‍රමාදයන් ඉදිරියේ සන්සුන්ව සහ නොසතුට පළ නොකරමින් සිටීමට ඇති හැකියාවයි. මෙම ගුණාංගය ඉවසා දරා සිටීම (අධිවාසනා), දරා සිටීම (තිතික්ඛා) හෝ දීර්ඝ ලෙස ඉවසා දරා සිටීම (ඛම) ලෙස ද බුදුපියාණන් වහන්සේ සමහර විට හැඳින්වූහ. නොඉවසිලිවන්ත පුද්ගලයෙකු අප්‍රසන්න ලෙස රළු සහ පසුතැවිලිබවට ගොදුරක් වන බව බුදුපියාණන් වහන්සේ නිරීක්ෂණය කළහ (A.III,254-5). සැම දෙනා කෙරෙහිම ඉවසීම තිබීම පිළිබඳව ජාතක

කතාවලින් උපදෙස් දෙයි. 'මිනිස්සු බිය නිසා ප්‍රධානීන්ට ප්‍රතිප්‍රහාර නොදෙති. සාමය රැකීම සඳහා මිනිස්සු තමන් හා සමාන අය සමග වාදකිරීමෙන් වළකිති. නමුත්, මතුපිටට යටින් පවතිනා දේ සම්බන්ධයෙන් ඉවසීම, යහපත්, අව්‍යාජ ඉවසීමයි. නමුත්, අපට ඉහළින් සිටින්නේ, අපට සමාන හෝ යටින් වූ අය කව්ද කියා අපට පෙනුමෙන් පමණක් දැනගත හැක්කේ කෙසේ ද? එම නිසා සැම දෙනා සමගම ඉවසීමෙන් සිටින්න' (Ja.V,141-2).

බුදුපියාණන් වහන්සේගේ කාලයේ සිටි සමහර බෞද්ධ නොවන තවුසෝ ඔවුන්ගේ ඉවසීම සහ නොඇලීම පරීක්ෂා කිරීමට, තමන් වෙනුවෙන් ඕනෑකමින්ම දුෂ්කරතා (දැඩි හික්මීම්) ඇති කළහ. මෙය ඇත්තටම මෝඩ දෙයක් ලෙස බුදුපියාණන් වහන්සේ සැලකුහ. සාමාන්‍ය ජීවන රටාව තුළ අප හා සම්බන්ධවන පුද්ගලයන් හා තත්ත්වයන් කෙරෙහි අපට දැනෙන ස්වල්ප වූ පීඩා හිරිහැර සමගින් ඉවසිලිවන්තව සිටීම හා ඒවායෙන් වෙන්වී සිටීම වඩා හොඳ යැයි උන්වහන්සේ විශ්වාස කළහ. එම නිසා උන්වහන්සේ අවවාද කළහ: 'ඉවසිලිවන්ත වීම ඉහළම තපසයි' (Dhp.184). මිලින්දපඤ්හයේ මෙසේ සඳහන් වේ: 'ජලය ස්වභාවයෙන්ම නිශ්චල සහ සිසිල් මෙන්ම, භාවනායෝගියා සියලු සත්ත්වයන් කෙරෙහි කරුණාවෙන් හා ඔවුන්ගේ සුභසිද්ධිය අපේක්ෂා කරමින්, ඉවසීම සහ වරද නැති බව, ආදරය සහ අනුකම්පාව වර්ධනය කළ යුතුයි' (Mil.183).

**පාතිමොක්ඛ**

පාතිමොක්ඛයෙන් ත්‍රිපිටකයේ විනය පිටකයේ හරය සහ මුල්ම කොටස සකස් වී ඇත. එහි බෞද්ධ

භික්ෂූන් සහ භික්ෂුණීන් පිළිපැදිය යුතු නීති ඇතුළත් වේ.

පාතිමොක්ඛ යන වචනයේ අර්ථය අපැහැදිලි වේ. නමුත්, එයින් 'බැඳීම' හෝ 'බැඳී සිටින පොරොන්දුව' වැනි දෙයක් අදහස් විය හැකිය. මුල්ම පාතිමොක්ඛ ඉගැන්වීම් සංක්ෂිප්ත කරන ලද නීතිවාක්‍යවල එකතුවක් විය (D.II,49). නමුත්, ක්‍රමයෙන් මෙය භික්ෂූන් සඳහා නීති 227ක් සහ භික්ෂුණීන් සඳහා අතිරේක නීති 84ක් සහිත හැසිරීම් පිළිබඳ පද්ධතියක් බවට පත් විය. නීති උල්ලංඝණය වුවහොත් ඔවුන් ලබා දෙන දඬුවමෙහි බරපතලකම අනුව, නීති කොටස් අටකට බෙදා ඇත. මෙම නීතිවලින් වැදගත්ම දෙය නම් පාරාජික හතරයි. ඒවා බිඳ දැමුවහොත්, පැවිදි ප්‍රජාවෙන් නෙරපා හැරීම අවශ්‍ය වේ. ඒවා නම්, 1. ලිංගික සේවනයේ යෙදීම, 2. සොරකම් කිරීම, 3. මිනීමැරීම, 4. ආධ්‍යාත්මික මුදුන්පමුණුවා ගැනීම්වලට එළඹ ඇතැයි ව්‍යාජ ලෙස කියා සිටීමයි. අනෙක් වැදගත් නීති වන්නේ සඞ්ඝාදිසෙස වන අතර, උල්ලංඝණය කළේ නම්, පාපෝච්චාරණය කළ යුතුයි.

පාතිමොක්ඛයේ ඇති සමහර නීති සදාචාරමය කරුණු සමග කටයුතු කරයි. ඒවායෙන් බොහොමයක් සමාජ සිරිත්, පැවිදි ජීවිතයට අදාළ විධිමත් චරියා හා සිරිත් විරිත්, සහ භේද රහිත ප්‍රජාවකට හිතකර ජීවත්වීමට උපකාරවන හැසිරීමට අදාළ වන අතර, ඒ නිසා බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'මා පරිනිවන් පෑ පසු, භික්ෂූන්ට අවශ්‍ය නම්, සුළු නීති වෙනස් කළ හැකිය' (D.II,154). විනය පිටකයට අනුව, භික්ෂූන් සහ භික්ෂුණීන් මසකට දෙවරක් රැස්වී පාතිමොක්ඛය සජ්ඣායනය

කළ යුතුයි. බලන්න **දිනදර්ශණය**
*Buddhist Monastic Life,* Mohan Wijayaratna, 1990.

## පැටිනා

පැටිනා යනු උතුරු ඉන්දියානු බිහාර් ප්‍රාන්ත රාජ්‍යයේ අගනුවරයි. එය පිහිටා ඇත්තේ ගංගානම් ගඟේ දකුණු ඉවුරේය. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී එය ප්‍රධාන උතුරු-දකුණු මාර්ගයේ සහ එහි ඇති ගංගාවේ ප්‍රධාන තොටුපළ පිහිටි පාටලිගාම නමින් හැඳින්විණ. බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ අවසාන වර්ෂයේ, උන්වහන්සේ මෙම ගම පසුකර වඩින විට, එහි මිනිස්සු එදින රාත්‍රිය එහි තානායමේ ගතකරන ලෙස උන්වහන්සේට ඇරයුම් කළහ. උන්වහන්සේ ඔවුන්ගේ ආරාධනය පිළිගත්හ. ගම්වාසීසු 'පොළොව අතුගා, අසුන් සකස් කර, ජල කළය පුරවා, තෙල් ලාම්පුව ද පිරවූහ'(D.II,84). මගධ රාජ්‍යයේ රජුගේ ඇමතිවරු පාටලිගාමයේ සිටි අතර, ඔවුහු පසුදින දානය සඳහා වඩින ලෙස බුදුපියාණන් වහන්සේට ඇරයුම් කළහ. එයින් පසු බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ සංචාරය නැවතත් ඇරඹූ සේක. උන්වහන්සේ එම ගමෙන් නික්ම යන කුමන හෝ දොරටුව 'ගෞතම දොරටුව' (ගොතමද්වාර) යනුවෙන් සහ උන්වහන්සේ තරණය කරන ගංගාව 'ගෞතම තොට' (ගොතමතිත්ථ, D.II,89) යනුවෙන් හඳුන්වන බවත් ප්‍රකාශයට පත් කළහ. එසේ සිදු කළ අතර, එම ස්ථාන දෙකේ මෙම නම් ශතවර්ෂ ගණනාවක් පුරා පැවතුණි.

බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර සියයක් තුළ, පාටලිගාමය විශාල නගරයක් බවට පත්

වී පාටලිපුත්ත යනුවෙන් නැවත නම් කරන ලදී. එය මයුර අධිරාජ්‍යාගේ අගනගරය බවට පත් වී, පසුව අශෝක රජුගේ පාදකය බවට පත්විය.
'Pataliputra.' D. B. Spooner, *Archaeological Survey of India Eastern Circle Annual Report*, 1912-13.

## සාමය

ඍණාත්මකව, සාමය (සමග්ග, සන්ති හෝ උපසම) යනු ගැටුම් නොමැති අතර ධනාත්මකව, සමගිය, සන්සුන්බව සහ පහසුව තිබීමයි. බුදුපියාණන් වහන්සේ සමාජය තුළ, පුද්ගලයන් අතර සහ පුද්ගලයන් තුළ සාමය අගය කළහ, වර්ධනය කළහ. ජාතක කතාවේ මෙසේ සඳහන් වේ: 'මෙහි රැස්වූ ඔබට මගේ පණිවුඩය මෙයයි; එකඟතාවෙන් ජීවත් වන්න, වාද-විවාද වලින් වළකින්න ... ඔබ තුළ සාමය පුහුණු කරන්න, ඒ බුදුපියාණන් වහන්සේලා එය අගය කර ඇති නිසාය. සාමය සහ සාධාරණත්වය ඇති තැන සතුටට පත් වන්නේය. එවිට, බැඳීම්වලින් නිදහස්වීම විනාශ නොවේ' (Ja.IV,211). සාමයෙන් සිටින මිනිසාට දෙවිවරුන් පවා ඊර්ෂ්‍යා කරන බව බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ (Ud.30). 'මතභේදයන් ඇති පුද්ගලයන් සමාදාන කරවන්නෙකු සහ දැනටමත් එක්සත් වූ, සාමය නිසා ප්‍රීතිප්‍රමෝදයට පත්, සාමයට ආදරය කරන, සාමයෙන් සතුටට පත්, සාමයට පක්ෂව කථාකරන අය ඒ සඳහා ධෛර්යමත් කරවන්නෙකු' ලෙස බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේ හැඳින්වූහ (D.I,4).

බුදුපියාණන් වහන්සේ හුදෙක් සාමකාමී වූවා පමණක් නොවේ. උන්වහන්සේ හුදෙක් සාමය උදෙසා පමණක් කථා කළේ ද නැත. උන්වහන්සේ එය

ප්‍රවර්ධනය කිරීම සඳහා කළ හැකි දේ ද ක්‍රියාකාරීව කළහ. එක් අවස්ථාවකදී ශාක්‍යයන් සහ ඔවුන්ගේ අසල්වැසියන් වූ කෝලියවරු යුද්ධයක් කිරීමට සූදානම් වෙමින් සිටියහ. ඒ ඔවුන්ගේ රටවල් එකිනෙකාගෙන් වෙන් කරන්නට යෙදුණ ගංගාවේ ජලය සම්බන්ධයෙනි. එය උෂ්ණ ඍතුවේ තියුණුම අවස්ථාව වූ නිසා බෝග වගා කිරීමට ප්‍රමාණවත් ජලය නොතිබුණි.

බුදුපියාණන් වහන්සේ දෙපැත්තේම රණවිරුවන් අතර ස්ථානීයව සිට ඔවුන්ගෙන් ප්‍රශ්න කළහ. 'ඔබලා කුමක් සඳහා දබර කරන්නේ ද?' ඇසූහ. 'ජලය' ඔවුහු පිළිතුරු දුන්හ.'වඩා වටින්නේ කුමක් ද ජලය හෝ තරුණ ඔබගේ රුධිරය ද?' 'රුධිරය ජලයට වඩා බොහෝ වටින්නේය.' 'එසේ නම් ජලය නිසා රුධිරය හැලීම නුසුදුසු නොවන්නේද?'

බුදුපියාණන් වහන්සේගේ මෙම තර්කානුකූල සහ කරුණාවන්ත වචනවලින් යුක්ත වරද පෙන්වා දීම සැමදෙනාටම හරි අවබෝධය ලබා ගැනීමට හේතු විය. එකඟතාවයකට එළඹීමෙන් පසු සාමය ප්‍රකෘති තත්ත්වයට පත් විය (Dhp-a.254).

නොබෙල් ත්‍යාගය ලැබූ පළමු බෞද්ධ භික්ෂුව වන දලයි ලාමා සහ එම ත්‍යාගයම ලැබූ පළමු ආසියානු කාන්තාව වන ඔන්ග් සැන් සුන් කි යන දෙදෙනාම එම ත්‍යාගය ලැබුවේ සාමකාමී දේශපාලනමය වෙනසක් ඇති කිරීමට ඔවුන් දැරූ උත්සාහයන් සම්බන්ධයෙනි. බෞද්ධ ධර්ම ග්‍රන්ථවල මෙසේ සඳහන් වේ: 'මතභේදයට භාජන වූ කරුණ අන්තරයක්, එක්සත්කම සාමය ලෙස දැක, එක්සත්ව

සහ කරුණාවෙන් වාසය කිරීම, බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම එයයි' (Cp.3,15,13).

බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ එක් භාවනාවක් නම් සාමය පිළිබඳව මතක් කර ගැනීමයි (A.I,29). මෙම කාලය තුළ භාවනායෝගියා තමා තුළ සහ තමාගේ ප්‍රජාව තුළ ඇති සාමයේ සුන්දරත්වය පිළිබඳව භාවනා කරයි. ගැඹුරුතම සහ වඩාත් පවතින සාමය, කෙසේ නමුත්, ලැබිය හැක්කේ නිර්වාණයට පත් වූ අයට පමණය. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ, 'සම්පූර්ණයෙන්ම නිරෝධයට පැමිණි සහ නිදහස් වූ පුද්ගලයෙකුගේ මනස, වචනය සහ ක්‍රියා සාමකාමී වේ' (Dhp.96).
*Buddhism and Peace*, K.N. Jayatilleke, 1983.

## ශිෂ්නය

ශිෂ්නය (අඩිගජත, ලිඩිග, මුත්තකරණ, පුල්ලිඩිග, පුරිසව්‍යඤ්ජන හෝ සුභලක්ඛණ) යනු මූත්‍ර කිරීමට සහ ප්‍රජනනය සඳහා භාවිත කිරීමට පුරුෂයන්ට ඇති දිගු, මස් සහිත උපංගයයි. ග්‍රීකයන් සහ රෝමන්වරුන් මෙන්ම, පැරණි ඉන්දියානුවෝ ද පුරුෂ ශරීරයේ ඇති සියලු අංගයන් ඇතුළු මනුෂ්‍ය රූපය පිළිබඳව බොහෝ සේ වර්ණනා කළ අය වෙති. ඍග් වේදයට අනුව, මුගුරක් වැනි විශාල ඝන ශිෂ්නයක් පරිපූර්ණ එකක් ලෙස සැලකේ. අථර්ව වේදයේ ශිෂ්නය දීර්ඝ සහ තද දුන්නක් මෙන් ඝන කර ගැනීමට යාච්ඤාවක් ඇත. එසේම එය වල් බූරුවෙකුගේ, ඇතෙකුගේ හෝ අශ්වයෙකුගේ මෙන් කර ගැනීමට මන්ත්‍ර ද ඇතුළත් වේ. අනෙක් අතට රාමායනයේ විස්තර කරන්නේ වාසනාවන්ත

මිනිසෙකුට තියෙන්නේ සුමුදු රවුමක් (ශිෂ්නයේ අග කොටස) සහ පහතට එල්ලා වැටෙන වෘෂණ සමග සිහින් කෙටි ශිෂ්නයක් බවයි.

පුරුෂ සිරුරේ මෙම කොටස ගැන බුදුපියාණන් වහන්සේට සෞන්දර්යය පිළිබඳවූ ඇගයීමක් තිබූ බව පෙනීයයි. ශිෂ්නය පිළිබඳව විස්තර කරමින්, උන්වහන්සේ පොදුවේ භාවිත වූ ආචාරශීලී වචන භාවිත කර ඇත. නමුත් සමහර විට වඩාත් කාව්‍යමය වූ භාෂිතය වන 'ඉහළම අවයවය' (උත්තමාඞග, Ja.V,197) යනුවෙන් භාවිත කර ඇත.

ශිෂ්න අග සම (කොස) ශිෂ්නයේ අග කොටස රවුම (මකුල) මත රැඳී පවතින විට, එල්ලා වැටෙන හෝ කෙළින් තිබෙන්නේ නම්, එය සුන්දර හෝ උදාර බවක සළකුණක් ඇතැයි පැරණි ග්‍රීකයන් මෙන් බුදුපියාණන් වහන්සේගේ සමකාලීනයන් විශ්වාස කළ බවට අපේක්ෂා කළ හැකිය. පසුකාලීනව, මෙම කායික ගතිලක්ෂණ බුදුපියාණන් වහන්සේ තුළ තිබුණේ යැයි හඟවා ඇත. කෙසේ වෙතත්, මෙවැනි ශිෂ්නයක් නිර්වාණය නොලැබූ අයටද තිබුණේ යැයි සඳහන් කිරීම වටී (e.g. Ja.V,197; *Mahāvaṁsa* VI.11;57; Sn.1022).

ත්‍රිපිටකයට අනුව, උත්තරීතර මිනිසෙකුගේ සලකුණු 32න් 'වස්ත්‍රයෙන් සැඟවී තිබෙන්නේ කොපුවකින් මැදි කර කෝෂයකි' (කොසොහිතවත්ථුයිහ, M.II,135). බුදුපියාණන් වහන්සේගේ ශිෂ්නය, අශ්වයන්, ගවයන් සහ ඇතුන් වැනි සතුන්ගේ මෙන් ශරීරය තුළට ගෙන එහි රැඳී පැවතිය හැකි බව යන අර්ථයෙන් මෙය අර්ථකථනය කර ඇත.

ගණඩව්‍යූ, නමැති එක් මහායාන කෘතියක් මෙසේ සඳහන් කරයි 'උන්වහන්සේගේ ප්‍රජනන අංශය කොපුවකින් ආවරණය වී, ඇතෙකුගේ අශ්වයෙකුගේ පෙළපතේ මෙන්, ශරීරය තුළ හොඳින් සැඟවී තිබුණි. නිරාවරණය වී සිටියත්, ඕනෑම කාන්තාවක්, පුරුෂයෙක්, තරුණයෙකු හෝ තරුණියක, මහලු හෝ මැදි වියේ හෝ තරුණ පුද්ගලයෙකු, රාගයෙන් හෝ කාම ශක්තිය ඇති හෝ උන්වහන්සේ දෙස බැලීමෙන් අවම හෝ ආශාවක් ඇති නොවේ.'

උතුම් මිනිසෙකුගෙන් විද්‍යමාන වන සලකුණු බොහොමයක් නූතන මනසට පුදුමයක් ලෙස පෙනෙනු ඇත. කෙසේ වෙතත්, මෙය ඇතුළු තවත් සමහර අයගේ මූලාරම්භය පරමාදර්ශී සුන්දරත්වය සහ වාසනාවන්ත බව පිළිබඳ පැරණි ඉන්දියානු සංකල්පයෙන් විය හැකිය. එමනිසා උදාහරණ වශයෙන්, නුග ගස පූජනීය ලෙස සලකනු ලැබූ අතර, බුදුපියාණන් වහන්සේට නුග ගසක (නිග්‍රොධ පරිමණ්ඩල), එනම් උන්වහන්සේගේ දිගුකළ අත්වල දිග ප්‍රමාණයට උන්වහන්සේගේ උස සමාන වූ බව උපකල්පනය කෙරේ. උන්වහන්සේට දිගු වක්‍ර වූ ඇස් පිහාටු (ගොපඛුම) සහ ඉතා පළල් දිවක් (පහූතජිව්හා), තිබුණු බවට උපකල්පනය කෙරේ. මේ දෙකම ගවයෙකු සතු ලක්ෂණ වේ. ගවයා ඉන්දියානුවන් ඉතා ගෞරවය කළ සත්ත්වයෙකි.

ත්‍රිපිටකයට පසුව එකතු වූ, ලක්ඛණ සූත්‍රයට අනුව, උතුම් මිනිසෙකු සතු සියලු සලකුණු 32ම පෙර ජීවිතයේදී කරන ලද යහපත් ක්‍රියා නිසා කායිකව විද්‍යාමාන වීම්ය. ඒ අනුව, සැමවිටම කරුණාවෙන්

සහ මෘදුලෙස කථා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බුදුපියාණන් වහන්සේ උත්පත්තිය ලැබුවේ පුළුල් දිවක් ඇතිවය. ගුරුවරයෙකු වශයෙන් උන්වහන්සේ තමන් වහන්සේගේ ශිෂ්‍යයන්ට ඉක්මණින් අවබෝධය ඇතිවන සේ ඉගැන්වූ නිසා ඉක්මණින් දුවන මුවෙකු සේ පාද උන්වහන්සේට ලැබුණි. උන්වහන්සේ දීර්ඝ කාලයක් නැතිවී සිටි පවුල්වල සාමාජිකයන් සහ මිතුරන් එකට එක් කිරීම හේතුවෙන් 'ඔවුන් බොහෝ සෙයින් ප්‍රීති ප්‍රමෝදයට පත් වීම නිසා' බුදුපියාණන් වහන්සේට කොපුවකින් ආවරණයවූ ශිෂ්නයක් ලැබුණි (D.III,160-1).

ශිෂ්නයට වැදගත්කමක් විනය පිටකයේ ලැබී තිබේ. භික්ෂුවක් හෝ භික්ෂුණියක් හතර ආකාර වැරදි කළ හොත්, පැවිදි දිවියෙන් පළවා හරිනු ඇත. එයින් එකකි ලිංගික සේවනය (මෙථුන). එබැවින් එය හරියටම සෑදී ඇත්තේ කුමකින් ද යන්න පිළිබඳව අවිනිශ්චිතතාවක් තිබිය නොහැකිය. ශිෂ්නය ඕනෑම සත්ත්වයෙකුගේ, (ජීවත්වන හෝ මිය ගිය), තල ඇටයක් තරමේ ප්‍රමාණයට එනම්, මිලිමීටර් 3කට යම්තම් අඩුවෙන්, (*tilaphala*, Vin.III,28) යෝනිය, ගුදය හෝ මුඛය තුළට ඇතුළු වුවහොත්, විනය පිටකයේ එය ලිංගික සේවනය වශයෙන් හරියටම අර්ථ දක්වා ඇත. විශේෂිත දඬුවම් ලබා දෙන වෙනත් ආකාරයේ ලිංගික හැසිරීම්වලට, බරපතළ වැරදිවලට සඞ්ඝ ශාසනයෙන් නෙරපා හැරීමක් සිදු නොවේ.

*A Bull of a Man, Images of Masculinity, Sex and the Body in Indian Buddhism*, John Powers, 2009.

## සුවඳ විලවුන්

සුවඳ විලවුන් (ගන්ධ, සුගන්ධ හෝ වාස) යම් පැලෑටිවලින් ලබාගත් අත්‍යවශ්‍ය තෙල් සහ වෙනත් සුවඳවත් ද්‍රව්‍ය යොදා සෑදූ සම්මිශ්‍රණයකි. ඕනෑම අප්‍රසන්න ගන්ධයන් වසා දැමීමට හෝ ශරීරයේ සුවඳ ආකර්ෂණය කිරීමට භාවිත කෙරේ. පැරණි ඉන්දියානුවන් ප්‍රධාන වශයෙන් සුවඳ විලවුන් නිෂ්පාදනය කළ අතර, සුවඳ විලවුන් නිෂ්පාදනය කිරීම සඳහා මල් පැළඳ සිටියහ. සුවඳ විලවුන් වෙළඳාමේ කේන්ද්‍රය වූයේ කාසි, නූතන වරාණසීය. ත්‍රිපිටකයේ සුවඳ විලවුන් වර්ග දුසිමක් පමණ ගැන විස්තර කර ඇත. ඒවායෙන් සමහරක් අදටත් භාවිත වේ. උදාහරණ වශයෙන් කපුරු (කප්පූර), හෙල්බෝර් (කටුකරොහිණී), ඉන්දියානු ෆ්‍රැන්කිසෙන්ස් (සලළ), ඉන්දියානු කුරුඳු (තමාල) සහ ස්වීට් ෆලැග් නමැති පැළෑටිය (වච), (Ja.I,290; II,416; S.III,156) උසීර, නමැති සිනිඳු රෝස පැහැති සුවඳවත් බීරාණ නමැති තණකොළවල අලය බොහෝ සෙයින් සොයන නමුත්, අද භාවිත වන්නේ කලාතුරකිනි (Dhp.337).

වඩාත් මිල අධික සුවඳ විලවුන් සාදනු ලබන්නේ දම් පැහැති ස්පයිකෙනඩ් (නරද) සහ සුදුහඳුන්වලින්ය (චන්දන). ගස් වල මුල් - අල වලින් සාදන සියලු සුගන්ධ අතරින් වඩාත් ප්‍රසන්න වන්නේ ස්පයිකෙනඩ් අලයෙන් (කාළානුසාරී) සාදන සිත් ගන්නා, වන ගහණ සුවඳ විලවුන් ලෙස බුදුපියාණන් වහන්සේ සැලකූහ (A.V,22; Ja.VI,537). අඳුරු මීපැණි සේ දුඹුරු වර්ණයෙන් යුතු සුදුහඳුන් තලපයක් සේ අඹරා ශරීරය පුරා අතුල්ලා, හෝ සමහර විට එයින් තෙල් මිරිකා රැගෙන, ශරීරයේ තවරයි. (Ja.IV,440; Thi.145)

ස්පයිකෙනරාඩ් මෙන්ම, සුදුහඳුන් ද සුවඳදුම්කුඩු ලෙස ගිනි දල්වයි. බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත් වූ විගසම, සුවඳදුම් කුඩු දිව්‍යලෝකයෙන් වැටුණු බව එක් ලස්සන ජනප්‍රවාදයකින් කියයි (D.II,137).

ගුණ යහපත්කම (සීල) සුවඳවිලවුන්වලට බුදුපියාණන් වහන්සේ බොහෝ විට සමාන කළහ. ඒ දෙකම ඔවුන් සතු පුද්ගලයාගේ ආකර්ෂනීය බව වැඩි කරයි. දෙකටම ප්‍රසන්න බව පිළිබඳ අත්දැකීම් ඇති අතර, දෙකටම ඒවායේ ආසන්න පේනතෙක් මානයෙන් ඔබ්බට බලපෑමක් ඇති කරයි.

මෙම අවසාන කාරණය සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ කියා සිටියේ ත්‍රිවිධ රත්නයේ සරණ ගිය, පංච ශීලය පුහුණු කරන සහ සුන්දර ස්වභාවයක් (කල්‍යාණධම්ම) ඇති පුරුෂයෙකු හෝ ස්ත්‍රියක පිළිබඳව වඩාත් ප්‍රබල සුවඳ විලවුන්වලට පවා පැතිරවිය හැකි ප්‍රමාණයකට වඩා පුළුල් ප්‍රදේශයක කථා කරන බවත්, ප්‍රශංසා කරන බවත්ය (A.I,225).

මෙය ක්‍රිස්තියානි අදහසක් වූ 'පාරිශුද්ධභාවයේ ගන්ධය' ට සමාන වේ. තවත් අවස්ථාවක බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ 'මල්, සඳුන් හෝ පිච්චවල සුවඳ හමායන දිසාවට පැතිර යන්නේ නැත. නමුත්, යහපත් මිනිසාගේ සුවඳ සියලු දිසාවන් වෙත හමා යයි. සියලු සුවඳවිලවුන් අතරින් - සඳුන්, පිච්ච, ලිලීමල් හෝ වස්සිකා - අතරින්, ගුණයහපත්කමේ සුවඳ හොඳම දෙය වේ' (Dhp.54-5).

බොහෝ අය ප්‍රසන්න සුවඳ ආඝ්‍රාණය කිරීමට හෝ

අඩුම තරමෙන් ගන්ධයක් පිට කිරීමට බොහෝ මිනිස්සු දැඩි සැලකිල්ලක් දක්වති. ප්‍රසන්න පෞරුෂයක් සතු කර ගැනීමට දක්වන්නේ ඊට අඩු අවධානයකි. ශික්ෂා පද අට සහ දහයෙන් එකක් වන්නේ මාසික උපෝසථ කාලයේදී සුවඳ විලවුන් භාවිතයෙන් වැළකී සිටීමයි. බලන්න **විලවුන්**
*Nature and the Environment in Early Buddhism*, S. Dhammika, 2015.

## සියල්ලෙහිම අශුභ දැකීමේ ප්‍රවණතාව

සියල්ලෙහිම අශුභ දැකීමේ ප්‍රවණතාව යනු ජීවිතයේ ඍණාත්මක කරුණු අවධාරණය කිරීමට අවධානය යොමු කිරීමේ ප්‍රවණතාවයි. මෙහි ඉංග්‍රිසි වචනය පැවත එන්නේ ලතින් භාෂාවේ පෙසිසිමුස් යන වචනයෙන් වන අතර, එහි අර්ථය 'ඉතාමත් නරක' යන්නයි. බුදුදහම විවේචනය කරන්නන් සමහර විට එය සියල්ලෙහිම අශුභය දකින බවට චෝදනා කරයි. නමුත් වෙසෙසින්ම සියල්ලෙහිම අශුභය දැකීම හෝ දකින්නා යන වචනවලට සමාන වචනයක් පාළි භාෂාවේ නැත. සියල්ලෙහිම අශුභය දැකීමට විරුද්ධ වචනය සර්ව ශූභ වාදය යැයි හැඳින්විය හැකිය. එය ආකර්ෂණීය, කැමැති සහ ධනාත්මක දේ කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමේ ප්‍රවණතාවයි. මෙම ආකල්ප දෙකෙහිම සමබරතාවක් නොමැති බව සහ ව්‍යාකූල බව සහ බලාපොරොත්තු සුන්වන බව තුළින් අවසාන වන්නට ඉඩ ඇති ප්‍රවණතාවක් බුදුදහම දකී. ඍණාත්මක බව (ලෙඩරෝග, මහලු විය, මරණය, නපුර යනාදිය) නොසලකා හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම යනු අවසානයේදී ඒවාට මුහුණ දෙන්නට සිදුවන විට, සම්පූර්ණයෙන්ම සූදානම් නොවී සිටීමයි. ධනාත්මකබව (අලංකාරය, සත්පුරුෂබව, ගුණවත්බව,

සතුට, ප්‍රීතිප්‍රමෝදය ආදිය) දකින්නට හෝ ඇගයීමට නොහැකි වීම නොපහන් වීම, හැඟීම් ලෙහෙසියෙන් පළ නොකිරීම සහ අමිහිරි වීමයි. ආකල්ප දෙකම පුද්ගලයෙකුගේ ධර්මය කෙරෙහි ප්‍රගමනයට උපකාරයක් විය නොහැකිය. බුදුපියාණන් වහන්සේ ඉගැන්වූයේ 'දේවල් පිළිබඳ ඒවායේ යථාස්වරූපයෙන් දැනුම සහ දර්ශනය' දියුණු කර ගැනීමට අප උත්සාහවන්ත විය යුතු බවයි.

## සුරතල් සතුන්

සුරතල් සතෙකු (පියසත්ත) මිතුරුබවට හෝ විනෝදය සඳහා තබාගන්නා සතෙකි. බුදුපියාණන් වහන්සේගේ කාලයේ මිනිස්සු ගිරව්, වඳුරු පැටව් සහ වෙනත් සතුන් සුරතලයට ඇති දැඩි කළහ (J.II,184; III,97). සුරතල් සතුන් ගෘහස්ථ හෝ කැලෑ සත්තු විය හැකිය. සුනඛයන් සහ බළලුන් වැනි ගෘහස්ථ සතුන් මිනිසුන් සමග ඇසුර කැමැති වන අතර, කුරුල්ලන් සහ සුරතලට ඇති කරන හාවන් වැනි අනෙක් වර්ගයන් මිනිසුන්ගේ රැකබලා ගැනීම් හෝ ආරක්ෂා කර ගැනීම් නොමැතිව ජීවත් විය නොහැකිය. කැළෑ සතුන් සුරතලුන් ලෙස ඇති දැඩි කිරීමට නම් සාමාන්‍යයෙන් ඔවුන් පැන යෑම වැළකීමට කූඩු කළ යුතුයි. ගෘහස්ථ සතුන් ඔවුන්ගේ අයිතිකරුවන්ට බොහෝ සහනය සහ සතුට ලබා දිය හැකි වන අතර, සාමාන්‍යයෙන් එම සතුන්ටත් ප්‍රතිචාර ලැබේ. අනෙක් අතට, කැළෑ සත්තු මුළුමණින්ම සහ නිශ්චිතවම ඔවුන්ගේ ස්වාභාවික පරිසරයට සහ තමන්ගේම වර්ගයාගේ ඇසුරේ සිටින්නට වැඩි කැමැත්තක් දක්වති. සමහර මිනිස්සු විශාල මකුළුවන්, උරග සතුන්, හෝ විශාල වානරයන්

වැනි අසාමාන්‍ය හෝ භයානක කැළෑ සතුන් තබා ගනිති. එසේ කරන්නේ ආදරයක් දීමට හෝ ලැබීමට නොවේ, නමුත්, ඔවුන්ගේ මමත්වය වැඩි කර ගැනීමට සහ ඔවුන් වඩාත් අවධානයට ලක්කරවමින් පෙනී සිටින්නටය. කැළෑ සතුන් සුරතල් සතුන් ලෙස තබා ගැනීම තුන්වන ශික්ෂාපදය බිඳ දැමීමක් යැයි තර්ක කළ හැකිය. එහි වෙනත් සචේතනික සතුන්ට වේදනා ගෙන දෙමින් සතුටක් ලබා ගැනීම සම්බන්ධ වේ. කාරණය කුමක් වුවත්, කැළෑ සතුන් සුරතල් සතුන් ලෙස තබා ගැනීමට ඇති කැමැත්තෙන් අදහස් කරන්නේ එම සතාගේ ස්වාභාවික පරිසරය එහි වන ජීවීන්ගෙන් අහිමි කර ඇති බවයි. එය එම සතාගේ දීර්ඝකාලීන සෞඛ්‍යයට සහ පැවැත්මට හානිදායක වේ. වගකිවයුතු බෞද්ධයෙකු බොහෝ විට මෙම ප්‍රශ්නයට දායක නොවනු ඇත. බලන්න **මිනිස් - සත්ත්ව අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය**

## බුදුපියාණන් වහන්සේගේ ශාරීරික පෙනුම

බුදුපියාණන් වහන්සේගේ ශාරීරික පෙනුම පිළිබඳව යම් අදහසක් ලබා ගැනීම සඳහා සෑහෙන තරමට අමතර තොරතුරු ත්‍රිපිටකයේ ඇත. උන්වහන්සේ බඹයක උසින් යුක්ත වූහ (S.I,62). බඹයක් (බ්‍යාම) යනු අත් දෙක ඒවායේ සම්පූර්ණ දිගට විහිදූ විට ඒ දෙක අතරෙහි සම්පූර්ණ දිග දක්වා ඇති දිග ප්‍රමාණයයි. බුදුපියාණන් වහන්සේ සෙන්ටි මීටර් දෙකක් උන්වහන්සේගේ සුළු සහෝදර නන්දට වඩා වැඩියෙන් උස බව අපට දැනගන්නට ඇත (Vin.IV,173). උන්වහන්සේ තරුණ අවධියේදී, අභිනිෂ්ක්‍රමණයට පෙර, දිගු කළුවර්ණ කෙස් සහ රැවුළක් තිබුණි (M.I,163). බුදුපියාණන් වහන්සේගේ

පිළිම සැමවිටම පෙන්වන්නේ හිසකෙස් සමග වුවත්, එය චිත්‍රරූප චාරිත්‍රයකි. සම්ප්‍රදායානුකූලව නිවැරදි නොවේ. වෙනත් සියලු භික්ෂූන් මෙන්ම උන්වහන්සේගේ අභිනිෂ්ක්‍රමණයෙන් පසුව, 'උන්වහන්සේගේ හිසකෙස් සහ රැවුළ කපා දමන ලදී' (M.I,163). බුදුපියාණන් වහන්සේ විශේෂයෙන්ම කඩවසම් බවට සියලු මූලාශ්‍රයන් එකඟ වේ. 'කඩවසම්, ශෝභන පෙනුම, දකින්නට ප්‍රියඋපදවන, යහපත් සමේ වර්ණය සහ සුන්දර ස්වරූපය සහ මුහුණ' (D.I,115) යනුවෙන් සෝණදණ්ඩ බ්‍රාහ්මණයා විස්තර කළේය. මෙම ස්වාභාවික යහපත් පෙනුම උන්වහන්සේගේ ගැඹුරු අභ්‍යන්තර සංයමයෙන් තවදුරටත් වැඩිවිය. දොණ නමැති තවත් පුද්ගලයෙක් 'සුන්දර, ප්‍රබෝධක ආත්ම විශ්වාසය, නොකැලඹුණබව, සංසුන්, හැම අතින්ම හීලෑකළ ඇතෙකුගේ උදාරබව සහ පෙනුම සමගින්' යනුවෙන් බුදුපියාණන් වහන්සේ විස්තර කළේය (A.II,38). උන්වහන්සේගේ සමේ වර්ණය සම්බන්ධයෙන් එක් බ්‍රහ්මණයෙක් මෙසේ පැවසුවේය: 'චමත්කාරජනකයි, සැබැවින්ම විශිෂ්ටයි, යහපත් ගෞතමයන් වහන්සේගේ ශාන්ත පෙනුම, උන්වහන්සේගේ සමෙහි පෙනුම කෙතරම් පැහැදිලිද, ප්‍රභාවත් ද, වසන්ත ඍතුවේ හටගන්නා රන්වන් ජුජුබේ පලතුරක් මෙන්ම, යහපත් ගෞතමයන් වහන්සේගේ සමේ වර්ණය ද පැහැදිලිය, ප්‍රභාවත්ය' (A.I,181).

කෙසේ නමුත්, අනෙක් සියලු දෙනා මෙන්ම, බුදුපියාණන් වහන්සේගේ පෙනුම ද වයසත් සමග පිරිහීමට පත් විය. උන්වහන්සේ මහලු වියේදී සිටි අයුරු ආනන්ද හිමියෝ විස්තර කළහ: 'උන්වහන්සේගේ සමෙහි වර්ණය තවදුරටත්, පිරිසිදු

සහ දීප්තිමත් නැත. උන්වහන්සේගේ අවයව දුබල සහ රැළි වැටීම් ඇත. ශරීරය පහතට නැමී ඇත, උන්වහන්සේගේ ඉන්ද්‍රියයන් වෙනස් වී ඇත' (S.V,216). උන්වහන්සේගේ ජීවිතයේ අවසාන මාසවලදී බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේ පිළිබඳව මෙසේ පැවසූහ: 'ජීවිත ගමන පසුකර ඇති මා දැන් මහලුයි, විඩාපත්ය. අවුරුදු 80ක් වන මා මගේ ජීවිතයේ අවසානයට සමීපවෙමින් සිටින නිසා, පරණ කරත්තයක් තවදුරටත් ගෙන යා හැක්කේ අණ්ඩ දැමීමෙන් පමණක් මෙන්ම, මගේ ශරීරයද ගෙන යා හැක්කේ අණ්ඩ දැමීමෙන්ම පමණකි' (D.II,100). බලන්න **කන්පෙත්ත**

*The Buddha and His Disciples*, S. Dhammika, 2005.

## වන්දනා ගමන

වන්දනා ගමන් (චෙතියචාරිකා හෝ වන්දනාචාරිකා) යනු විශේෂයෙන්ම ආගමික හේතූන් මත ආගමික වැදගත්කමක් ඇති ස්ථානයකට ගමන් කිරීමයි. බුදුදහමේ වන්දනාගමන් යෑම ඉස්ලාම් ආගමේ මෙන් වගකීමක් හෝ ක්‍රිස්තියානි ධර්මයේ මෙන් ස්වයං වන්දියක් නොවේ. නමුත්, එය බොහෝ කලක් සිට අදටත් ජනප්‍රිය සිරිතක්ව පැවතේ.

අවම වශයෙන් එක් වරක්වත්, තම ජීවිතයේ බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ වැදගත්ම සිදුවීම් සිදුවූ ස්ථාන හතර වූ - උන්වහන්සේ උත්පත්තිය ලැබූ ලුම්බිනිය, බුද්ධත්වය ලැබූ උරුවෙල, පළමු ධර්ම දේශනාව සිදු කළ සාරනාත්, සහ පරිනිර්වාණයට පත්වූ කුසිනාරා යන ස්ථානවලට යන්නට බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ

ශ්‍රාවකයන්ට නිර්දේශ කළහ (D.II,141). වන්දනා ගමන් යාම යහපත් වන අතර, ගුණවත් වීම ඊට වඩා බොහෝ වැදගත් වේ. ජාතකමාලාවේ මෙසේ සඳහන් වේ: 'ඕනෑම මාලාවකට වඩා ලස්සන, ඕනෑම රසකට වඩා රස, සත්‍යවාදී බව විශාල යහපත උපද්දයි. එය දැඩි සේ හික්මීම පුහුණු කිරීම හෝ දුර බැහැර සිද්ධස්ථානවලට වන්දනා ගමන් යෑමට වඩා අඩුවෙන් දුෂ්කර වේ.' වන්දනා ගමන් ගිය පළමු බෞද්ධයා අශෝක රජුයි. ඒ ක්‍රි. පූ. 260දී පමණ උරුවෙලාවටත්, වසර දහයකට පසුව ලුම්බිනියටත්ය.

සෑම කාලයකම වඩාත්ම ජනප්‍රිය සංචාරක පොත සහ ශතවර්ෂ 14ක් තිස්සේ අඛණ්ඩව මුද්‍රණය කර ඇති ග්‍රන්ථයක් ලියා ඇත්තේ චීන ජාතික වන්දනාකරු සුඇංසෑං භික්ෂුව විසිනි. මෙම භික්ෂුව වන්දනා චාරිකා සඳහා ඉන්දියාවේ වසර 16ක් ගත කළ අතර, පසුව, ඔහුගේ ගමන් පිළිබඳ විස්තරයක් ලියා ඇත. එය සවිස්තරාත්මක සහ නිවැරදි තොරතුරුවලින් පිරී ඇති අතර, අදටත්, ඉන්දියාවේ ඉතිහාසඥයන්, භූගෝලවිද්‍යාඥයන් සහ සංචාරකයන් විසින් අධ්‍යයනය කරනු ලැබේ. බලන්න **සඞ්කස්ස**

*Middle Land, Middle Way: A Pilgrim's Guide to the Buddha's India*, S. Dhammika, 1999.

## පැළ

පැළෑටි යනු පෘථිවියේ වැඩෙන ජීවීන් වන අතර, හිරු එළිය වර්ධනයට අවශ්‍ය ශක්තිය බවට පරිවර්තනය කිරීමේ හැකියාව එයට ඇත. පැළෑටි ඒක-පාර්ශ්වික (එකින්ද්‍රිය) ජීව ස්වරූපයක් ලෙස බුදුදහම සලකයි (Vin.III,155). පැරණි ඉන්දියාවේ පැළෑටි වර්ගීකරණය කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමය වූයේ ඔසු පැළ (ඖසධී),

වනාන්තර වර්ගයේ ගස් (වනස්පති), පළතුරු හෝ මල් හට ගන්නා ගස් (රුක්ඛ), පඳුරු (ගුම්බ), තණකොළ (තිණ), කියඹු වැල් සහිත පැළෑටි (පතාන) සහ වැල් (වල්ලී) යනුවෙනි.

බුදුපියාණන් වහන්සේ ඒවා වර්ග කළේ ගසේ මුල, කඳන්, පුරුක්, කැබලි හෝ බීජ වශයෙන් බෝකර ඇද්ද යන්නට අනුවයි (D.I,5). පැළයක් මරා දැමීම පළමු ශික්ෂාපදය කඩ කිරීමක් නොවේ. බුදුපියාණන් වහන්සේ පැළෑටි ඇතුළු සියලු ජීවීන් කෙරෙහි ගෞරවය ඇති කර ගන්නා ලෙස තමන්වහන්සේගේ ශ්‍රාවකයන් ධෛර්යමත් කළහ. ඒවායේ අතු - කොළ වදුලු හෝ ඇටවලට අනවශ්‍ය ලෙස හානි කිරීම හෝ විනාශ කිරීම නොකළ යුතු බව ද උන්වහන්සේ පැවසූහ (D.I,5). බලන්න **මල්, නෙළුම් සහ ගස්**
*Plants in Early Buddhism*, L. Schmitthausen, 2009.

## සතුට

සතුට (කාම හෝ සාමිස සුඛ) යනු ඉඳුරන් හෝ මනස උත්තේජනය වීමෙන් ඇති වන ධනාත්මක හැඟීමකි. සතුට ජීවිතය වැඩි දියුණු කරන අත්දැකීමකි. නමුත්, එය සිතෙහි පැලපදියම් වුවහොත්, හෝ එය ජීවිතයේ වඩාත්ම වැදගත් දෙය හෝ ජීවිතයේ අරමුණ ලෙස සිතුවොත්, එය විනාශකාරී විය හැකිය. මෙය සිදුවීමට අඩුම තරමෙන් ආකාර තුනක් ඇත :
1. ඉන්ද්‍රියයන්ගේ හැඟීම්වල ස්වභාවය කෙසේ ද යත්, දිග්ගැස්සුණු උත්තේජනය ඒවා නීරස කරයි, ඊට පසු ඒ මට්ටමේම සතුට ලබා ගැනීම සඳහා උත්තේජනය

තීව්‍ර කළ යුතු වේ. මේ අනුව, පුද්ගලයෙකු සතුට සෙවීමේ නිරන්තරව සිදුවෙන ක්‍රියාවලියකට සම්බන්ධ වේ. එය අතෘප්තියට සහ තව තවත් තීව්‍ර උත්තේජනය අවශ්‍යකරවන තත්ත්වයකට යොමු කරවයි. බුදුපියාණන් වහන්සේ එය මෙසේ දැක්වූහ: 'සම්පූර්ණයෙන්ම කන්දක් රත්රන්වලින් සාදා තිබුණත්, එහි දෙගුණයකින්වත් පුද්ගලයෙකු තෘප්ත කළ නොහැකිය. මෙය දැනගෙන ඒ අනුව ජීවත් වන්න' (S.I,117).

2. සතුට සඳහා ඇති දැඩි ආශාව නිසා පුද්ගලයෙකු මිනිසුන් සහ වස්තූන් ඔවුන් තුළ ඇති දේවල් ලෙස නොව, තමන්ගේම පිනවීම පමණක් සඳහා වූ වත්කමක් ලෙස ඒවා දෙස බලන්නට ඉඩ ඇත. මෙය පුද්ගලයෙකු අතිශයෙන්ම ආත්මාර්ථකාමී සහ තමාගේ වාසියට හසුරුවන්නට පුළුවනි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ 'හේතුව, ප්‍රභවය සහ පදනම වශයෙන් ඉඳුරන්ගේ තෘප්තිය සමගින්, මිනිස්සු එකිනෙකා අතර දබර කරති, යුද්ධයට යති, ගෙවල්වලට කඩා වදිති, කොල්ලකති, සොරකම් කරති, අධිවේගී මාර්ගවල මංකොල්ලකෑම් කරති, කාන්තාවන් කාමයට පොළඹවති සහ ඒ සඳහා දඬුවම් ලබති' (සංක්ෂිප්ත කර ඇත. M.I,86-7).

3.ඉඳුරන්ගෙන් ලැබෙන තෘප්තීන් ඉන්ද්‍රියමය මනඃකල්පිතයන් සහ සිතුවිලි වශයෙන් විඥානයේ දෝංකාර දෙමින් සහ දැඩි ආශා, කලබල සහ නොසතුට ඇති කරමින් මනස කෙරෙහි බලවත් බලපෑමක් ඇති කරයි. මෙම තත්ත්වය යම් කෙනෙකු මනස සංවර සහ පිරිසිදු කර ගැනීමට උත්සාහ කරන්නේ නම්, එහිදී අපහසු වේ. මෙම හේතු නිසා,

සතුට ඇති කර ගැනීම සඳහා බුදුපියාණන් වහන්සේ ප්‍රවේසම් සහිත, නමුත් තාත්වික ආකල්පයක් ලබා ගැනීම සඳහා උපකාර කළහ. 'ඉඳුරන් පිනවීමෙන් ලැබෙන සතුට, ඒවායේ ඇති භයානකත්වය දැක ඒවායෙන් ගැලවී' (M.I,85) ඉඳුරන් සමග ආශාවේ ගැලීම සහ අන්ත තපස අතරට සෞඛ්‍යමත් උපක්‍රමයක් දියුණු කර ගැනීම සඳහා උන්වහන්සේ අපට අවවාද කළහ (S.IV,330).

ඉඳුරන් උත්තේජනය නිපදවෙන සතුටට වඩා ඉහළ සහ වඩා පිරිසිදු සතුටක් ඇති බවට අවබෝධ කර ගැනීම සඳහා බුදුපියාණන් වහන්සේ අප ධෛර්යමත් කළහ. උන්වහන්සේ මෙසේ පැවසූහ: 'කෙනෙකුට අත්විඳිය හැකි ඉහළම සතුට මෙයයි' යනුවෙන් කෙනෙකු කියන්නේ නම්, මම ඔහු සමග එකඟ නොවෙමි' (M.I,398). ඊට පසු උන්වහන්සේ භාවනාව හරහා ලබන ශාන්තිය සහ නිහැඬියාවෙන් කෙනෙකුට ප්‍රීති ප්‍රමෝදය සහ සතුට අත්විඳිය හැකි බව විස්තර කළහ.

## කාව්‍යය

කාව්‍යයක් (කබ්බ) යනු චිත්තවේගී ප්‍රතිචාරයක් ඇති කිරීම සඳහා අදහස් කරන පද (ගාථා), කාව්‍ය රිද්මය (ඡන්දෝ) සහ අලංකාරවලින් (අලඞ්කාර) විස්තර කරන ලද නිර්මාණයකි. එයින් අදහස් කරන්නේ චිත්තවේගී ප්‍රතිචාරයක් ප්‍රබෝධ කිරීමයි. එය සාමාන්‍යයෙන් කෘතිම සහ වඩා ඔප කරන ලද භාෂාවක් සමග සම්බන්ධ කර ඇත. එය වඩාත් ස්වාභාවික වන ගද්‍ය සමග සසඳා වෙනස දැක්විය හැකිය.

සියලු කලාවන් අතරින්, බුදුපියාණන් වහන්සේ වඩාත් සමීප වූයේ කාව්‍ය සමගය. සමහර විට, උන්වහන්සේ තරුණ වයසේදී ලැබූ අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් විය හැකිය. කාව්‍යයේ ව්‍යූහයට අදාළව උන්වහන්සේ මෙසේ පැවසූහ 'පදවල සංකල්පමය සැකිල්ල කාව්‍ය රිද්මයයි. මාත්‍රා ඒවායේ පදරචනය සාදයි. පැදි වචන මත රඳා පවතී. පැදිවල වාසස්ථානය කවියාය' (S.I,38). බුදුපියාණන් වහන්සේ විවිධ වෙනස් ආකාරයේ කවියන් පිළිබඳව කථා කළහ, ගැඹුරු, විස්තරාත්මක, උපදේශාත්මක තාත්වික සහ ප්‍රබෝධවත් (A.II,230) යනාදී වශයෙනි. සාවිත්තී වඩාත් ඔප දැමූ කාව්‍ය රිද්මය බව බුදුපියාණන් වහන්සේ සැලකූහ. එයට පේළි තුනක් සහ මාත්‍රා 24ක් ඇතුළත් බව උන්වහන්සේ දැන සිටියහ (Sn.568;457). පඤ්චසිඛ ආධ්‍යාත්මික සහ ශෘංගාරයේ මූලයන් සම්මිශ්‍රණය කරමින් ලස්සන පද ගැයූ විට, බුදුපියාණන් වහන්සේ ඒවා ඇගයූ සේක (Sn.568;457). වඞ්ගීස ඔහු විසින් එවලේම රචිත පද ගැයූ විට, තවත් ඒවා රචනා කර ගයන ලෙස බුදුපියාණන් වහන්සේ ඔහුට පැවසූහ (S.I,193).

බුදුපියාණන් වහන්සේගේ කාලයේ ලේඛන කලාව භාවිතය සඳහා එමින් පැවතුණා පමණක් නිසා, තොරතුරු සටහන් කර ගැනීමට තිබූ වඩාත් සාමාන්‍ය ක්‍රමය වූයේ ඒවා කටපාඩම් කර ගැනීම පමණි. කථාවක් අතරතුර යම් අවස්ථාවක හෝ එහි අවසානයේදී, ගුරුවරයෙකු කවියක්, හෝ කවි පෙළක් ගායනා කරයි. ඔහු විසින් එහි ගායනා කළ ප්‍රධාන කරුණු සාරාංශගත කරයි, හෝ හරය පමණක් දක්වයි. එයට හේතුව මෙම කවි ලෙහෙසියෙන් මතක සිටින හෝ අසාමාන්‍ය භාෂාව හෝ විස්තරවලින්

යුක්ත වීමයි. ඒවා භාවිත කර තිබුණේ ගුරුවරයා කිවූ සියල්ල නැවත මතක්වන්නට පසුවට උපකාරවන ස්මරණ උපක්‍රම ලෙසයි. බුදුපියාණන් වහන්සේ මෙම පුහුණුව අනුගමනය කළහ. උන්වහන්සේ විසින් නිර්මාණය කරන ලද කාව්‍ය දහස් ගණනක් උන්වහන්සේගේ ශ්‍රාවකයන් මතකයේ තබා ගත් අතර, පසුකාලීනව ඒවා බෞද්ධ පූජනීය ග්‍රන්ථවල අත්තිවාරම සකස් කිරීමට හේතුවිය.

කාව්‍ය පිළිබඳව බුදුපියාණන් වහන්සේට තිබූ දැනුම සහ හැකියාව තිබියදීත්, ධර්ම ග්‍රන්ථවල බොහෝ ස්ථානවල උන්වහන්සේ ඒ සම්බන්ධයෙන් හෙළාදැකීම් ද කර ඇත. භික්ෂූන් සහ භික්ෂුණීන් කාව්‍ය රචනා කිරීම් හෝ සවන් දීම නොකළ යුතු බව ද බුදුපියාණන් වහන්සේ පවසා ඇත (D.I,11). කෙසේ වෙතත් ඉහත සඳහන් කර ඇති දේ දෙස බලන විට, එසේ විය හැක්කේ උන්වහන්සේ කාව්‍ය කලාව ප්‍රතික්ෂේප කළ බැවිනි. බුදුපියාණන් වහන්සේ කවියක් අනුමත කළත් නැතත්, එහි ශෛලිය, අන්තර්ගතය සහ වර්ගය මත රඳා පවතී. බොහෝ පැරණි ඉන්දියානු කාව්‍ය රචනා වී තිබුණේ රජවරුන්, යුද හමුදාමය ජයග්‍රහණ, දෙවිවරුන්, ආචාරශීලී ආදරය හෝ අසැබි බස් හෝ හැසිරීම් පිළිබඳවයි. මෙම විෂයයන් බුදුපියාණන් වහන්සේ හිංසාකාරී නොවන බවට සලකන්නට ඉඩ තිබෙන්නට හැකි නමුත්, ආධ්‍යාත්මික හා මානසික දියුණුවක් ඇති කිරීම දුෂ්කරය. ඇතැම් කාව්‍යයන් සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේට ඇති වන්නට හැකි තවත් ප්‍රශ්නයක් නම්, ඒවායෙන් දැඩි හැඟීම් ජනිත කළ හැකි වීමයි. උන්වහන්සේ එවැනි හැඟීම්වලට විරුද්ධ නොවූහ. සැබැවින්ම උන්වහන්සේගේම වචනවලින්,

අපට දිගින් දිගටම පවසා ඇත්තේ, 'මිනිසුන් ප්‍රබෝධවත් කළහ, ඔසවා තබන ලදී සහ ප්‍රීතියට පත් කරන ලදී' යනුවෙනි (D.II,98; M.II,140).

නමුත් සමහර කාව්‍යයන් හෙළා දැකීම, කල්පනාකාරී නොවූ දේශ ප්‍රේමය, අහංකාරය හෝ කාමුක ආශාවන් වැනි උතුම් බවින් අඩු හැඟීම් ජනිත කරයි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ 'තේරුමක් නැති කවි දාහකට වඩා කවියක එක් වචනයක් ඇසීමෙන් කෙනෙකු සන්සුන් කරන්නේ නම් එය වඩා හොඳයි' (Dhp.101). සමහර කවිවලින් ගද්‍යයට වඩා සත්‍යය ඵලදායී ලෙස ප්‍රකාශ කළ හැකිය. අනෙක් ශෛලීන් ප්‍රතිඵලය සඳහා සත්‍යය අත හරී. සුන්දර වචන සහ වාක්‍ය ඛණ්ඩයන්ට සම්පූර්ණයෙන්ම අප වශීකළ හැකිය (කාවෙය්‍යමත්ත). ඒ අප අවබෝධ කරගෙන ඇත්තේ යම් දෙයක් වන අතර, සැබැවින්ම ඔවුන් සිදුකර ඇත්තේ එක් ප්‍රසන්න හැඟීමක් අපට ලබා දීම පමණි.

මේ ආකාරයට ඔවුන් අපට පවසන්නේ හුදෙක් සත්‍යය යැයි ඒත්තු ගැන්විය හැකිය. එයට හේතුව එය පවසා ඇත්තේ කිවි බසට යෝග්‍ය වන අයුරෙන් නිසාය. 'වෛවර්ණ වචන සහ එළිසමවලින් ප්‍රයෝග යොදමින් කවියන් කවියෙන් රචිත ඉගැන්වීම්වලට' (A.I,72), සවන් දීමට විරුද්ධව සමහර විට බුදුපියාණන් වහන්සේ අනතුරු ඇඟවීම් කළේ මේ නිසා විය හැකිය. මෙයට ප්‍රතිවිරුද්ධව, උන්වහන්සේගේ ධර්ම දේශනාවල අදහස, යමක් පැවසීමට සුන්දර භාෂාව හෝ රූප සංඥාවන් භාවිත කළ විට වුවත්, සැමවිටම ඒ දේශනා පැහැදිලි විය.

කාව්‍යමය කලාවට දීර්ඝ සහ කීර්තිමත් ඉතිහාසයක් බුදුදහමේ ඇත. එසේම ධර්මය පැතිරවීමේදී වැදගත් කාර්යභාරයක් තිබුණි. ඉන්දියාවේ සමහර විශිෂ්ට කවියන් බෞද්ධයන් වූ අතර, ඔවුන් විශේෂයෙන්ම අශ්වඝෝෂ, මාතෘචට, චන්ද්‍රගොමින්, භර්තෘහරි සහ ක්ෂෙමෙන්ද්‍ර යන අයයි. බෞද්ධ පැවිද්දෙකු වූ මිලරෙප ටිබෙටයේ ජනප්‍රියත්වය බොහෝ කල් පවත්වාගත් කවියා විය. ශ්‍රී ලංකාවේ විශිෂ්ටම කවියා ශ්‍රී රාහුල සහ ජපානයේ ඉතාම ආදරණීය කවියා වූ බෂො යන දෙදෙනාම භික්ෂූහු වූහ. බලන්න **දොණ සහ වාචික සම්ප්‍රදාය**

*A Literary Appraisal of Pali Poetical Works*, Asha Das, 1994.

**බහු භාර්යා - බහු පුරුෂ සේවනය - බලන්න විවාහය**.

## කාම උත්තේජනය ඇති කරවන දර්ශන

කාමුක දර්ශන යනු ලිංගික හැඟීම් ඇවිස්සීම සඳහා වූ මාධ්‍යයකි. ශෘංගාරයෙහි මෙන් නොව, එහි අපූර්වත්වය සහ කලාත්මක අන්තර්ගතයන් නැත. සාමාන්‍යයෙන් අසභ්‍ය ලෙස තේරුම් යයි. කාමුක දර්ශන කියවීම හෝ ඒ දෙස බැලීම තුන්වන ශික්ෂාපදය බිඳ දැමීමකට සමාන වේද යන්න සලකා බැලිය යුත්තේ පළමුව එය අපටම බලපාන්නේ කෙසේ ද යන්නයි. ගිහියන්ට 'ඉන්ද්‍රිය පිනවීමෙන් විනෝදය භුක්තිවිඳීමට' (A.IV,281) තර්කානුකූලව පිළිගත හැකි බව බුදුපියාණන් වහන්සේ පිළිගත්හ. එසේම ඉන්ද්‍රියයන් පිනවීමෙන් ලැබෙන ආශ්වාදයන් 'මෝඩයන්ගේ අනිත්‍ය, හිස්, ව්‍යාජ, රවටන සුළු, මායාවී, බොළඳ දේවල්' බව උන්වහන්සේ මතක් කළහ (M.II,261). තවදුරටත් උන්වහන්සේ පෙන්වා

දුන්නේ කාමාශාවන් (කාමරාග) මානසික සන්සුන් බවට සහ පැහැදිලිතාවට බාධාවක් බවත්, මනස වැසී පැතිරී යන බවත්, ප්‍රඥාව දුර්වල' වන බවත්ය (A.III,63).

ඊළඟට අප කාමුක දර්ශන මගින් අන් අය කෙරෙහි ඇති වන බලපෑම ගැන සිතා බැලිය යුතුයි. එයට හේතුව අද බොහෝ කාමුක දර්ශන මිනිසුන්ගේ සැබෑ රූපවලින්ම සමන්විත වන නිසාය. ගණිකා වෘත්තියේදී මෙන්, මෙම මිනිසුන්ගෙන් සමහර අය 'නිරූපකයන්' ලෙස වැඩ කරනවා විය හැකිය. එයට හේතුව එය පහසුවෙන් මුදල් ඉපයිය හැකි වෘත්තියන් වන අතර, අනෙක් අයට එය කරන්නට සිදුවන්නේ දුප්පත්කම හෝ සමාජීය අභිමිකම් හේතුකරගෙනය.

ඒ අනුව, එවැනි ද්‍රව්‍ය දෙස බැලීමෙන් කෙනෙකු අන් අයගේ අපයෝජනයට සම්බන්ධ වීමට ඉඩ ඇත. එමනිසා, ශික්ෂාපදවලට විරුද්ධවීමට සිදුවිය හැකිය. සමහර විට තවත් කාරණයක් සැලකිල්ලට ගත යුතු වේ - ඊනියා ස්වර්ණමය නීතියට. කෙනෙකු තමන්ගෙන්ම මෙසේ ඇසිය යුතුයි: 'මගේ දරුවෙකුගේ, සහෝදරියකගේ සහෝදරයෙකුගේ හෝ මිතුරු මිතුරියෙකුගේ කාමුක දර්ශනයක් සඟරාවක හෝ චිත්‍රපටයක දුටුවහොත් මට කෙසේ දැනේ ද?'.

## භූතයෙකු වැහී සිටීම

භූතයෙකු හෝ ආවේශිත භුක්තියක් (ආවිසති හෝ ගහිත) යනු අනර්ථකාමී අද්භූත ජීවීන් එකෙකු හෝ වැඩි ගණනක් පුද්ගලයෙකු තුළ බලහත්කාරයෙන් වාසය කරමින් සහ පාලනය කරන තත්ත්වයක්

පිළිබඳව විශ්වාස කිරීමයි. එවැනි අද්භූත ජීවීන්ගේ බලහත්කාරයෙන් වාසය කිරීම සහ පාලනය කිරීම සහ බලවේගවලට විරුද්ධව භූතාත්ම පළවා හැරීම බොහෝ ආගම්වලින් සිදුකිරීම පිළිබඳව ද වාර්තා වේ. භූතාත්ම පළවා හැරීම ජේසුස්වහන්සේගේ මෙහෙවරේ ප්‍රධාන අංගයක් වූ අතර, බයිබලයට අනුව, ඔහු මිනිසුන් 30කට ආසන්න ප්‍රමාණයක සිටි භූතාත්ම පළවා හැර, එයම කිරීමට තම ශ්‍රාවකයන්ට අවසර සහ බලය දුන්නේය. 'භූතයන් නෙරපන්නට' හැකිවීම ශුභාරංචියේ සාක්ෂියක් ලෙස තහවුරු විය.

බුදුපියාණන් වහන්සේගේ කාලයේ භූතයන් වැහී සිටීම පිළිබඳ විශ්වාසය සාමාන්‍ය දෙයක් විය. එසේ කළ මනුෂ්‍ය නොවන ජීවීන් (අමනුස්ස) 'දරුණු, භයානක සහ බිය උපදවන' (D.III,203) බවට සලකනු ලැබීය. භූතයෙකු ආවේශිත අයෙකු බයෙන් කෑගැසූවේය: 'මෙම භූතයා මා අල්ලා ගත්තේය, මට ආවේශ විය, මට හිංසා සහ පීඩා කරයි. මට යන්නට ඉඩ නොදෙයි! (D.III,204) 'භූතයන් ආවේශ වීම සම්බන්ධයෙන් ත්‍රිපිටකයේ ඇත්තේ එක් සිද්ධියක් පිළිබඳව පමණි. බුදුපියාණන් වහන්සේ කිසි විටක භූතයන් පළවා හැරීම් සිදු කළේ නැත. කෙසේ නමුත්, ත්‍රිපිටකයේ මාර හෝ විවිධ යක්ෂයන් බුදුපියාණන් වහන්සේ හෝ උන්වහන්සේගේ ශ්‍රාවකයෙකු පොළඹවා ගැනීමට, බිය වැද්දීමට හෝ හානි කිරීමට උත්සාහ කළ සිදුවීම් විශාල ප්‍රමාණයක් පිළිබඳව සඳහන් වේ. එවැනි සෑම අවස්ථාවකදීම, අභිප්‍රායික චින්දිතයා මෙම හිරිහැර කිරීම පිටුපස සිටින්නේ කවුද හෝ ආක්‍රමණය පිටුපස ඇත්තේ කුමක්ද යන්න හඳුනා ගත් විගසම එම සියලු අවස්ථාවල උත්සාහ ව්‍යර්ථ විය (e.g. S.I,103ff).

මනෝ චිකිත්සාව සහ වෛද්‍යමය භාෂිතයට අනුව භූත ආවේශවීම නූතන චින්තනයෙන් පැහැදිලි කරන්නේ හිස්ටීරියාව, දැඩි මනෝ විකෘතිය, භින්නෝන්මාදය හෝ සමහර විට අපස්මාරය ලෙස ද බවයි. මෙසේ තිබියදීත්, භූත ආවේශ සඳහා සමහර සාම්ප්‍රදායික ප්‍රතිකාර ඖෂධීය චිකිත්සාවලට සහ මනෝ චිකිත්සක මැදිහත්වීම්වලට වඩා වැඩියෙන් ඵලදායී හෝ ඉඳහිට, ඊටත් වඩා ඵලදායී බවට ඔප්පු වී ඇත. බලන්න **නරක සහ උමතුව**

## ඉරියව්ව

ඉරියව්ව (ඉරියාපථ) යනු ශරීරයේ පිහිටීමයි. බෞද්ධ ධර්ම ග්‍රන්ථවල නිතරම ඉරියව් හතරක් ගැන කථා කරයි - සක්මන (ගච්ඡන්ත), සිටගෙන සිටීම (ඨිත), ඉඳගෙන සිටීම (නිසින්න) සහ වැතිර සිටීම (සයන, M.I,57); වශයෙනි. මෙයට අපට ගුළි වී සිටීම, නැමීම, ඇණ තියා ඉඳ ගැනීම සහ තවත් විවිධ ඉරියව් එකතු කළ හැකිය. ශරීරය සහ මනස එකිනෙකා කෙරෙහි බැඳුන නිසා, කෙනෙකුගේ ඉරියව්ව එම පුද්ගලයාගේ මනසේ තත්ත්වය පිළිබඳ ඇඟවිය හැකිය (D.I,76). බුදුපියාණන් වහන්සේ සැමවිටම ප්‍රසන්න සහ උදාර ආකාරයකින් කෙළින් සිටියහ. එයින් පිළිබිඹු වූයේ උන්වහන්සේගේ උත්සාහයෙන් තොරවූ සිහි කල්පනාව සහ ගැඹුරු අභ්‍යන්තර ශාන්ත බවයි. උන්වහන්සේ නිරීක්ෂණය කළ එක් පුද්ගලයෙකු වරක් මෙසේ පැවසුවේය: 'උන්වහන්සේ වඩා වේගය වැඩියෙන් හෝ පමණට වඩා වේගය අඩුවෙන් ගමන් නොකරති... උන්වහන්සේ සක්මන් කරන්නේ නිරුත්සාහයෙන්ය... ඉඳගන්නා විට උන්වහන්සේ පාදවලින් දඟලන්නේ නැත ... හෝ

තමන්වහන්සේගේ නිකට මත අත තබා ගෙන ඉඳගන්නේ නැත... උන්වහන්සේ ආරාමයකට වඩින විට, තමන්වහන්සේට සූදානම් කර ඇති ආසනයේ වාඩි වෙන්නට පෙර, උන්වහන්සේ පාද දෝවනය කරයි. උන්වහන්සේ ඒ පිළිබඳව කලබල නොකරමින් සහ පාද දෝවන කිරීමෙන් පසු උන්වහන්සේ හරහට පාද තබාගෙන, ශරීරයේ පිටුපස ඍජුව තබාගෙන, සිහි කල්පනාව මුල් තැනට ගෙන එමින් ඉඳ ගන්නා සේක' (M.II,137-9). බුදුපියාණන් වහන්සේ ගිමන් හැරීමට හෝ සැතපීමට වැතිරෙන විට, සාමාන්‍යයෙන් 'සිංහ සෙයියාවෙන්' (සීහාසන) වැඩ සිටියහ. එනම්, උන්වහන්සේගේ දකුණු පස එක් පාදයක් අනෙක් පදය පිට තබාගෙන, සිහිකල්පනාවෙන් සහ සම්පූර්ණයෙන් සවිඥාකව සිටීමයි (S.I,27,107).

බුදුදහමේ ඉරියව්ව පිළිබඳව ඇති වැදගත්කම ප්‍රධාන වශයෙන් අදාළ වන්නේ භාවනාව පුහුණු කිරීමටයි. භාවනාවේ මූලික අවධිවලදී කෙනෙකු දෙපා හරස් අතට හෝ නවාගෙන (පල්ලඞ්කං), සහ කොන්ද ඍජුව (උජුං කායං , M.I,56) තබාගෙන ඉඳගන්නා (නිසීදති) ලෙස බුදුපියාණන් වහන්සේ නිර්දේශ කළහ. බොහෝ මිනිස්සු කොට්ටයක් තමන්ගේ තට්ටමට යටින් තබා ගැනීම, දෙඅත් උකුළ මත හෝ දණහිස් මත තබා ගැනීම සහ ඇස් වසා ගැනීම ප්‍රයෝජනවත් බව සැලකුහ. සමහර භාවනායෝගීහු පොළොව මත ඉඳගන්නවා වෙනුවට පුටුවක් මත ඉඳ ගැනීම සුදුසු යැයි සිතති. භාවනායෝගීන් දින තුනක් විවිධ ඉරියව් අත්හදා බලා, ඔවුන්ට වඩාත් පහසු ඉරියව්ව තීරණය කළ යුතු බවට ප්‍රයෝජනවත් යෝජනාවක් විසුද්ධිමග්ගයේ සඳහන් කර ඇත

(Vism.128).

යහපත් භාවනා ඉරියව්වල තිබිය යුතු වඩාත් වැදගත් කරුණු දෙකකි : 1. පහසු ස්වසනයක් ඇති කිරීම සඳහා ශරීරයේ පිටුපස දැඩි නොවී සෘජු විය යුතුයි. 2. ශරීරය සැහැල්ලු සහ සුවපහසු විය යුතුයි. එවිට ශරීරයේ අපහසුවක් නොමැති නිසා අවධානය වෙනතකට නොහැරේ (S.V,156).

සිහිකල්පනාව දියුණු කිරීම තමන්ගේ අරමුණ බවට පත්කර ගත් අය නියම කරනු ලැබූ ආකාරයෙන් අඛණ්ඩව ඉඳගෙන ඉන්නා පුහුණුවක් කළ යුතුයි. කෙසේ නමුත්, මෙම සිහිකල්පනාව ශක්තිමත් වූ පසු, එය පුළුල් කිරීම සඳහා සියලු ක්‍රියාවන්හි යෙදෙන විටදී, උදාහරණ වශයෙන් සියලු ඉරියව් හතරේම සිටින විට, උත්සාහ කිරීම අවශ්‍ය වේ. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ 'භික්ෂුවක එන යන විට, දෙඅත් දිග හරින විට හෝ හකුළන විට, සිවුරු පොරවන විට හෝ පාත්‍රය රැගෙන යන විට, ආහාර සහ බීම ගන්නා විට, ආහාර සපන සහ රස බලන විට, මලපහ කරන විට සහ මූත්‍ර පිටකරන විටත්, සම්පූර්ණ සිහියෙන් සිටිය යුතුයි. භික්ෂුවක සක්මන් කරන විට, සිටගෙන ඉන්නා විට සහ ඉඳගෙන ඉන්නා විට, නින්දට යන විට සහ අවදි වන විට, කථා කරන විට සහ නිශ්ශබ්දව ඉන්නා විට ද සම්පූර්ණ සිහියෙන් සිටිය යුතුයි' (M.I,57). බලන්න **පද්මාසන ඉරියව්ව**

## පස්වන සහ අටවන ශික්ෂාපද

ශික්ෂාපදයක් යනු (සික්ඛාපද) ස්වයං පනවන ලද

නීතියක් හෝ හික්මීමකි. සියලු බෞද්ධයන් කැපවී ජීවත් වීමට උත්සාහ කරන ශික්ෂාපද පහ (පඤ්ච සීල) ලෙස හැඳින් වේ. ඒවා 1. ජීවත්වන සත්ත්වයන්ට හානි නොකිරීම, 2. සොරකම් නොකිරීම, 3. වැරදි කාමයෙහි නොයෙදීම, 4. බොරු නොකීම, මත්පැන් හෝ මත්ද්‍රව්‍ය නොගැනීම. මෙම ශික්ෂාපද පහ අනුගමනය කිරීමෙන්, කෙනෙකු ක්‍රමයෙන් අනෙක් අයගේ ජීවිත කෙරෙහි, ඔවුන්ගේ වස්තුව කෙරෙහි, ඔවුන්ගේ අභිමානය කෙරෙහි, ඔවුන්ට සත්‍යය දැනගැනීමට ඇති අයිතිය කෙරෙහි ගෞරවයක් දියුණු කර ගනී. එසේම තමාගේම මනසේ පැහැදිලි තත්ත්වයක් දියුණු කර ගැනීම සඳහා ද ගෞරවයක් ඇති වේ.

මෙම ශික්ෂාපද පිළිපැදීමෙන් අනෙක් අය පිළිබඳව සැලකිල්ලක් දැක්වීමෙන් 'ආදරය සහ ගෞරවය ඇතිවන බවත්, එය උපකාරවන, මතභේද නොමැති වීම, එකඟතාව සහ සමගියට පාදකවන' (පියකරණා, ගරුකරණා), සඞ්ගහාය, අවිවාදාය, සාමග්ගියා, එකීභාවාය, A.III,289) බව බුදුපියාණන් වහන්සේ හැඳින්වූහ. එය දෙන්නා සහ ලබන්නා යන දෙන්නාටම ප්‍රයෝජනවත් වන, අනෙක් අයට ලබා දෙන ත්‍යාගයක් බව බුදුපියාණන් වහන්සේ දුටුවහ. 'උතුම් ශ්‍රාවකයෙකු පංච ශීලය පුහුණු කරන විට, සීමාවක් නැති තරම් සත්ත්වයන් කෙරෙහි ඔහු බියෙන්, වෛරයෙන් සහ නොමනාපයෙන් නිදහස් කරන ත්‍යාගය ලබා දෙයි. මෙම ත්‍යාගය ලබා දීමෙන් ඔහු සීමාවක් නැති ප්‍රමාණයකින් බියෙන්, වෛරයෙන් සහ නොමනාපයෙන් නිදහසකට සහභාගී වෙයි' (සංක්ෂිප්තයි, A.IV,246). තවත් අවස්ථාවක, 'නිදහස - දීමේ' ගුණාංගය සහ

'ඒකාග්‍රතාව ලැබීමට උපකාරවන' (A.III,132) බව බුදුපියාණන් වහන්සේ හැඳින්වූහ. පංච ශීලය රැකීමෙන් ඇතිවන වඩාත් වැදගත් ප්‍රයෝජනය වන්නේ එම පුද්ගලයා 'නිදොස් පුද්ගලයෙකු වීමේ සතුට' (අනවජ්ජ සුඛ, D.I,70) අත්විඳීම බව උන්වහන්සේ සඳහන් කළහ. තවත් වචනයකින් කියනවා නම්, පංචශීලය රැකීම යනු එසේ රකින්නා තමන්ගේ සහ අනුන්ගේ සුභසිද්ධිය සහ සතුට පිළිබඳව සැලකිල්ලක් දැක්වීමයි.

මෙම ශික්ෂාපද වලට අමතරව, සමහර බෞද්ධයෝ අටසිල් (අට්ඨංග සීල), අඩු තරමින් සෑම මසකම හතර වාරයක් එළඹෙන උපෝසථ දිනවල පුහුණු කරති. අෂ්ටංගික සීලය පංචශීලයේ තුන්වැන්න වෙනුවට සියලු ලිංගික සේවනයෙන් වැළකීම සහ අතිරේක ශික්ෂාපද තුනක්, එනම්, මධ්‍යාහ්නයෙන් පසු ආහාර ගැනීමෙන්, නැටුම්, ගැයුම්, සංගීතයෙන්, සුවඳ විලවුන්, මල්මාලා ආදියෙන්, සහ උස් අසුන් මත ඉඳ ගැනීමෙන් වැළකීමෙන් සිටිය යුතුයි. පංචශීලය සදාචාරමය හැසිරීමට අදාළ වන අතර, අවසාන තුන සරලබව, සන්හිඳියාව සහ ප්‍රත්‍යවේක්ෂණයට උපකාරවන හැසිරීමට අදාළ වේ.

සාමණේර භික්ෂූන් සහ භික්ෂුණීන් ඔවුන්ගේ පැවිදි ජීවිතයට සූදානම් වීම සඳහා දසසිල් (දස සීල) පුහුණු කළ යුතු වේ. ඒවා, 1. ජීවීන්ට හානි නොකිරීම, 2. සොරකම් නොකිරීම, 3. ලිංගික හැසිරීම්වලින් වැළකීම, 4. බොරු නොකීම, 5. මත්පැන් සහ මත්ද්‍රව්‍ය වලින් වැළකීම, 6. දහවලින් පසු ආහාර ගැනීමෙන් වැළකීම, 7. නැටුම්. ගැයුම්, සංගීතයෙන් වැළකීම, 8. සුවඳ විලවුන්, මල්මාලාවලින් වැළකීම, 9.

උස් අසුන් භාවිතයෙන් වැළකීම. 10. රත්රන් සහ රිදී, එනම් මුදල් භාවිතයෙන් වැළකීමයි.
*Going for Refuge*: *Taking the Precepts*, Bhikkhu Bodhi, 1981.

## මැණික් ගල් සහ ලෝහ

මැණික් (මණි හෝ රතන) යනු සාමාන්‍යයෙන් පොළොවෙන් හමුවෙන දීප්තිමත්, වර්ණවත් හෝ විනිවිද පෙනෙන ඛනිජයි. බටහිර රටවල තිබෙන සමහර ඇත් දළ, ඇම්බර, කළු ලිග්නයිට සහ සිප්පි වැනි ස්වභාවික වර්ධනය ලක්ෂණ කොට ඇති ද්‍රව්‍යය ද මැණික් ලෙස සලකනු ලැබේ. ඉන්දියාවේ ද එය එසේම සිදු වේ. මැණික්වලට පසු වඩාත් සුලභ සහ සොයන වර්ග දහය වශයෙන් මුතු (මුත්තා), පළිඟු (මාණ), වෛඩූර්යය (වෙළුරිය), හක්ගෙඩි සිප්පිය (සඞ්ඛ), තිරුවාණ (සිලා), රතු කොරල් (පවාල), රිදී (රජාත), රත්රන් (ජාතරූප), පද්ම රාගය (ලොහිතඞ්ක) සහ පච්ච මැණික (මසාරගල්ල, Ud.54) ලෙස බුදුපියාණන් වහන්සේ ලැයිස්තු ගත කළහ.

17වන ශතවර්ෂය වන තෙක්ම ඉන්දියාව දියමන්ති (වජිර) සඳහා වූ එකම උල්පත වුවත්, බුදුපියාණන් වහන්සේ ඒවා මෙම ලැයිස්තුවට ඇතුළත් නොකිරීම පුදුමයකි. උන්වහන්සේ ඒවා වෙනත් තැනක හෝ සඳහන් කර නැත (Dhp.161).

පැරණි ඉන්දියානුවන් පළිඟු අගය කළේ ඒවායෙන් ජලය පිරිසිදු කළ හැකි යැයි විශ්වාස කිරීම නිසාය (Mil.35). වෙළුරිය බොහෝ විට ලපිස් ලසුලි වශයෙන් පරිවර්තනය කළත් එය නිවැරදි නොවේ. මෙම මැණික පැති අටක් තිබෙන, විනිවිද පෙනෙන සහ මොණරෙකුගේ බෙල්ලේ වර්ණය (D.I,76; Ja.I,207) ඇති

බවට බුදුපියාණන් වහන්සේ විස්තර කළහ. ලපිස් ලසුලිවල නොමැති ස්වභාවයන් මෙහි ඇත. වෛධූර්යයයේ කෙසේ නමුත්, පැති හයක් ඇති පළිඟුවක් වන අතර, කෙළවර දෙකක් සමග පැති අටක් ඇත. එය විනිවිද පෙනෙන සහ කොළ පැහැයේ සිට තද නිල්-කොළ වර්ණවලින් විහිදී තිබේ. හක්ගෙඩි සිප්පි වටිනාකමින් ඉහළ වූයේ ඒවා සම්පූර්ණයෙන්ම මතුපිට ඔපය ඇති කරන සුදු වර්ණය ඇතිවන සේ ඔපදැමිය හැකි නිසාය. ගුණවත්, විනයගරුක භික්ෂුවක් 'සම්පූර්ණයෙන්ම පිරිසිදු, සම්පූර්ණයෙන්ම පවිත්‍ර සහ ඔපදැමූ හක්ගෙඩි සිප්පියක්' (Vin.D.I,63) මෙන් ජීවිතයක් ගත කරන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. දකුණට සර්පිලාකාර හැඩය ඇති දුර්ලභ හක්ගෙඩි සිප්පිය විශේෂයෙන්ම වාසනාවන්ත දෙයක් ලෙස සලකන අතර, එයට ඉහළ මිලක් උපයා ගත හැකිය (Ja.IV,350).

බටහිර රටවල රත්රන් (හෙම, කනක හෝ සුවණ්ණ) මැණිකකට වඩා වටිනා ලෝහයක් ලෙස සාමාන්‍යයෙන් සිතනු ලැබේ. මෙම ලෝහයට සෑම විටම ඇලුම් කරන්නේ එහි ඇති ලස්සන, නිදහස් මනසකින් තළා හැඩගැන්විය හැකි බව සහ නිර්මාණය කිරීමට එහි ඇති ගුණාංග නිසාය. බුදුපියාණන් වහන්සේ විවිධ වර්ගයේ රත්රන් (හාටක, ජම්බොනද, කඤ්චන සහ සිඞ්ගනද), A.I,181: IV,255) විස්තර කළහ. බොහෝ අවස්ථාවල ලෝභ පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය භාවනාවෙන් මනස පිරිසිදු කිරීම හා උන්වහන්සේ සැසඳූහ (A.I,257-8; III,16; Dhp.239; S.V,92).

මෙම සංසන්දයන්හි දීර්ඝතම සහ වඩාත්ම සවිස්තරාත්මක එක අතරින්, උන්වහන්සේ මෙසේ පැවසූහ, 'ගල් සහ වැලි, බොරලු සහ පස් වැනි රත්රන්වල දළ අපද්‍රව්‍යය ඇත. පස් සෝදන්නා හෝ ඔහුගේ සහායකයා ලෝහ පස තාච්චියකට දමා එය නැවත සෝදා, පස සේදී යන තුරු තවදුරටත් සෝදයි. මෙය මෙසේ කර ඉවර වූ විට, වැලි කැට සහ වැලි වැනි කුඩා අපද්‍රව්‍යය ඉතිරි වේ. අපද්‍රව්‍යය සෝදන්නා නැවත එම ක්‍රියාවලියේ යෙදේ. එය එසේ කළ විට, තවදුරටත් සියුම් වැලි කැට සහ රොන් මඩ වැනි ඉතා කුඩා අපද්‍රව්‍යය ඉතිරිව තිබේ. එම නිසා අපද්‍රව්‍යය සෝදන්නා රත්රන් කුඩු පමණක් ඉතිරි වන තෙක් තවත් වරක් එම ක්‍රියාවලිය නැවත සිදු කරයි. ඊට පසු රන්කරුවා හෝ ඔහුගේ සහකරු රත්රන් කුඩු කෝවට දමා එය උණු කරයි. එවිට එය උණු වෙයි. නමුත් ඔහු එය පිටතට නොගනී. අපද්‍රව්‍ය තවමත් මතුපිටට පැමිණ නැති නිසා රත්රන් තවමත් තළා හැඩගැන්විය නොහැකිය, වැඩට ගත නොහැකිය, තවමත් දීප්තිමත් කිරීම හෝ මෝස්තර නිර්මාණය සිසු කළ නොහැකිය. නමුත් වඩා උණු කිරීමෙන්, අපද්‍රව්‍ය ඉවත් වී රත්රන් තළා හැඩගැන්විය හැකිය, වැඩට ගත හැකිය, දීප්තිමත් සහ මෝස්තර නිර්මාණය කිරීමට සූදානම්ය. රන්කරුවා කුමන රත්රන් බඩු සාදන්නට බලාපොරොත්තු වන්නේ ද, එය ඔටුන්නක්, කරාබු, මාලයක් හෝ චේන්පොටක් හෝ වේවා, ඔහුට එම රත්රන්වලින් කළ හැකිය.

ඒ ආකාරයටම උසස් මනසක් වැඩීම සඳහා භික්ෂුවකගේ අභිප්‍රායයේදී දළ අපද්‍රව්‍යයෙන් යුක්ත ක්‍රියා, වචන සහ සිතුවිලි ඇත. එවැනි වැරදිවලින් කල්පනාකාරී, දක්ෂ භික්ෂුවක විසින් නිදහස් විය

යුතුයි. මෙය කළ විට, ඉතිරිවන්නේ ඉඳුරන් පිනවීම, නොරිස්සුම හෝ කෲරත්වය වැනි සුළු අපද්‍රව්‍යය වන අතර, ඔහු ඒවායෙන් නිදහස් වේ. ඊට පසු තවදුරටත් තමන්ගේ ඥාතීන්, රට හෝ ප්‍රසිද්ධිය පිළිබඳ සිතුවිලි වැනි සියුම් අපද්‍රව්‍යය ඉතිරි වන අතර ඒවායෙන් ද ඔහු නිදහස් වේ. ඊට පසු ඉහළ මුදුන්පමුණුවා ගැනීම් පිළිබඳව අධික උනන්දුවක් තවදුරටත් තිබිය හැකි වන අතර, ඒ නිසා ඔහුගේ ඒකාග්‍රතාව සම්පූර්ණයෙන්ම සන්සුන් හෝ උදාර, නිසල හෝ ඒකාබද්ධ වී නැත. එය පවත්වාගෙන යන්නේ සචේතනික උත්සාහයකින්ය. නමුත් කාලයත් සමග, ඔහුගේ මනස සන්සුන්, උදාර, නිසල සහ ඒකාබද්ධ වේ. එසේම එය පවත්වාගෙන යාමට සචේතනික උත්සාහයක් තවදුරටත් අවශ්‍ය නොවේ. ඊට පසු සෘජු දැනුමකින් කුමන හෝ මානසික තත්ත්වයකට හෝ එළඹිය හැකිය. නිවැරදි තත්වයන් සැලකිල්ලට ගනිමින් ඔහුට එය අවබෝධ කර ගත හැකිය' (A.I,253-5).

පසුකාලීන බෞද්ධ සම්ප්‍රදායේ තුන් සරණ, එනම් බුද්ධ, ධම්ම සහ සඞ්ඝ, අදටත් මැණික් තුන (තිරතන), යනුවෙන් හැඳින් වේ. එයට හේතුව, මැණික් මෙන් ඒවා ලස්සනය, බොහෝ දෙනාට ප්‍රියය. වටිනා කමින් ඉතා ඉහළය (Sn.224-35).

## භාවනාවේ ප්‍රගමණය

විවිධ වර්ගයේ බොහෝ භාවනා ඇත. එසේම එකම වර්ගයෙන්ම බොහෝ වෙනස්වීම් ඇත. ඒ නිසා මිනිස්සු බොහෝ විට විමසති 'භාවනාවේ හොඳම

ශිල්පීය ක්‍රමය කුමක් ද? සහ 'එය මා කරන්නේ නිවැරදිව ද නැද්ද කියා දැනගන්නේ කෙසේ ද?' එය තක්සේරු කිරීම සඳහා උපමාන හතරක් බුදුපියාණන් වහන්සේ භාවනාවේ දී හඳුන්වා දී ඇත. 'ප්‍රගමනය, වර්ධනය සහ වැඩි දියුණු කිරීම' (විඩ්ඩිං, විරූළ්හිං, වෙපුල්ලං) *viḍḍhiṁ, virūḷhiṁ, vepullaṁ*) දර්ශක නම්, 1. ඔබ සාමාන්‍යයෙන් භාවනා ඇරඹීමට ප්‍රථමයේදීට වඩා වැඩියෙන් සතුටෙන් නම්, 2. ඔබ තුළ ධනාත්මක ගුණාංග වැඩිවී ඇති බව සහ ඍණාත්මක ගුණාංග අඩුවී ඇතැයි ඔබට වැටහෙන්නේ නම්, 3. ඔබට වඩාත් සංසිඳුණු බවක් සහ විවෘත බවක් ඇත්තේ නම්, සහ 4. ඔබට ඔබ පිළිබඳව වඩාත් මැදහත් බවක් ඇති කර ගන්නට හැකි නම්, යනාදියයි.

භාවනා කිරීම සඳහා වන සමහර ප්‍රවේශයන් සහ මිනිසුන්ගේ ඇතැම් ආකල්ප නිසා භාවනා පුහුණු කරන්නන් නොසන්සුන්, දුර්මුඛ සහ ඕනෑවට වඩා විනයක් පවත්වන්නට ඉඩ ඇත. වෙනත් නිකායන් අනුගමනය කරන්නන් සහ බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් අතර කැපී පෙනෙන වෙනසක් පසේනදී රජතුමා දුටුවේය. මුලින් සඳහන් කළ අය වැහැරුණු සහ දුක්ඛිත පෙනුමක් තිබුණේද කිවහොත්, 'කෙනෙකුට ඔවුන් නැවත දකින්නට කැමැති නැති' වන අතර, දෙවෙනියට සඳහන් කළ අය 'සිනහ වෙමින්, ප්‍රීතිසිතින්, ජයග්‍රාහී හැඟීම් පළකරමින්, සහ සතුටු දනවන, ප්‍රභාවත් පෙනුම හා ගුණයෙන්, සැහැල්ලුවෙන්, සාංකාවක් නොමැතිව, ඔවුන්ට ලැබෙන දෙයින් තෘප්තිමත් වෙමින්, සහ වනයේ වෙසෙන මුවෙකුගේ මනසකින් මෙන්' පෙනුණි (M.II,121). වරින් වර, බුදුපියාණන් වහන්සේ සමබර, පරිණත භාවනාවක් සතුට සමග සම්බන්ධ කළහ.

'සතුටු සිතක් ඒකාග්‍රතාවයට පැමිනේ' (සුඛිනො චිත්තං සමාධියන්ති), 'සිහිකල්පනාවෙන් යුක්ත පුද්ගලයා වඩාත් සතුටට පත් වේ' (සතිමා සුඛං එධති', 'දැන් දැන් සිතන්නට පුළුවනි' සමහර විට මෙම ක්ලේශ සහිත මානසික තත්ත්වයන් ඉවත්ව යනු ඇතැයි කියා ... යම් කෙනෙකු තවමත් අසතුටෙන් විය හැකිය. 'නමුත්, එය සැලකිල්ලට ගත යුත්තේ මෙසේ නොවේය. ක්ලේශ සහිත තත්ත්වයන් ඉවත්ව ගියොත් ... දැඩි සතුට සහ ප්‍රීති ප්‍රමෝදය, ශාන්ත භාවය, සිහිකල්පනාව සහ පැහැදිලි තත්ත්වය පමණක් පවතී, එය ප්‍රීතිමත් ස්වභාවයයි' (D.I,73; 196; S.I,208) .

තමන් සැබැවින්ම සිටින ආකාරය ඔවුන් විසින්ම දකින්නට උත්සාහ කරනවා වෙනුවට, සමහර භාවනායෝගීන්ට ඔවුන් 'සිටිය යුතු' සහ ඊට පසු ඔවුන් ඒ පරමාදර්ශයට අනුරූපවීම සඳහා මර්දනය සහ උපක්‍රම යෙදීමට තරම් හැඟීමක් ඇත. මෙහි ප්‍රතිඵලය බොහෝ විට ශාරීරික අනම්‍යතාවය - පීඩනයට ලක් වූ, සිනහ නොවන හැඟීම් පළ කිරීම, තදින් සීමාකරගත් පියවර ගැනීම් සහ දරදඬු ශරීරයකි. ඉතා සුළු නීතිරීති කෙරෙහි පවා දැඩි ආගමික හෝ සදාචාර රීති අනුගාමී සහ නොනැමෙන වෙනත් භාවනායෝගීහු ඔවුන්ගේ ආකල්ප සහ ධර්මය සහ භාවනාමය විධි වේදයන් පිළිබඳ අර්ථකථයන් සම්බන්ධයෙන් උද්ධච්ච මානසික දරදඬු ස්වරූපයක් ඇති කර ගනිති. තමන් කරන භාවනාව 'සම්පූර්ණයෙන්ම නිවැරදි' සහ අනෙක් අයගේ ක්‍රම, ඒවා සුළු වශයෙන් වෙනස් වුවද 'සම්පූර්ණයෙන්ම වැරදි' බවත් සඳහන් කරන එවැනි මිනිසුන්ගේ කථා අපට නිතරම අහන්නට ලැබේ.

එවැනි ශාරීරික සහ මානසික දරදඬුභාවය යහපත් ලකුණක් නොවේ. ඊට ප්‍රතිවිරුද්ධව, 'සැහැල්ලු වෙමින්, ජීවිතය විඳින්නට' (අප්පොස්සුක්ක පන්නලොම) සාර්ථක භාවනායෝගියෙකුට දැඩි විශ්වාසය ඇත. එසේම, ප්‍රමාදී නොවෙමින්, සහ ධර්මානුකූල සංකල්ප සහ භාවනාමය විධි වේද කෙනෙකුට විශේෂිත අරමුණක් කෙරෙහි යාම සඳහා උපකාරී වන ක්‍රියාවක් බව දැකීමට ඇති හැකියාව තිබිය යුතු අතර, තදින්ම පිළිපැදිය යුතු වෙනස් නොකළ හැකි ඒවා යැයි නොසිතිය යුතුයි.

සාර්ථක භාවනාවක් ක්‍රමයෙන් මමත්වය හීන කළ යුතුයි. කෙනෙකුගේ ආත්ම ප්‍රතිබිම්බය වැදගත් බවින් අඩුවිය යුතුය. තමන් කෙරෙහි ඇති අසුභවාදී හැඟීම් ඇතුළුව, නොඇලීම වැඩිවිය යුතුයි. එහි ප්‍රතිඵලයක් ලෙස, භාවනායෝගීන්ට වැඩිවෙන යථාර්ථවාදී සහ සැඟවුණු ඇත්ත දැකීමේ හැකියාවෙන් යුක්ත ස්වයං තක්සේරුවක් තිබිය යුතුයි. ඔවුන්ගේ අභ්‍යන්තර ජීවිතය පිළිබඳව විවෘත සහ අවංක විය යුතුයි. ආධ්‍යාත්මික මිතුරන්ගෙන් සහ ගුරුවරුන්ගෙන් උපදෙස් ලැබීමට ඔවුන් වඩාත් විවෘත විය යුතුයි. වැරදි පිළිගැනීමට වඩාත් සූදානම් විය යුතුයි. ඇගයීම පසුනොබාමින් සහ විවේචනය සැක නොවෙමින් පිළිගත යුතුයි. පරිණත වූ භාවනායෝගියා 'තමන්ගේ කෙලෙස් ඒ ආකාරයෙන්ම ගුරුවරයාට හෝ අත්දැකීම් බහුල භික්ෂුවකට හෙළි කිරීමට' කැමැත්ත දක්වන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.IV,189-90).

'හොඳම භාවනා විධි වේදය කුමක් ද ?' යන ප්‍රශ්නයට ඇති පිළිතුර නම් : 'ඔබ පුහුණු කරන භාවනාව තුළින්

ඉහත දක්වන ලද ගුණාංග වඩාත් ප්‍රත්‍යක්ෂ වේ නම්, ඔබට වඩාත් සුදුසු විධි වේදය එයයි. බලන්න **බාධා සහ ධ්‍යාන**

*Eight Mindful Steps to Happiness*, Bhante Henpola Gunaratana, 2001.

## අනාවැකිය

අනාවැකියක් (ආදෙසනා) යනු සාමාන්‍යයෙන් ආගමික සන්දර්භයක් තුළ, සිද්ධීන් අනාගතයේදී දැනගන්නට ලැබෙන්නේ කෙසේ ද කියා නිවැරදිව කලින් කියන විස්තරයකි. ක්‍රිස්තියානි ධර්මය බොහෝ විට අනාවැකිමය ආගමක් ලෙස විස්තර කර ඇත. පරණ තෙස්තමේන්තුවෙන් ජේසුස් වහන්සේගේ උපත හා වෘත්තීය ප්‍රගමනය පිළිබඳව හිතූ පරිදිම අනාවැකි පළ කරයි. අළුත් තෙස්තමේන්තුව මගින් ඔහුගේ දෙවන ආගමනය සහ ඊට පෙර සිදුවන අපූර්ව සිද්ධීන් පිළිබඳව අනාවැකි පළ කරයි. පැරණි ඉන්දියානු ආගමේ අනාවැකි පිළිබඳව කිසි විටක වැදගත් කමක් නැත. එසේම බුදුදහමේ ද කිසි වැදගත් කමක් නැත. ධර්මය ප්‍රධාන වශයෙන්ම සැලකිල්ලට ගන්නේ පුද්ගලයා සහ ඔහු හෝ ඇයගේ වර්තමාන අත්දැකීම් වන අතර, අනාගතය පිළිබඳව අනාවැකි පළ කිරීම් නොවේ. තවදුරටත්, සමහර ආගම් විශ්වාස කරන්නේ සිදුවීම් පිළිබඳව අනාවැකි කීමට ඇති හැකියාව මානව කටයුතුවලට අදාළව උත්තරීතර පුද්ගලයෙකුගේ සම්බන්ධයට සාක්ෂියක් බවයි. බුදුදහම එවැනි දේ දකින්නේ, ඒවා සැබැවින්ම සිදුවිය හැකි නම්, එය ක්ෂණිකව සිදුවිය හැකි විවිධ චිත්ත බලයන්ගෙන් එකක් බව හෝ භාවනාවෙන් දියුණු කර ගත් එකක් විය හැකි බවත්ය.

## ගණිකා වෘත්තිය

ගණිකා වෘත්තිය යනු ලිංගික උවමනාවට තමන්ගේ සිරුර විකිණීමයි. පැරණි ඉන්දියාවේ තවමත්, මිනිසුන් සලකනු ලබන්නේ ගණිකා වෘත්තිය 'පහත්ම වර්ගයේ ජීවනෝපාය බවයි' (අන්තිමජීවිකා, Mil.122). එය බොහෝ විට සම්බන්ධ වූයේ බීමත්කම නිසා හෝ අසංවර හැසිරීම නිසාය. රජගහ නුවර ගණිකාවක් සම්බන්ධයෙන් කල්ලි දෙකක් අතර ඇති වූ මතභේදයක් ප්‍රචණ්ඩත්වයට හේතුවීමෙන් සිදු වූ සිද්ධියක් ත්‍රිපිටකයේ සඳහන් වේ (Ud.71). එයට ලිංගික හැසිරීම සහ මුදල් හුවමාරුව, සම්බන්ධ වන නිසා, ගණිකා වෘත්තිය තුන්වන ශික්ෂාපදයට සහ බුදුපියාණන් වහන්සේගේ සම්මා ආජීව යන ඉගැන්වීම්වලට සම්බන්ධ වේ.

ගණිකා වෘත්තිය යන ගැටලුව දෙස බැලිය යුත්තේ ගණිකාව සහ පාරිභෝගිකයා සැලකිල්ලට ගනිමිනි. දළ වශයෙන් කිවහොත්, ගණිකාවන් වර්ග දෙකක් ඇත. 1. ගණිකා වෘත්තියට දුප්පත්කම හෝ සමාජීය අහිමි වීමෙන් බලෙන් තල්ලු වීම, 2. එය මුදල් ඉපයීමට පහසු සහ ලෙහෙසි ක්‍රමයක් නිසා එසේ කිරීමට තෝරා ගැනීමයි. පළමු වර්ගයේ අය වෙසඟන (වෙසියා) හෝ ගණිකාව (බන්ධකී), සහ දෙවන වර්ගයේ අය ගණිකාව (ගණිකා හෝ නගරසොභිනී) යනුවෙන් බෞද්ධ ධර්ම ග්‍රන්ථවල හැඳින් වේ. පළමුවැන්නේ අරමුණ සමහර විට හුදෙක් දිවි රැක ගැනීමට වන නිසා, කර්මානුරූපීව දෙවැන්නට වඩා බොහෝ අඩුවෙන් හානිදායකය. දෙවැන්නේ අභිප්‍රාය වන්නේ ලෝභය, අලසකම හෝ ආත්ම ගෞරවය නැති කමයි. පළමු වැන්නේ වැරදි

ජීවානෝපායකට කැමැත්තෙන් සම්බන්ධ නොවන අතර, දෙවැන්න පැහැදිලිවම වැරදි ජීවානෝපායකි.

දැන් පාරිභෝගිකයා පිළිබඳව කොහොම ද? පළමු වර්ගයේ ගණිකාවගේ පාරිභෝගිකයා අනිවාර්යයෙන්ම පළමු සහ තුන්වන ශික්ෂාපදය බිඳියි. ඔවුහු ලිංගිකව තවත් පුද්ගලයෙකුගෙන් අයුතු ප්‍රයෝජන ගනිති. දෙවන වර්ගයේ පාරිභෝගිකයාගෙන් තුන්වන ශික්ෂාපදය කඩ කිරීමක් සිදු නොවිය හැකිය. නමුත්, ඔවුන් ඔවුන්ට අධ්‍යාත්මිකව ප්‍රයෝජන ලැබිය හැකි ක්‍රියාකාරකමකට සම්බන්ධ වන්නේ නැති තරම්ය. සාමාන්‍යයෙන් කථාකරනවා නම්, ගණිකා වෘත්තිය පිළිකුල් සහ ආධ්‍යාත්මික හා මානසික දියුණුව ඇති නොකරන ක්‍රියාවකි. අවංක බෞද්ධයන් එවැනි දෙයකට සම්බන්ධ නොවනු ඇත.

බුදුපියාණන් වහන්සේට ආධාර කළ අම්බපාලී නමැති කාන්තාව වේසාලියේ ජීවත් වූ ධනවත් වෙසඟනකි. පසුව ඇය භික්ෂුණියක් වීමට එම වෘත්තිය අතහැරියාය (D.II,95). එක් රාත්‍රියකට ඔවුන්ගේ ඇසුර සඳහා කාසි 500ක් හෝ 1000ක් අය කළ ගණිකාවන් පිළිබඳව අපි ධර්ම ග්‍රන්ථවල කියවා ඇත්තෙමු (Vin.I,268-9).

'Remarks on the Third Precept: Adultry and Prostitution in Pali Texts.'Steven Collins, *Journal of the Pali Text Society*, Vol.XXIX, 2007.

## මායාකාරී ගැබිණිබව

මායාකාරී ගැබිණිබවක් යනු මනෝවිශ්ලේෂණ තත්වයකි. මෙම තත්ත්වයේදී පුද්ගලයෙකු ගැබිණි බවක් නැතිව ගැබිණි බවේ සියලුම ලක්ෂණ

ප්‍රදර්ශනය කරයි. මෙම තත්ත්වය වඩාත් සාමාන්‍යයෙන් දන්නේ මතුපිටින් පෙනෙන ගැබිණිබව යනුවෙනි. මායාකාරී ගැබිණිබව ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ දැනගන්නට ඇත. පැරණි ග්‍රීක වෛද්‍යවරයෙකු වූ හිප්පක්‍රට්ස් (460-377), එහි අවස්ථා කිහිපයක් විස්තර කර ඇත. තරුණ කුමරියක් වූ සුප්පවාසාට වසර හතක්, ගැබිණි බවේ ලක්ෂණ තිබී ඇත. අවසානයේ ඇය ගැබිණියක් වී දරුවෙකු ප්‍රසූත කළේ ඊට පසුවයි (Ud.15).

ව්‍යාජ ගැබිණිබව ඇති වන කාන්තාවන්ට ඔසප්වීම නතර වන අතර, සැබෑ ගැබිණිබවේදී හා සමානවම ඒ තරමටම උදරය ඉදිමීම ඇති වේ. ඔවුන්ගේ පියයුරු වඩා විශාල සහ මෘදු වේ. තනපුඩු ඉදිමේ. සමහර විට කිරි පවා ගලයි. එම තත්ත්වය බොහෝ කාලයක් පවතී නම්, ඔවුන්ට බලාපොරොත්තු වන කාලයේදී දරු උපතේදී ඇති වන වේදනා ද ඇති වේ. ව්‍යාජ ගැබිණි බව ඇති වන්නේ ගැබිණි වීමට ඇති බිය හේතුකරගෙන, ගැබිණි කෙනෙකු කෙරෙහි ඇති ප්‍රබල සංවේදනය හෝ ගැබිණියක් වීමට ඇති තීව්‍ර ආශාව නිසාය. සුප්පවාසාට ව්‍යාජ ගැබිණි බවක් ඇති වූයේ සමහර විට ඇයගේ සැමියා පුරුෂ ශක්තිය හීන හෝ තාවකාලිකව වඳ වූ අවස්ථාවක රජ පවුලෙන් උරුමක්කාරයෙකු ඵල දැරීම සඳහාවූ බලපෑම නිසා විය හැකිය.

ව්‍යාජ ගැබිණි බවේ සිදුවීම් තරම් සංකීර්ණ සහ ප්‍රබෝධක අයුරෙන් ශරීරය තුළට වෙනස්කම් බලාපොරොත්තුවක්, ආශාවක් හෝ සංවේදනයක් වැනි මානසික තත්ත්වයන්ට හේතුවිය හැකිනම්, කියනු ලබන ප්‍රාතිහාර්යමය සුව කිරීම් සහ අත්දැකීම්

ඒ හා සමානවම, දිව්‍යමය මැදිහත්වීම්වලට වඩා, මනස නිසා සිදුවේ යැයි සිතීමට හොඳ හේතුවක් ඇති බව බෞද්ධයෙකුට කිව හැකිය.

පුද්ගලයෙකුගේ මානසික තත්ත්වයට ඔසප්වීමේ ස්වභාවික චක්‍රය නැවැත් විය හැකිනම්, එවිට, එයට රෝගයකින් සුවය ලැබීමටද සත්තකින්ම උපකාර විය හැකිය. ගැබිණිබව අනුකරණය කරමින්, මනසට උදරය ඉදිමිය හැකි නම්, තැනක නොමැති දේ දකින්නට ඇසට සලස්වන්නත් හැකි බවට සැකයක් නැත. කෙනෙකු ගැබිණි යැයි හුදෙක් විශ්වාස කරමින්, පියයුරු ඉදිමවන්නට සහ කිරි ස්‍රාවය කරවන්නට හැකි නම්, එය දෙවියන්ගේ නියෝජනයක් ලෙස අර්ථකථනය කළ හැකි හැඟීම් පහසුවෙන්ම මවාපෑම කළ හැකිය. අසාමාන්‍ය අත්දැකීම් සඳහා මානසික හේතුවක් ඉදිරිපත් කිරීම අද්භූත දෙයක් විශ්වාස කිරීමට වඩා විචාරශීලී සහ සාක්ෂි මත පදනම් වූවකි. මෙයින් අදහස් වන්නේ, දෙවියන් වහන්සේ යනු සමහර ආගම්වලට වන අතර, මනස යනු බුදුදහමටයි. බලන්න **ප්‍රාතිහාර්යය**

‘Pseudocyesis: A Modern Perspective on an Old Disorder.’J. P. O’grady and M. Rosenthal, *Obstetrical & Gynecological Survey*, July 1989.

## චෛතසික බලය

චෛතසික බලය (ඉද්ධි) යනු ස්වභාව ධර්මයේ දන්නා නීතිවලට අනුකූල නොවන අයුරින් ක්‍රියා කිරීමට ඇති හැකියාව වේ. එය සිදුවන්නේ මනසේ බලය මුදා හැරීමෙන් හෝ දියුණු කිරීමෙන්ය. සමහර ආධ්‍යාත්මික වශයෙන් දියුණු වූ මිනිසුන්ට යම් චිත්තමය හැකියාවන් පහළ කළ හැකි බව බුදුපියාණන් වහන්සේ පිළිගත්හ. සැබැවින්ම

උන්වහන්සේත් ඉඳහිට ඒවා සමහරක් පහළ කළහ. බෞද්ධ ධර්ම ග්‍රන්ථවල සඳහන් ප්‍රධාන චෛතසික බලයන් නම්, සිතින් සන්නිවේදනය කිරීම, සිතේ බලයෙන් ද්‍රව්‍ය චලනය කිරීම, සෘද්ධිචාරය සහ සූක්ෂම ශරීරය කායික ශරීරයෙන් (D.I,77-9) වෙන් කිරීමට ඇති හැකියාවයි (මනොමයකාය).

චෛතසික බලය සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේට පරීක්ෂාකාරී ආකල්පයක් තිබුණි. මෙයට හේතුව, එවැනි බලයන් ඇති අය අතිවිශාල ප්‍රමාණයක් ආකර්ෂණය කර ගන්නා අතර, එය පහසුවෙන්ම දූෂණයට මෙහෙය වීමට ඉඩ ඇත. එසේම එවැනි බලයන් ඇත්තේ යැයි කියැවෙන බොහෝ අය සැබැවින්ම වංචාකාරයෝ වූහ. තවද, බුදුපියාණන් වහන්සේට හැඟී ගියේ, ගුණවත්බව, අවංකබව සහ මානසික පාලනයක් ඇති අය කෙරෙහි විශ්වාසය තැබීම, ධ්‍යාන බලයෙන් ඉහළ පාවෙන හෝ මනස කියැවීමට හැකියාවක් ඇති අයට වඩා නිවැරදි බවයි. මේ නිසා බුදුපියාණන් වහන්සේ භික්ෂුවක් හෝ භික්ෂුණියක් චෛතසික බලයන් දියුණු කර ඇත්නම්, ඒවා සඬ්ඝයාගෙන් අවසර නොලබා ගිහියන්ට ප්‍රදර්ශනය කිරීම හෝ අනෙක් අයට ඒ පිළිබඳව පැවසීම තහනම් කරමින් නීතියක් පැණවූහ.

වරක් එක් ධනවත් මිනිසෙක් වටිනා සඳුන් භාජනයක් නගරය මධ්‍යයේ ඉදි කරන ලද උණබම්බු කණුවක් මත තබා, ඒ කණුව මත තිබෙන භාජනය ගැනීමට එම කණුව මතට නැඟීමට හැකිවන පුද්ගලයාට එම භාජනය ලැබෙන බවට දැන්වූයේය. ධ්‍යාන බලයෙන් ඉහළ පාවෙන්නට හැකියාව දියුණු කළ එක්

භික්ෂුවක් එම අභියෝගය භාරගෙන එම භාජනය ගත්තේය. ඊට පසු ඔහු ගිය හැම තැනටම ඔහු අනුගමනය කරන්නන් සහිත විශාල පිරිස් යන්නට පටන් ගත්හ. මේ පිළිබඳව දැනගත් බුදුපියාණන් වහන්සේ එම භික්ෂුව කැඳවා, මෙසේ පවසමින් ඔහුට තරවටු කළහ: 'නුඹ කාලකණ්ණි කාසියක් ලබා ගැනීම සඳහා වෙළඳපොළට තමන් ප්‍රදර්ශනය කරන පහත් ගැහැණියක් මෙන්ය' (Vin.II,110-111). බලන්න **හාස්කම් සහ අණාවැකි කීම**

## පූජා

පූජාවක් යනු භක්තිමත් බෞද්ධයන් විසින් කරන ලද සරල චාරිත්‍රයකි. සාමාන්‍යයෙන් බුදු පිළිමයක් ඉදිරිපිට, බුදුපියාණන් වහන්සේගේ මතකයට ගෞරවය සහ බුහුමන් පුද කරනු ලැබේ. පූජා යන පාලි වචනය පැවත එන්නේ පූජ් යන මූලයෙනි. එහි අර්ථය 'බුහුමන් දැක්වීම' හෝ 'ගෞරව කිරීමයි'. පූජාවක් සිදු කරන විට, මල්, විදුලි පහන් සහ සුවඳ දුම් බුදු පිළිමයක් ඉදිරිපිට තැන්පත් කෙරේ. ඒවායේ සංකේතාත්මක වැදගත්කම සිහිපත් කෙරේ. ඊට පසු පද කිහිපයක් සජ්ඣායනය කරනු ඇත. ඒ අනුව, පූජා මෙනෙහි කිරීමක් සහ මානසික විශ්වාසයක මතුපිටින් පෙනෙන හැඟීම් පළ කිරීමකි. බලන්න **වැඳීම**

## සුනාපරන්තයේ පුණ්ණ

පුණ්ණ ඉපදුණේ සුනාපරන්ත රාජ්‍යයේ සුප්පාරක නගරයේය. දැන් හඳුන්වන්නේ මුම්බායේ උතුරු මුහුදුබඩ සොපර යනුවෙනි. ඔහු වෙළෙඳුන් සමග තවලමකින් සාවත්ථිය බලා ගමන් කළේය.

බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳව අසා, භික්ෂුවක් බවට පත්විය. ඔහු බුද්ධිමත් සහ උද්‍යෝගීමත් පුදුගලයෙකු බවට ප්‍රත්‍යක්ෂ විය. පුහුණුවීමෙන් පසු, ඔහු බුදුපියාණන් වහන්සේ හමුවී තමන්ට ධර්ම ප්‍රචාරය සඳහා තම ගමට යාමට ඇති කැමැත්ත ප්‍රකාශ කළේය. බුදුපියාණන් වහන්සේ ඔහුට මෙසේ පැවසුහ: 'සුනාපරනතයේ මිනිසුන් දරුණු සහ ප්‍රචණ්ඩය. ඔවුන් ඔබට බැණ වැදුණහොත් හෝ තර්ජනය කළහොත් ඔබ කුමක් කරන්නේ ද?' පුණ්ණ පිළිතුරු දුන්නේය 'ඔවුන් මට නොගැසූ නිසා කෙතරම් කරුණාවන්ත දැයි මම සිතමි'. 'ඔවුන් ඔබට පහර දුන්නොත්?' 'මට ගල් නොගැසූ ඔවුන් කෙතරම් කරුණාවන්ත දැයි මම සිතමි'. 'ඔවුන් ඔබට ගල් ගැසුවොත්?' 'ඔවුන් මට කෝටුවලින් නොගැසූ නිසා කෙතරම් කරුණාවන්ත දැයි මම සිතමි'. 'ඔවුන් ඔබට කෝටුවලින් ගැසුවොත් ?' 'ඔවුන් මට ආයුධයකින් පහර නොදුන් නිසා කෙතරම් කරුණාවන්ත කියා මම සිතමි'. 'ඔවුන් ඔබට ආයුධයකින් පහර දුන්නොත් ?' 'ඔවුන් මා නොමැරූ නිසා, කෙතරම් කරුණාවන්ත දැයි මම සිතමි'. 'සුනාපරන්තයේ මිනිසුන් ඔබ මරා දැම්මොත් ඔබ කුමක් සිතන්නේද?' 'මා මරා දැම්මොත්, ඔබවහන්සේගේ සමහර ශ්‍රාවකයන් ඔවුන්ගේ ශරීර ගැන පිළිකුලට පත්ව, සිය දිවි නසාගත් බව මම මතක් කරමි. මෙතැන මම එසේ කිරීමක් නොමැතිව මරන්නට නියමිත යැයි සිතමි'. 'අතිවිශිෂ්ටයි පුණ්ණ, අතිවිශිෂ්ටයි !. එතරම් ආත්ම සංයමයක් සහ සන්සුන් බවක් ඇතිව, ඔබට සුනාපරන්තයේ මිනිසුන් අතර, ජීවත් විය හැකිය. එහි ගොස්, ඔබට හොඳම දේ කරන්න' (M.III,267-9).

මෙම කථාව නැවත විස්තර කරමින්, දිව්‍යාවදානයේ, බුදුපියාණන් වහන්සේ පවසන්නේ මෙසේය 'යන්න පුණ්ණ! නිදහස් වන්න!, ඊට පසු අනෙක් අය නිදහස් කරන්න! තරණය කරන්න!, ඊට පසු අනෙක් අයට තරණය කිරීමට උපකාර කරන්න!. ප්‍රබෝධමත් වන්න!, ඊට පසු අනෙක් අය ප්‍රබෝධමත් කරන්න!. නිර්වාණය අවබෝධ කර ගන්න!. ඊට පසු අනෙක් අයට නිර්වාණය අවබෝධ කර ගැනීමට උපකාර වන්න!. අවසානයේ පුණ්ණ ඔහුගේ ගම බලා පිටත්වී මාස කිහිපයක් තුළ දී දහස් ගණන් මිනිසුන් බුදුදහමට බඳවා ගෙන නිර්වාණය අත්පත් කර ගන්නට මග සැලසුවේය.

අන්‍යයන්ට සේවය කිරීමට කැමැත්තක් ඇතිව ධර්මදූත සේවයේ යෙදුණු භික්ෂුවක ලෙස දැක්වීමට පුණ්ණ භික්ෂුව විශිෂ්ට උදාහරණයකි. උන්වහන්සේට ආත්ම සංයමය සහ සන්සුන් (දමූපසම), ධෛර්යය (ධිති), අධිෂ්ඨානය (අධිට්ඨාන) සහ අන් සියල්ලටමට වඩා, ධර්මය සඳහා දැඩි උද්‍යෝගයක් තිබුණි. එසේ කිරීමේදී සාර්ථක වන්නේ ඔවුන්ට ධර්මය කෙරෙහි ඇති දැඩි උද්‍යෝගය (ධම්මකාමො භවං හොති, *hoti*, Sn.92) නිසා බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. පසුකාලීන ශතවර්ෂවලදී, පුණ්ණ තෙරුන්ගේ උදාහරණයෙන් ප්‍රබෝධමත් වී, ඉන්දියානු භික්ෂූහු ධර්මය ආසියාවේ තව දුරටත් විහිදිය හැකි ප්‍රමාණයටම ව්‍යාප්ත කිරීම සඳහා අනතුරු සහ දුෂ්කරතාවලට මුහුණ දුන්හ.

## නිරය

නිරය යනු මරණයෙන් මතු සදාකාලිකව දඬුවම් තක්සේරු කර කරන විෂය පථයක් හෝ තත්ත්වයක් ලෙස ක්‍රිස්තියානි ධර්මයේ ඉගැන්වෙයි. බුදුදහම සදාකාලික නිරයක පැවැත්ම ප්‍රතික්ෂේප කරන අතර, පාළියෙන් නිරය යන වචනය සිංහලෙන් අපායක් තිබෙන බවට උගන්වයි. බුදුදහමේ අපායට විවිධ වචන ඇත. ප්‍රධාන වචනය වන්නේ 'නැතිවීම' (අපාය), 'දුෂ්කර මාර්ගය) (දුග්ගති), 'පහළට බැසීම' (නරක සහ නිරය) සහ 'විනාශය' (විනිපාත), යනුවෙනි. අවීචි, යන නම අපායට, බෞද්ධ ධර්ම ග්‍රන්ථවල සහ පසුකාලීන බෞද්ධ සාහිත්‍යයේ බොහෝ විට භාවිත වී ඇත. සූත්‍රවල පවතින්නේ එක් වරක් පමණි (It.86).

අපාය, සත්ත්වයන් නැවත ඉපදිය හැකි විෂය පථ හෝ ජීවත්වන තත්ත්වයන් හයෙන් එකක් පමණි. අනෙක් ඒවා දිව්‍ය ලෝක, මිනිස් ලෝකය, සත්ත්ව ලෝක, ඊර්ෂ්‍යාකාරී ප්‍රේත ලෝක (අසුර) සහ කුසගින්නෙන් පෙළෙන ප්‍රේත ලෝක (පෙත) ආදී වශයෙනි. නැවත ඉපදෙන්නට හැකියාව ඇති විෂය පථ සමගින්, නිරය දිව්‍ය ලෝකයට ඇති එකම ආදේශකය නොවේ. බුදුදහමේ මූලික අභිප්‍රාය වන්නේ දිව්‍ය ලෝකයේ හෝ සැබැවින්ම වෙනත් කිසියම් විෂය පථයක ඉපදීමත් නොවේ, නමුත්, කොහෙත්ම නොඉපදීමයි. දිව්‍ය ලෝකයේ හෝ මිනිස් ලෝකයේ නැවත ඉපදීම අපායේ ඉපදීමට වඩා සත්තකින්ම වඩා හොඳය. නමුත්, මරණය සහ නැවත ඉපදීම යන ක්‍රියාවලිය අවසාන කිරීම, එනම් නිර්වාණයට පැමිණීම වඩා හොඳය.

බොහෝ විවිධ අපායන් පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වේ. අසිපත්තවන, ගූථ, ඛාරොදකා, නාඩී, කුක්කුළ සහ සිම්බලිවන එක් ලැයිස්තුවක සඳහන් වෙයි. (M.III,185) දීර්ඝ සහ විවිධ ලැයිස්තුවකින්, අබබ, අබ්බුද, අතතථ කුම්බ, නිරබ්බුද, පදුම, පුණ්ඩරීක, සොගන්ධික සහ උප්පලක යනුවෙන් විස්තර කෙරේ (S.I,149; A.V,173). සූත්‍රවලින් විවිධ අපායන් පිළිබඳව ලබා දෙන්නේ ඉතා කෙටි විස්තර පමණි. නමුත්, ඒවායේ සමහර නම් මතකය අවුස්සයි. උදාහරණ වශයෙන්, ගූථ, අදහස 'මලපහ' හෝ 'අපවිත්‍ර දේ', සහ සිම්බලි ද කඳේ සහ අතුවල තියුණු කටු ගසක නමකි. අනෙක් නම්වලින් අදහස් කරන්නේ අප්‍රසන්න බව බොහෝ දුරට අඩු, පදුම, පුණ්ඩරීක, සොගන්ධික සහ උප්පලක සහ ලිලී මල්වලට සහ නෙළුම් මල්වලට පොදු නම් වේ.

බෞද්ධ නිරය ක්‍රිස්තියානි ධර්මයේ නිරයෙන් බොහෝ වැදගත් ආකාරයෙන් වෙනස් වේ. 1. කිසිවෙකු මියගිය අය විනිශ්චය නොකරයි, ඔවුන් නිරයට වැනේනට ඉඩ නොසලසයි. ඊට වඩා, එක් එක් පුද්ගලයා තමන්ගේ වර්තමාන ජීවිතයේ දී ඇති කර ගන්නා කුණාත්මක සිතුවිලි සහ ක්‍රියාවලින් ඔවුන් විසින්ම කුණාත්මක දෛවයක් නිර්මාණය ගනියි, එනම්, ඔවුන්ගේ කර්මයයි. 2. අපාය සදාකාලික නොවේ, නමුත්, සෑම පවත්නා තත්ත්වයක් මෙන්ම සීමිත සහ අස්ථිර වේ. අපායේ ජීවිත කාලය අවසන් වූ විට, ජීවියෙකු තවත් තත්ත්වයක නැවත උපදී. නිමක් නැති නිරයක් පිළිබඳ අදහස, යුක්ති සහගත සහ කරුණාවන්ත යැයි කියනු ලබන දෙවි කෙනෙකුගේ යථාර්ථය

ගැන බෞද්ධයෙකුට බරපතල සැක මතු කරයි.

3. අපාය පිළිබඳ මැවුම්කාර දෙවියන් පිළිබඳ සංකල්පයට අනුව, අපායේ දුක් විඳීම 'දඬුවමක්' නොවේ. නමුත්, මීට කලින් සඳහන් කළාක් මෙන්ම, කෙනෙකුගේ සෘණාත්මක ක්‍රියාවල ප්‍රතිඵල වේ. 4. කෙනෙකු අපායේ නැවත උපදිනවා ද නැද්ද යන්න නිර්ණය වන්නේ ප්‍රධාන වශයෙන් එම පුද්ගලයාගේ ආගමික විශ්වාස නොවේ, නමුත් ක්‍රියාවන්ය. ඒ අනුව, ගුණවත්, සික්වරුන්, යුදෙව්වන්, ටාඕවරුන් හෝ අදේවවාදීන්ට යහපත් නැවත උත්පත්තියක් ලැබිය හැකි වන අතර, තමන් බෞද්ධයන් යැයි හඳුන්වා ගන්නා දුරාචාරී හෝ දුෂ්ට මිනිසුන් අපායේ උත්පත්තිය ලැබිය හැකිය.

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ සමහර ප්‍රකාශවලින් අපාය සැබෑ ස්ථානයක් ලෙස හැඟවූහ. මේ අතර, සමහර අවස්ථාවලදී එය වඩාත් මනසේ තත්ත්වයක් ලෙස විස්තර කළහ. උදාහරණ වශයෙන්, උන්වහන්සේ මෙසේ පැවසූහ 'මෝඩයන් කියන්නේ අපාය තියෙන්නේ මුහුද යට බවයි. නමුත් මා කියන්නේ අපාය යනු සැබැවින්ම දුක්සහිත අත් දැකීම්වලට නමක් බවයි' (S.IV,206). බලන්න **අවතාර**

(S.IV,206)

*Heaven and Hell in Buddhist Perspective*, B. C. Law, 2004.

## රාහුල

රාහුල බුදුපියාණන් වහන්සේගේ එකම දරුවාය (A.I,24). ඔහුට මෙම නම තබන්නට ඇත්තේ ඔහු ඉපදී ඇත්තේ චන්ද්‍ර ආලෝක ග්‍රහණයක් (රාහු) තුළදී හෝ එසේ ඇතිවෙන සමීපයේදී නිසා විය හැකිය. සම්ප්‍රදායට අනුව, බුදුපියාණන් වහන්සේ අභිනිෂ්ක්‍රමණය කර භික්ෂුවක බවට පත් වී උන්වහන්සේගේ සත්‍ය සොයා යෑමේ ගමනට අවසාන වශයෙන් තීරණය කළේ රාහුලගේ උත්පත්තියත් සමගමය. වසර හතකට හෝ අටකට පසු, බුදුපියාණන් වහන්සේ නැවත කපිලවත්ථුවට පැමිණ, රාහුල හමුවී, සාරිපුත්ත හිමියන් වෙත රාහුල සාමණේර භික්ෂුවක ලෙස පැවිදි කර, උන්වහන්සේ නැවත වඩින විට රාහුල හිමියන් ද කැටුව ගියහ. මෙය සිදුහත් කුමාරයාගේ බිරිඳ සහ පියා වූ සුද්ධෝදනට සෑහෙන වේදනාවක් ඇති කළේය. ශුද්ධෝදන කියා සිටියේ දරුවෙකු හෝ මුනුබුරෙකුගෙන් වෙන්වීමෙන් ඇති වෙන පාඩුව, 'සම, මාංශ පේශීන්ට, මසට, අස්ථිවලට කපා දමන බවයි. එය ඇමිදුළුවලට පවා කපා දමන බවයි' (Vin.I,83). සමහර විට තමන් වහන්සේගේ පුත්‍රයාට ඔහු නිවසේ සිටියා නම් ලැබීමට තිබෙන්නට දේට වඩා ආධ්‍යාත්මය මත පදනම් වූ අධ්‍යාපනයක් උන්වහන්සේට දිය හැකි යැයි බුදුපියාණන් වහන්සේ සිතන්නට ඉඩ ඇත. රාහුල හිමියෝ ඉතා හොඳින් සංවර වූ භික්ෂුවක ලෙස වැඩී අවසානයේ රහත් ඵලයට පත් වූහ. උන්වහන්සේ මෙසේ පැවසූහ. 'හේතු දෙකකට ''රාහුල වාසනාවන්තයා'', යැයි ඔවුහු

මා හඳුන්වති', ඒ මම බුදුපියාණන් වහන්සේගේ 'පුත්‍රයා වන නිසා, සහ මම සත්‍යය සමග එක් වන කෙනෙකු බැවිනි' (Th.295). ස්වල්ප වූ අසම්පූර්ණ තොරතුරු හැර, ත්‍රිපිටකයේ රාහුල පිළිබඳව ලබා දී ඇත්තේ තොරතුරු ස්වල්පයකි. බුදුපියාණන් වහන්සේ මජ්ඣිම නිකායේ සිදු කර ඇති ධර්ම දේශනා තුනකින් රාහුල හිමියන් ආමන්ත්‍රණය කර ඇත (M.I,414; 421; III,277).

*Great Disciples of the Buddha*, Nyanaponika and Hellmuth Hecker, 1997.

## වැස්ස

අහසින් ජල බිංදු වැටෙන විට, එය වැස්ස (වස්ස හෝ වුට්ඨි) යැයි කියනු ලැබේ. බුදුපියාණන් වහන්සේ වැඩ සිටි සමයේ පැවතුණේ ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික සමාජයක් නිසා වැස්ස අතිශයින් වැදගත් විය. බුදුපියාණන් වහන්සේගේ නිරීක්ෂණයේ මෙය පිළිබිඹු විය.'මවක් තම එකම දරුවා පෝෂණය කරන්නේ යම් සේ ද, එසේම වැස්ස මන්දෝත්සාහී සහ දිරිමත් යන දෙකම පෝෂණය කරයි. සියලු පොළොවට සම්බන්ධ සත්ත්වයන් පෝෂණය වන්නේ වැස්ස වැටීමෙනි' (S.I,44). සරල මිනිසුන් විශ්වාස කළේ වැස්ස ඇති වූයේ විත්ථීභූත නමැති වැස්සට සම්බන්ධ ආත්මයන් විසින් බවයි. නමුත්, ශක්‍ර සහ වස්සවලාහකදෙවරාජ, වැහි වලාකුළු රජුටත් එය එසේ කළ හැකිය (Ja.I,330). බුදුපියාණන් වහන්සේ විවිධ වර්ගයේ වලාකුළු ගැන කථා කළ අතර, ඒවා යම් ආකාරයකින් වලාකුළු සැකැසීම පිළිබඳ නූතන කාලගුණ විද්‍යාත්මක වර්ගීකරණයට සමාන වේ. බුදුපියාණන් වහන්සේ සඳහන් කළ වර්ග පහ නම්, සිසිල් වලාකුළු (සීත),

උණුසුම් වලාකුළු (උණ්හ), කුණාටු හෝ ගොරවන වලාකුළු (අබ්භ හෝ ථනෙති), සුළං හමන වලාකුළු (වාත), සහ වැහි වලාකුළු (වස්ස, S.III,254). වැස්ස වැටෙන්නේ අඩුම ගණනේ ආකාර දෙකකට බව බුදුපියාණන් වහන්සේ දුටුවහ, මෝසම් මහ වැස්ස කාලයේ මෙන් (A.I,243; S.I,104) විශාල බින්දු (ථුල්ල ඵුසිතක) සහ කෙළ ගසන විටදී මෙන් විසිරී යන බින්දු (එකං එකං) වශයෙනි. වැස්ස නැති වීමට හේතුව රස්නය, සුළං හෝ වලාකුළු මුහුදෙන් ඔබ්බට ගසාගෙන යාම වැනි හේතු නිසා බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.III,243). පැරණි ඉන්දියානුවන් විශ්වාස කළේ පාලකයෙකුගේ විශාල ලෙස පැතිරුණු දුරාචාරය හෝ අයුක්ති සහගත බව වැස්ස කඩා කප්පල් කරන බවයි. බුදුපියාණන් වහන්සේ ද මෙම විශ්වාසයට දායක වූහ.

ජාතක කතාවල මෙසේ සඳහන් වේග 'නරක රජෙකු නිසා වැරදි වේලාවට වැසි වසියි, හරි වේලාවට වැසි නොවසියි' (J.II,124). නියඟයක් සලකන්නේ වසංගත සහ අවුල් ඇති කරන ආපදාවක් ලෙසයි. හොඳ හෝ නරක වර්ෂාපතනයක් ගැන අනාවැකි පළ කරන්නට හැකි යැයි සමහර පැවිද්දන් මිනිසුන්ගේ අසහනයට හානිකර බලපෑම් ඇති කළහ (D.I,11).

කාලගුණය රෝගවලට සාධකයක් ලෙස පැරණි ඉන්දියානුවෝ හඳුනා ගත්හ (Vin.I,199). මෙය විශේෂයෙන්ම වැසි සෘතුවේ සත්‍යයක් විය. සිසිල් හදිසි සැඩ සුළඟ, අධික තෙතමනය සහ ජලය සැමතැනම රැඳී තිබීමෙන් අදහස් වන්නේ උණ, සමේ අසනීප සහ ජලය ආශ්‍රිත රෝග වන අතර, ඒවා බොහෝ සෙයින් මේ කාලයේ ව්‍යාප්ත වේ.

බුදුපියාණන් වහන්සේට අවසානයේදී පරිනිර්වාණයට හේතු වූ රෝගය වැළඳුණේ ද වැසි ඍතුවේ ය (D.II,99).

උතුරු ඉන්දියාවේ සාමාන්‍යයෙන් වැසි වහින්නේ මෝසම් ඍතුවේදී පමණය. ඒ ජූනි සහ සැප්තැම්බර්වලදීය. බුදුපියාණන් වහන්සේට ශතවර්ෂ ගණනාවක් පෙරදී, මෙම කාලයේ දී විවිධ නිකායන්වල ඔබමොබ යන තවුසන් අතර සම්ප්‍රදාය වූයේ පිටත නොගොස් ඇතුළතට වී වැඩ සිටීමයි. එයට හේතුව වූයේ, මඩ සහිත පාරවල්, උතුරා ගිය ගංගා සහ සැම තැනම එකතුවූ ජලය සංචාරය දුෂ්කර කරන්නට විය. බුදුපියාණන් වහන්සේ මෙම චාරිත්‍රය පිළිගත්හ. ඊට පසු එය ක්‍රමයෙන් භික්ෂූන් සහ භික්ෂුණීන් අතර ස්ථීර නීතියක් බවට පත්විය. වස් වැසීම (වස්සං වසති, Vin.III,10) සාමාන්‍යයෙන් ආරම්භ වන්නේ ආසළ්හ මාසයේ පසළොස්වකට පෙර දිනයේ දීය. විධිමත් උත්සවයකින් භික්ෂූහු ඊළඟ මාස තුන තෝරාගත් ස්ථානයක රැඳී සිටීමට පොරොන්දු වෙති. අවට ගිහි පිරිස එම භික්ෂූන්ගේ අවශ්‍යතා සැපයීමට පොරොන්දු වෙති. වස්සාන කාලය අවසානයේ දී කඨින නමැති උත්සවයක් පැවැත් වේ. ඒ අවස්ථාවේ ගිහි පිරිස භික්ෂූන් වහන්සේලාට සිවුරු සහ ඉදිරි මාස නමය පයින් වැඩීම සඳහා අවශ්‍ය වෙනත් අවශ්‍ය දේ පූජා කරති. ථේරවාදී රටවල භික්ෂූහු තවමත් වස්වැසීමේ චාරිත්‍ර පවත්වති. බෞද්ධ දිනදර්ශනයේ මෙම උත්සව ආරම්භය සහ අවසානය සලකුණු කිරීම වැදගත් වේ.

**රාජගහ**

රාජගහ යනු 'රජුගේ වාසස්ථානයයි'. එය මගධයේ අගනුවරයි. එසේම මධ්‍යම දේශයේ විශාලතම නගරය සහ බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ බොහෝ සිද්ධීන් සිදු වූ ස්ථානයයි. මෙම නගරය කොටස් දෙකකින් යුක්ත විය. කඳුකරයේ ඉදි කළ පැරණි නගරය සහ කඳුකරයේ උතුරට ස්වල්ප දුරක තැනිතලාවක පිහිටි නව නගරයයි. මේ ස්ථාන දෙකම විශාල ප්‍රාකාරවලින් වටවී තිබුණි. අදටත් ඒවා දැකගත හැකිය. නගරය වටා ඇති බොහෝ ස්වාභාවික සහ මිනිසුන් විසින් ඉදිකරන ලද ඉම් සලකුණුවල ලස්සන බුදුපියාණන් වහන්සේ ඇගයූහ (D.II,116). උන්වහන්සේ ඉතා ප්‍රිය කළ වෙළුවනාරාමය සහ ගිජ්ඣකූට පර්වතය පිහිටියේ නගරයේ නැගෙනහිර දොරටුවට යම්තම් ඔබ්බෙන්ය. ත්‍රිපිටකයේ සඳහන් රජගහ නුවර විවිධ ස්ථාන පුරාවිද්‍යාඥයන් විසින් හඳුනාගෙන සහ කැණීම් කටයුතු කර ඇත. දැන් රජගහ නුවර හැඳින්වෙන්නේ රාජ්ගිර් යනුවෙනි. පිහිටියේ නූතන උතුරු ඉන්දියානු බිහාර් රාජ්‍යයේය. බලන්න **ගුහා**

'Rajagaha in Ancient Literature.'*Memoirs of the Archaeological Survey of India*, 1938.

## හේතුධර්ම වාදය

හේතුධර්ම වාදය යනු දැනුම ලබා ගත හැක්කේ මනුෂ්‍ය හේතුවක් මත පමණක් යැයි යන දාර්ශනික න්‍යායයයි. සමහර උද්‍යෝගිමත්, නමුත්, දැනුමක් නැති බෞද්ධයන් කියන්නේ බුදුපියාණන් වහන්සේ හේතුධර්මවාදියෙකු සහ බුදුදහම 'සම්පූර්ණයෙන්ම හේතුධර්මවාදයක්' බවත්ය. බුදුදහමේ සමහර විට බොහෝ ආගම්වලට වඩා වැඩියෙන් ප්‍රබල තාර්කික මූලද්‍රව්‍ය නැත. බුදුදහම සම්පූර්ණයෙන්ම තර්කාන්විත යැයි කීම අතිශෝක්තියකි. සම්පූර්ණයෙන්ම තර්කය

මත විශ්වාසය තැබීමෙන් සිතුවිලිවල ක්‍රියාවලියන්ට කැමැත්ත සහ පටු අදහස්වලින් ඇතිවන සියුම් බලපෑම් පිළිබඳව බුදුපියාණන් වහන්සේ හොඳින් දැන සිටියහ.

තර්කානුකූල තර්කනයෙන් (තක්කහේතු) සහ අනුමාන තර්කනයෙන් (නයහෙතු) පමණක් ප්‍රමාණවත් දැනුම් ක්‍රමයක් නොවන බවට බුදුපියාණන් වහන්සේ කාලාම සූත්‍රයෙන් උපදෙස් දුන්හ (A.I,189). බුදුපියාණන් වහන්සේට අනුව, දැනුම හෝ ප්‍රඥාව අත්පත් කර ගන්නට, කරුණු තුණක් කාර්යභාරයක් ඉටු කළ යුතුයි. ඒ අධ්‍යාපනය තුළින් ලබාගත් තොරතුරු (සුතමයා පඤ්ඤා), පරිස්සමින් සලකා බලා ලබා ගත් තොරතුරු (චින්තාමයා පඤ්ඤා) සහ භාවනාවෙන් ලබාගොත් තොරතුරු (භාවනාමයා පඤ්ඤා, D.III,219) යනුවෙන් හැඳින්වේ.

## නැවත ඉපදීම

පළමු බෞද්ධයන් ජීවිතය සලකනු ලැබුවේ විඤ්ඤාණයේ ක්‍රියා සන්තතිය ශරීරය හරහා අනුපිළිවලින් එහා මෙහා වීමක් ලෙසයි. මරණය මෙම ක්‍රියා සන්තතියේ ක්ෂණික සිදුවීමක් පමණි. මෙම සංසිද්ධි සමහර විට හැඳින්වෙන්නේ 'පැවැත්මකට පසු පැවැත්මක්'(Sn.1060), 'දරුගැබකින් දරුගැබකට යෑමක්' (Sn.278,) වශයෙනි, හෝ වඩාත් හරියටම, 'නැවත වෙනවා' (පුනබ්භව, D.II,15) පසුකාලීන අභිධර්ම චින්තකයන් නැවත ඉපදීමේ ක්‍රියාවලිය පැහැදිලි කළේ, සංකීර්ණ සහ ඉතා සුළු විස්තරයකිනි. මුල්කාලීන බෞද්ධයන් විෂය සමග කටයුතු කළේ කෙටියෙන් සහ සාපේක්ෂ සරල

බවෙනි. ශාරීරික, වාචික සහ මානසික ක්‍රියාකාරකම් නතර වූ විට, ඕජෝගුණය සහ උෂ්ණය නතර වූ විට, විඤ්ඤාණය ශරීරයෙන් වෙන් වී ජීව ක්‍රියාකාරීත්වය නතර වීමෙන් මරණය සිදු වූ බවට බුදුපියාණන් වහන්සේ සැලකූහ (M.I,296). විඤ්ඤාණය 'ඉහළට ගමන් කරයි' (උද්ධගාමී), ඊට පසු දරුගැබකට, එනම් මවකගේ අලුතින් සංසේවනය වූ ඩිම්බයකට (D.III,103; S.V,370) 'පහළට බසියි' (අවක්කන්ති), ඊළඟට 'විවේක ගැනීමට ස්ථානයක්' (පතිට්ඨා, D.II,63) එහි සොයයි. මෙම අවකාශමය විස්තරය සමහර විට සංකේතනයක් පමණක් වේ.

සමහර බෞද්ධ ගුරුකුලවලින් උගන්වන්නේ මරණයෙන් පසු විඤ්ඤාණය උඩ කරකැමෙන් රැඳී සිටින බව හෝ අතරමැදි තත්ත්වයක නැවත ඉපදීමට පෙර යම් කාලයක් නතර වන බවයි. තවත් අය ස්ථිරව ප්‍රකාශ කරන්නේ විඤ්ඤාණය ශරීරයෙන් වෙන් වූ මෙහොත තුළම නැවත ඉපදීම සිදුවන බවයි. මරණය සහ නැවත ඉපදීම අතර අන්තරයක් තිබෙන බව ත්‍රිපිටකයේ සඳහන් වේ (S.IV,73; 400; V,69). විඤ්ඤාණය එක් ජීවිතයක් සහ ඊළඟ එක අතර මාරුවන විට, එය ගන්ධබ්බ (M.I,265) වශයෙන් හැඳින් වේ. බොහෝ මිනිසුන්ට මරණය සහ ඇත්තෙන්ම නැවත-පුද්ගලබවක් ඇති වන විට සමස්ත ක්‍රියාවලියම ඔවුහු අවිඥානක (අසම්පජඤ්ඤ) වේ. නමුත්, ආධ්‍යාත්මිකව දියුණු වූ පුද්ගලයන්ට මාරුවීම තුළදී සම්පූර්ණ අවබෝධයෙන් රැඳී සිටිය හැකිය (D.III,103).

බුරුමය සහ ශ්‍රී ලංකාව වැනි පාරම්පරික බෞද්ධ රටවල තරුණ දරුවන් ඉඳහිට ප්‍රසිද්ධ අවධානයට පැමිණ ඔවුන්ට ඔවුන්ගේ පෙර ජීවිත මතක බවට

ප්‍රකාශ කර ඇත. මෙම දරුවන්ගෙන් සමහරක් වර්ජිනියා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඉයන් ස්ටීවන්සන් පරෙස්සමින් අධ්‍යයනය කර ඇත. ඔහුගේ *Cases of the Reincarnation Type*, Vol.I,1975; Vol.II,1978; Vol.III, 1980 and Vol.IV,1983 වශයෙන් අධ්‍යයනය විශ්වවිද්‍යාලයෙන් ප්‍රකාශයට පත් කර ඇත. බුදුපියාණන් වහන්සේට අනුව, සමහර පුද්ගලයන් නිර්වාණයට පත්වන්නට ඉතා ආසන්නව, පෙර ජීවිත පිළිබඳව දැනුමක් යනුවෙන් හැඳින්වෙන (පුබ්බේ නිවාසානුස්සති, D.I,81) අත්විඳ ඇත. මෙම අත්විඳීම තුළ දී, එම පුද්ගලයන්ගේ පෙර ජීවිතවල තීව්‍ර සහ විස්තරාත්මක මතකයන් මනස හරහා හදිසියේ මතුවෙයි. බලන්න **අනත්තා සහ නැවත ඉපදීම, පුනරුත්පත්තිය, අවබෝධ, The Three** and **Wager Argument**.

## තිසරණය

රැකවරණය (සරණ) යනු සාමය, ආරක්ෂාව සහ සුරක්ෂිත බව සොයමින් පුද්ගලයෙකු යන ස්ථානයකි. සංසාරයේ නිරන්තරව සිදුවන නැවත ඉපදීම සිත් ඇදනොගන්නා බලාපොරොත්තුවක් ලෙස බෞද්ධයන් සලකන අතර, බුද්ධ, ධම්ම සහ සඞ්ඝ මෙයින් රැකවරණයක් ලෙස විශ්වාස කරති. මේ අනුව, බුද්ධ, ධම්ම සහ සඞ්ඝ බොහෝ විට හැඳින්වෙන්නේ තිසරණය වශයෙනි. බුදුන් රැකවරණයක් වන්නේ බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වයට පත්වීම එයට සංසාරය ඉක්මවා යා හැකි බව පෙන්වන නිසායි. ධර්මය රැකවරණයක් වන්නේ නිර්වාණයට පත් විය හැක්කේ කෙසේ ද කියා එයින් පෙන්වා දෙන නිසාය. සඞ්ඝයා

රැකවරණයක් වන්නේ එයින් මාර්ගෝපදේශ, ධෛර්යය, සංසාරය ඉක්මවා යන්නට අවශ්‍ය සහාය ලබා දෙන නිසාය.

පුද්ගලයෙකු බෞද්ධයෙකු වන්නට තීරණය කරන විට, ඔහු හෝ ඇය සරල ප්‍රකාශයක් සජ්ඣායනය කරයි. එයින් ඔහු හෝ ඇය තුන් සරණ කෙරෙහි ඇති තමන්ගේ විශ්වාසය සහ කැපවීම ස්ථිර කරයි. එම ප්‍රකාශය පහත දැක් වේ -

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සඞ්ඝං සරණං ගච්ඡාමි

මෙයින් අදහස් වන්නේ: 'මම බුදුන් සරණ යමි. ධර්මය සරණ යමි. සඞ්ඝයා සරණ යමි.' මෙම ප්‍රකාශය සාමාන්‍යයෙන් තෙවරක් නැවත කියනු ලැබේ.

බුදුපියාණන් වහන්සේ පිරිණිවන් පෑමට සති කිහිපයකට පෙර, තමන්වහන්සේගේ පරිනිර්වාණයට ඉක්මණින්ම ළඟාවෙන බව භික්ෂූන්ට දැන්වූහ. ඊට පසු උන්වහන්සේ මෙසේ පැවසූහ: 'එමනිසා මහණෙනි, ඔබටම හුදෙකලා වන්න, ඔබටම සරණක් වන්න, කිසිවෙකු ඔබගේ සරණ කර නොගන්න. ධර්මය ඔබගේ දූපත කරගන්න, ධර්මය ඔබගේ සරණ කර ගන්න, වෙනත් කිසිම සරණක් නොපතන්න.' (D.II,101). තුන් සරණ යෑමේ අදහස පරස්පර දෙයක් ලෙස මෙයින් පෙනෙන්නට හැකිය. නමුත්, සමහර විට එයින් අදහස් වන්නට ඇත්තේ ධර්මයට වෙනත්

කිසිම මනුෂ්‍ය ගුරුවරයෙකුට හෝ නිර්වාණයට පත් වූ අයෙකුට පවා වඩා ප්‍රමුඛතාව දීමට දිරිගැන්වීමක් විය හැකිය.

හින්දු බැතිමතෙකුට උපනයන නමැති පූජනීය නූල් උත්සවය, ක්‍රිස්තියානීන්ට බව්තීස්මය, සහ මුස්ලිම්වරුන්ට ශහද මෙන්, බෞද්ධයන්ට තිසරණය වැදගත් වේ. බලන්න **චරිතය**
*The Three Refuges*, Nyanaponika, 1983.

## පුනරුත්පත්තිය

පුනරුත්පත්තිය යනු සාමාන්‍යයෙන් මරණයේදී පුද්ගලයෙකුගේ අධ්‍යාත්මය, ජීවය හෝ ආත්මය අලුත් ශරීරයක් තුළට ගමන් කරන අතර, අවසාන අරමුණ තෙක් ළඟාවන තුරු එය දිගටම කරගෙන යනු ඇත. එය සමහර විට සසර සැරිසැරීම හෝ පුනර්භවය ලෙස ද සඳහන් වේ. පයිතගරස් සහ නව-ප්ලේටෝගේ දර්ශනය අදහන්නෝ පුනර්භවය පිළිබඳව විශ්වාසය තැබූහ. හින්දු ධර්මය, ජෛන ආගම, ලෙබනන්වල ඩ්‍රෑස්වරුන්, ඉරාකයේ යොසීඩීස්වරුන් සහ නව යුග ව්‍යාපාරයේ (New Age Movement) සමහර න්‍යාය ඉදිරිපත් කරන්නෝ එය තවමත් විශ්වාස කරති. බුදුපියාණන් වහන්සේ එක් ජීවිතයකින් තවත් ජීවිතයකට ගමන් කරන ආත්මයක් පැවතීම ප්‍රතික්ෂේප කළහ. එබැවින් උන්වහන්සේගේ පශ්චාත් මරණ සංකල්පය සාමාන්‍යයෙන් හැඳින්වෙන්නේ, එය පුනරුත්පත්තියෙන් වෙන්කර හඳුනා ගැනීම සඳහාය.

## ධාතු

ධාතු (ධාතු) යනු බුදුපියාණන් වහන්සේගේ හෝ පූජනීය භික්ෂූන්ගේ හෝ භික්ෂුණීන්ගේ යැයි සිතනු ලබන ශාරීරික ශේෂය. සමහර විට ඒවා ඔවුන් විසින් භාවිත කළ දේවල්ය. සාමාන්‍යයෙන් ධාතු ස්තූපවල තැන්පත් කර වැඳුම් පිදුම් ද කෙරේ. ධාතුවලට ගෞරව කිරීම සමහර මිනිසුන්ගේ ශ්‍රද්ධාව වඩන, හිංසාවකින් තොර පුරුද්දක් ලෙස බුදුපියාණන් වහන්සේ පිළිගත් බව පෙනී යයි. නමුත්, ධර්මය කෙරෙහි ගැඹුරු අවබෝධයක් ඇති අයගේ වටිනාකමට වඩා මෙය වටිනාකමින් අඩු වේ. පරිනිර්වාණයට මත්තෙන්, තමන්වහන්සේගේ භික්ෂූන් අමතා බුදුපියාණන් වහන්සේ පැවසුවේ ධාතූන්වලට ගෞරව කිරීමට කරදර නොවී ඒවැනි ගෞරව කිරීම් ගිහියන්ට කරන්නට ඉඩ හරින ලෙසයි (D.II,141). තවත් අවස්ථාවක උන්වහන්සේ මෙසේ පැවසූහ 'භෞතික දේවලට නොව, මගේ ධර්මයට උරුමක්කාරයන් වන්න' (M.I,12). නැවතත්, අවබෝධයෙන් සහ ධර්මය අනුව ජීවත්වීම සමග සසඳන විට ධාතූන්වල ඇත්තේ ස්වල්ප වූ වටිනාකමක් බව උන්වහන්සේ පැවසූහ. වඩා වැදගත් ගුණාංග වර්ධනයට ධාතුවලට ගෞරව කිරීම අවශ්‍ය නොවන බව යන අදහස, බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු, ඇතැම් කණ්ඩායම් උන්වහන්සේගේ ශාරීරික ශේෂයන් සම්බන්ධයෙන් කෝපයට පත්ව අසැබි දබරවලට වැටීමෙන් ඉස්මතුකර පෙන්වූහ. වෙනත් ආගම්වල මෙන්ම, බුදුදහමේ ධාතු වන්දනාව ද බොහෝ කාලයක් මුළුල්ලේ මිථ්‍යාමත, වංක ක්‍රියා සහ පොදුවේ භාවිත ලාභයට වැඩි අවධානය දීම හා සම්බන්ධ වී තිබේ

(D.II,164-5). බලන්න **දොණ**
*Embodying the Dharma: Buddhist Relic Veneration in Asia*, David Germano and Kevin Trainor, 2004.

## අටපිරිකර

අටපිරිකර (අට්ඨ පරික්ඛාර) යනු භික්ෂූන් සහ භික්ෂුණීන්ට ඔවුන්ගේ පෞද්ගලික දේපළ වශයෙන් තබා ගැනීමට අවසර ඇති මූලික අවශ්‍යතා අටයි. ඒවා නම්, 1. පිටත සිවුර, 2. ඇතුළත සිවුර, 3. ශීත ඍතුව සඳහා දෙපට සිවුර, 4. දානය රැස් කිරීම සඳහා පාත්‍රය, 5. හිස මුඩු කිරීම සඳහා දැලිපිහිය, 6. ඉඳිකට්ට සහ නූල්, 7. බඳ පටිය සහ 8. බීමට ජලයේ ඇති අපිරිසිදු දෑ පෙරීම සඳහා පෙරහන්කඩයි. 'කුරුල්ලෙකු යන යන තැන ගෙනයන්නේ තමන්ගේ තටු පමණක් මෙන්' (D.I,71) භික්ෂු භික්ෂුණීන්ට තමන් යන යන තැන තමන් සතු දේ ගෙන යාම බලාපොරොත්තු විය. ප්‍රායෝගිකව ගත් කල, අද භික්ෂු භික්ෂුණීන් සාමාන්‍යයෙන් මීට වඩා බොහෝ දේ හිමිකර ගෙන තිබේ. නමුත්, සරල ජීවිතය පරමාදර්ශී වේ. බලන්න **දානය එකතු කිරීම**

## ගෞරවය

ගෞරවය (අපචිති, චිත්තිකාර හෝ ගාරව) යනු යම් කෙනෙකුගේ යහපත් ගුණාංග හෝ ජයග්‍රහණ කෙරෙහි අගය කිරීමකි. එම ප්‍රසාදය වචනයෙන් හෝ ක්‍රියාවෙන් ප්‍රකාශ කෙරේ. ඉංග්‍රීසි වචනය එන්නේ *re spectum* යන ලතින් වචනයෙනි. එහි අදහස 'නැවත බලන්න' හෝ 'වඩා පරිස්සමින් බලන්න' යන අදහසයි. අප මිනිසුන් පළමු වරට හමු වන විට, අප එම පුද්ගලයා පිළිබඳව ඇති කර ගන්නා හැඟීම

වැරදි හෝ අසම්පූර්ණ වේ. නමුත් එය ස්ථිර එකක් වේ. ඒ නිසා, නිකම්ම ප්‍රශංසාව පිළිබඳ සාමාන්‍ය අවබෝධයෙන් ඔබ්බට ගොස්, පුද්ගලයෙකුට ගෞරව කිරීම යනු ඔවුන් වඩා හොඳින් දැන ගැනීම පිණිස කාලය ගන්නට විවෘත වී, ඔවුන්ගේ යහපත් ගුණාංග පිළිබඳව දැනුවත් වීමට උත්සාහවත් වී, සුදුසු අවස්ථාවලදී, එම ගුණාංගවලට ගරු කිරීමයි. ගෞරවාන්විත හැඟීම් ඇති කර ගැනීමට ඇති හැකියාව මහත් ආශීර්වාදයක් බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (Sn.265).

බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් බලන විට, සියලුදෙනාම අපගේ ගෞරවය ලැබීමට සුදුසු වේ. එයට හේතුව, සැමදෙනාම, වඩාත්ම නූගතා හෝ වඩාත් දුෂ්ට පුද්ගලයාටත් නිර්වාණය ලබා ගැනීමට විභවය ඇති නිසාය. එසේම, අප මිනිසුන් හැර ගෞරව කිරීමට දේ ඇත - සත්ත්වයන්, විවිධ ආගම්, අනෙක් අයගේ දේපල සහ පරිසරය යනාදියයි. ආගන්තුක සත්කාරය, විනය සහ විඥානය වැනි ගුණාංගවලට ගෞරව කිරීම යහපත් බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (D.III,244). මෙසේ පැවසීමෙන් උන්වහන්සේ අදහස් කළේ, අප එවැනි දේ සුළුවට තැකිය යුතු නැති බවයි. නමුත්, ඒවා අපේ ජීවිතයට සතුටින් පිළිගෙන ඒවා ලැබීම පිළිබඳව සතුටු විය යුතුයි. බෞද්ධයන් බුදුපිළිමයක් ඉදිරියේ මල්, ආලෝකය සහ සුවඳදුම් සහිත පූජා තබා ගෞරව කරන්නේ බුදුපියාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ආධ්‍යාත්මික මුදුන්පමුණුවා ගැනීම්වලටයි.

## අනාවරණය

අනාවරණය (අනුස්සව හෝ සුති) යනු දෙවිකෙනෙකු හෝ දිව්‍යමය ජීවයන් විසින් මනුෂ්‍යයන්ට දැනගන්නට සලස්වන සත්‍යයක් හෝ දැනුමක්ය. අනාවරණයක් ලබන පුද්ගලයා සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන්නේ අනාගත වක්තෘ හෝ අනාගතය හෙළි කරන්නා (ඉසි) වශයෙනි. බොහෝ ආගම්වල පූජනීය ධර්ම ග්‍රන්ථ අනාවරණයන් ලෙස විශ්වාස කෙරේ. 'අනාවරණය සත්‍යය යැයි කියන, අනාවරණය මත පදනම් වූ ධර්මයක් දේශනා කරන අය, අතීතයෙන් අරගෙන ආ දේ මත පදනම් වූ, ධර්ම ග්‍රන්ථවල බලපෑම මත පදනම් වූ' පිළිබඳව බුදුපියාණන් වහන්සේ සහ බෞද්ධ සම්ප්‍රදාය සාමාන්‍යයෙන් සැක පහළ කර ඇත (M.I,520). එසේම අනාවරණය විශ්වාස කළ නොහැකි දැනුම් මාර්ගයක් ලෙස සලකන්න.

අනාවරණය පිළිබඳ සමහර විරුද්ධතා මේවායි : අනාවරණය ලැබූ පුද්ගලයාට එය හරියාකාරව නොඇසෙන්නට ඉඩ ඇත. ඔහු හෝ ඇයට එය හරිහැටි ඇසුණත්, එය හරියාකාරව සටහන් කර ගත්ත ද, එසේ වුවත්, ඒවා තෙවැනි පාර්ශ්වයක් සේ මැදිහත් වූ ශතවර්ෂවලදී නිවැරදිව සම්ප්‍රේෂණය නොවූයේ ද යනාදියයි (M.I,520). අනාවරණයේ වලංගුභාවය සම්බන්ධයෙන් ඇති අනෙක් විරුද්ධතා අතරට මේවාද එකතු කළ හැකිය. අනාවරණය වූ බොහෝ ආගම් ඇත. ඒ සියල්ල වෙනස්ය. ඒ සියල්ල සත්‍යය වන්නට නොහැකි නිසා, කෙනෙකු ඒවායෙන් කුමක් සත්‍යයද, කුමක් අසත්‍යය ද කියා දැනගන්නේ කෙසේ ද? තවදුරටත්, එක් ආගමක් තුළ පවා, පුළුල්

සහ බොහෝ විට හෙළිකරන ලද ධර්ම ග්‍රන්ථ අර්ථකථනය කර ඇති ආකාරය සම්බන්ධයෙන් පරස්පර වෙනස්කම් ඇත. කෙනෙකු අනාවරණයේ කුමන අර්ථකථනය හරි ද නැද්ද කියා දැනගන්නේ කෙසේ ද? මෙම පදනම් නිසා, අනාවරණය කරන ලද ධර්ම ග්‍රන්ථ මත පදනම් වූ ආගම් අසතුටුදායක බව බුදුදහම පවසයි. නමුත්, අනිවාර්යයෙන් අසත්‍ය නොවේ (M.I,520). බලන්න **වේදය**

## දකුණ

දකුණ (දක්ඛිණ) යනු යම් දෙයක් උතුරු දෙසට මුහුණලා සිටින විට, යම් දෙයක පැත්තක් නැගෙනහිර දෙසට මුහුණ ලා සිටීමයි. සම්පූර්ණයෙන්ම වගේ සියලුම සංස්කෘතීන් මෙන්ම, පැරණි ඉන්දියාවේ ද දකුණු පස හොඳම පැත්ත, වඩාත් වාසනාවන්ත, පිරිසිදු සහ නිවැරදි ලෙස සැලකිල්ලට ගන්නා ලදී. ඉංග්‍රීසියෙන්, නැතිවම බැරි සහාය ලෙස විස්තර කර ඇත්තේ 'දකුණු-අතින් වැඩ කරන මිනිසා' බවයි. තමන්ට සැබැවින්ම අවශ්‍ය දේ ගැනීමට ඔවුන් 'තමන්ගේ දකුණු අත දෙන බව' මිනිස්සු කියති. බුදුපියාණන් වහන්සේ හෝ වෙනත් ගෞරවණීය කෙනෙකුගෙන් වෙන්වී යන විට, 'එම ගෞරවණීය පුද්ගලයා දකුණු පස සිටින සේ' මිනිසුන් එසේ කරන බව, මුළු ත්‍රිපිටකයේම සඳහන් වේ (D.I,89).

වර්තමානයේ මිනිසුන් ස්තූපයක් වටා සක්මන් කරන්නේ ඔරලෝසු කටුව යන දිශාවට හෙවත් ස්තූපය දකුණින් තිබෙන ආකාරයටයි. භික්ෂුවක් බුදුපිළිමයකට හෝ ජ්‍යෙෂ්ඨ භික්ෂුවකට ආචාර කරන

විට, ඔවුහු ඔවුන්ගේ දකුණු උරහිස නිරාවරණය කරති, මෙය කෙනෙකු තොප්පිය ගලවනවාට සමානය. බෞද්ධ රටවල දේවල් දීමට සහ ගැනීමට දකුණු අත භාවිතය ආචාරශීලී යැයි සලකති. එසේම දකුණු අතින් ආහාර ගනිති. කෙසේ නමුත්, දකුණු පසට සැලකීමක් දැක්වීම විනීත හැසිරීමක් සහ චාරිත්‍රයක් පමණි. නමුත්, ධර්මය සමග කිසිදු සම්බන්ධයක් නැත.

**හරි සහ වැරදි** බලන්න **යහපත සහ අයහපත**

## චාරිත්‍ර

චාරිත්‍රයක් (පූජාවිධි හෝ වත) යනු සෑම විටම එකම ආකාරයකින් ක්‍රියාත්මක කරන ක්‍රියාකාරකම් පෙළක් වන අතර, හරියාකාරව කළහොත් ඒවාට යම් ආගමික වැදකමක් හෝ ප්‍රතිඵලයක් තිබෙන බවට විශ්වාසයක් ඇත. චාරිත්‍ර පිළිබඳ සාමාන්‍යයෙන් බුදුපියාණන් වහන්සේට තිබුණේ ස්වල්ප සැලකිල්ලකි. හානියක් නැති සහ මිනිසුන්ට යම් සහනයක් ගෙන දෙන චාරිත්‍ර පිළිබඳව උන්වහන්සේගේ විරුද්ධත්වයක් නොතිබුණි. අනෙක් අතට, චාරිත්‍ර සිදුකිරීම හෝ ඒවාට සම්බන්ධ වීම හෝ එයින් තමන්ට ආධ්‍යාත්මික වටිනාකමක් (සීලබ්බතපරාමාස), ලැබිය හැකි යැයි සිතමින් එසේ කිරීම අසත්‍ය වූ මතයක් බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. එසේම එය සම්පූර්ණයෙන්ම කෙනෙකුගේ ආර්ය මාර්ගයේ දියුණුවට බාධාවක් බව ද උන්වහන්සේ පැවසූහ (Dhp.271). බුදුපියාණන් වහන්සේට අනුව, සදාචාරමය හැසිරීම, කරුණාවන්ත

ක්‍රියා, මනස සන්සුන් සහ පිරිසිදු කර ගැනීම, සහ අවබෝධය දියුණු කර ගැනීම කෙනෙකු නිර්වාණයට ළං කළ හැකිය.

මෙසේ තිබියදීත්, බෞද්ධ ලෝකය පුරා සිටිනා මෙම භක්තිමත්, නමුත්, වැරදි තොරතුරු ලත් මිනිසුන් ඒවාට ආධ්‍යාත්මික වටිනාකමක් ඇතැයි විශ්වාස කරමින් චාරිත්‍රවල විවිධ චාරිත්‍ර සිදු කරති. මෙම සමහරක් චාරිත්‍රවලට විශාල සංඛ්‍යාවක වැඳ වැටීම්, බුදුපිළිම ඉදිරිපිට අතිශය දියුණු පූජා තැබීම, සහ ආශීර්වාද පූජාවලට සහභාගී වීම ඇතුළත් වේ. එවැනි දේවලින් සහනයක් සහ විශ්වාසයක් යළි තහවුරු වීමක් වෙන්නට හැකි වුවත්, සහ යහපත් අදහස්වලින් පෙළඹීමක් ඇතිව කළ හැකි වුවත්, ඒවා සියල්ලම ඉතා පහසුවෙන් සැබෑ වෙනසක් ගෙන දෙන පිළිවෙත් වෙනුවට ආදේශකයක් බවට පත්වේ. භාවනාව, ශික්ෂාපද රැකීම, තමන්ගේ අසල්වැසියාට හෝ දුප්පතුන්ට උපකාර කිරීම, පරිත්‍යාගශීලීත්වය, දුකට පත් වූවන් සැනසීම යනාදියට. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'බාහිර දේවලින් පිරිසිදු බව සොයන්නාට පිරිසිදු බව ලබාගත නොහැකි බව කුසලයෙන් පිරි පුද්ගලයා කියයි.' (විනිපාත) (*vinipāta*). (S.I,169). බලන්න **සදාචාරයට සහ නීතිවලට ඇලීම**

## චාරිත්‍රමය පිරිසිදු බව සහ අපිරිසිදුබව

සමහර දේවල්, බොහෝ විට ආහාර වර්ග, ශරීරයෙන් නිකුත්වෙන ශ්‍රාවය හෝ සමහර සත්ත්වයන්, අපිරිසිදු සහ කෙසේ හෝ ඒවා ස්පර්ශවන පුද්ගලයෙකු දූෂණය කරවන බව බොහෝ ආගම්වලින් ඉගැන් වේ. එවැනි අදහස් සම්බන්ධයෙන් සාමාන්‍යයෙන්

මතය වන්නේ ජලයෙන් සෝදා හෝ සංකේතමය සේදීමෙන් පුද්ගලයෙකු පිරිසිදු තත්ත්වයකට, තිබූ තත්ත්වයට ගෙන එන බවයි. බුදුපියාණන් වහන්සේගේ කාලයේ දී එවැනි විශ්වාස ඉන්දියාවේ පැවතුණි. බ්‍රාහ්මණ ආගමෙන් ඉගැන්වූයේ ගංගානම් ගඟේ හෝ වෙනත් පූජනීය ගඟකින් ස්නානය කිරීමෙන් පව් සෝදා දැමිය හැකි බවයි (M.I,39). අඩු කුලයේ පුද්ගලයන්, කාන්තාවන් ඔසප් තිබෙන විටදී හෝ බල්ලන් හෝ උගුරන් වැනි සමහර සතුන් සමග ස්පර්ශ වීමෙන් ද අපිරිසිදු වන බව උගන්වා ඇත. චාරිත්‍රමය පිරිසිදු සහ අපිරිසිදු බව පිළිබඳ මතය වැරදි සහගත දෙයක් ලෙස බුදුපියාණන් වහන්සේ බැහැර කළහ. කුණු ස්පර්ශ වූ විට කෙනෙකු අපිරිසිදු වන නමුත්, එය හුදෙක් සෝදා නිවැරදි කර ගත හැකි බව උන්වහන්සේ පැවසූහ (M.II,151). පූජනීය ගංගාවලින් ස්නානය කර මිනිසුන්ට ඔවුන්ගේ පව් සෝදා හැරිය හැකි බව කියන විට, පුණ්ණිකා භික්ෂුණිය උපහාසයෙන් කියා සිටියේ, එසේ නම් සියලු ඉබ්බන්, කිඹුලන් සහ ගෙම්බන් දිව්‍යලෝකයට යන බවයි (Thi.341).

එක් පුද්ගලයෙකු බුදුපියාණන් වහන්සේ සමග එක් අවස්ථාවකදී කියා සිටියේ 'තමා බටහිරෙන් පැමිණි බ්‍රාහ්මණයන්ගේ ශ්‍රාවකයෙකුවූ බවත්, ඔවුන් ජල බඳුන් රැගෙන, ලිලී මල්මාලා පැළඳ, ගින්දරට වැඳපුදා, ජලය පිරිසිදු කිරීම උගන්වන බවත්ය.' ඔවුන් ඉගැන්වූ මෙම චාරිත්‍රයේ එක් කොටසක, සෑම හවසකම තුන් වතාවක් ඔවුන් ජලයේ ගිලීම ද ඇතුළත් විය (A.V,263). බුදුපියාණන් වහන්සේ පැවසුවේ උන්වහන්සේ උගන්වන්නේ සම්පූර්ණයෙන්ම වෙනස් ආකාරයක පිරිසිදු කිරීමක්

බවයි. එසේ කියමින් උන්වහන්සේ සදාචාරය සහ භාවනාව පුහුණු කිරීම පැහැදිලි කරමින් ඉදිරියට ගියහ (A.V,264-8). සැබෑ දූෂ්‍ය වීම වශයෙන් බුදුපියාණන් වහන්සේ දරා සිටියේ, සෘණාත්මක සිතිවිලි සහ දුරාචාරයෙන් යුක්ත හැසිරීම බවත්, මෙය 'පිරිසිදු' කළ හැක්කේ කෙනෙකුගේ හදවත සහ ක්‍රියාවන් වෙනස් කිරීමෙන්ම පමණක් බව ද උන්වහන්සේ පැවසූහ. මෙය 'අභ්‍යන්තරය සේදීම' (සිනාතො අන්තරෙන සිනානෙන, M.I,39) යනුවෙන් උන්වහන්සේ හැඳින්වූහ. සදාචාරාත්මක හික්මීම සහ සදාචාරාත්මක පිරිසිදුබව සහිත ජීවිතයක් ගත කිරීම 'ජලය නොමැතිව සේදීම' (සිනානං අනොදකං, S.I,43) බව උන්වහන්සේ පැවසූහ.

## ගංගා

ගංගාවක් (ගඞ්ගා, නදී හෝ සවන්ති) යනු ස්වභාවික දසුනක් හරහා තවත් ගංගාවකට, විලකට හෝ මුහුදට දීර්ඝ දියපාරක් හරහා අඛණ්ඩව ගමන් කරන ස්වාභාවික ජල ප්‍රහාරයකි. හිමාලය හැරුණු කොට, බුදුපියාණන් වහන්සේ ජීවත් වූ ඉන්දියාවේ මධ්‍යම දේශයේ වඩාත් කැපී පෙනෙන ස්වාභාවික ලක්ෂණයක් වූයේ ගංගාය. එසේම ඒවා ස්වාභාවික දසුන්වලින් ඉතා වැදගත් අංගය ද විය. ඒ ගමනාගමන පහසුකමක් ලෙස, ආහාර සපයන්නෙකු ලෙස සහ භෝගවගාවට ජල සැපයීමේ මූලාශ්‍රයක් වශයෙනි. මධ්‍යම දේශය හරහා ගලායන ප්‍රධාන ගංගා වූයේ ගංගානම් ගඟ, යමුනා, අචිරවතී, සරභූ සහ මහී යනාදියයි (A.V,22). මෙයින් පළමු ගංගා දෙකේ නම් වෙනස් වී නැත. තුන්වැන්න දැන්

හැඳින්වෙන්නේ රජ්ති, හතරවැන්න සරයු යන නම්වලින්ය. අවසාන ගඟේ අනන්‍යතාව නිශ්චිත නැත.

මෙම ගංගාවලින් සමහරක් අතිශයින් පුළුල්ය. බුදුපියාණන් වහන්සේ සාරනාත්වලට වඩින විට සහ ආපසු වඩින විට ඩෙහරි වල සොන් ගංගාව තරණය කරන්නට ඇති අතර, එය කිලෝමීටර් හතරකට කිට්ටුව පළල්ය. බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේ කැටුව ආ භික්ෂූන් සහ භික්ෂුණීන් ගංගාවක් වෙතට පැමිණි විට, උන්වහන්සේලාට ගංගාව තරණය කරන්නට බෝට්ටුවක් සොයා ගැනීමට හෝ පාරුවක් සාදා ගැනීමට බට හෝ අතුවලින් සාදන්නට උත්සාහ කරන්නට සිදුවන්නට ඇත (D.II,89). ඒ නිසා, ජීවිතයේ බොහෝ කාලයක් රට හරහා ගමන් කළ බුදුපියාණන් වහන්සේට ගංගාවන් තරම් වෙනත් කිසිම දෙයක් අභියෝගාත්මක බාධාවක් නොවන්නට ඇත. එමනිසා, උන්වහන්සේ ආධ්‍යාත්මික සෝදිසියට සහ එහි ඉලක්කයට බොහෝ විට ගංගා සහ බොහෝ දේවල් රූපක වශයෙන් සම්බන්ධ කර ගැනීම පුදුමයට කරුණක් නොවේ.

උන්වහන්සේ සාමාන්‍ය ලෞකික ගතිස්වභාවය 'මෙම ඉවුර' (ඔර) සහ නිර්වාණය 'අතිරේක ඉවුර' (පාර) යනුවෙන් හැඳින්වූහ. නිර්වාණයේ පළමු අදියරය 'ගඟට ඇතුල්වීම' (සොතාපත්ති), යනුවෙන් උන්වහන්සේ හැඳින්වූහ. එය ගඟක් හරහා පිහිනීමේ මූලික දේ වේ. බුදුපියාණන් වහන්සේට අනුව, ලෝභය, ද්වේෂය සහ ආශාව වැනි ඍණාත්මක ආකල්ප සහ චිත්තවේගය 'ගලායන ජලධාරා' හෝ

'ගංවතුර' (ඔඝ) කෙනෙකුට පිසදැමිය හැකිය. උදේ‍යාගයෙන් ධර්මය උගත් භික්ෂුව 'දිය බැස එගොඩ විය හැකි තොට දන්නා කෙනෙකු' (තිත්ථං ජානති, M.I,221) ලෙස බුදුපියාණන් වහන්සේ හැඳින්වූහ. හරක් බලන්නෙකු වූ නන්ද යහපත් භික්ෂුවක වන්නට ඔහුට ඇති අධිෂ්ඨානය සහ හැකියාව පිළිබඳව බුදුපියාණන් වහන්සේට විශ්වාසය පළ කළේ මෙසේය: 'බුදුපියාණන් වහන්ස, මම මේ ඉවුරේ හිර නොවෙමි, හෝ දුර තිබෙන ඉවුරේ අතරමං නොවෙමි. මා ගඟේ මැද ගිලෙන්නේ නැත. මා ගොඩ ඇනුණු වැලි පරයක් මතට දුවන්නේ නැත. බුදුපියාණන් වහන්සේ මා භික්ෂුවක ලෙස පිළිගන්න' (S.IV,181). බුදුපියාණන් වහන්සේගේ ඉතා ජනප්‍රිය උපමාවක උන්වහන්සේගේ ඉගැන්වීම් තාවකාලිකව සාදාගත් පාරුවකට සමාන කළහ. එය භාවිත කිරීමෙන් පසු, අත්හැරිය හැකිය. මෙහි අදහස නම්, විමුක්තිය ලබාදෙන ධර්මය වැනි වටිනා දෙයකට වුවද නොඇලිය යුතුය යන්නය. (M.I,134). බලන්න **පාලම් සහ නෙරඤ්ජර ගඟ**

## සිවුරු

සම්ප්‍රදායානුකූල ගිහි වස්ත්‍ර වෙනුවට, බෞද්ධ භික්ෂුහු සහ භික්ෂුණීහු සිවුරු (චීවර හෝ කාසාව) අඳිති. ඇඳුම් පැළඳුම් කොටස් තුනකින් යුක්තය. කුඩා සෘජුකෝණාශ්‍ර සිවුරක් ඉණ වටා ඔතයි (අන්තරවාසක), බඳ පටියක් (බන්ධන) එය සුරක්ෂිතවීමට භාවිත කෙරේ. විශාල සෘජුකෝණාශ්‍ර සිවුරක් (උත්තරාසඞ්ග) මුළු සිරුර වටා, වම් උරහිස සහ දකුණු අත යටින් ලිහිල්ව ඔතයි. සමහර විට භාවනා කරමින්ම බුදුපියාණන් වහන්සේ මෙම විශාල

සිවුර හිස වටා ලිහිල්ව ඔතයි. සමහර විට උන්වහන්සේගේ ඇස් ආවරණය කිරීමට විය හැකිය (S.I,167). දෙපට සිවුර භාවිත කරන්නේ සීත දේශගුණය ඇති විටයි. සිවුරු ලිනන් රෙදි, කපු, සිල්ක්, වූල්, හණ කෙඳි හෝ හණ වලින් නිමවා ඇත (Vin.I,394). සමහර භික්ෂූහු රෙදිකඩ සහ රෙදි කැබැලි එකට මසා තමන්ගේ සිවුරු සාදා ගත්හ. එවැනි සිවුරු සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ පැවසුවේ භික්ෂුවක භාවනාවෙන් ඇතිවෙන ප්‍රීතිප්‍රමෝදය අත්විඳින්නට ආරම්භ වන විට, ඔහුට ඔහුගේ කඩමාලුවලින් මසන ලද සිවුර දැනෙන්නේ ලස්සනට වර්ණවත්වූ ඇඳුමක් ලෙස බවයි (A.IV,230).

'කහ පැහැති සිවුර' යන ජනප්‍රිය පදය වැරදි ව්‍යවහාරයකි. කහ (කුණ්කුම) සිවුරු වර්ණ ගැන්වීමට කිසිවිටක භාවිත කර නැත. එයට හේතුව එය සායමක් නොවන නිසාය. එසේ වුවත්, එය බොහෝ මිල අධිකය. නිවැරදි වර්ණය නම්, කණිකාර මලට සමාන *Pterospermum acerifolium* (Ja.II,25) කහ, තැඹිලි හෝ තැඹිලි පැහැති දුඹුරු වර්ණයකි. පැරණි ඉන්දියානුවන්ගේ අදහසට අනුව, මෙම වර්ණයෙන් අදහස් වන්නේ නොඇලීම හෝ අත හැරීමයි. එයට හේතුව, ගස්වලින් වැටෙන්නට පෙර, කොළ කහ පැහැති දුඹුරු වර්ණයකට පත් වේ. සම්පූර්ණ සිවුරු කට්ටලයක් භික්ෂූන් සහ භික්ෂුණීන්ගේ අටපිරිකරවලින් අංග තුනක් සම්පූර්ණ කරයි. බොහෝ බෞද්ධයන්ට සහ බුදුපියාණන් වහන්සේට මෙන්ම, කහ සිවුරු හුදෙක් ඇඳුම් පමණක් නොවේ. ඒවා ඉහළම සදාචාරමත් සහ ආධ්‍යාත්මික පරමාදර්ශවල සංකේතයක් වේ. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'දුරාචාරයෙන් නිදහස්,

යහපත් ගුණාංගවලින් පිරුණු, සවයං පාලනයක් ඇති, සත්‍යවාදී පුද්ගලයෝ, සැබැවින්ම කහ සිවුරට සුදුසු වෙති ' (Dhp.10).

බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ : 'කෙනෙකු ලෝභයෙන්, කෝපයෙන් සහ තණ්හාවෙන් පිරී ඇත්නම්, නොසැලකිලිමත් නම්, දූෂිත නම්, නොහික්මුණු නම්, සෝෂාකාරී නම් සහ ව්‍යාකූල නම්, ඔහු මගේ සිවුරේ වාටිය අල්ලාගෙන පියවරෙන් පියවර මා පිටුපසින් කොපමණ ඇවිද්දත්, ඔහු සිටින්නේ මගෙන් බොහෝ ඈතය. යම් කෙනෙකු යොදුන් සියයක් මගෙන් ඈත්ව ජීවත් වුවත්, ඔහු තණ්හාවෙන් සහ ආශාවෙන් නිදහස් නම්, කරුණාවන්ත හදවතක් ඇත්තේ නම්, පිරිසිදු මනසක් ඇත්තේ නම්, සිහිකල්පනාවෙන් යුක්ත නම්, සංසුන් නම්, නොකැළඹුණු නම්, සහ සමාධිගත නම්, ඔහු කෙසේ වෙතත් මා සමීපයේ ඇත, මා ඔහු සමීපයේ ඇත. ඒ ඇයි? එයට හේතුව ඔහු ධර්මය දකී. ධර්මය දැකීමෙන් ඔහු මා දකී' (It.91). බලන්න **නග්නත්වය**

**සබ්බඨ්**

බලන්න **උපෝසථ**

**සාධු**

සාධු යනු යහපත්, විශිෂ්ට හෝ වාසනාවන්ත යන අර්ථය ඇති පාළි වචනයකි. භාවිත කරන වචනවල උදාහරණ වන්නේ : 'උතුම් පුද්ගලයන් දැකීම සාධු වේ' (D.I,88). 'මනස පාලනය කර ගැනීම සාධු වේ' (Dhp.35). 'සාධු ජීවිතයක් ගත කරන්නෙකු වුවද, අලස පුද්ගලයෙකු සමග ඇසුරු කිරීමෙන් පිරිහීමට පත් වේ' (It.71). සාධු යන වචනය ඉඳහිට විස්මය දැනවීමට ත්‍රිපිටකයේ භාවිත කර ඇත. සාරිපුත්ත රහතන් වහන්සේ කියන ලද දෙයකට තමන්වහන්සේගේ ඇගයීම පළ කිරීම සඳහා බුදුපියාණන් වහන්සේ ප්‍රතිචාර දැක්වූයේ: 'සාධු, සාධු, සාරිපුත්ත,'(Vin.I,56) යනුවෙනි. වර්තමානයේ, ධර්මය සම්බන්ධයෙන් යම් දෙයක් ඇසූ විට තමන්ගේ සතුට හෝ අනුමැතිය පළ කිරීම සඳහා බෞද්ධ රටවල මිනිසුන් තුන් වරක් සාධු කීම සාමාන්‍ය දෙයකි.

**කහ**

බලන්න **සිවුර**

## ශක්‍ර

ඉන්ද යනුවෙන් පාළියෙන් සහ සංස්කෘතියෙන් ඉන්ද්‍ර මෙන්, සක්ක, සංස්කෘතයෙන්, ශක්‍ර වශයෙන් ද, නම් දරණ බ්‍රාහ්මණ ආගමේ යුධකාමී දෙවියෙකු පිළිබඳව නිතර ත්‍රිපිටකයේ සඳහන් වේ (S.I,216 ff).

මුල් බෞද්ධයන් තරයේ කියා සිටියේ සෘග් වේදයේ නිරූපණය කරන භයානක සහ වහා කිපෙන රණශූරයාට වඩා බුදුපියාණන් වහන්සේ ඉදිරියේ පෙනී සිටිමින්, වැඳ නමස්කාර කරමින් ධර්මය පිළිබඳව ප්‍රශ්න අසන දෙවියන් සැබැවින්ම මෘදු දෙවියෙකු බවයි. මෙම දක්ෂ ක්‍රියාවලිය ශක්‍ර දෙවියන් බුදුපියාණන් වහන්සේ සහ බුදුදහමේ භාරකාරයෙකු බවට පහත හෙළනු ලැබූ අතර, ඔහුට නමස්කාර කිරීම අදාළ නොවීය. ශක්‍ර සහ බුදුපියාණන් වහන්සේ අතර ඉතා ජනප්‍රිය හමුවීම සිදුවූයේ රජගහ ඉන්දසාල ගුහාවේදීය (D.II,263). බලන්න **දෙවියන් සහ දෙවිවරු**

Godage, C.E. 1945. 'The Place of Indra in Early Buddhism,' C. E. Godage, *University of Ceylon Review*, 1945.

## සක්‍ය

සක්‍ය, සමහර විට සක්ක, එක් ප්‍රාන්තයක සහ එහි ජීවත්වූ මිනිසුන්ගේ ගෝත්‍රික නමයි. සිද්ධාර්ථ ගෞතම යන නමින් ඉතිහාසයට පහළවූ බුදුපියාණන් වහන්සේ සාක්‍ය වංශිකයෙකි. සාක්‍ය යනු කෝසල රාජධානිය සහ වජ්ජි සමාජයක් අතර පිහිටා ඇති කුඩා රාජ්‍යයකි. එය වර්තමාන උතුරු ඉන්දියානු ප්‍රාන්තයේ උත්තර් ප්‍රදේශ්හි ඊසාන දිග කෙළවරට සමාන වේ.

ජනප්‍රවාදයට අනුව, ශාක්‍යයන් ඔවුන්ගේ නම ලබා ගත්තේ *Tectona grandis*, ඉන්දියානු තේක්ක නම් සාක වෘක්ෂයෙනි (D.I,93). ශාක්‍යයන් පැරණි ආදිච්ච පරම්පරාවෙන් පැවත එන බව කියති. ඔවුන් රණශූර කුලයට අයත් වූ අතර, ඔවුන් ඔවුන්ගේ අභිමානය සහ ආවේගිතාව පිළිබඳව හොඳින් දැනසිටිය අතර, ඔවුන්ගේ අසල්වැසියන් විසින් ගොරෝසු මිනිසුන් ලෙස සලකනු ලැබුණි (D.I,90; II,165; Sn.423). තරුණ ශාක්‍ය කණ්ඩායමක් තමන් පිළිබඳව මෙසේ කියනු අසන්නට ලැබුණි 'ශාක්‍යයන් වන අපි අභිමානවත් අය වෙමු (Vin.II,183). ගෞරවයට පාත්‍රවූ උපාලි නමැති ප්‍රජා නායකයෙකු සහ බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකු ශාක්‍යයන් 'බිහිසුණු මිනිසුන්' (Vin.II,182) බව පැවසුවේය. වඩාත් නිශ්චිතව, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ඥාතීන් 'වස්තුව සහ බලය උරුමකර ගත්' අය ලෙස විස්තර කළහ (ධනවිරියෙන සම්පන්නො, Sn.422).

නාමමාත්‍රව ස්වාධීන වුවත්, ශාක්‍යයෝ ඔවුන්ගේ නැගෙනහිර අසල්වැසියන්ගේ බලපෑමට ලක්වූහ. ත්‍රිපිටකයේ මෙසේ සඳහන් කරයි :'ශාක්‍යයන් කෝසලයේ රජුගේ බැළයන් වන අතර, ඔව්හු රජුට යටහත් පහත් සේවයක් සහ නමස්කාරයක් ලබා දෙති. ඔහුගේ අණ ඉටු කරති, ඔහුට නමස්කාර කරති' (D.III,83). බුදුපියාණන් වහන්සේගේ කාලයේ අවසානයට එන විට, ශාක්‍යයන්ගේ ඉඩම් ආක්‍රමණය කර කෝසලයට අල්ලා ගැනීමත් සමග ඔවුන්ගේ නීත්‍යානුකූල නිදහස ද අවසානයට පැමිණියේය. මෙයට පෙරදීම, තමන්වහන්සේගේ මාතෘභූමිය කෝසලයේ රජුට හිමි එකක් බව බුදුපියාණන් වහන්සේ පවසා ඇත (Sn.422). පුරාවෘත්තයට අනුව,

බුදුපියාණන් වහන්සේගේ පියා වූ සුද්ධෝදන ශාක්‍යයන්ගේ රජ කෙනෙකු බව කියා ඇත. නමුත්, වර්තමානයේ සඳහන් කරන රජ කෙනෙකුට වඩා, ඔහු සමහර විට පත්කර ගත් ප්‍රධානියෙකු විය හැකිය. ශාක්‍යයන්ගේ එකම රජු ත්‍රිපිටකයේ සඳහන් භද්දිය පමණි (Vin.II,182). බුදුපියාණන් වහන්සේ වරක් තමන්වහන්සේගේ භික්ෂූන්ට පැවසුවේ ඔවුන් පිළිපදින්නේ කාගේ දර්ශනය ද හෝ කුමන ගුරුවරයෙකු අනුගමනය කරන්නේ ද කියා වෙනත් අයෙකු ඔවුන්ගෙන් ඇසුවොත්, ඒ 'ශාක්‍යයන්ගේ පරම්පරාවෙන් පැවත එන්නෙකුගේ' (D.III,84) යැයි පවසන ලෙසත්ය, එනම් බුදුපියාණන් වහන්සේගේ බවයි. නේපාලයේ ජීවත්වන ප්‍රජාවක් ශාක්‍ය නමින් හැඳින්වෙන අතර, ඒ අය පැරණි මිනිසුන්ගෙන් සෘජුව පැවත එන පෙළපත බව කියයි. නමුත්, ඉතිහාසඥයෝ මෙම කියමන පදනම් රහිත ලෙස සලකති. බලන්න **කපිලවත්ථු**

*Republics in Ancient India*, J. P. Sharma,1968.

## සක්‍යමුනි

බුද්ධ සහ තථාගත මෙන්ම, සක්‍යමුනි ද සිද්ධත්ථ ගෞතම හිමියන්ට උන්වහන්සේ බුද්ධත්වයට පැමිණීමෙන් පසු දෙන ලද පදවි නාමයකි. ශාක්‍ය යනු බුදුපියාණන් වහන්සේ උත්පත්තිය ලැබූ ගෝත්‍රික නාමයයි. මුනි යන වචන්යේ අර්ථය 'මහා ප්‍රාඥ' හෝ 'නිශ්ශබ්ද පුද්ගලයා' යන්නයි. ඒ අනුව, එම පදවි නාමයේ අර්ථය 'ශාක්‍ය ගෝත්‍රයේ මහා ප්‍රාඥ' යන්නයි. ත්‍රිපිටකයේ නවතම කොටසේ එක් වරක් පමණක් තිබෙන ශාක්‍යමුනි නමැති පදවි නාමය දුර්ලභ එකකි (Bv.26.9).

## සල්

සල් යනු බෞද්ධ ධර්ම ග්‍රන්ථවල හැඳින්වෙන සාල යන වෘක්ෂයට නූතන ඉංග්‍රීසි සහ හින්දි නමයි. සල් උතුරු ඉන්දියානු සාමාන්‍ය ගසක් වන අතර එහි උද්භිද නාමය *Shorea robusta*. තද කොළ පැහැති පත්‍ර සහ සෘජු කඳක් ඇති දකින්නට ලස්සන විශාල ගසක් ලෙස විස්තර කර ඇත (A.III,44; Ja.V,251). සල් මල් තැඹිලි-කහ වර්ණයෙන් සහ ප්‍රසන්න සුවඳකින්ද යුක්තය. බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත්වූයේ කුසිනාරාවේ සල් ගස් දෙකක් අතර සැතපී සිටින විටයි. ඒ කාලය මල් පිපෙන ඍතුවක් නොවූවත්, ඒ මොහොතේ නිරායාසයෙන්ම මල් පිපී ඒවායේ පෙති උන්වහන්සේ මත විසිරුණි. බුදුපියාණන් වහන්සේ මේ අවස්ථාව ඉතා වැදගත් කරුණක් මතු කිරීමට යොදා ගත්හ 'මේ සල් මල් පිපී ඇත්තේ ඍතුවෙන් බාහිරව වන අතර, ඒ මල්වල පෙති ගෞරවය පුද කිරීම පිණිස මා මත විසිරුණි. නමුත් මට ඉහළම ගෞරවය පුද කරන්නේ ධර්මයෙන් ජීවත්වෙමින් සම්පූර්ණයෙන්ම ඉෂ්ට කරන භික්ෂූන් හෝ භික්ෂුණීන්, උපාසක සහ උපාසිකාවන්ය' (D.II,137-8).

*Nature and the Environment in Early Buddhism*, S. Dhammika, 2015.

## ඒක ලිංගික විවාහ

ඒක ලිංගික විවාහ යනු එකම ලිංගයේ දෙදෙනෙකු අතර නීත්‍යානුකූලව පිළිගත් එක්වීමකි. එනම්, සමලිංගිකයන් දෙදෙනෙකි. ඒක ලිංගික විවාහ නීත්‍යානුකූල බවට පත්ව ඇත්තේ මෑතදී යුරෝපියානු රටවල් කිහිපයක සහ අමෙරිකාවේදීය. කෙසේ නමුත්, එවැනි එක්වීම් පැරණි ලෝකයේ

සමහර ප්‍රදේශ ඇතුළු ඉන්දියාවේ ද තිබී ඇත. පුරුෂයන් අතර ඇති වූ විවාහ පිළිබඳව කාම සූත්‍රයේ (ක්‍රි. පූ. 3වන ශතවර්ෂයේ දී පමණ) සඳහන් වේ. නමුත්, මේවා සිදු කළේ හින්දු පූජකවරුන් ද හෝ රජයෙන් පිළිගත්තාද යන්න පැහැදිලි නැත. බොහෝ විට නොවන්නට ඇත.

යසෝධර ඔහුගේ ජයමඞ්ගල (13වන ශතවර්ෂයේදී පමණ) කර්ම සූත්‍රය පිළිබඳ විවරණයෙන් මෙසේ සඳහන් කරයි, 'කාන්තාවන් ප්‍රතික්ෂේප කරන, මෙම නැඹුරුවෙහි නිදහස් මිනිසුන්ට (එනම් සමලිංගිකයන්ට), කාන්තාවන් නොමැතිව වැඩ කටයුතු කරගෙන යන්නට පුළුවනි. එයට හේතුව ඔවුන් එකිනෙකාට ආදරය කරමින්, විවාහ වී, ගැඹුරු ලෙස විශ්වාස කරන මිතුරුදමකින් වෙළී සිටින නිසාය'. අදාල යුවල එකිනෙකාට විශ්වාසවන්ත නම්, (D.III,190) ඕනෑම සමීප, දිගුකාලීන මිතුරුදමක් පවතිනු ඇත, තෘප්තිමත් වනු ඇත. එකිනෙකාට ආදරණීයව වචන කථා කරනු ඇත (A.II,59). එකිනෙකා කෙරෙහි කරුණාව සහ ආදරය තිබෙනු ඇත, එකිනෙකා කෙරෙහි උපදේශකයා සහ ගුරුවරයා ලෙස දකිනු ඇත (A.III,295-8).

එවැනි විවාහ කෙරෙහි බෞද්ධ ආකල්ප මොනවාද? බුදුදහම විවාහය දකින්නේ ලෞකික ආගමකට සම්බන්ධ නැති මනුෂ්‍යයන් දෙදෙනෙකු අතර ඇති කර ගන්නා චාරිත්‍රයක් ලෙසයි. එම නිසා බෞද්ධ භික්ෂූන් සහ භික්ෂුණීන් විවාහයට ඇතුළත් වන්නේ නැත. නමුත් ඔවුහු බොහෝ විට විවාහ උත්සවයකට ඔන්න මෙන්න තිබියදී හෝ පසුව, විවාහමය යුවලකට ආශීර්වාද කිරීමට පැමිණෙති. එසේම භික්ෂූහු නව ව්‍යාපාරයක් අරඹන විට දී,

උපන්දිනවලදී, අවමංගල උත්සවවලදී සහ රෝගී හෝ මිය යන විට දී කෙටි දේශනයකට සහ සූත්‍ර ස්වල්පයක් සජ්ඣායනය කිරීමට පැමිණෙති. එකිනෙකා කෙරෙහි ගැඹුරු ලෙස කැපවූ පුරුෂයෙකු සහ ගැහැණියකට ඔවුන්ගේ විවාහයට භික්ෂුවක් ආශීර්වාද කිරීම අවශ්‍ය නම්, එම භික්ෂුව ඔවුන් වෙනුවෙන් එයට කැමැති වීම පිළිබඳව සිතන්නට දුෂ්කරතාවක් නැත. බලන්න **සමලිංගික සේවනය**

## සංසාරය

සංසාර යනු පාළි වචනයකි. එහි පදගත අර්ථය 'සදා පවත්වාගෙන යන ඔබමොබ යෑමයි'. නොකඩවා නැවත උත්පත්තිය සිදුවන ක්‍රියා සන්තතියකි - උත්පත්තිය සිදුවන, මරණයට පත්වෙන සහ නැවත උපත ලැබීමයි. නිර්වාණයට පත් නොවුවහොත්, මෙම අවිවේකී, වෙහෙසකර ක්‍රියාවලිය නොනැවතී සිදුවනු ඇත. බුදුදහමේ සම්පූර්ණ අරමුණ, සාධාරණීය කරන හේතුව, මෙයයි,

## සංයුත්ත නිකාය

සංයුක්ත නිකාය පූජනීය ධර්ම ග්‍රන්ථවල ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයේ තුන්වන පොතයි. සංයුත්ත යන වචනයේ අර්ථය 'ගැලපුණු' හෝ 'සම්බන්ධ' යන්නයි. පාරම්පරිකව, මෙම ග්‍රන්ථයේ සූත්‍ර හෝ දේශනා 7,762ක් තිබෙන බව කියැවේ. නමුත්, සැබැවින්ම 3,000ක් නැත. මෙම දේශනා සකස් කර ඇත්තේ දළ වශයෙන් ඒවා බෙදන ස්වරූපය අනුවයි - විෂය කරුණ, ඒවායේ කවි තිබේ නම්, ඒවා දේශනා කළේ කොහේ ද හෝ ඒවා දේශනා කළ පුද්ගලයන් ආදී වශයෙනි. සංයුක්ත නිකායේ සඳහන් දේශනා

විශාල ප්‍රමාණයක් ආරම්භ වන්නේ 'සාවත්ථියේදී' බව කියමින්ය. මෙයින් අදහස් වන්නේ මෙම ග්‍රන්ථය සකස් කළේ එම නගරයේ සිට බවයි.
*The Connected Discourses of the Buddha*, trans. by Bhikkhu Bodhi, 2000.

**අභයභූමිය**

නීතිමය අර්ථයෙන් ගත් කල, අභයභූමිය (අභයත්ථන හෝ පුජ්ජත්ථන) යන්නෙන් අදහස් කරන්නේ ඇතැම් ආගමික ආයතනවල රැකවරණය ලැබීමට ඇති අයිතිය පිළිබඳව සඳහන් වේ. එසේම, එය අවිධිමත් ලෙස හෝ නීත්‍යානුකූලව රජය විසින් පිළිගෙන ඇත. ශ්‍රී ලංකාවේ බෞද්ධ ආශ්‍රමවල රක්ෂාස්ථාන පැවතීම පිළිබඳව අඩුම තරමින් වසර 1000කවත් දිගු ඉතිහාසයක් ඇත. රාජකීය නිලධාරීන් හෝ අපරාධයක් සිදු කළේ යැයි විශ්වාස කළ පුද්ගලයෙකු පහසුවෙන් කෝපයට පත්විය හැකිය. තීරණවලට ඉක්මණින් එළඹ, වැරදිකරු ලෙස වැඩියෙන් පෙනෙන පුද්ගලයාට ඉක්මනින් යුක්තිය ඉෂ්ට කරයි.

මේ නිසා ඇතැම් විට අහිංසක පාර්ශ්වයන්ට දඬුවම් කිරීමට පෙළඹුණි. ළඟම ඇති ආශ්‍රමයකට පලා යා හැකිවූ චූදිතයෙකු එවැනි කලහකාරී සමූහයකින් නඩුකාරයෙකුගෙන් ආරක්ෂා වනු ඇත. අභයභූමිය විසින් එම පුද්ගලයාට තමා ගැනම පැහැදිලි කරන්නට සහ ඔහුට පැමිණිලිකරුට සන්සුන් වෙන්නට ඉඩ සලස්වා ඒ ආකාරයෙන් අදාළ කරුණු වඩා මධ්‍යස්ථව විමසා බැලිය හැකි වනු ඇත. ආශ්‍රමයේ සිටිනා භික්ෂූන්ට ද ඔහු හෝ ඇය වෙනුවෙන් විනිශ්චයක් කිරීමට හැකිවනු ඇත.

පැරණි ශ්‍රී ලංකාවේ බොහෝ ලියකියවිලිවලින් පෙන්නුම් කරන්නේ රාජකීය නිලධාරීන්ට සහ අනෙක් අයට ඇතැම් ආශ්‍රම, සමහර විට ආශ්‍රමස්ථ වතුවලට භික්ෂූන්ගේ අවසර නොමැතිව චුදිතයන් අල්ලා ගැනීමට ඇතුළුවීම තහනම් බවයි. අභයභූමිවල නීති වරින් වර සහ විවිධ ස්ථානවල වෙනස් විය. නමුත්, සාමාන්‍යයෙන් පුද්ගලයෙකුට අභයභූමියක රැඳී සිටීමට ඉඩ ලැබුණේ දින පහකට හෝ ඊළඟ උපෝසථ දිනය වන තෙක්ය. ආරක්ෂාව සොයන පුද්ගලයා වරදකරුවෙකු ලෙස භික්ෂූන් තීරණය කළහොත්, ඔවුන් ඔහු පන්නා දමනු ඇත. නැතිනම් රාජකීය නිලධාරීන්ට ඔහු සිරභාරයට ගැනීම සඳහා ආශ්‍රමය තුළට ඇතුල්වීමට ඉඩ දෙනු ඇත. වෙනත් අවස්ථාවලදී, චිත්තිකරු, ඔහුගේ චින්දිතයා සහ අධිකරණ බලධාරීන් අතර විසඳුමක් සඳහා සාකච්ඡා කළ හැකිය. අභයභූමිය සාමාන්‍යයෙන් ලබා දුන්නේ 'බරපතල වැරදි පහක්' (පඤ්චමහාපරාධ) යනුවෙන් හැඳින්වූ දේ කළ බවට චෝදනා ලැබූ අයටය. නමුත් මේවා මොනවාද යන්න පැහැදිලි නැත. එය ශික්ෂාපද පහ කඩකිරීම හෝ 'ක්ෂණික ප්‍රතිවිපාක ගෙන දෙන ක්‍රියා' (පඤ්චානන්තරියකම්ම, Miln.25), හයෙන් පහක් වන, එනම්, කෙනෙකු මව මැරීම, පියා මැරීම, රහතුන් වහන්සේ කෙනෙකු මැරීම, බුදුන්වහන්සේට හිංසා කිරීම හෝ සඬ්ඝ භේදය ඇති කිරීම සඳහා විය හැකිය (As.358). ඉහත දැක්වූ සන්දර්භය තුළ දී, බුදුපියාණන් වහන්සේට හිංසා කිරීම වශයෙන් අවබෝධ වූයේ බුදුපියාණන් වහන්සේගේ පිළිමයක් හෝ වෙනත් පූජනීය දෙයක් සොරකම් කිරීම හෝ කෙලසීමයි. බරපතල වරද පහ පිළිබඳ වෙනත්

විස්තරවල ඇතුළත් වන්නේ පහරදීම්, හරක් සාතනය, මංකොල්ලකෑම් සහ දූෂණයයි.

අභයභූමියට ඇති අයිතිය උල්ලංඝනය කිරීමෙන් එසේ කළ අයට බරපතල ප්‍රතිවිපාක ගෙන දෙන්නට හැකිය. මේ පිළිබඳ උදාහරණයක් මහාවංසයේ සඳහන් වේ. 111වන උදය රජුගේ පාලන සමයේ (934-937) දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියාකාරීත්වය තුළදී, අධිකරණ නිලධාරීන් කිහිප දෙනෙකු, ඔවුන්ගේ සරල බව සහ පූජනීය බව නිසා ගෞරවයට පත් සමහර භික්ෂූන් වහන්සේලාගේ ආශ්‍රමයකට පලා ගියහ. රජු සහ ඔහුගේ සොල්දාදුවන් ආශ්‍රමයට ඇතුළුවී නිලධාරීන් වහාම මරණයට පත් කළහ. අභයභූමියකට ඇති අයිතිය උල්ලංඝණය කිරීම සහ ආශ්‍රමය තුළ ලේ වැගිරීමට එරෙහි විරෝධතාවක් ලෙස භික්ෂූන් වහන්සේලා සමූහයක් ලෙස නැඟී වනාන්තරය බලා අගනුවරින් පිටත් වූහ.

මෙයින් කෝපයට පත්වී අගනුවර කැරලි ඇති වූ අතර, හමුදාවේ සමහර කොටස් කැරලි ගැසූ අතර, රජුගේ ජීවිතයට පවා තර්ජන එල්ල විය. තත්ත්වය සන්සුන් කිරීම සඳහා, රජුට තම ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් භික්ෂූන් වහන්සේලාගෙන් සමාව ඇයදීමට සහ භික්ෂූන් වහන්සේලාට නැවත ආශ්‍රමයට පැමිණෙන ලෙස ඉල්ලා සිටීමට සිදුවිය. මෙම කැලඹීම පහව ගිය අතර, අවමානයට ලක් වූ සහ හික්මවනු ලැබූ රජුට නැවත අභයභූමියේ අයිතිය උල්ලංඝණය නොකරන බවට පොරොන්දු වන්නට සිදුවිය.

ආශ්‍රමවල අභයභූමි ආරක්ෂාව සැලසිය හැකි බවට සැබැවින්ම කිසිම සඳහනක් ත්‍රිපිටකයේ නැත.

භික්ෂූන් වහන්සේලා ඇතැම් නීතිවලින් නිදහස් කළ හැකිය යන අදහසින් චාරිත්‍රය වර්ධනය වන්නට ඇත (e.g. D.I,60). විනිශ්චයන් වඩාත් හොඳින් සිදුවන්නේ සන්සුන් සහ කරුණු සලකා බැලීමෙන් පසුව තීරණය කළ විට දී යන බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම ද එක් සාධකයක් විය හැකිය.

**සඞ්ඝ**

සඞ්ඝ යන පාලි වචනයේ අර්ථය 'සමූහයක්' හෝ ආගමික සභාව' වන අතර, බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන්ගේ සමුච්චයට දෙන ලද නමයි. බුදුපියාණන් වහන්සේ සඞ්ඝයා වර්ග දෙකකට බෙදයි. ආශ්‍රමස්ථ සඞ්ඝයා සහ ආර්ය සඞ්ඝයා වශයෙනි. ආශ්‍රමස්ථ සඞ්ඝයා යනු නිසියාකාරව පැවිදි වූ භික්ෂූන් සහ භික්ෂුණීන් ගේ ආගමික සභාවයි. ආර්ය සඞ්ඝයා (ආරිය සඞ්ඝ හෝ සමහර විට සාවක සඞ්ඝ) සෑදී ඇත්තේ පළමු ආර්ය මාර්ගය හෝ ඊට ඉහළ මාර්ගවලට පැමිණෙන ලද සියලු භික්ෂූන්ගෙන්ය.

කෙසේ නමුත්, පුළුල් අදහසින් ගත් කළ සඞ්ඝ යනු පැවිදි වූ හෝ නොවුණු සියලු නිර්වාණයට පත් වූ හෝ නොවුණු, බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට සම්පූර්ණයෙන්ම කැපවූ පුද්ගලයන්ය. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'ප්‍රඥාවන්ත සහ ආත්ම විශ්වාසය ඇති, දැනුමැති, ධර්ම පිළිවෙත් දිගටම ගෙන යන ඒ අනුව ජීවත්වෙන, ඕනෑම කෙනෙකු ඒ අය සඞ්ඝයාගේ ආලෝකය යැයි හඳුන්වනු ලැබේ. දැහැමි භික්ෂූව, දැනුමැති

භික්ෂුණිය, ශ්‍රද්ධාවෙන් පිරුණු උපාසක, උපාසිකාවන් යන සියලු දෙනා නිවරදව සඬ්ඝයාගේ ආලෝකය ලෙස හැඳින් වේ' (A.II,8). බලන්න **ප්‍රජාවගේ පදනම**

## සඬ්ඝමිත්තා

බුදුපියාණන් වහන්සේගේ ඍජු කාන්තා ශ්‍රාවකයන්ට පසු බෞද්ධ ඉතිහාසයේ පළමු වැදගත් කාන්තාව වන්නේ සඬ්ඝමිත්තා තෙරණියයි. ඉන්දියානු වාර්තාවල ඇය ගැන කිසිදු සඳහනක් නොමැති අතර, අප ඇය ගැන දන්නා සෑම දෙයක්ම ලැබී ඇත්තේ ශ්‍රී ලංකාවේ වංශකථාවලින් උපුටා ගත් දේවලිනි. එනම් දීපවංස සහ මහාවංස (3වන - 4වන ශතවර්ෂයේදීය) යනාදියෙන්ය.

සඬ්ඝමිත්තා අශෝක රජුගේ දියණියයි. ඇය භික්ෂුණියක ලෙස වයස 18දී පැවිදි වූවාය. ඇයගේ සහෝදර මහින්ද ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වා දුන් පසු දේශිය භික්ෂූන් පස් නමක් පැවිදි කළේය. රාජ සභාවේ කාන්තාවන් පස් දෙනෙකු ද පැවිදි කරන ලෙස ඉල්ලීමක් කරන ලදී. කාන්තාවක් පැවිදි කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ සහ භික්ෂුණීන් වහන්සේලාගේ ගණපූරණය අවශ්‍ය බැවින් මහින්ද නැවත ඉන්දියාවට පණිවුඩයක් යවමින් භික්ෂුණීන් වහන්සේලා පිරිසක් ශ්‍රී ලංකාවට එවන ලෙස ඉල්ලා සිටියේය. ඇය බුද්ධ ගයාවෙන් බෝධි වෘක්ෂයේ ශාඛාවක් රැගෙන පැමිණ පසුව කාන්තාවන් පිරිසක් පැවිදි කර ඉන්දියාවෙන් පිටත පළමු වරට ශ්‍රී ලංකාවේ භික්ෂුණී ශාසනය පිහිට වූවාය. සඬ්ඝමිත්තා තෙරණිය ඇයගේ ජීවිතයේ ඉතිරිය ශ්‍රී ලංකාවේ ධර්මය උගන්වමින්, ආධුනික භික්ෂුණීන්ට මඟ

පෙන්වමින් ගත කළාය. ඇය 59වන වියේ දී මිය ගියාය.

5වන ශතවර්ෂයේදී භික්ෂුණී පෙළපත චීනයේ පිහිට වූයේ ශ්‍රී ලංකාවේ භික්ෂුණීන් විසින්ය. එම නිසා, චීනයේ, කොරියාවේ සහ තායිවානයේ භික්ෂුණීන් ඔවුන්ගේ ආරම්භකයා සඞ්ඝමිත්තා ලෙසින් සලකයි. නමුත්, 20වන ශතවර්ෂය වනතුරු ඇයගේ නම ඒ රටවල අමතකව තිබුණි. ශ්‍රී ලංකාවේ මෙරටට සඞ්ඝමිත්තාගේ පැමිණීම සෑම වර්ෂයකදීම දෙසැම්බර් මස පුරපෝය දින සමරනු ලබයි.

**සඞ්කස්ස**

සඞ්කස්ස (සංස්කෘතියෙන් සඞ්කස්ස) මධ්‍යම දේශයේ බටහිර අයිනේ පිහිටි නගරයකි. සම්ප්‍රදායෙන් කියැවෙන්නේ බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ මව ඇයගේ මරණයෙන් පසු නැවත උත්පත්තිය ලැබූ තාවතිංස දිව්‍යලෝකයට වැඩම කර මාස තුනක් ඇයට අභිධර්මය උගන්වමින් එහි රැඳී සිටීමෙන් පසු ආපසු වැඩම කළ බවයි. කියන ආකාරයට ඉණිමං තුනක් අහසේ දිස් වී ඇත - දකුණු පසින් ශක්‍රදේවේන්ද්‍රයන් සඳහා රත්‍රන් ඉණිමඟක්, වම්පසින් බ්‍රහ්ම සඳහා රිදී ඉණිමඟක් සහ මැදින් බුදුපියාණන් වහන්සේ සඳහා මැණික් ඉණිමඟක් වශයෙනි. සම්ප්‍රදායේ සමහර මතවලට අනුව, බ්‍රහ්ම බුදුපියාණන් වහන්සේ දිව්‍ය ලෝකයේ සිට පොළොවට වැඩම කරන විට කුඩයක් උන්වහන්සේ වෙත එසවූ බව කියැවේ.

මෙම 'ඊනියා' ප්‍රාතිහාර්යය ත්‍රිපිටකයේ සඳහන් වී

නැත. එම ස්ථානය ගැන පවා විස්තර කර ඇත්තේ අවස්ථා දෙකකදී වන අතර, බුදුපියාණන් වහන්සේ එහි වැඩම කර ඇත්තේ එක් වතාවක් පමණි. ඒ උන්වහන්සේ එම ස්ථානය පසු කර වෙනත් ස්ථානයකට වඩින විටදීය (Vin.II,299; III,11). එය ඇදහිය නොහැකි දෙයක් වීම හැර, සංකස්ස පුරාවෘත්තය චෛතසික බලයන් හෝ ආශ්චර්යමත් හැකියාවන් ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කිරීමට විරුද්ධව බුදුපියාණන් වහන්සේ පැණවූ තහනම සමග පරස්පර ද වේ (Vin.II,110-111). මීට අමතරව, බුදුපියාණන් වහන්සේ මාස තුනක් අභිරහස් ලෙස සමාජයෙන් අතුරුදහන් වූ බවට ධර්ම ග්‍රන්ථවල සඳහනක් නැත. සඞ්කස්ස පුරාවෘත්තය අභිධර්මය සමග ඇති සම්බන්ධය එහි ආරම්භය සහ මූලික හේතුවට යමක් විවෘත කර දෙයි.

අභිධර්මය බුදුපියාණන් වහන්සේගේ දේශනාවල නොමැති වීම ප්‍රකට කරුණකි. එය බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල ශාඛාවලින් එකක් ලෙස සඳහන් වී නොමැත. (නවඞග, A.II,103) පළමු ධර්ම සංගායනාවේ විස්තරයක පැවිදි නීති (විනය) සජ්ඣායනයක, සහ ධර්මදේශනා (සූත) සඳහන් කර ඇති නමුත්, අභිධර්මය (Vin.II,285) පිළිබඳව නැත. බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු ශතවර්ෂවලදී අභිධර්මයට ප්‍රවේශවීම වඩාත් ජනප්‍රිය වූ අතර, අභිධර්ම පිටකයේ ග්‍රන්ථ ක්‍රමයෙන් රචනා වූ විට, ඒවා ධර්ම සංග්‍රහයට අයත් ලෙස ඒවා සැලකීමට සහ ත්‍රිපිටකයට ඇතුළත් කිරීමටත් බලපෑම් වැඩිවිය. කාලයත් සමග අභිධර්මයේ ප්‍රභවය පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍ය විය. ඒ අනුව, බුදුපියාණන් වහන්සේ අභිධර්මය ඉගැන්වීමට දිව්‍යලෝකයට ගිය

බවට පුරාවෘත්තය ක්‍රමයෙන් ඇතිවිය.

අශෝක රජු විශාල ගල් කුළුණක් සඞ්කස්සයේ ඉදි කළේය. එහි සමහර කොටස් තවමත් තිබේ. නමුත්, මෙම කුළුණ ඉදි කළේ මෙම පුරාවෘත්තය සිහිකිරීමටය යන්නට සාධකයක් නැත. සමහර විට එකල එය නොපැවතිය හැකිවීමට ඉඩ ඇත. සඞ්කස්සයේ පුරාවෘත්තයේ පැරණිතම සාක්ෂිය වන්නේ සාංචියේ ඇති ස්තූපයේ මුර්තිමය නිරූපණයකි. එය ක්‍රි. පූ. 1වන ශතවර්ෂයේ සිට එහි තිබේ.

'Excavations at Sankisa.' *Journal of the U.P. Historical Society*, 1927.

## සංස්කෘත

සංස්කෘත යනු 'ඔප දමන ලද' හෝ 'වඩා ඔප කරන ලද' යන අර්ථයයි. එය ඉන්දියාවේ සම්භව වූ භාෂාවට දෙන ලද නමයි. හින්දු ආගමේ පූජනීය ධර්ම ග්‍රන්ථ සහ මහායාන සහ වජ්‍රායන බුදුදහම රචනා වී ඇත්තේ සංස්කෘත භාෂාවෙනි. ථේරවාදී බුදුදහමේ ත්‍රිපිටකය රචනා වී ඇත්තේ පාළි භාෂාවෙනි. මෙම භාෂා දෙකේම බොහෝ සමාන දේ තිබෙන අතර, සංස්කෘතයේ පාළි භාෂාවේට වඩා සංකීර්ණ ව්‍යාකරණ විධි සහ විශාල වචන සමුදායක් ඇත. තව දුරටත්, සංස්කෘතයට, දෙවනාගරී යනුවෙන් හැඳින්වෙන එයටම අයත් හෝඩි ක්‍රමයක් ඇත. පාළි භාෂාවේ විශේෂිත හෝඩි ක්‍රමයක් නැත. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී පවා, සංස්කෘතියෙන් කථා කළේ රාජ සභාව සහ පූජකයන් සහ බුද්ධිමතුන් පමණි. මෙම හේතුව නිසා බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ දේශනා සංස්කෘත පැදිවලින්

ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කළහ (Vin.II,139). උන්වහන්සේට අවශ්‍ය වූයේ උන්වහන්සේගේ ඉගැන්වීම් හුදෙක් ස්වල්ප වූ ඉහළ පැළැන්තියට පමණක් නොව, සියලු දෙනාට ලබාගත හැකිවීමය.
*History of Classical Sanskrit Literature*, S. Bhattacarji, 1993.

## සාරිපුත්ත

සාරිපුත්ත බුදුපියාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවකයන් දෙදෙනොගෙන් එක් අයෙකි. උන්වහන්සේ සහ ළමාවියේ මිතුරු මොග්ගල්ලාන යන දෙදෙනාම පැවිදි වූයේ සඤ්ජය ගුරුවරයාගෙනි. අවසානයේ ඔවුන් එම ගුරුවරයා සහ ඔහුගේ දර්ශනය පිළිබඳව කලකිරීමට පත් වී, ඔහු අතහැර වඩා හොඳ ගුරුවරයෙකු සොයමින් දෙදෙනා වෙන්ව ගමන් ඇරඹූහ. එක් දිනක සාරිපුත්තට බුදුපියාණන් වහන්සේගේ මෙම අපූර්ව ධර්මය පිළිබඳව අසන්නට ලැබී, එම ධර්මය වැළඳගෙන, තම මිත්‍රයාට පැවසීම සඳහා ඔහු සොයා කෙළින්ම ගියේය. ඔවුන් හමු වූ පසු, මොගල්ලාන ද ධර්මය අසා, එය වැළඳගෙන, පැවිදි වීම සඳහා බුදුපියාණන් වහන්සේ සොයා ගියහ.

කාලයාගේ ඇවෑමෙන් බුදුපියාණන් වහන්සේ සාරිපුත්ත සහ මොග්ගල්ලාන උන්වහන්සේගේ අග්‍රශ්‍රාවකයන් සහ උරුමක්කාරයන් ලෙස සැලකූහ. සාරිපුත්තගේ වෙසෙසි හැකියාව වූයේ ධර්මයේ වඩාත්ම ගම්භීර කරුණු අවබෝධ කිරීමට සහ එය පැහැදිලි සහ තේරුම් යන ආකාරයෙන් පැහැදිලි කිරීමට තිබූ හැකියාවත්ය. එම නිසා, බුදුපියාණන් වහන්සේ සාරිපුත්ත භික්ෂුවට 'ධර්මයේ ප්‍රධානී' යන

පදවි නාමය ලබා දුන්හ. සාරිපුත්ත භික්ෂුවගේ එක් ධර්ම දේශනාවකදී, තමා සතුව තිබූ ගුණාංග, සහ යහපත් ධර්ම ගුරුවරයෙකු වීමට තිබිය යුතු ගුණාංග පිළිබඳව කථා කළහ: 'යම් කෙනෙකු තවත් කෙනෙකුට උගන්වන විට, ඔහු පළමුව තමා තුළ කරුණු පහක් ඇති කර ගත යුතු වන අතර, ඊට පසු ඉගැන්විය යුතුයි. ඒ පහ මොනවාද? ඔහුට සිතන්නට ඉඩ හරින්න: 'මම කථා කළ යුත්තේ නිවැරදි වේලාවටයි, වැරදි වේලාවට නොවේ. මා කථා කළ යුත්තේ මෘදු ලෙසයි, රළු ලෙස නොවේ. මම අරමුණ ගැන කථා කරමි, අරමුණ නොවන දේ ගැන කථා නොකරමි. මම ආදරයෙන් පිරුණු මනසකින් කථා කරමි, වෛරයෙන් පිරුණු මනසකින් නොවේ.' පළමුව මේ කරුණු පහ ඇති කර ගෙන තවත් කෙනෙකුට උගන්වන්න' (A.III,196). මෙය ත්‍රිපිටකයේ සුරැකිව තිබෙන සාරිපුත්ත භික්ෂුවගේ ධර්ම දේශනාවලින් එකකි.

ශ්‍රී ලංකාවේ සහ තායිලන්තයේ පන්සල්වල තිබෙන ප්‍රධාන බුදුපිළිමවල දෙපැත්තේ බොහෝ විට කුඩා පිළිම දෙකක් ඇත, එයින් එකක් සාරිපුත්ත භික්ෂුවගේත්, අනෙක මොග්ගල්ලාන භික්ෂුවගේත් පිළිම වේ.

*Great Disciples of the Buddha*, Nyanaponika and Hellmuth Hecker, 1997.

## සාරනාත්

සාරනාත් උතුරු ඉන්දියාවේ පිහිටි වාරණාසි නගරයේ පිටත අයිනේ තිබෙන කුඩා ගම්මානයකි. සාරනාත්, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය පළමු වරට ලොවට හඳුන්වා දුන් ස්ථානයයි. එකල, එය

ඉසිපතනය ලෙස හඳුන්වනු ලැබුණි. එහි මිගදාය නම් මුවන් ගැවසුණු වනඋද්‍යානයක් තිබුණි. සාරනාත් යන නම අලුත් එකකි. 'මුවන්ගේ ප්‍රධානියා' යන අර්ථය ඇති වචනයෙන් පැවත එන්නකි. බුදුපියාණන් වහන්සේගෙන් වසර ගණනාවකට පසු, සාරනාත් සංස්කෘතිය සහ ඉගෙනීම සම්බන්ධ ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට පත්විය. අද, සාරනාත්හි නටබුන් විශාල ප්‍රදේශයක ආවරණය වේ. එම ස්ථානයේ ඇති කෞතුකාගාරයේ කලාභාණ්ඩවල විශාල එකතුවකට ඉඩ සැලසී ඇත.
*Guide to the Ruins of Sarnath*, Rai Sahni,1922.

## උණුසුම් කළ කාමරය (සෝනාව)

සනීපාරක්ෂාව හෝ වෛද්‍යමය හේතු නිසා, දහඩිය දැමීම සැලැස්වීමට සකස් කළ කාමරයක් හෝ නිවෙසක් සෝනාව ලෙස හැඳින් වේ. තෙත උණුසුම් කිරීම (හුමාලය) හෝ වියළි උණුසුම මගින් දහඩිය දැමීම සැලැස්විය හැකිය. සෝනාව විනය පිටකයේ විස්තර කර ඇත්තේ උණුසුම් කාමරයක් (ජන්තඝාර) හෝ වඩාත් විශේෂිත ලෙස ගිණි කාමරයක් (අග්ගිසාලා) කුස්සියක් වශයෙන් හඳුන්වා දී ඇත. මෙම සෝනාවන් සැලසුම් කළේ සහ භාවිත වූයේ කෙසේ ද කියා දීර්ඝ විස්තරයක් විනය පිටකයේ ඇත. උණුසුම ඇතුළත රඳවා ගැනීම සඳහා තදින් වැසෙන දොරවල්, ජනේල සහ සිවිලිම් සහිත කාමරයක් එහි තිබුණි. ගින්දර වටා අසුන් සහ බංකු සූදානම් කර තිබූ අතර, ශරීරයට සහ ගින්දරින් රත්වූ ගල් මතට ඉසීම සඳහා ජල බඳුන් හෝ ද්‍රෝණිකා තිබුණි. ඇඳුම් බිත්ති ඇබ මත රෙදි එල්ලා තිබුණි. කාණුවලින් අමතර ජලය ඉවතට ගියේය (Vin.II,120-1).

පයිප්ප වලින් වාෂ්පය පිටතට යන්නට සැලසුණි. සෝනාව තුළ භික්ෂූන්ට නිර්වස්ත්‍රව ඉන්නට අවසර නොතිබුණි. සාමාන්‍ය ක්‍රියාවලිය වූයේ සමහර විට පරණ සම ඉවත් කිරීම සඳහා සීරීමට යොදන ද්‍රව්‍යයක්, සියුම් මැටි සිරුර මත ආලේප කිරීමයි. ඊට පසු මැටි දහඩියෙන් සෝදා යන තුරු අවයව අතුල්ලයි හෝ සම්බාහනය කරයි. 'දහඩිය දැමීමට සලස්වන ප්‍රතිකාර' (සම්භාරසෙද) වර්ග හතරක් ඇත : යම් ඖෂධ සහිත ජලයෙන් වාෂ්ප කිරීම, කංසා ශාකය සහිත ජලයෙන් වාෂ්ප කිරීම, 'ප්‍රබල දහඩිය දැමීමක්' සහ උදකකොත්තක, උණු ජලය නාන බාල්දියක පොඟවන ලද යන අදහස විය හැකිය (Vin.I,205).

ඉන්දියානු බෞද්ධ භික්ෂූන් සෝනා චීනයට හඳුන්වා දුන් අතර, එතැනින් කොරියාවටත්, අවසානයේ ජපානයටත් එය පැතිර ගියේය. ගෙන්ජෝ සන්සොගේ (602-664 ක්‍රි. පූ.) ඩයිටෝ සෙයිඉකි දින පොතේ, සෝනා ඇති චීන බෞද්ධ ආරාම පිළිබඳව සඳහන් කරන අතර, ඒවා මහජනතාවට විවෘත වූ බවත් සඳහන්ය. මෙම සෝනාවල දුප්පතුන්ට සහ රෝගීන්ගේ යහපත සඳහා ඖෂධ සහ ආහාර සපයා ඇත. නාරා සමය තුළ ජපානයට බුදුදහම හඳුන්වා දීමත් සමග, බොහෝ විශාල පන්සල්වල සෝනා ඇති විය. එතැන් සිට නවීන උණුසුම් කිරීමේ ස්ථාන, සෙන්ටෝ ක්‍රමයෙන් බිහි විය. ආරම්භයේදී, මෙම උණුසුම් කිරීමේ ස්ථාන ප්‍රධාන වශයෙන් අරමුණු වූයේ භික්ෂූන්ටය. නමුත්, ඉඳහිට අනෙක් අයටද විවෘත විය. ෂොමූ රජුගේ බිරිඳ වූ කෞමයූ කෞගූ (701-760 ක්‍රි. පූ.) රෝගීන්ට මාසයකට දින හයක් උණුසුම් කිරීමේ අවස්ථාව ලබා දුන් අතර, ඇය

පෞද්ගලිකවත් ඔවුන් පිරිසිදු කළ බව වාර්තා වේ. කමකුරා අවධියේ (1185-1333) සිට, රෝගීන් සඳහා උණුසුම් කිරීමේ ස්ථාන පන්සල්වල තිබීම සාමාන්‍ය දෙයක් විය. පන්සල්වලින් පිටත පොදු උණුසුම් කිරීමේ ස්ථාන බිහිවූ පසු, ඔවුහු ඒවා පන්සල්වල ආකාරයට බිහි කළහ. එම සම්ප්‍රදාය අදටත් නොකඩවා සිදු වේ. 1960 ගණන් වල සිට, ජපානයේ නිවෙස් වඩාත් පොදුවේ නානකාමර සමග සැලසුම් කර තිබීමත් සමග, පොදු උණුසුම් කිරීමේ කාමර ජනප්‍රියත්වයෙන් අඩු විය.

## සාවත්ථී

සාවත්ථිය කෝසල රාජධානියේ අගනුවරයි. සම්ප්‍රදායට අනුව, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ජීවිතයේ අවසාන අවුරුදු 23 බොහෝ කාලයක් නගරයේ ජීවත් වූහ. වර්තමානයේ, සාවත්ථියේ නටබුන් රප්ති ගංගාව සමග කිලෝමීටර් 5ක් පමණ දිග, විශාල චන්ද්‍රවංකයක් සාදයි. එහි අභ්‍යන්තර වංගුව හරහා ගංගාව ගලයි. නගරයේ දකුණට ස්වල්ප වූ දුරකින් ජේතවනයේ නටබුන් අතර, බුදුපියාණන් වහන්සේගේ කාලයේ බිහිවූ මුල්ම විශාල ආශ්‍රම සංකීර්ණය තිබේ. එය තවත් වසර 1500ක් නොකඩවා ක්‍රියාත්මක විය. සාවත්ථිය ඇතුළත සහ අවට බොහෝ ස්ථාන පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වී තිබේ. මේවායෙන් ස්වල්පයක් අදටත් හඳුනාගත හැකිය.

‘Sravasti in Ancient India.’ *Memoirs of the Archaeological Survey of India*, 1935.

## ධර්ම ග්‍රන්ථ

ධර්ම ග්‍රන්ථ යනු ඕනෑම විශේෂිත ආගමක පූජනීය ලියවිලි හඳුන්වන සාමාන්‍ය භාෂිතයයි. බුදුපියාණන්

වහන්සේ තමන් වහන්සේගේ ශ්‍රාවකයන් උන්වහන්සේගේ වචන ඉතා ප්‍රවේසමින් සැලකිල්ලට ගැනීම බලාපොරොත්තු වූ අතර, පොෞද්ගලික අත්දැකීම්වලට වඩා ධර්මග්‍රන්ථවලට ප්‍රමුඛත්වය දීමට විරුද්ධව අවවාද කළහ. ඒ අනුව, දැනුවත් බෞද්ධයා ත්‍රිපිටකය, බෞද්ධ ධර්ම ග්‍රන්ථ, නැතිවම බැරි මාර්ගෝපදේශය ලෙස භාවිත කරයි. නමුත්, ඔහු එය වැරදි සිදුවිය නොහැකි හෝ සත්‍යයේ එකම නිධිය ලෙස නොසලකයි. බලන්න **කාලාම සූත්‍රය**

## උස් ආසන සහ සෝපාවන්

උස් ආසන සහ සෝපාවන් (සයනාසන) වාඩිවීම සහ දිගාවීම සඳහා භාවිත කරන ලීබඩු වර්ග වේ. අෂ්ටාංග සිල්වල අවසාන ශික්ෂාපදය සහ දසසිල්වල නමවැන්නෙහිද කෙනෙකු උස් අසුන් (උච්චා) හෝ විශාල (මහා) අසුන් සහ සෝපාවන් භාවිතයෙන් වැළකිය යුතු බව කියැවේ (A.I,212). උපෝසථ දිනවල පොළොව මත පැදුරක් එලා නින්දට යන ලෙස බුදුපියාණන් වහන්සේ තමන්ගේ ශ්‍රාවකයන්ට පැවසූහ (A.I,215). සමහර මිනිස්සු මෙම නීතියෙන් ව්‍යාකූලත්වයට පත් වී, එය සදාචාරය හෝ මනස පුහුණු කිරීම සම්බන්ධයෙන් කෙසේ බලපාන්නේද කියා පුදුමයට පත් වේ. සැබැවින්ම සදාචාරය සම්බන්ධයෙන් එහි කිසිවක් නැත. පළමු ශික්ෂාපද පහ පමණක් සදාචාරමත් හැසිරීමකට සම්බන්ධ වන අතර සහ කර්මානුකූලව වැදගත් වේ. ආසන සහ සෝපාවන් ඇතුළුව, අනෙක් ශික්ෂාපද මනස සන්සුන් කිරීමට සහ චරිත හැඩගැස්වීමට උපකාරී වන ක්‍රම වේ.

වර්තමානයේදී මෙන්ම, පැරණි ඉන්දියාවේ, උස් හෝ මහා පුටුවක ඉඳගැනීම බලය සහ තත්ත්වය පිළිබිඹු කරන සලකුණක් විය. රජවරුන්, විනිශ්චයකරුවන්, දේශකයන්, කළමනාකරුවන්, පාර්ලිමේන්තුවේ කථානායක, ආදීන් සඳහා විශේෂ උස් ආසන ඇත. අටවන ශික්ෂාපදය පුහුණු කිරීම යනු අවම වශයෙන් දිනකටවත් කෙනෙකුගේ සමාජ තත්ත්වය අත්හැරීම, ප්‍රදර්ශනය නොකිරීම සහ වාසි ලබා නොගැනීමයි. අටවන ශික්ෂාපදය පිළිපැදීම යනු නිහතමානීකම රැකගැනීම, මමත්වය හීන කිරීම සහ 'තමන්ට ඕනෑවට වඩා ගරුසරු නොදැක්වීමයි'.
*Ancient Indian Furniture*, K. Krishna Murthy, 1982.

## බුදුපියාණන් වහන්සේගේ කාලයේ ආගමික නිකායන්

බුදුපියාණන් වහන්සේගේ කාලයේ තිබූ ප්‍රධාන ආගමික ව්‍යාපාර දෙක නම් බ්‍රාහ්මණයන්ගේ සහ ශ්‍රමණයන්ගේය. බ්‍රාහ්මණයන් පිළිගත්තේ බ්‍රාහ්මණ ආගම වන අතර, වේදය අවසාන ආධ්‍යාත්මික බලය ලෙස සැලකූහ. කෙසේ නමුත්, එකල සිටි සමහර වඩාත් ප්‍රගතිශීලී බ්‍රාහ්මණයන්ට වෛදික චාරිත්‍රවල ඇති වටිනාකම පිළිබඳව සැක මතුවන්නට විය. ඔවුහු ආචාරධර්ම සහ භාවනාවලට වැඩි අවධානයක් දුන්හ. විශේෂයෙන්ම, ඔවුහු වෛදික සත්ත්ව බිලිපූජා පිළිබඳව වඩාත් නොසන්සුන් වූහ. සමහර නිදහස් මතධාරී බ්‍රාහ්මණයෝ පාසැල් පිහිටු වූහ. නමුත්, තමන් ඒ වන විටත්, වෛදික සම්මතයේ සිටින බව දුටුවහ.

අනෙක් අතට, ශ්‍රමණයන් වේදය සහ බොහෝ

බ්‍රාහ්මණ ආගමේ විශ්වාස සහ පුහුණුවීම් ප්‍රතික්ෂේප කළ අතර, සම්මත විරෝධ ලෙස සලකනු ලැබුණි. බ්‍රාහ්මණයෝ පවා මිථ්‍යාලබ්ධික වූහ. ශ්‍රමණයන්ගේ මෙම අප්‍රසාදය, බුදුපියාණන් වහන්සේ සහ ශ්‍රාවකයන් 'නොවැදගත්, රැවුල කපන ලද වාල් වැඩ කරන ශ්‍රමණයන්, බ්‍රහ්මගේ පාදයේ හොරිකඩ වැදගම්මක් නැති කොටස' බව බ්‍රාහ්මණ ශිෂ්‍ය අම්බට්ඨගේ ප්‍රකාශයෙන් මනාව පැහැදිලි වේ (D.I,90). ඔහුගේ අපහාසයේ අවසාන කොටස යොමු වූයේ පහත් කුලවල මිනිසුන් බිහි වූයේ, උත්තරීතර දෙවියන් වහන්සේ වන, බ්‍රාහ්මණගේ පාදයෙන් යන විශ්වාසයෙන්ය. බ්‍රාහ්මණවරුන්ගේ ඇස් හමුවේ බොහෝ ශ්‍රමණයන් පහත් කුලවලට සමානව සිටියේ කුල නීති නොසලකා හැර ඇති බැවිනි. ශ්‍රමණයන් සමාජීය චාරිත්‍ර සහ බලාපොරොත්තු නොසලකා හැර තිබුණි. සාමාන්‍යයෙන් පුහුණු කළේ බ්‍රහ්චරියාව සහ දානයෙන් පමණක් යැපෙන, සහ ආධ්‍යාත්මික කරුණුය. ඔවුන් ප්‍රමුඛත්වය දුන්නේ ධර්ම ග්‍රන්ථ පිළිබඳ හැකියාවන්ට නොව, ඊට වඩා අත්දැකීම්වලටය. ඔවුහු භාවනාව, ස්වයං අත්ථකිලමථය, යෝගීමය ස්වසනය, උපවාසය සහ ඉන්ද්‍රීය සංවර විරහිතතාව පිළිබඳව අත්හදාබැලීම් කළහ. සමහරු නිර්වස්ත්‍රව සිටීම පුහුණු කළහ. එවැනි පුරුදුවල ප්‍රතිඵලයක් වශයෙන්, පුද්ගලයෙකුට යම් අද්භූත අත්දැකීමක් ඇති වූ අතර, ඔහු තමන්ට රහත්ඵලය හෝ විමුක්තිය ලැබුණේ යැයි විශ්වාස කළේය. ඔහු ශ්‍රාවකයන් ආකර්ෂණය කර, අළුත් නිකායක් ආරම්භ කරන්නට හේතු විය හැකිය.

ත්‍රිපිටකයේ සඳහන් කර ඇති සමහර නිකායන්වලට ආජීවක (පිරිසිදු ජීවිත ඇති අය), මුණ්ඩක සාවක

(මුඩු කළ ශ්‍රාවකයන්), ජටිල (අවුල්වූ කෙස් ඇති අය), පරිබ්බාජක (ඔබ මොබ යන අය), මාගණ්ඩක, තෙඩණ්ඩික (ත්‍රිපාද ඇති), අවිරුද්ධක (නිදහස් අය), දෙවධම්මික (දිව්‍යමය අය), සහ අද්භූත දාරුපාත්තික (ලී බඳුන සමග සිටින අය), A.III,276-7; D.I,157) යනුවනි. මේ අය සහ වෙනත් ශ්‍රමණ නිකායන් ඒකාබද්ධව හැඳින්වූයේ 'දිය බැස එගොඩ වෙන අය' (තිත්ථිය) ලෙසයි. එයට හේතුව ඒ අය මෙම ලෝකයේ සිට ඊළඟ ලෝකයට 'එගොඩ වෙන්නට' හැකි ක්‍රමය පෙන්වන්නට හැකි අය ලෙස හැඳින්වීම නිසාය. පසුකාලීන ශතවර්ෂවලදී, ඕනෑම බෞද්ධ නොවන ශ්‍රමණයෙකුටත් 'දිය බැස එගොඩ වෙන අය' යන නාමය බෞද්ධයන් භාවිත කරන ලදී. එකල තිබූ ශ්‍රමණ නිකායවලින් ප්‍රමුඛ සහ වර්තමානය වනතුරුත් පැවතෙන දෙක නම්, ජෛන ආගම සහ එහි අනුගාමිකයන් වන නිගණ්ඨයන් (බැඳීම් නැති අය) සහ බුදුදහමයි. බුදුපියාණන් වහන්සේ බොහෝ විට හඳුන්වනු ලැබූවේ 'ශ්‍රමණ ගෞතම' යනුවෙනි (D.I,4).

ක්‍රි. පූ. 5වන ශතවර්ෂයේ සිට 3වන ශතවර්ෂය අතර, බොහෝ සෙයින් ආගමික මාරුවීම් විශාල ප්‍රමාණයක් සිදුවිය. මෙහිදී බුදුපියාණන් වහන්සේත්, වෙනස් ගුරුවරුන් දෙදෙනෙකු යටතේ ශ්‍රාවකයෙක් විය. ඒ ආලාර කාලාම සහ උද්දක රාමපුත්ත යටතේ උන්වහන්සේගේ මුල් අවුරුදු හය තුළදී සත්‍යය සෙවීම සඳහා වූ මෙහෙවරදීය (M.I,164-5). උන්වහන්සේගේ මුල්ම ප්‍රගමනයේදී, ජටිළ කණ්ඩයමක් මෙහෙයවූ කාශ්‍යප සහෝදරයන් තිදෙනා ඔවුන් සමග ඔවුන්ගේ සියලු අනුගාමිකයන් රැගෙන එමින් ශාවකයන් බවට පත්වූහ (Vin.I,24-5).

බුදුපියාණන් වහන්සේ ධර්මය ඉගැන්වීම ආරම්භයත් සමගම උන්වහන්සේ වෙත ඉතා ඉක්මණින්ම පුළුල් අවධානයක් ලැබීමට වෙන අන් කිසිම දෙයකට වඩා හේතුවූයේ මෙම සිද්ධියයි. 'විමුක්තිය ලැබූ තිදෙනා' වශයෙන් සිතන අයගෙන් නන්ද වච්ච ආජීවක නිකායේ එක් අයෙකි. ඔහු බුදුදහම වැළඳ ගත්තේය අනෙක් මිනිස්සු දෙදෙනා පසුව බුදුපියාණන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශ්‍රාවකයන් වූ සාරිපුත්ත සහ මොග්ගල්ලානයි. ඒ දෙදෙනාම බෞද්ධයන් වීමට පෙර දී ආජීවකයන් වූහ. ඉඳහිට දී බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වූ අය වෙනත් නිකායන්වලට එකතු වූහ. මෙයට උදාහරණ වශයෙන් සුනක්ඛත්ත (D.III,2) දැක්විය හැකිය. බලන්න

**සුභද්ද සහ බුදුපියාණන් වහන්සේගේ ගුරුවරුන්**

*Sramana Tradition*: *Its History and Contribution to Indian Culture*, G. C. Pandey, 1978.

## පුද්ගලභාවය

දෙආකාරයක පුද්ගලභාවයන් ඇති බව කියන්නට පුළුවනි - ප්‍රායෝගික පුද්ගල සහ න්‍යායාත්මක පුද්ගල වශයෙනි. ප්‍රායෝගික පුද්ගලභාවය යනු පුද්ගලයා එය අත්විඳින ආකාරයමය - ඔහුගේ හෝ ඇයගේ සිතුවිලි සහ හැඟීම්, ගති ලක්ෂණ සහ නැඹුරුව, සහ අනෙක් අයගෙන් ස්වාධීන වීමට සහ වෙන්වීමට ඇති හැඟීමයි. මෙම ආත්මභාවය නිතරම වෙනස්වන සහ ක්‍රමයෙන් ඇති වී නැතිවී යන නිර්මාණයකි, නමුත්, පැහැදිලිවම පවතී. න්‍යායාත්මක පුද්ගලභාවය පුද්ගලයෙකුගේ වෙනස්නොවන යටිතලයකි. එය පුද්ගලයෙකුගේ සාරයයි. සමහර සම්ප්‍රදායන් තුළ, එය හඳුන්වන්නේ ජීවය හෝ ආත්මය වශයෙනි. බුදුපියාණන් වහන්සේගේ

කාලයේදී උපනිෂදික මුණිවරයෝ ආගමික ජීවිතයේ අරමුණ වන්නේ න්‍යායාත්මක පුද්ගලබව (ආත්මන්) ලෝක පුද්ගලබව (බ්‍රාහ්මන), සමග ඒකාබද්ධ කිරීමට හෝ එසේ නැත්නම්, පළමුවැන්නා සැබැවින්ම දෙවැන්නා හා සමාන ලෙස දකින්නට යන අදහස වර්ධනය කිරීම ආරම්භ කරමින් සිටියහ. ඇත්ත වශයෙන්ම න්‍යායාත්මක පුද්ගලභාවයේ සංකල්පය ප්‍රායෝගික පුද්ගලභාවය පිළිබඳව වැරදි අනුමානයේ ප්‍රතිඵලයක් බව බුදුපියාණන් වහන්සේ වටහා ගත්හ. එය මරණයට ඇති බිය, සතුට සඳහා ඇති ආශාව සහ සදාකාලිත්වය සඳහා වූ දැඩි ආශාව නිසා ඇති වූවකි. කෙටියෙන් කිවහොත්, ආත්මාර්ථකාමිත්වය, මානය, තම රූපයට වසඟවීම, සහ ස්වයං ප්‍රවර්ධනය සාමාන්‍ය ජීවිතයේ වැදගත් ස්වරූපයක් වීම පිළිබඳව වඩාත් දියුණු කළ විස්තරයකි.

බුදුපියාණන් වහන්සේට අනුව, නිදහස සහ ස්ථීර සතුට ලැබිය හැක්කේ, න්‍යායාත්මක පුද්ගලභාවයක් නොමැති බව, හෙවත් අනත්තයේ සත්‍යය දැකීමෙනි. ජනප්‍රිය අනත්තලක්ඛණ සූත්‍රයේ, බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'ශරීරය පුද්ගලයෙක් නොවේ, හැඟීම්, හැඳින ගැනීම, මානසික නිර්මාණ සහ විඥානය පුද්ගලයෙක් නොවේ. ඒවා එසේ වූවා නම්, ඒවා අනිත්‍ය නොවේ. එසේ නම් ඔබට ඔබේ ශරීරයට, හැඟීම්වලට ආදිය මෙසේ කිව හැකිය 'මේ වගේ වන්න. මේ වගේ වන්නට එපා.' නමුත්, ශරීරය, හැඟීම්, හැඳින ගැනීම්, මානසික නිර්මාණ, සහ විඥානය අනිත්‍ය නිසා, ඔබට ඒවාට 'මේ වගේ වන්න. මේ වගේ වන්නට එපා' යැයි ඔබට ඒවාට කියන්නටය නොහැකිය. ඒ ඒවාට පුද්ගලබවක් නැති නිසාය... හොඳින් උපදෙස් ලැබූ ශ්‍රාවකයෙකු මෙය

දුටු විට, ශරීරයෙන්, හැඟීම්වලින් ආදියෙන් වෙනත් අතකට හැරෙයි, ඒවායෙන් වෙනත් අතකට හැරෙන විට, තද ආශාවන් අඩුවෙයි. තද ආශාව අඩුවෙන විට, පුද්ගලයා නිදහස් වෙයි. නිදහස් වූ විට, ඔහු තමන් නිදහස් බව දැන ගනී. නැවත ඉපදීම නැවතුණ බව දැනගනී. පූජනීය ජීවිතය ජීවත් වී ඇත. කළ යුතු දේ ඔහු සිදු කර ඇත. මෙයින් මතු තවත් වැඩිපුර දෙයක් නැත'(S.III,66 ff).
*Selfless Persons*, Steven Collins, 1985.

## ස්වයං-පිළිගැනීම

ස්වයං පිළිගැනීම යනු තමන්ගේම හොඳ ගුණාංග පිළිබඳව ප්‍රීතිප්‍රමෝදයට පත්වීම සහ තමන්ගේ වැරදි සමග සන්හිඳියාවෙන් සිටීම සහ ඉවසීමේ හැකියාවයි. සමහර ආගම් පවිටු සහ වැදගම්මක් නැති හැඟීමක් දිරිමත් කරයි.

එවැනි අදහස්, හැඟීම් සෘණාත්මක සහ ප්‍රයෝජනයක් නැති බවට බුදුදහම සැම විටම සලකා ඇත. එයට ප්‍රධාන හේතුව වන්නේ ඒවා අතීතය සමග ජීවත්වන නිසාය. බෞද්ධ මනෝවිද්‍යාවේ, අත්තපිය (Dhp.157), අත්තකාර (S.I,75) සහ අත්තකාම (A.II,21) යන පදවල අර්ථය වන්නේ 'ස්වයං ඇගයීම', 'ආත්ම ගෞරවය' සහ 'ස්වාර්ථකාමය'යි. ඒවා බුදුපියාණන් වහන්සේ සැමවිටම භාවිත කර ඇත්තේ ධනාත්මක අර්ථයකිනි. මෛත්‍රී භාවනාව පුහුණු කරන විට, පළමු පියවර වන්නේ තමා කෙරෙහි මෛත්‍රිය වැඩීමයි. එයට හේතුව, අපට අප කෙරෙහි ආදරයක් නොමැතිව, අනෙක් අය කෙරෙහි ආදරය හෝ ගෞරව කිරීම කළ නොහැකිය. බුදුපියාණන් වහන්සේ කියන ආකාරයට:

'තමන්ට අවංකවම ආදරය කරන පුද්ගලයෙකු කිසි විටක තවත් කෙනෙකුට හානියක් නොකරයි' (S.I,75) .

## ලිංගිකත්වය සහ ආධ්‍යාත්මිකතාව

ආගම් කිහිපයක ලිංගිකත්වයෙන් ආධ්‍යාත්මික මානයක් ඇති බව හෝ එය ආධ්‍යාත්මික ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බව යන අදහස ඇතුළත් කර ඇත. කතෝලික ධර්මය ලිංගිකත්වය නොමැතිව විවාහය විශේෂ ආගමික චාරිත්‍රයක් ලෙස දකිමින් ලිංගිකත්වය නොමැතිව එය අසම්පූර්ණ බවත්, සැබැවින්ම ලිංගිකත්වය සිදුනොවේ නම්, එම විවාහය අවලංගුද කළ හැකි ය. බොහෝ ප්‍රොතෙස්තන්ත ආගම අදහන්නෝ ලිංගික පිනවීම 'දෙවියන් වහන්සේගෙන් ත්‍යාගයක්' ලෙස සලකති. බෞද්ධ සහ හින්දු තන්ත්‍රයේ ඇතැම් ව්‍යාපාර උගන්වන්නේ ලිංගික බලපත්‍රය යනු සමාජ සම්මතයන්ගෙන් සම්පූර්ණයෙන්ම බැහැරවීමක් හෝ එම ඉන්ද්‍රියය නිර්වාණය මුඳුන්පත් කර ගැනීමේ මාර්ගයක් විය හැකි බවයි.

සමහර නව යුගයේ න්‍යාය ඉදිරිපත් කරන්නන් විසින් 'තන්ත්‍ර' ලෙස ප්‍රසිද්ධ කර ඇත්තේ සැබැවින්ම ටිකක් වැඩියෙන් ලිංගිකත්වය අවුල් සහිත වැදගැම්මක් නැති දර්ශන විද්‍යාවක් සමග මිශ්‍ර කර ඇත. පෙර කී ලෙස ලිංගික පරිශ්‍රමයේ ශක්තිය ලිංගිකත්වයේ තියුණු සතුට සැලකිල්ලට ගෙන, එවැනි අදහස් වර්ධනය වීම, ජනප්‍රිය වීම සහ ජනප්‍රියත්වයේ රැඳීම පුදුමයක් නොවේ.

බුදුපියාණන් වහන්සේගේ කාලයේ දී ඇතැම් තවුසන්

'තමන්සේ හිස මත කෙස් වැටිය ගැට ගසන කාන්තා තවුසන් සමග 'ලිංගික සේවනයේ යෙදී ඇත. එය භික්මවීමට හෝ බ්‍රහ්මචාරිය වෙනුවෙන් කථා කරන අයට ඔවුන් පැවසුවේ 'මෙම යහපත් භික්ෂූන් වහන්සේලා සහ පූජකවරුන් ඉඳුරන් පිනවීමෙන් අනාගතයේදී ඇතිවෙන කුමන ඍණාත්මක ප්‍රතිඵල දකිමින් ඒවා ගැන අවබෝධයකින් සහ ඒවා අත්හැරීම පිළිබඳව කථාකරන්නේ ද? වෙල්වට් වැනි සුමුදු අත් ඇති කාන්තා තවුසන් සැබැවින්ම ප්‍රසන්නය.' බුදුපියාණන් වහන්සේ එවැනි අදහස්වලට දැඩි භාෂිතයෙන් විරුද්ධත්වය පළ කළහ (A.II,53; M.I,35). 'ඉඳුරන් පිනවීමේ සම්බාහනය' යනුවෙන් දැන් හඳුන්වන දෙයෙහි අනෙක් තවුසෝ ආශාවන් සපුරා ගත්හ. එය නැවතුණේ හරියටම ලිංගික සංසර්ගය කෙටි වේලාවකින් නතර වූ විටය (A.IV,53). අරිට්ඨ නම් එක් භික්ෂුවකට 'බුදුපියාණන් වහන්සේ ඉඳුරන් පිනවීම බාධාවක් සේ පැවසුවත් (එනම් කාමුක ආශ්වාදයන්), එසේ ඉඳුරන් පිනවමේ යෙදෙන කෙනෙකුට, එය සැබැවින්ම බාධාවක් නොවන බව' අවබෝධ විය (M.I,130). බුදුපියාණන් වහන්සේ ඒ පිළිබඳව තදින් තරවටු කිරීමට පසුබට නොවූහ. උන්වහන්සේ ඔහු නිවැරදි කළහ.'මෝඩ පුරුෂය, ඔබ මා එසේ ධර්මය උගන්වනවා යැයි කිසිදිනක දැන සිටියේද? මෝඩ පුරුෂය, මා පවසා ඇති බොහෝ දේශනාවල ඉඳුරන් පිනවීම බාධක සහ ඒවායෙන් ආශ්වාදය ලබන්නන්ට බාධාකරන බව මා කියා නැත්තේ ද? ඉඳුරන් පිනවීමෙන් ලැබෙන්නේ අල්ප පිනවීමක් බවත්, බොහෝ කරදර සහ ඉච්ඡා භංගයන්, සහ විශාල උවදුරු අන්තර්ගතවී ඇති බවත්, මම සැමවිටම උගන්වා ඇත' (M.I,132).

බෞද්ධ දෘෂ්ටිකෝණයට අනුව, විවාහමය සම්බන්ධයන්හිදී ලිංගිකත්වයට වැදගත් කාර්යභාරයක් ඇත. එසේම චිත්තමය සුභසිද්ධිය සඳහා සාධකයක් විය හැකිය. නමුත්, එහි ආධ්‍යාත්මික වැඩිදියුණුව සඳහා කිසිම දායකත්වයක් නැත. පුද්ගලයෙකුට නිර්වාණ මාර්ගයේ පළමු පියවරට (සෝතාපති) විවාහවී සහ සාමාන්‍ය ලිංගික සම්බන්ධතාවක් තිබියදී පත්විය හැකිය. දෙවන පියවරට එළඹීම (සකදාගාමි) සඳහා ලිංගික සංවරය සහ සමහර විට, බොහෝ දෙනෙකුට, බ්‍රහ්මචර්යාව අවශ්‍ය වේ. වර්තමාන ජීවිතයේ දී මෙම ස්ථානයෙන් ඔබ්බට සහ සම්පූර්ණ නිර්වාණයට ප්‍රගමණය සඳහා සියලු ඉඳුරන් පිනවීමේ ආශාවන්වලින් සම්පූර්ණ වෙන්වීම අවශ්‍ය වේ. හෝ සමහර විට, සම්පූර්ණ නිර්වාණයට කෙනෙකු පත් වන්නේ ඉඳුරන් පිනවීමේ සියලු ආශාවන් ක්ෂය වී ගිය පසු බව කීම වඩාත් නිවැරදි විය හැකිය.

## ලිංගික හැසිරීම

ලිංගික හැසිරීම (කාම හෝ මෙථුන) යනු ලිංගික ආදරයට සම්බන්ධ ආශාවෙන් පෙළඹී සහ සාමාන්‍යයෙන් ප්‍රජනන ඉන්ද්‍රියන්ට සම්බන්ධ ඉන්ද්‍රියක් වටාවූ පෙදෙසක් සම්බන්ධ කර ගනිමින්ය. මෙයට සියලු ආකාරයේ ලිංගික සංසර්ගයක්, අන්තර් ලිංගික ලිංගිකත්වය, ස්වයං සම්භෝගය, ලිංගික සෙනෙහෙවන්ත වීම, සහ සමහර විට ලිංගික දසුනෙන් ආස්වාදය ලැබීම පවා ඇතුළත් වේ. බුදුදහමේ ආචාරධර්ම පිළිබඳ මූලික මූලධර්ම වන පංචශීලයේ තුන්වන ශික්ෂාපදයට අනුව, කෙනෙකු කාමමිච්ඡාචරයෙන් (කාමේසු මිච්ඡාචාර) වැළකිය

යුතුයි. ලිංගික (කාම) සේවනය (චාර) වැරදි (මිච්ඡා) වන්නේ කෙසේ ද?

වරක් බ්‍රාහ්මණයන්ගේ ශ්‍රාවකයන් පිරිසක් අමතමින්, බුදුපියාණන් වහන්සේ පැවසුවේ ලිංගික සේවනය වැරදි වන්නේ, 1. දෙමාපියන්ගේ රැකවරණයේ සිටිනා තරුණියන් (මාතුරක්ඛිතා, පිතුරක්ඛිතා) එනම්, වයසින් අඩු, 2. ධර්මයෙන් ආරක්ෂා වන කාන්තාවන්, (ධම්මරක්ඛිතා), භික්ෂුණින් හෝ බ්‍රහ්මචාරිය සඳහා කැපවූ, 3. විවාහ වූ කාන්තාවන්, (සසාමික), 4. දඬුවමකට යටත් වූ (සපරිදණ්ඩා), එනම් සිරකාරියන්, 5. මල්මාලාවලින් සැරසුණු (මාලාගුණපරික්ඛිත්ත), විවාහ වීමට ගිවිස ගත් කෙනෙකු යන අයයි (A.V,264). මෙම ධර්මදේශනය පුරුෂයන් පමණක් ඇමතූ නිසා, බුදුපියාණන් වහන්සේ කථාකළේ ස්ත්‍රී ලිංගික සහකාරියන් පිළිබඳව පමණකි. උන්වහන්සේ කාන්තාවන් ඇමතුවේ නම්, සැබැවින්ම පුරුෂයන්ට අදාළ වූ දේ කථාකරන්නට ඉඩ තිබුණි.

දරුවෙකුට ලිංගිකත්වය සම්බන්ධයෙන් දැනුම්වත් තීරණයක් ගැනීමට පරිණත බවක් හෝ අත්දැකීමක් තිබෙන්නට නොහැකි වන අතර, 2, 3 සහ 5 යන කාණ්ඩවලට අයත් වන අය පොරොන්දුවක් කැඩීමට එනම් බොරුකීමට සම්බන්ධ වෙති. සිරගතව සිටින පුද්ගලයෙකුට ඔහු හෝ ඇය කිරීමට අකැමැති දෙයක් කිරීමට බල කළ හැකි අතර, එමගින් අවශ්‍යාජ නිදහස් තේරීමක් කළ නොහැකිය. අපයෝජනය, වංකකම, හෝ බලයෙන් නම්මා ගැනීම හෝ අකැමැත්තෙන් ලිංගිකත්වය සම්බන්ධ වූ ක්‍රියාවක්, තුන්වන ශික්ෂාපදය කැඩීමක් බව මෙයින් පැහැදිලි වේ. මෙහි සඳහන් නොවූවත්, කායික බලපෑම්

සිදුකිරීම හෝ එසේ කිරීමට තර්ජනය කිරීම (එනම් දූෂණය) කෙනෙකු ලිංගික සේවනයට බලයෙන් යොමුකරවා ගැනීම, සහ බීමත්වූ හෝ මානසික දුබලතාවක් ඇත්තියක සමග ලිංගික සේවනය සිදුකිරීම වරදවා ලිංගික සේවනයේ යෙදීමට සමාන වේ. එනිසා, බුදුදහමේ දෘෂ්ටිකෝණයෙන් බලන කල, විවාහයට පෙර ලිංගික සේවනයේ යෙදීම, පහත් කුලයේ කෙනෙකු සමග, ස්වයං සම්භෝගය, සමලිංගික සේවනය සහ ලිංගික අසංවරය, සමහර විට නුවණට හුරුනැති වන අතර, සමාජීය වශයෙන් පිළිගත නොහැකි හෝ ආධ්‍යාත්මික දියුණුවට යෝග්‍ය නොවන, තුන්වන ශික්ෂා පදය එයින්ම කැඩීමට හේතු වේ. රාත්‍රීකාලයේ විමෝචනය සිදුවීමෙන් ශික්ෂාපද නොකැඩේ.

බොහෝ සමාජවල තිබෙන්නාක් මෙන්ම, පැරණි ඉන්දියාව ද බොහෝ අද්භූත විශ්වාසවලින්, සීමාවලින් සහ තහංචිවලින් වටවී තිබුණි. බ්‍රාහ්මණයන් විශ්වාස කළේ තමන්ගේ බිරිඳ ගර්භිණී අවස්ථාවේ ලිංගික සේවනයේ යෙදීමෙන් කළලය (අතිමීළ්හජ), අපිරිසිදු වන බවයි. නැතිනම් ඇය දරුවාට දෙන කිරි අපිරිසිදු වේ යැයි සිතූහ. ඒ මගින් දරුවාට ඍණාත්මක (අසුචිපට්ඨපිත) බලපෑමක් ඇති වේ යැයි සිතූහ. ඔවුන් ඉගැන්වූයේ ලිංගික සේවනය කළ යුත්තේ දරුවන් ඇති කිරීමට පමණක් බවත්, වින්දනයට (කාම) ක්‍රීඩා (දව) හෝ ඉඳුරන්ගේ පිනවීමට (රති) නොවන බවත්ය. එසේම බිරිඳගේ ඔසප් කාලයේදී ලිංගික සේවනයේ යෙදීම වැරදි බව ද ඔවුහු විශ්වාස කළහ. එවැනි නීති අනුගමනය කළ බ්‍රාහ්මණයන් බුදුපියාණන් වහන්සේ පැසසූහ, ඒ උන්වහන්සේ ඔවුන් සමග එකඟ වන නිසා නොව,

නමුත්, ඒ ඔවුන් දේශනා කරන දෙයට සත්‍යවාදී වූ නිසාය (A.III,226). තවත් පුළුල් විශ්වාසයක් වූයේ ඕනෑවට වඩා ලිංගිකව හැසිරීම නිසා විවිධ රෝගාබාධ සහ තීරණ ගැනීමේ අඩුවක් ඇති විය හැකි බවයි (Ja,VI,295). මේවාට හෝ වෙනත් ලිංගික මිථ්‍යා විශ්වාසයන්ට බුදුපියාණන් වහන්සේ දායක වූ බවට උදාහරණ නොමැත.

සාමාන්‍ය ගිහි ජීවිතයේ කොටසක් ලෙස ලිංගිකත්වය පිළිගනිමින්, බුදුපියාණන් වහන්සේට ඒ පිළිබඳව සාමාන්‍යයෙන් තිබුනේ අල්ප අදහසකි. උන්වහන්සේ එය 'ග්‍රාමීය දෙයක්' (ගාම ධම්ම, D.I,4) ලෙස ප්‍රතික්ෂේප කළහ. එනම්, සාමාන්‍ය, සරල සහ ලෞකික යන්නයි. ඉඳුරන් පිනවීමෙන් ලබන සැපය (කාමච්ඡන්ද) තීව්‍ර වූවිට කායික සහ මානසික නොසන්සුන් බව ඇති කරන බව බුදුපියාණන් වහන්සේ වටහා ගත්හ. මෙයින් අවධානය ආධ්‍යාත්මික අභිලාෂයන්ගෙන් පසෙකට හරවයි. භාවනාව ප්‍රමාද වේ. උන්වහන්සේ උන්වහන්සේගේ වඩා කල්පනාකාරී ශ්‍රාවකයන් ඔවුන්ගේ ලිංගික හැසිරීම් සීමා කරන්නට හෝ බ්‍රහ්මචාරී වන්නට ධෛර්යමත් කළහ. භික්ෂූන් සහ භික්ෂුණීන් සැබැවින්ම බ්‍රහ්මචාරී විය යුතුමයි. කෙසේ වෙතත්, කෙනෙකු සූදානම් නැති අවස්ථාවක බ්‍රහ්මචාරී වීමට ප්‍රතිඥා දීම පිළිබඳව අත්දැකීම්වලින් පෙන්වන්නේ යම්දෙයක් විය හැකිය, නමුත් ප්‍රයෝජනවත් වේ. යම් කෙනෙකු නිරන්තරව ලිංගික ආශාවන්ට එරෙහිව අරගල කරන විට, සහ ප්‍රතික්ෂේප කරන විට, එය ප්‍රශ්න විසඳනවාට වඩා ප්‍රශ්න ඇති කළ හැකි අතර, එය මානසිකව හානිකර විය හැකිය. බලන්න **පරදාර සේවනය, ව්‍යාභිචාරී සහ ගණිකා වෘත්තිය**

*Buddhism and Sex*, M. O' C Walsh, 1986.

## රැවුල බෑම

රැවුල බෑම (ඔහාරෙන්ත) යනු ශරීරයේ කෙස් රේසරයකින් කපා ඉවත් කිරීමයි. ලෞකික ආගමකට සම්බන්ධ නැති පැරණි ඉන්දියාවේ කාර්යයක් වූ කාම සූත්‍රයේ පුරුෂයන්ට ඔවුන්ගේ යටි රැවුල් සහ උඩු රැවුල් දින හතරකට වරක් කප්පාදු කිරීමට සහ ඔවුන්ගේ ලිංගික පරිපාකය සහ කිහිලි දින දහයකට වරක් මුඩු කරන ලෙසත්, උපදෙස් දී ඇත. භික්ෂූන්ට ඔවුන්ගේ හිස් සහ මුහුණු මුඩු කිරීමටත්, භික්ෂූණීන්ට ඔවුන්ගේ හිස් මාස දෙකකට වරක් හෝ අඟල් දෙකක ප්‍රමාණයට වඩා දික් වන්නට පෙරත් මුඩු කරන ලෙස බුදුපියාණන් වහන්සේ පැවසූහ. මෙයට ප්‍රධාන හේතුව කෙස් සම්බන්ධයෙන් බොහෝ විට ඇති පුහු ආටෝපය ඇවිස්සීමට නොවේ. සමහර විට සනීපාරක්ෂාව පිළිබඳ හේතු නිසාය. කෙස් නොමැති අයගේ උකුණන් නොමැති නිසා මැරීම අදාළ නොවේ. භික්ෂූණීන්ට ඔවුන්ගේ කිහිලි සහ ලිංගික පරිපාක මුඩු කිරීමට අවසර තිබුණි. පෙනෙන ආකාරයට එකල සිටි වැදගත් කාන්තාවන් එසේ කර ඇත (Vin.IV,260).

භික්ෂූන්ට සහ භික්ෂූණීන්ට මූලික අත්‍යවශ්‍ය දේවල් අතෙන් එකකි රේසරය (බුර) එසේම ඔවුන්ට එය දමා ගැනීමට කවරයක්, මුවහත් ගලක මුවහත් කිරීම සඳහා සහ එය මලකඩ කෑම වැළැක්වීම සඳහා ගම් වර්ගයක් ද භාවිතයට අවසර තිබුණි (Vin.II,134). සමහර බ්‍රාහ්මණයෝ බෞද්ධ භික්ෂූන්ට සරදම් කිරීම සඳහා ඔවුන් 'වාල් වැඩ කරන හිස මුඩු කළ තවුසන්'

යැයි හැඳින්වූහ. (මුණ්ඩකා සමණකා ඉබ්භා, D.I,90)

## රෝග සහ සෞඛ්‍යය

රෝග (ආතණ්ක, ගෙලඤ්ඤ හෝ රොග) යනු ආසාදන හෝ තුවාල නිසා ශරීරය නිසිලෙස කාර්ය කිරීමට අපොහොසත් වීමයි. සෙංගමාලය, උණ, සැරව වණ, කැස්ස, අසාත්මිකතාව ඇතිවන පීනස, දියවැඩියාව (මධුමෙහික, පද ගත අර්ථය 'මී පැණි මූත්‍ර') සහ ලාදුරු ඇතුළුව විවිධ ආකාරයේ රෝග වර්ග පිළිබඳව බෞද්ධ ධර්ම ග්‍රන්ථවල සඳහන් වේ. සමහර දැනුම්වත් නැති බෞද්ධයන් සිතන ආකාරයට සෑම රෝගයක්ම අතීත කර්මවලින් සිදුවේ නම්, ඖෂධ ගැනීම අවශ්‍ය නොවේ. බුදුපියාණන් වහන්සේ රෝග ඇතිවීමට හේතු අටක් නම් කළ අතර, කර්මය වන්නේ එයින් එකක් පමණි. අනෙක් හේතු වන්නේ පිත අසංතුලනය වීම නිසා, සෙම අසංතුලනය වීම නිසා, වාතය අසංතුලනය වීම නිසා, ශරීරයේ තුන්දොස් අසංතුලනය වීම නිසා, දේශගුණික වෙනස්වීම් නිසා, නොසැලකිල්ල නිසා සහ අනතුරු යනාදියයි (S.IV,230). අල්ප ආහාර රටාව (A.III,144) මෙන්ම වැඩිපුර ආහාර ගැනීම රෝගවලට හේතුවන බව තවත් ස්ථානයක දී බුදුපියාණන් වහන්සේ පැවසූහ (M.I,473). වාතය, උෂ්ණය හෝ තෙතමනය නිසා ඇතිවන ඍතුමය රෝග හඳුනාගෙන ඇත (Vin.I,199). පුරාවෘත්තයට අනුව, සිදුහත් කුමරුන් අභිනිෂ්ක්‍රමණය කරන්නට සහ සත්‍යය සොයා යෑමට හේතු වූ සතර පෙර නිමිත්තවලින් රෝගී මිනිසෙකු දැකීම එකකි.

සෞඛ්‍යය යනු (අප්පාබාධතා, ආරොග්‍ය හෝ කල්ල)

'සුභ සිද්ධි සහ යහපත් දිරවීමේ ශක්තිය තිබීම, වඩා සීතල හෝ වඩා උණුසුම් නොවීම, සමතුලිත බව සහ ක්‍රියා කිරීමේ හැකියාව' (A.III,103) ලෙස බුදුපියාණන් වහන්සේ විස්තර කළහ. ධර්මය පුහුණු කිරීම සඳහා යහපත් සෞඛ්‍යය සැබෑ ආශීර්වාදයක් සහ වැදගත් පෙරඇවැසියක් බව බුදුපියාණන් වහන්සේ සැලකූහ. උන්වහන්සේ මෙසේ පැවසූහ: 'යහපත් සෞඛ්‍යය ඉහළම ලාභයයි' (Dhp.204). උන්වහන්සේ සැහැල්ලු ආහාරයක් ගැනීම වෙනුවෙන් පක්ෂව කථා කළහ. එයට හේතුව එයින් 'සෞඛයට රෝගවලින් නිදහස් ලැබීම, ශක්තියක් සහ කායික පහසුවක්' ලබා දෙන නිසාය (M.I,473). එසේම ව්‍යායාමය සහ සෞඛ්‍යය අතර ඇති සම්බන්ධය උන්වහන්සේ දැන සිටියහ (A.III,30; Vin.II,119). උන්වහන්සේ ශ්‍රාවකයන්ට කියා සිටියේ යහපත් සෞඛ්‍යයක් තිබීමෙන් ඇති ආශීර්වාදය පිළිබඳව සැලකිල්ලට ගෙන ධර්මය පුහුණු කිරීමට එම අවස්ථාව භාවිත කරන ලෙසයි (A.III,103). පෞද්ගලික ගුණයන් සහ සෞඛ්‍යය අතර ඇති සම්බන්ධය අවධාරණය කරමින් පැරණි බෞද්ධ වෛද්‍යමය කෘතියක් වූ භෙසජ්ජමඤ්ජූසාවේ මෙසේ සඳහන් වේ: 'සෞඛ්‍යමත් ආහාර පුරුදු සහ හැසිරීම් ඇති, සුපරීක්ෂාකාරී, ලෞකික සැප සම්පත් සමග නොබැඳුණු, පරිත්‍යාගශීලී, අන් අය කෙරෙහි සමානව නැඹුරු වෙන, සත්‍යවාදී, සමාව දෙන, බුද්ධිමතුන් ඇසුරු කරන, පුද්ගලයා රෝගාබාධවලින් නිදහස් වනු ඇත'.

හාම්පුතුන් තමන්ගේ සේවකයන් රෝගී වූ විට, ඔවුන් රැකබලා ගැනීමට යුතුකමක් තිබිය යුතු බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (D.III,191). ආධ්‍යාත්මික

සොයා යෑමේදී කායික රෝගී තත්ත්වය එයට බාධාවක් විය හැකි වන අතර, ඉවසීම, නොඇලීම සහ මනසේ ශක්තියෙන් මෙම දුෂ්කරතා අභිබවා යා හැකි බව බුදුපියාණන් වහන්සේ තරයේ දරා සිටියහ. ''මගේ ශරීරය රෝගී වූවත්, මගේ මනස රෝගී නොවේ'' යැයි සිතමින් පුද්ගලයෙකු මනස පුහුණු කළ යුතුය' (S.III,1).

රෝගී වූවන් දැක බලා ගැනීමට යෑම සහ ඔවුන්ට උවටැන් කිරීම ගුණවත් ක්‍රියාවක් සහ කරුණාවෙන් සිදු කරන ක්‍රියාවක් ලෙස උන්වහන්සේ සැලකූහ. උන්වහන්සේ මේ දෙකම සිදු කළ අතර, එයම කරන ලෙස උන්වහන්සේගේ ශ්‍රාවකයන් ධෛර්යමත් කළහ. උන්වහන්සේ මෙසේ වදාළහ: 'රෝගීන්ට සාත්තු කරන්නා, මට සාත්තුකරන්නකි (යො ගිලානං උපට්ඨෙය්‍ය සො මං උපට්ඨිස්සති, Vin.I,301-2). මෙම වචන පිළිබඳව සද්ධම්මොපායනයේ මෙසේ සඳහන් වේ: 'මහාකාරුණික බුදුපියාණන් වහන්සේ රෝගීන්ට උපස්ථාන කිරීම ඉහළින්ම අගයන ලදී. උන්වහන්සේ එසේ කිරීම පුදුමයක් ද? මුණිවරයන් අනෙක් අයගේ සුභසිද්ධිය දකින්නේ තමාගේම දෙයක් ලෙස නිසා, එවැනි උත්තමයෝ පරෝපකාරී ලෙස ක්‍රියා කරති. රෝගීන්ට උවටැන් කිරීම බුදුපියාණන් වහන්සේ අගය කර ඇත්තේ මේ නිසාය. උතුම් ගුණධර්ම පුහුණු කරන්නෙකුට අනෙක් අය කෙරෙහි ආදරණීය සැලකිලිමත් බවක් තිබිය යුතුයි.' ප්‍රබන්ධ කරන ලද බ්‍රහ්මජාල සූත්‍රය ද මෙම කරුණුම කියයි. 'බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකු රෝගීවූ ඕනෑම කෙනෙකු දුටුවහොත්, ඔහු බුදුපියාණන් වහන්සේට පූජාවක් කරන්නාක් මෙන්ම එම රෝගියාගේ අවශ්‍යතා සපයා දිය යුතුයි.' බලන්න

## වෛද්‍යවරු සහ රෝග සුව කිරීම

*Asceticism and Healing in Ancient India,Medicine in the Buddhist Monastery,* K.G. Zysk, 1989.

## සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ

සම්ප්‍රදායිකව, සිද්ධාර්ථ ගෞතම යන්න බුදුපියාණන් වහන්සේගේ නම යැයි විශ්වාස කෙරේ. උන්වහන්සේට ලබා දී ඇති සිද්ධාර්ත යන නමේ තේරුම 'තමන්ගේ ඉලක්කය සපුරා ගන්නා තැනැත්තා' යන්නයි. එහෙත් ත්‍රිපිටකයෙහි කොතැනකවත් එම නම දක්නට නොලැබීම අවධානය ගන්නාසුලු කරුණකි. ගෝතම, හෙවත්, 'හොඳම එළදෙන' යන්න උන්වහන්සේගේ පවුලේ නාමයයි. බුද්ධත්වයට පත්වීමෙන් පසු, සාමාන්‍යයෙන් උන්වහන්සේගේ ශ්‍රාවකයන් උන්වහන්සේ ආමන්ත්‍රණය කරණු ලැබුවේ, භාග්‍යවතුන් වහන්සේ (භගවා) යනුවෙනි. අනෙක් අය ගෞතම ශ්‍රමණයන් වහන්සේ (සමණ ගෝතම) වශයෙනුත්, උන්වහන්සේ තමන්වහන්සේ තථාගත වශයෙන්ද හැඳින්වූහ.

*The Historical Buddha,* H.W. Schumann, 1989

## සිගාලොවාද සූත්‍රය

දීඝ නිකායේ 'සිගාලට අවවාද කිරීමට කරන ලද ධර්ම දේශනාව' හෙවත් සිගාලොවාද සූත්‍රය, අන්තර්පුද්ගල සම්බන්ධතා පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වලින් සම්පූර්ණ සහ වඩාත් වැදගත් විස්තරයයි (D.I,180-193). මිනිසුන්ගේ ජීවිතවල වඩාත් වැදගත් සම්බන්ධතා සියල්ල - දරුවන් සහ දෙමාපියන් අතර, ගුරුවරු සහ ශ්‍රාවකයන් අතර, ස්වාමිපුරුෂයන් සහ බිරින්දෑවරුන් අතර, මිතුරන්,

සේවායන් සහ සේවකයන් අතර, පූජ්‍ය පක්ෂය සහ ගිහියන් අතර, යනාදී වශයෙන් සාකච්ඡා කෙරේ. මෙම මාර්ගෝපදේශයේ අරමුණ වන්නේ, බියෙන් (බෙමා අප්පතිභයා), ආරක්ෂාව, සාමය සහ නිදහස ප්‍රවර්ධනය කිරීම බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. උන්වහන්සේ වඩා අවධානය දුන්නේ මිත්‍රයන් අතර ඇති සම්බන්ධතාවලටය. සමහර විට, පරමාදර්ශීව, කෙනෙකුගේ සම්බන්ධතා සියල්ලක්ම ක්‍රමයෙන් මිත්‍රත්වයට වැඩිදියුණු විය යුතු නිසා විය හැකිය.

## සතර පෙරනිමිති

සතර පෙරනිමිති (චතු නිමිත්ත) යනු ජනප්‍රවාදයේ කියැවෙන්නේ තරුණ සිද්ධාර්ථ මේවා දැක අවසානයේ අභිනිෂ්ක්‍රමණය කර සත්‍යය සොයා ගිය බවයි. සිතන පරිදි, උන්වහන්සේ කපිලවත්ථු මාර්ග ඔස්සේ අශ්ව කරත්තේ වැඩ, ඊට පසු මහල්ලෙකු, ලෙඩෙකු, ආදාහනය සඳහා ගෙන යන මලමිණියක් සහ ඔබමොබ යන තවුසෙකු හමු වූ බව කියැවේ. මෙම පුරාවෘත්තය ත්‍රිපිටකයේ නැත. කෙසේ නමුත්, එය මනුෂ්‍ය අවුල් ස්වභාවය (මහලු විය, රෝග සහ මරණය) පිළිබඳ බෞද්ධ වැටහීම සහ එයට යෝග්‍ය ප්‍රතිචාර (අවුල් ස්වභාවයෙන් පිට වන්නට මාර්ගයක් සොයමින්) සඳහා රූපකයක් ලෙස දකින්නට ඇත. සතර පෙරනිමිති පිළිබඳ ජනප්‍රවාදය බොහෝ කාලයක් බෞද්ධ කලාවේ ජනප්‍රිය මාතෘකාවක් වී තිබේ.

අභිනිෂ්ක්‍රමණය කිරීමට ගත් තීරණය පිළිබඳව කථාකරමින් බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'මගේ බුද්ධත්වයට පත්වීමට පෙර, මා ඒ වනවිටත්

බුදුබව නොලැබූ බෝධිසත්ත්වයෙකු පමණක්ව සිටියදී, මමත්, ඉපදීමට, වයසට යෑමට, රෝගීවීමට, මරණයට, දුකට පත්වීමට සහ ක්ලේශෂවලට යටත් වෙමින් සිටින විට, එවැනි දේවලට යටත් වන දේ සෙව්වෙමි. එවිට මම සිතුවෙමි, 'ඇයි මම මෙය කළ යුත්තේ උපත, මහලුවීම, රෝගීවීම, මරණය, ශෝකය, ක්ලේශ යන කරුණුවලට යටත් වීම, සහ එහි ඇති අන්තරාය දකිමින්, එම බැඳීමෙන් මම වයසට නොයන, රෝගීනොවන, නොමැරෙන, ශෝකය නැති සහ නොකෙලෙසුණු උත්තරීතර ආරක්ෂාව වූ නිර්වාණය සෙවිය යුතුයි.' ඊට පසු, තවමත් තරුණව සිටියදී. කළු කෙස්, තාරුණ්‍යයේ ආශීර්වාදයෙන්, ජීවිතයේ මුල් අවධියේදී, මගේ දෙමාපියන්ගේ හැඬීම්, වැළපීම් නොතකා, මම මගේ කෙස් සහ රැවුල මුඩු කොට, කසාවත පොරවාගෙන, ගෘහජීවිතයෙන් ඔබමොබ යන්නෙකු බවට පත් වූයෙමි.' (සංක්ෂිප්ත කර ඇත, M.I,163).

## බුදුපියාණන් වහන්සේගේ මහාපුරිස ලක්ෂණ 32

බුදුපියාණන් වහන්සේගේ මහාපුරිස ලක්ෂණ 32 (මහා පුරිස ලක්ඛණ) යනු සියලු බුදුවරුන්ගේ ශරීරයේ තිබෙනවා යැයි කියනු ලබන මංගල ලකුණු 32යි. බුදුදහමට නොවැදගත් දෙයක් වුව ද, මෙම අදහස ධර්ම දේශනා තුනක තේමාවයි (D.II,142; M.II,133; Sn.103). එසේම තවත් ඒවායේ කෙටියෙන් සඳහන් කර ඇත. සලකුණු, සමහර විට එහි මූලය බ්‍රාහ්මණ අගමේ තිබූ අතර පසුකාලයකදී බුදුදහමට ඇතුළත් කර ඇත. එයට හේතු පැහැදිලි නැත. පුළුල් දිව, නිල් ඇස් රන්වන් සමේ පැහැය සහ ආවරණයවූ පුරුෂ ලිංගය සමහර විට පැරණි ඉන්දියානු

පරමාදර්ශී කායික රූපශ්‍රීය හා සම්බන්ධ විය හැකිය. අනෙක් ඒවා ඉතා පුදුම සහගත, අස්වාභාවික වුවත්, ඒවායින් ලැබෙන්නේ කුමක් දැයි දැන ගැනීම දුෂ්කර වේ.

බුදුපියාණන් වහන්සේගේ ශාරීරික පෙනුම සෑම අතින්ම සාමාන්‍ය බව ත්‍රිපිටකයෙන් පැහැදිලි වේ. අජාසත්තු රජු බුදුපියාණන් වහන්සේ හමුවීමට ගිය අවස්ථාවේ, ඔහුට අවට සිටි භික්ෂූන් වහන්සේලාගෙන් උන්වහන්සේ වෙන්කොට හඳුනාගත නොහැකි විය (D.I,50). බුදුපියාණන් වහන්සේට සලකුණු 32න් යමක් තිබුණේ නම්, ඔහුට උන්වහන්සේ වහාම හඳුනාගත හැකිවන්නට ඉඩ තිබුණි. පුක්කුසාති ස්වාමීන් වහන්සේට බුදුපියාණන් වහන්සේ කව්දැයි අවබෝධ කරගෙන ඇත්තේ පැය ගණනාවක් වාඩිවී බුදුපියාණන් වහන්සේ සමග කථා කරමින් සිටීමෙන් පසුවයි (M.III,238). බුදුපියාණන් වහන්සේට එම සලකුණු කිසිවක් තිබුණේ නම්, එම තරුණයා එය වහාම අවබෝධ කරගෙන, තමා සිටින්නේ අසාමාන්‍ය පුද්ගලයෙකු ඉදිරිපස බව අවබෝධ කරගන්නට ඉඩ තිබුණි. උපකට බුදුපියාණන් වහන්සේ ගයාවට යන මාර්ගයේදී හමුවූ අතර, ඔහුගේ අවධානය යොමු වූයේ බුදුපියාණන් වහන්සේගේ අසාමාන්‍ය ශරීරය නොව, නමුත්, 'පැහැදිලි ඉන්ද්‍රියයන් සහ දීප්තිමත් සමේ වර්ණයයි' (M.I,170).

බුදුපියාණන් වහන්සේගේ ධර්මයේ බාහිර සහ කායික දේ සැමවිටම අභ්‍යන්තර සහ මානසික දෙයට වඩා වැදගත්කමින් අඩු ලෙස සැලකේ (S.I,169). බ්‍රාහ්මණ ආගමේ සංකල්පය වූ 'උසස් මිනිසා' හඳුනාගන්නේ

කෙනෙකුගේ කායික ගතිලක්ෂණවලින් බව බුදුපියාණන් වහන්සේ දැන සිටි අතර, උන්වහන්සේ මෙම මතය ප්‍රතික්ෂේප කළහ. කෙනෙක් බුදුපියාණන් වහන්සේගෙන් මෙසේ ඇසුවේය (S.I,169). 'ඔවුන් ''උසස් මිනිසෙකු'' පිළිබඳව කථා කරයි. නමුත්, ''උසස් මිනිසෙක'' වන්නේ කෙසේද'? බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ: 'කෙනෙකු ''උසස් මිනිසෙකු'' වන්නේ මනස නිදහස් කර ගැනීමෙන්ය. මනස නිදහස් කර නොගනිමින් කෙනෙකුට ''උසස් මිනිසෙකු'' විය නොහැකිය' (S.V,158).
*Concept of Great Man*, B.Wimalaratana, no date.

## නිශ්ශබ්දතාව

නිශ්ශබ්දතාව (මෝන හෝ තුණ්හිභාව) යනු නිශ්ශබ්දව, නිසලව සහ ශබ්දයක් නැතිව ඉඳීමේ ස්වභාවයයි. වාචික නිශ්ශබ්දය සහ මානසික නිශ්ශබ්දය අතර ඍජු සම්බන්ධයක් බෞද්ධ මනෝවිද්‍යාව දකී. ඒ අනුව, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ භික්ෂූන්ට මෙසේ පැවසූහ: 'ඔබලා එකට හමුවූ විට, ධර්මය සම්බන්ධව කථා කරන්න, එසේ නැත්නම්, උතුම් නිශ්ශබ්දතාවය රකින්න' (M.I,161). නිශ්ශබ්දතාවට සුත්ත නිපාතයේ සඳහන් එක් ලස්සන ප්‍රශස්ති ගීයක, උන්වහන්සේ මෙසේ පැවසූහ, 'මෙය ජලයෙන් ඉගෙන ගන්න. කන්දක කුස්තුරවල සහ දැඩි පරතරයෙන්, සෝෂාකාරී ගලායන ගංගා තිබෙන නමුත්, මහා ගංගා නිශ්ශබ්දව ගලයි. හිස් දේවල් ශබ්ද නගන අතර, පිරුණු දේ සැමවිටම නිශ්ශබ්දයි. මෝඩයෙකු බාගෙට පිරුණු කළයක් මෙන්ය, ප්‍රඥාවන්තයා ගැඹුරු නොසෙල්වෙන තටාකයක් මෙන්ය' (Sn.720-1).

බුදුපියාණන් වහන්සේ විශේෂයෙන්ම, අපහාස සහ ව්‍යාජ චෝදනා හමුවේ තැන්පත් නිශ්ශබ්දතාවක් රැකීම අගය කළහ. 'කෝපය හමුවේ කෝපාවිෂ්ට වචනවලින් ප්‍රතිචාර නොදැක්වීම, දිනන්ට අපහසු යුද්ධයක් දිනීමයි. එය තමන්ගේ සහ අනෙක් පුද්ගලයාගේ සුභසිද්ධියට ක්‍රියා කිරීමයි. නමුත්, ධර්මය නොදන්නා අය ඔබ මෝඩයෙකු යැයි සිතයි' (S.I,162) .

මෙහි ප්‍රතිඵලයක් ලෙස, බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට 'නිශ්ශබ්දතාවට ප්‍රිය, නිශ්ශබ්දතාව ධෛර්යමත් කරන සහ නිශ්ශබ්දතාවය ඇගයීම' පිළිබඳව කීර්තියක් ඇතිවුණි' (D.III,36). 'වනයේ නවාතැන් ගැනීමට සොයන, වනයේ අභ්‍යන්තරයේම, ස්වල්ප ශබ්ද ඇති නිසංසල ප්‍රදේශ, ජනයාගෙන් බොහෝ දුර, මිනිසුන්ගෙන් බාධා නොවන සහ හුදෙකලාවට හොඳින්ම ගැලපෙන' වශයෙන් බුදුපියාණන් වහන්සේ පිළිබඳව පැවසේ (D.III,38).

## බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව

'බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව' යනුවෙන් බොහෝ විට සඳහන් කරන දෙය මුළුමණින්ම ප්‍රකට සහ විද්වතුන් සහ ජනප්‍රිය ලේඛකයන් යන දෙපිරිසම පුළුල් ලෙස මත ප්‍රකාශ කර ඇත. අත්‍යන්ත යථාර්ථය පිළිබඳව ප්‍රශ්න ඇසූ විට, බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්දතාව රැකි බව සමහර අය කියා ඇත. ඒ උන්වහන්සේට වැදගැම්මකට නැති අනුමාන කිරීම් මඟහරින්නට උවමනා වූ විට සහ උන්වහන්සේ භෞතික සංසිද්ධිවලින් බැහැරව කිසිවක් නැතැයි ඇදහූ නිසා හෝ පිළිතුරු දීමට නොදත් නිසා යැයි

ඔවුහු කීහ. තවත් අය කියා සිටියේ උන්වහන්සේ දෙවියන් වහන්සේ පිළිබඳව නිශ්ශබ්ද වූයේ 'දෙවියන් වචනවලට ඔබ්බෙන්' සිටින නිසා බවයි. එක් ලේඛකයෙකු මෙසේ පැවසුවේය: 'බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව ප්‍රතික්ෂේප කරමින් බෞද්ධයෝ උන්වහන්සේ වැරදිලෙස තේරුම් ගත්හ. දෙවියන් ගැන බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව වරදවා වටහා ගත් බෞද්ධයන් සිතුවේ බුදුපියාණන් වහන්සේ දෙවියන් නොමැති බව නිශ්ශබ්දතාවෙන් ඇඟවූ බවයි. දෙවියන් කිසිසේත්ම නොමැති බව ඔබ තීරණය කළ පසු, ඔබගේ භාවනාවේ ඇති පරමාර්ථය කුමක් ද? ආත්මය යනු අරමුණ නම්, ඔබ පිළිබඳව උනන්දුවක් ඇති කරගැනීමෙන් ප්‍රයෝජනයක් නැත. ඒ ඔබ සැමවිටම ඔබ කෙරෙහි උනන්දුවෙන් සිටින නිසාය'. රේමන් පනික්කර් නමැති ඇගයීමට ලක්වූ කතෝලික චින්තකයා මෙසේ ලිව්වේය: 'බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාවට හේතුව මුල් බැස ඇත්තේ මානව විෂයේ ආවේණික සීමා කිරීම් හෝ අපගේ දැනීමේ අසම්පූර්ණත්වය හෝ යථාර්ථයේ ගුප්ත දුරවබෝධ ස්වභාවය තුළ නොවේයැයි මට හැඟේ. ඒ වෙනුවට, මට හැඟෙන්නේ බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාවට අත්‍යන්ත හේතුව නිශ්චිතවම පවතින්නේ මෙය අත්‍යන්ත යථාර්ථය නොවන බව යන යථාවයි'. මේවා සහ වෙනත් විවිධ අර්ථකථනවලින් හැඟෙන්නේ ප්‍රශ්නවලට 'පරස්පර විරෝධී' හෝ 'නොවැටහෙන' නිශ්ශබ්දතාව දැරීම බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීමේ ශෛලියේ ප්‍රධාන ගතිලක්ෂණයක් වූ බවත්, උන්වහන්සේ අවබෝධකරගත් සත්‍යයන් සන්නිවේදනය කළ ප්‍රධාන මාර්ගයක් වූ බවත්ය. යථාර්ථය ඉතා

වෙනස්ය'. බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්දතාව පිළිබඳ උපදේශකයෙකි. ප්‍රශ්නවලට ප්‍රතිචාර දැක්වීම, න්‍යායාත්මක හෝ වෙනත් යමක් නොව, නමුත්, සමාජීය සන්දර්භය තුළ නිතර සිදුවෙන වැදගැම්මකට නැති අතොරක් නැති දෙඩවිලි වෙනුවට විකල්පයක් වශයෙනි (M.I,161). උන්වහන්සේ කෝපය සහ ප්‍රකෝප කිරීම ඉදිරියේ නිශ්ශබ්දතාව රැකීම ධෛර්යමත් කළහ (S.I,162). ඉදහිට, මාස භාගයක් උන්වහන්සේ හුදෙකලාවට වැඩියහ. මෙම කාලයේදී උන්වහන්සේ කථාවෙන් වැළකුණහ (S.V,12).

බුදුපියාණන් වහන්සේගේ කියනු ලබන නිශ්ශබ්දතාව පිළිබඳ සාකච්ඡාවල මෙතෙක් සඳහන් කර ඇති මූලාශ්‍ර කිහිපයෙන් එකක් නම්, ඔබමොබ යන තවුසෙකු වූ වච්ඡගොත්ත සමග කළ සංවාදයයි. ඔහු බුදුපියාණන් වහන්සේගෙන් ප්‍රශ්න මාලාවක් ඇසුවේය; විශ්වය සීමිත ද, අසීමිත ද, දෙකම ද, නැත්තේ ද, ආත්මය එකම ද හෝ ශරීරයෙන් වෙනස් ද, රහත්වූ පුද්ගලයෙකු මරණයෙන් පසු පිටත් වේ ද? යනාදියයි. මේ ප්‍රශ්න එකින් එකට බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ: 'මම ඒ අදහසේ නැත වච්ඡගොත්ත' (න ඛො අහං වච්ඡ එවංදිට්ඨි) අවසානයේ, මෙම කාරණා පිළිබඳව බුදුපියාණන් වහන්සේට අදහසක් නැත්තේ ඇයි ද කියා ඇසූ විට බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්නේ එයට හේතුව එවැනි ප්‍රශ්න සහ ඒවාට දිය හැකි යම් පිළිතුරු 'හුදෙක් මත, මත අල්ලා ගැනීමක්, විනිවිද නොපෙනෙන මත, ඇඟබේරා ගන්නා මත... බවයි. ඒවා අත්හැරීමට, ප්‍රතික්ෂේප කිරීමට, සන්සුන් වීමට, නැවැත්වීමට, නොකැළඹීමට, ඉහළ දැනුමට, පුබුදු වීමට හෝ නිර්වාණයට මාර්ගය නොසලසයි'.

වච්ඡගොත්තගේ ප්‍රශ්නවලට නිශ්ශබ්දතාවෙන් ප්‍රතිචාර දැක්වීම වෙනුවට, බුදුපියාණන් වහන්සේ වාචිකව සහ පැහැදිලිව අදහස් පළ කළහ. එක් ආකාරයකින් හෝ තවත් ආකාරයකින් මත නොමැති බව බුදුපියාණන් වහන්සේ පැහැදිලිව විස්තර කළහ. උන්වහන්සේ එයට හේතු දැක්වූහ. එයට හේතුව, එවැනි ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කිරීමෙන් සැබැවින්ම වැදගත් දේවලින් අවධානය වෙනතකට යොමු කෙරෙන බැවිනි (M.I,484-8). මෙම දෙබස බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දව සිටීම පිළිබඳ උදාහරණයක් නොවේ.

සැබැවින්ම, ත්‍රිපිටකයේ සඳහන් ආකාරයට, බුදුපියාණන් වහන්සේගෙන් අසා ඇති දහස් ගණන් ප්‍රශ්නවලට උන්වහන්සේ නිශ්ශබ්දතාවෙන් ප්‍රතිචාර දැක්වූ අවස්ථා ඇත්තේ දෙකක් පමණි. තවත් අවස්ථාවක වච්ඡගොත්ත ම බුදුපියාණන් වහන්සේගෙන් මෙසේ ඇසූහ: 'ආත්මයක් තිබේ ද?' බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්ද වූහ. වච්ඡගොත්ත නැවතත් ඇසුවේය: 'එසේ නම්, ආත්මයක් නොතිබේ ද?'නැවතත් බුදුපියාණන් වහන්සේ ප්‍රතිචාර නොදැක්වූහ. සමහර විට කෝපයට පත් වී හෝ කළකිරීමට පත් වී වච්ඡගොත්ත නැගිට පිටවූයේය. බුදුපියාණන් වහන්සේ මෙම ප්‍රශ්නවලට නිශ්ශබ්දතාව රැක්කේ ඇයි දැයි ආනන්ද හිමියන් ඇසූ විට උන්වහන්සේ මෙසේ පැවසුවහ: 'ආත්මයක් තිබේ දැයි ඇසූ විට, මම ''ඔව්'' යැයි පිළිතුරු දී තිබුණේ නම්, මම සදාකාලිකවාදී ගුරුවරුන් සමග සිටිමි. මම ''නැත'' යනුවෙන් පිළිතුරු දී ඇතිනම්, මම උච්ඡේදවාදී ගුරුවරුන් සමග සිටිමි. මම ''ඔව්'' යනුවෙන් පිළිතුරු දී තිබුණේ නම්, මෙය සියල්ල

ආත්මයක් නැති බව දැන ගැනීමට අනුකූල වනු ඇත'? ''නැත, ස්වාමීනී'', ආනන්ද හිමියෝ පිළිතුරු දුන්හ. 'එසේම මම ''නැත, ආත්මයක් නැත'', යනුවෙන් පිළිතුරු දුන්නේ නම්, ඒ වනවිටත් වික්ෂිප්තව සිටි වච්ඡගොත්ත ඊටත් වඩා වික්ෂිප්ත වී මෙසේ සිතනු ඇත ''කලින් මට ආත්මයක් තිබුණි, දැන් ආත්මයක් නැත'' (S.IV,400).

මෙම දෙබසින්, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ නිශ්ශබ්දතාව පිළිබඳ හේතු පැහැදිලිව සහ සරල ලෙස පැහැදිලි කළහ, උන්වහන්සේට කිසියම් විශේෂිත දාර්ශනික ආකල්පයකින් තමන්වහන්සේ හඳුන්වා ගැනීමට අවශ්‍ය නොවීය. එසේම උන්වහන්සේට ප්‍රශ්න විමසන්නන් තවදුරටත්, ව්‍යාකූල කිරීමට අවශ්‍ය නොවීය. බුදුපියාණන් වහන්සේගෙන් ප්‍රශ්න කිරීමේදී නිහඬව සිටීම පිළිබඳ අනෙක් එකම උදාහරණය නම් උත්තිය හමුවීමේදීය. ඒ උත්තිය සෑම දෙනාම අවසානයේදී නිර්වාණය අවබෝධ කරගනීද කියා බුදුපියාණන්ගෙන් විමසීමයි. බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්දව සිටි අතර, ආනන්ද හිමියෝ උන්වහන්සේ වෙනුවෙන් පිළිතුරු දුන්හ (A.V,194). මෙම කාරණයේදී බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව පිළිබඳව හේතුවක් නොදක්වන ලදී. නමුත්, ප්‍රශ්නය සමීපයේ තිබෙන කාරියට අදාළ නොවන බව උන්වහන්සේ සැලකූ බව පෙනෙන්ට ඇත.

බුදුපියාණන් වහන්සේට තිබූයේ යැයි කියන නිශ්ශබ්දතාව පිළිබඳ කල්පනාමාත්‍ර සහ කල්පිත පැහැදිලි කිරීම් පදනම් වී ඇත්තේ මෙම සිද්ධීන් දෙක මතය. ඒවායේ මූලාරම්භය ඇත්තේ මූලාශ්‍ර පිරික්සීමට

අපොහොසත් වීම හෝ බුදුපියාණන් වහන්සේ පැවසූ හෝ නොකීමට ඕනෑම දෙයක් තෝරා ගැනීමට වඩා, ලේඛකයාගේ විශේෂිත විශ්වාසයන් සමග බුදුපියාණන් වහන්සේ තෝරා ගැනීමට ඇති ආශාවයි.

## නිශ්ශබ්ද බුදුපියාණන් වහන්සේ

බුදුපියාණන් වහන්සේ යනු, තවත් කෙනෙකුගේ මගපෙන්වීමෙන් තොරව සම්පූර්ණයෙන්ම තමන්ගේ උත්සාහයෙන් සහ ස්ථීර අධිෂ්ඨානයෙන් පිරිපුන් සහ සම්පූර්ණ බුද්ධත්වයට එළඹි පුද්ගලයෙකි. සියලු බුදුවරුන්ට ඇත්තේ එකම අවබෝධයයි. එකම සවිඥානයකි. නමුත් උන්වහන්සේලා සියල්ලන්ටම ඇත්තේ එකම හැකියාවන් නොවේ. අපේ යුගයේ බුදුපියාණන් වහන්සේ වන සිද්ධාර්ථ ගෞතම, අසාමාන්‍ය ලෙස සුවිශේෂ කුසලතාවන්ගෙන් යුත් පුද්ගලයෙකි. උන්වහන්සේ කියූ සහ කළ දේ උන්වහන්සේගේ සමකාලීනයන්ට ගැඹුරු බලපෑමක් ඇති කළේය. සැබැවින්ම ඔවුන් සහස්‍ර දෙකහමාරකට පසුවත්, මිනිසුන් මෙහෙයවමින් පවතී. කෙසේ නමුත්, වෙනත් බුදුවරුන් ඔවුන්ගේ මෘදු ස්වභාවය, සන්නිවේදන කුසලතා නොමැතිකම හෝ විශේෂිත තත්ත්වයන් නොමැතිවීම, උන්වහන්සේලා අවබෝධකරගත් දේ කිසිවිටක උගන්වා නැති, නමුත්, නිහඬව උන්වහන්සේලාගේ ජීවිත ගත කළ අතර, තමන්වහන්සේලා වටා සිටින අය නොදැනම පරිනිර්වාණයට පත්වූහ. එවැනි බුදුවරුන් නිශ්ශබ්ද බුදුවරුන් (පච්චෙක බුද්ධ) යනුවෙන් හැඳින් වේ. එක් විශේෂ නිශ්ශබ්ද බුදුවරයෙක් උන්වහන්සේගේ අවබෝධය පිළිබඳව මෙසේ පැවසූහ: 'දරුගැබේ

ඇවුරුම මගෙන් බිඳ වැටී ඇත. නැවත ඉපදීම අවසන් වී ඇත. අඛණ්ඩ පැවැත්මේ දැළි කුණු පිරිසිදු කර ඇත, කඳුළු සාගරය වියළී ඇත, අස්ථිවල බාධක කඩා බිඳ දමා ඇත, මට තව දුරටත් නැවත උත්පත්තියක් නැත' (Ja.III,377). නිශ්ශබ්ද බුදුවරුන් පිළිබඳව මෙසේ විස්තර කර ඇත: 'උන්වහන්සේලාගේ හිස කෙස් සහ රැවුල් මුඩුකර ඇත. උන්වහන්සේලා කසාවතින් පලඳවා ඇත. උන්වහන්සේලා කිසිම විශේෂිත පවුල් හෝ ගෝත්‍ර නාමයකින් නොහැඳින් වෙති. උන්වහන්සේලා සුළඟෙන් ගසාගෙන යන වළාකුලක් මෙන් නිදහස්ය. ආලෝක ග්‍රහණයකින් පසු චන්ද්‍රයා මෙන් ප්‍රභාවත්ය' (Ja.III,377).

*The Paccakabuddha: A Buddhist Ascetic*, R. Kopperborg, 1983.

## සරලතාව

සරලතාව (අජ්ජව හෝ අසඨ) යනු සංකීර්ණ නොවීම, ඍජු සහ ක්‍රියා කිරීමට හෝ අවබෝධකර ගැනීමට පහසු ස්වභාවයයි. එය සංකීර්ණතාව, අවුල් සහිත බව, මැඩපැවැත්වීම සහ මවාපෑමේ ප්‍රතිවිරුද්ධයයි. මෙහි ඉංග්‍රීසි වචනය පැමිණ ඇත්තේ 'හරියටම එකයි' යන අර්ථය ඇති සිම්ප්ලෙක්ස් යන ලතින් වචනයෙනි. සරලබව ඇති පුද්ගලයාට යම්කිසි සිරියාවක්, ලස්සනක් සහ අවංකබවක් ලබා දෙයි. බුදුපියාණන් වහන්සේ බොහෝ විට එය මෘදුබව (මද්දව) සහ විනීතබවක හා සම්බන්ධ කළහ (අජ්ජව) (D.III,213; Sn.250). කොම්තෙ-ස්පොන්විල් නමැති ප්‍රංශ ජාතික සමාජ විද්‍යාඥයා මෙසේ පැවසුවේය: 'බුද්ධිය යනු සංකීර්ණ දේවල් සරල කිරීමේ කලාව මිස, එහි විරුද්ධ දෙය නොවේ'. බුදුපියාණන් වහන්සේ මෙය සමග එකඟ වනු ඇත. බුදුපියාණන් වහන්සේ

උන්වහන්සේගේ ධර්මය දීර්ඝව සහ විස්තරාත්මකව ඉගැන්වුවත්, උන්වහන්සේට සැමවිටම එය ඉතාමත් මූලික, සරල, සහ අවබෝධකරගත හැකි භාෂාවෙන් සාරාංශ කිරීමට හැකියාවක් තිබුණි. 'එක දෙයක්, මම උගන් වන්නේ එකම දෙයක් පමණි. ඒ දුක්විඳීම සහ දුක්විඳීම නතර කරන්නේ කෙසේ ද යන්නයි' (M.I,140).

අපට බොහෝ ආකාරයෙන් සරල විය හැකිය. නමුත්, මේවායෙන් වඩා වැදගත් වන්නේ අප ජීවත් වන ආකාරය, අපගේ මනස භාවිත කිරීම සහ අප වටා ඉන්නා අය සමග සම්බන්ධ වීමයි. ජීවන රටාවේ සරල බව තිබීමට, දේවල්වල මූලික අරමුණ පිළිබඳව අප අපට මතක් කර දිය යුතුව ඇත. ඇඳුම්වල මුල් අරමුණ වූයේ, උදාහරණ වශයෙන්, විනීතබව සහ ශරීරය මූලික ධාතුවලින් ආරක්ෂා කිරීමයි. බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් බලන කල ඇඳුම් සමාජ තත්ත්වයේ සංකේතයක් ලෙස, ධනය පිළිබඳ සංඥාවක් ලෙස, විලාසිතා අතර ඉදිරියෙන් සිටීමට, අපගේ ලිංගිකත්වය ඉස්මතු කිරීමට හෝ අපගේ වයස වසන් කිරීම ඒවා අනිසි ලෙස භාවිත කිරීමකි. එසේම ඒවා අපගේ ජීවිත සංකීර්ණ සහ අවුල් කරයි. සරල බව අගය කරන පුද්ගලයා පිළිවෙලට, පිරිසිදුව සහ සුවිශේෂ ආකාරයට, 'හැඟීම් ඇතිකිරීමට' සැලකිල්ලක් නොදක්වමින් ඇඳුම් අඳියි'. තමන් සතු දේවල සැබෑ අරමුණ ඔවුහු අමතක නොකරති. අප ජීවිතය සරල කරන විට, අප භුක්ති විඳින බොහෝ ආශීර්වාදවලින් දෙකක් වන පහසුවෙන් නඩත්තු කළ හැකි බව (සුභරෝ) සහ නිරන්තරව කාර්යබහුල නොවනබව (අප්පකිච්චෝ), යන ගුණාංග දෙක බුදුපියාණන් වහන්සේ මෙත්ත සූත්‍රයෙන් ඇගයූ සේක (Sn.144).

මානසික සරලබව ඇති වන්නේ භාවනාව පුහුණු කිරීමෙනි. විශේෂයෙන්ම සිහිකල්පනාව පිළිබඳ භාවනාවෙනි. සාමාන්‍යයෙන් අප දේවල් දකින්නේ ඒවායේ යථාස්වරූපයෙන් නොවේ. නමුත් අගතිය, මතකයන්, ආශාවන්, සහ නිරන්තරව අතොරක් නැතිව දොඩවන සිතුවිලි රාශියක් හරහා ඒවා විකෘති කිරීමයි. භාවනාවෙන් මේ සියල්ල ඉවත් කරයි. එවිට අපට දේවල් සම ඍජු සම්බන්ධතාවක් ඇති කර ගත හැකිය. දේවල් ඍජුවම දැන ගැනීමෙන් ඒවායේ සත්‍යය හෙළි කිරීමට අපට ඉඩ ලබා දේ.

සදාචාරාත්මක සරල බව, නැතහොත් බුදුපියාණන් වහන්සේ ඍජුබව (උජු හෝ උජුක) ලෙස හැඳින් වූයේ සත්‍යවාදීව සහ අවංකව, චාටු බසින් අපගේ ක්‍රමය ඒවා වටා ගෙන යාමට හෝ රවටන්නට උත්සාහ නොකරමින් ශික්ෂාපද පිළිපැදීමයි. එවිට ඔවුන් සතු නොවන ගතිස්වභාවයන් ඔවුන්ගෙන් පිළිබිඹු නොවේ. සරල සුචරිතයකින් සැරසී සිටින පුද්ගලයෙකු අවංකය, කරුණාවන්තය, ත්‍යාගශීලීය, සහ උපකාරීවන්නේය. එයට හේතුව කළ යුතු හරි දෙය නිසා මිස, ඔහුට හෝ ඇයට ආකර්ෂණය කිරීමට, ලාභප්‍රයෝජන ගැනීමට, 'පින් කිරීමට' හෝ 'නරක කර්ම' කෙරෙහි බිය නිසා නොවන නිසාය.

නිවටයෙකු වීම සරලවීම හා සමාන නොවේ. පළමු වැන්නාට බුද්ධිය නැත. දෙවැන්නා සරලබව අගය කරයි. එයට හේතුව එය කෙනෙකුගේ ජීවිතය පහසු කරවන අතර, ප්‍රීති ප්‍රමෝදය ලබා දීමයි.

## පාපය

පාපය යනු 'වරද ඇති' යන අර්ථය ඇති සොන්ස් යන ලතින් වචනයට සන්ධානගත ක්‍රිස්තියානි වචනයකි. ක්‍රිස්තියානි ආගමේ පාප වර්ගයන් තුනකි: සමා කළ හැකි පාපය, ඉතා බරපතල පාපය සහ පළමු පාපය වශයෙනි. දෙවියන් වහන්සේගේ නීති අනුව, පළමුවැන්න සුළු උල්ලංඝනය කිරීමක් වන අතර, දෙවැන්න මිනීමැරීම වෙනත් දෙවිවරුන්ට වැඳීම වැනි වඩා බරපතල උල්ලංඝන කිරීමකි. පළමු පාපය යනු සියලු මිනිසුන් දූෂ්‍ය වී ඇති, සහ පළමු පව්කාරයන් වන ආදම් සහ ඒවගෙන් උරුම වූ ඒවාය. ලෝභ (ලොභ), ද්වේෂ (දොස) සහ මෝහය (මොහ) බුදුදහමේ මානසික ක්ලේශයන් වේ. ඒ සියල්ලේ අංකුර (උදාහරණ, ලෝභය සහ ගිජුබව, තරහ සහ නොරිස්සුම, බොළඳකම සහ මෝඩකම) සමහර විට හඳුන්වන්නේ පාප ලෙසයි. නමුත්, එසේ කිරීම නුසුදුසු සහ නොමඟ යවන සුළු වේ.

පාපය යනු දෙවියන් වහන්සේගේ නීති උල්ලංඝනය කරන සිතුවිලි, වචන සහ ක්‍රියාවන් වේ. ඒ සම්බන්ධයෙන් පළමු පාපයේ මෙන්, පව්කාරයන්ගේ දූරස්ථ පැවත එන්නන් ද වගකිව යුතු වේ. මෙම අදහස්වලට සමානකම් බුදුදහමේ නැත. තවදුරටත්, සමහර වඩාත් බරපතල පව්වල සදාචාරමය වැදගත්කමක් බුදුදහමේ නැත. උදාහරණ වශයෙන් දේවනියෝග දහයේ, පළමුවැන්න, දෙවැන්න සහ හතරවැන්න යනුවෙනි. බුදුදහමේ මානසික කෙලෙස් (ආසව හෝ කිලෙස) තනිකරම විෂය නිශ්‍රිත හේතූන් මත සැලකිල්ලට ගනු ලැබේ. ඒවා අදක්ෂ හෝ නුසුදුසු වන්නේ ඒවා ඍණාත්මක අරමුණුවලින්

(ලෝභය, ද්වේෂය සහ මෝහය) ජනනය වන නිසා ඍණාත්මක විපාක (පසුතැවීම, අසතුට සහ කෝපය, ප්‍රචණ්ඩත්වය, පළිගැනීම සහ දඬුවම ආදිය) ඇති වේ. එසේම බුදුදහමට අනුව, කෙනෙකුට වෙනත් කෙනෙකුගේ ක්ලේශ හේතුකර ගෙන කර්ම විපාක අත්විඳිය නොහැකිය. බලන්න **මිනිස් ස්වභාවය**

## සූක්ෂම උපක්‍රම

සූක්ෂම උපක්‍රම (උපාය කොසල්ල) යනු ගුරුවරයෙකුගේ සන්දර්භය තුළ ධර්මය සාර්ථකව සන්නිවේදනය කිරීම සඳහා අන් අයගේ උවමනාකම්, අවශ්‍යතා සහ අන් අයගේ අවබෝධ කරගැනීමේ මට්ටම්මට යොදා ගැනීමට ඔහු හෝ ඇය දක්වන කැමැත්තයි (D.III,220; Th.158). හොඳම සූක්ෂම උපක්‍රමය වන්නේ නම්‍යශීලීබව සහ අනුකම්පා සහගත වීමයි. සුත්ත නිපාතයෙහි හොඳ ගුරුවරයෙකු වශයෙන් විස්තර කරන්නේ 'උපක්‍රම දැනගැනීමේ සූක්ෂම' (උපායඤ්ඤූ කුසලෝ, Sn.321) බවයි. බුදුපියාණන් වහන්සේ විවිධ ආකාරයේ මිනිසුන්ට හොඳින් ධර්මය ඉගැන්වීම සඳහා තමන්වහන්සේගේ වචනය සහ පෙනුම පවා යෝග්‍ය සේ සකස් කරගන්නා බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. 'මට මා සහභාගී වූ බොහෝ රදළයන්, පූජකයන්, ගෙවැසියන්, භික්ෂූන් සහ දෙවිවරුන්ගේ ... සභාවන් හොඳින් මතක තිබේ. මම ඔවුන් සමග ඉඳ ගැනීමට පෙර, ඔවුන්ට කථා කළෙමි, හෝ ඔවුන්ගේ සාකච්ඡාවට එකතු වුනෙමි. ඔවුන්ගේ පෙනුම සහ කථාව කුමක් වුවත්, මම පිළිගෙන, ඊට පසු ඔවුන්ට ධර්මය පිළිබඳව උපදෙස් දුන්නෙමි' (D.II,109). බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ

භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට පැවසුවේ ධර්මය පිටස්තර කොටස් වලට උගන්වන විට, ඔවුන් සමග ජීවත් වන එම ජනතාවගේ භාෂාව පිළිපැදිය යුතු බවයි (M.III,235).

සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වී ඇති සිගාල හමුවීම බුදුපියාණන් වහන්සේගේ සූක්ෂම උපක්‍රම සඳහා හොඳම නිදසුනයි. එක් දිනක මෙම තරුණයා එකල තිබූ සාමාන්‍ය පුරුද්දක් වූ දිශාවන් හයට නමස්කාර කරනු බුදුපියාණන් වහන්සේ දුටුවහ. බුදුපියාණන් වහන්සේ ඔහු එසේ කරන්නේ කුමන හේතුවටද යන්න විමසූ විට, ඔහුගේ පියා මැරෙන විට පවුලේ සම්ප්‍රදාය තව දුරටත් රකිමින් එසේ කිරීමට ඔහු පොරොන්දු කරවා ගත් බව පැවසුවේය. එවැනි පුරුදු පිළිබඳව උන්වහන්සේ තුළ තිබුණේ අල්ප සැලකිල්ලක් වූ නමුත්, සිගාලගේ අරමුණු යහපත් වූ බවත්, ඔහු නමස්කාර කරන්නේ තමන්ගේ පියා කෙරෙහි වූ ගෞරවය නිසා සහ ඔහු විසින් කරන ලද පොරොන්දුව ඉෂ්ට කිරීමට බවත් උන්වහන්සේට පෙනුණි. ඒ නිසා එම පුරුද්ද විවේචනය කිරීමට සහ හෙළා දැකීමට වඩා, එම පුරුද්ද යම්තම් වෙනස් කරන ලෙස සිගාලට උපදෙස් දෙමින්, ඒ වෙනුවට ඔහු සමග සම්බන්ධතා ඇති (දෙමාපියන්ට, දරුවන්ට, මිත්‍රයන්ට, සේවකයන්ට, ගුරුවරුන්ට, ආදිය) දිසාවලට සමාන කරමින් දැකීමට සහ ඔවුන්ට කරුණාව, ගෞරවය සහ ආදරයෙන් සලකමින් නමස්කාර කරන ලෙස ඉල්ලූහ (D.III,181).
*Skillful Means*, Michael Pye, 1978.

## වහල් භාවය

වහල් භාවය යනු පුද්ගලයෙකු නීත්‍යානුකූලව අන්‍යයන් සතු කරමින් ඔවුන්ගේ වැඩ කිරීමට බල කරන ආයතනයකි. වහලුන් (දාස හෝ ආහතක), වෙනත් දේපළ මෙන් මිලදී ගැනීම, විකිණීම සහ උගස්කිරීමට හැකි වීමයි. පැරණි ඉන්දියාවේ පස් ආකාර වහල්ලු සිටියහ. වහල් මවුවරුන්ට උපන් දරුවන්, මිලදී ගත් අය, ස්වේච්ඡාවෙන් වහලුන් වූ අය, උදාහරණ වශයෙන් සාගත කාලයේදී සාගින්නෙන් මිදීම සඳහා, බිය හේතුකර ගෙන වහලුන් වූ අය සහ වැටලීම්වලදී හසු වූ අය (Ja.VI,285; Vin.IV,224) ආදී වශයෙනි. වහලුන්ගේ දෛවය ඉතා දුෂ්කර එකකි. කුඩාම වැරැද්දක් සඳහා වුවද, ඔවුන්ට කසපහර දීම, දම්වැල් දැමීම, හංවඩු ගැසීම හෝ සුන්බුන් ආහාරයට දීම සිදු වේ (Ja.I,451). තමන්ගේ වහල් දැරිය ප්‍රමාද වී අවදි වීම නිසා තදබල ලෙස පහර දුන් කාන්තාවක් පිළිබඳව අපි කියවා ඇත්තෙමු (M.I,125). මෙම අනුමත කළ නොහැකි තත්ත්වය ඉස්මතු කර දක්වා ඇත්තේ වහලෙකුට වහල්භාවයෙන් මිදෙන විට ඇතිවන සහනකාරී හැඟීම පිළිබඳව බුදුපියාණන් වහන්සේ කර ඇති විස්තරයෙනි. උන්වහන්සේ මෙසේ පැවසූහ, 'ඔහු මෙසේ සිතනු ඇත, ''මම වහලෙකුව සිටින විට මගේම ස්වාමියා මම නොවුනෙමි. එය තිබූයේ වෙනත් කෙනෙකු යටතේය. මට යන්නට අවශ්‍ය කොතැනකවත් මට යා නොහැකි විය. නමුත් දැන්, මම මගේම ස්වාමියා වෙමි. තවත් කෙනෙකු යටතේ නැත. නිදහස්, විමුක්තිය ලැබී ඇත, මට යා යුතු තැන යා හැකිය'', ප්‍රතිඵලයක් වශයෙන්, ඔහු ප්‍රීතිප්‍රමෝදයට පත් වෙයි, සතුටු වෙයි' (D.I,72).

බුදුපියාණන් වහන්සේ වහලුන්ට භික්ෂූන් වීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කළහ. ඒ ඔවුන් සැබෑ ආධ්‍යාත්මික හේතූන්ට වඩා, සඞ්ඝයා රැකවරණය ලෙස භාවිත කරනු ඇතැයි උන්වහන්සේ සිතූ නිසාය. එම හේතුව නිසාම, රහසින් පැනගිය දාමරිකයන්, ණයගැතියන් සහ රජුට බැඳීම් ඇති අයට ද පැවිදි වීම උන්වහන්සේ තහනම් කළහ (Vin.I,75-6).

මිනිසුන් මිලදී ගැනීම අලෙවි කිරීම ගිහියන්ට වැරදි ජීවානෝපායක් බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.III,208). එසේම උන්වහන්සේ භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට වහලුන් ත්‍යාග වශයෙන් පිළිගැනීම හෝ අයිති කර ගැනීම ද තහනම් කළහ (D.I,5). මෙම උගැන්වීම් වහල්සේවයට විරුද්ධව දන්නා පැරණිතම තහනමයි. යම් ශතවර්ෂ ගණනාවකට පසු, මහාවස්තුවේ වහල්සේවය හෙළාදැක ඇත්තේ මෙසේය, 'ආරක්ෂාව සහ සරණ නොමැතිව මිනිසුන් වහල්සේවයට යොදවා ගන්නා අය' නැවත උත්පත්තිය ලබන්නේ නිරයේය. උපාසකශීල සූත්‍රයේ (ක්‍රි. පූ. 3වන ශතවර්ෂයේදී පමණ) සඳහන්ව ඇත්තේ ගිහියෙකු වහලුන් මිලදී ගැනීම හෝ අලෙවිය නොකළ යුතුයි, තමන්ගේ බිරිඳ හෝ දරුවන් වහල්සේවයට නොවිකිණිය යුතුයි යනුවෙනි. පුරුෂයන් හෝ පියවරු සමහර විට දුෂ්කර අවස්ථාවන්හිදී ණය වූ විට එසේ කර ඇත.

එවැනි ඉගැන්වීම් තිබියදීත්, සියලු බෞද්ධ රටවල වහල්සේවය ලෝකයේ අනෙක් රටවල මෙන්ම පැවතී ඇත. වැදගත් බෞද්ධ සංස්කෘතියක් තිබූ රටක් වූ ජපානය 1590දී වහල්සේවය අහෝසි කරමින් එසේ

කළ පළමු රට බවට පත් විය. වෙනත් බොහෝ බෞද්ධ රටවල වහල්සේවය අහෝසි කළේ යටත් විජිත බලයන් විසිනි. ශ්‍රී ලංකාව 1820දී, බුරුමය, ලාඕස් සහ කාම්බෝජියාව 19වන ශතවර්ෂය අගදීත්, සහ තායිලන්තය බටහිර රටවල්වල බලපෑම නිසා 1905දීත් එසේ කළහ. අවසානයට වහල්සේවය අහෝසි කළ බෞද්ධ රට භූතානය 1958දී කරන ලදී. නාසීවරුන් ඔවුන්ට අයිතිව තිබූ රටවල ඉතා පුළුල් ලෙස වහල්සේවය යොදා ගත්හ. සෝවියට් දේශය 1920 අවසාන කාලයේ සිට 1950 මුල් කාලය වනතුරු එසේ කළහ. අවසානයට වහල්සේවය තහනම් කළේ 1980දී මෞරිටනියා රටේය. නමුත්, සත්‍ය වශයෙන්ම මැදපෙරදිග රටවල සමහර කොටස්වල එය තවමත් පවතී.

'Slavery as Known from the Buddhist Pali Sources.'M. M. Singha, *Indian Historical Quarterly*, Vol.39, 1-4, 1963.

## නින්ද

නින්ද (නිද්දා හෝ සෙයියා) යනු අඩු කායික චලනතාව, බාහිර උත්තේජනයන්ට සීමිත ප්‍රතිචාර ඇති සහ දැනීමක් නැති බවක් නිරූපණය වන ස්වාභාවික තත්ත්වයකි. සාමාන්‍ය පුද්ගලයෙකු ඔහුගේ හෝ ඇයගේ ජීවිතයේ තුනෙන් එකක් නින්ද සඳහා වැය කරන බව ගණනය කර ඇත. නින්දෙන් සිදුවෙන ජීව විද්‍යාත්මක කාර්යය වන්නේ ශරීරයට සහ මනසට පූර්ණ විවේකයක් ලබා දෙමින් යළි ප්‍රාණවත් බවක් ලබා දීමයි. කෙසේ නමුත්, අවශ්‍ය ප්‍රමාණයට වඩා නිදා ගැනීම, ප්‍රමාණවත් සහ අක්‍රමවත් නින්ද කෙනෙකුගේ කායික සහ මානසික යහපැවැත්මට බරපතල ලෙස බලපායි. මෙය බුදුපියාණන් වහන්සේ හොඳින් දැන සිටිය කරුණකි.

උන්වහන්සේ තමන්වහන්සේගේ ගිහි ශ්‍රාවකයන්ට කියා සිටියේ දිවා කාලයේ නිදාගැනීම සහ මුළු රාත්‍රියේම නැගිට සිටීම ඔවුන්ගේ ජීවිතවලට අහිතකර ලෙස බලපානු ඇති බවයි (D.III,185). භික්ෂූන් වහන්සේලාට සහ භික්ෂුණීන්ට වැඩ කිරීමට අවශ්‍ය නැති නිසා, භාවනා කිරීම හෝ ඉගෙනීම වෙනුවට, නිදා ගැනීමේ පුරුද්දට පහසුවෙන් ලිස්සා යා හැකි තරම් නිදහස් කාලයක් ඇති බව බුදුපියාණන් වහන්සේ තේරුම් ගත්හ. එම නිසා, ඔවුන්ට උන්වහන්සේගේ නිතර මතක් කිරීම වූයේ ඔවුන් 'නිදා ගැනීමට ළැදි' (නිද්දාරාම, A.III,116; It.72; Sn.96) නොවිය යුතු බවයි. උන්වහන්සේ මෙසේ පැවසූහ, 'කෙනෙකු කම්මැලි වූ විට, ඕනෑවට වඩා කන විට, කෙටි නින්දක් නිදන විට, සහ විශාල මහත ඌරෙකු මෙන් ඇඳ මත ඇලව සිටීමෙන්, ඔහු නැවත නැවතත් ඉපදේ' (Dhp.325).

බුදුපියාණන් වහන්සේ සමහර විට දහවල් කෙටි නින්දක් හෝ සවස නින්දක් ගත් (දිවාසෙයිය) නමුත්, ඒ බොහෝ විට උන්වහන්සේ මහලු වියට පත්වීමෙන් පසුය. සච්චක භික්ෂුව වරක් බුදුපියාණන් වහන්සේ සවස සැතපෙන්නේදැයි උන්වහන්සේගෙන් ඇසුවේය: 'පසුගිය මාසයේ උෂ්ණ ඍතුවේදී, දානය රැගෙන පැමිණ, දානය වැළඳීමෙන් පසු, මම මගේ සිවුර හතරට නවා, එළා, සැතපී සම්පූර්ණ සිහියෙන් යුක්තව සැතපුණු බව මට මතකයට එයි.' සච්චක ඉව කරමින් මෙසේ පැවසුවේය: 'සමහරු එය මායාවේ රැඳී සිටීම යැයි හඳුන්වනු ඇත' (M.I,250).

අවදිව සිටියදී අපගේ හැසිරීම සමහර විට නින්දේදී බලපෑමක් ඇති කළ හැකි බව බුදුපියාණන් වහන්සේ

නිරීක්ෂණය කළහ. දුරාචාරයේ යෙදීම හෝ ක්‍රෘරවීම උදාහරණ වශයෙන් නින්ද නොයෑමේ පුරුද්ද හෝ විවේකය නොමැති නින්ද ඇති කළ හැකිය. 'මෝඩයා තම යහනේ හෝ ඇඳේ හෝ බිම වැතිර සිටින විට, ඔහු අතීතයේ කර ඇති නපුරු ක්‍රියාවන්, පමා වූ සවස් වරුවේ කන්දක සෙවණැල්ල, පොළොව මත බැස, තැන්පත් වන්නා සේ සහ වැතිර සිටින්නා සේ ඔහු පහත් මට්ටමකට ඇද හෙළයි, කිඳා බස්සවයි, සහ ඔහු මත වැතිර සිටියි. එවිට මෝඩයා මෙසේ සිතයි ''මම ලස්සන හෝ දක්ෂ දෙයක් කර නැත. මම බියකරු දෙයින් මා ආරක්ෂාකර නැත.'' එවිට ඔහු නොසන්සුන් සහ කලබලයට පත්ව, හඬයි. බලාපොරොත්තු නැතිකර ගනියි' (සංක්ෂිප්ත කර ඇත, M.III,164-5). එසේම ආදරණීය ස්වභාවයක් ඇති පුද්ගලයා 'හොඳින් නිදයි, සතුටෙන් අවදිවෙයි, නරක සිහින නොදකියි' (සුඛං සුපති, සුඛං පටිභුජ්ඣති, න පාපකං සුපිනං පස්සති, A.V.342).

නිර්වාණයට පත්වීමෙන් ලැබෙන බොහෝ වූ ධනාත්මක ප්‍රතිඵලවලින් එකක් වන්නේ බාධා රහිත සහ නිසල විවේකයක් බව බුදුපියාණන් වහන්සේ පැවසුහ. 'නිර්වාණයට පත් වූ තැනැත්තා, ඉන්ද්‍රිය ගෝචර සතුටින්, වස්තු ලෝභයෙන් නිදහස්ව සහ සැහැල්ලු හදවතකින් යුතුව සැමවිටම සතුටින් නිදයි. බැඳීම් කපා හෙළන විට, හදවත නිස්කලංක වේ, මනස සැනසීමට පත් වේ, සන්සුන් පුද්ගලයා හොඳින් නිදයි' (S.I,212).

භාවනාව පුහුණු කරන අය සමහර විට, ආහාර ගැනීමෙන් පසු (භත්තසම්මද) නිදිමත ඇති වේ, නිදි

කිරයි (පචාල) සහ ප්‍රමාණවත් නින්දකින් පසුව ද අවදිව සිටීමට වෙහෙසෙන්නට සිදු වේ. මෙය හඳුනාගත් බාධාවන්ගෙන් එකකි. එයින් ජයගන්නට උපකාරී වීම පිණිස බුදුපියාණන් වහන්සේ අපට ප්‍රායෝගික උපදෙස් දුන්හ. නිදිමත ගතියට අනුබල දෙන සිතුවිලි ඇති වූ විට, ඔබ ඒවාට අවධානය යොමු නොකළ යුතුයි. මෙසේ කිරීමෙන් පසුවත්, නිදිමත ගතිය නැති නොවුණහොත්, ඔබ ඉගෙන ගත් පරිදි ධර්මය මෙනෙහි කළ යුතුයි. ඔබ එය පරීක්ෂා කර ඒ පිළිබඳව සිතිය යුතුයි. මෙසේ කරමින් ද, නිදිමත ගතිය නැති නොවුණහොත්, ඔබ ඉගෙන ගත් පරිදි ධර්මය සජ්ඣායනය කළ යුතුයි. මෙසේ කිරීමෙන් පසුවද, නිදිමත ගතිය නැති නොවුණහොත්, ඔබ කන් පෙති දෙකම ඇද, ඔබගේ අත්වලින් අත් පා ඇතිල්ලිය යුතුයි. මෙසේ කිරීමෙන් පසුව ද, නිදිමත ගතිය නැති නොවුණහොත්, නැගිට, මුහුණ සෝදා, අවට බලා, තරුවලින් වැසුණු තාරකා මණ්ඩලය දෙස තදින් බලා සිටිය යුතුයි. එසේ කළ පසුත්, නිදිමත ගතිය ඉවත් නොවේ නම්, ඔබ එළියක් සිතින් මවා ගෙන, දවල් කාලයේ හෝ රාත්‍රියේ වුවත් ඒ එළිය කෙරෙහි අවධානය යොමු කළ යුතුයි. ඒ අනුව, මනස විවෘත කර පැහැදිලි කරගන්න, මනස ආලෝකමත් වේ. එසේ කළත් නිදිමත ගතිය තිබේනම්, ඔබ ඔබගේ සිහිය ඇතුළතට යොමු කර, උඩට පහළට සම්පූර්ණ සිහියෙන් සක්මන් කළ යුතුයි. එසේ කිරීමෙන් පසු නිදිමත ගතිය තවමත් තිබේනම්, ඔබ සිහියෙන් ඔබගේ දකුණු පසට එක පිට එක පාද තබාගෙන වැතිර, විවේක ගැනීමෙන් පසුව, කෙළින් විය යුත්තේ, මෙසේ සිතමින්ය: ''මම නිදා ගැනීමෙන්, හාන්සි වෙමින් සහ අලසබවින් සිටීමෙන් ඇතිවන කැමැත්තට ආශා නොවිය යුතුයි''

(සංක්ෂිප්තයි, A.IV,86-7) බලන්න **සිහින**

## සිනාව සහ සිනහසීම

සිනාවක් යනු මුඛයේ කොන් ඉහළට යමින් සතුට නිසා ඇති වන මුහුණේ ප්‍රකාශනයකි. සිනහසීම යනු මුහුණේ ඉරියව්, ශබ්ද සහ ශාරීරික චලනයන්හි එකතුවකි. එය ප්‍රබල සතුටක් හෝ විනෝදයක් පෙන්නුම් කරයි. බුදුපියාණන් වහන්සේ කවදාවත් සිනහසුණු බවට සඳහනක් නැත. නමුත් උන්වහන්සේට සුන්දර සිනාවක් තිබූ බවත්, බොහෝ විට සිනාසුණු බවත් කියනු ලැබේ (S.I,24; Th.630).

බුදුපියාණන් වහන්සේගේ සිනාව, උන්වහන්සේගේ සන්සුන් සහ රැස් විහිදෙන මුහුණ සමගින් ස්වභාවයෙන්ම මිනිසුන් උන්වහන්සේ වෙත ඇද බැඳ ගන්නා ආකර්ෂණයක් ලබා දුන්නේය. උන්වහන්සේගේ ශ්‍රාවකයන් විස්තර කරනු ලැබුවේ 'සිනහවෙමින්, ප්‍රීතිසිතින්, අතිශයින් ප්‍රීති වෙමින්, සතුට දනවන සහ ප්‍රභාවත් සමේ වර්ණයකින් යුක්තවය' (M.II,121). සිනහව සහ සිනහසීමේ විවිධ වර්ග සහ තීව්‍රතා අභිධර්මයේ මනෝවිද්‍යාව හඳුනාගනී. මේවා, මෘදු සිනහව (සිත), මුඛයේ කොන් ඇරී දත් දැකිය හැකි සිනහව (හසිත), සිනහවෙන් ශබ්දයක් ඇසෙන (විහසිත), සිනහවෙන් හිස, උරහිස් සහ අත් වෙව්ලන (උපහසිත), ඇස්වලට කඳුළු යනතුරු සිනහවීම (අපහසිත), සහ සිනහව සමග අති ගැඹුරු රළු හඬක් නිකුත්වීම (අතිහසිත) යන ඒවාය.

භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට උස් හඬැති මෝඩ විදියට

සිනහව නුසුදුසු බව බුදුපියාණන් වහන්සේ සැලකූහ (A.I,261). ඒ පෙර කී ලෙස ඔවුන්ගේ වෘත්තිය කල්පනාකාරී එකක් වන නිසාය. ධම්මපදයේ උන්වහන්සේ මෙසේ අසති: 'ලෝකය ගිණි මත තිබියදී මේ සියලු සිනහ සහ සැමරීම් කුමටද?' (Dhp.146). මහාවස්තුවේ මෙසේ සඳහන් වේ: 'එකට ජීවත්වෙමින්, කරුණාවන්ත බැල්මකින් සහ උණුසුම් සිනහවකින් මිනිසුන් සහ සත්ත්වයන් අතර ආදරය උපදී'. ඕනෑවට වඩා සැලකිලිමත් වන නැඹුරුතාවක් ඇති භාවනායෝගීන්ට බොධිචර්යාවතාරයෙන් අවවාද කරයි: 'සැමවිටම ඔබගේ මුහුණේ සිනහවක් නගා ගන්න, එරවීම අතහරින්න, ගැඹුරු පෙනුමක් ... මුළු ලෝකයටම මිතුරෙකු වන්න'. ආසියාවේ බෞද්ධ මිනිසුන් සිනහවීමට ඔවුන්ගේ ඇති සූදානම පිළිබඳව ප්‍රසිද්ධය. එය බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් බෙදා දෙන පොදු විවෘතභාවය සහ කරුණාව පිළිබිඹු කරන ගතිලක්ෂණයකි. බලන්න **හාස්‍යය**

*Humor in Pali Literature and Other Essays*, W. Rahula, 1997.

## දුම් ඉරීම

දුම් ඉරීම යනු සිගරට් හෝ දුම් පයිප්ප මගින් සෙමින් දැවෙන දුම්කොළ දුම ඉරීමේ පුරුද්දයි. දුම්කොළ පැරණි ඉන්දියාවේ නොදත් නමුත්, මිනිස්සු වෛද්‍යමය හේතු සහ විනෝදාත්මක කටයුතු සඳහා දුම් ඉරූහ. වෛද්‍ය විද්‍යාව සම්බන්ධ පැරණි ශාස්ත්‍රීය නිබන්ධයක් වූ සුශ්‍රුත සංහිතාවට අනුව, විරේකයක් වශයෙන්, විඩාවට සුවයක් වශයෙන්, අප්‍රාණික ගතියට, උගුරේ සහ නාසයේ ප්‍රශ්නවලට දුම් ඉරීම

යහපත් වේ. එසේම ගැබිණි මාතාවන්ට ද යහපත් වේ. යම් ඖෂධීය පැලෑටි පුළුස්සා එහි දුම කුඩා වානේ බටයක් (ධූමනෙත්ත) හරහා උරයි. මෙම ධූම චිකිත්සා ක්‍රමය බුදුපියාණන් වහන්සේ කැමැත්ත පළකර සිටි අතර, භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට දුම්උරන බට තබා ගැනීමට අවසර දුන්හ (Vin.I,204). නමුත් සමහර මිනිසුන් ඒවා සුඛෝපභෝගී යැයි සැලකූ බව පෙනේ (Ja.IV,363).

විනෝදය සඳහා උරන සිගරට් (ධූමවත්ති) සාදන්නේ කරඳමුංගු, කහ, සුදු හඳුන් සහ කෝමාරිකා සාරු වලින් සියුම් තලපයක් සාදා එය බටයකට වාත්තු කිරීමෙනි. එය සෙන්ටිමීටර් 15ක් පමණ දිග සහ මාපටඇඟිල්ලක තරම ඝනකමින් යුක්තය. මෙම තලපය වියළී වූ විට, බටය ඉවත්කර ඵලය ලෙස ලැබෙන සිගරට්ටුව ගිනිදැල්වීමට පෙර, පිරිසිදු කරගත් බටර් හෝ සුදුහඳුන් තෙල් ආලේප කරනු ලබයි. මෙම සිගරට් සමහර විට නූතන ඒවාට වඩා බොහෝ දුරට අහිතකර බවින් තොර වේ. කෙළින් ඉඳගෙන, නමුත් පහසු ඉරියව්වෙන් දුම් උරන අතරේ, එක් වරකට දුම් රොටු තුනක් ගනිමින් සහ මුවෙන් සහ නාස් පුඩුවලින් ආඝ්‍රාණය කරමින් ද දුම් ඉරීම සිදු වේ. නමුත්, නාස්පුඩුවලින් පමණක් දුම් උරන ලෙස තවත් පැරණි වෛද්‍යමය කෘතියක් වන චරකසංහිතා නිර්දේශ කරයි.

දුම්කොළ දුම ඉරීමෙන් ශරීරයට ඍණාත්මක ප්‍රතිඵලයක් ඇති කරන අතර, එයින් සිහියට ස්වල්ප හෝ ප්‍රතිඵලයක් ඇති නොකරයි. ඒ නිසා බෞද්ධ දෘෂ්ටිකෝණයට අනුව, සදාචාරමය වැදගත් කමක් නැත. පුද්ගලයෙකු කරුණාවන්ත සහ අවංක වන

අතරේ දුම් උරන්න ද පුළුවනි. ඒ අනුව, ශාරීරික සෞඛ්‍යය පිළිබඳ දෘෂ්ටි කෝණයෙන්, දුම්පානය නුවණට හුරුනැති වුවත්, එය පස්වන ශික්ෂාපදයට පටහැනි නොවේ.

දුම් ඉරීම සියලු බෞද්ධ රටවල ඉතා සාමාන්‍ය වන නමුත්, 2005දී භූතානය එය තහනම් කළ පළමු රට බවට පත්විය. බුරුමයේ, තායිලන්තයේ සහ කාම්බෝජියාවේ භික්ෂූහු සාමාන්‍යයෙන් දුම් උරති. නමුත් ශ්‍රී ලංකාවේ ඔවුන් එසේ කිරීම පිළිගත නොහැකි දෙයක් ලෙස සැලකේ. නමුත්, බොහෝ විට පෞද්ගලිකව කෙරේ. කෙසේ නමුත්, ශ්‍රී ලංකික භික්ෂූන්ට විවෘතව දුම්කොළ සැපිය හැකිය.

## හුදෙකලාව

හුදෙකලාව හෝ නික්ම යාම (පටිසල්ලාන, පවිවෙක හෝ විවේක) යනු අනෙක් අයගෙන් ඈත්වීම හෝ වෙන්වීමයි. පුද්ගලයෙකුට හුදෙකලාවීමට තෝරා ගැනීමක් කළ හැකි අතර, වෙනත් අය හෝ අවස්ථාවන් හේතුකර ගෙන එසේ කිරීමට බලපෑම් ද කළ හැකිය. හුදෙකලාව අනවශ්‍ය වූ විට, එයින් තනිකම, සාංකාව හෝ බිය ඇතිවිය හැකිය. නිසි කලට සහ නිසි ආකාරයෙන් එය භාවිත කළ විට, එයින් ආධ්‍යාත්මික දියුණුවට වැදගත් කාර්යභාරයක් ඉටු වේ. ජේසුස් වහන්සේ බව්තීස්ම කළ පසු, ඔහු කාන්තාරයක දින 40ක දවල් සහ රාත්‍රී හුදෙකලාව ජීවත්ව ඇත. තරුණ මොහමඩ් හිරා කන්දේ ගල්ගුහාවක සෑම වර්ෂයේම සති කිහිපයක් තනිවම භාවනා කළ බව සම්ප්‍රදායෙන් කියැවේ.

බුද්ධත්වය ලැබීමට පෙර, බුදුපියාණන් වහන්සේ ද කැලෑවල දීර්ඝ කාලයක් හුදෙකලාවේ ගත කළහ. මීට වර්ෂ බොහෝ ගණනාවකට පසුව එය සිහිකරමින් උන්වහන්සේ මෙසේ පැවසූහ: 'මගේ හුදෙකලාව කෙසේ ද යත්, මම යම් කැලෑවකට බලෙන් කඩා වදිමින් එහි ජීවත් වුනෙමි. මම ගොපල්ලෙකු, එඬේරෙකු, තණකොළ කපන්නෙකු, දර එකතු කරන්නෙකු හෝ වනවාසියෙකු දුටුවේ නම්, මම මග හැර යන්නෙමි, එවිට ඔවුහු මා නොදකිති, නැත්නම් මම ඔවුන් නොදකිමි (M.I,79). බුද්ධත්වයට පත් වීමෙන් පසු ද බුදුපියාණන් වහන්සේ ඉඳහිට හුදෙකලාවට වැඩියහ. උන්වහන්සේ මෙසේ පැවසූ බව සංයුක්ත නිකායේ සඳහන් වේ, 'මාස බාගයකට මම හුදෙකලාවට යන්නට කැමැත්තෙමි. මට දානය ගෙනෙන පුද්ගලයා හැර වෙනත් කිසිවෙකු මා හමුවීමට නොපැමිණිය යුතුයි' (S.V,12).

කායික සහ මානසික හුදෙකලාව වෙන්කොට හඳුනා ගැනීමක් බුදුපියාණන් වහන්සේ සිදු කළහ. මේ දෙකෙන් දෙවැන්න වඩාත් වැදගත් දෙය ලෙස උන්වහන්සේ සැලකූහ (S.II,282; V,67). උන්වහන්සේට අනුව, මානසික හුදෙකලාවෙන් අදහස් කරන්නේ මනස ඍණාත්මක සිතුවිලි සහ චිත්තවේගයන්ගෙන් වෙන් කිරීමයි. මිනිසුන් හුදෙකලාවීමට විවිධ හේතූන් තෝරා ගන්නට ඉඩ ඇති බවත්, සමහරක් ධනාත්මක හේතූන් නිසාත්, අනෙක් අය ඊට අඩුවෙන් බවත් බුදුපියාණන් වහන්සේ හඳුනා ගත්හ. සමහර අය අනෙක් අයගෙන් හුදෙකලා වන්නේ මෝඩකම හෝ මනස අවුල්වීම නිසාත්, සමහර අය දුෂ්ට අරමුණින්, පිස්සුවට හෝ මානසික අස්ථීර බව, හෝ හුදෙක්

උන්වහන්සේ එය අගය කරන නිසා බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. කෙනෙකු හුදෙකලාව අපේක්ෂා කිරීම වඩා බුද්ධිමත් හේතූන් නිසා විය හැකි බව ද බුදුපියාණන් වහන්සේ පැහැදිලි කළහ. ඒවාට, කෙනෙකුගේ අවශ්‍යතා අල්ප නිසා (අප්පිච්ඡතං), සතුටට (සන්තුට්ඨි), තමන් පිරික්සීමට (සල්ලෙඛං), තනිව සිටීම ඇගයීමට (පවිවෙකං) හෝ ආධ්‍යාත්මික සාවර්ධනයට උපකාර වීමට (අට්ඨිතම්, A.III,219) ඇතුළත් වේ. අඛණ්ඩ හුදෙකලා කාලපරිච්ඡේදයක් සහ ඉඳහිට යම් කාල පරිච්ඡේදයක් වුවද එය මානසිකව ප්‍රබෝධ කරන්නක් විය හැකිය යන්න නිශ්චිතවම සත්‍යයකි. එයින් කෙනෙකුට ස්වාධීනත්වය උගන්වයි, මනස සංසිඳුවයි, නිශ්ශබ්දතාව කෙරෙහි ඇගයීම වැඩි කරයි, තමන් කෙරෙහි යහපත් බලා සොයා ගැනීමක් ඇති කර ගැනීමට අවස්ථාව සලසයි. බුදුපියාණන් වහන්සේ පැවසූ පරිදි 'මහණෙනි, ඔබ හුදෙකලාවට යොමු වන්න. එසේ කරන්නා දේවල් ඒ ආකාරයෙන්ම දකියි' (S.III15).

කෙසේ වෙතත්, නිවැරදි හේතූන් සඳහා කෙනෙකු දීර්ඝ කාලයකට හුදෙකලාවීමට උත්සාහ කළත්, එම පුද්ගලයා තමන් ප්‍රවේශමින් සහ බුද්ධිමත්ව අධීක්ෂණය කළ යුතුයි. තනිව සිටීමෙන් ඇතිවන ප්‍රීති ප්‍රමෝදය (පවිවෙකසුඛ, A.IV,341) කෙනෙකුගේ යුතුකම් පැහැර හැරීමකට, සියුම් ලෙස පිරිහීමට ලක්විය හැකිය. ඒ ලෙසම, කෙනෙකු පමණ ඉක්මවා කළ හැකිය, කෙනෙකු සීමාව ඉක්මවා යා හැකිය. මනස අධික ලෙස වෙහෙසීමෙන් අවසන් විය හැකිය. ඒ නිසා බුදුපියාණන් වහන්සේ අවවාද කළහ 'හුදෙකලාවට යන තැනැත්තා එක්කෝ පහළට ගිලා

බසිනු ඇත, නැත්නම් ඉහළටම නැඟී සිටිනු ඇත' (A.V,202).

**ආත්මය**
බලන්න **ස්වයං**

**සම්මා වාචා**

සම්මා වාචා (සම්මා වාචා) යනු බුදුපියාණන් වහන්සේගේ ආර්යඅෂ්ටාංගික මාර්ගයේ තුන්වන පියවරයි. කථාව යනු වචන සකස් කර ප්‍රකාශ කිරීමට ඇති හැකියාවයි. මෙම හැකියාව අනන්‍යසාධාරණ වන්නේ මිනිසුන්ට පමණය. යහපත සහ අයහපත යන දෙකටම එහි ඇති බලය නිසා, සත්‍යය කථා කිරීම සඳහා බුදුපියාණන් වහන්සේ මහත් වූ අවධාණයක් ඒ සඳහා යොමු කළහ. තමන් වහන්සේගේම වචනත් සැමවිටම සත්‍යවාදී වූ (භූත), ප්‍රයෝජනවත් (අත්ථසංහිතං), නිවැරදි වේලාවේ (කාලෙන) කථා කළ සහ කරුණාව සහ අනුකම්පාවෙන් පෙළඹවුණු (අනුකම්පප, M.I,395) අතර, එය නිවැරදි කථාව පිළිබඳ හොඳ අර්ථ දැක්වීමක් විය හැකි බව උන්වහන්සේ පැවසූහ. මෘදු බවින් (සණ්හවච, Ja.IV,110; M.I,126) සහ කරුණාවෙන් (සක්හිල, Ja.IV,110) කථා කිරීම උන්වහන්සේ ඇගයූහ.

වාචිකව කරන සන්නිවේදන සූක්ෂම ලෙස භාවිතය පිළිබඳව බුදුපියාණන් වහන්සේ විසින් කරන ලද වඩාත් දීර්ඝ විස්තරයක මෙසේ සඳහන් වේ 'බොරු කීමෙන් වැළකීමෙන් කෙනෙකු සත්‍යය කථා කරන්නෙකු බවට පත් වේ, එම පුද්ගලයාගේ වචන පිළිගත හැකිය, විශ්වාස කටයුතු වේ, විශ්වාසය

තැබිය හැකිය, එම පුද්ගලයා ලෝකය නොරවටයි. ද්වේෂ සහගත වචනවලින් වැළකීම සඳහා කෙනෙකු එතැන අනෙක් අයට හානිවන දේ ඇසූ දෙය මෙතැන නැවත නොකියයි. මතභේද ඇති වූ අය අතරට කෙනෙකු සමගි කරවන්නෙකු විය යුතුයි. එම පුද්ගලයා දැනටමත් එකමුතුව ඉන්නා අය දිරිමත් කිරීම, සාමය දැක ප්‍රීතිවීම, සාමයට ආදරය කිරීම, සාමය දැක දැඩි සතුටට පත්වීම, හා සාමයට පක්ෂව කථා කරන්නෙකු විය යුතුයි. රළු කථාවලින් වැළකී, කෙනෙකු නිර්දෝෂී, ප්‍රසන්න, කනට පහසු, එකඟවිය හැකි, හදවතට යන, විනීත, ප්‍රසන්න සහ සෑම කෙනෙකුම කැමති වචන කථා කරන්නෙකු විය යුතුයි. එම පුද්ගලයා නිෂ්ඵල කථාබහෙන් වැළකී, යම් කෙනෙකු සුදුසු වේලාවට, නිවැරදිව, අදාළ කරුණට, කථා කරන්නෙකු විය යුතුයි. ධර්මය සහ පුහුණුව පිළිබඳව, ඉතා අගේ කොට සැලකිය යුතු වචන, යෝග්‍ය, සාධාරණ, පැහැදිළිව අදහස් පළ කිරීම සහ අරමුණට සම්බන්ධව කථා කන්නෙකු විය යුතුයි' (D.I,4). බලන්න **පරුෂ වචනයෙන් බැණ වැදීම සහ වාචික පරිහව කිරීම සහ කථාකිරීම සහ සවන්දීම**

## ක්‍රීඩා

පුළුල්ම අර්ථයෙන් ක්‍රීඩා (කීළා හෝ ලීළා) යනු විනෝදය, සෞඛ්‍යය හෝ තරඟකාරීත්වය සඳහා වන කායික ප්‍රයත්නයකි. සියලු ජනතාව මෙන්ම, පැරණි ඉන්දියානුවන් ද විවිධාකාරයේ ක්‍රීඩාකර, විනෝද වූහ. ගෙවතු ක්‍රීඩාවලට හැංගි මුත්තන්, තලා දිවුම සහ තරඟ දිවීම, ඇතුළත් වූ අතර, ජල ක්‍රීඩාවලට පිහිනීම සහ කිමිදීම ඇතුළත් විය. අංගම්පොර, බොක්සිං, මල්ලව පොර ක්‍රීඩා, ව්‍යායාම සහ වෙනත් ක්‍රීඩා සහ

සෙල්ලම් සමහර විට ක්‍රීඩා මණ්ඩපවල සෙල්ලම් කරන ලදී (කීළාමණ්ඩල, Ja.VI,333). මෙම ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු අප සතුව නොමැති වුව ද, තවත් ක්‍රීඩා කිහිපයක් පන්දුවක් භාවිත කරමින් කරන ලදී. අප දන්නා එක් ක්‍රීඩාවක් නම්, පන්දුවකට නූලක් සවි කර, පන්දුව විසි කිරීමයි. එහිදී නූල පිටුපසට තල්ලු කිරීම, සහ අතේ ඇති පන්දුව අල්ලා ගැනීමට උත්සාහ කිරීමයි (Ja.V,196). භික්ෂූන් වහන්සේලා සහ භික්ෂුණීන් ක්‍රීඩා නැරඹිය යුතු නැති බව හැරෙන්නට බුදුපියාණන් වහන්සේට ක්‍රීඩාව ගැන කීමට කිසිවක් නොතිබුණි (D.I,7). එසේ වුව ද, ක්‍රීඩාවේ ඇති ශාරීරික සහ මානසික කරුණු බෞද්ධයන්ට අදාළ විය හැකිය.

බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ, 'යහපත් සෞඛ්‍යය ඉහළම ලාභයයි' (Dhp.204). උන්වහන්සේ භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට ශක්තිය සහ සෞඛ්‍යය ප්‍රවර්ධනය සඳහා ව්‍යායාම කිරීමට ධෛර්යමත් කළහ (Vin.II,119). මනස සම්බන්ධයෙන් ගත් කල, කණ්ඩායම් හැඟීම, මිත්‍රත්වය, පරීක්ෂාකාරී බව, සහ යම් තරමකට නොඇලීම ද (උදාහරණ වශයෙන් පරාජය නිහතමානී ලෙස පිළිගැනීම) වැනි ධනාත්මක ස්වභාවයන් දියුණු කිරීම සඳහා ක්‍රීඩාවලින් උපකාර විය හැකිය. කණගාටුවට කරුණක් නම්, අද වන විට සෑම ක්‍රීඩාවක්ම පාහේ අධික ලෙස තරඟකාරී වී ඇති අතර, තරඟකාරීත්වය තරම්ම මිනිසුන්ගේ නරකම දේවලින් ස්වල්පයක් ප්‍රකට වේ. වංචා කිරීම්, ප්‍රේක්ෂකයන් සහ ක්‍රීඩකයන් යන දෙපාර්ශ්වයේම ප්‍රචණ්ඩත්වය, පෞද්ගලික සතුරුකම්, මත්ද්‍රව්‍ය භාවිතය, තරඟයක ප්‍රතිඵල ආරම්භයේම තීරණය කිරීම්, සහ පරාජය වූ වීට කෝපයට පත්වීම යන මේ

සියල්ල වෘත්තිමය ක්‍රීඩාවල සම්මතයක් වී ඇත. සමහර හමුවීම් 'පෞද්ගලික විරෝධය මත තරඟ' ප්‍රවර්ධනය ද කෙරේ. 'එය ඔබ ජයග්‍රහණය කළා හෝ පරාජය වුවා ද යන්න නොව, ඔබ ක්‍රීඩාව කරණ ආකාරය' යන පැරණි තක්සේරුව බලාපොරොත්තු නොවන ආකාරයෙන් විශාල ආත්මාර්ථකාමී සහ විශාල වැටුප් හේතුකර ගෙන හිටිගමන් පැත්තකට තල්ලු කර ඇත.

නිපුණතාව අවශ්‍ය වන ක්‍රීඩාවකට හොඳම උදාහරණයක් වන්නේ ශරීරයට සෞඛ්‍ය සම්පන්න බව සහ මනසට සන්සුන්බවත්, ක්‍රීඩකයන් අතර මිත්‍රත්වය සහ අන්‍යෝන්‍ය ඇගයීම සඳහා උපකාර වීමත්, එය ප්‍රේක්ෂකයන්ට ප්‍රියජනක වීමත්ය. එය බුරුමයේ චින් ලොන් සහ තායිලන්තයේ ටක්රෝ ලෙස හැඳින් වේ. මෙම ක්‍රීඩාවෙන් බලාපොරොත්තු වන්නේ වේවැල් බෝලයක් විලුඹ, දණහිස, වැලමිට හෝ උරහිස්වලින් පමණක් තට්ටු කිරීමෙන් වාතයේ තබා ගැනීමයි.

මෙම ක්‍රීඩාවේ තරඟයක් නැත, එක් ක්‍රීඩකයෙකු පන්දුව ඔහුගේ නිපුණතාව සහ ඔහු ඉඩ දී ඇති කාල සීමාව ප්‍රදර්ශනය කරමින් ඊළඟ ක්‍රීඩකයාට යන්නට පෙර, ටික වේලාවක් පන්දුව තබාගනී. කිසිවෙකු දිනන්නේ හෝ පරාජය වන්නේ නැත. සමහර විට සංගීතයේ සහාය සමග චින් ලොන් - වේවැල් බෝලය යොදා ගෙන ක්‍රීඩා කෙරේ. බුදුපියාණන් වහන්සේ මෙසේ නිරීක්ෂණය කළහ: 'ජයග්‍රහණය කිරීම අමනාපය අවුස්සයි. පරාජය වූ අය දැඩි වේදනාවෙන් ජීවත් වේ. ජයග්‍රහණය සහ පරාජය අත්හැරීමෙන් කෙනෙකු සාමයෙන් සහ සතුටින්

සිටියි' (Dhp.201). බලන්න **ලේ ක්‍රීඩා සහ දඩයම් කිරීම**

## ප්‍රතිමා

ප්‍රතිමාවක් (පටිමා) යනු ලෝහ, ගල් හෝ වෙනත් ද්‍රව්‍යයකින් නිමවූ පුද්ගලයෙකු හෝ සතෙකුගේ රූපයකි. බුදුපිළිම සමහර විට සිතන පරිදි පිළිම නොව, නමුත් බුදුපියාණන් වහන්සේගේ නිරූපණය. ඒවායෙන් අදහස් කරන්නේ භාවනාව සඳහා හෝ අවධානය යොමු කිරීම සඳහා වස්තුවක් ලෙසය. පළමු බෞද්ධ පිළිම ක්‍රි. ව. 2වන ශතවර්ෂයේ දී ඉන්දියාවේ නිපදවන ලද්දේ ග්‍රීක ආභාෂයෙනි. ඊට පෙර, බුදුපියාණන් වහන්සේ නියෝජනය කරනු ලැබුවේ චක්‍රයක්, බෝධියක්, පාද සලකුණු යුගලයක් හෝ හිස් සිංහාසනයකි. ශතවර්ෂ කිහිපයක් පුරාම බුදුපියාණන් වහන්සේගේ පිළිම සෑදීම 'තහනම්' වූ බව සමහර විට කියැවේ. නමුත්, මෙය නිවැරදි නොවේ. බුදුපිළිම නොසෑදීමට හේතුව ප්‍රතිමූර්ති කුසලතා ප්‍රමාණවත් තරම් ඉහළ මට්ටමකට වර්ධනය වී නොතිබූ නිසාය. බුදුපිළිම සෑදීමට හෝ පිළිම භාවිතය බෞද්ධ නායකයන් 'තහනම්' කළ බවට සාක්ෂි නොමැත.

පැරණි කලාකරුවෝ බුද්ධ ප්‍රතිමා සෞන්දර්යාත්මකව ප්‍රියමනාප කිරීමට ඔවුන්ගේ උපරිම හැකියාවන් අනුව කටයුතු කළහ. පිළිම සාදන්නන් සඳහා වූ පැරණි අත්පොතක් වන වරාහිමිහිර සංහිතා වේ මෙසේ සඳහන් වේ. 'බුදුපියාණන් වහන්සේගේ පිළිමයට, සිත්කලු මුහුණක් සහ හැකිතාක් ලස්සනට අත් පා දෙන්න.

උන්වහන්සේගේ අත් පාවල රේඛා නෙළුම් මලක් මෙන් සාදන්න. උන්වහන්සේ වැඩ සිටින ඉරියව්ව නෙළුම් මලක් මත ඉන්නා ලෙස ඉදිරිපත් කරන්න. බ්‍රහ්මගේ මෙන් උන්වහන්සේට අළු පැහැ හිසකෙස් සමගින් සන්සුන් හැඟීම් ප්‍රකාශනයක් ලබා දෙන්න.' බුදුපියාණන් වහන්සේගේ පිළිමවලින් පෙන්නුම් කරන්නේ උන්වහන්සේ සිටගෙන සිටින, ඉඳගෙන හෝ සැතපී සිටින ඉරියව්වලින්ය. සැතපී සිටින ඉරියව්වේ පිළිම බොහෝ විට 'නිදාගෙන සිටින බුදුන්' යැයි වැරදි ලෙස හඳුන්වනු ලබයි. සැබැවින්ම එයින් නිරූපණය කරනු ලබන්නේ උන්වහන්සේගේ පරිනිර්වාණයේ වැඩ සිටින ඉරියව්වයි. බුදුපියාණන් වහන්සේගේ දෑත් සාමාන්‍යයෙන් අභිනය (මුද්‍රා) කිහිපයකින් දැක් වේ. වඩාත් සුලභ භාවනාව, නිර්භීතබව, ඉගැන්වීම සහ පොළොව ස්පර්ශ කරන අභිනයන්ය. පිළිමයේ හිස් මුදුන සාමාන්‍යයෙන් ගිනිදැල් ඇත, සමහර විට තාත්වික ලෙසින් නිරූපණය කර ඇති අතර, වෙනත් අවස්ථාවල දී බොහෝ සෙයින් ශෛලීගත කර ඇත. එයින් අදහස් කරන්නේ රැස් වළල්ලක් බවයි.

බුදුපියාණන් වහන්සේ පිළිබඳ මතකයට ගෞරව කිරීමට සහ පුද්ගලයෙකුගේ ක්ෂණික රූපශ්‍රීය මතක් කිරීමට, දැනුමේ ආලෝකය සහ ගුණධර්මවල සුවඳ යනාදිය සිහිපත් කිරීම සඳහා මල්, විදුලි පහන් සහ සුවඳ දුම් බෞද්ධයෝ බුදුපිළිම ඉදිරියේ තබති. බුදුපිළිම වටා, විශේෂයෙන්ම තායිලන්තයේ, බොහෝ ප්‍රසිද්ධ අද්භූත විශ්වාස තිබුණත්, දැනුම්වත් බෞද්ධයෙක් ඒවා බුදුපියාණන් වහන්සේගේ ද්‍රව්‍යමය ස්වරූපයෙන් සංකේතවලට වඩා වැඩි යමක් නොවන බව විශ්වාස කරයි. බලන්න **රූප වන්දනාව**

## සහ ප්‍රීති ප්‍රමෝදය

*Image Problems: The Origin and Devolopment of the Buddha's Image in Early South Asia*, Robert D. DeCaroli, 2015.

## ස්තූප

ස්තූප පැමිණෙන්නේ 'ගොඩ ගැසීම' යන අර්ථය ඇති ස්තූප් යන සංස්කෘත වචනයෙන්ය. එය බෞද්ධ ස්මාරකයක ගතිස්වාභාවයක් ලෙස හැඳින් වේ. එය පාලි භාෂාවෙන් ථූප වේ. බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් සහ ආදාහනයෙන් පසු, උන්වහන්සේගේ භෂ්මාවශේෂ කොටස් අටකට බෙදා එකල තිබූ චාරිත්‍රය අනුව, විශාල අර්ධගෝලීය මැටි පස් කන්දක් යට රඳවනු ලැබුණි (D.II,141).

මිනිසුන් පස් කඳුවලට ඔවුන්ගේ ගෞරවය පුද කළ අතර, අවසානයේ බුදුපියාණන් වහන්සේගේම සංකේත ලෙස පෙනෙන්නට තිබුණි. කාලයත් සමග සරල පස් කඳු මේසන් නිර්මාණයන් බවට පරිණාමය වූ අතර, සමහර විට විශාල ප්‍රමාණයෙන් සහ අලංකාර ලෙස සරසනු ලැබුණි. ස්තූප බෞද්ධයන්ට පමණක් ආවේණික වූවක් නොවේ. ජෛනයෝ සහ ආජීවකයෝ ද ඒවා භාවිත කළහ. ජෛන ආගම ප්‍රතිසංස්කරණය කළ මහාවීර මිය ගිය පසු, ඔහුගේ මතක වස්තු ස්තූපයක (M.II244) තැන්පත් කර ඇත. මතුරාහි පුරාවිද්‍යාව විසින් ආකර්ෂණීය ජෛන ස්තූපයන් කිහිපයක් සොයාගෙන ඇත.

වර්තමානයේ, ස්තූපවල සාමාන්‍යයෙන් ඇත්තේ සැබෑ හෝ බුදුපියාණන් වහන්සේගේ යැයි කියනු ලබන ධාතූන් හෝ යම් උසස් සුපේෂල පුද්ගලයෙකුගේ ඒවා හෝ උන්වහන්සේලා විසින්

භාවිත කරන ලද සුවිශේෂ ද්‍රව්‍යයි. ඒවා සියලු බෞද්ධ රටවල භක්තියට පාත්‍රවන පොදු වස්තූන් වේ. ලොව එවැනි විශාලතම ස්මාරකය වන්නේ 4වන ශතවර්ෂයේ අගභාගයේදී ශ්‍රී ලංකාවේ පැරණි අගනුවර වූ අනුරාධපුරයේදී මහාසේන රජු විසින් ඉදිකරවන ලද ජේතවන ස්තූපයයි. මෙම දැවැන්ත ස්මාරකය පළමුව මීටර් 160ක් උසවූ අතර විෂ්කම්භය මීටර් 109කි. ජේතවන ස්තූපයේ ගඩොල් මිලියන 620ක් අඩංගු වන අතර, බර ටොන් 657,000කි. වර්ග මීටර් 173ක විශාල ගල් අතුරන ලද හෙල්මළුවක එය පිහිටා ඇති අතර, විශේෂ අවස්ථාවන්හිදී බැතිමතුන් 30,000කට පමණ රැඳී සිටිය හැකිය. බලන්න **දොණ**

*The Stūpa, Its Religious, Historical and Architectural Significance*, ed. by A. L. Dallapiccols,1980.

## සුභද්ද

බුදුපියාණන් වහන්සේ විසින් අවසාන වශයෙන්, වඩා යහපත් බවට පත් කරන ලද පුද්ගලයා සුභද්දයි. වරක් බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ, 'ඔබලාට මා ගිලන් මැස්සක රැගෙන යාමට සිදු වුවත් (ලෙඩරෝග හෝ මහලුවිය නිසා) මගේ ප්‍රඥාවේ පැහැදිලිකම පිළිබඳ කිසිදු වෙනසක් නොවේ. යමෙක් මා ගැන නිවැරදිව කථා කරන්නේ නම්, බොහෝ අයගේ යහපත පිණිස, ලෝකය කෙරෙහි මහාකරුණාවෙන්, දෙවිවරුන්ගේ සහ මිනිසුන්ගේ යහපත සහ සතුට වෙනුවෙන් මෝහයට නොබැඳුණු පුද්ගලයෙකු ලෝකයට පහළ වී ඇති බව ඔවුන්ට කිව හැකිය' (M.I,83).

මේ අර්ථයෙන් ගත් කල බුදුපියාණන් වහන්සේ

උන්වහන්සේගේ වචනයට සත්‍යය විය. උන්වහන්සේ පරිනිර්වාණයට පත් වීමට පැය ස්වල්පයකට පෙර, උන්වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රාවකයන් වටකරගෙන සිටියදී ඔබමොබ යන තවුසෙකු වූ සුභද්ද ප්‍රශ්න කිහිපයක් ඇසීමට කැමති පිරිස අතරට ගියේය. ආනන්ද හිමියෝ සුභද්ද වැළැක්වූහ. 'ඇති සුභද්ද, තථාගතයන් වහන්සේට බාධා නොකරන්න. උන්වහන්සේ බොහෝ වෙහෙසට පත් වී සිටිති.' බුදුපියාණන් වහන්සේට මෙය ඇසුණි. එම තවුසාට එන්නට ඉඩ දෙන ලෙස ආනන්ද හිමියන්ට පැවසූහ. 'ඔහු අසන්නේ කුමක් වුවත්, ඒ නිර්වාණය පිණිසයි' උන්වහන්සේ කීහ. සුභද්ද බුදුපියාණන් වහන්සේ ඉදිරියේ ඉඳගෙන සුළු වේලාවක් කථා කළේය. බුදුපියාණන් පැවසූ දේ සුභද්ද හදවතට ගත් අතර පසුව රහත්ඵලය ලැබුවේය (D.II,149). බුදුපියාණන් වහන්සේගේ මහාකරුණාව එවැනිය, උන්වහන්සේ අවසාන හුස්ම දක්වාම ධර්මය ඉගැන් වූ සේක.

බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණය පිළිබඳ පැරණි නිරූපණයන්හි බොහෝ විට ඇතුළත් වන්නේ භාවනාවේ යෙදෙන භික්ෂූවකගේ රූපයක් වන අතර, එහි පැත්තක යම් වටකුරු වස්තුවකට ආධාරක වන ත්‍රිපාදයක් මෙන් පෙනේ. බුදුපියාණන් වහන්සේගේ කාලයේ එක් නිකායක් හැඳින්වූයේ තෙදණ්ඩික, ත්‍රිපාදයේ අයයි A.III,276). ත්‍රිපාදයක් (තිදණ්ඩ, Ja.III,276) ඇති තවුසෙකු සිටි බව ජාතකයේ සඳහන් වේ. මෙම නිකාය පිළිබඳව සමහර මුල් බෞද්ධ නොවන කෘතිවල ද සඳහන් වේ. මෙම තවුසන් තිදෙනා කොටස් තුණක යෂ්ටි ඔවුන්ගේ උරහිසට උඩින් රඳවා ගත් බව පෙනෙන්නට තිබූ අතර, එය ඔවුන්ගේ පාත්‍රය මත, ජල බඳුන හෝ ජල පෙරණය

එල්ලන ලදී. විවේක ගන්නා විට, ඔවුන් යෂ්ටි ත්‍රිපාදයට රැස් කර එය ඔවුන්ගේ උපාංග සඳහා ආධරකයක් ලෙස භාවිත කළහ. ත්‍රිපිටකයේ කිසිම තැනක සුභද්ද තෙදණ්ඩිකයෙකු ලෙස හඳුනාගෙන නැත. නමුත් ඔහු සිටි බවට මුල් වාචික සම්ප්‍රදායක් තිබිය හැකිය. ඒ අනුව, බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණය නිරූපණය කරන දර්ශනවල ත්‍රිපාදය අසල භාවනා කරන භික්ෂුවගේ නිරූපණය බොහෝ විට සුභද්ද විය යුතුයි.

## හදිසි හෝ ක්‍රමික

බුදුපියාණන් වහන්සේ උගන්වන අවස්ථාවල, උන්වහන්සේ බොහෝ විට 'ක්‍රමානුකූල කථාවක්', (ආනුපුබ්බිකථා, D.I,110) යනුවෙන් හැඳින් වූ සවන් දෙන්නාගේ අවබෝධ කර ගැනීමේ මට්ටමට අනුව එක් වරකදී හෝ අධ්‍යයන වාර සමූහයක් ලබා දුන්හ. මූලික කරුණුවලින් පටන් ගෙන, උන්වහන්සේ පරිත්‍යාගශීලීත්වය, ගුණ යහපත්කම, දිව්‍යලෝකය, ඉන්ද්‍රිය තෘප්තිමත් කිරීමෙන් ඇති වන උපද්‍රව සහ ඒවායෙන් ඉවත්වීමෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳව කථා කළහ. සවන්දෙන්නාගේ මනස 'ඉක්මනට ග්‍රහණය කරගත හැකි, අවහිර නොවන, ප්‍රමුදිත සහ නිරවුල්' බව උන්වහන්සේට අවබෝධ වුවහොත්, ඊට පසු උන්වහන්සේ තථාගතයන් වහන්සේට අනන්‍යසාධාරණ වූ ධර්මය වන චතුරාර්ය සත්‍යය පැහැදිලි කරති (D.I,110). බුදුපියාණන් වහන්සේගේ ක්‍රමානුකූලව කථා කිරීමේ පුරුද්දෙන් පෙන්නුම් කරන්නේ මූලික ඉගැන්වීම් සමගින්, ද්විතීයික අරමුණු කරා යොමු වන අතර, ඊට පසු ප්‍රධාන අරමුණ වූ නිර්වාණයට සම්බන්ධ වඩාත් ගැඹුරු ධර්මයන්ට

පිළිවෙළට යාමට ධර්මය තුළ අනුපිළිවෙළක් තිබෙන බවයි. ධර්මය පිළිගැනීමට යම් මට්ටමක විශ්වාසයක්, විවෘතභාවයක් සහ තෘප්තියක් අවශ්‍ය බව ද එයින් අඟවයි.

බෞද්ධ දර්ශනවාදයේ විවිධ කාලවල දී, නිර්වාණය හදිසියේ හෝ ක්‍රමයෙන් (දන්ධාභිඤ්ඤ, ඛිප්පාභිඤ්ඤ, Vism.85) ලබන්නේ ද යන්න පිළිබඳව විවාද ඇති වී තිබේ. නිර්වාණය ඇතිවන මොහොත ක්ෂණිකය. නමුත්, එම පියවරට එළඹීමේ ක්‍රියාවලිය ක්‍රමික විය හැකිය. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'ටිකෙන් ටික, කලින් කල, බුද්ධිමත් පුද්ගලයා තමන්ගේ ක්ලේශ ඉවත් කළ යුත්තේ ලෝහ වැඩ කරන්නා රිදීවලින් යබොර ඉවත් කරන ආකාරයටය' (Dhp.239). තවත් අවස්ථාවක දී උන්වහන්සේ මෙසේ පැවසූහ: 'සාගරය ක්‍රමයෙන් බෑවුම්වන ආකාරයට, කිසිම හදිසි භයානක අවස්ථාවක් නොමැතිව, ක්‍රමයෙන් නැඹුරු වන ආකාරයටම, මෙම ධර්මය සහ පුහුණුව ක්‍රමානුකූලව සිදු කරන, ක්‍රමාණුකූල පුහුණුවකි, ක්‍රමානුකූලව ක්‍රියාවට නඟන දෙයකි. දැනුම හදිසියේ සිතට ඇතුළුවීමක් නැත' (Ud.54).

## සුද්ධෝදන

'පිරිසිදු බත' යන අරුත ඇති සුද්ධෝදන යන්න සිද්ධත්ථ ගෞතමයාණන් වහන්සේගේ පියාගේ නමයි. සම්ප්‍රදායෙන් කියැවෙන්නේ ඔහු ශාක්‍යයන්ගේ රජ බව වුවත්, මෙය විශේෂයෙන් ත්‍රිපිටකයේ සඳහන් වී නැත. එහි සඳහන් එකම ශාක්‍ය පාලකයා වූයේ භද්දිය පමණි. ඔහු පිළිබඳව විස්තර කර ඇත්තේ

සක්‍යරාජා යනුවෙනි. භද්දිය ඔහුගේ මිතුරන් අතරට භික්ෂුවක් වී එකතු වෙන බව හැඟවූ විට, ඔහු කීවේ,: 'මා රාජ්‍යය මගේ පුත්‍රයන් සහ සහෝදරයන්ට භාර දෙන තුරු ඉන්න' යන්නයි (Vin.II,182). ශාක්‍යයන්ට 'රජුන් තනන්නන්' (රාජකත්තාරෝ, D.II,233) යනුවෙන් මිනිස් කණ්ඩායමක් සිටි බව අපි දන්නෙමු. එම නිසා, මෙම කණ්ඩායම සුද්ධොදන ඔවුන්ගේ ප්‍රධානියා වශයෙන් යම් කාලයකට හෝ ඔහුට ඔවුන්ගේ විශ්වාසය තිබෙන තුරා පත් කර ගත්තා විය යුතුයි. ඍග්වේදය සහ අථර්ව වේද පාලකයන් තෝරා ගත්හ. නමුත්, ක්‍රි. පූ. 5වන ශතවර්ෂයේ දී මෙම පුරුද්ද පාරම්පරික රාජාණ්ඩු ක්‍රමයට මඟ පෑදීය.

සුද්ධෝදනට භාර්යාවෝ දෙදෙනෙක් සිටියහ. බුදුපියාණන් වහන්සේගේ මව වූ සහ උන්වහන්සේගේ උත්පත්තියෙන් නොබෝ දිනකින් මිය ගිය මහා මායා සහ ඇයගේ සහෝදරිය වූ සහ බුදුපියාණන් වහන්සේගේ සුළු මව වූ මහා පජාපතී ගෝතමී යන දෙදෙනාය. සුද්ධෝදනට තම පුත්‍රයාගේ අභිනිෂ්ක්‍රමණය කිරීමට තිබූ කැමැත්ත ඉතා තීරණාත්මක එකක් විය. නමුත් අවසානයේ උන්වහන්සේට උපකාර කළේය, ශ්‍රාවකයෙකු බවට ද පත් විය.

## දුක්විඳීම

දුක්ඛ යන පාලි වචනය සාමාන්‍යයෙන් පරිවර්තනය වන්නේ 'දුක්විඳීම' වශයෙනි. එය චතුරාර්ය සත්‍යයේ පළමුවැන්නයි. බුදුපියාණන් වහන්සේ එය මෙසේ විස්තර කළහ 'උපත, මහළුවිය සහ මිය යෑම යන මේ සියල්ල දුක්ඛ නම් වේ. කැමති අයගෙන්

වෙන්වීම, අකැමැති අය සමග එක්වීම දුක්ඛ වේ' (Vin.I,9). දුක්ඛ යනු හුදෙක් කායික දුක් විඳීමට වැඩි දෙයකි; එය සාමාන්‍ය අසම්පූර්ණබව, අතෘප්තිමත්බව, ප්‍රමාණවත් නොවනබව සහ පැවැත්මේ භයානක ස්වභාවයයි. එක් උදාහරණයක් දෙනවා නම්, අතීතයේදී ළදරු මරණ සංඛ්‍යාව ඉතා ඉහළ විය. මෙම ප්‍රශ්නය යහපත් පෝෂණය සහ සෞඛ්‍ය සත්කාරවලින් විසඳන ලදී. දැන් මිනිසුන්ගේ සුභසිද්ධිය ජනගහනය වේගයෙන් වැඩිවීම නිසා තර්ජනයට ලක් වී ඇත. උත්පත්තිය මරණයෙන් කෙළවරට පත් වේ, තෘප්තිය විඩාවට යොමු කරවයි. එක් ගැටලුවකට විසඳුම තුළ අලුත් ගැටලුවක බීජ අඩංගු වේ.

## සියදිවි නසා ගැනීම

සියදිවි නසා ගැනීම (අත්තවධ හෝ අත්තමාරණිය) තමා ඕනෑකමින් මැරීමට උත්සාහ කිරීමයි. සමහර විට, එය 'පිහිය ගැනීම' (සත්ථහාරති S.V,320), වශයෙන් ද විස්තර වේ. මිනිසුන් සියදිවි නසා ගන්නේ බලාපොරොත්තු සුන්වීම හෝ අපේක්ෂා නොමැතිව, දුක්විඳීමෙන් ගැලවීමට, නින්දාව හෝ අපවාද වළක්වා ගැනීමට හෝ සමහර විට දේශපාලනමය ප්‍රකාශයක් ලෙසය. තරුණ ස්වාමිපුරුෂයෙකු සහ බිරිඳ සියදිවි නසාගත් සිද්ධියක් ත්‍රිපිටකයේ සඳහන්ව ඇත්තේ කාන්තාවගේ දෙමව්පියන් ඔවුන්ගේ විවාහය බිඳ දැමීමට අධිෂ්ඨාන කරගෙන සිටි නිසා බවය (M.II,110). එසේම භික්ෂූන් කණ්ඩායමක් සියදිවි නසාගෙන ඇත්තේ ඔවුන් කෙරෙහිම ඇති වූ පිළිකුලක් හේතුකර ගෙනය (S.V,320). බුදුපියාණන් වහන්සේ සඳහන් කළේ

මිනිසුන් විසින් සමහර විට තමන්ටම පිහියෙන් ඇනීම, වස පානය කිරීම, ප්‍රපාතවලින් පැනීම හෝ ගෙලවැලලා මැරීම, තමා කෙරෙහි ඇති කෝපය සහ වියරුව නිසා සිදු කරන බවයි (A.IV,97-8). පැරණි ඉන්දියාවේ ද ආගමික සියදිවි නසා ගැනීම් ඇතැම් විට සිදු විය. ජෛන ආගමේ සල්ලෙඛනා නමින් හැඳින්වෙන මාරාන්තික උපවාස පුරුද්දක් තිබුණි.

බෞද්ධ සදාචාර ප්‍රතිපත්තිවලට අනුව, සියදිවි නසාගැනීම මිනීමැරුමට සමාන සෘණාත්මක ක්‍රියාවකි. මිනීමැරීම සිදුකරන්නේ විනාශ කිරීමේ චිත්තවේගවලින් සහ තවත් පුද්ගලයෙකු කෙරෙහි එල්ල කරන ලද අභිප්‍රායෙන් වන අතර, සියදිවි නසාගැනීමට එම අභිප්‍රාය එල්ලවන්නේ තමා කෙරෙහිය. සැබැවින්ම ඔවුන් කරන්නට යන දේ වැරදි යැයි සියදිවි නසා ගැනීමට සිතන්නන්ට අවශ්‍ය නැත. ඔවුන්ට චිත්තවේගී සහයෝගය සහ උපදෙස් අවශ්‍ය වේ. දරුණු ලෙස රෝගී වූ භික්ෂුවක් සියදිවි නසා ගැනීමක් පිළිබඳව කියූ විට, සාරිපුත්ත මහරහතන් වහන්සේ මෙම වචනවලින් ඔහුට උපදෙස් දුන්හ 'සියදිවි නසා නොගන්න ඡන්න. ජීවත්වන්න. ඔබ ජීවත්වීම මට අවශ්‍යයි. ඔබට සුදුසු ආහාර සහ බෙහෙත් නොමැති නම්, මම ඒවා ඔබට ලබා දෙන්නම්. ඔබට සුදුසු රැකවරණය නොමැති නම්, මම ඔබ රැකබලා ගන්නම්. ඔබගේ ජීවිතය නැති නොකරන්න. ජීවත් වන්න. මට ඔබ ජීවත් වීම අවශ්‍යයි' (M.III,264). යම් කෙනෙකු සියදිවි නසා ගැනීමට ධෛර්යමත් කිරීම හෝ එසේ කිරීමට උපකාර කිරීම භික්ෂුවක් හෝ භික්ෂුණියක් සඬ්ඝ වෙතින් නෙරපා හැරීමට තරම් වරදකි (Vin.III,71). සියදිවි හානි කිරීම භූතානයේ සම්පූර්ණයෙන්ම

වාගේ නුහුරු දෙයකි. ශ්‍රී ලංකාවේ වසර ගණනාවක් මුළුල්ලේ අසාමාන්‍ය ලෙස සියදිවි නසා ගැනීමේ ඉහළ අනුපාතයක් තිබී ඇත.
'Buddhism and Suicide.'Damien Keown, *Journal of Buddhist Ethics*, Vol.3,1996.

## සුජාතා

ජනප්‍රවාදයට අනුව, සිද්ධත්ථ ගෞතම උන්වහන්සේගේ අවසාන භාවනාව ආරම්භ කළේ බුද්ධ ගයාවේ බෝධි වෘක්ෂය පාමුළ සිටයි. සුජාතා නමැති තරුණියක් උන්වහන්සේට කිරිබත් භාජනයක් මී පැණි සමග පූජා කළාය. පාලි භාෂාවෙන් හඳුන්වන මෙම ආහාරය හඳුන්වන්නේ ඛීරොදන හෝ පායා යනුවෙනි. ඒවා සාදන්නේ හාල් සහ කිරි සන වනතුරු පිස ගැනීමෙනි. මෙම ආහාරය සිද්ධත්ථ හිමියන්ට උන්වහන්සේගේ සෙවීම අඛණ්ඩව කරගෙන ගොස් අවසානයේ බුද්ධත්වයට එළඹීමට ශක්තිය ලබා දුන්නේ යැයි කියනු ලැබේ. ආසියාවේ පන්සල්වල බිතුසිතුවම් පුරා සුජාතා ඇයගේ කිරි ආහාරය බුදුපියාණන් වහන්සේට පූජා කරන දර්ශන බහුල ලෙස දකින්නට ඇත. නමුත්, මෙම පුවත ත්‍රිපිටකයේ නැත. කෙසේ නමුත්, බුදුපියාණන් වහන්සේගේ පළමු කාන්තා ශ්‍රාවිකාව ලෙස සුජාතා යන නාමය සඳහන්ව ඇත (A.I,26).

## සූකරමද්දව
## බලන්න **බුදුපියාණන් වහන්සේගේ අවසාන ආහාරය සහ නිර්මාංශවීම**

## සුත්ත

සුත්ත යනු පාලි වචනයෙකි. එහි අදහස 'නූල' වන

අතර, එය බුදුපියාණන් වහන්සේගේ ධර්මදේශනාවලට ලබා දී ඇති නමයි. එයට සමාන සංස්කෘත නාමය සූත්‍ර වේ. ධර්මදේශනා මෙසේ හඳුන්වන්නේ ඒ සියල්ලේ ඇතුළත් වන්නේ 'තේරුම්වල නූලක්' නිසාය. එනම්, යම් ආකාරයකින්, එය නිර්වාණයට සම්බන්ධ සහ නිර්වාණයට මඟපෙන්වන්නක් වන නිසාය.

බුදුපියාණන් වහන්සේගේ දේශනා 5,700ක් සහ ස්වාධීනව ගාථා සහ වෙනත් බොහෝ කියමන් සහ පැවසූ දේ 10,000 පමණ ඇත. උන්වහන්සේගේ ඉගැන්වීම්වල ස්කන්ධය ඕනෑම ශ්‍රේෂ්ඨ ආගමික ගුරුවරුන්ගේ ඉගැන්වීම් අතරින් විශාලතම එක වේ. ධර්මදේශනා සාමාන්‍යයෙන් වර්ග තුනකි - ගාථා එකතුවක්, බුදුපියාණන් වහන්සේගේ දේශනාවක්, හෝ බුදුපියාණන් වහන්සේ සහ තවත් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් සමග සාකච්ඡාවක් වශයෙනි.

සූත්‍රයක් සාමාන්‍යයෙන් කොටස් තුනකින් යුක්තය 1. බුදුපියාණන් වහන්සේ ධර්ම දේශනාව සිදු කළ ස්ථානය සහ අවස්ථාව පිළිබඳ හැඳින්වීමක්, 2. දේශනාව හෝ සාකච්ඡාව, 3. නිමාව, සංවාදකයා බුදුපියාණන් වහන්සේට ස්තුති කිරීම හෝ උන්වහන්සේගේ ශ්‍රාවකයෙකු වීමට අවසර ඉල්ලා සිටීම, වශයෙනි. ත්‍රිපිටකයේ සඳහන් ස්වල්ප වූ ප්‍රමාණයක් ධර්මදේශනා උන්වහන්සේගේ ශ්‍රාවකයන් සිදු කළ ඒවාය.

## සුත්ත නිපාතය

බුදුදහමේ පූජනීය ග්‍රන්ථ වූ, ත්‍රිපිටකයේ පස්වන

කොටසේ සුත්ත නිපාතයේ ඛුද්දක නිකායේ ග්‍රන්ථයකි. සුත්ත නිපාතය යනු 'ධර්මදේශනාවල එකතුවක්' යන්නයි. මෙම ග්‍රන්ථයේ ධර්මදේශනා 55ක් සහ එකතුව වශයෙන් ගාථා 1149ක් ඇත. සුත්ත නිපාතයේ කිවි බසට ඉතා යෝග්‍ය සහ තදින් මතකයට එන ධර්මග්‍රන්ථවල කාව්‍යය ඇතුළත් වේ. ඒවායේ බොහොමයක ස්වාභාවික පරිසරයේ රූප සංඥා චිත්‍ර අඳියි. උදාහරණ වශයෙන් 'නයෙකු හැව අරින ආකාරයට' සහ 'රයිනොසරස් මෙන් තනිවන්නට' භික්ෂුවකට අත්හැරීම සඳහා බලකෙරෙයි.

ධර්ම ග්‍රන්ථවල අඩංගු කිවි බසට ඉතා උචිත සහ ප්‍රබෝධමත් කාව්‍ය සමහරක් සුත්ත නිපාතයේ ඇතුළත්ව ඇත. ඒවා බොහොමයක් ස්වභාව ධර්මයේ ප්‍රතිමූර්තිය නිරූපණය කරයි.
*The Group of Discourses*, trans. by K. R. Norman, 1992.

## සූත්‍ර පිටකය

බුදුදහමේ පූජනීය ධර්ම ග්‍රන්ථ වූ ත්‍රිපිටකයේ දෙවන කාණ්ඩය සූත්‍ර පිටකයයි. අනෙක් කොටස් වන්නේ විනය පිටකය සහ අභිධම්ම පිටකයයි. සූත්‍ර පිටකයේ බුදුපියාණන් වහන්සේගේ ධර්මදේශනා සහ උන්වහන්සේගේ සමහර ශ්‍රාවකයන්ගේ ධර්මදේශනා ඇතුළත් වේ. එය ග්‍රන්ථ හෙවත් නිකාය පහකින් යුක්තය. ඒ දීඝ නිකාය, දීර්ඝ දේශනා, මජ්ඣිම නිකාය, මධ්‍යම ප්‍රමාණයේ දේශනා, සංයුක්ත නිකාය, සම්බන්ධ ධර්මදේශනා, අංගුත්තර නිකාය, අංක යෙදූ ධර්මදේශනා සහ ඛුද්දක නිකාය, කුඩා ධර්මදේශනා වශයෙනි. මෙම ධර්මදේශනා භික්ෂූන් සහ භික්ෂුණීන්

සහ සමහර විට උපාසක උපාසිකාවන් ද කටපාඩම් කරගත් දේශනා වේ. එසේම බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර සිය ගණනාවක් වාචිකව පතුරුවා හැර ඇත. සූත්‍ර ලේඛන ගත කර ඇත්තේ ක්‍රි. පූ. පළමුවන ශතවර්ෂයේ දී ශ්‍රී ලංකාවේදී බව ඓතිහාසික ලේඛන සඳහන් කරයි. නමුත් ඒවා සමහර විට ඉන්දියාවේදී කලින් ලේඛනගත වී තිබෙන්නට ඉඩ ඇත. බලන්න **වාචික සම්ප්‍රේෂණය**

## පරුෂ වචනයෙන් බැණ වැදීම සහ වාචික පරිභවය

පරුෂ වචනයෙන් බැණ වැදීම (පරිභාසා හෝ සපති) යනු සාමාන්‍යයෙන් කෝපවූ විට, කෙරෙන සම්පූර්ණයෙන්ම අපහාසාත්මක කථාවයි. එවැනි කථා, 'අනෙක් අය කෙරෙහි රළු, පහර දෙන, අප්‍රසන්න සහ නින්දා සහගත සහ, කෝපය අවුස්සන සහ මනස අවුල් කරන බවත්' බුදුපියාණන් වහන්සේ විස්තර කළහ (A.V,265). පරුෂ වචනයෙන් බැණ වැදීම බුදුපියාණන් වහන්සේගේත් අද කාලයේ මෙන්ම සාමාන්‍ය දෙයක් වූ බවට බොහෝ සාක්ෂි තිබේ. යම් කෙනෙකු බූරුවෙකු, හරකෙකු හෝ ඔටුවෙකු යැයි හැඳින්වීම අපහාසයක් ලෙස සලකනු ලැබුණි (Vin.IV,12). ඒ හා සමානවම කෙනෙකුට 'කොටා' හෝ 'දිගා' යනුවෙන් හැඳින්වීම ද නොහික්මුණු කමක් ලෙස සලකනු ලැබුණි (Vin.IV,7). මිනිස්සු අනෙක් අයට මෙසේ චරිත ඝාතන කරති: 'ඔබ සහ ඔබේ මව මිය යා යුතුයි' (අතුමරි මතුමරි) හෝ 'වඳ කාන්තාවකගේ පුතා' (පුත්තමතය පුත්ත), සහ කාන්තාවකට ගණිකාවක් (බන්ධකී) යනුවෙන් හැඳින්වීම සැබැවින්ම ඉතා නරක ක්‍රියා

ලෙස තේරුම් ගත හැකිය (M.I,449; I,524; Vin.IV,24). තවත් සාප කිරීමක් වන්නේ 'මුවන්ගේ මලපහ' (මිගලන්දික (*migalandika*! Vin.III,68) යන්නයි. පුද්ගලයෙකුගේ වර්ණය හෝ සමාජ තත්ත්වය අවඥාවට ලක් කිරීමක් හෝ සැක කිරීමක් සිදු විය හැකිය. පැරන්නන්ට එසේ කිරීමට පසුතැවිල්ලක් නොවීය. විවිධ ශ්‍රාවකයන්, පූජකයන් සහ භික්ෂූන් අපහාස හුවමාරු කර ගැනීමේ ඉතා දක්ෂ වූහ. ඒ 'දිව නමැති ආයුධයෙන් එකිනෙකාට තුවාල කරමින්ය' (M.I,320).

'මුඬු කළ පහත් තවුසන්' හෝ 'නෑයන්ගේ පාද ලෙවකන්නන්' (බන්ධුපදාපච්චා, D.I,90) යනුවෙන් ද බ්‍රාහ්මණයෝ නිතර බෞද්ධ භික්ෂූන්ට නිග්‍රහ කළහ. 'අපේ නෑදෑයෝ' යනුවෙන් ඔවුන් අදහස් කළේ බ්‍රහ්ම පිළිබඳව වන අතර, අඩු කුලයේ අය නිර්මාණය වූයේ බ්‍රහ්මගේ පාදයෙන් යැයි කියනු ලබයි. වරක් භික්ෂූන් බවට පත් වූ සමහර බ්‍රාහ්මණයන් ඔවුන්ගේ සම බ්‍රාහ්මණයන් බුදුපියාණන් වහන්සේට පැවසුවේ 'අපට පරිභව කළහ. හිරිහැර කළහ. ඔවුන්ගේ නිතර සිදුවෙන පරිභවවල පිටාර ගැලීමේ කෙළවරක් නැත' යනුවෙනි (D.III,80). තවත් අවස්ථාවක, එක් බ්‍රාහ්මණයෙකු භික්ෂුණීන් හැඳින්වූයේ 'හිස මුඬු කළ ගණිකාවන්' (මුණ්ඩාබන්ධකිනියො, Vin.IV,265) ලෙසිනි. පරුෂ වචනයෙන් බැණවැදීම සහ වාචික පරිභවය සමග ඇති විය හැකි කායික අභිනයන් පිළිබඳ උදාහරණ කිහිපයක් පමණක් ත්‍රිපිටකයේ සඳහන් වේ. ඒ ද්වේෂයෙන් කඩා පැනීමයි (D.II,96). පෙනෙන ආකාරයට හිස වැනීම, දිව දිගු කිරීම සහ යමක් පැවසීමෙන් පසු දිව ඉහළ පහළ වැනීම යනාදිය නිග්‍රහය හෝ අවිශ්වාසය පළ කිරීමේ

ක්‍රමයකි (M.I,109).

පරුෂ වචනයෙන් බැණ වැදීම සහ වාචික පරිභවය රළු කථාවේ (ඵරුසාවාචා) වර්ගයක් වන අතර එය ආර්ය අෂ්ටාංගික මාර්ගයේ (D.I,4) තුන්වැන්න වූ සම්මා වාචාවට විරුද්ධ වේ. බුදුදහම පුහුණු කරන්නා 'නිදොස්, ප්‍රසන්න, කනට පහසු, එකඟවිය හැකි, හදවතට යන, විනීත, මිහිරි සහ හැම දෙනාම කැමැති වචන කථා කරන' බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (D.I,4).

## සංකේත

සංකේතයක් (ධජ හෝ නිමිත්ත) යනු වෙනත් දෙයක් නියෝජනය කිරීමට හෝ විස්තර කිරීමට භාවිත කරන දෙයක් හෝ රූපයකි. වෙනත් සියලු ආගම් මෙන්ම බුදුදහම ද සංකේත භාවිත කරයි. මේවායින් වඩාත් පොදු දේ බුදු පිළිමය, නෙළුම් මල, ස්තූප සහ ධර්ම චක්‍රයයි.
*Reading Buddhist Art*, Meher McArthur, 2004.

## මුදිතාව

මුදිතාව (මුදිතා) යනු අනෙක් අයගේ සතුටේ දී සතුටු වීමට ඇති හැකියාවයි. එමනිසා එය කුඩුකේඩු බව, ද්වේෂය සහ ඊර්ෂ්‍යාවේ විරුද්ධයයි. මෙම ආකර්ෂණීය මානසික තත්ත්වය බ්‍රහ්ම විහාර හතරෙන් එකකි. ආදරයේ විවිධ ප්‍රකාශයන්ය. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'කෙනෙකු තමන්ගේ ජයග්‍රහණයේදී සතුටු වෙයි ද, ප්‍රීති ප්‍රමෝදයට පත් වෙයි ද, ඒ ආකාරයෙන්ම අනෙක් අයගේ ජයග්‍රහණයේ දී සතුටු විය යුතුයි, ප්‍රීති

ප්‍රමෝදයට පත් විය යුතුයි' (S.II,198). ශෝකයට කරුණ නම්, වෙනත් මිනිසුන්ගේ සාර්ථකත්වයේදී සහ වාසනාවේ දී සාමාන්‍ය ප්‍රතිචාරය නම්, ඔවුන්ගේ හැකියාවන් ද්වේෂයෙන් හෝ ඊර්ෂ්‍යාවෙන් හෝ හෙළා දැකීමයි. ජීවිතයේ සියලු කරුණුවලදී පරමාදර්ශය සහ තරඟකාරීත්වය අවධාරණය කරන කරන විට 'ජයග්‍රහකයෙකු' ලෙස දරා සිටින සමාජවල මෙය විශේෂයෙන්ම සත්‍ය වේ. බුදුදහමේ සහයෝගීතාව සහ බෙදාහදා ගැනීම අගය කරන අතර සාර්ථක ව්‍යාපාරයක ප්‍රතිලාභවලට සෑම කෙනෙකුම සහභාගී වෙයි. එතැන ඊර්ෂ්‍යාව බොහෝ සෙයින් අඩුය. අනුන් කෙරෙහි 'යහපත සඳහා කැප වීම' (පුඤ්ඤ අනුමෝදනා) යන පැරණි බෞද්ධ චාරිත්‍රය සමහර විට මුදිතාව ධෛර්යමත් කරයි.

## අනුකම්පාව

අනුකම්පාව (අනුකම්පා හෝ සඞ්ග) යනු තවත් කෙනෙකුගේ හැඟීම්, ස්වභාවය හෝ තත්ත්වය හඳුනා ගැනීමට ඇති හැකියාවයි. අනුකම්පාව මෙන්ම, කරුණාව, අනෙක් අයගේ වේදනාව සහ පීඩාව කෙරෙහි සංවේදනාත්මකව සලකා බලයි. නමුත්, එපමණක් නොව, එය ඔවුන්ගේ දෘෂ්ටිකෝණය ද අවබෝධ කර ගනී. ඔවුන් කෙරෙහි ප්‍රිය වේ. ඔවුන් සමග පොදුවේ ගත් ලක්ෂණයන් සොයන්නට උවමනා වේ. ඒ අනුව, අපට කිව හැක්කේ අනුකම්පාව යනු හදවතේ ඇති ආදරය, කරුණාව, මුදිතාව, ඉවසීම සහ දරා සිටීමේ හැකියාව යන තත්ත්වයයි.

## සංකලනය

සංකලනය යනු එක් ආගමක මූලද්‍රව්‍යයන් වෙනත් ආගමක් සමග මිශ්‍ර කිරීමයි. බුදුදහමේ සැම විටම ඇති විශාල ශක්තීන්ගෙන් එකක් වන්නේ එහි යමක් දරාසිටීමේ ඇති හැකියාවයි. යම් ප්‍රදේශයකට පැමිණි විට, පවතින ආගම විනාශ කිරීම වෙනුවට, එය සාමාන්‍යයෙන් උත්සාහ කරන්නේ එය එකට එකතු කිරීමයි, සමහර කොටස් වෙනස් කරන්නටයි, වෙනත් ඒවා නැවත අර්ථ දැක්වීමටයි. මෙම 'දක්ෂ උපාය'යෙන් අදහස් වන්නේ බුදුදහම ව්‍යාප්ත වීම කලාතුරකින් අන්‍යෝන්‍ය විරෝධයට හෝ ගැටුමට හේතුවන බවයි. අවාසනාවට මෙන්, එයින් අදහස් වන්නේ ධර්මය ද සමහර විට, එකඟතාවයකට එළඹීමෙන් අවසාන වන බවයි.

බුරුමයේ නැට්ස්වරුන්, තායිලන්තයේ සහ ලාඕස්වල 'ඵී' වැඳීම, නේපාලයේ සහ ශ්‍රී ලංකාවේ කුල පිලිවෙත්, බෞද්ධ ලෝකය පුරා පැවතෙන මැජික්. ජ්‍යෝතිෂය, වශීකරණය සහ අනාවැකි කීම යනාදිය මෙයට උදාහරණ වේ. චීන ජාතිකයන් අතර ජනප්‍රිය බුදුදහම ටාවෝවාදයේ සහ ජනකාණ්ඩ ආගමේ අංගයන්ගෙන් සමන්විත වන අතර, ටිබෙටයේ වජ්‍රායන, හින්දු ආගමේ සමහර විශ්වාසයන් සහ භාවිතයන් සහ ටිබෙටයේ ආදීවාසි ආගම වන බොන් තුළට ඒකාබද්ධ කර ඇත. ජපානයේ බුදුදහම ෂින්ටෝගේ අංගයන් තුළට ඇතුළත් කර ඇත. එය ෂින්බුට්සු ෂූගෝ, හෙවත් 'දෙවිවරු සහ බුදුපියාණන් වහන්සේ එකට' යන නමින් හැඳින්වෙන නැඹුරුවකි.

## කථා කිරීම සහ සවන් දීම

කථා කිරීම (කථා) යනු වචන පැහැදිලිව උච්චාරණය කිරීම සහ සවන් දීම (නිසාමෙති හෝ සුස්සූසති) යනු කථා කරන වචනවලට අවධානය දීමයි. කථා කිරීම සහ සවන්දීමේ සංයෝජනය මානව සන්නිවේදනයේ නිතර සිදුවෙන ආකාරයයි. එම නිසා එය මානව සම්බන්ධතාවට ඉතා වැදගත් වේ. යම් කෙනෙකු සමග කථා කිරීම ප්‍රතික්ෂේප කිරීම, පුද්ගලයෙකු අනෙක් අය සමග කථා කරන විට පැහැදිලිව කථා නොකිරීම, හෝ ඒ අය යමක් පැහැදිලි කිරීමට උත්සාහ දරන විට ඔවුන්ට සවන් නොදීම, මිනිසුන් අතර අප්‍රමාණ ප්‍රශ්න ඇතිවීමට හේතුවයි. අප අනෙක් අයට කථා කරන්නේ නම් සහ ඔවුන් කථා කළ විට සවන් දෙන්නේ නම්, එවිට අපි අන්‍යෝන්‍ය අනුකම්පාව, අවබෝධය සහ ඉවසීමට හැකියාව ඇති කරන්නෙමු.

බුදුපියාණන් වහන්සේගේ සම්මා වාචා යන සංකල්පය ප්‍රධාන වශයෙන් අදාළ වන්නේ කථාවේ සදාචාරමය මානයන්ටය. නමුත්, අපගේ වචනවල ධනාත්මක සහ සාර්ථක සන්නිවේදන උපක්‍රමයක් බවට පත් කළ හැකි එම ගුණාංග සමග අප කථා කරන ආකාරය ගැන ද බුදුපියාණන් වහන්සේ සැලකිලිමත් වූහ. බුදුපියාණන් වහන්සේ නිතරම කථා කළේ 'මනස විවෘත කිරීම සඳහා කල්පනාකාරී

සහ ප්‍රයෝජනවත්' ආකාරයකටය' (කථා අභිසල්ලෙඛිකා චෙතොවිවරණසප්පායා, A.V,67). එසේම උන්වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රාවකයන්ට උපදෙස් දුන්නේ සෙමෙන් (නබයාධයති) හෝ පැකිලීමෙන් (අසන්දිට්ඨං) තොරව, මෘදු ස්වරයෙන් (සණ්හ) සහ 'විනීත, පැහැදිලි, නිදහසේ ගලායන, අර්ථවත්, පරිපූර්ණ සහ සාධාරණ භාෂාව' භාවිත කරන ලෙසයි (A.II,51; V,81). එවැනි ආකාරයෙන් කථා කිරීමෙන් සාමාන්‍ය සමාජීය අන්‍යෝන්‍ය ක්‍රියා වඩාත් ප්‍රසන්න සහ භේද රහිත වේ. එසේම එවැනි ආකාරයෙන් ධර්මය ඉගැන්වීමෙන් එය වඩාත් ආකර්ෂණීය සහ ඒත්තුගන්වන සුළු බවට පත් වේ.

කෙසේ නමුත්, සියලු වාග් චාතුර්යය ප්‍රායෝගික නොවේ. සමහර මිනිස්සු ඔවුන්ගේ අතිශයෝක්තියෙන් දක්වන කුසලතා දක්ෂ තර්ක සමග එකට ගලපා සෑම සංවාදයක්ම ඉස්මතු කිරීමට විශාල ශබ්දයක් නඟා, තමන්ගේ ඒවා හැර අනෙක් සියලු අදහස් මැඬ පවත්වති.

බුදුපියාණන් වහන්සේගේ කාලයේදී පැවති ආගමික විවාදවලදී සමහර කථිකයන්ට 'සත්‍ය කථාවක් බොරු කථාවකින් ප්‍රතික්ෂේප කිරීමට සහ පරාජය කිරීමට හැකි වන අතර, එමගින් ශ්‍රාවකයන් කලබලයට පත් වී' ''සැබැවින්ම මහා ප්‍රාඥයෙක්! සැබෑ ප්‍රාඥයෙක්! '' (A.V,230) යැයි කෑ ගසනු ඇත. සරල ලෙස, අවංකව සහ මෘදු ලෙස රිද්මයානුකූල හඬින් යමක් පැවසීම සමහර විට, විචක්ෂණශීලී කතා පැවැත්වීමට වඩා ඵලදායි විය හැකිය.

සමහර විට සාර්ථක වාචික සන්නිවේදනයට තිබෙන විශාලතම බාධාව වන්නේ ඕනෑවට වඩා කථා කිරීමයි. එනම්, 'ඉතා වාචාල සහ වෙහෙසකාරී ලෙස කථා කිරීම නිසා කිසිම කෙනෙකුට කථා කිරීමට අවස්ථාව නොසැලසීමයි' (Ja.I.418). මෙම අප්‍රසන්න පුරුද්දට මුල් බැස ගෙන ඇත්තේ ආත්මාර්ථකාමීත්වය, අනෙක් අය පිළිබඳව අවබෝධයක් නොමැති කම, හෝ තමන්ගේම අදහස්වලට පමණට වඩා ඇලීමයි. බුදුපියාණන් වහන්සේ සැමවිට අගය කළේ 'කථා කිරීමට පහසු' (සුවච, A.V,81) අයයි. කෙනෙකු වෙත සමීප වීමට අත්‍යවශ්‍ය, මිත්‍රශීලී සහ ඔහු හෝ ඇය ඔවුන් කෙරෙහි සහ ඔවුන්ට කියන්නට ඇති දේ පිළිබඳව උනන්දු බව අනෙක් අයට දැන්වීමට එම ගතිලක්ෂණය අවශ්‍ය වේ. අනෙක් අයට තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා, පවසන දේ සලකා බැලීමට හෝ ප්‍රශ්න ඇසීම සඳහා ඉඩ දෙන විරාම සමග කෙනෙකුගේ සංවාදයක් අතරින් පතර නතර කිරීම ද අවශ්‍ය වේ. සැම වේලේම හෝ ඕනෑවට වඩා වේලාවක් කථා කිරීම ආත්මාර්ථකාමී ස්වභාවයකි. කථා කිරීමට පහසු බවෙන් පෙන්නුම් කරන්නේ අනෙක් අය කෙරෙහි ඇති ගෞරවය, පරිත්‍යාගශීලීත්වය සහ ආචාරශීලී බවයි. සමහර විට, එය පුදුමයක් නොවේ. එම නිසා, කථා කිරීමට ඇති පහසුව ආදරය ප්‍රකාශ කිරීමක් බව බුදුපියාණන් වහන්සේ දුටුවහ (Sn.143).

නමුත්, සන්නිවේදනයක් ඇති වීමට, හුදෙක් අනෙක් අයට ඉඩ සැලැස්වීම ප්‍රමාණවත් නොවේ. ඒ අය කථා කරන විට අප ඔවුන්ට අවංකව සවන් දිය යුතුයි. සමහර විට, අනෙක් අය කථා කරන විට, අපි

සැබැවින්ම ඔවුන්ට සවන් නොදෙන නමුත්, නැති හැඟීමක් ඇති ලෙසට ආරූඪ කර ගනිමු. නමුත්, ඔවුන්ට බාධා කිරීමට අවස්ථාවක් බලමින් සිට, අපට අවශ්‍ය දේ කියමු. අවංකව සවන් දීමට, අප අපේ මුඛය වසා අපගේ මනස විවෘත කළ යුතුයි. එවිට එම පුද්ගලයාගේ වචන හුදෙක් ඇසෙනවා පමණක් නොව, ඒවා අවබෝධ වේ. හොඳ අසන්නෙකු වීමෙන් මිනිසුන් තේරුම් ගැනීමට උදව් වේ. එසේම එය අදහස් තේරුම් ගැනීමට ද උපකාර වේ. අධ්‍යාපනයේ දී සවන්දීම වැදගත් සාධකයක් වන බව බුදුපියාණන් වහන්සේ දැන සිටියහ. උන්වහන්සේ මෙසේ පැවසූහ: 'ධර්මයට සවන් දීමෙන් ඇති වන ප්‍රයෝජන පහකි. ඒ පහ මොනවාද? කෙනෙකු මීට පෙර නොඇසූ දේ අසයි. මීට පෙර ඇසූ දේ පැහැදිලි කර ගනියි, සැක දුරු කර ගනියි, කෙනෙකුගේ අදහස් නිවැරදි කර ගනියි, මනස ප්‍රීතියට පත් වෙයි' (A.III,248). ධර්මය ඉගැන්වීමට ප්‍රථමව, බුදුපියාණන් වහන්සේ බොහෝ විට තමන්වහන්සේගේ ශ්‍රාවකයන්ට මෙසේ පවසති: 'පරිස්සමෙන් සවන්දෙන්න, අවධානය යොමු කරන්න' (සුණාහි සාධුකං මනසිකරොහි, A.V,302).

**තථාගත**

'බුදුපියාණන් වහන්සේ', සිද්ධත්ථ ගෞතම' යන නිල නාමවලට වඩා, සමහර අවස්ථාවල උන්වහන්සේම හෝ වෙනත් අය උන්වහන්සේ හැඳින්වූයේ 'තථාගත' යන නාමයෙනි. තථාගත යන නිල නාමය තරමක් දුරට, සම්මතයට විරුද්ධ එකකි. එසේ නැතහොත්, 'එසේ පැමිණියහ' හෝ 'එසේ නික්ම ගියහ'

යනුවෙන් අදහස් කළ හැකිය. මෙම පදයේ මූලාශ්‍රය හෝ එය භාවිත වූයේ ඇයි ද යන්න පැහැදිලි නැත. බුදුපියාණන් වහන්සේ පැවසූ යෝගික ප්‍රකාශයන් ඉතා ස්වල්පය අතරින් එකක, තථාගත යනු 'ධර්ම සමුච්චයක්, බ්‍රහ්මා සමුච්චයක්, ධර්මය බවට පත්වීම, බ්‍රහ්මා බවට පත්වීම' (D.III,84) බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. බලන්න **බ්‍රහ්මා**

## බුදුපියාණන් වහන්සේගේ ගුරුවරු

බුදුපියාණන් වහන්සේගේ පළමු ගුරුවරයා වූයේ ආලාර කාලාමයි. ඔහුගේ 'ගැඹුරු මානසික පැහැදිලිතාවය' (උළාරං පසාදං , D.II,131) පිළිබඳව පුළුල් ලෙස ගෞරවයට පත්විය. හිස්බව පිළිබඳ විෂය යනුවෙන් හැඳින් වූ භාවනාමය ස්වභාවයක් කාලාම ඉගැන්වූයේය (M.I,164). භාවනාව පිළිබඳ බුදුපියාණන් වහන්සේගේ ඉක්මන්, පරිපූර්ණ දැනීම, මහත් සිතේ කාවැදුණු ඔහු උන්වහන්සේගේ සම ගුරුවරයා වීමට කැමැත්ත පළ කළේය. බුදුපියාණන් වහන්සේ එම යෝජනාව ප්‍රතික්ෂේප කළහ. උන්වහන්සේ පැවසුවේ තමන්වහන්සේ සංසාරයෙන් සම්පූර්ණ නිදහස ලැබීම හෙවත් සම්පූර්ණ මාර්ගඵලයට පත්වීමට අඩු කිසි දෙයකින් එකඟත්වයට පත් නොවන බවයි. බුදුපියාණන් වහන්සේ ආලාර කාලාම සමග සිටින විට. බුදුපියාණන් වහන්සේගේ මිත්‍ර ශ්‍රවකයෙකු වූ භරණ්ඩු කාලාම වසර ගණනාවකට පසු නැවතත් කපිලවත්ථුවේ වැඩ සිටින විට හමු විය (A.I,277). ආලාර කාලාමගේ තවත් ගිහි ශ්‍රාවකයෙකු වූ පුක්කුස දශක ගණනාවකට පසු උන්වහන්සේට හමු වූ අතර, ඔහු උන්වහන්සේගෙන් ත්‍රිවිධ රත්නයේ සරණ ලැබුවේය (D.II,130-4).

බුදුපියාණන් වහන්සේගේ දෙවන ගුරුවරයා වූයේ උද්දක රාමපුත්ත යි. රාමපුත්ත ගේ එක් ශ්‍රාවකයෙකු වූයේ මගධයේ රජුගේ ප්‍රාදේශීය ආණ්ඩුකාරවරයෙකු වූ එලෙයිය වන අතර, එම තත්ත්වය ඔහුගේ ගුරුවරයාට යම් කීර්තියක් ලබා දෙන්නට ඇත (A.II,180). බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ පළමු ගුරුවරයා සමග සිටින විට රාමපුත්තගේ භාවනා විධි වේදය ප්‍රගුණ කළ අතර, උන්වහන්සේට සම ගුරුවර තත්ත්වය පිරි නැමුණු නමුත්, එය ප්‍රතික්ෂේප කර එතැනින් පිටත්වූහ. බුදුපියාණන් වහන්සේ ආලාර කාලාමගේ ආධ්‍යාත්මික අත්පත්කර ගැනීම් තරම් රාමපුත්තගේ ආධ්‍යාත්මික අත්පත්කර ගැනීම් පිළිබඳව පැහැදුණේ නැති බව පෙනුණි. පසුව, රාමපුත්ත තමන් ඉහළම දැනුම අභිබවා ගොස් ඇති බවට සඳහන් කළත්, ඔහුගේ එම විනිශ්චය වැරදීමකි (S.IV,83).

ඊට පසු බුදුපියාණන් වහන්සේ විවිධ ආකාරයේ ස්වයං-අත්ථකිලමථය පුරුදු කරමින් වසර ගණනාවක් ගත කළහ. මේ කාලය තුළ දී උන්වහන්සේ වෙනත් පැවිදි ගුරුවරුන්ගෙන් ඉගෙන ගන්නට ඇත, හෝ අඩුම තරමින් ඔවුන් ඇසුරු කරන්නට ඇත. නමුත් උන්වහන්සේ කිසි විටක එවැනි අය පිළිබඳව සඳහන් කර නැත. උන්වහන්සේගේ පෙර ගුරුවරුන් දෙදෙනා කෙරහි තිබූ ගෞරවය සහ කළගුණ දැක්වීම කෙබඳුද කිවහොත්, බුද්ධත්වයට පත් වීමෙන් පසු උන්වහන්සේ ධර්මය ඉගැන්වීමට තෝරා ගත් පළමු පුද්ගලයන් එම ගුරුවරුන් දෙදෙනාය. අවාසනාවට, ඔවුන් දෙදෙනාම එම කාලයේම මිය ගොස් තිබුණි (M.I,169-70). බලන්න **ගුරුවරු සහ ශ්‍රාවකයන්**

## ගුරුවරු සහ ශ්‍රාවකයන්

ගුරුවරයෙකු (ආචාරිය හෝ ගරු, සංස්කෘතයෙන් ගුරු) යනු නිපුණත්වය හෝ දැනුම බෙදා දෙන පුද්ගලයා, සහ ශ්‍රාවකයෙකු (සාවක) යනු ගුරුවරයෙකුගෙන් ඉගෙන ගන්නා පුද්ගලයාය. සමහර ආගම්වලට අනුව, ශ්‍රාවකයන් තමන්ගේ ගුරුවරයාට සම්පූර්ණයෙන්ම කැපවිය යුතු අතර, විමසීමෙන් තොරව කීකරු විය යුතුයි. වජ්‍රයාන බුදුදහමට අනුව, තුන් සරණ යෑමට ප්‍රථමව ගුරුවරයා සරණ යා යුතු වේ. ගුරුවරයෙකුට කැපවීමේ ප්‍රතිඥාවක් (සමය) ඇති කර ගැනීමට නොබෙදුණු පක්ෂපාතීත්වය සහ විවේචනාත්මක නොවන කීකරුකම අවශ්‍ය වන අතර, සිතන පරිදි එය කඩකිරීමෙන් කල්ප ගණනක් නිරයේ නැවත ඉපදීම සිදුවෙයි. එවැනි අදහස් බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට ඉගැන් වූ සහ ඔවුන්ගෙන් බලාපොරොත්තු වූ දෙයට පටහැනි වේ. උන්වහන්සේ උපදෙස් දුන්නේ ගුරුවරයෙකු යටතේ ඉගෙන ගන්නා විට, සහ උපදෙස් ලබන විට පවා, ගෞරවණීය, නමුත්, විමසීමෙන් සහ විචක්ෂණයෙන් වෙන්කර ගත හැකි ආකල්පයක් පවත්වාගෙන යා යුතු බවයි. යමෙකු තමන් ආධ්‍යාත්මික දියුණුවක් ලැබූවෙකු ලෙස සැලකීමට සුදුසු යැයි හෝ වෙනත් අය තවත් කෙනෙකු එසේ යැයි පැවසීම නිසා එසේ උපකල්පනය කිරීම අවශ්‍ය නොවේ. කෙනෙකු ගුරුවරයා ඔහුගේ හැසිරීම උගන්වනු ලබන දෙයට අනුකූල දැයි සෝදිසියෙන් සිටීමෙන් සහ සවන්දීමෙන් ප්‍රවේසමින් සෝදිසි කර (විමංසෙයිය)

බැලිය යුතුයි. කාලයත් සමග, දිගින් දිගටම ප්‍රවේසමින් සෝදිසි කරමින්, ශ්‍රාවකයා ගුරුවරයා තුළ මතුපිටින් පෙනෙන යහපත් ගතිගුණ ස්වභාවයෙන්ම අභ්‍යන්තරයේ තිබේ ද නැතහොත්, ඒවා හුදෙක් උත්සාහ කිරීමෙන් හෝ බලපෑමක ප්‍රතිඵලයක් ද යන්න දැකීමට උත්සාහ කළ යුතුයි. ගුරුවරයෙකුගේ සැබෑ වටිනාකම අඟවන අනෙක් කරුණු නම්, ඔවුන්ගේ පුද්ගලික හැසිරීම ප්‍රසිද්ධ හැසිරීමට වඩා වෙනස් ද සහ ඔවුන් ප්‍රසිද්ධියෙන් සහ සාර්ථකත්වයෙන් බලපෑමට ලක් වී ඇත් ද යන්නයි (M.I,318-20). ගුරුවරයාගේ හැසිරීම ධර්මයට විරුද්ධ නම්, විශේෂයෙන්ම, ආචාර ධර්මවලට අදාළ කරුණු වල දී, ශිෂ්‍යයා එම ගුරුවරයා අතහැරිය යුතුයි.

සැබෑලෙස අවංක ගුරුවරයාට අවශ්‍ය වන්නේ තමන්ගේ ගුණ ධර්ම සහ දැනුමේ මට්ටමටම ශ්‍රාවකයා පත්වීමයි. එසේ නැතිනම්, එයත් අභිබවා යෑමයි. මෙය කළ හැක්කේ ප්‍රශ්න කිරීම සහ නිදහසේ අදහස් ප්‍රකාශ කිරීම ධෛර්යමත් කරන පරිසරයක් තුළ පමණි. ශ්‍රාවකයෙකු ගුරුවරයෙකුට ගෞරව කිරීම සහ ප්‍රණාමය දැක්වීම බුදුපියාණන් වහන්සේ අනුමත කළහ. උන්වහන්සේ මෙසේ පැවසූහ: 'ගුරුවරයෙකු ශිෂ්‍යයෙකුට සැලකිය යුත්තේ පුතෙකු ලෙසයි. ශිෂ්‍යයා ගුරුවරයාට සැලකිය යුත්තේ පියෙකු ලෙසයි. මෙම අන්‍යෝන්‍ය ගෞරවය සහ ගරු සැලකිල්ල සමග එක්වීමෙන් සහ එකිනෙකා සමග සහයෝගයෙන් ජීවත්වීමෙන්, දෙදෙනාම මෙම ධර්ම පුහුණුවේ වැඩිවීමක්, වර්ධනයක් සහ ප්‍රගතියක් අත්පත් කර ගනු ඇත' (Vin.IV,45). 'ශ්‍රාවකයා ගුරුවරයාට මෛත්‍රියෙන් සැලකීම සුදුසු වේ' (M.III,264).

කෙසේ නමුත්, ගුරුවරයා කෙරෙහි ඇති භක්තිය එහි පළමු පියවර බවත්, ආධ්‍යාත්මික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය එකක් බවත් පොදුවේ කරන ලද ප්‍රකාශය බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ. උන්වහන්සේගේ පරිනිර්වාණයට සුළු වේලාවකට පෙර උන්වහන්සේගේ ශ්‍රාවකයන් උන්වහන්සේ වටා එක්රැස් වූ විට, මෙම කාරණය පිළිබඳව වක්‍රාකාර ලෙස ආමන්ත්‍රණය කළහ 'ඔබට ඇති මඟපෙන්වීම නතර වූ බවක්, තවදුරටත් ගුරුවරයෙකු නොමැති බවත් සමහර විට ඔබලා සිතන්නට පුළුවනි. නමුත්, ඒ ආකාරයට නොසැලකිය යුතුයි. මා නික්ම ගිය පසු, ධර්මය සහ පුහුණුව ගුරු තනතුරේ තබා ගන්න.' (D.II,154) බලන්න **ගුරුබව**

## දේවවාදය

දේවවාදය (ඉස්සරකරණවාද) යනු විශ්වය නිර්මාණය කළ සහ පාලනය කරන, සියලු දෙනාට ආදරය කරන, සියලු බල ඇති සහ සියලු දේ දන්නා දෙවියන් කෙරෙහි ඇති විශ්වාසයයි (A.I,173). ඒ හතර ආකාර මිථ්‍යා අදහස්වලින් එකකි. ඒවා භෞතික වාදය (ලොකායතවාද), කර්මානුකූල නියතිවාදය (සබ්බං පුබ්බෙ කතහෙතු) සහ අක්‍රමික බව (අහෙතුවාද) යනුවෙනි. දේවාවදය පිළිබඳව බුදුදහමේ ප්‍රධාන විරුද්ධත්වය වන්නේ දෙවියන් වහන්සේගේ සිතනු ලබන ගතිලක්ෂණ එකිනෙකට පටහැනි නිසාය. දෙවියන් වහන්සේ (සමහර දෙවිවරු ස්ත්‍රී, අනෙක් අයට ස්ත්‍රී පුරුෂ භාවයක් නැත.) සැබැවින්ම සැම දෙයක්ම නිර්මාණය කළා

නම් සහ පාලනය කරන්නේ නම්, ලෝකයේ ඇති සියලු දුක්විඳීම්වලට ඔහු වගකිව යුතුයි. දෙවියන් වහන්සේ සැබැවින්ම සර්වඥ නම්, එයින් අදහස් වන්නේ මිනිසුන්ට නිදහසක් නැති බවයි. ඒ අනුව හරි වැරැද්ද පිළිබඳව විනිශ්චය කරුවා ලෙසත්, යහපත ප්‍රදානය කරන්නා සහ පාපයට දඬුවම් කරන්නා ලෙසත්, දෙවියන් වහන්සේගේ කාර්යය අනවශ්‍ය වේ. දෙවියන් වහන්සේට සැබැවින්ම සියලු බල ඇත්තේ නම්, භූමිකම්පා, ගංවතුර සහ සුනාමි වැනි සියලු ව්‍යසන නැවැත්විය හැකිවිය යුතුයි. නමුත්, එසේ නැත. ඒ නිසා ඔහුට සියලු දෙනාට ආදරය කළ නොහැකිය.

බෞද්ධ දෘෂ්ටි කෝණයෙන් බලන කල, මිනිස් ආධ්‍යාත්මික සවිඥානය පියවර හතරකින් - සජීව අජීව හැම දෙයෙහිම ආත්මයක් ඇතැයි යන ඇදහීම, බහුදේව වාදය, ඒකදේව වාදය සහ දේවාදී නොවන යනුවෙන් ක්‍රියාත්මක වන බව කියනු ලැබේ. ඇත්ත වශයෙන්ම සෑම තැනකම, එකම වේලාවක හෝ එක් නිශ්චිත සමාජයක සියලු දෙනා අතරම නොවේ. අති පුරාණයේ මිනිස්සු අජීවී වස්තූන් විවිධ බලයන් සමග යෙදවූහ. ඊට පසුව, ඔවුහු මෙම වස්තූන් දෙවියන් බවට මනුෂ්‍යත්වාරෝපණය කළහ. පසුව මේ සියලු දෙවියන් එක් දෙවියෙකු ලෙස සම්බන්ධ කළහ. එහි ඉහළතම සහ වඩාත් විචක්ෂණශීලී අවදියේදී, මිනිස් සිත තේරුම් ගන්නේ දේවල් සිදුවන්නේ සොබාදහමේ පිළිවෙළේ කොටසක් ලෙස මිස දෙවියෙකුගේ කැමැත්ත නිසා නොවන බවයි. මෙම අදියර හතර දළ වශයෙන් අනුරූප වන්නේ මිනිසුන් මුලින්ම ඔබමොබ යන කුඩා කණ්ඩායම් ලෙසත්, ඊට පසුව, ගෝත්‍ර වශයෙන් ද, අත්තනෝමතික රාජාණ්ඩු

විසින් පාලනය කරවූ කාලයේදී සහ අවසානයේ ප්‍රජාතන්ත්‍රවාදී සහ විද්‍යාත්මක චින්තනය බලවත් වූ කාලයේ දී බව සැලකිල්ලට ගැනීම සිත්ගන්නා කරුණකි. බලන්න **භෞතික සංසිද්ධිවලින් බැහැරව කිසිවක් නැතැයි ඇදහීම සහ බ්‍රහ්මා**
*Buddhism and the God-idea*,Nyanaponika, 1996.

## ථේරගාථා සහ ථේරීගාථා

බුදුදහමේ පූජනීය ධර්ම ග්‍රන්ථවන ත්‍රිපිටකයේ දෙවන කාණ්ඩයේ, සූත්‍ර පිටකයේ පස්වන කොටසේ ඛුද්දක නිකායේ ථේරගාථා සහ ථේරීගාථා යනුවෙන් ග්‍රන්ථ දෙකකි. ථේර යනු වසර දහයකට වඩා භික්ෂුත්වය දැරූ පුද්ගලයෙකුට පිරිනමන නිල නාමයකි. එහි අර්ථය 'වැඩිමහලු' යන බවයි. භික්ෂුණියකට සමාන නිල නාමය ථේරී යන්නයි. ගාථා යන වචනයේ අර්ථය 'කවියක්' යන්නයි. මෙම ග්‍රන්ථ දෙකේම ඇත්තේ බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් විසින් රචිත පැදිය. ථේරගාථාවල පැදි 263ක් ද ථේරීගාථාවල 73ක් ද ඇත. බොහෝ ඒවා සැලකිය යුතු තරම්, සාහිත්‍යමය වටිනාකම්වලින් යුක්තය. සමහරු නිවන් අවබෝධ කිරීමේ ප්‍රීතිය සමරති. අනෙක් සමහර අය වනයේ ඇති අසිරිය ද තවත් අය බුදුපියාණන් වහන්සේගේ මහාකරුණාව ද අගයති. ථේරීගාථාව කාන්තාවන් විසින් රචිත ඉන්දියාවේ මුල්කාලීන කවි ඇතුළත් සංග්‍රහකි.
*Elders Verses*, trans. by K.R. Norman, Vol. I, 1990; Vol. II, 1991.

## ථේරවාද

ථේරවාද යනු 'වැඩිමහල් භික්ෂූන්ගේ ඉගැන්වීම්' යන අර්ථයයි. එය ශ්‍රී ලංකාවේ, බුරුමයේ, තායිලන්තයේ,

ලාඕස්, කාම්බෝජියාවේ සහ දකුණු නැගෙනහිර ආසියාවේ වෙනත් රටවල සහ වඩාත් මෑත දී බටහිර පවා කුඩා කණ්ඩයම් දැන් පුහුණු කරන බෞද්ධ ගුරුකුලයක නමයි. ථේරවාද යන නම, එක් වරක් ත්‍රිපිටකයේ සඳහන් වේ. ඒ බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය ලැබීමට පෙර උගත් එක් ගුරුවරයෙකු වන ආලාර කාලාමගේ ඉගැන්වීම් සමග සම්බන්ධ කරමින් තිබූ විස්තරයකින්ය (M.I,164). බුදුපියාණන් වහන්සේ සමහර අවස්ථාවල තමන්වහන්සේ හැඳින්වූයේ හෝ හඳුන්වනු ලැබූයේ 'විශ්ලේෂණ ගුරුවරයෙකු' (විභජ්ජවාද) වශයෙනි. මෙය වෙනත් 'දෘෂ්ටිගත මත අවධාරණය කරන ගුරුවරුන්' (එකංසංවාද) සමග සසඳනු ලැබුණි. ඒ අනුව, බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ දෙයට වඩා උන්වහන්සේගේ ප්‍රවේශය සහ ඉගැන්වීම් ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් ගැන සඳහන් වේ. (A.V,190; M.II,197).

ථේරවාද බුදුදහම යනු ශ්‍රී ලංකාවේ පැරණි අගනුවර වූ අනුරාධපුරයේ ප්‍රධාන ආශ්‍රමය වූ මහාවිහාරයේදී පාලි ත්‍රිපිටකයේ විශේෂ අර්ථ නිරූපණයකට අනුව, සකස් කරනු ලැබුණි. අවසානයේ ක්‍රි. පූ. පස්වන ශතවර්ෂයේ දී බුද්ධඝෝෂ හිමියන් විසින් එය ක්‍රමවත් ලෙස සකස් කරනු ලැබුණි. ථේරවාද බුදුදහමේ වඩා මැදහත් සහ ආශ්‍රමස්ථ කේන්ද්‍රගත ප්‍රවේශයක් ඇතැයි සාමාන්‍යයෙන් සිතනු ලැබේ. බලන්න **බුදුපියාණන් වහන්සේගේ ගුරුවරු**

*Theravada Buddhism: A Social History from Ancient Benares to Modern Colombo*, Richard Gombrich, 1988.

## සම්මා සංකප්ප

සම්මා සංකප්ප (සම්මා සංකප්ප) යනු බුදුපියාණන් වහන්සේගේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දෙවන පියවරයි. සිතුවිලි යනු මනසේ සකස් වන වචන හෝ දර්ශනයි. ඒවා බොහෝ විට හැඟීම් සමග පවතී, නැතහොත් මතුවෙයි. එමගින් ක්‍රියා බවට පත්විය හැකිය. බුදුපියාණන් වහන්සේ සිතුවිලි වර්ග දෙකක් විස්තර කර ඇත - තාර්කික හෝ සෘජු සිතුවිලි (විතක්ක) සහ ඉබාගාතේ යන සිතුවිලි (විචාර) වශයෙනි. සාමාන්‍යයෙන් අපගේ මනස විසිරෙන, අහඹු, ඉබාගාතේ යන සිතුවිලිවලින් පිරී ඇති අතර, ඒවා මොනවාද හෝ ඊළඟට කුමක් වේද යන්න ගැන අපට ඇත්තේ අල්ප දැනුමකි. අපට යමක් කරන්නට තිබෙන විට හෝ විසඳීමට ප්‍රශ්නයක් ඇති විට, කැමැත්ත යම් දිශාවකට සිතුවිලි අල්ලා ගෙන යොමු කරයි. නමුත් සාමාන්‍යයෙන් කාර්යය අවසන් වූ වහාම හෝ ගැටලුව විසඳූ විගස, කැමැත්ත පහව යන අතර, සිතුවිලි නැවත වරක් සිතුවිලිවල දෝෂ සහගත බව නිදැල්ලේ යෑම ආරම්භ කරයි. බුදුපියාණන් වහන්සේ මෙම වැදගත්, නමුත් බොහෝ විට සැලකිල්ලට නොගෙන තිබූ නිරීක්ෂණය කළහ: 'යම් කෙනෙකු බොහෝ විට සිතන සහ මෙනෙහි කරන ඕනෑම දෙයකට, මනස ඒ ආකාරයටම නැඹුරු වේ' (M.I,115).

එක් විශේෂ සිතුවිල්ලක් පිළිබඳව අප වඩ වඩාත් සිතන විට, එය වඩ වඩාත් මතකයට එයි. අපට නිතර ලෝභ සිතුවිලි ඇතිවන්නේ නම්, සහ ඒවා දිගටම පවතින්නට අප ඉඩ හරින්නේ නම්, ඒවා අපගේ මනසේ බහුල වශයෙන් රැඳෙන්නට හේතු

වේ. එයින් අප වඩාත් ලෝභ සිතෙන ආකාරයෙන් ක්‍රියා කිරීමට ආරම්භ වේ. එම නිසා බෞද්ධ පුහුණුවේ වැදගත් කරුණක් නම්, සම්මා සංකප්ප වැඩි දියුණු කිරීමයි. අපගේ මනස තුළ ඍනාත්මක සිතුවිලි දිගටම පවතින්නට ඉඩ නොදීම සහ ධණාත්මක සිතුවිලි ධෛර්යමත් කිරීමයි. සම්මා සංකප්ප යනු අතහැරීම, ආදරය සහ උපකාර කරන බව යන්න බුදුපියාණන් වහන්සේ ඉතා පුළුල් ලෙස අර්ථ දැක්වූහ (M.III,251). සම්මා සමාධි, සම්මා සතිය සහ සම්මා වායාම සැබැවින්ම සම්මා සංකප්ප දියුණු කිරීමට උපකාර වන වැදගත් සාධකයකි.

**කාලය**

කාලය (කාල, සමය හෝ වේලා) යනු වෙනස් වීමේ ප්‍රපඤ්චයන් විසින් අල්ලා ගන්නා ලද කාල සීමාවේ හැඟීමයි. පැරණි ඉන්දියානුවන් කාලය මැණීම සහ බෙදීම සඳහා විවිධ ක්‍රම භාවිත කළ නමුත්, වඩාත් බහුල ලෙස භාවිත වූ ඒකක වූයේ ක්ෂණයක් (ඛණ), තත්පරයක් (තත්තක), මිනිත්තුවක් (ලව), පැයක් (හෝරා), දිවා සහ රාත්‍රී (අහොරත්ත), සතියක් (සත්තාහ), සති දෙකක් (අඩ්ඪමාස), මාසයක් (මාස), වසරක් (සංවච්ඡර) සහ ශතවර්ෂයක් (වස්සසසත), වශයෙන්ය. රාත්‍රිය බෙදා තිබුණේ පැය තුනකට (යාම, Dhp.157) සහ මාස දෙසති දෙකකට (Ja.I,159) වශයෙනි. මෙම ඒකක සමහරක කාලය වෙනස් විය, සමහර විට එක් ක්‍රමයකින් තවත් ක්‍රමයකට වෙනස් විය. දිනයක ආරම්භය සැලකිල්ලට ගත්තේ ඉර උදාවත් (සුරියුග්ගමන) සමගය.

බුදුපියාණන් වහන්සේගේ ප්‍රඥාව සහ පරිකල්පනය කෙතරම් ද යත්, උන්වහන්සේට අතිවිශාල කාල සීමාවන් පරිකල්පනය කළ හැකි විය. උන්වහන්සේ වරක් කියා සිටියේ ලෝකය බිහි වූයේ දින හයකින් නොව, මීට වසර දහස් ගණනකට පෙර යුදෙව්-ක්‍රිස්තියානි සම්ප්‍රදාය විශ්වාස කළ ආකාරයට නොව, කල්ප (කප්ප) ගණනාවක් පුරා බවය. කල්පයක් යනු කොපමණ කාලයක් ද කියා ඇසූ විට උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: 'සැතපුමක් දිග, සැතපුමක් පළල, සැතපුමක් උස පාෂාණ කන්දක්, කිසිදු ඉරිතැලීම් හෝ විවරයන් නොමැති එක් ඝන ස්කන්ධයක් ගැන සිතන්න. ඊට පසු, සෑම වසර සියයකට වරක් මිනිසෙකු සිල්ක් රෙද්දකින් එම කන්දට පහර දෙනු ඇතැයි සිතන්න. ඒ මහා පාෂාණ කන්ද කල්පය ගෙවී යාමට පෙර, ගෙවී යන්නට ඉඩ ඇත' (S.II,182). මෙම උපමාව සැබැවින්ම නිශ්චිත මිනුමක් නොවේ. නමුත්, සිතාගත නොහැකි තරම් කාලයක් පිළිබඳව හැඟීමක් ලබා දීම පමණකි.

ශතවර්ෂ ගණනාවක් බෞද්ධ අභිධම්ම පිළිබඳ දාර්ශනිකයන් විසින් කාලය සම්බන්ධයෙන් න්‍යායයන් කිහිපයක් වර්ධනය කරන ලදී. ඒවායෙන් සමහරක් සැලකිය යුතු තරම් සංකීර්ණ වේ. කෙසේ වෙතත්, බුද්ධිමය වශයෙන් උනන්දුවක් ඇති නමුත්, මෙම න්‍යායන්වලින් ස්වල්පයක කිසිදු ප්‍රායෝගික භාවිතයක් නොමැත. කාලය පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ සංකල්පය වූයේ හුදෙක් සාමාන්‍ය දැනුමක් සහ ප්‍රායෝගික එකක්ය. උන්වහන්සේ කාල දෙකක් පිළිබඳව කථා කළහ. කාලක්‍රමානුගත කාලය සහ නිරීක්ෂණ කාලයයි.

කාලානුක්‍රමික කාලය දැනගත හැකිය, සහ වස්තුවක නියාමන ප්‍රගමනයෙන් මැනිය හැකිය. පැරණි ඉන්දියාවේ මෙය සිදු කරන ලද්දේ සූර්යයා පිහිටි ස්වභාවය (M.I,393) දකිමින්ය. නැතිනම් සූර්යයාගේ සෙවනැල්ලේ චලනය සූර්ය ඩයලයක ආධාරයෙන් (කාලත්ථම්බ) මැනීමෙන්ය. පසුව, වලාකුළු සහිත දවල් සහ රාත්‍රී පැවසිය හැකි ජල ඔරලෝසු නිර්මාණය කරන ලදී. නිරීක්ෂණ කාලය දැනෙන්නේ අතීතය මතක තබා ගැනීම, වර්තමානය පිළිබඳව දැනුවත් වීම සහ අනාගතය පිළිබඳව අනුමාන කිරීමට ඇති හැකියාව මගිනි. මේ අනුව බුදුදහමේ කාලය මූලික වශයෙන් මනෝවිද්‍යාත්මක සංසිද්ධියක් ලෙස සලකනු ලැබේ. මේ අර්ථයෙන් කාලය ගැටළුවක් විය හැකිය.

මතකයන් කෙරෙහි ඇති බැඳීම කණගාටුවට සහ වරදට මෙහෙය විය හැකිය. අනාගතය පිළිබඳ කල්පිත අසහනයට, ආශාවන්ට, බිය සහ ප්‍රයෝජනයක් නැති මනඃකල්පිතයන්ට පත් වීමට මඟ පෑදෙන්න පුළුවනි. මේ දෙකම වර්තමාන යථාර්ථයෙන් ගැලවීමක් ලෙස භාවිත කළ හැකිය. එක් අවස්ථාවකදී බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'අතීතය අනුගමනය නොකළ යුතු අතර, අනාගතය අපේක්ෂා නොකළ යුතුයි. එයට හේතුව, අතීතය නිමා වී ඇති අතර, අනාගතය තවමත් පැමිණ නැත. ඒ වෙනුවට, කෙනෙකුට ප්‍රඥාවෙන් වර්තමාන මෙහොත, මෙතැන, දැන් දැකීමට ඉඩ දෙන්න. කෙනෙකුට දැනගැනීමටත්, ඒ සමග සිටීමටත් ඉඩ දෙන්න' (M.III,187). ජේසුස් වහන්සේගේ ප්‍රකාශය කෙනෙකුට මතක් විය හැකිය:

'එමනිසා හෙට ගැන කරදර නොවන්න, හෙට, හෙට පිළිබඳව කරදර වනු ඇත' (මැතිව් 6:34) වර්තමානයේ ජීවත්වීමේ ඇති වටිනාකම පිළිබඳව කථාකරමින්, බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'ඔවුන් අතීතය ගැන වැළපෙන්නේ නැත, ඉදිරියට සිදුවන්නට තිබෙන දේ පිළිබඳව ඔවුන් උදක් ආශා කරන්නේ නැත. නමුත් ඔවුන් වර්තමානයේ පැවතෙන නිසා ඔවුන්ගේ සමේ වර්ණය ශාන්තය' (S.I,5). ධර්මයේ ඇති ගතිලක්ෂණවලින් එකක් නම්, එය සදාකාලිකය (අකාලික) එහි අර්ථය එය බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ කාලයේ මෙන්ම අදටත් අදාළය, යෙදිය හැකිය (M.I,137). බලන්න **දින දර්ශනය**

'The Buddhist Conception of Time and Temporality.' D. J. Kalupahana, *Philosophy East and West*, 1974.

## ත්‍රිපිටකය

පූජනීය ධර්ම ග්‍රන්ථ හඳුන්වන නාමය ත්‍රිපිටකය වන අතර, එය වචන දෙකකින් සෑදී ඇත ; එනම් ති යනු 'තුන' සහ පිටක යනු 'කූඩය' යයි. මෙම ලියවිලි සඳහා කූඩය යන වචනය ලබා දී ඇත්තේ ඒවා ශතවර්ෂ ගණනාවක් තිස්සේ වාචිකව පතුරුවා හරින ලද නිසා සහ ඉදිකිරීම් සිදුකරන ස්ථානයක පස් කූඩයක් එක් කම්කරුවෙකුගේ හිස මතින් තවත් පුද්ගලයෙකුට මාරුවෙන් මාරුවට යැවීම කළ හැකි බැවිනි. ත්‍රිපිටකයේ කොටස් තුන විනය පිටකය, සූත්‍ර පිටකය, සහ අභිධම්ම පිටකයයි. ත්‍රිපිටකය නිර්මාණය වී ඇත්තේ පාලි භාෂාවෙන් වන අතර, එය ඉංග්‍රීසි බසින් සකස් වී ඇත්තේ වෙළුම් 40කට වඩා වැඩියෙන්ය. ලෝකයේ ඇති ඕනෑම විශිෂ්ට ආගම් අතර, විශාලතම පූජනීය ධර්ම ග්‍රන්ථයයි.

බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් වර්තමානයේ ඇති ස්වභාවයට කොටස් තුනකින්, ග්‍රන්ථ 15ක් ආදී වශයෙන් සකස් කරන ලද්දේ කවදා ද යන්න නොදනී. අවස්ථා කිහිපයකදීම බුදුපියාණන් වහන්සේ පැවසුවේ උන්වහන්සේගේ ඉගැන්වීම් සැලසුම් කර ඇත්තේ 'ශාඛා නවයකට' (නවාංග) බවයි, එනම්, ධර්ම දේශනා (සූත්‍ර), ගද්‍ය සහ පද්‍ය එකට (ගෙයිය), විවරණ (වෙයියාකරණ), ගාථා (ගාථා), සදාචාරාත්මක උත්තේජනය ඇති කරන ගාථා (උදාන), උපුටාගැනීම් (ඉතිවුත්තක), ජාතක කථා (ජාතක), විස්මකුරු සිද්ධීන් හා බැඳි කාව්‍ය (අබ්භූතධම්ම) සහ ප්‍රශ්න සහ පිළිතුරු (වෙදල්ල, A.II,7). ධර්මය ඉගැන්වීම් වර්ගීකරණය කර පිළිවෙළකට සකස් කිරීම සිදුවූ මුල්ම ක්‍රමය මෙය විය හැකිය. එසේ නම්, පූජනීය ග්‍රන්ථවල මුල්ම විස්තරවලට විනය පිටකය සහ අභිධම්ම පිටකය ඇතුළත් නොවූ බව මෙයින් අදහස් වේ. බලන්න **වාචික ප්‍රචලිත කිරීම්**

*An Analysis of the Pali Canon*, Russell Webb, 1975.

## කූඩා තුන
## (ත්‍රිපිටකය)

**ධර්ම දේශනා ඇතුළත් කූඩය (සූත්‍ර පිටකය)**

1. දීර්ඝ ධර්ම දේශනා එකතුව (දීඝ නිකාය)
2. මධ්‍යම ප්‍රමාණයේ ධර්ම දේශනා එකතුව (මජ්ඣිම නිකාය)
3. සමාන ධර්ම දේශනා එකතුව (සංයුක්ත නිකාය)
4. ක්‍රමික ධර්ම දේශනා එකතුව (අංගුත්තර නිකාය)
5. විවිධාංග එකතුව (ඛුද්දක නිකාය)

**ඉහත අංක එක යටතේ බෙදෙන කොටස් -**

A. විවිධාකාර ග්‍රන්ථ (ඛුද්දක පාඨ)
B. ධර්ම මාර්ගය (ධම්මපද)
C. ආධ්‍යාත්මික සදාචාරාත්මක ඉහළ දැමීමට ගාථා (උදාන)
D. එසේ කියන ලදී (ඉත්තිවුත්තක)
E. ධර්ම දේශනා එකතුව (සුත්ත නිපාත)
F. ප්‍රාසාදවල කථා (විමාන වත්ථු)
G. වෙන්වූ අය පිළිබඳ කථා (පේත වත්ථු)
H. භික්ෂූන්ගේ කථා (ථේරගාථා)
I. භික්ෂුණීන්ගේ කථා (ථේරීගාථා)
J. ජාතක කථා (ජාතක)
K. වරණ (නිද්දෙස)
L. විශ්ලේෂ දැණුමට මග (පටිසම්භිදාණ මග්ග)
M. සුපේසල පුද්ගලයන්ගේ ජීවිත (අපදාන)
N. බුදුපියාණන් වහන්සේගේ ඉතිහාසය (බුද්ධවංස)
O. චර්යා කූඩ (චරියා පිටක)

## විනය ඇතුළත් කූඩය (විනය පිටකය)

1. විශාල වැරදි (පාරාජික පාළි)
2. සුළු වැරදි (පාචිත්තිය පාළි)
3. විශාල කොටස (මහා වග්ග)
4. කුඩා කොටස (චුල්ල වග්ග)
5. විනය පිළිබඳ සංක්ෂේපය (පරිවාර)

## විශ්ලේෂණ ඇතුළත් කූඩය (අභිධම්ම පිටකය)

1. ප්‍රපංච වර්ගීකරණය (ධම්මසංගනී)
2. බෙදීම (විභංග)
3. ධාතූන් පිළිබඳ ධර්ම දේශනා (ධාතුකථා)
4. මනුෂ්‍ය වර්ග (පුග්ගල පඤ්ඤත්ති)
5. මතභේදයට තුඩුදෙන කරුණු (කථාවත්ථු)
6. යුගල ග්‍රන්ථය (යමක)
7. අනියම් සබඳතා (පට්ඨාන)

## The Three Baskets
## (Tipiṭaka)

### The Basket of Discourses
**(Sutta Piṭaka)**

1 The Collection of Long Discourses **(Digha Nikāya)**
2 The Collection of Middle Length Discourses **(Majjhima Nikāya)**
3 The Collection of Kindred Discourses **(Samyutta Nikāya)**
4 The Collection of Gradual Discourses **(Anguttara Nikāya)**
5 The Miscellaneous Collection **(Khuddaka Nikāya)**

- A Miscellaneous Text **(Khuddaka Pātha)**
- B Path of Dhamma **(Dhammapada)**
- C Verses of Uplift **(Udāna)**
- D The Thus Said **(Ittivuttaka)**
- E Discourse Collection **(Sutta Nipāta)**
- F Stories of Mansions **(Vimāna Vatthu)**
- G Stories of The Departed **(Peta Vatthu)**
- H Verses of the Monks **(Theraghāta)**
- I Verses of the Nuns **(Therīgātha)**
- J Birth Stories **(Jātaka)**
- K Expositions **(Niddesa)**
- L Way of Analytical Knowledge **(Patisambha Magga)**
- M Lives of The Saints **(Apadāna)**
- N History of The Buddha **(Buddhavaṃsa)**
- O Basket of Conduct **(Cariyā Piṭaka)**

### The Basket of Discipline
**(Vinaya Piṭaka)**

1 Major Offences **(Pārājika Pāli)**
2 Minor Offences **(Pācittiya Pāli)**
3 Greater Section **(Mahā Vagga)**
4 Lesser Section **(Cullavagga)**
5 Epitome of Discipline **(Parivara)**

### The Basket of Analysis
**(Abhidhamma Piṭaka)**

1 Classification of Phenomenon **(Dhammasangani)**
2 Division **(Vibhanga)**
3 Discourse on Elements **(Dhātukathā)**
4 Human Types **(Puggala Paññatti)**
5 Points of Controversy **(Kathāvatthu)**
6 The Book of Pairs **(Yamaka)**
7 Causal Relations **(Patthāna)**

## සනීපාරක්ෂා (වච්චකුටි)

සනීපාරක්ෂා (වච්චකුටි) යනුවෙන් හඳුන්වන්නේ ශරීරයේ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ඇති සාමාන්‍යයෙන් කුඩා කාමරයකි. එම අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා යම්කිසි ක්‍රමයක් ඇතුළත් වේ. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී වැසිකිළිවලට අපද්‍රව්‍ය රැස්කර දිරාපත් කරවන ටැංකියක් (වච්චකූප) තිබුණි. එය ගලකින් හෝ බදාම තට්ටුවකින් ආවරණය කර ඒ තුළ කුඩා සිදුරක් සහිතව තිබුණි. එම සිදුර දෙපැත්තේ උස්වූ පාද සලකුණු සහිත උස් තලාවක් (වච්චපාදුකා) ඇත. ඒ මත කෙනෙක් වාඩි වේ, නැත්නම් ඇණ තියා ඉඳ ගනී. එම කාර්යය අවසානයේදී, කෙනෙක් සොදා ගනී, නැතිනම් තණකොළවලින් හෝ ලී කැබැල්ලකින් පිස දමා ගනී. වැසිකිළියෙන් පිටත අත් සෝදා ගැනීම සඳහා ජලය සහිත කළයක් ඇත.

බුදුපියාණන් වහන්සේ සනීපාරක්ෂාවේ ඇති වැදගත්කම වටහා ගත් අතර, ආශ්‍රමවල වැසිකිළි නිතිපතා සෝදා අතුගා දැමිය යුතු යැයි කියා සිටියහ. 'වැසිකිළි පිළිබඳ සමාජ සිරිත්' යනුවෙන් හැඳින්විය හැකි දේ පිළිබඳව උන්වහන්සේ විනය පිටකයේ කථා කළහ. වැසිකිළිය ආසන්නයට එන විට කෙනෙකු ඇතුළත යම් කෙනෙකු සිටී නම්, කෙනෙකු එන බව දැනගන්නට සැලස්වීම සඳහා කහිමින් ශබ්දයක් පිට කළ යුතුයි. කෙනෙකු ඇතුළත සිටී නම්, ඒ ආකාරයටම වැසිකිළිය ඇතුළේ කෙනෙකු සිටින බව දැනගැනීම පිණිස කහින ශබ්දය පිට කළ යුතුයි. වැසිකිළිය ඇතුළට

පැමිණෙන විට, සිවුර ගලවා නිසි ලෙස එල්ලා තැබිය යුතුයි. සහනය සැලසෙන විට, කෙනෙකු කෙදිරිනොගෑ යුතුය, දත් පිරිසිදු නොකළ යුතුයි හෝ බිමට කෙළ නොගැසිය යුතුයි. එසේම, ශරීර කෘත්‍ය නිම කිරීමෙන් පසු, ඊළඟ පුද්ගලයාට අනුග්‍රයක් වශයෙන්, ජල බහාලුම් නැවත පිරවිය යුතුයි (Vin.II,222).

පෙනෙන ආකාරයට ඉහත විස්තර කළ අයුරින් සියලු ආශ්‍රමවල වැසිකිළි නැත. ඒ වෙනුවට, පොළොව යට කුටි කල (ගූන්ඨකටක) ආදේශකයක් වශයෙන් තිබුණි. අන්තර්ගතය පසුව ඉවත් කරන ලදී. සමහර විට, මාර්ගයට විසි කරන ලදී (Vin.IV.265).

බෞද්ධ භාවනාවේ හදවත සම්මා සතියයි. මෙම පුහුණුවේ මුල් අවධියේදී භාවනායෝගියා හුස්ම ඇතුල් වීම සහ පිටවීමේ මෘදු චලනය පිළිබඳව දැනුවත් වේ. පසුව ඔහු හෝ ඇය සියලු අංශ, සම්පූර්ණ ශරීරය, හැඟීම්, මනස සහ ඊට පසු මනසේ අන්තර්ගතය පිළිබඳව දැනුවත් වීමට තරම් වර්ධනය වේ. නමුත්, කෙනෙකුට නිශ්ශබ්ද කාමරයක වාඩි වී සිටියදී පමණක් සිහියෙන් සිටිය හැකි නම්, එම පුද්ගලයාට දැනගත හැක්කේ ඔහුගේ ජීවිතයේ කුඩා කොටසක් පිළිබඳව පමණි. එය තරමක් සිත්නොගන්නා දෙයකි. සැබැවින්ම ඵලදායී වීමට නම්, සිහිකල්පනාව කෙනෙකු කරන සියලු දේ වෙත ගලා යායුතුය. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ 'භික්ෂුවක් එන යන විට, අත් දිගහරින විට, ආපසු ගන්නා විට, සිවුර ඇඳ ගන්නා විට සහ පාත්‍රය රැගෙන යන විට, ආහාර පාන ගන්නා විට, හපන විට, රස බලන විට, මලපහ කරන විට, මූත්‍රකරන විට

පවා සම්පූර්ණ සිහියෙන් සිටිය යුතුයි. සක්මන් කරන විට, සිටගෙන ඉන්නා විට, නින්දට යන විට, අවදි වන විට, කථා කරන විට සහ නිශ්ශබ්දව ඉන්නා විට ද සම්පූර්ණ සිහියෙන් සිටිය යුතුයි' (M.I,57).

'මලපහ කරන විට හා මූත්‍ර කරන විටත්' (උච්චාරපස්සාවකම්මෙ) අප සිහියෙන් සිටිය යුතු බව බුදුපියාණන් වහන්සේ පැවසුවේ කෙතරම් පොදු ස්ථානයක වූව ද සියලු ක්‍රියාකාරකම් පැහැදිලි හා පෙනුමක් ඇති අරමුණක් විය යුතු බවයි. සිහිකල්පනාවෙන් කළ විට සෑම ක්‍රියාවක්ම ඉතා ඉහළ මට්ටමේ සිට වඩාත් ලෞකික මට්ටම දක්වා පූජනීය වේ.
*A Pure Mind in a Clean Body: Bodily Care in the Buddhist Monasteries of Ancient India and China*, A. Heirman and M. Torck, 2012.

## ඉවසීමේ හැකියාව

ධර්මයට අදාළව ඉවසීම යනු තමන්ගේම ආගම හැර වෙනත් ඇදහිලි කෙරෙහි පිළිගැනීමක් සහ හොඳහිතක් ඇති ආකල්පයකි. බුදුදහම සාමාන්‍යයෙන් ඉවසනසුළු ආගමකි. මෙය බුදුදහමේ බොහෝ ඉගැන්වීම්වල ස්වාභාවික ප්‍රතිඵලයකි. 1. පූර්ණ සහ නොබෙදුණු පක්ෂපාතීත්වය ඉල්ලා සිටින දෙවියෙකුගේ සංකල්පයෙන් බුදුදහම නිදහස්ය. 2. එය කිසිවිටකත් ධර්මය පිළිබඳ අවිශ්වාසය නපුර සමග සම්බන්ධ කර නැත. 3. බෞද්ධයන් මෙන්ම අනෙක් ඇදහිලි දරන අයටත් කරුණාව සහ ගුණ ධර්ම ඇති කර ගැනීමේ හැකියාවක් ඇති බව එය හඳුනා ගනී. බුදදහම සැමවිටම උගන්වා ඇත්තේ මරණයෙන් පසු කෙනෙකුගේ ඉරණම නියම

කරන්නේ ආගමික බැඳීමට වඩා ක්‍රියාවන් බවයි. සද්ගුණවත් හින්දු, ක්‍රිස්තියානි හෝ සිඛ් ආගම්වලට අයත් පුද්ගලයන්ට යහපත් නැවත උත්පත්තියක් ලැබිය හැකි අතර, අනාචාර, කුහක බෞද්ධයෙකුට සෘණාත්මක උත්පත්තියක් ලැබිය හැකිය. 4. නැවත ඉපදීම යන සංකල්පයෙන් අදහස් කරන්නේ සමහර අයට මේ ජීවිතයේදී ධර්මය අවබෝධ කර ගත නොහැකි අතර, ඔවුන්ට එය ඊළඟ භවයේදී හෝ ඊට පසු භවයේ දී එසේ කර ගැනීමට අවස්ථාව උදාවිය හැකි බවයි. මේ අනුව, අන් අය 'බේරා ගැනීම' සඳහා ඔවුන් තමන්ගේ දහමට හරවා ගැනීම සහ හැරවීමට අපොහොසත් වන අය කෙරෙහි ඇති කෝපය ද ඇති වීමේ අවශ්‍යතාවයක් බුදුදහමේ නැත. බුදුදහම අවධාරණය කරන්නේ සෘණාත්මක මානසික තත්ත්වයන් කුමක් වුවත්, පිළිගත නොහැකි බවත්, ඒ නිසා වෙනත් ආගම් කෙරෙහි කෝපයක් හෝ නොඉවසීමක් ඇති කර ගැනීම තවදුරටත් හුදෙක් කෝපය හා නොඉවසීම පමණක් බවත්ය.

ක්‍රි. පූ. 256දී අශෝක රජු මෙසේ ලියමින් අව්‍යාජ බෞද්ධ හැඟීමක් මෙසේ ප්‍රකාශ කළේය. 'සියලු ආගම්වල අත්‍යවශ්‍ය දේවල්වල වර්ධනයක් ඇති වේවා යැයි මම ප්‍රාර්ථනා කරමි. මෙය ක්‍රම කිහිපයකින් කළ හැකි නමුත්, ඒ සියල්ලන්ගේම මුල සංයමයෙන් යුතුව කථා කිරීමයි ; එනම් හොඳ හේතුවක් නොමැතිව, ප්‍රශංසා නොකිරීම සහ අනෙක් අයගේ ආගම් හෙළා නොදැකීමයි. විවේචනය යුක්ති සහගත වුවද, එය මෘදු ආකාරයෙන් කළ යුතුයි. යම් කෙනෙකු අධික භක්තිය නිසා තමන්ගේ ආගම ප්‍රශංසා කරමින් අනෙක් අයගේ ආගම් විවේචනය කරයි ද, ඔහු හානි කරන්නේ තමන්ගේම ආගමටයි.

එම නිසා, ආගම් අතර සම්බන්ධය හොඳය. අනෙක් අය විසින් ප්‍රකාශ කරනු ලබන ධර්මයන්ට යමෙකු සවන් දිය යුතුයි, ගෞරව කළ යුතුයි. අනෙක් අයගේ යහපත් ධර්මයන් සියලු දෙනා උගත යුතු යැයි මම ප්‍රාර්ථනා කරමි'. බොහෝ පැරණි බෞද්ධ ප්‍රකාශයන් මෙන්ම, මෙයට ද අපූර්ව නව සීමා පැනවීමක් ඇත.

911දී, අබු සෙයිඩ් හසන් නමැති අරාබි භූගෝල විද්‍යාඥයා ශ්‍රී ලංකාව පිළිබඳව මෙසේ පැවසුවේය: 'දිවයිනේ යුදෙව්වන් මෙන්ම තවත් බොහෝ නිකායන් ඇත. රජතුමා සෑම ආගමක්ම පිළිපැදීමට අවසර දෙයි'. 1349දී පමණ කතෝලික පූජකයෙකු වූ ජෝන් ද මරිග්නොලි ශ්‍රී ලංකාවට පැමිණියේය. එහි සිටි 'භික්ෂූන් මා පිළිගත්තේ ඔවුන්ගේම කෙනෙකු ලෙසයි', යනුවෙන් ඔහු පැවසුවේය. 1850 ගණන් වලදී ඇමෙරිකානු ප්‍රොතෙස්තන්ත මිෂනාරිවරුන් තායිලන්තයට පැමිණි විට, මොන්ග්කුට් රජ ඔවුන් වෙනුවෙන් පල්ලියක් ඉදිකර ලතින් භාෂාව උගන්වන ලෙස ඉල්ලා සිටියේය. ඒ ඔහුට බයිබලය කියවා ඔවුන්ගේ ආගම පිළිබඳව හුරුවක් ලබා ගැනීමටය. බලන්න **ආගමික නම් හා පූජනීය දේ අවමනට ලක් කිරීම සහ වෙනත් ආගම්වලට හැරවීම**

*Tolerance*: *A Study from Buddhist Sources*, Phra Khantipalo, 1964.

## කුසල් අනුමෝදන් කිරීම

කුසල් අනුමෝදන් කිරීම (පත්තිදාන) යනු යහපත් දේ කර එහි කර්මානුරූප ප්‍රතිඵල (විපාක) මිය ගිය කෙනෙකුට අනුමෝදන් කිරීමට හැකි යැයි යන විශ්වාසයයි. මෙම විශ්වාසයය නූතන ථේරවාදී

බුදුදහමේ බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල ඇති වැරදි වැටහීම් කිහිපයකින් එකකි. එය කර්මය පිළිබඳ ධර්මයට පටහැනි වේ. එනම්, බුදුදහම උගන්වන්නේ අපගේ චේතනාන්විත ක්‍රියාවන් අපට බලපෑමක් ඇති කරන බවත්, අප කරන දෙයට අප සෑම කෙනෙකුම වගකිව යුතු බවත්ය. එසේම එය සදාචාරාත්මක හේතු කාරකය ප්‍රතික්ෂේප කරයි. මක්නිසා ද යත්, අප කළ යහපත් දේවල ප්‍රතිඵල අන් අයට අනුමෝදන් කළ හැකි නම්, ඒ ආකාරයටම අප කරන ලද නරක කර්මවල ප්‍රතිඵල ද අන් අයට පැවරිය හැකි විය යුතුයි. එවිට ඒවායේ ප්‍රතිවිපාක වලින් වැළකීමට අපට හැකි විය යුතුයි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'නපුරක් කරන්නේ තමා විසින්මයි, නපුරෙන් වැළකෙන්නේ ද තමා විසින්මයි, පිරිසිදු වන්නේ ද තමා විසින්මයි. පිරිසිදු බව හෝ අපිරිසිදු බව රැඳෙන්නේ තමා මතයි. තවත් කෙනෙකු තවත් කෙනෙකුට කළ නොහැකිය' (Dhp.165). සූත්‍ර පිටකයේදී උන්වහන්සේ මෙසේ පැවසූහ: 'කෙනෙකු මරණයට මුහුණ දී මෙතැන සිට වෙනත් ලෝකයකට යන විට, පියාට අනෙක් ඥාතීන් කරන දේට වඩා වැඩි යමකින් තම පුත්‍රයාට උපකාර කළ නොහැකිය' (Sn.579. දේවදූත සූත්‍රයෙන් ද උන්වහන්සේ එයම උපුටා දක්වමින් සහ අනුමත කරමින් මෙසේ අදහස් දක්වයි. 'ඔබ මෙම නපුරු ක්‍රියාව කළ අතර, එහි ප්‍රතිඵලය ඔබ තනිවම අත්විඳිනු ඇත' (M.III,180). එම කරුණම ජාතක කතාවක අවධාරණය කර ඇත. 'කෙනෙකු තමන්ගේම යහපත උදාකර ගනී. කෙනෙකු තමන්ගේම අයහපත උදාකර ගනී. ඒ මන්ද, එක් පුද්ගලයෙකුගේ යහපත හෝ එය නොමැති වීම ඇති කර ගැනීම තවත් කෙනෙකුට කළ නොහැකිය' (Ja.III,263). කුසලය සොරකම් කළ

නොහැකි වස්තුවකි. එසේම එය බොහෝ විට කෙනෙකුට දිය නොහැකිය. බුද්ධචරිතයේ මෙසේ සඳහන් වේ, 'කෙනෙකුට යහපත කර එය තවත් කෙනෙකුට දිය නොහැකිය (Khp.9). කෙනෙකුට එසේ කිරීමට අවශ්‍ය වුවත්, අනෙක් පුද්ගලයාට එය ලැබිය නොහැකිය. කෙනෙකුගේ ම ක්‍රියාවන්වල ප්‍රතිඵල විනාශ නොවේ. ඒවා එම පුද්ගලයාගේ අත්දැකීම් වේ. නමුත් කෙනෙකු නොකළ දේවල්වල ඵලය අත්දකින්නේ යැයි යන්න සත්‍ය නොවේ' (XX,28).

මුල්කාලීන බෞද්ධයන් ඉගැන්වූයේ වෙනත් කෙනෙකු වෙනුවෙන් හෝ තවත් කෙනෙකුගේ නමින් යහපත් දේ කිරීම සහ එම යහපත් ක්‍රියාවෙන් ලැබෙන දේ (පුඤ්ඤානුමොදනා) ඔවුන්ට ප්‍රීතිවීමට අවස්ථාව ලබා දීමේ අදහසයි. මෙම පුරුද්දේ පිටුපස ඇති න්‍යාය මෙවැනි දෙයක් ක්‍රියාත්මක කරයි. මම මිතුරියකට උපන්දිනයට කාඩ්පතක් යැවූවිට, එය ඇයට ලැබී මගේ ආශීර්වාදය සහ සුභ පැතුම් කියවා සමහර විට සතුටට පත්වෙනු ඇත. ඇයට කිසිවක් 'අනුමෝදන්' කර නැත. ඒ වෙනුවට, මා ඇයගේ උපන්දිනයේ ආදරයෙන් ඈ පිළිබඳව සිතා ඇති නිසා ඇයට සතුට ගෙන දෙනු ඇත. ඒ ආකාරයටම අප යම් යහපත් දෙයක් කර එසේ කළේ ඔවුන් වෙනුවෙන් බව කී විට, අපි ඔවුන්ට ප්‍රීති වීමට අවස්ථාව උදාකර දෙන්නෙමු.

මිය ගිය කෙනෙකු වෙනුවෙන් ද මෙසේ කිරීම කළ හැකි බව මුල්කාලීන බෞද්ධයෝ ඉගැන්වූහ. මෑත දී මිය ගිය කෙනෙකු තවමත් 'ගන්ධර්ව අවස්ථාවේ' සිටින නිසා තවමත් නැවත ඉපදී නැති නම්, ඔහු

හෝ ඇය තමන්ගේ ආදරණීයන් පිළිබඳව සහ ඔවුන් කරන්නේ මොනවාද යන්න තවමත් දන්නවා ඇත. අප යම් පුණ්‍ය කර්මයක් හෝ යහපත් දෙයක් කර මිය ගිය කෙනෙකු පිළිබඳව එසේ කළ බව කීවොත්, ඒ අය ඒ පිළිබඳව දැන සතුටට පත් විය හැකිය. නමුත්, මිය ගිය කෙනෙකු වෙනුවෙන් යහපත් දේ කිරීමේ පුරුද්දට කැප වෙන ලෙස බුදුපියාණන් වහන්සේ ඉගැන්වූයේ නැත. එය උන්වහන්සේගේ ඉගැන්වීම්වලට පටහැනි නොවේ.

## සංක්‍රාන්ති ලිංගිකත්වය

සංක්‍රාන්ති ලිංගික හෝ විරුද්ධ ලිංගයට අයත් යැයි සිතන පුද්ගලයන් සාමාන්‍යයෙන් ඔහුගේ හෝ ඇයගේ ශරීරයෙන් දැක්වෙන ලිංගිකත්වයන් විරුද්ධ සාමාජිකයෙකු ලෙස ජීවත් වීමට හා පිළිගැනීමට කැමැති වේ. මේ අනුව, සමහරුන්ට පුරුෂ ලිංගේන්ද්‍රයන් තිබියදීත්, තමන් ගැහැණු බව හෝ කාන්තාවන්ගේ ලිංගේන්ද්‍රයන් තිබියදීත්, ඔවුන් පිරිමියෙකු යන දැඩි හැඟීමක් ඇත. එවැනි අය බොහෝ විට පවසන්නේ ඔවුන් 'වැරදි ශරීරයේ' සිටින බවයි. පැරණි ඉන්දියානු සාහිත්‍ය තුළ සාමාන්‍යයෙන් එම ලිංගයේම කෙනෙකු පිළිබඳව ආශාවක් හෝ සමහර විට එවැන්නකු අගය කිරීමෙන් නිරායාසයෙන්, හුදෙක් ලිංගිකත්වය වෙනස් කළ පුද්ගලයන් පිළිබඳව මිථ්‍යාවන් රාශියක් ඇතුළත් වේ. එවැනි කථා සමහරක් බෞද්ධ මූලාශ්‍රවල ද ඇත. ධම්මපදයට (ක්‍රි. පූ. 5වන ශතවර්ෂයේදී පමණ), විවරණයක ඇතුළත් වන්නේ එක්තරා භික්ෂුවකගේ සුන්දර ස්වරූපය දැක කුල්මත් වී සෝරෙය්‍ය නමැති මිනිසෙකු කාන්තාවක් බවට පැමිණීමේ කථාවකි. ඊට

පසු ඔහු විවාහ වී දරුවන් දෙදෙනෙකු ලැබූ බව ද සඳහන් වේ (Dhp-a.324). සංක්‍රාන්ති තත්ත්වයන් සහ පුද්ගලයන් පිළිබඳව විවිධාකාර වර්ග ත්‍රිපිටකයේ සඳහන් වේ. - පිරිමියෙකු වැනි කාන්තාවන් (වෙපුරිසිකා), ලිංගික කැපී පෙනෙන ලක්ෂණ නැති (සම්භින්න), ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම ලක්ෂණ ඇති (උභතොව්‍යඤ්ජනක), ආදී වශයෙනි (Vin.III,129). බෞද්ධ සාහිත්‍යයේ සංක්‍රාන්ති ලිංගිකයන්ගේ පැවැත්ම සැලකිල්ලට ගනු ලබන්නේ ඒ පිළිබඳව සදාචාරාත්මක විනිශ්චයක් නොමැතිවය.

සංක්‍රාන්ති ලිංගිකත්වය පැහැදිලි කිරීම සඳහා විවිධ න්‍යායයන් උපග්‍රහණය කර ඇත.; එනම් එය මානසික හෝ හෝමෝන පිළිබඳ ආබාධයක් හෝ එයට ජානමය හෝ පාරිසරික හේතු ඇති බවයි. පුනරුත්පත්තිය පිළිබඳ බෞද්ධ ධර්මය සංක්‍රාන්ති ලිංගිකත්වය පිළිබඳව පැහැදිලි කළ හැකිය. ගැහැණු සොබා ඇති ආකල්ප, ආශාවන්, ගතිලක්ෂණ සහ නැඹුරුව මනසෙහි තදින්ම සටහන් වී ඇති අඛණ්ඩ ජීවිත ගණනාවක කාන්තාවක් ලෙස පුද්ගලයෙකු නැවත ඉපදීමට ඉඩ ඇත. මෙයින් ලිංගභේදයේ භෞතික ගතිලක්ෂණවලට බලපාන සාධක කුමක් වුවත්, ඇය නිරන්තරයෙන් කාන්තා ශරීරයක් තුළ නැවත ඉපදීම හෝ ඇගේ විඤ්ඤානය නව කලලරූපය ගැහැණු ස්වරූපයක් බවට හැඩගස්වනු ඇත. එවිට, කර්මානුරූප, ජානමය හෝ වෙනත් හේතු මත, එම පුද්ගලයා දිගු කලක් තිස්සේ ස්ථාපිතවූ ස්ත්‍රී මනෝ විද්‍යාත්මක ගති ලක්ෂණ රඳවා ගනිමින් පිරිමි ශරීරයක් තුළ නැවත ඉපදීමට ඉඩ ඇත. මෙය හෝ ඒ හා සමාන දෙයක් සංක්‍රාන්ති ලිංගිකත්වයට

හේතුව නම්, එයින් අදහස් වන්නේ මෙම තත්ත්වය සමහර ආගම් විසින් පවත්වා ගෙන යනු ලබන සදාචාරාත්මක විකෘතියකට වඩා ස්වාභාවික තත්ත්වයක් බවයි. බුදුපියාණන් වහන්සේ පැවසුවේ අඛණ්ඩ ජීවිත (අබ්බොකිණ්ණනී) තුළින් වර්ධනය වූ ගතිලක්ෂණ හෝ නැඹුරුවීම් (වාසනා) වර්තමාන ජීවිතය තුළ හොඳින් ප්‍රකාශ විය හැකි අතර, දැන් සිදුකරන ඕනෑම දෙයක අභ්‍යන්තර සදාචාරාත්මක දෝෂයක් (දොසතර) නොවිය හැකි බවයි (Ud.28).

අන් සෑම තැනකම මෙන් සංක්‍රාන්ති ලිංගිකත්වය සියලු බෞද්ධ සමාජවල පවතී. කෙසේ වෙතත් සංක්‍රාන්ති ලිංගිකයන් තායිලන්තයේ විශේෂයෙන් පෙනෙන්ට තිබෙන සාමාන්‍ය දෙයකි. කැතොයි යන තායි වචනය ලිහිල් ලෙස භාවිත වන්නේ ගැහැණියක් බඳු සමලිංගිකයන්, විරුද්ධලිංගික ඇඳුම් අඳින සහ විශේෂයෙන් සංක්‍රාන්ති ලිංගිකයන් හැඳින්වීම සඳහාය. සමහර විට බුදුදහමෙන් ලැබී ඇති සාමාන්‍ය ඉවසීම නිසා, එවැනි පුද්ගලයන්ට තායිලන්තයේ යම් මට්ටමක පිළිගැනීමක් තිබුණ ද, ඔවුහු තවමත් විවිධාකාරවූ සමාජ සහ නීතිමය දුෂ්කරතාවන්ට මුහුණ දෙති. ධර්මය අවංකවම ක්‍රියාත්මක වන අධිකරණ බලසීමාවක් තිබේ නම් සංක්‍රාන්ති ලිංගිකයන්ගේ නිශ්චිත අවශ්‍යතාවන් හඳුනාගෙන ඔවුන්ට නැවත ලිංගික තත්ත්වය වෙනස් කිරීම සඳහා සැත්කමකට භාජනය වීම සඳහා නීත්‍යානුකූල අවසර ලබා දෙනු ඇත. බලන්න **කාන්තාවන්**

## බුදුපියාණන් වහන්සේගේ චාරිකා

සංචාරය කිරීම (චාරිකා හෝ සඤ්චරණ) යනු සාමාන්‍යයෙන් දීර්ඝ දුරක් ඉක්මවා එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට යාමයි. බුදුපියාණන් වහන්සේ මූලික වශයෙන් ගුරුවරයෙකු වශයෙන් සලකනු ලැබේ. මෙම හැඟීම නිවැරදිය. නමුත් උන්වහන්සේ ශාස්ත්‍රීය අධ්‍යයන ආයතනයක ගුරුවරයෙකුවූ ප්ලේටෝ හෝ විශ්ව විද්‍යාලයක කථිකාචාර්යවරයෙකු වූ ඇක්වයිනාස් වැනි ගුරුවරයෙක් නොවීය. උන්වහන්සේගේ සියලු ඉගැන්වීම් සිදු කරනු ලැබුවේ පාර අයිනේ නැවතුම් පොළවල, ගම්මානවල පිහිටි අඹ වතුවල, පාර අයිනේ සිද්ධස්ථානවල සහ නගර උද්‍යානවලය. තමන්වහන්සේගේ ධර්මය ඇසීමට හැකි තරම් පිරිසකට අවස්ථාව තිබිය යුතු යැයි උන්වහන්සේ සැලකිලිමත් වූහ. එය ඉටු කිරීම සඳහා උන්වහන්සේ තමන්වහන්සේගේ ජීවිතයෙන් වැඩි කාලයක් සංචාරය කළහ. බුදුපියාණන් වහන්සේගේ චාරිකා විස්තර සමහරක් ත්‍රිපිටකයේ සඳහන් වේ. උදාහරණ වශයෙන් උන්වහන්සේගේ බුද්ධත්වයෙන් මාස 12කට පසු, උන්වහන්සේ උරුවෙලා සිට සාරනාථ්, නැවත උරුවෙලාවටත්, එතැන් සිට කිලෝමීටර් 315ක් පමණ වූ දුරක් ගයා හරහා රාජගහටත් වැඩියහ. ත්‍රිපිටකයේ සඳහන් වැඩිම දුරක් වැඩි චාරිකාව වූයේ රාජගහ සිට වෙසාලි හරහා සාවත්ථියටත් ඊට පසු නැවත රාජගහට විකල්ප මාර්ගයක් වූ කිලෝමීටර් 920ක් පමණ වූ සම්පූර්ණ දුරක් කීටගිරි සහ ආළවි හරහා චාරිකාවේ වැඩීමයි. උන්වහන්සේගේ අවසාන චාරිකාව වූයේ රාජගහ සිට පැටිනා, වේසාලි සහ අවසානයේ කුසිනාරාවට කිලෝමීටර් 275ක පා

ගමනක් වැඩීමයි. එම චාරිකාව වයස 80ක් වූ පුද්ගලයෙකුට වෙහෙසකර සහ පීඩාකාරී විය යුතුයි (D.II,72-137).

බුදුපියාණන් වහන්සේ චාරිකාවේ වැඩියේ භික්ෂූන් 500 නමක් සමග බව බොහෝ විට විස්තර වේ. එය 'බොහෝ' යන අරුත ඇති සම්ප්‍රදායානුකූල අංකයක් විය යුතුයි, නැතහොත්, හුදෙක් 'විශාල භික්ෂූන් කණ්ඩායමක්' විය යුතුයි. අනෙක් වේලාවට උන්වහන්සේ තමන්වහන්සේගේ උපස්ථායක හෝ සහායකයන්ට නොදන්වා යම් වේලාවකට ඔබ මොබ වඩිති (S.III,95). උන්වහන්සේට පයාග, වර්තමානයේ අල්ලහබාද් (Vin.III,5) සහ පැටිනා (M.I,225) මෙන් පළල් ගංගා තරණය කරන්නට ඇති විට හැර, පයින් වැඩිය බව පෙනී යයි. එම ගංගා තරණය කරන විට උන්වහන්සේ පාරුවක් භාවිත කළහ. එක් ස්ථානයකදී පමණක් උන්වහන්සේ පාවහන් භාවිත කළ බව සඳහන් වේ. බොහෝ අවස්ථාවල උන්වහන්සේ පාවහන් නොමැතිව වඩින්නට ඇති බව පෙනේ (Vin.I,187). මහ මඟ සිටින විට, උන්වහන්සේ සැතපී ඇත්තේ මාර්ගයේ ඇති නවාතැනක, මහලු වළංකරුවාගේ මඩුවේ, (M.III,238) හෝ කිසිම තැනක් නොතිබුණේ නම්, එළිමහනේ 'කොළ අතු විසුරුවන ලද පොළොවේ' (A.I,136) ය. උන්වහන්සේ කුරු රටේ වැඩ සිටින එක් අවස්ථාවක, 'පොළොව මත තණකොළ ඇතුරූ' කුඩා මඩුවක වැඩ සිටියහ (M.I,501).

බුදුපියාණන් වහන්සේ වරක් භික්ෂූන් අමතා මෙසේ පැවසූහ 'බොහෝ දෙනාගේ යහපත පිණිස, බොහෝ දෙනාගේ සතුට පිණිස, ලෝකය වෙනුවෙන් මහා

කරුණාවෙන්, සුභසිද්ධිය වෙනුවෙන්, දෙවියන්ගේ සහ මිනිසුන්ගේ යහපත සහ සතුට පිණිස, ඉදිරියටම යන්න. මුල, මැද සහ අග සුන්දර වූ ධර්මය උගන්වන්න. පූජනීය ධර්මයේ නීති සහ අරමුණ සම්පූර්ණයෙන්ම තෘප්තිමත් සහ හැම අතින්ම පිරිසිදුයි' (Vin.I,20). එය මෙසේ කියමින්, බුදුපියාණන් වහන්සේ බොහෝ දීර්ඝ සහ දුෂ්කර චාරිකා උන්වහන්සේ විසින්ම සිදුකිරීමට හේතු පැහැදිලි කරමින්, ලෝකය වෙනුවෙන් තමන්වහන්සේ තුළ තිබූ මහා කරුණාව නිසාම බව පැවසූහ. බලන්න **මධුර, මධ්‍යම දේශය සහ වෙසාඛ**

**ගස්**

ගස් (රුක්ඛ) යනු සාමාන්‍යයෙන් ඝණ වන ගහණ, කඳක් සහිත, වැඩෙන කොළවලින් ආවරණයවූ අතු ඇති උස ශාක වේ. සංවේදී සහ නිරීක්ෂණය කරන පුද්ගලයෙකු ලෙස, උන්වහන්සේගේ කාලයෙන් වැඩි කාලයක් වනයේ ගත කළ, බුදුපියාණන් වහන්සේ ගස් පිළිබඳව විශාල ඇගයීමක් සහ දැනුමක් වර්ධනය කර ගත්හ. ගස්වල සමහර ව්‍යුහාත්මක කොටස් අතරට කඳ (ඛන්ධ), ගසක කඳේ පිටත කොටස (පපතිකා), පටක හෝ අභ්‍යන්තර පොත්ත (තච), පිටත මෘදු තට්ටුව (ඵෙග්ගු), කඳේ ඝන අභ්‍යන්තර කොටස (සාර), අතු (සාඛා), කුඩා රිකිලි (පසාඛ), කොළ (පණ්ණ), සහ මුදුන (අග්ග), වශයෙන් බුදුපියාණන් වහන්සේ පැහැදිලි කළහ. උන්වහන්සේ විවිධ මූල පද්ධති පිළිබඳව ද දැන සිටියහ. ඒවා විශාල දැවමය මූලයන් (මූල), අග සිහින්වෙන මුල් හෝ ආංශික මුල් (මූලානි

අධොගමානි යානි තිරියංගමානි), පෝෂණය ලබා දෙන මුල් සහ අවශෝෂක මුල් (උසීරන්ජලී) වශයෙනි. මෙම මුල් තෙතමනය සහ පෝෂණය පස්වලින් උරාගන්නා ශාක යුෂ (ඕජා) කඳ හරහා උඩු දිසාව හරහා අතුවලට ගමන් කරයි (S.II,87-8).

බුදුපියාණන් වහන්සේගේ බොහෝ ධර්ම දේශනාවලින් ද පෙනී යන්නේ උන්වහන්සේට ගස් කෙරෙහි විශේෂ ආකර්ෂණයක් තිබූ බවයි. තරුණයෙකු වශයෙන් උන්වහන්සේට පළමු ගැඹුරු ආධ්‍යාත්මික අත්දැකීමක් ඇති වූයේ ජම්බු ගසක සෙවනේ ඉඳගෙන ඉන්නා විටයි (M.I,246). උන්වහන්සේ බුදුවූයේ බෝධි වෘක්ෂය යට ඉඳගෙනය. එසේම පරිනිර්වාණයට පත් වූයේ සල් ගස් දෙකක් අතර වැතිර සිටිමින්ය (D.II,137). සෙවන ගෙන දෙන ගස් පාර දෙපැත්තේ සිටුවන ලෙස උන්වහන්සේ ඉගැන්වූහ (S.I,33). භාවනා කිරීමට වනය හොඳ ස්ථානයක් ලෙස උන්වහන්සේ සැලකූහ. බොහෝ විට උන්වහන්සේ ශ්‍රාවකයන්ට මෙසේ පැවසූහ: 'මේ තියෙන්නේ ගස්වල මුල්, මේ හිස් ස්ථාන. භාවනා කරන්න. ඒ ඔබට මගේ උපදෙස්ය' (M.I,46). බුදුපියාණන් වහන්සේ 'වනාන්තරයේ, ලඳු කැලෑවල අභ්‍යන්තරයේ, නිශ්ශබ්ද ස්ථානවල තාවකාලික නවාතැන් සෙවූ' බව කියැවේ (D.III,38). බුදුපියාණන් වහන්සේට උන්වහන්සේගේ ධර්මය කෙතරම් ස්වයං-ප්‍රත්‍යක්ෂද යත්, එක් අවස්ථාවක දී උන්වහන්සේ අසල ඇති ගස් පෙන්වමින් මෙසේ පැවසූහ: 'මෙම විශාල සල් ගස්වලට අවබෝධ කරගත හැකි නම්, ඒවා ද ධර්මය වැළඳ ගන්නවා ඇත. එසේ නම් මිනිසුන් ඊට වඩා වැඩියෙන් ගත

යුතු නොවේද? ' (A.II,194).

බෞද්ධ සාහිත්‍යයේ ඇති සමහර සුන්දරතම උද්ධෘතයන් ගස් හා සම්බන්ධ වේ' (Ja.VI,526). කරුණාවන්ත, ආගන්තුක සත්කාරයට ලැදි පුද්ගලයෙකු ගැන බුදුපියාණන් වහන්සේ පැවසුවේ 'විඩාවට පත් සංචාරකයන් එහි ඇති සිසිල් සෙවනින් සනසන, මාර්ගය දෙපස වැඩෙන මහා අතු ඇති නුග ගසක් මෙන්'ය. අප ගස් මෙන් වන්නට උත්සාහ ගත යුතු බව මිලින්දපඤ්හයේ සඳහන් වේ. 'ගසක් ලබා දෙන සෙවනේ ප්‍රභේදයක් නැතිවා මෙන්ම, භාවනායෝගියෙකු කිසිම කෙනෙකු අතර ප්‍රභේදයක් ඇති නොකළ යුතුයි. නමුත්, මෛත්‍රිය සමානව සොරුන්ට, මිනීමරුවන්ට, සතුරන්ට සහ තමන්ටත් දියුණුව ඇති කළ යුතුයි' (Mil.410). බුදුපියාණන් වහන්සේ පෙතවත්ථු අංකුරයේ සියලු ජීවිත කෙරෙහි සැලකිල්ල සහ ගෞරව දැක්වීමේ පොදු බෞද්ධ ආකල්පය ගැන අදහස් දැක්වූයේ මෙසේය: 'ගසක සෙවනේ ඉඳගෙන හෝ වැතිර සිටින්නා එහි අත්තක්වත්, නොකැඩිය යුතුයි, එයට හේතුව ඔහු එසේ කරන්නේ නම්, ඔහු මිතුරෙකුට ද්‍රෝහියෙක් වේ, වැරදි කරන්නෙක් වේ. කෙනෙකු ගසක සෙවනේ ඉඳගනීද, නැතිනම් වැතිර සිටීද, ඔහු එම ගසේ කොලයකටවක් හානි නොකළ යුතුයි, ඔහු එසේ කරන්නේ නම්, මිත්‍රයෙකුට ද්‍රෝහිවන්නෙක් වේ, වැරදි කරන්නෙකු වේ' (Pv.9,3-5). tla ජාතක කතාවක, තරුණ කාන්තාවක් ඇයගේ මවට මෙසේ කීවාය: 'මා මළොත්, මගේ ඇටකටු එකතු කර, ඒවා පුළුස්සා, සිහිවටනයක් තනන්න. එතැන කිණිහිරියා ගසක් සිටුවන්න. ඊට පසු ශීත ඍතුව අවසානයේ දී වසන්ත ඍතුවේදී, මල් පිපෙන විට ඔබට මා සිහිවී මෙසේ

කියන්න: ''මගේ දියණියගේ රූපශ්‍රීය එවැනියි'' (Ja.V,302). බුද්ධචරිතයේ ආධ්‍යාත්මික පුහුණුව ගසකට සමාන කරයි. 'ගසේ කෙඳි ඉවසීමයි, මල් ගුණවත්බවයි, අතු දැනුවත් බව සහ ප්‍රඥාව අධිෂ්ඨානය තුළ මුල් බැස ඇත. එය ධර්මය නමැති ඵලය දරයි'.
*Nature and the Environment in Early Buddhism*, S. Dhammika, 2015.

## වෘක්ෂ වන්දනාව

වෘක්ෂ වන්දනාව යනු ඒ පිළිබඳව ඇති තාක්ෂණික නමයි. පැරණි ඉන්දියාවේ භූතයන් හෝ දෙවිවරුන් ගස්වල වාසය කරන බව විශ්වාස කෙරුණි. විශේෂයෙන්ම විශාල, පැරණි සහ දඟර ගැසුණු ගස් සහ වෘක්ෂ වන්දනාව වර්තමාන ඉන්දියාවේ මෙන්ම ජනප්‍රිය ආගමක වැදගත් කොටසක් විය. ග්‍රීකයන්ටද එවැනිම විශ්වාස තිබුණි. ඔවුන් රුක් දෙවියන් ලෙස හැඳින්වුණි. ත්‍රිපිටකයේ ඔවුන් හඳුන්වා ඇත්තේ රුක්ඛදේවතා, වනදේවතා, හෝ ආරාමදේවතා ලෙසය (M.I,307; S.IV,302). සමහර ගස් ප්‍රාර්ථනා ගස් (රුචරුක්ඛ) යනුවෙන් හඳුන්වනු ලබන අතර, ප්‍රාර්ථනා වලට සවන්දෙන, හෝ වඩාත් නිවැරදිව, එම ගස්වල සිටින දේවතාවන් එසේ කරන බව විශ්වාස කෙරේ. එමෙන්ම සමහර ඖෂධවල ඇති සුවකිරීමේ බලය ඇත්තේ ඒවායේ ජීවත්වන දේවතාවන් නිසා බව විශ්වාස කෙරේ. ගස් කපන්නෙක් ගස කපන්නට පෙර, එහි පදිංචි දේවතාවන්ට තමන්ගේ අදහස පවසා එයට පූජා පවත්වයි (Ja.I,442; IV,114).

දෙවියන්ට නමස්කාර කිරීම සඳහා ඉඳහිට කළ

ආකාරයට, බුදුපියාණන් වහන්සේ ගස් වන්දනා කිරීම අනුමත කළ ස්ථානයක් ත්‍රිපිටකයේ නොමැත. ධම්මපදයේ උන්වහන්සේ මෙසේ සඳහන් කළහ: ''භීතියෙන් ඇලලී ගිය මිනිස්සු පූජනීය කඳු, වනාන්තර, වතු, ගස් සහ සිද්ධස්ථානවලට යති. නමුත් මේවා ආරක්ෂිත රැකවරණ නොවේ. හොඳම රැකවරණය නොවේ. එහි යාමෙන් සියලු දුකෙන් මිදෙන කෙනෙක් නැත'' (Dhp.188-9). උන්වහන්සේ මෙසේ ද පැවසූහ: ''මිනිස්සු ගස්වල ජීවයක් (එනම්, භූතයන් හෝ දේවතාවන්) (Vin.III,156) ඇතැයි සාමාන්‍යයෙන් සිතති''. මෙය පුළුල් මතයක් වන නමුත්, තමන්වහන්සේ එය පිළිගත් එකක් නොවන බව උන්වහන්සේ අඟවති. ජාතක කථා කිහිපයක වෘක්ෂ වන්දනාව පිළිබඳව උසුළු විසුළු කෙරේ. බලන්න **බෝධි වෘක්ෂය සහ පැළැටි**

## දැඩි විශ්වාසය

දැඩි විශ්වාසය (විස්සාස හෝ සද්දහති) යනු යම් කෙනෙකු යහපත්, අවංක සහ හානිකර නොවන බව උපකල්පනය හෝ විශ්වාස කිරීමයි. මෙහි ඉංග්‍රිසි වචනය එන්නේ ට්‍රෙවි යන මධ්‍යම ඉංග්‍රීසි වචනයේ විශ්වාස කටයුතු යන අර්ථයෙන් වන අතර එය 'දැඩි විශ්වාසය' යන වචනයට සම්බන්ධ වේ. යම් කෙනෙකු විශ්වාස කිරීම ත්‍යාගශීලී ක්‍රියාවක් වන අතර, එය ඔවුන්ට දිය හැකි උතුම්ම අනුග්‍රයයි. මිනිස්සු තමන් විශ්වාසවන්ත පුද්ගලයෙකු ලෙස සැලකීම අගය කරති. සාමාන්‍යයෙන් ඔවුහු තමන් විශ්වාසවන්තයෙකු ලෙස සැලකීම පෙරළා සාධාරණීය කිරීමට වගබලා ගනිති. විශ්වාසවන්ත

භාවයට සුදුසු වීමට පුද්ගලයෙකු ශික්ෂාපදවලට අවංක විය යුතුයි. අප විශ්වාසවන්තව සිටිමින් අනෙක් අය විශ්වාස කළ විට, අපි අවංක සහ වැදගත් දායකත්වයක්, වඩාත් ප්‍රසන්න සහ සාමුහික සමාජයක් වෙනුවෙන් කරන්නෙමු. එසේම අපි සැබෑ වටිනාකමක් ඇති මිත්‍රත්වයන් ද ගොඩ නගන්නෙමු. බුදුපියාණන් වහන්සේ විශ්වාසය 'හොඳම ඥාතියා' Dhp. 204) (විස්සාසා පරමා ඤාතී,) වශයෙන් හැඳින්වූයේ ද මේ නිසා විය හැකිය. ජාතක කථාවේ මෙසේ සඳහන් වේ: 'ඔබේ විශ්වාසයට සුදුස්සා සහ පෙරළා ඔබ විශ්වාස කරන්නා, ඔබට සවන් දෙන්නා සහ ඔබ කෙරෙහි ඉවසන පුද්ගලයා, යන්නේ කොහේද, ඔහු අනුගමනය කරන්න' (Ja.IV,525).

එයට හේතුව විශ්වාසය පැකිළීම සහ සැකයෙන් බරක්, කරදරයක් වන්නේ නැති නිසා එය යම් නිශ්චිත හැකියාවන් අපට විවෘත කිරීමයි. එහි ආධ්‍යාත්මික දියුණුව සඳහා වැදගත් කාර්යභාරයක් ඇත. සමහර මිනිස්සු ප්‍රඥාවෙන් සොයා බලා ධර්මය පිළිගනිති. එය සම්පූර්ණයෙන්ම පැසසිය යුතුයි. කෙසේ නමුත්, එය එකම ප්‍රවේශය නොවේ. සමහර මිනිස්සු ධර්මයට සවන් දෙති. හුදෙක්ම අසන දේ විශ්වාස කරති. එවැනි මිනිසුන් 'නිවැරදි ස්ථාවර මාවතකට අවතීර්ණ වී, උත්තරීතර පුද්ගලයාගේ තලයට ඇතුළු වී සාමාන්‍ය මිනිසුන්ගේ තලය ඉක්මවා ගොස් ඇත' යනුවෙන් බුදුපියාණන් වහන්සේ පැවසූහ. කිසිම පහත් තලයක නැවත ඉපදීමට හේතුවිය හැකි කිසිම ක්‍රියාවක් ඔවුන් නොකරනු ඇත. ඔවුන්ගේ ජීවිතය අවසන් වීමට පෙර ඔවුන් නිර්වාණයේ පළමු අදියර කරා ළඟවනු ඇත' (S.III,225). බලන්න **ඇදහිල්ල සහ විශ්වාසදායක බව**.

## සත්‍යය

සත්‍යය, (සච්ච හෝ තච්ඡ) යනු කථාවට, ලිවීමට හෝ යථාර්ථයට ගැලපෙන අවබෝධයක් වන අතර, එය නිවැරදිව වටහා ගතහොත්, එම යථාර්ථය පිළිබඳ වඩාත් නිවැරදි සහ පූර්ණ අවබෝධයක් ලබා ගත හැකිය. සත්‍යය වර්ග දෙකකි, ලෞකික සහ ලෝකෝත්තර වශයෙනි. යම් කෙනෙකු 'දැන් වහිනවා' සහ 'දැන් වහිනවා' යැයි පවසන්නේ නම්, එම කියමන සත්‍යය යැයි කිව හැකිය. කෙසේ නමුත්, මෙය ලෞකික සත්‍යයකි. එයට හේතුව, එහි ඇත්තේ සීමිත වටිනාකමක් නිසාය. අනෙක් අතට, කෙනෙකු මෙසේ කියයි නම්: 'ලෝභය අතෘප්තබව ඇති කරයි' සහ එය සැබැවින්ම එසේ කරයි, මෙය ලෝකෝත්තර සත්‍යයකි. එයට හේතුව, එම සත්‍යය අවබෝධ කරගත හොත්, සැලකිල්ලට ගතහොත්, එය කෙනෙකුගේ ආකල්ප, ජීවිතය සහ අවසානයේ කෙනෙකුගේ දෛවය මූලික වෙනස්කමකට මඟ පෙන්විය හැකිය. සමහර සත්‍යයන් අර්ධ වශයෙන් සත්‍යයක් විය හැකිවන අතර, ඒවා යථාර්ථයේ සමහර කරුණුවලට ගැලපේ, නමුත් අනෙක් ඒවාට නැත. කෙසේ නමුත්, එක සත්‍යයක් අනෙකට පටහැනි විය නොහැකිය. යම් පුද්ගලයෙකු මෙසේ කියන්නේ නම් :'දෙක එකතු කිරීම දෙක පහට සමානයි,' මෙම ප්‍රකාශ දෙකෙන් එකක් හෝ වෙනත් එකක් අසත්‍ය විය යුතුයි. ඒ අනුව, බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: 'සත්‍යය එකකි', (එකං හි සච්චං, Sn.884) සහ ජාතක පොතේ මෙසේ කියයි: 'අවයවයක් බේරා ගැනීමට ධනය අත්හරින හෝ තමන්ගේ ජීවිතය බේරා ගැනීමට අවයවයක් අත්හරින කෙනෙකු සත්‍යය වෙනුවෙන් ධනය, අවයව, ජීවිතය,

සැබැවින්ම සියලු දේ අත්හැරීමට සූදානම් විය යුතුය' (Ja.V,500).

බුදුපියාණන් වහන්සේ විසින් ඉගැන්වූ ඉතාම වැදගත් ලෝකෝත්තර සත්‍යය නම් චතුරාර්ය සත්‍යයයි. කෙසේ නමුත්, උන්වහන්සේ තවත් සත්‍යයන් හතරක් ඉගැන්වූහ. ඒවා හඳුන්වන්නේ සතර බ්‍රහ්ම විහරණ (බ්‍රහ්මණ සච්ච) වශයෙනි. ඒවා, 1. සියලු සත්ත්වයන් දෙස බැලිය යුත්තේ පිළිගැනීමෙන්ය, 2. ඉඳුරන් පිනවීම අස්ථීර සහ අසතුටුදායක, 3. පවතින සියලු තත්ත්වයන් අනිත්‍ය සහ අසතුටුදායක සහ අවසානයේ 4. මම,මා හෝ මගේ යන දෙයක් නොමැති බව යනාදිය. මෙම සත්‍යයන් අවබෝධ කරගත් විට, කෙනෙකු තුළ සියලු සත්වයන් කෙරෙහි කරුණාව සහ සංවේදනය (අනුද්දයාය අනුකම්පාය) ඇති වේ. එවිට කෙනෙකුට ඉඳුරන් පිනවීම සහ පැවැත්මේ තත්ත්වයන් පිළිබඳව උනන්දුව නැති වේ. එවිට කෙනෙකු කිසිවක් නැත යන මාර්ගය පුරුදු පුහුණු කරනු ඇත', බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.II,176-7).

බුදුපියාණන් වහන්සේ සත්‍යය කථා කිරීම පිළිබඳව ඉහළින්ම අවධාරණය කළහ. සම්මා වාචාවේ පළමු සහ වැදගත්ම ගතිලක්ෂණය වන්නේ එය කෙනෙකුගේ හොඳම අවබෝධයට අනුව සත්‍ය වීමයි. බුදුපියාණන් වහන්සේ පැවසුවේ ධර්මය සමග එකඟ වන කථාවේ: 'කෙනෙකු අසත්‍යය කථා කිරීමෙන් වැළකිය යුතුයි. උසාවියට කැඳවූ විට, පරීක්ෂණයකදී, පවුලේ එක්වීමකදී, සමාජයේදී හෝ රජෙකු ඇසූ විට, : ''ඉතින් යහපත් මිනිසා, ඔබ දන්නා දේ අපට කියන්න''. ඔහු දන්නේ නැතිනම්,

ඔහු කියන්නේ ''මම දන්නේ නැහැ''. ඔහු දන්නේ නම්, ඔහු කියන්නේ ''මම දන්නවා''. ඔහු දැක්කේ නැති නම්, ඔහු කියන්නේ ''මම දැක්කේ නැහැ'' සහ ඔහු දැක්කේ නම්, ඔහු කියන්නේ ''මම දැක්කා''. ඔහු ඔහුගේ වාසියට හෝ තවත් කෙනෙකුගේ වාසියට හෝ යම් සුළු වාසියකට දැන දැනම බොරු නොකියයි' (M.I,288).

සම්පූර්ණ සත්‍යය සහ සාපේක්ෂ සත්‍යය (පරමාර්ථ සත්‍ය සහ සංවෘත සත්‍ය) යන මහායාන ධර්මයේ එන සත්‍ය දෙක ත්‍රිපිටකයේ නැත. බලන්න **අනුකූලතාව සහ විශ්වාසවන්තකම**
*The Early Buddhist Theory of Knowledge*, K.N. Jayatilleke, 1963.

## පාත්‍රය අනෙක් පසට හැරවීම

පැවිදි සඞ්ඝයා සහ ගිහි ප්‍රජාව 'අන්‍යෝන්‍ය රඳා පැවැත්මෙන් එකට ජීවත්වීම' (අඤ්ඤමඤ්ඤං නිස්සය, It.111) බව බුදුපියාණන් වහන්සේ සිතූහ. භික්ෂූන් වහන්සේලා සහ භික්ෂුණීන් සාමාන්‍යයෙන් ගිහියන්ගේ, ගුරුවරුන්ගේ කාර්යභාරය ඉටු කළහ. නමුත් සමහර අවස්ථාවල මෙම තත්ත්වය විරුද්ධ පැත්තට හැරවුණි. උදාහරණ වශයෙන් ප්‍රමාණවත් තරම් උගත් නැති භික්ෂූන්ට ඉගැන්වීමට තරම් චිත්ත නමැති ගිහියා ධර්මය උගත් සහ දක්ෂ විය (S.IV,282-8). එසේම භික්ෂුවකගේ හෝ භික්ෂුණියකගේ හැසිරීම ගිහියන්ගේ දොස් පැවරුම්වලට හෝ ප්‍රතිලෝම වශයෙන් ලක්වීමට අවස්ථා එළඹිය හැකි බව ද බුදුපියාණන් වහන්සේ අවබෝධ කරගත්හ. භික්ෂූන් වහන්සේ කෙනෙකු හෝ භික්ෂුණියක ප්‍රතික්ෂේප කිරීම සඳහා උන්වහන්සේලා පිඬුසිඟා වැඩිවිට ඒවා

ලබාදීමෙන් වැළකීම ද සිදු විය හැකි බව උන්වහන්සේ පැවසූහ.

විවරණවලට අනුව, කෝසම්බීවලදී භික්ෂූන් අසැබි ලෙස දබරයකට ගොදුරු වූ විට, ගිහියන් තීරණය කළේ, 'ඔවුන්ට ගෞරව කිරීම සඳහා ආචාර කිරීම හෝ අභිනය කිරීම හෝ ඔවුන් පැමිණි විට දානය නොදීමට' යි (Ja.III,409). මේ නිසා ඉතා ඉක්මණින්ම භික්ෂූන් වහන්සේලාට කරුණු වැටහුණි. ඒ හා සමානවම, භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට ගිහි පිරිස කෙරෙහි ඇති අප්‍රසාදය පළ කිරීම සඳහා 'පාත්‍රය අනෙක් පසට පෙරළීමෙන්' (පත්තම් නික්කුජ්ජෙය්‍ය), දානය පිළිගැනීම ප්‍රතික්ෂේප කළහ. භික්ෂූන්ට එසේ කිරීම සඳහා සලකා බැලිය යුතු කොන්දේසි බුදුපියාණන් වහන්සේ පහදා දුන්හ. ඒවා සියල්ලම යම් ආකාරයකින් භික්ෂූන් වහන්සේලාට අවාසිදායක ලෙස සැලකේ (Vin.II,125). කෙසේ නමුත්, දානය දෙන ගිහියා ඒවා ලබාගෙන ඇත්තේ දුරාචාරමය මාර්ගයකින් යැයි එම භික්ෂුව දන්නේ නම්, ඔහුට එය පිළිගැනීම ප්‍රතික්ෂේප කළ හැකිය. 2007 වසරේදී බුරුමයේ පැවති විරෝධතා සමයේ, ඒ පිළිබඳව වඩාත් දැනුවත් බොහෝ භික්ෂූහු රජයේ නිලධාරීන්ගේ පවුල්වලින්, හමුදා නිලධාරීන්ගෙන් සහ හමුදා කල්ලිවල ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ගේ පවුල්වලින් දානය ලබා ගැනීම ප්‍රතික්ෂේප කළහ.

## උදාන

බුදුදහමේ පූජනීය ධර්ම ග්‍රන්ථවන ත්‍රිපිටකයේ දෙවන කාණ්ඩයේ සූත්‍ර පිටකයේ පස්වන කොටසේ ඛුද්දක නිකායේ කුඩා ග්‍රන්ථයකි උදාන ය. එය ධර්ම දේශනා 80කින් සමන්විත වන අතර, ඒවා දේශනා කිරීමට මූලික වූ අවස්ථාව සහ බුදුපියාණන් වහන්සේ ඒවායේ බොහොමයක අවසානයේ කෙටි පැදි ප්‍රකාශ කිරීමට හේතුත් සඳහන් වේ. උදාන යන වචනයේ අර්ථය 'ප්‍රබෝධ කරන කියමන්' හෝ ආධ්‍යාත්මික සදාචාරාත්මක උත්තේජනය ඇති කරන කියමන්' වන අතර, බුදුපියාණන් වහන්සේ ඒ සෑම පැදියක්ම පැවසුවේ නිරායාසයෙන්මය යන කාරණයද මතුකර ඇත.
*Udāna, Inspired Utterances of the Buddha*, trans. by J.D.Ireland, 1990.

## අවිඥානය

අවිඥානය යනු මනසේ අප නොදන්නා කොටසයි. අවිඥානය පිළිබඳ නූතන සංකල්පය වර්ධනය කරන ලද්දේ සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් විසිනි. වරදකාරීත්වය, ලැජ්ජාව සහ දේපළ පිළිබඳ ප්‍රබල හැඟීමක්, අනවශ්‍ය ආශාවන්, පෙළඹවීම් හෝ මතකයන් අවිඥානය තුළට තල්ලු කරන නමුත්, තවදුරටත් එයින් ඇතිවන බලපෑම ගැන පුද්ගලයා නොදන්නා බව ඔහු ඉගැන්වූයේය. අවිඥානක පුද්ගලයා, මානසිකව සතුටු සහ පරිණත පුද්ගලයෙකු කළ හැක්කේ ඔහු සවිඥාණක කරවීමෙන්ම පමණක් බව ද ෆ්‍රොයිඩ් පැවසුවේය. මෙය සිදු කළ යුතුව තිබුණේ, නිදහස්

සම්බන්ධය නමැති විධි වේදය භාවිත කරමින්, සිහින විශ්ලේෂණය සහ මානසික විශ්ලේෂකයෙකුගේ මග පෙන්වීම යටතේ බව ඔහු පැවසුවේය. අවිඥානය යන සංකල්පයට සැබැවින්ම පිළිගැනීමක් තිබෙන සහ මනස පිළිබඳ බෞද්ධ අවබෝධයට පටහැනි නොවන නමුත්, එය සවිස්තරව බෞද්ධ මනෝවිද්‍යාවේ නැත. එයට හොඳ හේතුවක් ඇත. ප්‍රබල, නොපසුබටව කරගෙන යන, විවේචනාත්මක නොවන සිහිකල්පනාවක් දියුණු කිරීමෙන් සහ ඊට පසු මනස කෙරෙහි හැරවීමෙන් මනසේ බොහෝ සැඟවුණු රහස් තැන් හෙළි වන බව බුදුපියාණන් වහන්සේ අනාවරණය කර ගත්හ. මෙය එසේ වුවද, සවිඥානක සහ අවිඥානක මනස අතර තියුණු සහ අවසානයේ පදනම් රහිත වෙන්කොට හඳුනා ගැනීමක් කිරීමට අවශ්‍ය නොවීය.
*Buddhist and Freudian Psychology*, Padmasiri de Silva, 1975.

## සම්මා දිට්ඨි

සම්මා දිට්ඨි (සම්මා දිට්ඨි) යනු බුදුපියාණන් වහන්සේගේ ආර්යඅෂ්ටාංගික මාර්ගයේ පළමුවෙනි පියවරයි. මෙහි ඉංග්‍රීසි වචනයේ පදගත අර්ථය වන්නේ, එය (ආර්යඅෂ්ටාංගික මාර්ගය) හොඳින් දැන ගැනීමට 'පිළිපැදිය යුතු', 'වඩා ළංවිය යුතු' යන අදහසයි. දිට්ඨි යන පාලි වචනයේ පදගත අර්ථය 'දර්ශනය'යි. එම නිසා, සම්මා දිට්ඨි යනු මනසේ එම ගුණාංග වැඩි දියුණු කිරීමයි. එයින් පුද්ගලයෙකුට දේවල් පිළිබඳව සම්පූර්ණ සහ යථාර්ථවාදී අවබෝධයක් ඇති කර ගැනීමට නැතහොත් බුදුපියාණන් වහන්සේ නිතරම පැවසූ ආකාරයට 'දේවල් පිළිබඳව දැනුමක් සහ දර්ශනයක් එහි සැබෑ

ස්වරූපයෙන්ම' දැන ගැනීමට ඉඩ ලැබේ (e.g. S.III,59).

සම්මා දිට්ඨිය දියුණු කිරීමට උපකාර වන සමහර ආකල්ප වශයෙන් අනෙක් අයගේ අදහස් මත විශ්වාසය තැබීමට වඩා, යමක් පිළිබඳව සෘජු අත්දැකීමක් ලැබීමට උත්සාහ කිරීම, පූර්ව නිගමනවලට එළඹීම නොමැතිවීම, තීරණ ගැනීමේදී පැන පැන නොයෑම, විවිධ පැහැදිලි කිරීම්වලට විවෘත වීම, තීරණ ගැනීමට කාලයක් ගැනීම, තමන්ගේ අදහස්වලට විරුද්ධ අදහස් කරුණු සහිතව ඉදිරිපත් කළ විට, ඒවා වෙනස් කරගැනීමට සූදානම් වීම, සම්පූර්ණ දෙයක් ලෙස කොටසක් පමණක් වරදවා තේරුම් නොගැනීම ආදිය ඇතුළත් වේ. මේ සියලු ආකල්ප බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්ම දේශනා එකක හෝ තවත් එකක සඳහන් කර ඇත. අනෙක් අයට සවන් දීම, අවධානයෙන් යුතුව අසා සිටීම, සාකච්ඡා කිරීම, ගුණවත් බව සහ සන්සුන් මනසක් තිබීම යන මේ සියලු දේ සම්මා දිට්ඨිය දියුණු කිරීමට උපකාර වන බව සාරිපුත්ත මහරහතන් වහන්සේ පැවසූහ (M.I,294). ඉතා පැහැදිලිව, සම්මා දිට්ඨිය නොවෙනස්වන අදහසකට, විශ්වාසයකට හෝ මතයකට වඩා ක්‍රියා මාර්ගයකි. මෙම ක්‍රියා මාර්ගයේ කූටප්‍රාප්තිය සහ පරිසමාප්තිය වන්නේ අර්හත්ඵලයට පැමිණීමයි.

## බුදුදහමේ එකමුතුව

බාහිර පුද්ගලයෙකුට හෝ බුදුදහම පිළිබඳව හොඳින් නොදන්නා පුද්ගලයෙකුට, බුදුදහමේ අනේක ගුරුකුල සහ සම්ප්‍රදායන් එකිනෙකා අතර ඇත්තේ සුළු හෝ සමාන කිසිවක් නැති, ස්වභාවයෙන් හා

ගුණයෙන් වෙනස් ලෙස පෙනෙන්නට පුළුවනි. තමන් බෞද්ධයන් ලෙස හඳුනා ගන්නා සමහර සුළු නිකායන් සහ ලබ්ධීන් සැබැවින්ම එසේ නොවන බව සත්‍යයක් වුව ද, සියලු අවංක බෞද්ධ සම්ප්‍රදායන් ඇතැම් පොදු ලක්ෂණ බෙදා ගනී, පිළිපදී. 1967දී රටවල් 25කින් බෞද්ධයන් නියෝජනය කරමින් සියලු බෞද්ධ ශාඛා සහ සම්ප්‍රදායන්ගෙන් සැදුම් ලත්, ලෝක බෞද්ධ සඬ්ග සභාවේ පළමු සම්මේලනයේදී ***ථේරවාද සහ මහායාන මූලික කරුණු ඒකාබද්ධ කිරීම*** නමින් හඳුන්වන පොදු ගිවිසුමේ ලේඛනයකට අවධානය යොමු කළහ. මෙම ලේඛනය සියලුම බෞද්ධයන් විසින් පිළිපදින ලද ඒකාබද්ධ කිරීමේ ප්‍රතිපත්තිවල සංක්ෂිප්ත රීතියක් වන අතර, එය සභාවට සහභාගී වූවන් විසින් ඒකමතිකව අනුමත කරන ලදී. එම ප්‍රකාශයේ මෙසේ සඳහන් වේ:

1. බුදුපියාණන් වහන්සේ අපගේ එකම ප්‍රධානියාය (ගුරුවරයා සහ මගපෙන්වන්නා).
2. අපි බුදුන්වහන්සේ, ධර්මය සහ සඬ්ගයා (තිසරණ) සරණ යමු.
3. අපි මේ ලෝකය දෙවිකෙනෙකු විසින් මවන ලද්දේ යැයි සහ පාලනය කරන්නේ යැයි විශ්වාස නොකරමු.
4. ජීවිතයේ ඇති අරමුණ වන්නේ සියලු සත්ත්වයන් කෙරෙහි වෙනස් කමකින් තොරව කරුණාව දියුණු කිරීමට සහ ඔවුන්ගේ යහපතට, සතුටට සහ සැනසීමට කටයුතු කිරීම, සහ අත්‍යන්ත සත්‍ය අවබෝධ කිරීමට ප්‍රඥාව (පඤ්ඤා) දියුණු කිරීම බව අපි සලකමු.

5. අපි චතුරාර්ය සත්‍ය වූ, දුක්ඛ, දුක්ඛ ඇතිවීම, දුක්ඛ නැති කිරීම, සහ දුක්ඛ නැති කිරීමේ මාර්ගය, සහ හේතු ඵල දහම (පටිච්චසමුප්පාද) පිළි ගනිමු.
6. සියලු තත්ත්වාරෝපිත දේවල් (සංඛාර) සහ අනිත්‍යය (අනිච්ච) සහ දුක්ඛ, සහ සියලු තත්ත්වාරෝපිත සහ තත්ත්වාරෝපිත නොවන දේ (ධම්ම) වල ආත්මයක් (අනත්ත) නැත.
8. නිර්වාණයට පාදක වන ගුණාංග තිස් හතම (බෝධිපක්ඛිය ධම්ම) බුදුපියාණන් වහන්සේ විසින් නිර්වාණයට මග ලෙස ඉගැන්වූ විවිධ වූ කරුණු ලෙස අපි පිළිගනිමු.
බෝධි හෝ නිර්වාණයට පත්වීමට මාර්ග තුනක් ඇත, නම් වශයෙන්, ශ්‍රාවකයෙකු වශයෙන් (සාවක), පච්ඡේකබුද්ධ වශයෙන් සහ සම්මා සම්බුද්ධ (සම්පූර්ණයෙන්ම සහ නොඅඩුව සම්බුද්ධත්වයට පත් වූ) වශයෙනි. බෝධිසත්වයෙකුගේ වෘත්තීය අනුගමනය කිරීම සහ අන් අය ගලවා ගැනීම සඳහා එය ඉහළම, උතුම්ම, සහ වඩා වික්‍රමවාන්විත බව අපි පිළිගනිමු.
9. විවිධ රටවල, බෞද්ධ විශ්වාස සහ පුහුණුව සම්බන්ධයෙන් විවිධ වෙනස්කම් ඇති බව අපි පිළිගනිමු. මෙම බාහිර ස්වරූප සහ කියමන් බුදුපියාණන් වහන්සේගේ මූලික ඉගැන්වීම් සමග පටලවා ගත යුතු නොවේ. (ධර්මය පිළිබඳ සියලු භාෂිතය සඳහා සංස්කෘතයෙන් ද ආරම්භයේ භාවිතා කර ඇත.)

## විශ්වවාදය (සියලු මිනිසුන්ගේ විමුක්තිය ගැන විශ්වාස කිරීම)

විශ්වවාදය යන යෙදුම ආගම තුළ භාවිත වන සංකල්ප දෙකකට යොමු වේ. ඒ 1. ආගම යන අදහසේ අර්ථය හුදෙක් යම් ජාතියකට, ගෝත්‍රයකට, කුලයකට හෝ ලිංගභේදයකට වඩා, සියලු මනුෂ්‍ය වර්ගයා සඳහා හෝ 2. සෑම කෙනෙකුම, ඔවුන්ගේ ආගම කුමක් වුවත්, ඒ සියලු දෙනා ආරක්ෂා වන බව, නිර්වාණයට පත් වන බව, හෝ විමුක්තිය ලැබෙන බවයි. විශ්වවාදයේ විරුද්ධ අර්ථය විශේෂත්වවාදයයි (විමුක්තිය ලැබෙන්නේ සුවිශේෂ පුද්ගලයාට පමණක් යන්න). මෙම පළමු අර්ථයෙන්, පැරණිතම විශ්වීය ආගම බුදුදහමයි. බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේ හැඳින්වූයේ 'දෙවියන්ගේ සහ මිනිසුන්ගේ, එනම්, තර්කනයේ සහ තේරුම්ගැනීමේ හැකියාවක් ඇති සියලු සත්ත්වයන්ගේ ගුරුවරයා' (සත්ථාදෙවමනුස්සානං) වශයෙනි. ගස් පවා ඒවාට තේරුම් ගැනීමේ හැකියාවක් තිබුණේ නම්, ධර්මය වැළඳ ගනු ඇතැයි වරක් බුදුපියාණන් වහන්සේ පැවසූහ, 'එසේ නම් කෙතරම් මිනිසුන් ද?' (A.II,194). උන්වහන්සේ පළමු ශ්‍රාවකයන් බිහි කළ පසු, 'බොහෝ දෙනාගේ යහපත පිණිස, බොහෝ දෙනාගේ සතුට පිණිස, ලෝකය කෙරෙහි අනුකම්පාවෙන්' ධර්මය දේශනා කරන මෙන් උපදෙස් දුන්හ' (Vin.I,20).

එකල බ්‍රාහ්මණ ආගමේ තිබූ ඉතා දැඩි විශේෂත්වවාදය සැලකිල්ලට ගත් විට, බුදුපියාණන් වහන්සේගේ විශ්වවාදය විශේෂයෙන්ම සිත්

ඇදගන්නා සුළු වේ. හින්දු ග්‍රන්ථ සහ නීති පොත් අවධාරණය කරන්නේ පහත් කුල සහ රොඩී කුලවල මිනිසුන් සහ විදේශිකයන්ට (ම්ලීච) ධර්ම ග්‍රන්ථ කියවීම, පූජනීය පිළිවෙත්වලට සහභාගීවීම හෝ පන්සල්වලට ඇතුළු වීම තහනම් වේ. නමුත්, බොහෝ නූතන හින්දු ප්‍රතිසංස්කරණ කරන්නන් සහ නූතන මත දරන්නන් එවැනි සීමාකිරීම් දැන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

විශ්වවාදය යන පදය භාවිත කරන දෙවන අර්ථයෙන් ගත් කල, බුදුදහම විශ්වවාදී ආගම් කිහිපයෙන් පළමු සහ තවමත් විශ්වවාදී ආගම් ස්වල්පයෙන් එකකි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ 'පිටත සත්‍යවූ ශ්‍රමණයෙකු නැත' (සමණෝ නත්ථි බාහිරෙ, Dhp.254). සමහර විට මෙය අර්ථකථනය කරන්නේ බුදුදහමින් පිටත (බාහිර), කිසිම කෙනෙකුට නිර්වාණය අවබෝධ කරගත නොහැකි බවයි. කෙසේ නමුත්, සැබැවින්ම එය පවසන සියල්ල නම්, බුදුපියාණන් වහන්සේගේ පැවිදි ශ්‍රාවකයන් හැර, කිසිදු භික්ෂුවකට භික්ෂුණියකට අවංක ශ්‍රමණයෙකු වීමට සුදුසුකම් නැති බවයි. බුදුපියාණන් වහන්සේ එය පැවසූ අවස්ථාවේදී ද එය එසේ වන්නට ඇත.

වෙනත් නිකායන්හි හෝ ආගම්වල භික්ෂූන් වහන්සේලා හෝ පූජකයන්ගෙන් කෙනෙකු නිර්වාණයට පැමිණ ඇත්දැයි වරක් කෙනෙක් බුදුපියාණන් වහන්සේගෙන් ඇසුවේය (Sn.1081). උන්වහන්සේ පිළිතුරු දුන්හ: 'සියලුම භික්ෂූන් වහන්සේලා සහ පූජකයන් උපතේ සහ මරණයේ (සංසාර) ආවරණය වී ඇතැයි මම නොකියමි.

ඉඳුරන්ගේ අත්දැකීම්වලට හෝ **සදාචාරයට** සහ නීති රීතිවලට ඇලී නොසිටින, සැකයන් අත්හළ, තණ්හාවෙන් සහ කෙලෙස්වලින් නිදහස් ඕනෑම කෙනෙකු, ඔහු හෝ ඇය නිර්වාණය අවබෝධ කරගෙන ඇති බව මම කියමි' (Sn.1082). ඒ අනුව, බුදුපියාණන් වහන්සේගේ පිළිතුර, කෙනෙකුට අවසාන විමුක්තිය ලබා ගත හැක්කේ උන්වහන්සේගේ ධර්මය තුළ පමණක්ය යන බවට කළ සම්පූර්ණ ප්‍රකාශයක් නොවීය. නමුත්, ඒ වෙනුවට 'එය රඳා පවතී'. තවත් අවස්ථාවකදී කෙනෙකු උන්වහන්සේගෙන් ඇසුවේ, අනෙක් ආගම්වල අයට අර්හත් ඵලය, නිර්වාණය, ලැබිය හැකිය යන්න උන්වහන්සේ ප්‍රතික්ෂේප කරන්නේ ද යන්නයි. උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ, **'අනෙක් අයට අර්හත් ඵලය ලැබිය හැකිය යන්න මම ප්‍රතික්ෂේප නොකරමි' (න ඛො... අර්හත්තස්ස මච්ඡරායාමි, D.III,7). තවත් ධර්ම දේශනාවකදී බුදුපියාණන් වහන්සේ ස්ථිරව ප්‍රකාශ කර සිටියේ සමහර මිනිසුන් 'වෙනස් කළ නොහැකි මාර්ගයකට ඵළඹෙන බවත්, (ඔක්කමති නියාමං) එයින් ඔවුන් බුදුපියාණන් වහන්සේ කිසි දිනක නොදුටුවත්, හෝ උන්වහන්සේගේ ධර්මය නොඇසුවත්, නිර්වාණයට මඟ පෙන්වන බවයි** (A.I,121).

නිර්වාණයට පත්වීම රඳා පවතින්නේ දෙවිකෙනෙකුගේ අනුමැතිය දිනා ගැනීමෙන් හෝ අනුග්‍රහයක් ලබා ගැනීමෙන් නොවේ. නමුත්, සෑම කෙනෙකුටම කළ හැකි යම් නිශ්චිත ස්වාභාවික සත්‍යයන් අවබෝධ කර ගැනීමෙන්ය. තත්ත්වය එසේ තිබියදී, ධර්මය කිසි දිනක අසා නැති අයට පවා

නිර්වාණයට පත් විය හැකි බව සිතාගත හැකිය. කෙසේ නමුත්, මෙය පැවසිය හැකිය, බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට විවෘතවීමෙන් ඒ පිළිබඳව ඇගයීමට වැඩි ඉඩ කඩක් ඇත. බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් ඇගයීම එය පුහුණුව සඳහා කැමැත්තක් ඇති වීමට වැඩි ඉඩ කඩ ඇත. බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් පුහුණු කිරීමෙන් නිර්වාණයට පත්වීමට බොහෝ වාරයක් සම්භාවිතාව ඇත.

*The Buddhist Attitude to Other Religions*, K. N. Jayatilleke, 1975.

## විශ්වය

විශ්වය (ලොකධාතු) යනු මුළු අවකාශය සහ එහි ඇති සියලු දේවල්ය. විශ්වයේ ඇති සියලු පැරණි සංකල්ප අතරින්, වඩාත් යථාර්ථවාදී වන්නේ බුදුපියාණන් වහන්සේගේ සංකල්පයයි. උන්වහන්සේට අනුව, විශ්වයට අත්‍යන්ත ආරම්භයක් හෝ අවසානයක් නැත (S.II,178). නමුත්, ඊට වඩා විශාල කාලයක් තුළ, ක්‍රමයෙන් ඇති වී යයි, අහෝසි වී යයි, සහ නැවත ක්‍රමයෙන් ඇති වී යයි (D.III,84). විශ්වය තුළ, මන්දාකිණිවලට අනුරූප වෙන ගණන් කළ නොහැකි තරම් ලෝක පද්ධති (ලොකධාතු) ඇත. බුදුපියාණන් වහන්සේ පැවසුවේ මෙම ලෝක පද්ධති තුළ 'සූර්යෝ දහස් ගණන්, චන්ද්‍රයෝ දහස් ගණන්, මහාද්වීප දහස් ගණන්' (A.I,227) ඇති බවයි. 'අපගේ චන්ද්‍රයාගේ සහ සූර්යයාගේ ආලෝකය, බලවත් සහ මහේශාක්‍ය වුවත්, ඒවාට ළඟා විය නොහැකි ලෝක පද්ධති අතර, ඇති' කළු, අඳුරු ප්‍රදේශ' (M.III,124) ගැන ද බුදුපියාණන් වහන්සේ විස්තර කළහ. මෙම මන්දාකිණි අභ්‍යවකාශයේ

එකිනෙක අතර විශාල දුරින් තිබෙන බව උන්වහන්සේ අඟවා ඇත.

සමහර ආගම් විශ්වාස කරන්නේ විශ්වයේ පැවැත්ම පැහැදිලි කළ හැක්කේ එය නිර්මාණය කළ උත්තරීතර ජීවියෙකු විසින් පමණක් බවයි. නමුත්, බුදුදහම මෙය සලකන්නේ වැරදීමක් ලෙසයි. බුදුපියාණන් වහන්සේට අනුව, විශ්වය සහ එහි ඇති සියල්ල බිහි වූයේ ස්වාභාවිකව මිස සොබාදහම ඉක්මවූ හේතු නිසා නොවන බවයි. විසුද්ධිමග්ගයේ මෙසේ සඳහන් වෙයි: 'සංසාරය මැවූ දෙවියෙකු නැත, බ්‍රහ්මයෙකු නැත. හේතු සහ පවත්නා තත්ත්ව රාශියක් මත ප්‍රපඤ්ච හුදෙක් පෙරළෙයි' (Vism.603) .

## පරිකල්පනය කළ නොහැකි

පරිකල්පනය කළ නොහැකි දෙයක් යනු එය සිතීමට තරම් අප්‍රසන්න හෝ තේරුම් ගැනීමට අපහසු, හෝ කෙතරම් සිතුවත් එයින් කිසිදු පැහැදිලි අවබෝධයක් ලබා නොදෙන බවයි. බුදුපියාණන් වහන්සේ මෙහි සඳහන් අවසාන අර්ථයෙන් සිතාගත නොහැකි බව (අචින්තෙය්‍ය) යන යෙදුම භාවිත කරයි. උන්වහන්සේ මෙසේ පැවසූහ : 'මෙම සිතාගත නොහැකි කරුණු හතරක් ඇත, එනම්, ඒවා ගැන නොසිතිය යුතුයි, සිතීමෙන් කෙනෙකු උන්මත්තක හෝ ව්‍යාකූල වන කාරණා ගැන නොසිතිය යුතුයි. ඒ හතර මොනවාද? බුදුපියාණන් වහන්සේගේ අවබෝධයේ පරාසය ගැන සිතීම, ධ්‍යානවල පරාසය ගැන සිතීම, කර්මවල ප්‍රතිඵල ගැන සිතීම සහ ලෝකයේ මූලාරම්භය ගැන සිතීම' (A.II,80).

පරස්පර විරෝධී ලෙස, මෙම පළමු විෂයයන් තුන පිළිබඳව බෞද්ධ විවරණ ලිවීම විශාල ප්‍රමාණයකින් සිදු කර ඇත. අතීතයේ බෞද්ධ න්‍යායාචාර්යවරුන් සහ අභිධම්ම චින්තකයින් නිමක් නැති තරම් අනුමාන කර ඇත. බුදුපියාණන් වහන්සේගේ අවබෝධයේ ස්වභාවය ගැනත්, අතීත ක්‍රියා නිසා කුමන කර්ම ප්‍රතිඵල ඇති විය හැකි ද යන්න ගැනත්, එකිනෙකා සමග තර්ක කළහ. බලන්න **ධ්‍යාන සහ ලෝකය**

## උපාසක සහ උපාසිකා

බෞද්ධ ගිහි පිරිමි උපාසක සහ ගිහි කාන්තාවන් උපාසිකා ලෙසත් හැඳින් වේ. වචන දෙකම පැවත එන්නේ 'සමීපව වාඩිවීම' (උපාසති) සහ 'සහභාගී වීමට' (උපාසන) යනුවෙනි. ගිහි පිරිමින් සහ කාන්තාවන් බෞද්ධ ප්‍රජාවේ රැස්වන පිරිසගෙන් (චතුපරිසා) සතරගුණයෙන් භාගයකි. ඉතිරි භාගය භික්ෂූන් (භික්ඛු) සහ භික්ෂුණීන්ය (භික්ඛුනී). ධර්මය තුළ ගිහි ශ්‍රාවකයන් නොසිටියේ නම්, පූජනීය ජීවිතය අසම්පූර්ණ බව ත්‍රිපිටකයේ සඳහන් වේ (M.I,494). ගිහි බෞද්ධයෙකු වීමට කෙනෙකු ත්‍රිවිධ රත්නය සරණ යෑම සහ පංචශීලය පුහුණු කිරීම අවශ්‍ය බව බුදුපියාණන් වහන්සේ පැවසූහ (A.IV.222). සැබැවින්ම මෙය අවමයයි. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ සියලු ශ්‍රාවකයන්ගෙන් ඉහළම සදාචාරාත්මක, බුද්ධිමය සහ ආධ්‍යාත්මික අභිලාෂයන් අපේක්ෂා කළහ. ධර්මය සියලු දෙනාටම පොදුයි, එය සෑම දෙනාටම අවබෝධ කරගත හැකිය. ඒ නිසා එය සියලු දෙනා විසින්ම පුහුණු කළ යුතුයි. උන්වහන්සේ මෙසේ ද පැවසූහ: 'නිවැසියෙකු

හෝ පැවිදි කෙනෙකු හෝ වේවා, මම නිවැරදි පුහුණුව අගය කරමි. ඔවුන් නිවැසියෙකු හෝ පැවිදි කෙනෙකු වේවා. ඔවුන් නිවැරදි ආකාරයට පුහුණු කරන්නේ නම්, එවිට ඔවුන්ගේ නිවැරදි පුහුණුව නිසා, ඔවුන් සත්‍යයේ, ධර්මයේ, නිපුණත්වයේ ජයග්‍රහකයන් බවට පත් වේ' (S.V,19).

අද කාලයේ සමහර ගිහියන් සිතන්නේ ඔවුන් හුදෙක් බුදුපියාණන් වහන්සේ හෝ වෙනත් වැඳිය යුතු පුද්ගලයෙකුට නමස්කාර කළ පමණින් එය ප්‍රමාණවත් වන බවයි. බුදුපියාණන් වහන්සේ මෙයට එකඟ වනු ඇත. නමුත් සැබැවින්ම, අර්ථවත් නමස්කාරය යන්න පිළිබඳව උන්වහන්සේගේ අදහස හිස නැමීම, යාච්ඤා කරන ඉරියව්වෙන් අත්දෙක තබා ගැනීම සහ සිද්ධස්ථානවල මල් තැබීම වැනි දේවලින් වෙනස් කාණ්ඩයකට අයත්විය. උන්වහන්සේ මෙසේ පැවසූහ. 'මට ඉහළම ගෞරවයෙන් ආචාර කරන්නේ ධර්මය සමග ජීවත්වෙන, එය පරිපූර්ණ ලෙස ඉටු කරන, භික්ෂුව හෝ භික්ෂුණිය, උපාසකයා හෝ උපාසිකාවය (D.II,138).

ගිහියෙකුට ඇති වැදගත්ම යුතුකම වන්නේ භික්ෂූන් සහ භික්ෂුණීන්ට සිව්පසයෙන් සංග්‍රහ කිරීමයි. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ගිහි සහ පැවිදි ශ්‍රාවකයන් අතර තිබිය යුතු පරමාදර්ශී සම්බන්ධතාව සහජීවනය බව නුවණින් දුටුවහ. එනම් ගිහි පිරිස පැවිදි පිරිසට ද්‍රව්‍යමය අවශ්‍යතා සැපයීම සහ පැවිදි පිරිස ගිහි පිරිසට ආධ්‍යාත්මික මඟපෙන්වීම සහ ආදර්ශය සැපයීම වශයෙනි. නමුත්, ගිහි පිරිස හුදෙක් භික්ෂූන් සහ භික්ෂුණීන් සඳහා

සැපයුම් සාප්පුවක් පමණක් වීමෙන් සතුටට පත් වූයේ නම්, බෞද්ධ ප්‍රජාව දැඩි ලෙස අසංතුලනය සහ අසම්පූර්ණ වන බව බුදුපියාණන් වහන්සේ දැන සිටියහ. ඒ නිසා, උන්වහන්සේ ගිහි ශ්‍රාවකයන්ට අවවාද කළහ: ''අප සඬ්ඝයාට අවශ්‍ය දේ දී ඇත'' යන සිතුවිල්ලෙන් ඔබලා තෘප්තිමත් නොවිය යුතුයි (A.III,206). බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ අවංක ගිහි ශ්‍රාවකයන්ගෙන් බලාපොරොත්තු වූ තවත් සමහර දේවල් අතරට, යහපත් දේ කිරීම, ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු වලදී සෘජුබව, අනෙක් අයට සැබෑ මිතුරෙකු වීම (D.III,188), රෝගීන් බැලීමට යාම සහ ඔවුන් සැනසීම(S.V,408), වරින් වර භාවනා කටයුතු වලට හුදෙකලා වීම (S.V,19), කෙටියෙන් කිවහොත් ආර්ය අෂ්ටාංගික මාර්ගය එහි සියලු දැනුමෙන් සහ ගැඹුරෙන් පුහුණු කිරීමද ඇතුළත් වේ.

නමුත්, සැබැවින්ම කෙනෙකුට බුදුපියාණන් වහන්සේගේ ධර්මය පුහුණු කළ හැක්කේ එම පුද්ගලයා එය දන්නේ නම් පමණි. එම නිසා, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ගිහි ශ්‍රාවකයන් ධර්මය පිළිබඳව හොඳින් දැනුමැති වීම අපේක්ෂා කළහ. උන්වහන්සේ මෙසේ පැවසූහ: ''උපාසක සහ උපාසිකාවන් නිපුණ, හොඳින් පුහුණුවූ සහ උගත්, ධර්මය දන්නා අය, ධර්මය සමග ජීවත්වෙන සහ ධර්ම මාර්ගයේ ගමන් කරන අය වන තුරු මම පරිනිර්වාණයට පත් නොවෙමි. එසේම ඔවුන් තමන්ගේ ගුරුවරුන්ගෙන් උගත් දේ අනෙක් අයට උගන්වන තුරු, අනාවරණය කරන තුරු, ස්ථාපනය කරන තුරු, පැහැදිලි කරන තුරු, ප්‍රවර්ධනය කරන තුරු, තේරුම් කරනතුරු, ඔවුන්ට ඒවා පරිහරණය කරන්නට හැකිවන තුරු, වැරදි

ඉගැන්වීම් ප්‍රතික්ෂේප කරන තුරු, සහ මෙම විස්මකුරු ධර්මය බෙදා දෙන තුරු'' මම පරිනිර්වාණයට පත් නොවෙමි (D.II,105). බුදුපියාණන් වහන්සේගේ කාලයේදී උගත් ගිහි ශ්‍රාවකයන්ට ධර්මය බෙදා දීමේදී ස්වල්ප, නමුත් වැදගත් කාර්යභාරයක් තිබුණි. පැහැදිලිව අදහස් පළ කරමින් ඉගැන්වීමේ හැකියාවක් ඇති භික්ෂුවක් නැති විටදී හත්ථක නමැති උපාසක ඔහුගේ නගරයේ විශාල පිරිසකට උපදෙස් දී ඔවුන් බුදුදහම කෙරෙහි හැරවීමට තරම් ධර්මය දැන සිටියේය (A.IV,218). ගිහි ශ්‍රාවකයෙකු වූ උග්ගට භික්ෂූන්ට ඉගැන්වීමට තරම් ධර්ම දැනුම සහ ආත්ම විශ්වාසය තිබුණි (A,IV,211). චිත්ත නම් උපාසකට භික්ෂූන් වහන්සේලාට පවා ප්‍රයෝජනවත් වන අයුරින් ධර්මයෙහි අංගයන් ආලෝකවත් කිරීමට හැකි විය (S.IV,284-5). බලන්න **ගෘහස්ථ ජීවිතය**

'The Buddha's Teachings to Lay People.' John L. Kelly, *Buddhist Studies Review*, Vol.28, 2011.

## උපෝසථ

උපෝසථ යනු පැරණි ඉන්දියාවේ දින දර්ශනයේ සෑම මසකම පුර පෝය, අව පෝය සහ අඩ පෝය දෙක යන දිනයන්ය. පුර පෝය (පුණ්ණමා) වඩා වැදගත් උපෝසථය වන අතර, පෙර-බෞද්ධ කාලයේ වෛදික පූජාවට පෙර උපෝසත උපවාස දිනයයි. පුර පසළෝසවක පොහොය (පුණ්ණමා) වඩාත් වැදගත් වූ උපොසථ දිනය වූ අතර, බුදුදහම පැවති කාලවලට පෙර, උපෝසථ දිනය වෛදික පූජාවට පෙර උපවාස දිනය විය.මෙම සංස්කෘත වචනය සහ එහි පාලි සමාන අර්ථය 'සපුරා ඇති'

වැනි දෙයකි. යම් ආකාරවලින්, උපෝසථ යුදෙව් සහ ක්‍රිස්තියානි සබ්බත්වලට සමානය. ඒ හැර, එය පිළිපැදීම අනිවාර්ය නොවේ.

කෙසේ වෙතත්, බුදුපියාණන් වහන්සේ ගිහි බෞද්ධයන්ට මෙම නිවාඩු දින 'අපිරිසිදු මනස නිවැරදි ආකාරයෙන් පිරිසිදු කිරීම' (උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපන A.I,207), සඳහා නිසැකවම භාවිත කරන ලෙස නිර්දේශ කළහ. එවැනි දිනවල ඔවුන්ගේ දෙමාපියන්ට වැඳුම් පිදුම් කිරීමට, යහපත් ක්‍රියාවල යෙදීමට, නිශ්ශබ්දව භාවනා කිරීමට කාලය ගත කිරීම සහ අෂ්ටාංගික ශීලය පිළිපැදීමට කාලය ගත කිරීමට උන්වහන්සේ ගිහි පිරිස ධෛර්යමත් කළහ (A.I,142-3; 207). එවැනි ක්‍රියාවල උපෝසථය ගත කිරීමෙන්, කැළැල් සහිත කැඩපතක් ඔප දැමීම වැනියැයි උන්වහන්සේ පැවසූහ (A,I,209). එවැනි ක්‍රියාවලට උපෝසථ දින වෙන් කිරීම උන්වහන්සේ ඇගයූයේ මෙම වචනවලින්ය. 'මුතු, පළිඟු, වෛඩූර්ය සහ රත්රන්, ශික්ෂාපද අටෙන් සම්පූර්ණ කරන ලද උපෝසථයෙන් දහසයෙන් පංගුවක් නොවටියි. එසේම එය සඳෙන් සහ දිව්‍යමය සිරුරවලින් බැබලෙන්නේ නැත' (A.I,215).

බොහෝ බෞද්ධ රටවල ග්‍රෙගොරියානු දින දර්ශනය හඳුන්වා දෙන තුරු, උපෝසථය රජයේ නිවාඩු දිනයන් විය. සිංහල බසින් එය පෝය ලෙසත්, බුරුම බසින් උබොට් නෙ, චීන බසින් ෂොා වොං, සහ ජපන් බසින් සයිනිචි නම් වේ. භික්ෂූහු සහ භික්ෂුණීහු, එක්රැස්වී පතිමොක්ඛ සජ්ඣායනය

සඳහා පුරපෝය සහ අඩ සඳ පෝය භාවිත කරති.

## උරුවෙල

උරුවෙල යනු බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය ලැබූ යාබද ප්‍රදේශයේ උතුරු ඉන්දියාවේ කුඩා ගමකි. බුදුපියාණන් වහන්සේ ගම සහ වට පිටාව විස්තර කළේ, 'විහිදෙන සුන්දර භූමියක්, රමණීය වන වදුලක්, පැහැදිලිව ගලා බසින ගංගාවක් සමග සුන්දර තොටක්, සහාය සඳහා අසල ගම්මානයක්... උත්සාහයක් දැරීම සඳහා සුදුසු තැනක්' (M.I,167) යනුවෙනි. පසු කාලීන ශතවර්ෂවලදී, මෙම ගම්මානය බුදුදහම අධ්‍යයනය සහ වන්දනා සඳහා වූ මධ්‍යස්ථානයක් දක්වා වර්ධනය වූ අතර, හරියටම බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූ ස්ථානය යැයි විශ්වාස කරන ස්ථානයේ අනුභාවසම්පන්න මහාබෝධි විහාරස්ථානය ඉදි කරන ලදී. උරුවෙල විවිධ නම්වලින් හඳුන්වනු ලැබුණි. සම්බෝධී, මහාබෝධී හෝ වජ්‍රාසන යනුවෙන්ය. වර්තමානයේ උරුවෙලා භූමියේ වර්ධනය වී ඇති නගරය හැඳින්වෙන්නේ බුද්ධ ගයා යනුවෙනි.

*Navel of the Earth: The History and Significance of Bodh Gaya,* S. Dhammika, 1996.

## වාග්භඨ

වාග්භඨ සමහර විට බටහිර ඉන්දියාවේ සින්ධුවල 6වන ශතවර්ෂයේදී සාර්ථකවූ ආයුර්වේද වෛද්‍යවරයෙක් වේ. පැරණි කාලයේ සිට ඔහුගේ කාර්යය වූ අෂ්ටාංගහෘදය, පෙර පැවති සියලුම වෛද්‍යමය ගිවිසුම් අතර, ප්‍රතිමූර්තිය ලෙස සැලකේ. වාග්භඨ ඔහුගේ ශාස්ත්‍රීය නිබන්ධනය ආරම්භ කළේ ඒ 'රෝග නිවාරණය කරන උතුම් වෛද්‍යවරයා වූ' බුදුපියාණන් වහන්සේ අගය කරමිනි. 'ප්‍රධාන වශයෙන් රාගය, එය සෑම විටම මුළු ජීවිතයම තදින් අල්ලාගෙන, තණ්හාව, මායාව සහ අතෘප්තිකර බව ඇති කරයි. රෝග නිවාරණය කරන පුද්ගලයා, බුදුපියාණන් වහන්සේ යැයි ඔහු හැඳින්වූයේය. මූලික වශයෙන් වෛද්‍ය විද්‍යාව, රෝග සහ සෞඛ්‍යය ගැන සැලකිලිමත් වුව ද, වාග්භඨ ආචාරධාර්මික ජීවිත්වීම පිළිබඳ උපදෙස් ඇතුළත් කර ඇත. එයට හේතුව ඔහු මේ දෙක සම්බන්ධ යැයි විශ්වාස කිරීමයි. 'සියලු සත්ත්වයන් විශ්වාස කරන්නේ තමන් කරන සෑම දෙයක්ම ඔවුන් සිදු කරන්නේ එය ඔවුන්ට සතුට ඇති කරන බැවිනි. නමුත්, ගුණවත් බව නැතිව සැබෑ සතුටක් නැත. ඒ නිසා කෙනෙකු පළමුව ගුණවත් බවට මුල් තැන දිය යුතුයි'.

ඔහු නිර්දේශ කළ සදාචාරාත්මක සාරධර්ම එකිනෙකට වෙනස් බෞද්ධ මූලධර්මයන්ගෙන් සමන්විත වේ. උදාහරණ වශයෙන්, අෂ්ටංගහෘදයේ පළමු පරිච්ඡේදයේ ඇත. 'ජීවත්වීමට ක්‍රමයක් නොමැති නිසා, හෝ අසනීපයෙන් හෝ පීඩාවෙන් පෙළෙන නිසා දුක්විඳින අය රැකබලා ගැනීම සඳහා කෙනෙකු උත්සාහ කළ යුතුයි'. යමෙකු කුඩා

සත්ත්වයන් තමාගේම ජීවිතය මෙන් දැකීමට පවා උත්සාහ ගත යුතුයි... යමෙකු තමා රෝගීවනු ප්‍රාර්ථනා කරන සතුරන්ට පවා උපකාර වීමට අරමුණු කළ යුතුයි. කෙනෙකු හොඳ කාලයේ සහ නරක කාලයේත්, උපේක්ෂාව පවත්වා ගත යුතුයි. සාර්ථකත්වය සඳහා ආශා නොකරන්න, ඒ වෙනුවට සාර්ථකත්වය පෝෂණය කරන දේට අවධානය දෙන්න. නියම වේලාවට කථා කරන්න, කරුණාවන්ත වන්න, මධ්‍යස්ථ වන්න, ප්‍රසන්න වන්න. කිසිවිටක පොරොන්දු කඩ නොකරන්න... සියලු වැඩවලදී මධ්‍යස්ථ වන්න... යහපත් පුද්ගලයෙකු මෙම ගුණාංග ඉෂ්ට කරයි, පවුල කෙරෙහි මෘදු බව දක්වන්න. අනෙක් අය කෙරෙහි පරිත්‍යාගශීලී වන්න, කය, වචනය සහ මනස සංයමයෙන් තබා ගන්න, අන් අය කෙරෙහි දක්වන සැලකිල්ල ඔබගේම ලෙස සලකන්න'.

වෛද්‍යවරයෙකුගෙන් උපදෙස් ලබා ගත යුතු අසනීප සහ අනතුරු වළක්වා ගැනීම සඳහා වාග්භථ ආචාරවිධි සහ නිරවුල් ප්‍රායෝගික බුද්ධිය පිළිබඳ පෙර පරෙස්සම සම්බන්ධයෙන් උපදෙස් නොසලකා හැරියේ නැත. 'කෙනෙකු තමන්ගේ ශරීරයේ කෙස්, නියපොතු සහ රැවුල කෙටි කළ යුතුයි. පාද සහ ශාරීරික විවර පිරිසිදුව තබා ගත යුතුයි. නිතිපතා ස්නානය කළ යුතුයි, හොඳින් සුවඳ විලවුන් ගැල්විය යුතුයි, ප්‍රසන්න ආකාරයට නමුත්, අසංවර නොවන අයුරෙන්, හොඳින් ඇඳ පැළඳිය යුතුයි... කුඩයක් සහ සෙරෙප්පු පැළඳ සහ තමන්ගේ දෑස් ඉදිරියෙන් තබාගෙන ගමන් කරන්න. රාත්‍රියේදී පිටතට යාමට අවශ්‍ය වූවොත්, යෂ්ටියක් රැගෙන යන්න, හිස්වැසුමක් පළඳින්න, සහ මිතුරෙකු සමග

යන්න...කෙනෙකු කිඹිසුම් පිටකිරීම, සිනහවීම හෝ ඇණුම් යැවීම මුඛය ආවරණය නොකරමින් නොකරන්න. කෙනෙකු නාසය හැරීම හෝ අරමුණකින් තොරව පාදයෙන් පොළොව කුරුටු ගෑම නොකළ යුතුයි'. බලන්න **වෛද්‍යවරු සහ ජීවක**

*Vāgbhaṭa's Aṣṭaṅga Hṛdaya: Text, English translation, notes, appendix, and indices*, trans. by K. R. Srikantha Murthy, 1991.

## වාරාණසි

වාරාණසි, බරණැස ලෙස බොහෝ විට ඉංග්‍රීසි උරුව ගෙන ඇත. එය හින්දු ආගමේ පූජනීය නගරයයි. පැරණි නගරය මුලින් පිහිටා තිබුණේ ගංගා නම් ගඟේ කුඩා අතු ගංගා දෙක වන වරුණ සහ අසි අතර නිසා, ඒ නම ලැබී ඇත. සියලු බැතිමත් හින්දූන්ගේ අරමුණ වන්නේ වාරණසියේ මිය යෑමට හෝ ගංගානම් ගඟේ ස්නානය කිරීමයි. ත්‍රිපිටකයේ සමහර අවස්ථාවල වාරාණසි හැඳින්වෙන්නේ නගරයේ පැරණි නම වන කාසි යන නමින් හෝ බාරාණසි යනුවෙනි (D.II,146). නගරය බොහෝ කාලයක් තිස්සේ ආගමික ඉගෙනීමට, සංස්කෘතිය සහ වෙළෙඳ, විශේෂයෙන්ම සුඛෝපභෝගී භාණ්ඩ සඳහා මධ්‍යස්ථානයක් විය. බුදුපියාණන් වහන්සේ පැවසුවේ, උන්වහන්සේගේ අභිනිෂ්ක්‍රමණයට පෙර, වටිනා කසී රෙදිපිළි වන බ්‍රොකේඩ් සහ සුදුහඳුන් භාවිත කළ බවයි (A.I,145). බොහෝ ජාතක කථා ස්ථාපිත වී ඇත්තේ හෝ සිදුව ඇත්තේ 'බාරාණසි රජු බ්‍රහ්මදත්තගේ' කාලයේදීය.

පුරාවිද්‍යාත්මක පරීක්ෂණවලින් හෙළි වී ඇත්තේ පැරණි කාලයේ වාරාණසියේ බෞද්ධ පැවැත්මක්

තිබූ නමුත්, එය සෑමවිටම හින්දු ආගම විසින් යටපත් කර ඇති බවයි. බුදුපියාණන් වහන්සේ විසින් උන්වහන්සේගේ පළමු සහ දෙවන ධර්ම දේශනා සිදු කළ ඉසිපතනය, දැන් සාරානාත් යනුවෙන් හැඳින්වෙන අතර, එය පිහිටා ඇත්තේ වාරාණසියෙන් පිටත තදාසන්න ප්‍රදේශවලින් ඔබ්බෙහිය.

*Life in Ancient Varanasi*, B. P. Singh, 1985.

## වේදයන්

සියලුම හින්දු පූජනීය සාහිත්‍ය අතුරින් වඩාත්ම පැරණි සහ වඩාත්ම වැදගත් වන්නේ වේදයන්ය. බෞද්ධ ධර්ම ග්‍රන්ථවල සඳහන් කර ඇත්තේ තුනක් පමණක් වුවද වේද හතරක් ඇත (M.II,133). ඒවා ඍග් වේදය, සාම වේදය, යජුර් වේදය, වන අතර, රචනා කර ඇත්තේ ක්‍රි. පූ. 2500 සහ 900 වන වර්ෂය අතරේදීය. හතරවන වේදය, වන අථර්ව වේදය බුදුපියාණන් වහන්සේගේ කාලයේදී අසන්නට ලැබුණි (Sn.927). නමුත්, පෙනෙන්නට තිබෙන ආකාරයට පූජනීය ධර්ම ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් කර ඇත්තේ ශතවර්ෂ ගණනාවකට පසුවයි. වේදයන් දිව්‍ය සම්භවයක් ඇති (අපෞරුශෙය්‍ය). සදාකාලික (සනාතන) අනාවරණයක් (ශ්‍රැති) යැයි විශ්වාස කෙරේ. වේදයේ බලය ප්‍රතික්ෂේප කරන අය මිථ්‍යාලබ්ධිකයන් (නාසිතක) යැයි කියනු ලැබේ. නමුත් බුදුපියාණන් වහන්සේ පැවසුවේ කිසිම දෙයක් සදාකාලික නොවන බවයි, අනාවරණය විශ්වසනීය නොවන උපක්‍රමයක් බව උන්වහන්සේ සැලකූ සේක. එසේම උන්වහන්සේ උත්තරීතර දෙවිකෙනෙකු පිළිබඳ අදහස ඒත්තු ගැනීමට නොහැකි දෙයක්

ලෙස ප්‍රතික්ෂේප කළහ. වේදයේ කියා සිටීම් පිළිබඳ උන්වහන්සේගේ විවේචනය අවිද්‍යාව මත පදනම් නොවූවකි. ඒවායේ සමහර කරුණු පිළිබඳව උන්වහන්සේ ඉතා ප්‍රමාණවත් අයුරින් පළපුරුද්දෙන් දැන සිටියහ. එම නිසාම උන්වහන්සේට බොහෝ වෛදික ඉසිවරයන්, 'පැරණි දේවගීතිකාවල නිර්මාණකරුවන් සහ රචකයන්' නම් කළ හැකි විය (M.II,169); ඒවාට සමාන සංස්කෘත ඒවා නම්, අෂ්ටක, වාමදෙව, විහාමිත්‍ර, ජමදග්නි, අංගිරස්, භාරද්වාජ, වසිෂ්ඨ, කාශ්‍යප සහ භ්‍රගු යනාදියයි. වේදයේ සඳහන් කිසිම ඉසිවරයෙකු සමග වාමක පමණක් හඳුනාගත නොහැකිය. වේදයන්ගේ කතෘවරුන්ට දිව්‍යමය දැනුම ඇතැයි යන කියමන පිළිබඳව ද බුදුපියාණන් වහන්සේ බරපතල සැක පහළ කර ඇත.

වරක් බ්‍රාහ්මණයෙකු උන්වහන්සේගෙන් ඇසුවේ වේදයේ කතුවරයන්ට දිව්‍යමය අත්දැකීම් ඇති බවට කරන ප්‍රකාශය ගැන සිතන්නේ කුමක් ද යන්නයි. උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: 'මේ ගැන ඔබ සිතන්නේ කුමක් ද?, ''මම දනිමි. මම දකිමි. මෙය පමණක් සත්‍යයි, අනෙක් සියල්ල වැරදියි'' කියන එක් බ්‍රාහ්මණයෙකු සිටී ද ?
'නැත, ගෞතමයන් වහන්ස'.
'පරම්පරා හතක් පසුකර යන බ්‍රාහ්මණ ගුරුවරුන්ගෙන් කිසිවෙකු හෝ ඔවුන්ගේ ගුරුවරුන් හෝ එසේ පවසා තිබේ ද?'
'නැත, ගෞතමයන් වහන්ස'.
'එසේ නම්, වෛදික ගීතිකා රචනා කළ, සජ්ඣායනය කළ, උච්චාරණය කළ සහ සම්පාදනය කළ, අද දවසේ බ්‍රාහ්මණවරුන් තවමත් සජ්ඣායනය

කරන, ගායනා කරන, නිකම්ම නැවත කියන ලද සහ සජ්ඣායනය කරන ලද දේ නැවත කියවීම ගැන පැරණි බ්‍රාහ්මණ ඉසිවරයන් ගැන කුමක් කිව හැකි ද ? ඔවුන් කවදා හෝ කීවා ද ? , ''අපි දන්නවා, අපි දකිනවා, මෙය පමණක් සත්‍යය, අනෙක් සියල්ල අසත්‍ය යැයි කියා?".
'නැත, ගෞතමයන් වහන්ස. ඔවුන් එසේ කීවේ නැත'.
'අන්ධ මිනිසුන්ගේ රැහැනක් එකිනෙකා අල්ලාගෙන සිටිනු සිතින් සිතා ගන්න. පළමු වැන්නා මැද සිටින්නා නොදකියි. මැද සිටින්නාට අවසානයේ සිටින්නා නොපෙනේ. මෙම බ්‍රාහ්මණයන්ගේ කීමත් ඒ හා සමානය. පළමු වැන්නාට මැද සිටින්නා නොපෙනේ. මැද සිටින්නාට අවසානයේ සිටින්නා නොපෙනේ. ඒ නිසා බ්‍රාහ්මණයන්ගේ විශ්වාසය පදනම් විරහිත බව පෙනේ' (M.II,169-70).

බුදුපියාණන් වහන්සේ බ්‍රාහ්මණවාදයේ ප්‍රධාන විශේෂ ආගමික චාරිත්‍රය වූ පූජනීය අග්නිපූජා වන්දනාව (අග්ගිහොත්ත) ආධ්‍යාත්මික වශයෙන් නිශ්ඵල දෙයක් බව සැලකූහ (D.I,102).

සත්ත්ව බිලි පූජාව, පිළිවෙත් ක්‍රමවල සඵලත්වය, කුල ක්‍රමය, සදාකාලික ආත්මයක් පිළිබඳ ඇති විශ්වාසය සහ සැබැවින්ම වේදයන් විසින් නීත්‍යානුකූල කර ඇති බොහෝ පිළිවෙත් ද උනුවහන්සේ විසින් ප්‍රතික්ෂේප කර ඇත. බුදුපියාණන් වහන්සේ හින්දු භක්තිකයෙක් හෝ බුදුදහම හින්දු ආගමෙන් පරිණාමය වූවක් හෝ එහි ප්‍රතිසංස්කරණය කරන ලද්දක් යන ප්‍රකාශයට සාක්ෂි නොදරයි. බලන්න **බ්‍රහ්ම, තුන් ආකාර දැනුම් සහ**

## මන්ත්‍ර

*Buddhism in the Shadow of Brahmanism*,Johannes Bronkhorst, 2001.

## නිර්මාංශවීම

නිර්මාංශවීම යනු මස් අනුභව නොකිරීමේ පුරුද්දයි. සමහර නිර්මාංශකයෝ සත්ත්ව නිෂ්පාදන - කිරි, බිත්තර හෝ බටර් ආහාරයට නොගනිති. ඔවුන් මස් මාළු නොකන්නා ලෙස හැඳින්වේ. බුදුපියාණන් වහන්සේගේ කාලයේ සිටම නිර්මාංශකත්වය සඳහා ධෛර්යමත් කිරීම යම්තම් ආරම්භ වූවා පමණි. නමුත් බුදුපියාණන් වහන්සේ නිර්මාංශ නොවූහ. එසේම උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට එසේ කරන ලෙස ද උපදෙස් නොදුන්හ (M.I,369). ත්‍රිපිටකය සාක්ෂි දරන්නේ සහ වෙනත් මුල්කාලීන ඉන්දියානු සාහිත්‍යයෙන් පෙන්වා දෙන්නේ මස් මිනිසුන්ගේ ආහාරවල සාමාන්‍ය කොටසක් වූ බවයි. ගෘහස්ථ සහ වන සතුන්ගේ මස් ආහාරයට ගන්නා මිනිසුන් සඳහා මස්මරන වධකාගාර, මස් අලෙවි කරන ස්ථාන සහ මස් වෙළඳ සැල්වලට මස් සපයන මස් වෙළෙඳුන්, දඩයක්කාරයන් සහ මස්මරන්නන් පිළිබඳව ඒවායේ බොහෝ විස්තර සඳහන් වේ (Ja.III,277). මහාවස්තුවේ සඳහන් ලැයිස්තු දෙකක, සඳහන් විස්තරවල ආහාරයට ගන්නා ලද මස් අතරට, වලස් මස්, මාලු, සැවුලන්, වටුවන්, කුරංගයන්, මීහරක්, එළුපැටියන්, බැටළුවන්, කුකුළන්, මොණරුන් සහ කොක්කු අයත් වූහ (Mv.70; 82). මස් අතරින් වඩාත්ම රසවත් ලෙස සලකනු ලැබුවේ මුව මස්ය. ඒවා ලබා ගැනීමට සාමාන්‍ය සහ වංශවත් අය ද දඩයමේ ගියහ (Ja.I,137; III,49; IV,431) බුදුපියාණන් වහන්සේ හරස් මාර්ගයේ සිටි මස් මරන්නෙකු විසින් මරන ලද එළදෙනක

පෙති ගසා මග යන එන අයට අලෙවි කරනු විස්තර කළහ (M.I,58). එසේම සේවකයන්ට, කම්කරුවන්ට සහ වහලුන්ට සාමාන්‍යයෙන් කැඩුණු සහල් සහ ගොරෝසු කැඳ දුන් නමුත්, උන්වහන්සේගේ පියාගේ නිවසේ, ඔවුන්ට ලබා දුන්නේ හොඳම වර්ගයේ සහල් සහ මස් බව උන්වහන්සේ විස්තර කළහ (සාලිමංසොදන, A.I,145) මෙයින් අදහස් වන්නේ පවුලේ අය අනුභව කළ අවුළුපත්ම ඔවුන් ද අනුභව කළ බවයි (A.I,145). මස් බැඳීම (තලිය), පිළිස්සීම (භජ්ජිය), වේලීම (පරිසුක්ක), සිහින්ව කැපීම (චුණ්ණිකමංස) සහ ලුණු දැමීම (ලවණ) පිළිබඳව විස්තර ද ඇත.

බුදුපියාණන් වහන්සේ හෝ සමහර භික්ෂු භික්ෂුණීන් මස් අනුභව කළ බව සඳහන් තැන් ත්‍රිපිටකයේ දුසිමක් හෝ ඊට වැඩි ප්‍රමාණයන් ඇත. අංගුත්තර නිකායේ සඳහන් වන්නේ වරක් බුදුපියාණන් වහන්සේට ජුජුබේ පළතුරක් සමග සූකරමංස පිළිගැන්වූ බවයි. මෙම පදය නිශ්චිතවම සූකර = උරු, මංස = මස් හෝ මදය වශයෙන් පරිවර්තනය කළ හැකිය (A.III,49). තවත් ස්ථානයක, එක් මිනිසෙකු තම සේවකයා වෙළඳ පොළට යවා මස් මිලදී ගෙන, පිළියෙල කර, බුදුපියාණන් වහන්සේට පිරිනැමූ බව සඳහන් වේ (A.IV,187). තවත් ග්‍රන්ථයක විස්තර කර ඇත්තේ, බුදුපියාණන් වහන්සේට සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට මිනිසුන් කණ්ඩායමක් භෝජන සංග්‍රයක් පිළියෙල කරමින්, 'තම්බන ලද කැඳ සහ බත්, කුඩු කරන ලද මස් සහ සුප්' (මංසනි කොට්ටෙන්ති) පූජා කළ ආකාරයයි (Vin.I,239). එක් අවස්ථාවකදී, සමහර මිනිස්සු එළදෙනක මරා, එය

උයා 'උයන ලද හොඳම මස් කැබලි' (මංසෙ පක්කෙ වරමම්මසනි) භික්ෂුණියකට ලබා දුන්හ. පසුව ඇය එය සුද්ධ කර, පිළියෙල කර බුදුපියාණන් වහන්සේට පූජා කර ඇත (Vin.III,208). තවත් අවස්ථාවක, භක්තිමත් ගිහියෙකු භික්ෂූන් වහන්සේලා පිරිසකට මස් පාත්‍ර 125ක් පූජා කර ඇත Vin.I,222).

ජෛනවාදීන් බුදුපියාණන් වහන්සේට සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට එල්ල කරන ලද එක් චෝදනාවක් නම්, ඔවුන් මස් අනුභව කිරීම පිළිබඳවයි. 'බොහෝ ජෛනයන් නගරය හරහා, ප්‍රධාන පාරවල් සහ හරස් පාරවල්, මංතීරු, පටු පාරවල්, හරහා යමින්, දෑත් ඔසවමින් සහ කෑගසමින් :''සිහ ජනරාල්තුමා, ගෞතම භික්ෂුව පෝෂණය කිරීම සඳහා විශාල සතෙකු මුල්ම දිනයේම මරා ඇත. ඔහු වෙනුවෙන්ම මැරූ බව දනිමින් ඔහු එය අනුභව කරනු ඇත'' (A.IV,187).

ජෛන ආගමට අනුව වෙනත් පැවිදි අය මස් අනුභවයෙන් වැළකීම සඳහා පෙළඹවූ බව පෙනෙන්නට තිබේ. සමහර අය එසේ කළ අතර, තවත් අය බුදුපියාණන් වහන්සේ මෙන්, එසේ නොකළහ. උදාහරණ වශයෙන්, කළාරමිට්ඨක පැවිදි පිරිස මස් සහ මත්පැන් පමණක් අනුභව කිරීමට පොරොන්දුවක් ගෙන ඇත. නමුත් මෙයින් ඔහු ඉහළින්ම උතුම්කොට සැළකිල්ලට ලක්වීමට බාධාවක් නොවීය (D.III,9).

බුදුපියාණන් වහන්සේ සමහර විට නිර්මාංශත්වය වෙනුවෙන් පෙනී නොසිටියේ උන්වහන්සේ සෘජු ලෙස සතෙකු මරා දැමීම - සතෙකු තමා විසින්ම

මරා දැමීම හෝ වෙනත් කෙනෙකු ලවා සතෙකු මැරීම - සහ වක්‍රාකාර මැරීම - මරන ලද සතෙකුගේ මස් මිලදී ගැනීම අතර ඇති වෙනස පෙන්වා දී ඇති නිසා විය හැකිය. ඍජුවම සතෙකු මැරූ විට එම පුද්ගලයා මරණයක් සඳහා ඍජු ලෙස වගකිව යුතු වේ. නමුත් කෙනෙකුගේ කැමැත්ත හෝ දැනීම නොමැතිව මැරූ සතෙකුගේ මස් මිලදී ගෙන ආහාරයට ගැනීමෙන් වගකිව යුත්තේ වක්‍රව සහ දූරස්ථව පමණි. නිර්මාංශකයන් හෝ බුදුපියාණන් වහන්සේ විවේචනය කරන්නන් මෙය තේරුමක් නැති විරෝධයක් ලෙස සිතන්නට පුළුවනි. නමුත් සැබැවින්ම එය එසේ නොවේ. දැඩි නිර්මාංශකරුවන් පවා ඔවුන් ඇවිදින වාරයක් පාසා කුඩා සතුන් මරයි. එසේම ඔවුන් ආහාරයට ගන්නා එළවළු ඒවා කන හෝ විනාශ කරන සතුන් මැරීම සඳහා ඉසිනු ලැබේ. ඒ අනුව, නිර්මාංශිකයා වෙළඳ සැලකින් මස් මිලදී ගන්නා පුද්ගලයා මෙන්ම වක්‍රව හෝ දූරස්ථව මැරීම සඳහා වගකිව යුතුයි.

කෙසේ වෙතත්, පරිණත බෞද්ධයන් සිතිය යුත්තේ හුදෙක් ඔවුන්ගේ ක්‍රියාවන් ඔවුන් කෙරෙහි ඇති කරන බලපෑම ගැන පමණක් නොව, ඔවුන් අන් අයට ද බලපාන ආකාරය ගැන ද සිතිය යුතුයි. යම් කෙනෙකු තමාගේම දෑතින්, සතෙකු මරා දැමුව ද, සුපිරි වෙළඳ සැලකින් මස් මිලදී ගත්ත ද, අවස්ථා දෙකේදීම, එහි ප්‍රතිඵලයක් ලෙස සචේතනික ජීවියෙකු මිය යයි. එහි ප්‍රතිඵලයක් ලෙස, මස් අනුභව නොකිරීමෙන්, ලෝකයේ සමහර කුරිරුකම් අවම කිරීමට ඔවුන් උදව් කරන බවත්, නිර්මාංශත්වය පළමු ශික්ෂාපදයේ සාමාන්‍ය ස්වභාවයට වඩා අනුකූල බවත් හඟින බෞද්ධයෝ සිටිති.

ශ්‍රී ලංකාවේ නිර්මාංශත්වය සාමාන්‍ය දෙයකි. එය කිසිසේත්ම විශ්වීය නොවේ. එසේම, බුරුමයේ, තායිලන්තයේ, ලාඕස්, කාම්බෝජියා සහ ටිබෙටයේ එය සාමාන්‍ය දෙයක් නොවේ. චීනයේ සහ කොරියාවේ බොහෝ බැතිමත්තු උපෝසථ දිනවල මස් අනුභව නොකරති. බොහෝ චීන සහ කොරියානු භික්ෂූන් සහ භික්ෂුණීන් නිශ්චිත ලෙසම නිර්මාංශ වේ. බලන්න **දේවදත්ත සහ සතුන් නොමරණ දින**

*To Eat or not to Eat Meat,* S. Dhammika,2010.

## වැස්ම සහ ආවරණය කිරීම

වැස්ම (ඡද්ද හෝ ඔගුණ්ඨික) යනු ආවරණයක් ලෙස භාවිත කරන රෙදි කැබැල්ලකි. සමහර ආගම් සහ සංස්කෘතීන් නිහතමානී බවේ සලකුණක් ලෙස සලකමින්, කාන්තාවන්ට වැස්මක් භාවිත කිරීම අපේක්ෂා කරයි. කාන්තාවක් පල්ලියේ සිටියදී වැස්ම භාවිත කළ යුතු බව බයිබලය සඳහන් කරයි. (1 කොරින්තියන්ස් 1,4-16) බටහිර මනාලියන් ඔවුන්ගේ විවාහයේදී ඉතා සිනිඳු වැස්මක් භාවිත කිරීම මෙම පුරුද්දේ ශේෂවූවකි. රාජ්‍ය තාන්ත්‍රිකයන් වතිකානුවේ පාප්තුමා හමුවීමට ගිය විට ඔවුන්ගේ භාර්යාවන් ආවරණයකින් මුහුණ වසා ගත යුතුයි. බොහෝ ඉස්ලාමීය සංස්කෘතිවල කාන්තාවන් ඔවුන්ගේ හිසකෙස් වැසීම කළ යුතුයි. සමහර විට ප්‍රසිද්ධ ස්ථානවල සිටින විට ඔවුන්ගේ සම්පූර්ණ මුහුණ වැසිය යුතුයි.

බුදුපියාණන් වහන්සේගේ කාලයේදී සමහර කාන්තාවෝ වැස්මක් භාවිත කළහ. නමුත් එයට මුහුණ සහ කෙස් සැඟවීමට වඩා, තොප්පියකට සමාන දෙයකි. පළමු සහස්‍ර වර්ෂය ආරම්භ වන සමයේදී, ඉහළ පැළැන්තියේ කාන්තාවන් සහ රාජකීය වැසියන්ට ඔවුන්ගේ මුහුණු වැසීම සුදුසු යැයි සැලකීම ආරම්භ විය. 13වන ශතවර්ෂයේදී ඉස්ලාම් දහම හඳුන්වාදීමත් සමග ඉන්දියාවේ වඩාත් පුළුල් වූ ප්‍රවණතාවක් වූ ෆර්ඩා යනුවෙන් හැඳින්වෙන මුහුණු ආවරණයේ ආරම්භය ඇති වූ අතර, එය කාන්තාවන් ප්‍රසිද්ධ ජීවිතයෙන් බැහැර කිරීම සිදු විය.

බුදුපියාණන් වහන්සේ පිළිබඳ මනඃකල්පිත චරිතාපදානයක් වන ලලිතවිස්තරෙහි, කාන්තා මුහුණු වැස්ම පිළිබඳ රසවත් කථාවක් තිබේ. මෙම කාර්යයට අනුව, සිද්ධත්ථ කුමරුගේ බිරිඳ වශයෙන් යසෝධරා තෝරා ගැනීමෙන් පසු, ඇයගේ මාමණ්ඩිය සහ නැන්දනිය ඉදිරියේ මුහුණ වසා නොගැනීම පිළිබඳව ඇය මිනිසුන්ගේ විවේචනයට ලක් වී ඇත. මෙය විලිබිය රහිත බව සහ මුරණ්ඩු බව දක්වන ලකුණක් ලෙස සලකන ලදී. ලලිතවිස්තරයේ තරුණ කාන්තාවන් තමාව ආරක්ෂා කරගනු පිණිස මෙම වචනවලින් නිරූපණය කරයි. 'ශරීරය සහ හැසිරීම පාලනය කර ඇති, සැලකිල්ලෙන් කථාව පාලනය කරන, ඉඳුරන් පාලනය කරන ලද, සන්සුන් සහ සන්හිඳියාවෙන් යුක්ත, නම් මුහුණු වසා ගත යුත්තේ ඇයි? ආවරණ දාහකින් වසාගෙන සිටියත්, විලිබිය නැති නම්, අවිනීත නම්, වංක නම් සහ ගුණවත් බවින් තොර නම්, ඔවුන් මේ ලෝකයේ ජීවත් වන්නේ නොවැසුණු සහ අනාවරණය වෙමින්ය.

ආවරණය නොකළත්, ඔවුන්ගේ ඉඳුරන් සහ මනස හොඳින් ආරක්ෂා කර ගෙන ඇත්නම්, ඔවුන් තමන්ගේ පුරුෂයන්ට අවංක නම්, තවත් කෙනෙකු පිළිබඳව කිසිවිටක සිතන්නේ නැතිනම්, ඔව්හු ඉර සඳ මෙන් බබලති. එසේ නම්, ඔවුන් මුහුණු ආවරණය කළ යුත්තේ ඇයි? අනෙක් අයගේ මනස කියවන ඉසිවරයා, මගේ හැසිරීම සහ ගුණවත්බව, මගේ විනය සහ මගේ විලිබිය ඇති බව දන්නා දෙවියන් මෙන් දනී. එම නිසා, මා මගේ මුහුණ ආවරණය කළ යුත්තේ ඇයි?'

මෙම කථාව ප්‍රබන්ධයක් වුවත්, එය ද්‍රව්‍යමය සහ බාහිර දේවලට වඩා මනෝවිද්‍යාත්මක සහ අභ්‍යන්තරික වශයෙන් වැදගත්ය යන බුදුපියාණන් වහන්සේගේ අදහසට අනුකූල වේ. බලන්න **ඇඳුම්**

## වෙසාඛ

වෙසාඛ බෞද්ධ දින දර්ශනයේ දෙවන මාසයයි. සිංහලෙන් එය ශබ්ද නගන්නේ වෙසක් වශයෙනි. ථේරවාද සම්ප්‍රදායට අනුව සිද්ධත්ථ ගෞතම උත්පත්තිය ලැබුවේ, බුද්ධත්වය ලැබුවේ සහ පරිනිර්වාණයට පත් වූයේ වෙසාඛ මාසයේ පුර පසළොස්වක දිනයේ සවස් යාමයේය. නමුත් මෙය ත්‍රිපිටකයේ කිසිම තැනක සඳහන් නොවේ. ධර්ම ග්‍රන්ථවලට අනුව, බුදුපියාණන් වහන්සේ වේසාලියේ නතර වී සිටින විට, තමන් වහන්සේ මාස තුනක කාලයේදී (ඉතො තිණ්ණං මාසානං, D.II,114) පරිනිර්වාණයට පත් වන බව පැවසූහ. සමහර විට, වැසි සෘතුව (ඔක්තෝබර් මැද) අවසාන වන තුරු වේසාලියෙන් නික්ම නොගියේ, ජනවාරි මැද

පසුවන්නට පෙර උන්වහන්සේ පරිනිර්වාණයට පත් වන්නට ඉඩ තිබූ නිසා විය හැකිය.

චීන ජාතික වන්දනාකරු සුඇංසෑං 7වන ශතවර්ෂයේදී ඉන්දියාවේ සිටින විට, බොහෝ බෞද්ධයන් බුදුපියාණන් වහන්සේගේ උපත, බුද්ධත්වය සහ පරිනිර්වාණය වෙසාඛ දිනයේ සමරන ලදී. සමහර නිකායන් වෙනත් කාලවල එසේ කළ බව ඔහුට පෙනී ගියේය. ඔහු මෙසේ ලිව්වේය, 'සාමාන්‍ය සම්ප්‍රදායට අනුව, තථාගතයන් වහන්සේ වෙසාඛ මාසයේ දෙවන භාගයේ 15වන දිනයේදී වයස 80ක් විය. එවිට උන්වහන්සේ පරිනිර්වාණයට පත් වූහ... නමුත්, සර්වාස්තිවාදීන් පවසා ඇත්තේ උන්වහන්සේ පරිනිර්වාණයට පත් වූයේ කත්තික මාසයේ දෙවන භාගයේ 8වන දිනයේදී බවයි... නමුත් සාවක ගුරුකුලය පවසන්නේ එය සිදුවූයේ වෙසාඛ මාසයේ දෙවන භාගයේ 15වන දිනයේදී බවයි'.

ථෙරවාදී බෞද්ධ රටවල, වෙසාඛ ප්‍රසිද්ධ නිවාඩු දිනයකි. එම දිනයේදී, මිනිස්සු පන්සල්වල රැස්වී ධර්ම දේශනාවලට සවන් දෙති, භාවනා පුහුණු කරති, විවිධ උත්සව පවත්වමින් බුදුපියාණන් වහන්සේට නමස්කාර කරති. බලන්න **කුසිනාරා සහ බුදුපියාණන් වහන්සේගේ සංචාර**

*The Significance of Vesak*, K.N. Jayatilleke, 1972.

## වේසාලි

වේසාලිය වජ්ජි ජනරජයේ අගනුවරයි. බුදුපියාණන් වහන්සේ පිළිබඳ බොහෝ වැදගත් සිදුවීම් සිදු වූ ස්ථානයයි. බුදුපියාණන් වහන්සේට මෙම නගරය

සඳහා විශේෂ හොඳහිතක් තිබුණි. උන්වහන්සේ අවසාන වරට ඒ ප්‍රදේශයෙන් පිටත් වන විට, ඒ දෙස බොහෝ වේලාවක් වටපිට බැලූහ (D.II,1220). දෙවන බෞද්ධ සංගායනාව පැවතුණේ වේසාලියේ දීය. ඒ බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර සියයකට පමණ පසුය. වර්තමානයේ වේසාලියේ නටබුන් පුළුල් ප්‍රදේශයක් පුරා ව්‍යාප්ත වී ඇත. මේවා අතරින් ඉතාම වැදගත් ඒවා වන්නේ සිංහ ටැඹක් සහිත විශාල ගල් කුළුණක්, එයට යාබදව පිහිටි විශාල ස්තූපයක් සහ පුරාවිද්‍යාඥයන් විසින් සිතන පරිදි බුදුපියාණන් වහන්සේගේ භෂ්මාවශේෂවලින් වප්ජීන් සතුව තිබූ අටෙන් එකක කොටස තැන්පත් කළ ඒ සමීපයේ පිහිටි තවත් ස්තූපයකි. නූතන ඉන්දියානු බිහර් ප්‍රාන්තයේ අගනුවර වන පැටනා සිට කිලෝමීටර් 40ක් උතුරෙන් වේසාලියේ පිහිටා ඇත.
*Vaisali Excavations 1950*, K. Deva, 1961.

## විනය පිටකය

විනය පිටකය පූජනීය ධර්ම ග්‍රන්ථ වන ත්‍රිපිටකයේ පළමුවන කොටසයි. අනෙක් කොටස් සූත්‍ර පිටකය සහ අභිධම්ම පිටකයයි. විනය යන වචනයේ අර්ථය 'පුහුණුව' යන්නයි. එයින් විස්තර වන්නේ භික්ෂූන් සහ භික්ෂුණීන් පිළිපැදිය යුතු විනය නීති පිළිබඳවයි. විනය පිටකයේ කාණ්ඩ තුනක් ඇත - සුත්තවිභඞ්ග, ඛන්ධක සහ පරිවාර යනුවෙනි. මෙහි පළමුවැන්නේ පාතිමොක්ඛ, භික්ෂූන් සඳහා නීති 227ක් සහ භික්ෂුණීන් සඳහා 311 ඇත. ඒ අතරට ඔවුන්ට අටුවාවක් ද ඇත. ඛන්ධකයේ පැවිදි කිරීම සහ පැවිදි පරිපාලනය වැනි විවිධ පැවිදි ක්‍රියා පිළිවෙළ ඇතුළත්

වේ. විනය පිටකයේ අවසාන කොටස පැවිදි නීතියට සම්බන්ධ ආගමික ඉගැන්වීම්වලට අදාළ ප්‍රශ්න සහ උත්තර ඇතුළත් පරිශිෂ්ටයක් ඇත. විනය පිටකයේ මුල්ම කොටස පාතිමොක්ඛ වන අතර, ඉතිරිය බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත් වී ශතවර්ෂ ගණනාවක දිගු කාලයක් පුරා ක්‍රමයෙන් ඇතිවිය.

*Buddhist Monastic Life*, Mohan Wijayaratna, 1990.

## විසුද්ධිමග්ග

විසුද්ධිමග්ගයෙන් අරමුණු වන්නේ එය ථේරවාද බුදුදහමේ මහාවිහාර සම්ප්‍රදාය විසින් වටහා ගත් පරිදි සමස්ත සූත්‍ර පිටකයේ සාරාංශයක් බවයි. නමේ අර්ථය 'නිර්වාණ මාර්ගය' යන්නයි. මෙම ග්‍රන්ථය රචනා කළේ ක්‍රි. පූ. 5වන ශතවර්ෂයේ දී බුද්ධඝොස හිමියන් විසිනි. එහි සැලැස්ම ලෙස බුදුපියාණන් වහන්සේ විසින් රථවිනීත සූත්‍රයේ (M.I,145) උගන්වන ලද පවිත්‍රතා හත (සත්ත විසුද්ධි) නම් වේ. ආධ්‍යාත්මික පුහුණුව සඳහා විසුද්ධිමග්ගයේ ප්‍රවේශය ප්‍රයෝගික නොවන අතර, එය සිද්ධාන්තමය වන අතර, අභිධර්මය මත පදනම් වේ.

*The Path of Purification*, trans. by Bhikkhu Ñāṇamoli, 1964.

## බුදුපියාණන් වහන්සේගේ හඬ

කටහඬ (ඝොස) කථා කරන විට හෝ ගායනා කරන විට මුඛය හරහා ඇතිවන ශබ්දයයි. කටහඬේ ශබ්දය පුද්ගලයෙකුගේ ශාරීරික සහ මානසික තත්ත්වය සමග සමීපව සම්බන්ධ වේ. අධික උනන්දුව හෝ ප්‍රබෝධය හේතුකරගෙන ඉහළ අන්තරාලයක්,

වේගයෙන් උච්චාවචනය වීමක් ඇති කළ හැකිය. කෝපය, බිය හෝ අසහනය නිසා බාධා කරන, යටිගිරියෙන් කෑගැසන ශබ්දයක් හෝ විකල්පීය වශයෙන්, පහළ, අනතුරු අඟවන ශබ්දයක් ද ඇති විය හැකිය. බුදුපියාණන් වහන්සේට තිබුණේ විශේෂයෙන් සුන්දර කටහඬකි. එයින් උන්වහන්සේගේ ගැඹුරු අභ්‍යන්තර නිශ්චලතාව සහ උණුසුම් මහාකරුණාව, පිළිබිඹු විය. මෙය උන්වහන්සේගේ කථාව වඩාත් සිත් ඇදගන්නා සුළු කරන්න ඇත. උන්වහන්සේගේ කටහඬේ ගතිලක්ෂණ අටක් තිබුණි. අසමාන (විස්සට්ඨ) සහ පැහැදිලි (විඤ්ඤෙයිය), මිහිරි (මඤ්ජු) සහ ප්‍රසන්න (සවනීය), හොඳින් සම්පූර්ණ වූ (බින්දු) සහ ගලා යන (අවිසාරි), ගැඹුරු (ගම්භීර) සහ අනු නාදක (නින්නාදි) යනුවෙනි. නිරීක්ෂකයෙකු දුටුවේ බුදුපියාණන් වහන්සේගේ කථා අවසන් වූ විට, ශ්‍රාවකයන් නැගිට පිටත් වූයේ අකැමැත්තෙන් බව හා ඔවුහු උන්වහන්සේ දෙස දෑස් දල්වාගෙන සිටි බවත්ය (M.II,140).

## ඔට්ටු ඇල්ලීමේ තර්කය

ඔට්ටු ඇල්ලීම යනු විකල්ප දෙකකින් හෝ වැඩි ගණනකින් අවදානම් සැලකිල්ලට ගැනීම සහ වාසිදායක ප්‍රතිඵලය ලබා ගැනීමට බොහෝ දුරට ඉඩ ඇති එක මත තීරණයක් ගැනීමයි. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ඉගැන්වීම් තුළින් මිනිසුන්ට ධර්මයේ ඇති සත්‍ය අවබෝධ කර ගැනීමට උපකාර කිරීම සඳහා පුළුල් පරාසයක ප්‍රවේශයන් භාවිත කළහ. සමහර විට උන්වහන්සේ ගුණවත් බව 'ආදරය සහ ගෞරවය ඇති කරයි, තවත් විටක ඔවුන්ගේ අනාගතය ඉලක්ක කරමින්, උපකාරවන බව, ආරවුල් ඇති නොවන, සමගිය සහ එක්සත් බව ඇති කිරීම සඳහා පාදක වෙන බව 'කියමින් ඔවුන්ගේ යහපත් ස්වභාවයට අවධානය කැඳවයි (A.III,287). තවත් විටක, යහපත් බව සහ ඍජුබව අන් අයගේ ගෞරවය ලැබීමට හේතු වන අතර, දුරාචාරය කීර්තියට කැලලක් ඇති වීමට, හොඳ නරක පිළිබඳ දැනීම සසල කිරීමට හේතුවන බව, සමහර විට නීතිය සම්බන්ධයෙන් ද කරදර ඇති වීමට මඟ සැලැස්විය හැකි බව මතක් කරමින්, ඔවුන්ගේ අනාගතය කෙරෙහි ඔවුන්ගේ සැලකිල්ල ඉලක්ක කළහ (M.III,164). මෙවැනි තර්ක පදනම් වන්නේ නිරීක්ෂණය කළ හැකි සාධක මතයි. ඒ නිසා, සාමාන්‍යයෙන් ඍජු අත්දැකීම්වලට ප්‍රවේශ විය නොහැකි සමහර කරුණු ධර්මයේ ඇත, කර්මය සහ

නැවත ඉපදීම උදාහරණ වශයෙන් දැක්විය හැකිය. මේ අනුව, බුදුපියාණන් වහන්සේ සමහර විට මෙම විෂයයන් ගැන කථා කරන විට, හේතු භාවිත කළ අතර, උන්වහන්සේ භාවිත කළ වඩාත් සිත්ගන්නා සුළු තර්කය වූයේ ඔට්ටු ඇල්ලීමේ තර්කය ලෙස හැඳින්විය හැකියි.

වරක් උගත් පුද්ගලයන්ගෙන් යුක්ත ශ්‍රාවක පිරිසක් බුදුපියාණන් වහන්සේ අමතමින් සිටි විට, ඔවුන් කියා සිටියේ තමන්ට 'හේතූන්වලින් සාක්ෂි නොදරන' (නො ආකාරවති) ධර්මය කෙරෙහි විශ්වාසය තැබිය නොහැකි බවයි. ඔවුන් සමග බුදුපියාණන්සේ කළ කථාවේ සාරාංශය මෙයයි. කර්මය සහ නැවත ඉපදීම සත්‍ය නම්, යම් කෙනෙකු ගුණවත් නම්, ඔහු හෝ ඇය දැන් ප්‍රිය මනාප වේ, විශ්වාස කරනු ඇත, ගෞරව කරනු ඇත, ඊළඟ භවය යහපත් එකක් වනු ඇත. කර්මය සහ නැවත ඉපදීම සත්‍යය නම් සහ කෙනෙකු දුෂ්චරිතයෙන් යුක්ත නම්, එම පුද්ගලයා දැන් මහත් හිරිහැරවලට ලක් වනු ඇත, ඊළඟ භවය අභාග්‍යසම්පන්න වනු ඇත. කර්මය සහ නැවත ඉපදීම සත්‍යය නොවේ නම්, කෙනෙකු ගුණවත් නම්, ඔහු හෝ ඇය තවමත් කෙසේ වෙතත්, මේ ජීවිතයේදී ප්‍රිය මනාප වෙනු ඇත, විශ්වාසවන්තයෙකු වේ, ගෞරවයට පාත්‍ර වේ. පෙර කී ලෙස බුද්ධිමත් පුද්ගලයෙකුට කර්මය සහ නැවත ඉපදීම විශ්වාස කිරීමට තදින් සිත් ගන්නාවූ හේතු දැකිය හැකිය. ඔහු ඒ අනුව, හෝ අඩුම තරමින් ඒවා සත්‍ය යැයි ගනිමින් ක්‍රියා කරනු ඇත (M.I,402).

නැවත ඉපදීමේ යථාර්ථය ගැන සැකයක් ඇති නිසා බෞද්ධ වීමට පසුබට වන අයට මෙම තර්කන සීමාවම සලකා බැලිය හැකිය. නැවත ඉපදීම සත්‍යයක් වුවත්, නැතත්, යම් කෙනෙකුට තවමත් යහපත්ව ක්‍රියා කළ හැකි අතර, එයින් ප්‍රයෝජන ද ලබා ගත හැකිය. තවමත් භාවනා පුහුණු වීම් සහ සන්සුන් බවින් සහ සමාධියෙන් ප්‍රයෝජන ලබා ගත හැකි වන අතර, බුදුපියාණන් වහන්සේට ගෞරව කර එයින් ද වැඩි දියුණු විය හැකිය.

## යුද්ධය

යුද්ධයක් (රණ හෝ යුද්ධ) යනු කණ්ඩායම් දෙකක් හෝ වැඩි ගණනක් හෝ රටවල්, දීර්ඝ කාලයක් තිස්සේ එකිනෙකා සමග සන්නද්ධ ගැටුම්වල යෙදෙන අවස්ථාවකි. යුද්ධය භීතියෙන්, ලෝභයෙන් හෝ වෛරයෙන් වර්ධනය වන අතර, සෑම විටම ඝාතනය සම්බන්ධ වේ. එනිසා බුදුදහම එය පළමුවැනි ශික්ෂාපදයට සම්බන්ධ යැයි සලකයි. ත්‍රිපිටකයේ ඉඳහිට යුද්ධ ගැන සඳහන් කරන නමුත්, ඒවායේ ඇති බිය සහ අවාසනාවන්ත කම පිළිබඳව කිසිවක් සඳහන් කර නැත. එක් අණදෙන නිලධාරියෙකු ඔවුන් යටත් කර ගැනීම සඳහා නගරයක් වැටලූ විට, එහි පදිංචි වැසියන්ගේ වට්ටක්කා වැනි හිස් ඔවුන්ට භාවිත කළ හැකි බව තම මිනිසුන්ට පැවසූ බව අපට කියවන්නට හැකි විය (Ja.VI,400). යුද්ධයට යෑමට පෙර සොල්දාදුවන්ගේ භීතිය විස්තර කරමින්, බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ 'ඔහුගේ හදවත ගිලී යයි, දුර්මුඛ වෙයි, ඔහු කම්පනයකට සූදානම් වේ.' (සංසීදති විසීදති න සන්ථම්භති, A.III,89), A.III,89).

ජාතික උපද්‍රව ඇති කාලවලදී, ආගමික නායකයන් බොහෝ විට සොල්දාදුවන් සටන් කිරීමට පෙළඹවීමට උත්සාහ කර ඇත්තේ ඔවුන් යුදපිටියේදී මිය ගියහොත්, ඔවුන්ට ස්වර්ගයේ තැනක් හිමිවන බව කියමිනි. මෙම ප්‍රයෝජනවත්, නමුත්, ව්‍යාජ අදහස පැරණි ඉන්දියාවේ පැවති අතර, එය භගවද් ගීතයේ සහ වෙනත් ආගමික ග්‍රන්ථ කිහිපයක ද සඳහන් වී ඇත. වරක් එක් සොල්දාදුවෙකු මෙම කියමන සත්‍යදැයි බුදුපියාණන් වහන්සේගෙන් ඇසූ නමුත්, බුදුපියාණන් වහන්සේ එයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළහ. සොල්දාදුවා මෙම ප්‍රශ්නය නොනවත්වා ඇසූ අතර, අවසානයේ බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්නේ 'මෙම මිනිසුන් මැරීමට, ඝාතනය කිරීමට, සමූල ඝාතනය කිරීමට, විනාශ කිරීමට, මුලිනුපුටා දැමීමට' සොල්දාදුවෙකුට එවැනි සිතුවිලි ඇත්නම්, ඒ වෙලාවේ ඔහුත් මරණයට පත් වේ නම්, ඔහු ඉපදීමට ඉඩ ඇත්තේ නිරයේ බවයි (S.IV,309). එසේම මහාවස්තුවේ සඳහන් වෙන්නේ 'මිනිසුන්ගේ අතේ අවි ආයුධ තබා, මෙම ගම්මානයට, මෙම නගරයට, හෝ මෙම මිනිසාට හෝ අර සත්ත්වයාට පහර දෙන්න' යැයි පවසන පුද්ගලයන් පිළිගැනීමට නිරය සූදානමින් සිටී.

බෞද්ධ දාර්ශනිකයෝ සහ චින්තකයෝ කිසිවිටකත්, යුද්ධය නපුරු යන අදහසට එකඟ නොවූහ. ඒ නිසාම, ශුද්ධ යුද්ධයක්, යුක්ති සහගත යුද්ධයක් කුරුස යුද්ධයක් හෝ ජිහාඩ් යන සංකල්ප කිසි විටකත් ඇති කළේ නැත. එසේ තිබියදීත්, යුද්ධයෙන් අල්පයක් වූ යහපතක් සමහර විට සිදු විය හැකි බව පිළිගත යුතුයි. ක්‍රි. පූ. 262දී අශෝක රජු කාලිංග

(නූතන ඔරිස්සේන් ඉන්දියාව) ආක්‍රමණය කර අයිති කර ගැනීමට නියෝග කළේය. ඔහුගේම වචනවලට අනුව, 'එක් ලක්ෂ පනස් දහසක් පිටුවහල් කරන ලදී. ලක්ෂයක් මිය ගියහ. තවත් බොහෝ පිරිසක් වෙනත් හේතූන් නිසා මිය ගියහ'. තමා වගකිව යුතු දේ වටහාගත් අශෝක බුද්ධාගම වැළඳ ගෙන ආක්‍රමණශීලී ප්‍රතිපත්තිය අත් හළේය. ඔහුට 'ගැඹුරු පසුතැවිල්ලක්' (අනුසොචන) ඔහු කළ දේ පිළිබඳව ඇති වූ බව ඔහු ප්‍රසිද්ධියේ පිළිගත්තේය. 'යටත් කර නොගත් රටක් යටත් කර ගත් විට ඇති වන ඝාතන, මිය යෑම සහ ජනශූන්‍ය වීම නිසා රජු දැන් දැඩි ලෙස වේදනාවට පත්ව සිටී'. අශෝක රාජ්‍ය පාලන කාලය තුළ අවම වශයෙන් ඉන්දියාවේ දීර්ඝ කාලයක සාමයක් භුක්ති විඳින්නට හැකි විය.

බෞද්ධ දාර්ශනිකයෙකු වූ චන්ද්‍රකීර්ති තම රජු සහ රට වෙනුවෙන් සටනේදී තම ජීවිතය පූජා කරන අය ගැන ඉතා පහත් මතයක් දරයි. 'මේ ලෝකයේ සූදුවට, මත්පැන්වලට, සහ ගණිකාවන් සමග යෑමට තමන් සතු දේ අත්හරින මිනිසුන්ට ප්‍රශංසාව ලැබිය යුතු නැත. ගුණවත් අය එවැනි අත්හැරීම්වලට ගෞරව නොකරති. එයට හේතුව එය සිදුවන්නේ ඇබ්බැහිවීමක් නිසාය. ඒ හා සමානවම, යුද්ධයේදී තම ජීවිතය අත් හරින්නා අගය කළ යුතු නැත. එයට හේතුව එයට සම්බන්ධ වන්නේ නපුරු ක්‍රියාවන් නිසාය'.

මෙම වචන වලින් යුද්ධයෙන් තොර ලෝකයක් සඳහාවූ ප්‍රාර්ථනය ස්වර්ණප්‍රභාසොත්තම සූත්‍රය ප්‍රකාශ කරයි. 'සියලු රාජවංශ, නගර, ඉඩම් සහ

පළාත් ආරක්ෂා කරන්න, ඔවුන් රකින්න, ආක්‍රමණවලින් ඔවුන් ආරක්ෂා කරන්න, ඔවුන්ට සාමය සහ සමෘද්ධිය ලබා දෙන්න. ඔවුන් බියෙන්, ව්‍යසනවලින් සහ නපුරු නිමිතිවලින් නිදහස් කරන්න. ඔවුන්ගේ සතුරු සේනාවන් ආපසු හරවා ඉන්දියාවේ සියලුම රජවරුන් තුළ ගැටුම්, ආක්‍රමණ, රණ්ඩු දබර සහ අසල්වැසියන් සමග ආරවුල් ඇති නොවීමට ඇති ආශාව අවදි කරන්න. ඉන්දියාවේ සියලුම රජවරු තමන්ගේ රාජධානි, ඔවුන්ගේ දේශසීමා සහ ඔවුන්ගේ ධනයෙන් සෑහීමට පත්වන විට, ඔවුන් එකිනෙකා සමග සටන් නොකරනු ඇත. හෝ අන්‍යෝන්‍ය අරගල ඇති නොකරනු ඇත... ඔවුන් ඔවුන්ගේ රාජධානිවලින් සෑහීමට පත් වනු ඇත. ඔවුන් මුළු පළාතටම අපද්‍රව්‍ය දැමීමෙන් එකිනෙකා අභිබවා නොයනු ඇත, හෝ ඔවුන්ගේ ශක්තිය භාවිත නොකරනු ඇත. ඉන්දියාවේ සියලුම රජවරු තමන්ගේ සහ අන් අයගේ සුභසාධනය ගැන සිතන විට, ඉන්දියාව බහුල ආහාර, ප්‍රසන්න සහ ජනාකීර්ණ බවෙන් පොහොසත් වනු ඇත. (සංක්ෂිප්තයි)

ඇතැම් විට, යුද්ධයකට සහභාගිවීම දුෂ්ටකම් දෙකකට වඩා අඩුවිය හැකි බව බෞද්ධයන් පුද්ගලිකව සැලකිල්ලට ගත හැකි විය හැකිය. එය පිළිගැනීමට අපහසු නමුත් නොවැළැක්විය හැකිය. වෙනත් කල්පනාකාරී බෞද්ධයන් ඕනෑම තත්ත්වයක් යටතේ වුවත්, යුද්ධයකට සම්බන්ධ වීම ප්‍රතික්ෂේප කළ හැකිය. කෙසේ නමුත්, යුද්ධයක් හදිසියේ නොඇරඹේ. ඒවා සාමාන්‍යයෙන් ඇතිවන්නේ ආතතිය සහ බිය ඇති කාලපරිච්ඡේදයක

අවසානයේදීය. යුද්ධයට වඩාත්ම ස්ථිර බෞද්ධ ප්‍රතිචාරය වනුයේ සන්නද්ධ ගැටුම් නොවැළැක්විය හැකි තත්ත්වයට පත්වීමට පෙර එහි හේතු සමග කටයුතු කිරීමයි.

බෞද්ධ රටවල දේශපාලන ඉතිහාසය අනෙකුත් බොහෝ රටවල මෙන් යුද්ධවලින් පිරී තිබේ. කෙසේ වෙතත්, තනිකරම ආගමික හේතූන් මත හෝ බුදුදහම ප්‍රවර්ධනය කිරීම සඳහා කරන ලද යුද්ධ සාමාන්‍ය නොවේ.
The Place for a Righteous War in Buddhism.' P. D. Premasirs, in *Studies in Buddhist Philosophy and Religion*, 2006.

## මුඩුබිම - හිස් තැනක්

ටී.එස්. එලියට් (1888-1965) විසිවන ශතවර්ෂයේදී වඩාත්ම බලවත් කවියෙකු වූ අතර, ඔහු මුඩුබිම යන නමින් රචනා කළ කාව්‍යය ඔහුගේ වැදගත්ම කෘතිය ලෙස සැලකේ. අපැහැදිලි ඓතිහාසික, සාහිත්‍ය සහ මිථ්‍යා උපුටාගැනීම්, සංකේතවාදයේ සංකීර්ණ රටාවන්ගෙන් පිරුණු එය, නූතන ලෝකය හිස් සහ ආධ්‍යාත්මික අර්ථයෙන් තොර වූවක් ලෙස නිරූපණය කරයි. බුදුපියාණන් වහන්සේගේ සුප්‍රසිද්ධ තුන්වන ධර්මදේශනාව වන ආදිත්තපරියාය සූත්‍රය (S.IV,19-20) ට පසුව, මුඩු බිමේ තුන්වන සර්ගය හඳුන්වන්නේ ගිනි දේශනය ලෙසයි. මෙම සර්ගයේ අවසානයේ, 'මහණෙනි, සියල්ල දැවෙමින් පවතී' (සබ්බං භික්ඛූ ආදිත්තං) යන ධර්ම දේශනාව පුරාම බුදුපියාණන් වහන්සේ විසින් බොහෝ වාරයක් නැවත නැවතත් පැවසූ 'දැවෙයි, දැවෙයි, දැවෙයි, දැවෙයි!' යන වචනවල භාවාර්ථය එලියට් ප්‍රකාශ

කරයි. මෙසේ කියමින් බුදුපියාණන් වහන්සේ අදහස් කළේ සාමාන්‍ය මිනිසුන් ඉඳුරන්ගෙන් ලබන විඳීම සහ රූප සංඥා සිතෙන් දැඩිව දරාගෙන සහ ආශාවෙන්, වෛරයෙන් සහ මෝහයෙන් දැවෙයි. එලියට්ට මෙම වචන බොහෝ මිනිසුන් ජීවත්වෙන හැඟීම් රහිත ආකාරය පිළිබඳව ප්‍රබල සහ පසුනොබසින ප්‍රකාශයකි.

එලියට්ට බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් කෙරෙහි ගැඹුරු ඇගයීමක් තිබූ අතර, සමහර බෞද්ධ ග්‍රන්ථ පවා ඔහු අධ්‍යයනය කර ඇත. එලියට් පිළිබඳව පීටර් ඇක්‌රොයිඩ්ගේ චරිතාපදානයේ, ඔහු මෙසේ ලියා ඇත. '... බුදුදහම කෙරෙහි තිබූ ආකර්ෂණය හුදෙක් දාර්ශනික එකක් නොවේ. නිර්වාණය යනු නිවීයාමයි - ආශාව, අහෝසි කිරීමයි. බැඳීම්වලින් නිදහස් වීමයි -තරුණ එලියට්ට නිදහස් වීමට වැඩි ප්‍රමුඛතාවකින් යුතු ආශාවක් ඇති බව ඔහුගේ කවිවලින් පෙනෙන්ට තිබේ'. සාමාන්‍ය ලෞකික පැවැත්ම පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ විස්තර කිරීමෙන් එලියට් සසල වී ඇත. එසේම ඔහු ආදිත්තපරියාය සූත්‍රයේ අවසානයේදී බුදුපියාණන් වහන්සේ දුන් පොරොන්දුවෙන් ඒ හා සමානවම සසල වූ බව පෙනී යයි, එනම් මේ ආකාරයට ජීවත්වීමෙන් මතුපිටට පැමිණ 'මෙය දකිමින්, හොඳින් උපදෙස් ලැබූ උතුම් ශ්‍රාවකයා ඉඳුරන් පිනවීමෙන් ඉවතට යයි. ඒවායෙන් පිටතට ඒමෙන් ඔහුගේ තද ආශාව මැකී යයි, දැඩි ආශාවන් මැකී යාමෙන්, ඔහු නිදහස් වෙයි. ඔහු නිදහස් වූ විට, තමන් නිදහස් වූ බව ඔහු දනී'.

එලියට් සිය සුප්‍රසිද්ධ කවිය නම් කරන විට

බුදුපියාණන් වහන්සේගෙන් ඉඟියක් ලබගන්නට ඇතැයි යන්න සිත්ගන්නා කරුණකි. බුදුපියාණන් වහන්සේ බොහෝ විට 'මානසික මුඩුබිමක්' ලෙස සමහර ඍණාත්මක මානසික ස්වභාවයන් විස්තර කළහ (චෙතොඛිල, A.V,17; M.I,101; S.V,57). බලන්න **ගින්දර සහ කවි**

## ධනය

ධනය (භොග, ධන හෝ විත්ත) යනු පුද්ගලයෙකුට, ආයතනයකට හෝ රටකට අයත් විශාල ප්‍රමාණයෙන් මුදල් හෝ වටිනා භාණ්ඩ වේ. ධන යන පාලි වචනයේ අර්ථය 'ධාන්‍ය' - බාර්ලි, සහල්, තල හෝ තිරිඟු - එයට හේතුව ඉන්දියාවේ මුදල් නිර්මාණයට පෙර, ධනයේ ප්‍රධාන නිර්ණායකය (ධඤ්ඤං, A.II,32) මෙය විය. බොහෝ කුඹුරු සහ පිරුණු ධාන්‍යාගාරයක් හිමි පවුලක් ධනවත් යැයි සැලකේ. බුදුපියාණන් වහන්සේගේ කාලයේ ධනය ධාන්‍යවලින් මනිනු ලැබූව ද, ඊට වඩා රන් හා රිදී වලින් මනිනු ලැබුණි (A.IV,7).

ජේසුස් වහන්සේ විමුක්තිය සඳහා ධනය ප්‍රධාන බාධාවක් ලෙස සැලකුවේය. (මතෙව් 6:19-21: 19:23: මාක් 10:17-30; ලූක්16:13; 18:22: 1 තිමති.6:9-10) , සහ ඔහු කළ දැඩි හෙළාදැකීම් සමහරක් ධනවතුන් සඳහා වෙන් කර තබා ගත්තේය, (ලූක් 6:24-25; 16:19-31;ජේම්ස් 1:9-11; 5:1-2) බුදුපියාණන් වහන්සේ ධනය සහ ධනවතුන් කෙරෙහි වඩාත් යථාර්ථවාදී සහ අගය කිරීමේ ආකල්පයක් තිබුණි. උන්වහන්සේ මෙසේ පැවසූහ 'කෙනෙකු තම ධනය නීත්‍යානුකූලව සහ අන් අයට හානියක් නොවන ලෙස උපයා එයින්

සතුටට පත්ව සහ තෘප්තිමත්ව, අනෙක් අය සමග බෙදා ගනී ද, යහපත් ක්‍රියා කරයි ද, ලෝභයෙන්, මෝහයෙන් මුළා නොවී, එහි සීමාව දනිමින්, ඔහුගේම ආධ්‍යාත්මික ගුණවගාව සිතේ තබාගෙන කටයුතු කරයි ද, එම පුද්ගලයා මේ සියලු කාරණා සමබන්ධයෙන් ප්‍රශංසනීයයි' (A.V,180-1). බුදුපියාණන් වහන්සේ මෙහිදී පැවසුවේ කරුණු තුනකට අනුව ධනවතුන් 'ප්‍රශංසනීය' (පාසංසො) විය හැකි බවයි. 1. ඔවුන් ඔවුන්ගේ ධනය උපනය ආකාරය, 2. ඔවුන් එය භාවිත කරන ආකාරය, 3. ඒ කෙරෙහි ඔවුන් දක්වන ආකල්පය වශයෙනි.

බෞද්ධයෙකු තම ධනය නීත්‍යානුකූලව (ධම්මෙන), අනෙක් අයට හානි නොකර (සංවිභජති), එනම් පංචශීල සීමාව තුළ, සම්මා ආජීව ආචාර ධර්මයට අනුකූලව, සහ සමාජයේ නීති සම්මත උල්ලංඝණය නොකර, ඉපයිය යුතු වේ. තමන්ගේ ධනය ඉපයීමෙන් පසු, ඔවුන් එය භාවිත කළ යුත්තේ අර්ථවත් සහ ඔවුන් සැපවත් සහ තෘප්තිමත් (අත්තානං සුඛෙති පීණෙති) වන ආකාරයෙනි. එය හරයක් නැති සහ සුලබ සුඛෝපභෝගී දේවලට නිකරුණේ නාස්ති කිරීමෙන් හෝ කිසිසේත්ම වියදම් කිරීමෙන් වැළකිය යුතුයි. නමුත්, ඒවා ප්‍රයෝජනයට ගනිමින් සිටින විට එසේ භුක්ති විඳීමට හැකියාවක් නැති පුද්ගලයන් කිසිසේත් අමතක කළ යුතු නොවේ. පරිත්‍යාගශීලී සහ පරාර්ථකාමී හැඟීමකින් යුක්තව, ඔවුන් තමන්ගේ ධනය අනෙක් අය සමග බෙදා ගත යුතුය (සංවිභජති) සහ පුණ්‍ය ආයතන සහ ආගමික ආයතනවලට (පුඤ්ඤානි කරොති) උපකාර කළ යුතුයි.

බුදුපියාණන් වහන්සේගේ සරණ පැතූ පළමු පිරිස වන්නේ තපස්සු සහ භල්ලික වෙළඳුන් බව දැන ගැනීම වැදගත් වේ. ඔවුන්ගේ එම ක්‍රියාවෙන් බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් මුල් බැස ගත් විගසම ධනවත් වෙළෙඳුන්වන අනාථපිණ්ඩික, සෝසිත, කුක්කුට, පාවාරික සහ වෙනත් අයගේ නොමසුරු අනුග්‍රහය ලැබීමට හේතුවිය.

ධනය මිනිසුන්ට අහංකාර වීමට සහ තුටු පහටු සිතැතිව සිටීමටත්, විශේෂයෙන් එය හදිසියේ හෝ සුළු උත්සාහයකින් අත්පත් කර ගෙන තිබේ නම්, ප්‍රවණතාවක් ඇති කළ හැකිය. බුදුපියාණන් වහන්සේ නිරීක්ෂණය කළ ආකාරයට,: 'විශාල ධනයක් අත්පත් කරගත් විට, එයින් ඉවතට නොයන්නේ, නොසැලකිලිමත් වන්නේ, ඉඳුරන් පිනවීම පසුපස යන්නේ සහ අනෙක් අයට නරක විදියට සලකන්නේ සුළු පිරිසකි' (S.I,74). මෙම අනතුරු ඇඟවීම මතක තබා ගනිමින්, පරිණත ධනවත් බෞද්ධයන් ඔවුන්ගේ ධනය (ආදීනවදස්සාවී) පිළිබඳ සීමාවන් සිතේ තබා ගත යුතුයි. ධනයට ඔවුන්ට සමහර අංශවලින් බොහෝ දේ දිය හැකි නමුත්, එයට ඔවුන්ට ජීවිතයේ බොහෝ වැදගත් බොහෝ දේ ලබා දිය නොහැකිය. මෙය ඔවුන් ලෝභයෙන්, මෝහයෙන් හෝ ආශාවෙන් (අමුච්ඡිත) තොරව භාවිත කිරීම ධෛර්යමත් කරයි. එසේම, ඔවුන්ගේ ආධ්‍යාත්මික වර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමට ඔවුන්ට ලබා දෙන කාලය, නිදහස සහ අවස්ථාවන් ඔවුන් භාවිත කරන්නේ නම් ඔවුන්ගේ ධනයට ඊටත් වඩා

විශාල වටිනාකමක් තිබිය හැකි බව ද ඔවුන් තේරුම් ගත යුතුයි' (නිස්සරණපඤ්ඤ).

නිවැරදිව අත්පත් කරගත් සහ බුද්ධිමත්ව භාවිත කරන ලද ධනයට ප්‍රශංසා කරන අතරම, බුදුපියාණන් වහන්සේ මෙය සැමවිටම සමතුලිත කළේ වැඩි වටිනාකමක් ඇති, සෑම දෙනාටම ලබා ගත හැකි, කිසිවිටක සොරකම් කළ නොහැකි, නැතිනොවන, සහ ඊළඟ භවයට ගෙන යා හැකි වෙනත් ආකාරයේ ධනයක් තිබෙන බව පෙන්වා දෙමිනි. උන්වහන්සේ මෙසේ පැවසූහ: 'පස් ආකාරයක ධනය ඇත. ඒ පහ මොනවා ද? විශ්වාසය නමැති ධනය, ගුණවත් බව නමැති ධනය, ඉගෙනීම නමැති ධනය, පරිත්‍යාගශීලීත්වය නමැති ධනය සහ ප්‍රඥාව නමැති ධනයයි' (A.III,53). මෙම සහ වෙනත් ආධ්‍යාත්මික වස්තුවලින් 'පොහොසත්' කවුරුන් හෝ 'ඔවුන් පිරිමියෙකු හෝ ගැහැනියක හෝ වේවා, ඔවුන් දුප්පත් නොවේ, ඔවුන්ගේ ජීවිත හිස් නොවේ' (A.IV,5). බලන්න **ව්‍යවසාත්මක නිපුණතා**

## ආයුධ

ආයුධ (ආයුධ හෝ සත්ත) යනු ආරක්ෂාව සහ ඝාතනය සඳහා භාවිත කරන උපකරණ වේ. සාම්ප්‍රදායික සුභ ආයුධ පහ නම්: කඩුව (ඛග්ග), හෙල්ලය (සෙත්ති), දුන්න (ධන), පලිහ (ඛෙඨ) සහ පොරොව (වාසි) යනාදියයි. සම්මත කඩුව අඟල් සමාන 33ක් දිග වන අතර (Ja.I,273), ඊතල හිස් විවිධ හැඩයන්ගෙන් යුක්තය (M.I,429). ඒවා සමහර විට විෂවලින් ආලේප කර ඇත.

පළමු ශික්ෂාපදය පිළිපැදීමට, බුදුපියාණන් වහන්සේ නියම කළේ, 'ජීවිත නැති කිරීමෙන් වැළකීම, කෝටුව සහ කඩුව පැත්තකට දැමීම, සහ සියලු ජීවීන් කෙරෙහි සැලකිලිමත් වෙමින්, කරුණාවෙන් සහ අනුකම්පාවෙන් ජීවත් වීමයි' (D.I,4). සමහර විට, උන්වහන්සේ 'ආයුධය' නමැති වචනය ප්‍රචණ්ඩත්වය අදහස් කරමින් භාවිත කළහ. සමහර විට එකල තිබූ වාග් සම්ප්‍රදායක් භාවිත කරමින්, 'දිව නමැති ආයුධය භාවිත කරමින් එකිනෙකාට තුවාල කරමින්' ප්‍රචණ්ඩකාරී වාදවිවාදවල යෙදී සිටින මිනිසුන් පිළිබඳව උන්වහන්සේ හැඳින්වූ ආකාරය විය හැකිය (M.I,320). තවත් අවස්ථාවක උන්වහන්සේ පැවසුවේ ආදරය පිරුණු හදවතක් ඇත්තෙකුට ආයුධවලින් හානි කළ නොහැකි බවය. බුදුපියාණන් වහන්සේ විසින් සඳහන් කළ පස් ආකාර වැරදි ජීවානෝපායන් අතර, ආයුධ වෙළඳාම (සත්ථවණිජ්ජා) ද ඇතුළත් වේ (A.III,208).

බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් කෙතරම් හොඳින් පුහුණු වී තිබූයේ ද යත්, මෙම පුහුණුව කිසි විටකත්, පීඩනයට, බලහත්කාරයට හෝ තර්ජනවලට සම්බන්ධ නොවීම ගැනත් මිනිස්සු බොහෝ විට ප්‍රශංසා කළහ. වරක් පසේනදී රජු බුදුපියාණන් වහන්සේට මෙසේ කීවේය: 'මම උතුම් අභිෂේක ලත් රජෙක් වෙමි. එසේම සුදුස්සන් ඝාතනය කිරීමට දඩ නියම කිරීමට හෝ පිටුවහල් කිරීමට මට බලය ඇත. එහෙත් මා සභාවේ සිටින විට, මිනිසුන් බොහෝ විට මට බාධා කරනු ඇත. මා ඔවුන්ට කථා කිරීම අවසන් වනතුරු රැඳී සිටින්න යැයි පැවසුව ද, ඔවුහු මට බාධා කරති. නමුත් ඔබවහන්සේ සිය ගණනක්

මිනිසුන්ට උගන්වන විට, යම් කෙනෙකු කැස්ස හෝ උගුර පෑදීමක හෝ ශබ්දයක් පවා නැත. වරක් ඔබවහන්සේ සමූහයකට ධර්මය උගන්වන විට, යම් කෙනෙකු ඔහුගේ උගුර පෑදුවේය. ඔහුගේ සගයෙකු ඔහුගේ දණහිසට තට්ටු කර, ''නිශ්ශබ්ද වන්න, ශබ්ද නොකරන්න. බුදුපියාණන් වහන්සේ ධර්මය උගන්වන සේක''. එවිට මම සිතුවෙමි, ''පුදුමයි, සැබැවින්ම පුදුමයි, කෝටුවක් හෝ කඩුවක් නොමැතිව, සභාවක මෙතරම් හොඳ විනයක් ඇති වන්නේ කෙසේ ද.''සැබැවින්ම, මෙතරම් හොඳ විනයක් ඇති සභාවක් මම නොදනිමි'' (M.II,122).

සමහර පැරණි ඉන්දියානු දෙවිවරුන් යුද්ධයේ සහ සන්නද්ධ සටන්වල යෙදී සිටි බව කියනු ලැබේ;. නිරූපණවලින් ඒවා බොහෝ විට සටහන් කර ඇත්තේ ඔවුන් ආයුධ අතැතිව සිටින අයුරෙනි. විශේෂස්තව, යනුවෙන් හැඳින්වෙන බුහුටි කවිය ක්‍රි. පූ. 4වන ශතවර්ෂයේදී රචනය වී ඇති අතර, එයින් බුදුපියාණන් වහන්සේගේ පෙනුම, හැසිරීම සහ සන්නාහ ආයිත්තම්, විවිධ ඉන්දියානු දෙවිවරුන්, අඩදේවතාවන් සහ වීරයන් සමග සසඳා ඇත. කවිය සම්පූර්ණයෙන්ම අගය කළ හැක්කේ හින්දු ආගමේ ඇතැම් විට, සංකීර්ණ ජනප්‍රවාද සහ සත් ආදර්ශ චරිතාපදානයන් පිළිබඳව මනා දැනුමක් ඇති කියවන්නෙකුට පමණි. නමුත්, ආයුධ ගැන සඳහන් පද තේරුම් ගත හැකි තරම්ය. විශේෂස්තවයේ පද අංක 8, 53, 55 සහ 56 මෙසේය - 'කවපෙත්තෙන් සහ හෙල්ලයෙන් ඔවුන්ට මාරයාගේ බලවේග ජයගත නොහැකි විය. නමුත්, ආයුධ නොමැතිව, මෛත්‍රිය තුළින් ඔබට ජයග්‍රයග්‍රහණ ලබාගත හැකි විය'. ව්‍යාස ප්‍රකාශ කළේ යුද්ධයේදී මරණය

ස්වර්ගයේ විභූතිය ජයග්‍රහණය කරන බවයි. මේ අතර බුදුපියාණන් වහන්ස, ඔබවහන්සේ උගන්වා ඇත්තේ ප්‍රචණ්ඩකාරී මනසක් නිරයේ දුක් විඳීමට හේතුවන බවයි. ''ස්කන්ධ, ඉන්ද්‍ර, උපෙන්ද්‍ර සහ රුද්‍ර යන මේ සියලු දෙනා ආයුධ රැගෙන සිටින්නේ බිය නිසා හෝ අනෙක් අය බිය වැද්දීමටයි. ඔබ කිසිවකට බිය නොවේ, එසේම ඔබ කිසිවෙකු බිය නොවද්දයි. ඔබ බිය හෝ බියජනක නොවේ. ඔබ කිසිවෙකුට එරෙහිව ආයුධ අතට ගන්නේ නැත. ඔබ භීතියෙන් නිදහස්ය, ඔබ අන් අයට බිය නොවන්න, එවිට ඔබ මිනිසුන් අතර, ඉහළම තැනැත්තා වේ'.

සමහර මහායාන බෝධිසත්ත්වයන් වහන්සේලා වජ්‍රයාන සම්ප්‍රදායේ දෙවිවරුන් මෙන් වුවත්, බුදුපියාණන් වහන්සේ කිසි විටෙකත්, ආයුධයක් අතැතිව නිරූපණය කර නැත.
*Arms and Armor: Traditional Weapons of India*, E. Jaiwant Paul, 2005.

## විවාහ උත්සව

විවාහ උත්සව (ආවාහමඞ්ගල හෝ මඞ්ගලකිරියා) යනු දෙදෙනෙකුගේ විවාහය සනිටුහන් කරන උත්සවයකි. මුල්කාලීන බෞද්ධයෝ එකල පැවති විවාහ උත්සව තෝරා ගත්හ. කෙසේ නමුත්, ඔවුන්ගේ විවාහ උත්සවයන් බ්‍රාහ්මණ ආගමෙන් වෙන්කර හඳුනා ගැනීමට අවශ්‍ය වූ ඔවුහු, මනාලිය සහ මනාලයා විසින් ගින්න හත් වරක් පැදකුණු කරන චාරිත්‍රය අත් හැරියහ. බ්‍රාහ්මණයෙකු වෙනුවට, පවුල් දෙකේම වැඩිහිටියෝ නිල කටයුතු සිදු කළහ. විවාහ උත්සවය සඳහා සුභ වේලාවක් තීරණය කිරීම පිණිස බොහෝ විට ජ්‍යෝතිෂය භාවිත කරන ලදී.

නමුත් මුල් කාලීන බෞද්ධයෝ මෙම පුරුද්ද පරිහාසයට ලක් කළහ (Ja.I,258). විවාහය මූලික වශයෙන් දේපළ ආරක්ෂා කිරීම හෝ වැඩි දියුණු කිරීම සහ නීත්‍යානුකූල දරුවන් බිහිකිරීම සඳහා විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් තරුණ පුද්ගලයෙකුගේ විවාහය සූදානම් කරන විට ඔවුන්ගේ කැමැත්ත සහ බලාපොරොත්තු සැලකිල්ලට ගත්තේ අල්ප වශයෙනි. කෙසේ නමුත්, මෙම කාරණයේදී සහ තවත් බොහෝ කාරණවලදී බුදුපියාණන් වහන්සේ පැවසුවේ කරුණාව, සැලකිල්ල සහ ඊට සම්බන්ධ වන පුද්ගලයන්ගේ හොඳම කැමැත්තට භූමිකාවක් තිබිය යුතු බවයි. උන්වහන්සේ පැවසුවේ දෙමාපියන් තම දියණියට හෝ පුත්‍රයාට විවාහයක් කර දෙන විට, 'ඇයගේ යහපතට, ඇයගේ සුභසිද්ධියට සැලකිල්ලක් දක්වමින්, ඇයට අනුකම්පාවක් ඇතිව සහ ඇය කෙරෙහි අනුකම්පා ඇතිව,' කළ යුතු බවයි (A.IV,265).

විවාහ උත්සයකදී මූලික වශයෙන් ආකාර දෙකක් ඇත. එක්කෝ මනාලයා මනාලියගේ නිවසට (ආවාහ) යන අතර, අනෙක මනාලිය මනාලයාගේ නිවසට (විවාහ) ගෙන ගියහ. මෙම අවස්ථා දෙකේදීම පෙරහැරක් සහ සංගීතය සහ නැටුම් බොහෝ සෙයින් තිබුණි (A.II,61; D.I,99). උත්සවයේ අත්‍යවශ්‍ය ලක්ෂණය වූයේ මනාලියගේ පියා ඇගේ වම් අතගෙන චාරිත්‍රානුකූල කෙණ්ඩියක් (හිංකාර) ඔහුගේ දකුණු අතෙන් යුවලගේ දෑතට වතුර වත්කරයි. එය චාරිත්‍රානුකූලව මනාලිය මනාලියට භාර දීමයි (A.III,226; IV,210; Ja.III,286). සංස්කෘත සාහිත්‍යයේ මෙම උත්සවය හඳුන්වන්නේ 'අත දීම' (පාණිප්‍රදාන) ලෙසයි. මෙයින් පසු, දෙමාපියන්ගේ

සහ වැඩිහිටියන්ගේ ආශීර්වාදය සිදු වේ. ජාතක කථවක බෝධිසත්ත්ව මෙම විවාහ ආශීර්වාදය දෙයි - 'ඔබගේ ආදරණීය බිරිඳ සමග ඇති ඔබේ මිත්‍රත්වය කිසි විටකත් හීන නොවේවා' (අජෙය්‍ය එසා තව හොතු මෙත්තී භරියාය කච්චාන පියාය සද්ධිං, Ja.VI,323).

පැරණි ඉන්දියාවේ මනාලියගේ පවුල සමහර විට දෑවැද්දක් (දායජ්ජ) ගෙවා ඇති අතර, තවත් විටක ඔවුන් ඇයට සහජ උරුමයක් (නහානමූල), ලබා දුන්හ. නමුත්, එවැනි චාරිත්‍ර පුරුදු කර ඇත්තේ ප්‍රධාන වශයෙන් පොහොසතුන් විසින් බව පෙනී යයි. එවැනි පුරුදු පිළිබඳව බුදුපියාණන් වහන්සේ කිසිවක් පවසා නැත. නමුත්, උන්වහන්සේ ගැහැණු ලමයින් බිරින්දෑවරුන් වශයෙන් මිලදී ගැනීම සහ විකිණීම විවේචනය කළහ (A.III,221; Ja.IV,363). අළුතින් විවාහ වන මනාලිය ඇයගේ ස්වාමියාගේ නිවසේදී පත්වන අසහනය පිළිබඳව බුදුපියාණන් විස්තර කළේ අනුකම්පාවෙන්ය. 'තරුණ භාර්යාවක් තම ස්වාමිපුරුෂයාගේ නිවසට දවල් හෝ රාත්‍රී ගෙන යන විට, ඇයට තම නැන්දම්මා, මාමණ්ඩි, සැමියා, වැඩකාරයින් සහ වහලුන් ඉදිරියේ පවා මහත් බයාදු සහ ලජ්ජාශීලී හැඟීමක් ඇති වේ' (A.II,78).

විනය පිටකයට අනුව, ආශ්‍රමයක දායකයෙකු ආරාධනා කරනු ලැබුවහොත්, භික්ෂූන්ට විවාහ මංගල්‍ය උත්සවවලට සම්බන්ධ විය හැකිය (Vin.I,140). ඔවුන්ගේ පැමිණීම මංගල කටයුතු සඳහා සුබ පැතුම් පිරිනැමීමක් ලෙස සැලකුවාද, නැතහොත් බ්‍රාහ්මණයන් වෙනුවට තෑගි ලැබීමට පැමිණියේද, හෝ ඔවුන් උත්සවයේ යම් විධිමත් කාර්යභාරයක්

ඉටු කළේ ද යන්න පැහැදිලි නැත. පසුකාලීන ශතවර්ෂවලදී ඉන්දියාවේ භික්ෂූන් විවාහ උත්සවවලට සහභාගී වූයේ නැත. අළුත විවාහවූවන්ට පැමිණෙන භික්ෂූන් විසින් ආශීර්වාද කිරීම සඳහා අභිසමාචාරිකාවේ සුන්දර කවි පෙළක් ඇතුළත් වේ.

බුදුපියාණන් වහන්සේට අනුව, භික්ෂූන් සහ භික්ෂුණීන් වහන්සේලා විවාහ උත්සවයේ 'විවාහ කර දීමේ කටයුතුවලට' සම්බන්ධ නොවිය යුතුයි (D.I,11). එයට හේතුව ඔවුන් මඟුල් කපුවන් ලෙස ක්‍රියානොකළ යුතු නිසාය (Vin.III,138). වර්තමානයේ බොහෝ ථේරවාදී රටවල භික්ෂූන් විවාහ උත්සවවලට සහභාගී වීම සාමාන්‍ය දෙයකි. පැරණි උත්සවවල සමහර අංග තවමත් ථේරවාදී රටවල පවතී. නමුත්, ඒවා දේශීය චාරිත්‍ර සමග මිශ්‍ර වී ඇත. බලන්න **විශ්වාසදායක බව**

## චක්‍රය

චක්‍රය (චක්ක)යනු චලනය වන විට හැරෙන පැතලි රවුම් වස්තුවකි. පැරණි ඉන්දියානුවන් දේශපාලනමය සෛ වරීභාවය සහ ආධිපත්‍යයේ සංකේතයක් ලෙස චක්‍රය භාවිත කළහ. පළමු බෞද්ධයන් එය සෛ වරීභාවය සඳහා සංකේතයක් ලෙස ද භාවිත කළහ. නමුත්, දේශපාලනමය සෛ වරීභාවයට වඩා ආධ්‍යාත්මික වශයෙන් භාවිත කළහ. බුදුපියාණන් වහන්සේගේ පළමු ධර්මදේශනාව හැඳින්වෙන්නේ 'ධර්ම චක්‍රයේ චලනය ස්ථාපිත කිරීම' ලෙසයි (S.V,420 ff). චක්‍රයේ වළල්ල (මුඛවට්ටි) ප්‍රගතියේ ඉදිරියට යෑම නියෝජනය කරයි. ගරාදි (අර) සහ මධ්‍යය (නාභි) නියෝජනය කරන්නේ විවිධ දේ එකට

එකමුතු කිරීමයි. පරිත්‍යාගශීලීත්වය, කාරුණික කථාව, අනෙක් අය වෙනුවෙන් යහපත් දේ කිරීම, සහ ලෝකය වෙනුවෙන් ඔවුන්ට අපක්ෂපාතීව සැලකීම, චක්‍රයක කඩ ඇණය (ආණි) බව (A.II,32) බුදුපියාණන් වහන්සේ පැවසූහ. එනම් එය චක්‍රය බාධක ඉවත් කර ගනිමින් හැරවීමට පහසු වේ. චක්‍රයක් දෙපැත්තේ මුවෙකු බොහෝ කාලයක් සිට භාවිත කර ඇත්තේ බුදුපියාණන් වහන්සේගේ පළමු ධර්ම දේශනාව සාරානාථවල මුව උද්‍යානයේ තිබීම සංකේතවත් කිරීම සඳහාය.

වර්තමානයේ බුදුදහමේ සංකේතයක් ලෙස බොහෝ විට චක්‍රයක ගරාදි අටක් නිරූපණය කරන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගය නියෝජනය කිරීමටයි. නමුත් මෙය සාපේක්ෂව මෑත කාලයේ අලුත් වෙනස්කමකි. බුදුපියාණන් වහන්සේගේ පළමු ධර්ම දේශනාවේදී උන්වහන්සේ කියා සිටියේ චතුරාර්ය සත්‍යයේ සෑම සත්‍යයක්ම 'අවබෝධ කරගෙන ඇත', 'අවබෝධ කළ හැකිය', අවබෝධ කරගන්නවා ඇත' යනුවෙනි. ඒ අනුව, ඒවා දොළොසක් වශයෙන් තුන් ආකාරයකින් සම්පූර්ණ කෙරේ' (තිපරිවට්ටං ද්වාදසාකාරං, S.V,422). ඒ අනුව, ධර්ම චක්‍රයකට ගරාදි දොළොසක් තිබූයේ යැයි බලාපොරොත්තු විය හැකිය. නමුත් මුල් කාලීන බෞද්ධ කලාවේ එකක්වත් එසේ නිරූපණය කර නැත. ධර්ම ග්‍රන්ථවල ධර්ම චක්‍ර හඳුන්වා දී ඇත්තේ උත්තරීතර චක්‍රය (බ්‍රහ්මචක්ක) හෝ උත්තරීතර ධර්ම චක්‍රය (අනුත්තරං ධම්මචක්කං, A.III,9; 148) ලෙසයි. එය 'ගරාදි දහසක් සහිත' (සහස්සාරං, D.III,60) එකකි. ක්‍රි. පූ. 3වන ශතවර්ෂය වනතුරු ධර්ම චක්‍ර නිරූපණය වූයේ බොහෝ වූ

ගරාදි සමගය. දහසක් ඉදිරිපත් කිරීමට අදහස් කළ බවට සැකයක් නැත.

ස්තූප සම්ප්‍රාප්තියට පෙර, බුදුපියාණන් වහන්සේ බොහෝ විට නියෝජනය කරනු ලැබුවේ චක්‍රයක් මගින්ය. ක්‍රිස්තියානීන්ට කුරුසය මෙන්, යුදෙව්වන්ට මෙනොරාය, තාඕඉස්ට්ට යින්ග් යැන්ග් සංකේතය සහ හින්දූන්ට ඔම් සලකුණ මෙන්ම, බෞද්ධයන්ට චක්‍රයයි. බලන්න **ප්‍රජාවේ පාදක**
*The Buddhist Wheel Symbol*, T. Karunaratne, 1969.

## ප්‍රඥාව

ප්‍රඥාව යනු (පඤ්ඤා) අත්දැකීම් සහ දැනුම මත පදනම්ව බුද්ධිමත් තීරණ ගැනීමට සහ නිවැරදි නිගමනවලට එළඹීමට ඇති හැකියාවයි. ප්‍රඥාව මනසේ හැකියාවයි. ඒ නිසා මනසේ තත්ත්වය ඥානවන්ත වීමට ඇති හැකියාව කෙරෙහි බලපායි. අගතියෙන් සහ පූර්ව නිගමනවලින් මනස නිදහස් කර ගැනීම, දැනුවත්භාවය වර්ධනය කිරීම සහ විධිමත් සහ නොකැළඹුණ මනසක් තිබීම යන මේ සියල්ල ප්‍රඥාව දියුණු කිරීමට උපකාර වේ. සදාචාරමය හැසිරීම සහ ප්‍රඥාව අතර සමීප සම්බන්ධයක් තිබෙන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. : 'ප්‍රඥාව පිරිසිඳු වන්නේ ගුණවත් කමෙන් වන අතර, ගුණවත් බව පිරිසිඳු වන්නේ ප්‍රඥාවෙනි. එකක් ඇති තැන, අනෙක් එක ද එසේමය. ගුණවත් පුද්ගලයාට ප්‍රඥාව ඇත, ප්‍රඥාවන්ත පුද්ගලයාට ගුණවත් බව ඇත. ගුණවත් බව සහ ප්‍රඥාව අතර ඇති සංයෝජනය ලෝකයේ ඇති ඉහළම දෙය ලෙස හැඳින් වේ' (D.I,124).

## කාන්තාවන්

තරමක් මෑතක් වන තුරුම, සෑම සමාජයක්ම පාහේ කාන්තාවන් පිරිමින්ට වඩා පහත් යැයි සැලකූහ. මෙම පහත් තත්ත්වය බොහෝ ආගම්වල ඉගැන්වීම් වල ද පිළිබිඹු විය. මිනිස් සංහතියේ වැටීමට (1 තිමති 2,11-15) කාන්තාවන් වගකිව යුතු බව බයිබලය දරා සිටියි. දරු ප්‍රසූතියේ දී ඇතිවන වේදනාව මෙම වරදට දෙවියන් වහන්සේ කාන්තාවන්ට දුන් දඬුවම ලෙස සලකනු ලබයි. (ප්‍රභවය 3,16) කොන්ෆියුෂියානුවාදය ඉගැන්වූයේ කාන්තාවන් ජීවත් විය යුත්තේ 'යටත්වීම් තුන' යනුවෙන් හඳුන්වන ආකාරයට බවයි. එනම් විවාහයට පෙර පියාට යටත්වී, විවාහයට පසු ස්වාමිපුරුෂයාට යටත්ව සහ වැන්දඹුවක් වූ විට වැඩිමහල් පුත්‍රයාට යටත් වීම වශයෙනි. බිරින්දෑවරුන් මිය ගිය පුරුෂයන්ට නැවතත් විවාහ වීමට ධෛර්යමත් කරන ලදී. නමුත්, කාන්තාවන්ට එසේ කිරීම තහනම් විය. හින්දු ආගමේ මනුස්මෘතියට අනුව, කාන්තාවන්ට ගෞරව කරන ලදී. නමුත් සෑම ආකාරයෙන්ම යටහත්ව තබන ලදී. ඔවුන්ට වේදය, පූජනීය ග්‍රන්ථ කියවීමට අවසර නොදුණි. මනුස්මෘතියේ බලය පොදුවේ පිළිගත් එකක් නොවුවද එය පිළිගත් අය වූවද, එහි සියලු චෝදනාත්මක විවේචන අවශ්‍යයෙන්ම පිළිගත්හ. කාන්තාවන් පිළිබඳ ඉන්දියානු ආකල්පය සඳහා එහි බලපෑම ගැඹුරුය.

බුදුපියාණන් වහන්සේගේ කාලයේ ඉන්දියානු කාන්තාවන්ට සැලකිය යුතු තරම් වැඩි නිදහසක් පසු

කාලීන ශතවර්ෂවලට වඩා වැඩියෙන් තිබුණි. පසුකාලීනව සිදු වූවාක් මෙන් ෆර්ඩා, වැන්දඹුවන් පිළිස්සීම, ගැහැණු බිළිඳු දරුවන් මරා දැමීම හෝ ළමා විවාහ යනාදිය සම්මතයක් බවට පත්ව ඇති බවට සාක්ෂි නැත. වැන්දඹුවන්ට නැවත විවාහ විය හැකිය. නමුත්, ජාතකවල ඇති පද එකතුවක සඳහන් වූයේ ඔවුන් දෙස පිළිකුලෙන් (Ja.VI,508) බලන්නට පටන් ගත් බවයි. මෙම ආකල්පය පසුකාලීනව බලහත්කාරයෙන් වැන්දඹුභාවයට මඟ පෑදීය. බෞද්ධයෝ එය අනුමත නොකළ බව පෙන්වමින් වැන්දඹුවගේ දුෂ්කර තත්ත්වය ගැන මෙම පදවලින් මහත් අනුකම්පාවක් දක්වති.

කාන්තාවන් කෙරෙහි බුදුපියාණන් වහන්සේගේ ආකල්පය පිළිබඳ ප්‍රධාන සමකාලීන විවේචනය වන්නේ උන්වහන්සේට ආරෝපණය කර ඇති අදහස්ය. 1. කාන්තාවකට සම්පූර්ණයෙන් පරිපූර්ණවූ බුදුකෙනෙකු (සම්මා සම්බුද්ධ) වන්නට නොහැකිය. (සම්මා සම්බුද්ධ, M.III,65) 2. භික්ෂුණීන් භික්ෂූන්ට වඩා පහත් තත්ත්වයට පත් කරමින් විශේෂ නීති අටක් (අට්ඨ ගරුධම්ම) සමඟින් ඔවුන් ජීවත් විය යුතුයි' (Vin.II,254). මෙම පළමු අදහස සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම පරිපූර්ණවූ බුදුකෙනෙකු පහලවීම ඉතා විරල අවස්ථාවකි. බොහෝ කල්ප ගණනාවකට වරක් පමණක් සිදුවන අතර, ඕනෑම කෙනෙකුට, ඔවුන්ගේ ලිංගභේදය කුමක් වූවත්, බුදුකෙනෙකු වීම අතිශයින් දුරය. තත්ත්වය එසේ තිබියදී විරුද්ධත්වය තීරණයක් නැති තරම්ය. භික්ෂුණීන් පිළිබඳ විශේෂ නීති අට නිසා ඔවුන්ට භික්ෂූන් වහන්සේලාට වඩා දෙවන ස්ථානයක් ලබා දෙන අතර, කරුණු

කිහිපයකදී ඔවුන් භික්ෂූන් මත යැපීමට සලස්වයි. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ නූතන අදහස් සමග නොගැලපෙන නමුත්, බුදුපියාණන් වහන්සේගේ කාලය තුළ මෙය විවාදාත්මක නොවන්නට ඇත. අද වන විට බොහෝ විනය නීති නොසලකා හරිනු ලබන්නේ ඒවා ගරුසරු නැති නිසා හෝ නූතන සම්මතයන්ට අනියම් නිසා වන අතර, විශේෂ නීති අට මේ සඳහා උදාහරණයක් වේ. එබැවින් ඒවා පිළිපැදිය යුතු නොවේ.

කාන්තාවන් කෙරෙහි බුදුපියාණන් වහන්සේට නොපැහැදිලි ආකල්පයක් තිබූ බව පෙනේ, ඒ සමහර විට ඔවුන් අගය කිරීම සහ තවත් විටෙක ඔවුන්ට අවඥාවෙන් කථා කිරීම වශයෙනි. කෙසේ නමුත්, ධර්මයෙහි අත්‍යවශ්‍ය කරුණු සම්බන්ධයෙන් උන්වහන්සේ ස්ථිරව ප්‍රකාශ කළේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වය අතර සැලකිය යුතු වෙනසක් නොමැති බවයි. උන්වහන්සේ මෙසේ පැවසූහ 'නිවසේ සිට නිවසෙන් බැහැරට ගොස් තථාගතයන් වහන්සේ විසින් උගන්වන ලද ධර්මය සහ පුහුණුව තුළින් කාන්තාවන්ට නිර්වාණය තෙක් ඇති පියවර ඔස්සේ ගමන් කරමින් නිර්වාණය අවබෝධ කරගත හැකිය' (Vin.II,254).

නැවතත්, 'පුරුෂයෙකු හෝ වේවා, කාන්තාවක හෝ වේවා, ධර්මය නමැති අශ්ව කරත්තයේ ගමන් කරන ඕනෑම කෙනෙකු නිර්වාණය වෙත ළඟාවනු ඇත' (S.I,33). සෝමා භික්ෂුණිය ද එම කාරණයම, සමහර විට වඩාත් අවධාරණයෙන් පැහැදිලි කළාය. 'මනස සන්සුන්ව සහ ස්ථිරව පවතින විට, දිනෙනේ දින දැනුම වැඩෙන විට සහ ධර්මය පිළිබඳ ඇයට ඇතුළු

නුවණ තිබෙන විට, කාන්තාවගේ ස්වභාවය වැදගත් නොවේ. ''මම කාන්තාවක්'' හෝ ''මම පිරිමියෙක්'' යනුවෙන් සිතන්නෙකු, හෝ වෙන යම් සිතුවිල්ලක්, ''මම ...''මාරයාට එම පුද්ගලයා ඇමතිය හැකිය (S.I,129). බුදුපියාණන් වහන්සේ පැවසුවේ භික්ෂුණීන් සහ උපාසිකාවන් ඇතුළු උන්වහන්සේගේ සියලු ශ්‍රාවකයන් 'ධර්මයේ නිපුණ සහ හොඳින් පුහුණුව ලැබූ, උගත්, සහ ප්‍රාඥ, ධර්මය හොඳින් දන්නා, ධර්මයේ ජීවත්වෙන සහ ධර්ම මාර්ගයේ ගමන් කරන...ඔවුන්ගේ ගුරුවරුන්ගෙන් උගත් දේ අනෙක් අය වෙත යවන්නට, උගන්වන්නට, ප්‍රකාශ කරන්නට, ස්ථාපිත කරන්නට, තේරුම් කරන්නට, ප්‍රවර්ධනය කරන්නට සහ පැහැදිලි කරන්නට... වැරදි ඉගැන්වීම් ප්‍රතික්ෂේප කරන්නට සහ මෙම විස්මකුරු ධර්මය බෙදන්නට' උන්වහන්සේ ඒ සියලු දෙනාගෙන් බලාපොරොත්තු වන බව පැවසූහ (D.II,105).

අභිධම්ම පිටකයේ ධම්මසඞ්ගණීයෙන් කියා සිටින්නේ ස්ත්‍රී පුරුෂ භාවය යනු පදාර්ථයේ (රූප) ගතිලක්ෂණයක් මිස විඥානයේ ලක්ෂණයක් නොවේ (චිත්ත, Dhs.633-4). එහි නිසැකවම අර්ථයක් ඇත. මේ අනුව, මේ ජීවිතයේ ස්ත්‍රී ශරීරයක් ඇති සත්ත්වයෙකුගේ විඥානය පිරිමි ශරීරයක් යළි පණ ගැන්වුවද, ඊළඟ ජීවිතයේ විඥානයට සමාන වේ. බලන්න **අම්බපාලී, ගෘහස්ථ ජීවිතය, මහා ප්‍රජාපතී ගෝතමී, පැවිදි වීම, ආවරණ සහ ආවරණ කිරීම, සඞ්ඝමිත්තා සහ ථේරගාථා සහ ථේරීගාථා.**

*Women and Monastic Buddhism in Early South Asia*, Garima Kaushik, 2016

## බුදුපියාණන් වහන්සේගේ අවසාන වචන

බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයට පැය කිහිපයකට පෙර කුසිනාරාවේ දී, උන්වහන්සේ වටා සිටි අයට යම් අවසාන උපදෙස් දුන්හ. මෙසේ කොට, උන්වහන්සේ තමන්වහන්සේගේ අවසාන වචන කථා කළ අතර, ඒවා ඔවුන්ට මතක් කිරීම් සහ ධෛර්යමත් කිරීම්ය. උන්වහන්සේගේ අවසාන වචන මෙසේය, ''මහණෙනි, මම ඔබට කියමි, සියලු (කොන්දේසි සහිත දේ) තත්ත්වාරෝපිත දේවල් අනිත්‍ය වේ. දැනුවත් භාවයෙන් යුතුව උත්සාහ කරන්න' (වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථ). ඊට පසු උන්වහන්සේ ගැඹුරු භාවනාමය තත්ත්වයට පත් වී ටික වේලාවකට පසු නිසල ලෙස පරිනිර්වාණයට පත්වූහ (D.II,156).
*The Last Days of the Buddha*, trans. by Sister Vajira and Francis Story, 1988.

## වැඩ

බලන්න **දිවිපෙවෙත**

## ලෝකය

බුදුපියාණන් වහන්සේගේ මූලික අවධානය යොමු වූයේ මිනිස් ස්වභාවය පිළිබඳව වන අතර, ඒ නිසා උන්වහන්සේට ලෝකයේ මූලාරම්භය හෝ ස්වභාවය (ලෝක) ගැන කීමට තිබුණේ අල්ප වශයෙනි. උන්වහන්සේ භූගෝල විද්‍යාඥයෙකුට වඩා, මිනිස් හදවත පිළිබඳ ගවේශකයෙකු සහ පරිවර්තකයෙක් වූහ. මෙම විෂය පිළිබඳව උන්වහන්සේ දැක්වූ අදහස් කිහිපයෙන් එකක් නම්, පෘථිවිය විශ්වයේ ඇති

අසංඛ්‍යාත දේහයන්ගෙන් එකක් පමණක් වන අතර, එය ස්වාභාවික බලවේගයන් විසින් බිහිකොට නිර්මාණය කරන ලද්දක් බවත්ය (D.III,84).

උන්වහන්සේ සමහර විට ලෝකය හැඳින්වූයේ චක්කවාළ යන වචනයෙන් වන අතර, එහි අදහස 'තැටිය' හෝ 'ගෝලය' වේ. ඇත්ත වශයෙන්ම එය ගෝලය ලෙස හැඳින්වීම සම්පූර්ණයෙන්ම සුදුසු වේ. පැරණි බෞද්ධයන් ද ලෝකය භ්‍රමණය වන බව වටහා ගත්හ. එය 'කුඹල්කරුවෙකුගේ රෝදයක් හෝ තෙල් මෝලක ගලක්' (නිදානකථා 25) මෙන් භ්‍රමණය වන බව පැවසේ. බුදුපියාණන් වහන්සේ පැවසුවේ ලෝකයට ජලයෙන් සහාය ලැබෙන බවත්, ජලයට වාතයෙන් සහ වාතයට අභ්‍යවකාශයෙන් සහාය ලැබෙන බවත්ය (D.II,107). විශාල කැස්බෑවෙකුගේ පිටුපස සිටගෙන සිටින අලි ඇතුන් සිව්දෙනෙකු විසින් ලෝකයට සහයෝගය ලබා දී ඇති බවට කියැවෙන පැරණි ඉන්දියානු අදහසට මෙය සිත්ගන්නා සුළු සැසඳීමකි. පෘථිවිය මත විශාල මහාද්වීප හතරක් තිබෙන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. උන්වහන්සේ යුරෝපය සහ ආසියාව නොබෙදූහ. නමුත්, ඒවා, සැබැවින්ම ඒවා තිබෙන ස්වරූපයෙන්ම තනි භූමි ස්කන්ධයක් ලෙස සැලකූ බවට මතක තබා ගතහොත් එය නිවැරදිය (A.I,227; D.II,173).

ලෝකය සෑදුවේ කව්ද, කවදාද සහ ඇයිද යන්න පිළිබඳව සිතින් විපරම් කිරීම සහ මත නිර්මාණය කිරීම, සැබැවින්ම වැදගත් වන කරුණාවන්ත කම පිරිසිදු හදවතක් සහ එය දියුණු කර ගන්නේ කෙසේ

ද වැනි කාරණාවලින් අවධානය ඉවතට ගන්නා නිෂ්ඵල ලුහුබැඳයාම් බව බුදුපියාණන් වහන්සේ සැලකූහ. උන්වහන්සේ මෙසේ ද පැවසූහ: 'එබැවින් ලෝකය සදාකාලිකද, හෝ ලෞකික ද, සීමිතද හෝ නිමාවක් නැද්ද ... යන්න ගැන කල්පනාවේ නොගැලෙන්න. එවැනි කල්පනාවන් ඉතාම මෝඩ කමකි. එයට අව්‍යාජ, පිරිසිඳූ හැසිරීමට සුදුසු කිසිවක් නැත. එය අත්හැරීමට, ඉවතට හැරීමට, සන්සුන් බවට, නැවතීමට, නොකැළඹීමට, ඉහළ දැනුමට, පුබුදුවීමට හෝ නිර්වාණයට' මඟ නොපෙන්වයි (M.I,431). බලන්න **පරිකල්පනය කළ නොහැකි**

## යක්ඛ

යක්ඛ යනු ත්‍රිපිටකයේ සමහර විට සඳහන්ව ඇති පුද්ගල ස්වභායකට අයත් වර්ගයකි. නමුත් ඔවුන්ගේ නිශ්චිත ස්වභාවය පැහැදිලි නැත. බිය දනවන හෝ අද්භූත, අඳුරේ සහ පාළු ස්ථානවල ගුප්තව රහසේ රැඳී සිටින, සහ මිනිසුන්ට පහර දෙන සහ ඔවුන් ගිල දමන පවා අයෙකු ලෙස බොහෝ විට ඔවුන් පිළිබඳව විස්තර කර ඇත (D.II,346; Ja.I,99). මෙම ස්වරූපයෙන් ඔවුන් සත්ත්ව බිලි පූජා හෝ මස් සහ මද්‍යසාර පූජා මගින් සතුටු කරනු ලැබේ (Ja.I,425; 489). තවත් විටක, ඔවුන් මිනිසුන්ට උදව් කරන බවත්, දෙවියන්ගේ හෝ අඩු මට්ටමේ දෙවියන්ගේ භූමිකාව භාර ගන්නා බවත් කියනු ලැබේ (S.I,205). වෛදික දෙවිකෙනෙකු වූ සක්ක සමහර විට හඳුන්වන්නේ යක්ඛ යන නමිනි (Ja.IV,4). වජ්‍රපාණි නමින් සමහර විට බුදුපියාණන් වහන්සේට භාරකාරයා ලෙස ක්‍රියා කර ඇත (D.I,95). බුදුපියාණන් වහන්සේ ඉඳහිට යක්ඛ යන වචනය මනස අදහස් කරමින් පවසා ඇත (Sn.478; 876). ඉංග්‍රීසි වචනයෙන් ප්‍රේතයෙකු යන වචනයෙන් අවතාරය, මනස, හදවත, හෝ විඤ්ඤාණය යන කරුණක් අදහස් කළ හැකිය. පෙර කී ලෙස, ප්‍රේතයා යන වචනය යක්ඛ යන්නට සුදුසු පරිවර්තනයක් විය හැකිය.

## යසොධරා

සම්ප්‍රදායට අනුව, සිද්ධත්ථ ගෞතමගේ බිරිඳගේ නම

යසොධරා නම් වේ. නමුත්, මෙය ත්‍රිපිටකයේ කිසි තැනක සඳහන් වී නැත. එහිදී උන්වහන්සේගේ බිරිඳ රාහුලමාතා, 'රාහුලගේ මව' ලෙස එක වරක් පමණක් සඳහන් වේ. මුල් කාලීන විස්තරවලට අනුව, සිද්ධත්ථගේ බිරිඳ හඳුන්වා ඇත්තේ භද්දකච්චානා යන නමිනි. එය සමහර විට ඇගේ සැබෑ නම විය හැකිය (Bv.26,15). අටුවාවල ඇය හඳුන්වා ඇත්තේ බිම්බාදෙවී, සමහර විට බිම්බාසුන්දරී යනුවෙනි (Ja.II,392; IV,478). යසොධරා යනු සැබැවින්ම බියවද්දන තේරුමකි. එනම් 'ප්‍රසිද්ධිය ගෙනෙන්නිය' සමහර විට එය නමක් ලෙස සිතන්නට පටන් ගත්තේ පසුකාලීන ශතවර්ෂවල දී පමණය. මෙයට අමතරව, සිද්ධත්ථගේ බිරිඳ පිළිබඳව කිසිම තොරතුරක් නැත. නමුත්, පසුව, බොහෝ පුරාවෘත්ත ඇය පිළිබඳව ගොඩ නැඟුණි. බලන්න **මුහුණු ආවරණ සහ මුහුණු ආවරණය කිරීම**

## යෝග

අප්ටේ ගේ සංස්කෘත-ඉංග්‍රීසි ශබ්දකෝෂයට අනුව, යෝග යන වචනයට වෙනස් වූ අර්ථ 40කට වඩා ඇත. මේවා බොහොමයක් ආගමට සම්බන්ධ නැත. මෙම වචනයට සමීපතම සමාන සිංහල වචනය යෝගී ක්‍රමයයි. බ්‍රාහ්මණ ආගමේ එම වචනයේ තේරුම පසුකාලීන හින්දු ආගමේ, ආධ්‍යාත්මික භාවිතයේ හෝ විනයෙහි අර්ථය වුවත්, එය ත්‍රිපිටකයේ මේ අර්ථයෙන් කිසි විටකත්, භාවිත නොකරේ. බුදුපියාණන් වහන්සේ වරින් වර යෝග යන වචනය ධනාත්මක අර්ථයකින් භාවිත කළහ. 'ධර්මයට බැඳතැබීම' (යොගධම්ම) යනුවෙන් අදහස් වන්නේ ආධ්‍යාත්මික පුහුණුවට ඇති ප්‍රබල කැප

වීමයි (A.III,335). කෙසේ නමුත්, යෝගවලට සාමාන්‍යයෙන් ඇත්තේ ඍණාත්මක ඇඟවීමකි. නිර්වාණය සඳහා එක් පදයක් වන්නේ 'බන්ධනයෙන් ආරක්ෂාව' (යොගඛෙම, S.I,123) යන්නයි. අර්හත් පුද්ගලයෙකු සමහර විට විස්තර කරන්නේ 'බන්ධනය අභිබවනය කරන්නා' (යොගාතිග, It.61) ලෙසයි. මානසික කෙලෙසීම් සමහර විට බන්ධනයක් ලෙස හැඳින් වේ (A.II,10).

කෙසේ වෙතත් අද බොහෝ මිනිසුන් සඳහා යෝග යන වචනය හත යෝගය යනුවෙන් හැඳින්වෙන පැරණි ශාරීරික සහ මානසික ව්‍යායාම සමග සම්බන්ධ වේ. හත යෝගයේ මූලික පෙළ පොත වන්නේ පරිච්ඡේද හතරකින් සහ පද 383කින් යුක්ත හඨයොගප්‍රදීපිකා වේ. ඒවා ඉරියව්ව (ආසන), හුස්ම ගැනීම (ප්‍රාණයාම), අභිනයන් (මුද්‍රා) සහ ඒකාග්‍රතාව (සමාධි) සමග කටයුතු කරයි. මෙම කාර්යය අද දක්වා දුෂ්කර වන නමුත්, බොහෝ විට රචනා වී ඇත්තේ ක්‍රි. ව. 14 සහ 15වන ශතවර්ෂය අතරය. හින්දු ශික්ෂණයක් වුව ද, බෞද්ධ භාවනාවක් කරන ඕනෑම කෙනෙකුට හත යෝග ඔවුන්ගේ පුහුණුවීම්වලට ප්‍රයෝජනවත් වනු ඇත. එයින් යහපත් සෞඛ්‍යයක් වැඩි දියුණු කෙරේ. කය කෙරෙහි සිහිය පවත්වා ගෙනයන ක්‍රමයක් විය හැකිය. එසේම දීර්ඝ කාල වේලාවක් භාවනා කිරීමෙන් පසු කය ප්‍රබෝධමත් කරයි.

## යොන

තිපිටකයේ බොහෝ විවිධ ගෝත්‍ර සහ ජනවාර්ගික කණ්ඩායම් පිළිබඳව සඳහන් වී ඇත. මෙයින් එකකි යොන. කුල-සවිඥාණක බ්‍රාහ්මණයෙකු වූ අස්සලායන සමග කළ සංවාදයෙකදී බුදුපියාණන් වහන්සේ තර්ක කළේ, දිව්‍යමය වශයෙන් නියම කළ යථාර්ථයකට වඩා කුලය සමාජීය සංසිද්ධියක් විය යුතු බවයි. එයට හේතුව යොන අතර, ඇත්තේ කණ්ඩායම් දෙකක් පමණි (M.II,149). ඒ නිදහස් මිනිසුන් සහ වහලුන් වන අතර, ස්වාමියකු වීමෙන් කෙනෙකුට වහලෙකු සහ ප්‍රතිලෝම වශයෙන් ද විය හැකිය. යොන යන පාලි වචනය පැමිණ ඇත්තේ ග්‍රීසියේ පැරණි නාමය වූ අයොනියා හෝ වඩාත් නිවැරදිව, ග්‍රීක රාජ්‍යය සහ වෙරළබඩ අනතොලියාවේ ජනතාවයි. ඔවුන් යටත් කරගනිමින් සහ පර්සියානු අචෙමෙනිඩ් අධිරාජ්‍යයාට අවශෝෂණය කළ විට, අධිරාජ්‍යය පුරා නැගෙනහිර මායිම තරමක් දුරක් දක්වා ඔවුන්ට ගමන් කළ හැකි විය. නැගෙනහිර මායිම ඉන්දියාවේ බටහිර මායිම මෙන් විය. උදාහරණ වශයෙන් මහා ඇලෙක්සැන්ඩර් තක්සිලාවට පැමිණි විට, ඔහු හමු වීමට ග්‍රීක වෙළෙඳුන් පිරිසක් නගරයෙන් පිටතට පැමිණියහ. අශෝක රජුගේ එක් නියෝගයකින් අයොනාස්, ඔහුගේ අධිරාජ්‍යයේ දේශසීමාවේ සිටින ජනතාවක් ලෙස සඳහන් වන අතර, ඔහුගේ එක් නියෝගයක් ඇත්ත වශයෙන්ම ග්‍රීක භාෂාවෙන් ලියැවී ඇත. ක්‍රි. පූ. 120දී කණිෂ්කගේ සුප්‍රසිද්ධ රන් කාසියේ බුදුපියාණන් වහන්සේගේ රූපය තිබූ අතර,

උන්වහන්සේගේ නම (බොද්දො) යනුවෙන් ග්‍රීක භාෂාවෙන් සඳහන් වී තිබුණි.

බුදුපියාණන් වහන්සේ හෝ උන්වහන්සේ ජීවත් වූ ප්‍රදේශයේ කිසිම ඉන්දියානුවෙකු කිසි ග්‍රීක ජාතිකයෙකු දැක ඇති බවක් නොපෙනේ. නමුත්, ත්‍රිපිටකයේ ඇති තනි විස්තරයකින් පෙන්නුම් කරන්නේ ඔවුන් පිළිබඳ අසම්පූර්ණ තොරතුරු නැගෙනහිර දෙසට පැතිර ඇති බවයි. බුදුපියාණන් වහන්සේගේ වංශය වූ ශාක්‍ය වංශිකයන්ට යොන ලාම්පු අතැතිව සිටින පිළිම තිබූ බව අංගුත්තර නිකායේ අට්ඨවාවේ සඳහන් වීම සිත් බඳනා කරුණකි. ඇලෙක්සැන්ඩර්ගේ ජයග්‍රහණයෙන් පසු, ග්‍රීකයන් විශාල සංඛ්‍යාවක් ඉන්දියාවට (නූතන ඇෆ්ගනිස්ථානය සහ උතුරු පකිස්ථානය) සංක්‍රමණය වූ අතර, ඉන්දියානු සංස්කෘතියට යම් බලපෑමක් ඇති කළහ.
*The Greeks in Asia*, John Boardman, 2015.

## උද්‍යෝගය

උද්‍යෝගය (විරිය) යනු විශාල ශක්තියක් සහ උනන්දුවක් ඇති හැඟීමකි. එය කරුණු කිහිපයකින් ක්‍රියාත්මක කළ හැකිය - ධර්මය අධ්‍යයනය සහ පුහුණු කිරීමෙන් ඇති වන ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන්ම ගුණවත් සහ බුද්ධිමත් පුද්ගලයෙකුගෙන් ප්‍රබෝධමත් වීමෙන්, භාවනාවේ ප්‍රතිලාභ අත්විඳීමෙන්, හෝ මරණය නොවැළක්විය හැකි බව මෙනෙහි කිරීමෙන් පවා ඇති වන ඵලයක් ලෙස නිශ්චිත හැඟීමක් ඇති වීමෙනි. උද්‍යෝගයේ ඇති වටිනාකම ලෙස බුදුපියාණන් වහන්සේ පැවසුවේ, එය කැමැත්ත ප්‍රාණවත් කර අපට ශක්තිය, විශ්වාසය සහ අධිෂ්ඨානය ලබා දෙන බවයි. (M.II,175) කෙසේ නමුත්, එය තහවුරු කර නොගත්තේ නම්, ඕනෑම දෙයක් හුදු ආත්ම ශක්තියෙන්, සහ අන්ධ භක්තියෙන් පවා ලබා ගත හැකි යැයි යන වැරදි විශ්වාසය නිසා, උද්‍යෝගය කැළඹීමක් ඇති කරන පිරිහීමකට පත් විය හැකිය. බුදුපියාණන් වහන්සේ පැවසුවේ, අප අපගේ ශක්තිය භාවිත කළ යුත්තේ අප වටු කුරුල්ලෙකු අල්ලන ආකාරයට බවයි. අප වටු කුරුල්ලා උවමනාවට වඩා තදින් අල්ලා ගතහොත්, අප ඌ මරණයට පත්වන ආකාරයෙන් මිරිකෙන්නට පුළුවනි (M.III,159). අප ඌ තදින් අල්ලා නොගතහොත්, ඌ අපගේ ඇඟිලි

අතරින් පියාඹා යන්නට පුළුවනි. එක් අතකින් උද්‍යෝගය සහ අනෙක් අතකින් ඉවසීම, විවේකය සහ මානසික සන්සුන්කම අතර සමබරතාවක් තිබිය යුතුයි. බලන්න **උත්සාහය**

## උච්චස්ථානය

උච්චස්ථානය (උපරිමා දිසා) යනු සූර්යයා අහසේ සමීප වන ඉහළම ස්ථානය හෝ වඩාත් සාමාන්‍යයෙන් ඉහළට යන දිශාවයි. මෙහි ඉංග්‍රීසි වචනය පැමිණෙන්නේ අරාබි බසින් සම්ත් උර් රස්, යනුවෙනි. එහි අර්ථය 'ඉහළට මාර්ගය' යන්නයි. ජනප්‍රිය පරිකල්පනයේ දී, ඉහළ දිසාව සෑමවිටම දෙවියන් හෝ තාරකා හා සමග සම්බන්ධ වේ. ඒ දෙඅංශයම දිව්‍ය ලෝකයේ රැඳී සිටින අතර, මිනිස් ඉරණමට බලපෑම් කරන බව සමහර අය විශ්වාස කරති. ස්වයං නිර්වාණය පිළිබඳ බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම දෙවියන් සහ දෙවියන්ගේ අතිරික්තයක් ඇති කළ අතර, කර්මය පිළිබඳ උන්වහන්සේගේ ඉගැන්වීම ජ්‍යෝතිෂය අසත්‍ය බව පෙන්නුම් කරන ලදී.

වරක් ඔබ මොබ යන භික්ෂුණියක් සාරිපුත්ත මහරහතුන් වහන්සේ පිඬු සිඟා වැඩීමෙන් පසු, දානය වළඳනු දුටුවාය. උන්වහන්සේ දානය වළඳන විට දිසා හයෙන් එකක් දෙස බලමින් ආහාර වළඳනවාද කියා ඇසුවාය. එසේ නොකරන බව උන්වහන්සේ පැවසූහ. ඊට පසු තමන්වහන්සේ එසේ පවසමින් අදහස් කළ දේ ඇයට පැහැදිලි කළහ. උච්චස්ථානය සම්බන්ධයෙන් උන්වහන්සේ මෙසේ

පැවසූහ. 'ජ්‍යෝතිෂ ශාස්ත්‍රය යනුවෙන් හැඳින්වෙන වැරදි ජීවානෝපාය මාර්ගයක් වන එම පහත් ප්‍රයෝග ප්‍රගුණ කිරීමෙන් තම ජීවානෝපාය උපයා ගන්නා භික්ෂූන් සහ පූජකයන් ඉහළ බලමින් අනුභව කළ හැකිය. 'ඉන්පසු උන්වහන්සේ තවදුරටත් මෙසේ පැවසූහ, 'මම එවැනි වැරදි ආකාරවලින් මගේ ජීවානෝපාය උපයන්නේ නැත. මම මගේ ආහාර ධර්මිෂ්ඨ ලෙස ලබාගෙන, ධර්මිෂ්ඨ ලෙස අනුභව කරමි.' මෙයින් මහත් ආකර්ෂණීය වූ භික්ෂුණීය මාර්ගයෙන් මාර්ගයට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට, බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් අගය කරමින් ගියාය (S.III,239). බලන්න **ජ්‍යෝතිෂය**

# සංක්ෂිප්ත

| | |
|---|---|
| A | අඞ්ගුත්තර නිකාය, ed. R. Morris, E. Hardy, PTS, London, 1885-1900 |
| As | අත්ථසාලිනී, ed. E. Muller, PTS, London, 1897 |
| Bv | බුද්ධවංස, ed. N. A. Jayawickrama, PTS, London, 1974 |
| Cp | චරියාපිටක, ed. N. A. Jayawickrama, PTS, London, 1974 |
| D | දීඝ නිකාය, ed. T. W. Rhys Davids, J. E. Carpenter, PTS, London, 1890-1911 |
| Dhp | ධම්මපද, ed. O. Von Hinuber, K. R. Norman, PTS, Oxford, 1994 |
| Dhp-a | ධම්මපද අත්ථකථා, ed. H. C. Norman, PTS, London, 1906-14 |
| Dhs | ධම්මසඞ්ගණී, ed. E. Muller, PTS, London, 1885 |
| It | ඉත්වුත්තක, ed. E. Windisch, PTS, London, 1889 |
| Ja | අටුවා සමග ජාතක, ed. V. Fauseboll, PTS, London, 1877-96 |
| Kv | කථාවත්ථු, ed. A. C. Taylor, PTS, London, 1894 |
| M | මජ්ඣිම නිකාය, ed. V. Trenchner, R. Chalmers, PTS, London, 1887-1902 |
| Mil | මිලින්දපඤ්හෝ, ed. V. Trenchner, PTS, London, 1880 |
| Pj | පරමත්ථජොතිකා, ed. H. Smith PTS, London, 1915 |
| Pv | පේතවත්ථු, ed. N. A. Jayawikrama, PTS, Oxford, 1977 |
| S | සංයුත්ත නිකාය, ed. L. Feer, PTS, London, 1884-98 |
| Sn | සුත්ත නිපාත, ed. D. Andersen, H. Smith, PTS, London, 1913 |
| Th, Thi | ථේරගාථා සහ ථේරීගාථා, ed. H. Oldenberg, R. Pischel, 2nd edition, PTS, London, 1966 |
| Ud | උදාන, ed. P. Steinthal, PTS, London, 1885 |
| Vin | විනය පිටක, ed. H. Oldenberg, PTS, London, 1879-83 |
| Vism | විසුද්ධිමග්ග, ed. C. A. F. Rhys Davids, PTS, London' 1920-21 |
| Vv | විමානවත්ථු, ed. N. A. Jayawickrama, PTS, Oxford, 1977 |

# සූචිය


අභිධම්ම,**1**, 75, 136, 179, 167, 283, 324, 352,
අභිධම්ම පිටක, **1**, 179, 283, 171, 179,
ගබ්සා කිරීම,**1**, 23
සම්මා කම්මන්ත,**2**, 64, 119
පරදාර සේවනය, **2**, 283
අධිෂ්ඨානය සහ යාච්ඥාව, 3
දෙවියන් වහන්සේ කෙනෙකු සිටී දැයි නොදැනීම, 4
අජාසත්තු, 150, 175, 237, 288, 295
ආජීවකයන්, 227, 288, 230, 287
මද්‍යසාර,**4**, 87, 186
පිණ්ඩපාතය වැඩීම,**6**, 30, 74
පරහිතකාරීත්වය,6
අම්බපාලී,**7**, 131, 260
අභිලාෂය සහ ප්‍රාර්ථනාව,7
ආනන්ද, **8**, 198
අනාථපිණ්ඩක,163
අනත්තා, **9**, 92, 290
අනත්තා සහ නැවත ඉපදීම, 9
කෝපය,**10**, 14, 352
අඞගුත්තර නිකාය, 10
අංගුලිමාල, 133
සත්ත්වයන්,**10**, 26, 79, 162, 248
සත්ත්වයන් නිදහස් කිරීම, 12
සත්ත්වයන් බිලිදීම,**13**, 287, 347, 365
වරදට සමාව ඉල්ලීම,14
අදහන ධර්මය වෙනස් කිරීම,15
ඇගැයීම,**15**, 134, 308,
අර්හත් ඵලය, **16**, 63, 92, 115, 138, 183, 366
කලාව, **17**, 187, 294
අසිත,18
අසොක,12, 14, **18**, 64, 75, 151, 173, 189, 229, 249, 327, 354, 366

ජ්‍යෝතිෂය,**19**, 83, 316, 359
අවලෝකිතෙශ්වර, 28
සම්ප්‍රජානනය, 19
සමබරතාව,**21**, 29, 54, 96, 208
ප්‍රජාවේ පදනම් හතර, 22
සුන්දරත්වය, 17, **23**, 58, 107, 184, 203
පුවක්, 87
ස්වාමීන් වහන්සේ,217
බයිබලය, 83, 102, 120, 131, 173, 203, 362
බිම්බිසාර රජු, 173
උත්පත්ති පාලනය,2
ආගමික හා පූජනීය දේ අවමනට ලක් කිරීම,24
ආශීර්වාදය,15, **25**
අන්ධ මිනිසුන් සහ අලියා පිළිබඳ උපමා කථාව, 25,
දඩ කෙළිය,26
බුද්ධ ගයා, **27**, 28, 224, 282
බෝධිචර්‍යාවතාර, 24, 304
බෝධිසත්ඊව,**27**, 101, 114, 138, 162, 193, 360
බෝධි වෘක්ෂය,**28**, 192, 282, 308
ශරීරය, **28**, 51, 69, 93
ශරීරය සිදුරු කිරීම සහ විරූප කිරීම, 29
පාත්‍ර, 6, **30**, 287, 335
බ්‍රහ්මා, **30**, 48, 136, 341
බ්‍රාහ්මණයන්,**32**, 48, 103, 104
බ්‍රාහ්මණ විවාදය,13, **34**, 103, 172, 237, 347
බ්‍රහ්ම විහාර,**34**, 188
ආශ්වාස ප්‍රශ්වාසය,35
අල්ලස් ගැනීම හෝ දීම,36
පාලම්,**36**, 143
බුදුපියාණන් වහන්සේ, 37
බුද්ධචරිත, 11, **38**, 73, 86, 328, 332
බුදුපියාණන් වහන්සේගේ කාලය, 38
බුද්ධඝෝස, **39**, 163, 322, 352
බුදුදහම සහ බෞද්ධයන්,**39**, 65,115, 156, 267, 316
බුදුපියාණන් වහන්සේ සහ ජේසුස් වහන්සේ,39

බුදුපියාණන් වහන්සේගේ ජීවිතය, 31, **42**, 70, 102, 110, 111, 114, 126, 241, 249, 176,199, 200, 297, 310,
බුදුපියාණන් වහන්සේගේ ස්වභාවය, 147
බුරුමය, 36
සීසර් සැත්කම් අංශය, 45
දින දර්ශනය, **45**, 266, 343
චම්පා, 46
කංසා ශාකය,**46**, 87
මරණ දඬුවම,47
කුලය,32, **48**, 117, 227
ගුහා,**50**, 215
බ්‍රහ්මචාරී බව, 31, **50**, 287, 289
සජ්ඣායනය කිරීම, 52
චරිතය සහ චරිත ගොඩනැගීම,14, **52**, 170, 286
ධර්මය පැතිරවීම, 53
ක්‍රිස්තියානි ධර්මය, 107, 115, 121, 147, 207, 259
චර්මච්ඡේදනය, 29
සුචරිතයට සහ සිරිත්වලට ඇලීම, **54**, 145, 151, 274
ඇඳුම්, **55**, 145, 151, 274
වළාකුළු, 266
සාමූහික කර්ම,55,
කරුණාව,34, **56**, 55, 122, 182, 199, 310, 352
සමේ ස්වභාවික වර්ණය සහ මුහුණ,**58**, 189, 214, 249
සම්මා සමාධි, 59, 73, 93
පැරණි චීනයේ දාර්ශනික සහ සදාචාරාත්මක ඉගැන්වීම් පද්ධතියක්, 147, 173
අනුකූලතාව,60
සන්තුෂ්ටිය,**60**, 306
ආගමික මත වෙනස් කිරීම,61
සිරුර අලංකාරයට යොදන ආලේපන, 63
කවුන්සලය, 8, 50, **63**, 172, 229, 351
ආචාරශීලී බව, 64
දැඩි ආශාව,**64**, 74, 154
ඇදහිල්ල,64
ආදාහනය,**65**, 110, 176

අපරාධය,29, **65**, 157
විවේචනය, **66**, 259
නැටීම,**69**, 111, 359
මරණය,47, **69**, 294
වාදවිවාද, 24, **70**, 79, 193, 317
සත්ත්වයන් උගුලකට හසු කිරීම, 150, 151
හේතුඵල ධර්මය, **72**, 219
නියතිවාදය,**73**, 108,
දේවදත්ත,**73**, 124, 212
භූතයා,**74**, 97, 205
ධම්ම,24, 31, **75**, 80, 81, 181
ධම්මපදය,75
ධර්මය, 76
බුදුපියාණන් වහන්සේගේ ආහාර, 76
ආහාර පාලනය,77
දීඝ නිකාය,78
දිශාවන්,**79**, 301, 369
කායික සහ මානසික දුබලතාවන්,80
ධර්මය අතුරුදහන් වීම,80
බුදුපියාණන් වහන්සේගේ පළමු ශ්‍රාවකයන්,82
අනාවැකි කීමේ හැකියාව, විජ්ජා, වාසනාව සහ ඉරණම,83
දික්කසාද කිරීම, 83
දිව්‍යවදාන, 49, 238, 263
වෛද්‍යවරු,**84**, 134
දොණ, **85**, 91, 200, 249
සැකය, **85**, 194
දෑවැද්ද, 360
සිහින,**86**, 229, 337
ඖෂධ,2, 5, 68, **87**
දුක්ඛ, 87
බුදුපියාණන් වහන්සේගේ කන් පෙති, 89
ප්‍රථිවිය,**89**, 98, 364
සම්මා වායාම,90
සතර මහා ධාතු, 28, 81, 154
ඇත්තු, 25, 79, **91**, 192, 194

හිස් බව,92
අවබෝධයට පත්වීම - නිර්වාණය,18, 26, 82, **92**, 311
අවබෝධයේ සුවිශේෂ කොටස්, 93
ව්‍යවසායක කුසලතා,93
විශේෂණයක් ,95
උපේක්ෂාව, 34, 93, **96**, 164
වරම් ලැබුවන්ට පමණක් තේරෙන ගුප්තවිද්‍යාව, 97
දුෂ්ටකම, 29, 49, 75, **97**, 147, 327
පරිණාමය, 97
භූතාත්ම පළවා හැරීම, 253
ප්‍රෘථිවියෙන් අමතර ජීවිත,98
ශ්‍රද්ධාව,21, 72, 91, **99**
විශ්වාසදායකත්වය,100, 197
ප්‍රසිද්ධිය,7, **101**, 320
උපවාස කිරීම,1**02**, 218, 287, 312
ගින්දර, 13,**103**, 204, 224
පළමු ඵලතුරු,**104**, 118
නැමෙනසුලු බව, 54, **104**, 137, 300
මල්,**105**, 110, 155
ආහාර,30, 77, 102, **106**
සමාව දීම,14, **108**, 145
නිදහස් කැමැත්ත, 4, **108**
මිත්‍රත්වය, 100, **108**, 125, 294
මූලධර්මවාදය,**110**, 181
අවමඟුල්,**110**, 176
සූදු ක්‍රීඩාවේ යෙදීම, 27, 65, **113**,
ගංගානම් ගඟ,**114**, 243
ගෙවතු, **115**, 164
සුදු ලූනු,77, **117**
ලිංගභේදය,**117**, 140
ත්‍යාගී බව, 14, 22, **118**, 205
මෘදුබව,91, **119**, 124
භූතයන්,**120**, 365
දෙවියන් වහන්සේ සහ දෙවිවරුන්, 4, 30, 74, 99, **121**, 149, 154, 210, 332, 339

ස්වර්ණමය පාලනය,**121**, 122, 253
හොඳ සහ නරක,**122**, 147, 206
පාත්තයා, 32, **123**
දේශපාලනය කිරීම,**124**, 173
කෘතඥතාවය,15, 28, **125**, 242,
ආචාර කිරීම,125
දැඩි ශෝකය, 69, **126**, 157
ඉඳුරන්ගේ දොරටු රැකීම, 59
වරදකාරීත්වය, 62, **127**, 323, 337
ගුරු, 128
බුදුපියාණන් වහන්සේගේ පුරුදු සහ චර්යා රටාව, 76, **129**
හිසකෙස්,28, 58, **131**, 248
ප්‍රභා මණ්ඩලය,**132**, 309
ප්‍රීතිය,15, 73, 95, **132**, 158, 163
එකඟතාව,19, **133**, 244
රෝග සුව කිරීම, 52, 117, **134**
සෞඛ්‍ය,106, 293
හදවත,28, **135**
දෙව්ලොව,**136**, 224, 225, 354
අපාය, 15, 41, 62, **136**
මිථ්‍යා ලබ්ධිය, 136
ද්විලිංගිකතාව,118,
හිමාලය,114, **137**, 156, 172, 201, 206
හීනයාන,138
භාවනාවට ඇති බාධා,**138**, 163
හින්දු ධර්මය, 14, 32, 1**39**, 154, 207, 346
නිවාඩු, 46
සමලිංගිකතාව,118, **140**, 291
මී පැණි, 5, 76, 82, **141**, 313
ආරෝග්‍යශාලා, 19, 201
ආගන්තුක සත්කාරය,**142**, 233
ගෘහස්ථ ජීවිත,**143**, 238
මිනිස් - සත්ත්ව අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය,145
මිනිස් ස්වභාවය, 147
මානව හිමිකම්,148

හාස්‍යය, 25, **149**, 162
කුසගින්න, 107, 119
දඩයම් කිරීම,27, **150**
සනීපාරක්ෂක විද්‍යාව,**151**, 292, 326
රූප වන්දනාව,153
අවිද්‍යාව,64, **153**
මායාව, 92, **154**
සංක්‍රමණිකයන්, 124
මැදහත් බව, 22
අන්තරාභවය,**155**, 268
සුවඳ දුම් කුඩු,**155**, 247
ව්‍යාභිචාරිය (වැරදි ආශාව), 156
ඉන්ද්‍රියාව,123, **156**, 173, 207, 241
උමතුකම, 157
පොලිය, **157**, 186
ඉසිපතන,159
ඉතිවුත්තක,159
ජෛන ආගම, 4, 62, 99, **161**, 207, 230, 236
ජපානය, 37, 69, 141, 148, 216, 285
ජාතක, **162**, 193, 346, 348
ජාතකමාලා, 57, 151, 249
ජෙතවනය, 162
ධ්‍යාන,59,139, **163**
ජීවක කොමාරභච්ච,116, **164**
ප්‍රීති ප්‍රමෝදය, 15, 73, 93, **165**, 306
විනිශ්ච, 165
කයිලාෂ් කන්ද, 138, 206
කාලාම සූත්‍රය, 110, **169**, 267
කාම සූත්‍රයල 115ල 195ල 196ල 198ල 279ල 292
කර්මය,55, 80,161, 166, **169**, 175
කපිලවත්ථු, 18, **171**, 265
කප්ප, කල්ප, 323
කර්ම, 172
කථාවත්ථු, 172
ඛුද්ධක නිකාය, 75, 159, 162, **172**,

බුජ්ජුත්තරා, 16, 80, 158
කරුණාවන්ත බව,11, 54, 109, 143, **172**
රජවරු සහ රජකමල47ල 75ල 124ල 148ල **173**ල 233ල 311
දැනුම් තුන, 175
කොසැම්බි,176
කුසිනාරා, 85, **176**, 279,
ලලිතවිස්තර, 38, 350
භාෂාව,**179**, 241, 301, 317
අවසාන සිතුවිල්ල ඇතිවන මොහොත, 179
සිනහවෙන බුදුන්, 193
ගිහි බෞද්ධයන්,181
රීතිය සහ රීතියේ පොදු අභිප්‍රාය,110, **181**
ජීවිතය,2, 35, 69, 72, 107, 148, **182**
ජීවිතයේ අර්ථය, 183
ජීවිතයේ අදියර,183
ආලෝකය, 132, **185**
සම්මා ආජීව,47, **185**, 206, 302, 358
නෙලුම්, 46, 146, 171, **186**
නෙලුම් මලේ ඉරියව්ව,187
ආදරය,11, 22, 34, 79, 87, 96, 101, 106, 134, 145, **187**, 196, 200, 207, 220, 242, 289, 315,
මෛත්‍රී භාවනාව,35, 59, **188**, 202
ලුම්බිනී, 189
මධුර, 191
මහාබොධි විහාරස්ථානය,**191**, 344
මහා මායා,189, **192**, 311
මහාපජාපතීගොතමී,**192**, 311
මහාවස්තු, 3, 6, 17, 124, 142, 150, **193**, 196, 302, 304, 354,
මහායාන බුදුදහම, 28, 36, 92, 138, 147, 193, 231, 283, 335, 359,
මෛත්‍රිය,27, 38, 81, **193**
මජ්ඣිම නිකාය,**193**, 265
මන්ත්‍ර, **194**, 363
*මනුස්මෘති*, 32, 83, 84, 117, 142, 204, 222, 362
මාර,**194**, 253, 363
විවාහය,69, 83, 100, 103, **195**, 359

සම්බාහන කිරීම,**197**, 285, 290
ස්වයං සම්භෝගය,**198**, 229, 290
මායා, 198
බුදුපියාණන් වහන්සේගේ අවසාන භෝජනය, 198
මිනුම් සහ මැනීම,199
ඖෂධ,117, 134, 141, **200**, 228, 292
භාවනාව,21, 52, 116, **201**, 291, 303
භාවනාව සහ ස්වභාවික ලස්සන, 202
ඔසප්වීම, 195, **203**, 291
මානසික කෙළෙස්,103, 175, **204**
පුණ්‍යය,205
මෙරූ කන්ද,206
මෛත්‍රිය, 146, 188, **207**,
මෙත්ත සූත්‍රය,52, **207**, 299
මධ්‍යම දේශය,46, 114, 157, 191, **207**, 267
මධ්‍යම ප්‍රතිපදාව,**208**, 227, 345
මිලින්දපඤ්හය, 67, 86, 97, 142, 147, 157, 180, 184, 199, **208**, 243, 332
මනස,74, 135, **210**
හුස්ම පිළිබඳව සිහිකල්පනාව,59, 78, 202, **210**
සම්මා සතිය, 77, 93, 164, 202, **211**
ප්‍රාතිහාර්යයන්,45, 61, 99, **212**
ධර්මදූතයන් සහ දූතමෙහෙවර, **213**, 263
නිහතමානිකම,55, **214**, 286, 299
මොග්ගල්ලාන,8, 127, 146, **214**
පැවිදි ආශ්‍රමයක්,17, 50, 116, 142, **215**, 280
මුදල්,113, 157, **215**
වඳුරු මනස,216
භික්ෂූන්, 48, 107, 143, **216**
මව, 109, 242
මවකගේ මෙන් මනසක්, 51
මූලසර්වාස්තිවාද විනය, 118
සංගීතය,17, 111, **217**, 359
ගුඨ වාදය, 218
නාගාර්ජුන, 16, 34, 47, 67, 143

නාළන්දා, 215, **221**
නම්, 221
නන්ද, 63, 132, **223**
ස්වභාව ධර්ම, 170
පෘථිවියේ නාභිය, 191
නෙරඤ්ජරා ගඟ,224
නිර්වාන, 103, 122, 155, **224**
නිර්වානය සහ තණ්හාව,225
නිර්වානමය නියතය, 226
ආර්ය අෂ්ටාංගික මාර්ගය,31, 59, 90, 185, 208, **227**, 307
චතුරාර්ය සත්‍යය,219, **228**
රාත්‍රී විමෝචනය,87, **228**
ප්‍රාණඝාත නොකරන දින,229
නග්නත්වය, 229
භික්ෂූණීන්, 48, 107, 132, 143, 192, **231**
ගිලනුන්ට උවටැන් කිරීම, 118, 293, 345
පූජනීයත්වයේ සුවඳ, 247
පස් වැදෑරුම් පරිත්‍යාග,142, **233**
මහලු විය,7, 199, **234**, 294
සර්වඥතා ඥානය,**236**, 321
වාචික සම්ප්‍රේෂණය,236
පැවිදි කිරීම, 231, **238**, 283
ශරීරයේ ඉන්ද්‍රියයන් දන්දීම, 239
මුල් පාපය, 300
පාළි, 39, 115, **241**, 283
උපමාකථා සහ උපමා, 25, 39, **241**
දෙමව්පියන් සහ දරුවන් ඇති දැඩි කිරීම,144, 182, 233, 236, **242**, 294, 343
පසේනදී රජු, 62, 77, 162, 174
පඨවී,89
ඉවසීම, 91, 119, **242**, 316
පාතිමොක්ඛ,45, **243**, 352
පැටිනා, 61, 114, 201, **243**
පයාග, 114, 331
සාමය, 16, 86, **244**, 354

ශිෂ්නය,51, 245
සුවඳ විලවුන්,246
සියල්ලෙහිම අගුභ දැකීමේ ප්‍රවණතාව,247
සුරතල් සතුන්,248
බුදුපියාණන් වහන්සේගේ ශාරීරික පෙනුම,41, 76, **248**, 295
වන්දනා ගමන,189, **249**
පැළ,115, 151, 246, **250**
සතුට,51, 66, 250
කාව්‍යය,17, 193, 203, **251**, 321
බහු භාර්යා - බහු පුරුෂ සේවනය,253
කාම උත්තේජනය ඇති කරවන දර්ශන, 253
භූතයෙකු වැහී සිටීම, 253
ඉරියව්ව,59, 178, **254**
පස්වන සහ අටවන ශික්ෂාපද,26, 36, 63, 69, 87, 181, 104, 165, 218, **255**, 286,
මැණික් ගල් සහ ලෝහ,256
භාවනාවේ ප්‍රගමණය, 258
අනාවැකිය,259
ගණිකා වෘත්තිය,186, 253, **259**
මායාකාරී ගැබිණිබව,260
චෛතසික බල,74, 76, 121, 212, **261**
පූජා, 152, 218, **262**
සුනාපරන්තයේ පුණ්ණ, 53, **262**
නිරය,83, 136, 149, **263**
රාහුල,90, 149, 185, 195, **265**, 365
වැස්ස, 265
රාජගහ, 50, 63, **267**
හේතුධර්ම වාදය,267
නැවත ඉපදීම,175, **267**
තිසරණය,53, 61, 100, 165, **268**, 319
පුනරුත්පත්තය,269
ධාතු,82, 85, **269**
අටපිරිකර,270
ගෞරවය, 242, **270**, 320,
අනාවරණය,**271**, 346

දකුණ, 45, 256, **271**, 274
හරි සහ වැරදි, 272
*රිග් වේද*,237, 245, 277, 311, 346
චාරිත්‍ර, 54, 239, 262, **272**
චාරිත්‍රමය පිරිසිදු බව සහ අපිරිසිදුබව,84, 204, **272**
ගංගා, 273
සිවුරු, 55, 74, 129, **274**
සබ්බඨ්,277
සාධු, 277
*සද්ධර්මපුණ්ඩරීක සූත්‍ර*, 41, 201
කහ පැහැති, 277
සක්ක, 30, 265, **277**, 283
සකාය, 42, 48, 55, 156, 171, **277**, 278, 311
සකාමුනි,278
සල්, 146, 176, **279**
ඒක ලිංගික විවාහ,279
සංසාර,41, 227, **280**
සංයුත්ත නිකාය,174, 231, **280**
අභයභූමිය, 280
සඳුන් ලීය, 63, 155, 247
සඩ්ඝ,24, 82, 217, **281**
සඩ්ඝමිත්ත, 282
සඩ්කස්ස,282
සංස්කෘත,283
සාරිපුත්ත,8, 127, 146, 222, **284**
සාරනාථ්, **284**, 361
සත්තපණ්ණි ගුහාව, 50, 63
උණුසුම් කරන ස්ථානය - සෝනාව,285
*සෞනරානන්දකාව්‍ය*, 106, 224
සාවත්ථි, 116, 162, **286**
ධර්ම ග්‍රන්ථ,78, 110, **286**, 324
උස් ආසන සහ සෝපාවන්,286
බුදුපියාණන් වහන්සේගේ කාලයේ ආගමික නිකායන්,30, 102, 227, **287**
පුද්ගලබාවය,9, 66, 223, **288**

ස්වයං-පිළිගැනීම,289
ලිංගිකත්වය සහ ආධ්‍යාත්මිකතාව,289
ලිංගික හැසිරීම,50, 246, **291**
රැවුල බෑම, 292
ෂ්වෙදගොන් චෛත්‍යය, 82
රෝග සහ සෞඛ්‍යය,84, 151, 234, **292**
සිද්ධත්ථ ගෞතම,294
සිගාලොවාද සූත්‍රය,108, **294**, 301
සතර පෙරනිමිති,294
බුදුපියාණන් වහන්සේගේ මහාපුරිස ලක්ෂණ 32, 245, **295**
සීක් ආගම ධර්මය, 121, 131,
නිශ්ශබ්දතාවය,57, **295**
බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාවය, 296
නිශ්ශබ්ද බුදුපියාණන් වහන්සේ, 298
සරලතාව,55, 270, **299**
පාපය, 147, **300**
සූක්ෂම උපක්‍රම,224, 277, **300**, 316
වහල් භාවය,186, **301**
නින්ද,86, 228, 254, **302**
සිනහා සහ සිනහසීම,304
දුම් ඉරීම, 46, 234, **305**
කිවිසුම්, 130
හුදෙකලාව,21, **305**
ආත්මය, 306
දකුණු දොරටුව, 79, 111
සම්මා වාචා,22, 64, 119, **307**, 317
ක්‍රීඩා,
ශ්‍රී, 30, 83
ශ්‍රී ලංකා, 36, 82,103, 111, 141, 213, 280, 310, 321, 327
ප්‍රතිමා, 89, 105, 130, 153, **308**
සොතාපත්තියට එළඹීම, 93
ස්ථූපල 33ල 82ල 86ල 193ල269ල **309**
සුභද්ද,310
හදිසි හෝ ක්‍රමික,311
සුද්ධොදන,18, 73, 265, **311**

දුක්විඳීම, 31, 65, 154, 234, **312**
සියදිවි නසා ගැනීම,312
සුජාතා, 141, **313**
සූකරමද්දව, 313
සූර්යාගේ පිහිටීම අනුව වේලාව දක්වන උපකරණය, 323
හිරු උදාව, 323
සූත්‍ර, 10, 237, **313**
සුත්ත නිපාතය,25, 194, 207, **314**
සූත්‍ර පිටකය,78, 241, **314**
පරුෂ වචනයෙන් බැණ වැදීම සහ වාචික පරිභවය,314
සංකේත, 315
මුදිතා, 34, 109, 165, **315**
අනුකම්පාව,47, 57, 151, 243, **316**
සංකලනය,316
කථා කිරීම සහ සවන් දීම, 317
පච්චකෙටීම, 29
බඳු, 233
තෙදණ්ඩික, 287, 310
තාවකාලික පැවිදිවීම, 239
තායිලන්තය, 36, 111, 141, 239, 321, 328, 330
තථාගත, 318
ටිබෙටය, 68, 111, 213, 316, 319
මළවුන් පිළිබඳ ටිබෙට් ග්‍රන්ථය, 155
බුදුපියාණන් වහන්සේගේ ගුරුවරු, 259, **319**
ගුරුවරු සහ ශ්‍රාවකයන්,39, 60, 294, **319**
දේවවාදය,320
ථේරගාථා සහ ථේරීගාථා, 7, 82, 203, **321**
ථේරවාද,39, 138, 155, 179, 205, **322**, 231, 241, 350
සම්මා සංකප්ප,322
කාලය,57, 81, **323**
ත්‍රිපිටකය, 172, 241, **324**
සනීපාරක්ෂා (වච්චකුටි),326
ඉවසීමේ හැකියාව,316, **327**
දත් බුරුසුව, 151
කුසල් අනුමෝදන් කිරීම,56, **328**

සංක්‍රාන්ති ලිංගිකත්වය,329
බුදුපියාණන් වහන්සේගේ චාරිකා, 330
ගස්,143, 275, **331**
ඍක්ෂ වන්දනාව,332
දැඩි විශ්වාසය, 2, 100, 109, **333**
සත්‍යය,60, 66, 137, 169, **334**
පාත්‍රය අනෙක් පසට හැරවීම, 335
උදාන,337
අවිඥානය,108, **337**
සම්මා දිට්ඨි,65, 71, 86, 184, **338**
බුදුදහමේ එකමුතුව,338
විශ්වවාදය (සියලු මිනිසුන්ගේ විමුක්තිය ගැන විශ්වාස කිරීම),339
විශ්වය,121, 135, **340**, 364
පරිකල්පනය කළ නොහැකි, 341
*උපනිෂද්*, 97, 140
උපාසක සහ උපාසිකා, 341
උපොසථ, 45, **343**
උරුවෙල, 82, 191, 202, **343**
වාග්භඨ,53, 117, 157, 197, **345**
වජ්‍රයාන බුදුදහම, 97, 104, 155, 194, 283, 319, 359
වාරාණසී, 247, 284, **346**
වේදයන්,3, 13, 140, 194, 237, 287, **346**
නිර්මාංශවීම,74, **347**
වැස්ම සහ ආවරණය කිරීම,55, 131, **349**
වෙසාඛ,45, **350**
වෙසාලි,7, 351
විනය පිටක, 74, 174, 193, 217, 243, 324, **351**
විස්ණු, 30, 140, 218
විසුද්ධිමග්ග,34, 39, 165, 184, 188, 202, 207, 257, 341, **352**
බුදුපියාණන් වහන්සේගේ හඬ, 352
ඔට්ටු ඇල්ලමේ තර්කය,353
යුද්ධය,69, 150, 244, **354**
මුඩුබිම - හිස් තැනක්ල355
ධනය,60, 93, 216, **356**

ආයුධ,186, **358**
විවාහ උත්සව, 195, **362**
චක්‍රය,308, **360**
ප්‍රඥාව,21, **361**
කාන්තාවන්,117, 192, 144, 204, 341, **362**
බුදුපියාණන් වහන්සේගේ අවසාන වචන,363
වැඩ, 364
ලෝකය, 185, 323, **364**
සුඇංසෑ, 48, 82, 221, 250, 305
යක්ඛ,350, **365**
යසොධරා, 350, **365**
යොග, 187, **365**
යොන,366
උද්‍යෝගය,369
උච්චස්ථානය, 78, **369**
ලෝකයේ පැරණිතම - පැවැත්වෙන සරතුස්ත්‍ර ගේ ආගම, 121

මෙම ග්‍රන්ථය බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් සහ විවිධ සමකාලීන කරුණු පිළිබඳ බෞද්ධ යථා දර්ශය පහසුවෙන් කියවීමට, පරිපූර්ණ සහ නිවැරදි මඟපෙන්වීමකි. එහි 450කට වඩා වැඩි ප්‍රමාණයක වෙන් වූ සටහන්, පාළි ත්‍රිපිටකයේ උපුටා ගැනීම් දහසකට වඩා වැඩි ප්‍රමාණයක් සහ ඒවායෙන් බොහෝ යොමු කිරීම් ද අඩංගු වේ. මත්වතුර සහ ජ්‍යෝතිෂය, සුවකිරීම් සහ මානව හිමිකම්, යුද්ධ සහ ප්‍රඥාව යනාදි වශයෙන් ආවරණය කරන ලද විෂයයන් පුළුල් පරාසයකින් යුක්ත වේ. ඒ ආකාරයෙන් මෙම ග්‍රන්ථය වචනයේ පරිසමාපත්තියෙන්ම බුදුදහම පිළිබඳ කුඩා විශ්වකෝෂයක් බවට පත් කිරීම සහ සදාකාලික ආධ්‍යාත්මික සම්ප්‍රදාය වූ බුදුදහමට විශිෂ්ට හැඳින්වීමක් ද වේ.

මෙම ග්‍රන්ථයේ කතුවරයා වන ශ්‍රාවස්ති ධම්මික හිමියන් උපත ලැබූයේ ඕස්ට්‍රේලියාවේදීය. උන්වහන්සේ බෞද්ධ භික්ෂුවක වශයෙන් වසර 45ක සිට වැඩ වසති. 1976දී ඉන්දියාවේදී පැවිදි වූ උන්වහන්සේ මරදානේ ශ්‍රී ලංකා විද්‍යාලයේ සහ කැලණිය විශ්වවිද්‍යාලයේ පාළි සහ බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ ලබා ඇත. වසර ගණනාවක් සිංගප්පූරුවේ බෞද්ධ ආයතනවල ආගමික උපදේශකවරයෙකු ලෙස කටයුතු කර ඇත. උන්වහන්සේ විසින් රචිත ග්‍රන්ථ භාෂා 30කට වැඩි ගණනකට පරිවර්තනය කර ඇත.

ග්‍රන්ථ කතෘ, පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමියන් උපත ලැබූවේ 1951දී ඕස්ට්‍රෙලියාවේ ක්‍රිස්තියානි පවුලකය. උන්වහන්සේ වයස 19දී බුදුදහම වැළඳ ගත්හ. 1973දී උන්වහන්සේ භික්ෂූවක් වීම සඳහා ආසියාවට ගොස්, තායිලන්තය, ලාඕසය සහ බුරුමය යන රටවල සංචාරය කළහ. අවසානයේ අනගාරික ධර්මපාල තුමාගේ අවසාන ශ්‍රාවක, පූජ්‍ය මාටිවැල්ලේ සංඝරතන හිමියන් යටතේ 1976දී ඉන්දියාවේ සැවැත් නුවරේදී පැවිදි වූහ. එතැන් සිට උන්වහන්සේ ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ සහ සිංගප්පූරුවේ ජීවත් වූහ. උන්වහන්සේ බුදුදහම සහ ඊට සම්බන්ධ විෂයයන් පිළිබඳව බොහෝ ග්‍රන්ථ සහ ලිපි ලිවීම පිළිබඳව ප්‍රසිද්ධ වේ. 2017දී උන්වහන්සේ අවසානයේ උන්වහන්සේගේ උපන්ගමට පැමිණි අතර, වර්තමානයේ හුදෙකලාව උතුරු ක්වීන්ස්ලන්තයේ වැඩ වසති.